2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.05.28 වේලාව: ප.ව.05.40 යි.
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-
(පැමිණියේ නැත)

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලු මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා සමඟ නීතිඥ රවිෂානි පීරිස් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	:	534
නම	:	සෙයියදු අබ්බාස් මොහොමඩ් ඉක්රාම්
වයස	:	අවුරුදු 44
ආගම	:	මුස්ලිම්
රැකියාව	:	මේජර් , යුධ හමුදා සන්නද්ධ බලකාය

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

නියෝගය

මේ අවස්ථාවේදී මින් පසුව සාක්ෂි මෙහෙයවනු ලබන්නේ බුද්ධි අංශයේ නිලධාරීන් මාර්ගයෙන් බැවින් කොමිෂන් සභාව පිටත මාධ්‍යයට කොමිෂන් සභාව තුළ සිදු වන දේ පෙනීමට සකස් කර ඇති රූපවාහිනී යන්ත්‍රය නිවා දමන ලෙසට නියෝග කරමි. නමුත් මාධ්‍යයට කොමිෂන් සභාව තුළ දෙන සාක්ෂිය ඔවුන්ට ඇසෙන බව සටහන් කර තබමි. විශේෂ ඉල්ලීමක් මාධ්‍යයෙන් කිරීමට අවශ්‍යයි. මේ සාක්ෂි ලබා දෙන්නේ බුද්ධි අංශයේ නිලධාරීන් බැවින් ඔවුන්ගේ නම් කිසිසේත්ම වාර්තා නොකරන ලෙසට කාරුණිකව ඉල්ලා සිටිනවා. එසේම ඔවුන්ගේ සාක්ෂිය තුළ සඳහන් වන බුද්ධි අංශයේ නිලධාරීන්ගේ නම් අපි මාධ්‍යයට ඇසෙන නොවෙන ලෙසට අපි ඒ නම් ලබා ගැනීමට අපි අරමුණු කරනවා. යම් අවස්ථාවකදී වැරදීමකින් හෝ එම නම් මාධ්‍යයට ඇසුනත් එම නම් ප්‍රසිද්ධ නොකරන ලෙසටද මාධ්‍යයෙන් ඉල්ලීමක් කරනවා. එසේම එම බුද්ධි අංශ නිලධාරීන් සේවා කරන ස්ථානය වාර්තා නොකරන ලෙසටත් ඉල්ලීමක් කරනවා. එසේම මාධ්‍යට විශේෂයෙන්ම ඉල්ලීමක් කරන්නේ මෙම බුද්ධි අංශයේ නිලධාරීන්ගේ රූප පවා සජීවිව හෝ නිශ්චල ලබා නොගන්නා ලෙසට.

සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා

ප්‍ර : සාක්ෂිකරු ඔබ ශ්‍රී ලංකා යුධ හමුදාවේ මේජර්වරයෙකු වශයෙන් කටයුතු කරනවා කියලා මා කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි.

ප්‍ර : ඔබ 2019/04/21 වන විට ඔබ ශ්‍රී ලංකා යුධ හමුදාවේ මේජර්වරයෙකු වශයෙන්ද කටයුතු කළේ?

පි : ඔව්.

ප්‍ර : ඔව්?

පි : ඔව්.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබට සිංහල භාෂාවට අමතරව ද්‍රවිඩ භාෂාව, ඉංග්‍රීසි භාෂාව හෝ එම භාෂා දෙකම කතා කිරීමේ හැකියාවක් තියෙනවාද නැද්ද ?

පි : හැකියාවක් තියෙනවා.

ප්‍ර : 2019/04/21 මේ ශ්‍රී ලංකාවේ කොළඹ ප්‍රදේශයේ ප්‍රධාන පෙළේ හෝටල් කිහිපයකමත්, ශාන්ත අන්තෝනි මුනිඳුන් වෙනුවෙන් වෙන් කරලා තියෙන කොච්චිකඩේ දේවස්ථානයේත්, මීගමුව ශාන්ත සෙබස්තියන් දේවස්ථානය කියන ස්ථානයන් වල මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයන් සිදු වූ බව ඔබ දන්නවාද?

පි : දන්නවා.

ප්‍ර : මෙන්න මෙම බෝම්බ ප්‍රහාරයන් සිදු වෙන කොට ඔබට ඔබ කොහේද සිටියේ කොළඹද නැත්නම් පිට පළාතකද කියලා කියන්න?

පි : කොළඹ.

ප්‍ර : කොළඹ ප්‍රදේශයේ හිටියේ. ඊළඟ ප්‍රශ්නේදී නම් කියන්න එපා. එසේ මේ බෝම්බ ප්‍රහාරයන් සිදු වෙන අවස්ථාවේදී ඔබට ඔබගේ ඉහළ නිලධාරීවරයෙකුගෙන් හරි නිලධාරීවරුන්ගෙන් හරි ඔබට කිසියම් උපදෙසක් ලැබුණාද?

පි : මුලදී මට ලැබුණේ නෑ. මට මෙහෙම බෝම්බ ප්‍රහාරයක් සිද්ධ වෙනවා කියලා අපේ හමුදාවෙන් ගිය එක්කෙනෙක් කතා කරලා කිව්වා. ඒක මං කතා කරන්න මගේ අධ්‍යක්ෂකතුමාට කතා කළා. එතකොට අධ්‍යක්ෂකතුමා ඒ මේ බීසි වෙලා හිටියේ ඔය ප්‍රශ්නේ හින්දා. phone එකට answer කළේ නෑ. මම එවකට හිටියේ නිවසේ. ඊට පස්සේ තමයි මගේ අධ්‍යක්ෂකතුමා කතා කරලා මම නිවසින් ආවා මේ කාර්යාලයට. ඊට පස්සේ තමයි අධ්‍යක්ෂකතුමා මම කාර්යලයේ ඉන්න කොට ගිහිල්ලා කිව්වා මෙහෙම ප්‍රශ්නයක් යනවා. Social media හරහා මේක අන්තවාදීන් කළා කියලා පොඩි කතාවක් යනවා. ඒ හින්දා ගිහිල්ලා බලන්න කියලා.

ප්‍ර : ඒ ගැන බලන්න කියලා?

පි : බලන්න කියලා.

ප්‍ර : මේ අවස්ථාව වන කොට ඒ කියන්නේ 2019/04/21 වන විට මොහොමඩ් ලතීෆ් ජමීල් මොහොමඩ් යන පුද්ගලයා සම්බන්ධව යුධ හමුදාවට තොරතුරක් තිබුණාද?

පි : තිබුණා.

ප්‍ර : ඔබගේ මේ ඉහළ නිලධාරීවරයා ඔබට කිව්වා කියා සිටියා සමාජ මාධ්‍ය ජාලා පරීක්ෂා කරන්න කියලා?

පි : නෑ සමාජ මාධ්‍ය හරහා යනවා කියලා කිව්වා මේ මුස්ලිම් අන්තවාදීන් මේක කළා කියලා. අපිට තියෙන තොරතුරු අනුව ඒ ගැන හොයලා බලන්න කියලා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : ඒ ගැන හොයලා බලන්න කියලා. ඒ උපදෙස ඔබට ලැබුණාට පසුව ඔබ කිසියම් පුද්ගලයෙකු සම්බන්ධයෙන් පරීක්ෂාවට ලක් කළාද?

පි : ඒ වෙන කොට අපිට මේ ජමිල් ගැන තොරතුරු හම්බ වෙලා තිබුණේ. ජමිල් අන්තවාදී ක්‍රියාවලට

ප්‍ර : සම්බන්ධයි කියලා ?

පි : සම්පූර්ණයෙන් නෙවේ. Certain level සම්බන්ධයි කියලා. ඒ හින්දා මගේ අධ්‍යක්ෂකතුමාම කිව්වා එයාගේ ගෙදර ගිහින් බලන්න කියලා එයා ඉන්නවාද නැද්ද කියලා.

ප්‍ර : ජමිල් ඉන්නවාද නැද්ද කියලා එයාගේ ගෙදර කියන්නේ ජමිල්ගේ ගෙදර?

පි : ජමිල්ගේ ගෙදර

ප්‍ර : ගිහින් බලන්න කිව්වා?

පි : ඔව්.

ප්‍ර : සාක්ෂිකරු ඒ අනුව ඔබ මේ ජමිල් කියන තැනැත්තාගේ නිවසට ගියාද?

පි : ගියා.

ප්‍ර : මේ ජමිල්ගේ නිවසට ඔබ ගියේ තනියමද නැත්නම් කණ්ඩායමක් සමඟද?

පි : කණ්ඩායමක් සමඟ.

ප්‍ර : කණ්ඩායමක් සමඟ. එම කණ්ඩායමේ කී දෙනෙක් ඔබත් සමඟ තව කී දෙනෙක් ගියාද?

පි : මට මතක විදිහට මට වඩා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ගියා. ඒ එක්කම දෙදෙනෙක් අපි වෙනම ක්ෂේත්‍ර රාජකාරිවල ඉන්න දෙන්නෙක් ගෙන්නව ගත්තා.

ප්‍ර : ක්ෂේත්‍ර රාජකාරිවල ඉන්න

පි : දෙන්නෙක් ගෙන්න ගත්තා. වාහනයේ රියදුරුත් එක්ක තව එක්කෙනෙක් හිටියා.

ප්‍ර : මේ ජමිල් කියන තැනැත්තාගේ නිවස තියෙන ස්ථානය ගැන ඔබලා ඒ ඔබ දැන ගෙන සිටියාද?

පි : මට හරියටම මෙතනයි කියලා දන්නේ නෑ. වැල්ලම්පිටිය ප්‍රදේශයේ ගෙදර තියෙනවා කියලා මම දැන ගෙන හිටියා. ඒ තැන දන්නේ නැති හින්දා තමයි ක්ෂේත්‍ර නිලධාරීන් දෙන්නෙක් ගෙන්න ගත්තේ.

ප්‍ර : ක්ෂේත්‍ර නිලධාරීන් ගෙන්න ගත්තේ. ඔබට මතකද මේ ජමිල් පදිංචි නිවස අංකය හෝ කොහේද තියෙන්නේ කියලා මේ වේලාවේදී කියන්න?

පි : එහෙම මතකයක් නෑ.

Registrar's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : වැල්ලම්පිටිය ලංසියාවත්ත කියන ප්‍රදේශයේ කිව්වොත් හරිද?

පි : හරි.

ප්‍ර : ඔබ සහ ඔබේ අනෙකුත් පිරිස මේ වැල්ලම්පිටිය ලංසියාවත්තේ තියෙන ජමිල් මොහොමඩ්ගේ නිවසට ගියාද?

පි : අපි ඉස්සෙල්ලාම ගියේ එයා කලින් හිටපු ගෙදරට. ඒ වෙනකොට ඒයා ඒ ගෙදර පදිංචි නෑ කියන එක අනාවරණය වුණා. ඊට පස්සේ එයාගේ බිරිඳගේ ගෙදරට ගියා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

උත්තර දෙන කොට සිවිල් පාර්ශවකරුවන්ගේ නම් කියන්න. ඒකට කමක් නෑ. ඔබගේ අංශයේ අයගේ නම් කියන්න එපා. සිවිල් පාර්ශවකරුවන්ගේ නම් සම්පූර්ණ දන්න විදිහට කියන්න.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : දැන් ඔබ ඒ අනුව ජමිල්ගේ බිරිඳගේ නිවසට ගිය බවයි කියා සිටියේ?

පි : ඔව්.

ප්‍ර : ඒ අර ඔහු පදිංචි වෙලා හිටපු නිවසේ ඉඳලා කොච්චර වගේ දුරක්ද තියෙන්නේ?

පි : මීටර් 30 ක් විතර.

ප්‍ර : මීටර් 30 ක් විතර?

පි : ඔව්.

ප්‍ර : දැන් එම නිවසට ඔබ යන කොට එම නිවසේ ඔබ ඒ නිවස ඇතුළට ගියාද?

පි : ගියා.

ප්‍ර : ඔබලා නිලධාරී කණ්ඩායමක් ගිය බව තමයි ඔබ මීට පෙර ප්‍රකාශ කර සිටියේ? මේ ජමිල්ගේ බිරිඳගේ නිවසට ඒ සියළු දෙනාම ගියාද?

පි : රියදුරුයි තව එක්කෙනෙකුයි හැරෙන්න අනිත් සියළු දෙනාම ගියා.

ප්‍ර : අනිත් අය ගියා?

පි : අනිත් අය ගියා.

ප්‍ර : ඔබලා මේ ජමිල්ගේ නිවසට ඒ ඇතුළට යන විට නිල ඇඳුමෙන්ද ගියේ එහෙම නැත්නම් සිවිල් සාමාන්‍ය සිවිල් ඇඳුමෙන්ද?

පි : සිවිල් ඇඳුමෙන්.

ප්‍ර : සිවිල් ඇඳුමෙන් ගියේ. 2019/04/21 මේ ජමිල්ගේ නිවසට ඔබලා යන විට වේලාව කීයට විතර වගේ ඇත්ද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මට හරියටම වේලාව කියන්න මතකයක් නෑ. කොළඹ බෝම්බ පිපිරිලා විනාඩි 45 කට 50 කට පැයකට විතර පස්සේ.

ප්‍ර : පැයකට විතර වගේ පසුව. ඔබලා මේ ජමිල්ගේ නිවසට ගිහිල්ලා ගියාම ඔබට ජමිල්ව මුණ ගැසුණාද?

පි : නැහැ.

ප්‍ර : ජමිල් නිවසේ සිටිනවාද කියලා ඔබලා සොයා බැලුවාද?

පි : සොයා බැලුවා.

ප්‍ර : කොහොමද ඒ සොයා බැලීම ඔබ සහ ඔබේ නිලධාරීන් කළේ? ඒ කියන්නේ ගෙදර පරීක්ෂා කළාද නැත්නම් එම නිවසේ වෙනත් කවුරු හරි ඉඳලා ඒ ගොල්ලන්ගෙන් විමසා සිටියාද?

පි : අපි නිවස ඇතුළට ගියේ නෑ.

ප්‍ර : ඔව්.

පි : යහළුවෙක් විදිහට තමයි එතන අපි මේ පෙන්නලා තිබුණේ.

ප්‍ර : කාගේ යහළුවෙක් විදිහටද?

පි : ජමිල්ගේ.

ප්‍ර : ඔබ සියළු දෙනාම ජමිල්ගේ යාළුවන් විදියට?

පි : යාළුවන් විදියට තමයි එතන අපි පෙන්නුවේ.

ප්‍ර : ඔව්.

පි : ඊට පස්සේ

ප්‍ර : යහළුවන් බවට තමයි ප්‍රකාශ කර සිටියේ.

පි : ප්‍රකාශ කර සිටියේ.

ප්‍ර : ඒ යහළුවන් බවට ප්‍රකාශ කර ඉඳලා ඔබ ඒ නිවසේ කාත් එක්කද කතා කළේ?

පි : ජමිල්ගේ බිරිඳගේ පියා එක්ක.

ප්‍ර : ජමිල්ගේ බිරිඳගේ පියා එක්ක. මොකක්ද ඔහුගේ නම?

පි : නම ඇහුවේ නෑ.

ප්‍ර : සමාවෙන්න.

පි : නම ඇහුවේ නෑ.

ප්‍ර : නම ඇහුවේ නෑ?

පි : නෑ.

ප්‍ර : ඒ අනුව ඔබලා කුමක්ද විමසා සිටියේ?

පි : ජමිල් ඉන්නවාද කියලා තමයි ඇහුවේ.

ප්‍ර : ජමිල් ගෙදර ඉන්නවාද කියලා විමසා සිටියාම මොකක්ද ලැබිච්චි පිළිතුර?

පි : ඒ ගොල්ලන් කිව්වා මේ ජමිල් සිකුරාදා දින තුනක ආගම ප්‍රචාරයේ ගියා කියලා.

ප්‍ර : සිකුරාදා ඒ කියන්නේ 2019/04/19?

පි : 19 වගේ.

FAIR COMMENT
BY JEZEEM
Presidential Secretary's Copy

ප්‍ර : ආගම ප්‍රචාරය සඳහා පිටත් වෙලා ගියා කියලා?

පි : දින තුනක.

ප්‍ර : කවුද ඒක කිව්වේ?

පි : ඒක කිව්වේ ජමිල්ගේ බිරිඳගේ පියා.

ප්‍ර : ඉතින් ජමිල්ගේ යාළුවන් කියලා ඔබලා ප්‍රකාශ කළාම ජමිල්ගේ බිරිඳ නිවසේ ඉන්නවාද කියලා හොයලා බැලුවාද නැද්ද?

පි : අපි එවෙලේ හොයලා බැලුවේ නෑ. මොකද මුස්ලිම් පවුලක සාමාන්‍යයෙන් ගෑණු කට්ටිය ඉස්සරහාට එන්නේ නෑ කවුරුත් එළියට ආවාට පස්සේ . ඒ හින්දා අපි පියයි මම හිතන විදිහට බිරිඳගේ සහෝදරයයි ඒගොල්ලන් තමයි හිටියේ. ඒගොල්ලන්ගෙන් තමයි අපි විස්තර ඇහුවේ.

ප්‍ර : දැන් ජමිල් මේ නිවසේ නොමැති බව ඔබලාට දැන්වුවාට පසුව ඔබලා එම නිවසින් පිටත්ව ගියාද?

පි : ඔව් එතකොට අපි ඇහුවා තව විස්තර වගයක් ඇහුවා නෑ කියලා කිව්වට පස්සේ එයාගේ telephone number එකක් තියෙනවාද එයා ගෙදරට කතා කළාද කියන විස්තර ඇහුවා.

ප්‍ර : telephone number එකක් තියෙනවාද කියලා විස්තරය ඇහුවාම මොකක්ද ඔබට දැන ගන්න ලැබුණේ?

පි : තියෙනවා කියලා කිව්වා . ඒ වුණාට එයා මේ ආගම ප්‍රචාරයේ ඒ විදිහට ගියාට පස්සේ telephone එක off කරනවා කියලා කිව්වා.

ප්‍ර : ආගම ප්‍රචාරයට ගියාම telephone එක off කරනවා කිව්වා?

පි : දවස් තුනම කතා කරන්නේ නෑ කියලා කිව්වා.

ප්‍ර : ඔබ ඒ දුරකථන අංකය ලබා ගන්නට කටයුතු කළාද?

පි : ගත්තා.

ප්‍ර : ඔබට මේ අවස්ථාවේදී ඒ ලබා ගත්ත දුරකථන අංකය මොකක්ද කියලා ප්‍රකාශ කරන්න පුළුවන්ද?

පි : මතකයක් නෑ.

ප්‍ර : ඒ ලබා දීපු දුරකථන අංකයට ඔබ දුරකථන ඇමතුමක් ගත්තාද?

පි : අපි එතනදී ගත්තේ නෑ.

ප්‍ර : ඔබ එතනදී ගත්තේ නෑ?

පි : ඒගොල්ලොන්ට අපි කිව්වා ගන්න කියලා call එකක්.

ප්‍ර : ඒගොල්ලොන්ට ඒ කියන්නේ නිවසේ ඉන්න අයට කිව්වා?

පි : call එකක් ගන්න කියලා.

ප්‍ර : යාළුවෝ හැටියට ගිහිල්ලා එහෙම කීමට හැකියාවක් තිබුණාද ඔබලාට?

පි : නෑ ඒගොල්ලන්ට ඒ වෙන කොටත් මොකක් හරි මේ දැනිලා තිබුණා ප්‍රශ්නක් තියෙනවා කියලා මම හිතන විදිහට. ඒගොල්ලන්

Provided by Parliament Secretariat
FAIR COMMENT BY JEZEEM

කිසිම විරෝධකමක් පෑවේ නෑ ඒ වේලාවේ කතා කරන හැමදේටම උත්තර දුන්නා. ඉතින් අපි එයාට call එකක් අරන් බලන්න කිව්වාම එගොල්ලන් call එකක් ගත්තා.

ප්‍ර : call එකක් අරන් බලන්න කිව්වාම ගත්තා?

පි : ඔව්. වැඩ කළේ නෑ.

ප්‍ර : දුරකථනය වැඩ කළේ නෑ. ඊට අමතරව ඔබ කිසියම් තොරතුරක් ලබා ගන්නට යෙදුණද ජමිල්ගේ බිරිඳගේ පියාගෙන්?

පි : ඔව් ඊට පස්සේ ඇහුවා බිරිඳටවත් කතා කළේ නැද්ද කියලා. ඒ වෙන කොට කිව්වා එයාට කතා කළෙත් නෑ කියලා. ඊට පස්සේ තමයි ඒගොල්ලො ඇහුවේ මොකක් හරි ප්‍රශ්නයක්ද කියලා. මම කිව්වා කිසි ප්‍රශ්නයක් නෑ මේ ජමිල්ව හම්බ වෙන්න ඕනී හදිසියේ . ඒක හින්දා තමයි ආවේ කියලා.

ප්‍ර : ජමිල්ව හම්බ වෙන්න ඕනී. හදිසියේ ඒක තමයි ආවේ කියලා. දැන් ඔබලා මේ ජමිල්ගේ බිරිඳගේ පියාගේ නිවසට ගියේ පයින්ද නැත්නම් වාහනයකින්ද?

පි : වාහන දෙකකින් ගිහිල්ලා එක වාහනේකට ගොඩ වුණා.

ප්‍ර : එක වාහනේකට ගොඩ වුණා. ඒ ගොඩ වුණ වාහනේ මොකක්ද?

පි : කැබ් රථයක්.

ප්‍ර : කැබ් රථයක්?

පි : ඩබල් කැබ් රථයක්.

ප්‍ර : සමාවෙන්න .

පි : ඩබල් කැබ් රථයක්.

ප්‍ර : දැන් ඒ ඩබල් කැබ් එක යුධ හමුදා වාහන වල යුහ වශයෙන් අංක කරලා තියෙනවා. දැන් මෙම ඔබලා යන්න යෙදුණේ ඒ වගේ රාජකාරී වාහනයකද නැත්නම් සාමාන්‍යයෙන් තියෙන සිවිල් වාහනයකද?

පි : රාජකාරී වාහනයක් නමුත් යුහ කියලා ගහලා තිබුණේ නෑ.

****

දැන් වේලාව : ප.ව.06.00 යි.
මෙතැන් සිට ල/ලේ :- වන්දිමා මෙය.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව:ප.ව.6.00
පෙර සටහන් :ල/ලේ මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට:චන්දිමා දිල්හානි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: දැන් ඒ වාහනය ඔබලා නතර කර සිටියේ ඒ ජමිල්ගේ බිරිඳගේ පියාගේ නිවසේ ඉදලා කොච්චර වගේ දුරකින්ද .?

පි: අපි ඉස්සෙල්ලා වාහනය නතර කරපු තැන ඉදලා පයින් ගියේ.

ප්‍ර; අර එක වාහනයකට ගොඩ වූ අවස්ථාවේ දී අර අනිත් වාහනය කොහේද තිබුනේ?

පි: ඒ වාහනය තිබුනේ වැල්ලම්පිටිය හන්දිය.

ප්‍ර; දැන් සාක්ෂිකරු දුරකථන අංකය ලබා ගත්තා දුරකථන ඇමතුමක් ලබා ගත්තා බිරිඳට දුරකථන ඇමතුමක් ලබා දුන්නාද කියලා ඇහුවා පිළිතුරක් ලැබුනද ඒකට?

පි: ගත්තේ නෑ කියලා තමයි කිව්වේ කෝල් එකක් .

ප්‍ර: ඊට අමතරව යම් තොරතුරු විමසා සිටියාද ඒ නිවැසියන්ගෙන්?

පි: නෑ ඊට පස්සේ එයා කෝල් කරොත් අපිට කෝල් කරන්න කියලා නම්බර් එකක් දිලා.

ප්‍ර: නැවත කියන්න කරුණාකරලා ?

පි: එයා කෝල් කරොත් අපිට කෝල් කරන්න කියලා නම්බර් එකක් දිලා ආවා මාත් එක්ක ගිය ක්ෂේත්‍ර රාජකාරියේ ඉන්න සොල්දාදුවෙක්ගේ නම්බර් එකක් තමයි දුන්නේ.

ප්‍ර: එසේ ඒ දුරකථන ඇමතුමක් ලබා දෙන්න කියලා ගිහල්ලා ඔබලා එම ස්ථානයෙන් පිටත්වෙලා ගියාද?

පි: පිටත් වෙලා ගියා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: දැන් ඔබ සහ ඔබ සමඟ ගිය අනෙක් අය ඔය ජමිල්ගේ ගෙදරට කලින් ගිහිල්ලා තියෙනවාද?

පි: මං ගිහිල්ලා නෑ ස්වාමිනි.

ප්‍ර: අනෙක් අය ගිහිල්ලා තියෙනවාද?

පි: ක්ෂේත්‍ර රාජකාරියේ ඉන්න කට්ටිය ගෙදරට ගිහිල්ලා නෑ ඒ වුනා අවේශනය කරලා තියෙනවා.

ප්‍ර: දැන් ඒ කියන්නේ ඔබලා යන්නේ සම්පූර්ණයෙන් අමුත්තන් වශයෙන් තමයි ජමිල්ගේ ගෙදර යන්නේ නේද?

පි; ඔව්.

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට ඒ වගේ අමුත්තන් ඇවිල්ලා අපි මේ යාළුවෝ කිව්වාම ඒ කට්ටිය පොඩ්ඩක් කලබලයක් වුනා ද නැත්නම් ?

පි: මුලදි කලබලයක් වුන් නෑ ඒ වුනාට පස්සේ කලබල වුනා.

ප්‍ර: කොහොමද?

පි: හේතුව ඇහුවා ඇයි හොයන්නේ කියලා හේතුව ඇහුවා අපි කිව්වා විශේෂ දෙයකට නෙමේ අපිට හම්බෙන්න ඕනේ කතා කරොත් කෝල් එකක් දෙන්න කියලා අපි පිටත් වෙලා ගියා.

ප්‍ර: එතකොට ඒ අවස්ථාව වෙනකොට ඔබ කියන හැටියට එළියට ආවේ ජමිල්ගේ බිරිඳගේ පියා සහ ජමිල්ගේ බිරිඳගේ සහෝදරයා?

පි: ඔව්

ප්‍ර: ගෙදර ගෑනු අය ඉන්නවා කියලා ඔබ දැක්කාද?

පි: එතකොට දැක්කේ නෑ පිරිමි තව කීපදෙනෙක් හිටියා ස්වාමිනි මං දන්නේ නෑ ඒ කවුද කියලා

ප්‍ර; එතකොට ඔබ කියන විදියට ඔබ කිව්වානේ ඒ කට්ටියට ජමිල්ගේ දුරකථනයට ඇමතුමක් ගන්න කියලා ඒ ඇමතුම ගත්තේ ඔබ ඉදිරිපිටද නැත් නම් ගෙදර ඇතුලතට ගිහිල්ලා ඇවිල්ලා කිව්වාද?

පි: අපි ඉදිරිපිටමයි ගත්තේ.

ප්‍ර: කාගේ දුරකථනයෙන්ද ගත්තේ ඔබ සමඟ ගිය කාගේ හරිද නැත්නම්?

පි: නෑ ගෙදර පියා හෝ බිරිඳගේ සහෝදරයා තමයි ගත්තේ.

ප්‍ර: ඔබ ඒ දුරකථන ඇමතුම ගන්නවා දැක්කාද?

පි: දැක්කා.

ප්‍ර: ඒ දුරකන ඇමතුම ගත්තේ සාමාන්‍ය දුරකථන සම්බන්ධතාවයක් තුලින්ද නැත්නම් imo නැත්නම් telegram යන සම්බන්ධතාවක් තුලින්ද?

පි: ඒ ගැන අවබෝධයක් නෑ.

ප්‍ර: ඒක දැක්කේ නෑ?

පි: නෑ.

****

<u>**ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සංජීව දිසානායක මහතා**</u>

ප්‍ර: දැන් යම් ඔබ මේ නිවැසියන්ට දන්වා සිටියේ ජමීල් ගෙදර ආවෝත් ඔබලාට දැනුම් දෙන්න කියලාද නැත්නම් මොකක්ද?

පි: කතා කරොත් අපිට දැනුම් දෙන්න අපිට කියන්න කියලා තමයි කිව්වේ.

ප්‍ර; කතා කරත් ඔබලාට කියන්න කියලා තමයි ඉල්ලා සිටියේ කාටද ඒ ඉල්ලිම කරේ?

පි: පියාටයි බිරිඳගේ සහෝදරයාටයි.

ප්‍ර: ජමිල්ගේ බිරිඳගේ පියාටයි බිරිඳගේ සහෝදරයාටයි එහෙම කරලා ඒ ඉල්ලිම කරලා ඔබලා එම නිවසින් එළියට පිටත් වෙලා ගියාද?

FAIR COMMENT — BY JEZEEM —

පි: පිටත් වෙලා ගියා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: දැන් ඔබ කිව්වා නේද ඔබලා ඉස්සරහා තමයි ජමිල්ට ඇමතුම ගත්තේ කියලා එතකොට ඒ ඇමතුමට ඒ අනිත් පැත්තෙන් දුරකථනය නාද වෙනවා ඇහුනාද නැත්නම්?

පි: එහෙම ඇහුන් නෑ ස්පීකර් දලා නෙමේ කතා කරේ.

ප්‍ර: ඒ කියන්නේ ඔවුන් කියපු කටවචනය තමයි ඔබ විශ්වාස කරේ?

පි; විශ්වාස කරේ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර; ඒ ඉන් ඔබලා පසුව එම ස්ථානයෙන් පිටපත්වෙලා ඒ ප්‍රදේශයෙනුත් ඒ කියන්නේ ලන්සියා වත්ත ප්‍රදේශයෙනුත් පිටත් වෙලා ගියාද?

පි: අපි ලන්සියා වත්ත ප්‍රදේශයෙන් පිටත්වෙලා හන්දියට ඇවිල්ලා හන්දියට ආවා.

ප්‍ර: ඔබ මේ හන්දිය ලෙස හඳුන්වන්නේ මොකක්ද?

පි: අපි වාහනය නවත්වලා මට හරියටම කියන්න බැහැ මෙතනයි කියලා හන්දියේ වාහනය නවත්වලා ගිය තැනට අවා .

ප්‍ර: ඒ සාමාන්‍යයෙන් ජමිල්ගේ බිරිඳගේ පියා හමුවූ නිවසේ සිට කොච්චර වගේ දුරකින්ද දළ වශයෙන්?

පි: කිලෝමීටරයකට වඩා ආවා.

ප්‍ර: කිලෝමීටරයකට වඩා ආවා?

පි: ඔව්.

ප්‍ර; ඒ අනුව හන්දියට ඇවිල්ලා ඔබලා මොකක්ද කරේ?

පි: ඊට පස්සේ මං අධ්‍යක්ෂක තුමාට දුරකථන ඇමතුමක් ගත්තා අරගෙන කිව්වා අපි අපේ අනන්‍යතාවය ඔප්පු කරොත් එහෙම මීට වඩා තොරතුරක් ගන්න පුළුවන් මම මගේ අනන්‍යතාව ඔප්පු කරලා ඒ ගොල්ලන්ට කතා කරන්න ද ඇති කියලා.

ප්‍ර: ඒ කියන්නේ අනන්‍යතාව හෙලි කරලා හරි?

පි: කථා කරන්න ද කියලා ඊට පස්සේ මං එහෙම කියපු වාහින්දා අධ්‍යක්ෂක තුමා කිව්වා ආපු ගිහිල්ලා කතා කරන්න කියලා ඊට පස්සේ නැවත මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා නැතිව මමයි අර ක්ෂේත්‍ර රාජකාරියේ හිටපු දෙන්නත් එක්ක මම ආපහු ගියා ජමිල්ලාගේ ගෙදර.

President Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: දැන් අධ්‍යක්ෂක තුමාට කතා කරන්න ඉස්සෙල්ලා ඔබගේ අනන්‍යතාව හෙලිකරන්න හෙලිකිරීම සම්බන්ධයෙන් ඔබ සමඟ ගියපු අනික් නිලධාරිවරුන් සමඟ සාකච්ඡා කරාද නැද්ද?

පි; මම වඩා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ගියානේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා එක්ක සාකච්ඡා කරා.

ප්‍ර: ඉන් එකඟතාවය මතද ඒ දුරකථන ඇමතුම ලබා ගත්තේ?

පි; ඔව්.

ප්‍ර: ඒ ලබා ගෙන ඒ අනුමැතිය ලැබුනාට පසුව ඔබ කිව්වා ඔබ නැවත ජමිල්ගේ බිරිඳගේ පියාගේ නිවසටද ගියේ?

පි: ඔව්.

ප්‍ර: ඔබලා තුන්දෙනෙක් ගියේ?

පි: තුන්දෙනයි.

ප්‍ර: ඔබලා ඒ කියන්නේ වැල්ලම්පිටිය හන්දියට ඇවිල්ලා කොච්චර වගේ වේලාවකට පස්සේද මේ නැවත යන්න පිටත් වුනේ?

පි; විනාඩි 15 කින් විතර.

ප්‍ර; විනාඩි 15 කින්?

පි: ඔව් විනාඩි 15,20 විතර.

ප්‍ර; ඒ ගියේත් අර කැබ් රථයේමද?

පි: කැබ් රථයේ

ප්‍ර; එතකොට ඔබට වඩා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් හිටියා කිව්වානේ ඔහු සහ අනිකුත් නිලධාරින් කොහේද හිටියේ?

පි: ඔවුන් එතන බැහැලා හිටියේ.

ප්‍ර; ඒ අනුව ඔබලා ජමිල්ගේ බිරිඳගේ පියාගේ නිවසට ගියාද?

පි; ගියා.

ප්‍ර: ඒ ගිහිල්ලා එම නිවසේ කවුරු හරි මුණ ගැසුනාද?

පි: ආපහු ඒ කට්ටියම තමයි හිටියේ ඒ පුද්ගලයන්මයි හිටියේ.

ප්‍ර; ජමිල්ගේ බිරිඳගේ පියායි සහෝදරයායි ?

පි: තව පිරිමි කිප දෙනෙකුයි.

ප්‍ර: දැන් ඔවුන්ට ඔබලාගේ අනන්‍යතාවය හෙලිකරාද?

පි: හෙලි කරා.

ප්‍ර; ඒ හෙලිකරාට පසුව හෙලිකර ඔබ මොකක්ද කියා සිටියේ?

පි; අපේ අනන්‍යතාව හෙලි කරේ අපි ආරක්ෂක අමාත්‍යාංශයෙන් කියලා තමයි අපි කිව්වේ. අපිට ජමිල් ගැන සැකයක් තියෙනවා දැනට තියෙන ප්‍රශ්නෙත් එක්ක අපි ගාව තොරතුරු ත් තියෙනවා ඒ හින්දා ඔයගොල්ලන්ට මොනවා හරි ජමිල්ව බේරගන්න අවශ්‍ය නම් ජමිල් මොනවාහරි සම්බන්ධ වෙන එකත් එක්ක බේරගන්න අවශ්‍යනම් අපිට ඇත්ත කියන්න කියලා කිව්වා.

ප්‍ර: එහෙම කිව්වාට පසුව ඔබට පිළිතුරක් ලැබුනාද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ලැබුනා එතකොට කිව්වා අපි ඇවිල්ලා ගියාට පස්සේ ඒ ගොල්ලන්ට දුරකථන ඇමතුමක් හම්බුනා කියලා ජමිල්ගෙන් වැල්ලවත්ත පල්ලියක ඉන්නවා කියලායි වැල්ලවත්ත පල්ලියේ ඉන්න security officer කෙනෙක් ඒ ගොල්ලන්ට කතා කරලා මේයා ගැන සැකයක් ඇතිවුන හින්දා මේයාගේ අනන්‍යතාව ඔප්පු කර ගන්න වයිෆ්ට කතා කරා කියලා. බිරිඳට කතා කරා කියලා. ඊට පස්සේ ඒ අපි ඒවෙලේම ඒ ගත්ත එක්කෙනාට ආපහු ගන්න කිව්වා කෝල් එකක් ඒ වෙනකොට බිරිඳ ඉස්සරහට ඇවිල්ලා අපිත් එක්ක කතා කරා බිරිඳගෙන් විස්තර ඇහුවා තව මොනවාද ඇහුවේ කියන එක එහෙම එතකොට Identity card එකක් whatsApp කරලා ඒටකන් අනන්‍යතාව ඔප්පු කරගෙන තිබුනා ජමිල්ම කියන එක වැල්ලවත්ත පල්ලියේ ඉදලා එතකොට ඊට පස්සේ අපි කිව්වා ඒයාට කෝල් එකක් ගන්න කියලා සිකුරිටි ඔෆිස්ර්ට ඒගොල්ලන්ගේ ෆෝන් එකෙන් මට මතක විදියට ඒ ගොල්ලන්ගේ ෆෝන් එකෙන් security officer ට කෝල් එකක් අරගෙන අපිට දුන්නා.

ප්‍ර: පල්ලිය කොහේද කියලා ගෙදර අය කියා සිටියේ?

පි: වැල්ලවත්ත තවුහිද් පල්ලියක්.

ප්‍ර: දැන් whatsApp එකෙන් එවපු අනන්‍යතාවයක් ගැන ඔබගෙන් අසා සිටියානේ කවුද ඒක කා විසින් කාහට යවපු එකක්ද කිව්වේ?

පි: security officer විසින් බිරිඳට යවපු එකක්.

ප්‍ර: ඒක ඔබ දැක්කාද ඒ එවපු ?

පි: පෙන්නුවා.

ප්‍ර; ඒක ජාතික හැඳුනුම්පතක්ද නැත්නම් රියදුරු බලපත්‍රයක්ද නැත්නම් ගුවන් ගමන් බලපත්‍රයක්ද කියලා ඔබට මතකයක් තියෙනවාද?

පි: මතකයේ තියෙන විදියට රියදුරු බලපත්‍රයක්.

ප්‍ර; මේ වෙලාවේ මං ඔබට රියදුරු බලපත්‍රයක් පෙන්නුවොත් 2019.04.21 ජමිල්ගේ බිරිඳගේ පියාගේ ගෙදරදී අර ඔබ පරීක්ෂා කරන්නට යෙදුනු රියදුරු බලපත්‍රය ඒ කියන්නේ whatsApp message එකකින් පැමිණි රියදුරු බලපත්‍රයද නැද්ද කියලා හඳුනා ගන්න පුළුවන්ද?

පි; පුළුවන්. C460 සාක්ෂිකරුට පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා පරීක්ෂා කර බලයි

පි: මේක තමයි. සාක්ෂිකරු විසින් C 460 විසින් හඳුනා ගනී.

ප්‍ර: දැන් ජමිල්ගේ බිරිඳත් ඔබත් සමඟ කථා කරාද?

පි: කථා කරා.

ප්‍ර; ඇය කුමක්ද ඔබලාට ප්‍රකාශ කර සිටියේ?

FAIR COMMENT
BY JEZEEM

පි; මේ සම්බන්ධව විතරයි ප්‍රකාශ කරේ.මේ කතා කරා security officer කෙනෙක් කථා කරලා අනන්‍යතාව ඔප්පුකර ගන්න තමයි කතා කරේ කියන එකයි. ඇයි ජමිල් ගැන හොයන්නේ කියන එකතමයි මගෙන් ඇහුවේ.

ප්‍ර: ඒ වෙලාවේදී ජමිල්ගේ බිරිඳමොකක්ද කිව්වේ ඒ පුද්ගලයාට කියපු දේ එක ගැන ඔබලාට දැන්නුවාද නැද්ද?

පි: දැන්නුවා ඒ එයාගේ හස්බන්ඩ් කියන එකයි මගේ මතකයේ විදියට තරහාවෙලා ගියා කියන එක කියලා තිබුණා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: දැන් ඔබ පළවෙනි පාර ජමිල්ගේ බිරිඳගේ නිවසින් පිටත් වෙනකොට ඔබ කිව්වා නේද දුරකථන අංකයක් දීලා ජමිල් පිළිබඳ තොරතුරක් ලැබුනණොත් කථා කරන්න කියලා?

පි: එහෙමයි.

ප්‍ර: එහෙම තමා පළවෙනි පාරට ගෙදරින් කිව්වේ එතකොට ඔබලා නැවත ඒ නිවසට යනකම් ඒ දුන්නු දුරකථන අංකයට ඒ ජමිල්ගේ ගෙදරින් දුරකථන ඇමතුමක් ලැබුනාද නැද්ද?

පි: ලබා දීලා තිබුන් නෑ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර; ඒ අනුව දැන් අර දුරකථන ඇමතුම ලබා දෙන්නට යෙදුනු පුද්ගලයා සමඟ ඔබලා සම්බන්ධ වුනාද දුරකථනයෙන්?

පි: සම්බන්ධ වුනා.

ප්‍ර: ඒ දුරකථන ඇමතුම ජමිල්ගේ බිරිඳගේ පියාගේ නිවසින් ලබා ගත්තේ කවුද?

පි: මට ඒ ගැන හරියටම මතකයක් නෑ කවුද ගත්තේ කියලා ඒ ගොල්ලන්ගේ ගෙදර නිවසේ හිටපු එක්කෙනෙක්ගෙන් ෆෝන් එකෙන් තමයි ගත්තේ.

ප්‍ර: ඒ අරගෙන අරගත්තාට පසුව ඒ දුරකථනයෙන් ඒහා පැත්තෙන් සම්බන්ධවෙලා ඉන්න පුද්ගලයත් එක්ක කවුද කතා කරේ?

පි: මම කතා කරේ.

ප්‍ර: ඒ ඔබට දැනුම් දුන්නාද එහා පැත්තේ කථා කරන පුද්ගලයාගේ නම?

පි: ඔව් නමක් කිව්වා.

ප්‍ර: නම මතකද?

පි: මුස්ලිම් පුද්ගලයෙක් කියලා මතකයි නම මතක නෑ.

****

President Secretary's Copy
FAIR COMMENT — BY JEZEEM —

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඔබෙන් තව එක් පැහැදිලි කර ගැනිමක් අවශ්‍යයි. ඔබ ඉස්සෙල්ලා ජමිල්ගේ ගෙදරට ගියාම ඒ ගෙදර අය කිව්වේ ජමිල් ආගමික කටයුත්තක් සඳහා එදාට ඉස්සෙල්ලා දවස් තුනකට ඉස්සල්ලා පිටත් වුනා කියලා. ආගමික කටයුත්තක් සඳහා පිටත් වුනායි කියලා ?

පි; දවස් තුනක ආගමික කටයුත්තක් සඳහා දවස් දෙකකට කලින් පිටත් වුනා කියලා සිකුරාදා.

ප්‍ර: ආගමික කටයුත්තක් සඳහා දවස් දෙකකට කලින් පිටත් වුනා කියලා?

පි: පිටත් වුනා කියලා.

ප්‍ර: ඔබ දෙවනි පාරට ඒ ගෙදරට ගියාම මේ ජමිල් කතා කෙරුවා කිව්වාම පස්සේ ඔවුන් කිව්වා කියලා තිබ්බා අර වැල්ලවත්තේ ඉදලා කතා කරපු තැනැත්තාට ගෙදරින් තරහ වෙලා ගිහිල්ලා කියලා.

පි: ඔව්

ප්‍ර: එතකොට ඔබට ඒ තොරතුරු දෙක මත ඒ නිවැසියන් සම්බන්ධයෙන් යම් කිසි සැකයක් ඇති වුනාද?

පි; නෑ අතන ආගමික කටයුත්තකට ගියා කියන එක ගැන අපි විශ්වාස කරා මොකද හැමවේලේම හැම සතියේම එයා යනවා කියලා කිව්වා. ඊට පස්සේ ඇවිල්ලා කිව්වාට පස්සේ ගෙදරින් තරහවෙලා ගිහිල්ලා කියලා කියලා තිබුනේ මේ මේයාගේ ක්‍රියාකලාපයට බිරිඳ අකමැති හින්දා ඒ හරහා තරහා වෙලා ගියා කියලා තමයි කිව්වේ. අරයාට කියලා තිබුණේ තරහා වෙලා ගියා කියලා අපිටත් ඊට පස්සේ කිව්වා එච්චර හිත හොදින් නෙමේ එයත් එක්ක හිටියේ කියලා.

ප්‍ර; හැබැයි හිත හොදින් හිටපු නැති කතාවක් ඔබට පළවෙනි වතාවේ කිව්වේ නෑ?

පි: කිව්වේ නෑ අපි බිරිඳට කථා කරේ නැනේ ස්වාමිනි.

ප්‍ර: ඒ වුනාට අර බිරිඳගේ පියා වුණත් කිව්වේ නැනේ?

පි: කිව්වේ නෑ.

ප්‍ර: අර හිත හොදින් නෙමේ කියන කථාව ඉස්සෙල්ලාම ආවේ අර ජමිල් ගැන සැකයක් ඇතිවෙලා වැල්ලවත්තෙන් ආපු දුරකථන ඇමතුමට පිළිතුරක් වශයෙන් එතකොට ඔබට ඒ පදනම මත ඔබට යම් සැකයක් ඇති වුනේ නැද්ද මේ නිවැසියන් සම්බන්ධව?

පි: ඒ බිරිඳ මේ ජමිල්ගේ ක්‍රියාකලාපයකලාපයට අකමැතියි කියන එක ගැනත් අපිට තොරතුරු තිබුනා ස්වාමිනි.

****

FAIR COMMENT
BY JEZEEM

<u>**ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සංජීව දිසානායක මහතා**</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ අර දුරකථනයෙන් සම්බන්ධ වුනා කියා සිටියා පුද්ගලයෙක් සමඟ ඔහුගේ නම අමීර් කියලා මම මේ අවස්ථාවේදී කිව්වොත් ඔබට මතකයක් තියෙනවාද?

පි: ඒ වගේ නමක්.

ප්‍ර; ඒ පුද්ගලයා සමඟ ඔබ කතා කල බව කියා සිටියා ඔහු සමඟ ඔබ මොකක්ද විමසා සිටියේ ඔහුගෙන්?

පි; ඒ කොහොමද ජමිල් මුන ගැහුනේ මොකක්ද එතන සිද්ධ වුනේ කියන තොරතුරු තමයි මං ලබා ගත්තේ.

ප්‍ර: ඔබ විමසා සිටියේ නැද්ද එම පුද්ගලයාගෙන් ජමිල් එම අවස්ථාවේ ඔහු සමඟ සිටිනවාද නැද්ද කියලා?

පි: විමසා සිටියා.

ප්‍ර: මොකක්ද ඔබට දැනගන්නට ලැබුනේ?

පි: ඔහු ත්‍රීවිල් රථයකට නැගලා Marine Drive එකේ දිගේ දෙහිවල පැත්තට ගියා කියලා තමයි කිව්වේ.

ප්‍ර: ඔබ ඉල්ලා සිටියේ නැද්ද එම තැනැත්තාගෙන් ජමිල් ඒ ආසන්නයේ සිටිනවා ද නැද්ද කියලා විපරම් කරලා පරීක්ෂා කර බලලා කියන්න කියලා?

පි: නැගලා ගියා කියලා කිව්වාට පස්සේ මම එහෙම කිව්වේ නෑ.

ප්‍ර: දැන් ඔබ ඒ තැනැත්තට කියා සිටියාද දැන් ඔබ හෙළිදරව් කරාද එම තැනැත්තාට ඔබ ආරක්ෂක අමාත්‍යාංශයේ පුද්ගලයකු බව ?

පි; හෙලි දරව් කරා.

ප්‍ර; ඒ පුද්ගලයාට ඔබ කියා සිටියාද ඇයි ඔබ ජමිල්ව සොයන්නේ කියන එක ?

පි: ඒ සම්බන්ධව මුකුත් ප්‍රකාශ කරේ නෑ.

ප්‍ර; ඇයි ඔබ ඒ දුරකථනයෙන් එහා පැත්තෙන් සම්බන්ධ වූ පුද්ගලයාට ජමිල්ව සොයන කාරණය ප්‍රකාශ නොකරේ?

පි: ඒක වැදගත් කියලා මං හිතුවේ නෑ ඔය කාරණය කියන්න නමුත් මේ තියෙන වතාවරණය අනුව යම් පුද්ගලයෙක් මේ සැකකටයුතු විදියට හැසිරුණා නම් ඒයා ගැන දැනගන්න ඕන කියන එක තමයි කිව්වේ.

ප්‍ර: ඔබ කියා සිටියා ද ඇයි ඔබ ඔහුව සොයන්නේ සොයා කාරණය සොයා සිටියේ නෑ?

පි; නෑ. මේකට සම්බන්ධයි කියලා කිව්වේ නෑ.

ප්‍ර; මේකට කියන්නේ .

පි: මේ ප්‍රහාරයට සම්බන්ධ හින්දා හොයනවා කියලා ප්‍රකාශ කරේ නෑ.

ප්‍ර; ඔව් ?

Registrar General's Copy
FAIR COMMENT
BY JEZEEM

පි: නමුත් මේ තියෙන වාතාවරණය අනුව සැකකටයුතු එක්කෙනෙක් ඉන්නවානම් ඒයා ගැන හොයන්න ඕනේ ඒ හින්දයි ඒකයි කතා කරන්නේ කියලා කිව්වා.

ප්‍ර: එහිදි ඔහු අමීර් කියන ඒ කියන්නේ දුරකථන ඔබ සමඟ සම්බන්ධ වුනු පුද්ගලයා මොකක්ද ප්‍රකාශ කර සිටියේ?

පි: ඔහු උත්සහ කරලා තිබුණා ඒ ජමිල්ව ගෙරදට ගෙනල්ලා ඇරලවන්න. දැන් තියෙන වාතාවරණය හොඳ නෑ ඔය මෙහෙම එහේ මෙහේ සැරිසරන එක හොඳ නැති හින්දා මංම ගෙදරට ගිහින් අරින්නම් කියන ඉල්ලිම එයා කරලා තිබුනා.ජමිල් එයාට කියලා තිබුනා මේ එහෙම අවශ්‍ය නෑ මට යන්න පුළුවන් ත්‍රිවිල් එකක් තියෙනවා කියලා තමයි ත්‍රිවිල් එකට නැගලා ගිහිල්ලා තිබුනේ.

ප්‍ර; දැන් සාක්ෂිකරු ඔබට මේ දුරකථනයෙන් සම්බන්ධ වෙච්ච පුද්ගලයා කියා සිටියාද ජමිල්ව ඔහුට මුණ ගැසුනේ කොහොම ද කියලා?

පි: ඔව් එතන එයා ආවාට පස්සේ එළියේ හිටපු පිරිසක් එක්ක මොනවා හරි කලහාකාරි විදියට හැසිරිලා තිබුනා ඒක විසඳන්න ගිහිල්ලා තමයි මුන ගැහිලා තිබුණේ.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

කොමිෂන් සභාවේ කටයුතු විනාඩි 10 කට අත්හිටවනවා.

දැන් වේලාව ප.ව.6.20

****

කෙටි විවේකයකින් පසුව නැවත කොමිෂන් සභාව ආරම්භ කරයි.

දැන් වේලාව:ප.ව.6.50

සාක්ෂිකරු නැවත ප්‍රතිඥා දී කැඳවයි.

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: මෙම දුරකථන ඒ කථාව සිද්ධිය වූ නිශ්චිත ස්ථානය ඔබටඒ අමීර් කියන තැනැත්තා දන්වා සිටියාද ඒ වෙලාවේ දෙහිවලද වැල්ලවත්තේද ගල්කිස්ස ද කොහේද කියලා?

පි: මට තේරුන් නෑ ප්‍රශ්නය.

ප්‍ර: දැන් අමීර් කියන පුද්ගලයාට ජමිල් මුන ගැහිලා මේ යම් සිද්ධියක් ගැන ඔබ කියා සිටියානේ ඒ සිද්ධිය වෙලා තිබ්බේ මොන ප්‍රදේශයේ ද කියලා අමීර් කිව්වාද?

පි; වැල්ලවත්ත පල්ලිය .

ප්‍ර: වැල්ල වත්ත ද දෙහිවල ද?

FAIR COMMENT — BY JEZEEM —

පි: වැල්ලවත්ත පල්ලිය.

ප්‍ර; දැන් සාක්ෂිකරු ජමිල් මෙම ස්ථානයෙන් පිටත්වෙලා ගියා කියලා ඔබට දැන්නුවාට පස්සේ ඒ දුරකථන සම්බන්ධතාවය විසන්ධි කරාද?

පි: ඔව් විසන්ධි කරා.

ප්‍ර: ඒ පුද්ගලයාගේ දුරකථන අංකය ඔබ හෝ ඔබ සමඟ ගිය වෙන යම් හෝ නිලධාරියෙක් ලබා ගන්නට යෙදුනාද?

පි: ලබා ගත්තා.

ප්‍ර: ඒ කියන්නේ ජමීල්ව මුණ ගැසුන පුද්ගලයාද?

පි; ඔව්.

ප්‍ර: ඒ පුද්ගලයාට ඔබ කොයි වෙලාවකවත් කියා සිටියාද මේ ජමීල් මෙම බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ විය හැකි පුද්ගලයෙක් සහ ඔහු ඉතා අත්‍යවශ්‍ය පුද්ගලයෙක් කාරණය දන්වා සිටියාද ?

පි: මට මතක හැටියට මං කියා සිටියේ නෑ.

ප්‍ර: ඒකට හේතුවක් තිබ්බාද?

පි: මම හිතුවේ ඒක එයාට අදාල නැති එකක් කියලා.

ප්‍ර; ඉන්පසුව ඔබ එම නිවසින් පිටත්ව ආවාද?

පි: පිටත් වෙන්න කලින් නැවතත් සමහර ප්‍රශ්න ඇති වෙච්ච වෙලාවේ අරයාගේ මාත් එක්ක ගිය සොල්දාදුවාගේ ෆෝන් එක මට මතකයි සමහරක් වෙලාවට අපි කතා කරලා එයාගෙන් මගහැරිච්ච ප්‍රශ්න මොනවාහරි තියෙනවානම් මං එයාට කිව්වා අහන්න කියලා ඒවා අහලා එයා කිව්වා.

ප්‍ර; දැන් මේ තොරතුර අනාවරණය වුනාට පසුව ඔබලා මෙම නිවසින් පිටත්ව ආවාද?

පි: පිටත්ව ආවා.

ප්‍ර; සාක්ෂිකරුට කීමට හැකියාවක් තියෙනවාද ජමිල්ගේ බිරිඳගේ පියාගේ නිවසට ගිහිල්ලා මේ අමීර් කියන පුද්ගලයාත් එක්ක දුරකථනයෙන් සම්බන්ධ වෙනකොට වේලාව කීයට විතර වගේ ඇද්ද?

පි: වේලාව ගැන ප්‍රශ්නයක් තියෙනවා ස්වාමිනි එදා අපි අපේ රාජකාරියට ප්‍රමුකතාවයක් දුන්නා මිසක් වේලාව ගැන එච්චර අවබෝධයක් තිබුන් නෑ අපිට.

ප්‍ර: වේලාව ගැන ප්‍රශ්නයක් කියලා ඔබ කියන්නේ වේලාවේ ප්‍රශ්නයක්ද නැත්නම් වේලාව ගැන ඔබලාට අවබෝධයක් තිබ්බේ නැද්ද?

පි; වේලාව ගැන අවබෝධයක් අපි ගිය වෙලාව එහෙම අවබෝධයක් තිබුන් නෑ.

President Secretariat's Copy
FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: දැන් මේ ජමිල් ගේ මාමණ්ඩි ඒ කියන්නේ බිරිඳගේ පියාගේ නිවසින් පිටත්වෙලා ඔබලා නැවත ගියා ද අර හන්දියේ ඉන්න නිලධාරින් හමුවීමට?

පි: හමුවුනා.

ප්‍ර: ඒ හමුවෙලා ඔවුන් එම නිලධාරිවරුන්ට දන්නා සිටියාද මේ අනාවරණය වෙච්ච කරුණු මොනවාද කියලා?

පි; ඒ නිලධාරිනටත් දන්වා සිටියා මගේ අධ්‍යක්ෂකතුමාටත් දන්වා සිටියා.

ප්‍ර; දැන් අධ්‍යක්ෂක තුමාටත් දැන්වීමෙන් අනතුරුව ඔබලා තීරණය කරාද ජමිල්ව සොයා ගෙන යාමට?

පි: එවෙලේම මම අධ්‍යක්ෂකතුමාට යෝජනා කරේ ජමිල්ව හරියටම සොයාගන්න විස්තරයක් නැති හින්දා තොරතුරක් නැති හින්දා අපිට තොරතුරු තිබුනු ඉල්හාම් ගැන හොයලා බැලුවොත් හොඳයි කියලා.

ප්‍ර; මේ ඉල්හාම් කියන පුද්ගලයා ගැන ශ්‍රී ලංකා යුධ හමුදාවට යම් දැනුමක් තිබ්බාද?

පි; තොරතුරු තිබුණා.

ප්‍ර: ඔහු සම්බන්ධයෙන් මොනවගේ තොරතුරක් ද තිබ්බේ?

පි: ඔහු සහ ජමිල් කියන පුද්ගලයන් දෙන්නාම අන්තවාදී මත දරණ පුද්ගලයන් විදියට.

ප්‍ර: ඒ පුද්ගලයෝ දෙදෙනා ගැන දැන් ඉල්හාම් ඒ ඉල්හාම් කියන තැනැත්තා කොහේද පදිංචි වෙලා ඉන්නේ කියලා ඔබ හෝ ඔබ සමඟ ගිය අනෙකුත් නිලධාරින් කණ්ඩායම සාමාජිකයෙකු හෝ දැනගෙන සිටියාද නැද්ද?

පි; දළ වශයෙන් ප්‍රදේශය මං දැන ගෙන හිටියා.ක්ෂේත්‍ර රාජකාරියේ හිටපු අය හරියටම නිවසත් එක්කම දැනගෙන සිටියා.

ප්‍ර; මං අහන්නේ ඉල්හාම් ගැන ?

පි: ඉල්හාම්.

ප්‍ර: ඒ ඉල්හාම් කියන පුද්ගලයා ගේ සම්පූර්ණ නම මොකක්ද?

පි: මට මතක විදියට ඉල්හාම් අහමඩ්.මොහොමඩ් ඉල්හාම්.

ප්‍ර: මොහොමඩ් ඉබ්‍රාහිම් ඉල්හාම් මොහොමඩ් කිව්වොත් හරිද?

පි: හරි.

ප්‍ර; මොහොමඩ් ඉබ්‍රාහිම් ඉල්හාම් අහමඩ්

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: නැවත වාර්ථාවට පැහැදිලිකර ගැනීමක් වශයෙන් ඔබ ඉල්හාම් යනුවෙන් සඳහන් කරන තැනැත්තාගේ සම්පූර්ණ නම කියන්න පුළුවන්ද කොමිෂන් සභාවට ඔබ දන්නා පරිදි?

පි: ඉල්හාම් අහමඩ් කියන එක තමයි මට මතක තියෙන්නේ ස්වාමිනි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඉල්හාම් අහමඩ් කියන එක ?
පි: ඔව්.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර; දැන් මේ ඉල්හාම් කියන තැනැත්තා ඔබ කියා සිටියා ඔහුගේ පදිංචිය ගැන සාමාන්‍ය දැනිමක් තිබ්බා කියලාමොකද්ද ඔබට ඒ වෙන කොට තිබ්බ දැනීම?

පි: ඔහු දෙමටගොඩ ප්‍රදේශයේ පදිංචි වෙලා ඉන්නවා කියලා දන්නවා සමන්තා හෝල් එක ලඟ.

ප්‍ර: සමන්තා හෝල් එක ළඟ චිත්‍රපට හෝල් එක ළඟ දැන් වැල්ලම්පිටියේ ඉදලා දෙමටගොඩට එන එකද ලේසි පහසු නැත්නම් වැල්ලම්පිටියේ ඉදලා වැල්ලවත්තට යන එකද පහසු?

පි: වැල්ලම් පිටියේ ඉදලා දෙමටගොඩට යන එක.

ප්‍ර: දැන් ඔබ කියා සිටියා ඉල්හාම් සම්බන්ධයෙන් ඔහු ගැන සොයා බැලිම සුදුසුයි කියලා ඔබ යෝජනා කරා කියලා

පි: එහෙමයි .

ප්‍ර; ඔබ සමඟ ගමන් ගත් ඉහල නිලධාරිවරයාට ඔබ ඒ ගැන දැන්නුවාද ?

පි: දැන්නුවා.

ප්‍ර: ඉන්පසුව ඒ සම්බන්ධයෙන් ඔබගේ අධ්‍යක්ෂකතුමාත් දැනුවත් කරාද?

පි: දැනුවත් කරා.

ප්‍ර: ඒ දැනුවත් කරලා මොකක්ද ඔබලා ගත්ත ක්‍රියා මාර්ගය?

පි: අපි තීරණය කරා ඉල්හාම්ගේ ගෙදර ගිහින් බලන්න ඉල්හාම් නිවසේ ඉන්නවාද නැද්ද කියලා.

ප්‍ර; ඒ අනුව ඔබලා ඒ ඉල්හාම් කියන තැනැත්තාගේ නිවසට ගියාද?

පි: ගියා .

ප්‍ර; ඔබලාට හැකියාවක් ලැබුණාද ඒ ඉල්හාම් කියන තැනැත්තාගේ ඒ පදිංචි නිවසට ආසන්නයටම යාමට ?

පි: ඔව් අපි ඒ නිවසින් පිටත්වෙලා ඔරුගොඩ වත්ත හන්දියට එනකොට

ප්‍ර; ඒ නිවසින් කියන්නේ කාගේ නිවසින්ද?

පි: ජමිල්ගේ නිවසින්.

ප්‍ර: ලන්සියා වත්තේ ජමිල්ගේ නිවසින් පිටවෙලා ඔරුගොඩ වත්තට එනකොට?

පි: ඔරුගොඩ වත්තට එනකොට අපිට දැන ගන්න ලැබුණා බෝම්බයක් තව පිපිරිලා තියෙනවා කියලා මට හරියටම මතක නෑ දෙහිවල බෝම්බය ද දෙමටගොඩ බෝම්බයද කියලා තව බෝම්බයක් පිපුරුනා කියලා ආරංචියක් හම්බුනා.ඒකෙන් දෙකම

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

එක ළඟ වගේ විනාඩි 10 ,15 ක් අතර වගේ තමයි පණිවිඩ දෙකම හම්බුනේ.එතකොට දෙහිවල බෝම්බය පිපිරුනා කියන ආරංචිය හම්බුනාම අපි සැක කරා ඒ සමහර විට ජමිල් වෙන්න පුළුවන් කියලා . එතකොට සමන්තා එක ගාව බෝම්බයක් ගියා කියලා කිව්වා පස්සේ අපි ආපහු සැක කරා ඒක ඉල්හාම් වෙන්න පුළුවන් කියලා තමයි හිතාගෙන සමන්තා එක ගාවට ගියේ. නිවසට මායි මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියයි දෙන්නා වාහනයෙන් බැහැලා හන්දියෙන් පාලම ගාව බැහැලා පයින් ගියා නිවස ළඟට නිවස ඉදිරිපිටට දොරකඩට යන කොට තවත් බෝම්බයක් පිපිරුනා නිවස ඇතුලේ ඊට පස්සේ අපි එතනින් අයින් වුනා.

ප්‍ර; දැන් ඔබලා ඒ ඉල්හාම්ගේ නිවසට පයින් යනකොට වේලාව ගැන කිමට ඔබට හැකියාවක් තියෙනවාද?

පි: මතකයක් නෑ.

ප්‍ර: සාමන්‍යයෙන් දහවල් වෙලාවේද උදේ හවස් වෙලාවෙද වෙලාවේද කීමට හැකියාවක් තියෙනවාද?

පි: දහවල් වෙලාවේ.

ප්‍ර: ඔබට කීමට හැකියාවක් තියෙනවාද දවල් 12 පැය පහුවෙලාද?

පි: 13,පැයයි 14 පැයයි අතර වෙන්න පුළුවන්.

ප්‍ර: දැන් ඔය ඉල්හාම් පදිංචි නිවසට ඔබලා යන විට තවත් බෝම්බයක් පිපුරු බව කියා සිටියා ඉන් පසු ඔබලා ඒ ස්ථානයේ රැඳී සිටියාද නැත්නම් එතනින් පිටත් වුනාද?

පි; අපි සුළු වෙලාවක් එතන රැඳිලා හිටියා අපිට උවමනාව තිබුනා මොකද වුනේ කවුද ඒ බෝම්බය පුපුරව ගත්තේ කියන එක දැන ගන්න මට මතක හැටියට STF එකෙනුයි පොලිසියෙනුයි ඇවිල්ලා තිබ්බා එතැන්ට STF කීපදෙනෙක් ඇතුලේ ඉන්න කොට තමයි ඒ බෝම්බය මේවා කරලා තිබ්බේ ඒ එක්කම ඉල්හාම්ගේ පියාව අත්අඩංගුවට අරන් ගෙනියනවා අපි දැක්කා ඒවා ඔක්කෝම නිරීක්ෂණය කරලා ඊට පස්සේ තමයි අපි එතැනින් පිටත් වුනේ.

ප්‍ර; ඉන්පසු ඔබලා එම ස්ථානයෙන් පිටත් වෙලා කොහාටද ගියේ?

පි: අපිට උවමනාව තිබුනේ අර security officer ව හම්බවෙන්න .

ප්‍ර: ඔබලාට අවශ්‍යවෙලා තිබ්බා security officer ව හම්බවෙන්න ඇයි?

පි: තවදුරටත් විස්තර අහන්න මේ සම්බන්ධව ඒකට අපි ඇත්තටම security officerව හම්බෙන්න හිතන් හිටියේ බෝම්බ පිපිරෙන්න කලින් ඒ වුනාට අපි එයත් එක්ක කතා කරලා අපි security officer මුණ ගැහෙන්න යොදා ගත්ත හින්දා අපි ආපහු ගියා security officer හම්බෙන්න.

ප්‍ර: ඒ security officer හම්බෙන්න කොහේදීද හම්බුනේ හම්බුනාද?

FAIR COMMENT BY JEZEEM

පි: අපි හම්බුනා වැල්ලවත්ත පොලිසියේදී හම්බුනේ.

ප්‍ර; ඒ security officer හම්බවීම සඳහා සම්බන්ධවීමේදී ඔබලා දුරකථන ඇමතුම් ලබා ගත්තාද?

පි: ලබාගත්තා.

ප්‍ර: ඒ දුරකථන ඇමතුම් ලබා ගත්තේ ඔබ ද නැත්නම් ඔබ සමඟ ගියපු වෙනත් නිලධාරියෙක් ද?

පි: මමත් එක්ක ගිය සොල්දාදුවෙක්.

ප්‍ර: ඒ අවස්ථාවේදී ඔබලා එක් දුරකථන ඇමතුමක්ද ලබා ගත්තේ දුරකථන ඇමතුම් කීපයක් ලබා ගත්තාද කියලා ඔබට දැනීමක් තියෙනවාද?

පි: අපී කීපයක් ලබා ගත්තා.

ප්‍ර: ඒ දුරකථන ඇමතුම් ලබා ගත්තේ ඔය දහවල් කාලයේම නැත්නම් හවස් වෙන්නද එහෙම නැත්නම් වෙනත් දවසකද?

පි: එදිනම.

ප්‍ර: ඒ අනුව ඒ අමීර් කියන ආරක්ෂක නිලධාරියා ඔබ කියා සිටියේ ඔබලාට මුණ ගැසුනාද?

පි: මුන ගැසුනා.

ප්‍ර; ඒ මුන ගැසිම සඳහා ඔබගේ ඔබ කියා සිටියා ජ්‍යෙෂ්ඨ නිලධාරිවරයෙක් සිටි බවඔහුත් ගියාද?

පි: ඔහුත් පැමිණියා.

ප්‍ර ඉන් අනතුරුව ඔබ මේ අමීර්ව මුණ ගැසිලා ඔහුත් සමඟ ඔබලා මොකක්දකරේ?

පි: අපි ඔහු ගාව තිබ්බ විස්තර ඔක්කෝම ලබා ගත්තා.ඔහු ගාව තිබුනා ජමිල් ගැන තිබුණු විස්තර ඔක්කෝම අරගෙන එතකොට අපිට දැනගන්න ලැබුනා එයා ඇවිල්ලා අපේ හමුදාවේ ඉදලා විශ්‍රාම ගිය ජනරල් කෙනෙක්ගේ security firm එකක තමයි වැඩ කරන්නේ කියලා එයා. ඊට පස්සේ එතන ඉදන් අපි ඒ ජනරාල් තුමාට කතා කරා කතා කරලා මෙයාගේ උපරිම සහයෝගය ලබා ගන්න හිතාගෙන තමයි අපි එහෙම කරේ ඒත් එයා මේ කිසි දෙයක් හංගන්නැතිව හැමදේම අපිට කිව්වා. කිව්වාට පස්සේ අපි එතනින් එයාගෙන් විස්තර අරගෙන ගියා කෙලින්ම Tropical Innඑකට.

ප්‍ර; Tropical Innඑකට ගිහිල්ලා ඒ ස්ථානය පරීක්ෂාවට ලක් කරාද?

පි: ඒ වෙනකොටත් ඒ බෝම්බය පුපුරුවාගෙන තිබුනේ ජමිල් කියන එක අනාවරණය වෙලා තිබුන් නෑ සමහර විට පොලීසියට අනවරණය වෙලා තියෙන්න ඇති අපිට අනාවරණය වෙලා තිබුන් නෑ. අපිට ඕන වෙලා තිබුණේ කවුද ඒ බෝම්බය පුපුරවා ගත්තේ කියන එක දැනගන්න.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර; එතැන්ට ගියාට පසු දැනගන්න ලැබුනාද කවුද බෝම්බය පුපුරාගෙන තියෙන්නේ කියලා?

පි; එතන අයිඩින්ටි කාඩ් එකක් තිබුණා Reception එකේ තිබුණා අයිඩින්ටි කාඩ් එකක් ඒක හරහා අපි තහවුරු කර ගත්තා ඒ ජමිල් කියලා.

ප්‍ර; දැන් සාක්ෂිකරු ඔබ ඒ ජමිල්ගේ ජාතික හැඳුනුම්පත Tropical Innඑකට ගියාට අවස්ථාවේදී පරීක්ෂා කරලා බැලුවද?

පි: මම දැක්කේ නෑ.

ප්‍ර: දැන් 2019.4.21 වන විට ඔබ කියා සිටියා ඔබලාට දැනිමක් තිබ්බා කියලා ජමිල් මොහොමඩ් සහ ඉල්හාම් අහමඩ් සම්බන්ධයෙන් ජමීල් මොහොමඩ් සම්බන්ධයෙන් ඔබලාට තොරතුරු තිබ්බේ මොන කරුණක් සම්බන්ධයෙන්ද?

පි: ස්වාමිනි අපිට තොරතුරු තිබුණා ජමාතේ ඉමාතේ ඉබ්‍රාහිම් සේලානි කියලා සංවිධානයක් ගැන ඒ සංවිධානය තමයි ජමීල් මොහොමඩ්, ඉල්හාම් මේ හැමෝම හිටියේ ඒ එක්කම තව කීපදෙනෙක් හිටියේ.මේ සංවිධානය කාලයක් යන කොට දෙකඩ වුනා දෙකඩ වුනේ එක කොටියාශයක් කිව්වා අන්තවාදි ක්‍රියා කටයුතු ලංකාව තුල ව්‍යාප්ත කරන්න ඕනේ කියලා අනෙක් කොටියාශය කිව්වා ලංකාව තුල නෙමේ අපි ලංකාවෙන් පිට ගිහිල්ලා හිජ්ජා කරලා ආගම වෙනුවෙන් දිවි පුදන්න ඕනේ කියලා එතකොට ඒ ආගම වෙනුවෙන් දිවි පුදන්න ඕනේ කියපු කට්ටිය අතරේ අපි දැක්කේ නෑ ලොකු අන්තවාදි ක්‍රියාකාරකම් නමුත් ජමිල් ගැනයි ඉල්හාම් ගැනයි අපිට සැකයක් තිබුණා නමුත් අපිට ඔවුන් හබා යන්න මාර්ගයක් තිබුණේ නෑ.ඔවුන් ඉතා රහසිගතව තමයි මේ ගොල්ලන්ගේ ඒ වැඩකටයුතු කරගෙන ගියේ ඒ හින්දාම තමයි මේ බෝම්බ පුපුරන ගමන් අපි ඉස්සෙල්ලාම ජමිල්වයි ඉල්හාම්වයි හොයන්න තිරණය කලේ.

ප්‍ර: ඔබලාට තොරතුරක් තිබ්බා ද මේ ජමිල් හා ඉල්හාම් බෝම්බ පුපුරවාගෙන ආගම වෙනුවෙන් මරාගෙන මැරෙන ක්‍රියාදාමයකට යා හැකි බවට?

පි: එහෙම තොරතුරු තිබුණේ නෑ.

ප්‍ර: මොකක්ද එහෙනම් තිබ්බ තොරතුර?

පි: ඒ ගොල්ලන්ගේ අදහස් තිබුණේ අන්තවාදි ක්‍රියාකාරකම් කරන්න ඕනේ කියන එක ගැන විතරයි නමුත් කොහොමද කරන්නේ කොයි වගේද ඒ දේවල් කරන්නේ කියන එක ගැන අපිට තොරතුරු තිබුන් නෑ.

ප්‍ර: ඒ වගේම ඔබට සහය වෙච්ච නිලධාරිවරයකු මේ 2019.04.21 ජමිල් හා ඉල්හාම් සම්බන්ධයෙන් තොරතුරු සැපයීමට සහය වෙච්ච

FAIR COMMENT — BY JEZEEM —

නිලධාරිවරයෙකුත් අද ඇවිල්ලා ඉන්නවා ද ඔබත් එක්ක සාක්ෂි දෙන්න?

පි: ඇවිල්ලා ඉන්නවා.

ප්‍ර: මා ඔබට යෝජනා කරොත් ඔබ මේ අමීර් කියන පුද්ගලයා සමඟ අමීර් ඔය 2019.04.21 ජමිල් මොහොමඩ්ගේ පියාගේ නිවසේදී කතා කරා කිව්වානේ දුරකථනයෙන් ?

පි: ඔව්.

ප්‍ර: ඒ දුරකථන සංවාදය පැවැත්වුයේ ඔබද ?

පි: මමත් පැවැත්වුවා මාත් එක්ක ගිය අනෙක් සොල්දාදුවාත් පැවැත්වුවා.

ප්‍ර: ඒ දුරකථන සංවාදය නිශ්චිතව අවශ්‍ය දළ වශයෙන් විනාඩි හෝ තප්පර කොච්චර වගේ තිබුණාද කියලා මතකයක් තියෙනවාද?

පි: පළවෙනි පාර මං ඒ ගෙදර එක්කෙනෙක්ගේ ෆෝන් එකෙන් ගත්ත සංවාදය එච්චර මට මතක විදියට ස්වාමිනි එච්චර ලොකු සංවාදයක් නෙමේ ඊට පස්සේ අපේ සොල්දාදු හරහා ගත්ත ටෙලිෆෝන් කෝල් එක පොඩි කොහොමත් විනාඩි තුනක් 4 ක් විතර කතා කරන්න ඇති clarification වලට .

ප්‍ර: ඒ නිවසින් ඒ දුරකතන ඇමතුම මේ ගත්තු ඒ අමීර් කියන පුද්ගලයාට ඒ දුරකථන ඇමතුම 2019.04.21 පැය 13 .32 ට පමණ ලබාගෙන තියන බවට මා ඔබට යෝජනා කරොත් හරිද වැරදීද?

පි: මං කලින් කිව්වා වගේ පැය.13.14 පැයත් අතර තමයි ගොඩාක් දේවල් සිද්ධ වුනේ.

ප්‍ර: එය තප්පර 92 ක පමණ දුරකථන ඇමතුමක් කියලා වියහැකිතාවය තිබුණා කිව්වොත් තප්පර 92 ක පමණ දුරකථන ඇමතුමක් කිව්වොත් හරිද වැරදීද?

පි: හරි.

****

<u>**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**</u>

ප්‍ර: ඔබ සඳහන් කරන්නේ පළවෙනි දුරකථන ඇමතුමද ?සාක්ෂිකරු ඔබ දැනට සේවයේ යෙදි සිටින අංශයේ කවදා ඉදලා සේවයේ යෙදි සිටිනවාද?

පි: මා විසිර ගියායින් පස්සේ ඉදලා 2002 ජනවාරි ඉදලා සේවය කරනවා.

ප්‍ර: 2002 ජනවාරියේ ඉදලා දැන් වෙනකම් ඒ අංශයේමයි සේවය කරන්නේ මේ කාලය තුල ලංකාවේ ආගමික අන්තවාදය මං ඉස්ලාම් අන්තවාදය ගැන නෙමේ කියන්නේ මං අහන්නේ ආගමික අන්තවාදය සම්බන්ධයෙන් ඔබේ අශංයට ඉස්සෙල්ලාම තොරතුරු ලබෙන්නේ කොයි කාලයේද?

FAIR COMMENT BY JEZEEM

පි: මම අධ්‍යක්ෂක මණ්ඩලයට ගියාට පස්සේ තමයි වැඩිපුර තොරතුරු ඒ සම්බන්ධ මට තොරතුරු ලැබුණේ මම අධ්‍යක්ෂක මණ්ඩලයේ ස්වාමිනි අන්තවාදී ක්‍රියාකාරකම් පිළිබඳ Desk එක තමයි Handle කරේ ඒ හින්දා අපි ට මට මතක විදියට මුස්ලිම් අන්තවාදය පිළිබඳ තොරතුරු 2016 විතර ඉදලා ලැබෙන්න පටන් ගත්තා ඊට කලින් ඉදන් අනෙක් ආගම්වල අන්තවාදී කටයුතුවල තොරතුරු තිබුණා.

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියන හැටියට ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් ඔබගේ අංශයට තොරතුරු ලැබෙන්නේ 2016 ඉදලා?

පි: 2015 අන්තිම 2016 වගේ ඉදලා.

ප්‍ර: ඔබ කිව්වානේ තවත් ආගමික අන්තවාදයක් ගැන ඊට කලින් තොරතුරු ලැබුනා කියලා ඒ ඉස්සෙල්ලා ඒ මොන ආගම් අන්තවාදයක් ගැනද?

පි: ඒක හින්දු ආගමික අන්තවාදයක් ගැනත් තොරතුරු තිබුනා බෞද්ධාගමික අන්තාවාද කටයුතු ගැනත් තොරතුරු තිබුණා ස්වාමිනි.

ප්‍ර; බෞද්ධාගමික අන්තවාද කටයුතු සම්බන්ධයෙන් ඔබගේ අංශයට ඉස්සෙල්ලාම තොරතුරු ලැබෙන්නේ කොයිකාලයේද?

පි: මට එහෙම හරියටම මතකයක් නෑ ස්වාමිනි.

ප්‍ර: මෙහෙම ඇහුවොත් යුද්ධය නිමාවෙන්න පෙර බෞද්ධාගමික අන්තවාදය සම්බන්ධයෙන් තොරතුරු ඔබේ අංශයට ලැබුනාද?

පි: මම ඒ කටයුතු සම්බන්ධව මම යෙදිලා හිටියේ නෑ.

ප්‍ර: හින්දු ආගමික අන්තවාදය සම්බන්ධයෙන් තොරතුරු කවද්ද ලැබුනේ?

පි: ඒ ගැන තොරතුරු මම දන්නේ කාලේ ඉදන් තිබුණා ස්වාමිනි LTTE ප්‍රශ්නයත් එක්කම යම් යම් පුද්ගලයන් යෙදිලා හිටපු ගැන තොරතුරු තිබුණා අපි ක්ෂේත්‍ර රාජකාරිවල යෙදිලා ඉන්න කාලයේ ඉදන්ම.

ප්‍ර: පැහැදිලි කිරීමක් වශයෙන් අහන්නේ හින්දු අන්තාවදය කියලා ඔබ හඳුන්වන්නේත් LTTE ක්‍රියාකාරකම් ද නැත්නම් ඊට වෙනස් එකක්ද ?

පි: ඊට වඩා දේශපාලනමය ක්‍රියාකාරකම් වගේ තිබුණේ .

ප්‍ර: දේශපාලන ක්‍රියාකාරකම් ඒ කියන්නේ හින්දු ආගමික අන්තවාදිය සම්බන්ධයෙන් වෙනම?

පි: වෙනම.

ප්‍ර; ඔබට ඒ හින්දු ආගමික අන්තවාදය සම්බන්ධයෙන් කාලසීමාවක් දෙන්න පුළුවන්ද තොරතුරු ලැබන්නේ කොයිකාලේද කියලා?

පි: මම මේ අංශයට බැඳුනු දවස්වල ඉදලා මට ඒ වගේ තොරතුරු දැන ගන්න ලැබිලා තියෙනවා.

ප්‍ර: ඒ කියෙන්නේ 2002 ඉදලා ඒ තොරතුරු තිබ්බා ඔබේ අංශයේ?

පි: තිබ්බා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර; බෞද්ධාගමික අන්තවාදය සම්බන්ධයෙන් තොරතුරු ඔබේ අංශයට ලැබෙන්නේ මුස්ලිම් ආගමික අන්තවාදය සම්බන්ධයෙන් තොරතුරු ලැබෙන කාල සිමාවේද නැත්නම් ඊට ඉස්සෙල්ලාද නැත්නම් ඊට පස්සේද?

පි: ඊට ප්‍රථම.

ප්‍ර: ඔබ කිව්වා මුස්ලිම් අන්තවාදය සම්බන්ධයෙන් ඔබට තොරතුරු ලැබෙන්නේ 2015 අවසානයේ ඉදලා බව ඊට කොපමණ කාලයකට පෙර ද ඔබ කියන හැටියට බෞද්ධාගමික අන්තවාදය ගැන ඔබගේ අංශයට තොරතුරු ලැබෙන්නේ?

පි: මම ඔය අංශය භාර ගත්තේ 2015 හෝ 2016 මුල ස්වාමිනි එතකම් මට ඒ මේ තොරතුරු පරිහරණය කරේ නෑ ඒ හින්දා මට ඒ ගැන හරියටම කියන්න බෑ මේ කාලයේ තමයි හම්බුනේ කියලා.

ප්‍ර; නමුත් ඔබ ඒ අංශය භාරගත් පසු ඒවා කියවන්න ඇතිනේ ?

පි: ඔව්.

ප්‍ර; ඒ වාර්ථා ඇතිනේ නේද ඔබගේ අංශයේ ලිඛිත වාර්තා තියෙනවානේ?

පි; තියෙනවා.

ප්‍ර; මතකයේ හැටියට එතකොට බෞද්ධාගමික අන්තවාදය සම්බන්ධව කවද්ද ලැබුණේ කියලා කියන්න පුළුවන්ද ?

පි: නිශ්චිත කාලයක් කියන්න බැහැ.

ප්‍ර: ඔබගේ අංශයට ලැබිලා තියෙන ඒ තොරතුරුවලට අනුව බෞද්ධාගමික අන්තවාදය සම්බන්ධ කටයුතු කරන යම් සංවිධානයට නැත්නම් පුද්ගලයින්ගේ නම් තමයි ලැබිලා තියෙනවාද?

පි: එහෙම ලැබිලා තිබුණා.

ප්‍ර; කියන්න ඒ කවුද කියලා?

පි: අපිට ඒ වෙනකොට බොදුබල සේනාවට ගැන තමයි ගොඩක් තොරතුරු තිබුණේ එහෙම අන්තවාදි කටයුතු වල යෙදෙනවා කියලා.

ප්‍ර: සංවිධානයක් වශයෙන් බොදු බල සේනාව එතකොට පුද්ගලයින් වශයෙන් කවුද?

පි: පුද්ගලයින් කීපදෙනෙක්ගේම එහෙම ඒ සංවිධානය සම්බන්ධව පුද්ගලයන්ගේ නම් තිබුණේ .

ප්‍ර: බොදු බල සේනාව සම්බන්ධ පුද්ගලයින් ගැන?

පි: ඇත්තටම ස්වාමිනි මම ඔය අංශය භාර ගත්තේ මුස්ලිම් අන්තවාදය ගැන තොරතුරු ලැබුනාට පස්සේ. ඒ කියන්නේ මගේ භාෂාව හැසිරිවිමේ හැකියාවයි, අනෙක් අයවලුන් එක්ක කතා කරන්න පුළුවන් හැකියාවයි හින්දා තමයි මේ භාර ගත්තේ.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර; එතකොට ඔය හින්දු අන්තවාදය සම්බන්ධයෙන් යම් කිසි කණ්ඩායම් හෝ පුද්ගලයින්ගේ නම් ඔබගේ අංශයට ලැබුණාද?

පි: ඔව් ශිව සේනා සංවිධානය ගැන තොරතුරු ලැබුණා.

ප්‍ර: එතකොට පුද්ගලයින්ගේ නම් ලැබුණාද?

පි: සංවිධානයට සම්බන්ධ පුද්ගලයින්ගේ නම් ලැබුණා.

ප්‍ර; එතකොට ඔබ කියන දේ පැහැදිලි කර ගැනීමක් වශයෙන් මේ අහන්නේ ඔබගේ අංශයට බෞද්ධ අන්තවාදය සම්බන්ධයෙන් තොරතුරු ලැබුණා ඒ තොරතුරු ලැබුණේ බොදු බල සේනාව සම්බන්ධයෙන් සංවිධානයක් වශයෙන් පුද්ගලයින් වශයෙන් ඔබට නම් ලැබෙන්නේ ඒ බොදුබල සේනාවට සම්බන්ධ තැනැත්තන් සම්බන්ධයෙන් හරිද?

පි: හරි ස්වාමිනි.

ප්‍ර; හින්දු ආගමික අන්තවාදය සම්බන්ධයෙන් තොරතුරු ලැබිලා තියෙන්නේ ශිවසේනා සංවිධානය සම්බන්ධයෙන් පුද්ගලයින් වශයෙන් එම සංවිධානයට සම්බන්ධ තැනැත්තන් හරිද?

පි: හරි ස්වාමිනි.

ප්‍ර: දැන් 2015 අවසානයේ දී හෝ 2016 දී ඔබ කියන හැටියට ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් තොරතුරු ඔබේ අංශයට ලැබෙන විට ලැබෙන්නේ සංවිධානවල නම්ද පුද්ගලයින්ගේ නම්ද?

පි: සංවිධානවල නම් හා පුද්ගලයින්ගේ නම් දෙකම ලැබිලා තිබුණා.

ප්‍ර: අපිට කියන්න ඒ ලැබුණු සංවිධානවල නම් මොකක්ද කියලා?

පි: ජාතික තවුහිද් සංවිධානය ගැන තොරතුරු ලැබිලා තිබුණා. ඒ එක්කම ජමාතේ මිල්ලති ඉබ්‍රාහිම් සංවිධානය ගැන තොරතුරු ලැබිලා තිබුණා.

ප්‍ර: ජමාතේ?

පි: ජමාතේ මිල්ලති ඉබ්‍රාහිම් සංවිධානය JMI සංවිධානය.

ප්‍ර: සංවිධාන වශයෙන් ලැබුණ නම් දෙක විතරද?

පි; එච්චරයි.

ප්‍ර: නැත්නම් තව තියෙනවාද ඔබට අමතකද?

පි: මට මතක විදියට ඔය දෙක විතරයි.

ප්‍ර; ජමාතේ ඉස්ලාම් සංවිධානය සම්බන්ධයෙන්?

පි: ස්වාමිනි ඊට අමතරව ජතික තවුහිද් ජමාත් SLTJ කියලා ශ්‍රී ලංකා තවුහිද් සංවිධානය ගැනත් හම්බෙලා තිබුණා.

ප්‍ර: දැන් ඔබ කියන හැටියට SLTJ ශ්‍රී ලංකා තවුහිද් ජමාත් ගැන තොරතුරු ලැබුනා ජාතික තවුහිද් ජමාත් සංවිධානය ගැන තොරතුරු ලැබුනා ජමාතේ මිල්ලති ඉබ්‍රාහිම් සංවිධානය තුනක් ලැබිලා තියෙනවා මම ඔබට තව නමක් අහන්නේ ජමාතේ ඉස්ලාමිය සංවිධානය ගැන තොරතුරු ලැබිලා තිබ්බාද?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඒ සංවිධානය අන්තවාදී සංවිධානයක් ගැන කියලා එහෙම තොරතුරු තිබුන් නෑ

පි: මොන විදියේ සංවිධානයක් වශයෙන්ද ඔබට තොරතුරු ලැබිලා තිබුණේ ?

පි: ජමාතේ ඉස්ලාමිය මට මතක විදියට ස්වාමිනි විද්වතුන් එකතු වෙලා හදපු සංවිධානයක් කියලා තමයි තොරතුරු ලැබිලා තිබුණේ. නමුත් අපි ඒ සංවිධානය ගැනත් සොයලා බැලුවා.

දැන් වේලාව : 7.30

මෙතැන් සිට :ල/ලේ සවිනි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව: ප.ව. 7.30
පෙර සටහන්: චන්දිමා මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවියි.

<u>ගරු විනිසුරු සභාපති ජනක් ද සිල්වා මහතා.</u>

ප්‍ර: ඔබගේ ඒ පරීක්ෂණ වලදී අනාවරණය වුණේ නැද්ද ජමාතේ ඉස්ලාමී සංවිධානයේ ශිෂ්‍ය සංවිධානයේ ක්‍රියාකාරීන් තුර්කිය හරහා සිරියාවට වරින් වර ගියා කියලා?

උ: ඒ වන කොට අපිට අනාවරණය වෙලා තිබුණෙ නැහැ.

ප්‍ර: ඒ වෙන කොට සඳහන් වෙලා තිබ්බේ නැහැ. දැන් වෙන කොට ඒ තොරතුර අනාවරණය වෙලා තියෙනව ද?

උ: ඒකත් අපිට මේ ප්‍රහාරය එල්ල වුණාට පස්සේ වෙනත් අංශ වලින් තමයි අපිට තොරතුරු තිබුණේ. ඊට අමතරව අපිට තොරතුරු තිබුණෙ නැහැ ස්වාමිනි.

ප්‍ර: ජමාතේ ඉස්ලාමීය සංවිධානය ගැන මේ බෝම්බ ප්‍රහාරය සම්බන්ධ වෙනකම් ඔබට කිසිම තොරතුරක් ලැබිලා තිබුණෙ නැහැ?

උ: තිබුණෙ නැහැ.

ප්‍ර: දැන් මේ මං ඒ ඇහුවේ ඒ සංවිධාන ගැන. ජමාතේ මිල්ලති ඊබ්‍රාහිම් සංවිධානය ඔබට තියෙන තොරතුරු වලට අනුව කොයි කාලෙ ද ආරම්භ වුණේ? මොකද්ද ඔවුන්ගේ අන්තවාදී ක්‍රියාකාරකම්? ලංකාවේ කොයි ප්‍රදේශ වලද එම සංවිධානය බලවත්ව තියෙන්නේ?

උ: ඒ සංවිධානය ආරම්භ වන්නේ 2016 මුල වගේ මට මතක විදියට ස්වාමිනි. ඒ ගොල්ලන් සංවිධානය ආරම්භ කරන්නේ හිජ්‍රාත් කරන්න. Migration ඒක ගැන Study කරන්න තමයි ඒ සංවිධානය ආරම්භ කරන්නේ. ආරම්භ කරලා කාලයක් යන කොට යම් යම් ක්‍රියාකාරකම් සිද්ධ වෙනවා සමාජ ජාලා හරහා. ඒවා අපි Monitor කරා. නමුත් එතැන දී කිසිම අවස්ථාවකදී මේ ඒ ගොල්ලන් අන්තවාදී ක්‍රියාකාරකම් කරන්න කතා වුණේ නැහැ. මිනිස්සු Migration වලට යොමු කරන්න තමයි කතා වුණේ. හිජ්‍රත් කරන්න.

ප්‍ර: දැන් කොමිෂන් සභාවට පැහැදිලි කරන්න මොකද්ද හිජ්‍රත් කරන එකේ තේරුම?

උ: හිජ්‍රත් කියන්නේ මුස්ලිම් ආගම අනුව වෙනත් මුස්ලිම් දේශයකට ගිහිල්ලා මුස්ලිම් ආගම වෙනුවෙන් දිවිපිදීම.

ප්‍ර: ඉස්ලාම් ආගම වෙනුවෙන්?

උ: ඉස්ලාම්.

ප්‍ර: එතකොට ඒ විදියට හිජ්‍රත් කරන්න කියන සාකච්ඡා ඒ සංවිධානවල ඇති වෙන්නේ කොහේට යන්න කියල ද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: සිරියාවට.

ප්‍ර: සිරියාවට?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඔබගේ පරීක්ෂණ වලින් අනාවරණය වුණා ද ඇයි මේ තැනැත්තන් සිරියාව තෝරගෙන තියෙන්නේ කියලා?

උ: එවකට සිරියාවේ ඉස්ලාම් දේශයක් තිබුණ හින්දා ඒ වෙනුවෙන් සටන් කරපු හින්දා තමයි ඒ දේශය තෝර ගෙන තියෙන්නේ.

ප්‍ර: එතකොට ඒ දේශය සිරියාවේ ඇති වුණේ කවද්ද කියලා ඔබගේ පරීක්ෂණ වලින් අනාවරණය වෙලා තියෙනව ද?

උ: මට මතක විදියට 2015 වගේ තමයි පටන් ගත්තේ ස්වාමිනි.

ප්‍ර: ඒක ආරම්භ වුණේ යම් කැලිෆට් එකක් හින්ද ද?

උ: කැලිෆට් එකක්.

ප්‍ර: ඒ කැලිෆට් එක මේ ප්‍රසිද්ධ කෙරුවේ කවුද කියලා දන්නව ද?

උ: අබුබකර් අල්-බග්දාදි.

ප්‍ර: ඔහු තමා ISIS සංවිධානයේ නායකයා?

උ: නායකයා.

ප්‍ර: හිටපු නායකයා. දැන් ඒ විදියට හිජ්රත් කරන්න ලංකාවේ ඔය කියන ඔබ සංවිධාන 3 ක් කිව්වනේ, ඒ 3 න් මොකද්ද ඒ හිජ්රත් කරන එක ගැන එකේ සාකච්ඡා කරන සංවිධානය?

උ: ජමාතේ මිල්ලතී ඊබ්‍රාහිම් සංවිධානය විතරයි කතා කරලා තියෙන්නේ.

ප්‍ර: ජමාතේ මිල්ලතී ඊබ්‍රාහිම් සංවිධානය විතරයි ඒ විදියට හිජ්රත් එකක් ගැන තමන්ගේ අනුගාමිකයින්ව දැනුවත් කරලා යොමු කෙරුවේ?

උ: ඔව්.

ප්‍ර: ඒ විදියට ඒ කට්ටියව යොමු කරන්න ඔවුන් භාවිතා කරපු ක්‍රමවේද මොනවද?

උ: සමාජ මාධ්‍ය.

ප්‍ර: සමාජ මාධ්‍ය ජාල. එතකොට ඒ සමාජ මාධ්‍ය ජාලා ඔබගේ අංශය විසින් නිරීක්ෂණය කරලා ඒ කියන්නේ track කෙරුවද?

උ: යම්තාක් දුරට කරා. Technical support එක ගන්න පුළුවන් විදියට යම්තාක් දුරට නිරීක්ෂණ කටයුතු කරා.

ප්‍ර: කරලා ඒ විදියට ඒ සංවිධානයේ ඒ ක්‍රියාකාරකම් කරන පුද්ගලයින් හඳුනාගත්ත ද?

උ: හඳුනාගත්තා.

ප්‍ර: ඒ හඳුනාගත්ත පුද්ගලයින්ගේ ලැයිස්තුවක් ඔබගේ අංශයේ තියෙනව ද?

උ: තිබුණා.

ප්‍ර: ඒ ලැයිස්තුව කොයි වසරේ ඉඳල තියෙනව ද?

උ: 2016 වගේ ඉඳන් ඇති ස්වාමිනි. 2016 / 2017 වගේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: හරි. ඒ ලැයිස්තුව ඔබ අංශය විසින් වෙනත් ලංකාවේ තියෙන බුද්ධි අංශ නැත්නම් වෙනත් නීතිය ක්‍රියාත්මක කරන අංශ සමඟ බෙදාගෙන තියෙනව ද?

උ: තියෙනවා.

ප්‍ර: කාත් එක්ක ද බෙදාගෙන තියෙන්නේ?

උ: මට මතක විදියට ජාතික බුද්ධි සේවාවත් එකක් බෙදාගෙන තියෙනවා.

ප්‍ර: ජාතික බුද්ධි සේවාවත් සමඟ පමණ ද?

උ: මට මතක විදියට ජාතික බුද්ධි සේවාව.

ප්‍ර: ඒ ජාතික බුද්ධි සේවාව සමඟ ඒ තොරතුර බෙදා ගත්තේ එම ජාතික බුද්ධි සේවාවේ ඉන්න යම් කිසි නිලධාරියෙකුට ද ඒ ලැයිස්තුව සැපයුවේ?

උ: අපි ලිඛිතව නෙවෙයි. ඒ ලැයිස්තුව ගෙනිහිල්ලා ඒ මම නෙවෙයි ස්වාමිනි ඒකට සම්බන්ධ වුණේ. ගිහිල්ලා සාකච්ඡා කරලා තිබුණා ඉහළ නිලධාරීන්.

ප්‍ර: ඔව්. ඔබ දන්නව ද කවුද ගිහිල්ලා සාකච්ඡා කළේ , කාත් එක්ක ද කියලා?

උ: දන්නේ නැහැ.

ප්‍ර: ඒ තොරතුරු ඔබගේ අධ්‍යක්ෂකවරයා සතුව තියෙන්න ඕන ද?

උ: තියෙන්න ඕන.

ප්‍ර: තියෙන්න ඕන. හරි. එතකොට ඒ ජමාතේ මිල්ලතී ඊබ්‍රාහිම් සංවිධානයගැනනේ මං ඔබෙන් ඇහුවේ ප්‍රශ්න . ඔබ ඊළඟට කිව්වා ජාතික තවුහිද් ජමාත් සංවිධානයත් ආගමික ඉස්ලාම් අන්තවාදී සංවිධානයක් කියලා. ජාතික තවුහිද් ජමාත් සංවිධානය ඉස්ලාමීය අන්තවාදී සංවිධානයක් වශයෙන් හඳුනාගත්තේ ඇයි?

උ: ජාතික තවුහිද් සංවිධානය ඝට්ටනයක් ඇති කරගත්තා තවත් සංවිධානයත් එක්ක මේ කාත්තන්කුඩිය ප්‍රදේශයේ. එතකොට සහරාන් කියන පුද්ගලයා තමයි ඒක lead කරලා තිබුණේ. ඔහුව පොලීසියෙන් පැනලා ගිහිල්ලා හිටපු නිසා එයාව හොයන්න පටන් ගත්තා. ඒක හරහා ඊට පස්සේ එයා ඒ සහරාන් කියන පුද්ගලයා නිකුත් කරපු විඩියෝ පට එක්ක බලන කොට ඔහු අන්තවාදී අදහස් දරණ පුද්ගලයෙක් කියලා දැන ගත්තා. ඒ හරහා තමයි ජාතික තවුහිද් සංවිධානයත් අන්තවාදී සංවිධානයක් හැටියට අපි හඳුනගත්තේ.

ප්‍ර: මොන විදියේ අන්තවාදී අදහස් ද ඒ සහරාන් කියන තැනැත්තා පල කරලා තිබ්බේ?

උ: ඔහුගේ අදහසුයිISISඅදහසුයි එක සමානයි.

ප්‍ර: ඒ කියන්නේ ඔබගේ අංශයේ පරීක්ෂණ වලට අනුව මොහොමඩ් සහරාන් යන පුද්ගලයා IS මතවාදය දරණ පුද්ගලයෙක් වශයෙන් හඳුනාගත්ත ද?

උ: හඳුනාගත්තා.

ප්‍ර: සහරාන් සමඟ එක්ව කටයුතු කරන පුද්ගලයින් ඔබලාගේ අංශය හඳුනාගත්ත ද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ: අපි හඳුනාගත්තට ඒ ගොල්ලන්ගේ සම්බන්ධතාවයන් ගැන අපිට තහවුරු කරගන්න බැරි වුණා ස්වාමිනි.

ප්‍ර: නමුත් අර ජමාතේ මිල්ලතී ඊබ්‍රාහිම් සංවිධානය වගේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සහරාන් සහ ඔහුගේ අනුගාමිකයින්ගේ ලැයිස්තුවක් ඔබලා ගාව තිබ්බ ද?

උ: අපේ ගාව තිබුණේ නැහැ.

ප්‍ර: නමුත් සහරාන්ව හඳුනාගත්තා ආගමික ඉස්ලාම් ආගමික අන්තවාදීන්?

උ: ඔව්.

ප්‍ර: ISIS මතය දරණ පුද්ගලයෙක් කියලා?

උ: පුද්ගලයෙක් කියලා?

ප්‍ර: ඔබලාගේ පරික්ෂණය වලින් අනාවරණය වුණාද ඔහුට සෘජුව ISIS සංවිධානයට සම්බන්ධකමක් තියෙනව ද නැද්ද කියලා?

උ: අනාවරණය වුණේ නැහැ.

ප්‍ර : නමුත් මොහොමඩ් සහරාන් සම්බන්ධයෙන් ඔබගේ අංශය අර ජමාතේ මිල්ලතී ඊබ්‍රාහිම් සංවිධානය ගැන දැනුවත් කරා වගේ රටේ වෙනත් බුද්ධි අංශයක් නැත්නම් නීතිය ක්‍රියාත්මක කරන අංශයක් දැනුවත් කෙරුව ද?

උ: දැනුවත් කරා.

ප්‍ර: කාවද දැනුවත් කරේ?

උ: පොලිස්පතිතුමා පවා දැනුවත් කරා.

ප්‍ර: පොලිස්පතිතුමාව දැනුවත් කළේ මොහොමඩ් සහරාන් ගැන?

උ: මොහොමඩ් සහරාන් ගැන.

ප්‍ර: කොයි කාලේ ද පොලිස්පතිවරයා දැනුවත් කෙරුවේ?

උ: 2018/ 2019 වගේ කාලය තුළ.

ප්‍ර: එවකට පොලිස්පතිවරයා වශයෙන් කටයුතු කෙරුවේ කවුද?

උ: මතකයක් නැහැ ස්වාමිනි.

ප්‍ර: නමක් යෝජනා කෙරුවොත් මතක ද නම?

උ: නමක් යෝජනා කරොත් මතක් වෙයි.

ප්‍ර: පූජිත ජයසුන්දර ද? මතක නැත්නම් කියන්න එපා.

උ: මතක නැහැ.

ප්‍ර: කවුද ඔය පොලිස්පතිවරයාව කවුරු මාර්ගයෙන් ද ඔබගේ සංවිධානය පොලිස්පතිවරයාව දැනුවත් කළේ?

උ: අපි ලිඛිතව දැනුවත් කරා ස්වාමිනි.

ප්‍ර: ලිඛිතව දැනුවත් කෙරුවා. ඔබ කියන්නේ 2018 දී පමණ?

උ: 2018 දී හෝ 2019 මුල.

ප්‍ර: ඒ ලිඛිතව දැනුවත් කෙරුවේ නම කියන්න එපා.මොන නිලය දරපු පුද්ගලයා ද ඔබගේ අංශයේ?

උ: අධ්‍යක්ෂකතුමා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබගේ අංශයේ අධ්‍යක්ෂකතුමා. ඒ අධ්‍යක්කතුමා දැන් විශ්‍රාම ගිහිල්ලද ඉන්නේ?

උ: සේවයේ ඉන්නවා.

ප්‍ර: ඒ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඔබලා දැනුවත් කෙරුවේ පොලිස්පතිවරයා විතරද?

උ: ජාතික තවුහිද් සංවිධානය නෙමේ ස්වාමිනි.

ප්‍ර: සහරාන් ගැන දැනුවත් කෙරුවේ පොලිස්පතිවරයා විතරද?

උ: නැහැ අපි සහරාන් ගැන ජාතික බුද්ධි ප්‍රධාන කාර්යාලයටත් දැනුවත් කරලා තියෙනවා.

ප්‍ර: ඒක ලිඛිතව ද වාචිකව ද?

උ: ලිඛිතව.

ප්‍ර: මතක ද ඒ අවස්ථාවේ ජාතික බුද්ධි ප්‍රධානියා වශයෙන් හිටියේ කවුද කියලා. එහෙම නැත්නම් කියන්න කොයි කාලෙද කොයි වසරේ ද?

උ: 2018/2019 වර්ෂයේ.

ප්‍ර: 2018 විතර. ඒක ලිඛිතව කෙරුවා කියලයි ඔබ දන්නේ. දැන් ඒ සහරාන් කියන තැනැත්තා ISIS මතවාදය දරණවා කියලා ඔබ නිරීක්ෂණය කෙරුවා කියලා ඔබ කිව්වනේ ඔබගේ අංශය?

උ: නිරීක්ෂණය කරා.

ප්‍ර: එතකොට ඔහුගේ ක්‍රියාකාරකම් ඔබගේ නිරීක්ෂණයන්ට අනුව ලංකාව තුළ තිබ්බ ද නැත්නම් ලංකාවෙන් පිටත තිබ්බ ද?

උ: අපිට හරි තොරතුරක් තිබුණේ නැහැ. ඔහු ලංකාව තුළ ක්‍රියාත්මක වෙනව ද, ලංකාවෙන් පිට ක්‍රියාත්මක වෙනව ද කියලා ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම් සංවිධානය ගැන කතා කරන කොට ඔවුන්ගේ ක්‍රියාකාරකම් හිජ්රත් ගැන තමයි තිබ්බේ.

උ: තිබුණේ.

ප්‍ර: හිජ්රත් කියන්නේ ශ්‍රී ලංකාවෙන් පිට ඔබ කියන විදිය. ජාතික තවුහිද් ජමාත් සංවිධානයට ඒ නායකයා විදියට හිටියේ සහරාන් ද?

උ: ඔහු මුලින්ම ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ නිර්මාතa ස්වාමිනි. ඊට පස්සේ එයාව ඔහුව අයින් කරා කියලා තමයි ජාතික තවුහිද් සංවිධානය ප්‍රකාශ කර සිටියේ.

ප්‍ර: එතකොට දැන් ඒ සහරාන්ගේ ක්‍රියාකාරකම් ඔබගේ අංශයේ නිරීක්ෂණවලට අනුව ලංකාව තුළ ද නැත්නම් පිටද කියලා නිරීක්ෂණය වුණේ නැද්ද?

උ: එහෙම ඒක වෙන් කරලා හඳුනාගන්න හැකියාවක් තිබුණේ නැහැ. මෙහෙ ලංකාව තුළ අන්තවාදී මතවාදය පතුරවන්න තමා එයා කරේ. ඒ හැරෙන්න අන්තවාදී ක්‍රියාකාරකම් කිරීමක් සම්බන්ධව ප්‍රකාශ කර සිටියේ නැහැ. මතවාදය තරුණයන් අතර පතුරවන්න ක්‍රියාත්මක වුණා.

ප්‍ර: ඒක තමා මං අහන්නේ? මොන මතවාදය තරුණයන් අතර පතුරවන්න ද?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ISIS මතවාදය.

ප්‍ර: එතකොට ISIS මතවාදය මොකද්ද?

උ: Islamic State එකක් establish කරන්න.

ප්‍ර: ඒ කියන්නේ මුස්ලිම් රාජ්‍යයක් ඇති කරන්න?

උ: ඇති කරන්න.

ප්‍ර: ඒ ඔබලගේ නිරීක්ෂණ වලට අනුව ඒ මුස්ලිම් රාජ්‍යය ඒ කියන්නේ Islamic State එක ලෝකයේ කොයි රටවල් ද Cover කරන්නේ?

උ: ඉරාකයයි සිරියාවයි පදනම් කරගෙන.

ප්‍ර: ඒ රටවල් දෙක පදනම් කරගෙන?

උ: ඔව්.

ප්‍ර: නමුත් ඒ ISIS මතවාදය පදනම් කරගෙන ගොඩනැගෙන ඒ මුස්ලිම් රාජ්‍යය ඔබ කියන සිරියාවයි ඉරාකයටයි පමණක් සීමා වුණ එකක් ද ඔබගේ පරීක්ෂණ වලට අනුව?

උ: ISIS මතවාදය දරපු කට්ටියගේ උවමනාව තිබුණේ ඒ ඒ ඉරාකයයි සිරියාවයි පදනම් කරගෙන මුස්ලම් රාජ්‍යයක් බිහිකරන්න.

ප්‍ර: ඔබගේ පරීක්ෂා වලදී ඔබ අන්තර්ජාලය නිරීක්ෂණයට ලක් කෙරුවා කියලා කිව්වා නේද?

උ: කරා.

ප්‍ර: එම අන්තර්ජාලයේ තිබ්බෙ නැද්ද මුස්ලිම් රාජ්‍යයක් සඳහා තෝරාගත්තු ලෝකයේ තියෙන භූමි ප්‍රමාණය පළ කරපු සිතියමක් තිබ්බ ද?

උ: තිබුණා.

C 140 දරණ ලේඛනය සාක්ෂිකරුට පෙන්වයි.

ප්‍ර: ඔබට ඔය පෙන්වන සිතියම ද ඔබ දැකලා තියෙන්නේ?

උ: දැකලා තියෙනවා.

ප්‍ර: ඔය සිතියමට අනුව මුස්ලිම් රාජ්‍යයක් කියන සංකල්පයට ලංකාව ඇතුළත් වෙනව ද නැද්ද?

උ: ඇතුළත් වෙනවා.

ප්‍ර: ඇතුළත් වෙනවා. එතකොට ඔබ ඒ විදියට අන්තර්ජාලය නිරීක්ෂණය කිරීමේ දී ලංකාව මුස්ලිම් රාජ්‍යයකට ඇතුළත් කරලා තිබ්බ කියලා ඔබ ඒ වෙලාවේ නිරීක්ෂණය කෙරුව ද?

උ: නිරීක්ෂණය කරා ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ හේතුව තුළ ඔබ තවත් සහරාන්ගේ අනුගාමිකයින් සෙවීමේ ක්‍රියාදාමයක් කෙරුව ද ඔබගේ අංශයෙන්?

උ: කරගෙන ගියා.

ප්‍ර: එතකොට යම් පුද්ගලයින්ව හඳුනාගත්ත ද?

උ: අපි හඳුනාගත්තා සමාජ මාධ්‍ය හරහා හඳුනගත්තා ස්වාමිනි.

ප්‍ර: ඒ පුද්ගලයින්?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඔව්. ඒ ගොල්ලනුත් සම්බන්ධ වෙලා තිබුණා ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම් එකට. ඒ දෙගොල්ලම ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම් පුද්ගලයින් ඒ සාමාජිකයින් සහරාන්ගේ වීඩියෝ පට ඒ ගොල්ලන්ගේ සමාජ මාධ්‍ය හරහා බෙදා හැරලා තිබ්බා.

ප්‍ර: එතකොට ඔබ කියන්නේ ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම් සංවිධානයේ සාමාජිකයිනුයි ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සමාජිකයනුයි එකම අය කියල ද?

උ: ජාතික තවුහිද් ජමාත් සංවිධානය නෙමේ ස්වාමිනි. සහරාන් සම්බන්ධ වෙලා තිබ්බා සහරාන්ගේ දේශනා අනුගමනය කරන්න ඒවාට සවන් දෙන්න ජමාතේ මිල්ලතී ඊබ්‍රාහිම් සාමාජිකයින් පෙළඹිලා තිබුණා.

ප්‍ර: නමුත් ඔබ එක අවස්ථාවක මොහොමඩ් සහරාන් තවුහිද් ජමාත් සංවිධානයේ නිර්මාතෘ විදියට අඳුරගත්තනේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට තවුහිද් ජමාත් සංවිධානය

උ: ජාතික තවුහිද් සංවිධානය.

ප්‍ර: ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සාමාජිකයින් කවුද කියලා හොයන්න

උ: සාමාජිකයින් ගැන අපි හොයලා තිබුණා නමුත් ජාතික තවුහිද් සංවිධානය අර ප්‍රශ්නය සිද්ධ වුණාට පස්සේ ඔහු තමන්ගේ සාමාජිකයෙක් නොවේ කියන එක තමයි කියලා තිබුණේ.

ප්‍ර: දැන් ඔබ තුන්වැනි කණ්ඩායමක් ගැන කිව්වේ ශ්‍රී ලංකා තවුහිද් ජමාත්. ඒකත් ඉස්ලාම් අන්තවාදී කණ්ඩායමක් විදියට ද ඔබේ අංශය හඳුනාගත්තේ?

උ: අපි හඳුනාගෙන තිබුණේ ඒ විදියට. හේතුව ඒ ගොල්ලන් හරහා ප්‍රශ්න කිහිපයක් ඇති වෙච්ච හින්දා ලංකාව තුළ. ඒ ගොල්ලන් ලබා දුන්න Statements හරහා ප්‍රශ්න ඇති වෙච්ච හින්දා.

ප්‍ර: එතකොට ඒ ශ්‍රී ලංකා තවුහිද්ජමාත් සංවිධානයේ නායකයා වශයෙන් කවුද කටයුතු කෙරුවේ?

උ: එවකට නායකයා එච්චර ප්‍රසිද්ධ නැති වුණත් රාසික් කියන පුද්ගලයා ප්‍රසිද්ධ චරිතයක් විදියට

ප්‍ර: අබ්දුල් රාසික් කියන තැනැත්තා?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඔබ ඒ කණ්ඩායම අන්තවාදී කණ්ඩායමක් විදියට ඔබගේ අංශය හඳුනා ගෙන තිබ්බා?

උ: අන්තවාදී කටයුතු වලට සම්බන්ධ වෙන්න පුළුවන් කණ්ඩායමක් විදියට හඳුනගෙන තිබුණා.

ප්‍ර: ඇයි ඒ කණ්ඩායම අන්තවාදී කටයුතු වලට සම්බන්ධ විය හැකි කණ්ඩායමක් වශයෙන් හඳුනගත්තේ?

FAIR COMMENT
BY JEZEEM

උ: ඒ ගොල්ලන් සමාජය තුළ ප්‍රශ්න ඇති කරපු හින්දා. යම් යම් Statements දිලා ඒ හරහා ප්‍රශ්න ඇති වෙන්න තුඩු දුන්නු හින්දා.

ප්‍ර: මොන විදියේ ප්‍රශ්න ද?

උ: අනිත් ආගම් ගැන කතා කරන්න ගිහිල්ලා තව තැන් තැන් වල Pocket meeting වගේ තියන්න පටන් ගත්ත හින්දා තමයි අපි ඒ ගොල්ලන් ඒ විදියට හඳුනගෙන තිබුණේ.

ප්‍ර: එතකොට ඔබගේ අංශයෙන් පවත්වාගෙන ගිය ඔය පරීක්ෂණ වලට අනුව දැන් මේ පාස්කු ප්‍රහාරයෙන් මියගියානේ ස්වයං ඝාතකයින් 7 දෙනෙක්?

උ: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ 07 දෙනාගේ නම් ඔබගේ අංශයේ සඳහන් වෙලා තිබ්බ ද?

උ: අපේ අංශයේ සඳහන් වෙලා තිබුණේ සහරාන්ගේ නමයි, ජමිල්ගේ නමයි, ඉල්හාම්ගේ නමයි, හස්තුන් කියන එක්කෙනාගේ නමයි ඒ 04 දෙනා තමයි.

ප්‍ර: ඒ 04 දෙනාගේ නම්?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඔබ කිව්වා සහරාන්ගේ නම පොලිස්පතිවරයාට ලබා දුන්නා කියලා එක් අවස්ථාවක. ඔබ කිව්වා සහරාන්ගේ නම ලබා දුන්න කියලානේ කිව්වේ?

උ: ඔව්.

ප්‍ර: ජමිල්ගේ නම ලංකාවේ වෙනත් අංශයක ඒ කියන්නේ බුද්ධි අංශයකට නැත්නම් නීතිය ක්‍රියාත්මක කරන අංශයකට ලබා දීලා තිබ්බ ද?

උ: මට හරියටම කියන්න මතකයක් නැහැ ස්වාමිනි. ජමිල්ගේ නම වෙනමම කිව්වා කියලා. නමුත් අර සම්පූර්ණ ලිස්ට් එකේ තිබුණා ජමිල්ගේ නම.

ප්‍ර: මොන ලිස්ට් එක ගැන ද ඔබ කතා කරන්නේ?

උ: JMI ලිස්ට් එකේ.

ප්‍ර: ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම් සංවිධානයේ ලිස්ට් එකේ ජමීල්ගේ නම තිබ්බා?

උ: තිබ්බා.

ප්‍ර: එම ලිස්ට් එක ඔබ කියන විදියට රාජ්‍ය බුද්ධි සේවාවට ලබා දුන්නා?

උ: ඔව්.

ප්‍ර: ඒ ඔබ කියන හැටියට 2018 නැත්නම් 2019 වර්ෂයේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට හස්තුන්ගේ නම කොහේද තිබ්බේ?

උ: ඒ ලිස්ට් එකේමයි.

ප්‍ර: ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම්ලිස්ට් එකේ?

උ: ඒ ලිස්ට් එකේ තිබ්බා. ඒ වුණාට ඔහු

ප්‍ර: එතකොට මුබාරක්ගේ නම ?

උ: මුබාරක්ගේ නම තිබුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර: එතකොට මුබාරක්ගේ නම ඔබගේ අංශයට ලැබිලා තිබුණේ නැහැ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ලැබිලා තිබුණේ නැහැ.

ප්‍ර: දැන් ඔබමීට කලින් කිව්වා ලැබිලා තිබ්බා කියලා?

උ: මුබාරක්ගේ නම

ප්‍ර: හස්තුන්ගේ නම කාටද ලබලා දුන්නේ?

උ: ඒත් අර JMI ලිස්ට් එකේ තිබුණා. ඔහු ක්‍රියාකාරී පුද්ගලයෙක් විදියට නෙවෙයි නමුත් ඔහුගේ නම ලිස්ට් එකේ තිබුණා. සමාජ ජාලා හරහා හඳුනගත්ත පුද්ගලයෙක් විදියට.

ප්‍ර: පැහැදිලිකර ගැනිමක් විදියට මං අහන්නේ. ඔබ කියන හැටියට ජමීල්ගේ නමයි, හස්තුන්ගේ නමයි, සහරාන්ගේ නමයි, ඉල්හාම්ගේ නමයි වෙනත් අංශයකින් ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවාවට ලබා දුන්න ද?

උ: JMI ගේ ලිස්ට් එකේ සහරාන්ගේ නම තිබුණේ නැහැ ස්වාමිනි. සහරාන්ගේ විස්තර වෙනම අපි ලබා දීලා තියෙනවා.

ප්‍ර: ඒ පොලිස්පතිට?

උ: පොලිස්පතිටයි මට මතක විදියට ජාතික බුද්ධි සේවාවත් එක්කත් ඒක හුවමාරු කරගෙන තියෙනවා.

ප්‍ර: අනෙක් තුන්දෙනාගේ නම ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම් ලිස්ට් එකේ තිබ්බා?

උ: තිබුණා.

ප්‍ර: ඒ ලිස්ට් එක ඔබ කියන හැටියට රාජ්‍ය බුද්ධි සේවයට ලබා දුන්නා?

උ: ලබා දුන්නා.

ප්‍ර: පොලිස්පතිවරයාටත් ඒක ලබා දුන්න ද?

උ: ඒ ලිස්ට එක ලබා දුන්නේ නෑ.

ප්‍ර: දැන් ඔබලාගේ අංශයට මාවනැල්ල බුදුපිළිම කැඩීම සිද්ධිය සම්බන්ධයෙන් ඔබලගේ අවධානය යොමු වුණා ද?

උ: යොමු වුණා.

ප්‍ර: කොයි අවස්ථාවේ ද අවධානය යොමු වුණේ?

උ: අපි මුල සිටම අවධානය යොමු කරමින් තිබුණේ ස්වාමිනි.

ප්‍ර: මුල සිට කියන්නේ 2018 දෙසැම්බර් මාසේ 22 වැනිදා ?

උ: කඩපු දවසේ ඉඳලම. එතකොට අපිට අවශ්‍ය මට්ටමේ තොරතුරු තිබුණේ නැහැ කවුරුත් අත්අඩංගුවට ගන්න ඒ සම්බන්ධව සම්බන්ධ වෙච්ච පුද්ගලයින් සම්බන්ධව. නමුත් පොලිසිය හොයා ගත්තට පස්සේ අපිට වුවමනාව තිබුණා ඒ සම්බන්ධව සම්බන්ධ අයවලුන් ප්‍රශ්න කරන්න. අපිට ඒ අවස්ථාව ලැබුණේ නැහැ.

ප්‍ර: ඔබලා කොයි පුද්ගලයින් ද හඳුනාගත්තේ මාවනැල්ල සිද්ධිය සම්බන්ධයෙන්?

උ: අපි කවුරුත් හඳුනාගත්තේ නැහැ ස්වාමිනි.

ප්‍ර: පුද්ගලයින්

උ: අපිට තොරතුරු තිබුණේ නැහැ හඳුනාගන්න.

ප්‍ර: ඔබලා ඒ හඳුනාගන්න තමා තොරතුරු ලබා ගන්න හැදුවේ?

Presidential Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

උ: ලබා ගන්න හැඳුවේ.

ප්‍ර: දැන් වෙන කොට ඔබ දන්නවා නේ ද මාවනැල්ල සිද්ධිය සම්බන්ධයෙන් යම්කිසි සැකකරුවන් පොලිස් අත්තඩංගුවේ අධිකරණ භාරයේ ඉන්නවා කියලා. සමහර අය ත්‍රස්ත විමර්ශන ඒකකය භරයේ ඉන්නවා කියලා?

උ: දන්නවා ස්වාමිනි.

ප්‍ර: ඒ තැනැත්තන් අතරින් කිසිවෙකුගේ නම් ඔබගේ අංශයට මාවනැල්ල බුද්ධ ප්‍රතිමා කඩන්න ඉස්සෙල්ලා ලැබිලා තිබුණ ද?

උ: ලැබිලා තිබුණේ නැහැ.

ප්‍ර: පාස්කු ප්‍රහාරය වෙනකන් ඒ තැනැත්තන්ගේ නම් ඔබගේ අංශයට ලැබිලා තිබ්බ ද?

උ: ලැබිලා තිබුණේ නැහැ ස්වාමිනි. පාස්කු ප්‍රහාරයට කලින් අර සහෝදරවරු දෙන්නගේ නම් ලැබිලා තිබුණා.

ප්‍ර: සාහිඩ් සහ සාදික්?

උ: සාහිඩ් සහ සාදික්.

ප්‍ර: ඒ සහෝදරවරුන් දෙන්නගේ නම් ඔබේ අංශයට ලැබෙන්නේ ?

උ: වෙනත් බුද්ධි අංශ වලින්.

ප්‍ර: වෙනත් බුද්ධි අංශ වලින්. කොයි වකවානුවේ ද ලැබෙන්නේ?

උ: හරියට මතකයක් නැහැ ස්වාමිනි.

ප්‍ර: මොකක් සම්බන්ධයෙන් ද ලැබෙන්නේ?

උ: ඒ ගොල්ලෝ බුදු පිළිම කඩපු සිද්ධියට සම්බන්ධයි කියලා.

ප්‍ර: ඒ සිද්ධියට සම්බන්ධයෙන් විතරයි ඒ නම් ටික ඔබලට වෙනම බුද්ධි අංශයකින් ලැබෙන්නේ?

උ: ලැබෙන්නේ.

ප්‍ර: ඔබගේ සාක්ෂියට අනුව ඒ වෙනකන් ඔවුන්ගේ නම් ඔබගේ අංශයට ලැබිලා තිබුණේ නැහැ?

උ: ලැබිලා තිබුණේ නැහැ.

ප්‍ර: දැන් ඊට ටික කාලයකට පස්සේ වනාත විල්ලුව සිද්ධිය සිදු වෙනවනේ. මේ ලොකු අවි ආයුධ තොගයක් හොයාගන්නවානේ?

උ: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ සිද්ධිය සම්බන්ධයෙන් ඔබගේ විමර්ශන අංශයට අවධානය යොමු වෙනව ද?

උ: යොමු වෙනවා.

ප්‍ර: ඇයි යොමු වෙන්නේ?

උ: යොමු වෙන්නේ Explosives හම්බු වෙච්ච හින්දයි ඒ සම්බන්ධ වෙච්ච කට්ටිය මේ Explosives produce කරේ මොන පදනම මතද කියන එක දැන ගන්න වුවමනාවක් තිබුණ හින්දයි.

ප්‍ර: දැන් ඔබගේ අංශය බලන්නේ ආගමික අන්තවාදය සම්බන්ධයෙන්නේ?

උ: මගේ අංශය බලන්නේ ආගමික අන්තවාදිය.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට වනාතවිල්ලුවේ ඔය පුපුරන ද්‍රව්‍ය සොයා ගැනීම ඔබගේ අංශයට යොමු වෙන්නේ ඒක යම්කිසි ආගමික අන්තවාදී ක්‍රියාවකට සම්බන්ධ විය හැකි?

උ: වෙන්න පුළුවන් කියන සැකය හින්දා.

ප්‍ර: එතකොට එවැනි සැකයක් ඒ වනාතවිල්ලුව අවි ආයුධ ගබඩා සම්බන්ධයෙන් ඇති වුණේ ඇයි?

උ: ඇති වුණේ මුස්ලිම් පුද්ගලයින් සම්බන්ධ වෙච්ච හින්දා ස්වාමිනි.

ප්‍ර: ඒ සම්බන්ධ වෙච්ච පුද්ගලයින්ගේ නම් ඔබගේ අංශයට ලැබුණ ද?

උ: නම් ලැබුණා. ඒ වුණාට ස්වාමිනි අපිට වුවමනා වෙලා තිබුණා ඒ පුද්ගලයින් ප්‍රශ්න කරන්න. ඒකට අවස්ථාවක් හම්බ වුණේ නැහැ.

ප්‍ර: ඔබ ඉල්ලුව ද ඒ අවස්ථාව?

උ: ඉල්ලුවා.

ප්‍ර: කාගෙන් ද ඉල්ලුවේ ඒ අවස්ථාව?

උ: CID එකෙන්.

ප්‍ර: අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්

උ: අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවන් ඉල්ලුවා.

ප්‍ර: ලිඛිතව ඉල්ලුව ද?

උ: ලිඛිතව ඉල්ලුවා ස්වාමිනි.

ප්‍ර: කාටද ඒ ලිඛිත ඉල්ලිම ඉදිරිපත් කරේ?

උ: අධ්‍යක්ෂකතුමාට.

ප්‍ර: එවකට හිටපු අධ්‍යක්ෂකවරයා දන්නව ද කවුද කියලා?

උ: ඔව් ස්වාමිනි.

ප්‍ර: කවුද?

උ: ෂානි අබේසේකර මහතා.

ප්‍ර: ලිඛිතව ඉදිරිපත් කරා?

උ: ලිඛිතව ඉදිරිපත් කරා.

ප්‍ර: කවුද ඒ ලිඛිත ඉල්ලිම ඉදිරිපත් කරේ?

උ: අධ්‍යක්ෂකතුමා.

ප්‍ර: ඒකට උත්තරයක් ලැබුණ ද?

උ: ලැබුණේ නැහැ.

ප්‍ර: එතැනින් ඊට එහා ක්‍රියාමාර්ගයක් ගත්තේ නැද්ද?

උ: ගන්න හැකියාවක් තිබුණේ නැහැ අපිට තිබුණ තොරතුරු මදි ඊට වඩා හබා යන්න මේ සම්බන්ධව.

ප්‍ර: ඒ ලිඛිත ඉල්ලිම එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාගෙන් කෙරුවේ පාස්කු ප්‍රහාරයට ඉස්සෙල්ල ද පස්සෙ ද?

උ: ඉස්සෙල්ලා.

ප්‍ර: කොපමණ කාලයකට ඉස්සෙල්ලා ද?

Presidential Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

උ: මාස 03 කට විතර පමණ පෙර. මට හරියට ම මතක නැහැ ස්වාමිනි. දළ වශයෙන් මාස 02 , 03 කට කලින්. ඒ සිද්ධිය Explosives හොයා ගත්ත සිද්ධිය සිදු වෙලා සති දෙකකට විතර පසසේ.

ප්‍ර: එතකොටත් ඒ වෙන කොටත් යම්කිසි පුද්ගලයින් අත්අඩංගුවේ හිටියා?

උ: අත්අඩංගුවේ හිටියා. ඒ අත්තඩංගුවේ හිටපු පුද්ගලයින් ප්‍රශ්න කරන්න තමා අපි අවස්ථාව ඉල්ලුවේ.

ප්‍ර: එතකොට ඔබ දන්නවා ද ඒ අත්තඩංගුවේ හිටපු පුද්ගලයින්ගෙන් යම් තැනැත්තන් ඊට පස්සේ නිදහස් කෙරුවා කියලා?

උ: දැන ගෙන හිටියේ නැහැ.

ප්‍ර: නමුත් ඒ වනාතවිල්ලුව අවි ගබඩාව සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත්තු පුද්ගලයින්ගෙන් ප්‍රශ්න කිරීමේ අවස්ථාව තමා ඔබ එවකට අධ්‍යක්ෂක අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා තියෙන්නේ?

උ: අපේ අධ්‍යක්ෂකතුමාට වුවමනාව තිබුණා මේ සම්බන්ධව වැඩිදුර පරික්ෂණය කරන්න. අපිට තිබුණු තොරතුරු ප්‍රමාණවත් මදි හින්දා තමයි අපි ඉල්ලුවේ ඒ අවස්ථාව ලබා දෙන්න කියලා.

ප්‍ර: දැන් ඊට පස්සේ කාත්තන්කුඩියේ යම්කිසි මෝටර් බයිසිකලයක් පුපුරුවා හැරීමක් සිද්ධවෙනවා?

උ: සිද්ධ වෙනවා.

ප්‍ර: එම පුපුරුවා හැරීම සිදු වෙන්නේ ඊට 300 m ක් විතර එහා යුද්ධ හමුදා කඳවුරක් තියෙනවා නේ ද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ ආසන්න ස්ථානයේ තමා මේ පිපිරීම සිදු වෙන්නේ. එම සිද්ධියට ඔබලගේ අවධානය යොමු වුණාද?

උ: යොමු වුණා.

ප්‍ර: ඒ යොමු වුණේ පාස්කු ප්‍රහාරයට ඉස්සෙල්ල ද පස්සෙද?

උ: ඉස්සෙල්ලා.

ප්‍ර: ඇයි ඒ සිද්ධියට ඔබලගේ අංශය අවධානය යොමු වුණේ?

උ: ඒකත් අසාමාන්‍ය විදියට ඒ පිපිරවීම සිදු වෙලා තිබුණ හින්දා. ඒකයි අතන explosive ගත්ත එකයි එක්ක සම්බන්ධතාවයක් තියෙන්න පුළුවන් කියන හැඟීම අපිට තිබුණ හින්දා ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ සම්බන්ධයෙන් ඔබලා මොනවද කෙරුවේ?

උ: මට හරියටම මතක නැහැ ස්වාමිනි අපි ලිඛිතව නම් ඉල්ලුවේ නැහැ ඒ පුද්ගලයා ඒ සම්බන්ධව විස්තර. ඒක මගේ අංශයට මට direct ලිඛිතවම ලැබිලා තිබුණේ නැහැ. ඒ සම්බන්ධව අධ්‍යක්ෂකතුමා යම් යම් සාකච්ඡාවලදී එහෙම කතා කරලා තිබුණා ස්වාමිනි.

ප්‍ර: ඔබ දැන් මේ කොමිෂන් සභාවට දීල තියෙන පිළිතුරු වලට අනුව පේනවා ඔබගේ අංශයට මේ මුස්ලිම් ආගමික අන්තවාදය සම්බන්ධයෙන්

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

තොරතුරු විශාල ප්‍රමාණයක් 2015 අවසානයේ සහ 2016 ඉඳලා ලැබිලා තියෙනවා?

උ: එහෙමයි.

ප්‍ර: ඔබගේ සාක්ෂියේ හැම වෙලාවේම අධ්‍යක්ෂවරයෙක් ගැන කතා කරනවා. කොමිෂමට කියන්න ඔබගේ අංශයෙන් සිදුකරන කාර්ය භාර්ය සහ ඔබගේ අංශය අනාවරණය කරගන්නා කරුණු අධ්‍යක්ෂකවරයා විසින් හෝ වෙනත් තැනැත්තෙකු විසින් යුධ හමුදාපතිව දැනුවත් කිරීමක් සිදු වුණා ද?

උ: දැනුවත් කරනවා.

ප්‍ර: දැනුවත් වීමක් සිදු වෙනවා?

උ: සිදු වෙනවා.

ප්‍ර: ඒ කියන්නේ ඔබ දන්නවා ද යුධ හමුදාපතිව ඒ විදියට ඔබගේ අංශයෙන් සිදුවන කාර්ය සම්බන්ධයෙන් දැනුවත් කරන්නේ කොයි කාලෙද?

උ: වාචිකව සහ ලිඛිතව ඒක දිගටම සිදු වෙනවා ස්වාමිනි.

ප්‍ර: වාචිකව සහ ලිඛිතව දිගටම සිදු වෙනවා?

උ: සිදු වෙනවා.

ප්‍ර: ඒක සිදුවෙන්නේ අධ්‍යක්ෂකවරයා මාර්ගයෙන්?

උ: අධ්‍යක්ෂකවරයා.

ප්‍ර: ඔබට ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට කිසිම සැකයක් නැතුව කියන්න පුළුවන්?

උ: දැනුවත් වෙනවා කියන එක මං දැනගෙන හිටියා ස්වාමිනි.

ප්‍ර: දැනුවත් වෙනවා කියලා දැනගෙන හිටියා. ඔබ ඔය අංශය භාරගත්තට පස්සේ යුධ හමුදාවේ හමුදාපති වශයෙන් සිටියේ කවුද?

උ: ජෙනරල් මහේෂ් සේනානායක හිටියා ස්වාමිනි. ඊට පස්සේ ඊට කලින් ජෙනරල් සිල්වා ඒ දෙන්න තමයි.

ප්‍ර: පාස්කු ප්‍රහාරයට පෙර හිටියේ ඒ දෙන්න විතරම ද ?

උ: ඔව්.

ප්‍ර: ජෙනරල් මහේෂ් සේනානායකයි, ජෙනරල් සිල්වායි.ඔබ කියන හැටියට ඔබගේ අංශයේ කියපු ඔය ආගමික අන්තවාදය විශේෂයෙන් මුස්ලිම් අන්තවාදය සම්බන්ධයෙන් තොරතුරු ඒ යුධ හමුදාපති දෙදෙනා වෙත දැනුවත් කෙරුවා කියලා ඔබට කියන්න පුළුවන්?

උ: මං විශ්වාස කරනවා ඒ සාකච්ඡාවල දී දැනුවත් කරා කියලා.

ප්‍ර: නම් කියන්න එපා ඔබගේ අංශයේ අධ්‍යක්ෂකවරයා කෙළින්ම යුධ හමුදාපතිට වාර්තා කරනව ද?

උ: වාර්තා කරනවා. වාර්තා කරන්න බැඳිලා ඉන්නවා ස්වාමිනි.

ප්‍ර: වාර්තා කරන්න බැඳිලා ඉන්නවා. ඒ කියන්නේ වෙන විදියට කියනව නම් ඔබගේ අංශයේ අධ්‍යක්ෂකවරයා අනිවාර්යයෙන් ම වාර්තා කරන්න ඕන යුධ හමුදාපතිට කිව්වොත් නිවැරදි ද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඔව්. නිවැරදි.

ප්‍ර: ඔහුට කිසිදෙයක් යුධහමුදාපතිගෙන් වසන් කරන්න බැහැ?

උ: වසන් කරන්න බැහැ.

ප්‍ර: වසන් කරන්න බැහැ. දැන් ඔබ කියපු පරිදි ඉල්හාම් අහමඩ් කියන තැනැත්තා සම්බන්ධයෙන් ඔබගේ අංශයේ අවධානය ප්‍රථමයෙන්ම යොමු වන්නේ කොයි කාලෙද?

උ: සංවිධානය දෙකඩ වුණාට පස්සේ. JMI සංවිධානය දෙකඩ වුණාට පස්සේ.

ප්‍ර: ඒ කොයි කාලෙ ද?

උ: 2018 මුල වගේ ස්වාමිනි මට මතක.

ප්‍ර: ඔබ මේ කියන්නේ සංවිධානය දෙකඩ වුණා කියලා ඔබ කියන්නේ අර 2018 මාර්තු මාසයේ අලියා හන්දියේ වුණ සිද්ධිය නෙමේ නේද?

උ: නැහැ නැහැ. වෙනම සංවිධානයක්

ප්‍ර: ජාතික තවුහිද් ජමාත් සංවිධානය දෙකඩ වුණ අවස්ථාව ද?

උ: නැහැ නැහැ . JMI සංවිධානය දෙකඩ වුණ අවස්ථාවේ.

ප්‍ර: ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම් සංවිධානය දෙකඩ වුණ අවස්ථාව?

උ: දෙකඩ වුණ අවස්ථාව.

ප්‍ර: ඔබ කියන හැටියට ඒක 2018 දී

උ: 2018 මුල් මාස වල මට මතක.

ප්‍ර: එතකොට

උ: මං මේ කියන කාලවකවානු වෙනස් වෙන්න පුළුවන් ස්වාමිනි. මං මතක විදියට කියන්නේ.

ප්‍ර: ආසන්න වශයෙන් තමා කියන්නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට ජමීල් මොහොමඩ් සම්බන්ධයෙන් ඔබගේ අංශයේ අවධානය යොමු වෙන්නේ කොයි කාලෙද?

උ: ඒ ඒ එක්කම තමයි.

ප්‍ර: කණ්ඩායම් දෙකක්.

උ: කණ්ඩායම් දෙකක්.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබට මතක ද අප්‍රේල් 11 වැනිදා මේ ප්‍රහාරය එල්ල වෙනවා කියලා මුල් තොරතුර එළියට ඇවිල්ලා තිබුණනේ.පස්සේ හරි ඔබ දැන ගත්තනේ?

උ: පස්සේ දැන ගත්තා.

President Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: ඒ තොරතුර ඔබලට අප්‍රේල් 11 වැනිදා හෝ ඒ ආසන්නයේ දැන ගන්න ලැබුණ ද?

උ: ලැබිලා තිබුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබගේ අංශයේ ඉහළ නිලධාරින් මේ පිළිබඳව කිසිම තොරතුරක් දැනන් හිටියේ නැහැ කියන එක ද ඔබ කියන්නේ?

උ: මට විශ්වාසයෙන් කියන්න පුළුවන් එහෙම තොරතුරක් ලැබුණ නම් අනිවාර්යයෙන්

ප්‍ර: දැන් ඔබට ඔබගේ පරීක්ෂණ කටයුතු අනුව කියන්න පුළුවන් ද මේ අන්තවාදී මුස්ලිම් කණ්ඩායම් වලට උදව් කරපු දේශපානලඥයෝ හිටිය ද?

උ: අපිට එහෙම තොරතුරු තිබුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒ තොරතුරු ලැබුණේ නැහැ. ඔබ ඒ සම්බන්ධයෙන් තොරතුරු සොයා බලන්න උත්සාහ කරේවත් නැද්ද?

උ: නැහැ ස්වාමිනි. තොරතුරු තිබුණෙ නැති නිසා ඒක හරහා හබා යන්න මේකත් තිබුණේ නැහැ ස්වමිනි.

ප්‍ර: දැන් මෙවැනි අන්තවාදී ක්‍රියා කරන්න මුදල් ඕනනේ. මෙවැනි මහ පරිමාණයේ දේවල් කරන්න මුදල් ඕන. එතකොට ඔබලාගේ පරීක්ෂණ කටයුතු වලට අනුව මේ මුදල් කොහෙන් ද ආවේ කියන එක සෙව්වෙ නැද්ද?

උ: අපිට මුදල් සම්බන්ධවත් ISIS සංවිධානයට සෘජු සම්බන්ධතාවය සම්බන්ධවත් මේ ගොල්ලන් මේ විදියට අන්තවාදී කටයුතු සිද්ධ කරන්න යනවා කියලා පිළිබඳවත් අපිට තොරතුරු තිබුණේ නැහැ ස්වාමිනි. එහෙම තිබ්බ නම් අපි අනිවාර්යයෙන් මේගොල්ලන් ගැන මීට වඩා හොයනවා. අපිට එහෙම පැහැදිලි තොරතුරු තිබුණේ නැහැ. මුදල් එන එක සම්බන්ධවත් එහෙම තොරතුරු තිබුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර: දැන් මේ පිපිරීම් සිද්ධ වෙන කාලෙ තොරතුරු නොතිබුණත් ඉන් පස්සේ හරි ඔබලා මේ පිළිබඳ පරීක්ෂණ පැවැත්තුවා නේද?

උ: ඊට පස්සේ පැවැත්තුවා. එතකොටත් අපිට මුදල් ඉල්හාම්ගේ සහෝදරයා විසිනුයි පියා විසිනුයි දුන්න කියන එක තමයි අපිට ලැබිච්ච තොරතුර.

ප්‍ර: එපමණ ද?

උ: එපමණයි.

ප්‍ර: ඔබ දන්නා විදියට?

උ: මම දන්නා විදියට.

ප්‍ර: එතකොට දැන් ඔබ කියනව නම් ඉල්හාම්ගේ ඔය ඊබ්‍රාහිම් පියා සල්ලි දුන්න කියලා ඔබට ඒ පිලිබඳව කරන ලද පරීක්ෂණ අනුව ස්ථිරවම තහවුරු කරන්න පුළුවන් ද ඔහු මේ අන්තවාදී මුස්ලිම් තරුණයින්ගේ කටයුතු වලට යම් මුදල් ආධාර ස්ථිරවම ලබා දුන්න කියලා?

FAIR COMMENT
BY JEZEEM

උ: ඒ අපිට වෙනත් අංශ වලින් ලැබුණ තොරතුරු විතරයි. අපිගාව Evidence තිබුණෙ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒ කාලේ තිබුණේ නැහැ නමුත් දැන්?

උ: පසුව වුණත් මම ඉන්න කාලේ එහෙම Evidence තිබුණෙ නැහැ.

ප්‍ර: සොයාගන්න ලැබුනේ නැහැ?

උ: ලැබුනේ නැහැ.

ප්‍ර: නමුත් තොරතුරු තිබුණා ඒ අය උදව් කරා කියලා?

උ: ඒ වෙනත් බුද්ධි අංශ හරහා තමයි අපිට තොරතුරු ලැබිලා තිබුණෙ.

ප්‍ර: එතකොට ඔබට මතකද නැත්නම් ඔබේ විමර්ශන කටයුතු වලදී හෙළිදරව් වුණාද ලංකාවේ දැනට ISIS සංවිධානයේ සාමාජිකයින් ඉන්නවා කියලා?

උ: නැහැ. ISIS සංවිධානයේ සාමාජිකයින් ඉන්නවා කියලා අපි තොරතුරු හම්බ වුණේ නැහැ. මතවාදය දරණ පුද්ගලයෝ ඉන්නවා කියන එක තොරතුරු තිබුණා.

ප්‍ර: ඒ අයගේ යම්කිසි සංවිධානයක් තියෙනවා කියලා ඔබට තොරතුරු වාර්තා වුණාද?

උ: JMI කියන සංවිධානය.

ප්‍ර: ඒකේ දැනට නායකයෙක් ඉන්නවා කියලා ඔබට තොරතුරු තියෙනව ද?

උ: ඒ දවස්වල අපි හඳුනාගෙන තිබුණේ උමර් මොහොමඩ් කියන පුද්ගලයා නායකයා විදියට.

ප්‍ර: තාමත් ඔහු ඉන්නව ද?

උ: ඔහු අත්අඩංගුවේ ඉන්නවා.

ප්‍ර: එතකොට ඔහු අත්අඩංගුවේනේ. ඔහු අත්අඩංගුවේ ඉන්න අවස්ථාවේ දී මේ සංවිධානය තවමත් ක්‍රියාකාරී තත්ත්වයේ පවතිනවා කියන එකට තොරතුරු තියෙනව ද?

උ: ස්වාමිනි මම දැනට වෙනත් ඒකකයක දෙවන අණ දෙන නිලධාරි විදියට කටයුතු කරන්නේ. මම මේ සිද්ධිය ඉවර වුණාට පස්සේ මාස එකහමාරකට පස්සේ මම වෙන තනතුරක් හොබවන්න ගියා ස්වාමිනි. ඊට පස්සේ සිදු වුණා තොරතුරු ගැන මට අවබෝධයක් නැහැ.

ප්‍ර: විලයාත් අල් සෙල්යානි කියලා සංවිධානයක් ගැන ඔබ දන්නවා ද තොරතුරු?

උ: මොන

ප්‍ර: විලයාත් අල් සෙල්යානි

උ: නැහැ.

ප්‍ර: එහෙම දන්නේ නැහැ. අහලා නැහැ?

උ: නැහැ. ඒ සම්බන්ධව මට මතක විදියට ස්වාමිනි මේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ නැවත ප්‍රතිසංවිධානයක් වන සංවිධානයක් ගැන තොරතුරක් ලැබුණා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒක තමයි මං අහන්නේ. ඔබට ඒ කියන්නේ තොරතුරු තියෙනවා. මම නම කිව්වා වැරදි වෙන්න පුළුවන් ඔබට තියෙන තොරතුරු මොනවද කියලා කියන්න බලන්න.

උ: ඒ ගැන මට අවබෝධයක් නැහැ. මම ඒ වන කොට

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු මේ ඉල්හාම් හෝ ජමිල් හෝ කිසිම අවස්ථාවක දී විදේශ ගත වෙලා එහෙම තියෙනව ද?

උ: ජමිල් විදේශගත වෙලා තියෙනවා කියලා තොරතුරු තියෙනවා.

ප්‍ර: කොයි කාලෙ වගේ ද?

උ: ඔහු 2015/16 කාලේ වගේ.

ප්‍ර: කොයි රටේ ද?

උ: ඔස්ට්‍රේලියාවේ තමයි ඔහු පදිංචි වෙලා හිටියේ ස්වාමිනි. ඔස්ට්‍රේලියාවේ ඉඳලා තුර්කි ගියා කියන එක ගැන තොරතුරු තිබුණා.

ප්‍ර: එතකොට තුර්කියේ මොකක් හරි ෆෙටා සංවිධානය හරි මොකක් හරි ත්‍රස්තවාදී සංවිධානයක් මේ පුද්ගලයින්ට උදව් කරා කියලා එහෙම?

උ: ඒ පිළිබඳව තොරතුරු තිබුණෙ නැහැ. මොහු තුර්කියට ගිහින් ආපහු හැරිලා ආව කියන තොරතුරක් තමයි තිබුණේ.

ප්‍ර: තුර්කියට ගිහින් හැරිලා ආවා කියන්නේ මොකක් හින්ද ද දන්නේ නැහැ?

උ: මොහුගේ දෙමව්පියන්ට අසනීප හින්දා ආපහු ආවා කියලා තමයි තිබුණේ.

ප්‍ර: තුර්කියෙන් සිරියාවට යන්න ඕන හින්දා යන්න බැරි වෙලා ආපහු ආවා කියලා?

උ: එහෙම සැකයක් අපිට තිබුණා ස්වාමිනි. ඔහු ගැන සිරියාවට යන්න ගිහිල්ලා ආපහු හැරිලා ආවා කියලා. ඔහු ඒක සාධාරණී කරණය කරලා තිබුණේ ගිහිල්ලා දෙමාපියන්ට අසනිප හින්දා ආවා කියලා.

ප්‍ර: දැන් ඔබ දන්නවද මේ තුර්කියේ පුද්ගලයෝ 40 ක් විතර මෙහෙ ඇවිල්ලා හිටන් ආයෝජන කලාපයේ ආයෝජන වලට සම්බන්ධ වුණා කියලා?

උ: දැනගෙන හිටියේ නැහැ ස්වාමිනි.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: සාක්ෂිකරු මෙම කොමිෂමේම සාමාජික මහත්මයෙක් අහපු ප්‍රශ්නයක් පොඩ්ඩක් ඉස්සරහට ගෙනියන්න කැමති මම. ඔය විලයාත් අස් සෙල්යානි ෆී කියන විලායත් අස් සෙල්යානි ෆී සංවිධානයක් තියෙනව ද ඔබ සඳහන් කර පරිදි නැෂනල් තවුහිද් ජමාත්, ජමාතේ මිල්ලති ඊබ්‍රාහීම් සහ විලායත් අස් සෙල්යානි ෆී කියලා සංවිධාන තිබුණ ද එකිනෙකට සම්බන්ධ සංවිධාන?

උ: ජමාතේ මිල්ලති ඊබ්‍රාහීම් ෆී සෙල්යානි කියලා තමයි මේ ගොල්ලෝ සම්පූර්ණ නම දාලා තිබුණේ. ජමාතේ මිල්ලති ඊබ්‍රාහීම් ෆී සෙල්යානි.

ප්‍ර: ඒ එක සංවිධානයක් ද?

උ: ඒ එක සංවිධානයක්. ඒක තමයි JMI කියන්නේ. ඊට අමතරව මැඩම් සංවිධානයක් ගැන

ප්‍ර: එතකොට ඔබලාගේ බුද්ධි තොරතුරු වලට හසු වී තිබුණාද ශ්‍රී ලංකාවේ විලායත් අස් සෙල්යානි කියලා ISIS සංවිධානයේ Province එකක් Declare කිරීම පිළිබඳව?

උ: අර map එක ඇරෙන්න වෙන මුකුත් අපිට එහෙම තොරතුරු තිබුණෙ නැහැ.

ප්‍ර: එතකොට අනිත් ප්‍රශ්නේ දැන් ඔය දෙමටගොඩ බෝම්බ සිද්ධියේ දී එක්තරා සැකකරුවෙක් පිළිබඳ ඔබලාට වේලාසනින් බුද්ධි තොරතුරු තිබුණනේ ඉල්හාම් ගැන ඉන්ෂාෆ් කියන ඔහුගේ සහෝදරයා පිළිබඳ ඔබලාට බුද්ධි තොරතුරක්?

උ: නැහැ කිසිම තොරතුරක් තිබුණෙ නැහැ. ඔහු ඉතාම අහිංසක පුද්ගලයෙක් විදියට තමයි අපි සාමාන්‍යයෙන් ඔය තොරතුරු හොයන කොට පවුලේ පුද්ගලයන් ගැනත් හොයනවා. ඔහු ගැන එහෙම තොරතුරක් තිබුණෙ නැහැ.

ප්‍ර: එතකොට ඒ ඉන්ෂාෆ් කියන පුද්ගලයාගේ ද දෙමටගොඩ නිවසේ අර බිරිඳ සහ දරුවන් ඔක්කොම බෝම්බයක් පුපුරාගෙන මිය ගියේ?

උ: පුපුරාගත්තා.

ප්‍ර: එතකොට ඔහු අහිංසක පුද්ගලයෙක් කියලා ද ඔබ තාමත් හිතන්නේ?

උ: දැන් හිතන්නේ නැහැ ඒ දවස් වල අපි තොරතුරු හොයන කොට ඔහු බිස්නස් වලට ඇබ්බැහි පුද්ගලයෙක් ඇරෙන්න ඔහුගේ අන්තවාදී කටයුතු ගැන අපිට මුකුත් තොරතුරු තිබුණෙ නැහැ.

ප්‍ර: ඒකෙන් ටිකක් ගම්‍ය වෙනවා තොරතුරු වලත් පොඩි අඩුපාඩුක් තිබුණා කියලා.

උ: අපිට තිබුණා. අපි මේ එතැන ස්වාමිනි මට තව දෙයක් කියන්න තියෙනවා ඒ මේ සම්බන්ධව අපි

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු විනිසුරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: කියන්න යන දේ දැනට ජීවත් වෙන පුද්ගලයෙක් සම්බන්ධව ද?

උ: ඔව්.

ප්‍ර: අත්අඩංගුවේ පත්වෙන පුද්ගලයෙක් ගැන ද?

උ: නැහැ.

ප්‍ර: ඒ තොරතුරු ප්‍රකාශ කිරීමෙන් දැනට තිබෙන විමර්ශන වලට බාධාවක් වෙන්න පුළුවන් ද?

උ: විමර්ශන වලට බාධාවක් නැති වෙන්න පුළුවන් ස්වාමිනි ඒක අපේ රහස්‍ය බාවයට බාධාවක් වෙනවා.

ප්‍ර: තොරතුරු ගත්තු ආකාරය සම්බන්ධයෙන් බාධාවක් වෙනවා?

උ: බාධාවක් වෙනවා.

ප්‍ර: එහෙනම් අපි ලේඛනයක් දෙන්නම් ඒකේ ලියලා දෙන්න පුළුවන් ද?

උ: පුළුවන්. ස්වාමිනි අපිට ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම් සංවිධානය ගැන තොරතුරු ලැබුණට පස්සේ අපි මොවුන් ගැන වැඩිපුර තොරතුරු හොයන්න උපාය දූතයෙක් යෙදෙවුවා. මේ සංවිධානයට infiltrate කරා. එතකොට මේ උපාය දූතයා හරහා හරහා තමයි අපිට පුළුවන් වුණේ ඒ ගොල්ලන්ගේ ඒ සමාජ මාධ්‍ය වලට access එක ගන්න. නැත්නම් ඒ ගොල්ලන් Accept කරේ නැත්නම් වෙන කාටවත් ඒ තොරතුරු බලන්න බැහැ. ඒ හින්දා අපිට එහෙම එකක් කරන්න සිද්ධ වුණා. ඒ වෙනකොටත් අපි ඒ උපාය දූතයා උපරිම තත්ත්වයට ඔහුව ඇවිල්ලා විශ්වාස කරන තත්ත්වයටම පත් කරලා තොරතුරු ගොඩක් ලැබුණා. ඒ හරහා තමා අපි දැනගත්තේ මොවුන්ගේ අවශ්‍යතාවයක් තිබුණෙ නැහැ කියලා ශ්‍රී ලංකාව තුළ මුකුත් කරන්න. නමුත් සිරියාවට හිජ්‍රත් කරන්න යන්න ඕන කියන එක ගැන. පස්සේ අපිට මේ උපාය දූතයා හරහා අපිට දැනගන්න ලැබුණා සංවිධානය දෙකඩ වුණා කියලා. ලංකාව තුළ අන්තවාදී ක්‍රියාකාරකම් කරන්නයි ලංකාවෙන් පිට අන්තවාදී ක්‍රියාකාරකම් කරන්නයි කියලා කොටස් දෙකක් ඉන්නවා කියලා. ඒ ලංකාවෙන් තුළ අන්තවාදී ක්‍රියාකාරකම් කරන්න ඕන කියන මතේ හිටපු දෙන්නෙක් තමයි ජමිල්යි , ඉල්හාම්යි, මේ දෙන්නා. මේ දෙන්නට කොහෙන් හරි තොරතුරක් හම්බුවෙලා තිබුණා මේ අපෙන් උපාය දූතයෙක් ඒ ගොල්ලොන්ගේ සංවිධානය තුළ ඉන්නවා කියන තොරතුර ලැබිලා ඒ හරහා මේ ගොල්ලන් රහස්‍ය විදියට මේ දේවල් කරගෙන යන්න පෙළඹුණා. එතකොට යම් අවස්ථාවක දී අපිට තොරතුර ලැබීමේ ප්‍රශ්නයක් ඇති වුණා මේ අර ගොල්ලන් රහස්‍ය භාවය උපරිම විදියට රකින්න පටන් ගත්තට පස්සේ. ඒක හින්දා තමා අපිට තොරතුරු නොලැබෙන්න ප්‍රධානම හේතුව වුණේ ස්වාමිනි.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: Threema App හරි එකට ඔබට යන්නට බැරි වුණා ද?

උ: යන්න බැරි වුණා.

****

<u>ගරු අදිකාරි මැතිණිය.</u>

ප්‍ර: හරි ඔබ මගේ ප්‍රශ්නයට පිළිතුරු දුන්නා. තව එක ප්‍රශ්නයක් පමණක් මම ඔබගෙන් අහන්නම්. ඔබ මෙම කොමිෂමේ පොලිස් ඒකකයට දුන්න ප්‍රකාශයේ තියෙනවා ඔබ මින්නේරියේ සහ මඩකලපුව ප්‍රදේශවල බුද්ධි අංශයේ රාජකාරි කළා කියලා?

උ: ඔව්.

ප්‍ර: ඒ මොන වර්ෂ වලද?

උ: 2002 වගේ මං වැඩ කරලා තියෙනවා මින්නේරිය area එකේ . මඩකලපුවේ

ප්‍ර: 2002?

උ: 2002, 2003

ප්‍ර: 2002, 2003 . එතකොට ඒ කාලයේ නැගෙනහිර පළාතේ විශේෂයෙන් ඔය කාත්තන්කුඩිය ප්‍රදේශයේ තිබුණෙ නැද්ද අන්තවාදය ම නෙවෙයි මුස්ලිම් වර්ග දෙකක් අතර ඔය සූෆි මුස්ලිම්වරුන් සහ තවත් කණ්ඩායම් අතර මතවාදි ගැටුම් ?

උ: එහෙම මම එතකොට දෙක ලුතිනර්වරයෙක් විදියට මගේ රැකියාවේ සිමාවන් තිබුණා. ඒ කියන්නේ මට අදාළ කොටසක් කරන්න ඒ ටික විතරයි මම යෙදිලා හිටියේ මැඩම් එම තොරතුරු තිබුණ කියලා දැන ගෙන හිටියේ නැහැ.

ප්‍ර: ඔබ සඳහන් කරා ඉස්ලාම් ආගමික අන්තවාදය මේ රට තුළ පැතිරවීම සහරාන්ලාගේ සංවිධානය කරා සහ ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම් සංවිධානය හිජ්රත් කරලා සිරියාවට ගිහිල්ලා ඉස්ලාම් රාජ්‍යය සඳහා යුධ කිරීම තමයි අරමුණ වුණේ කියලා. එතකොට

උ: සහරාන්ගේ

ප්‍ර: සහරාන් නෙවෙයි මම කිව්වේ ඔය අනිත් එක්කෙනා

උ: ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම්

ප්‍ර: ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම්යේ නායකයගේ නම කිව්වනේ

උ: ඔව්.

ප්‍ර: එතකොට ඔබ සඳහන් කරන විදියට ඔය ඉල්හාම් සහ අනිත් පුද්ගලයාත් ඒ සංවිධානයටනෙ සම්බන්ධ නේද,ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම් එකට?

උ: ඔව්.

Presidential Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: එතකොට මේ සහරාන්ගේ මේ ලංකාව තුළ අන්තවාදය ආගමික අන්තවාදය ව්‍යාප්ත කිරීම කියන එක ඇතුළේ මොනව ද තිබුණේ, ආගමික අන්තවාදය කියන එක ඇතුලේ මොනව ද තිබුණේ. ඒ කියන්නේ මුස්ලිම්වරුන් කුරානය ඇදහීම් පිළිබඳව ප්‍රශ්න තිබුණ ද, එහෙම නැත්නම් එවැනි මුස්ලිම්වරුන් හදිස් අනුගමනය කරන්නේ නැති එක ගැන ප්‍රශ්න තිබුණ ද, ඊට පස්සේ මුස්ලිම් රාජ්‍යය ගැන කතා කළාද ජිහාත් ගැන කතා කරාද සහරාන් එවැනි දේවල් තිබුණ ද සහරාන්ගේ?

උ: ඔහුගේ ප්‍රකාශ වල තිබුණා. කාෆිර්වරු ගැන ඒ කියන්නේ මුස්ලිම්වරු නොවන පුද්ගලයන් ගැන තිබුණා . එතකොට ජිහාත් ගැන කතා කරලා තිබුණා . ඒ පුද්ගලයා කතා කරලා තිබුණා. අන්තවාදී ඒ ප්‍රකාශ තිබුණා.

ප්‍ර: එතකොට දැන් ඔය සඳහන් කරපු හිජ්රත් කරන එක දැන් අපි හිතමුකෝ නැගෙනහිර පළාතේ ඉන්න සහරාන් වැනි මුස්ලිම් කණ්ඩායමක් ඇවිල්ලා කොළඹට ප්‍රහාරයක් එල්ල කරාම ඒක හිජ්රත් කිරීමක් වෙන්නෙ නැද්ද?

උ: හිජ්රත් වෙන්නේ නැහැ.

ප්‍ර: හිද්ජත් කියන්නේ අර එක දේශයකින් ඉඳලා තව දේශයකට යනවා. ගිහිල්ලා ඒ දේශයේ ඉස්ලාම් රාජ්‍යය සඳහා යුද්ධ කරනවා?

උ: ගිහිල්ලා.

****

<u>**ගරු විනිසුරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.**</u>

ප්‍ර: ඔබගෙන් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයයි. ඔබ කියන පරිදි ජමාතේ මිල්ලතී ඊබ්‍රාහීම් සංවිධානය දෙකකට බෙදෙන්නේ මතවාදයක් හින්දා.

උ: මතවාදයක් හින්දා ස්වාමිනි.

ප්‍ර: එක මතවාදයක් තමා ඉස්ලාමීය අන්තවාදී කටයුතු ලංකාව තුළ කරන්න ඕන කියන එක. එම මතවාදයේ හිටපු තැනැත්තන් කවුද කියලා ඔබගේ අංශයට වාර්තා වුණාද?

උ: ඔව්.

ප්‍ර: කවුද ඒ තැනැත්තන් ආපහු කියන්න ?

උ: ජමීල් සහ ඉල්හාම් කියන පුද්ගලයින්.

ප්‍ර: ජමිල් සහ

උ: ඉල්හාම් කියන පුද්ගලයත්.

ප්‍ර: ඒ දෙන්න විතර ද? ඉන්ෂාෆ් ඉන්තිකාබ් කියලා පුද්ගලයෙක් හිටිය ද?

උ: ඉන්ෂාන් ඉන්තිකාබ් කියන පුද්ගලයෙක් හිටියා JMI එකේ . ඒ වුණාට එයා අරම අන්තවාදී අදහස් දරණ පුද්ගලයෙක් කියලා අපිට වාර්තා වෙලා තිබුණේ නැහැ. අර කොට්ඨාශයේ ඉන්නවා කියලා වාර්තා වෙලා තිබුණේ නැහැ ස්වාමිනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ ලංකාව තුළ අන්තවාදී ක්‍රියාකාරකම් කරන්න ඕන කියලා වාර්තා වුණේ නැහැ?

උ: වාර්තා වෙලා තිබුණෙ නැහැ.

ප්‍ර: ලංකාව තුළ ඒ වගේ අන්තවාදී ක්‍රියාකාරකම් සිදු නොකළ යුතුයි කියන කණ්ඩායමේ නායකයා කවුද?

උ: උමයර් මොහොමඩ්.

ප්‍ර: උමාර් මොහොමඩ්. ඔබගේ මතකයේ හැටියට මේ ජමිල් ලංකාව තුළ ISIS සංවිධානයට සම්බන්ධ කණ්ඩායමක් හැදීමේ ක්‍රියාවලියක යෙදෙ වුණා කියලා ඔබගේ අංශයට වාර්තා වුණේ නැද්ද?

උ: වාර්තා වෙලා තිබුණේ නැහැ.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥ වරයාට ලබා දෙමි.

****

<u>ජනාධිපති නීතිඥ ශමිල් ප්‍රනාන්දු මහතා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබතුමාට කියන්න පුළුවන් ද ඔබතුමාගේ විමර්ශන කටයුතු වලදී ඇයි මේ කතෝලික පල්ලි ඉලක්ක කරගෙන මේ ප්‍රහාර සිදු කෙරුවේ කියලා යම් හේතුවක් දෙන්න පුළුවන් ද?

උ: අර පරීක්ෂණ කටයුතු හරහා කියන්න බැහැ. මගේ පෞද්ගලික මතයක් නම් ප්‍රකාශ කරන්න පුළුවන්. පෞද්ගලික මතය සමහර විට New Zealand වල සිද්ධ වෙච්ච ප්‍රහාරයට පළිගැනීමක් විදියට හෝ ISIS මතවාදය හැම වෙලේම කතෝලික අයවලුන්ට එරෙහිව තියෙන හින්දා ඒ වගේ ප්‍රහාරයක් එල්ල කරන්න ඇති කියලා මතයේ මගේ පෞද්ගලික මතයක් විදියට කියන්න පුළුවන්. ඒ ඇරෙන්න පරීක්ෂණ වලදී අපිට හොයාගන්න බැරි වුණා මේ අපිට තොරතුරක් ලැබුණේ නැහැ හේතුව මොකද්ද කියලා.

****

<u>ගරු විනිසුරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ කොමිෂන් සභාවට සාක්ෂිලබා දීමෙන් කොමිෂන් සභාවේ කටයුතු වලට කරන ලද දායකත්වය සහ සහයෝගය සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ ස්තූතිය සාක්ෂිකරුට පළ කරනවා.

ප්‍ර: ඊට අමතරව කියන්න මොනව හරි තියෙනව ද?

උ: මුකුත් නැහැ ස්වාමිනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නියෝගය

සාක්ෂිකරුට මේ අවස්ථාවේ දී කොමිෂන් සභාව ඉදිරියේ ලබා දුන් සාක්ෂිය හේතුවෙන් 2015 අංක 04 දරණ අපරාධයක විත්දිතයන් හා සාකිෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනතේ 25(4) උප වගන්තිය ප්‍රකාරව සාක්ෂිකරුට හිමි විය යුතු සියළු අයිතින් සහ වරප්‍රසාදයන් ඔහුට ලබා දෙන ලෙසට අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරමි.

සාක්ෂිකරු මුදා හරී.
වේලාව:ප.ව. 08.30

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.05.28 වේලාව: ප.ව.08.30 යි.
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-
(පැමිණියේ නැත)

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා සමඟ නීතිඥ රවිෂානි පීරිස් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	**:**	**381**
නම	**:**	**ජබ්බර්දීන් මොහොමඩ් ජවුසික්**
වයස	**:**	**අවුරුදු 30**
ආගම	**:**	**ඉස්ලාම්**
රැකියාව	**:**	**කෝප්‍රල්, යුධ හමුදා සන්නද්ධ බලකාය**
ලිපිනය	**:**	**ඔරුගොඩ වත්ත, විශේෂ ආරක්ෂක කණ්ඩායම**

සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ ශ්‍රී ලංකා යුධ හමුදාවට අනුයුක්තව සේවය කරන කෝප්‍රල්වරයෙක් වශයෙන් සේවය කරන්නේ?

පි : ඔව්.

ප්‍ර : 2019/04/21 පාස්කු ප්‍රහාරය ලෙස හඳුන්වන මේ ප්‍රසිද්ධ ප්‍රහාරයෙන් ලංකාවේ විවිධ ස්ථානවල බෝම්බ පිපිරීම් සිදු වුණා හරිද?

පි : හරි.

ප්‍ර : ඒ පිපිරීම් සිදු වුණාට පසුව ඔබට ඔබගේ ඉහළ නිලධාරීන්ගේ උපදෙස් මත කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයට ගියාද මොකක්ද වෙලා තියෙන්නේ කියලා බලන්න?

පි : ගියා ස්වාමිනි.

ප්‍ර : සාක්ෂිකරු ඉන් අනතුරුව ඔබ ඔබගේ ඉහළ නිලධාරීවරයෙක් සමඟ ජමිල් මොහොමඩ් නැත්නම් මොහොමඩ් ජමිල් කියන පුද්ගලයාගේ නිවසට ගියාද?

පි : ගියා ස්වාමිනි.

ප්‍ර : මේ තැනැත්තා පදිංචි නිවස දැන ගෙන සිටියේ ඔබද නැත්නම් වෙනත් නිලධාරීවරයෙක්ද?

පි : මම දැන ගෙන හිටියා ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ එම නිලධාරීවරුන්ට පෙන්වා සිටියේ ජමිල්ගේ බිරිඳගේ පියාගේ නිවස? ජමිල් පදිංචි වෙලා සිටින්න පුළුවන් කියන නිවසද?

පි : ගොඩාක් විස්තරාත්මකව කිව්වට කමක් නැද්ද.

ප්‍ර : කියන්න.

පි : ස්වාමිනි ජමිල් ඉස්සරොම පදිංචි වෙලා හිටියේ ස්වාමිනි වෙනත් නිවසක. ආවේෂණ රාජකාරිය සිදු කරපු යම් අවස්ථාවකදී අපිට දැන ගන්නට ලැබුණා ඔහු බිරිඳට අයත් තවත් නිවසක පදිංචියට ගොස් සිටි බව. මා සමඟ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය

Presidential Secretary's Copy
FAIR COMMENT — BY JEZEEM —

නියෝජනය කරමින් පැමිණ සිටි නිලධාරීන් පිරිස එම නිවස හඳුනා ගැනීමට අපහසු වීම හේතුවෙන් මා හට දුරකථන ඇමතුමක් ලබා දුන්නා මෙම නිවස අප හට පෙන්වන්න කියලා. ඒ වගේම ස්වාමිනි අපි ගිහිල්ලා ජමිල්ගේ බිරිඳගේ නිවස අපි සමඟ පැමිණි නිලධාරීලාට අපි පෙන්නුවා ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : එච්චරයි ?

පි : එච්චරයි ස්වාමිනි.

ප්‍ර : කලබල වෙන්නේ නැතුව හොඳට ප්‍රශ්නේ අහගෙන ඉඳලා උත්තර දෙන්න.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : මීට අමතරව ඔබ දැනන් සිටියාද මේ ජමිල් මොහොමඩ් පදිංචි නිවසට අමතරව දෙහිවල පදිංචි අක්කම් සහ වැල්ලවත්තේ පදිංචි ඉමාඩ් යන දෙදෙනා පදිංචි වෙලා ඉන්නේ කොහේද කියලා?

පි : දැන ගෙන සිටියා ස්වාමිනි.

ප්‍ර : දැන් ඒ දෙන්නා පදිංචි නිවසට ඔබ ගියාද මේ 2019/04/21?

පි : 04/21 වන දින ස්වාමිනි මම ඒ නිවෙස් දෙකටම ගියේ නෑ ස්වාමිනි.

ප්‍ර : ඇයි ඔබ ගියේ නැත්තේ?

පි : මා හට මාගේ ඉහළ නිලධාරීන්ගෙන් උපදෙස් හම්බ වුණේ ජමිල් නැමැත්තාගේ නිවස පෙන්වන ලෙසට. අනිකුත් කිසිවෙකු කිසිම පුද්ගලයෙකුගේ නිවසක් පෙන්වන ලෙසටවත් ඒ පුද්ගලයෝ පිළිබඳ කිසිම විස්තරයක්වත් මගෙන් අහලා තිබුණේ නෑ ස්වාමිනි.

ප්‍ර : නියෝග ලැබුණේ නෑ?

පි : නියෝග ලැබුණේ නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබ දන්නවාද මේ ජමිල්ගේ නිවසට ගියාම අමීර් කියන පුද්ගලයෙක් සමඟ ප්‍රථමයෙන් දුරකථනයෙන් Telephone එකෙන් මේ යුධ හමුදා නිලධාරීන් සම්බන්ධ වුණා කියලා?

පි : අපි ඇත්තටම ස්වාමිනි දෙවතාවක් එම නිවසට ගියා.

ප්‍ර : ඔව්.

පි : ප්‍රථම වතාව ගිය අවස්ථාවේ දී ස්වාමිනි ඇත්තටම අපි කොච්චිකඩේ සිටි අවස්ථාවේදී තමයි යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය නියෝජනය කරන නිලධාරී පිරිස අපිට දුරකථනයෙන් සම්බන්ධ වුණේ ස්වාමිනි. එම ස්ථානයේ සිට අපි ප්‍රථමයෙන්ම

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

යන විට ස්වාමිනි අපි ආරක්ෂක අමාත්‍යාංශයේ හෝ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයෙන් ආපු බව අපි ඒ කිසිම පුද්ගලයෙකුට පැවසුවේ නෑ ස්වාමිනි. ජමිල් අඳුරන පුද්ගලයෙකු බව තමා අපි මුලින්ම පැවසුවේ. මොකද කලබලකාරී තත්ත්වයක් තමා ස්වාමිනි එදා උදෑසන ඉඳන් මේ ලංකාවේ තිබුණේ. ඒත් එක්කම අපි විමර්ශනය කළා ජමිල් නැමැති පුද්ගලයා ඉන්නවාද කියලා. එතකොට ගෙදර සිටිය පුද්ගලයෝ කිසි කෙනෙක් අපි අඳුරන්නේ නෑ ස්වාමිනි. මොකද මීට පෙර ඒ මිනිස්සු අපි දැකලා නෑ. ඒ වගේම ජමිල්ගේ බිරිඳගේ සහෝදරයෙකු කියලා අපිට පස්සේ දැන ගන්න ලැබුණා. එම පුද්ගලයා අපිට කිව්වා දින තුනකට ජමාත් එකක් ඒ කියන්නේ ඉස්ලාම් ආගම තුළ දින තුනක් දින හතක් ජමාත් එක යනවා ස්වාමිනි එහෙම ගිහිල්ලා ඉන්නේ. දින දෙකක් වෙනවා ගිහිල්ලා. නමුත් phone එක වැඩ කරන්නේ නෑ කියලා කිව්වා ස්වාමිනි. මා සමඟ පැමිණි නිලධාරීන් එම ස්ථානයෙන් මාත් එක්කම පිටව පැමිණ නැවත බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයෙන් දුන් උපදෙස් පරිදි නැවත අපි ඒ නිවසට ගිහිල්ලා යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයෙන් මෙහෙම ආවේ කියලා අපි ඒ ගොල්ලොන්ට කතා කළා. කතා කරපු වේලාවේ මා සමඟ පැමිණි නිලධාරියා අමීර් නැමැති පුද්ගලයාට දුරකථනයෙන් සම්බන්ධ වුණා.

ප : ඔව්. ඒ අමීර් කියන පුද්ගලයාගේ දුරකථන අංකය පසු අවස්ථාවකදී මේ ජමිල් මොහොමඩ්ගේ බිරිඳගේ පියාගේ ගෙදර නෙවෙයි වෙන අවස්ථාවලදී ඔබ සමඟ ගිය නිලධාරීන් දුරකථනයෙන් සම්බන්ධ වුණාද?

පි : එක් වරක් අපි ජමිල්ගේ නිවසින් දෙවන වතාවට ගොස් පැමිණ සිටි අවස්ථාවේදී ස්වාමිනි දෙමටගොඩ මහවිල උද්‍යානයේ බෝම්බ පිපිරීමක් සිදු වෙලා තිබෙන බවට අපිට තොරතුරු ලැබුණා. ඒත් එක්කම අපි එම ස්ථානයට ගිහිල්ලා පැයක් එක හමාරක් විතර හරියට ඇත්තටම මතක නෑ ස්වාමිනි පැය ගණන් වේලාව එතනින් පිටත් වෙලා අපි කෙළින්ම ගියේ ස්වාමිනි මේ අමීර් නැමැත්තා හමු වීමට. එතකොට ඒ යන ගමන් මහතොටේදී දුරකථනයෙන් සම්බන්ධ වුණා ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප : දැන් ඔබ අහන ප්‍රශ්නවලට උත්තර දෙන කොට පුද්ගලයින්ගේ නම් කියන්න එපා. ඒ කියන්නේ ඔබගේ හමුදාවේ සේවය කරන පුද්ගලයින්ගේ නම් කියන්න එපා. සිවිල් පුද්ගලයින්ගේ නම්

FAIR COMMENT BY JEZEEM

ඇහුවොත් විතරක් කියන්න. ඔබ මේ ජමිල් මොහොමඩ් කියන තැනැත්තාව ඉස්සෙල්ලාම ආවේෂණය කරන්න පටන් ගන්නේ කොයි කාලේද?

පි : 2016 දෙසැම්බර් , 2017 ජනවාරි වගේ කාලයේ සිට ආවේක්ෂණය කරනවා ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබගේ සේවයේ යම් කිසි තැනැත්තෙකු ආවේෂණය කරන්න ඔබට පුළුවන් වෙන්නේ ඔබටම තනියම පුළුවන්ද නැත්නම් ඔබට යම් නියෝගයක් දෙන්න ඕනීද කවුරුහරි?

පි : එහෙම තනියම කිරීමට හැකියාවක් නෑ ස්වාමිනි. ඉහළ නිළධාරී කෙනෙක්ගෙන් අනිවාර්යයෙන්ම උපදෙසක් ලැබුණායින් පස්සේ තමයි ස්වාමිනි අපි රාජකාරිය ආවේෂණය කරන්නේ.

ප්‍ර : එතකොට මේ ජමිල් මොහොමඩ්ව ආවේෂණය කරන්න කියලා ඔබට නියෝග ලබා දෙන්නේ කවුද? නම කියන්න එපා තනතුර කියන්න?

පි : අප භාරව ඒ දිනවල සිටියේ ස්වාමිනි මේජර්වරයෙකු. එතුමාගෙන් ලබා දුන් උපදෙස් පරිදි තමා ස්වාමිනි අපි රාජකාරිය සිදු කළේ.

ප්‍ර : ඒ මේජර්වරයා කියලා ඔබ සඳහන් කරන්නේ මේ ආගමික අන්තවාදී අංශය භාරව හිටපු තැනැත්තාද නැත්නම් වෙන තැනැත්තෙක්ද මොකක්ද ඒ අංශය භාරව හිටියේ? ඒ මේජර් යම් අංශයක් භාරව හිටියාද?

පි : මම දැනට සේවය කරන ස්ථානයේ එදින අණදෙන නිලධාරී වශයෙන් සිටි.

ප්‍ර : Commanding officer හැටියට සිටි නිලධාරීවරයා?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබට ඒ විදිහට ඒ ජමිල්ව ආවේෂණය කරන්න කියලා නියෝග දෙන අවස්ථාවේදී ජමිල්ගේ ඉන්න ස්ථානයේ තොරතුරුත් දෙනවාද නැත්නම් ඔබ ඒ ටික හොයා ගන්න ඕනීද?

පි : අපට බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තොරතුරු යම් කිසි පුද්ගලයෙක්ගේ තොරතුරු ලබා දෙන විට අපට ලිපිනය හා ඔහු පිළිබඳ හැකි නම් ඡායාරූපයකුත් ලබා දෙනවා ස්වාමිනි.

ප්‍ර : එතකොට තමයි ඔබ ඒ කාර්යය පටන් ගන්නේ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : එතකොට මේ ඊට පස්සේ ඔබ කියපු ඉමාඩ් කියපු පුද්ගලයා ඉමාඩ්ද ඉමාම්ද ?

පි : ඉමාඩ් ස්වාමිනි.

ප්‍ර : ඉමාඩ්ව ඔබ ආවේෂණය කරන්න පටන් ගන්නේ කොයි කාලේද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඉමාඩ් ආවේෂණය කිරීමට ස්වාමිනි මම දෙවතාවක් විතර ගිහින් තියෙනවා. 2017 වර්ෂයේ ස්වාමිනි.

ප්‍ර : එතකොට අක්කම් දෙහිවල පදිංචි අක්කම් ?

පි : අහක්කම් පිළිබඳ ස්වාමිනි කිහිප වතාවක්ම ආවේෂණ රාජකාරී සිදු කරලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : කොයි කාලේද පටන් ගත්තේ?

පි : 2017 ස්වාමිනි.

ප්‍ර : දැන් ඒ කියන්නේ ඉමාඩුයි අක්කම්ද?

පි : අහක්කම් ස්වාමිනි.

ප්‍ර : අක්කම්. ඉමාඩුයි අක්කමුයි ඔබ ආවේෂණය කරන්න පටන් ගන්නේ ඒ අහක්කම් කියන තැනැත්තයි ඉමාඩ් කියන තැනැත්තයි ආවේෂණය කරන්න පටන් ගන්නේ එකම කාල සීමාවේද?

පි : එකම කාල සීමාවේ ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබට සාමාන්‍යයෙන් ඔබගේ අණදෙන නිලධාරියා යම්කිසි තැනැත්තෙකු ආවේෂණය කරන්න කියන කොට ඒ කරන්න හේතුවත් දන්වනවාද?

පි : විශේෂයෙන්ම හේතුවක් දන්වන්නේ නෑ ස්වාමිනි. නමුත් අනිවාර්යයෙන්ම සිදු කළ යුතු රාජකාරියක් නම් අපට හේතුව ඉදිරිපත් කරනවා. මෙම හේතුව නිසා තමයි මෙම පුද්ගලයාව අපි ආවේෂණය කළ යුතු බව.

ප්‍ර : එතකොට මේ ඉමාඩ්වයි අහක්කම්වයි ආවේෂණය කරන්න කියන කොට ඔබගේ අණදෙන නිලධාරියා ඔවුන් ආවේෂණය කරන්න හේතුව කිව්වාද?

පි : යම් අන්තවාදී අදහස් දරන පුද්ගලයින් බවට අපිට කියා සිටියා ස්වාමිනි.

ප්‍ර : එච්චරයිද?

පි : එච්චරයි ස්වාමිනි.

ප්‍ර : මොන විදිහේ අන්තවාදී අදහස්ද කියලා කිව්වේ නැද්ද?

පි : එහෙම දෙයක් අපිට කිව්වේ නෑ ස්වාමිනි.

ප්‍ර : එතකොට මේ ජමිල්ව ආවේෂණය කරන්න ඔබට නියෝගය ලැබෙන කොට ඒකට හේතුවක් කිව්වද?

පි : ජමිලුත් මෙම පුද්ගලයෝ සමඟ සබඳතා පවත්වන පුද්ගලයෙක් බවට කියා සිටි අතර ස්වාමිනි හේතුවක් ඉදිරිපත් කළේ නෑ ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ කියන හැටියට ජමිල්ව ආවේෂණය කරන්නේ 2016 දෙසැම්බර් මාසේ නැත්නම් 2017 ජනවාරි මාසේ? මේ ඉමාඩ්වයි අහක්කම්වයි ආවේෂණය කරන්නේ 2017 දී?

President Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

පි : සමාවෙන්න ස්වාමිනි ප්‍රථමයෙන්ම අසා සිටියේ ජමිල්ගේ නම මගෙන්. ජමිල් කියන පුද්ගලයාට ප්‍රථමයෙන්ම ඉමාඩ් කියන පුද්ගලයා තමා ස්වාමිනි මුලින්ම හඳුනා ගන්නේ අපි.

ප්‍ර : ඊට පස්සේ?

පි : ඒ ඉමාඩ් කියන පුද්ගලයාගේ මම හිතන විදිහට යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් කරන ලද පරීක්ෂණවලින් හෙළි වෙලා ඇති ස්වාමිනි ඒ පුද්ගලයා සමඟ සබඳතා තියෙන පුද්ගලයින්. ඊට පසුව අපිට ලබා දුන් උපදෙස් පරිදි තමා ස්වාමිනි ජමිල්, අහක්කම් නැමැති පුද්ගලයෝ ආවේෂණය කිරීමට පටන් ගන්නේ.

ප්‍ර : එතකොට ඔබ කියන හැටියට ජමිල්වයි ඉමාඩ්වයි අහක්කම්වයි ඔබ 2016 දෙසැම්බර් මාසේ විතර ඉඳලා ආවේෂණය කරනවා?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : ඒක නිවැරදිද?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : එතකොට මට කියන්න මේ තුන්දෙනාගෙන් කවුද ඉල්හාම් අහමඩ් සමඟ සම්බන්ධතාවයක් පැවැත්වුයේ?

පි : මම ආවේෂණය කරපු කාලය තුළ ස්වාමිනි එක දිගටම ආවේෂණය සිදු කළේ නෑ. අපිට නියෝගය දෙන කොට විතරයි අපි ආවේෂණ රාජකාරිය සිදු කළේ. ඒ සිදු කරපු කිසිම අවස්ථාවකදී අපිත් සමඟ තවත් අපේ සෙබළුන් රාජකාරිවල යොදවලා තිබුණා. එම පුද්ගලයෝ ඉල් හාම් පිළිබඳ ආවේෂණ රාජකාරියක් කළාද මේ ගොල්ලන් සම්බන්ධයෙන් හිටියාද කියලා දැන ගෙන හිටියාද කියන එක ස්වාමිනි ඇත්තටම මම දන්නේ නෑ. මම දැනුවත්ව මේ පුද්ගලයෝ තුන්දෙනා අදාළ ඉල්හාම් නැමැති පුද්ගලයාගේ නිවසට ගිය බවත් ඒ පුද්ගලයා එක්ක සම්බන්ධතා තිබූ බවත් මම දන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : එතකොට ජමිල් මොහොමඩ් ඉල්හාම් අහමඩ් එක්ක සම්බන්ධතාවයක් තිබ්බා කියලා ඔබ දන්නේ නෑ? ආවේෂණය කරලා නැද්ද?

පි : මම ආවේෂණය කරපු කිසිම අවස්ථාවකදී ජමිල් නැමැත්තා ඔහුගේ ගෙදරට ගියපු බව ස්වාමිනි මම දන්නේ නෑ.

ප්‍ර : එතකොට ඉල්හාම් අහමඩ්ගේ ගෙදර ඔබ ආවේෂණය කරලා නැද්ද කවදාවත්?

පි : ඉල්හාම් නැමැත්තාගේ ගෙදර බෝම්බ ප්‍රහාරයෙන් පසුව දෙවන ඒ කියන්නේ එම නිවසේ ස්වාමිනි පිපිරීම් දෙකක් සිදු වුණා. දෙවන පිපිරීම් සිදු වෙන කොට අපි අදාළ ස්ථානයේ හිටියේ. ඊට පසුව

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

යම් යම් රාජකාරීවලට ගියා මිසක් ඊට ප්‍රථමයෙන් ස්වාමිනි මම දන්න තරමට මම ඉල්හාම් ගැන රාජකාරියක් කරලා නෑ ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ හස්තූන් ගැන ආවේෂණ රාජකාරී කරලා තියෙනවාද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : මුබාරක් සම්බන්ධයෙන් ආවේෂණ රාජකාරී කරලා තියෙනවාද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : ඉම්ෂාෆ් අහමඩ් සම්බන්ධයෙන් ආවේෂණ රාජකාරී කරලා තියෙනවාද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : සහරාන් හෂීම් සම්බන්ධයෙන් ආවේෂණ රාජකාරී කරලා තියෙනවාද?

පි : ආවේෂණ රාජකාරියක් සිදු කරලා නෑ ස්වාමිනි. එම පුද්ගලයා සිටින ස්ථානයන් පිළිබඳ යම් යම් තොරතුරුකරුවන්ගෙන් විමසලා තියෙනවා. නමුත් යම් යම් අවස්ථාවලදී ඔවුන් පවසලා තිබූ එම ආකාරයටම අපගේ අණදෙන නිලධාරීතුමාට ඒ විදිහටම අපි කියලා තියෙනවා මෙම තොරතුරුකරුවාගෙන් මෙම විදිහට පණිවිඩේ හම්බ වුණා කියලා. නමුත් අදාළ ස්ථානයේ ඉන්නවා කියලා දැකලා තියෙනවා කියලා කිසිම පුද්ගලයෙක් අපිට කියලා නෑ ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ විදිහට සහරාන් හෂීම් සම්බන්ධයෙන් තොරතුරු සොයන්න කියලා ඔබට පළවෙනියෙන්ම කියන්නේ කොයි කාලේද?

පි : මට මතක විදිහට ස්වාමිනි මාවනැල්ලේ බුදුපිළිම හානි සිදු කරපු කාලයෙන් පසුව ස්වාමිනි.

ප්‍ර : ඊට පෙර සහරාන් හෂීම් සම්බන්ධයෙන් ආවේෂණ රාජකාරි කරලා නැද්ද?

පි : මම සිදු කරලා නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබ ඔය අංශයේ කොච්චර කාලයක් සේවය කරනවාද?

පි : දැනට වසර දහය හමාරක් සේවය කරනවා ස්වාමිනි.

ප්‍ර : දැන් ඔය කාල සීමාව තුළ ඔබ ආගමික අන්තවාදය සම්බන්ධයෙන් කොපමණ කාලයක් රාජකාරී කරලා තියෙනවාද?

පි : මම කොළඹ ප්‍රදේශයට පැමිණියේ ස්වාමිනි 2013 වර්ෂයේ. මීට ප්‍රථම වව්නියාව ප්‍රදේශයේ තමයි රාජකාරී කළේ ස්වාමිනි. 2013 වර්ෂයෙන් පැමිණ ස්වාමිනි 2016 දෙසැම්බර් හෝ 2017 ජනවාරි සිට තමා ස්වාමිනි අන්තවාදය පිළිබඳ රාජකාරියක යොමු වෙලා තිබුණේ.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : එතකොට ඔබ ඒ කාලේ ආවේෂණ රාජකාරිය කෙරුවායින් පස්සේ මේ පාස්කු දින ප්‍රහාරයෙන් මිය ගිය කවුරු හරි සම්බන්ධයෙන් ඔබ ආවේෂණ රාජකාරි කරලා තියෙනවාද?

පි : බෝම්බකරුවන්.

ප්‍ර : බෝම්බකරුවන් සම්බන්ධයෙන්?

පි : බෝම්බකරුවන් පිළිබඳවද ස්වාමිනි.

ප්‍ර : ඔව්.

පි : අදාළ අර පුද්ගලයෝ තිදෙනා හැර වෙනත් පුද්ගලයෙකු තවත් එක් පුද්ගලයෙකු ආවේෂණ රාජකාරීයක් සිදු කරලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : කවුරු සම්බන්ධයෙන්ද?

පි : මට්ටක්කුලිය ප්‍රදේශයේ නම මතක විදිහට ඉම්ෂාෆ්, ඉන්ෆාස් නොහොත් ඉන්ෂාෆ් .

ප්‍ර : ඉන්ෂාෆ් අහමඩ්ද?

පි : සම්පූර්ණ නම මතක නෑ ස්වාමිනි. මොකද පොඩි කාලයක් අපිව ඒ රාජකාරියේ යෙදවලා තිබ්බේ ඉන්ෂාෆ් නොහොත් ඉන්ෆාස්.

ප්‍ර : ඉන්ෆාෂ් නොහොත් ඉන්ෆාෂ්. ඔහු දැන් අත්අඩංගුවේද ඉන්නේ?

පි : දන්න තරමට අත්අඩංගුවේ ඉන්නේ ස්වාමිනි.

ප්‍ර : ඔබ කිව්වා මේ තුන්දෙනෙක් ඇරෙන්න වෙන කවුරුත් මේ ගැන මේවා කෙරුවේ නෑ කියලා. ඒ කියන්නේ මම අහන්නේ පාස්කු ප්‍රහාරයෙන් මිය ගිය ස්වයං ඝාතකයන් සම්බන්ධයෙන් කවුරු සම්බන්ධයෙන්ද ඔබ ආවේෂණය කෙරුවේ? ඒ කියන්නේ suicide කරපු අයගෙන් කවුරු සම්බන්ධයෙන්ද ඔබ ආවේෂණය කළේ?

පි : ඒ පුද්ගලයෝ ජමීල් හැර වෙන පුද්ගලයෙක් ආවේෂණය කළේ නෑ ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබගේ ආවේෂණ රාජකාරිවලට අනුව මේ කොළඹ ප්‍රදේශයේනේ ඔබ කිව්වේ ඔබ සේවයේ යෙදිලා ඉන්නවා කියලා?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : මේ ආගමික අන්තවාදයේ යෙදී ඉන්න පුද්ගලයින් කොපමණ විතර ඔබ ආවේෂණය කරලා තියෙනවාද?

පි : අපි ප්‍රධාන වශයෙන්ම ආවේෂණ රාජකාරී කළේ ස්වාමිනි මීට පෙර කියා සිටි පුද්ගලයෝ තිදෙනා සම්බන්ධව. ඒත් පුද්ගලයෝ හම්බ වෙන්න ආපු තව පුද්ගලයෝ සිටියා ස්වාමිනි. නමුත් ඔවුන් සම්බන්ධව ඔවුන් පිළිබඳ මම පෞද්ගලිකව හෝ මගේ නිලධාරීන්ගේ උපදෙස් මත රාජකාරියක් සිදු කළේ නෑ. වෙනත් පුද්ගලයොන්ට ඒ අදාළ රාජකාරිය යොමු කරලා තිබ්බලා ඇති.

ප්‍ර : ඔබ මල්වාන ප්‍රදේශයේ ආවේෂණ රාජකාරී කරලා තියෙනවාද?

පි : මල්වාන ප්‍රදේශයේ මතක විදිහට නෑ ස්වාමිනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : කොළඹ විතරද මේ කාල සීමාව තුළ කරලා තියෙන්නේ?

පි : ඔව් රාජකාරිය ස්වාමිනි කොළඹ විතරයි සිදු කරලා තියෙන්නේ. වෙනත් රාජකාරීන් අපට පවරන රාජකාරීන් වෙනත් ප්‍රදේශවල අන්තවාදය හැර .

ප : නෑ මම අහන්නේ ආගමික අන්තවාදය ගැන විතරයි?

පි : නෑ ස්වාමිනි.

ප : මට්ටක්කුලිය ප්‍රදේශයේ තියෙන මර්කස් එක දන්නවාද?

පි : නෑ ස්වාමිනි.

ප : මට්ටක්කුලිය නෙවේ ග්‍රෑන්ඩ් පාස්?

පි : මර්කස් එක දන්නවා ස්වාමිනි.

ප : මර්කස් එක දන්නවා කොස්ගස් හංදියේ?

පි : ඔව් ස්වාමිනි.

ප : එම ස්ථානයේ ඔබගේ ආගමික අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් ආවේෂණයට ලක් වෙලා තියෙනවාද?

පි : මර්කස් එක පිහිටුවා තිබෙන ස්ථානය ස්වාමිනි මම කිසිම පුද්ගලයෙකු පිළිබඳ සොයා බැලුවේ නෑ ස්වාමිනි.

ප : නෑ. ඔබගේ අංශයෙන් ඒ ස්ථානය ආවේෂණය වුණා කියලා ඔබ දන්නවාද?

පි : මා සමඟ සිටින අනිත් පුද්ගලයා කරන්නේ කෙසේද කියා ඇත්තටම ස්වාමිනි අපිට හොයලා බලන්න බෑ. ඒ වගේම මම කරන රාජකාරීය තවත් පුද්ගලයෙකුට කියන්නෙත් නෑ ස්වාමිනි. ඒ පුද්ගලයා කරන රාජකාරිය මට කියන්නෙත් නෑ ස්වාමිනි. ඒ පුද්ගලයාට පවරලා තිබ්බාද කියන එක නම් ඇත්තටම දන්නේ නෑ ස්වාමිනි.

ප : ඒ කියන්නේ ඔබ දන්නේ නෑ කොස්ගස් හංදියේ මර්කස් එකේ ආගමික අන්තවාදය සම්බන්ධයෙන් ආවේෂණ රාජකාරිය වුණාද නැද්ද කියන එක ඔබේ අංශයෙන්?

පි : නෑ ස්වාමිනි.

ප : කොටහේන ප්‍රදේශයේ තිබෙන යම් කිසි සංවිධානවල කාර්යාල ආවේෂණ රාජකාරීයට ලක් වෙලා තියෙනවාද ඔබගේ ?

පි : නෑ ස්වාමිනි.

ප : ආගමික අන්තවාදය? ජමාතේ ඉස්ලාමීය සංගමය සම්බන්ධයෙන් ඔබගේ ආවේෂණ රාජකාරී කරලා තියෙනවාද?

පි : බෝම්බ ප්‍රහාරයට පසු ජමාතේ ඉස්ලාමීය සම්බන්ධව රාජකාරීයක් සිදු කරලා තියෙනවා ස්වාමිනි ඒ නිලධාරීන්ගේ උපදෙස් පරිදි.

ප : කොයි ප්‍රදේශවලද ඒක කරලා තියෙන්නේ?

පි : දෙමටගොඩ පාර, මරදාන ඒ ගොල්ලොන්ගේ Head quarters එකක් තියෙනවා ස්වාමිනි. ඒ office වල යම් කිසි රැස්වීමක් හෝ

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

ඒගොල්ලොන්ගේ වැඩ සටහන් මොනවා හරි තිබුණොත් ඒ පිළිබඳ සොයා බලලා තියෙනවා ස්වාමිනි.

ප : ඒ ආවේෂණ රාජකාරිවල මොකක්ද විශේෂයෙන් හොයන්න කියලා ඔබට උපදෙස් ලැබිලා තියෙන්නේ?

පි : සැකකටයුතු පුද්ගලයෝ එසේ නැත්නම් දේශපාලකයෝ මේකට සම්බන්ධ වෙනවාද ඒ සමඟ පැමිණෙන පුද්ගලයෝ පිළිබඳ අවධානයෙන් සිටින්න කියලා කිව්වා ස්වාමිනි. කවුරුන්ද කියලා හඳුනා ගන්න කියලා කිව්වා එච්චරයි ස්වාමිනි.

ප : එතකොට ඔබ කරන ලද ආවේෂණ රාජකාරීවලට අනුව ජමාතේ ඉස්ලාමීය සංවිධානය සම්බන්ධයෙන් දේශපාලඥයින් කවුද? අපි ගාව යම් තොරතුරු තියෙනවා ඒකයි අහන්නේ ?

පි : ජමාතේ ඉස්ලාමීය සංවිධානයට දේශපාලන වශයෙන් මම ගියපු අවස්ථාවේදී එක් පුද්ගලයෙක්වත් පැමිණ සිටියේ නෑ. නමුත් මම සිවිල් ජීවිතය ගත කරන ආකාරයට සමහර නීතීඥවරුන් සහ සමහර දේශපාලකයින් සම්බන්ධකම් පවත්වන බව දැන ගන්නට ලැබුණා.

ප : කවුද ඒ දේශපාලඥයන්?

පි : දැනට අත්අඩංගුවේ පත් වෙලා ඉන්නවා නීතීඥ හිජාස් හිස්බුල්ලා. ඒ සමඟ මාවනැල්ල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු වෙන්න ඕනේ ස්වාමිනි හරියට මතක නෑ. මේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු හෝන්දෙණිගොඩ ප්‍රදේශයේ නම හරියට මතක නෑ ස්වාමිනි.

ප : ඊට අමතරව ජාතික දේශපාලනයට සම්බන්ධ යම් තැනැත්තන්ගේ නම් තියෙනවාද?

පි : මතක විදිහට නම් නෑ ස්වාමිනි.

ප : ඒ කියන්නේ ඔබගේ රාජකාරි මට්ටමෙන් නෙවේ මම අහන්නේ පුද්ගලිකව?

පි : පුද්ගලික මට්ටමින් ස්වාමිනි එහෙම කියපු පුද්ගලයෙකුට අර මාවනැල්ල ප්‍රදේශයේ හෝන්දෙණිගොඩ ප්‍රදේශයේ පුද්ගලයෙකුගේ නම දෙතුන් වතාවක් සඳහන් වෙලා තියෙනවා ස්වාමිනි. මීට අමතරව ස්වාමිනි දන්න තරම් පුද්ගලයෙකු පැමිණිලා නෑ අපි රාජකාරි කරපු අවස්ථාවලදී . නීතීඥවරයෙකු පැමිණි තිබෙනවා ස්වාමිනි.

ප : කවුද ඒ නීතීඥවරයා?

පි : නම කිව්වට කමක් නැද්ද ස්වාමිනි.

ප : කමක් නෑ.

පි : ෆාරිස් කියලා ලෝයර් කෙනෙක්.

ප : ෆාරිස් කියන ලෝයර්. කොහේටද ඔහු පැමිණිලා තියෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : ඔහු අපි කරපු සියළුම ආවේෂණ රාජකාරීවලදී ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ වැඩ සටහන් වලට පැමිණි තිබෙනවා ස්වාමිනි.

ප්‍ර : ඒ වගේ මේ තවත් මේ ප්‍රසිද්ධ තැනැත්තන් ඉන්නවාද ජමාතේ ඉස්ලාමීය සංවිධානයට සම්බන්ධ? අපි ඔබගේ සාක්ෂිය අවශ්‍ය නම් අපි මේ රහසිගතව තියා ගැනීමට අපිට ප්‍රශ්නයක් නෑ.

පි : යම් අවස්ථාවකදී ස්වාමිනි මම දැන් කරන රාජකාරීයට මට කිසිම බාධාවක් පැමිණෙන්න බැහැ. ඒ වගේම මේ මා හට පෞද්ගලිකවම පවුල් ජීවිතයක් තියෙනවා. මම දන්න දේ තමා මම විශ්වාස කරනවා මම මොන ආගමේ මොන ජාතියේ වුනත් රටට තියෙන ආදරේට තමයි මම යුධ හමුදාවට පැමිණියේ. බෝම්බ ප්‍රහාර සිද්ධියේ යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගත් අවස්ථාවේදී මා ළඟ කිසිම සාක්ෂියක් නැහැ. දැනට කලින් ආණ්ඩුවේ කර්මාන්ත වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදුර්දීන් යම් බාධාවක් කරලා තිබුණා.

ප්‍ර : මොකටද බාධා කරලා තිබුණේ?

පි : එම පුද්ගලයා අත්අඩංගුව ගන්නවාට.

ප්‍ර : කොයි පුද්ගලයා අත්අඩංගුවට ගන්නවාටද?

පි : මම නමින් දන්නේ නෑ. දෙහිවල ප්‍රදේශයේ පුද්ගලයෙක්. ඉන්ෂාන් වෙන්න ඕනී ස්වාමිනි. මට හරියට මතක නෑ.

ප්‍ර : අර හිටපු යුධ හමුදාපති මහේෂ් සේනානායක මාධ්‍ය.

පි : දුරකථන ඇමතුමක් ලබා දුන්නා කියන පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට පෙර හෝ අත්අඩංගුවට ගත්තායින් පස්සේ. එම පුද්ගලයා මේ අදාළ පුද්ගලයාගේ නිවසට ගොස් තිබෙනවා මේ ඒ එම පුද්ගලයාගේ පියා මම හිතන විදිහට ස්වාමිනි ඔහුගේ පෞද්ගලික ලේකම්වරයෙකු ලෙස සේවය කරනවා. නම් සඳහන් කරන්න ඇත්තටම මට නම මතක නෑ ස්වාමිනි. එහෙම සබඳතාවයක් ඒ දෙන්නා අතර තිබුණා ස්වාමිනි. එම පුතා අත්අඩංගුවට ගැනීම වැළැක්වීමට උත්සාහ කළ යුතු බව මට පෙනී තිබුණා.

ප්‍ර : ඒ ඔබට ඒ තොරතුර දුන්න පුද්ගලයාගේ නම ඔබට කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද? අපි ඔබව සඳහන් කරන්නේ නෑ.

පි : මට නම සඳහන් කරන්න තරම් ඒ කියන්නේ මාගේ ඒකකය හෝ මාගේ මිත්‍රයෙකු නොවෙයි. මාගේ මේ යුධ හමුදා ජීවිතයේ හම්බ වුණු පුද්ගලයෙකු නෙවෙයි. සිවිල් පුද්ගලයෙකු තමයි එම තොරතුර ලබා දුන්නේ. සමාවෙන්න ස්වාමිනි ඔහුගේ නම පැවසීමට මට .

****

FAIR COMMENT BY JEZEEM

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අවශ්‍ය නොවන බව අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයා දන්වයි.

කොමිෂන් සභාවට පැමිණ කොමිෂන් සභාවේ කටයුතුවලට සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තූතිය පළ කරනවා.

නියෝගය

සාක්ෂිකරුට මේ අවස්ථාවේදී කොමිෂන් සභාව ඉදිරියේ ලබා දුන් සාක්ෂිය හේතුවෙන් 2015 අංක 04 දරන අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනතේ 25 (4) උප වගන්තිය ප්‍රකාරව සාක්ෂිකරුට හිමි විය යුතු සියළු අයිතින් සහ වරප්‍රසාදයන් ඔහුට ලබා දෙන ලෙසට අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරමි.

සාක්ෂිකරු නිදහස් කරන ලදී.

කොමිෂන් සභාවේ වැඩ කටයුතු අදට අවසන් වන අතර නැවත කොමිෂන් සභාවේ වැඩ කටයුතු 2020.05.29 වන දින පස්වරු 12.30 ට ආරම්භ කරමි.

දැන් වේලාව : ප.ව.09.30 යි.

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන් තබන ලදී.

President Secretariat Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.06.25 වේලාව :- පෙ.ව. 10.50

සටහන් කළේ :- කේ.එම්.වන්දිමා දිල්හානි

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නිතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතිඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ කෞෂී සෙල්වනායගම් මහත්මිය සමඟ ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ ගිම්හානි ගම්ගේ විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම :- තුවාන් සුරේෂ් සලේ, ප්‍රතිඥා පිට වැඩිදුර සාක්ෂි සඳහා කැඳවයි.

ජ්‍යෂ්ඨ රජයේ අධිනිතීඥ සංජීව දිසානායක මහතා

ප්‍ර: ඔබ වර්තමානයේ ජාතික බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක ඔබේ තනතුර ජාතික බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක?

පි: ඔබ හරි.

ප්‍ර: ඔබ මීට පෙර සාක්ෂි දෙමින් කියා සිටියා ඔබ බුද්ධි සේවාව දැන් නියුතු වෙලා ආසන්න වශයෙන් වශයෙන් අවුරුදු 25 කට වැඩි ප්‍රමාණයක් වෙනවා?

පි: ඔබ හරි.

ප්‍ර; ඔබට මෙම ගරු සභාවට පැහැදිලි කරන්න පුළුවන්ද National Security එහෙම නැත්නම් ජාතික ආරක්ෂාව කියන්නේ කුමක්ද කියලා කෙටියෙන් පැහැදිලිව?

පි: ජාතික ආරක්ෂාව කියන්නේ Broad Term එකක්. ඒ ජාතික ආරක්ෂාව කෙටියෙන්ම කියනවා නම් දේශිය හෝ විදේශිය වශයෙන් රටේ ස්ථාවර භාවයට ඒකී භාවයට එල්ල වෙන්න පුළුවන් සියළු තර්ජන හඳුනාගෙන ඒවා නැවැත්වීමට ක්‍රියාවලිය තමයි අපි ජාතික ආරක්ෂාව කියන්නේ. ඒ එක්කම ජාතික ආරක්ෂාව තව විදියට විග්‍රහ කරනවානම් ජාතික ආරක්ෂාව විෂය පද්ධතියට කොටස් 10 ක් අයිති වෙනවා. එම කොටස් Economic Security එක.

ප්‍ර; ඒ කියන්නේ?

පි: ආර්ථික ආරක්ෂාව.

ප්‍ර: අංක 02?

පි Political Security දේශපාලනික ආරක්ෂාව.

ප්‍ර: අංක 03?

පි: Community Security ඒ කියන්නේ ප්‍රජාව ආරක්ෂාව.

ප්‍ර: අංක 04?

පි: Personal Security පුද්ගලික ආරක්ෂාව.

ප්‍ර: පුද්ගලික ආරක්ෂාව ඒ කියන්නේ පුද්ගලයාගේ ආරක්ෂාව ?

පි: Finance Security .

ප්‍ර: අංක 05 තමයි මුල්‍ය ආරක්ෂාව?

පි: Health Security සෞඛ්‍ය ආරක්ෂාව, Energy Security බලශක්ති ආරක්ෂාව,

ප්‍ර: Environmental Security ?

පි: පාරිසරික ආරක්ෂාව, Cyber Security

ප්‍ර: අංක 10 සයිබර් ආරක්ෂාව. මේ ආදී වශයෙන් මේ සියළුම ආරක්ෂාව අයිති වෙනවා ජාතික ආරක්ෂාව යටතට

Proofread Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: Economic Security, Political Security , Community Security, Public Security, Personal Security , Health Security, Energy Security, Environmental Security and Cyber Security

ප්‍ර: ජාතික ආරක්ෂාව යන සංකල්පය යන වැදගත් මාතෘකාව යටතේ බුද්ධි සේවාවක කාර්යය බුද්ධි සේවාවකින් බලාපොරොත්තු වන දේ ඔබට කරුණාකර කෙටියෙන් පැහැදිලි කරන්න?

පි: රාජ්‍ය බුද්ධි සේවාව හැටියට .

ප්‍ර: මා කියන්නේ බුද්ධි සේවාව රජයට සම්බන්ධ බුද්ධි සේවා වල කාර්යය කුමක්ද?

පි: අපේ කාර්ය භාරය තමයි මේ මම කියපු ජාතික ආරක්ෂාව යටතේ සියළුම කොටස් වලින් රටට ඇතිවෙන්න පුළුවන් තර්ජනයන් හඳුනා ගැනීම සහ ඒවා වැලැක්වීමට කටයුතු කිරීම තමයි මූලිකම කාර්ය භාරය බුද්ධි සේවාවක් හැටියට රටක.

ප්‍ර; ඔබ පසුගිය දිනයේ මේ ගරු කොමිෂන් සභාවේ සාක්ෂි දෙමින් කියා සිටියා ලංකාවේ ප්‍රධානතම බුද්ධි සේවාවන් වන්නේ රාජ්‍ය බුද්ධි සේවාව සහ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය කියලා?

පි: ඔබ හරි.

ප්‍ර: මෙහිදී රාජ්‍ය බුද්ධි සේවාව ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් කල යුතු සහ කරන කාර්ය භාරය කුමක්ද?

පි: මේකේ විශේෂයෙන්ම රාජ්‍ය බුද්ධි සේවාව සහ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය තමයි රටේ තියෙන ප්‍රධානතම බුද්ධි සේවාවන් කටයුතුවල නියතුවෙන්නේ මේ දෙක තමයි රටේ National Security එකේ Security Council එකෙත් බුද්ධි පිළිබඳව සම්පූර්ණයෙන්ම ඒ කාර්ය භාරය ඉටු කරන්නේ ඒ meeting සියළු දෙයක්ම මෙතනදි විශේෂයෙන්ම Director Military Intelligence හැටියට මම අවුරුදු හතර හමාරක් සේවය කරා ඒ එක්කම දැන් රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක හැටියට මම මාස 07ක වගේ කාලයක මං සේවයේ නිරත වෙලා සිටිනවා. මෙහිදී මම දැක්ක විශේෂම දෙක තමයි රාජ්‍ය බුද්ධි සේවාව කියන්නේ මං අර කියපු. Broad Security Scope එකේ ඒ සියළු දේටම වගකියන්න ඕන ආයතනයක්. විශේෂයෙන්ම මේ වගේ ලෝකයේ අනෙකුත් බුද්ධි ආයතනත් තියෙනවා. ඉන්දියාව, ඇමරිකාව ඒ වගේ රටවල් වල තියෙනවා. ඒ වලත් තියෙන ආයතන ඇවිල්ලා එක්කෝ External බුද්ධි ආයතනය Internal කියලා කොටස් වශයෙන් කඩලා තියෙනවා. එතදි සියළු දෙනාත් එක්කම Officially සියළුම ගනු දෙනු කරන්නේ ඇවිල්ලා රාජ්‍ය බුද්ධි සේවාව. මොකද ඒ රටවල් වල වෙන වෙනම තියෙනවා. ඒගොල්ලෝන්ගේ වෙනමම mandate එකක් තියෙනවා. ඒ ගොල්ලන්ගේ Scope එකක් තියෙනවා ඒගොල්ලන්ට engage කරන පුළුවන්. ආයතනයත් පැහැදිලිව සඳහන් කරලා තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ඉතින් ඒ අනුව රටේ තියෙන ප්‍රධානතම බුද්ධි සේවාව ඇවිල්ලා රාජ්‍ය බුද්ධි සේවාව. ඒ රාජ්‍ය බුද්ධි සේවාව හා සම්බන්ධ වෙලා තියෙනවා ලෝකයේ Region එකේ සහ ලෝකයේ අනෙක් රටවල් වල ඒ බුද්ධි සේවාවන් එක්ක එතකොට ඒ ගොල්ලන් එක්ක සම්බන්ධවෙලා රටේ තියෙන ජාතික ආරක්ෂාව යටතේ මම අර කියපු රාජකාරීන් කරන්න තමයි රාජ්‍ය බුද්ධි සේවාවට පැවරිලා තියෙන ප්‍රධානතම කර්ය භාරය.

ප්‍ර; ඔබ කියපු කාර්යයන් තමයි අර කරුණු 10 ක් ලෙස ඔබ ජාතික ආරක්ෂාවේ තිබෙන ආරක්ෂාව කරුණු 10 ක් ගෙන හැර දැක්කුවා. දැන් එම 10 ට විය හැකි තර්ජනයන් හඳුනා ගැනීම, එම තර්ජනයන් සම්බන්ධයෙන් අදාල පාර්ශයවන් දැනුවත් කිරීම සහ එම තර්ජනයන් මැඩපවත්වා ගැනීමේ ක්‍රියා පිළිවෙතත් දියත් කිරීමට ඉදිරිපත් කිරීම?

පි: ඒකේ විශේෂයෙන් මම කියන්න ඕනේ Proactively

ප්‍ර: ඒ කියන්නේ ක්‍රියාශීලිව ?

පි: ක්‍රියාශීලිව කිරීම තමයි ප්‍රධානතම කාර්ය භාර්ය.

ප්‍ර; කරුණාකර ඔබට තවදුරටත් පැහැදිලි කරන්න පුළුවන්ද මේ ක්‍රියාශීලිව එහෙම නැත්නම් Proactive. මොකක්ද මේකෙන් ඔබ අදහස් කරන්නේ කියලා?

පි: මෙකේ දී මම අදහස් කරන්නේ ප්‍රධානතම එක කාර්යයක් මම සඳහන් කරා ඒ කියන්නේ අපේ එක කාර්ය භාරයක් තමයි සිදුවීම වැළැක්වීමට කටයුතු කිරීම .

ප්‍ර: බුද්ධි තොරතුරකින් ලැබෙන යම් සිදුවීමක් එය සිදු වීම වැළැක්වීමට කටයුතු කිරීම?

පි: ඔබ හරි.

ප්‍ර: කොහොමද එම කටයුතු කිරීම ඔබ කරන්නේ බුද්ධි ඒකකයක් මගින්?

පි: දැන් මම හොදම උදාහරණයක් ගන්න පුළුවන් මෑතකදී Heath Security එක යටතේ මේ covid- 9 කියන එක කොහොමද රාජ්‍ය බුද්ධි සේවාවක් හැටියට ක්‍රියාශීලිව Contact Tracing වල දී දායකත්වයක් අපි දැක්වුයේ

ප්‍ර; Contact Tracing කියන්නේ?

පි: Contact Tracing විශේෂයෙන්ම මේ කාර්ය භාරයේ දී මේ රෝගී හඳුනා ගැනීම පමණක් නොව හඳුනා ගෙන පස්සේ මේගොල්ලෝ පළවෙනි contact එක, දෙවනි contact එක , තුන්වෙනි Contact එක වශයෙන්.

ප්‍ර; මේ රෝගීන් සමඟ සම්බන්ධ වූ පුද්ගලයින් හඳුනා ගැනීම?

පි: පුද්ගලයින් හඳුනා ගැනීම ඊට පස්සේ හඳුනා ගත්ත පුද්ගලයින්ව වෙන් කර තැබීම ඒ වෙන් කර තැබීම ක්‍රියාවලියේ දී කොහොමද අපි Technology එක use කරන්නේ.ඒ එක්කම භූමියේදී කොහොමද ඒ භූමි තොරතුරු අපි use කරන්නේ ඒ එක්කම රාජ්‍ය බුද්ධි සේවාවක් හැටියට අපිට මිලියන 7 කට වැඩිය සංඛ්‍යාවක තොරතුරු තියෙනවා පුද්ගලයින්

FAIR COMMENT — BY JEZEEM —

පිළිබඳව ඒක අතිවිශාල ප්‍රමාණයක් ඒවා කොහොමද ඒ Technology එකත් එක්ක use කරලා අපි මෙතන දී මේ රටට වෙච්ච වෙන්න ගිය ව්‍යවසනයට ප්‍රධාන වශයෙන් මේ ක්‍රියාශීලිව අනෙකුත් දෙපාර්තමේන්තු එක්ක සෞඛ්‍ය සහ යුධ හමුදාව සහ ඒ නායකත්වය එක්ක එකතුවෙලා කොහොමද අපේ කාර්ය භාරය මේ සඳහා ක්‍රියාශීලීව දැක්වූයේ කියන එක එක උදාහරණයක් හැටියට මට පෙන්නලා දෙන්න පුළුවන් ඒ එක්කම අපි අනික් විදියට බැලුවොත් මීට කලින් මගේ Experience එක අනුව විශේෂයෙන්ම අපි LTTE සංවිධානය 2009 න් පස්සේ කිසිම සිදුවිමක් සිදු නොවුන නෑ කියන්න බෑ 2009 ඉදන් මේ දක්වා අවස්ථා 12 කදී LTTE සංවිධානය ඒ ගොල්ලෝ ඔලුව උස්සන්න උත්සාහ ගත්තා. ඒ හැම අවස්ථාකදීම සමහර අවස්ථාවලදී අපි ඒ අපේ තියෙන තොරතුරු ජාලයන් සහ ඒ තොරතුරත් එක්ක අපිට හැකියාව ලැබුණා දින කීපයකදී ඒක සම්පූර්ණයෙන්ම මැඩ පවත්වන්න අවශ්‍ය කරන ක්‍රියාශීලි දායකත්වයක් Law Enforcement එකට සහ යුධ හමුදාවට සහ ඒකට ලබා දෙන්න. ඒ සමඟම ඒ 11 ට අමතරව මෙම මෙවැනි නැඟී සිටීම් වලක්වා ගැනීමට අතිවිශාල දායකත්වයක් ක්‍රියාශීලිව සිදුවුන නිසා එවැනි 12 ට අමරතව තව ගණනාවක් තිබ්බා නමුත් ඒවා ඒ තත්ත්වයට එන්න කලින් අපිට හැකියාව ලැබුණා. ඒවා නිෂ්ප්‍රභා කරන්න ඒ පටන් ගැන්මේ අවස්ථාවේ ඉඳන්ම .

ප්‍ර: ඒ කියන්නේ මා ඔබට පැහැදිලි කිරීමක් සඳහා විමසුවොත් බුද්ධි සේවාව එහෙම නැත්නම් රාජ්‍ය බුද්ධි සේවාවේ මේ අවස්ථාවේ රාජ්‍ය බුද්ධි සේවාව ගතහොත් කාර්ය භාරය වන්නේ බුද්ධි තොරතුරක් ඉදිරිපත් කිරීම පමණක් නොවේ කියලා තමයි ඔබගේ පිළිතුරෙන් මට වැටහෙන්නේ?

පි: ඔබ නිවැරදියි.

ප්‍ර: ඒ බුද්ධි තොරතුරට අනුව සිදුවිය හැකි ව්‍යසනයක් වලක්වා ගැනීමේ පියවර ඔබ විසින් ඉදිරිපත් කල යුතුවෙනවා සාමාන්‍යයෙන් ඉදිරිපත් කරනවා. එහෙමද කියන්නේ?

පි: ඔබ හරි අපි එතැනින් නවතින්නේ නැහැ.

ප්‍ර; ඊට අමතරව ඒ අදාල රජයට සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් වෙත මෙම තොරතුරු සැපයීමත් ඔබ විසින් සිදු කරනවා ද නැද්ද?

පි: ඒ සියළු තොරතුරු සැපයීම් සිදු කරනවා.

ප්‍ර: දැන් මෙම තොරතුරු සැපයීම සිදු කරන්නේ රජයට කුමන ස්ථානයකදීද කොයි ආකාරයට ද කියලා ඔබට නැවත පැහැදිලි කරන්න කෙටියෙන් කොහොටද මෙම තොරතුර ඉදිරිපත් කරන්නේ කියලා?

පි: ඔව් විශේෂයෙන්ම දැන් බුද්ධි තොරතුරු කිව්වාම අපි ඉස්සෙල්ලාම මේ බුද්ධි තොරතුරු අපි බලන්න ඕනේ කොහොමද මොකක්ද මේ බුද්ධි තොරතුර.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර; රාජ්‍ය ආරක්ෂාවට සම්බන්ධ බුද්ධි තොරතුරක් හෝ තොරතුරු රජය වෙත ලබා දෙන්නේ කොතනදීද කියලා කියන්න?

පි: අපි විශේෂයෙන්ම එතනදී ඒ තොරතුරු ලබා ගැනිම සාමාන්‍ය තොරතුරු ලබා ගැනීම කොටස් කීපියකින්ම සිදු වෙනවා .

ප්‍ර; To whom do you present it?

පි: රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධානියා හැටියට මේක අපි ඉදිරිපත් කරනවා කෙලින්ම රටේ ජනාධිපතිවරයාට Security Council එකේදී .

ප්‍ර; Security Council ඒ කියන්නේ ආරක්ෂක කවුන්සලයේ දී ජනාධිපතිට එය ඉදිරිපත් කරන බවයි ඔබ කියා සිටින්නේ ?

පි: ඊට අමතරව අපි ඒක සති පතා තියෙන එකක් ඒ එක්කම සති පතාම අපි තව එකක් තියෙනවා ආරක්ෂක අමාත්‍යාංශයේ ආරක්ෂක ලේකම්තුමා යටතේ සියළුම බුද්ධි නිලධාරින් යුධ හමුදාපති,සියළුම හමුදාපති වරුන් .

ප්‍ර; දැන් ඔබ කියන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ ආරක්ෂක ලේකම්ගේ ප්‍රධානත්වයෙන් තිබෙන සති පතා තිබෙන රැස්වීම ගැනද?

පි: ඔබ හරි.

ප්‍ර; එම රැස්වීමට කවුද සහභාගි වන්නේ?

පි: එම රැස්වීමට සහභාගි වන්නේ විශේෂයෙන්ම ආරක්ෂක ලේකම්තුමාගේ රැස්වීමට සහභාගි වෙනවා සියළුම ආරක්ෂක ලේකම්තුමා අනිවාර්යෙන්ම සහභාගි විය යුතුයි මෙම රැස්වීම පවත්වන්න නම්. ඊට අමතරව යුධ හමුදා හමුදා පතිවරුන්.

ප්‍ර; ආරක්ෂක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් එම රැස්වීමට සහභාගී වෙනවා. යුධ හමුදාපති වරුන්,නාවික හමුදා පති,ගුවන් හමුදා පති ,ඊට අමතරව IGP ඊට අමතරව රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධානී ඒ එක්කම DMI.

ප්‍ර; ඒ කියන්නේ ?

පි: Director Military Intelligence

ප්‍ර: ඒ කියන්නේ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ ප්‍රධානියා ?

පි: ඒත් එක්කම නාවික බුද්ධි අංශයේ ප්‍රධානියා,ගුවන් හමුදා බුද්ධි අංශයේ ප්‍රධානියා, ඒ එක්කම පොලිසියේ special branch එකේ විශේෂ කාර්යාංශයේ ප්‍රධානීයා.ඊට අමතරව Criminal Investigation Department එකේ ප්‍රධානියා .

ප්‍ර; අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඔබ කියන්නේ ඒ භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ද නැත් නම් අධ්‍යක්ෂකද ?

පි: ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති.ඊට අමතරව STF එකේ Commodant පොලිස් විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරි,ඒ කට්ටිය අනිවාර්යෙන්ම මේකට සහභාගිවෙනවා.

****

FAIR COMMENT
BY JEZEEM

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

ප්‍ර: TID?

පි: Terrorist Investigation Department එක්ක.

****

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා

ප්‍ර: ත්‍රස්තවාදී විමර්ශන ඒකකයත් සහභාගී වෙනවා? කවුද TID එකේ සහභාගී වෙන නිලධාරියා ?

පි: ඒකේ සහභාගි වෙන්නේ අධ්‍යක්ෂ.

ප්‍ර: මීට අමතරව අමාත්‍යාංශවලට අදාල ලේකම්වරු මෙම සම්බන්ධීකරණ රැස්වීම් වලට සහභාගි වෙනවාද?

පි: විශේෂයෙන්ම මේ සම්බන්ධීකරණ රැස්වීම් තියෙන්නේ ඇවිල්ලා ආරක්ෂක අමාත්‍යාංශයේ. ඒකට වෙන ලේකම්වරු සහභාගි වෙන්නේ නැහැ.

ප්‍ර: මෙම රැස්වීම කුමක් වශයෙන්ද හඳුන්වන්නේ?

පි: ඒක ඉංග්‍රීසියෙන් හඳුන්වන්නේ Intelligence Coordinating Meeting බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම .

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

ප්‍ර: බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමයි බුද්ධි සමාලෝචන රැස්වීමයි දෙකම එකද කියලා?

පි: ඒක එකට ලෙස හඳුන්වන්න පුළුවන් විශේෂයෙන්ම සමාලෝචනයක් එතන සිදු වෙනවා. ස්වාමිනි ඊට අමතරව Coordinating එකක් තමයි ගොඩාක් සිදුවෙන්නේ මොකද අපේ තියෙන දේවල් එතන තමයි Share කර ගන්නේ අපේ තොරතුරු අනුව. ඒ අනුව අපි Decide කරනවා ඒ තොරතුරු වලින් ප්‍රධාන දේවල් ටික Security Council එකට ගෙනියන්න.

ප්‍ර; ඒ ප්‍රශ්නය ඇහුවේ කලින් ඔය නම් දෙක අපිට කියවලා තියෙනවා. ඔබ දැන් කියන්නේ බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමක් කියලා තමයි ඔබ සඳහන් කරන්නේ. ඕකට සමහර වෙලාවට බුද්ධි සමාලෝචන රැස්වීම කියලාත් කියනවද නැත්නම් එහෙම බුද්ධි සමාලෝචන රැස්වීමක් කියල වෙනම එකක් තියෙනවාද?

පි: වෙනම එකක් නෑ ස්වාමිනි විශේෂයෙන්ම මේ නම් දෙකම අපි භාවිතා කරනවා මේ ජාතික ආරක්ෂක අමාත්‍යාංශයේ තියෙන මේ රැස් වීමට

****

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතීඥ සංජීව දිසානායක මහතා

ප්‍ර: දැන් මෙම බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම නැත්නම් සමාලෝචන රැස්වීම කොයි ආකාරයට ද පවත්වන්නේ ඒ කියන්නේ සතියකට සැරයක් ද මාසයකට සැරයක් ද කොහොමද පවත්වන්නේ?

පි: මේක සතියකට සැරයක් හැමදාම පවත්වනවා සඳුදා දිනයේ දී. මීට කලින් ඒක පැවැත්වුනේ අඟහරුවාදා ඒ කියන්නේ දින කලින් රජය තියෙද්දි නමුත් දැන් මේක අපි පවත්වන්නේ සඳුදා .

ප්‍ර: සෑම සතියකම වර්තමානයේ සඳුදා දින ඊට පෙර අඟහරුවාදා දින තමයි පැවත්තුවේ ?

පි; 2015ට පෙර 2015ත් පසුව සමහර අවස්ථාවල අඟහරුවාදා පැවැත් වුණා.

ප්‍ර: දැන් මෙම ආරක්ෂක ලේකම්ගේ ප්‍රධානත්වයෙන් තිබෙන මෙම බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේ දී ඔබ කියා සිටියා බුද්ධි තොරතුරු එයට සහභාගි වන එක් එක් පුද්ගලයන් සමඟ හුවමාරු කර ගැනීමක් සිදුවෙනවා කියලා?

පි: ඔබ හරි.

ප්‍ර; මෙම රැස්වීමේ දී එම තොරතුරු හුවමාරු කර ගැනීමට අමතරව වෙන යම් හෝ කාර්ය භාරයක් සිදුවෙනවාද?

පි: විශේෂයෙන්ම සම්පූර්ණයෙන්ම ඒ Coordinating Meeting එකෙන් කරන්නේ රටේ තියෙන ප්‍රධාන ප්‍රශ්න ජාතික ආරක්ෂාව කෙරෙහි සියළු ප්‍රශ්න පිළිබඳව සම්පූර්ණයෙන්ම Coordinating එකක් සහ සමාලෝචනයක් එතනදි ඒ එක් එක් නිලධාරින් විසින් බුද්ධි නිලධාරින් විසින් ඉදිරිපත් කරන අතරම investigation සම්බන්ධයෙන් ඒ වල Progress එකත් CID එකෙන්.

ප්‍ර: ඒ විමර්ශනයන් වල තිබෙන ප්‍රගතිය සම්බන්ධයෙන්?

පි: සම්බන්ධයෙන් අපරාධ දෙපාර්තමේන්තුවෙන් සාකච්ඡා කිරීමට හැකි කරුණු තෝරාගෙන ඒ සාකච්ඡා කිරීමත් සිදු කරනවා.

ප්‍ර; දැන් සාක්ෂිකරු මා ඔබව 2012 වර්ෂයට රැගෙන යනවා ඒ කියන්නේ 2012 වර්ෂයේදී ඔබ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂක වශයෙන් පත්වුනා ?

පි: ඔබ හරි.

ප්‍ර: 2012 නොවැම්බර්?

පි: නොවැම්බර් වල.

ප්‍ර: එසේ ඔබ බුද්ධි අධ්‍යක්ෂක DMI බවට පත් වුනාට පසුව ඔබ කියන ලද ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමට සහ ආරක්ෂක කවුන්සිලයට ඔබ සහභාගි වුනාද?

පි; ඔබ හරි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර; දැන් ආරක්ෂක සම්බන්ධීකරණ කවුන්සලයට මං ඉන්නේ 2012 ආරක්ෂක සම්බන්ධීකරණ ඒ රැස්වීමට ඔබ පෙර සඳහන් කල නිලධාරියෙක් වශයෙන් ඔබත් එම රැස්වීමට සහභාගි වුනාද?

පි: ඔබ හරි.

ප්‍ර; 2012 වසරේදී ඔබට කීමට හැකියාවක් තියෙනවාද ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීම පැවැත්වූ දිනය?

පි; ඔව්.අපි හැම අඟහරුවාදාම තමයි 2012 ඉදන් පැවැත්වුනේ.

ප්‍ර; ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමෙන් පසුවද ආරක්ෂක කවුන්සලය හමුවන්නේ?

පි; හැම බදදා දිනකම ආරක්ෂක කවුන්සලය හම්බෙනවා අඟහරුවාදා තමයි පළවෙනි Meeting එක. Coordinating Meeting එක.

ප්‍ර: ආරක්ෂක කවුන්සලය හැම සතියකම හමුවෙනවාද?

පි: හැම සතියකම අපි හමුවුනා.

ප්‍ර: 2012?

පි: 2012දී සමහර අවස්ථාල දී ඒ කියන්නේ 2012 ඉඳන් 2015 අතර කාලයේදී ජනාධිපතිතුමා නොමැති අවස්ථාවකදී ඒක කවුන්සලය තියෙන්නේ නෑ. එතුමා තමයි මේකේ තීරණ ගන්නේ ඒක නිසා ජනාධිපති තුමා නොමැති අවස්ථාවලදි කවුන්සලය තියන්නේ නෑ නමුත් ජනාධිපතිතුමා සිටි සෑම අවස්ථාවකදීම යම් කිසි විශේෂිත වූ රාජකාරියක් ඒ කියන්නේ පිටරටක ගිහිල්ලා තියෙනවා නම් නොවැලැක්වීය හැකි හේතුවක් මත ඉතාමත්ම අල්පයි එහෙම නැතිව හැමදාම මේ Council Meeting එක තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර; ඔබ කියන විදියට ආරක්ෂක කවුන්සිලයේ රැස්වීම තියෙනවාද නැද්ද කියන එක ඔබගේ ප්‍රායෝගික දැනුම අනුව තීරණය කරන්නේ එවකට හිටපු ජනාධිපතිවරයා?

පි: ඔබ හරි ස්වාමිනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතීඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: දැන් 2012 වර්ෂයේදී ආරක්ෂක කවුන්සිලයට කවුද සහභාගි වුනේ ඔබ කිව්වා එය පවත්වන්නේ ජනාධිපතිගේ ප්‍රධානත්වයෙන් කියලා. ජනාධිපතිතුමාට අමතරව වෙන කවුද මෙම රැස්වීමට සහභාගි වන්නේ?

පි: ස්වාමිනි ඒකට සහභාගි වෙනවා අගමැතිතුමා. ඊට පස්සේ සහභාගි වෙනවා අගමැතිතුමාගේ ලේකම් ඒ එක්කම

ප්‍ර; මන් කියන්නේ 2012?

FAIR COMMENT — BY JEZEEM

පි: ඔව් 2012 මුදල් අමාත්‍යාංශයේ ලේකම්, ඒ එක්කම Chief of Defence Staff CDS , මා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ආරක්ෂක ලේකම්තුමා, යුධ හමුදාපති, නාවික හමුදාපති, ගුවන් හමුදාපති, පොලිස්පති, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, Finace මුදල් අමාත්‍යාංශයේ ලේකම්, ඊට අමතරව රාජ්‍ය බුද්ධි ප්‍රධානී Chief of National Intelligence CIN ඊට අමතරව Director Military Intelligence අධ්‍යක්ෂක බුද්ධි, යුධ හමුදා බුද්ධි අංශය ඊට අමතරව director SIS.

ප්‍ර; අවසානයට ඔබ කියා සිටියේ CNI ,DMI සහ අධ්‍යක්ෂක SIS සහභාගි වෙනවා?

පි: සහභාගී වෙනවා මේ අය ඇවිල්ලා අනිවාර්යෙන් Permanet Membersලා ඊට අමතරව.

ප්‍ර; ඔබ මේ දැන් කියා සිටියේ ආරක්ෂක කවුන්සලයට සහභාගි වන ස්ථීර නිලධාරීන් ?

පි: ඔව්

ප්‍ර: අනිවාර්යයෙන් සහභාගි විය යුතු නිලධාරීන්?

පි; ඔව්.

ප්‍ර: ඊට අමතරව යම් යම් අවස්ථාවලදී වෙනත් නිලධාරි වරනුත් සහභාගි වෙනවාද?

පි; ඔව් ඒ සකාච්ඡාවලට බඳුන් වන විෂය පද්ධතියට අනුව ඒ අදාල Ministry එකේ අමාත්‍යාංශයේ ලේකම්වරුන්ව විවිධ අවස්ථාවලදී ගෙන්වනවා. ඒ ගෙන්වීමේදීත් අපි Conference එක පටන්ගන්න කලින් එම විෂය පද්ධතිය අපි කතා කරලා ඉවර වෙලා ඒක ඒ Subject එක ඉවර වුනාට පස්සේ තමයි Security Council එක කරන්නේ Security Council එකේදී Permanet Membersලා ඇරෙන්න අනික් කට්ටිය සහභාගි කර ගන්නේ නැහැ.

ප්‍ර; නිත්‍ය සාමාජිකයන් පමණද?

පි: පමණයි සහභාගි කර ගන්නේ. ඒකට යම් කිසි අනෙකුත් අමාත්‍යාංශ සම්බන්ධ නම් ඒ අවස්ථාවට පමණක් නම් ඒ සම්බන්ධ නිලධාරීන් අමාත්‍යාංශ ලේකම්වරුන් පමණක් නෙමේ සමහරවිට බන්ධනාගාර කොමසාරිස් වගේ අය ගෙන්වන අවස්ථා තියෙනවා. එතකොට KDU එකේ ඉන්න අධ්‍යක්ෂකව ගෙන්වන අවස්ථා තියෙනවා ඒ අවශ්‍යතාව අනුව අවශ්‍ය වෙලාවට ගෙන්නලා ඒ විෂය කතා කරායින් පස්සේ ඒ අය යවලායින් පස්සේ තමයි නැවතත් සුපුරුදු පරිදි Permanet Membersලා Security සම්බන්ධයෙන් Discuss කරන්නේ.

ප්‍ර; දැන් ආරක්ෂක කවුන්සලය ඔබ කියා සිටියා ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තමයි පැවැත්වෙන්නේ කියලා. මෙම ආරක්ෂක කවුන්සලයේ දී රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් වන රාජ්‍ය ආරක්ෂාවට

FAIR COMMENT BY JEZEEM

තිබෙන තර්ජන රටේ ඒවනවිට පවතින ආරක්ෂාව සම්බන්ධයෙන් කරුණු දැක්වීමක් සිදු වෙනවාද?

පි: ඔබ හරි.

ප්‍ර; කවුරු විසින්ද ඒ කරණු දැක්වීම සිදු කරන්නේ ?

පි; ඒක ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක සහ යුධ හමුදා බුද්ධි සේවාවේ අධ්‍යක්ෂතමයි ඒ කරුණු දැක්වීම කරන්නේ.

ප්‍ර; ඒ කියන්නේ?

පි: Director Military Intelligence සහ director SIS

ප්‍ර: කවුද ප්‍රථම ඉදිරිපත් කිරීම සිදු කරන්නේ?

පි: director SIS

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: TID doesn't take part in the Security Council ?

පි: ස්වාමිනි වෙන කවුරුත් සහභාගි වෙන්නේ නෑ ස්වාමිනි.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනිතීඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර; TID සහභාගි වෙන්නේ නෑ?

පි; TID එක සහභාගි වෙන්නේ නෑ

ප්‍ර; Not even STF ?

පි: නෑ ඒ කවුරුත් සහභාගි වෙන්නේ නෑ.

ප්‍ර: දැන් අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාව විසින් ඔබට කීමට හැකියාවක් තියෙනවාද මොන වගේ කරුණුද මෙම Security council එකේ ආරක්ෂක කවුන්සිල් එකේදී එම රැස්වීමට ඉදිරිපත් කරන්නේ කියලා?

පි; ඔව් විශේෂයෙන්ම දැන් අපි රාජ්‍ය බුද්ධි සේවාවක් විදියට නැත් නම් බුද්ධි ආයතනයක් හැටියට අපිට කාර්ය භාරයක් තියෙනවා විශේෂයෙන්ම භූමියේ ඉදන් ඉහළ Strategic Level එකට ඒ කියන්නේ අපි කොටස් 4 ක් තියෙනවා Grand Strategic, Operational and Tactical කියලා Levels 4 ක් තියෙනවා.

ප්‍ර; ඒ කියන්නේ ?

පි: Grand Strategic කියන්නේ විශේෂයෙන්ම Police Matters Decision Making Process එකේ Policy Matters වගේ ගන්න දේවල් තමයි අපි කෙලින්ම ඒ Security Council Discuss එකේ කරන්නේ. එතකොට Operational level එකේ ඒ කියන්නේ Strategic cum Operational level එකේ ක්‍රියාන්විතයේ අපි කොහොම ද කරන්නේ ඒ සම්බන්ධයෙන් අපි ගොඩාක් දුර Discuss කරන්නේ අර Operational Arms එක්ක ඒ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කියන්නේ TID ඒකත් එක්ක Security council එකේ දී සොරි ආරක්ෂක සම්බන්ධිකරණ රැස්වීමේදී.
ඊට අමතරව දැන් මේ රැස්වීම් දෙකට එකපාරට එන්නේ නෑ. ඒ කියන්නේ බුද්ධි ආයතනයක් හැටියට මම ඔබතුමා කිව්වේ මං ඇවිල්ලා Director Military Intelligence විදියට හැටියට අපේ ආයතනය ඒ වෙන කොට 4000 ක ප්‍රමාණයක් සමන්විත ආයතනයක්. එතකොට ලංකාව කොටස් කීපයකට කඩලා ඒවාට වෙනමම ඒකක පිහිටවලා තියෙනවා. ඒ එකක වගකීම ලබා දෙනවා ඒ අදාල ප්‍රදේශයට දැන් උදාහරණයක් වශයෙන් ගත්තොත් MIC කියන Military Intelligence Corp බුද්ධි සේවා ඒකක මං ඉන්න කාලේ 6 ක් තිබුණා. ඒ හය රටේ විවිධ ස්ථානවල ස්ථාපනය වෙලා තිබ්බා. එකක් මම ගත්තොත් උදාහරණයක් වශයෙන් 2MIC එක. දෙවනි බුද්ධි බලකාය ස්ථාපනය වෙලා තිබ්බේ යාපනය දිස්ත්‍රික්කයේ. ඒ යාපනය දිස්ත්‍රික්කයට ආවේණික වූ යුධ හමුදා Deployment එකක් වෙනමම තියෙනවා. ඒකට අපි කියනවා SF Command කියලා. Security Forces Head quarters එකක් තියෙනවා. ඒකට තියෙනවා Divisions තුනක්. එතකොට ඒකේ වෙනම පද්ධති එකක් තියෙනවා. පොලිසියේත් ඒ ආකාරයටම ඒගොල්ලන්ගේම Deployment එකක් තියෙනවා. යාපනය දිසාව භාරව වෙනම DIG කෙනෙක් එක්ක ඒක තියෙනවා . එතකොට බුද්ධි ආයතනයක් හැටියට DMI එක හැටියට අපේ ඒ Operational level එකේ ඉන්න ප්‍රධානියා එක්ක TID එකේ ඉන්න ප්‍රධානියා ඒ එක්කම Special Branch එකේ යාපනයේ ඉන්න ප්‍රධානියා ඒ වගේ අදාල කට්ටිය සියළු දෙනාමත් සති දෙකකට වතාවක් ඒ ගොල්ලෝ හමුවීමක් සිදුවෙනවා ඒ ප්‍රදේශයේ.එතකොට ඒ ගොල්ලනුත් ගොඩාක් දුරට Discuss කරනවා. මේ මං අර කියපු Tactical දේවල්. ඒ කියන්නේ පුද්ගලයෝ එනවා. පුද්ගලයෝ යනවා කවුද ඉන්නේ ඒ ගොල්ලෝ ඒ වගේ දේවල් තමයි කතා කරන්නේ ඒ තියෙන වාර්තා ඒ වාර්තා ඒ ඉන්න බුද්ධි ඒකකයට අපි කියමු 2MIC ඒ කියන ඒකකයට. වෙනම අංශ තියෙනවා මුළු යාපනය එක්ක විහිදෙව්ව කොටස් 7 ක් හෝ 8 ක් ඒ කියන්නේ Company වශයෙන් තියෙනවා. ඒ ගොල්ලන්ගේ කාර්ය භාරය තමයි ඒ අවශ්‍ය කරන තොරතුරු භූමියෙන් ලබා ගැනීම එතකොට මේක වෙන Process එකක් මේ Process එකේදී අපිට කියලා දීලා තියෙනවා බුද්ධි ප්‍රින්සිපල්ස් කියලා එකක් ඒ කියන්නේ Direction, Collection , Processing and Dissemination මේ තියෙන Intelligence Cycle එක යට ඉදන් උඩ වෙනකම්ම ක්‍රියාත්මක වෙනවා. එතකොට අපිට ආරක්ෂක මණ්ඩලයට කතා කිරීමේ දී මේවා මේවා එකක්වත් එක පාරට එන subjects නෙමේ එතකොට මේවා විශේෂයෙන්ම භූමියෙන් ඒ

FAIR COMMENT
BY JEZEEM

ක්‍රමවේදයක් අනුව සති පතා එන වාර්තා දින පතා එන වාර්තා විවිධ වාර්තා එනවා යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයට ඒ වාර්තා විශ්ලේෂණය කරන්න වෙනම කණ්ඩායම් යොදවලා තියෙනවා පුද්ගලයන්ව Source Control කියලා වෙනම තියෙනවා. ඒක විවිධාකාරයෙන් මේ ආයතනය ඒ Threat වලට Identify වෙලා තියෙනවා වෙනම Desk තියෙනවා. LTTE Desk එක කියලා තියෙනවා. ඒ අමතරව Extremis Desk කියලා වෙනමම තියෙනවා. එතකොට මේ එන තොරතුරු සියල්ලක්ම ආවයින් පස්සේ අපි මේක විශ්ලේෂණය කිරීමේ දී අපි ඒ Ground එකෙන් එන්නැති තොරතුරු අපි විදේශ රටවල් වල එන තොරතුරුත් එක්ක අපි නැවත වරක් ඒක සාකච්ඡා කරනවා ඒ කරලා ඔක්කෝම අපි එතනදි බුද්ධි නිලධාරින් හැටියට අපි ඒ තොරතුරු Intelligence වලට Covert කරලා analyse කරලා අපි Identify කරනවා. අපිට රටක් හැටියට අපිට එන තර්ජන මොනවාද කියන එක. ඒ තියෙන සමාලෝචනයන් හෝ Coordination එකක් වෙන්නේ ඇවිල්ලා සම්බන්ධීකරණ රැස්වීමේදී එතන දී අපි ඉදිරිපත් කිරීම් කරනවා. බුද්ධි අධ්‍යක්ෂක හැටියට Director Military Intelligence මගේ ඉදිරිපත් කිරීම් මම කරනවා. මන් කියපු ප්‍රධාන විෂයන් 4 ත්‍රස්තවාදය එතකොට Extremism එක සම්බන්ධයෙන් ඒ එක්කම Organised Crimes සම්බන්ධයෙන්. Cyber Threat එක සම්බන්ධයෙන් සහ Geo- political realities and Impact අනික් රටවල් කොහොමද අපේ රට තුල යම් යම් ක්‍රියාකාරකම් වෙන්නේ මේ කොටස් 05 ට ප්‍රධාන කරගෙන අපි ඉදිරිපත් කරනවා විශේෂයෙන්ම ඒ එතන ඉන්න Coordinating එකට ඒ හින්දා අපි එතනදි Sensitive දේවල් කතා කරන්නේ නෑ පොඩිම දේවල් කතා කරන්නේත් නෑ ඒ අවශ්‍ය කරන දේවල් පමණයි එතනදි කතා කරන්නේ.

ප්‍ර; Sensitive දේවල් කියන්නේ?

පි; Sensitive දේවල් කියන්නේ සමහර වශයෙන් සමහර Investigation එකක් යන්න පුළුවන් ඒ කියන්නේ උදාහරණයක් වශයෙන් අපි දැනගන්නවා යම් කිසි development එකක් වෙනවා. අපි එතනදි ඒක Intelligence වල තියෙනවා need to know කියලා principle එකක් තියෙනවා. එතනදි අපි සියළු දෙනාටම මොකද අපිට විශේෂයෙන්ම අපේ systems වලදි අපි හැමෝගේම අපිවත් monitor කරන System එකක් තියෙනවා. ඒකට කියන්නේ passive කියලා. ඒ කියන්නේ අපිට කවුරුත් මේකෙන් එළියට එන්න බැහැ. අපි බුද්ධි තොරතුරු ත්‍රස්තවාදීන්ගේ තොරුතුරු සොයා ගන්නවාත් සමඟම ඒ එක්කම මේ සොයා ගන්න නිළධාරින් මම ඇතුලුව අපිවත් monitor කරන system එකක් මේකේ තියෙනවා ඒ කියන්නේ හැමදෙයක්ම අපි Accountable එතනදි අපි ඒ

FAIR COMMENT BY JEZEEM

සමාලෝචනයේදී අපි අනවශ්‍ය දේවල් ප්‍රකාශ කරන්න යන්නේ නෑ මොකද අනවශ්‍ය දේවල් කිරීම තුලින් ඒක තව කෙනෙක් දැන ගැනීම තුලින් සමහර විට ඒකට negative impact එකක් වෙන්න පුළුවන්. ඉතින් ඒක සාමාන්‍යයෙන් තීරණය කරන්න පුළුවන් වෙන්නේ බුද්ධි අධ්‍යක්ෂකවරයෙක් හැටියට විරාත් කාලයක් තුල ඒකේ ආවාම ඔය ඒ Tactical level එකේ involve වෙලා Operation level එකේ involve වෙලා ඒ experience එකයි ඒ maturity එකයි අරන් ඒ තත්වයට ආවට පස්සේ එයා දන්නවා අනිවාර්යෙන්ම කතා කලයුතු දේවල් කොහොමද මොනවද අපි ගන්න ඕන තීරණ පිළිබඳ කොහොමද අපි නායකයන් දැනුවත් කරන්නේ කියන ක්‍රියාවලියකට යොමුවෙලා තියෙනවා. මං අර Collection,Direction.processing ඒක තමයි විශේෂයෙන්ම ඇයි වෙන බුද්ධි නිලධාරියෙක් එක්ක වෙන නිලධාරියෙක් සමාන කරන්න බැහැ.ඒක නිසා බුද්ධි නිලධාරියා එතැනට එනකොට ඒ Assessment එක අවසානයේදී එයා Assessment එක දෙන්න ඕනේ මොකද අපි කතා කරන ලේකම් වරයාට සමහරවිට දැනුමක් නෑ. අනිත් අයත් ඇවිල්ලා ගොඩාක් දුරට නිලධාරින් මාරුවෙනවා. නමුත් බුද්ධි නිලධාරියෙක් ඒ තත්ත්වයට එනකොට සාමාන්‍යයෙන් අවුරුදු 25 ක විතර එක තරාතිරම මේ එකටම එන්නේ ඒක විශේෂයෙන් බලපාන්නේ SIS යි. DMI එකටයි. එතකොට ඒ ගොල්ලෝ දකිනවා විවිධ ආරක්ෂක ලේකම්වරු එනවා විවිධ වෙනස්වීම් වෙනවා. එතකොට මෙතනදි ඒ Assessment එක ඉතාම වැදගත්. ඒ Assessment එක අනුව තමයි එතැනදී ඒ Coordination වෙන්නේ. ඉතිං එතන ලොකු අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් තියෙනවා. වගකීමක් තියෙනවා Coordination එකක් වෙනවා. එතනදි අපි කියනවා මේ දේ වෙලා නමුත් මේ දේ කරේ නැත්නම් මේ වගේ ප්‍රශ්නයක් ඇතිවෙනවා. එතනදී ඒ අවස්ථාවේදීම ආරක්ෂක ලේකම් වරයා උපදෙස් දෙනවා නාවික හමුදාවෙන් කල යුතු රාජකාරි මේක කරන්න එහෙම නැත්නම් CID එකෙන් තියෙනවා නම් මේකෙ Investigation එකක් පටන් ගන්න. එහෙම නැත්නම් මේකේදී තවදුරටත් තව ටිකත් ඔයගොල්ලන් ඕක කරගෙන යන්න. ඒ ආදී වශයෙන් අපි ඒ Decisions ගන්න Operational එකේදී ඉහළ තීරණ ගැනීමේ දී එතන ඒ සිදුවීමක් සිදුවෙනවා

ප්‍ර: දැන් මන් ඔබගේ පිළිතුර කෙටි කර ගතහොත් ආරක්ෂක ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් සතියකට වරක් පවත්වන ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමේදී ඔබලා සහභාගි වෙන විශේෂයෙන් බුද්ධි අංශ විසින් ඉදිරිපත්වන කරුණු සහ අනිකුත් පාර්ශවයන් විසින් ඉදිරිපත් කරන කරුණු සලකලා බලලා ඒ ඉදිරි පියවරක් ගැනීමට අවශ්‍ය අවස්ථාවන්

FAIR COMMENT BY JEZEEM

වලදි ඒ ගත යුතු ඉදිරි පියවර ඒ අදාල අංශ වෙත නිකුත් කිරීම ඒ අවස්ථාවෙදීම ලේකම් වරයා විසින් සිදුකරනවා කියලා ද ඔබ කියන්නේ?

පි: ඔබ හරි.

ප්‍ර; ඒ කියන්නේ ඔබ කිව්වා Tactical level?

පි: එතනදි වෙන්නේ Opertional

ප්‍ර; ඒ කියන්නේ?

පි: ක්‍රියාන්විතයක්.

ප්‍ර; ලැබෙන මෙහෙයුම් ?

පි: මෙහෙයුම් සම්බන්ධීකරණයක් කොහොමද කරන්න ඕනේ කියන එක Agencies එක්ක ඒ අදාල හමුදාපතිවරුන්ට ඒ අදාල IGP ට ඒ උපදෙස් ලබාදීම් සිදු කරනු ලබනවා ඒ Operational level developments වලට.

ප්‍ර: දැන් 2012 ඔබ අධ්‍යක්ෂක බුද්ධි යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක විදියට ඉන්න කොට මේ කරුණු ඉදිරිපත් කිරීම ඔබ සිදු කරේ කොයි ආකාරයට ද කොයි ආකාරයටද?

පි: මම දැන් අර කලින් .

ප්‍ර; මං කියන්නේ ආකාරය කියන්නේ Slide Presentation එකක් ද නැත්නම් Report හදලා ලේකම්තුමාට ලබා දීම කොහොමද ඒක කරේ?

පි: ඒක එතනදි Coordinating meeting එකේ අපි හැම තිස්සේම Power point එකක් use කරනවා ඒකට හේතුව අපිට ඉතාමත්ම පැහැදිලිවම ඒක ඉදිරිපත් කිරිමක් කරන්න පුළුවන් සියළුම අයටම. ඊට අමතරව අපි විශේෂිත වූ කරුණු පිළිබඳව විටින් විට විවිධාකාරයෙන් අපි Routing Report ඉදිරිපත් කරනවා අමතරව වෙනම Study කරලත් අපිසමඟ ඒවා එතැනදි කාල වෙලාව නෑ ඒ හැමදෙයක්ම කතා කරන්න ඒ පිළිබඳව වෙනම වාර්තාත් අපි ඉදිරිපත් කරලා කෙලින්ම ආරක්ෂක ලේකම්තුමාට ඉදිරිපත් කිරිමක් එතැන කරනවා.

ප්‍ර: ඔබ කියා සිටියා එම රැස්වීමෙන් පසුව සති පතා පැවැත්වෙන ආරක්ෂක මණ්ඩලයේ රැස්වීම් පවත්වනවා කියලා Security council ?

පි: ඔබ හරි.

ප්‍ර; එකී රැස්වීමේදී ආරක්ෂක කවුන්සිලයේ එහෙම නැත්නම් ආරක්ෂක මණ්ඩලයේ දී මොනවාද සාකච්ඡා කෙරෙන්නේ ?

පි: විශේෂයෙන් දැන් අතනින් සකච්ඡා කරපු හැමෝටම යන්න බැරි නිසා එතනදි මම කියපු Areas ටික අපි Broadly Identify කරනවා මම කියපු Threat 4. එතනදි අපි කාලය සහ අපි ජනාධිපතිතුමාගෙන් බලාපොරොත්තු වෙන්නේ අවශ්‍ය Direction එක සහ Decision එක එතකොට ඒකට අවශ්‍ය කරන විදියට ඒ අවශ්‍ය කරන දේවල් ටික අපි සකස් කරගෙන අපේ ඉදිරිපත් කිරීම ඒ ආරක්ෂක මණ්ඩලයට සුදුසු විදියට තමයි අපි ඉදිරිපත් කිරීම කරන්නේ ජනාපතිවරයාට අවශ්‍ය කරන

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

තීරණ ගන්න අවශ්‍ය කරන පසුබිම සහ උපදෙස් සහ අපගේ නිර්දේශයන් ලබා දීම තමයි අපි අර Strategic level එකේ ජනාධිපතිවරයෙක් හැටියට ඒය සම්පූර්ණයයෙන්ම ජාතික ආරක්ෂාව පිළිබඳව ඒ අදාල සතියේ අභියෝගයන් පිළිබඳව ද දැන ගැනීමට සහ ඒ අභියෝගයන්වලට අවශ්‍ය කරන අනෙකුත් රාජතාන්ත්‍රණය සහ අනෙකුත් දේවල් සම්බන්ධයෙන් උපදෙස් අපිට ලබාදීම කරන අතරම ඒ අවශ්‍ය කරන යාන්ත්‍රණය ශ්‍රී ලාංකීක ශ්‍රී ලංකාවක් හැටියට Implement කරන්න පුළුවන් ජනාධිපතිතුමාට පමණයි ඒක තමයි අපි එතනදි ඒ විදියට තමයි අපි briefing එක ඉදිරිපත් කරන්නේ.

ප්‍ර; ජනාධිපතිතුමා තමයි සේනාධිනායකවරයා ඒ වගේම කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා සහ විධායකයේ ප්‍රධානියා වන්නේ?

පි: ඔබ හරි.

ප්‍ර; ඔබලා විසින් එකී කවුන්සිලයේ දී ඉදිරිපත් කරන්නේ රටට තිබෙන අභියෝග සහ ඒ අභියෝග ජය ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ගයන් මොනවාද කියලා තමයි ඔබ එම කවුන්සිලයේ දී ඉදිරිපත් කරන්නේ?

පි; ඔබ හරි.

ප්‍ර: එහිදී ජනාධිපතිවරයා විසින් ඔබලා විසින් ඉදිරිපත් කරනු ලබන ඒ අභියෝගයන් ජය ගැනීමට එහෙම නැත්නම් ඒවා පරාද කිරීමට ඔබලා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා සලකලා බලලා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නියෝග සහ අදාල තීරණ ගැනීම තමයි ජනාධිපතිතුමා විසින් කවුන්සිලයේ දී සිදු කරන්නේ කිව්වොත් හරිද?

පි: ඔබ හරි මම ඒකට එකක් එකතු කරන්න කැමති විශේෂයෙන්ම Security Council permanent members ලා බැලුවාම ඉතාමත්ම පැහැදිලියි ඒ කියන්නේ රටේ තියෙන ප්‍රධානතම අමාත්‍යාංශවල ලේකම්වරු එතැන ඉන්නවා. රටේ Decision ගන්න හමුදා නිලධාරින් ඒ කියන්නේ Security පැත්තෙන් ඒ ගොල්ලොත් ඉන්නවා ඊට අමතරව අගමැතිතුමාත් එතන ඉන්නවා. පැහැදිලිවම එතනදි ඒ යම් කිසි දෙයක් ප්‍රශ්නයක් ආවාම ඒක සාකච්ඡා කරලා ඒ Direction එක දුන්නම යාන්ත්‍රණය කිසිම මේකක් නැතිව උඩ ඉදන් පල්ලෙහාටම ඒක ක්‍රියාත්මක වෙනවා.

දැන් වේලාව පෙ.ව.11.35
මෙතැන් සිට:ල/ලේ මුතුමාලි මෙනවිය.

FAIR COMMENT — BY JEZEEM

වේලාව : පෙ.ව.11.35 යි.
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප : සලේ මහත්මයා මම මේ අවස්ථාවේදී ඔබට බාධා කරලා ප්‍රශ්නයක් අහන්නම්. දැන් අපි හිතමු යම් කිසි සිද්ධියක් ඇති වෙන්න යනවා කියලා ඔබලා තොරතුරු වාර්තා කෙරුවොත් ඒ පිළිබඳව මම මේ උදාහරණයක් කියන්නේ ඒ පිළිබඳව ජනාධිපතිතුමාට අරමුණක් හෝ අදහසක් නැත්නම් ඔබලාගේ සිරිතක් තියෙනවාද අපි මෙහෙම කරමු කියලා යෝජනා කරලා ඒ සඳහා අනුමැතිය ලබා ගන්න?

පි : ස්වාමිනි ඔබ හරි විශේෂයෙන්ම ඒ කියන්නේ බුද්ධි නිලධාරීයෙක් හැටියට අපිට ලොකු වගකීමක් තියෙනවා තොරතුරට වැඩිය ඒ සිදු වීම වැළැක්වීමට කටයුතු කිරීම. එතකොට අපේ අභියෝගයන් අතරේ අපේ ඇත්තටම අපි සක්‍රීයව ක්‍රියාත්මක වෙන්නේ රටේ peace එකක් තියෙන කොට. යුද්ධය අපි බලකරනවා වගේම යුද්ධයක් ඇති වෙලා යුද්ධය නැවතුනයින් පස්සේ නැවත වරක් ඒ යුද්ධයක් ඇති නොවන්න කටයුතු කිරීමේ අති විශාල වගකීමක් රටේ තියෙන බුද්ධි අංශවලට පැවරිලා තියෙනවා. එතකොට අපේ කාර්ය භාර්ය ඉතාමත්ම සක්‍රීය වෙන්නේ යුද්ධයට වැඩිය යුද්ධය නැති සාමය කාලයේදී. එතනදී අපේ ක්‍රියාවලියේදී අපි විශේෂයෙන්ම ලොකු වගකීමක් තියෙනවා ඒ ජනාධිපතිතුමාට හඳුනා ගත හැකි ආකාරයට ඒ බැරුරුම් තත්ත්වය හඳුන්වලා දීලා ඒ තුළින් ඉදිරිපත් කරන්න අපේ විශේෂයෙන්ම ඒ Threat එක ඒ Threat එක අපි කරන ගමන්ම ජනාධිපතිවරයා කියන්නේ එක් රජයේ ඉන්න ප්‍රධානීයෙක් පමණයි. නමුත් ඊට වැඩිය අපිට ලොකු මේ පිළිබඳ ලොකු දැනුමක් තියෙනවා. එතකොට අපි කරන්නේ එතුමාට ඒ තීරණ ගැනීමට පහසු වන ආකාරයට අපි ඉදිරිපත් කිරීම කරන අතරම අපි වෙනමම Threats වලදී විශේෂයෙන්ම ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ Study එකක් කරලා මේ විදිහට තමයි අපිට මේක පාලනය කළ හැක්කේ කියන එක නිර්දේශයන් අපි සම්පූර්ණයෙන්ම ඉදිරිපත් කිරීමක් කරනවා. ඒ Security Council එකේදී Briefly ඉදිරිපත් කරත් අපි විශේෂයෙන්ම අනිකුත් කාරණාවලදී පොතක් හැටියට හදලා අපි ඒක ඉදිරිපත් කිරීමක් කරනවා මොකද එතකොට ස්වාමිනි කියපු විදිහට ඒකේ අපේ කාර්ය භාරයක් තමයි ඒක කොහොමහරි ඒක ඒ අපි දකින Threat

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

එක වළක්වන්න සියළු දෙනාවම එක් කර ගෙන ඒ අපේ තියෙන නිර්දේශයන් ක්‍රියාත්මක කරන්න පෙළඹවීමක් සහ ඒ අවශ්‍ය කරන පරිසරය ගොඩ නැඟීමක් අපි විසින් කළ යුතු වෙනවා. අපි ඒක කරනවා.

ප්‍ර : ඔබට තියෙන ඒ විශේෂිත දැනුම අනුවනේ මේ දැනුවත් කිරීම කරන්නේ?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : එතකොට දැන් බැරිවෙලාවත් මම මේ උදාහරණයක් කියන්නේ බැරිවෙලාවත් ජනාධිපතිතුමාගේ අදහස වුනොත් නෑ අපි එහෙම කරන්න ඕනේ නෑ කිව්වොත් මේ Practically වෙන දේ ආ... එහෙනම් අපි සද්ද නැතුව ඉන්නවාද නැත්නම් නෑ එහෙම නෙවෙයි ජනාධිපතිතුමනි කියලා එතුමාව දැනුවත් කරලා මේ වැඩේ අපි කරමු කියලා පෙළඹවීමක් කරනවාද?

පි : ස්වාමිනි අනිවාර්යෙන්ම අපි පෙළඹවීමක් කරනවා. මොකද හේතුව එතනදී අපිට එතෙන්ට යන්න බැරි වුනොත් අපි විකල්ප ක්‍රම යොදවා ගෙන එක්කෝ බලනවා ඒක අපේ ක්‍රමවේදය අනුව අපිට ඒක නතර කරන්න පුළුවන්ද කියලා. එහෙම බැරි වුනොත් අපි වෙන ආකාරයකින් හරි ජනාධිපතිතුමාට ඒ අවශ්‍ය කරන පණිවිඩය සහ ඒකේ බැරුරුම්කම දැනුම් දීමට අපි කටයුතු කරනවා.

****

<u>ජොෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : දැන් මා 2012 වර්ෂය ගැන කතා කරමින් ඉන්නේ. මේ 2012 වර්ෂයේ ඔබ Security Council එකට ආරක්ෂක කවුන්සිලයේ නිත්‍ය සාමාජිකයන් කවුද යන්න ඔබ කියා සිටියා. 2012 අවුරුද්දේදී රාජ්‍ය ඇමතිවරයෙක් හිටියද ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් එසේ රාජ්‍ය ඇමතිවරයෙක් සිටියා නම් ඔහු මෙම Security Council එකට ආරක්ෂක කවුන්සිලයට සහභාගි වුණාද?

පි : 2012 දී ජනාධිපති සහ අගමැති එවකට තිබ්බ මං හිතන්නේ ව්‍යවස්ථාව අනුව රාජ්‍ය වෙනමම හිටියේ නෑ. 2015 න් පස්සේ තමයි ඒ Appointment එක ආවේ. මගේ දැනුම හැටියට.

ප්‍ර : දැන් ඔබ මීට පෙර සාක්ෂි දෙන විට පෙර දිනයේ සාක්ෂි දෙන විට කියා සිටියා ඔබ DMI අධ්‍යක්ෂක යුධ හමුදා බුද්ධි වශයෙන් පත් වුණාට පසුව ජාතික ආරක්ෂාවට තිබෙන අභියෝගයන් පහක් හඳුනා ගත්ත බව?

පි : ඔබ හරි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : එනම් ත්‍රස්තවාදයක් නැවත ශ්‍රී ලංකාව තුළ ඇති වීමේ අවධානය අංක එක, අංක දෙක වශයෙන් විදේශ අන්තවාදී ප්‍රවණතා හා එමඟින් ශ්‍රී ලංකාවේ ඇති අවදානම?

පි : ඔබ හරි.

ප්‍ර : සංවිධානාත්මක අපරාධ, සයිබර් අපරාධ සහ අංක 05 ලෙස භූ දේශපාලනික හා ආරක්ෂක ප්‍රවණතා හා ඒවා එමඟින් ශ්‍රී ලංකාවට ඇති බලපෑම යන කරුණු ?

පි : ඔබ හරි.

ප්‍ර : ඔබ තවදුරටත් පෙර දිනයේ සාක්ෂි දෙමින් කියා සිටියා මෙම කරුණු පහ හඳුනා ගැනීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ Desks 05 ක් ඒ විෂයන්ට අනුව ඇති කළා කියලා හරිද?

පි : Desk 05 ක් ගොඩනැගුවා. Desk ගණනාවක් තියෙනවා නමුත් මේවා විශේෂයෙන්ම මේවා Handle කරන්න වෙනමම Desk තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ මෙම කරුණු පහ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අධ්‍යක්ෂක යුධ හමුදා බුද්ධි වශයෙන් ඔබ කුමක්ද ගත්ත ක්‍රියාමාර්ගය?

පි : විශේෂයෙන්ම ඔය Threat පහට මුල ඉඳන්ම ඒ කියන්නේ මම එන්න කලින් ඉඳන්ම ආයතනයේ දැන් රාජ්‍ය යුධ හමුදා බුද්ධි බලකාය කිව්වම Directorate එක කිව්වම මේකේ හදවත තමයි Directorate එක. Main Component එක. මේ ප්‍රධාන මේකේ තමයි සියළුම කොටස් ටික වෙන් කරලා තියෙන්නේ. එතකොට මේකේ යටතේ Executive Arm එක තමයි අර මං කිව්ව බලකා. පළවෙනි බලකාය, දෙවෙනි බලකාය, තුන්වෙනි බලකාය, හතරවෙනි බලකාය. ඉතින් මේ තොරතුරු ඔක්කොම එකතු වෙන්නේ ඇවිල්ලා Directorate of Military Intelligence එකට. එතනදී මේ තොරතුරු ඒ රැස් කර ගැනීම සහ අනෙකුත් තොරතුරු එකතු කර ගැනීම, විශ්ලේෂණය කිරීම ඔක්කොම කරන්න Desk ගණනාවක්ම තියෙනවා. ඒකේ විශේෂයෙන්ම කොටස් දෙකකට අපි කඩනවා. Intelligence කියලා එක පැත්තකුත්. Security කියලා තව පැත්තකුත්. දැන් Security Component එක deal කරන්නේ ඇවිල්ලා විශේෂයෙන්ම Identity Card එක සම්බන්ධයෙන් මිනිසුන්ට තියෙන වෙන මේවා සම්බන්ධයෙන්, Passive Operation සම්බන්ධයෙන්, නිලධාරීන් සම්බන්ධයෙන් එතකොට අපි Security Clearance එකක් කරනවා Recruit කරන කොට ඒ Security පැත්ත. ඉතින් Intelligence පැත්ත

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

තමයි දැන් මම ඔය කියපු කොටස් හතරටම වැටෙන්නේ. ඒ කොටස් හතර තීරණය කරන්න වෙනමම තියෙනවා LTTE Desk එකක්. ඊට අමතරව Extremism Desk එකක් තියෙනවා. නමුත් මේ Desk එකට සීමා වෙලා නෑ.

ප්‍ර : ඔබ කියන්නේ වෙනමම තියෙනවා ත්‍රස්තවාදී LTTE ත්‍රස්තවාදය සම්බන්ධයෙන්

පි : කටයුතු කරන වෙනමම Desks එකක් තියෙනවා.

ප්‍ර : වෙනම ඒකකයක් තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : ඒ වගේම අන්තවාදය සම්බන්ධයෙන් කටයුතු කරන ඔබ කියන්නේ වෙනම Desk එකක් තියෙනවා.

පි : නමුත් මේ Desk එකටත් අමතරව මේ Desk එක තියෙද්දීත් මේ Desk එක කොටස් ගණනාවකට වෙන් වෙනවා. ඒ කියන්නේ Social Media Handle කරන්න වෙනම. එතකොට සයිබර් සම්බන්ධයෙන් කටයුතු කරන්න වෙනම අංශයක් තියෙනවා. ඒ එක්කම GEO – Political Realities and Impact ඒක Handle කරන්නත් වෙනමම අංශයක් තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ භූ දේශපාලනික හා ආරක්ෂක ප්‍රවණතා කියන විෂය සම්බන්ධයෙන් කටයුතු කරන වෙනම Desk එකක් තියෙනවා?

පි : තියෙනවා. එතකොට මේ Threat වලට අමතරව දැන් මේවා ඔක්කොම ටික එක Registry එකක් තියෙනවා. ඒ කියන්නේ සියළුම දත්ත ටික ගබඩා කරනවා ඒක අපි කියනවා Directorate එකේ හදවත කියන එක. ඒ කියන්නේ සියළුම මම අර දැන් SIS එකේ මං කිව්වා මිලියන හතක වගේ අපිට තියෙනවා අති විශාල දත්ත සංඛ්‍යාවක්. ඒ වගේම DMI එකේ ඉන්දෙද්දීත් අති විශාල දත්ත කොටස් දෙකකට අපි එකතු කරලා තියෙනවා.

ප්‍ර : DMI එකේ හදවත ගැන ඔබ කියා සිටියා? ඒ දත්ත ගබඩාව කොටස් දෙකක් තිබෙන බව ඔබ කියා සිටියා?

පි : ඔව්.

ප්‍ර : මොකක්ද ඒ කොටස් දෙක?

පි : එකක් ඇවිල්ලා Manual Registry එක කියලා කියනවා. ඒ කියන්නේ සියළු දෙන Documents ඔක්කොම ටික Manually Record වෙනවා ඒ File වල. අනිත් එක තමයි ඇවිල්ලා Electronic Registry එක. ඒ කියන්නේ මේ Manually එන දේවල් ඔක්කොම පසුකාලීනව දැන් ඉස්සර කාලේ අපිට කරන්න පුළුවන් එතකොට Electronically මේ සියළුම දත්ත

FAIR COMMENT — BY JEZEEM —

Electronically ගබඩා කිරීමක් සිදු වෙනවා. දැන් උදාහරණයක් වශයෙන් ගත්තොත් දැන් SIS එකේ මේ ගබඩාකරණය කරන්න අවුරුදු 6 ක් ගත වුණා පරණ ඒවා ටික කරන්න. තාමත් අපි කර ගෙන යනවා.

ප : කොයි කාලේද ඒ ආරම්භ වුණේ?

පි : ඒක ආරම්භ වුණේ ඇත්තටම 2014 තමයි මේක Initiate කළේ දැන් ඉන්න ජනාධිපතිතුමා තමයි පස්සේ ඒ Project එක 2015 පටන් ගන්නවා SIS එකේ මේ Electronic විදියට මේ දත්ත ගබඩා කිරීම . හැම එකක්ම Scan කරලා ඒක ලොකු Project එකක් මිලියන ගාණක data තියෙනවා. ඉතින් එතකොට DMI එකෙත් මේක කලින් ඉඳලම පටන් අරගෙන තිබ්බා. තාමත් ඒක සිදු වෙමින් පවතිනවා. ඒ දත්ත ඒ විදිහට Registry එකේ තියෙනවා. මේ Registry එකට කාටවත් access එකක් නෑ. එතකොට මේ සියළු එන දත්ත ඒ අනුකූලව ඒක Desk අනුව වෙන්න පුළුවන්, ඒක සංවිධාන අනුව වෙන්න පුළුවන්, පුද්ගලයෝ අනුව වෙන්න පුළුවන්, රටවල් අනුව වෙන්න පුළුවන් යම් කිසි ක්‍රමානුකූලව මේ ගබඩාකරණය වෙනවා මේ සියළු දත්ත. එතකොට මේකෙන් File එකක් Access කරනවා නම් ඒකත් Security එක ආරක්ෂා කර ගන්න මම File එකක් ලබා ගන්නවා නම් මට මම ඉල්ලීමක් පොඩි Note එකක් දාන්න ඕනී ඒ Note එක අරගෙන ඊට පස්සේ ඒ Registry Process එකක් තියෙනවා ඒ Process එක ගිහිල්ලා ඒ File එක දුන්නාම මට දුන්නේ මේ වේලාවේ කියලා සඳහන් කරනවා. නැවත වරක් එන වේලාව සඳහන් කරනවා. එතකොට ඒකේ අර Need to know basis එක තියෙනවා. මම LTTE ඉන්න කොට මට ඒ කියන්නේ මගේ ඉන්න නිලධාරියාට LTTE Desk කරන නිලධාරියාට Extremism කියන Desk එකේ File එකක් ගන්න බෑ. එහෙම ගන්නවා නම් එයා බුද්ධි අධ්‍යක්ෂකගෙන් අනුමැතිය අරගෙන තමයි ගන්න ඕනී. ඒ එක ක්‍රමවේදයක් Registry එකේ. අනිත් එක දැන් මේ රටේ තියෙන ප්‍රශ්න සහ රටේ තියෙන මේ වේගයෙන් ව්‍යාප්ත වෙන කොට එතකොට අපිට මේක ගොඩක් දුරට ලොකු කාලයක් යනවා. ඒක නිසා පස්සේ මේක සම්පූර්ණයෙන්ම පරිගණක ගත කරලා තියෙනවා ඒක තමයි Electronic Registry එක. එතකොට Electronic Registry එකට අපි යම් කිසි පුද්ගලයෙක් දැම්මොත් එහෙම ඒ දැම්මම අපිට හැකියාව තියෙනවා ඒ පුද්ගලයාගේ Data එක අනුව සම්පූර්ණ විස්තර ටික අපිට ලබා ගන්න. විදේශ රටවලට ගිහිල්ලා

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

තියෙනවා ද, එයාගේ family එක කවුද, එයා කොහේද ඒ සියළුම දේවල් අපිට හැකියාව තියෙනවා. නමුත් මෙතනදී මේ Data base එක හැමතිස්සේම යාවත්කාලීන වෙනවා. විදේශවලින් එන තොරතුරු, ලංකාවෙන් ගන්න තොරතුරු, මාධ්‍යය හරහා ගන්න තොරතුරු ඒවා වෙනම Grading එකක් කරලා ඒ ආකාරයෙන් ඒ සිදු වීමක් සිදු වෙනවා.

ප්‍ර : ඒ කියන්නේ ඔබ කියන්නේ මේ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයෙන්?

පි : ඔව්.

ප්‍ර : සිදු වෙන කාර්යය මේ

පි : මම කියපු Registry එක.

ප්‍ර : Registry එක.

පි : ඔව් එතකොට මේ Registry දෙක තමයි ඇවිල්ලා ප්‍රධාන හදවත. ඕනෑම බුද්ධි ආයතනය ලෝකයෙත් මේ Registry එක තමයි හදවත . එතකොට අනිත් දේවල් ටික අපි එන කොට අනික් තොරතුරු එහෙම එනකොට අපි හැම තිස්සේම නමක් ආවාත් අපි ටක් ගාලා LU එකක් කරලා Immediately electronically හරි දෙපැත්ත ගන්නවා මෙයාගේ Back ground එක මොකක්ද කියලා.

ප්‍ර : LU එකක් කියන්නේ?

පි : LU එකක් කියන්නේ Look Up එකක් කරනවා. ඉතින් එතකොට ඒ වගේ අර අනිකුත් ආයතන වගේම මේ බුද්ධි ආයතනය කියන්නේ Professional ආයතනයක්. මේක අර විශේෂයෙන්ම මට කාලවේලාව මදී මේක explain කරන්න. මොකද මේ Need to know basis එකේදී ඒ නිලධාරීන් යොදවලා ඒ විදිහට ඉතාමත්ම සංවිධානාත්මකව තමයි මේ හැම දෙයක්ම වෙන්නේ. දැන් උදාහරණයක් විදිහට Security Clearance එකක් මගෙන් ඉල්ලුවොත් යම් කිසි කෙනෙක් පිටරට යවන්න, මට ඒ වේලාවේ මම කෝල් කරලා අහන්නේවත් ඒ ටික අහන්න මට අවශ්‍යතාවයක් නෑ. අවශ්‍ය කරන ආවාම අපි form එකක් තියෙනවා. ඒ form එක මම ඇරියාම ඒ form එක මම Registry Process එකට පටන් ගත්තාම ඒ ගොල්ලො සම්පූර්ණයෙන්ම ඒ පුද්ගලයෙක්ගෙන් අවශ්‍ය කරන Back ground එක එයාගේ Terrorist Involvement එක නම ඇවිල්ලා තියෙනවා නම් එහෙම Extremism involvement එකක් තියෙනවා නම් එහෙමයි පිටරට ගිහිල්ලා ඇවිල්ලා තියෙනවාද එහෙමයි එතකොට මට සම්පූර්ණයෙන්ම නමක් කිව්වම මට හැකියාව තියෙනවා පිටු

තුනක විතර විනාඩි කිහිපයක් ඇතුළත සම්පූර්ණ මේ පුද්ගලයාගේ වාර්තාවක් ලබා ගන්න. ඒ වාර්තාව ලබා ගැනීමේදීත් ඒ තොරතුරු ඒ Registry එකට දැමීමේදීත් යම් කිසි ක්‍රමවේදයකට වෙන්නේ. හැමෝම කියන තොරතුරු ඒවා වැටෙන්නේ නෑ. ඒවා වෙනම Assess කරලා Analyze කරලා ඒක මාධ්‍යය තොරතුරක් නම් මාධ්‍යය තොරතුරු Verify කරලා තියෙනවා නම් Verify මම අර Grading System ඒ ඔක්කොමත් එක්ක එන්නේ. ඉතින් එතකොට ඒ විදිහේ Process එකක් තමයි මම අර කියපු එක යන්නේ. ඒක නිසා මේක

ප්‍ර : මේ DMI එකේ තිබෙන තාක්ෂණික දත්ත ගබඩාව දැනට හැම මොහොතකම යාවත්කාලීන වෙනවාද?

පි : ඔව් මම දැන් 2016 එනකම්ම ඒක යාවත්කාලීන වෙනවා මොකද ඒක වෙන්නේ නැතුව ඉන්න බෑ. මොකද දවසකට අතිවිශාල ගණනාවක් දැන් මේ මම ඉන්න අවස්ථාවේ වුනත් අද දවස ඇතුළත සිදුවීම් වෙනවා. ගොඩාක් දේවල් වෙනවා . මේ හැම දෙයක්ම System එකට යන්න ඕනී. Registry එකට Process එක වෙනවා.

ප්‍ර : දැන් ඒ ආකාරයටම රාජ්‍ය බුද්ධි සේවාවේ තිබෙනවාද තාක්ෂණික තොරතුර ගබඩා Register යක්?

පි : ඔබ හරි මම හිතන්නේ ඊට වැඩිය සංවිධානාත්මක විදිහට මම දැක්කා මම ඒ Registry ට ගියාම ඊට වැඩිය ඒක යම් කිසි ක්‍රමානුකූලව ඒ දේ සිදු වෙනවා. අති විශාල මිනිස් සංඛ්‍යාවක් මම හිතන්නේ 25 ක් වගේ සංඛ්‍යාවක් මේ Manual Registry එකේ වැඩ කරනවා. ඒ හා සමානව සංඛ්‍යාවක් වැඩ කරනවා Electronic Registry එකේ. ඉතින් ඒක එතකොට දවසට දැන් වුනත් සාමාන්‍යයෙන් Scanners පහකින් Documents Scan වෙනවා. පරණ එක clear කරන ගමන්ම අලුතෙනුත් එන ඒවාත් එක්ක යන්න. ඉතින් අපි ඒ විදිහට තමයි ඒක කරන්නේ.

ප්‍ර : නමුත් ඒ කියන්නේ ඔබ කියා සිටින්නේ තවමත් රාජ්‍ය බුද්ධි සේවාවේ ඉලෙක්ට්‍රොනික දත්ත ඒකකය

පි : තවමත් ඒක යාවත්කාලීන වෙමින් පවතින ගමන්ම පරණ ඒවා තාම අපි clear කර ගෙන යනවා. ඒ කියන්නේ දැන් 1943 ඉඳන් තියෙන details තමයි අපි ළඟ තියෙන්නේ . මේක ආරම්භ වෙලා තියෙන්නෙ 1943. අවුරුදු 80 කට ආසන්න කාලයක ඉතිහාසයක් තියෙනවා රාජ්‍ය බුද්ධි සේවාවට. ඉතින් එතනදී ඒ Documents අතිවිශාලයි. ඉතින් එතකොට මම කිව්වේ මිලියන හතක වගේ පුද්ගලයෝ හැටියට ඒ data තියෙනවා. ඉතින් එතකොට මේවා ඒ

FAIR COMMENT BY JEZEEM

පුද්ගලයින්ගේ data පමණක් නෙවෙයි අනික් හැම දෙයක්ම මේ හැමdata එකක්ම මේ අපි Electronic කර ගෙන යන ගමන් අපි යන්නේ ඇත්තටම පස්සට යන්නේ . ඒ කියන්නේ අපි මේක 2015 පටන් ගන්න කොට අපි Electronic Registry එක පටන් ගත්තේ ඇවිල්ලා 2014, 2013, 2012 ඒ ආදී වශයෙන් තමයි අපි යන්නේ. ඉතින් ඒ අනුව අපි දැනට සෑහෙන සංඛ්‍යාවක් අපි 80% ක් විතර පරණ data ටික clear කරගෙන යනවා. ඒ එක්කම එන්න එන්න අපේ ආයතනයත් ගොඩක් පුළුල් වෙලා තියෙන නිසා ගොඩක් ඉතුරු date ත් තියෙනවා. ඉතින් මේවා ගොඩක් අපි යම් කිසි ක්‍රමවේදයකින් ඒ දත්ත ගබඩා වලට යනවා ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ඒ දත්ත ගබඩාව සකස් කරන්නේ ඕනෑම අවස්ථාවක Search Function එකකින් යම් කිසි පුද්ගලයෙක් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමේ හැකියාවක් තිබෙන අයුරින්ද?

පි : ස්වාමිනි අනිවාර්යයෙන්ම එහෙම තමයි තියෙන්නේ. ඒ අවශ්‍ය කරන Access එක ගන්න තැන්වලට ඒ අවශ්‍ය කරන Access එක දීලා තියෙනවා. අර Need to know basis එක පද්ධතියට අපිට ඒ ගොල්ලොන්ට ඒ ගොල්ලන් Log වුණත් අපිට බලා ගන්න පුළුවන් ඒ Access එක දීලා තියෙනවා ඕනෑම කෙනෙකුට ඒ ඒ කියන්නේ ඒ Subject එක කරන නිලධාරියාට තමන්ට ඒ Access එක ගන්න පුළුවන්.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : එතකොට සහරාන් කාෂිම් කියන පුද්ගලයා ස්වයං සාතකයා සම්බන්ධ තොරතුරු දැනට යාවත්කාලීන වෙලාද තියෙන්නේ නැත්නම් තවමත් වෙමින් පවතිනවාද කියලා ඔබට කීමට හැකියාවක් තියෙනවාද?

පි : ඔබ හරි යාවත්කාලීන පමණක් නෙවෙයි. තවත් වෙමින් පවතිනවා. දැන් උදාහරණයක් වශයෙන් අද සහරාන් ගැන අලුත් තොරතුරක් ආවොත් ඒක එතෙන්ට යනවා. ඉතින් මේක අපි බුද්ධි කියන්නේ අර Intelligence circle එක වගේ ඉතින් එන එන තොරතුරු සියළුම තොරතුරු අපි එයාගේ File එකට යනවා. ඒ කියන්නේ Manually ත් යනවා. Electronically ත් යනවා.

ප්‍ර : ඔබ කියා සිටින්නේ මේ SIS එක සම්බන්ධ මම අහන්නේ?

පි : දැන් මම SIS එකේ ඉන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප : මම අහන්නේ SIS එකේ?

පි : SIS එකේ ඒක අනිවාර්යයෙන්ම යුධ හමුදා බුද්ධි මණ්ඩලයට වැඩිය ඒක සිදු වෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප : එතකොට මම අහපු ප්‍රශ්නෙට ඔබ ලබා දුනු පිළිතුර SIS එකේ දත්ත ගබඩාව සම්බන්ධයෙන්?

පි : අන්තිමට මම

ප : Search Function එක ගැන

පි : ඔබ හරි ස්වාමිනි Search Function එක ගැන මේ SIS එක ගැන තමයි මම උත්තර ලබා දුන්නේ.

ප : එතකොට DMI දත්ත ගබඩාවේත් ඒ විදිහට Search Function එකක් කරන්න පුළුවන්ද?

පි : එසේමයි ස්වාමිනි. මම හිටියේ 2016 නොවැම්බර් වෙනකල්. දැනුත් මම හිතන්නේ එහෙම වෙනසක් වෙන්නේ නෑ. ඒ අනුකූලව මම හිතන්නේ නෑ SIS එක වගේ සම්පූර්ණයෙන්ම මොකද SIS එකේ මේ සම්බන්ධයෙන් මම හිතන්නේ 40 කට වැඩි පිරිසක් යොමු කරලා තියෙනවා data ටික වැඩි නිසා. ඉතින් ඒක නිසා විශේෂයෙන්ම Security clearance එහෙම අපි තමයි ප්‍රධානම බුද්ධි සේවාව. යුධ හමුදා බුද්ධි සේවාව ගොඩාක් දුරට focus වෙලා තියෙන්නේ ත්‍රස්තවාදය සම්බන්ධයෙන්. ඉතින් ත්‍රස්තවාදීන් සම්බන්ධයෙන් ඒ එන හැම තොරතුරක්ම ඒ ගොල්ලන් අර විදිහට යාවත්කාලීනව කරනවා.

ප : Search කරන්න පුළුවන්.

පි : Search කරන්න පුවළුන් අපිට නමක් දුන්නොත් ඒ නමට සම්පූර්ණයෙන්ම එනවා විස්තර ටික.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප : මිස්ටර් සලේ දැන් ඔය කියන Directorate of Military Intelligence එකේ තියෙන data base එකයි SIS එකේ තියෙන data base එකයි link වෙනවද? ඒ කියන්නේ මේ SIS එකේ Director ට Access තියෙනවාද Directorate of Military Intelligence එකේ data base එකට ගිහිල්ලා Information share කරන්න හරි අවශ්‍ය වේලාවකදී පුද්ගලයෙක් ගැන හොයන්න හරි Search Function එකට ගිහිල්ලා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමිනි එහෙම කවදාවත් අපි දෙන්නේ නැහැ. ඒ ආයතනයේ ඇතුළත් ඒ ආයතනයේ Need to know basis එක අනුව ඒ අනුව තමයි මොකද මේ අතිවිශාල බුද්ධි ගබඩාවක්ම තියෙන්නේ මේකේ. ඉතින් ඒකේදී අපි විශේෂයෙන්ම සැලකිලිමත් වෙනවා ආරක්ෂාව පිළිබඳවත්. එතනදී මට මොනවා හරි දැන ගන්න ඕනේ වුනොත් පුද්ගලයෙක්ගේ වැඩි තොරතුරු මම ලිපියකින් මම ඉල්ලලා යවනවා යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂකගෙන් මේ පිළිබඳව මේ පුද්ගලයා පිළිබඳව තොරතුරු අපිට ලබා දෙන්න කියලා. එතකොට ඒ ගොල්ලො අර දෙන print out එක සහ ඒ ගොල්ලො අපිට වාර්තාවක් අරන් අපිට එවනවා. එහෙම නැතුව කිසිම අවස්ථාවකදී මේක Stand - alone system එකක්. Electronically වුනත් අපි එකට එකතු කරලා නෑ. මේක අපිටම ආවේණික වූ System එකකින් VPN එක දාලා සම්පූර්ණයෙන්ම අපි මේවා කරලා තියෙනවා මොකද ඒකට ප්‍රධානම හේතුව ස්වාමිනි මොකද මේ දත්ත ගත් බවට කියන පුද්ගලයින්ගේ විස්තර තියෙන්නේ අනන්‍යතාවය ඒ ගොල්ලන්ගේ පෞද්ගලිකත්වය ගොඩාක් මේකට ලොකු වගකීමක් අපිට පැවරිලා තියෙනවා ඒක නිසා සියළුම ආරක්ෂක අපි පියවරයන් අරන් තියෙනවා. මේක Stand – alone system එකක් හැටියට function කරන්න. හැබැයි ඒක කිසිවිටෙක බාධා වෙන්නේ නෑ. බාධාවක් වෙන්නේ නෑ. පුද්ගලයෙක් ගැන හොයන්න කිව්වාම මට කිව්වා නම් අද මේ පුද්ගලයා ගැන හොයන්න කිව්වොත් මට පුළුවන් විනාඩි පහක් විතර ඇතුළත Immediately basic back ground details ටික ගන්න. ඒක ගන්න පුළුවන් වෙන්නේ මට මම Access එක කරත් මගේ Access එක සඳහන් වෙනවා එතනදී . ඉතින් හැම තිස්සේම මේක ආයතනයක් නිසා රටට වගකිව යුතු ආයතනයක් නිසා අපි ඒ හැමදෙයක්ම පුද්ගලයෙක් Access කරත් එයා Access කරපු වේලාව සියළුදේම සඳහන් කරනවා. ඒ system එකේම alert එකක් එනවා එයා ඒකට අවශ්‍ය නැති විස්තරයක් ඉල්ලනවා නම්. ඉතින් ඒ වගේ තමයි කවදාකවත් බුද්ධි අංශ දෙකක data එකට link වෙන්නේ නෑ.

ප්‍ර : ඔබ මොකක්ද හිතන්නේ මෙවැනි දියුණු යුගයක තවමත් ලියුමක් ලියලා තොරතුරකට අවසරයක් ලබා ගෙන ගැනීම සහ SIS එකේ Director වත් අඩුම තරමින් Directorate of Military Intelligence එකට with certain Limitations මොනවා හරි controls දාලා Access එකක් දීම පිළිබඳව මොකක්ද ඔබ අදහස් කරන්නේ මෙහි වැදගත්කම?

FAIR COMMENT
BY JEZEEM

පි : ස්වාමිනි අපි රටවල් ගණනාවකම බුද්ධි ආයතනවලට ගිහිල්ලා තියෙනවා. RAW සංවිධානය, CIA, KGB ගොඩාක් රටවල්වල මේ ඔක්කොම රටවල් වල යම් කිසි ක්‍රමවේදයක් අනුව තමයි හැම දෙයක්ම Principles අනුව තමයි වෙන්නේ. මොකද අපි ජාතික ආරක්ෂාව කෙරෙහි ගත්තාම විශේෂයෙන්ම අපි බැඳී හිටිනවා අනවශ්‍ය තොරතුරුත් එළියට යාම වළක්වන්න. ඉතින් එතනදී එහෙම කාල වේලාවක් විශේෂයෙන්ම මම හිතනවා වැදගත් වෙන්නේ විශේෂයෙන්ම ඒ අධ්‍යක්ෂවරයා වගකියන්න ඕනේ ඒකේ සිදුවන හැම ක්‍රියාවලියකටම. ඒ එක්කම බුද්ධි තොරතුරු වගේම ඒ බුද්ධි තොරතුරු ආරක්ෂා කර ගැනීමටත් Equally අපිට වගකීමක් තියෙනවා. ඉතින් මෙතනදී වේලාවක් අඩු වීමක් සිදු වෙන්නේ නෑ. විශේෂයෙන්ම අපිට හැකියාව තියෙනවා basic තොරතුරු ඔක්කොම ටික අපට ලබා ගත්තයින් පස්සේ ඒක Operational involvement එකක් ඉක්මනින්ම ගත යුතු ක්‍රියාමාර්ගයක් නම් අපිට දුරකථනයෙන් අපි ඒක Compromise කරනවා. ප්‍රශ්නයක් නෑ අපි ටක් ගාලා ඒ අංශයෙන් ටක්ගාලා කතා කරලා අහනවා මෙයා Movement එකක් මොකක් හරි තියෙනවාද කියන එක . ඉතින් අපි ගොඩක් දුරට මේ තොරතුරු පද්ධතියෙන් කරන්නේ Immediate situation එකට Address කිරීමක් නෙවෙයි. මේ පද්ධතියෙන් කරන්නේ ඇවිල්ලා සම්පූර්ණයෙන්ම පුද්ගලයෙක් පිළිබඳ දැන් සහරාන්ගේ වුනත් අපිට මුලින් ආවොත් සහරාන් පිළිබඳව අපි Immediately දැම්මොත් අපි system එකට සහරාන් පිළිබඳව සම්පූර්ණයෙන්ම එතෙක් වාර්තා වෙච්චි සියළුම දේවල් ටික අපිට ලැබෙනවා. ඒ ලැබුණාම එතනදී අපි ඒක බලනවා එහෙම නම් අපි තව report එකක් අපි ගෙන්න ගන්න ඕනේ නම් අපි යුධ හමුදා බුද්ධි අංශය ඒකටත් කියනවා මේ පිළිබඳව වාර්තාවක් එවන්න කියලා ඕනේ නම් අපිට CID එකටත් කියන්න පුළුවන් මේ පිළිබඳව වාර්තාවක් එවන්න කියලා. හැබැයි ඒ වාර්තාවේ අනිවාර්යෙන්ම පොලිසියේ යම් කිසි සිදුවීමක් කෙනෙක් පිළිබඳව Registration එකක් වුනොත් එහෙම නැත්තම් උසාවියේ යම් කිසි අධිකරණයක නඩු කටයුත්තක් එක පුද්ගලයෙක් පිළිබඳව දැනට විභාග වෙනවා නම් ඒ එක්කම මෙයා පිටරට ගිහිල්ලා තියෙනවා නම් මෙයා ඒ එක්කම වැරදි පුද්ගලයෝ එක්ක ඇසුරු කරලා තියෙනවා නම් මේ සියළු වාර්තා අපිට ගන්න පුළුවන්.

****

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබ කියා සිටියා Basic?

පි : Basic Intelligence

ප්‍ර : මූලික තොරතුරු ලබා ගන්න ?

පි : ඔව්.

ප්‍ර : මොකක්ද මේ Basic Information සහ Detailed Information කියලා දෙකොටසක් තියෙනවා?

පි : දෙකක් තියෙනවා ඔව් ඒ කියන්නේ මෙහෙමයි අපි විවිධ අර්ථ කථනය දීලා විවිධ විදියට වෙනස් කරන්න පුළුවන්. Basic Information කියන්නේ අපි විශේෂයෙන්ම සාමාන්‍ය අපි යම් කිසි සිදුවීමක් හෝ දැන් සිදුවීමක් වුනොත් Immediately අපිට තියෙනවා කොටස් හයක්. ඒ සිදු වීම ගැන විමර්ශනය කරන්න. ඒ කියන්නේ විශේෂයෙන්ම දැන් බෝම්බයක් සිදු වුනොත් එහෙම මගේ ඔළුවට එන පළවෙනි දේ තමයි දිනය, වේලාව, ඒ සිදුවීමේ ස්වභාවය ඊට පස්සේ දැනට Casualty මොනවද තියෙන්නේ සහ දැනට තත්ත්වය සහ ඉදිරියට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව Immediately බුද්ධි නිලධාරී කෙනෙක් හැටියට ඔළුවට එනවා. එතකොට සාමාන්‍යයෙන් එක් කෙනෙක් කිව්වොත් එහෙම සර් අතන බෝම්බයක් ගියා කියලා මගේ පළවෙනි ප්‍රශ්න ටික තමයි ඒක. කොතැනද වෙලා තියෙන්නේ, කොහොමද වෙලා තියෙන්නේ, කී දෙනෙක් මැරිලා තියෙනවාද, මේක බෝම්බ පිපිරීමක්ද නැද්ද, දැනට පොලිසිය එතෙන්ට ගිහිල්ලා තියෙනවාද නැත්නම් හමුදාව යනවා, ඉදිරියේදී මොකක්ද කළ යුත්තේ කියන එක. ඉතින් එතකොට ඒ ටික අපි ගණන් ගන්නේ Basic Intelligence කියලා. එතකොට ඒ Basic Intelligence ටික අපි ගත්තාම එහෙම නැත්නම් පුද්ගලයෙක් ගැන අපි වාර්තාවක් වෙනවා මේ පුද්ගලයා යම් කිසි සැක සහිත පුද්ගලයෙක් කියලා A කියන පුද්ගලයා. A කියන පුද්ගලයා සැක සහිත පුද්ගලයෙක් කියලා ආපු ගමන්ම අපිට එක පාරටම තීරණය කරන්න බෑ එන තොරතුරු අනුව සමහර අය කියනවා මෙයා ඇවිල්ලා Extremist කෙනෙක්. මෙයා ඇවිල්ලා බෝම්බ තියන්න ආපු පුද්ගලයෙක්. මෙයා ඇවිල්ලා තවත් පුද්ගලයෙක්. එතකොට බුද්ධි නිලධාරියෙකුගේ වගකීම තමයි ඉස්සෙල්ලාම මේක පෙරන්න ඕනී අපි එහෙම නැතුව ටක් ගාලා අපි බයට ටක් ගාලා මෙයා මෙහෙම කිව්වොත් එහෙම අපිට හැමදාම රටට බය කර කර තමයි ඉන්න වෙන්නේ. සර් අතන suicide cadre කෙනෙක් ඉන්නවා. මෙතන suicide cadre කෙනෙක් ඉන්නවා. අපිට අපිව Train

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

කරලා තියෙන්නේ එහෙම නෙවේ. අපි වගකීම ගන්න ඕනී. වගකීම ගැනීමේදී ඉස්සෙල්ලාම පුද්ගලයෙක්ගේ නමක් හරි මොකක් හරි ආපුවාම අපි මූලික වශයෙන්ම අපි හඳුන ගන්න ඕනී කවුද මේ පුද්ගලයා කියන එක. ඒ පුද්ගලයා හඳුන ගන්න කියන්නේ ඒ පුද්ගලයාගේ නම හරියට අපි අඳුර ගන්න ඕනී. නම හඳුන ගත්තයින් පස්සේ මෙයාට Identity card එකක් Issue කරලා තියෙනවාද. මෙයාට Passport එකක් Issue කරලා තියෙනවාද, මෙයා පිටරට ගිහිල්ලා තියෙනවාද, මෙයාගේ ගම මොනවාද , මෙයාගේ දුරකථන අංක මොනවාද, මෙයාගේ අම්මා කවුද, මෙයාගේ තාත්තා කවුද, මෙයාගේ ඒ basic ටික basic අපි form එකක් fill කරන කොට අපි දෙන්නේ ඒ basic details ටික අපි ගන්නවා. Basic details ටික ගත්තාම අපි දකිනවා මේකේදී දැන් මේකේ කියන්නේ Basic Details ගත්තට පස්සේ මෙයා ඇවිල්ලා සහරාන් එක්ක සම්බන්ධයක් තියෙනවා. මෙයා Extremism වල කටයුතු කරනවා කියලා එනවා. ඊට පස්සේ අපි මේ තොරතුරු ටික අරගෙන ඊළඟ පියවරට අපි යනවා Detail report එකට. ඒ Detail report ට එක යාමේදී මෙයාගෙන් ගත්ත දත්ත ටික අපි වෙන මාර්ගයෙන් යොමු කරනවා. දැන් උදාහරණයක් වශයෙන් අපි කියමු දුරකථන පිළිබඳව දැන් ඒ පුද්ගලයා කියනවා මෙහෙමයි දැන් පෙරේදා නුවර එළියේ ගිහිල්ලා යම් කිසි ක්‍රියාවලියකට බෝම්බ ඔක්කොම set කරලා ආවා කියලා කියනවා. එහෙම ආවා කියලා කිව්වාම ඉස්සෙල්ලාම අපි පුද්ගලයා ගැන කරුණු සොයා ගත්තට පස්සේ ඊළඟට අපේ කරුණු Detail report එකට යන්න ඕනී මෙයා නුවර ගියාද , මෙයා වෙන කොහේට හරි සම්බන්ධ වුනාද, එතකොට අපිට තාක්ෂණය උපයෝගී කර ගන්න වෙනවා Detail report එකට යන්න. ඉතින් එතනදී එහෙම නැත්නම් නුවර ගිහිල්ලත් නැත්නම් එයා මෙතනම නම් හිටියේ එතකොට එයා ඉන්න තැන අපිට සනාථ කරන්න පුළුවන් data තියෙනවා නම් Technical data විතරක් නෙවෙයි. ඒ කියන්නේ එයා සමහර විට Telephone එක තියලා යන්න පුළුවන්. ඒ වගේ හැමදෙයක්ම අපි Train වෙලා තියෙන්නේ. ඉතින් එතකොට අපිට හැකියාව තියෙනවා ඒ අනුව මේක Detail report එකට යන්න ඕනීද නැත්නම් අපි මෙතනින්ම අයින් කරනවාද කියන එක කරන්න. ඉතින් ඒ ක්‍රියාවලියත් සිදු වෙනවා. ඉතින් Basic Detail කියන්නේ සාමාන්‍යයෙන් තොරතුරක් හෝ පුද්ගලයෙක් මූලික වශයෙන්ම හඳුනා ගැනීම. ශ්‍රී ලාංකිකයෙක්ද, මොහුගේ වයස කීයද, මොහුගේ

FAIR COMMENT BY JEZEEM

අම්මා තාත්තා කවුද, මොහුගේ ප්‍රදේශය මොකක්ද, මොහු ඉගෙන ගත්ත පාසල කොහේද, එතකොට මෙයාගේ පිටරට ගිහිල්ලා තියෙනවාද මේවා තමයි Basic Details

ප්‍ර : මා ඔබව නැවත SIS එකේ ඔබ වර්තමානයේ කටයුතු කරන SIS රාජ්‍ය බුද්ධි සේවාවේ ඔබ කියා සිටියා Manually Registry එක පවත්වනවා එහි නිලධාරීන් 25 දෙනෙකු පමණ සේවය කරනවා?

පි : හ්ම්.

ප්‍ර : එසේම Electronic Register එහිත් නිලධාරීන් 25 දෙනෙකු පමණ කටයුතු කරන බව? ඔවුන් මෙම දත්ත ගබඩාව යාවත්කාලීන කරමින් සිටින නිලධාරීන්?

පි : හරි.

ප්‍ර : දැන් මෙම දත්ත ගබඩාවත් මේ Register එක මෙහි ආරක්ෂාවට ඔබ කියන මේ තොරතුරු ඔබලා වෙනත් පාර්ශවයන් සමඟ බුද්ධි ඒකකයන් සමඟත් හුවමාරු කර ගන්නේ නැති බව ඔබ කියා සිටියා. මේවායේ ආරක්ෂාවට යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙනවාද?

පි : ඔබ හරි ඒක මම කිව්වේ විශේෂයෙන්ම දැන් අපි තවත් බුද්ධි ඒකකයක්ම විය යුතු නෑ. ඒ රාජ්‍ය බුද්ධි සේවාවේ ඇතුළේ වුනත් කාටවත් හැමෝටම මේකේ Access එක නැහැ. මේක අනිවාර්යයෙන්ම Access එක තියෙන්නේ Need to know basis එකෙන්. එතනදී අවශ්‍ය කරන Access එක දෙන්න ඕනී පුද්ගලයාට අපි Access එක ලබා දීලා තියෙනවා. ඉතින් එතකොට ඒක ඒ Need to know basis එක යටතේ තමයි මේ හැමදෙයක්ම සිදු වෙන්නේ . ඒ Access කරත් System එක ඇතුලේම ඒ හැම data එකක්ම check වෙනවා. ඒ කියන්නේ manually ගිහිල්ලා file එකක් ඉල්ලුවත් system එකෙන් file එකක් Access එක ඉල්ලුවත් ඒක සඳහන් වෙනවා. ඒ එක්කම system එකෙන්ම design කරලා තියෙන්නේ unauthorized Access එකක් කවුරුහරි ගන්න බලනවා නම් ඒක වෙනවා. එතනදී විශේෂයෙන්ම අපි

ප්‍ර : unauthorized Access එකක් ගන්නවා

පි : unauthorized කියන්නේ මට මම බුද්ධි අධ්‍යක්ෂක හැටියට හිටියත් දැන් මට පුළුවන් Access එක ගන්න .

ප්‍ර : බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් ඔබට ඕනෑම වේලාවක මෙම දත්ත ගබඩාවේ තිබෙන ඕනෑම තොරතුරක් ලබා ගැනීමේ හැකියාව තියෙනවාද?

FAIR COMMENT — BY JEZEEM

පි : නෑ එහෙම කියන්න බෑ. මොකද හේතුව මට Access එක තියෙනවා හැබැයි මම ක්‍රමවේදය පාවිච්චි කරන්න ඕනී.

ප්‍ර : මොකක්ද ක්‍රමවේදය කියන්නේ?

පි : ඒ ක්‍රමවේදය කියන්නේ මේකේ ඉන්නවා DDX කියලා Deputy Director X Division කියලා.

ප්‍ර : X

පි : X ඒ කියන්නේ ඒක සම්පූර්ණයෙන්ම ඇවිල්ලා Registry එක භාරව ඉන්නේ එයා තමයි ආරක්ෂක පැත්තෙන්. එතකොට මම යම්කිසි දෙයක් තියෙනවා නම් මට දුරකථනයෙන් කතා කරලා කියන්න පුළුවන් note එකක් අරින්න පුළුවන් මම කියනවා මේක මට security මේක දෙන්න කියලා. එතකොට එතන ඉන්න ප්‍රධානියා ඒ data ටික අරගෙන ඒ අනුව මගේ කාල වේලාව කොච්චරද කියලා එයා Registry එකේ දාගන්නවා. Director අසවල් දිනයේ ඒ විස්තර ටික අනුව කියලා. මොකද හේතුව ඒ හැමදේකටම මේකක් තියෙනවා. අවසානයේදි වගකියන්න ඕනී.

ප්‍ර : වගකියන්න ඕනී?

පි : වගකියන්න ඕනී. එතකොට මට කියලා මම අධ්‍යක්ෂවරු කීප දෙනෙක්ම මාරු වෙන්න පුළුවන්. මට අනවශ්‍ය තොරතුරුත් මට ලබා ගන්න පුළුවන්. ඉතින් එතකොට System එකෙන් හැමතිස්සේම System එක හදලා තියෙන්නේ එහෙම කවුරුත් System එකට උඩින් යන්න බෑ. System එක ඇතුළේදී ඒක නිසා අපි අවංක විය යුතුයි. අපි අවශ්‍ය කරන Detail එක අපි දැන ගන්න ඕනේ මට අවශ්‍ය තියෙන Detail ටික මම ලබා ගන්න ඕනී. එහෙම නැත්නම් මට පුළුවන් මේ සියළු දත්ත ටික අරගෙන මට පුළුවන් තව ආයතනයකට දෙන්න. සියළු දත්ත ටික අරන් මට පිටරටකට විකුණන්න වුණත් පුළුවන්. ඒ කියන්නේ මේක ඉතාමත් Sensitive ඒ නිසා System එකේදී දැන් System එකේ නිලධාරීයාට වුණත් එය ලබා දීමේදී එයා දැන ගත්තොත් මේක අවශ්‍යද නැද්ද කියන එක දැන් මට වුනත් සමහර අවස්ථාවලදී DDX ඇවිල්ලා මට කතා කරලා කියනවා සර් අපි දැන් උදාහරණයක් වශයෙන් මේ ගරු සභාවට එවන details දැන් මේ details ටික එව්වාම අපිට ලියුමක් එවනවා මේ details ටික ලබා දෙන්න කියලා. එතකොට මට ලොකු වගකීමක් තියෙනවා මේ details ගත්තාම දැන් මේකේ අපිට දෙන්න පුළුවන් දේවල් මොනවාද නොදෙන්න පුළුවන් දේවල් මොනවාද. දැන් මේක ගරු අධිකරණයක් අපි සියළු දේම දෙන්න බැඳී හිටිනවා. නමුත් මෙතෙන්දී සමහර දේවල් තියෙනවා ගොඩක් sensitive. ඒ

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කියන්නේ මම බුද්ධි අධ්‍යක්ෂකවරයා හැටියටත් මටවත් ඒ වගකීම නෑ. දැන් උදාහරණයක් වශයෙන් අපි කියමු ළඟ රටක්. ඒ රටේ අපිට තොරතුරු ලබා දෙන්නේ යම් කිසි MOU එකක් මත හෝ Understanding එකක් මත. මේ තොරතුරු ලබා ගන්න මේ තොරතුරු තව කෙනෙක්ට දෙන්න බෑ කියලා පැහැදිලිවම ඒක යටින් සඳහන් කරලා තියෙනවා. එතකොට මම කෝල් කරලා කියනවා මට මේ Indian report එක හෝ American report එක දෙන්න කියලා මට ඉල්ලන්න බෑ. මම එහෙම ඉල්ලුවත් එයා සඳහන් කරනවා. මට කියනවා එයා උපදෙසක් දෙනවා . සර් මේක මෙහෙම Issue එකක්. මෙහෙම එකක් තියෙනවා කියන එක එයා සඳහන් කරනවා. ඒක විශේෂයෙන්ම දැන් එතන අර විශේෂයෙන්ම මේ වගේ ආයතනයක් ගෞරවය එක්ක යන්නේ. ඉතින් එතකොට අපි හැම තිස්සේම අපි පටන් ගත්ත දවසේ ඉඳන්ම අපි Example එකක් ඇතිව තමයි අපි ඒක කරන්න ඕනී. ඒක එතකොට ඒ ගොල්ලන් question අහන එක අඩුයි. නමුත් ඒ ගොල්ලොන්ට තේරුණොත් ඇවිල්ලා මේක වුනොත් මොකද එයත් අමාරුවේ පත් වෙනවා. එතකොට සමහර අවස්ථාවලදී අපි බොහොම අසරණ වෙච්චි අවස්ථාවල් තියෙනවා අපිට උසාවියෙන් මෙහෙම තීරණය කළාම දැන් මේක කොහොමද අපි compromise කරන්නේ කියන එක. ඉතින් මොකද අපි අර පැත්තෙන් බැඳී හිටිනවා දෙන්න . ඒ එක්කම ඒක නිසා විශේෂයෙන්ම මම කරන ප්‍රතිපත්තිය තමයි මගේ කාලයේදී යම් කිසි දෙයක් සිදු වුනොත් මම ඒක ගැන කිසිම ප්‍රශ්නයක් නෑ. මට ඒක ලබා දීම කරන්න පුළුවන් ඒ අවශ්‍ය කරන නීති ඒකත් එක්ක. හැබැයි මගෙන් ඉහළ මට කලින් වෙච්ච සිදුවීමක් සිදු වෙලා තියෙනවා නම් අනිවාර්යෙන්ම මට ලොකු වගකීමක් තියෙනවා මම ඒ තොරතුර ලබා දීම තුළින් මොනවගේ තොරතුරක් ද මට ඒ ඉල්ලන අනුව දෙන්න පුළුවන් කියන එක. ඉතින් ඒ අනුව මම විශේෂයෙන්ම ඒවා අපි බලනවා විශේෂයෙන් ඒකෙන් ලොකු ජාතික ආරක්ෂාවට තර්ජනයක් වෙන්න පුළුවන් නම් අපි නැවත වරක් කොමිෂමට අපි ලියනවා මෙන්න මෙහෙම sensitive areas තියෙනවා. ඒක නිසා අපිට මේ පොඩ්ඩක් මේවා කරන්න කියන එක. ඉතින් ඒ වගේ අවස්ථා තියෙනවා. එතනදී අපි ඇත්තටම බලන්නේ රටක් හැටියට අපි බැඳී හිටිනවා හැබැයි ඒ එක්කම අනිත් පැත්තෙන් විශේෂයෙන්ම යම් කිසි තොරතුරක් ඒකේ එළියට ගියොත් ඒක තව කෙනෙක්ගේ ජීවිතයක් එක්ක ලොකු තර්ජනයක් ඇති වෙන්න අවස්ථා තියෙනවා. ජාතික ආරක්ෂාව කෙරෙහිත් ඒක විශාල බලපෑමක් ඇති කරන්න පුළුවන්. දැන්

FAIR COMMENT BY JEZEEM

උදාහරණයක් වශයෙන් අපි රටක දුන්න තොරතුරක් අපි ඉදිරිපත් කළොත් එතනින් එහාට ඒ රට කවදාකවත් අපිට තොරතුරු දෙන්නේ නෑ. මොකද මම සමහර තොරතුරු අරින කොට මම ඒ රටත් consult කළා. මම කිව්වා මේක ජාතික අවශ්‍යතාවයක් අපි මේ දේවල් අපිට වෙන ක්‍රමයකින් කමක් නැද්ද මේක share කළාට කියන එක. නමුත් ඒ ගොල්ලො පැහැදිලිවම කළා. මොකද ඒ ගොල්ලො ප්‍රතිපත්තියක් අනුව තියෙන්නේ ඒ ගොල්ලො කිව්වා මෙහෙමයි ඒ ගොල්ලොන්ට නීති වෙනස් කරන්න බෑ. අපි මේ තොරතුරු ලබා ගැනීමේදී අපි සඳහන් කරලා තියෙනවා ඒකට වෙනස් වෙන්න ඕනී. එහෙම නම් අපි වෙනම MOU එකක් අත්සන් කරන්න ඕනී මේ සම්බන්ධයෙන් කියලා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : මිස්ටර් සලේ ඔබ කියපු කාරණාවලින් මට එක ප්‍රශ්නයක් අහන්න ඕනී' දැන් හිතමු රාජ්‍ය බුද්ධි සේවයට යම් කිසි තැනැත්තෙක් යම් කිසි ක්‍රියාවක් කරන්න පුළුවන් නැත්නම් කරනවා කියලා බාහිර ආයතනයකින් ඒ කියන්නේ විදේශීය ආයතනයකින් යම් තොරතුරක් ලැබෙනවා. එම තොරතුරෙහි නිරවද්‍යභාවය නැත්නම් ඒක විය හැකි භාවය පිළිබඳ තීරණය කරන්න අර ඔබ කියන දත්ත පද්ධතියේ තියෙන කරුණු වලින්ම processing කරලා Intelligence එකක් ගන්න පුළුවන් හැකියාව තියෙනවාද කෙටි කාලයකදී?

පි : ඔව් ස්වාමිනි විශේෂයෙන්ම ඒ එන තොරතුරු ලබා ගැනීමේදී අපිට රටකින් දෙන කොට ඇත්තටම ඒ ගොල්ලන් grading එකක් අනුව තමයි අපිට දෙන්නේ. ඒ අර මම කලින් සඳහන් කළා A, B, C, D, 1, 2, 3, 4 වශයෙන්. ඉතින් මම විශේෂයෙන් බුද්ධි අධ්‍යක්ෂකරයෙක් යුධ හමුදාවේ සහ දැන් අධ්‍යක්ෂක හැටියට මම හැම තිස්සේම තොරතුරක් ආවාම මේ කාරණාව මම emphasize කරනවා විශේෂයෙන්ම මොකක්ද මේ තොරතුරේ තියෙන වටිනාකම කියන එක. එතකොට ඒ වටිනාකම අනුව මගේ action එක මම plan කරනවා.

ප්‍ර : ඔබ පොඩ්ඩක් ඔය අවස්ථාවේ නවත්වන්න. දැන් ඔබට පෙර අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවයට ලැබුණු ඒ විදේශීය ආයතනවලින් ලැබුණු තොරතුරු වල වර්ගීකරණයක් ඔය දත්ත පද්ධතියේ තියෙනවාද?

පි : අනිවාර්යෙන්ම මේ හැම තොරතුරක්ම දත්ත පද්ධතියට යනවා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : ඔබ කියන විදිහට වර්ගීකරණය?

පි : ඔව් ඒ සමහර තොරතුරු එවන කොට ඒ කියන්නේ විවිධ රටවල් විවිධ ක්‍රම අනුගමනය කරනවා. ඒ සමහර රටවල් වලින් එනකොට වර්ගීකරණයක් නැතිව එන අවස්ථාත් තියෙනවා.

ප්‍ර : නමුත් ලංකාවෙන් වර්ගීකරණයක් කරනවානේ?

පි : අනිවාර්යෙන්ම අපි තොරතුරු ආවායින් පස්සේ මොකද ඒ තොරතුරේ එක්කොෘ අපි අහන්න ඕනී ඒ ගොල්ලන්ගෙන් මොකක්ද වර්ගීකරණය කියලා නැත්නම් අපි විශේෂයෙන්ම දැන් අපි අලුතෙන්ම කිසිම රටකින් එහෙම අලුත් තොරතුරක් එන්නේ නෑ. මොකද මේ ඔක්කොමත් එක්ක අපි අවුරුදු ගණනාවක්ම ගනුදෙනු කරන රටවල්.

ප්‍ර : දැන් මගේ ඊළඟ ප්‍රශ්නේ 2019 අප්‍රේල් මාසයේ දී මේ පාස්කු ප්‍රහාරය විය හැකි බවට තොරතුරු යම් කිසි විදේශීය ආයතනයකින් ලැබුණු බව ඔබ දන්නවානේ?

පි : එසේමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ ඒ සම්බන්ධ තොරතුරත් බලන්න ඇතිනේ?

පි : එසේමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට අපිට කියන්න එම තොරතුර ඒ විදේශීය ආයතනය විසින් යම්කිසි වර්ගීකරණයකට ලක් කරලා තිබ්බද?

පි : ස්වාමිනි මේකේදී විශේෂයෙන්ම මේ තොරතුරු විවිධාකාරයෙන් තොරතුරු ලැබිලා තිබ්බා. ඒ කියන්නේ මූලික වශයෙන්ම මේ තොරතුරු මෙහෙම ප්‍රහාරයක් පිළිබඳව සහ ඒ පුද්ගලයන් පිළිබඳව අවස්ථා කීපයකදීම ලියලා එවලා තිබ්බා. ඊට අමතරව වෙන ක්‍රමවලදීත් දැන් මේක develop වී ගෙන එන කොට දැන් කොළවලින් එවන්න බැරි අවස්ථාවලදී මම හිතන්නේ දුරකථන හරහා messages හරහාත් මේ තොරතුරු ලබා දීම් සිදු කරලා තිබ්බා.

ප්‍ර : දැන් මම කතා කරන්නේ 2019 අප්‍රේල් මාසේ ගැන නෙවෙයි. ඊට පෙර වකවානුවක් ගැන. දැනට it is publicly known the high commissioner of Pakistan himself went public and said that 6 month prior to සමාවෙන්න පාකිස්ථානු මහ කොමසාරිස් විසින් ප්‍රසිද්ධියේ කිව්වා 2019 අප්‍රේල් මාසේම මාස 06 කට පෙර යම් කිසි බුද්ධි තොරතුරක් ලංකාවේ එක්තරා ආයතනයකට නැත්නම් ආයතනවලට ලබා දුන්නා ඉතා වැදගත් තොරතුරක් කියලා?

පි : මම දැක්කා ස්වාමිනි ඒක පත්තරේ තියෙනවා.

ප්‍ර : එම තොරතුර ඔබට කියන්න පුළුවන්ද රාජ්‍ය බුද්ධි සේවයේ දත්ත ගබඩාවේ තිබ්බද නැද්ද කියන එක?

FAIR COMMENT — BY JEZEEM —

පි : එම මම දැක්කා ඒ මොකද මම දැන් ඔතන කියන්න කලින් අපි විශේෂයෙන්ම එතන ඉන්නවා බුද්ධි නිලධාරීයෙක්. අපි ඒ ගොල්ලෝ එක්ක දිගටම සම්බන්ධ වීම් සිදු වුණා. මම ආවායින් පස්සෙත් සම්බන්ධ වීම සිදු වෙනවා. විශේෂයෙන්ම ඒ ගැන මට දැනුවත් කිරීමක් කළා මට ඒ Document එකක් පෙන්නුවා ඒ ගොල්ලො පැවසුවා කියලා. හැබැයි ඒ කාලේ වෙන කොට ස්වාමිනි මම කියන්නේ එක specific intelligence එකක් නෙවෙයි. නමුත් යම්කිසි දෙයක් දීලා තිබ්බා. නමුත් ඊට වැඩිය දේවල් අප ආයතනය සතුව තිබ්බා.

ප්‍ර : ඒ අවස්ථාවට මම නැවත එන්නම්. ඒ පාකිස්ථානයෙන් ලබා දුන්නු තොරතුරු ඔබ කියන්නේ තොරතුරක්ද බුද්ධි තොරතුරක්ද?

පි : ඒක සාමාන්‍යයෙන් ඒක දෙපැත්තෙම මැද තියෙන තොරතුරක් කියලා තමා මම හිතන්නේ.

ප්‍ර : ඒ තොරතුර මේ ප්‍රහාරයට යම් සම්බන්ධතාවයක් තියෙනවාද?

පි : එතනදී ඒ තොරතුර මම දැකපු විදිහට ඒක මම මුලින් දැක්කා ඒ document එක අපි ළඟ තියෙනවා. එතනදී විශේෂයෙන්ම මේ යම් කිසි ප්‍රහාරයක් සිදු වෙන්න කට්ටියක් මෙහෙම plan කරනවා කියලා එකක් තිබුණා ඒක. නමුත් ඒ අවස්ථාවේ ස්වාමිනි සාමාවෙන්න නමුත් මෙතනදී ඊට වැඩිය ඒ කියන්නේ අපි මේක සාමාන්‍ය තොරතුරක් හැටියට තමයි මම ගණනය කරන්නේ මොකද ඒකේ වෙන විස්තරයක් සඳහන් වෙලා තිබ්බේ නෑ. කවුද, කොහොමද කරන්න, කින්ද මන්ද කියලා නමුත් ඊට පස්සේ

ප්‍ර : ප්‍රශ්න හයටම උත්තර තිබ්බේ නෑ?

පි : ප්‍රශ්න .....

ප්‍ර : Who, why, when ?

පි : ඔබ හරි ස්වාමිනි ඒ ප්‍රශ්න හයටම පිළිතුරු තිබ්බේ නෑ . නමුත් ඊට පසුව විදේශීය රටවලින් බුද්ධි තොරතුරු ආවා ඊට වැඩිය specific තොරතුරු ලැබුණා.

ප්‍ර : මේ පකිස්ථානයෙන් ලැබුණු තොරතුරුවලින් ප්‍රශ්න හයෙන් කීයකට පිළිතුරු ලැබුණාද?

පි : මම ඒක සම්පුර්ණයෙන්ම මුළු මේකම කියෙව්වේ නෑ. නමුත් මම සම්පුර්ණයෙන්ම කියෙව්වාම ඒකේ අර පසුකාලීන අනිත් රටවලින් ලැබුණු තොරතුරුත් එක්ක ගත්තාම ඒක සාමාන්‍ය තොරතුරක් හැටියට තමයි මම දකින්නේ . මොකද ඒ අවස්ථාව වෙන කොට අපිට ඇත්තටම දැන් රටක් හැටියට අපි අර කියපු Process එකේ අපි ඊට වඩා ගොඩාක් ඉදිරියට ගිහිල්ලා තිබ්බේ. මොකක්ද මේ, කවුද කණ්ඩායම, කවුද පුද්ගලයෝ, මොකක් ද මේ Extremism training වෙනවා ඊට වැඩිය ඒ කියන්නේ තොරතුරට

FAIR COMMENT BY JEZEEM

වැඩිය එහා පැත්තට තොරතුරු රාශියක් අපි සතුව තිබුණා. ඉතින් ඒක නිසා ඒක දැන් අපිට දැන් විශේෂයෙන්ම තව රටකින් අපිට දුන්නාම විශේෂයෙන්ම කාල වේලාවක් සඳහන් කරලා පුද්ගලයෝ සඳහන් කළාම ඒක ටිකක් ඒක specific. එතකොට ඒක ඒ කියන්නේ නමුත් ඔය මාස හයකට කලින් තිබ්බ situation එක ගත්තාම ස්වාමීනි ඒ වෙන කොට අපි සියළු දෙනාම කවුද සහරාන් කියන්නේ කවුද සහරාන්ලාගේ activities මොනවාද training මොනවාද එතකොට මේ අත්අඩංගුවට ගන්න වරෙන්තු මේ ඔක්කොම තිබ්බා. ඉතින් ඒකේ මම ලොකු විශේෂත්වයක් දකින්නේ නෑ පකිස්ථානයේ Intelligence report එකේ. නමුත් අනිත් රටෙන් එවපු report එක ඉතාමත්ම වැදගත්. මොකද දැන් එතනදී දැන් මේ තොරතුරු පකිස්ථානයට අපි තොරතුරු ලබා දීම් කරනවා. නමුත් ඉඳලා හිටලා තමයි ලබා දීම් කරන්නේ. නමුත් අනිත් රටවල්වල routine එකක් හැටියට දෙනවා. සාමාන්‍යනේ ඒ ගොල්ලො තොරතුරක් එව්වාම ඒ ගොල්ලො සාමාන්‍යයෙන් තොරතුරක් එවන්නේ නෑ. ඒ ගොල්ලො විශේෂයෙන් රටකට දෙන කොට ඒ ගොල්ලො professional ආයතනයක්. ඉතින් එතනදී අපි විශේෂයෙන්ම ලොකු focus එකක් කරනවා ඒ ගොල්ලන්ගෙන් ආවාම. ඒ කියන්නේ අපිට ඇත්තටම ඒ ගොල්ලොන්ගේ දැන් අපි තොරතුරු වර්ගීකරණයක් වෙන්නේ තොරතුරු විතරක් නෙවෙයි. මීට කලින් මේ අදාළ ආයතනය කී වතාවක් අපිට මේ වගේ තොරතුරු ලබා දීලා තියෙනවාද මේකට සම්බන්ධ හෝ වෙනත් දේවල් සම්බන්ධව. ඒ තොරතුරු වලින් කී දෙනෙක් ඇත්තට සිදුවීම් සිදු වෙලා තියෙනවාද. එතකොට යම් කිසි තොරතුරක් එන කොටම තොරතුරේ contents එක කොහොම වුණත් ආයතනය හැටියට reputation එකක් තියෙනවා මේ ආයතනය තොරතුරක් දුන්නොත් සාමාන්‍යයෙන් මේ වර්ගීකරණයේ තොරතුරක් තමයි මෙතෙන්ට එන්නේ. ඒක නිසා තමයි ඒ අනික් රටේ තියෙන තොරතුරු ඉතාමත්ම වැදගත් සහ ඒකේදී specific details දීලා තිබ්බා.

ප : දැන් 2019 වර්ෂය ගත්තොත් ඔය 2019 අප්‍රේල් 21 වෙනිදා සිදු වුණ ප්‍රහාරය සම්බන්ධයෙන් ඉස්සෙල්ලාම තොරතුරු ලැබෙන්නේ රාජ්‍ය බුද්ධි සේවයට කවද්ද?

පි : ස්වාමිනි ඒ කියන්නේ මම ගියේ 2016 නොවැම්බර් මාසේ තමයි ගියේ. ඒ වෙනකම්

ප : නෑ නෑ මම කියන්නේ අර විදේශීය සම්බන්ධ?

පි : විදේශීය බුද්ධි තොරතුරු ඇත්තටම පටන් ගන්නේ මම හිතන්නේ ස්වාමිනි හරි specific තොරතුරු එන්නේ මාස මම හිතන්නේ මාස

FAIR COMMENT — BY JEZEEM —

කිහිපයකට කලින් ස්වාමිනි මට හරියටම දැනුමක් නෑ. විශේෂයෙන්ම ඒ කියන්නේ specific තොරතුරක් හැටියට පකිස්ථානයේ මාස හයකට කලින් එන කොට ඒ හා සමාන කාල period එකකදී පොඩි warning එකක් එනවා අනිකුත් රටවල්වලිනුත් එනවා. අනිත් රටිනුත් එනවා.

ප්‍ර : වෙන රටවල් කීයකින් ආවාද?

පි : මම දැනුවත්ව ඒ කියන්නේ තොරතුරක් හැටියට මේ පිළිබඳව specifically ආවේ ඇවිල්ලා එක රටකින් පමණයි.

ප්‍ර : ඒ රටෙන් ආපු තොරතුර 2019 ද ආවේ? ආවා නම් 2019 කොයි කාලේද?

පි : දැන් මම දැනුවත්ව ඒ කියන්නේ මගේ දැනුමේ හැටියට මාස තුනකට කලින් සිදුවීමට මාස තුනකට කලින් එක තොරතුරක් ආවා. ඊට පස්සේ දවස්.

ප්‍ර : පොඩ්ඩක් ඉන්න අපි එකින් එක යන්. දැන් ඔබ කියන හැටියට 2019 අප්‍රේල් 21 වෙනිදාට මාස තුනකට පෙර ඒ විදේශීය මූලාශ්‍රයෙන් තොරතුරක් එනවා. එම තොරතුර වර්ගීකරණකයක් කරලා තිබ්බද ඒ විදේශීය ආයතනය?

පි : එම තොරතුරු වර්ගීකරණයක් කළාද කියන එක ස්වාමිනි මම හරියටම දැක්කේ නෑ වර්ගීකරණයක් කළාද කියන එක.

ප්‍ර : අපේ රාජ්‍ය බුද්ධි සේවාවෙන් වර්ගීකරණයක් කෙරුවාද?

පි : එතකොට විශේෂයෙන්ම එතනදී ඒ අදාළ අධ්‍යක්ෂකවරයා එක්ක තමයි ඒක තීරණය වෙන්නේ. අපි වර්ගීකරණය කිරීමේදී විශේෂයෙන්ම දැන් ඒ වගේ තොරතුරක් දැන් මම ඉද්දී ආවොත් මම ඉස්සෙල්ලාම බලනවා වර්ගීකරණයක් කරලා තියෙනවාද නැද්ද කියලා. වර්ගීකරණයක් නැත්නම් මම ආයතනයට මම කතා කරලා අහනවා මේකේ මොකක්ද වර්ගීකරණය කියන එක. ඒ එක්කම ඒ දෙන ආයතනය අනුව මම දන්නවා ඒකේ බෑරුරුම් තත්ත්වය. ඒ කියන්නේ ඒ ගොල්ලො මෙතෙක් කල් දීලා තියෙන සියළුම බුද්ධි තොරතුරුවල ලොකු වටිනාකමක් තියෙනවා. ඒ අවස්ථාවේදී මම සාමාන්‍යයෙන් ලියලා තිබ්බේ නැතත් විශේෂයෙන් මේ ආයතනයකින් දැනුම් දුන්නොත් ඒක සාමාන්‍යයෙන් බුද්ධි නිලධාරියෙකුට ඒ කියන්නේ highest රටකින් ඒ highest professional intelligence agency එකකින් එවලා තියෙන්නේ. එතකොට ඒ ගොල්ලන් ඒ සඳහන් කරලා තියෙන තොරතුර අනුව අනිවාර්යෙන්ම අපි immediately ඒ තොරතුරු වර්ගීකරණයට ලක් කරන්න නම් අපි immediately ඒ තොරතුරු ground එකට සහ අපේ තියෙන database එක අනුව ටක් ගලා check කරලා බලන්න ඕනේ මේ පිළිබඳව යම් කිසි back

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ground එකක් තියෙනවාද මීට වැඩිය තොරතුරක් අපි ළඟ තියෙනවාද එහෙම නැත්නම් අපි ටක් ගාලා sources වලට task කරලා ඒ ක්‍රියාවලියක් සිදු වෙන්න ඕනී immediately ඒක වර්ගීකරණයට ලක් වෙන්න පෙර වර්ගීකරණයක් නැත්නම් ඒක අපි ඒක අර විදියකට අපි ක්‍රියාවලියකට යටත් වෙන්න ඕනී.

ප : මම අහන්නේ දැන් ඔබ කියනවානේ විදේශීය ආයතනයකින් වර්ගීකරණයක් තිබ්බා කියලා ඔබ දැක්කේ නෑ කියලා?

පි : ඔව්.

ප : ඔය මාස තුනකට ඉස්සෙල්ලා ආපු තොරතුර?

පි : ඔව් ස්වාමිනි.

ප : අපේ රාජ්‍ය බුද්ධි සේවය විසින් ඒක වර්ගීකරණයක් කරලා ඒක දත්ත ගබඩාවේ තියෙනවාද?

පි : ඔව් එතකොට මගේ තියෙන දැනුම හැටියට මම දැක්කා ඒ report එක ආවාම ඒ report එක අදාළ ස්ථානවලට යොමු කිරීමක් සිදු වෙලා තියෙනවා. මේ පිළිබඳව මෙහෙම තොරතුරක් තිබෙනවා මේ පිළිබඳව තව ටිකක් තියෙනවා නම් ඒ ටික ඒ තොරතුරු තව විස්තර තියෙනවා නම් ලබා දෙන්න කියලා ඒ වගේ action එකක් අනිවාර්යෙන්ම අරගෙන තියෙනවා.

ප : ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවාව තුළ තියෙන ආයතනවලට තමයි ඔය යොමු කරලා තියෙන්නේ?

පි : මම හිතන්නේ පිටටත් ඒක සඳහන් වෙලා තියෙනවා මට ඒක හරියටම මතක නෑ ස්වාමිනි. හැබැයි අර දවස් 16 කට කලින් ආපු report නම් කෙළින්ම පිටට දැනුම් දීලා තියෙනවා. නමුත් මාස තුනකට කලින් ආපු එක මට ලොකු දැනුමක් නෑ ඒක පිටට දුන්නාද කියන එක. හැබැයි මේක අනිවාර්යෙන්ම මේක සාකච්ඡාවට බඳුන් වෙන්න ඇති කියලා මම හිතනවා intelligence coordinating meeting එකක් තිබ්බා නම් ඒ අවස්ථාවේදී.

ප : එතකොට 2019 අප්‍රේල් 21 ට ඉස්සෙල්ලා මාස තුනකට පෙර තොරතුරක් ආවා කියලා ඔබ කියනවානේ ඒ විදේශීය ආයතනයකින්?

පි : එසේමයි ස්වාමිනි.

ප : ඊට පස්සේ ආපු තොරතුර එන්නේ කවද්ද? අප්‍රේල් 21 ට කොපමණ මාසේකට පෙරද?

පි : මගේ මතකේ හැටියට 10 වෙනිදා සහ 16 වෙනි දිනයන් වල ඒ කියන්නේ ඒ incident එක වෙන්න සති තුනකට ඇතුළත කාල සීමාවකදී අවස්ථා දෙකකදී දැනුවත් වීම් වෙනවා සහ incident එක වෙන්න එදා රෑත් දැනුවත් වීමක් වෙනවා incident එක වෙන්න පැයකට කලිනුත් දැනුවත් වීමක් වෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මම අහන්නේ ඔය තොරතුරු ලබා දුන්නු එක ආයතනය ගැන නෙවෙයි?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබ කිව්වනේ ඔය අප්‍රේල් මාසේ ලබා තොරතුරු ලබා දුන්නු ආයතනයම මාස තුනකට ඉස්සෙල්ලාත් තොරතුරක් ලබා දුන්නා කියලා?

පි : ඔව්.

ප්‍ර : එම ආයතනයට අමතරව පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පෙර දැනුම් දීමක් වෙනත් විදේශීය ආයතනයකින් දැනුම් දීමක් කරලා තිබ්බද?

පි : නෑ මගේ දැනුමේ හැටියට මොකද මම ඒ කාලේ හිටියේ නෑ. නමුත් මම මේක හැබැයි හොයා බැලුවා මගේ තියෙන දැනුම අනුව මොකද හේතුව අපි රටවල් ගණනාවක් එක්ක මම බුද්ධි අධ්‍යක්ෂක හමුදාව ඉද්දී මම සම්බන්ධ වෙලා තිබ්බා. අපි ඒ ගොල්ලන් ගණනාවක් එක්කම යම් ගොඩාක් දුරට එකට වැඩ කළා. ලංකාවේත් විශේෂයෙන් මේ සම්බන්ධයෙන් නමුත් මම ඇහුවාම මේ පිළිබඳව කිසිම warning එකක්වත් ලැබුණාද කියලා ඒ කිසිම warning එකක්වත් ඒ පැතිවලින් ලැබිලා තිබුණේ නෑ කියන එක තමයි මට දැන ගන්න ලැබුණේ.

ප්‍ර : මේ අවස්ථාවේදී ඔබට අපි යම් කිසි ලේඛන වගයක් පෙන්වනවා. දැන් ඔබට ඒක පිළිතුරු දෙන්නේ මිස්ටර් සලේ ඔබ ඕකට පිළිතුර දෙන්න ඕනේ දැන් ඔබ දත්ත ගබඩාවට access කරනවානේ SIS Director වුණායින් පස්සේ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ මම අහන ප්‍රශ්නෙට පිළිතුරු දෙන්න ඕනේ ඒ SIS දත්ත ගබඩාවේ තියෙන තොරතුරු ඔබට බලන්න පුළුවන් කියන පදනම මත?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ දැන් තියෙන ඒවා ඔක්කොම අමතක කරන්න?

පි : ඔව්.

(C 4 (B) ලේඛනය සාක්ෂිකරුට පෙන්වයි.)

ප්‍ර : අර වේලාවේ ඔබට තියෙන තොරතුරු අනුව තමා මම මේ අහන ප්‍රශ්නේට පිළිතුරු දෙන්න ඕනේ? C 4 (B) කියන ලේඛනයේ තියෙන්නේ තොරතුරක්ද බුද්ධි තොරතුරක්ද?

පි : මේක ඇවිල්ලා මගේ දැනුමේ හැටියට මේක ඇවිල්ලා බුද්ධි තොරතුරක්. Intelligence report එකක්.

ප්‍ර : ඇයි ඔබ ඕකට බුද්ධි තොරතුරක් කියලා කියන්නේ?

President's Counsel's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එතකොට මම අර කියපු විදියට මේක බුද්ධි තොරතුරකට අවශ්‍ය ගුණාංග සියළු දේම තියෙනවා.

ප්‍ර : මොනවද අවශ්‍ය ගුණාංග?

පි : විශේෂයෙන්ම මේකේ පුද්ගලයන් ගැන සඳහන් වෙනවා.

ප්‍ර : ගුණාංග මනින්නේ කොහොමද මොනවා හරි ප්‍රශ්න වගයක් තියෙනවාද මොනවද ඒ ප්‍රශ්න?

පි : ඔව් විශේෂයෙන්ම අපි අර මම කලින් කිව්ව විදිහට ස්වාමිනි Basic intelligence කියන්නේ අපිට කිසිදෙයක් එන්නේ නෑ තොරතුරක්. ඒ කියන්නේ මොකක් හරි එකකට ප්‍රහාරයක් සිද්ධ වෙන්න පුළුවන් එහෙම නැත්නම් අර පුද්ගලයා මම දැක්කා අතන ඉඳලා A ස්ථානයේ ඉඳලා B ස්ථානයට ගමන් කරනවා, එහෙම නැත්නම් ඇවිල්ලා මම දැක්කා මේ විදිහට යම් කිසි දෙයක් සාකච්ඡාවක් සිදු වෙනවා. ඒ ඇවිල්ලා imaginary intelligence මත ඔක්කොම basic intelligence නමුත් මෙතනදී specific මේකේ specific එකක් ගියාම ඒකේ intelligence අර යම් කිසි analysis එකක් කරලා තමයි මේ තත්ත්වයට එන්නේ. ඒ කියන්නේ මේ තොරතුරු ඇවිල්ලා එක පාරටම ආපු තොරතුරක් නෙවෙයි. මේකේ කියනවා පැහැදිලිවම සහරාන් හෂීම් නැෂනල් තවුහිද් ජමාත් එකයි ඒ associate මෙහෙම attack එකක් plan කරනවා. ඒකට targets වගයක් ඒ ගොල්ලො දෙනවා. ඊට පස්සේ ඒක කරන ආකාරය කියනවා. Weapon, Knife attack එකක් එහෙම වෙන්න පුළුවන් කියලා. ඒ එක්කම විශේෂයෙන්ම මේ නම් ටිකක් දෙනවා. රිල්වාන්, සජිත් දැන් මේවා ඇවිල්ලා අනිවාර්යෙන්ම බුද්ධි තොරතුරක තියෙන්න ඕනී ගුණාංග අඩංගු විය යුතු කරුණු. නමුත් මේකේ කිසිම දෙයක් නැතුව තොරතුරක් හැටියට මෙහෙම ත්‍රස්තවාදී කණ්ඩායමක් අල්කයිඩා හෝ ISIS යම් කිසි සිදුවීමක් කරන්න උත්සාහ දරනවා කියලා කිව්වා නම් ඒක තොරතුරක්. හැබැයි අපි ඒ තොරතුර අපි එතකොට බුද්ධි තොරතුරකට අපි ඒක convert කරන්න ඕනී. ඉතින් මෙතනදී ඒක convert කරලා ඇවිල්ලා තියෙන්නේ. ඒක තවදුරටත් මේක අපි intelligence වලට තවදුරටත් මේක කරන්න නම් අපි මේක සම්පූර්ණයෙන්ම ආයිත් අපි ළඟ තියෙන තොරතුරු ටික මේ එන තොරතුරත් එක්ක මේ වෙන කොට රාජ්‍ය බුද්ධි සේවාවේ තියෙන තොරතුරු ටිකත් අපි මේකට එකතු කරනවා. ඊට අමතරව මේක immediately අපි මේක check කරනවා විශේෂයෙන්ම මේ නම් පුද්ගලයෝ. කවුද සහරාන් හෂීම් කියන්නේ. මේ ගොල්ලන් එක්ක LU එකක් කරලා බලනවා මේ ගොල්ලන් කොහේද

FAIR COMMENT — BY JEZEEM —

ඉන්නේ. ඒ ඔක්කොම ටික කරලා නැවත වරක් අපි මේක analysis එකක් කරනවා. කරලත් පස්සේ තමයි අපි ඒක අපි මේ ඒක සම්පූර්ණ බුද්ධි වාර්තාවක් හැටියට අපි යවන්නේ.

ප : හරි එතකොට ඔබ කියන හැටියට C 4 (B) කියන්නේ ඔබගේ විශේෂඥ දැනුම අනුව බුද්ධි තොරතුරක්?

පි : අනිවාර්යෙන්ම ස්වාමිනි.

(සාක්ෂිකරුට C 4 (C) ලේඛනය පෙන්වයි.)

ප : ඕක කියවලා බලලා හොඳට කියන්න ඔය ලේඛනයේ අඩංගු වන්නේ තොරතුරක්ද බුද්ධි තොරතුරක්ද කියලා ?

පි : ස්වාමිනි මේක අනිවාර්යෙන්ම මේක බුද්ධි තොරතුරක්. මේක සාමාන්‍ය තොරතුරක් නෙවෙයි. මොකද හේතුව දැන් මේකේ process එකක් වෙලා තියෙනවා. මේ සාමාන්‍ය RAW information එකක් තමයි තොරතුර කියන්නේ. ඒ කියන්නේ RAW information එකක් අපි සඳහන් කරන්නේ කිසිම analysis එකක් නැතුව. කවුරු හරි කෙනෙක් මූලික වශයෙන්ම දෙන තොරතුර තමයි RAW information එක. ඒ RAW information එක යම් කිසි විදිහකට විශ්ලේෂණයට ලක් වෙනවා නම් ඒ විශ්ලේෂණයට ලක් කිරීම තුළින් තමයි බුද්ධි තොරතුරත් එක්ක ඒක යන්නේ. දැන් මේක මේ තොරතුර මුලින්ම ඒ කියන්නේ මුලින්ම තොරතුරක් එනවා. සංවිධානය හෂීම් මොහොමඩ් හෙවත් සහරාන් සහ ඔහුගේ අනුගාමිකයින් එක්ව මෙරට මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කිරීමේ සුදානමක් පවතින බවද බුද්ධි අංශයක් විසින් තොරතුරු වාර්තා කර ඇත ඒක තොරතුරක්. ඊට පස්සේ කියනවා ඉහත තොරතුරු සම්බන්ධයෙන් සිදු කරන මූලික සොයා බැලීම්වලදී දැන් මෙතන intelligent process එකක් වෙනවා. ප්‍රහාරය සැලසුම් කිරීම සඳහා දායක වන බව තොරතුරේ සඳහන් පුද්ගලයන් අතුරින් කිහිප දෙනෙක් මෙම සේවාවේ බුද්ධි මෙහෙයුම් වලදී හඳුනා ගෙන ඇත. දැන් මෙතන සම්පූර්ණයෙන්ම තියෙන මේ RAW information එක තියෙන data ත් එක්ක එකතු වුණාම සම්පූර්ණයෙන්ම intelligent analysis එකක් කරනවා. ඒ analysis එකේදී එයාගේ assessment එක මෙතනදී කියනවා. ඉතින් මෙතනදී මේක ඇවිල්ලා intelligence report එකක්.

ප : ඔය C 4 (C) ලේඛනයේ අවසාන ඡේදය කියවන්න. ඔය අවසාන ඡේදයෙන් ඔබ කියන පරිදි C 4 (C) දරන ලේඛනයේ අඩංගු බුද්ධි තොරතුරු යම් කිසි දියාරු වීමක් සිදු කර තියෙනවාද?

පි : ස්වාමිනි මට උත්තර දෙන්න පුළුවන් මම බුද්ධි අධ්‍යක්ෂක නම් කොහොමද මම මේකට respond කරන්නේ කියලා.

FAIR COMMENT — BY JEZEEM

විශේෂයෙන්ම මේ වගේ තොරතුරක් ආවාම මම සාමාන්‍යයෙන් මම කරන්නේ විශේෂයෙන්ම මෙතනදී අපිට අපේ assessment එකක් යන්න ඕනේ. ඒ කියන්නේ සම්පූර්ණයෙන්ම මේ තොරතුරු A සහ B කියලා එකතු කරලා ඔක්කොම කරලා මගේ assessment එක මොකක්ද මම මොකක්ද මේ. ඒ assessment එක මම පැහැදිලිවම මම සඳහන් කරන්න ඕනේ මේ ටික මේ තොරතුරු ලැබු තොරතුරු සහ තියෙන තොරතුරු සහ අනිකුත් තොරතුරු මම විශ්ලේෂණය කිරීමේදී විශේෂයෙන්ම මේ තියෙන development අනුව මෙන්න මේ threat එකක් develop වෙනවා. එතකොට කරුණු ඒක නිසා අපි මේකේදී විශේෂයෙන්ම මෙන්න මේ මේ ස්ථාන vulnerable මේ වගේ ප්‍රහාරයක් එල්ල කරන්න පුළුවන් කියන එක මම පැහැදිලිවම ඒ assessment එකේ මම සඳහන් කරන්න ඕනේ එක පැත්තකින්. ඒක මම ඉහළ පැත්තට. අනිත් පැත්තේදී මෙතනදි මේකේදී එක දැන් මෙතනදී රිල්වාන් රාත්‍රී කාලයේදී (ලේඛනයක් කියවයි) දැන ගන්නට ඇති කියලා මේකේ එක

ප්‍ර : අවසාන ඡේදයට පහළින් තියෙන වාක්‍යය? මේ පිළිබඳව අර ඉහත සඳහන් තොරතුර පිළිබඳව රහසිගත පරීක්ෂණ කරමින් පවතිනවා කියනවනේ තියෙනවා නේද ඒක අන්තිම?

පි : ඔව්.

ප්‍ර : දැන් ඒ වාක්‍යයෙන් ඉහත සඳහන් තොරතුර පිළිබඳ රහසිගත පරීක්ෂණ සිදු කරමින් පවතිනවා කියන එකෙන් ඔබ කියන පරිදි C 4 (C) ලේඛනයේ අඩංගු බුද්ධි තොරතුර යම් කිසි දියාරු කිරීමට නැත්නම් හෑල්ලුවකට ලක් කිරීමක් සිදු වෙනවාද?

පි : ස්වාමිනි මට නිකම් තේරෙන්නේ දැන් මේකේදී සාමාන්‍යයෙන් අර සාම්ප්‍රදායානුකූලව report එක treat කරලා තියෙනවා මේ information එක. ඒ කියන්නේ මේක අනිත් හැම තොරතුරක් එන විදිහට අවසානයේදී අර මම කියපු කරුණු හයෙන් හයවෙනි එකේදී අපි කියනවනේ දැනට වෙන්නේ මොකක්ද . දැනට අපි කියනවා දැනට investigation is in progress කියලා. ඒක process ඉතින් මෙතනදී අර threat එක මීට වැඩිය analysis එකක් කරන්න තිබ්බා කියන එක තමයි මම දකින්නේ විශේෂයෙන්ම මේකේ තොරතුරක් ලැබිලා තියෙනවා, ඒ තොරතුරු ගත්තාම ground එකත් එක්ක ඒක reconfirm වෙනවා. එතකොට මේ තුළින් යම් කිසි දෙයක් අනිවාර්යෙන්ම සිදු වෙනවයි කියන එක අපි විශ්ලේෂණයකට භාජනය වෙනවා. එතකොට ඒ තුළින් එතනදී අපි ක්‍රියා කළ යුත්තේ immediately

FAIR COMMENT BY JEZEEM

මෙන්න මේ මේ areas ටික අපි identify කරලා තියෙනවා. මේකට අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගත යුතුයි කියන තැන තමයි මම ඉන්නේ ස්වාමිනි. එහෙම නැතුව අපි රහසිගත පරීක්ෂණයක් සිදු කරමින් පවතී නම් එහෙනම් ඒ රහසිගත පරීක්ෂණය මේකේ තියෙන බැරුරුම්කම අනුව ඒ රහසිගත පරීක්ෂණය තොරතුරු ටික සඳහන් කරන්න ඕනේ.

****

දැන් වේලාව : ප.ව. 12.35 යි.
මෙතැන් සිට ල/ලේ :- සවිනි මෙය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව: ප.ව.12.35
පෙර සටහන්:මුතු මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියන්නේ ඔය C 04 C කියන ලේඛනයේ අවසාන වශයෙන් දාලා තියෙන්නේ මේ පිළිබඳ රහසිගත පරීක්ෂණ සිදු වෙමින් පවතිනවා කියන එක සම්ප්‍රදානුකූලව ඔබලා සාමාන්‍යයෙන් බුද්ධි තොරතුරක ඇතුළත් කරන දෙයක් කියල ද ඔබ කියන්නේ?

උ: ගොඩක් දුරට මම අර කරුණු 06 කිව්වම ඒ මොකද කිසිම මේක develop වෙවි develop වෙවි එන තොරතුරු ස්වාමිනි. එතකොට අපි සාමාන්‍යයෙන් කරන්නේ මගේ දැනුමේ හැටියට මේ Assessment එක ඊට වැඩිය මොකද හේතුව දැන් තොරතුරු ඉතාමත්ම පැහැදිලියි. මේ තොරතුරු තුලින් ඉතාමත්ම threat එක develop කරලා මේ විදියට මේ threat එක මේ විදියට මේවා Vulnerable මේ පිළිබඳව අනිවාර්යෙන්ම කටයුතු කළ යුතුයි කියන එක අනිවාර්යෙන්ම වෙන්න ඕන. හැබැයි අවසානයේ දී අර Normal routine report එකක් විදියට අපි දනවා දැනටමත් ඒ පිළිබඳව පරීක්ෂණ කරමින් පවතිනවා ඒක සාමාන්‍යයෙන් ඕනම report එකක දාන වාක්‍යයක්.

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියන හැටියට ඔය වාර්තාව C 04 C කියන ලේඛනය ලැබෙන පුද්ගලයා සාමාන්‍යයෙන් බුද්ධි අංශ වල යම් දැනුමක් තියෙන පුද්ගලයෙක් නම් ඔය කියන අන්තිම වාක්‍යයට වැඩි බරක් දාන්නෙ නැහැ. මොකද ඒක සම්ප්‍රදානුකූලව ඇතුළත් කරන එකක් කියල ද ඔබ කියන්නේ?

උ: ඔව් ගොඩක් දුරට හැම තොරතුරක්ම ඉවර වෙන තොරතුරක් නෙවෙයි ස්වාමිනි. ඒ කියන්නේ අපිට එන හැම තොරතුරක්ම Continuation එකක් තියෙන්න ඕන දේවල්. ඒක නිසා ඒ ගොල්ලන් indicate කරනවා මේක තව දුරටත් පරීක්ෂණ කරනවා කියලා. මොකද අනිවාර්යෙන්ම පරීක්ෂණයක් පවතිනවා. නමුත් වෙලා තියෙන්නේ කොච්චර මේකේ තියෙන බැරෑරුම් තත්ත්වය identify කරලා මේ පරීක්ෂණය මොකද්ද මේ පරීක්ෂණය මොන විදියට පැවතුණා ද පරීක්ෂණය මොකද්ද ඒ පරීක්ෂණයක් කරනවානම් මේකේ මේ ලොකු threat එකක් තියෙන නිසා පැය 24 ක් ඇතුළත අපි මේ මේ report එක යවන ගමන්ම අපි ඒ අවස්ථාවේ දි ගත්ත ක්‍රියාමාර්ගය තමයි මොකද්ද මේ රහසිගතව කරන පරීක්ෂණය. ඒ රහසිගතව අපි සහරාන්ල පිළිබඳ තොරතුරු ලබාගත්ත ද එතකොට එතැන තමයි ඒක වැදගත් වෙන්නේ ඉතිං මෙතනදී මම දකින්නේ මේක අර සාමාන්‍යයෙන් හැම report එකම සඳහන් කරන

FAIR COMMENT — BY JEZEEM —

එකක් තමයි දැනට ඊට පස්සේ ඉදිරියේ දී මොකද්ද වෙන්නේ කියන එක එක්කොා රහසිගත පරික්ෂණයක් පවත්වනවා එහෙම නැත්නම් තවදුරටත් ඒ පිළිබඳව පරික්ෂණයක් පවත්වනවා තව දුරටත් ඒ පිළිබඳව සොයා බැලීම් සිදු කරනවා කියන එක ඕනම report එකක අපි අවසාන Sentence එකක් හැටියට දකිනවා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ දැන් අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි අංශයේ බුද්ධි අධ්‍යක්ෂක වර්තමානයේ. ඔබ මේ 2019 අප්‍රේල් 04 වැනිදා බුද්ධි අධ්‍යක්ෂක වෙලා හිටිය නම් ඔබ විසින් මෙම තොරතුර බුද්ධි තොරතුර පිළිබඳව ගනු ලබන පියවර මොනව ද?

උ: ස්වාමිනි මං විශේෂයෙන් මම දැක්කා විශේෂයෙන්ම යුධ හමුදා බුද්ධි අංශයේ සිද්ධියේ දී ඉන්නැද්දී ඒ අපිට ආවේණික වූ ක්‍රියාවලියන් ඔක්කොම අපිට විශේෂිත වූ දේවල්. ඒ කියන්නේ විශේෂයෙන්ම අපි proactive සංවිධානයක් ලෙස තමයි අපි කටයුතු කළේ. ඉතිං එතකොට ඒක මුළු සංවිධානයම තරුණ පිරිස් හිටියේ. ඒ කියන්නේ බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය එතකොට හැම තිස්සේ ම අපි proactively අපිව training ඔක්කොම කරලා තිබ්බේ මේ සිදුවීම් වළක්වාලීමේ ක්‍රියාවලියක්. ඉතිං මම රාජ්‍ය බුද්ධි සේවාවට ආවට පස්සේ මට දැනිච්ච දේ තමයි ඇවිල්ලා ගොඩාක් දුරට ඒ බුද්ධි සේවාව යොමු වෙලා තිබ්බේ proactive වලට වැඩිය ඒ විශේෂයෙන්ම තොරතුරු ලබාදීම පමණකට තමයි ඒ ගොල්ලන්ගේ රාජකාරී ගොඩදෙනෙක් හැම system එකම එක geared වෙලා තිබ්බේ. එතැන දි මම ලොකු වෙනසක් මම දැක්කා. ඉතිං විශේෂයෙන්ම මට මේ තොරතුර DMI වෙලා මම හිටිය නම් අනිවාර්යෙන්ම මේ report එකට වැඩිය මම Concentrate කරන්නේ immediately ම මේ පිළිබඳව immediately මේකේ පුද්ගලයෝ අත්අඩංගුවට ගන්න, ඒ ඒ එන තොරතුරු ගන්න, ඒ අනුව කරන ගමන්ම ඉහළ ස්ථානයට මම දැනුම්දීමක් කරනවා. ඒ එක්කම රාජ්‍ය බුද්ධි සේවාවේ ඉන්න දැනට මට මේ වගේ තොරතුරක් ආවොත් මම යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක වගේ හිටපු වගේම තමයි මම Act කරන්නේ මොකද මම system එක මට Support කරේ නැතත් අනිවාර්යෙන්ම මේකේ තියෙන වගකීම අති විශාලයි. ඉතිං ඒ වගකීමේ දි මට ලොකු වගකීමක් තියෙනවා මේ තෙරතුර දෙනවට වැඩිය මගේ තියෙන ලොකුම වගකීම තමයි මේ සිදුවීම සිදු වෙන එක Prevent කරන එක. ඉතින් එතැන දී මට Proactively කටයුතු කරන්න සිදු වෙනවා. හැබැයි මම දැක්ක ලොකු වෙනස තමයි විශේෂයෙන්ම රාජ්‍ය බුද්ධි සේවාව ගොඩක් දුරට ඒ ගොල්ලන්ගේ රාජකාරීන් සිමා වෙලා තිබ්බා මුළු ඔක්කොම යම්කිසි

කොටුවකට ඒ කියන්නේ මේ තොරතුර අපි කළ යුත්තේ තොරතුරු ලබා ගැනීම ලබාදීම කියන තත්ත්වය පමණයි හිටියේ ඒකට හේතුනුත් තියෙනවා ස්වාමිනි මොකද හේතුව නීතිමය පැත්තෙන් ගොඩක් අය ප්‍රශ්නයක් තියෙනවා. ඒ එක්කම හැමෝම වගකීම ගන්න ගොඩාක් කැමති වුණේ නැහැ 2015න් පස්සේ වුණේ හැම පොඩි ප්‍රශ්නයකටමත් පොලීසියට එන්න කියනවා. එතකොට මේ ගොල්ලෝ ගොඩක් දුරට කළේ තමන්ගේ රාජකාරී කොටස අර බුද්ධිමයට වැඩිය ඇඟ බේරා ගන්න වගේ තමයි හැම පැත්තටම හුරු වෙලා තිබ්බේ. ඉතිං එතකොට අපිත් ඒක experience කරා 2016 දි මොකද අර සාමාන්‍ය කොටසින් එළියට ගිහිල්ලා කරපු හැම නිලධාරියෙක්ම ලොකු සට්ටනයකට සහ උසාවි වලට ගෙනැල්ලා ලොකු ප්‍රශ්න රාශියක් ඇති වුණා. හැබැයි එහෙම තිබිලත් අපි අපේ තියෙන ක්‍රමවේදය අපි අමතක කරේ නැහැ. අපි කොහොමත් ඒ ක්‍රමවේදය කරා. නමුත් අර රාජ්‍ය බුද්ධි සේවාව වගේ ආයතනය ගොඩාක් දුරට නීතියත් එක්කම බැඳිලා තියෙන වගේ ආයතනයක් කියලා මම දැක්කා. මොකද ඒ proactiveness එක දැක්කේ නැහැ ඒ ගොල්ලන් හිතුවේ ඒ ගොල්ලන් ගොඩාක් දුරට මම දැක්කේ මුළු system එකම හැදිලා තිබුණේ තොරතුරු ලබා ගැනීම තොරතුරු ලබා දීම තමයි අපේ රාජකාරීය කියන කොටස තමයි උඩ ඉඳන් යට වෙනකන්ම ඒ system එකේ තිබ්බේ.

ප්‍ර: මෙවැනි තොරතුරක් ලැබුණාහම බුද්ධි සමාලෝචන මණ්ඩලයට මෙම කරුණ ඉදිරිපත් කිරීම සහ ආරක්ෂක කවුන්සලයට ඉදිරිපත් කිරීම SIS එක මගින් කළ යුතුයි නේද?

උ: ස්වාමිනි අනිවාර්යයෙන්ම මේක කළ යුතුයි. මොකද එකක් ඇවිල්ලා මේක විදේශීය රටක බුද්ධි සේවාවක්. අනිත් එක මේක රටම ඉතාමත්ම බලපෑමක් ඇති කරන්න පුළුවන් දෙයක් ඒ අමතරව මේ තොරතුර සනාථ කරන්න අවශ්‍ය කරන තොරතුරුත් අපි ළඟ තිබුණා. ඉතිං එතැන දී අපි අනිවාර්යයෙන්ම මේක Intelligence Coordinating meeting එකේදී සහ Security Council එකේදි අනිවාර්යයෙන්ම මේක දැනුවත් කිරීමක් කරලා අවශ්‍ය කරන පියවර ගැනීමට කටයුතු කළ යුතු දෙයක් ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ මෙම තොරතුරු සම්බන්ධයෙන් ඉදිරියට ගන්නා ලබන පියවර බුද්ධි සමාලෝචන මණ්ඩලයේ දී හා ආරක්ෂක කවුන්සිලයේ දී සාකච්ඡා කළ යුතුව තිබුණා?

උ: ඔව් ස්වාමිනි මොකද හේතුව දැන් මේක එක ආයතනයකට විතරක් ලැබිච්ච බුද්ධි තොරතුරක් වෙන්න පුළුවන් දැන් අපි එතැන දි විශේෂයෙන්ම Coordinating meeting එකේ දි අපි බලාපොරොත්තු වෙන්නේ මේ ප්‍රකාශය කරාම මේකට අනිකුත් ගොඩාක් කට්ටිය මේකට සම්බන්ධ වෙනවා. යුධ හමුදාව මේ ඔක්කොම. ඒ එක්කම ගොඩක් මොළවල් ටික එකතු වෙනවා.Secretary Defence ඔක්කොම එතකොට

FAIR COMMENT — BY JEZEEM

අනිවාර්යෙන්ම මේකේ දී ගන්න ක්‍රියාවලිය ඉතාමත්ම වෙනස්. අපි බුද්ධි තොරතුරු අපි ලබා ගෙන අපි පරීක්ෂණ කරනවට වැඩිය ලොකු Impact එකක් වළක්වන්න නම් අපි ඒ අර මං කියපු විදියට ඒක අනිවාර්යයෙන්ම MOD එකේ Operation Level එකත් උඩ Security Council එකේ දි ජනාධිපතිතුමාගේ Direction එකත් අනිවාර්යයෙන්ම ගත යුතුයි මේ වගේ තොරතුරක් අපි Action එකක් ගැනීමේ දී.

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියන්නේ මෙවැනි තොරතුරක් සම්බන්ධව ඉදිරි පියවර ගැනීමට ජනාධිපතිවරයාගේ උපදෙස් නියෝග ලැබිය යුතුයි කියලා?

උ: දැන් මේ තියෙන තොරතුරේ බැරෑරුම්කම විශේෂයෙන්ම මේක විදේශීය බුද්ධි සේවාවකින් ලැබුණු තොරතුරකින් ඒ සමඟම මේ ලැබිච්ච තොරතුරු අනුව ground එකේ ඒ අවස්ථාවේ දී බුද්ධි ආයතනවලත් මේ තොරතුරු තිබීමත් ඒ එක්කම මේක වළක්වන්න නම් අනිවාර්යයෙන්ම මේක අර විශේෂයෙන්ම අපිට හැකියාව ලැබෙන්න තිබ්බා අර කලින් තොරතුරු වගේ ඒ Assessment එක කරලා තිබ්බ නම් හරියට. ඒ Assessment එකේ දී විශේෂයෙන්ම මේ විදියට මේ Development එකේ දි මෙන්න මේ වගේ තමයි මේ ප්‍රහාරයක් එල්ලවන්න පුළුවන් මේක ඇති වෙන්න පුළුවන් Impact එක මොකද්ද කියන එක පැහැදිලිව සඳහන් කරාම automatically අවශ්‍ය වෙනවා මේක තව දුරටත් මේක අපි අතර තියා ගන්න බැහැ මේක අනිවාර්යෙන්ම intervene වෙන්න අවශ්‍යයි ආරක්ෂක අමාත්‍යාශය සහ Security Council එක.

ප්‍ර: දැන් SIS date base එකේ මේ සහරාන්ලගේ මෙම සම්බන්ධ සියළු පසුකාලීන තොරතුරු තිබ්බා?

උ: ස්වාමිනි මේකෙන් ඉතාමත් පැහැදිලි වෙනවා මේකේ කියනවා ඉහත තොරතුරු සම්බන්ධයෙන් සිදු කරන ලද මූලික සොයා බැලීම් වලදී ප්‍රහාරය සැලසුම් කිරීම සඳහා දායක වන බවට තොරතුරු සඳහන් පුද්ගලයන් අතරින් කිහිප දෙනෙක් මෙම සේවාවේ බුද්ධි මෙහෙයුම් වලදී හඳුනාගෙන ඇත. එතකොට ඒ registry එක වල තමයි සහරාන් ගැන රිල්වාන් ගැන ඒ සියළු සම්බන්ධ ඒ තියෙන data එක තමයි මේ ගොල්ලෝ මේ සඳහන් කරලා තියෙන්නේ.

ප්‍ර: ඒ අනුව මෙම තොරතුරේ බරපතලකම SIS අධ්‍යක්ෂවරයාට වටහා ගන්න පුළුවන් ?

උ: අනිවාර්යයෙන්ම වටහා ගන්න පුළුවන්.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: දැන් SIS අධ්‍යක්ෂකවරයා ඒ තොරතුරේ වටිනාකම වටහා ගත්ත නම් ඔහු විසින් ගත යුතුව තිබූ පළවෙනි පියවර මේක ජනාධිපතිතුමා වෙත

FAIR COMMENT BY JEZEEM

දැනුවත් කිරීම ද නැත්නම් සමාලෝචන මණ්ඩලයේ දී සාකච්ඡා කරලා අනිත් අයත් එක්ක Share කර ගන්න එකද ?

උ: දැනට මගේ රාජකාරීය අනුව ස්වාමිනි විශේෂයෙන්ම මේ වගේ දෙයක් නිතිපතාම මම ජනාධිපතිතුමාට උදේ හවස මං කතා කරනවා. Briefing එකක් දෙනවා. එතුමා directions දෙනවා විශේෂයෙන්ම ඉතිං ඒ කියන්නේ ඒකේ තියෙන බැරෑරුම්කම අනුව එතැන දී අනිවාර්යයෙන්ම දැන් ඒ වකවානුවේ දී මේ කිසි දෙයක් හරියට ක්‍රියාත්මක වුණේ නැහැ. උදාහරණයක් වශයෙන් Security Council එකක් හරියට පැවතුණෙත් නැහැ Coordinating meeting එකක් පැවතුණෙත් නැහැ. පැවතුණත් ඒ වල කිසිම තීරණ ගැනීමේ ක්‍රියාවලියක් සිදු වුණෙත් නැහැ. ඉතිං එතැන දී ලොකු වගකීමක් තිබුණා රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකටත්. නමුත් ප්‍රශ්නය තියෙන්නේ ස්වාමිනි එතුමාට අනිවාර්යයෙන්ම කිව යුතු දෙයක් කියලා මම හිතනවා නමුත් කාලීනව මේ වගේ තොරතුරු කියක් කියලා තියෙනව ද, ඒවට ගත්ත ක්‍රියාමාර්ග මොකද්ද කියන එකත් මං හිතන්නේ ඒ වගේ වාතාවරණයක් ඒ අවස්ථාවේ දී තිබුණෙ නැහැ කියන එක තමයි මගේ තියෙන හැඟීම. නමුත් අනිවාර්යෙන්ම මේ තොරතුර ජනාධිපතිතුමා විසින් දැනගත යුතුයි මොකද විශේෂයෙන්ම මේක පිටරටකින් ආපු තොරතුරක්. ඒ එක්කම මේ තොරතුරෙහි Impact එක අති විශාලයි. ඒ අවස්ථාවේ දී එතුමා දැනුවත් කිරීම මම හිතන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ හෝ බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ හරි ප්‍රධානියා හැටියට ඒ දැනුවත් කිරීම මං හිතන්නේ ඒ අනිවාර්යයෙන්ම කළ යුතුයි කියලා මට හිතෙනවා.

ප්‍ර: දැන් එවැනි අවස්ථාවක දී දැන් බුද්ධි අංශය කරන්නේ තොරතුරු දෙන එක පමණයි නේ. ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රථම වගකීම තියෙන්න ඕන කාටද ඔබේ මතය හැටියට?

උ: ඔව් දැන් ක්‍රියාමාර්ග ගැනීමට අර මං කියපු විදියට ස්වාමිනි විශේෂයෙන්ම අර දෙකක් තියෙනවා. අර Security Council එකයි Intelligent Coordinating Conference එක තියෙනවා ඕන. මං අර කිව්වා පැහැදිලිවම එතැන තමයි සම්පූර්ණම ක්‍රියාන්විතයන්වලට direction එක දෙන්නේ. එතැනදී විශේෂයෙන්ම මං හිතන්නේ ආරක්ෂක ලේකම්ට ලොකු වගකීමක් පැවරෙනවා මෙතැන දී ඒ පිළිබඳව Coordinate කරලා ඒ අවශ්‍ය කරන උපදෙස් ලබා දෙන්න ඒ අදාළ ආයතන වලට සහ මේකට මේකට කටයුතු කරන්න කියන එක. ඒ එක්කම බුද්ධි නිලධාරීන් හැටියට බුද්ධි ප්‍රධානීන් හැටියට අපේ වගකීමකුත් තියෙනවා ඒක කොහොම හරි කරලා Convince කරලා ඒකේ implement වෙන්න. ඒක implement වෙන්නෙ නැත්නම් නැවත වරක් ඒක implement කරන විදියට කටයුතු කිරීමට අපිටත් ලොකු වගකීමක් තියෙනවා.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා වශයෙන් ජනාධිපතිතුමාට සෘජුව කතා කිරීමේ දැනුම්දීමේ හැකියාවක් තිබෙනව ද?

උ: ස්වාමිනි මම බුද්ධි අධ්‍යක්ෂක ඉන්දැද්දිත් යුධ හුමදාවේ දැනුත් මම භාර ගත්තට පස්සේ නිරතුරුවම අතිගරු ජනාධිපතිතුමා එක්ක සම්බන්ධ වෙනවා ජාතික ආරක්ෂක කටයුතු වලදී හැමදාම උදේ සහ හවස ඒ එක්කම පොඩි සිදුවීමක් සිදු වුණත් එවකටත් එහෙම ආරක්ෂක ලේකම්තුමා ඉන්දැද්දි 2012 ඉන්න කොටත් විශේෂයෙන්ම ආරක්ෂක ලේකම් තමයි එතකොට සම්බන්ධ වුණේ.පොඩි සිදුවීමක් සිදු වුණත් විස්තර ටික අහනවා අහලා උපදෙස් ලබා දෙනවා මොකද ඒ පොඩි දෙයින් ලොකු දෙයක් වෙන්න පුළුවන් කියන එක ලොකු වගකීමක් පැවරිලා තියෙනවා රාජ්‍ය බුද්ධි සේවාවට. ඒ එක්කම එතුමා රටේ ජනාධිපතිතුමා බලාපොරොත්තුත් වුණා එහෙම අපි දුන්නයි පස්සේ අපි අවශ්‍ය කරන කළමණාකරනණය කරලා මේක prevent කරලා මේකට අවශ්‍ය කරන විදියට බුද්ධිමය පැත්තෙන් ඒ Actions ටික ගනී කියන එක බලාපොරොත්තු වෙනවා ඉතිං. ඒක විශේෂයෙන්ම පුද්ගලයන් අනුව තමයි ඒක තීරණය වන්නේ මම හිතන්නේ රාජ්‍ය බුද්ධි සේවාව කියන්නේ ඇවිල්ලා රටේ තිබෙන ප්‍රධානතම බුද්ධි සේවාව ඉතිං එතකොට ඒක සම්පූර්ණයෙන්ම ආරක්ෂක ලේකම් සහ ජනාධිපතිතුමාගේ යටතේ තමයි මේකේ බුද්ධි ඒ කියන්නේ අපි අනෙකුත් තොරතුරු ඕනම දෙයක් රටේ ජනාධිපතිට ආරක්ෂක ලේකම්ට දැන ගන්න ඕන වුණොත් රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකට තමයි කතා කරන්නේ. මොකද එතුමාට තියෙන ඒ Access එකයි details යි ඒ අවශ්‍ය කරන ඔක්කොම තියෙන්නේ එතැන. ඉතිං එතැන දී මේ පැත්ත වගේමයි මගෙත් යුතුකමක් තියෙනවා මොකද මේක ලොකු වගකීමක් ඒ වැඩේ වෙන්නෙ නැත්නම් එහෙම නැත්නම් මේකේ තියෙන මේක අනුව මං ඒ දැනුවත් කිරීම මම සිදු කළ යුතුයි ඒ අදාළ ක්‍රියා මාර්ග ගන්න.

ප්‍ර: ආරක්ෂක ඇමතිවරයෙක් ඉන්නව නම් ඇමතිවරයටත් දැනුම් දිය යුතුයි?

උ: මෙතැනදී දැන් ආරක්ෂක ඇමතිවරයා මම වැඩ කරන විට හිටියේ ස්වාමිනි ජනාධිපතිතුමා සහ ආරක්ෂක ලේකම් එතකොට අපිට එහෙම ලොකු ගැටළුවක් දැනුණේ නැහැ මොකද ආරක්ෂක ලේකම් මම රාජකාරි කරන අවස්ථාවේ දී 2015 වෙනකන් එතුමා තිරණ ගත්තා. ඒක නිසා අපිට එතැනින් එහාට යන්න අවශ්‍යතාවයක් තිබ්බෙ නැහැ තීරණ ගත්තා. එතකොට 2015න් පස්සේ ඒ ඒ තීරණ ගැනීමේ සහ ඒක සෑහෙන්න දුර්වලතාවයක් දැක්කා. එතකොට උඩත් ඒ දුර්වලතාවයක් දැක්කා. එතැනදි තමයි මුල් වශයෙන් මගේ දැනුමේ හැටියට රාජ්‍ය ඇමති කෙනෙක් පත් වුණේ රුවන් විජේවර්ධන අමාත්‍යතුමා. හැබැයි එතුමාට මේ පිළිබඳව කාර්ය භාරයක් පැවරිලා තිබ්බේ නැහැ. එතුමගේ කාර්ය භාරය ගත්තම එතුමා ගොඩක් දුරට සම්බන්ධ වුණේ ඇවිල්ලා training

FAIR COMMENT BY JEZEEM

පැත්තයි KDU එක ඒ වගේ දේවල්. එතකොට අපි විශේෂයෙන්ම එතුමත් Security Council එකට ආවා ගොඩක් දුරට. නමුත් රාජ්‍ය විශේෂයෙන්ම ආරක්ෂාව සම්බන්ධයෙන් ලොකු වගකීමක් එතුමා දැරුවේ නැහැ. මොකද එතුමාට එහෙම බලයක් සහ Authority එකක් තිබ්බේ නැහැ. එතුමාට විෂය පද්ධතියක් දීලා තිබ්බා අපි දැක්කා ඒ විෂය පද්ධතියේ ජනාධිපතිතුමා විසින් ඒ කියන්නේ රාජ්‍ය නායකයා විසින් මොකද්ද විෂය පද්ධතිය ඒ එක්කම Secretary Defence ගේ පද්ධතිය මොකද්ද ඒ එක්කම රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා හැටියට එතුමාට තිබ්බ කාර්ය භාර්ය Black and white ලියලා තිබ්බා එයාට අඩංගු එතැනදී මම දැක්කෙ නැහැ අපි වුණත් ගොඩක් සම්බන්ධ වීමක් සිදු වුණේ නැහැ.

ප්‍ර: මෙවැනි තොරතුරු අගමැතිවරයාට දැනුම්දීම් කරනවද?

උ: දැන් මෙතැනදි විශේෂයෙන්ම මේ එන නිලධාරින් Coordinating meeting එකට එන නිලධාරීන් ගොඩ දෙනෙක් පොලීසියේ නිලධාරීන්. එතකොට පොලිසිය පැවතුණේ එවකට හිටපු අග්‍රාමාත්‍යතුමාගේ යටතේ තමයි පොලීසිය පැවතුණේ. ඒ කියන්නේ සාගල රත්නායක සර් සහ ඒ කට්ටිය එතැන හිටියේ. එතකොට ජනාධිපතිතුමාගේ යටතේ තමයි ආරක්ෂක ඒ කියන්නේ මණ්ඩලය රැස් වුණේ. ඉතිං ආරක්ෂක මණ්ඩලයේදීත් ඒ සහභාගිවන නිලධාරීන් දෙපැත්තටම සම්බන්ධ වුණා. ඒ එක්කම අරාක්ෂක මණ්ඩලයේ දී අගමැතිතුමා සියළුම ඒ කට්ටිය ඒ meeting වලට පැමිණිනා. ඉතිං ඒ නිසා මෙතැන දි වගකීම මං හිතන්නේ දෙපැත්තටම මම දකිනවා විශේෂයෙන්ම මොකද ගොඩාක් දුරට පොලීසිය Coorporate කරේ නැහැ මම දැක්කා. ඒ කියන්නේ විශේෂයෙන් මුල ඉඳන්ම උඩ ඉඳන්ම මේකේ වෙන්වීමක් තිබ්බා. දැන් අපි මහජනතාව විසින් යම්කිසි රජයක් පත් කරාම අපි බුද්ධි නිලධාරීන් විදියට රජයේ සේවකයේ හැටියට බැඳී සිටිනවා ඒ රජයේ තියෙන ප්‍රතිපත්තිත් එක්ක කරන්න. එතකොට ඒ වුණත් රාජ්‍යය විශේෂයෙන්ම ආරක්ෂාව සම්බන්ධයෙන් අපි වගකිව යුතු නිසා කුමන රජයක් පත් වුණත් අපි ආරක්ෂාව පිළිබඳව අපේ තියෙන briefing එක අපි දෙන්න ඕන. නමුත් මගේ පෞද්ගලික දැනුම සහ මගේ අත්දැකීම් අනුව මම ඒ වෙනස දැක්කා 2015 දී මං කලිනුත් ගරු උසාවියට ඉදිරිපත් කරා විශේෂයෙන්ම එතැනදි අපි ඉදිරිපත් කරපු ගොඩක් දේවල්වලට අපිට පිළිතුරු ලැබුණේ නැහැ. ඒ පිළිතුරු ලැබුණෙ නැති එක හේතුවක් තමයි ජනාධිපතිතුමා විශේෂයෙන්ම Nationalistic පැත්තක හිටියේ. ඒ කියන්නේ ජාතිකවාදය පැත්තෙන් හිටියේ. අගමැතිතුමා ගොඩක් වෙලාවට Liberal Policies තමයි තිබ්බේ. ඒ කියන්නේ engagement එකත් එක්ක යන්න ඕන කියන එක. එතකොට මේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් යම් යම් අපි ගැටළු සම්බන්ධයෙන් මේ සහරාන්ලගේ නැති වුණත් මේ ideology සම්බන්ධයෙන් අපි යම් යම් දේවල් අපි

FAIR COMMENT
BY JEZEEM

ඉදිරිපත් කිරීමේ දී අපිට ගැටළුකාරී තත්ත්වයක් පැවතුණා මොකද මෙතැනදි උඩ තීරණ ලැබුණෙ නැහැ. ඒ තීරණවල පරස්පර විරෝධත්වයක් අපි දැක්කා. ඉතිං එතැනදි ඒ පරස්පර විරෝධත්වය Security Council එකත් වෙන්වෙලා තිබ්බෙ. ඊට පස්සේ ඒක Coordinating meeting ආවත් ඒකත් වෙන් වෙනවා. ඉතිං එතකොට වැඩිපුරම නිලධාරීන් 90% ක් යොමු වෙලා තිබ්බේ ඇවිල්ලා දක්ෂ නිලධාරින් ඔක්කොම යොමු වෙලා තිබ්බේ ඇවිල්ලා එවකට තිබ්බ පාලන තන්ත්‍රය විශේෂයෙන්ම දේශපාලනීකරණයක් මම දැක්කා විශේෂයෙන්ම. ඒ දේශපාලනීකරණය දැක්ක කියන්නේ ඒ ගොල්ලන්ට අවශ්‍ය කරන පසුබිමක් තමයි හැදිලා තිබ්බේ. එතකොට මේ දක්ෂ නිලධාරීන්ව යොමු වෙලා තිබ්බේ විශේෂයෙන්ම වෙන වෙන දේවල් හොයන්න මිසක් මේ ජාතික ආරක්ෂාව පිළිබඳව ගැන කරුණු සලකන්න නෙමේ. ඉතිං එතැන දි දැන් අපි මේ සිදුවීම් ගත්තත් මේ මේකට එන්න කලින්ම සිදුවීම් අවස්ථා 07 ක් විශේෂයෙන්ම අපිට සඳහන් වුණා. ඒක ඇවිල්ලා පළවෙනි එක ඇවිල්ලා පොලීසියේ එක්කෙනෙක්ගේ බෙල්ල කපන එක. දෙවැනි එක ඇවිල්ලා Explosives හොයා ගන්න එක. ඊට පස්සේ තව අවස්ථාවක දී අපි දැක්කා බුදු පිළිම කඩන එක. තවත් අවස්ථාවකදි අපි දැක්කා මෝටර් සයිකල් එකක් පුපුරන එක. ඉතිං මේ හැම අවස්ථාවකදීම මේ කිසිම Unity එකක් තිබ්බේ නැහැ. ඒ අවස්ථාවේදිත් පොලීසිය විසින් සියළුදේම අරගෙන තිබ්බා. මේ Intelligence Arm එක කියන්නේ එකක්. Investigation Arm එක කියන්නේ තව එකක්. එතකොට Investigators හැටියට ඒ ගොල්ලෝ Intelligence Arm එක එකතු කර ගත්තේ නැහැ. ඒ ගොල්ලෝ කිව්වේ නැහැ නැහැ මේක අපි කරන්නේ කියලා ඒ ගොල්ලෝ කරන්න බැලුවේ ඒ ගොල්ලොන්ට ආවේණික වූ අනුව ඒ ගොල්ලන්ට අවශ්‍ය කරල තිබ්බේ මේ කවුද පුද්ගලයා කොහොමද මේ කරන කෙනා අත්අඩංගුවට ගන්න අවශ්‍ය කරන්න මිසක් මේ බුද්ධිමය තොරතුරු එකතු විමක් දැක්කෙ නැහැ . ඒක ආරක්ෂක මණ්ඩලය තිබ්බෙත් නැහැ Coordinating meeting වල තිබ්බෙත් නැහැ. ඒ Coordinating meeting වල සමහර පොලිස් නිලධාරීන් ආවේ නැහැ. ඒ ගොල්ලෝ සමහර මං දැක්කා මම සහභාගි වෙච්ච අවස්ථාවලදී ඒ ගොල්ලෝ ඇවිල්ලා වෙනම ආරක්ෂක ලේකම් හම්බවෙලා මොනව හරි යම්කිසි දෙයක් කියලා ඒ ගොල්ලන් යනවා. ඊට පස්සේ ඒ ගොල්ලන්ට සහභාගි වෙන්න කියලා අපි ඒ කියන්නේ ආරක්ෂක ලේකම් කියපු අවස්ථාවලදී ඒ ගොල්ලෝ සමහර දේවල් මේවා ගොඩක් Sensitive අපිට මෙතැනින් කතා කරන්න බැහැ කියලා ඒ ගොල්ලෝ එළියට යනවා. ඉතිං ඒක නිසා මේ Coordination එක උඩ ඉඳන් පල්ලෙහාටම කිසිම අවස්ථාවක තිබ්බෙ නැහැ. ඒ නිසා අපි බුද්ධි නිලධාරී හැටියට අපි සමහර ගොඩාක් තැන් වලදී අපි

FAIR COMMENT BY JEZEEM

අසරණතාවයට පත් වුණා හැබැයි ඒ system එකින් අපිට Justify වෙන්න බැරි වෙන කොට අපි වෙන විකල්ප ක්‍රම යොදා ගත්තා මේ තොරතුරු හරියට මේක ඉදිරිපත් කරලා මේ පිළිබඳව රජය යොමු කරන්න මේවට තීරණ ගන්න ඕන කියලා. එක අවස්ථාවක දී මං මේ Document එකක් මම ගෙනවා සැප්තැම්බර් 27 වැනිදා මේ කිසිම දෙයක් වෙන්නෙ නැති වෙන කොට අපි සම්පූර්ණයෙන්ම රජයක් හැටියට මේ threat එක identify කරලා මේ ඔයගොල්ලන් කළ යුතු දේවල් Line ministries මොනවද කළ යුතු දේවල් පිළිබඳව අපි සම්පූර්ණයෙන්ම

ප්‍ර: මොන වර්ෂයේ ද?

උ: මේක 2016 සැප්තැම්බර් 27

ප්‍ර: මොකද්ද ඒ සම්බන්ධව කළේ?

උ: සම්පූර්ණයෙන් මේකේ ඉංග්‍රීසියෙන් තියෙනවා Identification of threat posed by the Islamic State Of Iraq and Syria ISIS and suggested pre-emption Counter strategy. අර Provetively අපි මොනව ද කළ යුත්තේ කියන එක අපි රජයක් හැටියට මොනව ද කළ යුත්තේ කියන එක අපි මේ පොත හදලා අපි ඉදිරිපත් කරා Security Council එකටත් අපි දුන්නා. ආරක්ෂක ලේකම්ටත් අපි එය ලබා දීම සිදු කරා. හැබැයි මේ තත්ත්වයට එන්න කලින් දිගටම අපි මේක director SIS දැනගෙන සිටියා විශේෂයෙන්ම රජයේ වෙනස් වීමත් එක්කම අපි දැක්කා ගොඩක් වෙනස්වීම් සිදු වෙනවා. එතැනදී අපි දෙන්නා සාකච්ඡා කළා ගොඩක් දේවල් කතා කරන්න කලින් විශේෂයෙන් ම Security Council එකේදි. එතැනදි සමහර අවස්ථා වලදී තිබ්බා අපිට briefing දෙකක් හදාගෙන ගිය අවස්ථාත් අපිට තිබ්බා. මොකද අපිට තිබ්බ මෙතුමා ඇවිල්ලා ලොකු කර්තව්‍යයක් තිබ්බා විශේෂයෙන්ම මේක එක පාරටම අපි හැම දෙයක්ම අපි එක පාරටම ප්‍රකාශ කරොත් ප්‍රතික්ෂේප කරන තත්ත්වයක් ආවා. ඒ ප්‍රතික්ෂේප කළොත් සම්පූර්ණයෙන්ම බුද්ධි ජාලයක්ම කඩා වැටෙනවා එතකොට අපි තේරුම් ගත්තා මේ මේ වගේ ව්‍යුහයකට අපි මීට වැඩිය tactically ඉදිරිපත් කරන්න ඕන කියන එක. tactically අපි ඉදිරිපත් කිරීමේ දී අවස්ථාවක් ලද විගසම අපි ඒ විශේෂයෙන්ම ජනාධිපතිතුමා පමණක් ඉන්න අවස්ථාවලදී මට මතකයි මම මගේ Presentation එක ටිකක් වෙනස් Presentation එකක්. එතකොට ජනාධිපතිතුමා අගමැතිතුමා දෙන්නම ඉන්න අවස්ථාවකදී මම ටිකක් තදින් ගියේ නැහැ. මොකද ඒකට හේතුන් තිබ්බා මොකද මම බුද්ධි නිලධාරීයෙක් හැටියට අපිව මෙච්චර කල් ගොඩනගලා අපිව මේව කරලා තියෙන්නේ අපිව tactically Changes එක්කත් අපි හැඩගැහෙන්න ඕන. මොකද අපේ ලොකු කාර්ය භාර්යක් තියෙනවා prevent කරන්න. ඉතිං එකපාරටම අපි ප්‍රතික්ෂේප කරන තොරතුරු ඉදිරිපත් කරලා ප්‍රතික්ෂේප වීමක් සිදු

FAIR COMMENT — BY JEZEEM —

වුණොත් සම්පූර්ණයෙන් ම අපිට කවමදාකවත් මේක කරගන්න බැරි වෙනවා. ඉතින් ඒක නිසා අපි ඒ අනුව ඒ Liberal thinking එකයි National mind එකටයි අවශ්‍ය විදියට කොහොම ද මේ තත්ත්වය අපි පෙන්නුම් කරන්නේ කියන එකට අපිට ලොකු උත්සාහයක් ගන්න සිද්ධ වුණා අපිට මේ තොරතුරු දෙන්න. එහෙම බැරි අවස්ථා වලදී අපි වෙන විකල්ප ක්‍රම උපයෝගි කරගත්තා විශේෂයෙන්ම පාර්ලිමේන්තුවට දැනුවත් කිරීමක් කරන්න Security Council එකේ තීරණ ගන්නේ නැති වෙන කොට Intelligence meeting ගන්නේ නැති වෙන කොට බුද්ධි නිලධාරියෙක් හැටියට මට ලොකු වගකීමක් තිබ්බා ඒ වගකීම කරන්න නම් මම වෙන විකල්ප ක්‍රමත් යොදවා ගත්තා මේක රටේ ජනතාව දැනුවත් කිරීම සහ රටේ නායකයන්ව දැනුවත් කරලා ඒ නායකයන්ව මේ තීරණ ගැනීමට යොදවන්න. නමුත් ඒ උත්සහායත් අපිට සාර්ථක වුණේ නැහැ මොකද Security Council එකටත් පාර්ලිමේන්තුවේදීත් මේ threat එක පිළිබඳව කතා කරලාත් ඒ කතා කරලා ඉවර වෙලත් කිසිම Action එකක් ගැනුණෙ නැහැ.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: සලේ මහත්මයා ඔබ 2019 අප්‍රේල් 20 ඉන්දියාවෙනෙ හිටියේ?

උ: ඔබතුමා හරි ස්වාමිනි.

ප්‍ර: අප්‍රේල් 20 මේ තොරතුර ලංකාවට ලැබෙන කොට හෙට ප්‍රහාරයක් එල්ල වෙනවා කියලා මේ තොරතුරෙන් බිඳක් හෝ ඔබටත් දැන ගන්න ලැබුණද?

උ: ගහන්න කලින් මට පොඩ්ඩක්වත් දැන ගන්න ලැබුණෙ නැහැ. මොකද මම හිටියේ ඉන්දියාවේ National Defence Collage එකේ පාඨමාලාවක් හදාරන. හැබැයි ලංකාවේ වෙන යම් යම් සිදු වීම් පිළිබඳව මම නිරතුරුවම සම්බන්ධ වෙලා සිටියා බුද්ධි නිලධාරියෙක් විදියට ඒ සෑම අවස්ථාවේ ම පුළුවන් අවස්ථාවලදි මං දැනුවත් කිරීමකුත් මම කරා ඒ අදාළ නිලධාරිනුත්. හැබැයි මේ සිදුවීම සිදු වෙන කොට මට immediately මට හැකියාව ලැබුණා විශේෂයෙන්ම මොකද අපි ඒ වෙන කොට 2016 නොවැම්බර් වෙන කොට මේ පුද්ගලයෝ ඔක්කොම අපි හඳුනාගෙන තිබුණේ. සහරාන් හැරෙන්න මේ මේ development එක. එතකොට ඒ අනුව මම එවකට හිටපු යුධ හමුදාපතිට immediately මම දැනුම් දුන්නා මේ කණ්ඩායම තමයි මේක තියෙන්නේ මේ තොරතුරු ටික මේකයි, මේ බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය මේ තොරතුරු සියළු දේම තියෙනවා. මේ පිළිබඳව ඉක්මනින් ක්‍රියා කරන්න කියලා. මම හිතනවා පස්සේ මට දැනගන්න ලැබුණා මොකද මේ අත්අඩංගුවට ගත්තයින් පස්සේ ඒ දවස් දෙකක් ඇතුළත අත්අඩංගුවට ගැනීම් සිදුවුණා සිදුවීමෙන් පස්සේ ඒ

FAIR COMMENT BY JEZEEM

සියළුම අය ඇවිල්ලා 2016 දී මගේ ආයතනය විසින් හඳුනාගත්ත 2016 නොවැම්බර් වෙන කොට හඳුනාගත්ත පුද්ගලයෝ තමයි 90% ක් ම ඒ අත්අඩංගුවට පත් වෙලා තිබුණේ.

ප්‍ර: ඔබ හමුදාපතිවරයා දැනුවත් කරා කිව්වනේ. ඒ කියන්නේ ජනරල් මහේෂ් සේනානායක?

උ: ඔබතුමා හරි. ඔව් ස්වාමිනි.

ප්‍ර: එතුමා දැන් කොහේද ඉන්නේ?

උ: මම දැනුවත්ව එතුමා ඉන්නේ විදේශීය රටක.

ප්‍ර: Location එක දන්නව ද කොහේද කියලා?

උ: මම හිතන්නේ මැද පෙරදිග රටක තමයි ඉන්නේ.

ප්‍ර: Contacts කරගන්න ක්‍රමයක් තියෙනව ද?

උ: මගෙත් එක්ක එහෙම සම්බන්ධයක් නැහැ ස්වාමිනි.

****

විවේකයෙන් පසුව නැවත කොමිෂන් සභාව රැස් වෙයි.
වේලාව: ප.ව.2.00
ප්‍රතිඥා දී නැවත කැඳවයි.

<u>ජොෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ ප්‍රකාශ කර සිටියා මෙම මාස 03 කට වගේ පෙර ඒ කියන්නේ 2019 අප්‍රේල් මාසේ 21 වැනි දිනට මාස 03 කට පමණ පෙර යම් බුද්ධි තොරතුරක් එකී ප්‍රහාරය ඒ කියන්නේ 21 වැනිදා වූ ප්‍රහාරය සම්බන්ධයෙන් විදේශ බුද්ධි ඒකකයක් විසින් ලබා දුන් බවක්?

උ: ස්වාමිනි මම දැන් ඒක Check කරා මං නිවැරදි කිරීමක් කළ යුතුයි. අපිට ලිඛිතව තියෙන්නේ reports දෙකයි. ඒ ඇවිල්ලා අප්‍රේල් 04 සහ අප්‍රේල් 05. ඒ ලිපි දෙකෙන් තමයි විශේෂයෙන්ම මේ ප්‍රහාරය පිළිබඳව අපිට දැනුම් දීමක් කරලා තියෙන්නේ. ඊට කලින් ලිඛිත දැනුම් දීමක් සිදු වෙලා නැහැ.

ප්‍ර: ඒ කියන්නේ මාස 03 කට ඔබ පෙර කී ලෙස 2019/04/21 වැනිදා සිදු වූ ප්‍රහාරයට මාස 03 කට පෙර ලිඛිතව එවැනි ප්‍රහාරයක් සිදු වෙන්න පුළුවන් කියන බුද්ධි තොරතුරක් විදේශ රටක බුද්ධි සේවාවක් මගින් රාජ්‍ය බුද්ධි සේවාව වෙත ලැබිලා නැහැ?

උ: ඔබ හරි. ඊට අමතරව පකිස්ථානය පිළිබඳව ඒ තොරතුරු පිළිබඳව නැවත වරක් මම විමර්ශනය කරා. ඒකේ දි මගේ ළඟ තිබෙන තොරතුරු අනුව documentations අනුව පකිස්ථානය ශ්‍රී ලංකා high Commissionකාර්යාලයට මේ සිදුවීමට සිදු වෙන්න මාස 06 කට කලින් ඒ කියන්නේ 2018 ඔක්තෝම්බර් මාසේ ලිපියක් භාර දිලා තියෙනවා

FAIR COMMENT — BY JEZEEM —

පකිස්ථානයේ බුද්ධි අංශය මගින් එහෙ ඉන්න පකිස්ථාන මහ කොමසාරිස් කාර්යාලයට. ඒ ලිපිය මම කියෙව්වා ඒ ලිපියේ පැහැදිලිව Attack එකක් පිළිබඳව කතා කරන්නේ නැහැ මේ සහරාන්ලා පිළිබඳව නමුත් ඒ ලිපියේ සඳහන් කරලා තියෙනවා ටෙලිග්‍රෑම් පවත්වන පුද්ගලයෝ දෙන්නෙක් විසින් ටෙලිග්‍රෑම් මාර්ගයෙන් Explosive සම්බන්ධයෙන් සහ ඒ Explosive හදන එක සම්බන්ධයෙන් යම් කිසි විමසිමක් සිදු කරලා තියෙනවා කියලා ඒ පුද්ගලයෝ දෙදෙනෙක් පිළිබඳව දැනුම්දීමක් සිදු කරලා තියෙනවා 2018 ඔක්තෝම්බර් 18. නමුත් මේ තොරතුරු SIS එකට ලැබිලා නැහැ. මේ තොරතුරු SIS එකට ලැබෙන්නේ නැවතත් සිදුවීම සිදුවෙලා මාස දෙකකට පස්සේ තමයි ශ්‍රී ලංකා පකිස්ථාන මෙහේ ලංකාවේ තියෙන මහ කොමසාරිස් කාර්යාලය විසින් SIS එකට භාර දෙන්නේ ඒ ලිපියේ කොටසක්. නමුත් ඒ ලිපිය මීට කලින් ඒ කියන්නේ ප්‍රහාරයට කලින් පකිස්ථාන බුද්ධි සේවාවක් මගින් SIS එකට භාර දීලා නැහැ. නමුත් එවැනි මං අර කලින් කියපු සිදුවීම් පිළිබඳව සම්බන්ධයෙන් ලිපියක් භාර දීලා තියෙනවා ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය පකිස්ථානයේ.

ප්‍ර: සාක්ෂිකරු දැන් ඔබ කියා සිටියා පකිස්ථානයෙන් ලැබූ බුද්ධි තොරතුරක් සම්බන්ධයෙන්. මේ බුද්ධි තොරතුර ශ්‍රී ලංකාවේ පකිස්ථානයේ තිබෙන මහ කොමසාරිස් කාර්යාලය වෙත ද ලබා දී තිබෙන්නේ?

උ: ඔබ හරි. 2018 ඔක්තෝම්බර් මස ඒ ලිපිය මගින් මම කියපු තොරතුර ලබා දිලා තියෙනවා ඒ පකිස්ථානයේ තිබෙන ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට.

ප්‍ර: මහ කොමසාරිස් කාර්යාලයට එම ලිපිය ලැබුණට පසුව මහ කොමසාරිස් කාර්යාලයෙන් ඒ සම්බන්ධයෙන් කුමක්ද අරන් තියෙන පියවර?

උ: මහ කොමසාරිස් කාර්යාලයෙන් ගත්ත පියවර පිළිබඳව මට අවබෝධයක් නැහැ ස්වාමිනි. නුමත් ඒකේ කොපියක් පසුව සිදුවීම සිදු වුණාට පසු මාස දෙකකට පසුව ඒකේ කොපි එකක් භාර දීලා තිබෙනවා රාජ්‍ය බුද්ධි සේවාවට.

ප්‍ර: කවුරු විසින් ද භාර දීලා තිබෙන්නේ?

උ: ඒ භාර දීලා තිබෙන්නේ ඇවිල්ලා ශ්‍රී ලංකාවේ තිබෙන පකිස්ථානු high Commission එකේ ඉන්න නිලධාරීයෙක් තමයි භාර දීලා තියෙන්නේ රාජ්‍ය බුද්ධි සේවාවට.

ප්‍ර: ඒ කියන්නේ පකිස්ථානයේ තිබෙණ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට හර දුන්නා යැයි කියන ලේඛනය මේ වන තෙක් රාජ්‍ය බුද්ධි සේවාව වෙත ලැබිලා නැද්ද?

උ: අපිට ලැබිලා තියෙන්නේ කොළඹින් භාර දුන් පිටපතක් පමණයි. ඒ සිදුවීමෙන් මාස දෙකකට පස්සේ.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: ඔබට හැකි වුණා ද බලන්නට දැන් පකිස්ථානයේ තිබෙන ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට දීපු දින වකවානු සහිත ලිපියක පිටපතක්ම ද ශ්‍රී ලංකාවේ තිබෙන පකිස්ථාන් තානාපතිතුමා විසින් ප්‍රහාරයෙන් පසුව ලංකාවේ ඔය SIS ආයතනයට දීලා තිබෙන්නේ කියලා?

උ: ස්වාමිනි ඇත්තටම මට උසාවියට ඉදිරිපත් කරන්න අපහසුයි මේකේ කරුණු තිබෙන නිසා දෙන්න එපා කියලා ඒ කියන්නේ මේකේ ඒ ගොල්ලොම ලියලා තියෙන නිසා නමුත් ඒ මට මේකේ ලිපිය බලන කොට මට තියෙනවා මේකේ Date එක දාලා තියෙන්නේ 10 th August 2018 කියලා. ඒ දවසේ තමයි භාර දීලා තියෙන්නේ.

****

<u>ජ්‍යෘෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: මෙම ඔබට කීමට හැකියාවක් තිබෙනව ද මෙහි කිසියම් පුද්ගලයෙකුගේ හෝ පුද්ගලයන්ගේ නම් සඳහන් වෙනවද එම නම් මොනවද කියලා ඔබට කීමට හැකියාවක් තිබෙනව ද?

උ: ඔව්, පුළුවන්. මෙහි එක පුද්ගලයෙකුගේ නමක් සඳහන් කරනවා. ඒ පුද්ගලයාගේ නම ඇවිල්ලා අලියාර් ජස්මීර් කියන පුද්ගලයෙක්.

ප්‍ර: ජස්මීර්?

උ: පස්මීර්. එරාවූර්වල පදිංචි පුද්ගලයෙක්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: අනෙක් පුද්ගලයා?

උ: අනිත් පුද්ගලයා ඇවිල්ලා මේකේ සඳහන් කරලා තිබෙනවා ඒ පුද්ගලයා අත් අඩංගුවට තාමත් පකිස්ථානයේ ඉන්නේ අත්අඩංගුවට පත් වෙලා ඒ පුද්ගලයාගේ නම මේකේ සඳහන් කරලා නැහැ. ඒකෙන් කියලා තියෙනවා ඒ රටේ ඉන්න පුද්ගලයෙක් මේ පුද්ගලයෙක් එක්ක සම්බන්ධවීමක් වුණා ටෙලිග්‍රෑම් පණිවිඩයක් මාර්ගයෙන් ඒ අනුව මේ මම කලින් සඳහන් කරපු පුද්ගලයා උත්සහා අරන් තියෙනවා මේ IED සම්බන්ධයෙන් weapon training සම්බන්ධයෙන් කොහොම ද මේවා කරන්නේ පිළිබඳව පරිශීලනය කරලා තියෙනවා Internet එකෙන් එම තොරතුරු තමයි මේ ලිපියෙන් සඳහන් වෙන්නේ.

ප්‍ර: ඔබ කියා සිටියේ පස්මිල් කියන පුද්ගලයා ශ්‍රී ලාංකිකයෙක් ද?

උ: ඒ පුද්ගලයා ශ්‍රී ලාංකිකයෙක්. එරාවුර් පදිංචි පුද්ගලයෙක්.

ප්‍ර: එම පුද්ගලයා සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව හෝ කිසියම් හෝ විමර්ශන ඒකකයක් විසින් විමර්ශනය සිදු කරලා තියෙනව ද?

උ: මම දැනුවත්ව මේ පුද්ගලයා දැනට ඉන්නේ UAE වල එතකොට අපි ඒ දවස්වල මගේ දැනුම අනුව මොහු ඉන්නේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ

FAIR COMMENT — BY JEZEEM —

ඒ පිළිබඳව පසුව Cheak කරලා තියෙනවා රටේ ඉන්නවා කියන එක. නමුත් අපිට මේ වෙනකන් මේ පුද්ගලයා මේ සිදුවීම් වලට සම්බන්ධතාවයක් තියෙනවා කියන එක අපිට අනාවරණය වෙලා නැහැ ස්වාමිනි. ඒ කියන්නේ මේ සහරාන් සම්බන්ධව කිසියම් හෝ සම්බන්ධයක් වුණා කියන එක අපිට සඳහන් වෙලා නැහැ.

ප්‍ර: හරි. සහරාන් නොමැතිව එම කණ්ඩායම නොමැතිව වෙනත් කණ්ඩායමක් හෝ පුද්ගලයෙකු වශයෙන් මෙම 2019/04/21 සිදු වූ ප්‍රහාරය වැනි ප්‍රහාරයක් සිදු කරගන්නට සුදානම් පුද්ගලයෙකු බවට අනාවරණය වෙලා තියෙනව ද?

උ: නැහැ එහෙම මුකුත්ම කියලා නැහැ. මේකේ කියලා තියෙන්නේ උත්සහා ගත්ත කියලා IED වගේ ඒවා හදන එකට manuals සහ උපදෙස් මෙයා Internet එක මාර්ගයෙන් ලබා ගන්න උත්සාහ ගත්තා කියන එක තමයි මේ තොරතුරේ තියෙන්නේ. ඉතිං ඒකයි ස්වාමීන් වහන්ස මම කිව්වේ මේක ලොකු වැදගත්කමක් වෙන්නේ නැහැ ඔය කියන විදියට මේ අපි කලින් දැනුම් දීමක් කරා කියන එකට.

ප්‍ර: දැන් ඔබ 2012 බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂක වශයෙන් පත් වුණාම මේ බුද්ධි කටයුතු සිද්ධ කළේ එහෙම නැත්නම් අභියෝගයක් වෙන්න පුළුවන් කාරණා 05 ක් හඳුනාගත් බව කියා සිටියා. ජාතික ආරක්ෂාවට අභියෝගයක් වෙන්න පුළුවන්?

උ: එසේමයි.

ප්‍ර: මෙම කාරණා 05 සම්බන්ධයෙන් ඔබ කියා සිටියා තොරතුරු සොයා බැලීම් සිදු කරා කියලා?

උ: ඔබ හරි.

ප්‍ර: දැන් ඔබ පෙර දිනයේ සාක්ෂි දෙන විට JMI කියන සංවිධානයක් සම්බන්ධයෙන් සාක්ෂි දෙන්නට යෙදුණා?

උ: ඔබ හරි.

ප්‍ර: මෙම JMI කියන සංවිධානය පිළිබඳ තොරතුරු බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයට ලැබෙන්නේ කුමන කාල වකවානුවේ ද?

උ: 2015 මුල් කාලයේ දී.

ප්‍ර: 2015 මුල් කාලයේ. එහි දී අනාවරණය වෙනව ද මේ JMI කියන සංවිධානය එහි සාමාජිකයන් කවුද ? සාමාජිකයෝ කී දෙනෙක් ඉන්නව ද? එහි නායකයා කවුද කියන්න අනාවරණය වෙනව ද?

උ: ඔබ හරි. ඒක 2015 දී

ප්‍ර: ඔව් 2015 දී

උ: 2015 දී අපි මුල් කාලයේ දී Identify කරනවා මේ JMI ජමෙයිතුල් මිලාති ඊබ්‍රාහීම් කියන සංවිධානය. පසු කාලීනව අපිට හැකියාව ලැබෙනවා බුද්ධි ක්‍රියාන්විතයක් හරහා මේකේ ඉන්න සියළුම සාමාජිකයන් පිළිබඳ විස්තර ලබා ගන්න. අපි ලබා ගන්න කොට අපි

FAIR COMMENT BY JEZEEM

අගෝස්තු මාසය වන කොට 2015 දී මේකේ සාමාජිකයින් 12 ක් සහ 15 ක් ක්‍රියාකාරීව සිටින බව අපි දැන ගන්නවා.

ප්‍ර: ඊළඟට ඔබ කියා සිටියා මේ JMI සංවිධානයේ ඒ ක්‍රියාකාරීන්ගේ සාමාජිකයන්ගේ අරමුණ වෙලා තිබුණේ කුමක්ද කියලා.අනාවරණය වුණා ද?

උ: ඔබ හරි.

ප්‍ර: මොකද්ද ඔවුන්ගේ අරමුණ වෙලා තිබුණේ?

උ: ඔවුන්ගේ අරමුණ එවකට තිබ්බේ ඇවිල්ලා ඒ ගොල්ලන් හිටියේ religious extremism කියන මතයේ ඒ කියන්නේ Violent extremism නෙවෙයි ආගමික අන්තවාදය කියන ඒ මතයේ හිටියේ. ඒ ගොල්ලන්ට අවශ්‍යතාවය තිබ්බේ ඇවිල්ලා ආගමික දැඩි මතධාරී පිලිවෙත් අනුගමනය කරමින් තම අරමුණ ඉටුකර ගැනීමට.

ප්‍ර: මොකද්ද ඒ අරමුණ?

උ: ඒ අරමුණ ඇවිල්ලා වෙනමම මුස්ලිම් අයවලුන්ට වෙනමම ප්‍රදේශයක් තිබිය යුතුයි කියන එක. මං ප්‍රදේශය කියලා හඳුන්වන්නේ කලාපයක්.

ප්‍ර: ඒ කියන්නේ Islamic state කියන එකද?

උ: ඒ ISIS කියන සංවිධානය 2014 දී ජූනි 27 අබුබක්කර් බලයට පත්වුණයින් පස්සේ ඒකේ නායකත්වය අරගෙන එයා ප්‍රකාශයක් නිකුත් කරා .

ප්‍ර: මා ඔබගෙන් අහන්නේ JMI සංවිධානයේ සාමාජිකයන්ගේ අරමුණ වෙලා තිබුණේ ඒ ISIS සංවිධානය විසින් සිරියාව සහ ඉරාකයේ සිදු කරනු ලබන යුධ මෙහෙයුම් සඳහා සහභාගී වීම ද නැත්නම් ලංකාව තුළ ඉස්ලාම් රාජ්‍යයක් පිහිටුවීම ද? 2015 මුල් කාලයේ ඔබට තොරතුරු එන කොට දැන ගන්න ලැබුණේ?

උ: මම උත්තරය ලබා දෙන්නේ 2014 දී කල ඉල්ලිම් අනුව. ඒ ඉල්ලිමෙ කොටස් දෙකක් තියෙනවා එක ඉල්ලීමක් තමයි පුළුවන් කට්ටිය ඇවිල්ලා කැලිෆට් කියන කලාපය බිහි කරන්න සිරියාවට ඇවිල්ලා සටන් කරන්න කියලා. ඒ අනුව එක කොටසක් යනවා සිරියාවට. 37 දෙනෙක්. ඊට පස්සේ ඉතුරු කට්ටියට ඒ ගොල්ලෝ කියනවා ඒ කියන්නේ කවුරු හරි ඉන්නවානම් ඔය ගොල්ලන් ඔය ගොල්ලෝ ඉන්න ප්‍රදේශ වල ඉඳන්ම මේ Ideologyඑකට ඒක achive කරන්න.

ප්‍ර: ISIS සංවිධානයේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා තමන් ඉන්න දේශයේම ඒ සම්බන්ධයෙන් ක්‍රියාකාරී වෙන්න කියලා?

උ: ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න කියලා.

ප්‍ර: දැන් මගේ ප්‍රශ්නය වුණේ JMI සංවිධානයේ අරමුණ මොවුන් පිළිබඳ ඉස්සෙල්ලාම අනාවරණය වුණාම ඔබලාට දැන ගන්න ලැබුණද ඔවුන් කුමන අරමුණක් සඳහා ද ඒ කියන්නේ ඔවුන් කුමන ඉලක්කයක් කරා යාම සඳහා ද ඔවුන් සංවිධානගත වෙලා ඉන්නේ කියලා?

FAIR COMMENT BY JEZEEM

උ: ඔව්. ඉතාමත්ම පැහැදිලිවම ඒ අරමුණ ඇවිල්ලා ISIS එකේ Political Ideology එක ඒ කියන්නේ extremist එ Ideology එකට ඒ කියන්නේ කැලිෆට් එකක් බිහි කිරීමට තමයි ඒ ගොල්ලන්ගේ ප්‍රධාන අරමුණ තිබ්බේ. කලාපියව.

ප්‍ර: ඒ කියන්නේ JMI එකේ ප්‍රධාන අරමුණ තිබ්බේ ISIS සංවිධානයේ කැලිෆට් එකට අනුව මෙම කලාපය තුළ ඒ කියන්නේ ශ්‍රී ලංකාව තිබෙන දකුණු ආසියාතික කලාපය තුළ ඉස්ලාම් රාජ්‍යයක් බිහි කිරීමද?

උ: ඔබ හරි.

ප්‍ර: දැන් ඔබ කියා සිටියා මොහොමඩ් නීලම් කියන පුද්ගලයා 2015 ජූලි මාසයේ දී පමණ සිරියාවේ දී මිය ගිය බව ඔබලාගේ බුද්ධි ඒකකයට වාර්තා වුණු බව?

උ: ඔබ හරි.

ප්‍ර: එහි දී ඔබ තවදුරටත් කියා සිටියා ඒ ලැබුණු තොරුතුරු වලට අනුව කරන ලද විමර්ශනයන්වලදී මෙම නිලම් ඇතුළු තවත් පුද්ගලයන් 37 දෙනෙකු සිරියාවට තුර්කිය හරහා ගොස් ඇති බව?

උ: ඔබ හරි.

ප්‍ර: ඔවුන් ඒ ISIS කියන සංවිධානයේ යුද්ධ කිරීමේ ඇතුළු එක් එක් ක්‍රියාකාරකම් සඳහා සහභාගි වෙලා තිබෙන බව ඔබ කියා සිටියා?

උ: ඔබ හරි.

ප්‍ර: ඔබ තව දුරටත් කියා සිටියා මෙම පුද්ගලයන් 37 දෙනා එසේ ISIS වෙනුවෙන් සටන් කිරීමට යන්නට යෙදුණේ අර 2014 වර්ෂයේ අබුබකර් අල් බග්දාදි විසින් මුස්ලිම් රාජ්‍යයක් පිහිටුවීම සඳහා කරන ලද ඇරයුමට අනුව කියලා?

උ: ඔබ හරි.

ප්‍ර: දැන් මෙම JMI සංවිධානයට අමතරව JMI කියන මෙම group එකට එහෙම නැත්නම් ඒ සංවිධානයට අමතරව ඒ 2015 දී අනාවරණය වුණා ද මේ ISIS මතවාදය අනුගමනය කිරීම හෝ ඒ මතවාදය වෙනුවෙන් බිහි වූ වෙනත් සංවිධාන තියෙනව ද කියලා?

උ: එවකට අපි JMI එක හඳුනගන්න කොට අපි දැක්කා විශේෂයෙන්ම සමාජ මාධ්‍යය හරහා අපි වෙනම ඒකකයක් තිබ්බා මේ සමාජ මාධ්‍යය Monitor කරන්න මං කලින් ප්‍රකාශ කරා 2013 අපි ඒක ආරම්භ කළේ. ඒක අනුව අපි දැක්කා යම් යම් කණ්ඩායම් ලෝකයේ ශ්‍රී ලාංකික තරුණයන් ඇතුළුව මේ මතවාදයට නැඹුරුවීමක් සහ ඒ මතවාදයත් එක්ක යම් යම් කණ්ඩායම් ගොඩනැගීමක්. ඒවා තවදුරටත් විමර්ශනය කිරීමේ දී අපිට දැන ගන්න ලැබුණා සමහරක් කොටස් ශ්‍රී ලාංකික තරුණ කොටස් 40 ක් විතර විවිධ තනි තනියෙන් හෝ ප්‍රකාශ නිකුත් කරන අතර තවත් සමහර පිරිසක් යම්කිසි සංවිධානාත්මකව මෙම ප්‍රකාශ නිකුත් කරන ආකාරයක් .

ප්‍ර: ඒ කියන්නේ ඔබ මෙම ප්‍රකාශ කියලා අදහස් කරන්නේ කුමක්ද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඒ කියන්නේ මේ ISIS මතවාදයට නැඹුරුව කරන ප්‍රකාශ. ඒ අනුව අපි identify කරා මේ ශ්‍රී ලංකිකයෝ එතකොට ඔක්කොම 150 ක් පමණ මේ groupවල හිටියා. මේ groups වල පුද්ගලයෝ 150 විතර හිටියා ඒ තරුණ පිරිස් හිටියේ. ඒ තරුණ පිරිස් අපි කොටස් කිහිපයකට වෙන් කරා. ඒ අනුව අපිට හැකියාව ලැබුණා ඒ අතරින් සංවිධානාත්මකවම ඉතාමත්ම දැඩිව ISIS මතවාදයත් එක්ක ඉන්න කණ්ඩායමක් හඳුනගන්න මේ 105 දෙනා අතරින් ඒ පිරිස 25 ක් 40 ක් වගේ ප්‍රමාණයක් වුණා.

ප්‍ර: ඒ වන විට එම සම්බන්ධිත පිරිස් වල කවුද ඒ පුද්ගලයන් කියලා නම් වශයෙන් හඳුනාගෙන තිබ්බ ද?

උ: විශේෂයෙන්ම එම සමාජ මාධ්‍යය හරහා අපිට හැකියාව ලැබුණා ඔක්කොම නෙවෙයි යම් පිරිස් හඳුනා ගන්න.

ප්‍ර: ඔබට මේ අවස්ථාවේ දී මතකයක් තියෙනව ද කවුද එම පුද්ගලයන්ගේ නම්?

උ: විශේෂයෙන්ම නම් වශයෙන් මට කියන්න අපහසු වුණත් විශේෂයෙන්ම ඒ පුද්ගලයන්ගේ මාර්ගයෙන් තමයි අපි ඔය JMI කියන සංවිධානය අපි හඳුනාගැනිමක් කරන්නේ.

ප්‍ර: දැන් ඔබ පෙර දිනයේ සාක්ෂි දෙන විට කියා සිටියා JMI සංවිධානයට ඔබලාගේ ඒජන්තවරයෙකු නියෝජිතයෙකු එම සංවිධානය තුළට ඇතළත් කරලා තොරතුරු ලබා ගත් බව?

උ: ඔබ හරි. ඒ ඇතුළත් කිරීම කළේ ඒක Sensitive Operation එකක්. සමහර දේවල් මට කියන්න පුළුවන් . අර සමාජ මාධ්‍යයත් එක්ක අපි මේ Open Sources media Cell එක ඇති කිරීම තුළින්,

ප්‍ර: Open Sources media Cell

උ: ඒක ඇති කිරීම තුළින් එතැනදි මම කිව්වා විශේෂයෙන්ම අරාබි කතා කරන කට්ටිය recruit කර අපි. විශේෂයෙන්ම මේකටම dedicated වගේ අපි Cell එක හැදුවේ.

වේලාව: ප.ව. 02.20
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දැන් වේලාව: ප.ව.2.20
පෙර සටහන් ල/ලේ: සචිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: අරාබි භාෂාව කතා කරන ?

පි: කතා කිරීමේ සහ ලිවීමේ සහ කියවීමේ හැකියාව තියෙන ශ්‍රී ලාංකිකයන්

ප්‍ර: ඔබලා විසින් යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ කටයුතු සඳහා ..

පි: විශේෂයෙන්ම ඔය Open Sources Media Cell එක යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයෙන් පිටත එක් ස්ථානයක් අපි තෝරගෙන ඒක සම්පූර්ණයෙන්ම Technology එක ලබා දීලා නිලධාරින් වෙනමම පුහුණු කරලා නිලධාරින් 25 දෙනෙක් පුහුණු කරලා ඒකට තමයි අපි ඔය අරාබි කතා කිරීමේ, ලිවීමේ සහ කියවීමේ හැකියාව අයවලුත් ඇතුළත් කරලා අපි සමාජ මාධ්‍ය තුළින් අපි උත්සහා ගත්තා මේගොල්ලන්ගේ Ideology එක හඳුනා ගන්න, ක්‍රියාකාරිත්වය හඳුනා ගන්න ඒ තුළින් ශ්‍රී ලාංකිකයෝ සම්බන්ධවීම් හඳුනා ගන්න, ඒ හඳුනා ගැනීම තුළින් අපිට හැකියාව ලැබුණා මූලිකවම මේ සමහර Groups වලට අපිට Infiltrate කිරීමේ හැකියාව ලැබුණා. ඒ පළවෙනි පියවර.

ප්‍ර: දැන් සාක්ෂිකරු මෙම JMI සංවිධානයට ඔබ කියා සිටියා ඔබේ ඒජන්තවරයෙකු ඇතුළත් වුණා. ඒ කියන්නේ තොරතුරු ලැබෙන්නට ගත්තා ඔබ වෙත?

පි: ඔව්. විශේෂයෙන්ම මම තව කරුණක් කියන්න ඕනි. සාමාන්‍යයෙන් දැන් මගේ අවුරුදු 32 ක විතර මගේ මේකෙ දී සාමාන්‍යයෙන් අපිට හැකියාව ලැබිලා තියෙන්නේ මුළු ජීවිත කාලයටම හොඳ Infiltrations කරන්න හම්බ වෙලා තියෙන්නේ 4ක් නැත්තම් 5ක්. LTTE සංවිධානයෙත් අපිට හැකියාව ලැබුණේ 2කට පමණයි. ඉතින් මේකත් ඉතාමත්ම විශේෂිතම Infiltration එකක්. අර මම කිව්වා වගේ Social Media එකෙන් අපි ඇතුළට රිංගලා එහෙම තමයි JMI එකට යන්නේ.

ප්‍ර: මගේ ප්‍රශ්නය වන්නේ එම Infiltration එක ඒ ඒජන්තවරයා JMI එක තුළට රිංගීම කිව්වොත් එය සිදු වුණ කාල වකවානුව ඔබට මතක ද?

පි: ඔව්. ඒක 2015 මැද

ප්‍ර: දැන් ඔබගේ ඒජන්තවරයා නියෝජිතයා එම JMI තුළ සිටින විට එම සංවිධානයේ ඉන්න සමාජිකයන් ගැනත් තොරතුරු ලැබුණාද ?

පි: ඊට වැඩිය ගොඩාක් දේවල් අපට ලැබුණා.

ප්‍ර: උදාහරණයක් වශයෙන් කිව්වොත් මොනවද ඒ ලැබුණු දේ?

පි: ඒ කියන්නේ ඒගොල්ලෝ කරන සියලුම ක්‍රියාවලියන් අපිට ලැබුණා. දැන් උදාහරණයක් වශයෙන් මෙම ගරු සභාවේ කවුරුහරි සාමාජිකයෙක් අපිට පුළුවන් නම් ඇතුළත් කරන්න ඒ සභාවේ වෙන සියලු සිදුවීම්, මම

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උදාහරණක් වශයෙන් කිව්වේ ඒ Infiltration එක ඇවිල්ලා එවැනි Infiltration එකක්.

ප්‍ර: ඒ කියන්නේ ඉහළ තලයේ ..

පි: දැන් මේ කණ්ඩායමේ හිටියේ 25ක් 15ක් අතර ප්‍රමාණයක්. ඒ එක්කෙනෙක් වෙන්න බවට පත් වුණා.

ප්‍ර: දැන් මේ JMI සංවිධානයේ ඔබගේ සාක්ෂිය සහ එහි ගලාගෙන යනතාවය පහසු කරන්න මම මේ ප්‍රශ්නය අහන්නේ. ඔය 2015 මැද භාගයේ දී පමණ ඔබගේ ඒජන්තවරයා ඇතුළත් කරන්න යෙදුණු එම JMI සංවිධානයේ සාමාජියෙකු හෝ සාමාජිකයන් කිහිප දෙනෙකු හෝ 2019.04.21 සිදු වූ බෝම්බ ප්‍රහාරයේ දී මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු ලෙස කටයුතු කරාද?

පි: එතන වුණේ ඒ Group එකේ

ප්‍ර: නැහැ නැහැ මම අහන්නේ

පි: ඒ Group ඒකේ එක්කෙනෙක් මැරුණා ද කියන එක මට හරියට මතකයක් නැහැ. ජමීල් එතන හිටියා.

ප්‍ර: දැන් මෙම සංවිධානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මේ ලැබෙන තොරතුරු අනුව 2015 වර්ෂයේ දී බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඒ ගැන හැදෑරීමක් සහ විශ්ලේෂණයක් සිදු කරාද?

පි: ඔබ හරි.

ප්‍ර: එහි දී එම විශ්ලේෂණයේ දී අධ්‍යක්ෂක යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් ඔබ පැමිණි නිගමනය කුමක් ද?

පි: දැන් මෙතන දී මම හිතන්නේ වුටි පැහැදීමක් කළ යුතුයි. විශේෂයෙන්ම දැන් මේ සංවිධානය ආරම්භයේ දී ඒ Ideology එකට තමයි අපි ඇතුළත් වුණේ. ඒ Ideology එක ඇතුළත් වුණාම ඒගොල්ලෝ යම් යම් ක්‍රියාකාරි කටයුතු වල නිරත වුණා.

ප්‍ර: මොකක්ද Ideology එක?

පි: JMI එක. ISIS එකේ ඔය කැලිෆට් එක බිහි කරන්න ඕනි කියන එක.

ප්‍ර: ඒ කියන්නේ JMI එකේ පරමාර්ථය වෙලා තියෙන්නේ ISIS සංවිධානයේ කැලිෆට් එකේ?

පි: මුස්ලිම් කලාපයක් ලෝකයේ ඇති කළ යුතු යි කියන සංකල්පය. එතකොට මේ සංකල්පය තුළ මේ සංකල්පය අලුතෙන්ම ආපු සංකල්පයක් නෙවෙයි. මම කියන්න ඕනි මීට කළින් JI කියලා සංවිධානයක් ගැන මම කිව්වා. ජමාතේ ඉස්ලාමී. ජමාත් ඉස්ලාමී එකෙත් සංකල්පය ඒකම තමයි. නැත්තම් අපි මේක විශේෂයක් දැක්වුවොත් ඇයි ඒක ප්‍රශ්නයක් එනවානේ. ඒක ඒගොල්ලන්ගේ JI එකේ ඇවිල්ලාත් ඒකත් ඒගොල්ලන්ගේ සංකල්පය. ඒගොල්ලන්ගේ පුත්තු සහ

FAIR COMMENT BY JEZEEM

ඒගොල්ලන්ගෙන් ආභාෂය ලබා ගත්ත අය තමයි වැඩි දෙනෙක් JMI එකේ සාමාජිකයෝ වුණේ.

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියා සිටින්නේ ජමාතේ ඉස්ලාම් කියන සංවිධානයේ අරමුණ වුණෙත් ඉස්ලාමිය රාජ්‍යයක් බිහි කරන්න?

පි: හැබැයි ඒක ඇවිල්ලා Violent විදිහට නෙවෙයි දැන් ඊශ්‍රායලය බිහි කරා වගේම ඒගොල්ලන්ගේ ඒ දවස්වලම 1934 ඉන්දියාවේ ආරම්භ වෙලා ලංකාවට 1954ට ඇවිල්ලා ඒගොල්ලන්ගේ අවශ්‍යතාවය තිබ්බේ ඒගොල්ලන් කියන්නේ මුස්ලිම් කලාපයක් බිහි කරන්න නම්, කැලිෆට් එක උගතුන් ඉන්න ඕනි. ඒකට උගත්තු හැටියට ඒගොල්ලෝ පුහුණු වීම් විශේෂයෙන්ම කරලා හැම වෘත්තියකටම නායකත්වයක් දීලා ඒ විදිහේ සංකල්පයක් තමයි ඔය JI එකෙන් බිහි කළේ. හැබැයි ඒක long term. ඒක දීර්ඝ කාලීනව Violent එකක් යන්නේ නැතුව කරන ක්‍රියාවලියක කොටසක් තමා ඒගොල්ලෝ හිටියේ. නමුත් ඒගොල්ලන්ගේ ආභාෂය ලබා ගත්ත

ප්‍ර: ඒ කියන්නේ JI එකේ ඔබ කියන්නේ ජමාතේ ඉස්ලාම් කියන මුස්ලිම් ඒකකයේ අරමුණත් ඇවිල්ලා ඉස්ලාම් රාජ්‍යයක් ලංකාවේ බිහි කිරීම?

පි: ලංකාවේ කියන්නේ කලාපීය, කැලිෆට් එකක්.

ප්‍ර: එසේ කරන්නේ හිංසාකාරී ක්‍රමයක් අනුගමනය කරලා නෙවෙයි දීර්ඝ කාලීනව සැලසුම් කරලා ඒ අනුව තමයි ඔවුන් ක්‍රියාත්මක වීමේ අරමුණ වුණේ?

පි: ඔබ හරි. ඒ කියන්නේ ඒ ආරම්භය හේතු වුණෙත් ඇවිල්ලා ඊශ්‍රායලයත් එක්ක ඒ ඊශ්‍රායලය කොහොමද බිහි වෙන්න ඊශ්‍රායලය කටයුතු කළේ කියන සංකල්පයම ඒ කියනේ මොළය හැම දෙයක්ම Use කරපු වගේම ඒගොල්ලෝ ඒගොල්ලන්ට විශ්වාසයක් තිබුණා මුස්ලිම්වරු හැටියට උගතුන් බිහි කරලා ඒ උගතුන් අතරේ ඒ කලාපීය කැලිෆට් එක බිහි කරන්න. නමුත් ඒක දීර්ඝ කාලිනයි. නමුත් ඒගොල්ලන්ගේ ළමයි ඒක තමයි ISIS එක බිහි වුණාම ඒගොල්ලෝ ඒකම තමයි තව ටිකක් කරලා මේක මේ විදිහට වෙන්න බැහැ. මේ විදිහට මේක වේගවත් වෙන්න ඕනි.

ප්‍ර: ඒ කියන්නේ JI කියන සංවිධානය නැත්තම් ඒගොල්ලන්ගේ අවිහිංසාවාදී ක්‍රියා පිළිවෙත අනුගමනය කරන්න බැහැ. එය ඔවුන් කැමැති ඔවුන්ට අවශ්‍ය වුණේ මෙම කලාපය තුළ ඉස්ලාම් රාජ්‍යයක් ඇති කිරීම එය වේගවත් කිරීම?

පි: එය වේගවත් කිරීම තමයි ISIS එකේ Ideology එක තිබ්බේ. එතකොට ඒ Ideology එක අනුව ඒගොල්ලෝ වේගවත් වෙන්න නම් අනිවාර්යයෙන්ම පිරිසක් ඒ අනුව යොදා ගත්ත ක්‍රමවේදය තමයි කොටසක් ඇවිල්ලා කෙලින්ම සටන් කරන්න කියලා සිරියාවත් එක්ක මේ කැලිෆට් එක බිහි කරන්න. අනික් කට්ටිය ඒ මතවාදයත් එක්ක පුළුවන් විදිහට තමන්ගේ කටයුතු කරන්න කියන එක තමයි අබුබක්කර්

FAIR COMMENT BY JEZEEM

කිව්වේ. එතකොට මේ JMI එක එක පාරටම බිහි වෙච්ච සංවිධානයක් නෙවේ. JMI එකේ පුද්ගලයන්ගේ Background එක බැලුවාම JMI එකේ පුද්ගලයෙක් වැඩි පිරිසක් එන්නේ JI, ජමාතේ ඉස්ලාමීය ආහාෂයත් එක්ක. සමහර අය ඇවිල්ලා ඒ නායකයන්ගේ දැන් අපි ගත්ත සමහර නායකයන්ගේ පුත්තු තමයි JMI එකට join වෙන්නේ.

ප්‍ර: ඔබට උදාහරණයක් වශයෙන් ලබා දෙන්න පුළුවන්ද?

පි: දැන් අර මේ ප්‍රහාරයේ දී මාවනැල්ල මේකේ දී ඊබ්‍රහීම් මවුලවි කියලා පුද්ගලයෙක් අත්අඩංගුවට, දැන් ඊබ්‍රහීම් මවුලවි ඇවිල්ලා JI එකේ නායකයෙක්. එතකොට එයාගේ අයියා හරි එයාගේ මාමා තමයි ඇවිල්ලා එවකට හිටපු JI ඒකේ නායකයා.

ප්‍ර: ඔහුගේ සහෝදරයා තමයි JI එකේ නායකයා?

පි: JI එකේ නායකයා. එතකොට ඒගොල්ලන්ගේ ළමයි ටික තමයි මේකට යොමු වෙන්නේ.

ප්‍ර: බුදු පිළිම කැඩීමට ද?

පි: කට්ටියක් බුදු පිළිම කැඩීමට යොමු වෙන ගමන්ම, මම අර කියන්නේ JI කියන්නේ ලොකු සංවිධානයනේ. දැන් අනික ඊබ්‍රහීම් ගත්තාම ඊබ්‍රහීම් කියන්නේ කොළඹ spices එයාගේ පුත්තු දෙන්නාම සම්බන්ධ වෙනවානේ ෂැන්ග්‍රි ලා හෝටලයයි මේකේ දී. ඒ ළමයි දෙන්නාත් ..

ප්‍ර: ෂැන්ග්‍රි ලා හෝටලය සහ සිනමන් ග්‍රෑන්ඩ්?

පි: ඔව්. එතකොට ඒ දෙන්නාගේ තාත්තාත් ඊබ්‍රහීම්නේ. ඒ ඊබ්‍රහීමුත් ඇවිල්ලා JI සාමාජිකයෙක්. එතකොට මම මේක කියන්න උත්සාහ ගන්නේ මේ දැන් අපි JMI එකට අපි අභ්‍යන්තරයට යනකොට මේ කැලිෆට් කියන එක අපට අලුත් දෙයක් නෙවේ. නමුත් අපිට අවශ්‍යතාවය තිබුණේ මේ කැලිෆට් එක කොහොමද ක්‍රියාත්මක වෙන්නේ, කොහොමද සැලසුම් කවුද මේකට ඉන්න සාමාජිකයෝ කියන එක. එතකොට ඒ අනුව මේගොල්ලෝ ඒ අවස්ථාවේ දී කිසිම විදිහකට Extreme Line එකට ගිහිල්ලා තිබුණේ නැහැ. Violent Extremism එකට ගිහිල්ලා තිබුණේ නැහැ.

ප්‍ර: ඒ කියන්නේ ඔවුන් හිංසාකාරී අන්තවාදයට ගිහිල්ලා හිටියේ නැහැ?

පි: තරයේ හිංසා අන්තවාදය ප්‍රතික්ෂේප කරා JMI එක.

ප්‍ර: JMI එක එක තරයේ හිංසාවාදී අන්තවාදය ප්‍රතික්ෂේප කරා?

පි: ප්‍රතික්ෂේප කරා.

ප්‍ර: නමුත් ඔවුන් අන්තවාදය ඔබ..

පි: ආගමික අන්තවාදය තිබ්බා.

ප්‍ර: ඔහු JMI එක තුළ ආගමික අන්තවාදය තිබ්බා. නමුත් හිංසාකාරී අන්තවාදය දක්වා එය දියුණු වෙලා තිබුණේ නැහැ කියන එකද කියන්නේ?

FAIR COMMENT
BY JEZEEM

පි: ඒ අවස්ථාවේ දී ඒගොල්ලෝ ඒක ප්‍රතික්ෂේප කරා කෙළින්ම. ඒ කියන්නේ අවස්ථාව අනුව අපි Suicide කරන්න ඕනි. අපි මෙහෙම කරන්න ඕනි කියන පැත්තකට ගියේ නැහැ. ඒගොල්ලන්ට ඕනි කරලා තිබුණේ සාමාජිකත්වය වර්ධනය කිරීම සහ මේක පිළිබඳව මේ මිනිස්සු පිළිබඳව මිනිස්සුන්ට ලොකු අවබෝධයක් දෙන්න මෙහෙම මීනි මරනවා, මෙහෙම කරනවා, මුස්ලිම් මුස්ලිම් එකතු කරන්න ඕනි ඒ ආදි වශයෙන් ඒගොල්ලන්ට කරන්න පුළුවන් ප්‍රමාණය තමා ඒගොල්ලෝ කරේ. හැබැයි පසු කාලීනව තමයි ඔය JMI එක ඒ කියන්නේ 2016න් පස්සේ 2017 වෙනකොට ඔය මතවාදය කොටස් 2කට කැඩෙනවා. ඒ එක කොටසක් ඊට පස්සේ ගිහිල්ලා සහරාන් එක්ක සම්බන්ධ වීමක් වෙනවා. ඉතින්..

ප්‍ර: JI කියලා ඔබ හඳුන්වන්නේ ජමාතේ ඉස්ලාම් කියන ..?

පි: 1954 ඉඳන් එන පැවතෙන සංවිධානයක්.

ප්‍ර: JMI ලෙස ඔබ මෙම ගරු කොමිෂන් සභාවට පැවසුයේ ජමාතුල් මිලාතේ ඊබ්‍රහීම් ෆ්‍රී සෙයිලානි ..?

පි: සෙයිලානි කියන සංවිධානය 2015 ඇති වෙච්ච සංවිධානයක්.

ප්‍ර: දැන් ඔබ 2015 දී මෙම JMI සංවිධානය සහ වෙනත් කණ්ඩායම් සහ පුද්ගලයන් පුද්ගලිකව මේ කැලෑට් එකක් යටතේ ඉස්ලාමීය රාජ්‍යයක් බිහි කිරීම සඳහා කටයුතු කරනකොට ඒ කියන්නේ ලංකාවත් ඇතුළත්ව යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ ප්‍රධානියා හැටියට ඔබ කුමක් ද එමඟින් අවබෝධ කර ගත්තේ?

පි: මම අවබෝධ කර ගත්ත දේ තමයි මේක සම්පූර්ණයෙන්ම විදේශිය රටක බලපෑමක් එක්ක Influence එකත් එක්ක LTTE වගේ සංවිධානයක් නෙවේ. මේක සම්පූර්ණයෙන්ම වෙනත් අතකට යොමු වෙන විශේෂයෙන්ම Religious Extremism එකෙන් Violent Extremism එකට යන සංවිධානයක් හෝ ඒ අවශ්‍ය කරන පසුබිම තමයි සැකසෙන්නේ කියන එක ඉතාමත් පැහැදිලිව අවබෝධ කර ගත්තා.

ප්‍ර: දැන් JMI කියන සංවිධානය ඔබ කියන්නේ ආගමික අන්තවාදී සංවිධානයක්?

පි: ඔබ හරි.

ප්‍ර: ඊට පස්සේ ඔබගේ නිරීක්ෂණය වුණේ මෙම ආගමික අන්තවාදය පසුව හිංසාකාරී අන්තවාදය දක්වා වර්ධනය වෙන්න පුළුවන් කියන එකද?

පි: වර්ධනය වෙන්න පුළුවන් නෙමේ අනිවාර්යයෙන්ම වර්ධනය වන බව.

ප්‍ර: අනිවාර්යයෙන්ම වර්ධනය වන බව තමයි ඔබට අවබෝධ වුණේ?

පි: ඔබ හරි.

ප්‍ර: එසේ හිංසාකාරී අන්තවාදයට Violent Extremism මෙම සංවිධානයක් වර්ධනය වුවහොත් එහෙම නැත්නම් සංවිධානයක් බිහි වුණොත් එමඟින් ජාතික ආරක්ෂාවට යම් බලපෑමක් වෙනවාද නැද්ද?

FAIR COMMENT BY JEZEEM

පි: අනිවාර්යයෙන්ම ලොකු බලපෑමක් වෙනවා.

ප්‍ර: එසේනම් සාක්ෂිකරු මෙම JMI සංවිධානය එහෙම නැත්නම් ආගමික මූලධර්මවාදය සහ හිංසාකාරී ආගමික මූලධර්මවාදය සම්බන්ධයෙන් ඔබ අධ්‍යක්ෂක යුධ හමුදා බුද්ධි වශයෙන් යුධ හමුදාපතිවරයාට ඒ සම්බන්ධයෙන් දැනුම් දීමක් කළාද?

පි: ඔබ හරි. ඒක දැන් අර අපි මුල ඉඳන්ම Social Media එකෙන් ඇවිල්ලා JMI එක එක පැත්තකින් ඒ Development ටිකත්, අනිත් පැත්තෙන් ISIS සංවිධානයේ 37 දෙනෙක් සිරියාවට ගිහිල්ලා කරන ක්‍රියාකාරකම් පිළිබඳවත් කණ්ඩායම් 2ක් වශයෙන් ඔවුන් පිළිබඳව සම්පූර්ණයෙන්ම අවබෝධ කරගෙන ඔවුන්ගේ පෞද්ගලික තොරතුරු, ඔවුන්ගේ පින්තූරු, ඒ එක්කම ඔවුන්ගේ ක්‍රියා කලාප පිළිබඳව ඒ අවබෝධ කරගෙන ඉන්පසු එම තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශයට ඊට අමතරව ආරක්ෂක මණ්ඩලයේ Meetings වලට ඊටත් අමතරව අපි විදේශීය රටවල් එක්ක අපි කටයුතු කරා. ඒ කටයුතු කිරීමේ දී අපි එම තොරතුරු ඔවුන්ටත් ලබා දීම් කරා. මොකද ඔවුන් සමාජ ජාලා එක්ක දැඩිව සම්බන්ධව තිබුණ නිසා.

ප්‍ර: දැන් හරි ඔබ යුධ හමුදාපතිතුමාට දැන්වූවාද?

පි: ඔව් යුධ හමුදාපතිතුමාට දැනුම් දීමක් කළා.

ප්‍ර: ඊට අමතරව ඔබ පෙර දිනයේ මෙම ගරු කොමිෂන් සභාවේ සාක්ෂි දෙමින් කියා සිටියා ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමේ දීත් ආරක්ෂක මණ්ඩලයේ දීත් මෙම කරුණු ඉදිරිපත් කළ බව?

පි: ඔබ හරි.

ප්‍ර: මෙම ඉදිරිපත් කිරීම එනම් JMI සංවිධානය සහ ලංකාව තුළ හිංසකාරී ආගමික අන්තවාදයක් ඇති වෙන්න පුළුවන් කියන කාරණාව සම්බන්ධයෙන් ඔබ එක් අවස්ථාවක දී පමණද Security Council ආරක්ෂක මණ්ඩලයට කරුණු දැක්වුයේ?

පි: එක් වරක් පමණක් නෙවෙයි. මොකද ඒ හැම වාර ගණනක දීම මොකද අපේ Subject එක ඇවිල්ලා කොටස් 7ක..දෙකටම මේ පිළිබඳව ඒ එන Development අනුව දැනුම් දීම් සිදු කරා.

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ දන්නවා මා ඔබට යෝජනා කළොත් 2015 ජනවාරි මාසේ 8 වෙනිදායින් පසුව ලංකාවේ සේනාධි නායකයා වශයෙන් ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පත්වුණා?

පි: ඔබ හරි.

ප්‍ර: දැන් ඔබ පෙර දිනයේ සාක්ෂි දෙමින් කියා සිටියා මෙම හිංසාකාරී ආගමික අන්තවාදය ගැන ඔබ කරුණු ඉදිරිපත් කිරීමේ දී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනත් එවකට අගමැති තුමා මම නම යෝජනා කළොත් රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් සහ අනිකුත් නිලධාරීන් සහභාගී වුණ බව?

පි: ඔබ හරි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ අද දිනයේ මෙම ගරු කොමිෂන් සභාවේ සාක්ෂි දෙනකොට කියා සිටියා මෙම ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමට මෙම තොරතුරු ඉදිරිපත් කරාම ඒ සම්බන්ධයෙන් ගතයුතු උපක්‍රමශීලීව ගත යුතු පියවර සම්බන්ධයෙන් එම රැස්වීමේ දී සාකච්ඡා වෙන බව?

පි: ඔබ හරි.

ප්‍ර: එහිදී ආරක්ෂක ලේකම්වරයා විසින් ඒ ගත යුතු පියවර සම්බන්ධයෙන් ඔබ සහ ඒ කියන්නේ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය සහ එයට සහභාගී වන අනිකුත් සාමාජිකයන් සහ නිලධාරීන් දැනුවත් කරලා කළ යුතු ක්‍රියාමාර්ගයන් දන්වන බව?

පි: ඔබ හරි.

ප්‍ර: 2015 වර්ෂයේ දී ඔබ මෙම හිංසාකාරී ආගමික මූලධර්මවාදය ගැන ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමට දැනුම් දුන්නායින් පසුව ඒ සම්බන්ධයෙන් ගතයුතු උපක්‍රමයන් නැත්නම් ගත යුතු උපක්‍රමයන් මොනවාද යන්න එවකට සිටි ආරක්ෂක ලේකම්වරයා විසින් ඔබ වෙත හෝ ඔබ සහ එම රැස්වීමට සහභාගී වූ අනිකුත් ඉහළ නිලධාරීන් වෙත දැනුම් දුන්නාද නැද්ද?

පි: බොහෝ විට මේක ඒ ආරක්ෂක අමාත්‍යාංශයෙත්, ජනාධිපති ලේකම් කාර්යාලයෙත් මේ තියෙන Discussions වල දී මේවා අපි Power Point එකෙන් ඉදිරිපත් කරන්නේ. ඊට අමතරව අපි ලිඛිත ඉදිරිපත් කිරීම් කරලා තියෙනවා. නමුත් ඒවා වලදී ගොඩාක් දුරට කිසිම අවස්ථාවක දී හරි තීරණ ගත්තේ නැහැ.

ප්‍ර: මා එකින් එක යමු පහසුව සඳහා. ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමේදී ඔබ මෙම කරුණු ඉදිරිපත් කරාම ඒ සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි පියවරවල් සම්බන්ධයෙන් උපදෙස් ලැබීමක් ලැබුණාද ආරක්ෂක ලේකම්ගෙන් එවකට?

පි: නැහැ. විශේෂයෙන්ම එතන දී මම දැකපු දේ තමයි එතන දී තීරණ ගැනීමක් සිදු වුණේ නැහැ. එතකොට හැම තිස්සේම ඒ වගේදී අපි ඕක දාමු Council එකට කියලා තමා කියන්නේ.

ප්‍ර: කවුද එහෙම කියන්නේ?

පි: ගොඩාක් වෙලාවට අපි තීරණ ගන්නේ නැතුව එතන ගිහිල්ලා හිර වුණාම ආරක්ෂක ලේකම් පවසනවා අපි මේක Council එකේ කතා කරන්න කියලා.

ප්‍ර: එවකට ආරක්ෂක ලේකම් වශයෙන් හිටියේ කරුණාසේන හෙට්ටිආරච්චි මහත්මයාද?

පි: මුල් කාලයේ Mr. බස්නායකත් පසුව කරුණාසේන හෙට්ටිආරච්චි මහත්මයාත් හිටියා.

ප්‍ර: මම ඔබට යෝජනා කරනවා 2015 ජනවාරි 11 වෙනිදා ඉඳලා 2015 සැප්තැම්බර් මස 8 වෙනිදා දක්වා ආරක්ෂක ලේකම් වශයෙන් සිටියේ

FAIR COMMENT BY JEZEEM

B.M.U.D බස්නායක මහතාත් 2015 සැප්තැම්බර් මස 9 වෙනිදා ඉඳලා 2017 ජූලි මස 5 වෙනිදා දක්වා ආරක්ෂක ලේකම් වශයෙන් සිටියේ කරුණාසේන හෙට්ටිආරච්චි මහතාත් බව?

පි: ඔබ හරි.

ප්‍ර: ඔබ මෙම JMI සහ මෙම හිංසාකාරී ආගමික මූලධර්වාදයට අදාළ කරුණු ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමේ දී ඉදිරිපත් කරන විට ආරක්ෂක ලේකම් වශයෙන් හිටියේ මේ දෙදෙනාගෙන් කවුද?

පි: දෙදෙනාම හිටියා. මොකද මේ Development පටන් ගන්නේ සාමාන්‍යයෙන් අපි දැන ගන්නේ අප්‍රේල් මාසේ. අප්‍රේල් මාසේ ඉඳන් දිගටම මේ Development අපි ඉදිරිපත් කිරීමක් කරා.

ප්‍ර: ඒ කියන්නේ ඔබ සතිපතාම මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරාද නැත්නම් කොහොමද ඒක ඉදිරිපත් කළේ කියලා ඔබට මතකයක් තියෙනවාද?

පි: බොහෝ දුරට අපි ඉදිරිපත් කිරීම මං කිව්වේ කොටස් 5කින් ඉදිරිපත් වෙන්නේ. මම අර කියපු මාතෘකා යටතේ. එතකොට ඒ මාතෘකා යටතේ දී මේ පිළිබඳව ඒ සතිපතා රැස්වීම්වල දී නිතිපතා අපි ඒ Development ඉදිරිපත් කරන අතරම මාසයකට සැරයක් විදිහට ඒක සම්පූර්ණ Summary එකක් හැටියට අපි ඉදිරිපත් කිරීම් කරා.

ප්‍ර: දැන් ඔබ කිව්වා කොටස් 5කින් ඉදිරිපත් කරන්නේ කියලා?

පි: ඔබ හරි.

ප්‍ර: ඒ කියන්නේ එම කොටස් 5ඔබ අර පෙර සඳහන් කළ ත්‍රස්තවාදයක් නැවත ශ්‍රී ලංකාව තුළ ඇතිවීම, අංක 2 වශයෙන් ආගමික අන්තවාදය සහ සංවිධානාත්මක අපරාධ වශයෙන් කොටස් 5ක් ඔබ දැක්වුවා?

පි: ඔව්.

ප්‍ර: ඒ 5ට අනුකූලව ද ..

පි: මම හැම තිස්සේම Brief එක දෙන්නේ ඒ 5ට අනුකූලව සමහර විට එක.. අපි ගමුකෝ සයිබර් එකට ඒ සතියේ මොකුත් තිබ්බේ නැත්නම් ඒ සම්බන්ධයෙන් මං ප්‍රකාශයක් කරන්නේ නැහැ. එහෙම නැත්නම් හැම සතියේම වෙන Development ඔය මාතෘකා යටතේ අපි Brief කරනවා.

ප්‍ර: ඔබ පෙර දිනයේ සාක්ෂි දෙමින් කියා සිටියා මෙම කරුණු ගැන 2015 දෙසැම්බර් මාසයේ දී පමණ Security Council එක දැනුවත් කරා කියලා?

පි: ඔබ හරි.

ප්‍ර: ඔබ කියා සිටියා අනිවාර්යයෙන්ම Security Council එකක් පැවැත්වීමේදී ජනාධිපති තුමා සහභාගී වෙනවා කියලා?

පි: අනිවාර්යයෙන්ම.

ප්‍ර: දැන් Security Council එකට JMI සහ හිංසාකාරී ආගමික මූලධර්මවාදය ගැන කරුණු ඉදිරිපත් කිරීමේ දී ඔබ විසින් අධ්‍යක්ෂක බුද්ධි යුධ හමුදාව වශයෙන් ඔබ ඉදිරිපත් කෙරුවේ ඒ ලැබිලා තියෙන තොරතුරුද ඒ

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කියන්නේ ලැබිලා තියෙන බුද්ධිමය තොරතුරු ආරක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරාද එහෙම නැත්නම් ලැබිලා තිබුණු තොරතුරු, එමඟින් විය හැකි එම තොරතුරු අනුව ලංකාව තුළ විය හැකි දේ ලෝකයේ වර්තමාන ප්‍රවණතා සහ එය වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ඇතුළත් විස්තරාත්මක වාර්තාවක් ද ඉදිරිපත් කළේ?

පි: අපි ඇත්තටම ඒ Coordinating Meeting එකයි. ඒ එක්කම ජනාධිපති ලේකම් කාර්යාලයේ තියෙන එක ගැනයි තොරතුරු ගැන අපි සාකච්ඡා කරන්නේ නැහැ. හැම දෙයක්ම විශ්ලේෂණ. විශ්ලේෂණ ඉදිරිපත් කිරීමේ දී විශේෂයෙන්ම ඒ තොරතුරු මොනවද, ඒ තොරතුරු වලින් එන Threat එක මොකක්ද, ඒ Threat එකෙන් වෙන්න පුළුවන් Impact එක මොනවද, ඒ Impact එක වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව තියෙන මූලික මේකත් එක්ක තමයි අපි ඉදිරිපත් කරන්නේ.

ප්‍ර: නැවත කරුණාකර ඒ පිළිතුර සඳහන් කරන්න.

පි: විශේෂයෙන්ම ඒ අදාළ සතියට තිබ්බ තොරතුරු සහ ඒ තොරතුරු විශ්ලේෂණය කරලා ඒ තොරතුරු වලින් වෙන්න පුළුවන් Impact එක රටට වෙන්න පුළුවන් හානිය. ඊට පස්සේ ඒ හානිය වළක්වා ගැනීමට අපිට ගත හැකි ක්‍රියාමාර්ග

ප්‍ර: අපට කියන්නේ මේ අවස්ථාවේ දී ..?

පි: එතන දී අපි බලන්නේ බුද්ධි ආයතනයක් නෙවේ. රටක් හැටියට මොනවද ගත යුතු ක්‍රියාවලිය මොකක්ද කියන එක. එතකොට ඒ තීරණ ගැනීම ඇවිල්ලා ජනාධිපතිතුමා හා ආරක්ෂක මණ්ඩලය සතු වගකීමක්. අපේ වගකීම තමයි ඇවිල්ලා ඒක ඉදිරිපත් කරලා ඒකේ Threat එක කොච්චර ද කියලා පැහැදිලි කරලා දීලා..

ප්‍ර: Threat එක කොතනද?

පි: Impact එක.

ප්‍ර: ඒ තර්ජනයේ තියෙන බරපතල භාවය ඒ කියන්නේ Gravity එක සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලය දැනුවත් කරනවා ද ඒ අවස්ථාවේ ?

පි: ඔබ හරි. දැන් එතකොට අපි මේ කතා කරන්නේ 2015 වසරේ. 2015 වසර ගැන කතා කරන්නේ. සහරාන්ගේ සිදුවීම සිදු වෙන්නේ 2017න් පස්සේ තමයි සහරාන් ඇත්තටම Active වලට එන්නේ. එතකොට මේක ඇවිල්ලා Process එකක්. ඇත්තටම 2015 දී අපි දැක්කා කොහොමද Suicide Cadresලා ලංකාවේ නැති වුණත්..

ප්‍ර: ඉන් අනතුරුව ඔබ කියා සිටියා මෙම ඉදිරිපත් කිරීම් සිදු කරලා ඒ සම්බන්ධයෙන් පොතක් හදලා ඒ පොත ආරක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ බව?

පි: ඔබ හරි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: පෙර දිනයේ දී ඔබ මේ ගරු කොමිෂන් සභාවට C – 268 ලෙස ඉදිරිපත් කරන්නට යෙදුණේ ආරක්ෂක මණ්ඩලය වෙත බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවද?

පි: ඔබ හරි.

ප්‍ර: දැන් මෙම පොත සහ ඔබලා විසින් සතිපතා මෙම කරුණු සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලය දැනුවත් කිරීමේ දී ආරක්ෂක මණ්ඩලයෙන් ඔබ වෙත හෝ එහෙම නැත්නම් විමර්ශන ඒකකය භාර පොලිස්පතිවරයා හෝ වෙනත් නිලධාරින් වෙත මෙම ආගමික අන්තවාදය ලංකාව තුල පැතිරවීම වැළැක්වීමට අවශ්‍ය එහෙම නැත්නම් නතර කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දුන්නාද නැද්ද?

පි: ගොඩාක් දුරට මේවා ඉදිරිපත් කිරීමේ දී රටක ප්‍රධාන ඒ කියන්නේ Security Council එකෙන් ගත යුතු ක්‍රියාමාර්ග ඒක විශේෂයෙන්ම ඒ උපදෙස් ඒ Strategic Level එකෙන්ම විය යුතුයි. ඒ කියන්නේ දැන් අපි කතා කරන්නේ ඇවිල්ලා මිනිහෙක්ව එළියට ඉන්දියාවට යන එක වළක්වනවාත් , සිරියාවට කවුරුහරි එන එක වළක්වන්නවත් ගන්න නෙමෙයි. අපි මෙතන දී Security Council එකේ කතා කරන්නේ Overall මේ Threat එකක් Development කිරීම තුළින් රටක් හැටියට මේක මැඩපැවැත්වීමට ගත යුතු ක්‍රියාමාර්ග තමයි අපි කතා කරන්නේ. ඒ කියන්නේ විශේෂයෙන්ම නීතිමය පැත්තෙන් ගත යුතු ක්‍රියාමාර්ග ඒ එක්කම Engagement එකක් හැටියට මේවා Identify කරලා මේ Line Ministries ත් එක්ක කටයුතු කරපු ගත්ත ක්‍රියාමාර්ග ..

ප්‍ර: ඔබලා යෝජනා කරනවා?

පි: ඔව් අපි ඒ යෝජනාව අපි ඒක ප්‍රකාශ කිරීම පමණක් නෙවෙයි මේ මාතෘකාව විශේෂයෙන්ම ඒ Security Council එකටත් අලුත් මාතෘකාවක්. දැනටත් ගොඩාක් කට්ටියට මේක අලුත් මාතෘකාවක්. ISIS එක කියනවා. JI එක කියනවා. JMI එක කියනවා. එතකොට අපිට හිතාගන්න පුළුවන් මේ අපි අවුරුදු ගාණක් ඇවිල්ලාත් දැනට අපි කතා කරනකොටත් ස්වාමීන් වහන්සේ මේක ගොඩාක් අයට අලුත් මාතෘකාවක්. නමුත් අපි මේක පැහැදිලිවම අවබෝධ කර ගත්තා. මෙහෙම කට්ටියක් ඉන්නවා. JMI කියලා කට්ටියක් සිටිනවා. එහෙම නැත්නම් පිටරට ගිහිල්ලා කට්ටියක් තියනවා කියන එක මේක මදි ආරක්ෂක අමාත්‍යාංශයට. අපි ආරක්ෂක මණ්ඩලයෙන් අපි බලාපොරොත්තු වෙන්නේ මේක පිළිබඳ හොඳ විශ්ලේෂණයක් කරලා ඒ විශ්ලේෂණය තුළින් රටට වෙන්න පුළුවන් බලපෑම සඳහන් කරලා ඒ බලපෑම නවත්වන්න නම් මෙන්න මේ ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව. එතකොට දැන් මේ එකම කාරණාව හැමදාම ආරක්ෂක මණ්ඩලයේ කතා කරන්න බැහැ. එතකොට අපිට කියයි හැමදාම ඔයාලා එකම කාරණය කතා කරන්නේ කියලා. එතකොට අපි ඒ තියෙන වාරවල දී අපි ඒ අවශ්‍ය

FAIR COMMENT BY JEZEEM

කරන ඒ සතියට අවශ්‍ය කරන දේවල් ටික අපි කතා කරනවා. හැබැයි දැන් මේකේ දී සම්පූර්ණ ව්‍යුහයක් දකින්න එපැයි. අපි කතා කරන එකේ කොටස් කොටස්නේ තියෙන්නේ. මොකද මේ සතියේ කතා කරාම ඒ රාජකාරිත් එක්ක ලබන සතියේ සමහර අයට ඒක අමතකයි. දැන් ඒක නිසාම අපි කරේ සම්පූර්ණයෙන්ම මේ විදිහට අපි 2016 වෙනකොට සම්පූර්ණයෙන්ම අපි මේක ක්‍රියාවලියක් සිදු නොවන නිසා නැවත වතාවක් විශ්ලේෂණය කරලා සම්පූර්ණ Threat එක මොකක්ද. Threat එක වර්ගීකරණය කරලා මේ තුළින් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අපි Detailed Study එකක් කරලා ඊට පස්සේ ඒ හැම Ministry එකක් ගැනම ඒ කියන්නේ විශේෂයෙන්ම බුද්ධ ශාසන අමාත්‍යාංශය විසින් ගත යුතු ක්‍රියාමාර්ග, ආරක්ෂක අමාත්‍යාංශය විසින් ගත යුතු ක්‍රියාමාර්ග, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ගත යුතු ක්‍රියාමාර්ග, පොලිස්පති විසින් ගත යුතු ක්‍රියාමාර්ග, ඒ එක්කම නීති පැත්තෙන් නීතිය කොහොමද වෙන්න ඕනි ක්‍රියාමාර්ග පිළිබඳ Detailed Study එකක් කරලා ඉංග්‍රීසියෙන් පමණක් නෙවෙයි. සමහර වේලාවට මේක ඉංග්‍රීසි භාෂාවෙන් ගොඩාක් දුරට Security Council එකේ සිංහලෙන් තමයි Brief කරන්නේ. ඒ නිසා මේක අපි සිංහලටත් පරිවර්තනය කරලා මේ පොත් 2ක් හදලා අපි දුන්නා මේ පිළිබඳව. ඇත්තමට මේකට අවශ්‍යතාවය තිබ්බේ මේකට කරන්න ඕනි ක්‍රියාවලි ඔක්කෝම තියෙනවා. මේකට අවශ්‍ය කරන අනුමැතිය ලබාදීම පමණයි සිදු කළ යුතුව තිබුණේ.

ප්‍ර: අනුමැතිය සඳහා තමයි ඔබ ඉදිරිපත් කළේ?

පි: ඔබ හරි.

ප්‍ර: ඒ අනුමැතිය කවුරු විසින් ද ලබා දෙන්න ඕනි?

පි: ඒක අනිවාර්යයෙන්ම ආරක්ෂක මණ්ඩලය විසින් මේක Study කරලා ආරක්ෂක ලේකම්තුමාගේ Recommendation එකත් එක්ක කළ යුතු ක්‍රියාවලියක්.

ප්‍ර: හරි. අවසාන තීරණය කාගේ ළඟ ද තියෙන්නේ?

පි: අවසානයේ දී මේක, මේකේ වගකීම තියෙන්නේ ඇත්තටම ආරක්ෂක ලේකම්තුමාගේ අතේ තමයි. එයා තමයි මේකේ ඉන්නේ. බැහැයි එයාට තනියම ක්‍රියාත්මක කරන්න බැහැ. ආරක්ෂක ලේකම් තුමාට තියෙන්නේ ඇවිල්ලා ඒ ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ කටයුතු. නමුත් මෙතන දී අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් කටයුතු කරන්න ඕනි. ඒ එක්කම ආගමික සම්බන්ධව ඒ පැත්ත තියෙනවා. ඊට පස්සේ නීතිපතිතුමාගේ පැත්තක් තියෙනවා. එතකොට එතන දී ඒ කාරණා ටික හරියට අපි ඉදිරිපත් කරාම ජනාධිපතිතුමා හෝ අගමැති තුමා විසින් මේක බලලා ඒ අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගන්න ඒ අදාළ නිලධාරින්ට උපදෙස් දෙන්න ඕනි. ඒක තමයි සාමාන්‍ය ක්‍රියා පිළිවෙත.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මෙම C – 268 ඔබ කියා සිටියා පෙර දිනයේ සාක්ෂි දෙන විට ආරක්ෂක අමාත්‍යාංශයට ඒ කියන්නේ ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලබා දුන් බව?

පි: ඔබ හරි.

ප්‍ර: දැන් ලේකම් තුමාට මේ C – 268 සහ C – 268 (A) කියන ලේඛන ලබා දුන්නු බව තහවුරු කරන්න ඔබ ගාව යම් ලිඛිත සාක්ෂියක් තිබේද නැද්ද?

පි: මුලින් මම බුද්ධි අධ්‍යක්ෂක හැටියට යුධ හමුදා, මුලින්ම යුධ හමුදාපති තමා මං මේ පොත් දෙක අරගෙන ගියේ. එවකට හිටපු යුධ හමුදාපතිතුමා මට උපදෙස් ලබා දුන්නා මේක ගිහිල්ලා ආරක්ෂක ලේකම්තුමාට ලබා දෙන්න කියලා. ඒ අනුව මම ආරක්ෂක ලේකම්තුමාට ලබා දීලා නැවතත් යුධ හමුදාපතිතුමාට මම කිව්වා ඒක ලබා දුන්නා කියලා. යුධ හමුදාපතිතුමා යන්න කළින් ආරක්ෂක ලේකම්ට කතා කරලා කිව්වා. මොකද 2015න් පස්සේ ක්‍රමවේදය ටිකක් වෙනස්. මොකද අපිට 2005ට වගේ තිබ්බ ලොකු සම්බන්ධයක් තිබ්බේ නැහැ මොකද ආරක්ෂාව පිළිබඳව ලොකු අවබෝධයක් කාටවත් තිබුණේ නැති නිසා අපිට ඒ Line එක Approach කරන්න ටිකක් අපහසු වුණා. ඒක නිසා හැම තිස්සේම හරි ක්‍රමවේදයක් අපිට අනුගමනය කරන්න වුණා. ඒ අනුව අපි මේ ටික Analyze කරලා හමුදාපතිට දන්වලා, යුද හමුදාපති ආරක්ෂක ලේකම්ට දුරකතනයෙන් කතා කරලා මෙහෙම මම බුද්ධි අධ්‍යක්ෂක එවනවා මේ Document එක දෙන්න කියලා ඒ අනුව මම ගිහිල්ලා බුද්ධි අධ්‍යක්ෂක හැටියට ඒ Document එක එතුමාට භාර දීලා නැවතත් ඇවිල්ලා හමුදාපතිතුමාට කිව්වාම ඒක තමා ක්‍රමවේදය තිබ්බේ.

ප්‍ර: කවුද එතකොට හමුදාපති වශයෙන් සිටියේ?

පි: ජනරාල් ක්‍රිශාන්ත සිල්වා.

ප්‍ර: ඔබ කියා සිටියා ආරක්ෂාව සම්බන්ධයෙන් අවබෝධයක් තිබ්බේ නැහැ කියලා. කාටද ආරක්ෂාව සම්බන්ධයෙන් අවබෝධයක් තිබ්බේ නැත්තේ?

පි: දැන් මම දකින්නේ මගේ පෞද්ගලික Assessment එක. ඒ මුළු පද්ධතියටම ඒ පිළිබඳව ලොකු අවබෝධයක් තිබ්බේ නැහැ.

ප්‍ර: මොකක්ද මේ පද්ධතිය?

පි: System එක. ඒ System එක කියන්නේ විශේෂයෙන්ම අපි උඩ ඉඳලා ගත්තාම පල්ලෙහාට වෙනකම්ම ඒ කියන්නේ උඩ ඉඳන්ම ආරක්ෂක මේ හැමදෙයක්ම අවසානයේ උඩට ඒ කියන්නේ ආරක්ෂක මණ්ඩලයට යන්න එපැයි. ආරක්ෂක මණ්ඩලය විසින් තමයි හැම දෙයක්ම මේ දේවල් තීරණය කරන්නේ. එතකොට ඒ මණ්ඩලය බෙදී වෙන්වීමක් තිබ්බා.

ප්‍ර: පැහැදිලි නැහැ.

පි: ඒ මණ්ඩලයේ බෙදීමක් තිබුණා.

ප්‍ර: ආරක්ෂක මණ්ඩලය තුළ ද?

පි: ඒක තුළ ඒගොල්ලන්ගේ මතවාදය අතර බෙදීමක් තිබුණා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකයන් අතර..

පි: එතනටත් වඩා උඩම තැන. අගමැතිතුමායි , ජනාධිපතිතුමයි අතර මේ ප්‍රශ්න දිහා බැලීමේ දී පැති දෙකක ඉඳන් තමයි බැලුවේ මගේ පෞද්ගලික හැඟීම. ඒ පැති දෙකෙන් බැලීමේදී ඒ ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයනුත් ඒ පැති දෙකෙන් බැලීමට පුරුදු වෙලා තිබ්බා. ඒවා ක්‍රියාත්මක කිරීමේදී යම් කොටසක් ජනාධිපතිතුමා යටතේ තිබුණු අතර යම් කොටසක් තිබ්බේ අගමැතිතුමාගේ පැත්තේ. ඉතින් එතන දී මූලික වශයෙන් මේ දේවල් වලට අවධානය යොමු කිරීමක් කළේ නැහැ. ඒගොල්ලන්ගේ Priorities තිබ්බේ වෙනත් පැති වලට.

ප්‍ර: මොන දේවල් වලටද අවධානය තිබ්බේ නැත්තේ?

පි: ඒ කියන්නේවිශේෂයෙන්ම ඔය ජාතික ආරක්ෂාවේ දී අපි මුස්ලිම් අන්තවාදය ගැන අපි කතා කළොත් දැන් මුස්ලිම් අන්තවාදය ගැන කතා කරනකොට පැහැදිලිවම මුස්ලිම් දේශපාලඥයන්ගෙන් ලොකු පැහැදීමක් තිබ්බේ නැහැ.

ප්‍ර: පැහැදිලි නැහැ කුමක්ද?

පි: මුස්ලිම් අන්තවාදය ගැන අපි 2014 ඉඳන් මේක Build Up කරගෙන ඇවිල්ලා 2015 දී මේ සංවිධාන ගිහිල්ලා මේ විදිහට Development එකක් වෙනවා. මෙහෙම ගිහිල්ලා කතා කිරීමේ දී මුස්ලිම් දේශපාලඥයන් අතර වුණත් ඒ පිළිබඳව පැහැදීමක් තිබ්බේ නැහැ. ඒගොල්ලෝ හැම තිස්සේම කරේ මේගොල්ලෝ මේ බොරුවක් කරන්නේ මේ නිකන් මේක Divide කරන්න හදන්නේ. මේ මුස්ලිම් ජනතාව පැත්තකට තල්ලු කරන්න හදන්නේ කියන මතයක් තමයි තිබ්බේ. ඒ මතයත් එක්කම දේශපාලඥයන් මේ පිළිබඳව අවධානය යොමු කරන්න කටයුතු කළේ නැහැ ඇත්තටම.

ප්‍ර: කටයුතු කළේ නැද්ද කටයුතු කරන්න මැලි වුණාද?

පි: කටයුතු කරන්න මැලි වුණා. මොක ද ඒගොල්ලන් හිතුවා මේ කිරීම තුළින් මේ මුස්ලිම් සමාජය අනවශ්‍ය ප්‍රශ්නයක් මේ තුළින් අපි ඇති කර ගන්නවා කියන එක. ඒ කියන්නේ දැන් මෙතන දී ඒ දවස් වල අර යම් යම් සංවිධාන ඇති වුණා දෙපැත්තෙන්ම. සිංහල සංවිධානත් ඇති වුණා. එතකොට මුස්ලිම් සංවිධානත් ඇතිවුණා. ඉතින් මේ සට්ටනය තුළ දී එවකට හිටපු රජය බැලුවා මේකේදී මුස්ලිම් අන්තවාදී, හෝ සිංහල අන්තවාදී සංවිධාන විසින් මේ උත්සාහ ගන්නවා මේ අතරේ යම්කිසි බෙදීමක් ඇති කර ගන්න. මෙතන දී එවකට මගේ දැනුම හැටියට තිබ්බ ගොඩාක් දුරට Engagement එක. ඒ කියන්නේ ගොඩාක් අසාධාරණයක් වුණා යම් යම් ජනතාවට. මේක තව දුරටත් මේක අසාධාරණයක් නොවිය යුතුයි සහ දේශපාලනිකව එකතු වීමක් සිදු කරන්න නම් මේ වගේ දේවල් අපි ඉස්සරහට ගන්න ඕනි නැහැයි කියන වගේ අදහසක් මම දැක්කා.

ප්‍ර: කවුද ඔබ සඳහන් කරන මෙම මුස්ලිම් දේශපාලඥයින්?

FAIR COMMENT BY JEZEEM

පි: මගේ මතකයේ හැටියට මට මතකයි 2015 දී මේ Threat එක Develop වීගෙන එනකොට එවකට හිටපු අමාත්‍යවරයා සාගල රත්නායක අමාත්‍යතුමා එවකට එතකොට ජනාධිපති හෝ ලේකම් හෝ කවුරුහරි කියන්න ඇති, කිව්වා මට මේකේ Brief එකක් ලෑස්ති කරන්න කියලා මුස්ලිම් අය ඔක්කෝටම Brief එකක් දෙන්න මේ පිළිබඳව. මේ ආගමික අන්තවාදය පිළිබඳව. හැබැයි ඒක ලෑස්ති කරන්න කියලා මම ඔක්කෝම ලෑස්ති වෙලා ඉද්දී පසුව මට දැනුම් දුන්නා ඒක අවශ්‍ය නැහැ කියලා. ඊට පස්සේ මම ඒක පිළිබඳව මොකද මමත් බුද්ධි නිලධාරියෙක් ඔය හැම Community එකත් එක්කම අපිට සම්බන්ධකම් තියෙනවා. මම හොයලා බැලුවා මොකක්ද ඒකට හේතු වෙන්න ඕනි කියන එක. ඉතින් එක පැත්තක දී හේතුවක් වෙලා තිබ්බේ ඔය මුස්ලිම් මම දන්නේ නැහැ කවුද කියන එක. ඒ අමාත්‍යවරුන් අපි සම්බන්ධකම් ඇති කරගෙන මේගොල්ලන්ට යම් යම් පැහැදිලි කරන්න යනකොට ඒගොල්ලන්ගේ පිළිගැනීමක් තිබ්බේ නැහැ. විශේෂයෙන්ම සියලුම මුස්ලිම් අමාත්‍යවරු. දැනට දේශපාලනයේ ඉන්න ප්‍රධාන අමාත්‍යවරු ඒගොල්ලන්ට මේ පිළිබඳව අවබෝධයක් දැන ගන්න අවශ්‍යතාවයක් තිබ්බේ නැහැ. මොකද හේතුව

ප්‍ර: නැහැ මට පැහැදිලි නැහැ. ඒ කියන්නේ ඔවුන්ට මුස්ලිම් ආගමික අන්තවාදයක්

පි: තියෙනවා කියන එක ඒගොල්ලෝ පිළිගන්න සූදානම් වුණේ නැහැ.

ප්‍ර: ලංකාව තුළ තියෙනවා කියන දේශපාලඥයන් පිළිගන්න සූදානම් වුණේ නැහැ?

පි: නැහැ. මොකද ඒගොල්ලන්ට තිබ්බ මම දකින හැටියට ඒගොල්ලන්ට පොඩි මේකක් තිබ්බා ඒ කියන්නේ මේක අන්තවාදයක් තිබ්බා කියන එක පිළිගත්තොත් ඒක ලොකු ප්‍රශ්න සහගත තත්වයක් ඇති වෙයි කියලා.

ප්‍ර: ඒ කියන්නේ ඔවුන් අන්තවාදය එම දේශපාලඥයින් මෙම මුස්ලිම් අන්තවාදයක් ලංකාව තුළ තියනවා කියලා පිළිගතහොත් ඔබ කියා සිටියා ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන් කියලා. මොකක්ද ඒ ප්‍රශ්නය දේශපාලනික ප්‍රශ්නයක් ද ජාතික ප්‍රශ්නයක් ද මොන වගේ ප්‍රශ්නයක් ද ?

පි: ඒක ප්‍රධාන වශයෙන්ම දේශපාලනික ප්‍රශ්නයක්. ඒගොල්ලෝ හැමෝම දේශපාලනයේ නිතර වීමේ දී ජාතික ආරක්ෂාවට වැඩිය තමන්ගේ බලය සහ පක්ෂය ඒ තියෙන සංකල්පය මතනේ ක්‍රියාත්මක කරන්නේ. ඉතින් එතකොට ජාතික ආරක්ෂාවේ දී මෙතන දී මේ වගේ දේවල් අර අපි හොඳම උදාහරණය 37 දෙනෙක් සිරියාවට ගියා කියලා මරණයට පත්වෙලා තියෙන මේ වගේ අවස්ථාවක දී වුණත් මුස්ලිම් ප්‍රජාවක් හැටියට ඒ දේශපාලන නායකයෝ මේවා පිළිබඳව ප්‍රසිද්ධියේ කතා කිරීම හෝ මේ පිළිබඳව Accept කිරීමට කැමැති වුණේ නැහැ.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: ඔබට ඒ අනුව එවකට 2015 හෝ 2016 දී සිටි මුස්ලිම් අමාත්‍යවරු සහ/ හෝ මුස්ලිම් මන්ත්‍රීවරු මෙම මුස්ලිම් අන්තවාදය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ හැකියාවක් ඔබට ලැබුණාද?

පි: එකම අවස්ථාවක් ලැබුණා. ඒ ඇවිල්ලා meeting එකක් ලෑස්ති කරන්න කියලා ඒ සියලු දෙනාටම Presentation එකක් හැටියට ඉදිරිපත් කරන්න කියලා කිව්වා. නමුත් ඒක පසුව ඒක Implement කළේ නැහැ.

ප්‍ර: ඒ කියන්නේ Implement කළේ නැහැ කියන්නේ එම රැස්වීම තිබ්බේ නැහැ කියන එක ද?

පි: ඒ රැස්වීම තිබ්බේ නැහැ.

ප්‍ර: කවදා විතර ද ඒ රැස්වීම ?

පි: 2015 අවසාන කාලයේ දී.

ප්‍ර: ඔබ අර පෙර දින සාක්ෂි දෙන විට කියා සිටියා මෙම 37 දෙනා සම්බන්ධයෙන් වන තොරතුරු ඊට පසු ඔබ විජේදාස රාජපක්ෂ අමාත්‍යාවරයා වෙත ලබා දුන් බව?

පි: ඔබ හරි.

ප්‍ර: ඒ ලබා දුන්නේ කොයි අවස්ථාවේ ද , කියලා ඔබට මතකයක් තිබෙනවාද?

පි: ඔව්. මගේ මතකයේ හැටියට මොකද මේ හැම දෙයක්ම Fail වෙනකොට ඒ කියන්නේ මේක අපි බුද්ධි රාජ්‍ය බුද්ධි Director Military Intelligence හැටියට මේ හැම ක්‍රමයක්ම Fail වෙනකොට මම කල්පනා කරා මේක එවකට හිටපු අධිකරණ ඇමතිතුමාට හම්බෙලා ගිහිල්ලා මේ පිළිබඳව සම්පූර්ණ විස්තර වාර්තාවක් එතුමාට ලබා දීලා ඒ තුළින් පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ට දැනුවත් වීමක් තුලින්, ඒ තුළින් යම්කිසි ක්‍රියාමාර්ගයකට යොමු වෙයි කියන එක.

ප්‍ර: ඒ අනුව තමයි ඔබ ඒ තොරතුරු ලබා දුන්නේ?

පි: ඒ අනුව මම ගිහිල්ලා සියලු නාම ලේඛන සියලු තොරතුරු මම එතුමාට ලබා දුන්නේ.

ප්‍ර: එම ප්‍රකාශයෙන් පසුව ඔබ කියා සිටියා මුස්ලිම් අමාත්‍යවරු ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරා එවැනි ආගමික අන්තවාදයක් ලංකාව තුල නැති බවට?

පි: ඔබ හරි මගේ මතකයේ හැටියට පාර්ලිමේන්තුවේ දී ඒ ප්‍රකාශය කරා. මේ කියන කොට හැබැයි ඒ තුළින් ඊට පස්සේ කොහොමද පාර්ලිමේන්තුව Respond කළේ සහ වෙනම වෙනම දේශපාලඥයන් විසින් කොහොමද Respond කරේ කියන එක මම හිතන්නේ ඒක මාධ්‍යයෙන් ගියා. ඉතින් ආරක්ෂක මණ්ඩලය විතරක් නෙවෙයි පාර්ලිමේන්තුවක් මේ සියලු කාරණා පිළිබඳව දැනගෙන හිටියා.

ප්‍ර: මහත්මයා දැන් ඔබ කවදායින් ද ඔබගේ ධූරය අධ්‍යක්ෂක බුද්ධි, යුධ හමුදා අවසන් වෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි: එහෙම කාලයක් අපිට නැහැ. මට යන්න සිද්ධ වෙනවා 2016 නොවැම්බර් මාසයේ දී.

ප්‍ර: දැන් ඔබ එම තනතුරෙන් ඉවත්ව යන තෙක් C- 268 දරන ලේඛනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලය විසින් පැහැදිලි තීරණ සහ නියාමනයන් ගත්තාද?

පි: පැහැදිලිවම නැහැ.

ප්‍ර: දැන් එසේම ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමේදී එහි දී ආරක්ෂක ලේකම්වරයා විසින් මෙම ඔබ විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු කරුණු සම්බන්ධයෙන් වැදගත්වන ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් යම් පියවරක් ගත්තාද?

පි: ප්‍රධාන වශයෙන් එහෙම දෙයක් මම දැක්කේ නැහැ.

ප්‍ර: හරි. C- 268 වෙත ඔබගේ අවධානය යොමු කරනවා. මෙම C- 268 දෙවන ඡේදයෙන් ඔබ රටේ එවකට පැවති ආරක්ෂක තත්ත්වය අර කරුණු 5 යටතේ පැහැදිලි කරනවා කිව්වොත් හරිද?

පි: ඔබ හරි.

ප්‍ර: එහි ඡේද අංක 4න් ඔබ ඉස්ලාම් අන්තවාදය ව්‍යාප්ත වීම යන මාතෘකාව යටතේ මෙම ඉස්ලාම් අන්තවාදයේ වර්ධනය සම්බන්ධයෙන් දේශීය සහ විදේශීය පැහැදිලි කිරීමක් සිදුකරනවාද?

පි: ඔබ හරි.

ප්‍ර: එසේම මෙම C- 268 ලේඛනයේ 5 වන ඡේදයෙන් ඔබ දැනුම් දෙනවා සිරියාවේ දී මියගිය ශ්‍රී ලාංකිකයා සම්බන්ධයෙන් සහ එම සිරියාවේ ISIS සංවිධානයට සම්බන්ධ වෙලා තිබෙන පවුල් පිළිබඳ විස්තරයක්?

පි: ඔබ හරි.

ප්‍ර: ඡේද අංක 6හි මෙම ISIS සංවිධානයේ සංකල්පයන් ඔබ දක්වලා තිබෙනවා. ඡේද අංක 5 ප්‍රතිඋපාය මාර්ගත් නැවත ඡේද අංක 8න් ISIS සංවිධානයේ ගෝලීය ව්‍යාප්ත වීමත් ඡේද අංක 9න් අනිකුත් රටවල් සමාන තර්ජනයන් සඳහා මුහුණ දෙන ආකාරයත් දක්වලා තිබෙනවා?

පි: ඔබ හරි.

ප්‍ර: විශේෂයෙන්ම ඡේද අංක 12 දී සතුරා සංවිධානය වීමට ප්‍රථම අඩපණ කිරීම යන මාතෘකාව යටතේ ඔබ කරුණු දක්වලා තිබෙනවා?

පි: ඔබ හරි.

ප්‍ර: මෙම කොමිෂන් සභාවේ පහසුව සඳහා නැවත මෙම ඡේද අංක 12 ඔබට කියවන්න හැකිද?

පි: සාක්ෂිකරු අදාළ කොටස කියවයි.

ප්‍ර: සාක්ෂිකරු මෙම වාර්තාවේ අවසානයට ඔබලා විසින් සැලැසුමක් ඉදිරිපත් කරලා තියෙනවාද?

පි: ඔබ හරි.

ප්‍ර: ඒ සැලැසුම කරුණු 7ක් යටතේ ඉදිරිපත් කරලා තියෙනවාද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔබ හරි.

ප්‍ර: මොනවද ඒ කරුණු 7?

පි: නීතිමය රාමු සකස් කිරීම, බුද්ධි ජාලය ව්‍යාප්ත කිරීම, අන්තවාදී මතවාදය අඩපණ කිරීම, දේශීය හෝ විදේශීය සටන්කාමීන් බඳවා ගැනීමට වැළැක්වීම, අන්තවාදය වැළැක්වීමට ගෝලීය ප්‍රයත්නයකට සහාය දැක්වීම, අන්තවාදයේ ව්‍යාප්තිය සහ ආක්‍රමණය අවහිර කිරීම, ප්‍රතිචාර දැක්වීම සඳහා අත්පත් කර ගැනීම.

ප්‍ර: එසේම මෙහි දී නිර්දේශ ඔබ විසින් ඉදිරිපත් කරලා තියෙනවද?

පි: ඔබ හරි.

ප්‍ර: නිර්දේශ 2ක්?

පි: ඔබ හරි.

ප්‍ර: 1 තමයි ඒකාබද්ධ කාර්ය සාධක බලකායක් ස්ථාපිත කිරීම. නීති සහ ප්‍රතිපත්ති සකස් කිරීම?

පි: ඔබ හරි.

ප්‍ර: මෙම C -268 කියන ලේඛනයේම ඔබලා ඇමුණුමක් ඉදිරිපත් කර තියෙනවා?

පි: ඔබ හරි.

ප්‍ර: එහිදී පෙර ඡේදයේ සඳහන් සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාල විස්තර ද ඒ ඇමුණුමේ දක්වා තිබෙන්නේ ?

පි: ඔබ හරි.

ප්‍ර: එසේම ඔබ එය වගුවක් ආකාරයට ඉදිරිපත් කරලා තියෙනවා ගත යුතු ක්‍රියාව, සැලැකිල්ලට ගත යුතු කරුණු, ක්‍රියාව සහ වගකීම් සහ ඒ වගකීම් භාරගෙන ඒවා ක්‍රියාත්මක කළ යුතු ආයතන හෝ පුද්ගලයන් සම්බන්ධයෙන්?

පි: ඔබ හරි.

ප්‍ර: මෙහි දී මද්‍රාසා, මුස්ලිම් පාසල් වල විෂය මාලාව ක්‍රමවත් කිරීම සම්බන්ධයෙන් දක්වලා තිබෙනවාද?

පි: ඔබ හරි.

ප්‍ර: එසේම එම මද්‍රාසා පාසල්වල ගුරුවරුන් සහ ඔවුන්ගේ සුදුසුකම් සම්බන්ධයෙන් පැහැදිලිව දක්වලා තියෙනවද?

පි: ඔබ හරි.

ප්‍ර: විදේශීය දේශකයන් ලංකාවට පැමිණීම සම්බන්ධයෙන් සැලැස්මක් ඉදිරිපත් කරලා තිබෙනවා එමඟින් නිවැරදි ද?

පි: ඔබ හරි.

ප්‍ර: මෙවැනි විස්තරාත්මක වාර්තාවක් සඳහාත් ඔබ කියා සිටින්නේ ප්‍රතිචාරයක් ලැබුණේ නැති බවයි ?

පි: ලැබුණේ නැහැ. ඊට අමතරව මේකේ තියෙනවා තව අන්තවාදය ප්‍රචාරණ කටයුතු නවත්වන්න කොහොමද ක්‍රියා කරන ආකාරය පිළිබඳවත් ඊට අමතරව බඳවා ගැනීම් කොහොමද මේගොල්ලන් බඳවා ගැනීම්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නවත්වන්න ගත යුතු ක්‍රියාකාරකම් පිළිබඳවත් ඒක අපි කියලා තියෙනවා මණ්ඩලය විසින් පහත සඳහන් කරුණු සැලකිල්ලට භාජනය කරන්න ඒ කියන්නේ Vulnerable Committees කවුද suicide cadres ලා වගේ යන්න පුළුවන් කට්ටිය හඳුනා ගන්න විදිහ කවුද.. ඒගොල්ලන් ගත්තයින් පස්සේ කොහොමද ක්‍රියා කරන්න ඕනි මේ සියලු ආදි වශයෙන් දීර්ඝ වශයෙන් අපි මේක සැලැස්මක් අපි යොමු කරලා තියෙනවා.

දැන් වේලාව: ප.ව.3.20
මෙතැන් සිට ල/ලේ: යමුනා මිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් ගැනීම. ල/ලේ නිල්මිණි.
මෙතැන් පටන් සටහන් ගැනීම ල/ලේ යමුනා දසනායක විසිනි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සංජීව දිසානායක මහතා</u>

මෙම 260 ට සම්බන්ධිත ඇමුණුම C268 A ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා.

උ සාමාන්‍යයෙන් අපි වාර්තා ඉදිරිපත් කරන්නේ ඉංග්‍රිසි භාෂාවෙන් තමයි නමුත් විශේෂයෙන්ම මේක අනිකුත් සියළු දෙනාම දැන ගත යුතු වාර්තාවක් නිසා මේක සිංහල සහ ඉංග්‍රිසි භාෂා දෙකෙන්ම මේ වාර්තාව සැකසුවා. C 268 B ලෙස

ප්‍ර ඔබ පෙර දිනයේදි සාක්ෂි දෙන විට කියා සිටියා ශ්‍රී ලංකාවේ තිබෙන මුස්ලිම් ජන ගහනය කොපමණද යන්න ?

උ ඔබ හරි.

ප්‍ර යම් හෙයකින් ලංකාවේ මුස්ලිම් ජනගහනය මිලියන 9.7 ක් ලෙස වාර්තා වෙලා තියනවා නම් එය නිවැරදිද ?

උ ඒක වැරදියි. මොකද මුස්ලිම් ජනතාව ඇවිල්ලා ඒ කියන්නේ ලංකාවේ මිලියන 21 න් මිලියන 2 ක් පමණ මුස්ලිම් ජනතාව ඉන්නවා සියට ප්‍රතිශතයක් ගත්තොත් 9. 7 ක්.

ප්‍ර එසේම ඔබ C 269 ලෙස මෙම ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලේඛණයේ පැහැදිලිවම ජනගහනය මුස්ලිම් ජනගහනය සම්බන්ධයෙන් විස්තර ඉදිරිපත් කර තිබෙනවා.?

උ ඔබ හරි.

මේ අවස්ථාවේදි C 269 ලේඛණයේ තිබෙන පලමුවෙනි ඇමුණුමෙහි ශ්‍රී ලංකාව තුල සිටින මුස්ලිම් ප්‍රජාව කොටස් 4 කින් සමන්විතව ඉදිරිපත් කර තිබෙනවා එම පිටුව මා C269 A ලෙස ලකුනු කර ඉදිරිපත් කර සිටිනවා .

එසේම මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවේ අවධානයට යොමු කර සිටිනවා මෙම C 269 දරණ ලේඛණය ලකුණු කර ඉදිරිපත් කර ඇතත් එසේ ලකුනු කිරීම සම්බන්ධයෙන් පෙර දින සාක්ෂි සටහන් වල සටහන් නොවන බවයි. එබැවින් මෙම ලේඛණය දැනටමත් C 269 ලෙස ලකුනු කර ඇති බව කොමිෂන් සභාවේ අවධානයට මම යොමු කර සිටිනවා

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

C 269 වශයෙන් ලකුණු කර ඇත්තේ Fundamentalism Extremism and Muslim structure in Sri lanka යන ග්‍රන්ථය බව සටහන් කර තබමි.

****

FAIR COMMENT
BY JEZEEM

එසේම C 720 ලෙස ලකුණු කරන්නට යෙදුණු ලේඛණයේ එනම් Muslim Sects in Sri Lanka යන මාතෘකාව යටතේ C 720 ලකුණු කර ඉදිරිපත් කරන්න යෙදුනා. එම මාතෘකාව යටතේම මෙම C 269 දරණ ලේඛණයේ සවිස්තරව ඉදිරිපත් කර ඇති ඇමුණුම C 269 B ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා එසේම එහි C ඇමුණුමෙහි මුස්ලිම් සංවිධාන වල විස්තර ඇතුලත් කර තිබෙනවා උතුමාණෙනි එය C 269 C ලෙස තවදුරටත් ලකුනු කර ඉදිරිපත් කර සිටිනවා .

ප්‍ර සාක්ෂිකරු මේ C 272 කියන ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිය ආගමික දේශකයන්, අධ්‍යාපනය හැදෑරීමට පැමිණෙන්නන් හා ශ්‍රී ලංකාවෙන් විදේශිය ආගමික ශිෂ්‍යත්ව ලබා විදේශගත වන අයවළුන් සබැඳි අධ්‍යයනය හා ඒ තුලින් ජාතික ආරක්ෂාවට සිදුවන බලපෑම සහ නිර්දේශ යන මැයෙන් බුද්ධි 2016 ඔක්තෝබර් මාසේදි මෙම බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේඛණය තමයි ඔබ ඉදිරිපත් කලේ C 272 කියලා ?

උ ඔබ හරි.

ප්‍ර කාටද මේ ලේඛණය ඉදිරිපත් කලේ ?

උ මේකත් යුද හමුදාපතිට ඉදිරිපත් කරලා පස්සේ මේක ආරක්ෂක ලේකම්තුමාට ඉදිරිපත් කලා

ප්‍ර මෙම ලේඛණයේ බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නිරික්ෂණ 06 ක් ඉදිරිපත් කර තිබෙනවා ?

උ ඔබ හරි.

ප්‍ර මොනවද ඒ නිරික්ෂණ 6 ?

උ 01. ශ්‍රී ලංකාව තුල අධ්‍යාපනය හැදෑරීමට පැමිණෙන විදේශිකයන්ගේ අනන්‍යතාවය සුදුසුකම් හා ක්‍රියාකාරකම් පිළිබඳව සොයා බැලීමට සුදුසු ක්‍රමවේදයක් නොමැතිවීම.

02 ආගමික කටයුතු ප්‍රචාරය කිරීමට පැමිණෙන්නන්ගේ අනන්‍යතාවය සුදුසුකම් හා ක්‍රියාකාරකම් පිළිබඳව සොයා බැලීමට සුදුසු ක්‍රමයක් නොමැතිවීම.

03. ශ්‍රී ලංකාව වෙතින් විදේශ රටවලට ආගමික දේශණ සඳහා යන පුද්ගලයන්ගේ අනන්‍යතාවය සුදුසුකම් හා ක්‍රියාකාරකම් පිළිබඳව සොයා බැලීමට සුදුසුක්‍රම වේදයක් නොමැතිවීම.

04. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය බෙදා හැරීමට හා ත්‍රස්තවාදීන් හට ගමන් කිරීමට හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස transit hub යොදවා ගැනීමට වළක්වා ගැනීමට ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳ ව නිසි ක්‍රියා මාර්ගයක් නොමැතිවීම.

05. ශ්‍රී ලංකාව තුල රැඳී සිටින අනවසර විදේශිකයන් හා ඔවුන් විසින් කරනු ලබන නීති විරෝධි ක්‍රියා සඳහා දැඩි නීතිරීතින් හා රෙගුලාසින් පැනවීමේ අවශ්‍යතාවය .

FAIR COMMENT BY JEZEEM

06 වීසා නිකුතුව හා ආශ්‍රිත ගැටළු නිරාකරණය කිරීම.

මෙම නිරීක්ෂණ 272 A ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා ගරු උතුමාණෙනි

ප්‍ර මෙම නිරීක්ෂණයන් වලට ඊට අනුකූලව නිර්දේශයන් ලබා දී තිබේද ?

උ ඔබ හරි.

ප්‍ර නිර්දේශයන් කීයක්ද?

උ නිර්දේශයන් 05 ක්.

ප්‍ර මොනවාද ඒ නිර්දේශ 05?

උ පලවෙනි නිර්දේශය ජාතික ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙයි. මෙම අධ්‍යයනයේදී ඉදිරිපත් කර ඇති ගැටළු සහ නිර්දේශයන් සබැඳිව පහත සඳහන් සියළු ආයතන , අමාත්‍යාශ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ඒකාබද්ධ කාර්ය සාධක බලකායක් පිහිටුවා ගැනීමට කටයුතු කලයුතු ආකාරය පිළිබඳව නිර්දේශ ලබා ගත යුතු බවට යෝජනා කෙරේ. ආරක්ෂක අමාත්‍යාංශය , නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය , විදේශ කටයුතු අමාත්‍යාංශය , මුදල් අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව , ශ්‍රී ලංකා පොලිසිය, නිතිපති දෙපාර්තමේන්තුව , ආගමන විගමන දෙපාර්තමේන්තුව,ශ්‍රී ලංකා රේගුව , සියළු බුද්ධි අංශ

02. සියළු ආගමික නායකයින් සහ ඔවුන් විසින් නම් කරනු ලබන නියෝජිතයන්ගෙන් සමන්විත වන මණ්ඩලයක් වෙත ජාතින් අතර සහ ජීවනය කඩවන ආකාරයේ ආගමික කටයුතු මෙහෙයවන අයවලුන් පිළිබඳව දැනුම් දීම සහ ක්‍රියා කිරීම.

03. විදේශිකයන්,ආගමික දේශන සඳහා ගෙන්වීමේදී රජය සමඟ සම්බන්ධිත අදාල ආගමික සංවිධාන දැනුවත් වීම හා පැමිණෙන අයවළුන් පිළිබඳ එම සංවිධානයේ වගකීම.

04. සංචාරක වීසා මත පැමිණෙන ආගමික දේශණ පවත්වන අයවළුන් සබැඳි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

05. වාස වීසා Residence Visa මත පැමිණ අධ්‍යාපනය හදාරන්නන් සඳහා පමණක් මෙරට තුල අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාවක් ලබා දීමට සහ ඔහු වෙත අනුග්‍රහය දක්වන ආයතන පුද්ගලයන් පිළිබඳ වෙනුවෙන් වගවීම.

එම නිර්දේශයන් 272B ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා .

ප්‍ර ඔබ මෙම නිර්දේශ ?

උ ස්වාමිනි මට අවසර දෙනවා නම් මෙතනදි මට තව එක දෙයක් සඳහන් කල යුතුයි කියලා මට හිතුනා . 2015 ට පෙර මේ යම්කිසි ක්‍රමවේදයක් තිබ්බා මේ විදේශීය කට්ටිය මේ ආගම උගන්වන එකට. ඒකෙදි CNI ට සම්පුර්ණයෙන්ම වගකීම ලබා දීලා තිබ්බා කිසිම කෙනෙකුට වීසා ලබා දෙන්න බැහැ වීසා ලබා දෙනවා නම් අනිවාර්යයෙන්ම ඒ ආගමික නායකයින් ඒ කියන්නේ විශේෂයෙන්ම

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

මේ මුස්ලිම් ආගම පිළිබඳ සම්පූර්ණයෙන්ම ජමතු උලමා සභාව තමයි කටයුතු කරන්නේ ඒ ගොල්ලෝ ඒ නාමලේඛණය අපිට එවන්න ඕනේ අපි ඒ නාම ලේඛණය ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඒ නාම ලේඛණය රාජ්‍ය බුද්ධි සේවාවට හා DMI එකට යැවීමක් කරායින් පස්සේ ඒ ගොල්ලෝ බලනවා අනිකුත් රටවල් එක්ක මේ ගොල්ලෝ ඇවිල්ලා කොහොම කට්ටියද කියලා ඒ clearance එක දුන්නායින් පස්සේ නැවතත් අපි යැව්වායින් පස්සේ තමයි ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් ඒ වීසා එක නිකුත් කරන්නේ .

දෙවනි එක අපි ඒ විදියට අනවසර හිටපු සෑහෙන පිරිසක් අපි ඒ ගොල්ලන්ව ඒ ආගමික නායකයන්ට පවසලා අපි එකවර ශ්‍රී ලංකාවෙන් පිටුවහල් කිරීමක් කලා. ඒ එක්කම අපි තීරණයක් අරගෙන තිබ්බා ශ්‍රී ලංකාවට විදේශ රටවලින් ආගමික කටයුතු කරන්න පුද්ගලයන් අවශ්‍ය නැහැ මොකද ලංකාවේ ඕනේ තරම් ඉන්නවා ඒ කටයුතු කරන්න. ඒ වගේ අපි ක්‍රමාණුකූලව අපි වසරකට යම්කිසි ප්‍රමාණයක් විතරක් සීමා කරලා ඒක ටිකෙන් ටික ටිකෙන් ටික අඩු කිරීමක් අපි යෝජනා කරලා තිබ්බා ඒ එක්කම ඒක හැම ආගමකටම බලපාන විදියට තමයි කටයුතු කරලා තිබ්බේ. නමුත් 2015 න් පස්සේ මේවා ඔක්කෝම වෙනස් වුනා ඊට පස්සේ ඒ කියන්නේ අපිට තිබ්බ control එක නැති වෙලා ඊට පස්සේ කෙලින්ම ආගමික නායකයින් කෙලින්ම වීසා පහසුකම් කෙලින්මම එතනින්ම අරගෙන ඒ ගොල්ලන්ට අවශ්‍ය විදියට කට්ටියව ගෙනල්ලා ආගම ප්‍රචාරය කිරීමට අවස්ථාව ලැබුනා

ඒ ඒක ටිකක් දුරක් ගියායින් පස්සේ තමයි අපි මේ පිළිබඳ අනිකුත් ඒවා වර්ධනය වෙන කොට මේ පිළිබඳව අපි අධ්‍යයනයක් කරලා මේක රජයට ඉදිරිපත් කරේ . මේක තර්ජනයක් වෙන්න පුළුවන් ඒක නිසා මේ විදියේ ක්‍රියාමාර්ගයක් ගන්න කියලා නැවත වරක්.

ප්‍ර මෙම ඔබ මෙම ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්නට යෙදුනු මෙම වාර්තාවන්වලට අමතරව ඔබ අධ්‍යක්ෂක යුද හමුදා බුද්ධි වශයෙන් සිටින විට මෙම ආගමික අන්තවාදය රට තුල ක්‍රියාත්මක වීම අවම කිරීම සඳහා ඔබගේ තනතුරේ සිට ඔබට ගත හැකි පියවරවල් ඔබ ගත්තාද ?

උ ඔබ හරි.

ප්‍ර මොනවද ඒ ගත්ත පියවරවල් ?

උ විශේෂයෙන්ම අපි අර සැලසුම් ඉදිරිපත් කලා. එකක් ඇවිල්ලා නීතිමය වෙනස් වීම් කල යුතු බව. දෙවෙනි එක ඇවිල්ලා engagement එක ඒ කියන්නේ කොහොමද අපි මේ පිරිස හඳුනාගෙන ඒ පිරිස අපි කොටස් කිහිපයකට කැඩුවා. ඒ කියන්නේ Religious Extremism එකේ වැඩිපුරම නැඹුරු වෙච්ච පුද්ගලයින් දෙවනි කොටස ඇවිල්ලා ඒ

FAIR COMMENT BY JEZEEM

නැඹුරු වීමට සහය දක්වන්න පුද්ගලයෝ, තුන්වෙනි කොටස ඇවිල්ලා එවැනි සහාය දැක්වීමත් එක්ක ඉදිරියේදි ඒකට යොමු වෙන්න පුළුවන් පුද්ගලයෝ හතරවෙනි එක ඇවිල්ලා ඔවුන්ගේ දෙමව්පියන් සහ ඒ ගොල්ලන්ගේ අනිකුත් ඥාතින් පිළිබඳව . මේ අනුව ඒ engagement එක අපි ඇත්තටම රජයේ අනුමතිය එනකල් හිටියේ නැහැ අපි මේ ගොල්ලන් එක්ක නිරන්තරයෙන්ම සම්බන්ධවීම් කලා. ඒ සම්බන්ධවීම් කිරීමේදි විශේෂයෙන්ම JMI එක සංවිධානයට ඇතුලට ගියාම පස්සේ ඒ තුලින් ඒ ගොල්ලන් කරන්න උත්සාහ ගත්තා මේගොල්ලෝ නැවත වරක් මේ පුද්ගලයන්ව recruit කරන්න ඒ recruit කිරීමේදි අපිට වළක්වාගන්න හැකියාව ලැබුනා මොකද ඒ ගොල්ලෝ යොමු වෙච්ච පුද්ගලයෝ අපි social media සහ ඒ සාකච්ඡා වලින් හඳුනාගෙන ඒ දෙමව්පියන්ට අපි වක්‍රාකාරව කථා කරලා ඒ ළමයි පිළිබඳව මීට වඩා අවධානයෙන් කටයුතු කරන්න කියලා ඒ දෙමව්පියන්ව දැනුවත් කිරීමක් කළා. ඒ සමඟම සමාජ මාධ්‍ය සමාජ ජාලය ඔස්සේ අපි විශේෂ ක්‍රියාන්විත ගොඩක් අපි යොමු කලා විශේෂයෙන්ම ඒ තවදුරටත් එන කණ්ඩායම් ඇතුලට රිංගලා , ඒ කණ්ඩායම් යම්කිසි සැකයකට භාජනය කරලා , ඒ ඊට පස්සේ ඒ අතරින් ඒ ගොල්ලන්ව සම්පූර්ණයෙන් අයින් කරන්න . ඒ විදියට අපි ඒ පැත්තෙන් ඒ process එක ගියා. ඒ එක්කම විශේෂයෙන්ම මෙතනදි අපි මේකට ISIS සංවිධානයට 37 දෙනා එකට ගියායින් පස්සේ ඊට පස්සේ ගරු ස්වාමිනි කව්රුත් ගියේ නැහැ. ඒකට හේතු වුනේ මේ 37 දෙනාගෙන්ම අපි immediately මේ ගොල්ලන්ගේ පවුල් වල කට්ටියත් එක්ක අපි engagement එකකට ගියා. ඒ ගොල්ලන්ගේ දෙමව්පියන් ඒ ගොල්ලන් ගේ අක්කලා ඒ ගොල්ලන්ගේ අක්කලාගේ ළමයි ඔය විද්‍යාල වල කෙලින්ම අපි සම්බන්ධ වෙලා මේකේ විශේෂයෙන්ම බැරෑරුම් කම අපි ඒකේ සඳහන් කරලා දීලා අපි ඒ ගොල්ලන්ව යම්කිසි නියාමනයකට ලක් කලා. ඒ එක්කම තුර්කියේ එම්බසි එකට ගිහිල්ලා මොකද මේ 37 දෙනාම ගිහිල්ලා තිබ්බේ Turkish Visa අරගෙන තුර්කියට යනවා කියලා තමයි කියලා තිබ්බේ නමුත් ඒ අවස්ථාවේදි තුර්කි එම්බසි එක දැනගෙන හිටියේ නැහැ මේ ගොල්ලෝ යන්නේ මේ ආකාරයට කියලා අපි ඊට පස්සේ ඒ ගොල්ලන්ට පැහැදිලි කරලා නැවත වරක් වීසා දෙන්න එපා කියලා අපි ඒ ගොල්ලන්ගෙන් ඉල්ලිමක් කලා මේ කවුරු හරි ඉල්ලිමක් කරනවා නම් අපිට ඒ ලේඛණය ලබා දෙන්න කියලා අපේ ලේඛණය අපි ඒ ගොල්ලන්ට ලබා දීමක් කරා

ඒ සමගම මේ 37 දෙනාම යන කොට අවස්ථා තුනකදි මේ 37 දෙනා අවස්ථා තුනකදි හෝ හතරකදි ගියත් මේ 37 දෙනාම සම්පූර්ණයෙන්ම පරිපාලනය සහ ගුවන් ටිකට් පත් ඔක්කොම අරගෙන දීලා තිබ්බේ

FAIR COMMENT BY JEZEEM

එක්තරා Travel Agent කෙනෙක් . ඒ ට්‍රැවල් ඒජන්ට් මුදලට තමයි වැඩ කරලා තියෙන්නේ . අපි ඒ Travel Agent අපි ගත්තා ඒ Travel Agent අරගෙන නීතිය මගින් අපිට ක්‍රියා කරන්න හැකියාවක් තිබ්බේ නැහැ . නමුත් අපි කිව්වා කිසි කෙනෙක් මීට පස්සේ යන්න බැහැ යන්න කව්රු හරි ඉල්ලිමක් කලොත් අපිට ඒක ලබා දීමක් අපිට සිදු කරන්න කියලා . ඒ එක්කම අපිට සම්බන්ධ කව්රු හරි කටයුතු හම්බ වෙනවා නම් අපි ඒ තොරතුරු වන් Vulnerable කට්ටිය අපි ඉන්දියාව සහ අනිකුත් රටවල් වලට ලබා දුන්නා මේ ගොල්ලන්ගේ යම්කිසි movement එකක් ඒ රටවල් වලින් හෝ මෙහෙම යන්න පුළුවන් නම් ඒවා වැලැක්වීමට පියවර ගන්න විශේෂයෙන්ම මේ ගොල්ලන් මේ පවුල් වලට සම්බන්ධ සහ Vulnerable Community කියලා එතකොට යුධ හමුදා බුද්ධි අංශයක් හැටියට අපි ඒ පැත්තෙන් engagement එක අපිට හැකි ආකාරයෙන් පුළුවන් උපරිමයෙන් අපි කලා. ඒ කිරීම තුලින් අපි ප්‍රතිඵල දැක්කා මොකද 37 දෙනාට පස්සේ ස්වාමිනි කවුරුත් ගියේ නැහැ සිරියාවට මගේ දැනුම අනුව. ඒ එක්කම ගොල්ලෝ ජමාති JMI කියන සංවිධානය අනික් රටවල් එක්ක සම්බන්ධතාවයක් ඇති කරගන්න උත්සාහ ගන්නකොට අපි ඒ සම්බන්ධතාවය සම්පූර්ණයෙන්ම කඩා කප්පල් කරන්න අපි යොමු වුනා . ඒවාට අධ්‍යයනය කරලා ඒ එන එක නවත්වන්න. ඒ එක්කම මේ ගොල්ලෝ වෙනත් තරුණ පිරිස් විද්‍යාලවල එක්ක සම්බන්ධතා ඇති කර ගන්නකොට අපිට ඒ සම්බන්ධවයනුත් අපිට ඒවා අඳුනාගෙන අපේ අනන්‍යතාවය ආරක්ෂා වන පරිදි අපි ඒවා නැවැත්වීම් කලා.ඉතින් අපිට ඒ විදියට engagement process එක පුළුවන් උපරිමයෙන්ම අපි 2015 ඔක්තෝබර් ඉදන් 2016 නොවැම්බර් වෙන තාක් කල් කලා . ඉතින් එතන දී අපි කරන ගමන් තමයි අපි පුළුවන් තරම් අපි කිව්වේ නීතිමය පැත්ත වෙනස් කරන්න මේ Extreme ඉන්න කට්ටියට system එකක් හදන්න මොකද සමහර කට්ටියව අපිට එහෙම engage කරන්න බැහැ. දැන් JMI එකට engage කරන්න බැහැ ඒ ගොල්ලන්ට යම්කිසි නීති පද්ධතියක් තියෙන්න ඕනේ. ඒ පැත්තෙන් අපි push කලා පුළුවන් තරම් ඒක කරන්න කියලා නමුත් ඒක සිද්ධ වීමක් සිද්ධ වුනේ නැහැ. ඉතින් අවසානයේදි ඒ මේ ක්‍රියා මාර්ග නොගැනීම තුලින් පසු කාලිනව මේක 2017 දි සහරාන්ලා වගේ පුද්ගලයෝ වර්ධනය වෙලා මේ ගොල්ලන්ට හැකියාව ලැබුනා මේ සංවිධාන වලත් වෙනත් මත දරන කට්ටියව ඒකට එකතු කරලා ගන්න ඒ එක්කම අපිට අපේ network එකට වැටිච්ච නැති සංවිධානයක් තිබ්බා save the pearl කියන එක . ඒක මන්දන්නේ නැහැ සුදුසුද කියන එක ගරු සභාව ඉදිරියේදි ඒ save the pearl එකත් ඇවිල්ලා මේ JMI වගේම

FAIR COMMENT
BY JEZEEM

බිහිවෙච්ච තව සංවිධානයක් හැබැයි එවකට අපිට මේ සංවිධානය පිළිබඳව කිසිම දැනුමක් තිබ්බේ නැහැ ඒකට හේතුවක් තිබ්බා මොකක්ද ඒකට ඒ save the pearl එක ඉතාමත්ම ඒ කියන්නේ ඉතාමත්ම පරිස්සමින් welfare organization හැටියට ඇතිවෙච්ච බිහිවෙච්ච සංවිධානයක්. හැබැයි ඒ save the pearl එකෙන් සෑහෙන පිරිසක් ඒ කියන්නේ ඊබ්‍රාහිම්ගේ පුත්තු දෙන්නා ජමිල් සහ ජමිල් ගේ මල්ලි මේ 4 දෙනාම බිහිවෙන්නේ save the pearl එකක් කියන එකකින් .එතකොට මේ save the pearl එකක් එක්ක තමයි ඊබ්‍රහිම් කියන හිස්බුල්ලා ඉජාස් හිස්බුල්ලාත් එයත් තමයි මේක ඇවිල්ලා president. ඊට පස්සේ ඒ මුල් අවස්ථාවලදි මේකේ මේ සංවිධානයේ 2015 වසරේදි අපිට ඇහැ ගැටෙන්නේ නැති වුනාට ඒ කටයුතු වෙන්නේ ඇවිල්ලා ආගමික සංවිධානයක් හැටියට ඒක මුහුණ දුන්නේ නැහැ ඒ ගොල්ලන් කටයුතු කරන්නේ ඇවිල්ලා විශේෂයෙන්ම welfare society යක් හැටියට එතකොට මුල් කාලයේදි මේකේ meetings තියෙන්නෙත් ඇවිල්ලා ජමිල් ගේ ගෙදර .

ප්‍ර ජමීල් ගේ ගෙදර කියන්නේ ජමිල් ගේ සහෝදරයාගේ ගෙදරද ? ජමීල් ගෙදරද ?

උ ජමීල් ගෙදර . ජමීල් සහෝදරයයි දෙන්නම එකයි ඒ දෙන්නම හිටියේ ඇවිල්ලා ඊබ්‍රහිම් ගේ ගේ ඉස්සරහ තියෙන ගෙදර දෙමටගොඩ. එතකොට ඒකේන් පස්සේ නැවත වරක් මේකේ ඉන්න එක suicide carder කෙනෙක් ඊබ්‍රහිම් ගේ එක පුතෙක් මේ සංවිධානය හරහා ඉඩමක් පරිත්‍යාග කරනවා orphanage එකක් හදන්න කියලා.ඒ orphanage එක හදන්න ඇවිල්ලා මුස්ලිම් ඉස්කෝලයක් හැටියට හදන්නේ පුත්තලමේ.එතකොට ඒ ඉඩම පරිත්‍යාග කරන්නේ ඇවිල්ලා ෂැන්ග්‍රිලා බොම්බය ක්‍රියාකරපු ඒ පුද්ගලයා තමයි මේකට දෙන්නේ.ඒ එක්කම මේ ඉස්කෝලේ හැදුවම මේ ඉස්කෝලේ තුල සම්පුරණයෙන්ම ළමයින්ය ගන්නේ අම්මා හෝ තාත්තා නැති, එහෙම නැත්නම් අම්මා නැති තාත්තා නැති, එහෙම නැත්නම් සම්පුර්ණයෙන්ම උගන්වන්න බැරි යම්කිසි ළමා පිරිසක් තමයි මේකට ගන්නේ එතකොට මේ ළමා පිරිසට ඇවිල්ලා lectures වලට එනව සහරානුත් එනවා මෙතෙන්ට. ඊබ්‍රහිම්ලත් එනවා. ඉජාස් කියන මේ Lawyer ත් එනවා මේ ආයතනය තුලත් අපට හම්බ වුනා පොත් ඒ පොත්වල බැලුවාම ඉතාමත්ම සංවිධානාත්මකව ඒ ළමා මනස විකෘති වන ආකාරයට ඒ පොත් හදලා තියෙනවා පොත් 35 ක් අපිට හම්බ වුනා ඒවා අපි කෙලින්ම රජයට දුන්නා අපි Translate කරන්න ලබාදීලා දැන් ඒක උසාවියට ඉදිරිපත් කරලා තියෙනවා ඒකේ ව්‍යුහය ගන්න කොහොමද මේකේ වෙන්නේ කියලා .ඉතින් මෙතනදි අපි සහරාන්ලා එක පැත්තකින් ක්‍රියාත්මක වෙන කොට සහරාන්ලාව බිහි

FAIR COMMENT BY JEZEEM

කරන්න අනිකුත් අනික් රටවල් වගේ අනිත් රටවල්වත් ඇවිල්ලා ඒ කියන්නේ දීර්ඝ කාලින සැලසුම් තියෙන්නේ මේ වගේ මධ්‍යස්ථාන හදාගෙන නීතිමය පහසුකම් ලබා දිලා ඒකට අවශ්‍ය කරන මාධ්‍ය ටික මේවා කරලා, සල්ලි ටික මේවා කරලා ඒ සැලසුමුත් මේ පිටිපස්සේ තිබ්බා. ඉතින් අපි අද ගොඩාක් කටයුතු කරන්නේ මං දකින්නේ අපි කටයුතු කරන්නේ ඇවිල්ලා මේ සහරාන් සහරාන් ගේ ක්‍රියාකාරිත්වය සහරාන් ගේ explosive ගැන එතකොට සහරාන් එක්ක සම්බන්ධ වෙච්ච කට්ටිය පමණයි. නමුත් මේ සහරාන්ලා බිහි වුණේ කට්ටිය කොහොමද කියන එක අපි ලොකු අවධානයක් යොමු වෙන්නේ නැහැ එතකොට සහරාන්ලා බිහි වෙන කොට සහරාන් ගේ කණ්ඩායමේ ඉන්න suicide cadres ලා තුන් දෙනෙක්ම බිහි වෙන්නේ save the pearl එකෙන්. එතකොට save the pearl එකෙන් බිහි වෙන්නේ කොහොමද ඒ ගොල්ලෝ ඒ ගොල්ලෝ හොඳට ඉගෙන ගත්ත පුද්ගලයෝ ඒ සමහර ඉගෙන ගත්ත පුද්ගලයෝ. ඒ ගොල්ලෝ තෝරා ගන්නවා ස්වර්ගය ට යන්න ඒ ideology ත් එක්ක සමහර ඉගෙන ගත්ත පුද්ගලයෝ ඒ ගොල්ලෝ තෝරාගන්නවා ඒ ගොල්ලන් ස්වර්ගයට යන්නේ නැහැ නමුත් ස්වර්ගයට යන්න මිනිසුන්ව ඒ යොමු කිරීම් කරනවා .ඉතින් එතනදී ප්‍රධානත්වයක් අපි දකින්නේ ideology එක එතකොට ideology එකේදි මේ ඉන්න නීතිය පිළිබඳ හදාරපු මේ පුද්ගලයා 2015 ඉදන් අවසානය දක්වාම මේ suicide cadres තුන්දෙනත් එක්කම නිරන්තරයෙන්ම දුරකථනයෙන් සම්බන්ධ වීමක් සිදු වෙනවා . පනස් වතාවක් විතර ඔය තුන්දෙනත් එක්කම . ඒ එක්කම ඔය තුන්දෙනා හිටපු සාමාජිකත්වය දරපු save the pearl එකේ president ඉන්නෙත් මේ පුද්ගලයා . එතකොට මාවනැල්ල බුදු පිළිමය කඩලා ඊට පස්සේ ඒකෙදි සහරාන් ලක්ෂ 17 ක් දෙනවා තව කණ්ඩායමකට එතකොට ඒ කණ්ඩායම හරහා මේ Lawyer තවමත් lawyer කෙනෙක් හරහා account එකකට ඒ සල්ලි ටික අරගෙන ඒ සල්ලි ටික යොදවා ගන්නවා supreme court එකේ කේස් එකක් ගියොත් . ඒ එක්කම අපි දැක්කා මේ ප්‍රධාන ලෝයර් ඇවිල්ල supreme court එකේ ඇවිල්ලා ඒ දවස්වල ප්‍රතිත්‍රස්තවාදි පිළිබඳ draft එක එනකොට එයාගෙම කෙනෙක්ව ඉදිරිපත් කරලා ඒකට මුස්ලිම් අන්තවාදය මේ ත්‍රස්තවාදිත් එක්ක සම්බන්ධ කරන්න එපා කියලා එයා එයාගේ opinion එකක් ගෙනල්ලා ඒකට විරුද්ධව කටයුතු කිරීමක් සිදු කරනවා .FR එකක් දාලා.ඊට අමතරව මෙතනදි ඔය සහාරාන්ගේ මාවනැල්ල බුදු පිළිමයේදි මේ අහුවෙච්ච මිනිසුන්ව තවත් එයාගේ junior කෙනෙක් හරහා නඩු කොහොමහරි මේවා ටික කරලා ඒ ගොල්ලන්ව බේරා ගන්න ලොකු වෑයමක නිරත වීමක් සිදු වෙනවා.මේක දුරකථන අංක මගින් E mail

FAIR COMMENT
BY JEZEEM

මගින් සහ physical සම්බන්ධතා මේ ඔක්කොම කරලා සිදුවීම් වෙන සතියේදි එයා යනවා ඊජිප්තුවට.ගිහිල්ලා නැවත වරක් එන්නේ ලංකාවට ඊට පස්සේ. එතකොට මේ ජමිල් කියන පුද්ගලයා ගේ මල්ලි තවම දැන් අඩංගුවේ පසුවෙනවා CID එකේ එයා සියළුම ප්‍රකාශයන් කරනවා කොහොමද මේ සම්බන්ධය වුනේ කියලා. ඒ එක්කම ළමයි 10 දෙනෙක් දැනට ප්‍රකාශ කරලා තියෙනවා මේ ගොල්ලෝ කොහොමද ඒ ඇවිල්ලා lectures දුන්නේ කොහොමද ආදි වශයෙන්. ඉතින් ඇත්තටම අපි දකින්නේ මේකේ එක්තරා එක පැත්තකින් අපි දකින්නේ ඇවිල්ලා සහරාන් සහ suicide cadres සහ අතර ඒක විතරයි.නමුත් ලෝකයේ ගොඩාක් දුරට treat through කරන්න බැරිවෙලා තියෙන්නේ මේ ideology එක.මේ ideology ත් එක පතුරවන මිනිස්සු තමයි භයානක මිනිස්සු මොකද ඒ ගොල්ලන් ඇවිල්ලා මේ මධ්‍යකාලින සහ දීර්ඝකාලින සැලසුම් එක්ක මේ වගේ කණ්ඩායම් බිහි කිරිම තමයි ඒ ගොල්ලන්ගේ අවශ්‍ය කරන පහසුකම් වෙන්නේ. හැබැයි හැබැයි ඒ ගොල්ලන්ට උගත් කට්ටිය හැබියා එකම පුද්ගලයාට මේ පුද්ගලයාට මුහුනුවර 07 ක් තියෙනවා කියලා මම දකින්නේ එක පැත්තකින් ඉතාමත්ම ප්‍රසිද්ධ නීතිවේදියෙක් අනිත් පැත්තෙන් ඉතාමත් ප්‍රසිද්ධ educationist කෙනෙක් , එයාටම විද්‍යාලයක් තියෙනවා ඒ කියන්නේ එයාගේ තාත්තා විසින් කරන එක එයා ඒකේ සාමාජිකයෙක් ඒත් එක්කම තව පැත්තකින් ඇවිල්ලා ආගමික කටයුතු පිළිබඳව ඒ වෙනුවෙන් පෙනි සිටින පුද්ගලයෙක් ඒ එක්කම ඇවිල්ලා සිවිල් සංවිධාන කටයුතුවල human right activist කෙනෙක් ඊට අමතරව businessman කෙනෙක් . මේ අති විශාල මුහුනු සංඛ්‍යාවක්ම තියෙනවා.ඒ එක්කම අපි දැක්කා මීට කලින් පිටරට අපිට වල්වලින් අපිට තොරතුරු ලැබිලා තිබ්බා මේ පුද්ගලයා මෙහෙම පුද්ගලයන් දෙන්නෙක් ඉන්නවා ලංකාවට ඇවිල්ලා මේ ගොල්ලන්ගේ ඇවිල්ලා සහෝදරයන්ලා suicide cadres ලා මේ ගොල්ලන් අත් අඩංගුවට අරන් තියෙනවා ඒ ගොල්ලන් පිළිබඳව ඉක්මනටම මේ ගොල්ලන්ව deport කරලා එවන්න කියලා අපි ඒ අවස්ථාවේ දි ඒ ගොල්ලන් එක්ක සම්බන්ධ වෙනකොට මේ නීතිවේදියා දුරකථන මගින් ඒ අවස්ථාවේ සම්බන්ධවීම් අපි දැක්කා. ඉතින් එහෙම තියන වාතාවරණයක් අනුව මේ ගොල්ලෝ අර ගොල්ලෝ JMI කියන සංවිධානය ඉතාමත්ම නම කිව්වාම JMI කිව්වාම යම්කිසි සැකයක් ඇති වෙන හින්දා මේ ගොල්ලන් කිව්වා save the pearl ලගෙ සංවිධානය ඒ කියන්නේ save the pearl කියන්නේ ලංකාව ආරක්ෂා කිරිම හැබැයි ලංකාව ආරක්ෂිත කිරීමක් නෙවෙයි මේකේ වෙන්නේ මතවාදය අවශ්‍ය කරන කණ්ඩායමක් එකතු කරලා ඒ මතවාදයට යන්න මේකක් හැදෙන

FAIR COMMENT BY JEZEEM

එක.ඊට පස්සේ පසු කාලිනව අපි දැක්කා ජනවාරි මාසේ මේ අවුරුද්දේ Awaking Sri Lanka කියලා media සංසන්දනයක් ඇති කරලා ඒකෙන් මේ lawyer තම ප්‍රධාන එක ගත්තේ එතුමා කිව්වා ඇවිල්ලා මුස්ලිම්වරු හැම තිස්සේම පිටිපස්සට ගිහිල්ලා තියෙන්නේ මුස්ලිම් වරුන්ටම කියලා කෙලින්ම TV station එකක් නහැ YouTube channel එකක් නැහැ. ඒක නිසා සියළු දෙනා එක්වෙලා අපි මේ ඉස්සරහට තියෙන අභියෝගයන්ට මුහුණ දෙන්නනම් අපි මේ වගේ නීති පද්ධති හදා ගන්න ඕනේ. මේ වගේ TV channels හදා ගන්න ඒනේ මාධ්‍යයට ලොකු කාර්ය භාරයක් තියෙනවා ඒ ආදි වශයෙන් ලොකු එක් රැස්වීමක් කරා. ඒ එක් රැස්වීම කරන්න තමයි අපේ අවධානය යොමු වුනෙ එතනදි meetings දෙකකුත් තිබ්බා.ඉතින් මේක ගත්තාම අපි විශේෂයෙන්ම අපි මේ පැත්තට ඉන්නවා යොමු කිරීම ගමන්ම අනිත් පැත්තෙන් යන්න අපේ නීති පද්ධතිය ගොඩාක්ම weak ඒ කියන්නේ අපේ investigators ලත්ගොඩක් weak මොකද මෙතෙන්ට යන්න බයයි. FR එකක් වැටෙයි එහෙම නැත්නම් මේක ඇවිල්ලා ඉතාමත්ම මම හිතන්නේ ගරු නීතිවේදින් ගොඩක් ඉන්නවා නමුත් ඒ ගොල්ලෝ සමහරවිට මේ ගොල්ලන්ගේ ක්‍රියාකාරකම් දන්නේ නැතිව ඇති මේ ගොල්ලන් වෙනුවෙන් පෙනි සිටින්න කට්ටියක් ඉන්නවා මේ ගොල්ලන්ගේ සැබෑ දකින ්දර්ශණයනෙවෙයි අභ්‍යන්තර දර්ශණය ඉතින් අපි සමහර වෙලාවට බස් එකට ටිකට් එක බුක් කරන පුද්ගලයාවත් අපි ලොකුවට පත්තරේ දාලා එයාව අත් අඩංගුවට ගැනීමක් සිදු කරනවා නමුත් එතකොට මේ වගේ ඉගෙන ගෙන 2015 ඉදන්ම suicide cadres 3 දෙනෙක් එක්ක නිරතුරුවම දුරකථනයෙන් සම්බන්ධ වෙලා ඒ එක්කම මේ save the pearlකියන සංවිධානය අරගෙන save the pearl කියන සංවිධානය අරගෙන මේ suicide cadres ගේ ඉඩම 2017 දි අර ගෙන ඒක ඉස්කෝලයක් අරගෙන ඒ ඉස්කෝලේ ළමයිව අර විදියට මේවා කරලා ඒ එක්කම මෙතුවා තව එකක් කියනවා එතුමාගේ දුරකථන ඔක්කොම කුණු බක්කියට දැම්මා කියලා මොකද එතුමා පාවිච්චි කරන දුරකථන වලට අමතරව අපිට ගොඩක් දත්ත ගන්න පුළුවන් විශේෂයෙන්ම ඇපල් ෆෝන් දෙකක් තිබිලා තියෙන්නේ ඒ දෙකම එයා පාවිච්චි කරන්න සුදුසු නැහැ කියලා එයා කියනවා ඒක dustbin එකට දැම්මා කියලා . මේ විදියට ඉතාමත්ම සූක්ෂම ආකාරයෙන් තමයි ඒ ගොල්ලෝ කටයුතු කරලා තියෙන්නේ. ඉතින් අපි එක පැත්තකින් සහරාන්ලාට යනකොට මේ පැත්තටත් අපිට අනිවාර්යයෙන්ම යන්න සිද්ධ වෙනවා මොකද මේ ගොල්ලෝ ඉන්නතාක් කල් මේ මතවාදය අපිට වෙන් කරන්න බැහැ. ඒක අපි පැහැදිලිවම 2015 ඉඳන්ම මේ save the pearl එක පිහිටු වන්නෙත්

FAIR COMMENT
BY JEZEEM

2015 වසරේ. එතකොට සහාරාන්ලා අර පැත්තේ JMI බිහිවෙනකොට එතකොට ඊබ්‍රහිම්ලේ ළමයිනුයි ඒජමීල්ලයි ජමීල්ගේ මල්ලියි එතකොට මේ දැන් අත් අඩංගුවේ ඉන්න සෑහෙන පිරිසක් සාමාජිකයන් ඉන්නේ save the pearl කියන ආයතනයෙන් . save the pearlකියන ආයතනය ඇවිල්ලා අපිට JMI එක ගන්නවා save the pearl එක ගන්නවා ඉතින් ඊට පස්සේ NTJ එක ගන්නවා එතකොට මේ ගොල්ලොන් ඇති කරලා තියෙන මේ ගොල්ලොන්ගේ දැනුම සහ මේ ගොල්ලන්ගේ වෘත්තිය හැකියාව එතකොට පිටරටත් එක්ක තියෙන සම්බන්ධතාවය මේ එක්කොම ටික මුල් කරගෙන ඒ ideology එකත් ඉදගෙන කිසිම කෙනෙකුට ලංවෙන්න බැරි වෙන විදියට මේ ටික කරගෙන යනවා ඉතින් මේක නිසා අපිට ලොකු පරිශ්‍රමයක් දරන්න වුනා මේ ගොල්ලෝ නීතිය හමුවට ඉදිරිපත් කරන්න ඒ හමුවට ඉදිරිපත් කිරිම වූ පමණක් නෙවෙයි නීතිය හමුවට ඉදිරිපත් කලාට පස්සේ ඒ වෙනුවෙන් කතා කරන්න අති විශාල පිරිසක් එකතු වෙලා හිටියා නමුත් දැන් ගොඩක් දේවල් එලියට ඇවිල්ලා තියෙනවා මේ ලක්ෂ 17 හම්බ වෙච්ච මුදලත් ඇවිල්ලා එයාගේ junior lawyer කෙනෙකුට තමයි ඒක කියලා තියෙන්නේ supreme court එක ගියොත් මේ කේස් එක කරන්න කියලා ඊට පස්සේ එයා එයාගේ තව ලෝයර් කෙනෙකුට කියලා account එකක් open කරලා ලක්ෂ 17 අරගෙන එයාට යම්කිසි මුදලක් දිලා එයා ඒ මුදල අරගෙන තියෙනවා . ඒ එක්කම ඒ email මාර්ගයෙන් මේ ගොල්ලන් සම්පුර්ණම මේවා කරලා තියෙනවා මේ මාවනැල්ල කේස් එකේදි සාකච්ඡා කරන්න එන්න ඒ කට්ටිය වෙනමම එන්න ඔයාගේ through එන්න කියලා ඒ විදියට email ගනු දෙනු කරලා තියෙනවා ඒ එක්කම මාවනැල්ල කේස් එකේදි අහුවෙච්ච අම්මලා තාත්තලා ඒ ගොල්ලෝ පිලිගන්නවා ඒ ඒගොල්ලෝ කොළඹට ඇවිල්ලා කොළඹට ආවාට පස්සේ ඉජාස්ව තමයි හම්බ වෙන්න ගියේ කියලා . ඉතින් අපි කියන්නේ නිති වේදියෙක් හැටියට හංඟලා කරන්න ඕනේ නැහැ එයාට පුළුවන් ප්‍රභාකරන් වෙනු වෙන් උණත් පෙනි සිටින්න ඉතින් මේ ඒ වගේ ක්‍රමවේදයක් එයාට අනුගමනය කරන්න ඕනේ නැහැ කියන එකකුත් ඒ එක්කම මේ ඔය ඉස්කෝලේ හදන්න මුදල් පාවිච්චි කරලා තියෙනවා මිලියන 4000 ක් ඇවිල්ලා තියෙනවා Qatar fund Qatar charity කියලා මිලියන 4000ක් ඒ ගැන අපි විමර්ෂණය කරගෙන යනවා ඒක ලෝකේ රටවල් දැනට කීපයකම තහනම් ඊශ්‍රායල, බහරේන් . වල සහ තව රටවල් කිහිපයකම තහනම් Qatar charity එතකොට ඒකෙන් අපි දැන් ඔක්කෝම විමර්ෂණය කරගෙන යනවා නමුත් ඒකෙන් ලක්ෂ 30 ක් ඇවිල්ලා තියෙනවා මේ ලෝයර්ට. එයා ඒක හරහා තමයි මේ ඉස්කෝලේ හදලා තියෙන්නේ ඉතින්

FAIR COMMENT BY JEZEEM

එතකොට මේක ඊට පස්සේ incident එක වෙලා මාස දෙකකින් සම්පූර්ණ ඉස්කෝලේ වහනවා ඒ ළමයිවත් එක්ක ඔක්කෝම ටික වහනවා . මේ ඔක්කොම ටික කාරණා ටික එකතු කරගන්න එක CID ආයතනයයි තියෙන්නේ නිළධාරි පිරිසත් හරිම සීමිතයි. ඉතින් එතකොට ඔය හිටපු නිළධාරි ත් ඇවිල්ලා විවිධාකාර ප්‍රශ්න වලට හිටපු නිළධාරින් ඉතින් මෙතනදි මේ විමර්ෂනය කිරිමේදි අපිට මුහුණ දෙන්න වෙලා තියෙන්නේ අතිවිශාල ලෝයර්ස්ලාගේ ගණනාවක් එක්ක ඉතින් ඒක නිසා ලොකු පරිශ්‍රමයක් අපිට දරන්න වුනා මේ සත්‍ය මිනිසුන්ට එලි කරන්න සහ මේ මැරිච්ච මිනිසුන් වෙනුවෙන් අපි justification එකක් කරන්න මට බුද්ධිමය පැත්තෙන් මටනම් හිතාගන්න ඉතාමත්ම පැහැදිලියි කොහොමද මේ හැම කෙනෙක්ගෙන්ම මේ සම්බන්ධය, ඒ ගොල්ලන්ගේ ක්‍රියාදාමය සහ ඒ ගොල්ලන් කරපු ක්‍රියාවලිය, ඉතින් ඉදිරියේ දි මම මේක කේස් එක යන නිසා මේක ඉදිරියේදි ස්වාමීනි ඉදිරියේදි මේක උසාවියේදි ඔප්පු වෙයි මේ ගොල්ලන්ගේ සැබෑ මුහුණ මොකක්ද කියන එක ඉතින් ඒ පිළිබඳව දැනට CID එක කටයුතු කරගෙන යනවා .

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ඔබගේ සාක්ෂිය අපි නැවතත් තව ස්වල්ප වේලාවකින් පසු ගන්නම් අපි කෙටි විරාමයක් ගන්නවා

කොමිෂන් සභාවේ කටයුතු ප.ව. 4 පසුවී විනාඩි 15 ට නැවත පටන් ගන්නවා

මින් පසු සටහන් ගැනීම ල/ලේ ඉන්ද්‍රානි මිය.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 4.30 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

තේ විවේකයෙන් පසුව නැවත කොමිෂන් සභාව ප.ව. 4.30 ට රැස් වේ.

(සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි)

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා :

ප : ඔබ ප්‍රකාශ කර සිටියා මෙම මතවාදය අන්තගාමී ආගමික මතවාදය මුස්ලිම් අන්තවාදී ආගමික මතවාදය රැගෙන යන පුද්ගලයන් සම්බන්ධයෙන් ඔබ දැන් සාක්ෂි දෙමින් කියා සිටියා. දැන් සාක්ෂිකරු ඔබ එහිදී හඳුන්වා දුන්නා මධ්‍යකාලීන හා දීර්ඝකාලීන මතවාදය රැගෙන යන්නන්. එසේම ඒ කියන්නේ කෙටිකාලීනව මතවාදය රැගෙන යන ඒ මතවාදය වෙනුවෙන් කැප වෙන අයත් ඉන්නවද?

පි : ඔව්.

ප : ඔබට උදාහරණයක් කියන්න පුළුවන්ද දේශීයව හෝ ගෝලීය වශයෙන් මේ කෙටිකාලීන අන්තවාදී අදහස් රැගෙන යන්නන් සම්බන්ධයෙන්?

පි : ඔව්. කෙටිකාලීනව රැගෙන යන්නන් තමයි ඔය සහරාන් වගේ පුද්ගලයෝ. මොකද ඒගොල්ලෝ තමයි අපි ඇහැට දකින්නේ. ඒගොල්ලෝ කෙටිම මාර්ගයෙන් ඒ ආගමික මතවාදය අන්තෙටම ගිහිල්ලා අන්තවාදයට ගිහිල්ලා, ප්‍රචණ්ඩකාරිත්වයට ගිහිල්ලා ඒගොල්ලෝ තමයි කෙටිකාලීනව යන පිරිස්.

ප : එතකොට ඒ කෙටිකාලීනව යන පිරිස් කවුරුන්ද යන්න හෙළි කර ගැනීමටද පහසු? මේ මධ්‍යකාලීන සහ දීර්ඝකාලීනව මේ අන්තවාදී ආගමික අදහස් සහිතව ක්‍රියා කරන්නන්ද හඳුනා ගන්න අමාරු?

පි : ඇත්තටම ගොඩක් අපහසු ඇවිල්ලා මධ්‍යකාලීන සහ දීර්ඝකාලීන. මොකද කෙටිකාලීන කට්ටිය අපට ඇහැට පේනවා. ඒගොල්ලෝ කථා කරනවා. ඒ එක්කම ඒගොල්ලන්ගේ ඉතාමත්ම පැහැදිලිව ඒගොල්ලන්ගේ අදහස් ප්‍රකාශ කරනවා. ඒගොල්ලන් තමයි ක්‍රියාවට නංවලා අපේ නීති පද්ධතිය සියළු දෙනාම යොමුවෙලා තියෙන්නේ ඒ පුද්ගලයෝ පිළිබඳව සොයා බැලීමටත්, ඒ පුද්ගලයන්ගේ සම්බන්ධතා පිළිබඳ සොයා බැලීමත් පමණයි. නමුත් මධ්‍යකාලීන සහ දීර්ඝකාලීන පුද්ගලයන් පිළිබඳව අපේ අවධානය යොමු වෙන්නේ නැහැ. අවධානය යොමු වුණොත් ඔවුන් එතනින් නීතිමය පැත්තෙන් ගැළවෙන්න පුළුවන් ආකාරයට

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ඉතාමත්ම ශක්තිමත්ව තමයි ඒ මධ්‍යකාලීන සහ දීර්ඝකාලීන පුද්ගලයෝ සහ සංවිධාන ගමන් කරන්නේ.

ප්‍ර : ඔබ පෙර සාක්ෂි දෙන අවස්ථාවේදී කියා සිටියා මේ මධ්‍යකාලීන මතවාදය රැගෙන ගිය නීතීඥවරයෙක් ගැන?

පි : ඔබ හරි.

ප්‍ර : ඊට අමතරව වෙනත් පුද්ගලයන් ඔබට මේ අවස්ථාවේදී මේ ගරු සභාවට හෙළි කිරීමට හැකියාවක් තියෙනවද? වෙනත් නම් තියෙනවද? තියෙනවා නම් ඒ නම්?

පි : ඔව්. දැන් මම හිතන්නේ දැනට ඒ පිළිබඳව විමර්ශනය කරගෙන යනවා. විශේෂයෙන්ම ඒ මධ්‍යකාලීනව සම්බන්ධ වෙච්ච පුද්ගලයින් නීතියේ රාමුවට අහු නොවුණත් බුද්ධිමය පැත්තට ඒගොල්ලන්ව අපිට හමුවෙලා තියෙනවා. ඒ කියන්නේ අපේ විමර්ශනයන්වලදී ඒගොල්ලන්ව ඉදිරියේදී අපි ඒ Line එකත් අපි අවශ්‍ය කරන නීතියට යොමු කරන්න කටයුතු කරනවා. දැනට මම හිතන්නේ අපේ විමර්ශන මට්ටමේ තියෙන නිසා දැනට ....,

ප්‍ර : ප්‍රකාශ කරන්න බැහැ. හරි. මෙම අන්තවාදී මතවාදය පෝෂණය කරලා, එය ඉදිරියට ගෙන යන දේශපාලනඥයෝ හෝ දේශපාලනඥයකු මේ වනවිට හඳුනාගෙන තියෙනවද? එසේ හඳුනාගෙන තිබේ නම් කවුරුන්ද ඔවුන්?

පි : දැන් අපි දේශපාලනඥයෝ වශයෙන් කියන්නේ මේ මතවාදයේදී හැම Level එකක්ම Involvement එකක් තියෙනවා. ඒ කියන්නේ සහරාන්ලා එක පැත්තකින් ඉන්නැද්දී ඒ අවශ්‍ය කරන පසුබිම සැකසීම සඳහා පුද්ගලයෝ ගණනාවක් ඉන්නවා. වෘත්තිකයෝ ඉන්නවා. දේශපාලනඥයෝ ඉන්නවා. ඒ එක්කම විවිධ Business Community එකේ කට්ටිය ඉන්නවා.

ප්‍ර : ව්‍යාපාරිකයෝ ඉන්නවා?

පි : ව්‍යාපාරිකයෝ ඉන්නවා. ඉතිං මේගොල්ලන් ඔක්කොම එක්තරා අවස්ථාවකදී එකම රූප රාමුවක තමයි ඉන්නේ. එකම අරමුණක තමයි ඉන්නේ. ඒ අරමුණට යොමු වීමේදී අපි දකින්නේ ඇවිල්ලා ඉහළ තලය විතරයි. ඊට පිටි පස්සේ තලයක් අපි දකින්නේ නැහැ අපේ ඇස්වලට එන්නේ නැහැ බුද්ධිමය Intelligenceවලට ඇරෙන්න. ඉතිං අපි විශේෂයෙන්ම ...,

ප්‍ර : ඉහළ තලය කියන්නේ මෙහිදී ඔබ අදහස් කරන්නේ කවුරුන්ද?

පි : ඒ ඉහළ තලය කියන්නේ අපි ගත්තොත් එහෙම අවසානයේ අපි දකින්නේ ප්‍රහාරයක් අපි දකින්නේ. ඒ ප්‍රහාරය ඇවිල්ලා එක කොටසක් පමණයි මේ අන්තවාදයේ. ඉතිං මේ ප්‍රහාරයට අවශ්‍ය කරන පසුබිම සකසන්න, ඒ අවශ්‍ය කරන Environment එක හදා

FAIR COMMENT — BY JEZEEM —

ගන්න, ඒකට Logistics Support එක කරන්න සහ ඒකට විශේෂයෙන්ම ඒ මතවාදය ශක්තිමත් කරන්න විවිධාකාර පුද්ගලයෝ තමන්ගේ දායකත්වය දක්වනවා.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : එතකම් එක ප්‍රශ්නයක් අහන්න තියෙනවා සාක්ෂිකරු. දැන් ඔබ විරාමයට ඉස්සරලා සාක්ෂි ලබා දෙමින් තුර්කිය සම්බන්ධයෙන් ප්‍රකාශයක් කෙරුවනේ?

පි : ඔබ හරි ස්වාමීනි.

ප්‍ර : ඔබගේ විමර්ශනවලදී තුර්කියේ තියෙන Feto සංවිධානය සම්බන්ධයෙන් සහ ලංකාවේ මේ සිදු වී ඇති පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනවලදී එම සංවිධානයේ නම කෙරෙහි අවධානයක් යොමු වෙනවද?

පි : අනිවාර්යයෙන්ම දැනට වෙන විමර්ශනවලදී ඒ අවධානය යොමු වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඔබ මීට කලින් දත්ත පද්ධතිය ගැන කථා කෙරුවනේ මේ රාජ්‍ය බුද්ධි සේවයේ තියෙන?

පි : එසේමයි ස්වාමීනි.

ප්‍ර : එහි යම් සඳහනක් තිබෙනවාද ඔබට පෙර රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා වශයෙන් සිටි නිලන්ත ජයවර්ධන මහතා සහ විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ 2017 වර්ෂයේදී තිබ්බ රැස්වීමකදී මේ Feto සංවිධානය සම්බන්ධයෙන් යම් තොරතුරු ලබා දීමක් සම්බන්ධයෙන්?

පි : ස්වාමීනි අනිවාර්යයෙන්ම මේක එහෙම සම්බන්ධවීමක් තිබ්බා නම් අපේ Registryයේ Recordsවල තියෙන්න ඕන. මට දැන් වෙනකොට ඒ පිළිබඳව නිසි පිළිතුරක් ලබා දෙන්න අමාරුයි. නමුත් ඒක අපට යම්කිසි ප්‍රශ්නයක් ඉදිරිපත් කළොත් ඒ අවශ්‍ය කරන මොකද්ද ඒ Meeting එක සම්බන්ධව විස්තර ගරු සභාවට ලබා දීමට හැකියාවක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර : හරි. අපි ඒක ඔබට වෙනම ලිඛිතව දන්වන්නම්?

පි : එසේමයි ස්වාමීනි.

****

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

ප : ආර්.එම්.බී. රත්නායක I.S.C. ලුතිනන් කර්නල් නිලය දරන නිලධාරියා ඔබට කීමට හැකියාවක් තිබෙනවාද 2014 වර්ෂයේදී බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ සිටි නිලධාරියෙක්ද නැද්ද කියන්න?

පි : මගේ මතකයේ හැටියට එම නිලධාරියා මගේ යටතේ සේවය කළා.

ප : 2014 අවුරුද්දේ කාත්තන්කුඩියේ සිටින සූෆි මුස්ලිම් කොට්ඨාශය තමන් වෙත සහරාන් ඇතුළු තවුහිද් ලබ්දිකයන් විසින් කරනු ලබන අකටයුතුකම් සහ හිරිහැර සම්බන්ධයෙන් බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යම් පැමිණිල්ලක් සිදු කරාද?

පි : 2014 වර්ෂයේදී මට ලොකු මතකයක් නැහැ. මේක බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයට ඇවිල්ලා තියෙන්නේ 2014. අනිවාර්යයෙන්ම මට මේක ලැබිලා ඇති.

ප : ඒ වනවිට නැගෙනහිර පළාත භාර අණ දෙන නිලධාරී වශයෙන් සිටියේ බ්‍රිගේඩියර් ලාල් පෙරේරා කිව්වොත් හරිද?

පි : මේජර් ජනරාල් ලාල් පෙරේරා.

ප : මෙම ලිපිය සමඟ ඊට අදාළ ඇමුණුමක් ඔබ වෙත ලැබුණද නැද්ද කියන්න ඔබට මතකයක් තියෙනවද?

පි : මට එහෙම ලිපි ගණනාවක් එනවා දවසකට මට ලිපි සීයක් විතර එනවා. මට එවලා තියෙනවා නම් ඒ නිලධාරියා අනිවාර්යයෙන්ම මට ඒක ලැබෙන්න ඇති.

ප : දැන් ගරු කොමිෂන් සභාව විසින් බුද්ධි ලේඛන යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් කැඳවන්න යෙදුණුවිට ඔවුන් ඉදිරිපත් කරන්නට යෙදුණු එම ලේඛන සමඟ මෙම ලුතිනන් කර්නල් රත්නායක විසින් එවන ලද ලිපියට සම්බන්ධ කරලා ඇමුණුමක් ඉදිරිපත් කර තිබෙනවා. එසේ නම් මෙම ඇමුණුම බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයට ඒ අදාළ කාල වකවානුවේදී ලැබිය යුතුද නැද්ද?

පි : අනිවාර්යයෙන්ම ලැබිය යුතුයි.

ප : මෙම ඇමුණුමෙන් බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර තිබෙනවද සහරාන් කියන මවුලවීවරයාගේ අනීතික වැඩ කටයුතු සම්බන්ධව?

පි : ඇත්තටම සහරාන් විතරක් නෙමෙයි. මමත් අවුරුදු හතක් විතර නැගෙනහිර පළාතෙම හිටියා 92 ඉඳන් 97 දක්වා ක්‍රියාන්විතයේදී තුවාල ලබනකම්. මේ මුස්ලිම් ඒ පැත්ත ගත්තහම කල්මුණේ, අක්කරෙයිපත්තු, කාත්තන්කුඩි ගත්තහම සංවිධාන ගණනාවක් තියෙනවා. එතකොට සහරාන් කියන පුද්ගලයා ඇවිල්ලා එතන

FAIR COMMENT BY JEZEEM

තිබ්බ සහරාන්ගේ Activity එකයි, අපි 2017 න් දකින Activity එකයි ගොඩාක් වෙනස්. එතකොට මෙතනදී මේ සඳහන් කරලා තියෙන්නේ මේ සහරාන් ඇවිල්ලා මේ සංවිධානයේ President කෙනෙක්. එතකොට එයා ඇවිල්ලා 2009 වර්ෂයේ M.C.M. සහරාන් යන අය අමතා එම සංයුක්ත තැටි මගින් අන්තර්ජාලය ඔස්සේ ප්‍රචාරය කරයි. මෙවැනි සංයුක්ත තැටි 10 ක් ඔහු විසින් නිකුත් කර ඇත. ඉතිං මේ මුළු කාත්තන්කුඩි ප්‍රදේශයේම විවිධ පල්ලි තියෙනවා. විවිධ Sects තියෙනවා. ගණනාවක් තියෙනවා. ඉතිං කවුරුත් කිසිම අවස්ථාවකදී ඒ ආගම් ප්‍රචාරවලින් එහා පැත්තට ගිහිල්ලා Violent Extremism හෝ ඒ විදියට කටයුතු කරලා නැහැ. ඒ විදියට කටයුතු කරන පුද්ගලයෝ හිටියා නම්, ඒ කියන්නේ ඒ Level එකට ආපු පුද්ගලයෝ ඉන්නවා නම්, ආගම ප්‍රචාරයෙන් එහා පැත්තට ගියා නම් ඒගොල්ලන් පිළිබඳව සම්පූර්ණයෙන්ම අපි අවධානයෙන් කටයුතු කරනවා බුද්ධි සේවාවක් හැටියට. ඉතිං මම හිතන්නේ මේ ලිපිය සම්පූර්ණයෙන්ම කියවගෙන යනකොට මම හිතන්නේ තේරෙයි මේකේ නම් ගණනාවක්ම තියෙනවා. ඉතිං ඔය NTJ කියන සංවිධානය ඇවිල්ලා මම අර කලින් කියලා තියෙනවා. මම හිතන්නේ සංවිධාන එකසිය ගාණක් තියෙනවා. ඒවල නායකයෝ සහ Chair Personලා ගත්තහම මම හිතන්නේ හාරසීයක් පන්සීයක් වගේ තියෙනවා. ඒවල අනුගාමිකයෝ තව දහස් ගාණක් ඉන්නවා. ඉතිං මෙතනදී බුද්ධි අංශයක් වශයෙන් අපි Focus කරන්නේ යම්කිසි කෙනෙක් ඇවිල්ලා ඒ තර්ජනයක් වෙන පුද්ගලයන්ව තමයි අපි Identify කරගෙන Follow up කරගෙන යන්නේ. ඉතිං මෙතනදී සහරාන් කියන පුද්ගලයාගේ නමක් ඇවිල්ලා තියෙනවා. නමුත් ඒ සහරාන්, එතන හිටපු සහරානුයි පස්සේ 2017 පස්සේ දකින සහරානුයි පුද්ගලයෝ දෙදෙනෙක්.

ප : ඒ කියන්නේ එකම පුද්ගලයාගේ මුහුණු දෙකක්. එහෙමද?

පි : නැහැ. ඒ පුද්ගලයා එතනට වර්ධනය වීමක් තමයි සිදු වෙන්නේ. දැන් උදාහරණයක් වශයෙන් අපි ගත්තොත් දැන් ප්‍රභාකරන් වුණත්, ප්‍රභාකරන් මුල් කාලයේදී එයාගේ Activity එකයි පහුකාලීන Activity එකයි වෙනස්. ඉතිං අපිට බුද්ධි අංශ හැටියට දැන් ගොඩක් දුරට අපේ සංවිධාන හැම තිස්සෙම පුරුදු වෙලා තියෙන්නේ මොකක් හරි ටක් ගාලා Incident එකක් වුණහම ඔක්කොම විස්තර කරලා කරලා කරලා ලිපිවලින්ම කටයුතු කිරීම තමයි අපි හැමෝම පුරුදු වෙලා තියෙන්නේ. මොකද ඒක ටක් ගාලා මම කිව්වා කියන ආකල්පයත් එක්ක. ඉතිං අපි ඊට වැඩිය

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

මෙතනදී අපි බැලෙන්න ඕන දහස් ගාණක් මිනිස්සු අතරින් හරි පුද්ගලයෝ අපි Identify කරගෙන ඒ Identify පුද්ගලයෝ ඒ දවස්වල යම්කිසි එහා පැත්තට යනවා නම් ඒවා නතර කිරීම සහ අනෙක් පුද්ගලයෝ Already Lu එකට දාලා යම්කිසි ක්‍රමවේදයකට මේවා කිරීමයි. මොකද මේ අවස්ථාවේදී අපිට සහරාන් පිළිබඳව 2016 වෙනකම්ම මේ ලිපිය පමණයි තියෙන්නේ. නමුත් මේ එක්කම මගෙන් ඇහුවොත් මේ වගේ නම් කීයක් ආවද කියලා ඇහුවොත් DMI එකට කථා කරලා මම හිතන්නේ නම් දාහකට වැඩිය අපිට ඇවිල්ලා තියෙනවා සංවිධාන වශයෙන් ගත්තොත් අපිට ගණනාවක් ඇවිල්ලා තියෙනවා.

(මේ අවස්ථාවේදී 2014 මැයි මස 02 වන දින දරන ලුතිනන් කර්නල් රත්නායක විසින් බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකර ඇති රහස්‍ය ලිපිය X-93 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා උතුමාණෙනි)

(එම ලිපිය සමඟ ඉදිරිපත් කර තිබෙන අල්හාජ් අබ්දුල් ජවාඩ් අලීම් වලිඋල්ලා හාරයේ ලිපි ශීර්ෂය සහිතව ඉදිරිපත් කර ඇති ලේඛනය, ලිපිය X-93(a) ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා)

ප : සාක්ෂිකරු දැන් මේ මුස්ලිම් ආගමික අන්තවාදයට අමතරව ඔබ DMI වශයෙන් ඉදිද්දී, බුද්ධි අධ්‍යක්ෂ වශයෙන් සිටිද්දී සිංහල අන්තවාදයක් සම්බන්ධයෙන්, එහෙම නැත්නම් සිංහල අන්තවාදීන් සම්බන්ධයෙන් අනාවරණය වූවාද නැද්ද?

පි : සිංහල, මුස්ලිම් පමණක් නෙමෙයි. සිංහල, මුස්ලිම්, හින්දු සියළු ජාතීන්වලට සම්බන්ධ අන්තවාදී කණ්ඩායම් සම්බන්ධයෙන් අපට දැන ගන්න ලැබුණා.

ප : සිංහල අන්තවාදී කණ්ඩායම් ගැන ඔබ විමසා සිටි, මෙම සිංහල අන්තගාමී කණ්ඩායම් හිංසාකාරී අන්තගාමී තත්ත්වයට පත්වීමක් වෙලා තිබුණාද? නැත්නම් පත්වෙලා එය වෙනස්වීමකට ලක්වෙලා තිබුණාද කියන්න ඔබට හැකියාවක් තියෙනවද?

පි : විශේෂයෙන්ම අපි මේ අන්තවාදීන් කණ්ඩායම් දෙකක් ගැන කථා කළොත්, සංසන්දනය කළොත් ඉස්ලාම් අන්තවාදයයි, සිංහල අන්තවාදයයි කියන්නේ හාත්පසින්ම අන්තවාදී දෙකක්. මොකද සිංහල අන්තවාදය මම දකින්නේ ගොඩක් දුරට දේශපාලනයත් එක්ක එකතු වෙලා යන අන්තවාදයක් හැටියට. ඉස්ලාම් අන්තවාදය දකින්නේ ඊට වැඩිය ගොඩාක් දීර්ඝකාලීනව ආගමික අන්තවාදයත් එක්ක දැඩි මතධාරීන් එක්ක යන අන්තවාදයක්. ඉතිං අර සිංහල අන්තවාදී විශේෂයෙන්ම ඒගොල්ලන් විටින්විට ඒ අන්තවාදී අදහස් වෙනස් වෙනවා. නමුත් ඒ අන්තවාදී අදහස්වල අරමුණ ඇවිල්ලා ගොඩක් වෙනස්. ගොඩක් දුරට දේශපාලන

FAIR COMMENT — BY JEZEEM —

අරමුණුත් එක්ක තමයි එතනදී ඉවර වෙන්නේ. එතනදී අපි දැකලා නැහැ ඒ කියන්නේ මම බුද්ධි අධ්‍යක්ෂ හැටියට මම දැකලා නැහැ ඒ අන්තවාදය ගිහිල්ලා Radical අන්තවාදයකට යනවා. ඒ කියන්නේ Violent Extremism එහෙකට යනවා. නමුත් ඒ අන්තවාදය වැඩි වෙන්න හේතුවත් ඇවිල්ලා සමහර වෙලාවට ඉස්ලාමික් අන්තවාදයේ තියෙන වර්ධනය තුළින්, ඒ තුළින් රාජ්‍ය තන්ත්‍රය සමහර වෙලාවට තීරණ ගැනීමේ සහ ඒ ප්‍රමාදයන් තුළින් ඒ තුළින් පැන නගින යම් යම් දුර්වලතා හේතුවෙන් තමයි මම හිතන්නේ සිංහල අන්තවාදය ගොඩ නැගෙන්න. මගේ Opinion එක ඒක.

ප : දැන් ඔබගේ පිළිතුර ගතහොත් සිංහල අන්තවාදය බිහි වෙන්නේ මුස්ලිම් ආගමික අන්තවාදය හේතුවෙන්? එය වියහැකි බව තමයි ඔබ කියන්නේ?

පි : ඔව්. ඒ තුළින් තමයි වැඩිපුර ප්‍රවර්ධනයක් වෙන්නේ.

ප : මම ඒකේ අනිත් පැත්තේ තර්කය ගත්තොත්, මුස්ලිම් ආගමික අන්තවාදය බිහි වෙන්නේ සිංහල අන්තවාදයට පිළිතුරු දීමට කියලා එහෙම නැත්නම් පිළිතුරක් වශයෙන් එයට ප්‍රති ප්‍රහාරයක් වශයෙන් කියලා මම ඔබට යෝජනා කළොත් මොකද්ද ඔබට ඒ ගැන කියන්න තියෙන්නේ?

පි : බුද්ධි නිලධාරියෙක් හැටියට අපි මේක පැති දෙකක් හැටියට බැලුවොත් එහෙම එක පැත්තකින් කියන්නේ එක අන්තවාදයක් පුළුවන් තරම් Develop වෙන්න දෙන්න. අනිත් පිරිස්වලට අපට බාධා කරන්න එපා කියලනේ කියන්නේ.

ප : පැහැදිලි නැහැ. කරුණාකරලා නැවත කියන්න?

පි : අපි කියමු A කියන අන්තවාදය මම කියන්නේ ඉස්ලාම් අන්තවාදය අපි දැක්කා ඒ කියන්නේ මුල් කාලයේ ඉඳන්ම 80 න් පස්සේ මම හිතන්නේ දීර්ඝ විස්තරයක් කළා ගිය සැරේදී. මේ අන්තවාදය ගොඩ නැගිගෙන ආවා. ඉතිං මේ අන්තවාදය ගොඩ නැගිගෙන ආවහම මේ Sects කැඩිලා ඊට පස්සේ සම්පූර්ණයෙන්ම මුස්ලිම් අනන්‍යතාවය ඒක අරාබි අනන්‍යතාවය එහෙම නැත්නම් ඒ පැතතත් අනන්‍යතාවයක් ඇති කරගෙන, ඊට පස්සේ ඒක විශේෂයෙන්ම හලාල්කරණය, ඊට පස්සේ ඇඳුම්, ඊට අමතරව ඒ මද්‍රසාස්, ඊට පස්සේ උගන්වන පාසල්, ශිෂ්‍යත්ව මේ හැම දෙයක්ම එක පැත්තකින් වර්ධනය වෙනකොට ඒ වර්ධනයට මුහුණ දෙන්න අන්තවාදී හෝ වෙනත් කණ්ඩායම් බිහිවීම ඒක සමාජයේ මම දකින්නේ නැහැ ඒක වරදක් හැටියට. ඉතිං ඒ බිහිවීම තුළින් තමයි සමහර අවස්ථාවලදී නායකයෝ සහ තීරණ ගැනීමේදී යම් යම් තොරතුරු එක්ක අපට ගලා යාමක් සිදු වෙන්නේ. ඉතිං මෙතනදී

FAIR COMMENT BY JEZEEM

මම පැහැදිලිව මගේ Opinion එක නම්, මතය නම් තව කණ්ඩායමක් කියනවා නම් මේ ආගමික සිංහල අන්තවාදය නිසා ඒගොල්ලන් යොමු වුණා කියලා, එතනදී බලන්න ඕන එහෙනම් ඒ වගේ අන්තවාදයක් පටන් ගන්න හේතු මොනවද කියන එක. එතකොට එහෙම සිංහල අන්තවාදයත් එක්ක කොටින්ම අපි කථා කළොත් අළුත්ගම Incident එක ගැන අපි කථා කළොත් ඒ අළුත්ගම වෙච්ච සිදුවීමේදී ඇත්තටම එතනදී ඒ මුස්ලිම් අන්තවාදය වෙනුවෙන් යම්කිසි පිරිසක් හඬ නැගුවා. ඒ හඬ නගපු පිරිසට ඇහුම්කන් දෙන්නත් රටේ පිරිසක් හිටියා. ඊට පස්සේ ඒක කථා කරලා ඊට පස්සේ ඒගොල්ලෝ යම් හේතුවක් මත මම දන්නේ නැහැ මොන අරමුණක් මතද කියලා, ඒගොල්ලන් සමහර ඒගොල්ලන්ගේ Meetings Arrange කළේ මේ අන්තවාදී යැයි සැක කරන මුස්ලිම් සමාජය තුළ. ඒ කියන්නේ ....,

ප : පැහැදිලි නැහැ?

පි : දැන් අළුත්ගම කියලා ගත්තොත්, ඒ අළුත්ගම අපි ගත්තොත් එහෙම ඒ පාරේ විශේෂයෙන්ම අපි දැක්කා ඒ දවස්වල නීතියක් හරියට ක්‍රියාත්මක වුණේ නැහැ.

ප : ඒ කියන්නේ අළුත්ගම දර්ගා නගරයේද?

පි : දර්ගා නගරය වගේ තැන්වල. ඉතිං එතකොට ඒ වගේ තැනකදී ගිහිල්ලා ආගමික තවත් කණ්ඩායමක් ඇවිල්ලා ප්‍රචාරයක් කරනකොට අනිවාර්යයෙන් ඝට්ටනයක් ඇති වෙන්න පුළුවන්. හැබැයි එතනදී ඒ ප්‍රචාරය කිරීම තුළින් එතනින් අන්තවාදී කියලා Violent Extremism එකකට ගියේ නැහැ. නමුත් වෙනත් අරමුණුත් එක්ක එතනදී එතන Meeting එක තිබ්බේ ඇයි කියන එක මම හිතන්නේ වෙනම සැළකිය යුතු කාරණාවක්. නමුත් ඒ Meeting එක එදා කරලා, ඒ Meeting එක ඒ දර්ගා නගරය තුළින් එනකොට තමයි ගල් මුල් ප්‍රහාරයක් මුලින්ම එල්ල වෙන්නේ. ඒක අපි සම්පූර්ණයෙන්ම ඒක Investigate කරා. මුල්ම ගල් මුල් ප්‍රහාරය එල්ල වෙන්නේ ඇවිල්ලා මුස්ලිම් ජනතාවගේ පැත්තෙන්. ඒක අපි වීඩියෝ කළා.

ප : ඒක මා ඔබගේ පිළිතුරට මම බාධා කරනවා. එහි මුල් වෙඩිල්ල තබන්නට යෙදුණේ සිංහල අන්තවාදී එහෙම නැත්නම් සිංහල අන්තවාදීන් විසින් මෙය සංවිධානය කරන ලද රැස්වීම හේතුවෙන්ද?

පි : එතකොට මම තව ප්‍රශ්නයක් ඔබතුමාගෙන් ඇහුවොත් දැන් මේ සිංහල අන්තවාදය පටන් ගන්නේ කොතනින්ද?

ප : ඒක මම බුද්ධි නැහැ?

FAIR COMMENT — BY JEZEEM

පි : මම දකින විදියට ඒ කියන්නේ මේක පටන් ගන්නේ ඇවිල්ලා මේ හලාල් එකත් එක්කනේ. මේ හලාල් එකක් පටන් ගත්තහම අපි දැක්කා පැහැදිලිවම ලංකාවේ යම්කිසි කොටසක් මේක අනුමත කළා. මොකද ඒකෙදී සමහර සාධාරණ ඉල්ලීම් තිබ්බා. ඒ කියන්නේ ඒගොල්ලෝ එක පැත්තකින් කිව්වා බෞද්ධ රටක් හැටියට අපි සියළුම හැම දෙයක්ම හලාල්කරණය කළයුතුද කියන එක. ඒ කියන්නේ වතුර බෝතල්ද, කොස්සද ඔක්කොම හැම දෙයක්ම. ඉතිං ඒ තත්ත්වය ඇති කළේ කවුද. ඒ තත්ත්වය ඇති කළේ ඒ හලාල්කරණයක් අපේ ලංකාවේ මුලින් තිබ්බේ නැහැනේ. පොඩි දෙයකින් පටන් අරගෙන සම්පූර්ණයෙන්ම ලොකු ව්‍යාප්තියක් දක්වා ඒ පැත්තෙන් ගියා.

ප්‍ර : ඔබ මේ අවස්ථාවේදී ඔබ මේ පැහැදිලි කරන්නේ මුස්ලිම් අන්තවාදය සහ සිංහල අන්තවාදය?

පි : ඔබ හරි.

ප්‍ර : නැහැ මගේ ප්‍රශ්නය වන්නේ සිංහල අන්තවාදය. එය විශේෂිත වූ ආගමික කොටසකට එහෙම නැත්නම් විශේෂිත වූ ජාතියකට එරෙහිව නෙමෙයි නමුත් සිංහල පුද්ගලයන් තුළ, ජාතිය තුළ ඇතිවන අන්තවාදය සම්බන්ධයෙන්?

පි : ඔව්.

ප්‍ර : එය වාර්ගික කොටසකට හෝ ආගමික කොටසකට නෙමෙයි පොදුවේ. සිංහල මතය වෙනුවෙන් ඇතිවන අන්තවාදයක් මේ ලංකාව තුළ තියෙනවද?

පි : මේකයි මම ඒක ඇත්තෙන්ම කියන්න ඕන මේක බෞද්ධ රටක්. 76% ක් ඉන්නේ බෞද්ධයෝ. එතකොට ලෝකයේ රටවල් ගණනාවකට අපි ගිහිල්ලා තියෙනවා. ඉන්දියාව, එතකොට Middle East රටවල්වල. ඉතිං ඒ බෞද්ධයන්ට හිමි වියයුතු ස්ථානය, ඒ කියන්නේ එතනදී ඒ ආරක්ෂා විය යුතුයි කියන මතයේ තමයි මම ඉන්නේ. මොකද එහෙම නැතිවන අවස්ථාවලදී ඒ නැගී සිටීම අපට අන්තවාදය කියලා හඳුන්වන්න අමාරුයි. අර්ථකථනය කරන්න අමාරුයි. ඉතිං අනිත් එක කිසිම අවස්ථාවකදී ඉස්ලාමික් අන්තවාදයයි, බෞද්ධ අන්තවාදයයි අපට එක තැන තියන්න කොහොමත්ම බැහැ. මම අර කිව්වා වගේ ඉස්ලාම් අන්තවාදීන් ඉන්නේ සම්පූර්ණයෙන්ම මේ ලංකාවේ නැති පිටරටක වෙච්ච මේකක් එක්ක, ලොකු Ideology එකක් එක්ක, ලොකු කැපවීමක් එක්ක, පාසල් පද්ධති මේ ඔක්කොමත් එක්ක එන අන්තවාදයක්. ඒක ලෝකෙම ගිල ගන්න විදියට එන අන්තවාදයක්. ඉතිං ඒ වෙනුවෙන් නැගී සිටීම ශ්‍රී ලංකාව විතරක් Isolate කර ගන්න බැහැ. ඉන්දියාවේ අද ගත්තොත්, ප්‍රධාන

FAIR COMMENT BY JEZEEM

සංවිධාන ගත්තොත්, එතකොට මියන්මාරය ගත්තත් ඒ එක්කම අනෙක් ඕනම Middle East වල ගත්තත් ඒ රටවල තියෙන ආගමික නිදහස සහ ඒවා සමහර ඒවා පාලනය කරලා තියෙනවා. ඉතිං මෙතනදී ප්‍රශ්නය තියෙන්නේ මෙතනදී මේ විදියට මේක වේගයෙන් ක්‍රියාත්මක වෙනකොට ඒ ක්‍රියාත්මකව නැගී සිටින කණ්ඩායම් පස්සේ පසුකාලීනව අන්තවාදී අදහස් එක්ක ගියා. එතකොට ඒගොල්ලන්ව සමහර කට්ටිය හඳුන්වන්න පටන් ගත්තා ඉතාමත් පහසුවෙන් දැන් මේ ඇවිල්ලා සහරාන්ලා බිහි වුණේ ඇවිල්ලා අළුත්ගම Incident එක. එහෙම නැතුව සහරාන්ලා බිහි වුණේ ඇවිල්ලා මේ අන්තවාදී පිරිස් හින්දා. හැබැයි අන්තවාදී කණ්ඩායම් බැලුවහම ඉතාමත්ම සුළු කණ්ඩායම් කොටසක් තියෙන්නේ. මේගොල්ලන්ගේ Followersලා පොඩි කොටසක් ඉන්නේ. හැබැයි ඒගොල්ලන් ගෙනාපු මතවාදය ටිකක් දරුණු මතවාදයක්.

ප : මොකද්ද?

පි : ඒ කියන්නේ බෞද්ධ සිංහල ගෙනාපු මතවාදය කියන්නේ ඒගොල්ලෝ ගෙනපු අන්තවාදය තමයි ඇවිල්ලා මෙතනදී යම්කිසි ඒ කියන්නේ මේ ඉස්ලාමික් අන්තවාදය මේ විදියට ගියොත් එහෙම ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා කියන එක. ඉතිං එතනදී අපි ඉතාමත්ම මේක පුළුල්ව බලන්න ඕන, හරි ලේසියි අපිට කියන්න මේ අළුත්ගම හින්දා මේකට බලපෑවා කියලා. නමුත් අළුත්ගම සිදුවීම යම්තාක් දුරට Facilitate කරන්න ඇති. ඒ කියන්නේ මේ වගේ එන්න. හැබැයි සහරාන්ටවත්, එහෙම නැතුව මේ Suicide Cadresලා එක්කෙනෙකුටවත් අළුත්ගම පිළිබඳ Experience එකක් තිබ්බේ නැහැ. මේගොල්ලන්ගේ Background එක ගත්තහම මේගොල්ලෝ සම්පූර්ණයෙන්ම දැඩි මතධාරීව ඉඳන්, JI, JMI, Save the Pearl හරහා එහෙම ගිහිල්ලා මේගොල්ලන් පිටරට ගිහිල්ලා අධ්‍යාපනය අරගෙන ඒ එක්කම ඉතාමත්ම ඒ කියන්නේ දැඩි ආගම මතධාරී, ඉතිං මේගොල්ලන්ට කිසිම සම්බන්ධයක් ඇති වෙන්නේ නැහැ. හැබැයි මේ සංවිධාන මේ දැඩි ඒ කියන්නේ මේ Extremism එක ඒගොල්ලෝ සම්පූර්ණයෙන් පුළුල් කළා. දැන් අපි කලින් කථා කළා කැලිෆට් එකක් ගැන. එතකොට මේ කැලිෆට් එක බිහි කිරීමට විවිධ කොටස් සම්බන්ධ වුණා. ඉතිං මේක ලොකු Wave එකක් එනකොට තවත් කණ්ඩායමක් ඒකට එරෙහිව බිහි වෙනකොට අපිට ඒක ආගමික අන්තවාදීන් කියලා ඒ පැත්තට දාන්න බැහැ. හැබැයි ඒගොල්ලෝ, ඒගොල්ලන් වෙනත් අරමුණු එක්ක මේක Expert කරන්න ඇති වෙන අරමුණු එක්ක. හැබැයි ගොඩක් දුරට

FAIR COMMENT BY JEZEEM

මේගොල්ලන් ගෙනාපු මතවාදය ඒ කියන්නේ Extreme සිංහල දැඩි මතධාරීන් ගෙනාපු මතවාදය ඇවිල්ලා ගොඩක් දුරට සමහර වෙලාවට එහි සත්‍යතාවයක් අපි දැක්කා. මොකද ඒවලින් අපි සමහර දේවල් වලට අපි යොමු වුණා. මේ තොරතුරු වැඩියෙන් හොයන්නත්, මේ පිළිබඳ මේ ප්‍රශ්නය නිරාකරණයට පත් කරන්න, ඒ එක්කම අපි ස්වාමීන් වහන්සේලායි මේ ජමෙයිතුල් උලමාලයි එකම මේසයට ගෙනාවා ස්වාමීනි. ඉතිං ඒ වගේ ලොකු කර්තව්‍යයක් අපි කළා.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඔබ කරපු පැහැදිලි කිරීමේදී අදහස් වෙන්නේ මේ කාරණාවද? සිංහල දැඩි මතවාදය, මම මේ අවස්ථාවේදී සිංහල දැඩි මතවාදය කියලා හඳුන්වන්නේ බෞද්ධ, කතෝලික ඇතුළු සියළු පාර්ශවයන් ඇතුළත් වන සිංහල මතවාදය. ඔබ කියන හැටියට ඒ සිංහල මතවාදය ඇතිවීමට හේතුව වන්නේ සිංහල ජාතියට විරුද්ධව සිදුවන යම් යම් වැරදි ක්‍රියා සම්බන්ධයෙන් රටේ පාලකයින්ගේ අවධානය යොමු කිරීම සඳහාත්, එසේ යොමුකර තිබියදීත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා නොකිරීම හේතුවෙන් ඔය මතවාදය ඇති වෙලා එය දැඩි බවට පත් වුණා කියන එකද ඔබ කියන්නේ?

පි : ස්වාමීනි ඔබ හරි. ඒකට තව එක කොටසක් එකතු කරන්න කැමතියි. විශේෂයෙන්ම ඒක ප්‍රධාන වශයෙන් දැක්කත් අනිත් පැත්තෙන් අනිත් මතවාදය දීර්ඝකාලීනව සැළසුමක් සහගතව මධ්‍යකාලීනව, දීර්ඝකාලීනව සහ කෙටිකාලීන වශයෙන් සංවිධානාත්මකව වෙන මතවාදයක්. ඉතිං ඒ මතවාදය එක පැත්තකින් Develop වෙනකොට ඒ පිළිබඳව රජයේ සහ රටක් හැටියට අපි ඒකට මැදිහත්වීම විවිධ හේතූන් මත හරි වෙලාවට නිසි වෙලාවට ඒවා කටයුතු නොකිරීම නිසා ඒ තුළින් ඇතිවන Gap එකට අනෙකුත් මතවාදීන් පැමිණීම තමයි මෙතන වෙන්නේ. ඉතිං එතනදී එක පැත්තක් ඉතාමත්ම පැහැදිලියි. අපි ක්‍රිස්තියානි හෝ වෙන්න පුළුවන්. සිංහල හෝ හින්දු වෙන්න පුළුවන්. ඒ දැඩි මතධාරී නම් ඒගොල්ලන් වෙනමම ඒ Ideology එකක් තියෙන්න ඕන ඒගොල්ලොන්ට. ඊළඟට Counter එකක් වෙන්න බැහැ. ඒගොල්ලෝ වෙන්න ඕන මේ ආගමික අදාළ අදාළ මේක සම්පූර්ණ බෞද්ධ රටක් වෙලා මේ ආකාරයෙන් මෙහෙම මෙහෙම සම්පූර්ණම යන්න ඕන කියන මතවාදයක් තියෙන්න

FAIR COMMENT BY JEZEEM

ඕනේ. ඉතිං මේ මතවාදය බිහි වෙන්නේ ඇවිල්ලා මේ එක්තරා ඉස්ලාමික් මතවාදයට විරුද්ධව තමයි මේක ගොඩ නැගෙන්නේ මේ හැම මතවාදයක්ම. ඉතිං එතකොට එතනදී අපි දෙපැත්තම සාධාරණව බලන්න වෙනවා එහෙනම් ඉස්ලාමික් මතවාදය අපි පැතිරවීම වැළැක්වීමට අපි පැහැදිලි දේවල් අරන් තියෙනවද කියලා. අපි පැහැදිලි දේවල් ගත්තේ නැති නිසා තමයි ඒ මුල ඉඳන්ම මේක වර්ධනය වෙලා, වර්ධනය වෙලා, වර්ධනය වෙලා. අද මේක සිදු වුණේ නැතත් ඒ කියන්නේ බෞද්ධ අන්තවාදයක් ගොඩ නැගුණේ නැතත්, ක්‍රිස්තියානි අන්තවාදයක් ගොඩ නැගුණේ නැතත් මේ සහරාන්ලා බිහිවීම කොහොමත් වළක්වන්න බැරුව යනවා. අපි ඉස්ලාමික් අන්තවාදයට අපි හරියට හඳුනාගෙන මුහුණ දුන්නේ නැත්නම්. ඉතිං ඒ දෙක සම්බන්ධයක් මම ලොකු සම්බන්ධයක් මම දකින්නේ නැහැ.

ප්‍ර : හරි. පිළිතුර පැහැදිලියි.

****

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : මගේ අවසාන පෙළ ගැස්මේ, අවසාන කොටසට මා පැමිණ සිටිනවා. මෙම 2019.04.21 වෙනි දින සිදු වූ මේ මරාගෙන මැරෙන ප්‍රහාරය සිදු වෙන අවස්ථාවේදී ඔබ ලංකාවේ හිටියේ නැති බව ඔබ ප්‍රකාශ කරනවා?

පි : ඔබ හරි.

ප්‍ර : කේසේ වෙතත් බුද්ධි නිලධාරිවරයෙකු වශයෙන් ඔබට හැකියාවක් තියෙනවද මේ අවස්ථාවේදී මෙම ගරු කොමිෂන් සභාවට කියන්න මෙම ප්‍රහාරයට හේතුසාධක වුණු හේතු මොනවද කියලා? මොකද්ද හේතුව?

පි : ප්‍රධානතම හේතුව හැටියට මම දකින්නේ එවකට ශ්‍රී ලංකාවේ තිබූ දේශපාලන, ආර්ථික සහ සමාජයීය පසු බැස්ම. ඒ පසු බැස්ම හරහා මේ වාතාවරණයක් සැකසුණා මේ වගේ කණ්ඩායම්වලට රිසි සේ තමන්ට කටයුතු කරන්න.

ප්‍ර : නැවත පැහැදිලි කරන්න ඔබේ පිළිතුර සාක්ෂිකරු?

පි : ඒ කියන්නේ මේක ඇති වෙන්න ප්‍රධානම හේතුව තමයි Social Political Economic දේශපාලනික, සමාජයීය, ආර්ථික අපි එතකොට 2015 න් පස්සේ අපි ඒවල තිබ්බ පසුබෑම. ඒ කියන්නේ ඒවා සම්පූර්ණයෙන්ම දුර්වල තත්ත්වයක තිබ්බේ. මේ දුර්වලතාවය මුළු ලංකාවටම බලපෑවා. ඒ බලපෑම තුළින් එතකෙට අපි ගොඩක් දුරට මේ පිළිබඳ නිසි අවධානයක් අපිට

FAIR COMMENT — BY JEZEEM —

යොමු වුණේ නැහැ. ඉතිං ඒ කියන්නේ විශේෂයෙන්ම රාජ්‍ය තන්ත්‍රයේ දුර්වලතාවය තමයි ප්‍රධානතම හේතුව මෙවැනි මේ විදියට දරුණු විදියට මම හිතන්නේ මුළු ලෝකයේම මේ Easter Sunday Attack එක ගැන කථා කරනවා. මේ වගේ ස්ථාන හයක, මේ විදියේ ඉතාමත්ම ලොකු සංවිධානාත්මක තත්ත්වයක් මම දකින්නේ නැහැ. වාහනවලින් බෝම්බ ප්‍රවාහනය කරගෙන, ඒවා එකතු කරගෙන, මේ විදියට මිනිස්සු ගැන පුළුවන් තරම් දැන ගන්න ලැබිලත්, ඒගොල්ලන් අත් අඩංගුවටත් නොගෙන, අත් අඩංගුවට ගන්න අවස්ථාවලදී වුණත් ඒවා පිළිබඳව නිසි විමර්ශනයක් නොකර, මේ හැම දෙයක්ම සිදු වෙලා තියෙන්නේ මුළු ඒ මුළු System එකේම තියෙන අකර්මන්‍යතාවය නිසා තමයි මම දකින්නේ බුද්ධි නිලධාරියෙක් හැටියට.

ප : මා ඔබට යමක් ඔබගේ මේ පිළිතුර මත ඔබ පෙර සඳහන් කළා අබුබකර් අල්බග්ඩාදි කියන ISIS මතවාදය මේ කැලිෆට් එකක් ඉදිරිපත් කළ බව. ඒ කැලිෆට් එකට අයිති වෙන භූමි ප්‍රමාණය ඔහු එහිදී දක්වන්නට යෙදුණා?

පි : ඔබ හරි.

ප : ඔබට දැනීමක් තියෙනවද ඒ ප්‍රථමයෙන්ම ඉදිරිපත් කළ ඒ භූමියේ, භූමි ප්‍රමාණයේ ප්‍රථමයෙන්ම ආපු සිතියමේ ශ්‍රී ලංකාව ඒ Islamic State එකේ කොටසක් වශයෙන් ඒ කියන්නේ ඉස්ලාම් රාජ්‍යයේ කොටසක් වශයෙන් හඳුනාගෙන තිබ්බාද නැද්ද කියන්න?

පි : අනිවාර්යයෙන්ම හඳුනාගෙන තිබ්බා.

ප : මම මෙහෙම අහන්නම්. ශ්‍රී ලංකාව බග්ඩාදි විසින් ඉදිරිපත් කරපු ඉස්ලාම් රාජ්‍යය යන සංකල්පයේ ඒ සිතියමට ඇතුළත්වීමට හේතු වුණේ කුමක්ද කියලා ඔබට මේ අවස්ථාවේදී පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : විශේෂයෙන්ම මුස්ලිම් ජනතාව වෙසෙන ප්‍රදේශ තමයි මේගොල්ලන් මේ කැලිපට් කියලා හඳුන්වලා තිබ්බේ. ඉතිං ඒ කැලිපට් එක විශේෂයෙන්ම මේගොල්ලෝ ලංකාව හඳුන්වලා තිබ්බා මට මතකයි ඔය ආදම්ගේ එකත් එක්කම ඒ කියන්නේ සිරීපාදේ තියෙන එක තමයි අබුබක්කර්ගේ එක්තරා දේශනයකදී එයා සඳහන් කරනවා. ශ්‍රී ලංකාවේ ඒ කියන්නේ ඒගොල්ලන් හඳුන්වනවා ආදම් කියන පුද්ගලයා ඉස්සරලාම කකුල තිබ්බේ ඇවිල්ලා සිරීපාදේ කියන එක. ඉතිං ඒ අනුව ඒගොල්ලන්ගේ සිතියමේ මම සිතියම් දෙකක් ගැන මම අවබෝධයක් මට නැහැ. නමුත් පැහැදිලිවම ඒ කැලිපට් කියන එකේ ශ්‍රී ලංකාව එක්ක තමයි ඒ සිතියම තියෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මගේ ප්‍රශ්නය මම මෙසේ ලංකාව ඇතුළත් කිරීමට 2014 මේ කැලිපට් එක ප්‍රකාශ කිරීමේදී ලංකාවේ තිබුණු භූ, දේශපාලනික සහ ආරක්ෂක ප්‍රවණතාවයන් හේතු වුණාද නැද්ද කියලා ඔබට ප්‍රකාශ කරන්න පුළුවන්ද?

පි : අනිවාර්යයෙන්ම එහෙම එකක් නෙමෙයි. මේක ඉතිහාසයේ ඉඳන්ම ඔය කැලිපට් කියන වචනය එනවා. ඒත් එක්කම ඉතිහාසයේ ඉඳන්ම ඔය ප්‍රදේශය ඔය මුස්ලිම් රටක්, මුළු මුස්ලිම් කලාපයක් බිහි වෙන්න ඕන මුස්ලිම්වරුන්ට කියන එක එනවා. ඒ අනුව තමයි මම අර කියපු විදියට 1934 ඉන්දියාවෙන් පටන් අරගෙන ඔය JI සංවිධානය 1954 ඒගොල්ලන් කියන්නේ ඔය කැලිපට් එක ගැනම තමයි. මුස්ලිම් කලාපයක්. සම්පූර්ණ මුළු ඔක්කොම මුස්ලිම් රාජ්‍යයවල් එකතු කරගෙන තනි මුස්ලිම් කලාපයක් එන්න ඕන කියන එක. ඒක එවකට තිබ්බ දේශපාලන, ආර්ථික සහ සමාජයීය පසුබිම මත අළුතින් ආපු දෙයක් නෙමෙයි. මේක සම්පූර්ණයෙන්ම මේක ඉතිහාසයේ ඉඳන්ම ඒ කැලිපට් කියන එක මේගොල්ලන් ඉතිහාස පොත් එක්ක ඒගොල්ලෝ කියන්නේ ඉතිහාසයේත් මේක අයිති මුස්ලිම්වරුන්ට. ඒක නිසා සම්පූර්ණයෙන්ම මේ කලාපය වෙනුවෙන් මුස්ලිම් සම්පූර්ණයෙන් රටක් බිහි කරන්න ඕන කියලා මේ රටවල් සියළු දේම එකතු කරලා. ඉතිං මේකට ලොකු අතීතයක් තියෙනවා. මේක වර්තමානයත් එක්ක සම්බන්ධතාවයක් මම දකින්නේ නැහැ.

ප්‍ර : මේ ඔබ දැන් ප්‍රකාශ කරන්නේ ඔබගේ මතයද?

පි : මගේ මතය ඔය ගොඩ නැගිලා තියෙන්නේ මේ Islamic Study කරලා තමයි.

ප්‍ර : දැන් මෙම C-4(b) කියන තොරතුර රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂ වෙත ලැබුණහම ඔහු ළඟ තිබුණු තොරතුරුත් එක්රැස් වී තිබුණු තොරතුරුත් සළකා බැලීමෙන් අනතුරුව ඔහු විසින් ගතයුතුව තිබූ ප්‍රධානතම ක්‍රියාමාර්ගය මොකක්ද කියලා ඔබට කීමට හැකියාවක් තියෙනවද?

පි : මම හිටියා නම් ...,

ප්‍ර : ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ වශයෙන් සිටියා නම් මේ C-4(b) කියන බුද්ධි තොරතුර ලැබුණුවිට ඒ වනවිටත් රාජ්‍ය බුද්ධි සේවාවේ සහරාන් සහ NTJ කියන සංවිධානය සම්බන්ධයෙන් තිබුණු තොරතුරුත් එකතු කරලා ගත්තහම ගතයුතුව තිබූ පියවර කුමක්ද?

පි : ස්වාමීනි මම පැහැදිලිව මම ප්‍රකාශ කරන්න ඕන ඒ System එක තිබ්බා නම් මේ බුද්ධි තොරතුරු අපිට මෙහෙම අවස්ථාවක් ලැබෙන්නේ නැහැ මෙවැනි බුද්ධි තොරතුරක් ගැන කථා කරන්න.

FAIR COMMENT — BY JEZEEM —

මොකද 2017 සහරාන් Extreme Line එකට යනකොටම අපේ තියෙන දැනුම සහ අපේ තියෙන හැකියාවන් සහ වර්ධනය කොතනද කියලා ගත්තහම අපි පැහැදිලිවම දන්නවා ඒ කියන්නේ උච්චතම අවස්ථාවට ගිහිල්ලා තියෙන්නේ. ඒ කියන්නේ උදාහරණයක් වශයෙන් අර රාළහාමි කෙනෙක්ගේ බෙල්ල කපපු අවස්ථාවම, ඒ අවස්ථාවෙම මේක අපිට නවත්වන්න තිබ්බා. එහෙම නැත්නම් Suicide Explosive වෙච්ච අවස්ථාවේදිම අපිට ඒක නවත්වන්න තිබ්බා.

ප : Explosive සොයා ගත්ත අවස්ථාවේ?

පි : සොයා ගත්ත අවස්ථවේදිම. ඒක මාවනැල්ල බුදු පිළිම මේකෙදි ගත්තහම ඉතාමත්ම පැහැදිලියි ඒකත් හොඳටම කාල වේලාව ඇති කරන්න. දැන් අපි අනුගමනය කරන්නේ ඕනම Incident එකක් වුණොත් අපි සාමාන්‍යයෙන් දින කිහිපයක් ඇතුළත සම්පූර්ණම Network එකම අපි මේවා කරනවා. ඉතිං මෙතනදී එහෙමනම් මගේ පිළිතුර වෙන්නේ මම එහෙනම් මීට දවස් ගණනකට කලින් මම මේ බුද්ධි අධ්‍යක්ෂ හැටියට පත් වෙන්න ඕන මේකට මම මේ පිළිතුර ලබා දෙනවා නම්. ඒ කියන්නේ මම එහෙම නම් මේ පිළිබඳව ඉස්සරලාම මම මේකේ තියෙන ඉතාමත්ම බැරෑරුම් මේකක්. Simultaneously එකවර මම පියවරවල් තුනක් ගන්නවා. පළවෙනි මුල්ම පියවර තමයි අපේ තියෙන Records වලින් ඔක්කොම ටික වලින් මේ පිළිබඳව තොරතුරු ටික ඔක්කොම ටික අපේ Background Details, Technical Details ඔක්කොම අරගෙන මේ පිළිබඳව පැහැදිලි Assessment එකක් ගන්නවා කවද්ද මේක කරන්න යන්නේ, කවුද කරන්න යන්නේ, කොහොමද කරන්න යන්නේ, මොකද්ද මේකේ Vulnerable Areas කියන එක ඉතාමත්ම පැහැදිලිව මම Assessment එකට ගන්නවා.

ප : නැවත කියන්න කරුණාකරලා ඔබේ පිළිතුර?

පි : ඒ කියන්නේ මුලික වශයෙන් මේ තොරතුරු සහ මගේ ළඟ තියෙන තොරතුරු සහ Technical තොරතුරු මේ සියළු දෙනාම ඒ සියළු ටික එකතු කරගෙන මම මේ තියෙන එකෙන් මම Situation එකක් Develop කරනවා මේ ප්‍රහාරය කවුද පුද්ගලයෝ කරන්නේ, මොන කාලයේද මේගොල්ලන්ට කරන්න පුළුවන්, මොන වගේද කරන්න පුළුවන්, මොනවද මේ Threaten Areas කියන එක. ඒ අනුව ඒක හඳුනා ගත්තම පස්සේ ඒ Report එක එක පැත්තකින් මම ඉහළ මූලස්ථානයට මම දැනුම් දීමක් කරනවා.

ප : මොකද්ද ඒ මූලස්ථානය?

FAIR COMMENT BY JEZEEM

පි : ඒක විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයට දැනුම් දීමක් මම කරනවා මෙන්න මෙහෙම මේකේ බැරෑරුම් තත්ත්වයක් තියෙනවා. මේකට Immediately මේකට අවධානය යොමු කරලා මේකට ගතයුතු ක්‍රියාමාර්ගය Immediately ගන්න ඕන කියලා. අනිත් පැත්තෙන් අනිවාර්යයෙන්ම මම රටේ ජනාධිපතිවරයාට මම Director SIS නම් මම ජනාධිපතිට දැනුම් දෙනවා මෙන්න මේ වගේ ප්‍රශ්නයක් තියෙනවා. මෙහෙම තොරතුරක් අපට ඇවිල්ලා තියෙනවා. මෙන්න මේ විදියට Threat එකක් තියෙනවා කියලා මම ඒ පැත්තෙනුත් නැවත වරක් ජනාධිපතිතුමා හරහාත් ආරක්ෂක ලේකම්තුමාට මේ පිළිබඳව කරලා මේ පිළිබඳව වගකීම මේක කරනවා. ඊට පස්සේ Simultaneouslyම මගේ පුද්ගලයන් ටික මේක Task කරනවා. කවුද මේ මේක කරන්න ක්‍රියාවට යොමු වන පුද්ගලයෝ. දැන් මේකේ නම් පහක් සඳහන් වෙලා තියෙනවා. මේ පුද්ගලයෝ Immediately Locate කරලා අපි මේගොල්ලන්ව එක්කෙනෙක් අවම වශයෙන් එක්කෙනෙක්වත් අත් අඩංගුවට ගන්න කටයුතු කරන්න කියන එකට සම්පූර්ණයෙන්ම මගේ අවධානය යොමු කරනවා. ඒකට මගේ Technical Resources සහ ඒ වෙන Special Groups අරින්න ඕන නම් ඒ ටික යවලා මම ඔක්කොම බැරි වුණත් පුද්ගලයෝ කිහිප දෙනෙක්ව අත් අඩංගුවට ගන්න පිළිබඳ මම Intelligence ක්‍රියාන්විතයක් මම .....,

ප්‍ර : දැන් ඔබ ආරක්ෂක ලේකම් වෙත මේ දැනුම් දීම කරන්නේ අර ඔබ පෙර කී ලෙස නිරීක්ෂණ, නිගමන සහ ගතයුතු පියවර ඇතුළත් කරලද නැද්ද?

පි : දැන් මෙතනදී මම කිව්වේ මම මේ තත්ත්වයට දැන් එකපාරට ඔබතුමා දැන් Report එකට ගෙනාවේ. ඉතිං මම කිව්වේ මම බුද්ධි නිලධාරියෙක් හැටියට මේ Report එක එනකම් මම ඉන්නේ නැහැ. මීට කලින්ම මේ Report එක එන්න නම් සෑහෙන Development මේ රටේ සිදු වෙන්න ඕන. ඉතිං එතකොට ඒ අවස්ථාවේදිම ඔය සිදුවන ක්‍රියාවලිය වෙනවා. ඉතිං එතකොට ඒ කිසිම දෙයක් සම්පූර්ණයෙන්ම වුණේ නැහැ කියලා හිතාගෙන අපි මෙතනට එනකොට දැන් මේකට එන්න කලින් අපි මේ ක්‍රියාමාර්ග ගොඩක් අරගෙන තිබ්බේ. එතකොට හැබැයි මෙතනට එනකොට කිසි දෙයක් ක්‍රියාත්මක වෙලා තිබ්බේ නැත්නම්, එහෙම ක්‍රියාත්මක වෙලා නැහැ කියන්න බැහැ. එතකොට අපෙත් වගකීමක් තියෙනවා. හැබැයි මේ අවස්ථාව වෙනකොට අනිවාර්යයෙන්ම Security Defenceව Pressurize කරනවා.

FAIR COMMENT
BY JEZEEM

මේක අනිවාර්යයෙන්ම මේක ප්‍රශ්නයක් වෙනවා. මේක අනිවාර්යයෙන්ම පොලීසියට කියන්න, මේක කරන්න, පොලිස්පතිතුමාට සහ එතකොට අනිත් Intelligence Agencies වලට සෑහෙන බල කිරීමක් කරනවා. මේ සිදුවීමට වැඩිය මේ පුද්ගලයන්ව අත් අඩංගුවට අරගෙන යම්කිසි මේකේ සත්‍ය අසත්‍යතාවය හරි හෙළි කර ගන්න කළයුතුයි කියන එක.

ප්‍ර : (C-4(c) ලේඛනය නැවතත් ඔබගේ අවධානයට යොමු කරනවා) මගේ ප්‍රශ්නය වන්නේ C-4(c) පෙන්වා සිටියි. C-4(c) ලේඛනයේ ඇතුළත් වන්නේ C-4(b) ලේඛනයේ ලැබුණ බුද්ධිමය තොරතුර සම්බන්ධයෙන්ද නැද්ද?

පි : මේ දෙකේ දින වකවානු කොහොමද දන්නේ නැහැ. පළවෙනි එක මේක ඉදිරිපත් වෙන්නේ ඇවිල්ලා මේ තොරතුරු මොන කාලයේද දන්නේ නැහැ ඉදිරිපත් කළේ. මේ දෙකම එකතු කරලා...,

ප්‍ර : මගේ ප්‍රශ්නය C-4(c) කියන්නේ C-4(b) ලේඛනයෙන් ලැබුණු තොරතුරු අනුසාරයෙන් පිළියෙල කරන ලද ලේඛනයක් කිව්වොත් නිවැරදිද?

පි : ඔව්. මේකේ තියෙන දත්ත මේකට අරගෙන තියෙනවා.

ප්‍ර : මේ C-4(c) ලේඛනයේ තිබෙන බුද්ධි තොරතුරු සැපයිය යුතු වන්නේ ඔබගේ පෙර පිළිතුරුවලට අනුව ආරක්ෂක ලේකම්වරයාටද?

පි : ඔබ හරි. හැබැයි මෙහෙම එකක් තියෙනවා. සමහර වෙලාවට මේ ලියුමම ලියුම් තුනකින් ඒ කියන්නේ අපි සමහර වෙලාවට එකම ලියුම ආරක්ෂක ලේකම්වරයාට එක ලියුමකුත්, IGPට එක ලියුමකුත් ඒ වගේම අපේ හමුදාපතිට එක ලියුමකුත් එකම ලියුම, එකම කරුණු ටික ලියුම් තුනකින් අපි අරින අවස්ථා තියෙනවා. ඒක අපි සඳහන් කරන්නේ නැහැ අරයාට Copy කරාද කියන එක.

****

ගරු අදිකාරි මැතිණිය :

ප්‍ර : මිස්ට සලේ දැන් අර C-4(b) කියන ලිපිය සහ C-4(b) එම ලිපිය Director රාජ්‍ය බුද්ධි සේවාවට ලැබුණු එකක් නම් ඔහු එම තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ට හෝ වෙනත් උසස් නිලධාරියෙකුට යැව්වා නම් ඔබගේ ආයතනයේ ලිපි ශීර්ෂයක තියෙන ලියුමක තොරතුර ලියලා මේ තොරතුරු ඇමුණුම් හැටියටද යවන්නේ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අපි ක්‍රම දෙකකට යවනවා ස්වාමීනි. එකක් ඇවිල්ලා Covering Letter එකක් එක්ක මේ Report එක අපි අරින අවස්ථා තියෙනවා. එතකොට ඒකේ Contents එක පොඩියි නම් ලියුමෙම අපි සඳහන් කරලා අරිනවා නමින්ම මේ තොරතුර සඳහන් කරලා අපි ඒ ලියුමෙම අත්සන් කරනවා. ඒ ක්‍රම දෙකටම අපි යවන අවස්ථා තියෙනවා.

ප්‍ර : දැන් ඔබ වර්තමාන ප්‍රධානියා ලෙස නිලන්ත ජයවර්ධන මහතා රාජකාරී කරන කාලයේදී ඔය ලිපිය තියෙන ලිපිගොනුවක හොයා ගන්න පුළුවන් වෙයිද යවලා තියෙන්නේ ඔබ කියන ක්‍රම දෙකෙන් මොකෙන්ද කියලා. Covering Letter එකකින් යැව්වද? එහෙම නැත්නම් ඒ තොරතුරුවලම සටහනක් දාලා යැව්වද කියන එක?

පි : අනිවාර්යයෙන්ම ස්වාමීනි අපිට සොයා ගන්න පුළුවන්. මම කිව්වේ ඒ ලේඛනගත කිරීම හරියටම සියයට සීයක්ම මේ ආයතනයේ සිදු වෙනවා. ඉතිං අනිවාර්යයෙන්ම කිසිම ලියුමක් යැවෙන්නේ නැහැ මේකේ Register Process එකෙන් එළියේ. එතකොට අනිවාර්යයෙන්ම එක්කෝ Covering Letter එකෙන් හෝ හැබැයි Minute එකක් දාලා යන්නේ නැහැ. අනිවාර්යයෙන්ම එක්කෝ Covering Letter එකකින් හෝ එහෙම නැත්නම් ඒ Contents ටික සම්පූර්ණයෙන්ම ලියුමටම අරගෙන තමන් ගහන විදියට හරි ඔය ක්‍රම දෙකෙන් එකකට තමයි යන්නේ. එහෙම ගියහම අනිවාර්යයෙන්ම ඒක සඳහන් වෙනවා මේ Register Process එකේ.

ප්‍ර : දැන් ඒ Contents ටික ලියුමකට අරගෙන ගැහුවත් ආයතන ප්‍රධානියාගේ අත්සන නැතුව යන්න පුළුවන්ද? Letter Head එක නැත්නම්?

පි : ආයතනයේ නැතුව පිට තැනකට යවන්න බැහැ.

ප්‍ර : ඔබට පුළුවන් වෙයිද ඒ කියන ලියුම මේ කොමිසමට ඉදිරිපත් කරන්න?

පි : පුළුවන් ස්වාමීනි.

හොඳයි. බොහොම ස්තුතියි.

****

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

(මේ අවස්ථාවේදී 2019.04.09 දිනය සඳහන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, රාජ්‍ය බුද්ධි සේවාව වශයෙන් අත්සන් තබා ඇති එහි නිලන්ත ජයවර්ධන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රාජ්‍ය බුද්ධි සේවාවගේ මුද්‍රාව සහිත ජාතික තවුහිද් ජමාත් නායක මොහොමඩ් සහරාන් විසින් මෙරට මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කිරීමට සැළසුම් කරන බවට ලද තොරතුරක් සම්බන්ධව යන මැයෙන් එනම් C-4(c) ලේඛනයේ මේ වනවිටත් ලකුණු කර ඇති C-4(c) ලේඛනයේ අන්තර්ගතයේම අඩංගු රාජ්‍ය බුද්ධි සේවාවේ ශීර්ෂය සහිත ලිපිය X-94 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා)

දැන් වේලාව : ප.ව. 5.30 යි
මෙතැන් සිට සටහන් කළේ චන්දිමා මෙය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව:ප.ව 5.30
පෙර සටහන්:ල/ලේ ඉන්ද්‍රානිමිය
මෙතැන් සිට:චන්දිමා දිල්හානි.

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

එසේම රාජ්‍ය බුද්ධි සේවාවේදී අධ්‍යක්ෂවරයා විසින් පොලිස්පති ආමන්ත්‍රණය කරන ලද කාත්තන්කුඩි පොලිස් වසමේ තාලන්කුඩා ප්‍රදේශයේදී යතුරු පැදියක් පුපුරවා හැරීම සම්බන්ධවයන ශීර්ෂය යටතේ යොමු කර ඇති 2019.04.18 දිනැති ලිපියක්, රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන විසින් පොලිස්තුමා වෙත යොමු කරන ලද මොහොමඩ් තාසිම් මොහොමඩ් සහාරාන් ගේ සමීපතයෙකු මෙන්ම 2019.04.16 දින කාත්තන්කුඩියෙහි යතුරු පැදියක් පුපුරවා හැරීමට ලේකනයන් 02 ක් සාන්ෂිකරුට පෙන්වා සිටිනවා.

මේ අවස්ථාවේ දී 2019.04.18 දිනැති අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාව විසින් පොලිස්පති අමන්ත්‍රණය කරන ලද කාත්තන්කුඩි පොලිස් වසමේ තාලම්කුඩා ප්‍රදේශයේදී යතුරු පැදියක් පුපුරුවා හැරීම සම්බන්ධව යන මෙයෙන් වන ලිපිය X95 ලෙසද 2019.4.19 දිනැති මොහොමඩ් තාසිම් මොහොමඩ් සහරාන්ගේ සමීපතමයකු මෙන්ම 2019.04.16 දින කාත්තන්කුඩිහිදි යතුරු පැදියක් පුපුරවා හැරීම සම්බන්ධ පුද්ගලයකු පිළිබඳව යන මැයෙන් වන ලිපිය X 96 ලෙසද ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා.

ප්‍ර: මෙම X 94, X 95 සහ X 96 කියන ලිපි ඔබ වෙත ලැබුණු තොරතුරු මත ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වශයෙන් සිටියදි යොමු කරන ලද්දේ නම් ඔබ මෙම ලිපි කාවෙත ද යොමු කරන්නේ?

පි: මං අනිවාර්යයෙන්ම මේ ලිපි Address කරන්නේ ආරක්ෂක ලේකම්ට .

ප්‍ර: දැන් මෙම X 94, X 95 සහ X 96 දරණ ලිපි ආරක්ෂක ලේකම්වරයා වෙත යොමු කර තිබුණාද නැද්ද යන්න පරීක්ෂා කර බලා ඔබට මෙම ගරු සභාවට වාර්ථා කිරීමට හැකියාවක් තියෙනවාද?

පි: එසේමයි.

ප්‍ර: දැන් X 94 X 95 සහ X 96 යන ලේඛන සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම්වරයා පියවරක් ගත් නැති විට නැත්නම් රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වශයෙන් ඔබ ඊළඟට ගන්නා පියවර කුමක්ද?

පි: මම පැහැදිලිවම මේ මේ assessment එක පුද්ගලයින් තුන්දෙනකුට මම ඉදිරිපත් කරනවා. ඒක ඇවිල්ලා පළවෙනි එක ඇවිල්ලා ලේකම්තුමාට ඊට පස්සේ මේකේ copy හරි වෙනම ලියමුක් හරි chief of National Intelligence වෙත C NI ඊ ට මම මේක ඉදිරිපත් කරනවා ඇවිල්ලා

Registrar Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පොලිස්පතිතුමාට ඒ සමඟම මේ දැනුවත් කිරීම මම කරනවා යුධ හමුදා බුද්ධි සේවාවට මොකද ඒ ගොල්ලන්ට ඊට වැඩිය ලොකු මේ ආවරණයක් තියෙනවා ඒ ප්‍රදේශයේ ඒ එක්කම මේ ප්‍රදේශයේ බැලුවොත් මේක කාත්තන්කුඩි ප්‍රදේශයක් මේකේ පොලිසියක් තියෙනවා ඒ පොලිසියේ තියෙන මගේ DIB එකක් තියෙනවා එතන ඒ කියන්නේ මඩකලපුව බලාගන්න ඒ ගොල්ලන්ට මම සම්පූර්ණයෙන්ම මේ තොරතුරු ලබා දීලා මේ පිළිබඳව කාත්තන්කුඩි පොලිසියත් එක්ක එකතුවෙලා යුධ හමුදාවත් එක්ක එකතු වෙලා මේ පුද්ගලයන් පිළිබඳ අත්අඩංගුවට ගෙන මේ සම්පූර්ණයෙන්ම මේක පිළිබඳව විමර්ශනය කරන්න කියන එක මම දැනුම් දීමක් මම කරනවා ලිඛිතව ඊට අමතර මම මේ ලිපි වලට අමරතව මේ මේ ලිපිය ගොඩාක් වෙලාවට යන්නේ අපි දැනුම් දීම අමතරව දුරකථනයෙන් කතා කරලා මේක මේ පුද්ගලයන්ගේ අපි ළඟ තියෙන විස්තර ටික දීලා ඒ ගොල්ලන්ව Task කරනවා කරලා කොහොම හරි කරලා මේ Detection කරන්න කියන එක .

ප්‍ර; මොකක්ද ඔබ කියා සිටියේ?

පි: DIB .

ප්‍ර; DIB වශයෙන් හඳුන්වන්නේ කුමක්ද?

පි: District Intelligence Bureau

ප්‍ර; දැන් මා පෙර සඳහන් කරපු C04 B දී තිබෙන තොරතුරු ඔබලා ගාව තිබෙනව රාජ්‍ය බුද්ධි සේවාවේ තිබෙන තොරතුරු **X95** සහ **X96** දැක්වෙන Dry run එක එහෙම නැත්නම් ඒ පුපුරා ගැනීමට අදාලව තොරතුරු අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාව වෙත ලැබුණු විට ඔබ විසින් අර security council එක ආරක්ෂක මණ්ඩලය කැඳවා එහිදි රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් පියවර ගත යුතුද නැද්ද යන්න සම්බන්ධව කරුණු පැහැදිලි කිරීමක් කරනවාද නැද්ද?

පි; සාමාන්‍යයෙන් ආරක්ෂක මණ්ඩලයේ රැස්වීම අපි තීරණය කරන්නෑ ඒක තීරණය කරන්නේ ජනාධිපතිතුමායි. නමුත් අනිවාර්යයෙන්ම මේකේ බැරෑරුම්කම බැලුවහම මේක විශේෂයෙන්ම මේ ලිපි යන එක එකක් දුරකථනයෙන් කතා කරලා පැහැදිලිවම ආරක්ෂ ලේකම්ට කියනවා මේක බැරෑරුම් තත්ත්වයක් මේක කිසිදෙයක් ground එකේ වෙන්නේ නෑ මේක මේ වගේ ප්‍රශ්නයක් ඇතිවෙන්න පුළුවන් ඒක නිසා මේක අනිවාර්යයෙන්ම නවත්වන්න කටයුතු කරන්න ඕනේ ඒක නිසා මේකට අවශ්‍ය කරන පියවර අපි ගන්න ඕනේ කියන එක කියලා. ඒ පියවර අපි හැටියට මට මේවා කරන්න පුළුවන් විශේෂයෙන්ම මේකේදී DMI වයි මේ කට්ටියට ගෙනත්ලා පොලිස්පතිවත් ගෙනත්ලා දැනුවත් කිරීමක් කරලා මේ අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගන්න කියන එක මට recommend කරනවා මම.sectary defence ඒ එක්කම මම හිටියා නම්

FAIR COMMENT BY JEZEEM

මම අපි අනිවාර්යෙන්ම ජනාධිපතිතුමාට කතා කරලා කියනවා මේ තියෙන Development එකටත් එක්ක මෙතනදි ගැටලුකාරී තත්ත්වයන් ගොඩාක් තියෙනවා මේ විදියට පිට රටිනුත් දැනුම් දීමමක් කරලා තියෙනවා. ඒක නිසා මේ threat එකට අපි මේ පිළිබඳ අවධානය යොමු කරන්න කියලා අපිට ජනාධිපති තුමාව දැනුවත් කිරීමක් කරනවා.

ප්‍ර; එහිදි ඔබට කීමට හැකියාවක් තිබේද සහ යෝජනාවක් වශයෙන් ආරක්ෂක ලේකම්වරයාට සහ ජනාධිපතිට රටේ ආරක්ෂාව තර කරන්න කියන කාරණය ප්‍රකාශ කරන්න පුළුවන්ද?

පි: නෑ . එහෙම අවස්ථාවලදී මොකද හේතුව රටේ ප්‍රධානම පුරවැසියා අපිට එතනදි අපිට තිරණ ගැනිම ඇවිල්ලා එතුමාගේ රාජකාරිය එතකොට අපි ඒ තීරණ ගැනීමේදී එතුමාගේ රාජකාරියට අපි පැහැදිලි ලෙස මේකේ threat එක මේකේදී වෙන්න පුළුවන්. Damage එක ඉතාමත්ම පැහැදිලිව ඉදිරිපත් කිරීමක් කළ යුතුයි.

ප්‍ර; එහිදි ජනාධිපතිවරයාට ගත හැකි ක්‍රියා මාර්ගය දැනුවත් කිරිමක් වෙන්නේ නැද්ද?

පි: ඒ අවස්ථාව අනුව ඒ ජනාධිපතිවරයාත් එක්ක තියෙන සම්බන්ධතාවය අනුව එතනදි කියන්න පුළුවන් මේක ආරක්ෂක ලේකම්තුමාටත් පැවසුවා නමුත් මේක වෙනේ නෑ ඔබතුමා චුට්ටක් මේක ලේකම්තුමාට සහ IGP ට මේක පොඩ්ඩක් තදින් මේක කියන්න කියන එක අපිට Recommend කරන්න පුළුවන් හැබැයි ඒක මෙතනදි කියන්නේ පුළුවන් දැන් ඉන්න ජනාධිපතිතුමාත් එක්ක අපිට මේ වගේ දේවල් කතා කරන්න බැහැ. මොකද එතුමා ඊට වැඩිය පැති තුනකට ගිහිල්ලා අපිට උපදෙස් දෙනවා මොනවාද කලයුත්තේ කියන එක.

ප්‍ර: මම ඔබතුමා 2019 අප්‍රේල් මාසේ සපත්තු දෙකට දාලා තියෙන්නේ ?

පි: ඔව්.

ප්‍ර: දැන් ආරක්ෂක ලේකම්වරයාට ඔබට හැකියාවක් තිබේද මේ මේ වගේ පියවරවල් ගත යුතු පියවරවල් මොනවාද කියලා දැනුම් දෙන්න?

පි: අනිවාර්යෙන්ම ඒක දැනුම් දීමක් කරනවා. නමුත් එතන ප්‍රශ්නේ තියෙන්නේ මේ ආරක්ෂක ලේකම් කියන්නේ එක පාරටම එදාට එන පුද්ගලයෙක් නෙමේ.ඒ ආරක්ෂක ලේකම් කියන්නේ එක ඒ ඒ කාලයේත් ඒ කියන්නේ මාස තුනක් ,මාස 04,ක් අපි දකිනවා කොහොමද එයා respond කරන්නේ කොහොමද මේවායේ කටයුතු කිරිමේ හැකියාවක් තියෙනවාද ඒ ඔක්කොම ටික අපි අධ්‍යයනය කරන්න ඕනේ ඉතින් ඒ අධ්‍යයන කිරීම අනුව අපිට මේකෙන් කියලා වැඩක් වෙන්නේ නැහැ කියලා හිතෙනවානම් අපි කියන එක තේරුමක් නෑ. අපි ලිඛිතව දැනුම් දීලා ඒක pressurize කරලා අනෙක් පැත්තෙන් එයාව ක්‍රියාවට නන්වන්න අපි අනිත් කටයුතු ගණනාවක් කරනවා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර; කිසිවක් සිදු නොවන විටක ඔබට හැකියාවක් තියේද යුධ හමුදාව නාවික හමුදාව ගුවන් හමුදාව සහ පොලීසිය මාර්ගයෙන් මේ රටේ ආරක්ෂාව තර කරවීමට යෝජනා කරන්න?

පි: විශේෂයෙන්ම ඒක depend වෙන්නේ ආරක්ෂක ලේකම් සහ ඉන්න ජනාධිපතිවරයා හැටියට. එතුමා සමහර වෙලාවට කැමති නැතිවෙන්න පුළුවන් අපි ඒ පැත්තෙන් මේක කරන්න කියලා කියනවාට නමුත් අපේ යුතුකම තමයි ජනාධිපතිවරයා, ලේකම්වරයා කොහොම වුනත් ඒ ගොල්ලන්ගේ ඒ කොහොමද personality ඒක identify කරලා මූලික අපේ ඩියුටිය විය යුත්තේ තොරතුරු ලබා දීමත් මුකුත් නෙමේ මේක වලක්වන්න ඉතින් වලක්වන්න ගත යුතු සියළු ක්‍රියාමාර්ග අපි ගත යුතුයි. ඒකේදී අපිට කියලා දැනුවත් කිරීම් තුලින් අපිට එකක් කරන්න පුළුවන් අනෙක් පැත්තෙන් දැන් අපෙත් භූමියේ කොටස් ඉන්නවා. යුධ හමුදා detect military Intelligence වුනත් කණ්ඩායම් ඉන්නවා ඒ කණ්ඩායම් යොමු කරලා පුළුවන් තරම් මේකේ detect එක ඒ කියන්නේ මේක damage.කර ගන්න පුළුවන් ඉතින් ඒක හැම තිස්සේම එක පැත්තකින් බලා ගන්න බැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර; සාක්ෂිකරු මම ප්‍රශ්නය ඔබට යොමු කරන්නේ මෙම කොමිෂම ඉදිරියේ දැනටමත් සාක්ෂි ලබා දීලා තිබෙනවා පූජ්‍ය ගලබොඩ අත්තේ ඥානසාර ස්වාමින් වහන්සේ ඔහුගේ සාක්ෂිය ඇසුරෙන් තමයි මං ඔබට මේ ප්‍රශ්නය යොමු කරන්නේ. 2013 වර්ෂයේදී පමණ ආරක්ෂක අමාත්‍යාංශය හරහා ගලබොඩ අත්තේ ඥානසාර ස්වාමින් වහන්සේ සහ බොදු බල සේනාව සහ DMI සහ රාජ්‍ය බුද්ධි සේවය අතර යම් කිසි තොරතුරු හුවමාරුවක් සිදුවීමක් ආරම්භ වනවාද?

පි; මම ඒ කාලයේදී හිටියේ 2013 දී මම හිටියේ DMI හැටියට නමුත් බොදුබල සේනා ප්‍රධාන ස්වාමිනි වහන්සේත් එක්ක මම සම්බන්ධ වෙන්නේ 2010 ඉදන්ම එතකොට එවකට මම හිටියේ ආරක්ෂක අමාත්‍යාංශයේ විදේශිය. බුද්ධි කටයුතු මෙහෙයුම් නිලධාරියා හැටියට එතකොට මේ වගේ සිදුවීම් වෙන කොට අපි ඒ කණ්ඩායමක් එක්ක සම්බන්ධවීමක් වුනා physically සම්බන්ධ වීමක් ඒ කියන්නේ බොදු බල සේනාවත් එක්ක ගිහිල්ලා ඒ ස්වාමින් වහන්සේ එක්ක සම්බන්ධවෙලා කරුණු කතා කරගෙන පන්සලට ගිහිල්ලා ගෙනත්ලා ඒ පැත්ත වෙනගමන්ම අනිත් පැත්තෙන් තවුහිද් ජමාත් වගේ කණ්ඩායම්ක් එක්කත් අපි සම්බන්ධ වෙලා ඒ කරුණු කාරණා කරගෙන අපි මේ පැති දෙකම අපිට හැකියාව ලැබුණා ආරක්ෂක අමාත්‍යාංශයට එකම කාමරයකට ගෙනත්ලා අපි ඒ පැත්තෙන් තියෙන තියෙන concern ටික

FAIR COMMENT BY JEZEEM

ඒ පැත්තෙන් කියන්න දෙනවා ගමන්ම අර පැත්තෙන් උත්තර දීමත් අපි සිදු කිරීම සිදු කරා. ඉතින් ඒ වගේ දෙයක් සිදුවුනා.නිරත්තරයෙන්ම මම බුද්ධි ඊට පස්සේ මම Director military Intelligence පත්වුනාට පස්සේ මේ සියළු සංවිධානත් එක්ක සම්බන්ධතාවයක් තිබ්බා ඒ සම්බන්ධතාවය ලියුම් වලට පමණක් නෙමේ physical සම්බන්ධතාවයක් තිබ්බා ඒ කියන්නේ. ඒ ගොල්ලන්ගේ. Concerns මොනවාද ඊට පස්සේ ඒවා ටික අරගෙන අයිත් අර පැත්තේ මොනවද තියෙන Concerns ඒ ඒ විදියට ලොකු ජාලයක් ක්‍රියාත්මක වුණා ස්වාමිනි.

ප්‍ර; ඒ පසුබිම තුල බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ නිලධාරියෙක් වන ශම්මි කරුණාරත්න යන නිළධාරියාව පත්කිරීමක් කරනු ලබනවාද මේ ජූජ්‍ය ගලබොඩඅත්තේ ඥානසාර ස්වාමීන් වහන්සේ සහ බොදු බල සේනාව සමඟ සම්බන්ධිකරණ කටයුතු කිරීම සඳහා?

පි: ඒකේදී මම කියන්න ඕනේ ස්වාමිනි විශේෂයෙන්ම බොදුබල සේනාව පමණක් නොවේ ඒ කියන්නේ වෙනම ඒ දවස්වල තිබ්බා තව රාවය කියලා සංවිධානයක්, ඒ එක්කම තිබ්බා ජමෙයිතුල් උලමා ,එතකොට .තවුහිද් ජමාත් මේ හැම කෙනෙක්ම මේ හැම සංවිධානයකටම අපි නිලධාරීන් පත් කරා. එතකොට මට මතක නෑ ශම්මි කියන නිලධාරියාද කියන මට මතකයි අපි තව හිටියා කර්නල් සුනිල් කියලා නිලධාරියෙක් විශේෂයෙන්ම ඒ ගොල්ලන්වත් මම යොමු කරා. Dedicatedly මේ සංවිධානත් එක්ක සම්බන්ධවෙලා නිරතුරුවම කටයුතු කරන්න කියලා මොකද එක පැත්තකින් අපි ඒ ගොල්ලන්ගේ තොරතුරු ලබා ගැනීම කරනවාත් එක්කම අපි පුළුවන් හැම අවස්ථාවකදීම ඒ අපි ඒ ගොල්ලන් ලබා ගන්න තොරතුරු නැවත වරක් මේ ඇත්ත මේවා බොරු මේවා පිළිබඳ විමර්ශනයක් කරගෙන යනවා කියන එක දැනුම් දීමක් කිරීම ටත් ඒ ගොල්ලන්ව violent පැත්තට නොයවා සම්පූර්ණයෙන්ම යම් කිසි පරිපාලනයකට ලක් කිරීමත් අපි සිදු කරා අපේ සියළුම කණ්ඩායම්වලට අපි සිදු කරා.

ප්‍ර: දැන් ඔබ 2016 අගෝස්තු මාසය වෙනකම් නේද?

පි: 2016 නොවැම්බර් මාසය වෙනකම්.

ප්‍ර; නොවැම්බර් මාසය වෙනකල් අධ්‍යක්ෂක වශයෙන් DMI එකේ ඔබ සේවය කරනවා?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර; 2015 වර්ෂයේදී මහ මැතිවරණයට ආසන්නයේ හෝ ඊට පසුව සහරාන්ගේ මල්ලි වන රිල්වාන් යන අය සම්බන්ධයෙන් ඔහුට තුවාල වීමක් සම්බන්ධයෙන් තොරතුරු ඔබගේ අංශයට අනාවරණය වෙනවාද?

පි: ස්වාමිනි මේ රිල්වාන් කියන පුද්ගලයා මම හිතන්නේ තුවාල වෙන්නේ 2017 වගේ මට මතක හැටියට නෑ ඊට කලින්.

ප්‍ර: ඒ බෝම්බය නේ?

FAIR COMMENT — BY JEZEEM —

පි: නෑ මට එහෙම ආරංචියක් එන්නේ නැහැ.

ප්‍ර; 2015 වෙදී එවැනි ආරංචියක් එන්නේ නැහැ?

පි: එවැනි ආරංචියක් එන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර; දැන් මම දැන් අහන්නේ 2016 නොවැම්බර් සහ ඊට ප්‍රථම තිබ්බ දැනීම සම්බන්ධයෙන් ඒ වකවානුවේදී අනාවරණය වෙනවාද මේ සහරාන් හෂිම් සහ ඔහුගේ කණ්ඩායමට යම් කිසි දේශපාලන සහායක් තිබෙන බව ?

පි: ඇත්තටම ස්වාමිනි 2016 නොවැම්බර් වන කොට අපි කණ්ඩායම් කීපයක්ම අපි Engage කලා කණ්ඩායම් අපි monitor කරා. නමුත් මේ සහරාන්ගේ මේ NTJ කියන එක actively involve වෙන්නේ 2017 න් පස්සේ කරලියට එන්නේ .ඊට පස්සේ අර ගැටුම් ඇතිකරගෙන ඒ ඔක්කෝම ටික දේශන අර ඒ වගේ ගොඩාක් දේවල් පටන් ගන්නේ 2017 න් පස්සේ 2017 ට කලින් මේගොල්ලන් actively සම්බන්ධ වීමක් වෙන්නේ නෑ. ඒ නිසාම DMI එකට කියන්නේ 3000,4000, විතර පිරිසක් ඉන්නවා. එතකොට විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ Battalion 02 ක්ම තියෙනවා. ඉතින් ඒ ගොල්ලෝ නිරතුරුවම සම්බන්ධවීම් කරනවා ඉතින් එතනදී මගේ දැනුමේ හැටියට අර මගේ ළඟට එනකොට ඒ තොරතුරු එක්රැස් කරලා ඒ පෙරිලා ඒ ඔක්කෝම ටික හැම එකක්ම එන්නේ නෑ. ඒ අවශ්‍ය එක්තරා ප්‍රමාණයකට ආවාට පස්සේ තමයි ඒ තොරතුරු බුද්ධි අධ්‍යක්ෂකට පුද්ගලයෙක් විදියට මට ලැබෙන්නේ ඒ 2016 නොවැම්බර් වෙනකල් සහරාන් කියන පුද්ගලයෙක් පිළිබඳව මගේ දැනුමට එහෙම නැත්නම් මගේ රේඩාර් එකට වැටුනේ නැහැ ස්වාමිනි.

ප්‍ර: මේ ප්‍රශ්නය මම ඔබගෙන් විමසන්නේ ඊයේ දින කොමිෂන් සභාව ඉදිරියේ මෙහෙය වූ සාක්ෂිය අනුසාරයෙන් සහරාන් හෂීම්ට සතුව අවි ආයුධ තිබෙන බවට ඔබගේ DMI අංශයට 2015ට පෙර වාර්තා වීමක් සිදුවෙනවාද ?

පි: ස්වාමිනි විශේෂයෙන්ම සහරාන් කියන පුද්ගලයාගේ නම මට මතකයට එන්නේ නැහැ. අවිආයුධ කියන්නේ විශේෂයෙන් මුස්ලිම් වෙනමම ඉස්සර ඒ කියන්නේ මුල ඉදන්ම මුස්ලිම් බලකා තිබ්බා මුස්ලිම්වරු වෙනමම battalion හදලා හමුදාවට එක්කිරීමට උත්සහ කරගත්තා. ඒ එක්කම විවිධ underworld එකේ විවිධ කටයුතුවලට නෑහෙන්න සහභාගිත්වයක් දැක්වුවා ඔය මුස්ලිම් ඒ ඒ යම් යම් එක ඔය criminal වැඩවලට සම්බන්ධ පුද්ගලයෝ. නමුත් අන්තවාදී පිරිස් වලට අවිආයුධ තියෙනවා කියන එක කිසියම් අයුරකින් ආවේ නෑ. නමුත් අනෙකුත් අවස්ථාවලදී අපි අත් අඩංගුවට ගත් අවස්ථා ගණනාවක් තියෙනවා. විශේෂයෙන්ම Organized crime . වලදී එක්කෝ ආයුධ විකුණන්න එහෙම නැත්නම් ඒ ආයුධ හරහා මංකොල්ල කෑම් කරන්න එහෙම

FAIR COMMENT BY JEZEEM

නැත්නම් ඒ ආයුධ බයකරලා වෙන වෙම Underworld කරනවා වගේ කණ්ඩායම් ගණනාවක් තිබ්බා අපි ඒවා අත්අඩංගුවට අරගෙනත් තියෙනවා අපි ඒ අවි ආයුධත් අත්අඩංගුවට අරගෙන තියෙනවා. දැනුත් අපි අත්අඩංගුවට ගනිමින් පවතිනවා නමුත් . ආගමික අන්තවාදී කොටඨාශයකට අවිආයුධ තියෙනවා කියන එක මගේ දැනුමේ හැටියට මට ලැබුණේ නෑ.

ප්‍ර; යම් කිසි මුස්ලිම් ජන කොටස් නැත්නම් කණ්ඩායම් සතුව අවි ආයුධ තිබෙන බවට තොරතුරු ලැබීමක් ඒ කාලයේ සිදු වුනාද?

පි: අනිවාර්යයෙන්ම ස්වාමිනි මොකද විශේෂයෙන්ම අපි එවකට ඒ කියන්නේ 2009 යුද්ධයෙන් පස්සේ එනකොට අපි අවිආයුධ ගණනාවක් අපි දුන්නා. ඒ කියන්නේ විශේෂයෙන්ම ගම් ආරක්ෂා කරන්න මුස්ලිම් ජාතිකයෝ වෙන වෙනම කණ්ඩායම් වලට ඒ බුද්ධි අංශය සහ සියළුම වෙනකම් EPRF, ENDLF අති සෑහෙන පිරිසකට දුන්නා විශේෂයෙන්ම නැගෙනහිර පලාතේ මොකද මම 1990 ඉඳන් 1997 වෙනකම්ම මම මඩකලපු ප්‍රදේශයේ මම හිටියේ ඉතින් 1992 ඉඳන් ඉතින් ගණනාවකට තිබ්බා අදටත් ගැටලුවක් තියෙනවා මේ අවි ආයුධ කොහේද තියෙන්නේ එක ගැන මොකද ඒ අවිආයුධවලට ගොඩාක් දුරට Documentation . නෑ. ඒ අවිආයුධ අපි ආරක්ෂාව සඳහා තමයි ලබා දීලා තියෙන්නේ . ඒ අවිආයුධ විවිධාකාර වශයෙන් LTTE සංවිධානයත් 2009 දී මේවා වෙනකොට ඒ අවි ආයුධ ගණනාවක් ඔය මුස්ලිම් සංවිධානවලටත් විකුණපු අවස්ථා තිබුණා. තවමත් අපිට ඒ අවි ආයුධ හම්බෙනවා. ඒ තිබ්බ Culture එක ටිකක් වෙනස් අනෙකුත් ප්‍රදේශත් එක්ක ගත්තාම. මේ සාමාන්‍යයෙන් අද වුනත් තුවක්කුවක් එක්ලක්ෂ පනස් දහසකට ගන්න පුළුවන්.පුද්ගලයකුට අවශ්‍ය නම් නමුත් ඒ දවස්වල මං මගේ මතකයේ හැටියට සාමාන්‍යයෙන් රුපියල් 15000 ක්ට දුන්නත් තුවක්කුවක් ගන්න පුළුවන්. ඒ විදියට තමයි අවි ආයුධ ගණනාවක්ම ඔය නැගෙනහිර පලාතේ තිබ්බේ. ඒ එක්කම LTTE සංවිධානය දෙකට කැඩුනායින් පස්සේ කරුණාගේ සාමාජිකයෝ එතන හිටියා අතිවිශාල ගණනක්. මේ අවි ආයුධත් සෑහෙන්න විකුණලා තිබ්බා. සමහර අය ඒ අවිආයුධ මුස්ලිම්වරු අරගෙන තිබ්බා. ඒ විදියට තිබ්බ වාතාවරණයක් තමයි නැගෙනහිර පළාතේ මම දැක්කේ බුද්ධි අධ්‍යක්ෂක හැටියට 2012 ඉඳන් 2010 දී කටයුතු කිරීමේ දී.

ප්‍ර: එතකොට ඔබ කියන විදියට ඔය ආයුධ ලබා දීමක් සිද්ධවුන කාලසීමාව මොකක්ද?

පි: ඒ ඒ ආයුධ ලබා දීම් විවිධාකාරයෙන් සිදුවුනා විශේෂයෙන්ම ඒ දවස්වල අපි ගත්තොත් එහෙම අපි දැක්කා කාත්තන්කුඩි පල්ලිවලට ප්‍රහාර එල්ල වෙනවා. ඒ ප්‍රහාර එල්ලවීමත් එක්කම අපි මුස්ලිම්වරු වෙනුවෙන්ම වෙනමම කට්ටිය එකතු කරලා අපි සමහර වෙලාවට අපි ගත්තා ට්‍රේනින්

FAIR COMMENT BY JEZEEM

කරලා ඒ ගොල්ලන්ට අපි අවිආයුධ ලබා දුන්නා . ඊට අමතරව දෙමළ LTTE විරෝධී සංවිධාන ගොඩාක් තිබ්බා Plot, EPDP ඒ ගොල්ලෝ වෙන වෙනම group වලින් තමයි මේවා කරේ. ඒ ගොල්ලන්ගේම අවි ආයුධ තිබ්බා ඒ අවිආයුධත් අපි විවිධාකාරයෙන් බුද්ධි හැටියට අපි ඒවා ලබා දීම්සිදුකරලා තිබ්බා මොකද එතනැදී ඒගොල්ලෝ තමයි LTTE විරුද්ධව කටයුතු කරේ. ඉතින් ඒ තිබ්බ වාතාවරණය ඉතාමත්ම වෙනස් මොකද LTTE සංවිධානයට ඒ අවස්ථාවේදී මරන්න උවමනා කරලා තිබ්බේ ඇවිල්ලා යුධ හමුදාපති විතරක් නෙමේ. ENDLF,EPRF,PLOT,TELO, ඒ නායකයන්ව මැරුවා ඉතින් ඒ වගේ වාතාවරණයකදී ඒ ආරක්ෂාව සඳහා විවිධාකාරයෙන් නිකුත් කරලා තිබ්බා. ඊට අමතරව LTTE සංවිධානය කැඩෙනවාත් එක්කම එතනිනුත් ලොකු අවිආයුධ ප්‍රමාණයක් නැගෙනහිර පලාතට ගියා. රටක් ඒ කියන්නේ රටක් හැටියට මං හිතන්නේ අවිආයුධ අර LTTE සංවිධානයට ලබාදීම් කරා වැලිඔයේදී. ඒකට වෙනම reasons තිබ්බා ඒකට ඒ අවිආයුධ දෙන්න. මොනද ඒ අවස්ථාවේදී LTTE සංවිධානය තිබ්බා ඊට පස්සේ IPFK එක තිබ්බා දැන් ගොඩාක් ඒ අවිආයුධ තිරණය වෙන්නේ රටක අවස්ථානුකූලව ඒ අවස්ථාවේදී තියෙන Situation එක අනුව නමුත් ඒ Situation එක ස්වාමීනි අද තත්ත්වයත් එක්ක අපිට නිර්ණය කරන්න අමාරුයි අද තත්ත්වය වෙනස් එදා තත්ත්වය වෙනස් එදා අපි දැක්කේ නෑ ආගමික අන්තවාදයක් තියන පිරිස් ඉන්නවා. එදාට තිබ්බ ලොකුම ප්‍රශ්නය වෙලා 2009ට කලින් තිබ්බේ LTTE සංවිධානය මැඩ පවත්වන්න ඒකට අපි උපරිම ශක්තිය යෙදෙව්වා. ඊට පස්සේ අපි දැක්කා Organized crimes වලදී විවිධ විවිධ කණ්ඩායම් එකතුවෙනවා. ඊට පස්සේ අපි deal කරේ ඒක. ඒ එක්කම විශේෂයෙන් මං හිතන්නේ අන්තවාදය අවි ආයුධ යන්න පටන් ගන්නේ ඇවිල්ලා අර පොලිස් නිලධාරියාව මරණවාත් එක්කම තමයි ඒ අවිආයුධ යන්න පටන් ගත්තේ. ඒක දැන් සහරාන්ගේ මගේ දැනුමේ හැටියට මේ ගොල්ලන්ගෙන් දැනට අපි recover කරපු අවි ආයුධ ඔය පිස්තෝල මේ සියළු දෙයක්ම ඇවිල්ලා මුල් කාලේ ගත්ත අවිආයුධ නෙමේ මොකද ඒ ගොල්ලන්ට එහෙම අවිආයුධ තිබ්බානම් ඒ ගොල්ලෝ අර පොලිස් නිලධාරියා මරලා අවියයි පිස්තෝලයයි ගන්න කිසිම අවශ්‍යතාවයක් නෑ. ඉතින් එතනදී මේක Violent Extremism එක develop වුනේ ඇවිල්ලා 2017 න් පස්සේ ඊට පස්සේ තමයි මේ හැම ඇක්ටිවිටියක්ම පොලිස් නිලධාරියාත් මරලා Explosive අරගෙන මේ ඔක්කොම වෙන්නේ ඊට කලින් අපි දකින්නේ Religious Extremism එකක් ඊටත් කලින් අපි දකින්නේ ඒ Religious Extremism එකට අවශ්‍ය කරන පසුබිමක් ඊටත් කලින් අපි දකින්නේ විදේශිය රටවල් කොහොමද මුස්ලිම්වරුන්ගේ

FAIR COMMENT BY JEZEEM

අනන්‍යතාවය සම්පූර්ණයෙන්ම ගියා සහ මුස්ලිම් ඒවාත් එක්ක වෙන් වෙන්නේ කියන එක ඉතින් ඒකේදී අපි දකිනවා දේශපාලනඥයන් ඒ එක්කම ආගමික නායකයින් ඒ එක්කම ව්‍යාපාරකයින් ඒ එක්කම අනිකුත් සාමාජීය ක්‍රියාකාන් විශේෂයෙන්ම අර සමහර පිටරටවල් එක්ක එකතුවෙලා මුස්ලිම් අනන්‍යතාවය ශ්‍රී ලාංකික අනන්‍යතාවය නැති කරගෙන අරාබි අනන්‍යතාවයක් ඇති කරගෙන ඒ තුලින් මම කායපු Long term, midterm plan එකකට තමයි සම්පූර්ණයෙන්ම ගියේ ඔය Calilphate එක අපි අබුබක්කර් කතා කරාට මුලික වශයෙන්ම ගත්තොත් එහෙම සුන්නි ෂියා මේකේදී ඒ සුන්නි පාර්ශවයට ඕනේ සම්පූර්ණයෙන්ම සුන්නි මුස්ලිම්වරුන්ගේ මේකක් ඇතිකරන්න. එතකොට ෂියා පාර්ශවය ඉරානයට අවශ්‍ය කරලා තියෙනවා ඉරානයටත් එක්කම මේවා කරන්න. ඒවා බටහිර රටවල් ඒවා Exploit කරගෙන ගියා නමුත් අවසානයේදී වුණේ විශේෂයෙන් ලංකාවේ අනෙකුත් රටවල් වල මේක ව්‍යාප්තිය කරන්න ඒ ගොල්ලෝ මුදල් පුළුවන් විදියට උපයෝගි කරගෙන ඒ ජනතාව කරගෙන ගියා ඒක දේශපාලනකරණයත් එක්කම සම්පූර්ණයෙන්ම ආගමික නැඹුරුවත් වෙලා තමයි ස්වාමිනි මේ තත්ත්වය අද ඇතිවුනේ

ප්‍ර; හරි මං ඔබ ඒ අවස්ථාවේදී මට තව ප්‍රශ්නයක් තියෙනවා ඔබ කියපු පිළිතුරකට නමුත් ඊට පෙර ඔබ කියන පරිදි ඔබගේ දැනීමේ හැටියට මේ මුස්ලිම් කොටස් නැත්නම් වෙනත් ජන කොට්ඨාශවලට මේ අවි ආයුධ සැපයීම නතර වෙන්නේ කොයි අවුරුද්දේද?

පි: විශේෂයෙන් 2009 ඉවර වෙනවාත් එක්කම අපේ threat එක ඒ කියන්නේ 2009 වෙනක් අපි ඉතා පැහැදිලිව සියළුම බුද්ධි අංශ රටේ සියළුම දෙනාම යොමු වෙන්නේ LTTE ත්‍රස්තවාදය වෙනුවෙන් අනික් ඒවාට අපි යොමු කරේ නෑ අපි සම්පූර්ණයෙන්ම කරේ මේ රටේ ත්‍රස්තවාදීන්ගෙන් මුදවා ගන්න තමයි හැම දෙයක්ම යොමු කරේ. නමුත් 2009 න් පස්සේ මේ threat එක වෙනස් වුනා. ඒතකොට තමයි 2010 වෙනකොට තමයි මේ මුලින්ම ආගමික ත්‍රස්තවාදය Extremism එක ඇතිවෙන්නේ 2009 ට කලින් ආගමික වෙනස්වීමක් අපි දැක්කේ නෑ. එතකොට ඒ ඒක්කම අපි දැක්කා Organized crime මිනිස්සුන්ව පිටරට යනවා Human smuggling ඇතිවෙනවා ඒ එක්කම අර ත්‍රස්තවාදීන් ඒ තිබ්බ ආකල්පයක් එක්ක ඇතිවෙච්ච මිනිස්සු වෙනත් මාර්ගයෙන් සල්ලි උපයාගෙන කර ගන්න ඇතිවෙනවා. ඒ එක්කම අපි දැක්කා අනිකුත් සංවර්ධනයත් එක්කම ආර්ථික පැත්තෙන් වාසි ලබා ගන්න කටයුතු කරා. ඒ එක්කම දේශපාලනඥයන් දැන් ඒ දවස් වල යම් කිසි පාලනයක් එක්ක නැති නිදහසත් එක්කම ඒ නිදහස උපයෝගී කරගෙන අර ආරක්ෂාව පිළිබඳව ලොකු අවධානයක් යොමු නොකර යම් යම් දේවල් වල නිරත වෙන්න ඒ වගේ දේවල් අපි දැක්කා අපි එතකොට ඒ threat

FAIR COMMENT BY JEZEEM

එක2009 Identify කරා මුලික වශයෙන්ම කරේ සියළුම අවි ආයුධ නැවත වරක් ලබා ගැනීමට අපි ක්‍රමවේදයන් කීපයක්ම යෙදෙව්වා. ඒක තමයි මුලිකම ක්‍රමවේදය තමයි සියළුම දෙනාටම තම අවි ආයුධ Surrender කරන්න අපිකටයුතු කරා. ඒ එක්කම 2011 වසරේ දී අපි අහනවා වසරකදීම ඒ T 56 වටිනාකම රුපියල් 15000 නම් අපි 25000 ක මුදලක් අපි ලබා දුන්නා මේ එක්කම ගැසට් කරලා පොලිසිය විසින් නිවේදනය කරලා අපි poster campaign එකක් කරලා සම්පූර්ණයෙන්ම අවි ආයුධ ලබා ගන්න කටයුතු කරා. ඉතින් එතකොට ඒ වගේ අපි අති විශාල ආයුධ ගණනාවක් අපි එකතු කිරීමක් කරා. ඒ එක්කම මේ සියළුම කණ්ඩායම් අපි ඒ ගොල්ලන්ව disarm කරා හැබැයි ඒ කරගෙන යන කොටත් විශේෂයෙන්ම අවිආයුධ වළලපු අවි ආයුධ ඒ එක්කම ඊට වැඩිය weapon එක 25,000 කට වැඩිය weapon එක use කරලා ඒ ගොල්ලන්ට කරන්න පුළුවන් සහ ආදායම ලබා ගන්න පුළුවන් වැඩිවෙන නිසා සමහර මිනිස්සු මේ අවි ආයුධ අපිට ලබා දීම් සිදු කරේ නැහැ. ඉතින් ඒ ආයුධ ලබා ගැනීම අපි 2009 ඉදන්ම ඉවර වෙච්ච ගමන්ම යුද්ධය මූලිකවම කලේ ඇවිල්ලා මේ අවි ආයුධ ලබා ගැනීම මොකද ඒ අවිආයුධ ලබා ගන්න ස්වාමිනි අපි පැහැදිලිවම බුද්ධි අංශ හැටියට අපි දැක්කා threat එක මේ group වලට මේ අවි ආයුධ තිබ්බොත් වෙන්න පුළුවන් ඒ එක්කම අපි දැක්කා තරුණ කණ්ඩායම ක්‍රියාකාරී වෙන අන්දම එතකොට තරුණ කණ්ඩායම අපි ඒ ගොල්ලන්ව අපි අවි ආයුධ කරලා නිකම් හිටියේ නෑ ඒ ගොල්ලන්ව අපි දේශපාලන ප්‍රවාහයට යොමු කරා TNVP කියන පක්ෂයක් ඒ විදියට ඇති කරගන්න අවශ්‍ය කරන පසුබිම සකසලා ඒ අවි ආයුධ ගත්ත පිරිස් ප්‍රධාන නායකයන්ව අපි යොමු කරා ඒ පැත්තට. ඉතින් ඒ වගේ දේවල් අපි කරා. ඒ එක්කම අපි ලොකු Reconciliation Process එකත් ගියා දැන් ඔය K.P වගේ පුද්ගලයින් ආවට පස්සේ ඒ ගොල්ලන්ව අරගෙන ඒ ගොල්ලන් ඇවිල්ලා අපි කෙලින්ම නිතිය හමුවට ගෙනත්ලා කුඩුවට දානවාට වැඩිය ඒ ගොල්ලන්ගේ දක්ෂතාවය හඳුනාගෙන අපි ඒ ගොල්ලන්ව කොහොමද මේ රටේ සංවර්ධනයට යොමු කිරීමේ ක්‍රියාවලියක් අපි කරා. අද ඒ පුද්ගලයා Orphanage එකක් run කරනවා ළමයින් 400 කගේ. එතකොට මේ විදියට අතිවිශාල reconciliation process එකක් ගියා ජාතික ආරක්ෂාව සහ reconciliation එකක් ගියා හැබැයි ඒ වෙනකොට අර විශේෂයෙන්ම මේ මුස්ලිම් අන්තවාදය අපේ ලංකාවට ලොකු බලපෑමක් එල්ල කරේ නෑ. ඒ බලපෑම එල්ල කරන්න පටන්ගත්තේ ක්‍රම ක්‍රමයෙන් ඇවිල්ලා අර මේ අරාබි පාසැල් බිහිවීම තුලින් ඒ එක්කම මූණ වහලා ඒ DRESS එක වෙනස්වීම තුලින් ඒ එක්කම හලාල් කිරීම තුලින් මේ ආදී ගණනාවක්ම අපි දැක්කා 2009 න් පස්සේ

LEAK COMMENT BY JEZEEM

ඉතාමත්ම වේගයෙන් මේක වෙනවා අනෙකුත් රටවල් වලින් මුදල් ලැබීම වුනත් අතිවිශාල වශයෙන් සිදු වුනා.

ප්‍ර: මගේ අවසාන ප්‍රශ්නය මේ සංවිධානවලට විදේශීය ආධාර ලැබෙනවාද? ලැබෙනවා නම් මොන ආයතනද මොන රටවල්ද?

පි: ස්වාමිනි දැන් මෙතන මුදල් ලැබීම කෙළින්ම මුදල් ලැබෙන්නේ නෑ අවි ආයුධ ගන්න කියන එක මං අර මුලින් කියපු විදියට සුන්නි ෂියා පාර්ශවයත් එක්කම දෙකඩ කැඩෙනවා අපි ඉතාමත්ම පැහැදිලියි දැන් මේ ශියා සුන්නි පාර්ශවය තමයි 98% ඉන්නේ ලංකාවේ මේ සුන්නි පාර්ශවය වර්ධනය කරගන්න ඒ කියන්නේ මේ සමාජය වර්ධනය කර ගන්න ඒ කියන්නේ සමාජය CONTROL කර ගන්න ක්‍රම කීපයක්ම තියෙනවා එකක් තමයි ඇවිල්ලා පල්ලි ඒ කියන්නේ මස්ජිත් දැන් මේවා අතරේ සාමාන්‍යයෙන් මුස්ලිම් ජාතිකයෙක් පස්වේලම ගිහිල්ලා ආගම අදහන එක කරනවා. එතකොට මේක සම්පූර්ණයෙන්ම පරිපාලනයට ලක්කරනවා යම් යම් සංවිධාන. එතකොට මේ සංවිධාන එක පැත්තකින් ලං කරනාවත් එක්කම අනිත් පැත්තෙන් ළමයෙක් ඉපදිච්ච දවසේ ඉදන්ම ඒ ළමයා මේ වෙනකන්ම ඒ ආගමට යොමු වීමක් සිදුවෙනවා. ආගම අනුව ජීවත් වීම. ඒක තමයි අරාබි පාසැල් වලට ඇවිල්ලා ඊට පස්සේ එතැනින් ඒ මද්‍රසාවලට ඇවිල්ලා ඒ මද්‍රසා හරහා වෙනමම UNIVERSITIES වලට ඇවිල්ලා ඒ විදියට අපි බොහෝම මේ සමාජය ගැන කතා කරන්නේ ඒ වගේ එතකොට එතැනදි BOTTLENECKS ටික දන්නවා අපි මොකක්ද වෙන්නේ කියලා. ඒ කියන්නේ අපි ආගමික නායකයන් අපි අල්ලගන්න ඕනේ. අපි දේශපාලඥයන් අපි ග්‍රහණයට ගන්න ඕනේ. ඒ එක්කම සිවිල් සමාජය කියන පැත්තත් අපි ගන්න ඕනේ. ඒ එක්කම මද්‍රසා මේ අධ්‍යාපනය කියන එක අපි දියුණු කරන්න කටයුතු කරන්න ඕනේ. මේ ආදි වශයෙන් මේවා වලට අති විශාලව FUNDS එනවා. මේ FUNDS ටික එන එකේ අපි දකින්නේ නෑ මේක අවිආයුධ ගන්න කියලා එන්නෙත් නෑ.ආගම ප්‍රචාරය කරන්න කියලා එන්නෙත් නැහැ. මේ මුදල් එන එක සීමාවක් නෑ. දැන් අර CHARITY QATAR එක ගත්තම අපි දැක්කා 2018 ඉදන් පහුගිය අවුරුදු එක හමාර වෙනකොට මිලියන 4000 ක් ඇවිල්ලා තියෙනවා. අතිවිශාල මුදල් ප්‍රමාණයක් එතකොට අපි මේ වෙන කොට 2012 ඉදන් 2017 වෙනකොට සාමාන්‍යයෙන් අවුරුද්දකට පිටරට PREACHERS ලා ඒ කියන්නේ සෞදි අරාබිය ඒ PREACHERS ලා සාමාන්‍යයෙන් අවුරුද්දකට 300 ක වගේ ප්‍රමාණයක් ලංකාවට එනවා. ඒ එක්කම අතිවිශාල SCHOLARSHIP ප්‍රමාණයක් දෙනවා වෙන රටවල ගිහිල්ලා STUDY කරන්න. දැන් අපි නිලාම් ගැන කතා කරා නිලාම් ඇවිල්ලා පළවෙනි එක්කෙනා ලංකාවෙන් මැරිච්ච හැබැයි නිලාම් ගේ ඉතිහාසය ගැන කතා කරොත් අපිට මේක ඉතාමත්ම එනවා මොකද නිලාම්ගේ ඉතිහාසය මෙයා පකිස්ථානයට යන්නේ SCHOLARSHIP එකක් හම්බවෙලා එයා විවාහ

FAIR COMMENT — BY JEZEEM —

වෙන්නෙත් ඇවිල්ලා ඒ SCHOLARSHIP එකේදී . ඊට පස්සේ එයා අවුරුදු තුනක් ඩිග්‍රී එක කරලා තව අවුරුදු දෙකකට එයා පශ්චාත් උපාධියක් කරනවා ISLAMIC LAW එක ගැන. ඊට පස්සේ ලංකාවට එනවා ඉතිං එතකොට මේ ගත්තාම කොහොම මෙයාට SCHOLARSHIP එක හම්බුනේ මෙයාට කොහොමද ඒ අභාෂය ලැබුණේ. මෙයා කොහොමද මේ තත්ත්වයට පත්වුනේ. ඉතින් මේ හැම SUICIDE CARD කෙනෙක්ගේම ඉතිහාසයක් තියෙනවා. මේ ඉතිහාසයේදී weapon ගන්නවත් එහෙම එතකොට මෙයාට කරන වෙන ක්‍රියාවලියන් වලටත් මුදල් ලබාදීම් කරන්නෑ. මේ මුදල් ලබාදීම් කරන්නේ LONG TERM PLAN එකක් එක්ක MID TERM PLAN එකක් එක්ක ඒ විදියට ක්‍රියාවලියක් තමයි අද සිදු වෙන්නේ ඒ සිදුවීම කරන්න පුළුවන් වෙන්නේ මං අර කියපු SOCIO POLITICAL ECONOMIC INSTABILITY එකක් වුනාම රටක් හැටියට අපි බොහෝම අපිව දුර්වල කරන්න හැම තිස්සේම අනික් රටවල් අපි උත්සහ කරනවා ඒ දුර්වල වීම තුලින් අපිට ගොඩාක් දේවල් අපිට COMPROMISE කරන්න සිදු වෙනවා ඒ COMPROMISE කිරීමේදී දැන් මෙතනදී අපිට MIDDLE EAST එකට විරුද්ධව කටයුතු කරන්න අපහසුයි මොකද අපේ තුන් වෙනි රටට එන විදේශ ආදායම එන්නේ ඒ රටවල්වලින් එතකොට අනික් පැත්තෙන් ඇවිල්ලා ඒ පැත්තෙන් එද්දි මේ පැත්තෙන් අති විශාල මුදල් ප්‍රමාණයක් එනවා ඒවා හරි ක්‍රමවේදයකට ලක්වෙන්නේ නෑ. එතකොට පල්ලි ගණනාවක්ම ඒ වලින් හැදෙනවා මද්‍රසා ගණනාවක් හැදෙනවා SCHOLARSHIP කී දෙනෙක් යනවාද කී දෙනෙක් එනවාද කියලා අපි දන්නේ නෑ. මේ ආගමික නායකයින් ඇවිල්ලා මොනවාද උගන්වන්නේ කියන එක අපි දකින්නේ නැහැ. එතකොට ඇයි මේ රටවල් මේ විදියට මේ INVEST කරන්නේ ඇයි මේ රටවල් මේ විදියට මේවා කරන්නේ. එතකොට ඒ ගොල්ලන්ට පැහැදිලි අරමුණක් තියෙනවා එතකොට ඒ අරමුණට අපේ ඉන්න මුස්ලිම් ජනතාවත් නොදැනුවත් හෝ දැනුවත්ව මේකට සම්බන්ධවීමක් කරනවා ඒ සම්බන්ධ වීම කරන කොට අර නැති ෂරියා ලෝ එකක් ඇති කර ගන්නවා. ඒ ISLAMIC LAW එක අනුව ජීවත් වෙන්න ඕනේ කියලා එතකොට ළමයා වුනත් අර විදියට සමාජයේ ඒ ආකාරයෙන් එයාව යොමු කරනවා. දේශපාලනඥයෝ මේ හැම දෙයක්ම මෙතැනට යොමු වෙනවා.

ප්‍ර; මං කෙටියෙන් අහන්නේ ඔබට අන්තවාදයටම අරමුණු කර ගෙන අධාර සපයන ආයතන හෝ විදේශ රටවල් ඉන්නවාද?

පි: අපිට කෙලින්ම DIRECTLY ස්වාමිනි අපි එහෙම DIRECTLY කියන්න අමාරුයි නමුත් මෙහෙම එකක් කියන්න පුළුවන් දැන් QATAR CHARITY එක රටවල් මම දැනුවත්ව රටවල් තුනක තහනම් ඊශ්‍රායලය පැහැදිලි කරලා තියෙනවා මේක ඇවිල්ලා තහනම් සංවිධානයක් අනු බල දෙනවා කියලා ත්‍රස්තවාදයට ඒ එක්කම බහරේන් රටෙන් මේක තහනම් කරලා

FAIR COMMENT BY JEZEEM

තියෙනවා තව එක රටක් තහනම් කරලා තියෙනවා. එතකොට එහෙම සංවිධානයක් අපේ ලංකාවට මිලියන 4000 ක් එවලා තියෙනවා 2015 ඉදන්ම සම්බන්ධ වෙලා තියෙනවා යම් යම් මුදලක් එවලා 2018 ඉදන් අපි මේක INVESTIGATE කරන කොට අපිට දැන ගන්න ලැබුණා මිලියන 4000 ක් එවලා තියනෙවා කියලා ඒ මිලියන 4000 න් කොටස් තමයි දැන් හොයන්නේ මේ මිලියන 4000 SORRY ලක්ෂ 4000 කොහාටද ගියේ කියන ඒක. දැන් අපි ඒ පිළිබඳව INVESTIGATE කර ගෙන යනවා.ඉතින් ඒක අපි ඉදුරාම අපි කියන්නේ තවත් රටකින් තහනම් කරපු දෙයක් නිසා ඊට අමතරව මුදල් ලබා දීම විශේෂයෙන්ම මේ සහරාන්ගේ කණ්ඩායමේ කටයුතු වලට මුදල් ලබා දීම ක්‍රම දෙක තුනකට වුනා. එකක් තමයි මේ ව්‍යාපාර ඇති කිරීම තුලින් ඒ ව්‍යාපාරිකයාට ලාභ ලබා දීමේ ක්‍රියාවලියක් සිදුවුනා. ලංකාව තුලම ඒ කියන්නේ යම් යම් ක්‍රියා පටි පාටින්වලින් එහා පැත්තට ගිහිල්ලා යම් කිසි දෙයක් සිදුවෙලා තියෙනවා නම් ඊබ්‍රාහිම් කියන මුදලාලිට මෙච්චර කෝටිපතියෙක් වෙන්න SPICE TRADE එකේ 4 වෙනියාට යන්න අතිවිශාල මුදලක් එකතු කරන්න අපි දැන් හොයාගෙන යනවා කොහොමද මේ පසු බිම සැකසුනේ කියලා ඒ එක්කම අපි දැක්කා සමහරවිට වෘත්තිමය වශයෙන් තවම INVESTIGATION PROCESS එකේ ඉතාමත්ම දොස්තරවරු ඒ වගේම වෘත්තිය මට්ටමේ පිටරට කට්ටිය ගොඩාක් මුදල් එවලා තියෙනවා මේ සහරාන්ට කෙලින්ම DIRECTLY . ඒකේදී අපිට ඒ ACCOUNTS ටික දැනට අපිට හම්බෙලා තියෙනවා. ඒ ACCOUNTS හොයලා තියෙනවා හැබැයි රටවල් වශයෙන් නෙමේ පුද්ගලයෝ වශයෙන්.

ප්‍ර; ඒ ACCOUNTS තියෙන්නේ සහරාන්ගේ නමින්ද නැත්නම් යම් ආයතනයක නමින්ද?

පි; එතනදි අපිට ඒ මුදල් ලැබිමේ දී මේ ගොල්ලෝ කවදාවත් ACCOUNT එකට එවන්නේ නෑ ස්වාමිනි. දැන් මේකේ කරපු INVESTIGATION එකක් තමයි ඒ මුදල් හවාලා ක්‍රමයට.

ප්‍ර: විස්තර නැතිව කොයි ක්‍රමයට ද එව්වේ කියන්න?

පි: ඒ ක්‍රමයට ගොඩාක් දුරට එවන්නේ බැංකු මාර්ගයෙන් නෙවේ.ඒක එවන්නේ හවාලා ක්‍රමයට බැන්කු මාර්ගයෙන් එවන අවස්ථාත් තියෙනවා බැංකු මාර්ගයෙන් අරගෙන පස්සේ ඒක වෙන නමකින් එවන්නේ ඒ මුදල අරගෙන එයා අතින් ගිහිල්ලා හාරදෙනවා බැංකුවකින් නෙමේ.

ප්‍ර: හවාලා ක්‍රමයයි උණ්ඩියා ක්‍රමයයි දෙකම එකද ?

පි: දෙකම එකයි.

ප්‍ර: එතකොට වෙන මුස්ලිම් බ්‍රදර්හුඩ් කියන සංවිධානය ඔබ අහලා තියෙනවාද?

පි; අහලා තියෙනවා ස්වාමිනි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: එම සංවිධානයෙන් මෙම අන්තවාදී ක්‍රියාකාරකම් වලට සහයෝගයක් ලැබිලා තියෙනවාද ලංකාවට?

පි; විශේෂයෙන්ම අපි දැකලා නැහැ. PHYSICAL COMMUNICATION එකක් තියෙනවා මේ සහරාන්ගේ කණ්ඩායම සහ ISIS සංවිධානයත් එක්ක අපිට මේ වෙනකම් අපිට හොයා ගන්න බැරිවෙලා තියෙනවා DIRECT සම්බන්ධතාවයක් INSPIRATION එකෙන් තමයි ඇවිල්ලා තියෙන්නේ. හැබැයි DIRECT සම්බන්ධතාවයක් නැති වුනත් මේ අවශ්‍ය කරන මුදල් ප්‍රමාණය ලබා දීම INDIVIDUALLY සිදුවීම් වෙලා තියෙනවා එක එක පුද්ගලයෝ සහ පුද්ගලයන් විසින් අර මම කියපු ආකාරයෙන් මුදල් ලබාදීම සිදු කරලා තියෙනවා.

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර; MR සලේ ගරු සභාපතිතුමාගේ අන්තිම ප්‍රශ්නේම පොඩි EXTENTION එකක් මුස්ලිම් බ්‍රදර්හුඩ් කියන එක යටතේ කටාර්,කුවේට් සහ සෞදි අරාබියාවෙන් ජමාතේ ඉස්ලාමිය සංවිධානයට මූල්‍යාධාර ලැබෙනවාද කියලා ඔබගේ බුද්ධි තොරතුරු වලින් හමුවෙලා තියෙනවාද? ඔබගේ DIRECTORATE OF MILITARY INTELLIGENCE?

පි: මගේ දැනුමේ හැටියට නම් මොකද මට අපිට එහෙම තොරතුරක් ලැබිලා නෑ අපිට චෙක් කරලා බලන්න පුළුවන් මොකද මගේ කාලේ නම් එහෙම DIRECT සම්බන්ධතාවයක් අපිට ESTABLISH කරගන්න බැරිවුනා මූල්‍යUH වශයෙන් හෝ වෙනත් ආකාරයේ වශයෙන් මේවාට ත්‍රස්තවාදී සංවිධාන සහ මේ සහරාන්ගේ කණ්ඩායම් එක්ක කිසි DIRECT සම්බන්ධතාවයක් හොයා ගන්න බැරිවුනා.

ප්‍ර: MR සලේ අපේ කොමිෂන් එකට ලැබිලා තියෙන බුද්ධි තොරතුරු වල මට කියන්නට බැහැ ඔබ එහි DIRECTORATE OF MILITARY INTELLIGENCE වල අධ්‍යක්ෂක සිටි යුගයේදී ද මේ තොරතුරු ලැබිලා තියෙන්නේ නමුත් ඔබගේ කිසියම් ඒකකයක REPORT එකක් තියෙනවා මම සඳහන් කරපු තොරතුර ගැන ජමාතේ ඉස්ලාමිය සංවිධානයට මුස්ලිම් බ්‍රදර්හුඩ් කියන එක යටතේ කටාර් ,කුවේට්,සහ සෞදි අරාබියෙන් මුදල් ලැබෙනවා කියලා මං යෝජනා කරන්න කැමතියි ඔබ මේ පිළිබඳව තවදුරටත් හොයලා අපිට FEED BACK එකක් දෙන්න පුළුවන් නම් සුදුසුයි කියලා.

පි: ස්වාමිනි ඒක ලබා දෙන්නම් ස්වාමිනි.

ප්‍ර; මට කෙටි ප්‍රශ්න ටිකක් තියෙන්නේ ඔබ මෙම කොමිෂමේදී ප්‍රකාශ කරා රුපියල් මිලියන 4000 ක් පුත්තලමේ අර ඉස්ලාම් පාසලට ඒ කියන්නේ රුපියල් බිලියන 4 ක් එය විශාල ප්‍රමාණයේ පාසලක් ද? ලොකු කියන්නේ පුනානිවල හදන හිස්බුල්ලාගේ විශ්ව විද්‍යාලයටත් ලැබිලා තියෙන්නේ

FAIR COMMENT BY JEZEEM

මේ හා සමාන මුදලක් නමුත් එය අක්කර 60 ක භූමි භාගයක හදන විශාල විශ්ව විද්‍යාලයක් දැන් මෙම ස්ථානය ඔබලා නිරික්ෂණය කළාද?

පි: ස්වාමිනි මේක නිරික්ෂණය කරා මේ මං කිව්වේ QATAR CHARITY එකෙන් එච්චර ප්‍රමාණයක් ලැබිලා තියෙනවා ලංකාවේ ACCOUNT එකට. ඒත් එක්කම ඒ ගොල්ලෝ ඒක DIVIDE කරලා තියෙනවා විවිධ විවිධ CHARITIES දැන් අපි විවිධ CHARITIES ටික අපි හොයාගන යනවා එතකොට අපිට මේ පුත්තලමේ හම්බෙව්ව පාසලට එතනින් අපිට ESTABLISH කරන්න හැකියාව ලැබිලා තියෙන්නේ ලක්ෂ 30 ක් පමණයි. හැබැයි අපි දන්නේ නෑ. ඒකේ තියෙන්නේ පොඩි DOCUMENT එකක ලියපු DOCUMENT එකක් තමයි තියෙන්නේ ඉතින් අපි දන්නේ නෑ. ඉතුරු මිලියන 4000 මොන ආකාරයෙන් බෙදුනාද කියන එක අපිට හරියටම අවබෝධයක් ලබා ගන්න හැකියාව තියෙන්නේ ඒ සම්පූර්ණයෙන්ම INVESTIGATION ඉවර වුනාම ස්වාමිනි.

ප්‍ර: ඔබට තොරතුරු සොයන කොට සමුවෙනවාද කියලා සොයා බලන්න තවදුරටත් මෙම QATAR CHARITY කියන එකෙන් ලැබිච්ච මිලියන 4000 න් කිසියම් හෝ මුදලක් ඔය නැෂනල් තවුහිද් ජමාත් සහ ජමාතේ මිල්ලති ඉබ්‍රාහිම් කියන සංවිධානය සහ ඔබ අද සඳහන් කරපු SAVE THE PEARL කියන මේ සංවිධානවලට ඔවුන්ගේ ආගමික අන්තවාදී කටයුතු අකණ්ඩව කර ගෙන යාම සඳහා ලැබිලා තියෙනවාද කියන එක?

පි: අනිවාර්යයෙන්ම ස්වාමීනි මම පැහැදිලිව ප්‍රකාශ කරා SAVE THE PEARL එකට මිකෙන් ලක්ෂ 30 ක් ලැබිලා තියෙනවා. ඒ SAVE THE PEARL එකෙන් තමයි අර ඉඩම හම්බෙන්න ඇවිල්ලා ඊබ්‍රාහිම්ගේ පුතාගෙන් 2017 දී එතකොට මේ ඉඩමේ මේ පාසැල හදන්නේ ඇවිල්ලා මේ ලක්ෂ 30ක් එක පැත්තකින් ඇවිල්ලා තියෙනවා අපි දන්නේ නැහැ අනික් මුදල් කොහොමද ආවේ කියන එක ඉතින් ඒක අපි පැහැදිලිවම ESTABLISH කරලා තියෙනවා එතකොට අනිකුත් සහරාන්ගේ මුදල් නම් ගොඩාක් දුරට ඒවා තනි තනි පුද්ගලයන්ගෙන් අර හවාලා ක්‍රමයට තමයි ඇවිල්ලා තිබ්බේ. ඊට අමතරව ඊබ්‍රාහිම් විසින් සෑහෙන මුදල් ප්‍රමාණයක් ලබා දීලා තියෙනවා. එතනදි අපිට ගැටළුව වෙන්නේ මේ ඊබ්‍රාහිම් විසින් මේක සාධාරණව හම්බකරපු මුදලක් ද එහෙම නැතිව ඊබ්‍රාහිම් විසින් මේමුදල හම්බ කිරීමට අවශ්‍ය කරන පරිසරය හදලා දීලා ඒ මුදල් ප්‍රමාණය මේකට වැය කරා ද කියන එක තමයි අපි INVESTIGATE කරගෙන යන්නේ .

ප්‍ර: කවුද ඔබ ඉබ්‍රාහිම් කියන්නේ?

පි: ඉබ්‍රහිම් කියන්නේ SPICE මුදලාලි එයාගේ පුතාලා දෙන්නා තමයි මරණයට පත්වුනේ .

ප්‍ර: ඉබ්‍රාහිම් මවුලවි?

පි: ඉබ්‍රාහිම් මවුලවි නෙමේ . ඉබ්‍රාහිම් හාජ්ජියාර්.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඉබ්‍රාහිම් හාජ්ජියාර්? ඔබට දැන් ඔබ අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවයට මෑත කාලයේදීනේ පත් වුනේ ඔබට හමුවුනාද 1994 වසරේදී එවකට සිටි ජනාධිපතිණිය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග විසින් මෙම SIS එක ESTABLISH කිරීම සම්බන්ධයෙන් වූ ගැසට් නිවේදනයක් නිකුත් කරලා තියෙනවාද කියන එක?

පි: 1994 දී මම තාම ඉතිහාසය ගැන STUDY කරේ නෑ ගොඩාක් හැබැයි එතනදී යම් කිසි ලිපි වගයක් දැක්කා මම විශේෂයෙන් එවකට හිටපු ජනාධිපතිවරිය මැදිහත්වෙලා තියෙනවා විශේෂයෙන්ම SIS එක යම් යම් CHANGES ඇති කරන්න

ප්‍ර: ඔබට හැකියාවක් තියෙනවා නම් එය හොයලා බලලා මේ කොමිෂන් එකට ලබා දෙන්න මම විශේෂයෙන්ම මේක අහන්නට කැමතියි ඔබ සඳහන් කලා මේ රාජ්‍ය බුද්ධි සේවාවට දේශපාලන නායකයින් කීපදෙනෙක් සහ TOP BUREAUCRATS ලා කීපදෙනෙක් ඉන්නවා ඔවුන් නිත්‍යා සාමාජිකයන් කියලා ඔබ එහෙම කිව්වානේ NATIONAL SECURITY COUNCIL

පි: NATIONAL SECURITY COUNCIL

ප්‍ර: NATIONAL SECURITY COUNCIL එකට නිත්‍ය සාමාජිකයෝ ඉන්නවා සහ ඒකේ දේශපාලන නායකත්වයේ කීප දෙනෙක් ඉන්නවා ජනාධිපතිතුමා, අගමැතිතුමා, නීතිය හා සාමය භාර අමාත්‍යවරයා එහෙම කියලා එතකොට රාජ්‍ය නිලධාරිනුත් ඔබ සඳහන් කරා මම ඔබගෙන් දැනගන්නට කැමති 2015 බලයට පත් වූ රජයේ රාජ්‍ය ප්‍රධානීයා විසින් පසු කාලයකදී ඔය සංයුතිය වෙනස් වන ආකාරයක කිසියම් දෙයක් සිදු කලාද ?ඒ කියන්නේ සාමාජිකත්වය ඔබ සඳහන් කල රාජ්‍ය නිලධාරින් සහ දේශපාලන නායකයන් නොවන අය මෙම කමිටුව සඳහා සහභාගි කරවීමක් සිදුවුනාද?

පි: මගේ දැනුමේ හැටියට ස්වාමිනි එසේ සහභාගීවීමක් සිදු වුනේ නැහැ. මගේ දැනුමේ හැටියට මම හැම MEETING එකට ම ගියා SECURITY COUNCIL එකේදී අර සමහර වෙලාවට ඒ විෂයට අදාලව යම් කිසි BRIEF එකක් කරන්න වුනොත් ඒ BRIEF එක කරලා එයා යනවා මිසක් මේ කට්ටියට අමතරව අපි කවුරුත් මං හිතන්නේ එහෙම දෙයක් වුන් නෑ මොකද සම්පූර්ණයෙන් අපි මේවල CONFERENCE MINUTE එකක්වත් අපි ගන්නේ නැහැ.

ප්‍ර; NATIONAL SECURITY COUNCIL එක සහ රාජ්‍ය බුද්ධි සේවාව කියන දෙකම කිසියම් නෛතික රාමුවක් ඇතුලේ ස්ථාපිත කරලා තියෙන රාජ්‍ය ව්‍යුහයන් දෙකක් ද?

පි: NATIONAL SECURITY COUNCIL එක ස්වාමිනි මම දන්නේ නෑ ඒක GAZETTED කියලා නමුත් විරාත් කාලයක් ඉදන්ම ඔය NATIONAL SECURITY COUNCIL එක

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

රැස්වීමක් කරනවා එතකොට රාජ්‍ය බුද්ධි සේවාව පටන් අරන් තියෙන්නේ 1943 එතකොට ඒවාට ගැසට් තියෙනවා ඊට පසුව ඒක වර්ධනය වෙලා වර්ධනය වෙලා DII , DFI පස්සේ NIB පස්සේ STATE INTELLIGENCE SERVICE කියන තත්ත්වයට පත්වෙලා තියෙනවා ඒ හැම දෙයක්ම ගැසට් එකෙන් තමයි මේවා වෙලා තියෙන්නේ නමුත් රාජ්‍ය බුද්ධි සේවාවට කියලා ACT එකක් නෑ ඒක නිසා අපි මේ දවස්වල රාජ්‍ය බුද්ධි සේවාවකට අවශ්‍ය INTELLIGENT ACT එක අපි මේ දවස් වල ඒක හදාගෙන යනවා.

ප්‍ර; අන්තිම ප්‍රශ්නේ මගේ ඔබ මෙම කොමිෂම හමුවේදී ප්‍රකාශ කලා ජාතික ආරක්ෂාව කියන එක ඔබ ලස්සනට අර්ථ ඒ පිළිබඳ විග්‍රහයක් කරා ඒ කියන්නේ ආර්ථික ආරක්ෂාව, මහජන ආරක්ෂාව, පරිසරය පිළිබඳ ආරක්ෂාව කියලා එවැනි තවත් ගොඩාක් කිව්වා දැන් ජාතික ආරක්ෂාවට මහජන ආරක්ෂාව සහ ආර්ථික ආරක්ෂාව කියන මේ දෙක විතරක් ගත්තොත් 2019 අප්‍රේල් 21 ප්‍රහාරයන් නිසා මහජන ආරක්ෂාවටත් ආර්ථික ආරක්ෂාවටත් ඒ දෙකම ඒකාබද්ධ වුනාම ජාතික ආරක්ෂාවටත් ඇතිවුනේ ලොකු හානියක්නේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට මේ කොමිෂම හමුවේ නොයෙකුත් දෙනා ඉදිරිපත් කරන ලද කරුණු විශේෂයෙන්ම සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් සහ අනෙකුත් විද්වතුන් ඉදිරිපත් කරපු කරුණු අනුව ශ්‍රී ලංකාව තුල බහුවාර්ගික සහ බහු ආගමික ජන සමාජයක් සිටින රටක තිරසාර ලෙස ජනවාර්ගික සමගිය සහ ආගමික සංහිදියාව ඇති කිරීම සදහා මෙම ඉස්ලාම් ආගමික අන්තවාදය ඒ කියන්නේ ඒක දේව වාදය, ෂරියා නීතිය ජිහාදය වැනි කරුණු නිසා ඉතාමත්ම දුෂ්කරයි ඉස්ලාම් ජාතිකයන් සහ අනිකුත් ජනවර්ග අනිකුත් ආගම් අදහන පිරිස් අතර තිරසාර ලෙස සාමය හෝ සංහිදියාව ඇති කිරීම ඔබ ජාතික බුද්ධි ප්‍රධානියා නිසා මෙම කොමිෂම දැන ගැනීමට කැමතියි ඔබ මේ රටේ සියළුම ජනවාර්ග සහ ආගමික කණ්ඩායම්වලට සමගියෙන් සහ තිරසාර ලෙස සාමයෙන් ජීවත් වීම සඳහා ඔබ කෙබදු යෝජනාවක්ද කරන්නේ මොන වගේ ක්‍රියාමාර්ගද ගත යුත්තේ මොනවාද කල යුත්තේ එවැනි ඔබට තේරුණද මං අහන ප්‍රශ්නේ?

පි: ස්වාමිනි විශේෂයෙන්ම මං හිතන්නේ අතිගරු ජනාධිපතිතුමා පැහැදිලිව ප්‍රකාශ කරලා තියෙනවා VISION එක කොටස් දෙකක් එකක් ඇවිල්ලා CREATE A SECURE ENVIRONMENT දෙවනි එක ඇවිල්ලා SUSTAINABLE DEVELOPMENT අපි මේ VISION එක යටතේ සියලුම බුද්ධි සේවාවන් රටේ ආරක්ෂාව මේවා කරන ගමන් ම සංවර්ධනයටත් අර කියපු විදියට දායකත්වය අපි දක්වන්න ඕනේ විශේෂයෙන්ම මේ රට අපි අනික් රටවල්වලට ගත්තාම තම ඕනම රටක මේ NATIONALISM එකක් තියෙනවා. NATIONALISM එකක් නැතිව රටවල් නෑ අපි අපිටම ආවේණික වූ අවුරුදු 2500 ක අපිට උරුමයක් තියෙනවා එතකොට මම තරයේ විශ්වාස

FAIR COMMENT — BY JEZEEM —

කරනවා මේක බෞද්ධයන් තමයි 76% ක් ඉන්නේ. ඒ එක්කම මුස්ලිම් ජනතාව 10% ක් ඉන්නවා. දෙමළ ජනතාව ඉතුරු ඉන්නවා ක්‍රිස්ත්තියානි ජනතාව 6% ක් වගේ ඉන්නවා. ඉතින් එතනදී සුළු ජාතීන් වුනත් තේරුම් ගත යුතුයි මහජාතියක් හැටියට ඒ ගොල්ලන් එක්ක ජීවත් වෙන්න ඒ එක්කම මේකේ බෞද්ධ ජනතාවත් විශේෂයෙන්ම දැනගතයුතුයි සම අයිතින් නෙමේ අරගොල්ලනුත් CO- EXISTENCE එකක් එක්ක ජීවත් වෙන්න. එතකොට එහිදි අපි දැක්කා 1980 ට කලින් මෙවැනි පසුබිමක් තිබ්බා ඒක නිසා මේ වගේ ලොකු ප්‍රශ්නයක් ඇතිවුනේ නෑ. දැන් ස්වාමීනි ප්‍රශ්නය ඇතිවෙලා තියෙන්නේ ශ්‍රී ලංකාව නෙමේ ශ්‍රී ලංකාවෙන් පිට මේ තියෙන ත්‍රස්තවාදය සහ මේ තියෙන මේ ISLAMIC FUNDAMENTAL එකත් එක්ක තමයි අපි මේ සටන් කරන්න වෙලා තියෙන්නේ. එතනදි අපි මුලික වශයෙන්ම අපි කියපු කරුණු සම්බන්ධයෙන් මුස්ලිම්වරුන් හැටියට ගොඩාක් දේවල් ඒ ගොල්ලන්ගෙන් වෙනස්විය යුතු ගොඩාක් දේවල් තියෙනවා නැවත වරක් අපි 80 දශකයට යන්න නම් සම්ප්‍රදායි මුස්ලිම්වලට යන්න නම් ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන් හැටියට අපි ජීවිතයේ අපි මුස්ලිම්වරුන් හැඩ ගැසීමට කටයුතු කලයුතුයි එතනදි ජාතික මේක ඇති කරන්නනම් ගොඩාක් කටයුතු කරන්න ඕනේ. විශේෂයෙන්ම ඒක බෞද්ධ ජනතාව කුපිත කරවලා බෞද්ධ ජනතාව තරහ කරගෙන ඒක කරන්න බැහැ. ඉතින් අනෙකුත් මං හිතන්නේ ඉස්ලාම් ආගමේත් පැහැදිලිව කියලා තියෙනවා ඒ කියන්නේ රටක ජීවත් වෙනවා නම් සුළු ජාතියක්නම් ඒ සුළු ජාතින්ගේ තමන්ගේ මේක ආරක්ෂා වන පරිදි ඒ මහාජාතියට DUE POSITION එක දීලා ඒක කරන්න කියන එක. ඉතින් එතනදි සම අයිතින් ඔක්කෝම ඒක අපි ගත්තම මේක විශේෂයෙන්ම පැති දෙකටම ලොකු වගකීමක් තියෙනවා හැබැයි මම දකින්නේ විශේෂයෙන්ම සංවර්ධනය සහ ජාතික ආරක්ෂාව ගොඩනැගීම තුලින් අපිට පුළුවන් මේ ප්‍රශ්නය මේවා කරන්න . ඒ වගේම අවසානන වශයෙන් මේ විශේෂයෙන් ම මේ අන්තවාදය පිළිබඳව හොඳ STUDY එකක් කරලා ඔය කරුණු පහ පිළිබඳවම PARLIAMENT SELECT COMMITTEE එකෙන් මම හිතන්නේ ගොඩාක් අපෙනුත් ඒ තොරතුරු ලබලා තියෙනවා. ඉතාමත් ම හොඳ නිර්දේශ ඉදිරිපත් කරලා තියෙනවා ඒ නිර්දේශ ඇත්තටම ඉතාමත්ම වැදගත් නිර්දේශ අධ්‍යාපනය පැත්තෙන් සංස්කෘතික පැත්තෙන්, ඔය ආගමික නායකයන් එන එක පැත්තෙන් මේ හැම පැත්තකින්ම මුදල් එහෙම සම්බන්ධයෙන් අපිට ඒ නිර්දේශ දැන් ඒක අනුමත වෙලා තියෙනවා. මං හිතන්නේ ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන්නම් මං හිතන්නේ අපිට හැකියාව ලැබෙනවා සෑහෙන දුරට මේ අන්තවාදය මේ රටින් පිටුවහල් කරන්න

ප්‍ර; අවසාන වශයෙන් සමස්ථ ලංකා ජමෙයිතුල් උලමාවරුන්ගේ සංවිධානය තියෙනවානේ ඉස්ලාම් ආගමික විද්වතුන්ගේ සංගමය. ඔවුන් සහ

FAIR COMMENT BY JEZEEM

සාම්ප්‍රදායික සූෆි මුස්ලිම්වරුන්ගේ එකමුතුවක් තුලින් පුළුවන් වෙයිද ඉස්ලාම් ආගමික අන්තවාදය කරා ඉස්ලාම් තරුණ පිරිස් ඇදී යාම වේගවත්ව නතර කර ගැනීමට ?

ප්‍ර; ස්වාමිනි මේ මුස්ලිම් බෙදීම ලෝකෙත් එක්කම එන එකක් දැන් සූෆි මුස්ලිම්ලා බොහොම සුළු පිරිසක් තමයි ඉන්නේ දැන් වැඩියෙන්ම ඉන්නේ ෂියා පාර්ශවයේ ඉන්න තබ්ලික් කට්ටිය තමයි මේ රටේ 60% ක්ම ඉන්නේ. ඉතින් එතනදී විශේෂයෙන්ම කිසියම් දෙයක් අපි ඉදිරිපත් කිරීමේදී අපිට බලාපොරොත්තු වෙන්න බැහැ තබ්ලික් කට්ටිය අර පොඩි පිරිසකට ඉඩක් ලබා දෙයි කියන එක ඒ වගේ ගැටළුවක් තියෙනවා මෙතනදි අර ප්‍රධාන කිව්වා වගේ ආගම් බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි ,මුස්ලිම් ආගම් එක්ක අපි සංහිදියාව ඇති කරන්න කලින් මුස්ලිම්වරු අතර තියෙන මේ SECT ටික මේවා කරලා අපි යම් කිසි මෙකක් ඇති කරන්න ඕනේ ඒත් එක්කම මම හිතනවා විශේෂයෙන්ම කිසිම ආගමික නායකයෙකුට සියළුම මුස්ලිම්වරුන්ට අයිතිය සහ DECIDE කිරීම සම්බන්ධයෙන් අපි ලබා දීම නොකල යුතුයි කියන එකයි මගේ තියෙන මේක විශේෂයෙන්ම අපි මේක ශ්‍රී ලාංකිකයෝ හැටියට එක අධ්‍යාපන ක්‍රමයකුත් ඒ කියන්නේ ආගමික නිදහස ලබා දීමත් ඒ එක්කම එක් නීතියකුත් ඒ වගේ අපි අනුගමනය කිරීම තුලින් අපිට හැකියාව ලැබෙන ඔය තියෙන DIFFERENCES ටික අපිට අඩු කරගන්න.

ප්‍ර: දැන් ඔබ පවසන ආකාරයට සූෆි මුස්ලිම්ලාත් ඉන්නේ ටික දෙනයි නම් තබ්ලික්, තවුහිද් ජමාත් කියන නිකායන් වල නම් බහුතරයක් ඉන්නේ සහ ඒ වගේම මේ කොමිෂම හමුවේ ඉදිරිපත් වෙලා තියෙනවා ජමාතේ සමස්ත ලංකා උලමාවරුන්ගේ සංවිධානයේ දී 1980 තිබ්විච සංයුතිය නෙමෙයි දැන් තියෙන්නේ ඒකාලේ දී සූෆි මුස්ලිම්වරුන්ට බරවෙච්ච එකක් අද තියෙන්නේ සම්පූර්ණයෙන්ම ආගමික අන්තවාදී ඉස්ලාම් ඔය සංවිධානවලට බර වෙලා. එතකොට එහෙම වුණාම ඔබ හිතනවාද අපිට පහසුවෙන් මේ ගමන යන්න පුළුවන් වෙයි කියලා මොකද මුස්ලිම් ජනතාව CONVINCE කරන්නට ඔබ යෝජනා කරන දේවල් වලින් පමණක් කරන්නට පුළුවන්ද? ඒ කියන්නේ CULTURALLY අපි ඔක්කෝම MIX වෙන්න ඕනේ අපි ඔක්කෝම හැම ආගමක්ම ඉගෙන ගන්න ඕනේ අපි එකට ඉන්න ඕනේ ඒ වගේ කියන දේවල්වලින් විතරක් පුළුවන් වෙයිද මේකට මුස්ලිම් ජනතාව INVOLVE කරගන්නේ නැතිව මොකද මේක ආගමත් සමඟ යන ප්‍රශ්නයක් නිසා?

ප්‍ර; ස්වාමිනි ඊට චුට්ටක් අපි එහා පැත්තට ගියොත් මං කිව්ව PARLIAMENT SELECT COMMITTEE එකේ මේ පිළිබඳ සම්පූර්ණයෙන්ම අර්ථ කථනයක් කරලා හොඳ STUDY එකක් කරලා තියෙනවා. විශේෂයෙන්ම සුන්නි සහ තබ්ලික් විතරක් යොමු වෙන්නේ නැතිව සියළු දෙනාටම එක අධ්‍යාපනයක් ඒ කියෙන්නේ ආගම ඉගෙන ගන්න පුළුවන් නමුත් ඒක

FAIR COMMENT — BY JEZEEM —

ඇවිල්ලා එක්තරා කොටසකට විතරයි ඒ කියන්නේ ඒ ගොල්ලන්ගේ ආගම කරන්න පුළුවන් යම්කිසි පරිපාලනයකට ලක් කරලා තියෙනවා එතකොට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් තමයි SYLLABUS එක හදන්නේ එතකොට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් මේ SYLLABUS එක හදන කොට ඔය හැම දෙයක්ම කරුණු කටයුතු කරලා එක නිර්ණාමයක් යටතේ ඒ අධ්‍යාපනය කරන්න ඒ අධ්‍යාපන කටයුතු කරන්න පුළුවන් එතකොට SHARIA LAW එක ගත්තාමත් ඒකත් කොහොමද ලංකාවට බලපානවා ද නැද්ද එහෙනම් විශේෂයෙන්ම විවාහ නීති මේ සියළු දෙනාම මං හිතන්නේ ශ්‍රී ලාංකික නීතියට යටත්විය යුතුයි. ඉතින් ඒ වගේම අපිට මේ SCHOLARSHIP දෙන එවාත් අර කිව්වා වගේ සංයුතිය වෙනස් වුනාම තබ්ලික් කට්ටිය විතරක්ම යනවා එතකොට අර සුන්නි අනෙකුත් පාර්ශවයට ඒ ගොල්ලොන්ට ආගමික නායකයෙකක් ගෙන්න ගන්න දුන්නාම ඒ ගොල්ලොන්ට ගෙන්න ගන්න බැහැ ඉතින් පොදුවේ මේ දෙගොල්ලන්ටම අපි ගෙන්නන්න අවශ්‍යතාවයක් නෑ මොකද ලංකාවේ ඕන තරම් ඉන්නවා ඒ කට්ටිය. ඒ එක්කම සියළුම අරාබි පාසැල් ටික නියාමනයට ලක්වෙන්න ඕනේ ඒ එක්කම UNIVERSITY අනිවාර්ය කරන්න ඕනේ. ඒ පාසැල්වල අධ්‍යයනය කරන්න බැහැ සම්පූර්ණයෙන් ආගම පමණක් . අනිවාර්යයෙන්ම අනෙකුත් විෂයන් ධාරාවන් ඇතිවෙන්න ඕනේ. මම තරයේ විශ්වාස කරනවා විශේෂයෙන්ම අර PARLIAMENT SELECT COMMITTEE එකේ ඒ PROPOSALS RECOMMENDATION ටික අපිට කරන්න හැකියාව තිබුණා නම් ඒක කරන්න පුළුවන් නම් ඉදිරියේදී IMPLEMENT කරන්න පුළුවන් නම් මේකට ලොකු පිටුවහලක් ලැබෙයි විශේෂයෙන්ම මේ අන්තවාදය අපි පිටුවහල් කරන්න .

ප්‍ර: ඔබ මුස්ලිම් විවාහ නීතිය ගැන කතා කරපු නිසා මම අහන්න කැමති බුර්කාව බුර්කාව ශ්‍රී ලංකාවේ සංස්කෘතික අනන්‍යතාවයට සහ ජාතික ආරක්ෂාවට අහිතකර ලෙස බලපානවාද බුර්කාව ඇඳීම?

පි: අනිවාර්යයෙන්ම ස්වාමිනි මොකද මේ රටවල් ඇවිල්ලා අපේ රටවල් ඇවිල්ලා REVOLUTIONS දෙකට ගිහිල්ලා යුද්ධ ගණනාවකට ගිහිල්ලා සෑහෙන දේවල් කරලා තියෙන රටක්. එතකොට 1980 ට කලින් අපි මේක දැක්කේ නැහැ. 80 පස්සේ තමයි මේක එන්නේ. මෙතනදි මුළු සමාජයම පොඩි කාලේ ඉදන්ම මේ බුර්කාවට පුරුදු කිරීමක් කරනවා. මේ පුරුදු කිරීම කරන්නේ ඇවිල්ලා ඒ අර ආගමික ආරබි පාසැල්වලට ගිහිල්ලා මේක අඳින්න ඕනේ ඒ තුලින් අපි සම්පූර්ණයෙන්ම වෙන් කරන්න ඕනේ මේක එක පාරටම නීතියෙන් කරන්න බැහැ අර අධ්‍යාපනය වෙනස් කිරීම තුලින් ඒ ළමයින්ගේ මනස වෙනස් කිරීම තුලින් ලොකු ප්‍රවාහයකට යන්න වෙනවා විශේෂයෙන්ම මේ බුර්කා ඇඳීම ලෝකයේ ගොඩාක් රටවල තහනම් කරලා තියෙනවා. සම්පූර්ණයෙන් මුහුණ වැසීම අනිවාර්යයෙන්ම ඒක ජාතික ආරක්ෂාවට තර්ජනයක් ඒ

FAIR COMMENT BY JEZEEM

එක්කම මම හිතනවා අනිත් පැත්තෙන් බැලුවාම අදින අයට වුනත් ඒ ගොල්ලන්ගේ RIGHTS වුනත් අපි මං හිතන්නේ සම්පූර්ණයෙන්ම අපි මේකක් කරන්නේ. ඒත් වෙලා තියෙන්නේ ඒ ගොල්ලන්ටත් අද කතා කරන්න විදියක් නැහැ මොකද ඒ ගොල්ලන්ව ඒ විදියටම තමයි මුළු ඒක හැඩගස්වලා තියෙන්නේ ඉපදිච්ච දවසේ ඉදලාම අවසානය දක්වා ඒක ලොකු දෙයක් හැටියට ඔයා මුහුණ වහගෙන සිටිම තමයි තිබිය යුත්තේ කියලා ඉතින් මේවා අපි එකපාරට වෙනස් කරන්න බැහැ නමුත් මේ වෙනස් කිරීම් අනිවාර්යයෙන්ම සමාජයේ ඒ ආගමික නායකයන්ට කතා කරලා මේ ඒ ගොල්ලන්ගේ අයගේම ENGAGEMENT එකක් කරලා මේවා අනිවාර්යයෙන්ම වෙනස් විම් සිදුවිය යුතුයි.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

පි: MR. සලේ ඔබ හිතන ආකාරයට තවමත් මුස්ලිම් ජනතාව අතර සම්ප්‍රදායක පිරිසද වැඩි නැත්නම් මේ අන්තවාදී මුස්ලිම් කට්ටියද?

පි: ස්වාමිනි දැන් අපි අන්තවාදය කියලා ගත්තාම අන්තාවදී කොටස් කීපයක්ම ඉන්නවා දැන් විශේෂයෙන්.

ප්‍ර: ඒ ඔක්කෝම සමස්ථයක් හැටියට ගත් විට?

පි; සමස්ථයක් හැටියට ගත්තම අන්තවාදීන් ඉන්නේ සුළු පිරිසක්.

ප්‍ර: ඔබ දැන් බුද්ධි අංශ ගැන කියන කොට විදේශිය බුද්ධි ආයතන වලින් ඔබට තොරතුරු ලැබෙනවානේ විදේශිය බුද්ධි ආයතන වලින් එතකොට මේ ඉන්දියාව සහ පකිස්ථානය හැර වෙනත් මොන රටවලින්ද ඔබට තොරතුරු ලැබෙන්නේ?

පි; ස්වාමිනි අපේ ලෝකයේ රටවල් ගණනාවක්ම ඒ කියන්නේ ඇමරිකාව,එංගලන්තය,රුසියාව,ලෝකයේ රටවල් මම දැනුවත්ව රටවල් 40 කට වැඩි ප්‍රමාණයක් එක්ක අපි සම්බන්ධතා තියෙනවා. අපි පුහුණු විම් සඳහා ඒ රටවල් වලට අරිනවා. ඒ එක්කම ඒ ගොල්ලන් එක්ක අපි කොහොමත් දිගින් දිගටම සම්බන්ධතා තියෙනවා. අපි වෙනම විදේශියක් අංශයත් තියෙනවා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න. ඒක සමහර අයත් එක්ක කෙළින්ම අපි DIRECT COMMUNICATION ESTABLISH කරලා තියෙනවා ඒ බුද්ධි අංශයත් එක්ක සමහර අවස්ථාවලදී MOU අත්සන් කරලා තියෙනවා අපි නිරන්තරයෙන්ම ඒ විදේශිය බුද්ධි සේවාවන් එක්ක අපි කටයුතු කරනවා ඉන්දියාව සහ පකිස්ථානය රටවල් දෙකක් පමණයි. විශේෂයෙන්ම බටහිර රටවල් එක්කත් අපි නිරන්තරයෙන්ම එවැනිම සම්බන්ධතාවයක් අපි පවත්වනවා.

ප්‍ර; මේ අන්තවාදය සම්බන්ධයෙන් ඉන්දියාව හා පකිස්ථානය හැර වෙන රටවලින්

FAIR COMMENT — BY JEZEEM —

පි: විශේෂයෙන්ම මේ අන්වාදය සම්බන්ධයෙන් මම යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක හැටියට ඉන්දැද්දි විශේෂයෙන්ම රටවල් දෙකක් එක්ක අපි ඉතාමත්ම සමීපව කටයුතු කරා. විශේෂයෙන්ම ඕස්ට්‍රේලියාව සහ ඇමරිකාව. ඒ එක්කම දැනුත් රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධානියා හැටියට විශේෂයෙන්ම අපි ඒ රටවල් ඇතුලුව ඊට අමතරව තුර්කිය වගේ රටවල් එක්කත් අපි නිරතුරුවම අපි සම්බන්ධතා පවත්වනවා ඒ කියන්නේ ඒ සම්බන්ධතා සීමා වෙන්නේ නෑ ලිපි ගනුදෙනුවලට පමණක්. සති දෙකකට වගේ සැරයක් අපි අපේ COUNTERPARTS හම්බෙනවා .

ප්‍ර; දැන් මැලේසියාවේ සෑහෙන්න ලෝකයේ එක එක විදියේ අන්තවාදීන් කටයුතු කරනවා මැලේසියාවට ලැබිලා තියෙනවාද?

පි: ඔව් මැලේසියාවත් එක්ක අපි දිර්ඝ වශයෙන් අපි සම්බන්ධ වෙනවා ඒ SPECIAL BRANCH එකක් එක්ක. දැන් උදාහරණයක් වශයෙන් K.P. වගේ පුද්ගලයන් අත්අඩංගුවට අරගෙන ලංකාවට ගෙනියන්න හැකියාව ලැබුණේ ඒ තියෙන මනා සම්බන්ධතා ඇතුළු ඒ එක්කම යුද්දෙන් පස්සේ වැඩිම පිරිසක් අත්අඩංගුට අරගෙන ලංකාවට එවලා තියෙන්නේ මැලේසියාවෙන්. එතකොට ගිය අවුරුද්දෙත් මැලේසියාවේ ප්‍රධාන බුද්ධි නිලධාරින් මේ ලංකාවට පැමිණියා. අපි මනා සම්බන්ධතාවයක් ඒ ගොල්ලන් එක්ක පවත්වනවා විශේෂයෙන්ම මේ LTTE සහ මේ අන්තවාදී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්.

ප්‍ර; දැන් මේ රාජ්‍ය බුද්ධි අංශයට කවුරු හරි පිට කෙනෙකුට Access එකක් තියෙනවාද කොහොම හරි?

පි; ස්වාමිනි ඒ අදහස් කරේ ඇවිල්ලා පිටරට කට්ටියකටද ඇවිල්ලා

ප්‍ර: පිටරට කට්ටියකට කියන්න පුළුවන්ද?

පි: එහෙම Access එක නැහැ ඒ Access එක තියෙන්නේ ඇවිල්ලා අපි අපේ Counterparts වලට විතරයි. ඒ කියන්නේ අපි ඉන්දියාවත් එක්ක ඒ රටේ තියෙන ප්‍රධාන බුද්ධි සේවා 2 ක් එක්ක කටයුතු කරනවා. එතකොට ඒ ගොල්ලන්ට හම්බෙන්න ඕන අවස්ථාවලදී ඒ ගොල්ලෝ දිනය වෙලාව අපිට සඳහන් කලාම ඒ ගොල්ලෝ ලංකාවේ ඉන්නේ අපි ඒ හමුවීම් සාමාන්‍යයෙන් සතියකට වරක් හෝ සති දෙකකට එක වරක් හෝ ඒවා නිරන්තරයෙන්ම Routinely සිදුවෙනවා.

දැන් වේලාව:ප.ව 6.30
මෙතැන්සිට:ල/ලේ මුතුමාලි මෙනවිය

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව.06.30 යි.
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>ගරු විනිසුරු ඛන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප : සාක්ෂිකරු ඔබ දැන් විස්තර කරගෙන ආපු විදියට ඔබට කියන්න පුළුවන්ද ISIS සංවිධානය ලෝකයේ තහනම් කරපු රටවල් තියෙනවා නේද දැනට?

පි : ISIS ලෝකයේ ඔක්කොම රටවල් තහනම් කරලා තියෙන්නේ ISIS සංවිධානය මම දැනුවත්ව. ඒ කියන්නේ ස්වාමිනි නීතිමය පැත්ත කොහොමද කියලා දන්නේ නෑ. මොකද තාම ලංකාවේ මං හිතන්නේ තහනම් කරලා නෑ. නමුත් තහනම් කරේ නැති වුණත් ලෝකේ අනිකුත් හැම රටක්ම අපි ගනුදෙනු කිරීමේදී තහනම් සංවිධානයක් කියලා හිතලා තමයි අපි ඒ කටයුතු කිරීම කරන්නේ.

ප : දැන් ඔබ හිතන විදිහට අපේ රටෙත් ISIS සංවිධානය තහනම් කිරීමේ මේ ප්‍රශ්නය යම් ආකාරයකට පාලනය කරන්න උදව්වක් වෙයිද?

පි : ස්වාමිනි මගේ දැනුමේ හැටියට දැන් මේ ISIS එක ඇවිල්ලා එක කාලේකට ආපු එකක් විතරයි. මීට කලින් IS කියලා ආවා. ඊට පස්සේ අල්කයිඩා කියලා ආවා. ඊට පස්සේ බෝකෝ හරාම් කියලා සංවිධානයක් තියෙනවා. අපි ඇත්තටම මේ තහනම් කිරීම තුළින් මම දකින්නේ නෑ ලොකු වෙනසක් ඇති වෙයි කියලා අපි සටන් කළ යුත්තේ මේ මතවාදයට එරෙහිව. ඉතින් ඒ එක්කම හැබැයි නීතිමය පැත්තත් අපි හදා ගන්න ඕනේ මේ මතවාදයත් එක්ක සම්බන්ධවීම් තුළින්. අපි කොහොමද මේ නීතිමය පැත්තෙන් කටයුතු කරන්නේ මේ වගේ extremist Groups එකක් කියන එක.

ප : ඔබ දැනට තොරතුරු සොයා ගෙන තිබෙන ආකාරයට ලෝකයේ දියුණු රටවල් ඒ කියන්නේ අපි හිතමු එංගලන්තය , ඇමරිකාව ඒ වගේම බහු ජනවාර්ගික රටවල් multi – cultural හැටියට සැලකෙන ඔස්ට්‍රේලියාව, New Zealand වැනි රටවල් පවා මේ මුස්ලිම් නැත්නම් ඉස්ලාමීක් අන්තවාදීන් පාලනය කරන්න යම් යම් ක්‍රියාමාර්ග අරන් තියෙනවානේ. ඒ ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාවටත් අනුගමනය කරන්න සුදුසු යැයි කියලා ඔබ හිතනවාද?

පි : ඔව් විශේෂයෙන්ම මේක ත්‍රස්තවාදී ජාත්‍යන්තර ත්‍රස්තවාදී සංවිධාන තියෙන්නේ. ඉතින් මෙතෙන්දී හැබැයි අපිට ආවේණික වූ අපිට තියෙන ක්‍රමවේදයන් තියෙනවා අපේ මුස්ලිම්වරුන් අපේ හැකියාවල් ඉතින් ඒ අනුව විශේෂයෙන්ම ඒ රටවලින් ගත යුතු

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ගණනාවක්ම තියෙනවා. දීර්ඝ කාලීන, මධ්‍ය කාලීන සහ කෙටි කාලීන වශයෙන්. ඉතින් විශේෂයෙන්ම මෙම ත්‍රස්තවාදය ඇති වෙන්නේ පිටින්. ඇතුළෙන් නෙවෙයි. ඒක නිසා අපි විශේෂයෙන්ම Region එකක් හැටියට අපි විශේෂයෙන්ම ළඟ රටවල් එක්ක මනා සම්බන්ධතාවයක් තියෙන්න ඕනේ. ඒ එක්කම ජාත්‍යන්තර වශයෙනුත් සම්බන්ධතාවයක් අපි තියෙන්න ඕනේ. විශේෂයෙන්ම මේ මතවාදය අපි මේක මේවා කරන්න. අපි ඒක Contribute කරන්න ඕනේ ස්වාමිනි විශේෂයෙන්ම දැන් මේ පාස්කු ඉරිදා ප්‍රහාරය වුනත් සම්පූර්ණයෙන්ම ප්‍රහාරය වෙන්නේ මේ සිරියාවත් එක්ක සහ මේ තියෙන ගැටුම්කාරී තත්ත්වයත් එක්ක අපි පැත්තක ඉඳපු පිරිසක් තමයි අපි මෙතෙන්ට යොමු වෙන්නේ. ඉතින් මේ මැරිච්ච මිනිස්සු පිරිස ඇවිල්ලා කියන්නේ නෑ අපි මේ සිංහල ජනතාවට විරුද්ධව අපි ඇටෑක් කළා. අපි මේ ලංකාවට විරුද්ධව ඇටෑක් කරලා කියන්නේ නෑ . ඒ ගොල්ලොන්ට යන්න ඕනේ ඒ ගොල්ලන් කියන්නේ සම්පූර්ණයෙන් අපේ මුස්ලිම් රාජ්‍යයක් බිහි කළ යුතුයි. අපේ මුස්ලිම්වරුන් වෙනුවෙන් සටන් කළ යුතුයි. අපි කැලිෆට් එකක් බිහි කළ යුතුයි. අපි අපේ ජීවිතය කැප කළොත් අපට ස්වර්ගයට ගිහිල්ලා කවදා හරි දවසක අපිට මේ මුස්ලිම් රාජ්‍යයක් බිහි කරන්න පුළුවන් කියන එක. ඒ වගේ ideology එකක් තියෙන ත්‍රස්තවාදී සංවිධානයක් එක්ක කටයුතු කිරීමේදී අපි විශේෂයෙන්ම ස්වාමිනි කියපු විදිහට විශේෂයෙන්ම ඒ රටවල් එක්ක එකතු වෙලා තමයි මේක කරන්න ඕනේ. එහෙම නැතුව අපිට isolatedly අපි කිසිම දෙයක් සංවිධානයක්වත් අපි තහනම් කරන්න යන්න නරකයි. අපි ඒ රටවල් එක්ක පිටිපස්සේ ඉඳන් තමයි මේක කරන්න ඕනේ. මොකද අපි කැපී පෙනෙන්න කටයුතු කරන්න නරකයි. අපි මේ මේ action ගන්නවා කියලා කටයුතු කළාම වැඩිපුර අපිට වෙන්නේ ඒ පිළිබඳව ඔය ත්‍රස්තවාදී අවධානය යොමු කරලා ඊට පස්සේ ඒ ගොල්ලන් අපිට බලනවා මේ ගොල්ලන්ට පොඩි යම් කිසි ප්‍රහාරයක් එල්ල කළ යුතුයි කියන එක. ඉතින් අපි ඒක නිසා මේක ජාත්‍යන්තරයත් එක්ක එකට තමයි යන්න ඕනේ මේ ගමන.

ප්‍ර : ඔබ දන්නවා ද කාත්තන්කුඩි ප්‍රදේශයේ ඉතාම ධනවත් ඉස්ලාම් ලබ්ධිකයන් ඉන්නවා කියලා? දැන් ඒ අය ඒ ධනවත් වෙලා තියෙන ආකාරය සොයා ගෙන යන කොට ඔබට තොරතුරු ලැබුණද ලෝකයේ තියෙන Braded ම දේවල් ඒ අය මේ රටේ නිෂ්පාදනය කරනවා. දැන් මේවා නීතිවිරෝධී කටයුතු . දැන් මෙවැනි තත්ත්වයක් යටතේ මෙවැනි නීතිවිරෝධී දේවල් පාලනය

FAIR COMMENT BY JEZEEM

කිරීම සඳහා කටයුතු කිරීම ඔබ හිතනවාද යම් ආකාරයකට මේ අන්තවාදීන්ට ඔළුව උස්සන්න තියෙන අවස්ථාව මර්ධනය කිරීමක් කියලා?

පි : ඔව් ස්වාමිනි ඔබ හරි ඒක හැම පැත්තටම ඒ ක්ෂේත්‍රයට යනවා. දැන් විශේෂයෙන්ම අපි ගත්තොත් මේ ඊබ්‍රහීම් කියන කෙනා එයා කළේ ඇවිල්ලා ඔය තඹ බිස්නස් එක තමයි කළේ. ඉතින් ඒකේ ගත්තාම එකේ වසරක ආදායම අති විශාල මිලියන ගාණක් මේකෙන්. ඉතින් එතනදී හැබැයි පැහැදිලිවම තියෙනවා ඒවා දෙන්න පුළුවන් ප්‍රමාණයක් තියෙනවා. ඒ කියන්නේ එකම අපි අවි ආයුධ ඔක්කොම අපි එකතු කර ගත්ත පරණ ඒවා අපි දෙන කොට අපි ඒවා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවට ලබා දීලා එතන තියෙනවා ක්‍රමවේදයක්. ඒ කියන්නේ එකම කෙනෙකුට ඒවා දෙන්න බෑ. ඒවා වෙන් වෙලා යන්න ඕනේ. ඉතින් එතනදී පරිපාලන සහ ඒ ඉන්න ප්‍රධානීන්ගේ කටයුතු අනුව ඒ ගොල්ලෝ ඒ ගොල්ලන්ට තියෙන අවශ්‍යතාවය අනුව ඒ ගොල්ලෝ යම් යම් පුද්ගලයන්ට මුදල් හම්බ කර ගැනීමේ අවස්ථාවක් ලබා දෙනවා මේ in absence of regulations. ඉතින් මේ regulations රටේ තියෙනවා. ප්‍රශ්නේ තියෙන්නේ ස්වාමිනි මේවා ක්‍රියාත්මක කරන්න තමයි අවශ්‍යතාවය තියෙන්නේ. ඉතින් මේ හැම එකටම ක්‍රියාවලියක් තියෙනවා නමුත් දේශපාලනයක් නෑ මේ ක්‍රියාවලිය කරන්නේ නැතුව තමන්ගේ වාසියට මේවා නොකර කිරීම තුළින් තමයි අද මේ වගේ තත්ත්වයක් අපිට ඒ කියන්නේ මේ පාස්කු ඉරිදා වගේ තත්ත්වයකට අනිවාර්යයෙන්ම බලපාලා තියෙන කරුණක් මුදල් පැත්තෙන් අපි ගත්තම.

ප්‍ර : කෙටි ප්‍රශ්න දෙකක් තියෙනවා. මම ඔබෙන් කෙටි පිළිතුරු බලාපොරොත්තු වෙන්නේ මේ ප්‍රශ්න දෙකට. පළවෙනි එක අබ්දුල් රාසීක් කියන මේ ඉස්ලාම් අන්තවාදී තැනැත්තා තාම එළියේ. ඇයි ඒ?

පි : විශේෂයෙන්ම ඔය පුද්ගලයාත් එක්කත් අපි ගණනාවක් සම්බන්ධ වීමක් කළා. ශ්‍රී ලංකා තවුහිද් ජමාත් එකේ ප්‍රධානියා. හැබැයි මට මේ වෙනකල් ඒ ඔය අබ්දුල් රාසීක් කියන පුද්ගලයා ඇවිල්ලා violent extremism එකට ගිහිල්ලා නෑ. එයාව එක සැරයක් ඔය සහරාන් ඇවිල්ලා NTJ එක හදාගෙන එයා ඉස්සෙල්ලා NTJ එකට යන්න කලින් එයා උත්සාහයක් ගත්තා SLTJ එක ඔය තත්ත්වෙට convert කරන්න. නමුත් එයාට හැකි වුණේ නෑ. එකම දේ වෙලා තියෙන්නේ මේගොල්ලො අර ඉගෙන ගෙන ප්‍රමාණය වැඩි. ඒ ගොල්ලොන්ට කතා කිරීමේ හැකියාව ගොඩාක් වැඩි. ඉතින් මෙතනදී මේ පුද්ගලයා විශේෂයෙන්ම විවිධ ප්‍රකාශ කරලා තිබ්බා

FAIR COMMENT — BY JEZEEM —

බුදුහාමුදුරුවොන්ට මිනීමස් කෑවා ඒ ආදී ප්‍රකාශ. නමුත් ඒ ප්‍රකාශ තුළින් අර යම් කිසි religious extremism එකක් යනවට මිසක් එතනින් එහාට මම දකින්නේ නෑ මේක යයි කියලා violent extremism එක. දැන් උදාහරණයක් වශයෙන් මේ ගොල්ලො මේ සංවිධානය විශේෂයෙන්ම කාන්තාවන්ගේ මූණ වැසීමට සම්පූර්ණ විරුද්ධ සංවිධානයක්. ඒ එක්කම මේගොල්ලො රට හැම තැනම ලේ දන් දීමේ කරන සංවිධානයක්. අර එකම දේ මේ ගොල්ලො ඇවිල්ලා අර දැඩි මතධාරී කොටසක ඉන්නවා. ඉතින් අපි සම්පූර්ණයෙන්ම මේ ගොල්ලන්ගේ කතා විලාසය පමණක් නෙවෙයි අපි අනිත් දේවලුත් යම් කිසි control එකකට ගන්න ඕනේ. මම හිතන්නේ engagement එකෙන් අපිට ලොකු හැකියාවක් තියෙනවා මොකද මේකේ followers ලා ඉන්නවා මම දැනුවත්ව ලක්ෂ එක හමාරක්.

ප්‍ර : අවසාන ප්‍රශ්නය මේක controversial දෙයක් මම මේ අහන්න යන්නේ නමුත් ඔබ දන්න විදිහට කෙටි උත්තරයක් දෙන්න. සමහර අයගෙන් තොරතුරු ලබා ගන්න හරි අපහසුයි. කොච්චර උත්සාහ කළත් ඒ අය තොරතුරු එළි දක්වන්න කැමති නෑ. ගල් ගෙඩිය වගේ ඉන්නවා. ලෝකයේ සමහර රටවල් වල ඔබ දන්නවාද hypnotism මෝහනය කරලා තොරතුරු ලබා ගන්නවා. ලංකාවේ ඒ ක්‍රමය පාවිච්චි කරන්න බැරිද?

පි : ස්වාමිනි අපිට ඒ පිළිබඳව අධ්‍යයනයක් අපි කරලා ස්වාමිනි අපි බලන්නම් කොහොමද අපිට ඒ වගේ ක්‍රමවේදයක් අපිට එකක් හැම තිස්සේම සම්ප්‍රදායික ක්‍රමයට යන්නේ නෑ. අපි විවිධ ක්‍රම උපයෝගි කර ගන්නවා . අපි උත්සාහ කරලා බලන්නම් කොහොමද මේ පාවිච්චි කරන රටවල් අපිට එහෙම හැකියාවක් අපට තියෙනවා නම් අපි අනිවාර්යයෙන්ම ඒක ප්‍රගුණ කර ගන්න අපි උත්සාහ කරන්නම් ස්වාමිනි.

කොමිෂන් සභාවේ කටයුතු තාවකාලිකව නතර කරනවා.
දැන් වේලාව :- 06.35 යි.

****

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව :- 06.40 යි.
නැවත කොමිෂන් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරමි.
සාක්ෂිකරු ප්‍රතිඥා දී නැවත කැඳවයි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>
සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අවශ්‍යද යන්න අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනි සිටින උගත් ජනාධිපති නීතිඥවරයාගෙන් අසමි. අවශ්‍ය බව ප්‍රකාශ කරයි. අවසර ලබා දෙමි.

****

<u>අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනි සිටින ජනාධිපති නීතිඥ ශ්‍රමිල් පෙරේරා මහතා</u>

ප : සලේ මහත්මයා ප්‍රශ්න කිහිපයක් තියෙනවා අහන්න 2012 සිට 2016 දක්වා ඔබතුමා හමුදා බුද්ධි අංශයේ කටයුතු කළා එහෙම නේද ?

පි : එසේමයි.

ප : දැන් එම කාල වකවානුවේදී තමාගේ දැනුම අනුව කුමන හෝ බුද්ධි තොරතුරක් ලබා තිබුණාද මුස්ලිම් අන්තවාදී කණ්ඩායමක් විසින් ප්‍රසිද්ධ කතෝලික පල්ලිවලට යම් ප්‍රහාරයක් ගැන තර්ජනයක් පිළිබඳව?

පි : මගේ කාලය තුළදී එහෙම කිසිම පල්ලියකට තර්ජනයක් පිළිබඳ වාර්තා වෙලා තිබුණේ නෑ.

ප : දැන් ඔබතුමා C 268 කියන වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙනවා මේ ගරු කොමිෂන් සභාවට. ඒ වාර්තාවේ කතෝලික පල්ලි හෝ කතෝලික ජනතාවට මුස්ලිම් අන්තවාදීන් විසින් යම් ප්‍රහාරයක් පිළිබඳව තර්ජනයක් ගැන වාර්තා වී තිබෙනවාද?

පි : ඔබතුමාට විස්තර කරන්න පුළුවන්ද කවදද දිනය කියලා එහෙම ඒ තොරතුරු තිබුණු? 2016/09/27

ප : ඔව් ඒ ලේඛනය අනුව ඔබතුමා ළඟ තිබෙන ලේඛනය අනුව.

පි : දැන් මෙතනදී මේ ලේඛනය සකස් කිරීමේදී විශේෂයෙන්ම අපි ISIS සංවිධානයේ ඒ කියන්නේ ඒකත් එක්ක සම්බන්ධ වෙච්ච සමහර පුද්ගලයන් එක්ක අපිට හැකියාව ලැබුණා සම්බන්ධ වීමක් සිදු වෙන්න. ඒ සම්බන්ධ වීමේදී අපි හඳුනා ගන්න බැලුවා ඒ ගොල්ලන්ගේ ප්‍රධාන අරමුණු මොනවාද කියන එක. එතකොට ඒ ගොල්ලොන්ගේ ප්‍රධාන අරමුණු වෙලා තිබ්බේ ඇවිල්ලා ඒ නායකයන් කරපු ප්‍රකාශ අනුව පළවෙනි එක තමයි ඇවිල්ලා ඒ ගොල්ලන් කියපු දේ තමයි ඒ ගොල්ලන්ගේ පරම සතුරා ඇවිල්ලා ක්‍රිස්තියානි සහ බටහිර ජාතිකයින්. ඒක ඇවිල්ලා තමයි පළවෙනිම සතුරා. ඒ සතුරාව දුටුතැන මරන්න ඕනේ කියන එක

FAIR COMMENT — BY JEZEEM

තමයි පළවෙනි එක තිබ්බේ. දෙවෙනි එක කියලා තිබ්බේ යම් රටක පුද්ගලයෝ මේ ඒ ගොල්ලොන්ට විරුද්ධව කරන සටනේදී ඒ ගොල්ලොන්ට සහයෝගය දක්වනවා නම් ඒ කියන්නේ ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල්වලට සහ ක්‍රිස්තියානිවරුන්ට සහයෝගය දක්වනවා නම් රටවල් ඉන්නවා නම් ඒ රටවල්වලටත් ඉඳලා හිටලා ප්‍රහාරය එල්ල කරනවා කියන එකක් ඒ ගොල්ලො ප්‍රකාශ කළා. ඊට පස්සේ තුන්වෙනි ගණයට ඒ දවස්වල දාලා තිබ්බ රටක් තමයි ශ්‍රී ලංකාවත්. එතනදී ඒ ගොල්ලො ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාව වගේ රටවල් ඇවිල්ලා neutral රටවල්. ඒ ගොල්ලන්ට කිසිම විරුද්ධව කටයුතු කරන්නේ නෑ. හැබැයි විරුද්ධව කටයුතු නොකළාට ඒ ගොල්ලන්ගේ කටයුතු කිරීමේදී ඒගොල්ලන්ගේ recruitment කරන්න ඒ ගොල්ලන්ගේ transit වලදී ඒ කටයුතු කරන්න කිසිම බාධාවක් ඒ රටවල් වලින් ඒගොල්ලන්ට එල්ල විය යුතු නැහැ කියන එක තමයි ඒගොල්ලන්ගේ නායකයන්ගේ මතයේ තිබ්බේ. ඉතින් එතනදී අපි අඳුන ගන්න උත්සාහ ගත්තා ISIS එකේ හැටියට ලෝකේ කොහොමද රටවල් කොටස්වලට කඩලා තියෙන්නේ කියලා. ඉතින් ඒ අනුව තමයි අපි මම හිතන්නේ මේ report එක දැම්මේ විශේෂයෙන්ම ඒ ක්‍රිස්තියානි ආගම සහ ලබ්ධිකයන් සහ බටහිර රටවල් තමයි ඒගොල්ලන්ගේ first target එක. දැන් ඒකම තමයි 2019 දී මේ සිදුවීම සිදු වෙන කොට ප්‍රහාරය එල්ල කරන කොටම මම දැන ගත්තා උදේ ඒ කියන්නේ මට ආරංචි වෙච්චි ගමන් පාන්දර පළවෙනි අටට වෙලා නවය වෙනකොට දැන ගත්තා විශේෂයෙන්ම අමුතුවෙන් ඔළුවට එන්න කිසි දෙයක් තිබ්බේ නෑ මම එතකොට ඒ රටේ ඉද්දී මොකද ඇයි මේ ගැහුවේ පල්ලිවලට. ඇයි මේ ගැහුවේ හෝටල්වලට ඉතින් ඒ තියෙන concept එකම තමයි මෙතන develop වෙලා ආවේ. නමුත් විවිධ පුද්ගලයෝ අර්ථ කථනය දක්වන්න උත්සාහ ගත්තා මේක plan කරලා තිබ්බේ ඇවිල්ලා පෙරහැරට ගහන්න. එහෙම නැත්නම් මේක මේවා කරලා තිබ්බේ ඇවිල්ලා අර අලුත්ගම හරි මොකක් හරි මේ සිදුවීමක ක්‍රියාවලියක් හැටියට. ඒ කිසි දේකට සම්බන්ධ නෑ. මොකද මේ ගොල්ලන්ට ස්වර්ගයට යන්න පුළුවන් වෙන්නේ මේ ideology එක follow කළොත් විතරයි. මේක inspiration එකත් එක්ක යන්නේ . ඉතින් එතෙන්දී ඒගොල්ලෝ පැහැදිලිවම ඒ ගොල්ලොන්ගේ සතුරෝ කියන එක ඒ ගොල්ලන් ප්‍රකාශ කළා. එතකොට ශ්‍රී ලංකාව සතුරෙක් නෙවෙයි නම් කොහොමද ශ්‍රී ලංකා ප්‍රහාරයට ලක් වෙච්ච එක ගැටලු සහගත තත්ත්වයක් ආවා. දැන් එතනදී දෙන්න පුළුවන් උත්තරේ තමයි ස්වාමිනි මොකද දැන් මෙහෙම තියෙද්දී

FAIR COMMENT BY JEZEEM

අපි මේ රට ශ්‍රී ලංකාව ක්‍රිස්තියානි කට්ටියගෙන් පිරිච්චි රටකුත් නෙවෙයි. එතකොට මේ රට බටහිර රටවල්වලින් පිරිච්චි රටකුත් නෙවෙයි . එතකොට ශ්‍රී ලංකාව මේ ISIS එකට විරුද්ධව බටහිර රටවල් එක්ක එකතු වෙලා ක්‍රියාන්විත කරපු රටකුත් නෙවෙයි . නමුත් මෙතනදී ප්‍රශ්නේ වුණේ 2016 න් ඒ කියන්නේ ඒ පස්සේ සිරියාවත් එක්ක ඒ ගොල්ලන්ගේ පරාජයත් ඔක්කොමත් එක්ක මේ ගොල්ලන්ට අවශ්‍යතාවයක් තිබ්බා යම්කිසි ප්‍රහාරයක් එල්ල කරන්න. ඒ inspiration එක වුණේ ඒ අනුව ශ්‍රී ලංකාව දැන ගත්තා මේකේදී අපිට පුළුවන් හොඳම දේ තමයි මේ අවස්ථාවේදී අර පැත්තෙන් පසුබසින කොට අපිට යම්කිසි ක්‍රියාන්විතයක් කරන්න පුළුවන් කියන. ඒ අනුව ඒ ගොල්ලො target කළා ක්‍රිස්තියානි පාස්කු ඉරිදා දවසත් ඒ එක්කම රටේ චර්මස්ථානවලට වැඩිය ඒ ගොල්ලො target කළේ ඇවිල්ලා බටහිර ජාතිකයෝ ඇවිල්ලා සිටින හෝටල් ටික. ඒ ටිකත් target කරලා ඒ ගොල්ලො ප්‍රහාරය එල්ල කළේ ඇවිල්ලා සම්පූර්ණයෙන්ම ISIS මතවාදයේ ඉඳන් ඒ තියෙන ideology එකත් එක්ක තමයි මේවා කළේ. ඉතින් මම හිතන්නේ ඔබතුමාගේ ප්‍රශ්නයට මම මේකේ සඳහන් කරලා තියෙනවා අපි මේක identify කළේ ඇත්තටම 2015 දී මේ ISIS එක නීලාම්ගේ කණ්ඩායම ඒ පැත්තේ ඉද්දී අපි මේ ගොල්ලන්ගේ ඉන්න අක්කලා නංගිලා එක්ක සම්බන්ධ වීමක් අපි සිදු වුණා. ඊට පසු කාලීනව අපිට හැකියාව ලැබුණා මේ නීලාම්ගේ වයසක අම්මයි තාත්තයි අවුරුදු මම හිතන්නේ 72 යි අවුරුදු 78 දෙන්නම ලංකාවට ගෙන්න ගන්න. අපි ඒ ගෙන්න ගැනීම තුළින් සම්පූර්ණයෙන්ම මුළු ව්‍යුහයම අපි identify කළා. කොහොමද ඒ ගොල්ලො ගියේ. මොනවද ඒ ගොල්ලො කළේ. වයසක කට්ටිය මොනවද කළේ. ළමයි මොනවද කළේ. නිලාම්ලා මොනවද කළේ. නිලාම්ගේ පවුලේ කට්ටිය කවුද මේ සියළුම තොරතුරු අපිට රැස් කර ගන්න පුළුවන් වුණේ මෙතනින්. එතනදී ඒ සම්බන්ධ වීම තුළින් බුද්ධි ක්‍රියාන්විතය තුළින් තමයි අපි මේ ගොල්ලන්ගේ මේ සතුරෝ කවුද කියන එක identify කළේ. හැබැයි අපි ඒක දැන ගෙන හිටියා අනිවාර්යයෙන්ම මේක දැන් neutral වුණාට අනිත් පැත්තෙන් සම්පූර්ණ ක්‍රියාවලියක් මේ recruitment වලටයි මේවාට යනවා. ඒ නිසා තමයි අපිට අවශ්‍ය කරලා තිබ්බේ මේක ඒ තත්ත්වෙට යාම වළක්වන්න අනිවාර්යයෙන්ම මේ ගත යුතු ක්‍රියාමාර්ග ටික අපි ගන්න ඕනේ කියන ඒක මත තමයි හිටියේ. එහෙම නැතුව අපිට බටහිර රටවල්වත්, වෙන රටවල්වත්, ISIS එක පිළිබඳවත්, පුද්ගලයෝ

FAIR COMMENT
BY JEZEEM

පිළිබඳවත් අපිට තොරතුරු දුන්නේ නෑ . අපි ගත්තේ horse's mouth වලින්. ISIS එකේ සටන්කාමීන් එක්ක හිටපු පුද්ගලයන්ගෙන් තමයි අපි ගත්තේ. ඉතින් ස්වාමීන් වහන්සේ ඒ වගේ බුද්ධි අංශයක් තමයි අපි develop කළේ. නමුත් ඒ වෙනකම් අපි ඒක පාලනය කළාට එතනින් එහාට අපිට පාලන තන්ත්‍රයෙන් ගිලිහුණා. මොකද ඒ අවශ්‍ය කරන ක්‍රියාවලියත් සිදු වුණේ නැති නිසා ඊට පස්සේ.

ප : දැන් ඔබතුමාගේ පිළිතුරෙන් කියන්න පුළුවන් වෙයිද ඉදිරියටත් ලංකාවේ කිතුනු ජනතාවද මේ ඉලක්ක කර ගෙන ඉන්නේ මේ මුස්ලිම් අන්තවාදීන් එහෙම මතයක් තියෙනවාද?

පි : ස්වාමිනි ඇත්ත වශයෙන්ම අපි තේරුම් ගන්න ඕනේ ISIS එක මොකක්ද, ISIS එකේ ideology එක මොකක්ද, ISIS එකේ අරමුණ මොකක්ද කියන එක. ඉතින් ඒ ideology එකයි අරමුණයි ඒ ටික ගත්තාම මේ මතවාදය ISIS කියන සංවිධානය අද ගිහිල්ලා හෙට නැති වෙලා හෙට අලුත් සංවිධානයක් එන්න පුළුවන්. නමුත් මේ මතවාදය තියෙන තාක්කල් ඒ community එක vulnerable කියලා තමයි මගේ assessment එක තියෙන්නේ.

ප : ඒ කියන්නේ community කියන්නේ ක්‍රිස්තියානි community එක කිව්වොත් හරිද?

පි : ඔබ හරි දැන් ලෝකේ අනිකුත් ඒ දේවල්මනේ සිදු වෙන්නේ. Christ – church එකෙත් ඒ දේ සිදු වුණේ. එතකොට Germany වලත් ඒ දේ සිදු වුණේ. ඒ එක්කම අනිකුත් හැම ප්‍රදේශයේම ඒ දේ තමයි සිදු වුණේ. ඉතින් ඒක නිසා මේක මතවාදය අපි පරාජය තාක්කල් මේ මතවාදයත් එක්ක ඉන්න මිනිස්සු ඒ targets වලට යන්න හැකියාව අනිවාර්යයෙන්ම තියෙනවා. ඒක තමයි ඒ ගොල්ලොන්ගේ අරමුණ. නමුත් අපි ගන්න විවිධ ක්‍රියාමාර්ග සහ මේක ජාත්‍යන්තරව සහ locally අපි ගන්න ක්‍රියාමාර්ග හරහා අපිට පුළුවන් මේක සම්පූර්ණයෙන්ම හෝ අපිට මේක අවම කරන්න. නමුත් threat factor එක අයින් වෙන්නේ නෑ.

ප : දැන් ඔබතුමා ළඟ තිබෙනවාද C 4 (A) කියන ලේඛනය?

පි : ඔව්.

ප : දැන් මේ C 4 (A) තමන්ගේ දැනුම අනුව ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ කතෝලික පල්ලි මුල් කර ගෙන මුස්ලිම් අන්තවාදීන් විසින් ඇති කර ගත හැකි ප්‍රහාරයක් පිළිබඳව ලැබුණු සුවිශේෂ බුද්ධි වාර්තාවක් කියලා තමා පිළිගන්නවාද?

පි : ඔබ හරි.

FAIR COMMENT BY JEZEEM

ප : එතකොට ඔබතුමාගේ දැනුම අනුව මෙය ප්‍රථම වතාවටද මේ අන්දමින් බුද්ධි තොරතුරක් ලැබිලා තිබෙන්නේ කතෝලික පල්ලි සම්බන්ධයෙන්?

පි : අර මම කියපු ඒ අරමුණත් එක්ක එය develop වෙලා මුල් වතාවට තමයි විශේෂයෙන්ම ක්‍රිස්තියානි පල්ලියක් target කරලා ප්‍රහාරයක් එල්ල කරනවා කියන එක තොරතුරු මගේ දැනුවත් වීම මොකද මම හිටියේ නෑ 2016 න් පස්සේ. නමුත් දැන් මං මේක පිළිබඳව පසු විපරමක් කරන කොට විශේෂයෙන්ම මුල් වතාවට තමයි මේවාගේ report එකක් ආවේ මේ ක්‍රිස්තියානි පල්ලිය ආශ්‍රිතව ප්‍රහාරයක් එල්ල කරනවා කියන එක.

ප : එතකොට ඒ විදිහටම තමා පිළිගන්නවා නේද මෙයට විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුයි කියලා මේ අන්දමට බුද්ධි වාර්තාවකට?

පි : අනිවාර්යයෙන්ම විශේෂ සැලකිල්ලක් අනිවාර්යයෙන්ම දැක්විය යුතුයි කාරණා දෙකක් හින්දා. එකක් ඇවිල්ලා අපි මේ වෙන කොට මේ ගොල්ලන්ගේ ක්‍රියාකාරීත්වයන් සහ මේ ගොල්ලන් මොනවගේ capability එකක් තියෙන පුද්ගලයන් ද කියන එක අපි දැන ගෙන හිටියා. දෙවෙනි එක විදේශීය බුද්ධි රටකින් විශේෂයෙන්ම ප්‍රධාන බුද්ධි සේවාවකින් ලෝකයේ තියන professional බුද්ධි සේවාවකින් මේ තොරතුරු ලබා දීම් කරලා තියෙනවා. මීට කලින් මගේ අත්දැකීම් අනුව යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක හැටියට ඉද්දී උතුරේ වෙන යම් යම් ප්‍රශ්නවලදී ඒ ලබා දුන්නු තොරතුරු අපට ඉතාමත්ම උපකාරයක් වුණා ඒ වගේ නැවත LTTE ත්‍රස්තවාදය වැළැක්වීමට කටයුතු කරන්න. ඉතින් මෙතනදී ඒ කාරණා දෙක මම හිතන්නේ මේක සුවිශේෂී බුද්ධි වාර්තාවක් හැටියට සඳහන් කරන්න පුළුවන්. අනිත් එක මේ විදියේ වාර්තා ඒ ගොල්ලො හැම තිස්සෙම දෙන්නෙත් නෑ.

ප : දැන් ඒ අනුව තමාගේ පළපුරුද්ද අනුව මෙවැනි බුද්ධි තොරතුරක් කොළඹ අගරදගුරු අති උතුම් කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් වහන්සේට දැනුම් දිය යුතු බවට වගකීම දැරිය යුත්තේ කවුද කාටද?

පි : ස්වාමිනි මම හිතනවා ඒ වගකීම සියළු දෙනාටම යනවා. විශේෂයෙන්ම රටේ තියෙන ප්‍රධාන නායකයාගේ ඉඳන් ආරක්ෂක ලේකම්, පොලිස්පති සහ බුද්ධි ප්‍රධානීන් මේ සියළු දෙනාගේම වගකීම තමයි එතුමාව දැන් මොකද මේක target එකක් දීලා තියෙනවා පල්ලිය කියන එක සඳහන් කරලා තියෙනවා. එතකොට අපි සාමාන්‍යයෙන් බැලුවොත් calendar එකක් බැලුවොත් එහෙම ඇයි මේ අදාළ දිනය වැදගත් වෙන්නේ කියන

FAIR COMMENT BY JEZEEM

එකත් ඉතාමත්ම පැහැදිලියි. එහෙම නම් ඒක වළක්වන්න තියෙන ප්‍රධාන දේ ඇවිල්ලා එක පැත්තකින් ඇවිල්ලා ආරක්ෂාව තොරතුරු තව ටිකක් එක් රැස් කිරීම, දෙක ඇවිල්ලා ආරක්ෂාව සැපයීම තුන්වෙනි එක ඒක වැළැක්වීමට ඒ පල්ලියට එදා දින රැස් වෙන කට්ටියට නොයෙන ලෙස දැන්වීම. ඉතින් ඒ දැන්වීමේදී ආයතනයේ ප්‍රධානියා දැන් මෙතනදී ඇවිල්ලා මේ මෙතනදී විශේෂයෙන්ම කාදිනල්තුමා තමයි එතනදී දැනුවත් කිරීමක් අනිවාර්යයෙන්ම ඒක දැනුවත් කිරීමක් කරන්න තිබ්බා. නමුත් ඒක බුද්ධි නිලධාරියාට විතරක් සීමා වෙන්නේ නෑ. ඒ මං ඔය කියපු පාර්ශවයන් හතරටම වගකීම තමයි ඒක දැනුවත් කිරීම සිදු කිරීම.

ප : දැන් බලන්න මේ C 4 (A) ලේඛනය ඒ C 4 (A) ලේඛනයේ තියෙනවා eyes only කියලා. eyes only දැන් ඔබතුමාගේ පළපුරුද්ද අනුව මේ eyes only කියන එකයි for your eyes only කියන එකයි දෙක අතර වෙනසක් තිබෙනවාද?

පි : ඇත්තටම මේ top secret, secret, restricted, confidential සහ unclassified කියලා documents අපි ළඟ තියෙනවා. මේකට විශේෂයෙන්ම systems දෙකක් තියෙනවා. ඇමරිකාවේ ඒ top secret එකට දීලා තියෙන definition එකයි එංගලන්තය විසින් top secret එකට දීලා තියෙන definition එකයි වෙනස්. ඒ එක්කම ඉන්දියාවේ top secret එකට දීලා තියෙන definition එක වෙනස්. එතකොට මම ඉගෙන ගත්ත පාසලේ අධ්‍යයනය කළේ ඇවිල්ලා යුධ හමුදාවේ. එතනදී සහ බුද්ධි පාඨමාලාව කළේ හමුදා බුද්ධි අංශයේ. ඉතින් එතනදී අපිට top secret කියලා කිව්වම අපිට ඒ කියන්නේ මේක ඉහළම ආරක්ෂක මේකක් මේක treat කරන්න ඕනේ. එතකොට top secret ලියුමක් සාමාන්‍ය පුද්ගලයෙකුට අත්සන් කරන්න බෑ. ඒකේ තියෙනවා පැහැදිලිවම top secret ලියුමක් අත්සන් කරන්න පුළුවන් ඒකේ ප්‍රධානියෙකුට පමණයි. ඒ එක්කම top secret එක යටතෙන් අපි eyes only or for your eyes only කියන එක දෙකම එකයි කියලා මම අර්ථ කථනය කරනවා මගේ දැනුම හැටියට. මොකද අපි එතනදී අපි සඳහන් කරන්නේ eyes only කියන්නේ තමන්ගේ අවධානය සඳහා පමණක් කියන එක. එහෙම අර need - to – know basis එක වගේ eyes only. එතකොට top secret එක තවදුරටත් විග්‍රහ කරලා තියෙනවා eyes only කියලා. හැබැයි මට මෙතනදී ගැටලුකාරී තත්ත්වයක් එනවා මේ මගේ දැනුමත් එක්ක මේ වගේ එකක් ඇයි eyes only කළේ කියන එකත්මට මේකක් වෙනවා.

FAIR COMMENT BY JEZEEM

මොකද මේකේදි විශේෂයෙන්ම අපි මේක දැනුවත් කිරීමක් කළ යුතු එකක්. ඉතින් මෙතනදී අපි නිශ්ශබ්දව අපි තොරතුරක් හොයා ගෙන මේක කාටවත් කියන්නේ නැතුව මේ තොරතුර මේක පිටිපස්සේ ගිහිල්ලා මිනිස්සු අල්ල ගන්න ඇවිල්ලා එහෙම නම් අපි මේක top secret විය යුතුයි. ඒ කියන්නේ මේක කාටවත් දැනුම් දෙන්න බෑ. කෙළින්ම බුද්ධි අංශයට පමණයි දෙන්නේ. වෙන කවුරුත් දැනුම් දෙන්න එපා. මොකද මිනිහා මේක දැන ගත්තොත් එළියට පැනලා යන්න පුළුවන්. ඒක නිසා අත්අඩංගුවට ගන්න ඕනේ කියන එක. ඉතින් විශේෂයේදී අපි සාමාන්‍යයෙන් මේක දැනුවත් කිරීමක් කරන්න අවශ්‍ය නම් අපි මගේ දැනුම නම් eyes only කියන එක භාවිතා කරන්නේ නෑ. Secret කියන එක භාවිතා කරයි. ඒ එක්කම මම මෙතන දැනුම් දීමක් කරයි. මෙතෙන්දී මේ මේ අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමක් කරන්න කියන එක. මොකද අපිට මෙතනදි මම අර කියපු විදිහේ මූලික දේ විය යුත්තේ proactive action and prevent the incident. ඉතින් එහෙම නැතුව reactive ඉඳලා මේකේ තොරතුරු ඇසට පමණක් අරගෙන කටයුතු කරන එක නෙවෙයි මේ incident එක මේ විදිහට develop වෙනකොට imminent threat එකක් දකින කොට ඊට කලින් අපි මේ study කරන අවස්ථාවේදී නම් අපි රහසිගතව කමක් නෑ. මොකද අපි ඒක කළ යුතුයි. නමුත් මේ අවස්ථාව වෙන කොට මේකේ attack එක imminent. ඉතින් මෙතනදී අපි රහස්‍යභාවයට වැඩිය අපි කරන්න ඕනේ මේක පුළුවන් තරම් දැනුවත් කරලා මේක වළක්වන්න තමයි කටයුතු කරන්න ඕනේ . නමුත් professional intelligence agency එකක් නම් systems තියෙනවා නම් immediately මේ ලියුම යන්න කලින් මේ පුද්ගලයන් අපි එක පැත්තකින් මේවා කරන ගමන් අනිත් පැත්තෙන් අපි අත්අඩංගුවට ගන්න කටයුතු කරන්න ඕනේ. ඒක කරන්න බැරි නම් මම හිතන්නේ මේ classificationඑක ගැන නැවත වරක් සිතන්න වෙනවා.

ප්‍ර : දැන් ඒ classification එක අනුව top secret කියන්නේ මේ ඔබතුමා කියන්නේ?

පි : අතිරහස්‍යය.

ප්‍ර : දැන් මෙහෙම කිව්වොත් හරිද මේක එංගලන්තයේ classification එක අනුව Most sensitive information requiring the highest levels of protection. For example from severe terrorist threats කියලා සඳහන් කරලා තිබෙනවා. ඒක හරිද ඒක?

FAIR COMMENT — BY JEZEEM

පි : මට ඒ definition එක මට හරියට මතකයක් නෑ. හැබැයි මේක ඇවිල්ලා අපිට classification එකේදී දෙන්න පුළුවන් උපරිම රහස්‍යභාවය තමයි මේ document එකට දෙන්නේ. හැබැයි ඇයි මේ document එක අති රහස්‍යභාවයක් දෙන්නේ. ඒ කියන්නේ ඒකයි මම අර කලින් කිව්වේ අතිරහස්‍ය document එකක් සාමාන්‍යයෙන් යුධ හමුදා නිලධාරියෙකුටවත්, පොලිස් නිලධාරියෙකුටත් මේක අත්සන් කරන්න බෑ. මේක අත්සන් කරන්න පුළුවන් level එකක් තියෙනවා. ඉතින් අපි මේ ක්‍රමවේද හදලා තියෙන්නේ ඒ අනුව පාවිච්චි කරන්න . ඉතින් මේවා හරියට කොහේවත් හරියට මේවා පාවිච්චි වෙන්නේ නෑ. ඉතින් මේක ඒ ඒ classification වුනත් හරියට කොහොමද අත්සන් කරන්න පුළුවන්, කාටද අත්සන් කරන්න පුළුවන් මේකේ තියෙන වැදගත්කම ඒ ආදී වශයෙන් අපි කටයුතු කරනවා නම් අපිට මේ වගේ දේවල් වළක්වන්න පුළුවන්. සමහර විට මේ information එක මේ විදිහට ආවාම අපි කියමු ground එකට ආවායින් පස්සේ මේක තව කෙනෙක් එක්ක share කරන්න බෑ. ලොකු ප්‍රශ්නයක්. ඒ කියන්නේ අපි කියමු මේක පොලිසියේ තැනකට ගියොත් එහෙම detachment එකට ගියොත් top secret කියලා කිව්වොත් එහෙම මෙතන ලොකු ගැටලුකාරී තත්ත්වයක් වෙනවා මම කාත් එක්කද මේ information එක share කරන්නේ කියලා. එහෙම share කරන්නේ නැත්නම් එයා අනිවාර්යයෙන්ම මේ incident එක prevent කරන්න අත්අඩංගුවට ගැනීමක් කරන්න ඕනේ. ඉතින් එතකොට ඇත්තටම අපි පොලිසියෙන් බලාපොරොත්තු වෙන්නේ අත්අඩංගුවට ගැනීමක්ද මේ වගේ imminent threat එකකදී incident එක prevent කරන්න පුළුවන් තරම් කාලයක් ගැනීමද කියන එක ඉතින් මෙතන ගැටලුකාරී තත්ත්වයක් මෙතන තියෙනවා පැහැදිලිවම.

ප්‍ර : දැන් ඔබතුමා ඒ කියන ලද පිළිතුරට මෙහෙම මම යෝජනා කෙරුවොත් eyes only for your eyes only, eyes only කියන්නේ යම් විශේෂ නිශ්චිත කණ්ඩායමකට පමණයි කියලා කිව්වොත් තමා පිළිගන්නවාද?

පි : ඔබ හරි ඒකෙන් පැහැදිලි වෙන්නේ ඇවිල්ලා ඒ කියන්නේ මේ බලන document එක බලන පුද්ගලයාට පමණක් මේක සීමා විය යුතුයි කියන එක තමයි මේකේ වෙන්නේ.

ප්‍ර : බලන පුද්ගලයා සහ අනිත් ඒ ලිපිය

පි : action එක ගත යුතු පුද්ගලයා.

ප්‍ර : ඔව් අනිත් අයටත්. එහෙම නේද?

FAIR COMMENT BY JEZEEM

පි : ඔබ හරි. තව එකක් කියන්න ඕනේ ස්වාමිනි විශේෂයෙන්ම දැන් අපි මේ එංගලන්තයේ definition එක ගත්තාම දැන් උදාහරණයක් වශයෙන් අපි කියමු ආජන්ටිනාවේ ඉඳන් Air craft වගයක් ගහන්න එනවා එංගලන්තයට. දැන් මේ තොරතුර ලැබුණාම ඒකේ ඉන්න ප්‍රධාන හමුදාපති හෝ ගුවන් හමුදාපති කෙළින්ම රටේ ඉන්න ප්‍රධාන පුද්ගලයාට අරිනවා top secret එකක් හැටියට මෙන්න ගුවන් ප්‍රහාරයක් එල්ල වෙනවා කියලා. එතකොට එතෙන්ට ආවායින් පස්සේ එතුමා මොකද කරන්නේ අවශ්‍ය කරන විදිහට ටක් ගාලා ඒක alert කරලා වැඩිය නිශ්ශබ්දව ඉඳලා කොහොමද මේකට අවශ්‍ය කරන කාර්ය භාරයක් කරනවා. ඉතින් එතෙන්ට ඒ information එක යන ක්‍රියාවලිය තමයි top secret වෙන්නේ. මොකද ඒක ඊට කලින් ප්‍රධාන පක්ෂයට යන්නේ නැතුව මේක වෙනවා නම් parellal වෙනවා නම් top secret එකක් ඒකේ secrecy එකක් නෑ. ඉතින් ඒක නිසා හැම තිස්සේම top secret එකක් යන්නේ ඉහළ ස්ථානයකට. ඒ එක්කම top secret එකක් අත්සන් කරන්න පුළුවන් වෙන්නේ ප්‍රධානම ඉහළ පුද්ගලයා ඒකේ පැහැදිලිවම සඳහන් කරලා තියෙනවා මගේ මතකේ හැටියට ජාතික ආරක්ෂාවට තර්ජනයක් වෙන්න පුළුවන් අවස්ථාවකදී තමයි මේ top secret එකක් යන්නේ. එතකොට ඒ top secret එකට අනිවාර්යයෙන්ම ක්‍රියා කළ යුත්තේ ඇවිල්ලා රටේ ඉන්න ප්‍රධානතම එක්කෝ ඒකේ ප්‍රධානීතයම තමයි. ඒ විදිහට තමයි මේකේ classification එක තියෙන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදි උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරයා තව එක් ප්‍රශ්නයක් ඇසීමට අවසර පතයි. අවසර ලබා දෙමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : දැන් මෙම top secret වශයෙන් සඳහන්ව යන ලිපියක ඒ ලිපිය ලබන්නාට එය බලලා FNA කියලා For necessary actionකියලා දැමීම ඒ දැමීම තුළින් කුමක්ද හැඟවෙන්නේ?

පි : ඔව් දැන් විශේෂයෙන්ම දැන් මේ top secret එකට ගියාම ඒකේ ප්‍රධානියාට අත්සන් කරලා තියෙන්නේ IGP. එතකොට IGP

FAIR COMMENT — BY JEZEEM —

දන්නවා මේක ඇවිල්ලා ඉතාමත්ම බැරෑරුම් තත්ත්වයක් සහ මේක ජාතික ආරක්ෂාව කෙරෙහි බලපාන තොරතුරක්. එතකොට එතුමා ඒක තියා ගෙන ඉන්නේ නැතුව එතුමා මේක දාන්න පුළුවන් විශේෂයෙන් හැබැයි මේ පුද්ගලයන්ට සඳහන් කරන කොට විශේෂයෙන්ම එයා සඳහන් කරන්න ඕනේ මේකට ගත යුතු ක්‍රියාමාර්ග. For necessary action කියන්නේ සාමාන්‍යයෙන් ඕන ලියුමක් ආවායින් පස්සේ අපි දැනුම් දෙනවා ඉදිරි ක්‍රියාමාර්ග ගන්න කියන එක. නමුත් මොකක්ද මේ ඉදිරි ක්‍රියාමාර්ගය කියන එක එතුමා විසින් මොකද මේක නායකයාට ලියලා තියෙන්නේ. මේ නායකයා මොකක්ද ගත යුතු ක්‍රියාමාර්ගය. මේකට තොරතුරු ගන්න මේක taskකරන්න ඕනේ. පල්ලිවලට දැනුම් දෙන්න කටයුතු කරන්න ඕනේ. ඒ එක්කම අදාළ security measures ටික ගන්න ඒවා ටික කරන්න ඕනේ. ඒ ආදී වශයෙන් මේ වගේ ලියුමක් ආවාම මේ ලිපිය ලබන්නා ආයතන ප්‍රධානියා හැටියට මේ කාරණා ටික අනිවාර්යයෙන්ම කළ යුතුයි.

ප්‍ර : ඒ කියන්නේ මේ ලැබිච්ච පුද්ගලයා මෙය බැරෑරුම් ලෙස සලකලා බලලා නෑ කියලද ඔබ කියන්නේ මේ බැලූ බැල්මට ඔබගේ මතය වන්නේ?

පි : ඔව් මගේ මතය තියෙන්නේ මේ top secret ලියුමක් ඇවිල්ලා දෙන්නෙක් තුන්දෙනෙක්ට යවන්න බෑනේ. top secret අරින්න පුළුවන් ජනාධිපතිතුමාට ලේකම්තුමාට. ඒ කියන්නේ එයා තමයි ඒ top secret එක ඇරියායින් පස්සේ අපි බලාපොරොත්තු වෙන්නේ එයා තමයි මේකේ බැරෑරුම්කම අඳුර ගෙන ක්‍රියාමාර්ග ගත යුත්තේ.

ප්‍ර : ඊට පස්සේ තමා ඒ බැරෑරුම්කම වටහා ගෙන තමාගේ කණිෂ්ඨ නිලධාරී ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග තමා විසින් සැලසුම් කරලා

පි : අනිවාර්යයෙන්ම මෙතනදී ලියුම මම නම් recipient ඇවිල්ලා ඒ කියන්නේ මට එන්න බෑ top secret එකක් නමුත් මට ඒ කියන්නේ මගේ කිසිම මගේ පල්ලෙහා නිලධාරීන් මට top secret ලියුමක් එවන්න බෑ. මොකද ඒ ගොල්ලෝ ඒකට eligible නෑ. හැබැයි මට ලියන්න පුළුවන් top secret ලියුමක් උඩට. හැබැයි මම top secret ලියුමක් ලියන්නේ මම බලාපොරොත්තු වෙනවා මේකේ තියෙන බැරෑරුම් තත්ත්වේ අනුව මේක ලොකු අවධානයක් යොමු කරලා මේ ක්‍රියාමාර්ග ගන්න අවශ්‍ය කරන සැලසුම කරන්න ඕනේ කියන එක. එතකොට ඒ ආවාම මේ හැම තිස්සෙම top secret ලියුමක් එන්නෑ. මේක ආවාම අනිවාර්යයෙන්ම මේක බලලා මේක කොහොමද අත්අඩංගුවට

FAIR COMMENT BY JEZEEM

ගන්න කවුද කටයුතු කරන්න ඕනේ . මේක warn කරන්න ඕනේ නම් එයා තීරණය ගන්නවා මේක warn කරන්න ඕනේ. මේ මේ කට්ටියට කියන්න. මේ අදාළ පල්ලිවලට තියෙනවා නම් සියළු පල්ලිවලට දැනුම් දීමට කටයුතු කරන්න කියලා පුද්ගලයෝ වශයෙන් එයා සඳහන් කිරීමක් කරන්න ඕනේ. ඊට පස්සේ මේක base කරගෙන මේකේ ඉන්න අනිත් අය තව ලියුමක් ගහන්න පුළුවන් ඒ හිතන්නකෝ මේන් මෙහෙම තොරතුරක් ලැබිලා තියෙනවා මේ අනුව මේ අනුව මේ security measures ටික ගන්න ඕනේ කියන එක මේ ලබන්නා ඒ ටික කරන්න ඕනේ.

ප : සහ ඔහුගේ අත්සන සහ ඔහුගේ මුද්‍රාව යටතේ?

පි : අනිවාර්යයෙන්ම.

ප : එසේම top secret සහ මෙම C 4 (A) හි eyes only ලෙස සඳහන් වෙනවා?

පි : ඔව්.

ප : එවැනි අවස්ථාවකදී එම විශේෂයෙන්ම eyes only සහ top secret කියන වාක්‍ය කාණ්ඩය ඇතුලත් වෙලා තියෙන කොට ඒ ලබන්නා වගකිව යුතු නිලධාරියෙක් වශයෙන් එම ලැබෙන ලේඛනය තමාගේ පහළ නිලධාරීන් වෙත

පි : මේකම photocopy කරලා යවන්න බෑ අනිවාර්යයෙන්ම. මොකද මේක top secret එක සඳහන් කරලා eyes only කියලා සඳහන් කරලා තියෙන්නේ මේකේ තියෙන බැරෑරුම් තත්ත්වය සහ ඒ වගකිව යුතු ප්‍රධානියාට දැනුම් දීලා එයාගෙන් බලාපොරොත්තු වෙනවා ඔයා මේක threat එකට ක්‍රියාමාර්ගයක් ගන්න කියලා. එතකොට මේ contents ටික අරගෙන උපදෙස් ලබා දීම තමයි සිදු කළ යුත්තේ.

ප : එතකොට මේ C 4 (A) මඟින් ලැබෙන තොරතුර පොලිස්පතිවරයා විසින් අවතක්සේරුවට ලක් කිරීමක්ද මෙහිදී සිදු වෙලා තියෙන්නේ?

පි : දන්නේ නෑ. මගේ පෞද්ගලික හැඟීම

ප : ඔබේ පෞද්ගලික හැඟීමක්නේ ඒ?

පි : මගේ පෞද්ගලික හැඟීම අනිවාර්යයෙන්ම මේකේ තියෙන එක හරියට ලියුමේ තියෙන contents එක කියෙව්වා නම් මේ විදිහේ minute එකක් දාන්න බෑ. මොකද මේක මේ minute එකෙන් බේරෙන්න බෑ. මම පාස් කළා කියන එක. මොකද මෙතනදී top secret එක මේ threat එක සඳහන් කරලා තිබ්බම අනිවාර්යයෙන්ම ක්‍රියාමාර්ග ගන්න පුළුවන් executive arm එක තමයි මේක. ජනාධිපතිතුමා, ලේකම්තුමා සහ පොලිස්පති. ඉතින්

President Secretary's Copy
FAIR COMMENT — BY JEZEEM —

පොලිස්පතිතුමාට තමයි පොලිසිය තියෙන්නේ එතකොට එයා උපදෙස් දෙන්න ඕනේ එයාගේ ඉන්න නිලධාරීන්ට එයාට තීරණයක් ගන්න පුළුවන් මේක අපි public එකට කියනවාද, ඔක්කොම media එකට awareness එකක් කරනවාද, පල්ලිවලට කියනවාද, එහෙම නැත්නම් මේක මොකුත්ම කියන්නේ නැතුව group එකක් දාලා වෙනමම STF එක හරි මොකක් හරි එකක් දාලා immediately මේක මේවා කරන්න. එහෙම නැත්නම් මේක තව ලියුමක් අපි මේක කරන ගමන් අපි මෙයා ගෙන්වන්න ඕනේ මේක එවපු පුද්ගලයාව ගෙන්වනවා ළඟට ගෙන්නලා අහනවා මොකක්ද මේක, කොහොමද මේක වෙන්නේ. ඒ අනුව එයා ක්‍රියාමාර්ග ගන්න ඕනේ.

ප්‍ර : පොලිස්පතිට හැකියාවක් තිබේද ඔබේ දැනීමේ හැටියට යුධ හමුදාව හෝ ත්‍රිවිධ හමුදාවේ සහාය ලබා ගන්න ?

පි : විශේෂයෙන්ම මේ වගේ එයාට ආවාම එයා action එකක් ගන්නේ නැත්නම් මෙයා අනිවාර්යයෙන්ම තව top secret ලියුමක් මේවා කරලා අරින්න ඕනේ ආරක්ෂක ලේකම්ට හෝ ජනාධිපතිතුමාට මෙහෙම threat එකක් තියෙනවා මේක කරන්න ඕනේ කියලා parallely එයාට එයාගේ system එකෙන් කරන්න බැරි නම්.

ප්‍ර : ඒ කවුද යවන්න ඕනේ පොලිස්පතිද?

පි : පොලිස්පති.

ප්‍ර : ඒ කියන්නේ ඔහු පොලිස්පතිට පොලිස්පතිගේ රාජකාරී සීමාව තුළ ඒ ලැබෙන තොරතුර සම්බන්ධයෙන් ක්‍රියාකාරී වෙන්න බැරි නම්

පි : බැරි නම්

ප්‍ර : ඒ සම්බන්ධයෙන් ක්‍රියාකාරී වෙන්න කියලා ලේකම් ආරක්ෂක අමාත්‍යාංශයට කියනවා?

පි : එයා අනිවාර්යයෙන්ම ආරක්ෂක ලේකම්ට දැනුම් දීලා කියන්න ඕනේ යුධ හමුදාව පොඩ්ඩක් මේකට යොදව ගන්න. මේකේ මෙතන පොඩි බැරුරුම් තත්ත්වයක් තියෙනවා මේ පල්ලි එහෙම නැත්නම් meeting එකක් කැඳවන්න කැඳවලා අපි මේ ආරක්ෂක වැඩ පිළිවෙලක් කරන්න ඕනේ කියලා.

****

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>
කොමිෂන් සභාවට පැමිණ කොමිෂන් සභාවේ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධයෙන් දැක්වූ සහයෝගයට සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තූතිය පල කරනවා.
සාක්ෂිකරු මුදා හරිමි.

දැන් වේලාව : ප.ව.07.10 යි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන් තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.07.04 වේලාව: පෙ.ව 10.30

සටහන් කළේ - යමුනා දසනායක

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නීතීඥ ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

ඉමිටියාස් අහමඩ් කලිලුර් රහුමාන්

වයස අවු 39 .

ආගම - මුස්ලිම්/ ඉස්ලාම්.

රැකියාව - ව්‍යාපාරික.

ලිපිනය- 115/04 , ශාන්ත ජේම්ස් වීදිය, මෝදර, කොළඹ.

සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය.</u>

රහුමාන් මහත්මයා අපි අද ඔබෙන් දැන ගන්නට බලාපොරොත්තු වන කරුණු කොයි විදියටද දැන ගන්නට බලපොරොත්තු වෙන්නේකියලා මම ඉස්සරවෙලාම කෙටියෙන් ඔබට හඳුන්වා දෙන්නට කැමතියි. මමත් මගේ සහෝදර නිළධාරියාත් දෙදෙනාම ඔබෙන් ප්‍රශ්ණ අහනවා ඒ ප්‍රශ්ණ අහනකොට අපට දැන ගන්නට අවශ්‍ය වෙනවා ඔබ මෙම කොමිෂන් සභාව ඉදිරියට ආවේ ඇයි ? ඔබ මේ කරුණු රැස් කර ගත්තේ කොහොමද?ඔබේ පසුබිම කුමක්ද ? ඔබ අද දින මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන කරුණු පිළිබඳව සනාථ කිරීම සඳහා ඔබලඟ යම්යම් ද්‍රව්‍ය තියෙනවාද ඒ හැරෙන්නට අපිට පුලුවන් කම ලැබී තිබෙනවා යු. ටියුබ් සහ සමහර වෙබ් සයිට් ආශ්‍රයෙන් ඔබ කියන දේ සනාථ කරන්නට අවශ්‍ය වෙන කරුණුත් ගරු කොමිෂන්සභාවේ අවධානයට යොමු කරන්න .

ප්‍ර ඉස්සරවෙලාම රහුමාන් මහත්මයා මම අහන ප්‍රශ්ණ මගේ සහෝදරයා අහන ප්‍රශ්න ඔබට තේරෙන්නේ නැත්නම් කරුණාකරලා කියන්න අපි පැහැදිලි කරලා අහන්නම් ඔබට සිංහලෙන් පිළිතුරු දෙන්නට පුලුවන්ද ?

උ පුලුවන්

ප්‍ර ඔබට පැහැදිලි කරන්න පුලුවන්ද ඔබ ජාතියෙන් මුස්ලිම් ජන කොට්ඨාශයට අයත් වෙලා ඉස්ලාම් භක්තිකයෙක් විදියට මේ ගරු කොමිෂන් සභාව ඉදිරියට ඇවිල්ලා මේ වගේ සාක්ෂි දෙන්නට ඇයි තීරණය කරේ කියලා ?

උ හේතුව ඇවිල්ලා මම සාමාන්‍යයෙන් පාරම්පරික පවුලකින් පැවතගෙන එන එක්කෙනෙක් .

ප්‍ර ඒකෙන් ඔබ මොකක්ද අදහස් කරන්නේ පාරම්පරික පවුලකින් පැවතෙනවා කියලා ?

උ ඒ කියන්නේ ඇවිල්ලා පාරම්පරික වත් පිලිවෙලිවත් වලින් ඉස්ලාම් දහමේ තියෙන පාරම්පරික වත් පිලිවෙත් වලින් පෝෂණය වෙච්ච කෙනෙක් මම . ඒවුනාට මම සමාජ ආශ්‍රයේදි ගොඩාක් පුද්ගලයන් ආශ්‍ර කරලා තියෙනවා ඒ කියන්නේ විවිධ මත දරන පුද්ගලයන් ඒ

FAIR COMMENT — BY JEZEEM —

විවිධ මත දරනවා කියන එක මන් දැන ගත්තේ ඇවිල්ලා පසුකාලීනවද වෙද්දි ඒ මත මොකක්ද කියනඑක ඒ විවිධ මත කිව්වේ ඇවිල්ලා වහාබ්වාදය ඉහ්වාන් මුස්ලිම්, ජමාතේ ඉස්ලාම්, තබ්ලික් ජමාත්, ඒසම්බන්ධව ඒ පුද්ගලයන්ව ආශ්‍රය කලත් මං දැන ගත්තේ පසුකාලීනව තමයි ඒ වාගේ තියෙන අන්තවාදභාවය පිළිබඳව. ඒ නිසා තමයි මමත් තීරණය කලේ මෙතන තියෙන පොත් ටිකක් මම ඒ කාලේ තරුණයෙක් වශයෙන් ඉන්න කාලේ රැස් කරපු පොත් තමයි මේ. ඒ කියන්නේ අපිව ආකර්ෂණය කරන්න එක එක සංවිධානවල් වලින් මුද්‍රණය කරපු පොත් ඒ කාල වලදි මේ පොත් වල තියෙන පින්තූරු බලලා මේ පොත් ගත්තා හැරෙන්න ඒවල තියෙන ඇතුලාන්තය අපි කියවලා නැහැ. පසුකාලින වෙද්දි මේ සහරාන්ගේ බෝම්බ ප්‍රහාරයෙන් පසු මං මගේ ගෙදර තියෙන පුස්තකාලයක් වගේ පොඩි ඒකේ තියෙන පොත්පත් ටික අරන් බලනකොට තමයි තේරුනේ මේකේ තියෙන භයානකත්වය ඒ කියනේන් මේ පොත් වල කොහේවත් සඳහන් කරලා නැහැ මේ මරන්න කියලා ඒවුනාට එතන තල්ලු කරන තැනක් තියෙනවා .

ප්‍ර මරන්න කියලා කියලා නැතිවුනාට ඒ සඳහා තල්ලු කරනවා මේ පොත්වල තියෙන අන්තර්ගතයෙන්?

උ අන්තර්ගතයෙන්. මේ පොත්වල හුඟක් තියෙන්නේ පලස්තීන නිදහස් සටන සම්බන්ධව පලස්තීන නිදහස් සටනට ලංකාවේ හිටපු ජනාධිපතිවරයා වර්තමාන අග්‍රාමාත්‍යවරයාත් පවා ඒ පලස්තීන නිදහස් විමුක්ති අරගලය වෙනුවෙන් පෙනී හිටපු නායකයෙන්. එතකොට ඒ වුනාට මේකේ කියන්නේ ඇවිල්ලා ඒ පලස්තීන කියන ඒ සටන මුල් කරගෙන එහේ ගිහිල්ලා සටන් කරන්න කියලා කියන්නේ නැහැ වක්‍රාකාරව මෙම පොත්පත්වල කියන්නේ ඇවිල්ලා ඒ කියන්නේ ඒකට උනන්දුවක් දක්වනවා ඇවිල්ලා වෙනත් භූමිතැන් වල මේ සටන් කරන්න කියන එක. එතකොට මේ පොත්වල තියෙන භයානකත්වය මේ ජමාතේ ඉස්ලාමික් සංවිධානය , ඉහ්වාන් මුස්ලිම් මත දරන සංවිධාන තමා මේ පොත් ලියලා තියෙන්නේ . මේ පොත් දැන් මං දන්න තරමට ඒ ගොල්ලන්ගේ පොත් අලෙවි සැල් වලපවා මේ පොත් නැහැ දැන් .

ප්‍ර ඇයි ඒ ?

උ මං හිතන්නේ මේවල තියෙන සමහර කරුණු මත ඒ ගොල්ලන් එක්කෝ පොත් විකුණලා කියලා කියන්නත් පුලුවන් එහෙම නැත්නම් මේ පොත් කොහෙන්හරි ඒ ගොල්ලන් අරන් දාලා තියෙන්නත් පුලුවන්. හැබැයි බොහොමයක් පොත් ඇවිල්ලා අයි. එස් ඛියන් කියන නම්බර්ස් තියෙන පොත් තමයි තියෙන්නේ හැබැයි මේ ඔක්කොම

FAIR COMMENT — BY JEZEEM —

පොත් ඇවිල්ලා දෙමළ භාෂාවෙන් තමයි එල වෙලා තියෙන්නේ එකක්වත් සිංහළ භාෂාවෙන් එල වෙලා නැහැ.

ප එහෙමනම් ඔබට පුලුවන්ද ඔබේ පසුබිම ගැන කෙටි හැඳින්වීමක් කරන්න මේ ගරු කොමසාරිස්වරුන්ට ?

උ පසුබිම කියලා කිව්වේ මට තේරුනේ නැහැ .

ප ඒ කියන්නේ ඔබ ඉගෙන ගත්තේ කොහේද ?

උ මම ඉගෙන ගත්තේ සිංහල බෞද්ධ පාසැලක මෝදර ශ්‍රී මේධා නන්ද විද්‍යාලය කියන සිංහල බෞද්ධ පාසැලක 1 වසරේ ඉදලා 11 වසර වෙනකල් අධ්‍යාපනය ලැබුවා . එහෙත් ඒ පාසැලේදි මම යම්කිසි අපහසුතාවයකට මම පත් වුන නිසා මම කොළඹ සහිරා විද්‍යාලයට ඇතුලත් වුනා.

ප අපහසුතාවය වුනා කිව්වාම මම හිතන්නේ වැදගත් වෙනවා ඔබ සිංහල බෞද්ධ පාසැලක ඉඳලා මුස්ලිම් පසුබිමක් තියෙන විද්‍යාලයකට යන්කට ඒක හේතුවුනා නම් මොකක්ද ඒ හේතුව කියලා. ?

උ ඒ පසුබිම ඒ හේතුව මුල් කරගෙන වැරදි අර්ථකථනයක් සිදු වෙනවා නම් ඒ පිළිබඳ මගෙන් ප්‍රශ්ණ කරන්නත් කියලා මම ඉල්ලා සිටිනවා ඒ කියන්නේ ඇවිල්ලා අපි මුස්ලිම් ලබ්ධිකයන් හැටියට සිකුරාදා දිනයට පල්ලි යනවා එතකොට ඒ පාසැලේදි සමහරක් ගුරුවරුන් ඇවිල්ලා ඒ සඳහා අපිට බාධා පමුණුවනවා එතකොට මේ බාධා පැමිණවීම අපි පාසැල් කාලයේදී සිද්ධ වෙන දේවල් ඒ වුනාට සහරාන්ලා වගේ අන්තවාදීන් ප්‍රයෝජනයට ගන්නෙත් මේ බාධා කිරීම් තමයි . ඒ හේතුව මත මට ඇතිවුන සිද්ධියත් මේකට උදාහරණයක් අරගෙන මම කතා කරන්නේ ඒක මගේ ද්වේශ සහගත ප්‍රකාශයක් නෙමෙයි සිද්ධිමය කරුණක් ගැන මම කියන්නේ . මගේ හිතට ඇතිවු අවංක කරුණ ගැන තමයි මෙතන කියන්නේ ඒවගේම එතන අපිත් එක්ක හිටපු සමහර මුස්ලිම් සහෝදරයන් පල්ලි ගියා. සමහරක් කට්ටිය ගියේ නැහැ ඒකට අර සමහර ගුරුවරු අර පක්ෂපාතිත්වය මත අපිට සමහරක් ඉස්කෝලේ අපිට දක්ෂතා ති බ්බත් අපිට ඒ තැනට එන්න බැරිවුනා යම්කිසි තනතුරු සහ ඉස්කෝලේ ශිෂ්‍ය නායක හෝ. ඉතින් මම තීරණය කලා

ප ඒකෙන් ඔබ අදහස් කරනවාද ඔබ දැන් එක වසර සිට එකලොහ වසර දක්වා මේ සිංහල බෞද්ධ පාසැලේ ඉගෙන ගත්තානේ ?

උ ඔව්.

ප එතකොට ඔබලාට ඒ අධ්‍යාපන පසුබිමේදි යම්යම් දේවල්වලට තේරීමේදි තනතුරු ලබා දීමේදි යම් යම් ආකාරයක අගතියක් ඔබලාට සිදුවුනා කියලා ඔබලා මුස්ලිම් ජන කොටඨාශයට අයත් වුන නිසා ?

උ එහෙම කියලා නැහැ ඒ කියන්නේ සමහරක් ගුරුවරුන්ව මම මේ අපහසුතාවයට හෝ අගෞරවයට පාත්‍ර කරන්නේ නැහැ මොකද ඒ

FAIR COMMENT — BY JEZEEM —

ගුරුවරුන් අපිට පොඩි වචනයක් හරි කියපු දීපු නිසා තමයි අපි අද මේ මෙතනට ඇවිල්ලා ජාතිකමය කරුණක් හරි හෙළි කරන්නේ. ඒ ගුරුවරුන් ගෙනුත් යම්කිසි මේකට කොටසක් හරි තියෙනවා තමන්ගේ නොදැනුවත් භාවය මත හෝ සමහරක් පරිසරාත්මක හේතු මත ඒ ගොල්ලන් ඇවිල්ලා අපි පල්ලි යන ඒක ගැන වැරදි අවබෝධයක් කරගෙන ඇති. සමහර කට්ටිය යන්නේ නැහැනේ සමහර කට්ටිය යනවා මේ ළමයා යනවා මේ ළමයා යන්නේ නැහැ එතකොට ඒ සම්බන්ධව ඒ ගොල්ලන් හිතනවා මෙයා ඇවිල්ලා ආගමට ලැදි එක්කෙනෙක් මෙයා ඒ කාලේ කොහොමද අන්තවාදි දෙයක් තිබ්බද කියලත් මං දන්නේ නැහැ ගුරුවරුන්ගේ සිත්වල .මේ ළමයා මේ තැනට අපි ඉදිරියට ගන්න නරකයි කියන හේතුව මත කියන එක දෝ අපි දන්නේ නැහැ චේතාන්විත හේතුව ඒ වුනාට ඉතින් ඒ වගේ සිද්ධියක් වුන නිසා මං පොඩි කලකිරිමක් මට ඇතිවුනා .

ප්‍ර ඒ අනුවද ඔබ සහිරා විද්‍යාලයට ගියේ ?

උ ඔව් ඊට පස්සේ මම තීරණය කලා කොළඹ සහිරා විද්‍යාලය තෝරාගතතේ මම අධ්‍යාපනය අතිනුත් පොඩි දියුණුවක් ලබන්න ඕනේ කියන මත ඒ පාසැලට මම ඇතුලත් වුනා. ඒ පාසැලටත් බොහොම අමාරුවෙන් තමයි ඇතුලත් වුනේ එතකොට මම 11 වසරේ ඉන්න ශිෂ්‍යයෙක් වශයෙන් මම 10 වෙනි වසරට ඒ ගොල්ලන් එතෙනදි ඇතුලත් කර ගත්තා. එතන ඉඳලා මමඅපො.ස සාමාන්‍ය පෙළ එහේ හදාරලා සහිරා විද්‍යාලයේ උසස් පෙළ සහිරා විද්‍යාලයේ හැදෑරුවා . මම අවුරුදු කෙටි කාලයක් තුල තමයි මම සහරා විදුහලට ඇතුලත් වුනේ එහිදි මම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක තනතුර සහ සමිති සමාගම් මම තනතුරු රාශියක් හෙඔවුවා . ඒ වගේම මම සමිති රාශියක් එහිදී පිහිටෙව්වා . එතනදි තමයි මම මුස්ලිම් පරිසරයක් හඳුනා ගත්තේ . මම ඉගෙන ගත්තු පාසැලේදි මම සිංහල බෞද්ධ පරිසරය එහිදි ගාථාව ඔක්කෝම සාමාන්‍ය මට්ටමකදි අපිට දැනුමක් තිබෙනවා . බෞද්ධ ආගම තමයි මම විභාගෙටත් ලිව්වේ ඒ පාසැලේදි . එහේ ඉස්ලාම් විෂයත් ඉගැන්නුවා. මේ පාසැලේදිත් සාමාන්‍ය අත්දැකීමත් මට ලැබුනා මේ තැනට මට එන්න එතනින් පස්සේ මම උසස් පෙළ හදාරලා කැළණිය විශ්ව විද්‍යාලයේ ජන හා සන්නිවේදන කියන ජනමාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව හදාරලා ජනමාධ්‍ය ක්ෂේත්‍රය සහිරා විද්‍යාලයේ ඉදගෙන ම සහිරා විද්‍යාලයේ තියෙන තොරතුරු ජනමාධ්‍ය වලට වාර්තා කරණය කරලා ඒහරහා ජනමාධ්‍ය වෘත්තියටත් මම ඇතුලත් වුනා. ඒ වෘත්තිය කරන්න අපේ ගෙවල් වලතිබුණු අකමැත්ත මත අපේ තාත්තගේ ව්‍යාපාර කටයුතු වලට මම සම්බන්ධ වුනා ජනාමාධ්‍ය වෘත්තිය කියන්නේ භයානක වෘත්තියක් කියන දේ ගෙදර කට්ටිය

FAIR COMMENT BY JEZEEM

තේරුම් ගත්ත නිසා මම එතනින් ගෙදර කට්ටිය වෙනුවෙන් ඒක මම සමගාමී ලෙස කරගෙන ගියා.

ප්‍ර ඔබ දැනුත් ඒ ජනමාධ්‍යකරණයේ නියැලිලා ඉන්නවාද ?

උ ඒ කියන්නේ ඇවිල්ලා සමහරක් ජනමාධ්‍ය තොරතුරු ඒ කියන්නේ රහසිගත තොරතුරු වාර්තා කරණ සම්බන්ධ දේවල් සමහර ජනමාධ්‍ය ආයතනවලට එවැනි උදව් කරන විදියට ඒ විදියට මිත්‍රත්වයක් ගොඩනගන්න නම් ඒ කියන්නේ වෘත්තිමය වශයෙන් නොවේ මම ලබා ගත් දැනුමට අනුව මම ඒ කටයුතු කරගෙන යනවා . ඒ වගේම මුස්ලිම් කුරල් කියලා එවකදි කොටි සංවිධානය තිබුණු අවස්ථාවකදී අපි පත්තරයක් මුද්‍රණයකරලා ඒක එලිදක්වාගෙන කටයුතු කරලා කරගෙන ගියා ඒක ඒ කාලයේදි අපේ කාර්යාලයට කොටි සංවිධානයේ පුද්ගලයෙක් ඇවිල්ලා තර්ජන පවා අපිට කරලා තියෙනවා .ඔළුවට තුවක්කුව තියලා මේ පත්තරය නවත්වන්න කියනවා ඒ වගේ තර්ජනාත්මක දේවල් අපේ ජීවිතයේදි අපි මුහුණ දීලා තියෙනවා පාසැල් සමයේදි මගේ මිත්‍රයෙක් වෙච්ච තව්සි කියන පුද්ගලයා තමයි අයි. එස්.අයි .එස්. සංවිධානයට ගිහිල්ලා සම්බන්ධ වුනේ.

ප්‍ර තව්සි සහිරා විද්‍යාලයේද ?

උ සහිරා විද්‍යාලයේ.

ප්‍ර ඔබ විනෝදාංශ විදියට මොනවද කරන්නේ ?

උ විනෝදාංශ විදියට මම අපේ ගම මෝදර එහේ මම ක්‍රිකට් සංවිධානය පිහිටුවලා එහේ තියෙන අවුරුදු උත්සව වලට සම්බන්ධ වෙලා සමිති සමාගම් වැඩවලත් ඒ කියන්නේ මම ගොඩක් සමාජ වැඩ වලට තමයි මම මගේ විනෝදාංශ වශයෙන් කලේ. පොඩිකාලෙදි මුද්දර එකතු කිරීම , පොත් එක් රැස් කිරීම වාගේ දේවල් කරාට සමාජ කටයුතු වලට තමයි මගේ තිබ්බේ විනෝදාංශ යක් වශයෙන්.

ප්‍ර ඔබ ඉවුම් පිහුම් වලටත් කැමතියි නේද?

උ ඔව්. මම ඒ කියන්නේ සුප වේදි ලලිත් සිල්වා මහතා එයත් ජනමාධ්‍ය වේදියෙක් එයාගේ ආයතනයේ පාඨමාලාවක් හැදෑරුවා විනෝදාංශයක් වශයෙන්.

ප්‍ර පරිසණක පාඨමාලාවක් හැදෑරුවා ?

උ පරිසණක පාඨමාලා ඒ වගේ දේවල් විනෝදාංශ වශයෙන් අධ්‍යාපනය සම්බන්ධයෙන් කටයුතු කිරීමකුත් මගේ ල ඟ තිබ්බා.

ප්‍ර ඒ කියන්නේ ඔබට ජීවිතයේ විවිධ පැතිකඩවල් සම්බන්ධයෙන් අත්දැකීම් තිබෙනවා නේද ?

උ අත්දැකීම් ලබා ගන්න මට උවමානවක් තිබ්බා.

ප්‍ර ඒ නිසාද ඔබ දේශපාලනයට පිවිසියේ ?

උ ඔව් දේශපාලනයට මම සම්බන්ධ වෙන්නේ ඇවිල්ලා අපේ සහිරා විද්‍යාලයේදි මුජීබර් රහුමාන් වර්තමානයේ හිටපු පාර්ලිමේනතු මන්ත්‍රී

FAIR COMMENT BY JEZEEM

මුජිබර් රහුමාන් එවන දී ඇවිල්ලා මුස්ලිම් එක්සත් විමුක්ති පෙරමුණ කියලා දේශපාලන පක්ෂයක් පිහිටුවා ගෙන තිබුනා.

ප ඒ මොන කාලයේද ?

උ ඒක මම සහිරා විද්‍යාලයේ 97/98 වකවානුවේද කියලා හිතනවා බොහෝ දුරට .

ප එතකොටත් ඔබ පාසැල් යනවා ?

උ පාසැල් යනවා මම 2000 නැත්නම් 2001 න් උසස් පෙලින් පස්සේ තමයි පාසැලෙන් මම සමු ගත්තේ. එතකොට මුජබර් රහුමාන් කියන ඒ ප්‍රගතිශිලි මතවාද වලට අපේ හිත් ආකර්ශණය වෙන්න ප්‍රධානතම හේතුව තිබ්බේ මරදාන සිකුරාදා දේව මෙහෙයෙන් පසු යම් යම් උද්ඝෝෂන පැවැත්වෙනවා පලස්තීන සම්බන්ධව ඒ වගේම ලංකාවේ මොනවා හරි දේශපාලන කරුණු කාරණා සම්බන්ධව එතකොට ඒත් දේශපාලනය පිළිබඳ මට පොඩි ආකර්ෂණයක් තිබ්බා ඒ ආකරෂණය මත හා අපේ සහිරා විද්‍යාලය ඉදිරිපිට දැන්වර්තමාන මරදාන පොලිසිය ඉස්සරහපිට ගියාම පේනවා එතන ගේට්ටුව දෙපැත්ත කඩ කාමර ඉදි කරන්න ගියා ඒ කඩ කාමර ඉදි කර ගන්න යනකොට මුජිබර් රහුමාන් කියන ඒ දේශපාලනඥයා ඒකට නැඟී ඉඳලා ඒවා විනාශ කරා ඒවා හදන්න දෙන්න බැහැ කියලා එතකොට මම ශිෂ්‍ය නායකයෙක් වශයෙන් මමත් ඒකට සම්බන්ධ වෙලා ඒකට විරෝධය පෑවා මේ වගේ දේවල් අපේ ඉස්කෝලේ තියන මුතුන් මිත්තන් අපිට දායාද කරපු ඉඩම් වලින් වර්තමාන පාලක මණ්ඩලය ඒ ගොල්ලන්ට කඩ බෙදා ගන්න ඉස්කෝල භූමිය පාවිච්චි කිරීමට මගේ විරෝධයත් මම ශිෂ්‍ය නායක නිල ඇඳුම පිටින් මගේ විරෝධයත් එතන්දි පෑවා. එතකොට මගේ ප්‍රධාන ශිෂ්‍ය නායක මාව ශිෂ්‍ය නායක කමෙන් පවා අහෝසි කරන්න පෙළඹුනා නමුත් මගේ සහායක කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායකයන්ගේ පෙළඹීවිම මත ඒ ගොල්ලන් ඒ අදහස ඒක අතහැර දැමුවා' මරදාන පොලිසියෙන් පවා ඒ කඩ කෑල්ල ඉදි කිරීමට විරෝධයට යම්කිසි රුකුලක් වක්‍රාකාරයෙන් ලබාදුන්නා හේතුව කොටි සංවිධාන ප්‍රශ්ණ මත මරදාන පොලිසියට ඒක අනතුරක් වෙන්නට ඉඩ තිබෙන නිසා ඉතින් ඒ වගේ කරුණු කාරණා මත මුජිබර් රහුමාන් කියන දේශපාලනඥයා හරහා දේශපාලනයට සම්බන්ධ වෙනවා.

ප එතකොට ඒ ඔය මොන වකවානුවේද?

උ 1997 / 1998 වකවානුවේ සිට මැතකදී වෙනකම් මම මුජිබර් රහුමාන් ගේ දේශපාලනවලට සම්බන්ධ වෙලා හිටියා . පසු කාලීනවලදී මම වෙනත් දේශපාලන ගමන් මාර්ගයක මම ගමන් කළා.

ප මොනවද ඒ පක්ෂ ?

උ ඒ කියන්නේ මුස්ලිම් එක්සත් විමුක්ති පෙරමුණ කියන දේශපාලන පක්ෂය පසුකාලීනවලදී ඒක තමයි ලංකාවේ ප්‍රථම වතාවට බිහි වෙච්ච

FAIR COMMENT BY JEZEEM

මුස්ලිම් දේශපාලන පක්ෂය කාතන්කුඩි එම්. අයි. මොහිදීන් මහතා විසින් ලංකාවේ ඇති කරපු මුස්ලිම් කොන්ග්‍රස් එකටත් කලින් ඇතිකරපු මුස්ලිම් දේශපාලනය පක්ෂය ඉතින් පසුකාලයේදී මුජිබර් රහුමාන් සහෝදරයා ඇවිල්ලා ඇමරිකාවට යනවා ඇමරිකාවට ගියායින් පස්සේ ඒ දේශපාලන පක්ෂය නිශ්ක්‍රීය මට්ටමක පැවතෙනවා. ඒ වකවානුවේදි නැගෙනහිර පළාතේ අෂරොෆ් අමාත්‍යවරයා සමඟ දේශපාලනය කරපු යම් කණ්ඩායම් අපිත් එක්ක සම්බන්ධ වෙලා මාත් සමඟ මෙතන පැමිණ සිටින කාදර් සහෝදරයා සමඟත් සම්බන්ධ වෙලා අපි දේශපාලනයට ඒ පක්ෂයේ නම වෙනස් කරලා එක්සත් UNP යුනයිටඩ් මුස්ලිම් පීපල්ස් එලයින්ස් කියලා කොඩිය ලකුණ යටතේ ඒකේ අශ්වයා ලකුණ අයින් කරලා ඒ දේශපාලනයේ ගමනක් යනවා . පසුකාලයේදි මුජිබර් රහුමාන් ලංකාවට පැමිණෙනවා පැමිණිලා ඒ දේශපාලන පක්ෂය සම්බන්ධ කරන්න යනකොට අපිත් එක්ක හිටපු නැගෙනහිර කණ්ඩායම සහ අපිත් එක්ක හිටපු ලේකම්වරයා අතර පොඩි මත ගැටුමක් මත ඒ පක්ෂය dispute එකට මැතිවරණ කොමසාරිස් කාර්යාලයට යනවා. එතකොට කාටත් පක්ෂයට අයිතිවාසිකම් කියන්න බැහැ උසාවිය හරහා තමයි ඒකට අයිතිවාසිකම් කියන්න වෙන්නේ .ඉතින් ඊට පස්සේ ඒ පක්ෂයේ හිටපු සමහර නිළධාරී මණ්ඩලය එකතු වෙලා ඒ පක්ෂය ලංකාවේ දේශපාලන පක්ෂ විකුණනවද කියන එක ප්‍රශ්නයක් තියෙනවා හැබැයි එවැනි දේවල් සිද්ධ වුනා . ඒ කියන්නේ ඒක නිල වශයෙන් සිද්ධ වෙන්න බැහැ අතයට ගනුදෙණු මත එවැනි දේවල් සිද්ධ වෙලා තියෙනවා ලංකාවේ දේශපාලන ඉතිහාසයේ.

ප ඒ පිළිබඳව ඔබ පෞද්ගලිකව දන්නවාද?

උ ඒකට කරුණු සාක්ෂි සහිතව දන්නේ නැතිවුනට එවැනි දෙයක් සිද්ධ වුනා කියන දේ අපි දන්නවා ඒ සම්බන්ධව සි. අයි. ඩී . එකේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අපි පැමිණිල්ලක් පවා දැම්මා. ඒ පැමිණිල්ලේදි හෙළිවූ කරුණු මත ඒ ගොල්ලන් කීව මේක සිවිල් නඩුවක් මේක සිවිල් ආරවුලක් නිසා මේකේ ව්‍යවස්ථාමය වෙනසක් සිදු වෙනකොට සහ නිළධාරී මණ්ඩලයේ වෙනසක් සිදු වෙනකොට මෙතන යම්කිසි නීතියට පටහැනි විදියට කරලා තියෙනවා කියන එක ඒ හේතු මට උසාවි යන්න කියල කිව්වා

ප ඒකද ඔබලා අධිකරණයට ගියේ ?

උ අපි අධිකරණයට ගියා අපි අධිකරණයට ගියාට ඒ සම්බන්ධව නඩු කියන්න අධිකරණයට විශාල මුදලක් යන නිසා අපි කෙසේ හෝ ඒවා එක් රැස්කරගෙන ඒ නඩු කටයුතු කරගෙන ගියාට පසුකාලයේදී ඒ නඩු කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා අපිට කරගෙන යන්න බැරිවුන නිසා ඒ නඩුවට කුමක් සිද්ද වුනාද කියන එකත් අපි අද දන්නේ නැහැ

FAIR COMMENT
BY JEZEEM

මොකක්ද සිද්ධ වුනේ කියන එක. වර්තමානයේදි එම දේශපාලන පක්ෂයට අයිතිවාසිකම් කියන්නේ ජනතා විමුක්ති පෙරමුණේ විජිත හේරත් මහත්මයා තමයි ඒ පක්ෂයට දැනට ඒ පක්ෂයේ ලකුණ කුසලානය. ඒක තමයි මුස්ලිම් ජනතාවගේ මුල් දේශපාලන උප්පැන්න සහතිකෙන් බිහිවෙච්ච පක්ෂයට සිද්ධවුන දේ.

ප්‍ර දැන් ඔය පැහැදිලි කිරීමේදී ඔබ සඳහන් කරන්නට යෙදුනා කාත්තන්කුඩිය කියන නම්?

උ ඔව්

ප්‍ර මුස්ලිම් ජන කොට්ඨාශය ගැන ගත්තාම ඔය කාත්තන්කුඩිය කියනනම් නැත්නම් ඒ ප්‍රදේශයේ යම් වැදගත් කමක් තියෙනවාද ?

උ දෙමළ භාෂාවෙන් සමහරක් කට්ටිය කියනවා එක එක කාත්තනහර් කියලා කියනවා . ඒවල යම්කිසි ඓතිහාසිකමය කරුණු එහේ ඉන්න බෂීර් ශේකුදාදු වැනි දේශපාලනඥ නායකයන් පවසලා තියෙන දේවල් මම අහලා තියෙනවා. හැබැයි කාත්තන්කුඩිය කියන ප්‍රදේශය එල්. ටී. ටී.ඊ. සංවිධානය විසින් එහේ මුස්ලිම් ජනතාව දේවස්ථානයේදී පුජාව නිරතවන අවස්ථාවේදී පිටිපස්සෙන් ඇවිල්ලා තුවක්කුවෙන් සමූලඝාතනයක් කරලා යනවා. එතකොට මම වීඩියෝ දර්ශන වලින් දැකලා තියෙනවා මම එතකොට මට මතක තියන විදියට අපේ තාත්තා ගෙදරට පත්තරයක් අරගෙන ආවා. Weekend කියලා ඒ Weekend කියන පත්තරයේ සමූලඝාතනය ගැන සම්පූර්ණ සඳහන් වෙලා තිබ්බා. පසු කාලිනයේදි මම මේ සම්බන්ධව රූප රාමු යු. ටියුබ් ආදිය වෙනත් මාධ්‍ය වලින් මම බලනකොට මම එහේ ඉන්න මිනිසුන් දිහා බැලුවා . එහේ ඉන්න මිනිසුන් දාලා තියෙන තොප්පිය දිහා බැලුවා. ඒ ගොල්ලන්ගේ ඇදුම දිහා බැලුවා. ඒ ගොල්ලන් දාලා තියෙන සරම දිහා බැලුවා . ඒ ඔක්කෝම අපේ පාරම්පරික අපේ මුතුමිත්තන්ගේ ඇදුම් වස්ත්‍ර තමයි තිබ්බේ.

ප්‍ර මේ පහර කෑමට ලක්වූ පුද්ගලයෝ ගැනයි ඔබ මේ කියන්නේ ?

උ එල්. ටී. ටී. ඊ. සංවිධානයේදී ඒ පහර කෑමට ලක්වූවන් සහ ඒ ගොල්ලන්ගේ ආදාහනයට සහභාගි වූ ඒ විශාල ජන සමූහයකගේ පින්තූර දිහා බලන කොට මට තේරුනේ ඇවිල්ලා එතන කිසිම අන්තවාදයක් තිබ්බේ නැහැ . ඒ මිනිස්සුන්ගේ මුහුණු වල ඒ මිනිසුන්ගේ තියෙන රැවුල් වල එවැනි අන්තවාද ලක්ෂණ තිබ්බේ නැහැ. ඒ මිනිස්සු කොටින්ම කියනවා නම් එල්. ටී . ටී.ඊ සංවිධානයට විරුද්ධව කටයුතු කලෙත් නැහැ. එතකොට දැන් සහරාන්ලා වගේ පුද්ගලයන් ඇවිල්ලා අහිංසක කතෝලික ජනතාවන් මරන්න පෙළඹී ඉන්න කොට සහරාන් ඒ කාලේ එතන එයාගේ වයස කීයද කියන්න මම දන්නේ නැහැ එතකොට ඒ කාලේ එවැනි පුද්ගලයන් සහ එවැනි මතධාරින් හිටියාද කියන්න ඒක අපි දන්නේ නැහැ ඒ වුනාට ඒකාල වකවානුවල හිටපු

FAIR COMMENT BY JEZEEM

මිනිස්සු දිහා බලනකොට ඒ මිනිස්සු අන්තවාදී නැති මිනිස්සු කියන එක තේරෙනවා . හේතුව ඇවිල්ලා ඒ මිනිස්සු කොටි සංවිධානයට විරුද්ධව ගල්කැටයක් ඔසවලා හරි අපි සටන් කරන්න ඕනේ අපේ අයියා මරලා දැම්මා අපිව මල්ලිව මරලා දැම්මා කියන වෛරයක් ඒ මිනිසුන්ගේ සිත්වල තිබ් බෙ නැහැ. ඒ වුනාට යම් යම් පුද්ගලයන් තරුණයන් ඒඅවස්ථාවේදී හමුදාවට සම්බන්ධ වෙලා යම්කිසි එල්. ටී. ටී.ඊ. විරෝධී තියන පෙරා මිල්ටර් ගෘපප් වලට සම්බන්ධ වෙලා වැඩ කරලා තියෙනවා කියන එක අපි දැකලා තියෙනවා මාධ්‍ය වලින් අහලා තියෙනවා අපි බලලා තියෙනවා .

ප්‍ර අපි ඔබට රූප රාමුවක් පෙන්නුවොත් ඔබ දැන් කිව්ව කරුණට අදාලව ඒ රූප රාමුව ඔබ කලින් දැකලා තියෙනවාද කියලා මේ ගරු කොමිෂන් සභාවට කියන්න පුලුවන්ද?

උ පුලුවන්.

ප්‍ර මේ තිරයේ දැක්වෙන මේ රූප රාමුව ඔබ කලින් දැකලා තියෙනවාද ?

උ ඔව් සෑහෙන අවස්ථාවල දැකලා තියෙනවා . ඒ වගේම කාත්තන්කුඩි සුහදාක්කල් තිනම් කියලා තියනවා ඒ කියන්නේ යම්කිසි මුස්ලිම්වරයෙක් දැන් සහරාන්ලා කියන සුහදාකල් නෙමේ සුහදාකල් කියන්නේ ඇවිල්ලා ජිහාඩ් අරමුණකින් නැත්නම් මොකක්හරි අරමුණකින් තමන්ගේ ජීවිතය තමන් නොසිතන අවස්ථාවක තමන් නොසිතන විදියට මැරෙන මිනිසුන්ට කියනවා ෂහීඩ් කියලා . සහරාන්ලත් කියන්නේ ඔය සහීඩ් කියන කථාවට අර්ථකතනය වැරදි විදියට දීලා. එතකොට මේ මිනිසුන්ට කාත්තන්කුඩියේ තියෙනවා මේ මිනිසුන්ගේ සොහොනක් ඒකට කියනවා සුහදාකල් පුංගා කියලා පුංගා කියනේන් වත්ත කියන අර්ථය තමා එන්නේ එතකොට ඒක පවා වර්තමානයේදී ඒ සොහොන ඉඳලා අඩි ගාණක් උසට ඒ ගොල්ලන්ගේ තියෙන සමරු එලක පවා ගලවලා තියෙනවා .

ප්‍ර කව්ද ඒ ගලවලා තියෙන්නේ ?

ප්‍ර මම හිතන්නේ එහේ පසු කාලනයේදී බිහි වෙච්ච අන්තවාදීන් ඔබ දන්නේ නැහැනේ ?

උ මම දන්නේ නැහැ .

ප්‍ර නමුත් ගලවලා තියෙන බව ඔබ දන්නවා ?

උ දන්නවා. මම ගියා එතෙන්ට.

ප්‍ර ස්වාමීනි මේ ඡායාරූපය ලකුණු කිරීම සඳහා අවසර ඉල්ලා සිටිනවා . මීට අදාලව දැනටමත් සාක්ෂි මෙහෙයවලා තියෙනවා

Colombo telegraph පුවත්පතෙහි 2017/08/02 වෙනි දින ප්‍රකාශයට පත් වී ඇති මෙම පුවත්පත් නිවේදනය I.A.K.R 1 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර ඉල්ලා සිටිනවා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර රහුමාන් මහත්මයා ඔබ කිව්වා ඔබ දැක්කයි කියල ඔවුන්ගේ සමරු එලක පවා ගලවලා තියෙනවා?

උ ඔව්.

ප්‍ර කොහේදීද ඔබ දැක්කේ? ඔබ එතෙන්ට ගියා කිව්වානේ ?

උ ඔව්.

ඡායාරූපයක් පෙන්වයි . මෙතන තියෙන්නේ තමයි සමරුඵලක . මෙතන ඒ මිනිසුන්ගේ සමරුඵලක නැහැ . ඒ මිනිස්සු කව්ද , කව්ද නැතිවුනේ කියන එක නැහැ. ඉතිහාසය නැති කිරීම තමයි අන්තවාදයේ මූලික අරමුණ මොකද ඉතිහාසය නැති කලොත් ඒගොල්ලන්ට ඕනේ දෙයක් ඉතිහාසය කියන දේ තහවුරු කරන්න පුලුවන්. එතකොට මෙතන කරලා තියෙන්නෙත් ඔය වැඩේම තමයි. එතකොට එතන තව අරමුණකුත් ඒ ගොල්ලන්ට තියෙන්න ඕනේ මරණය කියන දේ තුව්වයි. මරණය කියන දේ අපිට තුව්වයි . මරණය කියන දේ සාමාන්‍යයෙන් මේ බුදු හාමුදුරුවොත් කියලා තියෙනවා ජීවිතය අනියතං මරණය නියතං කියලා ඒ වුනාට මෙතන කියන දේ ඕක නෙමේ.අපේ අල්ලා දෙවියන් වහන්සේත් කියලා තියෙනවා නබි තුමා හරහා මරණය කියන දේ සාමාන්‍ය සිදුවීමක්. ඒ වුනාට මේ ගොල්ලන්ගේ මරණය කියන දේ සාමාන්‍ය සිදුවීම කියනදේ සාමාන්‍යයයි අපේ දෙමව්පියෙක් ගේ මරණයක් හරි දෙයක් සිදුවුනොත් අපි එක්කෝ සුසාන භූමි වල අපි එයාගේ උපත විපත ලකුණු කරනවා. මෙතනදී ඒ වගේ ලකුණු කිරීමක් සිද්ධ කරන්නේ නැහැ.

ප්‍ර ඔබ කියන්නේ එහෙම සිද්ධ කරලා තිබුන ඒවා ඉවත් කරලා තියෙනවා දැන්?

උ ඔව් ඒක ඒ කාලේ සාමාන්‍යයෙන් තිබ්බා .තිබ්බ දේවල් මත ඒ ගොල්ලන් ඉවත් කරලා තියෙනවා.

ප්‍ර කොහේද මේ ස්ථානය හරියටම කියන්න පුලුවන්ද ?

උ මම මේ පල්ලියට හරියටම මගේ දෙවනි විවාහයේදි මම මගේ පලවෙනි විවාහයේ මොකක්ද සිද්ධ වුනේ කියලා කරුණු කාරණා දක්වලා තියෙනවා .

ප්‍ර ඔබේ පළමුවන භාර්යාව මියගියානේ දරුවා දෙන්නා ලැබුනට පස්සේ නේද ?

උ ඔව් ඔව්.

ප්‍ර එතකොට දෙවනි විවාහය ඔබේ නැනා සමඟ නේද සිද්ධ වුනේ ?

උ නැනා කියන්නේ නැතිවුන මගේ භාර්යාවගේ තාත්තගේ නංගිගේ දුව සමඟ මම අවුරුදු තුනකට පස්සේ එතුමිය ගෙත් ස්වාමිපුරුෂයා හාට ඇටැක් එකකින් නැතිවුනා. එයාට ළමයි නැති නිසා මම එයා විවාහ කර ගත්තා .

ප්‍ර එයා විවාහ කරගත්තා.?

FAIR COMMENT BY JEZEEM

උ ඔව්.

ප එතකොට දෙවනි විවාහයෙන් පස්සේද මෙතෙන්ට ගියේ ?

උ ඔව් මම මෙතෙන්ට ගියා 2018 අවුරුද්දේ මෑතකදී.

ප මොකක්ද දන්නේ නැහැ එතෙන්ට කියන නම ?

උ මම හිතන්නේ මීරා මක්කම් මොහිදීන් පල්ලියද හරියට නම මතක නැහැ.

ප කාත්තන්කුඩියෙද තියෙන්නේ ?

උ කාත්තන්කුඩියේ.

ප කාත්තන්කුඩියේ කොයි හරියේ වගේද දන්නේ නැහැනේද ?

උ මට හිතෙන්නේ මහපාරෙන් යනකොට දකුණු අත පැත්තේ ඇතුල් පාරකට යන්න ඕනේ.

ප නගරයේමයි?

උ නගරයේම ඇතුල් පාරකට යන්න ඕනේ.

ප (පල්ලියක් පෙන්වයි)
ඔව් ඒ කියන්නේ ඒ පල්ලියේ තමයි අර පේන්නේ දුරට පේන්නේ පල්ලියේ තමයි ඔවුන් සමුලඝාතනය වුනේ ?

උ ඔව්. ඒ ලකුණු පවා අදටත් තියෙනවා. ඒක පුදුමයක් කියන්නේ .

ප මොකක්ද ලකුණු පවා තිබෙනවා කියන්නේ ඒකෙන් අදහස් කරන්නේ ?

උ බිත්ති වල පවා තියෙන අර වෙඩි ප්‍රහාර ඒවා ටික තවම තියෙනවා වර්තමානයේදි දැනට අර සහරාන්ගේ බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ කොච්චිකඩේ දේවස්ථානයේ ඒවගේ ඉතිහාසමය කරුණු එක් රැස් කරලා තියෙනවා වගේ එහෙත් එහි තියෙනවා . ඒක වගේ පුදුමයට කරුණක් ඒක තියෙන එක ඒ ගොල්ලන් අන්තවාදීන් ඇවිල්ලා ඒක යුස් කරන්නේනැහැ මම හිතන්නේ ඒ ක දැන් යූස් කරන්න පුලුවන් තත්වයක් තිබුනොත් ඒ ගොල්ලන් යූස් කරනවා . ඒ කියන්නේ දෙමළ ජනතාවට විරුද්ධව ඒ ගොල්ලන්ගේ ලංකාව තුල අන්තවාදයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ.මුස්ලිම් ජනතාව අතර මුස්ලිම් ජනතාව අතර මුස්ලිම් ජනතාව මතවාදය ඇවිල්ලා ක්‍රියාත්මක වෙන්නේ සිංහල ජනතාවට විරුද්ධව ඒක පුදුමයට කරුණක් තමයි කතෝලිකයන් දෙසට ඇයි හැරුනේ කියන එක.ඒකට හේතුව වෙන්න පුළුවන් මෙතන තියෙනවා සිලුවයුත්තම්ගල් කියලා කුරුස යුද්ධය කියලා පොතක් . එතකොට මේකේ කියලා තියෙනවා ලෝකයේ සිද්ධ වුන කුරුස යුද්ධ ගැන මේ පොත එලිදක්වලා තියෙන්නේ ජමා තුල් අන්සාරේ සුන්නත් මොහමදියා කියන සංවිධානය.

ප නම මොකක්ද ඒකේ ?

උ සිලුවයුත්තම්ගල් කියලා කුරුස යුද්ධයන් . බහු වචනයක් අර්ථ කථනය කරලා තමයි ඒක ලියලා තියෙන්නේ.

ප කවිද ඒක ලියලා තියෙන්නේ ?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ ලියලා තියෙන්නේ ඇවිල්ලා සමූන් එස්. රමන්ලාල් සලෆි . සලෆි කියන්නේ මතවාදයක් අතර තියෙන තව මතවාදයක් ජාමෙල් නලිමි කියලා ඉගෙන ගත්ත කට්ටිය තමගේ නමට නලිමි කියන නම දානවා වගේ මේ ගොල්ලන් සලෆි කියන නම දාගන්නවා.

ප ඔබට පුලුවන් කමක් තියෙනවාද ඒ පොත/

උ මම ගරු කොමිෂන් සභාවට කියනවා මේ පොත්වල තියෙන සම්පූර්ණ පිටපත් සමහර පොත් කොමිෂන් සභාවට ලැබිලා ඇති එහෙම ලැබුන් නැති පොත් පත් තියෙනවා නම් ඒකේ ඡායා පිටපත් අරගෙන මට පසු කාලිනවලදි දිනයක් සඳහන් කර මට නැවත බාර දුන්නොත් හොඳයි කියලා හිතෙනවා මොකද මේක සුරක්ෂිතව මගේ ලඟ තිබුනු නිසා තමයි .

ප ඔබට ගේන්න පුලුවන් වුනේ ?

උ ඔව්. මේක අපේ තාත්තා

ප ඔය ඔබගාව තියෙන පොත ලකුණු කරාට කමක් නැද්ද ඔය සඳහන්කරපු පොත අපි ලඟ නැහැ. කමක් නැද්ද ඒ මුල් පිටපත මෙ ලකුණු කරන හැම එකකටම සීල් එකක් ගහනවා කමක් නැද්ද ?

උ පුලුවන්.

ප දැන් ඔබ සඳහන් කෙරුවානේ අර කාත්තන්කුඩියේ මුස්ලිම් පුද්ගලයින් බොහොමයක් දැන් අපි පුළුල් තිරයේ දැක්ක ඒ පල්ලිය ඇතුලේදි එල්. ටි. ටි. ඊ හිතවාදීන් විසින් ඝාතනය කරලා තිබුනාය කියලා ?ඊට පස්සේනේ ඔබ කිව්වේ දැන් ඒ ගොල්ලන් වළලපු තැන් වල ඒ සිහිවටන නැහැ කියලා?

උ ඔව්.

ප ඒ වගේම ඔබ කිව්වා ඔබේ වැඩිහිටියෝ නැහැ කියලා එල්. ටි. ටි.ඊ. හිතවාදීන් විසින් ඝාතනය කරලා තිබුනාය කියලා. ඊට පස්සෙනේ ඔබ කිව්වේ ඒ ගොල්ලන් වලලපු තැන් වල ඒ සිහිවටන නැහැ කියලා ?

උ ඔව්.

ප ඒ වගෙම ඔබ කිව්වා එබේ වැඩිහිටියෝ මියගියාමත් ඉපදුනේ කවදාද මියගියේ කවදාද කියලා සටහනක් තියෙනවා කියලා ඒ කියන්නේ ටු ස්ටෝන් එකක් සිහිවටන ගලක් ?

උ ඔව්.

ප සාමාන්‍යයෙන් මුස්ලිම් ජන කොට්ඨාශයේ අය මියගියාම ඒ වගේ සිහිවටන ඵලක තැන්පත් කරනවාද ?

උ සාමාන්‍යයෙන් මියගිය අවස්තාවේදිම මේ ටෙම්පරි සිහිවටන ඵලකයක් දානවා . තමන්ට කැමති නම් හොඳ සිහිවටන ඵලයක් දාන්න පුලුවන් ඒවගේම තමන් මේ ඒ සුසාන භූමියේ අදාල කොටස හැමදාම ප්‍රයෝජනයට අරගෙන ඇවිල්ලා අවුරුද්ද දවසට ඇවිල්ලා ඒක පිළිබඳව සම්බන්ධයක් ඇති කරගෙන තිබ්බා නම් ඒ පල්ලියෙන් ඒ

FAIR COMMENT BY JEZEEM

අදාල තැනදී වෙන කෙනෙක්ව වළලන්නේ නැහැ. උදාහරණයක් වශයෙන් මගේ භාර්යාව දැන් මියගිහිල්ලා දැන් 2014 තාම වෙනකම් මගේ ළමයින්ට මම පෙන්වලා නැහැ ඒ වුනාට අදාල තැන ළමයින් වෙනුවෙන් අනාගතයේදි පෙන්වන්න සුරක්ෂිතව මම කුප්පියාවත්ත දේවස්ථානයේදී මම ඒක සුරක්ෂිතව කරගෙන එනවා. ඒ වගේම අපේ ලංකාවේ මියගිය ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රස් නායක අශ්‍රොෆ් මහතාගේ සිහිවටන ඵලකය පමණක් ජාවත්ත පල්ලියේ තියෙනවා. ඒ වුනාට ජාවත්ත පල්ලියේ පවා සිහිවටන ඵලක තියන්න දෙන්නේ නැහැ.

ප දැනුත් ඔබ කියන්නේ සාමාන්‍යයෙන් මුස්ලිම් ජනතාව විසින් මේ අනිත් බෞද්ධ ක්‍රිස්තියානි , හින්දු ඒ ගොල්ලන් වගේම සිහිවටන ඵලක ඔබලාත් තැන්පත් කරනවා කියලා ඒ අදාල භූමදානය කරන ලද ස්ථානයේ?

උ මෑත කාලයේ වෙන තුරු එවැනි වත් පිළිවෙත් සමාජයේ තිබුනා. පසුකාලිනයේදි ආපු සංවිධාන සහ එක එක කොටස් විසින් තරුණයන් අතර අදහස් ඒ ගොල්ලන්ගේ කවලා ඒක නැති කරලා දැම්මා එතකොට ඒ නිසා තමයි මිනිස්සු සොහොනට යන අවස්ථා පවා ප්‍රතික්ෂේප කරන මට්ටමක තියෙන්නේ.

ප පැමිණිලා තියෙන්නේ ?

උ ඔව්. ඒ නිසා මරණය කියනදේ ඒ ගොල්ලන්ට ඕනෑම අවස්ථාවකදී ඒක සාමාන්‍ය දෙයක්.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප සාක්ෂිකරු මෙම සිහිවටන ඵලක කඩා බිඳ දැම්මෙත් කවදාද කවුරුන් විසින්ද මතකද?

උ මම සාමාන්‍යයෙන් අපි පුංචි කාලේ ඒ වගේ සිද්ධි මං හිතන්නේ මං පුංචි කාලේ වගේ නැත්නම් මගේ තරුණ අවදියේදි තමයි මේවත් කාත්තන්කුඩියේ එල්. ටි. ටි ඊ.යුධ සමයේ හෝ ඊට පෙර අවස්ථාවේදී මේවා නැති කරන්න ඇති මොකද ඊට පස්සේ තමයි එහේට ආවේ අන්තවාදී මතවාද කාතන්කුඩියේ ඉන්නවා මෙහෙත් ඇවිල්ලා ප්‍රකාශ ලබා දුන්නා . රවුෆ් මවුලවිලාගේ කණ්ඩායමක් .ඒ කණ්ඩායම මට වඩා බොහෝ දුරට ඒ කරුණු දන්නවා ඇති . මම මේ දේවල් දැන ගත්තේ මාධ්‍ය හරහා සහ විවිධ පුද්ගලයන් ගෙන් සහ තොරතුරු වලින් සහ ඒ අදාල තැන්වලින් තමයි මෙම දැන ගත්තේ අදාල තැන් වලින් කියන්නේ මම එහේ ගියපු අවස්ථාවේදි මම දැන ගත්ත තොරතුරු .

FAIR COMMENT — BY JEZEEM —

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර රහුමන් මහත්මයා අපි මේ දැන් මරණය ගැන කතා කරපු නිසා මං හිතනවා මේකත් සුදුසුයි කියලා ඔබෙන් අහන එක ස්වාමියා මියගියොත් එතකොට කාන්තාවන්ට ඉද්දා කාලයක් කියලා කාලයක් තියෙනවා නේද ?

උ ඔව් තියෙනවා

ප්‍ර මොකක්ද ඒකෙන් අදහස්කරන්නේ ?

උ ඒකෙන් අදහස් කරන්නේ ඇවිල්ලා තමන්ගේ ශෝක කාලයක් වශයෙන් බිරිඳ ඇවිල්ලා වෙනත් පිරිමි පාර්ශව මුණ ගැහෙන් නැතුව ඒ කාලේ ගෙවා දමලා ඊට පස්සේ තමයි මාස හතර හමාරක වගේ කාලයක් ඊට පස්සේ තමයි ඒගොල්ලන් එලියට එන්න ඕනේ කියලා සුදු ඇදගෙන ඉන්න ඕනේ පවුලේ තියෙනවා මහරම් කියලා කණ්ඩායමක් ඒ කියන්නේ . අපිට මහරම් නැති මිනිසුන්ව මුණගැහෙන්න බැහැ. ඒ කියන්නේ ලේ නොවන ඥාතින්ව මුණ ගැහෙන්න බැහැ.

ප්‍ර ඒ කියන්නේ ඔවුන්ට ආරක්ෂාව තියෙන්නේ ලේ ඥාතින්ගෙන් කියන එකයි ඒකෙන් අදහස් කරන්නේ ?

උ ඒකෙන් නෙමේ මං හිතන්නේ යම්කිසි වත් පිළිවෙත් ආරක්ෂාව සාමාන්‍යයෙන් හැම කට්ටියගෙන්ම තියෙනවානේ.

ප්‍ර එතකොට ඉද්දා කාලය ආරම්භ වෙන්නේ ඔබ කිව්වානේ මාස හතරහමාරක් කියලා ?

උ ඔව්.

ප්‍ර ආරම්භ වෙන්නේ කවද්ද ?

උ ඒයාව භූමදානය කරපු වෙලාවේ ඉඳලා පටන් ගන්නවා.

ප්‍ර භූමදානය කරපු වෙලාවේ ඉඳලා පටන් ගන්නවා ඒක අවසාන වෙන්නේ මාස හතර හාමරක් ගියාම ඔබ කියන්නේ ?

උ ඔව්.

ප්‍ර ස්වාමීනි අවසර ඉල්ලා සිටිනවා සිලුවයුත්තන්ගල් සමුන් එස් රමලාන් සලෆි විසින් ලියා ඇති එම පොත I.A.K.R . 2 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට .

ප්‍ර ඔබ ඔබේ ප්‍රකාශයේ 2019 /4/21 වෙනිදා ප්‍රහාරය එල්ල වන්නට තුඩු දුන්න හේතු විදියට කරුණු ගොඩක් හඳුනාගනු ලැබුවා නේද?

උ ඔව්.

ප්‍ර ඔබ ඒ ප්‍රකාශය දවස් කීපයක් දුන්නානේ ?

අ ඔව්.

ප්‍ර ඒකෙන් එකක් විදියට ඔබ සඳහන් කරනවා පල්ලි ගොඩ නැගීම ගැන?

FAIR COMMENT — BY JEZEEM

උ ඔව්.

ප මොකක්ද ඔබට ඒ පල්ලි ගොඩනැඟීම කොහොමද බලපෑවේ 21 වෙනිදා ප්‍රහාරයට ඒක ගැන පැහැදිලි කරන්න ?

උ ඒ කියන්නේ ලංකාවේ අපේ මුතුන්මිත්තන් පල්ලි ඉදි කරලා තියෙනවා මා පිල්ලේ ලෙබ්බේ ආලින් කියන පුද්ගලයෙක් තමයි ලංකාවට දකුණු ඉන්දියාවෙන් පැමිණිලා පල්ලි රාශියක් ඉදිකරේ. සහෝදර සිංහල ජනතාව ජීවත් වන ඒ ජනතාවගේ පෞරාණික ඓතිහාසික පන්සල් දේවස්ථාන තියෙන තැන්වල පවා අපේ පාරම්පරික මුස්ලිම් ජනතාව පල්ලි ඉදි කරලා තියෙනවා කිසිම ප්‍රශ්නයක්නැතුව. ඒ පල්ලි සාමාන්‍යයෙන් විශාල අක්කර ගානක සහ පර්චස් ගානක භූමි ප්‍රමාණයක තමයි ඉදිකරලා තියෙන්නේ . එතකොට ඒ පල්ලි වලට ගියාම අපිට යම්කිසි නිවී සැනසිල්ලක් දැනෙනවා පන්සලකට ගියාම අර පහනේ සුවඳ හ දුන්කූරු වල සුවද වගේ එහේත් ඒ වගේ අපි විඳිනවා. ඒත්. පසුකාලිනවදී සවුදි අරාබි තානාපති කාර්යාලය ලංකාවට පැමිණිමත් සමඟ ලංකාවට විවෘත ආර්ථිකය පැමිනීමත් සමඟම.

ප ඒ මොන වසරේද ?

උ 1990 ගනන් වල .

ප 1990 කියලා තමයි ඔබ ප්‍රකාශ කරලාතියෙන්නේ ඔබේ ප්‍රකාශයේ හරිද එතකොට?

උ ඔව්.

ප 1990 න් වසරෙන් පසු සවුදි අරාබි තානාපති කාර්යාලය ලංකාවේ ඇතිවීමත් සමඟ ඒක හරිනේ?

උ මේ කොමිෂන් සභාවට නිසාර්දීන් කියලා මහත්මයෙකුත් කට උත්තර ලබා දීමට නියමිතව තිබෙනවා . මම සහ මගේ කාදර් සගයා අපි තුන්දෙනා තමයි මේ කතිකාවන මම නියැලුනේ ඒ වගේම මම ඔහු ගෙනුත් කරුණු කාරණා රාශියක් ඉගෙන ගත්තා මට වඩා වැඩිමහල් පුද්ගලයෙක්.එතතොට එතුමා මම ගොඩක් දේවල් ඉගෙන ගෙන තියෙනවා එතුමාත් අපේ දේශපාලන මුස්ලිම් එක්සත් විමුක්ති පෙරමුණට සම්බන්ධව ප්‍රචාරක ලේකම් වරයෙක් හිටපු.එතකොට මේ පල්ලිවල තියෙන තත්වයන් ගැන කියනවා නම් 90 ගණන් වල පස්සේ ලංකාවට මතවාද පල්ලි ගොඩනහන්න පටන් ගත්තා.

ප මොනවාද මේ මතවාද පල්ලි ?

උ මතවාද පල්ලි කියන්නේ ඉස්සර අපි පල්ලි ගියාම අපි දන්නේ අපේ පල්ලිය කියලා විතරයි අපි දන්නේ දැන් එහෙම නෙමේ මේක අර තබ්ලික් කාරයාගේ පල්ලිය මේක වහාබි කාරයාගේ පල්ලිය, මේක ජමාත් ඉස්ලාම් කාරයාගේ පල්ලිය, මේක ඉහ්වාන් මුස්ලිම් කාරයාගෙ ප්ලලිය. ඉස්ලාම් පල්ලියක් අපිට නැහැ අද.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර එතකොට දැන් උදාහරණයක් වශයෙන් කිව්වොත් ජමාතේ ඉස්ලාමී තැනැත්තාගේ පල්ලියට යන්න පුලුවන්ද තව්හික් එක්කනාට?

උ තව්හික් යන්න පුලුවන් ඔව්. ඒක ප්‍රතික්ෂේප කරන්නේ නැහැ සාමාන්‍යයෙන් යනවා යන කට්ටිය යනවා සාමාන්‍යයෙන් පාරම්පරික මත වල සාමාන්‍ය මට්ටමක ඉන්න පුද්ගලයා යන්නේ නැහැ . නිකම් මොකක්වත් නැතුව නිකම් ඉන්න පුද්ගලයා යනවා .

ප්‍ර ඒ වගේ අය ඕනෑම පල්ලියකට යනවා ?

උ යනවා.

ප්‍ර නමුත් ඔබ කියන්නේ පාරම්පරික මුස්ලිම් ජාතිකයින්ට ඒ වගේ එහෙම යෑමේ අපහසුකමක් තිනෙවා මොකද ඔවුන් ඒ කියන්නේ මේ පල්ලි බෙදාගෙන තියෙන නිසා අනිත් අය ?

උ අපහසුකමට වඩා එහේදි අනාවරණය කරන කරුණු සහ ඒ පල්ලි පල්ලි විදියට සලකන්නේ නැහැ ඒ ගොල්ලන්.

ප්‍ර ඇයි ඒ ?

උ හේතුව ඇවිල්ලා නබිතුමා විසින් කුරුවාන් ආයතනයක් පහල කරලා නබි තුමාට අල්ලා දෙවියන් වහන්සේ මක්කම නගරයේ පල්ලියක් ඉදි කරලා අලුතෙන් පල්ලියක් විවෘත කරන්න එන්න කියනවා කණ්ඩායමක් . එතකොට නබිතුමා යන්න සැරසෙනවා එතකොට ජිබ්රිල් කියන ඒන්ජල් හරහා කුරුවානයට ආයතයක් පහල කරනවා අල්ලා දෙවියන් වහන්සේ විලින් ඒ පල්ලිය විවෘත කරන්න යන්න එපා කියලා

ප්‍ර ආයතයක් කියන්නේ මොකක්ද ?

උ අර කුරුවානයේ තියෙන වැකි වලට

ප්‍ර ඒවැකියක් පහල කරනවා ඒ පල්ලියට යන්නට එපා කියලා ?

උ මගේ මතකයට සහ මගේ බුද්ධියට අනුව ඒක සූරා ලීරා කියලා තමයි කියන්නේ සූරා ලීරා මට සමාවෙන්න සූරා ලීරා එතකොට ඒ පල්ලියට නමක් තිබ්බා ඩිරාර් කියලා මස්ජිත් ඩිරාර් . එතකොට ඒ දේව වාක්‍යයේ සඳහන් වෙනවා ඒ පල්ලිය කඩා බිම දාලා සමතලා කරලා එතන කුණු දාන්න කිව්වා.

ප්‍ර කව්ද කිව්වේ ?

උ අල්ලා දෙවියන් වහන්සේ.

ප්‍ර අල්ලා දෙවියන් වහන්සේ තමයි මේ නියෝගය දුන්නේ ?

උ ඔව්.

ප්‍ර කාටද දුන්නේ ?

ප්‍ර නබි තුමාට. නබිතුමා පල්ලිය විවෘත කරන්න යනවානේ ?

උ ඔව් . එතකොට එතුමාටත් ඒ දවස්වල අල්ලා දෙවියන්ගේ දේව වාක්‍යය අනුව තමයි කටයුත් කරන්නේ එතුමාට ඒ දේව වාක්‍යය පහල වුනේ නැත්නම් එතුමා යනවා පල්ලිය විවෘත කරන්න.එතකොට ඒ පල්ලිය විවෘත කරන්න යන්න එපා කිව්වාම ඊට පස්සේ නබිතුමා යන්නේ නැහැ

FAIR COMMENT BY JEZEEM

නබිතුමාට නියෝගයකුත් දෙනවා පල්ලිය විවෘත කරන්න එපා ඒක කඩා බිඳ දාලා බිමට සමතලා කරලා ඒකට කුණු දාන්න කියලා. නබිතුමා ඒ අනුව කටයුතු කරනවා එතකොට අපිත් කියන්නේ ලංකාවේ සිංහල , දෙමළ , මුස්ලිම් ජනතාවගේ බදු මුදල් වලින් නඩත්තු වෙන මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශයෙනුත් කරන්නේ දේව වාක්‍යයට පටහැනි ක්‍රියාවක්.

ප ඇයි ඔබ එහෙම කියන්නේ ?

උ හේතුව පල්ලි ඉදි කරන්න ඕනේ මතවාද වලට නෙමේ . ඒ පල්ලිය ඉදි කරේ කඩා බිඳ දමන්න කිව්වෙත් බෙදුම් වාදි පල්ලියක් නිසා .

ප එතකොට ඔබ දැන් කිව්වානේ මුස්ලිම් ආගමික සංස්කෘතික අමාත්‍යාංශයත් ඒකට සහභාගි වෙනවා කියලා කොයි විදියටද ඔවුන් පල්ලි තැනිමටට සහභාගි වෙන්නේ ?

උ ඒ ගොල්ලන් තමයි ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ආගමික සම්බන්ධව රජය විසින් පත්කරලා තියෙන නිල බලයෙන් පත් කරපු ආයතනයක් . එතකොට ඒ ගොල්ලන්ගේ වගකීමත් තියෙනවා ඉස්ලාමිය ෂරියා මුලධර්ම අනුවත් කටයුතු කරන්න එතකොට මොකද ඉස්ලාමීය ෂරියා මුලධර්මයත් උල්ලංඝණය කරලා තමයි ලංකාවේ පල්ලි ඉදි කරලා තියෙන්නේ එතකොට ලංකාවේ තියෙනවා කඩලා බිම දාලා කුණු දාන්න පුලුවන් පල්ලි එතකොට ඒ පල්ලි ඒවාවලට අවසර දුන්නේ ලංකාවේ ආණ්ඩුව ලංකාවේ ආණ්ඩුව කියන්නේ මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුව . එතකොට ඒ වගේ පල්ලි රාශියක් අනුගනන් වලින් පස්සේ ලංකාවේ තිබ්බ එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදි යුද්ධය මත මේ ගොල්ලන් ඒක ඇතුලේ ආවරණයක් කරගෙන ඒක ඇතුලේ තමන්ගේ ක්‍රියා පටිපාටි ටික කරගෙන ගියා එතකොට මේ ඩිරාර් පල්ලි අදටත් තියෙනවා අදටත් ඉදි කරලා තියෙනවා .

ප ඩිරාර් පල්ලි ?

උ මම ඒක හඳුන්වන්නේ නිරාර් පල්ලි කියලා හේතුව.

ප මොකක්ද ඒ වචනයේ තේරුම?

උ ඒ අරාබි වචනයේ තේරුම සමාවෙන්න මම දන්නේ නැහැ . ඒකට කියන්නේ ඩිරාර් කියලා මක්කම ඒපල්ලියටත් දැම්මේ ඩිරාර් කියලා

ප ඒකනිසා තමයි ඔබ මේ අනිත් ඒ වගේ ඉවත් කල යුතු පල්ලි වලට ඩිරාත් පල්ලි කියලා හඳුන්වන්නේ ?

උ හඳුන්වන්නේ මම නෙත් එෆ් එම් එකෙත් ඒ සම්බන්ධව රහසිගත විදියට උදව් කලා කිව්වනේ ඩිරාර් පල්ලි සම්බන්ධව. නෙත් එෆ්. එම් එකෙනුත් පොඩි වීඩියෝ සටහනක් ඒ ගොල්ලන් කරා.

ප ඒක තියෙනවාද දැන් යු. ටියුබ් එකේ ?

උ යු. ටියුබ් එකේ තියෙනවා ඩිරාර් පල්ලි කියලා. එතකොට ඒ වගේ පල්ලි ලංකාව තුල ඉදි කරන්න අවසර දිලා තමයි මේ මතවාද හැදුනේ.

FAIR COMMENT
BY JEZEEM

එතකොට ඒ ගොල්ලන්ගේ ඉස්ලාම් දහම පෝෂණය කරන්නේ නැහැ ඒ ගොල්ලන් ඉස්ලාම් දහම වෙනුවට පෝෂණය කරන්නේ තමන්ගේ වහබ්වාදය ඉහ්වාන් වාදය ජාමාත් ඉස්ලාම් ඒ වගේ තමන්ගේ සංකල්ප තමයි ඒ අදහස් තමයි පෝෂණය කරන්නේ. ඒක තමයි ඒගොල්ලන් පල්ලිය කියන ආවරණය තුල කරන්නේ එතකොට ඒ පල්ලිය කියන ආවරණය තුල ඕනෑම කෙනෙකුට ඇවිල්ලා දේශණා තියන්න පුලුවන් .එතකොට අබ්දුල් රාසික් කියන පුද්ගලයා ඇවිල්ලා පුජකයෙක් නෙවේ. එතකොට පුජකයෙක් නොවන කෙනක්ට කොළඹ විශ්ව විද්‍යාලයේ එයත් සහිරා විද්‍යාලයේ .

ප්‍ර ඔබ කියන්නේ එතකොට පල්ලි වලට ඇවිල්ලා ඒ සඳහා සුදුසුකම් නැති අය දේශණා පවත්වනවා ඒවා අධීක්ෂණය කරන්නට නියාමනය කරන්නට කිසියම් ක්‍රමවේදයක් ලංකාවේ නැහැ කියලා ?

උ නැහැ.ඒ කියන්නේ ඒක නියාමනය කරන්න ඒ ගොල්ලන් ඇවිල්ලා උගත් පුද්ගලයන් අපිට වඩා අගත් පුද්ගලයන් උපාධි ගත්තු පුද්ගලයන් ඒ ගොල්ලන්ට ඇයි දැනුමක් නැත්තේ කියන එක ප්‍රශ්ණයක් තියෙනවා .

ප්‍ර ඇයි මේවට ඉඩ දෙන්නේ කියලා ?

උ ඔව්. උවමනාවෙන්ම සහ තමන්ගේ සන්තෝෂම් සහ තමන්ගේ සමහරක් සමහරක් දේවල් කරුණු කාරණා මුල් කරගෙන මේ ගොල්ලන් මේක සඳහා දායකත්වයක් ලබා දුන්නා කියලා කියන එක තමයි මමනම් හිතන්නේ .

ප්‍ර ඉතින් ඒ නිසා ඔබ හිතනවාද පල්ලි මේ වගේ තැන් තැන් වල ඉදි කිරීම මඟින් යම් ප්‍රබල විදියේ දායකත්වයක් ලැබුනාය කියලා අප්‍රෙල් මස සිදුවූ මේ පාස්කු ප්‍රහාරයට.?

උ ඔව්.සහරාන්ගේ සංවිධානය ලියා පදිංචි කරෙත් මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ එන්.ටී. ජේ කියන සංවිධානය. එතකොට ඒ සඳහා අවසරය දුන්නෙත් මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුව එහේ ගියපු තරුණයන් දන්නේ නැහැ සහරාන් අන්තවාදියෙක් වෙනවාද අන්තවාදී අදහස් දරන පුද්ගලයෙක් වෙනවාද කියන එක දන්නේ නැහැ. එහේ ගිය පුද්ගලයන් දන්නේ මේක ලංකාණ්ඩුවෙන් අවසර දුන්නු තැනක් කියන විදියට විතරයි දන්නේ එතනදි සමහරක් අහිංසක තරුණයන් මේවට බිලි වුනා . එතකොට සහරාන් සමඟ සම්බන්ධකම් තිබ්බ සමහරක් තරුණයන් අද අත්අඩංගුවෙත් ඉන්නවා. සමහර තරුණයන් නිරපරාදේ කරුවන් වෙන්නත් පුලුවන් රවුල් හකීම් ඇමතිවරයා වගේ . මොකද රවුල් හකීම් ඇමතිවරයාත් සහරාන් සමඟ සම්බන්ධකම් තිබ්බානේ එතකොට එතුමාත් ගිහිල්ලා සහරාන් එක්ක වාඩි වෙලා ජාතික ලැයිස්තුවක් ගැන රටේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ජාතික ලැයිස්තුවක් ගැන කතා කරනවානේ බිම ඉඳගෙන වාඩි වෙලා සැහැල්ලුවෙන් . එතකොට අෂ්රොෆ් අමාත්‍යවරයා ඇවිල්ලා කොටි සංවිධානයට

FAIR COMMENT BY JEZEEM

විරුද්ධව තමයි මුස්ලිම් ජනතාව ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුලට ගේන්න තමයි ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රස් කියන සංවිධානය බිහි කලේ ප්‍රජාතන්ත්‍රවාදය තුල මුස්ලිම් තරුණයන් රඳවාගන්න . එතකොට අෂ්රෆ් මහත්මයාගේ සංකල්පය සහ මුලින්ම බිද හෙළෙනවා රවුෆ් හකීම් මන්ත්‍රීවරයා වර්තමාන මුස්ලිම් කොන්ග්‍රස් නායකයා විසින් ඔහු සහරාන් ගේ ඡන්ද 2000 ක් වෙනුවෙන් බිම වාඩි වෙලා කතා කරනවා ඒ කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදී කතා කරන්නේ රවුෆ් හකීම් අමාත්‍යවරයා එතකොට සහරාන් කතා කරන්නේ අන්තවාදය ගැන එතකොට අන්තවාදය කතා කරන පුද්ගලයා ඇවිල්ලා එක්ක කේවල් කරනවා රවුෆ් හකීම් ප්‍රජාතන්ත්‍රවාදි නායකයෙක් . එතකොට ඒ තැනට තල්ලු වෙනවා ඒ තැනට තල්ලු වුනාම වටපිටාවේ ඉන්න තරුණයන් බලනවා රවුෆ් හකීම් ඇමතිවරයාත් එක්ක සහරාන් සම්බන්ධකම් තියෙනවා හිස්බුල්ලා අමාත්‍යවරයා එක්ක සම්බන්ධකම් තියෙනවා යහපාලන සඳහා ජාතික පෙරමුණ කියන එන්. එෆ්. ඩී.ඩී සංවිධානයත් එක්ක සම්බන්ධකම් තියෙනවා එතකොට සහරාන්කියන්නේ ප්‍රබල පුද්ගලයෙක් . එතකොට මේ වගේ සහතික දෙන්නේ කව්ද සහතික දීම තුලින්නේ මේ වගේ දේවල්වලට තරුණයින් පෙළඹෙන්නේ.

ප ඔබ කියන්නේ එතකොට මේ වගේ අන්තගාමී අදහස් තියෙන අයගේ මත දේශපාලනඥයින් යැපුනහම ඔවුන් වටා ඉන්න ඡන්දවලට දේශපාලනඥයින් යැපුනහම එයින් වැරදි පුර්වාදර්ශයක් ?

උ අනිවාර්යයෙන්ම.

ප එය බලාගෙන ඉන්න තරුණ කණ්ඩායම් වලට විශේෂයෙන්ම මුස්ලිම් ජන කොට්ඨාශය ලැබෙනවා කියලා?

උ ලැබෙනවා අනිවාර්යයෙන්ම.

ප ඔබ කිව්වානේ හකීම් මහත්මයා බිම වාඩි වෙලා සහරාන් සමඟ කතා කලා කියලා ? ඔබ කොහේද දැක්කේ ඕක

උ මේක ඇවිල්ලා කියනවා නම් මේ විඩියෝ පටය ලංකාවට එලියට එන්නේ ජනාධිපති මැතිවරණ සමයේ තමයි මේ වීඩියෝ පටය එන්නේ ?

උ මොන ජනාධිපති මැතිවරණය සමයද ?

උ පසුගිය ජනාධිපතිවරණය 2020

ප 2019 දි?

උ මේ වීඩියෝ පටය එන්නේ 2019 ජනාධිපති මැතිවරණ සමයේදි. එතකොට මේ වීඩියෝ එන්න ප්‍රධාන හේතුව හැටියට මම නම් දකින්නේ රවුෆ් හකීම් අමාත්‍යවරයා හිස්බුල්ලා අමාත්‍යවරයා ගිහිල්ලා කාත්තන්කුඩියේ ගිහිල්ලා දැඩි විවේචනයක් කරනවා

ප රවුෆ් හකීම් අමාත්‍යවරයා ගිහිල්ලා හිස්බුල්ලා ඇමතිවරයාව ?

FAIR COMMENT
BY JEZEEM

උ දැඩි විවේචනයක් කරනවා ඒ දැඩි විවේචනයෙන් පස්සේ සමාජ මාධ්‍යතුල මේක එනවා . එතකොට අපිත් එක්ක සම්බන්ධවෙලා ඉන්න පුද්ගලයෙක් තමයි මින්ලාල් මවුලවි කියන පුද්ගලයා .

ප්‍ර කව්ද ?

උ මින්ලාල් මවුලවි .

ප්‍ර මින්ලාල් මවුලවි.

ප්‍ර ඔව්. එතකොට මින්ලාල් මවුලවි කියන පුද්ගලයා ඇවිල්ලා මේ වීඩියෝ පටය අරගෙන යනවා පොලිස් මූලස්ථානයට ඊට පස්සේ තමයි මේක ජනමාධ්‍ය හරහා මේක ආවේ.

ප්‍ර එතකොට දැන් ඔය වීඩියෝ පටයෙන් පෙන්නුම් කරන්නේ කොයි අවස්ථාවේ රවුෆ් හකීම් ඇමතිවරයා සහරාන් සමඟ සාකච්ඡා කරන බවද ? මොන මැතිවරණයට අදාලවද ඒ ?

උ ඒක 2015 පාර්ලිමේන්තු මැතිවරණය අවසානයෙන් පස්සේ ජාතික ලැයිස්තුවට හිස්බුල්ලා පරාජයට පත්වෙනවා මහින්ද මහත්මයා තමන්ගේ පක්ෂය සමඟ බුලත් කොල ලකුණින් තරඟ කරලා ඊට පස්සේ එවකට වර්තමාන ජනාධිපති මෛත්‍රි පාල සිරිසේන ගරු ජනාධිපති වරයා .

ප්‍ර ජනාධිපතිතුමා දැන් මාරුවෙලා ?

උ එවකට

ප්‍ර ඔව් එවකට ?

උ එතකොට එවකට ජනාධිපතිවරයා සමඟ සම්බන්ධ වෙනවා .එතකොට ඒ අවස්ථාවේදි ඒජාතික ලැයිස්තුව ඒ යහපාලන ආණ්ඩුවට සම්බන්ධ ජාතික ලැයිස්තුවක් නිසා ඒක යහපාලන ආණ්ඩුවෙන් මේක දෙන්න එපා කියලා බලපෑම් කරනවා මේ සහරාන්.හේතුව හිස්බුල්ලා ඇවිල්ලා සහරාන් සමඟ

ප්‍ර ජාතික ලැයිස්තුවෙන් කාට දෙන්න එපා කියලද සහරාන් දැන් බලපෑම් කරන්නේ කාටද බලපෑම් කරන්නේ ?

උ හිස්බුල්ලාට එතන සඳහන් වෙනවා හිස්බුල්ලා ගේ නම.

ප්‍ර හිස්බුල්ලාට දෙන්න එපා කියලා බලපෑම් කරන්නේ ?

උ රවුෆ් හකීම් අමාත්‍යවරයාට . මොකද රවුෆ් හකීම් අමාත්‍යවරයා ඔවුන් සලකනවා එයා ආණ්ඩුවේ ප්‍රබල පුද්ගලයෙක් කියලා. එතකොට යහ පාලන ආණ්ඩුවේ එවකට ජනාධිපතිවරයාට බලපෑම් කරන්න පුලුවන් ඔහු හරහා කියලා හිතනවා සහරාන් හිතනවා. එතකොට හිස්බුල්ලා ඇවිල්ලා සහරාන් ගේ ගිවිසුම කඩා කප්පල් කරනවානේ සංගීත ඒවා දාලා .

ප්‍ර ඒ කියන්නේ ඔබ කියන්නේ එවකට හිස්බුල්ලා ඇමතිවරයා සහ සහරාන් අතර යම් ගිවිසුමක් තිබ්බා ඒ ගිවිසුම කන්ඩණය වීමක්

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වෙනවා කඩා දැමීමක් වෙනවා . බිඳීමක් වෙනවා සංගීතය ඒ දේශපාලන වේදිකාවේ වාදනය කලොත් ?

උ ඒක හිස්බුල්ලා අමාත්‍යවරයාම මාධ්‍යයට කියපු දෙයක් ඒක තමයි මමත් කියන්නේ .

ප්‍ර එහෙමයි ඔබ දැන ගත්තේ ?
එහෙම නම් අපි දැන්අර විඩියෝ පටය නරඹමුද?
විඩියෝ පටයක් නරඹයි.

ප්‍ර එතකොට කියන්න ඔබ දැකලා තියෙන්නේ ඒකද කියලා ? එතන ඉන්නවාද රවුල් හකීම් මහත්මයා

උ ඔව් .ඉන්නවා අර තොප්පිය දාගෙන ඉන්නේ අර සුදු පාට අත්කොට නවලා . මේ ඉන්නේ.

මින්පසු සටහන් ගැනීම ල/ගේ ඉන්ද්‍රාණි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : පෙ.ව. 11.30 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

(ස්වාමීනි 2019 ඔක්තෝම්බර් මස 20 වන දින ප.ව. 12.10 ට ප්‍රකාශයට පත්කොට ඇති adaderana.lk වෙබ් අඩවියෙහි පළ වී ඇති මෙම වීඩියෝ පටය IAKR-03 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා)

(CD තැටිය වාදනය කරයි)

ප : රහුමන් මහත්මයා දැන් මේ හිටපු ගරු ඇමති රවුෆ් හකීම් මහත්මයා කියනවනේ ඔහු ඒ ප්‍රදේශයේ කලබලයක් වෙලා ඒ ගැන බලන්නට ගියේ මේ මැතිවරණයෙන් පස්සේ. එතකොට හිටපු කට්ටිය කිහිප දෙනෙක් හිටියා. සහරාන් කියන කෙනත් එතන හිටිය බව පේනවා කියලා? පස්සේ ඔහුට දැන ගන්න ලැබුණයි කියලා?

පි : ඔහු දන්නේ නැහැ කියලා කියනවා. සහරාන් කියලා පුද්ගලයෙක් එතන හිටියයි කියලා ඔහු දන්නේ නැහැ කියලා කියනවා.

ප : එතකොට දැන් ඔබට යම් තොරතුරු තියෙනවද එවකට ගරු ඇමති හකීම් මහත්මයා මේ සහරාන් සමඟ ඇත්තටම ඔය සාකච්ඡාවේදී සාකච්ඡා කෙරුවේ මොනවද? සහරාන් ඇතුළු කණ්ඩායමත් එක්ක මොනවද සාකච්ඡා කළේ කියලා කියන්න?

පි : ඒ කියන්නේ ඒ පිළිබඳව දැන් ඒ රූප රාමුවල සිදුවන දෙමළ කථාබස්වලින් තමයි මම දැන ගන්නේ. මේ අදාළ ඒ කථාව ඇවිල්ලා ජාතික ලැයිස්තුවක් සම්බන්ධව කථා කරනවා කියන එක.

ප : ඔබ මේ ගරු කොමිෂන් සභාවට කියන්නේ දැන් අපි අර IAKR-03 කියලා ලකුණු කළානේ වීඩියෝ පටයක්. ඒ වීඩියෝ පටයේ ද්‍රවිඩ භාෂාවෙන් තියෙන කථා බහ අහලා තමයි ඔබ කියන්නේ මේක ජාතික ලැයිස්තුව පිළිබඳව තමයි මේ කථා කරන්නේ කියලා?

පි : කථා කරන්නේ කියන එකත්. අනිත් එක රවුෆ් හකීම් අමාත්‍යවරයා මෙතනදී සඳහන් කරනවා එයා ඒ සහරාන් කියන එක දන්නේ නැහැ කියලා.

ප : පස්සේ වෙනම Interview එකක් දීලානේ ඒක ගැන කියන්නේ?

පි : ඔව්. ඒ කියන්නේ එතකොට මම මෙතන පොඩි ඌණ පූර්ණයක් කරනවා. හේතුව එතුමා ඇවිල්ලා පාර්ලිමේන්තු පාස්කු ප්‍රහාරය සම්බන්ධව කමිටුවේ ප්‍රහල සාමාජිකයෙක්.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : තේරීම් කාරක සභාවේ?

පි : තේරීම් කාරක සභාවේ. එයා කියනවා එතන ඉන්නේ සහරාන් කියලා දන්නේ නැහැ කියලා. එතකොට ඥාණසාර හාමුදුරුවෝ 2013 දී සහරාන් ගැන කියනවා. මෙයා කියනවා සහරාන් කියන කෙනා එතන ඉන්නවා කියන එක දන්නේ නැහැ කියලා.

ප්‍ර : එයා 2015 දී දැනන් ඉඳලා නැහැ?

පි : ඔව්.

ප්‍ර : එහෙමයි කියන්නේ. එතුමා දැනන් හිටියේ නැහැ කියලා?

පි : නැහැ කියලා. ඒගොල්ලෝ නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ මුස්ලිම් කොන්ග්‍රසයට ආසන්න තියෙනවා දේශපාලනය කරනවා. මුස්ලිම් කොන්ග්‍රසය පටන් ගත්තෙත් කාත්තන්කුඩිවලදී තමයි. M.I. ඉමාම් මොහිදීන් කියන එක්කෙනත් එක්ක කථා කරලා අෂ්රොෆ් මහත්මයා ඒක හැදුවේ. එතකොට මේගොල්ලන්ගේ පක්ෂයෙනුත් ගිවිසුමක් ගහනවා සහරාන් එක්ක.

ප්‍ර : මේ කාගේ පක්ෂයෙන්ද?

පි : ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයත් එක්ක.

ප්‍ර : ඒ කියන්නේ හකීම් මහත්මයාගේ පක්ෂයෙනුත් ගිවිසුමක් ඇති වෙනවා සහරාන් එක්ක?

පි : ඔව්. ඒ කියන්නේ නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ තරඟ කරපු සියළු කට්ටිය එතුමත් එක්ක ගිවිසුමකට එළඹෙනවා. එතකොට මෙතුමා මෙතනදී කරන ප්‍රකාශය ඇවිල්ලා එතුමා හිතුවේ නැහැ ජීවිතයට මේ වගේ වීඩියෝ ක්ලිප් එකක් එළියට එයි කියලා. එතුමාගේ අවාසනාවකට හෝ රටේ වාසනාවකට මේක එළියට ඇවිල්ලා තියෙනවා. එතකොට මෙතනදී අර මිෆ්ලාල් මවුලවීතුමාවත් මේ සම්බන්ධව කොමිසමට වාර්තා කරන්න පුළුවන් නම් වඩා හොඳයි කියලා මම මෙතනදී යෝජනා කරනවා. එතුමාත් එතනදී අදහසක් කරනවා සහරාන් සමඟ එක් එක් ක්‍රියාවල නියැළුණු පුද්ගලයන් අද හිරේ කියලා. එතකොට ඇමතිවරයෙක් ඇවිල්ලා මෙහෙම සාකච්ඡා පවත්වලා එයා එළියේ කියලා. එතකොට මේ රටේ නීති දෙකක් ක්‍රියාත්මක වෙනවා කියන දෙයක් එයා ජනමාධ්‍යයට ප්‍රකාශ කරනවා. එතකොට ඒක බරපතල ප්‍රකාශයක්. නීතිය කියන දේ සියළු දෙනාටම සමාන වෙන්න ඕන. එතකොට එයා ඇමතිවරයෙක් නිසා එයාට වරප්‍රසාද ලැබෙන්නත්, සාමාන්‍ය ගමේ ගොඩේ ඉන්න කොල්ලෙක්ට එක නීතියක් වෙන්නත් ඒක අනාගතයට හොඳ නැහැ. ඒ නිසා අපි

FAIR COMMENT BY JEZEEM

කියන්නේ ඇවිල්ලා ඒ නීතිය හරියටම ක්‍රියාත්මක වෙනවා නම් වඩා හොඳයි කියලා එතුමාගේ ප්‍රකාශයට අනුව.

ප්‍ර : දැන් අපි මුස්ලිම් ජන කොටියාශයට ලැබෙන අධ්‍යාපනය ගැන බැලුවොත් ඒක මේ පාස්කු ප්‍රහාරයට යම් ආකාරයකට දායක වෙලා තියෙනවද කියන එක පිළිබඳව ඔබ සොයාගෙන තියෙන කරුණු අනුව මේ ගරු කොමිෂන් සභාවට ඔබේ අදහස් දක්වන්නට පුළුවන්ද?

පි : අධ්‍යාපනය සම්බන්ධයේදී උසස් පෙළ පාස්කු ප්‍රහාර පාර්ලිමේන්තු කමිටුවටත් වාර්තා කරලා තිබ්බා රිස්වින් ඉස්මත් කියන මාවනැල්ල ප්‍රදේශයේ පුද්ගලයෙක්. එතුමත් හිටපු ජමාත් ඉස්ලාම් සංවිධානයේ ක්‍රියාකාරිකයෙක්. එතකොට පුද්ගලයෙක් ආගම ඇතහැරලා යනවා කියන්නේ ඒක ප්‍රශ්නයකට භාජනය කළයුතු සහ අපි සැළකිය යුතු කරුණක් වෙනවා. එතකොට එතුමා අද අනාගමික පුද්ගලයෙක් වෙලා තියෙනවා රිස්වින් ඉස්මත්. ඒ කියන්නේ ඒ තරමට අන්තවාදී අදහස් ජමාත් ඉස්ලාම් සංවිධානය තුළ තිබුණු නිසා තමයි එතුමා අනාගමිකයෙක් වෙලා ඇත්තේ කියලා මම හිතනවා. එතකොට එතුමාගේ හෙළිදරව්වටත් අනුව වෙන NETH FM බැලුම්ගල වැඩසටහනේදී මගේ ඉස්කෝලේ ඉන්තිකාෆ් කියන සහෝදරයා සහ ...,

ප්‍ර : සහිරා විද්‍යාලයේ?

පි : සහිරා විද්‍යාලයේ. ඊට අමතරව ඔහු සමඟ සිටින ඊසාන් ආෆිස් කියන පූජකයත් මම තමයි NETH FM එකට සම්බන්ධ කරලා දුන්නේ. එතකොට මම වක්‍ර ආකාරව සමහරක් දේවල් කරනවා කියන එක ඒකෙන් මම අදහස් කළේ.

ප්‍ර : ඇයි ඔබ මාධ්‍යකරුවෙක්නේ?

පි : ඔව්. එතකොට එතුමා මෙතනටත් ඇවිල්ලා ප්‍රකාශයක් ලබා දුන්නා කියලා මට සඳහන් කළා. එතකොට ඒ පොත්පත් වල තියෙනවා උසස් පෙළ පොත්පත් ගැන මම කියන්නේ. අපි පුංචි කාලේ ඉස්කෝලේ පොත් පත්වල තිබ්බේ පාරම්පරික අපේ ලේඛකයන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියපු දේවල්. ඒකේ ගොඩාක් හික්මීම ගැන, විනය ගැන කියලා තිබ්බා. ඒ කියන්නේ ඇවිල්ලා දැන් අපි පල්ලියකදී සෙනඟ ගැවසෙන තැනකදී අපි පයින් ගමන් කරනකොට කකුල වැදුනා නම් අපි එයාගේ ඇඟ හරි කොහේ හරි ස්පර්ෂ කරලා මෙන්න මෙහෙම කරනවා.

ප්‍ර : සමාවෙන්න කියන එකේ සංඥාවක්?

පි : අර ජපානය වගේ, ඒ වගේ ඉතාමත් විනය ගරුක විදියට තමයි අපිට උගන්වලා තිබ්බේ. එතකොට මේගොල්ලන් කියනවා

FAIR COMMENT BY JEZEEM

එහෙම කිරීමත් වැරදියි. ඒක ආගමානුකූල නැහැ කියලා. එහෙම කිරීම තුළින් අපේ සිත් සතන් තුළට ඇති වෙන්නේ මිනිහෙක්ගේ කකුලට වදින එකත් පවක් කියන දේ. එතකොට අපි පුංචි කාලයේදී අපේ හිත සන්සුන් වෙනවා මෙහෙම ටජ් කරලා අපි මෙහෙම සමාව ඉල්ලනවා කියන එකෙන්. එතකොට ඒ වගේ වත් පිළිවෙත් පවා මේ පුංචි තැන්වලින් අයින් කළා. එතකොට ඒ අපේ ආගමික දේවල්, ඒ පොත්පත් පරිශීලනය කළොත් තේරෙනවා මොනවද අයින් කළේ කියන එක.

ප : එතකොට වැඩිහිටියන්ට ගරු කිරීම, ගුරුවරුන්ට ගරු කිරීම ඒ වගේ දේවල් දැන් සිද්ධ වෙනවද?

පි : සාමාන්‍යයෙන් ගුරුවරුන්ට ගරු කිරීම, වැඩිහිටියන්ට ගරු කිරීම වගේ දේවල් සිද්ධ වෙනවා. සමහරක් තැන්වලදී උගන්වලා තියෙනවා කෙනෙක් ආවහම නැගිටින්න එපා, ජාතික ගීයට නැගිටින්න එපා ඒ වගේ දේවල් උගන්වලා තියෙනවා.

ප : ඇයි ඒ?

පි : ඒ කියන්නේ දෙවියන් වහන්සේට විතරයි ගරු කරන්න ඕන කියලා. අනිත් කට්ටිය කාටත් ගරු කරන්න ඕන නැහැ කියන දේවල් උගන්වල තියෙනවා. ඒක සැබෑ ඉස්ලාම් දහම තුළ නැහැ. ඒකට මම වචනයක් කියනවා ඒක ඊනියා ඉස්ලාම් කියලා. ඒ ඊනියා ඉස්ලාම් තුළින් තමයි මේවා ඔක්කොම එළියට ඇවිල්ලා උගන්වලා තරුණයන්ව නොමඟ යැවිවේ.

ප : ඔබ කියන විදියට ඔය ඊනියා ඉස්ලාම් කියන ඒ වර්ගීකරණයට ඔය අන්තගාමී ඉස්ලාම් අදහස් තියෙන අය ඇතුළත් වෙනවද?

පි : ඇතුළත් වෙනවා අනිවාර්යයෙන්ම. එතකොට ඒගොල්ලන් උසස් පෙළ පෙළපොත් වල මම හිතන්නේ මේකත් ගණන් දීලා ඇති. ඒකටත් නාලය නාහරීහම් කියලා තියෙනවා. මේකේ තවුහිද් ගැන උගන්වලා තියෙනවා. එතකොට මේ පොත නාලය නාහරීහම් කියන පොතක්.

ප : ඒ මොකද්ද ඒ කියන්නේ?

පි : නාලය කියන්නේ හෙට, නාහරීහම් කියන්නේ මට හරියට පරිවර්තන දන්නේ නැහැ. එතකොට ඒකේ පොතක් උසස් පෙළ පොත්වල අන්තිම පිටුවේ සඳහන් කරලා තියෙනවා පරිශීලනය කළයුතු පොත්පත් ගැන. එතකොට මේ පොත Release කරන්නේ IBH කියන Islamic Book House කියන එක. අනාගත සංස්කෘතිය කියලා තමයි මේ පොතේ තියෙන අන්තර්ගතය සහ ඒක උසස්පෙළ පාඩමේ Subject එකක්.

ප : මේක පළවෙනි කොටස?

FAIR COMMENT — BY JEZEEM

පි : පළවෙනි කොටස. මේක දෙවෙනි කොටස.

ප්‍ර : උසස් පෙළටද එතකොට මේ පොත තියෙන්නේ?

පි : ඔව්. එතකොට දැන් අපිත් මේවා ඉගෙන ගත්තේ නැහැ. අපි උසස් පෙළ කළේ වාණිජ. එතකොට අපි ඉස්ලාම් දහම O/Level වලින් ඉවරයි අපේ.

ප්‍ර : එතකොට මේ පොත, ඔබ දැන් සඳහන් කරන මේ පොත අදාළ වෙන්නේ ඔය උසස් පෙළ ඉස්ලාම් ධර්මය හදාරන සිසුන්ටද?

පි : ඔව්. මගේ අවබෝධයක් නැහැ 1 වසරේ ඉඳලා 11 වසර වෙනකම් කොහොමද තියෙන්නේ කියන එක. ඒක අපි දැඩිව පරිශීලනය කළ යුතුයි කියලා මම ඉල්ලා සිටිනවා. මේකත් මම දැන ගන්න ලැබුණේ ඇවිල්ලා මේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ. එතකොට අපිත් මේ සම්බන්ධව දුර්වලයි කියන දේ තමයි මමත් කියන්නේ. එතකොට අපි එතනදී දෙවටගහ පල්ලියේදී සංවිධානයක් මත මේක සාකච්ඡා කරනකොට තමයි මේ පොත් සම්බන්ධව අපිට දැන ගන්නට ලැබුණේ. මමත් ඉතිං මේ පොත ගිහිල්ලා මගේ මුදලින් මිලදී ගත්තා මේකේ මොකද්ද තියෙන එක බලන්න.

ප්‍ර : මොනවද තියෙන්නේ මේකේ?

පි : එතකොට මේකේ තියෙනවා මේ අපි කියපු සංවිධානවල්වල පුද්ගලයන් ගැන, චරිතාප්‍රදාන.

ප්‍ර : කවුද?

පි : ඒ කියන්නේ ඉමාම් මොහොම්මදු ඉක්බාල් අබ්දුල් වහාබ්. එතකොට එයා තමයි වහාබ්වාදයේ පියා. ඊට අමතරව මවුලානා සෙයියත් අබුල් අවුලා මවුලුවදී රහුමතුල්ලා කියලා. එයා තමයි ජමාතේ ඉස්ලාම් සංවිධානය බිහි කළේ දකුණු ආසියානු රටවල්වල. ඊළඟට තියෙනවා ඉමාම් හසනුල් බන්නා. එයා තමයි ඉහුවාන් මුස්ලිම් කියන සංවිධානයේ ඊජිප්තුවේ ඇති කරපු එක්කෙනා. එතකොට මේ පොත්පත් කියවන්න, දැන් මෙයාලා ඉමාම් හසන්නුල් බන්නා ගැන විතරක් කියලා නිකම් ඉන්නේ නැහැ. ඊට පස්සේ ඊට ආපු උප සංස්කෘතිය ගැනත් මේ ළමයි ඉගෙන ගන්න ඉඩ තියෙනවා. එතකෙට ඒ සම්බන්ධව තියෙන ලංකාවේ තියෙන සංවිධානත් එක්කත් සම්බන්ධ වෙන්න ඉඩ තියෙනවා. එතකොට මේවාට පොළඹවන්නේ රජයේ වියදමින්. එතකොට රජයේ වියදමට මේකට නලීමියලා, බේරුවල ජාමියා නලීමියා එකේ අධ්‍යාපනය ලබපු, බේරුවල ජාමියා නලීමියා පාරම්පරික නලීම් හාජ්ජියාර් ඒක හැදුවේ පූජකයන්, පිරිවෙන් අධ්‍යාපන වගේ තියෙන පූජක අධ්‍යාපනය තුළින් එන පූජකයන් වෘත්තීමය අධ්‍යාපනයකින් එළියට එන්න ඕන කියන එක. ඒ

FAIR COMMENT BY JEZEEM

ගැන සාමාන්‍යයෙන් බෞද්ධ ජනතාව අතර හෝ කවුරුහරි අතර මතයක් තියෙනවා පූජකයා කියන ලෙබ්බේ කියන්නේ මස් මරන්නෙක් කියලා. එතකොට ඒ පුද්ගලයා සාමාන්‍යයෙන් ඒ කියන්නේ සමාජය තුළ මම කියන්නේ බුද්ධිමත් සමාජය තුළ නෙමෙයි, සාමාන්‍යයෙන් Grass Root Level එකේ. එතකොට ඒ වගේ කථා කරන තත්ත්වයක් තුළ ඒ පූජක අධ්‍යාපනය වෙනස් කරන්න ඕන කියලා බේරුවල ජාමියා නලීමියා එකේ මට දන්න විදියට ...,

ප : අපි ඔය පොත ලකුණු කරලා ඉතුරු ටික කියමු වැඩිදුරටත්. ඔව් කියන්නකෝ?

පි : එතකොට බේරුවල ජාමියා නලීමියා එක පටන් ගන්නකොට හිටියේ ඇවිල්ලා බුරුහාම්ඩීන් මවුලවීවරයා සහ මවුරුෆ් මවුලවීවරයා. මවුරුෆ් මවුලවීවරයා දැනට අභාවයට පත්වෙලා අවුරුදු නමයක් වෙනවා. බුරුහාම්ඩීන් මවුලවීවරයා දැනට මෑතකදී තමයි අභාවප්‍රාප්ත වුණේ. එතකොට ඒ පුද්ගලයන් තමයි මේක නලීම් හාජ්ජියාර් එක්ක එකතු වෙලා පටන් ගන්නේ. පසුකාලයේ ලිබියාවේ ගඩාෆි තමයි මේකට WICS කියන්නේ එයාගේ World Islamic Call Society කියන එකෙන් තමයි මේකට මූල්‍යාධාර නලීම් හාජ්ජියාර්ගේ මුදල්වලින් මේක හදනවා. පසුකාලයේදී මේකට රිංග ගන්නවා අන්තවාදීන්. ඔය කියන නලීම්වරුන්ගේ ආගමනය සිද්ධ වෙන්නේ එතනින් එහාට.

ප : ඒක විශ්ව විද්‍යාලයක් විදියට නේද යන්නේ ඒ ජාමියා නලීමියා?

පි : ඔව්. ඒක විශ්ව විද්‍යාලයට විදියට තමයි යන්නේ. එහෙන් අධ්‍යාපනය ලබලා විශ්ව විද්‍යාලයෙන් විභාග කරන විදියට තමයි ඒක හදලා තියෙන්නේ.

ප : අපි දැන් එතනට එමු. අපි ඉස්සර වෙලා ඔය පොත් දෙක ලකුණු කරමුද? මොකද ඒ පොත් මේ ගරු කොමිෂන් සභාවට නැහැ?

පි : හරි.

ප : එතකොට ඔබ කියන්නේ දැන් ඔය ඔබ පෙන්වන පොතේ නම මොකද්ද? ආයෙමත් නැවත කියන්න එම පොත් දෙකේ Part I and, Part I එකේ නම මොකද්ද?

පි : Part I එකේ නාලය නාහරීහම්.

ප : ඒ කියන්නේ මොකද්ද?

පි : අනාගත ශිෂ්ඨාචාරය නැත්නම් සංස්කෘතිය.

ප : අනාගත සංස්කෘතිය?

පි : ඔව්. අනාගත සංස්කෘතිය නැත්නම් ශිෂ්ඨාචාරය.

ප : කවුද ඒක ලියලා තියෙන්නේ?

FAIR COMMENT — BY JEZEEM —

පි : මොහොමඩ් අක්‍රම්.

ප්‍ර : ප්‍රකාශය කරලා තියෙන්නේ කවදද?

පි : Islamic Book House කියන ජමාතේ ඉස්ලාමීය සංවිධානය පොත් ප්‍රකාශ කරන ආයතනයෙන් තමයි ඒක ප්‍රකාශයට පත් කරලා තියෙන්නේ.

ප්‍ර : Islamic Book House එක ජමාතේ ඉස්ලාම් සංවිධානයේ නිල ප්‍රකාශකරුවොද?

පි : ඔව්. ඒගොල්ලන්ගේ ඇඩ්‍රස් එක තමයි මේ තියෙන්නේ මේ 77, ශ්‍රී වජිරාරාම මාවත, කොළඹ 09.

ප්‍ර : Publish කරලා තියෙන්නේ ඒ කියන්නේ ප්‍රකාශයට පත් කරලා තියෙන්නේ කවද්ද?

පි : ප්‍රකාශයට පත් කරලා තියෙන්නේ පෙබරවාරී 2013.

ප්‍ර : එතකොට දෙවෙනි, Part II එක?

පි : ඒකත් ඒ අදාළව නමින් තමයි තියෙන්නේ Part II කියලා. අදාළ කතුවරයාම තමයි. ප්‍රකාශයත් ඒ හා සමානයි. මෙතන තියෙන විශේෂත්වයක් ....,

ප්‍ර : දෙකේ වෙනස?

පි : රජයේ මේකක් තියෙනවා. කල්වි අමච්චි කියලා. අධ්‍යාපන අමාත්‍යාංශය රාජ්‍ය ලාංඡනය පවා මේකේ තියෙනවා.

ප්‍ර : ඔය පොත් දෙකේම රාජ්‍ය ලාංඡනය ....?

පි : මේකේ රාජ්‍ය ලාංඡනය මට දකින්නට ලැබුණේ නැහැ.

ප්‍ර : Part I එකේ නැහැ.

පි : Part I එකේ නැහැ. Part II එකේ තියෙනවා.

ප්‍ර : Part II එකේ රාජ්‍ය ලාංඡනය තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : අධ්‍යාපනය අමාත්‍යාංශය කියලා තියෙනවා?

පි : තියෙනවා. ඒක 2018 කියලා තමයි තියෙන්නේ.

(ස්වාමීනි අවසර පතනවා නාලය නාහරිගම් පළමුවන කොටස කතෘ මොහොමඩ් අක්‍රම් ඉස්ලාමික් පොත් ප්‍රකාශකයින් විසින් 2013 පෙබරවාරී මස ප්‍රකාශයට පත්කොට ඇති එම පොත IAKR-04(a) වශයෙනුත්, එහි දෙවන කොටස IAKR-04(b) වශයෙනුත්, එම IAKR-04(b) හි රාජ්‍ය ලාංඡනය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් එයට අනුග්‍රහය තිබෙන බව දැක්වෙන කොටස IAKR-04(b)(i) වශයෙන්
ලකුණු කොට ඉදිරිපත් කිරීමට)

President's Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප : වෙන මොනවද අධ්‍යාපනය සඳහා යොදාගනු ලබන පොත් ගැන ඔබ කරලා තියෙන නිරීක්ෂණ?

පි : පොත් ගැන මා දැනට මේක විතරයි මගේ නිරීක්ෂණයට මේවා වුණේ.

ප : හා. කමක් නැහැ. එතකොට දැන් මුස්ලිම් ජන කොට්ඨාශයේ කාන්තා හා පුරුෂ කියලා තියෙනවනේ අනෙක් ජන කොට්ඨාශ වගේම. එතකොට ඒ අයට සම අධ්‍යාපනයක් ලැබෙනවද?

පි : සම අධ්‍යාපනයක් ලැබෙනවා. ඒ කියන්නේ සාමාන්‍යයෙන් ලංකාවේ සංස්කෘතිය තුළ සාමාන්‍යයෙන් ගැහැණු ළමයට ඉස්සර කාලයේ අධ්‍යාපනය කියන දේ පොඩ්ඩක් අඩුවෙන් තමයි තිබුණේ. පසු කාලයේදී ලංකාවේ අධ්‍යාපන මට්ටම දිහා සළකලා බලනවා නම් ලංකාවේ ඉන්න මුස්ලිම් කාන්තාවන්ගේ අධ්‍යාපනය ශීඝ්‍ර වර්ධනයවීමක් වර්තමානයේදී තියෙනවා පිරිමින්ගේ අධ්‍යාපනයට වඩා. ඒ කියන්නේ විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමේ ප්‍රවණතාවය පවා කාන්තාවන්ගේ සම්භාවිතාවය තමයි වැඩි වෙලා තියෙන්නේ. ඒ නිසා ලංකාවේ මුස්ලිම් ජනතාවගේ කාන්තා අධ්‍යාපනය ඉහළ මට්ටමක පැවැත්වෙනවා කියන එක තමයි මගේ අදහස.

ප : නමුත් දැන් ඔය ඔබ කිව්වනේ ඉස්ලාම් අන්තවාදී අදහස් දරන කණ්ඩායම් ලංකාවේ ඉන්නවා කියලා?

පි : ඔව්.

ප : ඒ අනුව ඒ කාන්තාවන්ට අධ්‍යාපනය සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් ඇති වෙලා තියෙනවද?

පි : ඔව්. ප්‍රශ්නයක් ඇති වෙලා තියෙන නිසා තමයි ඒ සමහරක් අන්තවාදී කණ්ඩායම් කරන්නේ මොන වගේ ක්‍රියාවක් වුණත් ඒගොල්ලන්ව අරාබි පාසල් සහ මද්‍රසා පාසල් කියන අධ්‍යාපන රාමුව තුළට ඇදා ගන්නවා. ඒ කියන්නේ ඇවිල්ලා පාසල් අධ්‍යාපනය තුළ සමහරක් මිශ්‍ර පාසල් තියෙනවා මුස්ලිම් පාසල්වලත්. ඒ මිශ්‍ර පාසල් සංස්කෘතිය තුළ කාන්තාවන්ට විනය පිළිබඳව සහ යම්කිසි ප්‍රශ්න තිබෙන නිසා ඒගොල්ලන් ඇවිල්ලා මද්‍රසා සහ අරාබි පාසල් අධ්‍යාපනයට යොමු කරන්න ඕන කියන ප්‍රවණතාවයක් තියෙනවා. ඒ ප්‍රවණතාවය මත මුහුණු වසාගෙන අධ්‍යාපනය ලබන පිරිසුත් ඉන්නවා. මුහුණු වසන නොවන විදියට අන්තවාදී මත දරන මද්‍රසා අරාබි පාසලුත් තියෙනවා.

ප : එතකොට දැන් සාමාන්‍යයෙන් ලංකාවේ ඔබ දන්නවද මද්‍රසා කියන්නේ පාසල්නේ?

පි : ඔව්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : පාසල් කීයක් විතර තියෙනවද කියලා මුස්ලිම් ජන කොට්ඨාශයේ දරුවෝ ඉගෙන ගන්න?

පි : ඒ කියන්නේ අන්තවාදී විදියට අදහස් දරන පාසල් ගැන පොඩ්ඩක් කථා කරලා තමයි මට ඒක කියන්න පුළුවන්.

ප්‍ර : හොඳයි. කමක් නැහැ කියන්න?

පි : මට නිල සංඛ්‍යාලේඛන මට දන්නේ නැහැ.

ප්‍ර : ඔබ කියන ආකාරයට, ඔබ දන්න ආකාරයට අන්තවාදී අදහස් දරන ඒ මද්‍රසා පාසල් කීයක් තියෙනවද? කොහේද තියෙන්නේ?

පි : පුත්තලමේ තියෙනවා.

ප්‍ර : නම?

පි : ඉස්ලාහියා කියලා. ඉස්ලාහියා ගැහැණු. වෙන මාවනැල්ලේ තියෙනවා අයිෂා සිද්දිකා කියලා. ඒ වගේ ඒ දෙක තමයි මට දන්න විදියට ප්‍රධාන දේවල්. ඒ කියන්නේ ඒ එකක් ඇවිල්ලා ජමාතේ ඉස්ලාමි සංවිධානයට අයත් එකක් ඉස්ලාහියා කියන දේ. ඉස්ලාහියා අරාබි විද්‍යාලයේ මුල් කාලීන විදුහල්පති ඒ කියන්නේ නදීර් මවුලවී. එතුමත් NETH FM බැලුම්ගල හරහා සම්බන්ධ වෙලා ඒ අන්තවාදය ඉගැන්වීම් ගැන සඳහන් කළා. එතුමාගෙනුත් ප්‍රකාශයක් මෙහි ලබාගෙන තියෙනවද මම දන්නේ නැහැ. එතුමා තුළින් ඉතාම වැදගත් දේවල් අනාවරණය වෙලා තිබුණා NETH FM බැලුම්ගල වැඩසටහන තුළින්.

ප්‍ර : එතුමාගේ නම නැවත කියන්න පුළුවන්ද ඔබට?

පි : නදීර් මවුලවී.

ප්‍ර : NETH FM බැලුම්ගල නේ?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔය පාසල් නියාමනය කරනවද මුස්ලිම් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින්.

පි : ඒක අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ නිසා මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශයෙන් නෙමෙයි මම කියන්නේ අරාබි වගේ දේවල් නියාමනය කරන්නේ නැහැ. ඔහේ ලියාපදිංචි කරන්න දීලා ඔහේ ඉන්න එක තමයි මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශයේ ක්‍රියා පටිපාටිය වෙලා තියෙන්නේ.

ප්‍ර : දැන් එම පාසල් සාමාන්‍යයෙන් සමාගම් විදියටද ලියාපදිංචි කරන්නේ?

පි : සමහරක් ඒ කියන්නේ සමාගම් විදියට ලියාපදිංචි කළත් ...,

ප්‍ර : සමාගම් පනත යටතේද ඔවුන් ලියාපදිංචි කිරීම කරන්නේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. සාමාන්‍යයෙන් ඒ විදියට ලියාපදිංචි කරපු ඒවත් තියෙනවා. ඒ වුණාට මොන ක්‍රියාදාමය හරහා ලියාපදිංචි කළත් ඒගොල්ලන්ගේ නිල භාවය සහ ආගමික සහතිකය ලබා ගන්න ඔවුන් මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශයෙන් සහතිකයක් ඔවුන් ලබා ගන්නවා. ලියාපදිංචි සහතිකයක්.

ප්‍ර : එම පාසල්වල දේශන පැවැත්වීමට විදේශයන්ගෙන් අන්තගාමී අදහස් දරන අය ලංකාවට පැමිණෙනවද කියන එක ගැන ඔබ කියන්න දන්නවද?

පි : ඔව් අනිවාර්යයෙන්ම ඇවිල්ලා තියෙනවා. ඇවිල්ලා දේශන පවත්වලා සමහර කට්ටිය ගිහිල්ලත් තියෙනවා.

ප්‍ර : එවැනි පුද්ගලයින් කවුද කියලා ඔබට නම් කරන්න පුළුවන්ද?

පි : නම් කරන්න නම් බැහැ. එවැනි දේවල් සිද්ධ වෙලා තියෙනවා කියන දේවල් පසුගිය පාස්කු ප්‍රහාරයේ සිද්ධි දාමයෙන් පස්සේ සමහරක් කට්ටිය ආගමන විගමන ප්‍රශ්න කිරීම් මත ලංකාවෙන් පිටත් කර හැරියයි කියන එක මම දැන ගත්තා ජනමාධ්‍ය තුළින්.

ප්‍ර : එහෙම නම් දැන් ඔබ කිව්වනේ ඔය යම් යම් මතිමතාන්තර ලංකාවේ තියෙනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් ඔබ දන්නවද මොන මොන රටවල්වලින්ද ඒ අය ඇවිල්ලා තියෙන්නේ ලංකාවට කියන්න?

පි : දකුණු ඉන්දියාවෙන් ඇවිල්ලා තියෙනවා. වෙන අරාබිවල සෞදි අරාබියාවේ ඉඳලා ඇවිල්ලා තියෙනවා. ඊජිප්තුවේ නම් සාමාන්‍යයෙන් එන්නේ නැහැ. ඊජිප්තුවේ තියෙනවා අල් හසාර් කියලා විශ්ව විද්‍යාලයක්. ඒක පාරම්පරික විශ්ව විද්‍යාලයක්. ඥාණසාර හාමුදුරුවන්ගේ ප්‍රකාශයෙන් පස්සෙත් ඊජිප්තුවෙනුත් ඒ සම්බන්ධව ලංකාවේ අන්තවාදය සම්බන්ධව තමන් උදවු කරන්න කැමතියි කියලා මාධ්‍ය තුළින් ඇවිල්ලා තිබ්බා.

ප්‍ර : ප්‍රකාශයට පත් කරලා තිබ්බා?

පි : ප්‍රකාශයට පත් කරලා තිබ්බා. ලංකාවේ අධ්‍යාපනයටත් ඒ විශ්ව විද්‍යාලය හරහා සම්බන්ධ කර ගන්නවා නම් තමයි වඩා හොඳයි කියලාත්, ඒ තුළින් ලංකාවේ අන්තවාදය මුලිනුපුටා දමන්න පුළුවන් කියලත් මගේ විශ්වාසය.

ප්‍ර : දැන් ඔය මුස්ලිම් ජන කොට්ඨාශය තුළ මේ ආගම නිසා ඇති වෙලා, ඒ කියන්නේ ආගමේ බෙදීම් නිසා ඇතිවෙලා තියෙන යම් යම් මතිමතාන්තර, පුද්ගලයින්ගේ හිත් නොහොඳවීම්, ඔවුන්ගේ සාමාන්‍ය ජන ජීවිතයට ඇතිවන බාධාවන් මේ සියල්ලම ඔබේ උලමා සභාවට විසඳන්නට බැරිද?

FAIR COMMENT — BY JEZEEM —

පි : උලමා සභාව විසඳන්නේ නැහැ. මොකද උලමා ....,

ප්‍ර : ඇයි ඒ? කවුද මේ උලමා සභාව කියන්නේ?

පි : උලමා සභාව ඇවිල්ලා ලංකාවේ පාරම්පරික මුස්ලිම් ප්‍රජකයන් විසින් බිහි කරපු සංවිධානයක්. මගේ මතකයට අනුව 1924 දී කළේ. එතකොට ඒ උලමා සභාව 1980, 90, 90 ගණන්වලදින් පස්සේ දියාරු වෙලා යනවා.

ප්‍ර : ඇයි ඒ?

පි : දියාරු වෙලා යනවා කියන්නේ ඒ පාරම්පරිකයන්ගේ අතින් දියාරු වෙලා යනවා.

ප්‍ර : කොහොමද ඒ වගේ ආක්‍රමණශීලීභාවයක් ඇති වුණේ අනිත් අය උලමා සභාවට ඇවිල්ලා ඔබ කියන විදියට?

පි : ආර්ථිකය තමයි ප්‍රධාන ප්‍රශ්නය.

ප්‍ර : මොකද ආර්ථිකය කොහොමද බලපාන්නේ ඒකට?

පි : ආර්ථිකය කියන්නේ යම්කිසි සමිති සමාගම් පිහිටුවගෙන යනකොට ඒකට සාමාන්‍යයෙන් ඒවල තියෙන Maintains and ඒ වල නඩත්තුව, ඒ වල ශාඛාවේ සිදුවීම්වලට සම්බන්ධව ගොඩාක් දේවල් වෙනකොට ආර්ථික ප්‍රශ්න එනවා. එතකොට එක්කෙනෙක් දෙන්නෙක් ඒ තුළට රිංගනවා. රිංගලා ඒ ආර්ථිකමය බලපෑම් මත ඒක ඩැහැ ගන්නවා.

ප්‍ර : දන්නේ නැති නිසයි අහන්නේ. උලමා සභාවට දැන් ඔබ කිව්වනේ 1990 ගණන්වල වගේ තමයි ඔය දියාරුවීම පටන් ගත්තේ කියලා. එතකොට 1924 ඉඳලා 1990 ගණන් දක්වා වූ මේ ලොකු කාලය තුළදී කොහොමද උලමා සභාවට පැවැත්ම සඳහා අවශ්‍ය මුදල් ලැබුණේ?

පි : ඒ පිළිබඳව මට දැනීමක් නැති වුණාට කලීල් කියලා අර හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් එක්සත් ජාතික පක්ෂයේ ඩොක්ට එම්.සී. කලීල් කියලා මම හිතනවා. එතුමාගේ ඉස්පිරිතාලයක් තියෙනවා මරදාන ප්‍රදේශයේ. ඊට යාබඳව තියෙනවා අබ්දුල්ලා ගොඩනැගිල්ල කියලා ගොඩනැගිල්ලක්. එතුමා විසින් ඒ උලමා සභාවට තමන්ගේ දෙවෙනි තට්ටුව නොමිළයේ ලබා දීලා තිබුණා. පසුකාලයේදී තමයි අර ජිනීවා වලදී යම්කිසි දේවල් ලංකා ආණ්ඩුව වෙනුවෙන් උලමා සභාව පෙනී හිටපු නිසා ඔවුන්ට ලැබුණා මිහිඳු මාවතේ තැනක් නාගරික සංවර්ධන අධිකාරියේ. එතන යම් යම් අවට ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න මත එතන ඔවුන්ට ඒක කරන්න බැරි වුණා. දැන් ඔවුන් ඇවිල්ලා මාළිගාවත්ත ප්‍රදේශයේ තියෙන නිවාස අධිකාරියට සම්බන්ධ ඉඩමක් මම හිතන්නේ බොහෝ දුරට. ඔවුන්ට ඉඩමක් ලැබුණා.

FAIR COMMENT BY JEZEEM

ඒ ඉඩමේ තමයි ඔවුන් වර්තමානයේදී ඉන්නේ. එතකොට උලමා සභාව අර මම කිව්වනේ 90 ගණන් වලදී පස්සේ දියාරු වෙනවා කියලා. ඒක මම දැන ගන්න ලැබෙන්නෙත් ඒකට ඓතිහාසික ලියවිල්ලක් තියෙනවා කොළඹ දෙවටගහ පල්ලියේ.

ප්‍ර : මොකද්ද ඒ ලියවිල්ල?

පි : එය රියාස් සාලි කියන දෙවටගහ පල්ලියේ පරිපාලන සභාවේ අසාත් සාලිගේ සහෝදරයා. එතුමා හරහා ඒ ලියවිල්ල මේ කමිටුවට ලබාගත යුතුයි කියලා මම හිතනවා. හේතුව ඒක ඓතිහාසික ලියවිල්ලක්. ඒකේ තියෙනවා, ඒ කට්ටිය කියනවා අපේ පාරම්පරික මුතුන්මිත්තන් වෙච්ච පූජකයන් කියනවා මේ උලමා සභාවට අන්තවාදය ආපු විදිය සහ මෙතනින් එහාට ඔවුන්ට කටයුතු කරගෙන යන්න බැහැයි කියන එක ඔවුන් ලියවිල්ලකින් ඓතිහාසිකව දීලා ගිහිල්ලා තියෙන්නේ.
හේතුව ඇවිල්ලා එයා ඇවිල්ලා ඒකේ පරිපාලන දායක සභාවේ ඉන්නවා දෙවටගහ පල්ලියේ, රියාස් සාලි. මම හිතන්නේ එයා තමයි සභාපති. ඒ දෙවටගහ පල්ලියේ පරිපාලන සභාවේ.

ප්‍ර : දැන් ඔබ කිව්ව විදියට ඔය ඔබ දන්නවා කියලා දැන් මට පේනවනේ ඔය උලමා සභාව ගැන. ඔබට කියන්නට පුළුවන්ද උලමා සභාවේ සාමාජිකයෝ කී දෙනෙක් ඉන්නවද කියලා?

පි : ඔවුන් කියනවා 7000-10000 ක් අතර සාමාජිකයන් දැනට ඉන්නවා කියලා උලමා සභාවේ. ඒ කියන්නේ ඒකේ වැඩිපුරම ඉන්නේ තබ්ලික් මත දරන සාමාජිකයන්. ඔවුන්ගේ Net work එක හරි ප්‍රභලයි ලංකාවේ. ඒ කියන්නේ Grass Root Level එකේ වැඩ කරන සංවිධානයක් තමයි තබ්ලික් ජමාත් සංවිධානය කියන්නේ බිම් මට්ටමින්.

ප්‍ර : මම ඔය සංවිධානවලට වෙන වෙනම එනවා. දැන් ඉස්සරලා අපි උලමා සභාවේ ඔබ කියන්න, කෙටියෙන් කියන්න කවුරු කවුරුද ඉන්නේ කියලා. දැන් ඔබ කිව්වනේ 7000 ක් 8000 ක් පමණ සාමාජිකයෝ ඉන්නවා කියලා. එතකොට දැන් ඕකේ යම් මණ්ඩලයක් ඉන්නවාද. ඔය 7000, 8000 ටම පාලනය කරන්න බැහැනේ?

පි : බැහැ.

ප්‍ර : එතකොට ඒ සඳහා පාලනය ගෙන යන්නට පුළුවන් යම් මණ්ඩලයක් ඉන්නවද?

පි : ඔව්. ඒ කියන්නේ ඒගොල්ලන්ගේ සභාපති, ලේකම් ඒ වගේ භාණ්ඩාගාරික, නියෝජ්‍ය නායක, Executive Committee කියලා ඒගොල්ලන්ගේ කණ්ඩායමක් ඉන්නවා. ඒ කණ්ඩායමේ මම

FAIR COMMENT — BY JEZEEM —

දන්න විදියට 2003 ඉඳලා දැනට වෙනකම් ඉන්නේ සභාපති වශයෙන් රිස්වි මුෆ්ති.

ප්‍ර : රිස්වි මුෆ්ති?

පි : මුෆ්ති.

ප්‍ර : ඔහු තමයි සභාපති?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබ අදි දින මෙම ගරු කොමිෂන් සභාවට සඳහන් කළා යම් යම් ආගමික මතවාදයන් දරන කණ්ඩායම් ඉස්ලාම් ආගම ඔය මුස්ලිම් ජන කොට්ඨාශයේ ඉන්නවා කියලා. එතකොට ඔය සභාපතිවරයා අයිති වෙන්නේ ඒවායින් මොන කොට්ඨාශයටද?

පි : සභාපතිවරයා අයිති වෙන්නේ තබ්ලික් නිකායට. නිකායක් නෙමෙයි සංවිධානයට. ඒක නිකායක් කියලා තමයි ඒගොල්ලන් ගැළවෙන්න බලන්නේ. අබ්දුල් රාසික් මේ මෙහෙට ඇවිල්ලා කමිටුවට ඇවිල්ලා උත්තර දීලා එළියට බහිනකොටත් කිව්වේ මේක නිකාය ප්‍රශ්නයක් කියලා.

ප්‍ර : ඒ මෙහේ නෙමෙයි වෙන කොහේ හරි?

පි : නැහැ. මම හිතන්නේ එළියේ එළියේ. එළියේදී මාධ්‍යට ප්‍රකාශය කරනකොට.

ප්‍ර : එතකොට ඒ තමයි රිස්වි මුෆ්ති?

පි : ඔව්.

ප්‍ර : වෙන කවුද ඉන්නේ?

පි : වෙන ඉන්නවා අගාර් මොහොමඩ් කියලා. එයා නලීමිවරයෙක්. එයා ජමාතේ ඉස්ලාම් සහ ඉහුහාන් මුස්ලිම් සහ අනෙක් එක ජමාතු සලාමා කියලා එකක් හදලා තියෙනවා එයා සාමය කියන නම දාලා . සලාමා කියන්නේ සාමය. ඒකේ සම්බන්ධ වෙච්ච එක්කෙනෙක්. අනිත් එක්කෙනා තාසිම් මවුලවී කියලා එක්කෙනෙක් ඉන්නවා. එයා අෂ්ෂබාප්. ඒ කියන්නේ Association of Ceylon Muslim Youth කියලා.

ප්‍ර : ඒ කියන්නේ වහාබ්වාදයට?

පි : වහාබ්වාදයට අදාළ.

ප්‍ර : ඔය තාසිම් මවුලවී පිළිබඳව ටිකක් පැහැදිලි කරන්න පුළුවන්ද? ඔබ ඒ ගැන දන්නවද?

පි : තාසිම් මවුලවී කියන්නේ සාමාන්‍ය මම හිතන්නේ මාවනැල්ලේ නැත්නම් හෙම්මාතගම පදිංචි පුද්ගලයෙක්. එයා කොළඹට ඇවිල්ලා සාමාන්‍ය ජන ජීවිතයක් යටතේ ඉන්නවා. හැබැයි එයාට ඇවිල්ලා මම ඉස්කෝලේ යන කාලේ ඔය ෂබාප් කියන

Presidential Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

සංවිධානය තිබ්බා. වාමී කියන සංවිධානයත් බොරැල්ල වගේ ප්‍රදේශයක තමයි තිබ්බේ. ටර්නර් රෝඩ් එකයි, තව රෝඩ් එකක් තිබ්බා ....,

ප්‍ර : ඔව්. ටර්නර් රෝඩ් එකෙන් මාරු වුණා ඊට පස්සේ නේද?

පි : ෆෙයාෆීල්ඩ් ගාර්ඩින්ද මොනවද එකක් තිබ්බා එතන. ඒක වෙන මහවිල උද්‍යානයට ඒගොල්ලන් ආවේ නැහැ. ඒගොල්ලන් ආවේ මාළිගාකන්දට. ඇවිල්ලා ඒගොල්ලන් ඒගොල්ලන්ගේ අරාබි අකුරුවලින් නෙමෙයි නම් දාලා තිබ්බේ ඔය ඒ.එස්.එම්.වයි. නමින් තමයි යන්නේ. ඉතිං එයා ඇවිල්ලා සාමාන්‍යයෙන් ඇවිල්ලා අරාබි රටවල්වලින් සල්ලි අරගෙන, ළිඳවල්, පල්ලි ඒ වගේ හදන වැඩපිළිවෙලවල් තමයි කරන්නේ.

ප්‍ර : අපි ඒ සංවිධානවලට එනකොට ඒ ගැන වැඩිදුර විස්තර ගමු පොඩ්ඩක් කෙටියෙන් දැනගන්නයි ඕන වුණේ. එතකොට නවුෆර් මවුලවී ඉන්නවද එතන?

පි : ඔව්. නවුෆර් මවුලවී.

ප්‍ර : නවුෆර් මවුලවී මොන නිකායට අයිතිද?

පි : එයා තවුහිද් වහාබි සම්බන්ධ එක්කෙනෙක්.

ප්‍ර : සලෆි නෙමෙයිද?

පි : සමාවෙන්න. හරි සලෆි.

ප්‍ර : සලෆි නේද?

පි : ඔව්. වහාබ්වාදයේ දැඩි මතවාදයෙන් එන කට්ටිය තමයි සලෆි කියන්නේ. මේ පොත ලියපු කට්ටිය.

ප්‍ර : දැන් ඔබ කිව්වනේ 1990 ගණන්වල තමයි දැන් මේ අය මේකට ඇවිල්ලා ඔවුන් ප්‍රභල විදියට එහි කටයුතු කරන්න පටන් ගත්තේ කියලා. එතකොට අර සම්ප්‍රදායික මුස්ලිම් ජන කොට්ඨාශයේ නියෝජනයට මොකද වුණේ?

පි : ඒගොල්ලන් ඇවිල්ලා සාමාන්‍යයෙන් සම්ප්‍රදායික මුස්ලිම්වරුන් අතර තියෙනවා ඔවුන්ගේ අර සූෆි ලැදිභාවය මත සටන් කරන්න යන්නේ නැහැ. ඕන දෙයක් Give up කරලා.

ප්‍ර : ඔබ සූෆිද?

පි : මම අපේ පරම්පරාව සූෆි මතවාදය කියන්නේ ඇවිල්ලා පාරම්පරික මතවාද වෙච්චි, පොෂණය වෙලා.

ප්‍ර : මොන පරික්කාවටද ඔය අයිති වෙන්නේ?

පි : එහෙම නෙමෙයි අපේ තාත්තා තමයි වැඩියෙන්ම ලබ්දි. මම සාමාන්‍ය මට්ටමට ඒකට අනුගත වෙලා ඉන්නේ. ඒ කියන්නේ දැඩි මතධාරීන් විදියට නෙමෙයි ඒකට අනුගත වෙලා ඉන්නේ.

Presidential Secretariat Copy
FAIR COMMENT — BY JEZEEM —

ඒක සාමකාමී විදියට Practice කරන තැනක් නිසා මමත් ඒකට අනුගත වෙලා ඉන්නේ.

ප්‍ර : එතකොට දැන් මම මේ ඔබෙන් විමසමින් සිටියේ අර පාරම්පරික මුස්ලිම් ජන කොටඨාශය කොහොමද ගිලිහුණේ කියලා උලමා සභාවෙන්?

පි : ඒ තමයි මම කිව්වේ අර ඒගොල්ලන්ගේ බලය වෙනුවෙන් සටන් කිරීමක් කෙරෙන්නේ නැහැ. ඒගොල්ලෝ ඇවිල්ලා සූෆි කියන්නේ සාමාන්‍යයෙන් අධ්‍යාත්මික, සාමකාමීයි. ඔය කැලෑවට ගිහිල්ලා තපස් රකිනවා ....,

ප්‍ර : ඔවුන් භාවනා කරමින් ඉන්න කට්ටියක්ද?

පි : ඔව්. ඒ ගණයට අයිති කට්ටියක්. වෙන දාන මානය දේවල් කරනවා, පල්ලිවල දාන දෙනවා. ඒ කියන්නේ දැන් කයීන පිංකම වගේ කතෝලික කට්ටියගේ තියෙනවනේ Feast කියලා එකක්. හින්දු කට්ටියගේ තියෙනවා තේර්තිරුවිලා කියලා. ඉතිං මුස්ලිම් කට්ටියගේ තියෙනවා Feast කියලා එකක් කන්දූරි කියලා. එතකොට ඒ වගේ දේවල් තමයි ඒගොල්ලන් කරගෙන ඉන්නේ. ඒ කියන්නේ පරණ පූජකයන්ව සිහි කරලා, පරණ ඉස්ලාම් දහමට සම්බන්ධ වෙච්ච, ඉස්ලාම් දහම පෝෂණය කරපු ඒ මිනිස්සුන්ගේ දාන මාන කරන වැඩවලට තමයි ඔවුන්ගේ මේ මනෝභාවය තියෙන්නේ. එතකෙට මේ සංවිධාන සටන් කරලා ගන්න ඕන. පල්ලි පවා ගිලිහුණේ ඒ මත තමයි.

ප්‍ර : ඒකනිසා වැඩිය සාමකාමී වෙන්න ගිහිල්ලා තමයි ඔබ කියන්නේ ඒක සිද්ධ වුණේ?

පි : ඔව්. අනිත් එක ඔවුන් පොලීසිවලට ගිහිල්ලා පැමිණිලි කළාට ඔවුන්ට එතනින් අගතියක් වුණා හැරෙන්න සාමාන්‍යයෙන් යම්කිසි දෙයක් සිද්ධ වුණේ නැහැ.

ප්‍ර : එතකොට ඔය දැන් තියෙන විදියට ප්‍රධාන කාර්යාලයේ උලමා සභාවේ තියෙන්නේ කොහේද?

පි : දැන් තියෙන්නේ මාළිගාවත්ත ප්‍රදේශයේ, ජයන්ති වීරසේකර මාවතේ.

ප්‍ර : එතකොට මේ කාත්තන්කුඩියෙත් තියෙනවද උලමා සභාවක්?

පි : ඔව්. දැන් කාත්තන්කුඩියේ තියෙනවා ....,

ප්‍ර : එහෙම තියෙන්න පුළුවන්ද තැන් තැන්වල උලමා සභා?

පි : මේ උලමා සභාවේ Branches තියෙනවා ලංකාව පුරාම.

ප්‍ර : ඒ කියන්නේ ප්‍රධාන උලමා සභාවේ ශාඛාවන් තියෙනවා හැමතැනම. ඒකයි ඔබ කියන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : හැබැයි ඒ ශාඛාවන් කොහේවත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ කියන්නේ නිකම් නාමිකව තිබ්බට එයලා Position වල හිටියට ඒවල Letter Head යොදාගෙන ඒගොල්ලන් කටයුතු කරන්නේ නැහැ. හැබැයි මේ උලමා සභාවේම ශාඛාවක් තියෙනවා ගාල්ල.

ප්‍ර : ගාල්ලේ?

පි : ගාල්ල උලමා සභාව. ඒක තියෙන්නේ පාරම්පරික සහ සූෆි කට්ටියගේ අතේ. ඒක විතරයි දැනට එහෙම තියෙන්නේ.

ප්‍ර : ඒක ක්‍රියාකාරීද?

පි : ඒක ක්‍රියාකාරියි. ඒකේ මොහොමඩ් මවුලවී කියලා පුද්ගලයෙක් හිටියා වයසකම එක්කෙනෙක්. එතකොට එතුමාත් වර්තමානයේ හිටපු කථානායකතුමාව කරු ජයසූරිය මහත්මයාව මුණගැහිලා කියලා තිබ්බා ජාමියා නලීමියා සම්බන්ධව විශේෂ ප්‍රකාශයක් නිකුත් කරලා තිබ්බා. එතකොට එයා තමයි එහේ මම හිතන්නේ ලේකම් නැත්නම් සභාපති.

ප්‍ර : ඔබ දන්නවද කරු ජයසූරිය, හිටපු කථානායකතුමාව මුණ ගැහුණේ මොහොමඩ් මවුලවී මැතිතුමා කොයි කාලයේද කියලා?

පි : ඒ කියන්නේ අර පාස්කු ප්‍රහාරයෙන් පසුව මම හිතන්නේ අර Crisis එකකට පස්සේද. මට හරියට මතක නැහැ. හැබැයි පාස්කු ප්‍රහාරය සිද්ධියෙන් පස්සේ තමයි මුණ ගැහුණේ.

ප්‍ර : ඉතිං ඒකේ වැදගත්කම මොකද්ද? මොකද්ද කථා කරලා තියෙන්නේ?

පි : කථා කෙරුවේ ඇවිල්ලා බේරුවල ජාමියා නලීමියා සම්බන්ධව තමයි කථා කළේ.

ප්‍ර : දන්නවද ඔබ ඒකේ තොරතුරු?

පි : ඒකේ තොරතුරු ඒ කියන්නේ ජනමාධ්‍ය හරහා එතුමා කියලා තිබ්බා ඇවිල්ලා ඒ පූජකවරයා පාරම්පරික මේකේ උගන්වන දේවල් පාරම්පරික නැහැ කියලා. ඒ කියන්නේ මේ ආයතනයේ විනාශයට නෙමෙයි එතුමා කථා කළේ. ඒ කියන්නේ ආයතනය වහලා දාන්න හෝ එහෙම නෙමෙයි. ඒකේ තියෙන ප්‍රතිපත්ති සහ ඒකේ තියෙන Syllabus වෙනස් කරලා ඒක හරි මාර්ගයට ගන්න කියන එක තමයි එතුමාගේ මේකේ තිබ්බේ. හැබැයි එතුමාට ඊට පස්සේ ලොකු බලපෑමක් තිබ්බා මම දන්නා තරමින්.

ප්‍ර : කොහෙන්ද ආවේ?

පි : ඒ සමාජය තුළ ලොකු ප්‍රතිරෝධයක් ආවා. ඒ කියන්නේ සමාජය ...,

ප්‍ර : මොන පැත්තේ සමාජයෙන්ද ඒ ප්‍රතිරෝධය ආවේ?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : දැන් මෙතන ඉස්ලාම් මවුලවීතුමා කිව්වා වාගේම මිනිස්සු කියන්නේ හරි දෙයක් කිව්වොත් ඒක පාවා දීමක් කියලා. හරි දෙයක් කීම පාවා දීමක් වෙන්නේ නැහැනේ. එතකොට ඒකේ සමාජයේ අර්ථකථනය කරන්නේ යම්කිසි කෙනෙක් ගිහිල්ලා මුස්ලිම් සමාජයේ දෙයක් ගිහිල්ලා කිව්වොත් ඒක පාවා දීමක් කියලා. දැන් අපි බලන්නේ මෙතන රහසිගතව හෝ යම්කිසි මට්ටමක කරන්න ප්‍රධානම හේතුව මේක සමාජයට අපි යන්න අමාරුයි.

ප්‍ර : ඔව්?

පි : ඒ තරමටම සමාජය අධ්‍යාපනය ලබලා තියෙන්නේ සහ ඒගොල්ලන් දැනගෙන තියෙන කරුණු වෙනස්. ඒගොල්ලන් දැනගෙන නැහැ මේ වගේ කරුණු. ඒගොල්ලන් උඩින් දැනගත්තු දේ දැනගෙන මේක මොකටද මෙයාට අවශ්‍ය වැඩක්ද මෙයාට අනවශ්‍ය දෙයක්නේ. මොකද අපි අතරේ තියෙන ප්‍රශ්න අපි අතරේ තියාගෙන Cancer එකක් වගේනේ කරන්න බැහැනේ. එතකොට ඒක සුව කරන්න කියලා සමාජය හිතන්නේ නැහැ. ඒගොල්ලන් බලන්නේ මේක පාවා දීමක් කියලා එයාව කොන් කිරීම. ඊට පස්සේ එතුමා එතනින් පස්සේ නිහඬ වුණාද මොකද්ද දන්නේ නැහැ. එතුමාගෙනුත් මේ සම්බන්ධව, ඒ කියන්නේ එතුමා ලොකු භූමිකාවක්නේ ගාල්ල උලමා සභාවේ නායකයා හෝ ලේකම්නේ.

ප්‍ර : ඔව්?

පි : එතකොට ගාල්ලෙත් සිද්ධ වුණා ගොඩාක් දේවල්. එතකොට වහාබ්වාදය සම්බන්ධ දේවල්. එතුමාගෙනුත් අපිට වඩා වයසක මුහුකුරා ගියපු එක්කෙනෙක් නිසා අපට වඩා හසල දැනුමක් තියෙනවා කියලා මම හිතනවා. එතුමාගෙනුත් යම්කිසි සටහනක් ලබා ගත්තොත් හොඳයි කියලා මම හිතනවා.

ප්‍ර : අපි ගාල්ලේ ....?

පි : මට පුළුවන් උදව්වක් වශයෙන් මට පුළුවන් ඒකට යම්කිසි මැදිහත්වීමක් කරන්න. නොම්මරයක් එහෙම හොයලා.

ප්‍ර : අංකය එහෙම දෙන්න පුළුවන් නේද එතකොට. හා හොඳයි. බොහොම ස්තුතියි. එතකොට ඔබට අපට පැහැදිලි කරන්න පුළුවන්ද ....?

පි : අර කාත්තන්කුඩි උලමා සභාව ගැන මට පොඩ්ඩක් ....,

ප්‍ර : ආ ඔව්. කාත්තන්තුඩිය කිව්වේ නැහැනේ?

පි : ඔව්. කාත්තන්කුඩි උලමා සභාව ඇවිල්ලා මේ වගේ අනු ශාඛාවක් හෝ මේකේ කිසිම දෙයක් නැතුව ඒගොල්ලන් තනියෙන්ම

FAIR COMMENT BY JEZEEM

සංවිධානයක් හදවාගෙන ඒගොල්ලන් තනි ආධිපත්‍යයක් යටතේ කරන සංවිධානයක්.

ප්‍ර : එහෙම කරන්නේ කොහොමද?

පි : එහෙම කරන්න බැහැ. එහෙම කරන්න යනකොට ලංකාවේ ජන සමාජය තුළ තියෙන මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුව කියන්නේ නමට බෝඩ් ලෑල්ලක් දා ගත්තු සංවිධානයක්. දැන් ඒගොල්ලන් දන්නේ නැහැ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්ත්මේන්තුව කියලා තමයි ඒකේ නම තියෙන්නේ.

ප්‍ර : ඔව්?

පි : හැබැයි අනෙකුත් ආගමික කටයුතුවල නම් තියෙන්නේ ඇවිල්ලා ආගමට අනුව. බෞද්ධාගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුව, කතෝලික ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුව. එතකොට හින්දු ආගමික හා කියලා තමයි තියෙන්නේ.

ප්‍ර : මේක ඉස්ලාම් කියලා නැහැ?

පි : එතකොට මුස්ලිම් කියන දේ වෙන්න බැහැනේ. ඒක පවා ලංකාවේ හරි ගස්සන්න බැරි කොටසක් සහ ඇමති, මම හලීම් ඇමතිතුමාගේ මල්ලිටත් මේක කිව්වා. එතකොට මේක පවා වැරදියි. එතකොට ඒ වැරැද්දම හදා ගන්න බැරි දෙයක් තමයි අපිට වෙලා තියෙන්නේ. එතකොට මුස්ලිම් කියන දේ ආගමක් නෙමෙයි ඒක ජාතියක්. එතකොට මුස්ලිම් ආගමික කියන එක වෙන්න බැහැ. එතකොට දැන් ඒ වගේ ආයතනයකින් තමයි මේ වගේ දේවල් සිද්ධ වෙන්නේ. ඒගොල්ලන් බලන්නේ නැහැ නිකම් මුස්ලිම් සංවිධානය නමක්, ආගමක් මුල් කරගෙන සංවිධානයක් බිහි වෙනවා නම් ඒකට වගකිව යුතු ආයතනයක් වෙන්න ඕන මුස්ලිම් සංස්කෘතික ආගමික ආයතනය. ඒගොල්ලන්ට නිල බලයක් නැත්නම් ඒ නිල බලය සහ ඒ වගේ දේවල් තියෙනවා නම් ඒවා සංශෝධනය කරලා ලබා දෙන්න ඕන. එතකොට ඒක එවැනි දෙයක් මේ යන්න ඉඩ දීලා උලමා සභාව බලන් ඉන්න පුළුවන්. මොකද ඒගොල්ලන්ට කියන්න පුළුවන් මේක ලංකාව තුළ මෙහෙම ක්‍රියාත්මක වෙන්න පුළුවන්ද නැද්ද කියන එක මම දන්නේ නැහැ. එතකොට උලමා සභාව කියන්න පුළුවන් මේක එහෙම පුළුවන් නිසා ඒගොල්ලන් ක්‍රියාත්මක වෙනවා කියලා. එතකොට ඒගොල්ලන් ඒක මුල් කරගෙන කාත්තන්කුඩියේ ඉන්න රවුෆ් මවුලවීලාගේ කණ්ඩායමට ලොකු අකටයුතුකම් කරලා තියෙනවා. ඒ කියන්නේ ෆත්වා කියන ලේබල් එක යටතේ ආගමික ආඥා නිකුත් කරලා තියෙනවා. ඒ කියන්නේ සංඝ ආඥා වගේ.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : පුළුවන්ද දැන් උලමා සභාවට ඒ වගේ නීත්‍යානුකූලව ෆත්වා නිකුත් කරන්න. ඔබ දන්නවද ඒක?

පි : ඒගොල්ලන් ඇවිල්ලා දැන් ෆත්වා නිකුත් කරලා තියෙනවා ලංකාවේ ඉන්නවා කාදියානුවරු කියලා පකිස්ථානේ ඉඳලා ලංකාවට එන කට්ටිය. එතකොට ඒගොල්ලන්ට කාෆීර් කියලා ඒ කියන්නේ ඉස්ලාම් නොවන කියලා ෆත්වා එකක් දීලා තියෙනවා පකිස්ථානේ අප්‍රිකානු රටවල්වලින් ඇවිල්ලා රන්මුතු හොටෙල් එකේ. දැන් ඒක නැහැ. දැන් Hyatt Regency තමයි තියෙන්නේ කොල්ලුපිටියේ. එතකොට ඒකේ ෆත්වා එකක් නිකුත් කළා. එතකොට ඒගොල්ලන් එක්ක විවාහ කරන්න බැහැ. ගණුදෙනු කරන්න බැහැ එහෙම කියලා මීගමු ප්‍රදේශයේ ඒගොල්ලන්ට ෆත්වා නිකුත් කරලා තියෙනවා. මේ කාත්තන්කුඩි විතරක් නෙමෙයි එහෙත්. එතකොට ඒගොල්ලන් මුස්ලිම් ආගමේ තියෙන Practice වලින් එහාට ගිහිල්ලා තියෙනවා. අපි විශ්වාස කරන්නේ මොහොමඩ් නබිතුමා තමයි අවසාන දූතයා කියලා. ඒගොල්ලන් විශ්වාස කරන්නේ අර ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ Jesus Coming Soon කියලා බයිබල් කට්ටිය කියනවා වගේ ....,

ප්‍ර : ඊසා නබි විදියට?

පි : ඔව්. ඊසා නබි විදියට. ඒගොල්ලන් කියනවා ඊසා නබි එනවා කියලා ඒගොල්ලන්ගේ විශ්වාසයක් තියෙනවා. ඒ කට්ටිය තමයි අර පස්යාලේ ඔක්කොම ඉන්නේ. පකිස්ථානයෙන් ඒගොල්ලන්ට අගතියක් වෙනවා. ලංකාවේ දේශපාලන රැකවරණය පතා ඒගොල්ලන් ලංකාවෙත් ඉන්නවා. ලංකාවේ ජන කොට්ඨාශයකුත් ඉන්නවා ඒකට සම්බන්ධව. එතකොට ඒකටත් ෆත්වා නිකුත් කළා. එතකොට මම කියන්නේ මේ ෆත්වාවලින් තමයි දරදඬු විදියට පාලනය අරඹන්නේ.

ප්‍ර : උලමා සභාවේ?

පි : ඔව්. අපිටත් දැන් ෆත්වා එකක් නිකුත් කළොත් දැන් ලංකාව මුස්ලිම් රටක් නොවන නිසා ෆත්වා නිකුත් කරන්න බැහැ. නැත්නම් අපිටත් නිකුත් කරන්න පුළුවන්. නිකුත් කරලා ඒගොල්ලන්ට ඕන Weapons එක Use කරන්න පුළුවන්. එතකොට ඒක තමයි කාත්තන්කුඩි උලමා සභාවෙන් කරන්නේ සහ කළේ. එතකොට ඒගොල්ලන් එහේ තිබ්බා සාවියා කියලා පල්ලියක්. ඒ පල්ලියටත් කළා. දැන් මෙහේ කොවිඩ් නයින්ටීන් ....,

ප්‍ර : සාවියා?

පි : ඔව්.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : ඒ සාවියා පල්ලිය කොහේද තියෙන්නේ?

පි : කාත්තන්කුඩි.

ප්‍ර : කාත්තන්කුඩි?

පි : ඒ සාවියා පල්ලියේ තියෙනවා වත් පිළිවෙත් නවත්වන්නත් ඒගොල්ලන් ෆත්වා නිකුත් කළා ඒ සම්බන්ධව. එහේ තියෙන සාවියා පල්ලියේ එකේ කට්ටියත් ඒ සම්බන්ධව කථා කරලා තියෙනවා. ලංකාවේ මවුසාවියා කියන්නේ ඇවිල්ලා පල්ලි නෙමෙයි. පසු කාලයේදී ඒවා පල්ලි බවට පරිවර්තනය වුණා ඉඩ ප්‍රස්ථාව නැති නිසා. සාවියා සහ තක්කියා කියලා පල්ලි තියෙනවා පොඩි පොඩි පල්ලි. ඒ වල කළේ ඇවිල්ලා මොනවද ඒකට කියන්නේ භාවනා කටයුතු වගේ දේවල්. එතකොට ඒක පසු කාලයේදී භාවනා කටයුතු ඒකත් කරගෙනම පස්වෙල් නැමදුමක් ඒවල කළා. එතකොට ඒවා ඩැහැ ගත්තේ ඇවිල්ලා තබ්ලික් සම්බන්ධ වෙච්ච පිරිස් තමයි ඒ සාවියා පල්ලි ටික වැල්ලවත්ත, මාළිගාවත්ත ඒ වගේ රට පුරා තියෙනවා සාවියා පල්ලි. ඒකේ මව් පල්ලිය තමයි තියෙන්නේ උම්මුසාවියා කියලා එම්.ජේ.එම්. ලාෆිර් මාවත, කොළඹ 12. එතකොට ඒ එම්.ජේ.එම්. ලාෆිර් මාවතේ, කොළඹ 12 කියන ඒ සාවියා පල්ලියේ මූලස්ථානයේ දැනට සභාපති කවුද කියන එක මම දන්නේ නැහැ. ඒ වුණාට ඒ සභාපති හරහා ඒගොල්ලන්ගේ ලංකාව පුරා තියෙන සාවියා පල්ලිවලට සිදුවුණු අකටයුතුකම්, ඒ සම්බන්ධව මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ තියෙනවා පැමිණිලි, විභාග. ඒවට මොකද වුණේ කියන එකත් දැන ගන්න පුළුවන් ඇත්ත සිද්ධිදාමය. පොලීසිවලින් මේවට යම්කිසි වැඩපිළිවෙලක් දුන්නද නැද්ද. එතකොට ඒ උම්මුසාවියා කියන සංවිධානයෙන් මේ කමිටුවට පුළුවන් නම් මේ මම දැන් කියන දේ ඔක්කොම කමිටුවට පුළුවන්ද කියලා මම අහන්නේ වෙන මොකුත් හේතුවක් නෙමෙයි මේක අවසානයේදී හරි උත්තරයක් එන්න ඕන නිසා. එතකොට අර උම්මු සාවියා කියන ඒකේ සංවිධානයෙනුත් ඔහුත් රට පුරා තියෙන සාවියාවලට සිදු වුණු අසාධාරණ සහ කාත්තන්කුඩි සිද්ධියේදී සිදු වුණු අසාධාරණ සම්බන්ධයෙනුත් ප්‍රශ්න කිරීම් කරලා ඒකේ ඇත්ත සිද්ධිදාමය හොයා ගන්න පුළුවන්.

ප්‍ර : ඒක අපි කාටද කථා කරලා දැන ගන්න පුළුවන් වෙන්නේ?

පි : ඒකේ මහත්මයෙක් ඉන්නවා ෆවුසාන් අන්වර් කියලා.

ප්‍ර : ඔහුව අපිට සම්බන්ධ කර ගන්න පුළුවන්ද?

FAIR COMMENT
BY JEZEEM

පි : පුළුවන්. මම ඒ කියන්නේ සමහර සම්බන්ධකම්, ඒ කියන්නේ මම හරහා නොදුන් විදියට ඔබතුමන්ලාගේ ස්වේච්ඡාව මත ඒකෙන් ගත්ත විදියට තමයි ගන්න ඕන කියලා....,

ප්‍ර : ඔව්. නැහැ ඒසඳහා අවශ්‍ය පහසුකම් ඔබට සලසන්න පුළුවන්නේ අංකය ලබා දීල එහෙම?

පි : ඔව්. පුළුවන්.

ප්‍ර : හොඳයි. බොහොම ස්තුතියි. එතකොට අර කාත්තන්කුඩියේ ඔබ කිව්වනේ දැන් අර සාමාන්‍ය උලමා සභාවේ ශාඛා තිබුණට ලංකාවේ ගාල්ල උලමා සභාව ඒ ශාඛාව විතරයි ක්‍රියාත්මක වෙන්නේ සූෆි නිකායට අයිතිව. නමුත් අනිත් ප්‍රදේශවල ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ ඒ ශාඛාවල්?

පි : නැහැ. ඔව්.

ප්‍ර : ඒ වුණත් ඔබ කියනවා කාත්තන්කුඩියේ උලමා සභාව ඊට වඩා වෙනස්. ඔවුන් ස්වේච්ඡාවෙන් කටයුතු කරනවා. ඒ උලමා සභාව අර ප්‍රධාන උලමා සභාවේ අනු ශාඛාවක්ද?

පි : අනු ශාඛාවක් නෙමෙයි.

ප්‍ර : නෙමෙයි?

පි : නෙමෙයි.

ප්‍ර : ඉතිං එහෙම අනු ශාඛාවක් නොවී තමන්ට උලමා සභාව පිහිටුවා ගන්න පුළුවන්ද? ඒ සඳහා ප්‍රතිපාදන තියෙනවද?

පි : දැන් ඒ වගේ දේවල් ඔහේ යන්න දීපු නිසා තමයි ඔය UTJ, SLTJ කියන ඔක්කොම හතු පිපෙන විදියට ඔහේ පැලවෙන්න ඉඩ හැරලා බලාගෙන හිටියා මේ මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුව. කිසිම සමාජය තුළ මේ සම්බන්ධව මේ කොමිසමට තියෙන උනන්දුව පවා ඒගොල්ලන්ට තිබ්බේ නැහැ. මේ කොමිසම පවා, සහරාන් පවා බිහිවෙන්න නැති වෙන්න ඉඩ තිබ්බා ඒක හරියට ක්‍රියාත්මක වුණා නම්. ඒ කියන්නේ මේක මුස්ලිම් ජනතාවගේ ආයතනයක් වුණාට ඒක මේ රටේ බදු ගෙවන සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවගේ ආයතනයකින් නඩත්තු වෙන ආයතනයක්. එතකොට ඒවාට චේතනයක් ලබනවා නම්, පඩියක් ලබනවා නම් ඒ අනුව කටයුතු කළාද කියන එක, තමන්ගේ වගකීම මොකද්ද. එතකෙට රණ්ඩුවක් වුණහම ඒක Shape කරන එකද කරන්න ඕන, ඒක විසඳන එකද කරන්න ඕන කියන එක ප්‍රශ්නයක් තියෙනවනේ. එතකොට මේගොල්ලන් හැමදැම කළේ Shape කරන එක. Shape කිරීමෙන් මේ ප්‍රශ්නය නිවෙන්නේ නැහැ, ඒක එහෙමම තියෙනවා. එතකොට ඒ තුළින් තමයි

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ගොඩාක් පල්ලිවල ප්‍රශ්න ඇති වුණේ. ඔය බේරුවල ප්‍රශ්නය පවා ඇති වුණේ අර ඒ වල හේතු තමයි.

ප්‍ර : ඒ බේරුවල මොන ප්‍රශ්න ගැනද ඔබ ඔය කියන්නේ?

පි : අර බුහාරි පල්ලියේ ඇති වුණ සිද්ධිය. දෙන්නෙක්, කිහිප දෙනෙක් ඝාතනය වෙලා ...,

ප්‍ර : පොඩ්ඩක් පැහැදිලි කරන්න පුළුවන්ද ඔබට?

පි : අර බේරුවල තියෙනවා බුහාරි ටකියා කියලා. ඒ බුහාරි ටකියා පල්ලියේ කට්ටිය ඇවිල්ලා හරි සාමකාමියි. හරි විනයගරුකයි. ඒගොල්ලන් කොහේ හරි උද්ඝෝෂණ, මම දන්න විදියට ලංකාවේ අර ජිනීවා සම්බන්ධව ලංකා ආණ්ඩුවට උදව්වක් වශයෙන් ඔවුන් කොල්ලුපිටිය ප්‍රදේශයට පවා ඇවිල්ලා ඉතාම විනය ගරුකව, ජනතා විමුක්ති පෙරමුණ වගේ අර මොකක් හරි රැස්වීමකට කොහේ හරි ආවොත් අර විනය ගරුකව ඇවිල්ලා, විනය ගරුකව විසිරිලා යන කට්ටියක්. එතකොට ඒගොල්ලන්ගේ දානමය කටයුත්තක් තියෙනවා මුස්ලිම් සමාජය තුළ මේ වගේ සංවරකමක් තියෙනවද කියන එක බැලුවොත් හරි බලන්න පුළුවන්. ඒගොල්ලන් කාලා ඒගොල්ලන් යන එකත් තේරෙන්නේ නැහැ. කොරොනා වසංගතයෙන් පස්සේ අර තොප්පි ඇඳලා අර පොඩි මේකක් ආවේ මාධ්‍යවල. ඒ ඒගොල්ලන් සම්බන්ධව තමයි. එතකොට ඒකට යාබදව පල්ලියක් හැදුවා වහාබි මතධාරීන් විසින්. එතකොට ඒ පල්ලියත් එක්ක තියෙන මොකක් හරි මතිමතාන්දර ගැටුමක් වශයෙන් එතනදී මේගොල්ලන්ගේ උත්සව සම්බන්ධව යම්කිසි ප්‍රකාශයක් සිදු කරපු මත එතන ගැටුමක් ඇති වුණා. ඒ ගැටුමෙන් පස්සේ හිටපු ආණ්ඩුකාර අභාවප්‍රාප්ත අලෙවි මවුලානා මහතා ඇවිල්ලා දැඩි ප්‍රකාශයක් කරලා තිබ්බා Asian Tribune එකේ. ඒකේ එයා කියලා තිබ්බා ජාමියා නලීමියා එකේ සම්බන්ධ අගාර් මොහොමඩ්, ෆලීල් ෂේක් ෆලීල් ඒ වගේ පුද්ගලයන් ගැන සඳහන් කරලා තිබ්බා. එතකොට එතුමා කියලා තිබ්බා ලංකාවේ වහාබ්වාදය කියන්නේ අනාගතයට Treat එකක් කියලා, අනතුරක් කියලා.

ප්‍ර : අලෙවි මවුලානා මැතිතුමා?

පි : ඔව්. එතකොට ඒ වගේ කෘතහස්ත දේශපාලනඥයන් විසින් ලංකාවට, ඒ ආණ්ඩුවට සහ කියලා ගිය දේවල්. ඒවා අද යථාර්ථයක් බවට පත්වෙලා තියෙනවා බෝම්බ පිපිරීම තුළින්. එතකොට මමත් ඇත්තටම අලෙවි මවුලානා හිතුවේ නිකම් ඔහේ දේශපාලනය කරන එක්කෙනෙක් කියලා තමයි මම වැරදියට හිතාගෙන හිටියේ. මම එතුමාත් එක්ක සම්බන්ධ වෙලා,

FAIR COMMENT
BY JEZEEM

දුරකථනයත් එක්ක සම්බන්ධ වෙලා කථාබහ කරලා එහෙම සම්බන්ධකම් තිබුණට මම හිතුවේ නැහැ මම මේක දකිනකම් එතුමා මේ වගේ අනාවැකියක් කියලා ගියාද කියන එක.

ප්‍ර : මේ වගේ දූරදර්ශී දේශපාලනඥයෙක් කියන එක ඔබේ ඔළුවට වැටිලා තිබුණේ නැහැ?

පි : ඔව්. මම ඒක බලලා ඇත්තටම එතුමා වෙනුවෙන් ප්‍රාර්ථනා කරලා මම නිහඬ වුණා. එතුමා ගැන මම වැරදි චිත්‍රයක් මවා ගත්තු එකට. එතකොට එතුමා ඒ වගේ දේවල් ලංකාවේ අනාගත පරම්පරාවට ඉතුරු කරලා ගිහිල්ලා තියෙනවා. ඒ කියන්නේ මේ වගේ අදහස් තියෙනවා, මේ වගේ පුද්ගලයන් ඉන්නවා, මේවා තෝරලා බේරලා කටයුතු කරන්න ඕනෙයි කියලා කිව්වාට ඒවා කවුරුත් ගණන් ගත්තේ නැහැ. දැන් ලංකාවේ සූෆි මුස්ලිම්වරු හෝ පාරම්පරික මුස්ලිම්වරු හෝ කවුරු හෝ මේ සම්බන්ධව කරුණු කාරණා අනාවරණය කරලා තියෙනවා. හැබැයි ඒවා පිළිබඳව යම්කිසි සැළකිලිමත්ව බැලුවේ නැහැ කවුරුත්. ඒ නිසා තමයි මේ වගේ තැනකට මුස්ලිම් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මේ සමාජය ගෙනාවේ කියන එක මම කියන්න කැමතියි.

ප්‍ර : එතකොට ඔබගේ අදහස වෙන්නේ මුස්ලිම් සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මීට වඩා ක්‍රියාශීලීව මේ මුස්ලිම් ජන කොට්ඨාශය සහ ඉස්ලාම් ආගමට අදාළව තියෙන මේ ප්‍රශ්න පිළිබඳව විවක්ෂණශීලීව බලන්නට ඕන කියලා නේද?

පි : බලන්නට ඕනේ. ඒකේ මම දන්න තරමින් අවුරුදු විසි පහකට වඩා ඒකේ පුටුවට පත් වුණෙත් නලීමීවරයෙක්. ඒ කියන්නේ බේරුවල ජාමියි නලීමියා අධ්‍යාපනය ලබපු අධ්‍යක්ෂවරයෙක් තමයි ඒකේ එක දිගටම පත්වෙලා ආවේ. එතකොට ඒගොල්ලන් ඒ සඳහා රුකුළක් දුන්නාද කියන එක බරපතල සැකයක් තියෙනවා අපිට. මොකද මේ සමාජයේ ඉස්ලාම් මූලධර්මයට විරුද්ධවනේ ඒගොල්ලන් කටයුතු කරන්නේ.

ප්‍ර : නලීමියාවරු?

පි : ඒ කියන්නේ පල්ලියක් හදනවා නම් ක්‍රමවේදයක් තියෙනවා. දැන් ජුම්මා පල්ලිය කියන්නේ සිකුරාදා දේශනා පවත්වන පල්ලිය. එතකොට සිකුරාදා දේශනා පවත්වන පල්ලි ළඟ ළඟ තියෙන්න බැහැ.

ප්‍ර : කොච්චර දුරකින්ද ජුම්මා පල්ලියක් තියෙන්න ඕන? ඒ කියන්නේ සිකුරාදා දේශන පවත්වන පල්ලියක් තියෙන්න ඕන?

පි : ඒ සම්බන්ධව ලංකාවේ තියෙනවා ශ්‍රී ලංකා ෂරියා කවුන්සිල් කියලා ආයතනයක්. ඒ කියන්නේ උලමා සභාව ඒ කාලයේ

FAIR COMMENT — BY JEZEEM —

අෂ්රොෆ් මහත්මයා දීඝවාපියට මල් වට්ටියක් අරන් ගියා කියලා එයාට විරුද්ධව මතිමතාන්දරයක් ලිව්වා. ඒ කියන්නේ එවකට ලේකම් රියාල් මවුලවී. එයාගේ පුතා ජමාත් ඉස්ලාම් එකේ සම්බන්ධ වෙච්ච එක්කෙනෙක්. එතකොට ඒකට වෛරයට අෂ්රොෆ් අමාත්‍යවරයා ශ්‍රී ලංකා ෂරියා කවුන්සිල් කියන එක හැදුවා. හදලා අවුරුද්දක් යන්න මත්තෙන් එතුමා අභාවප්‍රාප්ත වුණා. එතුමා හදපු සංවිධාන අදත් තියෙනවා. ඒ සංවිධාන, දැන් ෂරියා කියන දේ සමාජය තුළ ඒක දැන් බාල්දු වෙච්ච වචනයක් හරි, භයංකාර වචනයක් විදියටනේ තියෙන්නේ ඒ නිර්වචනය අනුව ෂරියා කියන දේ. දැන් ෂරියා කිව්වහම බය වෙනවා මිනිස්සු.

ප්‍ර : ඇයි බය වෙන්නේ?

පි : මරණවා. එහෙමනේ බලන්නේ. එතකොට ඒක නෙමෙයි. ෂරියා කියන්නේ ජීවන ක්‍රමයක් හදන සැලැස්මක්. ඒකේ නීති ගැන තියෙනවා, අපේ Practice එක ගැන තියෙනවා හැම දෙයක් ගැනම තියෙනවා. එතකොට ඒක වෙනුවෙන්ම හදපු සංවිධානයක් තමයි ශ්‍රී ලංකා ෂරියා කවුන්සිල් කියලා.

ප්‍ර : ෂරියා නීතිය ලංකාවට උචිතද?

පි : ෂරියා නීතිය කියන දේ ලංකාව තුළ නැහැ. අපේ Practice එක තමයි ෂරියා කියලා කියන්නේ. දැන් අපේ මුතුන් මිත්තන් ඇවිල්ලා අපේ වත් පිළිවෙතක් තියෙනවානේ. දැන් මොකක් හරි විවාහයක් කරනකොට ඒ සම්බන්ධව විතරයි ලංකාවේ ඒ කොටසට විතරයි අර නීත්‍යානුකූල බැඳීම ගන්න විතරයි අර කියන දේ ලංකාණ්ඩුවත් එක්ක සම්බන්ධ වෙලා තියෙන්නේ කාර්තික් කියන දේ. එතකොට ඒ හැරෙන්න ලංකාව තුළ දැන් කාර්තික් උසාවිය තුළත් මේ කාන්තාවන්ට ලොකු අසාධාරණකම් වෙලා තියෙනවා.

ප්‍ර : ඇයි ඒ ඔබ එහෙම කියන්නේ?

පි : ඒ කියන්නේ ඒකට සාමාන්‍යයෙන් දැන් බේරුවල ජාමියා නලීමියා එක හැදුවා වගේ ඒකට පත් වෙන්නේ වෘත්තීමය කෙනෙක් නෙමෙයිනේ. ඒකට පත්වෙන්නේ සාමාන්‍යයෙන් පූජකයෙක්. ඒ පූජකයාගේ තුළින් හරියට ඒ නීතිය හරියට කාන්තාවන්ට හෝ පිරිමි පාර්ශවයට ඉටු වුණේ නැහැ. ඒ කියන්නේ ඒ පුද්ගලයා ළඟ සමාජ දැනුමක් නැහැ. එයා ළඟ වෙන දැනුමක් නැහැ. එයා සාමාන්‍යයෙන් පූජකයෙක්. එතකොට ඒ නිසා තමයි කාර්තික් උසාවිය ගැන මුස්ලිම් කාන්තාවන් පවා විරුද්ධව කථා කරන්න පටන් ගත්තේ. ඒ කාති ක්‍රමයට විරුද්ධව නෙමෙයි. ඉතිං ඒ නිසා

FAIR COMMENT — BY JEZEEM —

ඔය අසාද් සාලිලා වගේ මිනිස්සු මුස්ලිම් විවාහය තුළින් ජාතික නිදහස් දිනයකට වම් පැත්තෙන් එක්කෙනෙකුයි, දකුණු පැත්තෙන් තව එක්කෙනෙකුයි බැහැලා යන විදියට මේ ජන සමාජය හැල්ලුවට ලක් කළා. ඒ නිසා තමයි මුස්ලිම් සමාජය තුළ තියෙන යම්කිසි දේවල් පවා, වත් පිළිවෙත් පවා අනෙක් සමාජය වපර ඇහින් හෝ කුමන ක්‍රමයකින් බලන්න පටන් ගත්තේ. එතකොට මේක අපිට දැන් කාති කියන දේ ලංකාව තුළ නැති කළොත් දැන් ඒක තියාගෙන ආපු දෙයක්නේ, ලංකාවේ පාරම්පරිකව තියාගෙන ආපු දෙයක්නේ. පාරම්පරිකව තියාගෙන ආපු දෙයක් එතකොට නැති වෙනකොට එතකොට ඒ පාරම්පරිකවලදී සමස්ථ මුස්ලිම් ප්‍රජාවම ඒක ගැන කණගාටුවෙන් බලන්න ඉඩ තියෙනවා. එතකොට ඒ ක්‍රමය තියෙන්න ඕන. ඒ ක්‍රමය තුළ වැරැද්දක් නැහැ. ඒ ක්‍රමය හරි ක්‍රමයක් වශයෙන් තියෙන්න ඕන. ඒකේ නීතිය හරියට ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් ඉහළ උසාවියකට යන්න පුළුවන් ලංකාවේ සිවිල් නීතියකට යන්න පුළුවන් විදියට ඉඩ ප්‍රස්ථාවක් ඒ තුළින් හදලා දෙන්න ඕන. ඒ කියන්නේ ඒකෙන් දික්කසාද වෙන එක්කෙනෙක්ට අගතියක් වෙනවා නම් එයාට ඒ අගතිය සිද්ධ වෙනවාද, ඒ ගෙවීම කරනවාද කියන එක බලන්නත් අද කිසිම දෙයක් නැහැ. එතකොට ඒගොල්ලන් එතකොට කාති ක්‍රමයට විරුද්ධ වෙනවා. සමහරු ඉස්ලාම් දහම ඇදහුවත් එයාට අවබෝධයක් නැහැ. එයා හිතන්නේ මේ කාති ක්‍රමයේ වැරැද්දක් කියලා. මේ කාති ක්‍රමයේ වැරැද්දක් නෙමෙයි. කාති උසාවියට එහෙම බලයක් නැහැ උසාවි ගිහිල්ලා අල්ලලා, එහෙම බලයක් තිබ්බත් හරි ඒක හරියට ක්‍රියාත්මක කරන්නේ නැහැ අර Lawyers ලා නැතුව පත්වෙන අර පූජක කට්ටිය. ඉතිං ඒ නිසා තමයි අර කාති ක්‍රමය කියන දේ විතරයි අපට ෂරියා කියන මූලධර්මය තුළ ලංකාව තුළ තියෙන්නේ. ඒ ඇරෙන්න අර හලාල් බැංකුව අර අර බැංකුව ....,

ප්‍ර : අපි දැන් ඔය හලාල් එකටත් එමු. දැන් ඔය කාති ක්‍රමය සම්බන්ධයෙන් මගේ සහෝදර නිලධාරියාට ඔබෙන් ප්‍රශ්න වගයක් දැන ගන්න තියෙනවා. දැන් ඔබෙන් ඒ ගැන ප්‍රශ්න කරයි.

****

රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා :

ප්‍ර : සාක්ෂිකරු මෙම කාති උසාවිය මුස්ලිම් හා විවාහ දික්කසාද පනත යටතේ 1951 ඇරඹුණා කියලා ඔබට අවබෝධයක් තියෙනවද?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ මෙම කාන්ති උසාවියේ Administration එක නැත්නම් ව්‍යූහය පිළිබඳ ඔබට අත්දැකීමක් තියෙනවද?

පි : නැහැ.

ප්‍ර : කාන්තිවරයෙක් පත් කරන්නේ කොහොමද කියලා?

පි : නැහැ. ඒ සම්බන්ධව නැහැ.

ප්‍ර : ඔබ මීට පෙර කාන්ති උසාවියේ දෙන නියෝග පිළිබඳ කාන්තාවන්ට සිදුවන අසාධාරණ ගැන කථා කළා. ඔබ දන්නවද ශ්‍රී ලංකාවේ දිසා අධිකරණයකින් දෙන නියෝග පිළිබඳව?

පි : ඔව්.

ප්‍ර : සාමාන්‍යයෙන් විවාහ, දික්කසාදයක් සිදු වෙනවිට දිසා අධිකරණයට නියෝග ලබා දීමට හැකියාවක් තියෙනවා. මොනවද ඒ නියෝග කියලා ඔබ දන්නවද?

පි : නැහැ.

ප්‍ර : දරුවන් ලබා දීම ඒ කියන්නේ භාරකාරත්වය, ඒ වගේම මහේස්ත්‍රාත් අධිකරණයෙන් නඩත්තු සඳහා නියෝග ලබා දීමට හැකියාවක් ශ්‍රී ලංකා අධිකරණ ව්‍යූහයේ තියෙනවා. කාන්ති උසාවියකටත් එම බලතල තිබෙනවද?

පි : ඒ කියන්නේ බලතල තියෙනවා කියන එක දන්නවා. ඒකේ තියෙන අර ඒ කියන්නේ මොනවද ඒකට කියන්නේ අර Power එක සම්බන්ධව මට දැනුමක් නැහැ. මොකද ඒක Power එක ඒ කියන්නේ බලය හරියට ක්‍රියාත්මක වෙන්නේ නැහැනේ සමහරක් තැන්වලදී කාන්තාවන්ට. එතකොට ඒ Judgeට තියෙන බලය සම්බන්ධව මටත් ප්‍රශ්නයක් තියෙනවා.

ප්‍ර : ඔබ දැන් මීට පෙර සඳහන් කළා කාන්ති උසාවියට පත්වන කාන්තිවරුන් පත් වන්නේ කිසිම නීතිමය පසුබිමක්, පසුබිම රාමුවක් නෙමෙයි කියලා?

පි : නීතිමය පසුබිම මම කිව්වේ ඇවිල්ලා එයාගේ සුදුසුකම් කියන්නේ. ඒ කියන්නේ එයා සාමාන්‍යයෙන් පූජකවරයෙක් තමයි පත් වෙන්නේ ඉස්සර කාලයේ ඉඳලා.

ප්‍ර : ඇයි එහෙම පූජකවරයෙක් පත් වෙන්නේ කියලා ඔබ දන්නවද?

පි : ඒක දන්නේ නැහැ.

ප්‍ර : ඔය කාන්ති උසාවිවල කාන්තා නියෝජනයන් තියෙනවද?

පි : නැහැ.

ප්‍ර : කාන්තා නියෝජනයන් නැහැ?

පි : නැහැ.

President Secretariat's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : එතකොට ඔය කාන්ති උසාවිය පිළිබඳ 1970, 1984, 1990, 2005, 2009 වර්ෂයන්වල විවිධ කමිටු නැත්නම් සභාවන් පවත්වලා මෙම කාන්ති උසාවිය පිළිබඳ අළුත් නීතිය වෙනස් කිරීම සඳහා විවිධ කමිටු පත් කරනු ලැබුවා. ඒත් ඒ එකකවත් සාර්ථක වුණා කියලා ඔබට අදහසක් තියෙනවනේ?

පි : ගිය ආණ්ඩුවෙනුත් ඒ සම්බන්ධව කථිකාවක් ඇති වුණා තලතා අතුකෝරළ මැතිණිය හරහා. ඒත් කිසිම දෙයක් සාර්ථකත්වයට පැමිණ නැහැ කියලා මම දැන ගන්න ලැබුණේ.

ජ්ර : ඔබට දැන ගන්න ලැබුණේ ඇයි මෙම පනත් අළුත් කිරීමට මෙම නව වර්තමානයේ තියෙන නීති සමඟ මෙම කාන්ති උසාවියන් හැඩ නොගැස්වීම පිළිබඳව ඔබට අදහසක් කියන්න පුළුවන්ද?

පි : ඔව්. අර ෆායිස් මුස්තාපා ජනාධිපති නීතීඥතුමාගේ කමිටුව කියලත්, සලීම් මර්සුක් ජනාධිපති නීතීඥතුමාගේ කමිටුව කියලත් දෙකට බෙදුණා කියන එක මම දන්නවා. එතනදී එක්තරා කණ්ඩායමක් උලමා සභාවට පක්ෂපාතීවත්, තව කණ්ඩායමක් උලමා සභාවේ තීන්දුවලට විරුද්ධවත් කටයුතු කළා කියලා මට දැන ගන්න ලැබුණා.

ප්‍ර : දැන් මුස්ලිම් නීතියට අනුව අවම වයස, විවාහයක් සඳහා අවම වයස කීයද?

පි : ඒ කියන්නේ වැඩිහිටි වියට පත් වුණ කෙනෙක්ට විවාහ වෙන්න පුළුවන් කියලා තමයි තියෙන්නේ.

ප්‍ර : ඒ කියන්නේ වයස අවුරුදු 10-12 ක් අතර, වැඩිහිටි වයසට අඩු කාන්තාවක්. එතකොට සාමාන්‍යයෙන් ඔය වයස කීයක් විතර වෙනවද? සාමාන්‍යයෙන් ඔබ දන්න විදියට?

පි : සාමාන්‍යයෙන් 13 ක්.

ප්‍ර : ශ්‍රී ලංකා නීතිය අනුව නීතිමය වශයෙන් කාන්තාවකට විවාහ වීමට හැකිවන වයස කීයද කියලා ඔබ දන්නවද?

පි : 16 නැත්නම් 18 යි.

දැන් වේලාව : ප.ව. 12.30 යි
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව ප.ව. 12.30 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා</u>

ප්‍ර : ඒතකොට ඔබ දන්නවද 1952 උඩරට නීතිය ඒ කියන්නේ 1951 මුස්ලිම් නීතිය පනතක් කෙටුම්පත් කලා. ඊට පස්සේ 1952 උඩරට නීතිය කෙටුම්පත් කලා, ඒම නීතිය යටතෙත් වයස 18 යි, මෙම ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න කාන්තාවකට වයස අවුරුදු 12 නැත්නම් 13 ක් වැනි ඉතා පොඩි වයසක් තුලදි විවාහ වීම ඇයගේ මානසික තත්ත්වයට බලපාන්නේ කෙසේද කියලා?

පි : ප්‍රබල ලෙස බලපානවා. ඒ කියන්නේ එයා ළමා මනසකින් නේ ඉන්නේ. ළමා මනසකින් ඉන්න කෙනෙක්ට විවාහ කර දීම සම්බන්ධව ලොකු ගැටළුවක් තියෙනවා. ඒ කියන්නේ ඉස්සර කාලේ ඒවා සිද්ධ වුණාට වර්ථමානයේදී එහෙම සිද්ධ වෙන්න පුළුවන්ද කියන එක ලොකු ප්‍රශ්නයක් තියෙනවා. එතකොට ඒ සම්බන්ධව වයසක් නිර්ණය කරලා මම හිතන්නේ අර කොමිටු 2 ට බැදුනානේ, ඒක කොමිටුවකින් අවුරුදු 16 වගේ නිගමනයකට ආවා. තව කොමිටුවක් කිව්වා උලමා සභාවට පක්ෂපාති

FAIR COMMENT BY JEZEEM

කොමිටුව කිව්වා ඒකට එන්න බැහැ කියලා වයසකට. එතකොට අපිත් මත දරන්නේ ඇවිල්ලා යම්කිසි වයසක් මේකට නිර්ණය කරන්න ඕන කියන එක තමයි මගේ මතය. එතකොට ආගමික මතය වශයෙන් එහෙම තිබ්බට පතුවා තුළින් මේගොල්ලන්ට ඒක ඒක දේවල් වෙනස් කරන්න පුළුවන් නම් උලමා සභාවලට දැන් කොවිඩ් 19 එකට පස්සේ සිකුරාදා දේව මෙහෙය පවත්වන පල්ලිවලත් සිකුරාදා දේව මෙහෙය පවත්වනවා, ඉඩප්‍රස්ථාව නැති නිසා පුංචි පුංචි පල්ලිවලත් ඉස්ලාමිය ෂරියා මූල ධර්මයට පටහැනිව සිකුරාදා දේශනා පැවැත්වෙන පල්ලි හදලා තියෙනවා. ඒ කියන්නේ හැම තැනකම ඒක කරන්න පුළුවන් විදියට ඒක කරලා තියෙනවා පත්වා ක්‍රම තුළින්. එතකොට පත්වා ක්‍රම තුළින් ඒවා කරන්න පුළුවන් නම් මුස්ලිම් කාන්තාවකගේ කුඩා වයසකට ගිහිල්ලා ඒ ළමයාව බන්දලා දෙන ඒකේ ප්‍රශ්නයක් තියෙනවා කියන ඒක පෙනි පෙනී ඒකට පත්වා නිකුත් කරන්නේ නැතුව උලමා සභාව මේ කටයුතු කරන්නේ ඇයි කියන එක ප්‍රශ්නයකුත් තියෙනවා. උලමා සභාව දිහා බලලාද නීති හදන්න ඕනේ කියන එකත් අපි සැළකිල්ලට ගන්න ඕනෙ. ඒ කියන්නේ අපිට පුළුවන් මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශය හරහා හරි යම්කිසි තීරණයකට එළඹිලා ලංකාවේ විවාහ නීතිය හරි පොදු වයස් සීමාවකට ගේන්න ඕනේ කියලා කියන මතය තුළ මමත් ඉන්නවා. අපේ කවුරුත් එහෙම පොඩි වයස් වල බන්දලා දෙන්න කැමතිත් නැහැ, මගේ සහෝදරයෙක් හිටියත් හරි එක්කෝ මගේ ළමයෙක් හිටියොත් හරි මමත් ඒකට කැමති නැහැ. කැමති නැති දෙයක් කිරීම මේකෙන් ගොඩක් කට්ටිය ප්‍රයෝජනයට ගන්නේ ඇවිල්ලා පොඩි ළමයින් විවාහ කරන්න මම හිතන්නේ අඟහිඟකම් වලින් පිරිච්ච ළමයි, එහෙම නැත්නම් දෙවෙනි විවාහයකට, එහෙම නැත්නම් පවුලේ කාට හරි කරන්න බැරි වුණු දේවල් තමයි මම හිතන විදියට බොහෝදුරට සිද්ධ වෙලත් ඇත්තේ එහෙම සිද්ධ වුණා නම් ඒ නීති තුළ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : දැන් ඔබ ඉස්සර වෙලා විවාහ පිළිබඳව කතා කරපු හින්දා අපි ඒක ගැන පොඩ්ඩක් තොරතුරු දැන ගත්තේ. ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ෂූරා සභා කියන්නේ මොකක්ද කියලා?

පි : ෂූරා සභාව කියන දේ ලංකාවේ ආවේ උලමා සභාවට යම්කිසි attac එකක් හරි යම්කිසි chalange එකක් දෙන්න තමයි නලීමිවරු විසින් ඒක හැදුවේ. ඒ කියන්නේ උලමා සභාවේ රිස්ති මුක්ති අපි

FAIR COMMENT BY JEZEEM

කියන දේවල් අහන්න ඕනේ කියලා ඒකේ ඉන්න නලිමිවරුන්ට අදහසක් තිබ්බා. එතකොට ඒක හැදුවේ ඇවිල්ලා හිටපු අධ්‍යාපන ඇමති මම හිතන්නේ බදුර්දීන් මොහොමද්. ඒතුමාගේ පුත්‍රයා වෙච්ච දැනට තබ්ලික් ජමාත් එකට සම්බන්ධ වෙලා කටයුතු කරන තාරික් මොහොමද් තමයි ඒක එයත් සහ ඉනාමුල්ලා කියන පුද්ගලයන් තමයි ඔක හැදුවේ. එතකොට ඒකේ බුකර් ඒකේ තමයි යම්කිසි මේකක් තිබ්බා ඒක පටන් ගැනීම සම්බන්ධව. මමත් ඒකට ගියා. මගේ සහෝදරයත් මෙතනට පැමිණි එයත් ගියා. අපි ගිහිල්ලා බලලා අපිට තේරුණා මේක ඇවිල්ලා උලමා සභාවට chalange එකක් දෙන්න තමයි මේක හදන්නේ කියලා. එතකොට ෂූරා සභාව මගේ ප්‍රකාශයෙත් තියෙනවා කින්නියාවලත් තියෙනවා ෂූරා සභාවක්. ඒකත් කාත්තන්කඩි උලමා සභාව වගේ ක්‍රියාත්මක වන ආයතනයක්.

ප්‍ර : ෂූරා සභා එකක් ද තියෙන්නේ ලංකාවේ නැත්නම් කිහිපයක් තියෙනවද? ප්‍රධාන ෂූරා සභාවක් තියෙනවද කොහොමද ඒක?

පි : ඒකත් මේ එච්චර අවුරුදු කාලයක් නෙමෙයි මම හිතන්නේ අවුරුදු 5 ක් 6 ක් වගේ කෙටි කාලයක්. අවුරුදු 10 ක් වත් නැහැ මේක ඇවිල්ලා ලංකාවට. නැෂනල් ෂූරා කවුන්සල්. ජාතික ෂූරා සභාව. ඒකේ ගොඩක් ඉන්නේ මේ නලීමිවරු සහ ඉක්වාන් මුස්ලිම්, ජමාතේ ඉස්ලාමී සම්බන්ධ වෙච්ච පුද්ගලයන් තමයි ඉන්නේ. මේගොල්ලන්ට තේරෙනවා මේ සමාජයේ control එකට ගන්නවා නම් එක්කෝ අපිට උලමා සභාව තියෙන්න ඕනේ. එහෙම නැත්නම් මේ ෂූරා සභාව, උලමා සභාවට Challenge එකක් කරලා උලමා සභාවත් එක්ක අපි ඉදලා වෙනම ඉදලත් අපි මේකට ඒගොල්ලන්ගේ යම්කිසි පණිවිඩ පල්ලිවල Notice Board වල අලවනවා.

ප්‍ර : ඔව් ඒකෙන් ඔබ අදහස් කරනවද ෂූරා සභාව සහ උලමා සභාව අතර තරහයක් තියෙනවා යම් ආකාරයකට?

පි : ඒ කියන්නේ සීතල යුද්ධයක්.

ප්‍ර : සීතල යුද්ධයක් ඒ කියන්නේ එළියේ නෙමෙයි?

පි : ඒ කියන්නේ යම්කිසි Husband and wife ප්‍රශ්න තිබ්බත් හරි ජීවත් වෙනවා එකට හරි එන්න ඒ වගේ. ඒළියට

ප්‍ර : ඒළියට කියන්නේ නැහැ නමුත් අභ්‍යන්තරයේ ඔබ කියන්නේ ගැටුම් තියෙනවා?

පි : තියෙනවා ඒක ඒළියට එන්නේ නැහැ.

ප්‍ර : එළියට දෙන්නේ නැහැ, නමුත් සාමකාමී බවක් නැහැ?

FAIR COMMENT
BY JEZEEM

පි : සාමකාමී බවක් තමයි පේන්නේ. ඒගොල්ලන් නිකම් මුරණ්ඩු වෙන්නේ නැහැ. එයා මේක අදිනවා කියලා තේරෙනවා, එයත් නිකම් බලන් ඉන්නවා. එයා ඇදපු දෙන් කියලා. මෙයත් අදිනවා ඒක නිකම් එහෙම වෙනවා. ඒ කියන්නේ ගැටුමකට, ගැටුම්කාරී විදියට යන්නේ නැහැ.

ප්‍ර : ඒකයි මේ සීතල යුද්ධය කියන එකෙන් ඔබ අදහස් කළේ?

පි : ඔව්

ප්‍ර : එතකොට මුස්ලිම් ජන කොට්ඨාශයට කොහොමද මේක බලපාන්නේ?

පි : බලපාන්නේ කියන්නේ දැන් සංවිධාන ගොඩක් උපදෙස් දෙන්න පටන් ගන්නවානේ. දැන් උලමා සභාව විතරක් තිබ්බොත් ඇති. හැබැයි අපි කියන පාරම්පරික ඒ දවස්වල තිබ්බ උලමා සභාව තමයි තියෙන්නෙත් තියන්නත් ඕනේ. ඒ prictice එක නැතුව ඒ මේවා නැතුව දැන් සමාජය බලනවා කවුරු කියන දේ අපි අහන්නද කියන එක. එතකොට සමාජයට ඔක්කොම කතා කරන්න පටන් ගන්නවා.ඔක්කොම කතා කරන්න පටන් ගත්ත නිසා තමයි ඔය සහරාන්ලා වගේ මිනිස්සුත් කතා කරන්න පටන් ගත්තේ. එතකොට දැන් ඒ වගේ කතා කිරීම්වලට ඉඩ දෙන්න බලාගෙන ඉන්නෙත් මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුව. එතකොට නැෂනල් රා කවුන්සිල් එක ලියාපදිංචි කරලත් තියෙන්නේ මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමෙන්තුවෙන්. එතකොට එගොල්ලන්ගේ මෙවා නැතුව ඒගොල්ලන්ගේ අදහස ෂුරා කියන අදහස කින්නියාවලින්, කින්නියා තියෙනවා එහේ බුද්ධි අංශ වාර්තා කුමන හෝ ආකාරයෙන් ගන්න පුළුවන්. කින්නියා බේස් වෙච්ච එක ඇවිල්ලා ජමාතේ ඉස්ලාම් සංකල්පය තමයි තියෙන්නේ. එහෙත් තිබ්බා අර FJP කියලා Front for Justice and Peace කියලා දේශපාලන සංවිධානයක් තිබ්බා කින්නියාවල. එතකොට ඒකේ අර දැනට NFGG එකේ ඉන්න නජා මොහොමඩ්ලා ඒකේ හිටියා. එතකොට ඔය කියන කින්නියා ෂූරා සභාව ඇවිල්ලා ජමාතේ ඉස්ලාම් අදහස්වලින් පෝෂණය වෙච්ච සංවිධානයක්.

ප්‍ර : ත්‍රිකුණාමලේ?

පි : ත්‍රිකුණාමලේ. එතකොට ඒ අදහසම තමයි මෙතනත් තියෙන්නේ. නැෂනල් ෂූරා කවුන්සිල් කියන මේකෙන්. එතකොට මේවා අපිට අනවශ්‍ය දේවල්. ඒ කියන්නේ සමාජයට අදහස් දෙන්න පල්ලියට notice දාන්න උලමා සභාව තිබ්බොත් ඇති. හැබැයි අපි කියන පරණ උලමා සභාව. එහෙම නැතුව මේ නැෂනල් ෂූරා

FAIR COMMENT BY JEZEEM

කවුන්සිලුත්. හෙට අනිද්දා වෙන කොට තව එක්කෙනෙකුත් පටන් අරගෙන දැන් ශ්‍රී ලංකා ෂරියා කවුන්සිල් කියන එක උපමා සභාවට විරුද්ධව අෂ්රොප් ඇමති තුමා එහෙම පටන් ගත්තට ඒගොල්ලන් notice board වල නැහැ. එතකොට ඒගොල්ලන් සමාජයේ guid කරන මට්ටමක ඉන්නවා. ඒ කියන්නේ නැෂනල් ෂූරා මට්ටමකවත් ඒගොල්ලන් නැහැ. ඒ කියන්නේ ඒගොල්ලන් දුර්වලයි. ඒ කියන්නේ ආර්ථිමය වශයෙන් දුර්වලයි. නැෂනල් ෂූරා කවුන්සිල්වලට එහෙම ආර්ථික දුර්වලතාවයක් නැහැ.

ප : ඒගොල්ලන්ට එතකොට කොහොමද මුදල් ලැබෙන්නේ?

පි : මම හිතන්නේ ඒගොල්ලන්ට විදේශ ආධාර හෝ ඒගොල්ලන්ගේ කුමන හෝ ආධාර මට්ටම් තියෙන්න පුළුවන්.

ප : ඔබ ඒක ගැන හරියට දන්නේ නැහැ?

පි : දන්නේ නැහැ.

ප : හරි, එතකොට දැන් ඔබ කිව්වා උලමා සභාවේ සාමාජිකයෝ 7000 ක් 8000 ක් විතර ඉන්නවා කියලා. ෂූරා සභාවේ සාමාජිකයන් කීයක් විතර ඉන්නවද?

පි : මම හිතන විදියට 2000 ක් 1000 ක් වගේ සුළු සංඛ්‍යාවක් තමයි තියෙන්න පුළුවන්. මොකද ඒගොල්ලන්ගේ සංවිධානයට එච්චර ඒගොල්ලන්ට උලමා සභාව තියෙනවානේ. එතකොට ඒගොල්ලනට මේක උලමා සභාවට තරඟයක් දෙන්න හරි මොකක් හරි ඕගොල්ලන් අපි කියන එක කිව්වේ නැත්නම් අපි notice එකක් දානවා වගේ බලපෑම් කරන්නනේ ඕවා තීයාගෙන ඉන්නේ. එතකොට දැන් ඒවත් තමා සිද්ධ වෙන්නේ.

. ප : එතකොට ඔය 2000 ක් 3000 ක් වගේ ඉන්න සාමාජික සංඛ්‍යාවෙන් අර උලමා සභාවේ වගේ පාලක මණ්ඩලයක් ඉන්නවද ෂූරා සභාවේ?

පි : ඔව් ඒකේ ඉන්නවා.

ප : කීදෙනෙක් විතර ඉන්නවද?

පි : මම කියන්නේ ඔය තාරික් මොහොමද් වගේ ඒ වගේ අනෙකුත් උලමා සභාවේ ඉන්න පහළ මට්ටමේ නිලධාරීන්, ඒ වගේ ගොඩක් ඉන්නෙ ඇවිල්ල මතවාදය තියෙන්නේ ඇවිල්ලා අර ජමාතේ ඉස්ලාම් ඉහුවාන් සංකල්පයට අනුගත වෙච්ච කට්ටිය තමයි ඉන්නේ වැඩිපුරම.

ප : දැන් ඔබ කිව්වා උලමා සභාවේ ඉන්නවාය කියලා තබ්ලික්, ඒ වගේම වහබී, සලෆි, ඉක්වාන් මුස්ලිම් ඒ හැම එකේම අය එතන ඉන්නවයි කියලා ඒ පාලක මණ්ඩලයේ?

පි : නවුෆර් මවුලවිත් ඉන්නවා.

ප : ඔව් නවුෆර් මවුලවිත් ඉන්නවා, සලෆි වාදයනේ ඔහු නේද?

FAIR COMMENT — BY JEZEEM

පි : ඔව්.

****

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා:</u>

ප්‍ර : රහුමාන් ඔබ කිව්වා තරික් මොහොමඩ් තමයි ෂූරා සභාව ආරම්භ කරන්න මුල් වුණේ කියලා එකෙනෙක්?

පි : ඔව් එයත් එක්කෙනෙක්.

ප්‍ර : එතකොට මේ හිටපු අර අධ්‍යාපන ඇමති බදුර්දීන් මොහොමඩ්ගේ පුතෙක්?

පි : පුතෙක්.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද රිෂාඩ් බදුර්දීන් හිටපු ඇමතිවරයත් මේ තරික් මොහොමඩුත් අතර තියෙන සම්බන්ධකම?

පි : ඒ පිලිබඳව මම දැනුවත් නැහැ.

ප්‍ර : ඔබ දන්නේ නැහැ?

පි : නැහැ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : එතකොට ඔබ කියන ආකාරයට ෂූරා සභාවේ වැඩිපුරම ඉන්නේ ජමාතේ ඉස්ලාම් අදහස් දරන අය?

පි : ඉහුවාන් මුස්ලිම්. නලිමී.

ප්‍ර : එතකොට ඔබට දැන් ගරු කොමිෂන් සභාවට ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය ගැන?

පි : මුස්ලිම් කවුන්සලය බිහි වුනේ සුනාමි ව්‍යසනයෙන් පස්සේ තමයි බිහි වුණේ.

ප්‍ර : 2004 ?

පි : ඔව්. ඒ කියන්නේ ඒගොල්ලන් විවිධ නම් වලින් තිබිලා අපිත් ඒකේ සමාජයේ වැඩ කටයුතුවලට සහභාගි වුණා අමින් මහත්තයත් එක්ක රට පුරා සුනාමි ව්‍යසනය සම්බන්ධව. එතකොට ලංකාවට මැලේෂියානු ජනාධිපති මහතිර් මොහොමඩ් හිටපු එතුමාව ගෙන්නලා තමයි මම හිතන්නේ ක්‍රෙස්කැට් ඒකේ වෙන්න ඕනේ, එහේ උත්සවයක් තිබ්බා.

ප්‍ර : මොන කාලයේද? 2004 වගේනේ ඔබ කිව්වේ මේක පටන් ගත්තේ ?

පි : මට මතක නැහැ සුනාමි ව්‍යසනයෙන් පස්සේ.

ප්‍ර : ඔව් සුනාමි ව්‍යසනයෙන් පස්සේ ඕක ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය විදියටමද ආරම්භ වුණේ?

Presidents Secretarys Copy

FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය විදියට තමයි ආරම්භ වුනේ ඒ උත්සවයේදි.

ප්‍ර : ඒතකොට ඇයි මේ මහතීර් මොහෙමඩ් මැතිතුමාව ලංකාවට ගෙන්නුවේ?

පි : එයාට දුන්නා ඇඩම්ස්පීක් කියලා පොඩි සමරුපලකයක්. ඒ කියන්නේ ආදම්ගේ පාදය කියලා අපේ මුස්ලිම් ජනතාව විශ්වාස කරනවානේ

ප්‍ර : ශ්‍රී පාදයේ කියන එක?

පි : ශ්‍රී පාදයේ කියන එක. එතකොට එයාට දුන්නා Adam's Peak කියලා සමරුඵලකයක්. එයාව ගෙන්නුවේ මම හිතන්නේ සමහර ඒගොල්ලන්ගේ සංවිධානය brand කරන්න වගේ සංකල්පයකට ගේන්න ඇති.

ප්‍ර : ඒ කියන්නේ එතකොට ජාත්‍යන්තර වශයෙන් ඒ සංවිධානය පිළිගැනීමක් සඳහාද ඒක කළේ?

පි : ඒක වෙන්න පුළුවන් මම හිතන්නේ.

ප්‍ර : ඒ සංවිධානයේ නායකයා කවුද?

පි : මේ වනතුරු ඉන්නේ එන්.එම්.අමීන් කියන මහත්මයා තමයි ඒකේ ඉන්නේ.

ප්‍ර : ඔහුගේ පසුබිම මොකක්ද එන්.එම්.අමීන් මහත්තයගේ?

පි : එයා ඇවිල්ලා මම දන්න විදියට ලේක්හවුස් එකේ ලේඛකයෙක් වශයෙන් ආපු පුද්ගලයෙක්. ඊට පස්සේ එයා ඉමිටියාස් බාකිර් මාකර්ලගේ තාත්තලත් එක්ක දේශපාලනය කරපු එක්කෙනෙක්. මාවනැල්ල ප්‍රදේශයේ. නාරාහේන්පිට ඇල්විටිගල තමයි එයාට නිවාස ලැබුණා. ඒ නිවාස එකක තමයි දැනට කාර්යාල ලිපිනෙත් තියෙන්නේ. පසුකාලීනවලදි එයා දැන් නවමනී පත්තරේ කතෘ වශයෙන් ඉන්නවා. ශ්‍රී ලංකා මුස්ලිම් මීඩියා ෆෝරම් එකෙත් මේ දක්වාත් සභාපති එතුමා තමයි.

ප්‍ර : කොච්චර කාලයකටද ඔහු සභාපති ධූරය දරන්නේ එතකොට?

පි : මමත් ඒකේ යාවජීව සාමාජිකයෙක්. මම හිතන්නේ අවුරුදු මට දන්න තරමට 98 ඉදලා 99 වගේ කාලයට පස්සේ එයා ඉන්නවා කියලා මට මතක විදියට. ඒ සංවිධානය කවද්ද පටන් ගත්තේ කියන එක මම දන්නේ නැහැ ශ්‍රී ලංකා මුස්ලිම් ෆෝරම් කියන සංවිධානය. එතකොට ඒතුමා ඉන්නවා මේ දක්වා ඒකේ සභාපති වෙලා.

ප්‍ර : දැන් සාමාන්‍යයෙන් ඔබලාගේ සංවිධාන ලියාපදිංචි කරනවා නේද?

පි : ඔව්.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : එතකොට මේ ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය ලියාපදිංචි කරලා තියෙනව ද?

පි : ඒක ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිල් එක මේකේ මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශයේ ලියාපදිංචි කරලා තිබෙනවද දන්නේ නැහැ, හැබැයි ඒගොල්ලන් කියන්නේ Umbrella Organisation කියලා.

ප්‍ර : ඇයි ඒ Umbrella Organisation එකක් වෙන්නේ ඒක?

පි : ඒගොල්ලන්ගේ letter head එකේ පල්ලෙහා තියෙනවා සංවිධාන ගොඩකගේ නම්. ඒකේ අපෙත් ඒ කාලේ නමක් දැම්මා. මම මේ ලඟදී බැලුවා ඒ letter head එක අරන් ඒ නම තාම තියෙනවා.

ප්‍ර : මොකක්ද ඒ?

පි : Reformes of Future Islamic Generation කියලා.

ප්‍ර : ඒ ඔබේ සංවිධානයද?

පි : ඒ අපි නිකම් නාමිකව තරුණ කාලේ අපි එයත් එක්ක සම්බන්ධ වෙලා ඉන්න කොට අමීන් මහත්තයත් එක්ක සම්බන්ධ වෙලා ඉන්න කොට අපේ සංවිධානයේ නමක් දාන්න කිව්වාම මේක දාලා තිබ්බා. ඒකෙන්ම අපිට තේරුණා මම දැනට තේරුම් ගන්නවා අපේ සංවිධානය ලියාපදිංචි වෙලාද, මේක බෝඩ් ලෑල්ලක තියෙන සංවිධානයක්ද ඒවා තියෙන දේ පිළිබඳවත් දන්නේ නැතුව පිහිටවලා තියෙන්නේ මේ සංවිධානය.

ප්‍ර : ඒ කියන්නේ කරුණු සොයලා බලන්නේ නැතුව තමයි මේ Umbrella Organisation එකට මේ අනික් සංවිධාන එකතු කර ගන්නේ?

පි : ඒකේ තියෙනවා පරණ සංවිධාන තියෙනවා YMMA වගේ පාරම්පරික මුස්ලිම්, ඔල් මුවර්ස් ඇසෝෂියේෂන්ස් වගේ. MICH, ඒ වගේ වහබි සංවිධාන, සලෆි සංවිධාන ඔක්කොම ඕකේ ඇතුලේ ඉන්නවා. ඒකේ නම් ලැයිස්තුවේ. දැන් අපිත් ඒකේ සංවිධානයක් නේ මම කියන්නේ. ඒතකොට ඒකේ රැස්වීම් තිබිලා තිබෙනවා. මහා සභා රැස්වීම් තිබිලා ඇති මේ දක්වා. ඒ එකකටවත් අපිට ආරාධනා කරලත් නැහැ අපි ගිහිල්ලත් නැහැ. එදා අපි මහතිර් මොහොමඩ් දැක්කයින් පස්සේ අපිට සම්බන්ධයක් නැහැ.

ප්‍ර : ඇයි ඔබයි ඔවුනුයි අතර දැන් ඔබේ සංවිධානය ඒකේ ලියාපදිංචි කරලා තියෙනවා නම් ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලයේ ඇයි ඔබ එයින් පස්සේ ක්‍රියාකාරී විදියට ඒකට සම්බන්ධ නොවුනේ?

පි : අපි ඒ දවස්වල තිබුනු තරුණ උනන්දුව මත අපි සමාජ ක්‍රියා සත්කාරක මත අපි එතනට සම්බන්ධ වුණානේ. එතකොට දැන් එතුමාගේ වගකීමක් තියෙනවා මේ සංවිධාන ඒකේ නැත්නම් ඒක අයින් කරන්න.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ අමීන් මහත්තයාගේ?

පි : ඔව් එක්කෝ අපිට කතා කරන්න ඕනේ. එතකොට අපි කිසිම AGM එකකට ගිහිල්ලා නැහැ, මුකුත් නැහැ. එතකොට මමයි මගේ ඥාති සහෝදරයෙක් වෙච්ච තාරික් කියන අපි දෙන්නා තමයි නිකම් නම දැම්මේ ඒ කාලයේ. අපේ නමත් දාන්න ඕනේ කියලා අපි දැම්මා. ඒ කාලේ අපේ තරුණ උනන්දුව මත. එතකොට අපිට මේ දක්වා ඒවට සම්බන්ධව ආරාධනා කරලත් නැහැ මුකුත් නැහැ. අපිට මේකෙන් තේරෙනවා මේක නිකම් බොරුවට ගෙනියන සංවිධානයක් බෝඩ් ලෑල්ල දාගෙන. රටේ ප්‍රශ්න විසඳන්න, ඒක රටේ ප්‍රශ්නවලට අත පොවන්න, දේශපාලන බලපෑම් කරන්න, ෂූරා සභාව වගේ සංවිධානයක් කියලා වගේ තමයි මට වැටහෙන්නේ.

ප්‍ර : දැන් ඔය එන්.එම්.අමීන් මහත්තයට මේ යුෂුෆ් අල්කරලාවි සමඟ යම් සම්බන්ධකමක් තියෙනවද?

පි : ඒ කියන්නේ එයා ඇවිල්ලා කටාර් රාජ්‍යට යනවා මේ ඉනාමුල්ලා කියන පුද්ගලයත් එක්ක.

ප්‍ර : කවුද යන්නේ අමීන් මහත්තයා?

පි : අමීන් මහත්තයා. ඉනාමුල්ලා ඇවිල්ලා ෂූරා සභාවේ පුද්ගලයෙක්. එතකොට යුෂුෆ් අල්කරලාවි

ප්‍ර : ඔව් එතකොට ඔය ඉනාමුල්ලා මහත්තයා යම් දේශපාලනඥයෙක්ට ඥාති සම්බන්ධයක් තියෙනවද ?

පි : ඔව් රවුෆ් හකීම් අමාත්‍යවරයාගේ ඥාතිවරයෙක්.

ප්‍ර : ඒ කියන්නේ මස්සිනා?

පි : මස්සිනා. එතකොට එයාගේ තව සහෝදරයෙක් ඉන්නවා නෙමුල්ලා කියලා.

ප්‍ර : කාගේද ඉනාමුල්ලාගේ?

පි : ඔව්. එයා තමයි දැනට පුත්තලම දිස්ත්‍රික්කයේ තරඟ වදිනවා තරාදිය ලකුණ කියන ශ්‍රී ලංකා මුස්ලිම් පක්ෂය කියන පරණ පක්ෂයක නමක් වෙනස් කරලා මිලදී ගැනීම් කරලා ඒකේ ලේකම්වරයා නැත්නම් ඒකේ තනතුරක් හොබවනවා නෙමුල්ලා කියන එක්කෙනා.

ප්‍ර : එතකොට මේ ඉනාමුල්ලා මහතා සහ එන්.එම්. අමීන් මහත්මයා යනවා කටාර් රාජ්‍යයට ?

පි : ඔව්.

ප්‍ර : ඔය මොන වකවානුවේද?

පි : මම හිතන්නේ 2013, 12 වගේ වකවානුවේ කියලා තමයි මම හිතන්නේ. 2013 වගේ වකවානුවේ දි කියලා තමයි මම හිතන්නේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මොනවටද ඒ ගියේ කියලා කියන්න දන්නවද ඔබ?

පි : මම කිව්වානේ අපි සම්බන්ධ වෙච්ච නිසාර්ඩීන් මහත්තයා එතුමා තමයි මේ සම්බන්ධව හසල දැනුමක් තියෙන්නේ. එතකොට මොනවටද ගියේ කියන Agenda එක අපිට දන්නේ නැහැ. හැබැයි ඒකේ තියෙන ජීයෝ පොලිටික්ස් එක, භූගෝලිය දේශපාලනය සම්බන්ධව කරුණු කාරණා නිසාර්ඩීන් මහත්මා තමයි මට වඩා දන්නේ.

ප්‍ර : එතකොට මුහුණු පොතේ ඔය ඒ ගමන පිළිබඳව යම් ඡායාරූප එහෙම දාලා තිබුණද?

පි : ඔව් ඡායාරූප ඇවිල්ලා තිබ්බා.

ප්‍ර : ඔබ දැක්කද ඒවා?

පි : ඒකේ ප්‍රින්ට් කොපියක් නිසාර්ඩීන් මහත්තයා පෙන්නුවා.

ප්‍ර : ඒ වගේ පින්තූරයක් දැක්කොත් ඔබට නැවත හඳුනන්න පුළුවන්ද?

පි : පුළුවන්.

ප්‍ර : අපි ඒ පින්තූරය හොයා ගන්න කල් (C611, D612, C613) යුෂුෆ් අල්කරලාවි ගැන ටිකක් තොරතුරු දැනිමුකෝ ?

පි : එයා ඇවිල්ලා මරාගෙන මැරෙන පත්වා නිකුත් කරපු එක්කෙනෙක්.

ප්‍ර : ඔහුට පුළුවන්ද පත්වා නිකුත් කරන්න? මොන බලයක් ද ඔහුට තියෙන්නේ පත්වා නිකුත් කරන්න ?

පි : ඒ කියන්නේ මේ සාමාන්‍යයෙන් ඒගොල්ලන් හිතන්නේ ඒගොල්ලන් පූජකයෝ කියලා ඒගොල්ලන් ලේබල් දාගත්තු ගමන්ම. ඒගොල්ලන් ඉහළ නිළයකට ආවාම, ඒ සමහරක් සංවිධාන ඒගොල්ලන් අත්පත් කර ගත්තාම ඒ කියන්නේ මම හිතන්නේ එයා ලෝක මුස්ලිම් පූජක නැත්නම් මොකක් හරි ලොකු තනතුරක් දරන පුද්ගලයෙක්. එතකොට ලිබියාවේ අර ගඩාෆි ජනාධිපතිවරයාව මරා දමන්න, භූගෝලීය දේශපාලනය උවමනාව මත එතුමා ෆත්වා ඒකක් නිකුත් කරනවා එයා මරන්න පුළුවන් කියලා. එතකොට මේක ඇවිල්ලා

ප්‍ර : එතකොට ගඩාෆි මැතිතුමාව ඝාතනය කෙරුවේ ඒ පත්වා එක මතද?

පි : ඒ මතත් වෙන්න පුළුවන් මොකද දැන් ඒ උනන්දුව ඇති වෙනවානේ,

ප්‍ර : ද එහෙම නැත්නම් වෙන විදේශ රටක්ද?

පි : විදේශ රටවල බලපෑම තිබ්බා. ඒක අනුසාහික වශයෙන් මෙයාගේ ප්‍රකාශයත් ඒකේ බලපෑවා කියන එක මම හිතනවා. එතකොට මෙයාගේ පලස්තීන් ..

ප්‍ර : ඔය අමීන් මහත්තයට දරුවෝ ඉන්නවා නේද?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ඉන්නවා.

ප්‍ර : ඔහුට දුවලා කීයක් ඉන්නවද?

පි : මම දැනුවත්ව දුවෙකුයි, පුතෙකුයි තමයි ඉන්නේ.

ප්‍ර : දුව කොහේද ඉන්නේ?

පි : විදේශ රටක නේ එංගලන්තයේ.

ප්‍ර : පුතා?

පි : පුතා ලංකාවේ ඉන්නවා දැනට මොන වෘත්තියේ නියැලෙනවද කියලා දන්නේ නැහැ, හැබැයි ඒයා BBC ඒකේ ලංකා වාර්තාකරු වශයෙන් තමා හිටියේ.

ප්‍ර : කොයි කාලෙද?

පි : මෑතක් වනතුරුම, මම හිතන්නේ ගිය අවුරුද්දේ අග භාගයේදි තමයි එයා එතනින් අයින් වුනේ.

ප්‍ර : ඇයි ඒකෙන් අයින් වෙන්න වුනේ කියලා ඔබ දන්නවද?

පි : එයාගේ මොකක් හරි ප්‍රකාශයක් Facebook එකේ සටහනක් මත තමයි එයාව අයින් කළාද අයින් වුණාද කියන එක දන්නේ නැහැ, හැබැයි එයා අයින් වෙන්න හිටියා කියලා තමයි කිව්වේ. එයා අයින් වෙන්න ලියුමක් දුන්න විදියට තමයි එයා ප්‍රකාශයක් නිකුත් කරලා තිබ්බේ.

ප්‍ර : එතකොට ඔහුගේ නම දන්නවද ?

පි : අසාම් අමීන්

ප්‍ර : අසාම් අමීන්ට කොයි ආකාරයකටද BBC සිංහල සේවයේ නේද ඔහු සේවය කෙරුවේ?

පි : ඔව්.

ප්‍ර : ඒ රැකියාව ලැබුණේ කොහොමද කියන්න ඔබ දන්නවද?

පි : මම හිතන්නේ සමහරක් වෙලාවට පියා ශ්‍රී ලංකා මුස්ලිම් ජනමාධ්‍යවේදි සංවිධානයේ සභාපති. ඒ වගේම ජාත්‍යන්තර සාක් සංවිධාන වල ඔක්කොම ලොකු තනතුරු රාශියක් දරමින් හිටියා අමීන් මහත්තයා. එතකොට එයාට එම තනතුර තාත්තගේ මේක මත ලැබුණා නම් වැරදියි. එයාගේ සුදුසුකම් මත ලැබුණා නම් මම හරි කියලා පිළිගන්නවා. හැබැයි ඔය BBC ගුවන් විදුලි සේවය සාමාන්‍යයෙන් වාමාංශික ප්‍රගතගීලී ජනමාධ්‍යවේදීන් තමයි සිංහල සේවයේ කටයුතු කළේ. ඥාණසිරි කොත්තිගොඩගේ, එල්මෝ ප්‍රනාන්දුල වගේ මිනිස්සුන්. එතකොට මෙයා සාමාන්‍යයෙන් පුංචි එක්කෙනෙක්.

ප්‍ර : ඒ කියන්නේ ඒගොල්ලන්ට ඇවිල්ලා හසල දැනුමක් මේ අමීන් මහත්තයගේ පුතා ගැන ඔබ කියන්නේ පුංචි එක්කෙනෙක් කියලා?

පි : ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඇයි පුංචියි කියන්නේ අත් දැකීම් නැහැ?

පි : අත්දැකීමෙන්. BBC කියන්නේ ලෝක මාධ්‍යයක් නේ. එතකොට ලංකාවේ කොහේ හරි මාධ්‍යයක ප්‍රචලිත වෙලා Interview ස් අරගෙන ඒ වගේ තැනකට එන්න ඕන කෙනෙක් නේ.

ප්‍ර : එල්මෝ ප්‍රනාන්දු වගේ නෙමෙයි ඔබ කියන්නේ?

පි : නැහැ එල්මෝ ප්‍රනාන්දු, ඥාණසිරි කොත්තිගොඩගේ ඒ වගේ මිනිස්සු වගේ නෙමෙයි. එතකොට ඒගොල්ලන් ඉන්න කාලේ BBC ඇවිල්ලා හඬක් නැති මිනිස්සුන්ටත් හඬක් දුන්නා. ඒ කියන්නේ මුස්ලිම් සමාජයේ තියෙනවා විකල්ප මතවලට. මුජිබර් රහුමාන්ලා වගේ ඒ චරිතවල් වලට ඒ දවස්වල හොඳ ඉඩක් තිබ්බා BBC සිංහල සේවය තුළ. මෙයාගේ ආගමනයත් එක්ක මුස්ලිම් සමාජයේ තියෙන විකල්ප අදහස් වලට සිංහල භාෂාවෙන් ඉඩ තිබ්බේ නැහැ.

ප්‍ර : කාගේ ආගමනයද?

පි : අමීන් මහත්තයාගේ පුතා ආවයින් පස්සේ.

ප්‍ර : පුතාගේ ආගමනයත් එක්ක BBC සිංහල සේවයට?

පි : ඔව්.

ප්‍ර : ඔබ BBC සිංහල සේවයට සවන් දෙන කෙනෙක්ද?

පි : සවන් දෙන කෙනෙක් මමත් ඒවට Interview ස් වලට Interview දීලා තියෙනවා ඥාණසිරි කොත්තිගොඩගේ, එල්මෝ ප්‍රනාන්දු මහත්තයා දැන් අභාවප්‍රාප්තයි. එතුමාට ඔක්කොම මම Interview ස් දීලා තියෙනවා. එතකොට අපෙන් විකල්ප මත අහන කොට අපෙන් තමයි ඇසීමේ ප්‍රවණතාවයක් තිබ්බේ. එතකොට අමීන් මහත්තයාගේ පුතාගේ ආගමනයත් එක්ක ඒ වගේ විකල්ප අදහස් වලට යොමු වුනෙත් නැහැ එහෙම ඇහුවෙත් නැහැ අපෙන් ඒ පිළිබඳව විමසීම් කලෙත් නැහැ. අපිත් එයත් එක්ක ඒ සම්බන්ධව එයාගෙන් විමසන්න ගියෙත් නැහැ, අපි BBC සිංහල සේවයට ඒ සම්බන්ධව කතා කරන්න ගියෙත් නැහැ.

ප්‍ර : ඒ අනුව ඔබ හිතනවද ඔබට හැඟුන ආකාරයට ඔය BBC සිංහල පුවත් සේවයට සවන්දෙන කෙනෙක් විදියට අමීන් මහතාගේ පුත්‍රයා BBC සිංහල සේවයේ වාර්තාකරු වුණාට පස්සේ අර එහි තිබුණු ගුණාත්මක අගය සහ සමබරතාවය යම් ආකාරයකට හානි වුණා කියලා?

පි : අනිවාර්යයෙන්ම සමබරතාවය නැති වුණා. ඒ කියන්නේ අනෙකුත් දේශපාලන පුද්ගලයන්ගෙන් ප්‍රචලිත පුද්ගලයන් රටේ ලෝකේ දේවල් ලංකාවේ ජනමාධ්‍ය දේශපාලන සම්බන්ධ තොරතුරු එතුමා Interview කලා. අසාම් අමීන් මහත්තයා. ඒ

FAIR COMMENT BY JEZEEM

වුණාට විකල්ප අදහස් වලට ඒ කියන්නේ විශේෂයෙන් මුස්ලිම් සමාජය තුළ තියෙන විකල්ප අදහස්වලට එතුමාගේ ඉඩක් තිබ්බේ නැහැ.

ප්‍ර : දැන් මුස්ලිම් ජන කොටියාශය නියෝජනය කරනු ලබන තැනැත්තෙක් විදියට ඔබට මේ ගරු කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලයේ ඔය සභාපතිත්වය දරන එම්.එන්.අමීන් මහතාගෙන් යම් ඔබේ මුස්ලිම් ජන කොටියාශයට යම් ආකාරයක බලපෑමක් ඇති වෙනවද කියලා?

පි : බලපෑමක් ඇති වෙන්නේ නැහැ එතුමා මම දන්න තරමට අහිංසක පුද්ගලයෙක්. ඒ වුණාට එතුමා යම්කිසි න්‍යාය පත්‍රවලට එතුමාව නොදැනුවත්ව වැඩ කරනවාද කියන එක ප්‍රශ්නයක් තියෙනවා. ඒ කියන්නේ යුෂුෆ් අල්කරලාවි වගේ පුද්ගලයන්ව ගිහිල්ලා මුණ ගැසීම, එයා දැන් තුර්කියට ගිහිල්ලා තියෙනවා,

ප්‍ර : කවුද අමීන් මහත්තයා?

පි : අමීන් මහත්තයා.

ප්‍ර : තුර්කියට යන්න හොඳ නැද්ද?

පි : යන්න පුළුවන්. මම කියන්නේ තුර්කියේ තියෙන දේශපාලන වටපිටාව. ඒ සම්බන්ධව තියෙන දේවල් ජියෝ පොලිටික්ස් තියෙනවානේ, එතකොට භූගෝලීය දේශපාලන සම්බන්ධ වාතාවරණයන් තියෙනවා. එතකොට ජනමාධ්‍යවේදීන්ට මම දන්න තරමින් ටැප්ටොප්ස් ලබා දුන්නා. මුස්ලිම් සහ මුස්ලිම් නොවන ජනමාධ්‍ය වේදීන්ට.

ප්‍ර : ඉතින් ඒක හොඳයිනේ?

පි : මම කියන්නේ මේකේ හිටින් එජෙන්ඩාස් වැඩ කරනවානේ. දැන් තුර්කිය සම්බන්ධව කතා කරන්න, තුර්කීයේ දේශපාලනය, ඊට පස්සේ පස්තීනයේ ප්‍රශ්නෙ ගැන කතා කරන්න,

ප්‍ර : එතකොට යුෂුෆ් අල්කාරලාවිව මුණ ගැසීම ඒ වගේ දේවල් ඔබ මේ එකට එකක් පෙලගස්වලා තමයි කියන්නේ යම් මේකේ යටි අරමුණක් තියෙන්නට පුළුවන් කියලා?

පි : පුළුවන්. ඒ කියන්නේ හොඳ දේවල් කරනවා තමයි. ඒ කියන්නේ ජනමාධ්‍යය සංවිධාන හරහා ජනමාධ්‍ය වේදීන්නට අඟ හිඟකම්වලට උදව් කිරීම ඒවා ඔක්කොම හොඳ ප්‍රවනතාවයන්. මම කියන්නේ ඒගොල්ලන්ගේ නොදැනුවත් භාවය මත සිද්ධ වෙන සමහරක් දේවල් තියෙනවානේ, ඒගොල්ලන්ම දන්නේ නැතුව.

ප්‍ර : ඒ වගේ දේවල්වලට ඔහු හසු වන්නට පුළුවන් කියලා කියන්නේ?

පි : පුළුවන්.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහෙම නම් දැන් ඔබ උලමා සභාවේ ඉන්නවා කියලා කිව්වොත් තබ්ලික් ජමාත්?

පි : ඔව්.

ප්‍ර : නිකායට අයත් පුද්ගලයින්?

පි : ඔව්.

ප්‍ර : ඔය තබ්ලික් ජමාත් පිළිබඳව ඔබ පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට කියන්න? කොහෙන්ද ඒක පටන් අරගෙන තියෙන්නේ.?

පි : යුෂුෆ් අල්කරලාවි ගැන යම්කිසි ප්‍රකාශයක් කරපු නිසා මම පොඩි මේකක් කතා කරන්න කැමතියි.

ප්‍ර : කියන්නකෝ එහෙනම්?

පි : එතුමා දීලා තියෙනවා කුර්ආන් වැකියක් මෙතන සඳහන් කරලා.

ප්‍ර : කොයි තුමාද ලියලා තියෙන්නේ?

පි : මේක ඇවිල්ලා පස්තීන් පිරව්චනයිම් පෝරාට්ටමම් (දෙමලෙන් වැකියක් කියවයි) මම මුලදි කිව්වානේ පලස්තීනයේ ප්‍රශ්නේ කතා කරලා තමයි මේගොල්ලන් මුස්ලිම් සමාජය තුළට යුධ මානසිකත්වය දෙන්නේ. එතකොට මේක එළිදක්වනනේ මීල්පාරුවේ වෙලීට් ....(දෙමලෙන් වැකියක් කියවයි) මීල්පාරුවේ කියන්නේ ඇවිල්ලා නලීමිලා, ඉක්වාන් මුස්ලිම්ස්ලා, ඔය අගාර් මොහොමඩ්ලා ඒ කට්ටිය ඔස්සාඩ් මන්සුර්ලා මිනිස්සු හිටපු සංවිධානයක්. ඒකේ පත්තරයක් තමයි මීල්පාරුවේ කියන්නේ. එතකොට ජමාතු සලාමා ඒගොල්ලන්ගේ තබ්ලික් ජමාත් වගේ. එතකොට ඒකේ ප්‍රකාශයක් තමයි මේක. එතකොට ඒකේ යුෂුෆ් අල්කරලාවිගේ මාර්කත්තිර්පු (දෙමල වචනයක්) ඒ කියන්නේ පතුවා එකක්. එතකොට.(දෙමල වැකියයක් කියවයි) ඒ කියන්නේ ආක්‍රමණයට විරුද්ධව කොහොමද සටන් කරන්නේ කියන එක. ඒකේ කුර්ආන් ආයතනය කෝට් කරලා කතා කරලා තියෙනවා (දෙමල වැකියක් කියවයි) ඒ කියන්නේ අන්‍ය ජාතිකයන්.

ප්‍ර : මුස්ලිම් නොවන අය?

පි : ඔව්.(දෙමල වැකියක් කියවයි) ජිහාද් කියන්නේ අනිවාර්යය වගකීමක් වෙනවා කියලා ඒයා කියනවා. (දෙමල වැකියක්) තවුහා කියන මේක කෝ කරලා එයා කියනවා . එතකොට යුෂුෆ් අල්කරලාවි ඇවිල්ලා මරාගෙන මැරෙන්න කියන ඒ භූමිකාවට යම්කිසි අර්ථ නිරූපනයක් සහ මේ සම්බන්ධව ලංකාවේ ප්‍රකාශයට පත් කරලා තියෙනවා මේ පොතක්. මේ පොත්පත් වලින් තමයි මේකෙන් කියන්නේ නැහැ අරයා මරන්න මෙයා මරන්න කියලා. යම්කිසි රුකුලක් දෙනවා තල්ලුවක් දෙනවා.

ප්‍ර : මේ පොත ලංකාවේ ගන්න තියෙනවද?

පි : දැනට නැහැ. අපි ඒ දවස්වල තරුණ කාලේ ගත්තු පොත් මේවා.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප : ඔබ කොහෙන්ද ගත්තේ ඕක?

පි : මට මතක තියෙන විදියට මම ගොඩක් පොත් පත් මිලදී ගත්තේ ඇවිල්ලා ඉස්ලාමික් බුක් හවුස් එකෙන්. ඒ කියන්නේ දෙමටගොඩ. මම සහිරා කොලේජ් එක ඉවර වෙලා එතනට එන කොට මම පොත් පත් අරන් යනවා. ප්‍රබෝධය වගේ මැගසීන් ඒවගේ දෙවල් අරන් යනවා. සිංහල භාෂාවෙන් කියවන්න මට දෙමල අපේ අම්මා උගන්නපු නිසා

ප : ප්‍රබෝධය ජමාතේ ඉස්ලාමී නේද?

පි : ඔව් ජමාතේ ඉස්ලාමී. ඒගොල්ලන්ගේ අල් හසනාත් කියලත් තියෙනවා.

ප : ඔය පොතේ නම නැවත කියනවද?

පි : පලස්තීන් පිරව්චිනයුම් පෝරාට්ටමම්

<u>ස්වාමිනි ඒම පොත IAKR 5 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා</u>.

පි : මම මේ පොතේ සම්පූර්ණ දේවල්ම කියවලා නැහැ. මම ආකර්ශණයට ගත්තු පොත්. ඒතකොට මම මේ පොත් ටික අරගෙන

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

මේ අවස්ථාවේදි ලකුණු කරන ලද IAKR 5 දරන ලේඛනයේ ඇතුලත පිටුවේ යුෂුෆ් අල්කර්දාවි විසින් කර ඇති හැඳින්වීම

(මේ අවස්ථාවේදි සොලිසිටර් ජනරාල් මෙනවිය එය IAKR5(A) වශයෙන් ලකුණු කර සිටි)

එලෙස ලකුණු කරන ලද IAKR5(A) පිටුවේ සිංහල පරිවර්ථනයක් සකස් කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ භාෂා පරිවර්ථකට නියෝග කරමි.

නිවැරදි කිරිමක් IAKR5(A) වශයෙන් ලකුණු කරන ලද කොටස සිංහල භාෂාවට පරිවර්ථනය කොට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ භාෂා පරිවර්ථකට නියෝග කරන අතර එය එසේ ඉදිරිපත් කළ පසු එය IAKR5(B) වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අජේෂා ජීනසේන මෙනවිය:</u>

ප : දැන් අපිට තබලික් ජමාත් ගැන පොඩ්ඩක් කතා කරන්න පුළුවන්ද?

FAIR COMMENT BY JEZEEM

පි : තබ්ලික් ජමාත් එක ඇවිල්ලා ඉන්දියාවේ නවදිල්ලි නුවර මුල් කර ගෙන තමයි එවකට දී දේශපාලන බ්‍රිතාන්‍ය අධිරාජ කාලසීමාව තුළදී බිහි වුනේ. ඉල්ලියාස් කියන පුද්ගලයෙකු හරහා. තබ්ලික් ජමාත් සංවිධානයේ කට්ටියව ඒ කාලේ ඒගොල්ලන්ගේ ඇඳුම් පැළඳුම් ඔක්කොම තිබ්බේ නේරු මහත්මයාගේ ඇඳුම් හා සමානව. මෙතන ඉන්න කවුරු හරි දැකලා තියෙනවද දන්නේ නැහැ පුංචි කාලවල්වල ඒ වගේ මිනිස්සු ලංකාවේ පාරවල්වල හිටියා.

ප්‍ර : ඔව් නේරු මහත්මයාගේ සුදු තොප්පිය දාලා..

පි : සරමයි ෂර්ට් එකයි දාපු මිනිස්සු හිටියා. ඒක තමයි ඉස්සර තබ්ලික් ජමාත් කට්ටියගේ ඇඳුම. දැන් වගේ අරාබි ඇඳුම් තිබ්බේ නැහැ. එතකොට ඒක දකුණු ආසියානු කලාපයේ සංස්කෘතික ඇඳුම තමයි එතන තිබ්බේ.

ප්‍ර : ඔබ මේ සඳහන් කරන්නේ මොන වකවානුව ගැනද සාමාන්‍යයෙන් දළ වශයෙන්?

පි : මගේ, මම 1981 න් පස්සේ උපත ලැබූ කට්ටියනේ. එතකොට මගේ කාල වකවානුව අනුව කියනවා නම් 90 ගණන්වල මොකද අපේ ගමේ තියෙන පල්ලියේ හිටපු ඒ පුජකතුමත් ඒ ඇඳුම මහනවා. එයාගේ මැෂින් එකත් තියලා එයාගේ පූජකවරුන් මේකේ කුළියට ඇඳුම් මහනවා. එතකොට එයා දාලා තිබ්බෙත් ඒ තොප්පිය තමයි. එතකොට ඒ කාල වකවානුව තුළ අපි පාරවල්වල සැරිසරන කොට දැක්කෙත් ඒ වගේ මිනිස්සු. දැන් නැහැ. දැන් තියෙන්නේ අරාබි සංසස්කෘතිකත්වය මුල් කරගත් ඇඳුම් තමයි තියෙන්නේ. එතකොට අර පකිස්ථාන් ඇඳුමත් තිබ්බා. ඒ කියන්නේ පකිස්ථානයේ මිනිස්සු දාන්නේ අර පන්ජාබ් කිට් එකක් පිරිම කට්ටිය දාන්නේ අර උඩ සර්වා කමිසයක් ඒ වගේ. දැන් ඒක නෙමෙයි දැන් තියෙන්නේ අරාබි ලොගුව සුදුපාට ඒක තමයි දාන්නේ. එතකොට ඉන්දියාවේ නේරු ජනාධිපතිවරයා ඒ කාලේ අර දේශපාලන උවමනාවන් මත භූගෝලීය දේශපාලන හේතු මත බ්‍රිතාන්‍ය අදිරාජ්‍ය පකිස්ථාන් අර ජින්නලගේ ප්‍රශ්න මත ඒ කාලේ ඔත්තු සේවාවන් විසින් හදපු සංවිධානයක් කියලා තමයි මේ පොත්පත් වල තියෙන්නේ. තබ්ලික් ජමාත් සංවිධානයට සම්බන්ධව

ප්‍ර : ඔබ ගාව පොත් තියෙනවද?

පි : ඔව් මේක අපේ තාත්තා තියාගත්තු පොත්. එතකොට මේකේ තියෙනවා තබ්ලික් ජමාතිල් වහබිසම්ෂ කිරිමිහල් (දෙමල වාක්‍යයක්) ඒ කියන්නේ තබ්ලික් ජමාත් ඒක තුළ තියෙන විෂ කරුණු කියලා මේකේ තියෙනවා.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : කවුද ලියලා තියෙන්නේ?

පි : මේක ලියලා තියෙන්නේ කායල්පටිනම් මේක ඉන්දියාවේ. මේක බිහි වෙච්ච රටේම තමයි මේ පොත ලියලා තියෙන්නේ.

ප්‍ර : ඒ කියන්නේ තබ්ලික් ජමාත් සංවිධානයේ ඒ තියෙන නරක පැත්ත ගැන තමයි මේ පොතේ තියෙන්නේ?

පි : පොතේ තියෙන්නේ.

ප්‍ර : අපි ලකුණු කරමුද ඒක?

පි : හරි.

ප්‍ර : නැවත ඒකේ නම කියන්න කෝ ඔබ පරිවර්ථනය කරලා තියෙන? නැත්නම් ඕක දෙමලෙන්ද තියෙන්නේ?

පි : ඔව්. තබ්ලික් ජමාද්තිල් වහාබිෂතින් විෂක්කිරිමිහල්

ප්‍ර : කවුද ලියලා තියෙන්නේ?

පි : මේක ප්‍රකාශනය හිස්බුල්ලා සභාව සූෆි මන්සිල්. කායල්පටිනම් ඉන්දියාවේ.

ප්‍ර : ඉන්දියාවේ කවුද ප්‍රකාශ කර තියෙන්නේ?

පි : හිස්බුල්ලා සභාව. සූෆි මන්සිල්.

ප්‍ර : මන්සිල් කියන්නේ මොකද?

පි : මන්සිල් කියන්නේ මම හිතන්නේ නිවස වගේ අර්ථයක් දෙන්නේ. ඉන්දියාවේ කායල්පට්ටම් තියන නගරයේ තමයි මේක.

ප්‍ර : මොන අවුරද්දේ ද?

පි : මේ පොත නම් ඉතාමත් පැරණි පොතක්. 1985.

<u>ස්වාමිණි ඉන්දියාවේ 1985 දී හිස්බුල්ලා සභාව විසින් ප්‍රකාශයට පත් කොට ඇති තබ්ලික් ජමාඅතිල් වහාබිෂතින් විෂක්කිරිමිහල් නමැති පොත IAKR 6 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.</u>

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මහතා:</u>

ප්‍ර : How many pages are there?

පි : මේකේ හරියට pages counting එකක් නැහැ හරියට.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඔක කියවලා තිබෙනවද ඔබ?

පි : නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මහතා:</u>

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : සාමාන්‍යයෙන් පිටු 20 ක් විතර?

පි : මට පේන විදියට මේක පිටු 80 ක් විතර ඇති.

මේ අවස්ථාවේදි IAKR 6 වශයෙන් ලකුණු කරන ලද සම්පූර්ණ පොතේ සිංහල පරිවර්ථනයක් සකස් කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ භාෂා පරිවර්ථකට නියෝග කරන අතර එය එසේ කල පසු එය IAKR 6(A) වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

පි : සමාවෙන්න, තව පොතකුත් තියෙනවා

ප්‍ර : මොකක්ද ඒ පොත?

පි : තබ්ලිත් ජමාතිල් ඒන්සේර කූඩාදු . තබ්ලික් ජමාත් එකට ඇයි එකතු නොවිය යුත්තේ. ඒකත් ඒගොල්ලන් තමා ප්‍රකාශ කලාට ලංකාවේ ශාඛාවක් තියෙනවා කියලා මම දැන ගන්නේ හිස්බුල්ලා සබෙයි සූෆි මන්සිල් ගල්හින්න කන්ඩි නුවර.

ප්‍ර : තගබ්ලික් ජමාතිල් ඒන්සේර කූඩාදු මේක 1995. පිටු 24 ක් තියෙනවා.

<u>ස්වාමිණි එම තබ්ලික් ජමාතිල් ඒන්සේර කූඩාදු ස්වාමීනි එම පොත 1995 ප්‍රකාශයට පත් කරලා තියෙන්නේ එය IAKR 7 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිමි.</u>

ප්‍ර : දැන් ඔබ කිව්වා නුවර ප්‍රදේශයේ ශාඛාවක් තිබෙන බව ඔබ දැන ගත්තයි කියලා ඔය පොතේ? ඒ කියන්නේ දැන් මේ IAKR 7 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරපු පොතේ. ඒ මොකේ ශාඛාවක්ද නුවර තියෙනවා කියලා දැන ගත්තේ?

පි : මම කියන්නේ ඇවිල්ල මේක අර කලින් නමක් කිව්වානේ තබ්ලික් තබ්ලික් ජමාඅතිල් වහාබිෂතින් විෂක්කිරිමිහල් කියලා?

ප්‍ර : ඔව්.

පි : ඒ පොත ප්‍රකාශ කරන්නේ හිස්බුල්ලා සබෙයි සූෆි මන්සුල් ඉන්දියාවේ කායල්පට්නම් නේ.

ප්‍ර : ඔව්.

පි : මේ පොත ප්‍රකාශ කරන්නේ මේ හිස්බුල්ලා සබෙයි කියන සූෆි මන්සිල් එකේ ගල්හින්න නුවර ශාඛාව කියලා

ප්‍ර : ඒ කියන්නේ හිස්බුල්ලා සභාවේ ශාඛාවක් නුවර ගල්හින්නේ තියෙනවා ඒකයි මේ කියන්නේ?

පි : ඔව්.

Prasidheeya Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබට කියන්නට පුළුවන්ද ඇයි ඉන්දියාවේ මේ ඉල්ලියාස් කියන තැනැත්තාට තබ්ලික් ජමාත් සංවිධානය පිහිටුවීමට හැකි වුණේ කියලා, මොකක්ද පසුබිම?

පි : ඉන්දියාවේ ඇවිල්ලා දේශපාලන රැල්ලක් තිබ්බානේ. වෙනමම යන්න ඕන කියලා මුස්ලිම් ජනතාව අතර. වෙනමම රටක්.

ප්‍ර : මොන අවුරුද්ද ගැනද ඔබ කියන්නේ, මොන වකවානුව ගැනද?

පි : ඉන්දියානු නිදහස් සටන් වකවානුව.

ප්‍ර : 1947 ට ඉස්සෙරලා ?

පි : ඔව් 47 ට ඉස්සෙල්ලා.

ප්‍ර : ඒගොල්ලන්ට 47?

පි : ඔව්.

ප්‍ර : 47 ට ඉස්සරවෙලා ඔබ ඔය කියන්නේ?

පි : ඔව් 1947 ඒ වකවානුව තුල අර ජින්නලාගේ ප්‍රශ්නයක් තිබ්බානේ වෙනමම පකිස්ථාන් රටක් ඉල්ලුවා කියලා . එතකොට ඒක දියාරු කරන්න වගේ

ප්‍ර : ඒ ඉල්ලීම දියාරු කිරීම සඳහා?

පි : මේ සංවිධාන ඇවිල්ලා සාමාන්‍යයෙන් ඇල්මැරුණු සංවිධානයක් තබ්ලික් ජමාත් කියන්නේ. පොත් පත් කියවන්නේ නැහැ. ඉගෙන ගන්නේ නැහැ. ඒකට උදාහරණයක් ගන්න පුළුවන් ඇෆ්ගනිස්ථානයේ තලෙයිබාන්ලා වගේ. ඒ තමයි ඒගොල්ලන්ගේ තබ්ලික් චින්තනය තුළ තියෙන්නේ. මේ ගැන වැඩිය දැනීමක් ලබන්නේ නැහැ, ඒගොල්ලන් ඇවිල්ලා අල්කුර්ආනයට වඩා ඒගොල්ලන් ගාව තියෙනවා

ප්‍ර : පොත මොකක්ද අල්කුර්ආන්, හදීෂ් නැතුව? ඒගොල්ලෝ මොකක්ද?

පි : තාලිම් කියලා ඒගොල්ලන්ගේ පොතක් තියෙනවා. එතකොට ඒ පොත ලියලා තියන්නේ අර ඉල්ලියාස් කියන එක්කෙනා. ඒ වල තියෙන්නේ ඇවිල්ලා නිකම් සුරංගනා කතා වගේ තමයි තියෙන්නේ. ඔය ඉස්ලාම් කියලා පෙන්නුවට ඉස්ලාම් නෙමෙයි. එතකොට ඒ කතාවල්වල තමයි ඒගොල්ලන්ව මෝහනය කරලා

ප්‍ර : කවුද ලියලා තියෙන්නේ?

පි : ඒක ඉල්ලියාස්. තබ්ලික් ජමාත් ඒකේ නිර්මාතෘ. එතකොට ඒ සම්බන්ධව හසල විදියට විග්‍රහයක් මම හිතන්නේ මෙහේ කලාද මම දන්නේ නැහැ හිසාන් හාෆිස් කියලා.

ප්‍ර : නැහැ විග්‍රහයක් නම් කරලා නැහැ?

පි : එතුමා ඇවිල්ලා තබ්ලික් ජමාත් සම්බන්ධව ඉතාමත්ම අපිට වඩා යම්කිසි කරුනු කාරණා සහිතව එවිඩන්ස් සම්බන්ධව දේශනා පවත්වන ලෙක්චර් කෙනෙක්. එතකොට එතුමාත් කියලා

Project Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

තියෙනවා ඇවිල්ලා දැන් තබ්ලික් ජමාත් කියන්නේ අර දේශපාලන උවමනාවන් මත ඒ කාලවල් වල හදපු සංවිධානයක්. පසුකාලයේදි ආගමික සංවිධානයක් වශයෙන් දිල්ලියේදි ඒකට ඉඩමුත් දුන්නා. ඒකට කියන්නේ දිල්ලි මර්කස් කියලා. එතකොට ඒ උවමනාව මත තමයි ඒ සංවිධානය බිහි වුණේ.

ප : මර්කස් කියන්නේ මොකද?

පි : මර්කස් කියන්නේ ඒ සංවිධානයට ඒකේ අරාබි පරිවර්ථනය මම දන්නේ නැහැ මම හිතන්නේ මූලස්ථානය වගේ මොකක් හරි අර්ථ කථනයක්. එතකොට ලංකාවෙත් මර්කස් තියෙනවා ග්‍රෑන්ඩ්පාස් ඒකේ. එතකොට ලංකාවේ දැන් ඒක පල්ලියක් නෙමෙයි ඒක මූලස්ථානයක්. ලංකාවේ සමහරක් පල්ලි මර්කස් කළා මේගොල්ලන්.

ප : කවුද කළේ?

පි : තබ්ලික් ජමාත් ඒකෙන්. බයිපෝස්ලිත් කළා. ඒගොල්ලන්ට උවමනා නැති තැන්වල ලේසි තැන්වල නෝමලුත් කළා.

ප : කොහේද තියෙන්නේ ඒ මර්කස් ලංකාවේ?

පි : දැනට ලංකාවේ වැල්ලවත්ත පල්ලියේ මර්කස් එකක්. කොලඹ මම කියන්නේ.

ප : ඒ කියන්නේ මූලස්ථාන කරනවා මේ?

පි : ඔව් වැල්ලවත්ත පල්ලිය මර්කස් කළාට ඒක සාවිය එකක්. මම කලින් කිව්වේ සාවියා.

ප : ඔව් ඔව් සාවියා තක්කියා ?

පි : ඔව් එක සාවියා පල්ලියක්. පාරම්පරික මිනිස්සුන්ගේ. ඒකේ බලයත් බයිපෝස්ලි අරන් තියෙනවා. ඒ කියන්නේ ඒගොල්ලන්ගේ ඒ කාලේ හිටියා ලංකාවේ මේ සමහරක් චන්ඩි හිටියා මුස්ලිම් නමගිය අපරාධකරුවන් කෙරුමන් ඔය ෆ්වෝද් ආජිලා වගේ අළුත්කඩේදි ඒයා නැති වුණා. ඒ වගේ මිනිස්සුන්ව දම්මලා තමයි ඒ පල්ලි ඩැහැ ගත්තේ. එතකොට වහබි මිනිස්සු පල්ලි ඩැහා ගන්නේ නැහැනේ, ඒගොල්ලන් අළුතින් නිර්මාණය කරනවානේ. මේගොල්ලන් පාරම්පරික මිනිස්සුත් එක්ක තමයි හිටියේ ඒ කට්ටිය. පල්ලිවලින් ඒගොල්ලන් ඉඩ දීලා ඒ වගේ පල්ලි ඩැහැ ගෙන මර්කස් ප්‍රැක්ටිස් කරන්න පටන් ගත්තා.

ප : ඇයි ඒ මොකද එහෙම හෙඩ් ඔෆිස් ඒකක් ?

පි : හෙඩ් ඔෆිස් එකක් විදියට ඒගොල්ලන් ක්‍රියාත්මක කරන්නේ

ප : එහෙම කරන්නේ ඇයි?

පි : සතියකට වරක් ඒ කියන්නේ බ්‍රහස්පතින්දා රෑට ඒගොල්ලන් ඒක මූලස්ථානයක් කර ගෙන ගෙදර ඉදලා ඇවිල්ලා ඉදලා පොඩි දේශනා ටිකක් අහලා ඔහොම යනවා.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : විල්ලා ඒකට?

පි : විල්ලා කියන්නේ ඒගොල්ලන් ඇවිල්ලා දවස් 40 ක් වගේ මාස 4 ½ ක් වගේ යනවා. ගෑණු කට්ටියව දාලා

ප්‍ර : විල්ලා ජමාත්?

පි : ඔව් පිට රට හරි කොහේ හරි යනවා. ලංකාවේ හරි දවස් 3 තමා කෙටිම එක. දවස් 3 කියන්නේ සිකුරාදට ගිහිල්ලා ඉරිදට එනවා. එතකොට ගෙදර කට්ටියවත් දාලා තමයි අඹු දරුවනුත් දාලා තමයි ඒගොල්ලන් යන්නේ.

ප්‍ර : ඒ විල්ලාවල මොනවද කරන්නේ?

පි : ඒකට මම ගිහිල්ලා නැහැ, සාමාන්‍යයෙන් ඒගොල්ලන් ඇවිල්ලා සාමාන්‍යයෙන් මේ ආගම නෙමෙයි ඒගොල්ලන්ගේ මතවාදය ඇතුලේ යන සංවිධානයක්. එතකොට ඒගොල්ලන් බිම් මට්ටම තමයි අල්ලගෙන ඉන්නේ. එතකොට ඒගොල්ලන්ගේ මතවාදය ගෙනියන්න ලේසියි ඇවිල්ලා බිම් මට්ටම තුළින්. එතකොට ඒ සංවිධානය දැන් ලංකාවේ තියෙන පාරම්පරික මිනිස්සුන්ගේ පල්ලිවල ඒය දැන් සමහර පල්ලිවල තියෙනවා මේවා සුසාන පෞරාණික සූෆී සුසාන තියෙනවා. කොල්ලුපිටියේ පල්ලියෙත් තියෙනවා. කොල්ලුපිටියේ පල්ලියේ වෙල්කම් ටු මස්ජිත් කියලා ප්‍රොගෑම් එකක් කළා. එන්න අපේ පල්ලියට කියලා. එතකොට ඒකට අන්‍ය ජාතිකයන් ගෙනල්ලා පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ඊට කලිනුත් ඒගොල්ලන් කරන් හිටියා. වැල්ලවත්ත CIS සෙල්ටර් ෆෝ ඉස්ලාමික් ස්ටඩීන් සෙන්ටර් ඒක හරහා. එතකොට ඒගොල්ලන් කොල්ලුපිටිය පල්ලියේ ගෙනාවට නුවර මීරා මක්කම් පල්ලියෙත් ඒක කලා. හැබැයි නුවර මීරා මක්කම් පල්ලියෙත් තියෙනවා සූෆී ශාන්තුවරයෙක්ගේ සොහොනක්. පෞරාණික. ඒකට ගිහිල්ලා අපේ පාරම්පරික මිනිස්සු ගිහිල්ලා වත් පිළිවෙත් කරලා ඒයා ගරු බුහුමන් දක්වලා එයාට මොකක් හරි කුර්ආනයේ ආයතයක් කියවලා ඒනවා. හැබැයි ඒක පෙන්නුවේ නැහැ වෙල්කම් ටු මස්ජිත් නම් පල්ලියේ තියෙන ඔක්කොම පෙන්නනවා ඇයි ඒක පෙන්නුවේ නැත්තේ.

ප්‍ර : ඒ කියන්නේ, ඔබ කියන්නේ මේ වීඩියෝ පටවල ඒවා පෙන්නුවේ නැහැ?

පි : විඩියෝ පටවලත් පෙන්නුවේ නැහැ, ඒ එන මිනිස්සුන්ට.

ප්‍ර : ඒගොල්ලන්ට පෙන්නුවේ නැහැ මේ සොහොන්?

පි : පෙන්නුවේ නැහැ ඒ කියන්නේ මේක පෞරාණිකයි ඉතිහාස ගත සිද්ධියක්, ඒ පල්ලියේ මෙහෙම තියෙනවා ඒ Practic එක පෙන්නුවේ නැහැ. එතකොට මීරා මක්කම් පල්ලියෙත් පෙන්නුවේ

FAIR COMMENT
BY JEZEEM

නැහැ. ඒ ඔක්කොම තබ්ලික් control ඒකේ තියෙන පල්ලි. පාරම්පරික මිනිස්සු වුණාට.

ප : එතකොට ඔය තබ්ලික් ජමාත් සංවිධානයට අයිති අයත් ඔය සොහොන් වලට ගරු කිරීම කරන්නේ නැද්ද? ශාන්තුවරයින් ඇදහීම නැත්නම් ඒගොල්ලන්ට ගරු කිරීම කරන්නේ නැද්ද?

පි : මුල් කාලයේදි පාරම්පරික මිනිස්සුත් එක්ක ඒගොල්ලන් හිටියා. ඒ කියන්නේ රේල් පීල්ලේ අර කෝච්චි යනවා වගේ දෙපැත්තේ

ප : සමානව ගියා?

පි : සමානව ගියා. පස්සේ කාලෙකදි මේ වහාබි කට්ටිය ආවනේ ලංකාවට. එනකොට ඒගොල්ලන්ගේ තාත්තා ඇවිල්ලා ඇල්මැරුනිනි තබ්ලික් කියන්නේ තාත්තා පොතක් කියවන්නේ නැහැ මුකුත් කියවන්නේ නැහැ ගෑණු ළමයව මුහුණ වහනවා, මද්‍රසා එකට දානවා, උගන්වන්නේ නැහැ මේක එතකොට වහාබි එක ආවනේ ලංකාවට එන කොට ඒකේ හිටපු තරුණ කොල්ලා බලනවා මේක මොකක්ද තාත්තා පොතක් කියවන්නේ නැහැ, ඉගෙන ගන්නේ නැහැ මුකුත් කියවන්නේ නැහැ කිව්වම එයා තබ්ලික් එකෙන් ගැලවිලා තාත්තාට විරුද්ධව වහබි වුණා.

ප : ඔහු ක්‍රියාශීලී වෙනවා?

පි : ඔව් ඒක ක්‍රියාශීලි නැහැනේ.

ප : තාත්තා ක්‍රියාශීලි නැහැනේ ?

පි : මන්දගාමී නිකම් බිස්නස් ඒකක් කරලා ඒනවා නිකම් ටූට්පේස්ට් ඒක වෙනුවට නබිතුමා මේවා කළා කියලා ලෑල්ලෙන් මේවා කරනවා ප්‍රැක්ටිස් කියලා. ඒහෙම තමයි එයාගේ තියෙන්නේ බිස්නස් කරනවා අම්මව දාලා යනවා දවස් 3 ක්, මාස 40 ක් යනවා මුකුත් නැහැ. ඒ කොල්ලා රැඩිකල් වෙන්න පටන් ගන්නවා. මේක හරියන්නේ නැහැ මෙහෙම ආගමක් නැහැ කියලා එයාට ආගම දන්නේ නැහැනේ ඒයා ආගම කියලා හිතාගෙන ඉන්නේ මතවාද. එතකොට එයාට තරුණයන්ගේ ආකර්ශණය වෙච්ච මතවාදය තමයි අර වහබි මතවාදය.

ප : ඔබ කියන්නේ ඒතකොට ඒ වගේ පසුබිමක් තිබ්බාහම අර ක්‍රියාශීලි තරුණ පරපුර එයින් ඉවත් කරලා මේ වහබි වාදයට යොදා ගැනීම පහසුයි කියලා?

පි : වහබ්වාදි දේශකයින් කියන්නේ ඔයාගේ තාත්තා මොනවද කරන්නේ පත්තරයක් කියවන්නේ නැහැ මුකුත් නැහැ ඉස්ලාම් දහමේ කියනවා ඉගෙන ගන්න කියලා අරවා කියන්න කියලා ඒගොල්ලන්ගේ පොත් පත් දෙනවා. මේවා ඉගෙන ගන්න කියලා. එතකොට ඒක ඒගොල්ලන්ගේ තාලිම් කියලා කියනවානේ.

FAIR COMMENT — BY JEZEEM

මේකේ තාලිම් කියන්නේ සුරංගනා කතාවක් මේ හදීස් කියවන්න. කුර්ආන් ඇන්ඩ් හදීෂ් ඔන්ලි කියලා ඒ මඟට යනවා.

ප : දැන් ඔය ඒගොල්ලන්ට පුළුවන්ද මේ කාන්තාවන්ට අධ්‍යාපනය ලබන්න පුළුවන්ද ඔය තබ්ලික් ජමාත්?

පි : ඒගොල්ලන් ඇවිල්ලා තබ්ලික් ජමාත් කට්ටිය කාත්තාවන්ට අධ්‍යාපනය දෙනවා අඩුයි. කාත්තාවන්ට අධ්‍යාපනය දෙන්නේ සාමාන්‍යයෙන් පාරම්පරික මිනිස්සු. ජමාතේ ඉස්ලාම්, ඔය වහබි කට්ටිය දෙනවා. තබ්ලික් කට්ටිය කාත්තාවන්ව ගේතුළ තියනවා. ඒහෙම නැත්නම් ඒගොල්ලන්ගේ ලේඩිස් මද්‍රසා ඇරබික් විදුහල්වලට යොමු කරනවා. ඒක තමයි ඒගොල්ලන්ගේ ප්‍රධානම දේ. ඒතකොට ඒගොල්ලන්ගේ මුහුණ වහන එක, ඒ වගේ ඒ ප්‍රැක්ටිස් කලොත් ඇති කියලා තමයි ඒගොල්ලන් හිතන්නේ. එක්කෝ ආගම සම්බන්ධව අරාබි විදුහලකට ගිහිල්ලා ඉගෙන ගත්තොත් ඇති පාසැල් අධ්‍යාපනය අවශ්‍ය නැහැ කියලා. පාසැල් අධ්‍යාපනය ඒගොල්ලන්ගේ සමහරක් කට්ටිය වැඩිවියට පත් වුණාට පස්සේ අස් කරනවා. සිංහල පාසැල්වල ඒ ළමයින් හිටියා නම් සමහරක් කට්ටිය ළමයින්ව අස් කරනවා. සමහරක් කට්ටිය රජයේ පාසැල්වලට මුහුණ වහගෙන යනවා. දැන් රජයේ පාසැල්වලට මුහුණ වහගෙන යන්න පුළුවන් කොහොමද කියන එක මම නම් අදවනතුරුම දන්නේ නැහැ. කවුද ඒ බලය දුන්නේ කියන එක. එතකොට අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තියෙන පාසැල්. එතකොට මුහුණ වහගෙන යනවා. ඒ මුහුණ වහගෙන ළමයින් ගිහිල්ලා එහෙම පුළුවන් පාසැල්වලට යනවා. බැරිවුනොත් ළමයින්ව නවත්ව ගන්නවා. මුහුණ වහගෙන යන්න බැහැනේ. එතාකොට ඒගොල්ලන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වෙනවා. අනික් කට්ටිය මොනවද කරන්නේ කඩාකප්පල් වුණ අධ්‍යාපනයේ දී අරාබි ඒගොල්ලන්ගේ ලේඩිස් මද්‍රසා තියෙනවා නම් ඒවට යවනවා. එහෙමත් බැරි නම් ගෙවල්වල තමයි ඒ ළමයින් ඉගෙන ගන්නේ. නැත්නම් ගෙදර වැඩ.

ප : ඒගොල්ලන්ට පුළුවන්ද රූපවාහිනී බලන්න පුළුවන්ද ඔය ඉන්ටනෙට් වලට යන්න ඒවගේ දේවල් පත්තරේ කියවන්න ඒ සඳහා අවස්ථාව තියෙනවද?

පි : ඒගොල්ලන්ගෙන් තබ්ලික් වල රැඩිකල් කොටසේ ඒවට ඉඩ දෙන්නේ නැහැ. Grassrood Leveal එකේ මිනිස්සු ඔය වත්තවල ජීවත් වන මිනිස්සු TV බලනවා අරවා කරනවා ඔක්කොම කරනවා. ඒගොල්ලන්ගෙන්

ප : බොහෝ විට විප්ලවකාරී දැඩි විප්ලවකාරීන් ඒ සඳහා අවස්ථාව දෙන්නේ නැහැ?

FAIR COMMENT
BY JEZEEM

පි : නැහැ.

ප්‍ර : එතකොට අග්ගනිස්ථානයේ තියෙන්නේ ඒ වගේ දැඩි විප්ලවකාරී අදහස් තියෙන

පි : රූපවාහිනි බලන්න බැහැ ගෑනු ලමයින්ට ඉගෙන ගන්න බැහැ, කාන්තාවන්ට තැනක් නැහැ, ඒ කියන්නේ තලෙයිබාන් සංවිධානයේ සංකල්පයත් මේ තබ්ලික් සංකල්පය තමයි ඒගොල්ලන්ගෙත් තියෙන්නේ. දැන් බාමියන් බුද්ධපිළිම විනාශ කළා. තබ්ලික් කට්ටිය ඇවිල්ලා ශාන්තුවරුන්ව පිළිගන්නේ නැහැ. ඒ කියන්නේ ලංකාවට පල්ලියක් හරි ඉතිහාස ගත දෙයක් කරපු එතන පල්ලියක් ගොඩ නඟපු පුද්ගලයාට ගරු කරන්නේ නැහැ.

ප්‍ර : එතකොට ඔබට මතකයි ද 2012 ඔක්තෝබර් මාසේ 9 වෙනිදා මලල්ලාට වෙඩි තියනවා?

පි : ඔව්.

ප්‍ර : පාසැල් ශිෂ්‍යාවට බස් එකට නැඟලා School bus එකේ?

පි : ඔව්,

ප්‍ර : එතකොට ඇයගේ අදහස් ප්‍රකාශ කෙරුවානේ හරාම් දේවල් සම්බන්ධයෙන් ඊට විරුද්ධව ගිහිල්ලා. එතකොට ඒ වගේ අදහස් ප්‍රකාශ කිරීම් සඳහා මේ තබ්ලික් ජමාත් කට්ටිය ඉඩ දෙන්නේ නැද්ද?

පි : ඔව් ඒගොල්ලන් හිතන්නේ පාවා දීමක් කියලා.

ප්‍ර : මොකක් පාවා දීමක්ද?

පි : දැන් මලාලා කියන එක්කෙනා එළියට ඇවිල්ලනේ කතා කලේ. ඒ කියන්නේ මේකේ කාන්තා අධ්‍යාපනය දෙන්නේ නැහැ, රූපවාහිනී නරඹන්න දෙන්නේ නැහැ, අයිතිවාසිකම් දෙන්නේ නැහැ කියලා කියනවානේ. ඒගොල්ලන් හිතන්නේ මේක බටහිරින් මෙයාව අරගෙන මෙයා බටහිරත් එක්ක එකතු වෙලා පාවා දුන්නා කියලා. දැන් අපි හරි නම් මෙතන ඇවිත් කරන ක්‍රියාව පාවාදීමක් හැටියට ඒගොල්ලන් බලන්න ඉඩ තියෙනවා වගේ තමයි ඒකත් බලන්නේ.

ප්‍ර : ඒ කියන්නේ ඒගොල්ලන් හරියට කරුණු සොයලා බලන්නේ නැතුව තමයි තීරණවලට එන්නේ?

පි : තීරණවලට එන්නේ. ඒ කියන්නේ ඒගොල්ලන්ගේ ආගමික නායකයෙක් හරි ඔය දැන් විල්ලා කියලා එන එක්කෙනෙක් අමීර් වෙනවා. නැත්නම් නායකයා වෙනවා. එයා ඇවිල්ලා අපේ ගෙවල් වලට ඇවිල්ලා කියනවා එන්ඩ පල්ලියට යං කියලා. එහෙම ඒන්න පල්ලියට යං කියලා අපිව එක්කන් යන්න කියලා අපේ ආගමේ කියලා නැහැ. ඒකට තමයි අර අසාන් කියන දේ

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

කියන්නේ. එන්න පල්ලියට කැමති නම් ගියදෙන් නැත්නම් එයා යන්නේ නැහැ. එතකොට ඒගොල්ලන් ඇවිල්ලා අර ජමාත් යනවා නේ දවස් 3 ක් 40 ක් ගියාම පල්ලිවල බෝඩින් කරගෙන පල්ලිවල බෝඩින් කරන්න බැහැ, දැන් සාමාන්‍යයෙන් පල්ලි බෝඩින් කරලා තියෙන්නේ.

ප : මොකක්ද පල්ලි බෝඩින් කරලා කියන්නේ?

පි : පල්ලි බෝඩින් කරලා කියන්නේ මේගොල්ලන් ජමාත් යනවා නේ මාස 40 ක් හෝ

ප : විල්ලා යනවා?

පි : විල්ලා හෝ දවස් 3 ක් කියමු කෝ ඒගොල්ලන් පල්ලිවල තමයි නවතින්නේ. පල්ලිවල නවතිනවා එතකොට පල්ලි අපවිත්‍ර වෙනවා. ඒගොල්ලන්ගේ අපවිත්‍රභාවය යම්කිසි දේවල් සිද්ධ වුනොත් පල්ලි අපවිත්‍ර වෙනවා. ඒගොල්ලන්ට ඒ මුකුත් ගානක් නැහැ. පල්ලිවල කනවා බොනවා සමහර පල්ලිවල කුස්සි හදලා තියෙනවා. උයන්න පිහන්න කියලා. දැන් පල්ලි තියෙන්නේ පස්වේල් නමදින්නයි. සිකුරාදා දේව යාච්ඤා වලටයි කෙනෙක් අභාප්‍රාප්ත වුනොත් ඒවා යාච්ඤා කරන්නයි නැත්නම් විවාහ දේවල් සිද්ධ කරන්නයි අවුරුදු උත්සව වගේ දේවල් කරන්නයි තමයි පල්ලි තියෙන්නේ. මේගොල්ලන් පල්ලි භාවිතා කරන්නේ ඇවිල්ලා නිකම් තමන්ගේ සංවිධානයේ පැවැත්මට. ඒ සමහරක් පල්ලි ඒහෙම ඉඩ දුන්නේ නැත්නම් ඒකට ප්‍රශ්න ඇති වෙනවා. ලංකාවේ වැලිගම ඒ වගේ ප්‍රශ්න ඇති වුනා. එතකොට පල්ලිවල අර අසාන් කියන්නත් වැලිගම ප්‍රශ්න ඇති වුණා. ඒකට තමයි අර චම්පික රණවක ඇමතිතුමා අසාන් සම්බන්ධව වැලිගම සිද්ධිය හරහා පරිසර අමාත්‍යවරයා ඉන්න කාලේ නඩුවක් කියලා උදේට යාච්ඤා කියන්න බැරි පොඩි වාතාවරණයක් ලංකාවේ ශබ්ද මේවා වුනේ. එතකොට ඒ පල්ලි දෙකක් අතර ඇති වුණ ගැටුම තබ්ලික් පල්ලියක් සහ තරිකා පල්ලියක් අතර අසාන් කියන්න. ඒකේ Loudspeaker දානවා මේකෙත් Loudspeaker දානවා ඔයා දාන්න එපා මම දාන්නම් අපි තමයි පරණ පල්ලිය කියලා. එතකොට ඒ වගේ ගැටුම් ඇති වුණා. මේවා ඔක්කොම මතවාද සංවිධාන හරහා ඇති වුණ ගැටුම්. ලංකාවේ පොලිස් පොත්වල තියෙනවා තබ්ලික් ජමාත් සහ තරිකා කට්ටිය අතර ඇති වුණ ගැටුම්. තබ්ලික් ජමාත් සහ වහබි කට්ටිය අතර ඇති වුණ ගැටුම්. ඒ වගේ ලංකාවේ පොලිස් පොත්වල ඕන තරම් පැමිණිලි තියෙනවා. ඒ වගේම මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශයේ වකුප් සභාවෙත් ඕන තරම් පැමිණිලි තියෙනවා මේ සම්බන්ධව. එතකොට ඒවා බැලුවොත් හරි මේ ප්‍රශ්නේ කොහෙන්ද හට ගන්නේ. ඒ කියන්නේ අනවශ්‍ය

FAIR COMMENT BY JEZEEM

දෙයක් වෙන්නේ, පල්ලිවල නවතින්න ගිහිල්ලා ඒක ඉස්ලාම් දහමේ ප්‍රැක්ටිස් එකක් නෙමෙයි නේ.

ප : දැන් ඔබ ඔය පල්ලිවල නවතිනවා කියලා කිව්වාම එතකොට ඔය විල්ලා යන අය හැර වෙනත් කෙනෙක්ට වුනත් ඇවිල්ලා පල්ලිවල නවතින්න පුළුවන්ද ?

පි : සාමාන්‍යයෙන් අපේ සමාජය තුළ එහෙම නැහැ එහෙම වුනොත් ඉස්කෝලේ ළමයෙක් කොහේ හරි Trip එකක් ආවොත් ඒතකොට පල්ලියෙන් හරි ඉස්කෝලෙන් හරි අවසර අරගෙන පල්ලිවල ඒ පොඩි ලමයින්ව නවතින්න දෙනවා.

ප : මට ප්‍රශ්නයක් තියෙනවා ඒ තමයි මඩකලපුවේ සියෝන් දේවස්ථානයේ මරාගෙන මැරෙන ප්‍රහාරය එල්ල කරන ලද අසාන් කියන ඒ ප්‍රහාරයකයා ඒ ප්‍රහාරය එල්ල කිරීමට පෙර හිටියේ පල්ලියක ?

පි : හරි.

ප : එතකොට ඒ වගේ පිටින් ඒන අයට ඇතුලට ඇවිල්ලා නවතින්න පුළුවන්ද?

පි : අන්න ඒකයි මම කියන්නේ දැන් ඒ වගේ එන්නේ ඇවිල්ලා මේ තබ්ලික් ජමාත් ඒකේ මේ සිද්ධිය නිසා. නවතින්න පුළුවන් කියන ක්‍රමවේදය අපි ඒක තමයි කියන්නේ ඒ වගේ දේවල් අනවශ්‍යයි. ඒ වගේ දේවල් ලංකාව වගේ රටකට අවශ්‍ය නැහැ. එතකොට දැන් ඒ වගේ නවතින්න ගිහිල්ල නේ ඒ වගේ ප්‍රශ්නෙකුත් ඇති වෙන්නේ. ඒ නීතියේ හිඩසෙන් නේ යන්නේ. එතකොට පල්ලි තියෙන්නේ පූජාවට විතරයි කියන ඒක තමයි මගේ කරුණ.

ප : ඒතකොට ඒ වගේ ම ඔබ කියනවා මේ තබ්ලික් ජමාත් සංවිධානයේ Head Office ඒක නැත්නම් ප්‍රධාන කාර්යාලය තියෙන්නේ ග්‍රෑන්ඩ්පාස් වල කියලා, කොළඹ 14?

පි : ඔව් කොළඹ 14.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

කොමිෂන් සභාවේ කටයුතු දිවා ආහාරය සඳහා පස්වරු 2 තෙක් කල් තබනවා.

FAIR COMMENT — BY JEZEEM

වේලාව : ප.ව.02.55 යි.
පෙර සටහන් ල/ලේ : ධම්මිකා මිය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

විවේකයෙන් පසු නැවත කොමිෂන් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී .
සාක්ෂිකරු දමිළ භාෂාවෙන් ප්‍රතිඥා දී නැවත කැඳවයි.
(මම මේ කියන සාක්ෂිය, සැබෑය, සම්පූර්ණ සැබෑය, සැබෑවක් මිස අන් කිසිවක් නොකියන බවට ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.)

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : රහුමන් මහත්මයා ඔබ දිවා විවේකයට පෙර මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා යුෂුෆ් අල්කර්ලාවී ගැන. ඔහු කුමන රටක උත්පත්තිය ලබපු පුද්ගලයෙක්ද?

පි : එතුමා ඇවිල්ලා ඊජිප්තුවේ උප්පත්තිය ලබපු එක්කෙනෙක්. දේශපාලන ඒ කියන්නේ එහෙන් දේශපාලන මතවාදවලට විරුද්ධව ඒ කියන්නේ ඉහුවාන් මුස්ලිම් කියන දේශපාලන මතවාදයට විරුද්ධව රටෙන් එයාව පිටුවහල් කළා.

ප්‍ර : ඒ ඉක්වාන් මුස්ලිම් මතවාදය ඊජිප්තුවේ ඇති කළේ කවුද?

පි : ඉමාම් හසනුල් බන්නා. ඒක අර පොතෙත් තියෙනවා මම කිව්ව.

ප්‍ර : එතකොට යුෂුෆ් අල්කර්ලාවී කොහොමද ඒකට දායක වුණේ?

පි : ඒ කියන්නේ එතුමා බිහිකරපු අර දැන් අර තබ්ලික් ජමාත් එකේ

ප්‍ර : ඔව්.

පි : ඉස්මයිල් වගේ ජමාතේ ඉස්ලාම් එකේ මවුලානා මවුදීවුදි වගේ අර වහබිසම් එක පෝෂණය කරපු අබ්දුල්ලා වහබ් වගේ ඉමාන් හසනුල් බන්නා තමයි ඉහුවාන් මුස්ලිම් කියන Islamic Brother hood කියන concept එක මේ ලෝකේට මේවා කළේ.

ප්‍ර : ඔව්.

පි : එතකොට ඒ මතවාදයට අනුගත වෙච්ව එක්කෙනෙක් තමයි පසුකාලීන වලදී මතවාදය ගෙනිච්ව එක්කෙනෙක් තමයි ඉදිරියට

FAIR COMMENT BY JEZEEM

ගෙනිච්ච එක්කෙනෙක් තමයි යුෂුෆ් අල්කර්ලාවී කියන එක්කෙනා.

ප්‍ර : ඔහු එම මතවාදය ඊජිප්තුව ඇතුළේ පැතිරෙව්වා කිව්වොත් මා නිවැරදිද?

පි : ඔව් නිවැරදි.

ප්‍ර : එතකොට යම් අවස්ථාවකදී යුෂුෆ් අල්කර්ලාවීට එරෙහිව ඊජිප්තු රජය නඩු පැවරීමක් කළාද?

පි : කුමන හෝ දෙයක් මත එතුමාව රටින් පිටුවහල් කරනවා. නඩු පැවරීමක් කළාද නැද්ද කියන එක මට හරියට මතක නෑ. කුමන හරි දෙයක් මත ඔහු රටින් පිටුවහල් කරනවා.

ප්‍ර : එතකොට ඔහුට නැවත ඊජිප්තුවට යන්නට බැහැ?

පි : බෑ.

ප්‍ර : එහෙම නම් ඔහුට සරණ වෙන්නේ මොන රටද?

පි : කටාර් රාජ්‍යය තමයි එයාට සරණ වෙන්නේ. කටාර් රාජ්‍ය එයාට විතරක් නෙවෙයි ඇෆ්ගනිස්ථානය තලෙයිබාන්ලටත් සරණ වෙනවා. හේතුව ඇවිල්ලා ඇෆ්ගනිස්ථානයේ තලෙයිබාන් සංවිධානයේ සාම කාර්යාලයක් පවා කටාර් රාජ්‍යයේ ඒ පිහිටෙව්වා. එතකොට ඒ වගේ ඒ කියන්නේ සවුදි අරාබියානු අර දේශපාලන මතවාදයෙන් පස්සේ මැද පෙරදිග ඒ දේශපාලන බලය අතට ගන්න සැරිසරන රටක් වශයෙන් කටාර් රාජ්‍යය හඳුන්වන්න පුළුවන්. ඒ කියන්නේ සවුදි අරාබියානුවල ඇමරිකානු හිතවාදී සහ ඒ ඒ කණ්ඩායම්වල හිටපු රටක්. ඒකට ප්‍රතිවිරුද්ධව කටයුතු කරපු රටක් තමයි කටාර් රාජ්‍යය. කටාර් රාජ්‍යය තමයි වර්තමානයේදී ලෝකේට ඒ කියන්නේ තලෙයිබාන් දකුණු ආසියාවේ තලෙයිබාන් සංවිධානයට නැත්නම් මැදපෙර දිග ඔහ ඉහුවාන් මුස්ලිම් කියන concept එකට දේශපාලන රැකවරණය කියන මේ මතය උඩ ඉඳගෙන උදව් කරන රාජ්‍යයක් වශයෙන්.

ප්‍ර : ඒ අනුව තමයි යුෂුෆ් අල්කර්ලාවීට පිළිසරණ ලැබෙන්නේ කටාර් රාජ්‍යයෙන්?

පි : කටාර් රාජ්‍යයෙන්.

ප්‍ර : ඒ නිසා ඔහු දැන් දිගටම ජීවත් වෙන්නේ කටාර් රාජ්‍යයේ?

පි : එහේ ඉඳලා තමයි ඔහු ෆත්වා එකක් පවා නිකුත් කළේ ගඩාෆිට විරුද්ධව.

ප්‍ර : ඔබ අර කලින් සඳහන් කරපු එන්.එම්.අමීන් සහ ඉනාමුල්ලා කියන මහත්වරු යුෂුෆ් අල්කර්ලාවීව මුණ ගැහුණේ කටාර් රාජ්‍යයේදී?

Presidential Secretariat's Copy
FAIR COMMENT
BY JEZEEM

පි : කටාර් රාජ්‍යයේදී මට තියෙන ප්‍රශ්නේ දැන් කටාර් රාජ්‍යයට ගිහිල්ලා එයාව මොනවා හෝ හේතුවක් මත එයාලා මුණ ගැහෙනවානේ.

ප්‍ර : ඔව්.

පි : එතකොට ඒ ගොල්ලන් ඇයි ඉතාම පැරණි විශ්ව විද්‍යාලයක් වෙච්ච අල්සර් විශ්ව විද්‍යාලය ගිහිල්ලා හරි එහේ ඉන්න ප්‍රභූවරු හරි වෙනකාව හරි මුණ ගැහිලා මේ සම්බන්ධව හෝ ලංකාව වෙනුවෙන් උදව් කරන්න හෝ ලංකාවේ අධ්‍යාපනය නඟා සිටුවන්න හෝ කුමන හෝ ක්‍රියාවකට ඒගොල්ලන් පෙළඹුන්නේ නැත්තේ කියන එක අපිට ප්‍රශ්නයක් තියෙනවා. ඒ ප්‍රශ්නේ මත තමයි අපි ඒ ඡායාරූපය ගැනත් යම් කිසි හැඳින්වීමක් කරන්නේ.

ප්‍ර : එතකොට ඔබ කිව්වා මුහුණු පොතේ දැක්කයි කියලා ඒ ඡායාරූපය නේද?

පි : ඔව්.

ප්‍ර : ඒ වගේම ඡායාරූපයක් දැක්කොතින් අඳුරන්න පුළුවන්ද ඒ අවස්ථාවේ දැක්ක එකක්ද කියලා?

පි : පුළුවන්.

ස්වාමිනි C 611 ලේඛනය පෙන්වීම සඳහා අවසර පතනවා.

ප්‍ර : මේ ඡායාරූපය ඔබ දැක්කද?

පි : ඔව් දැක්කා.

ප්‍ර : ඔබ ඉනාමුල්ල මහත්මයාව අඳුරනවාද?

පි : ඔව්.

ප්‍ර : ඔය ඡායාරූපයේ ඔහු කොතැනද ඉන්නේ?

පි : වම්අත පැත්තේ.

ප්‍ර : ඒ කියන්නේ යුෂුෆ් අල්කර්ලාවීගේ

පි : දකුණු අත පැත්තේ.

ප්‍ර : දකුණු අත පැත්තේ ඉනාමුල්ල මහත්මයා?

පි : ඔව්.

ස්වාමිනි දැනටමත් ඔහුව C 611 (C) වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙනවා ඒ ස්ථානය.

ප්‍ර : එතකොට ඔබ කිව්වා එන්.එම්.අමීනුත් ඒ මහත්මයාත් ගියා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඔහුත් ඉන්නවාද මේ ඡායාරූපයේ?

පි : ඉන්නවා.

President Secretary Copy
FAIR COMMENT BY JEZEEM

ප : කොහේද ඉන්නේ?
පි : යුෂුෆ් අල්කර්ලාවී මහතාගේ වම් අත පැත්තේ.
ප : වම් අත පැත්තේ.

ස්වාමිනි එය C 611 (A) වශයෙන් ලකුණු කරලා දැනටමත් ඉදිරිපත් කරලා තියෙනවා.

ඉතාම ගෞරවයෙන් ස්වාමිනි මෙම සාක්ෂිකරුට පෞද්ගලික අපහසුතාවයක් තිබෙන බව දැනුම් දුන්නා. ඒ පෞද්ගලික අපහසුතාවය තබා ගෙන තමයි ඔහු අද දින මේ ගරු කොමිෂන් සභාවට නොතීසිය ලැබුණාම ඇවිල්ලා තියෙන්නේ. ඒ නිසා ඔහුව මේ අවස්ථාවේදී මුදවා හැරලා වැඩිදුර සාක්ෂිදීමෙන් ඒ සඳහා අනාගතේ දිනයකට අවස්ථාව දෙනවා නම් ඉතාම ස්තුතියි වන්ත වෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මහතා</u>
සාක්ෂිකරුගේ ඉල්ලීම අනුව ඔහුගේ පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා යාමට අවශ්‍ය බැවින් සාක්ෂිකරුව අද දින සාක්ෂි ලබාදීමෙන් මුදා හරිනවා. ඔහුට නැවත මෙම කොමිෂම ඉදිරියේ ජූලි මස 18 වෙනි දින උදෑසන 10.00 ට පෙනී සිටින ලෙසට නියෝග කරනවා.

****

දැන් වේලාව : 03.00 යි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදුවූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශණය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය 2020/07/16 වේලාව- ප. ව. 3.50

සටහන් කලේ යමුනා දසනායක විසිනි.

ගරු විනිසුරු මඩුල්ල -

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් දසිල්වා මැතිතුමා - සභාපති.

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා. -සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා. - සාමාජික

04. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව් . එම්. එම්. ආර් අදිකාරි මහත්මිය - සාමාජික

පෙනි සිටීම

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය. , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය , රජයේ අධිනීතිඥ නිමේෂාද අල්විස් මෙනවිය , රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර , රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ සහ රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ පෙනි සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ගේ ඉල්ලීම සලකාබැලු මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නිති නියෝජිත වශයෙන් නීතිඥ චමත් ප්‍රනාන්දු මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදි පෙනි සිටීමට අවසර ලබා දෙන ලදි.

Provided by Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂිකරු කැඳවයි.
නම ලලිත් ප්‍රියන්ත වතුදුර.
වයස අවු 54 යි.
රැකියාව - මම දැනට මුල්‍ය සහ අලෙවි කළමණාකරුවෙකු හැටියටත් ව්‍යාපාරිකයෙකු හැටියටත් කටයුතු කරනවා.
ජාතිය - සිංහළ.
ආගම- බුද්ධාගම.
ප්‍රතිඥා දෙයි.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බංඩාර මහතා</u>

ප්‍ර ප්‍රියන්ත මහත්මයා ඔබ මුලින්ම තමන්ගේ පාසැල් ජීවිතය ආරම්භ කරේ කුමන පාසැලකින්ද ?

උ මම කොළඹ ඩී. එස්. සේනානායක විද්‍යාලයේ ඉගෙනීම ලැබුවා.

ප්‍ර ඔබ ඩී. එස්. සේනානායක විද්‍යාලයේ වසර කීය දක්වා අධ්‍යාපනය ලැබුවාද ?

උ පලමු වසරේ සිට 13 වෙනි වසර දක්වා.

ප්‍ර ඔබ පාසැල් අධ්‍යාපනයෙන් පස්සේ කුමන ආකාරයේ වැඩිදුර අධ්‍යාපනයන් සඳහා යොමු වුනාද ?

උ මම තෝරා ගත්තේ ව්‍යාපාර කළමණාකරණය සහ ගිණුම්කරණය . මම ඒ අංශයෙන් ඉදිරියට ගියා.

ප්‍ර ඔබ උසස් පෙළ අවසන් කරේ කුමන වකවානුවකද ?

උ 1983 දි.

ප්‍ර ඉන්පසුව ඔබ රැකියාව විදියට විදේශගතවීමක් සිද්ධ වෙනවාද ?

උ ඔව්.

ප්‍ර ඒ කොයි වකවානුවේද?

උ ඒ 1990 වසරේදි.

ප්‍ර 1990 දි. කොයි රටටද ඔබ යන්නේ ?

උ මම යන්නේ මාලදිවයිනට.

ප්‍ර ඒ යන්නේ 1990 වසරේදි කිව්වොත් නිවැරදිද ?

උ ඔව්.

ප්‍ර ඔබ 1990 වසරේදි මාලදිවයිනට ගිහිල්ලා කුමන ආකාරයේ රැකියාවකද නිරත වෙන්නේ ?

උ මම මුලින්ම ගියේ ගණකාධිකාරිවරයෙක් හැටියට. පසුව එම ආයතනයේම මම මුල්‍ය කළමණාකාර හැටියට කටයුතු කරන්නට පටන් ගත්තා.

ප්‍ර ඔබට මෙම කොමිෂන් සභාවට කියන්න පුලුවන්ද මොකක්ද ඔබ ඒ තෝරාගත් ආයතනය කියලා ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ ඒලියස් එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ් කියන ආයතනය .

ප්‍ර ඔබ මේ වෙන කොටත් රාජකාරි කරන්නේ ඒ ආයතනයේමද ?

උ ඔව්.

ප්‍ර ඔබ මේ වෙන කොට රාජකාරි කරන්නෙත් මාලදිවයින් රාජ්‍යයේ කිව්වොත් නිවැරදිද ?

උ ඔව්.

ප්‍ර ඒ කියන්නේ ප්‍රියන්ත මහත්මයා මේ වෙන කොට වසර 30ක පමණ කාලයක් ඔබ මේ මාලදිවයින් රාජ්‍යයේ රැකියාව කරනවා කිව්වොත් මා නිවැරදිද ?

උ නිවැරදියි

ප්‍ර ඔබ මේ වෙන කොට දරන තනතුර මොකක්ද?

උ කළමණාකරු මුල්‍ය සහ ආනයන.

ප්‍ර ඔබ මේ මාලදිනයින් රාජ්‍යයේ රාජකාරි කරන ගමන් ශ්‍රී ලංකාවත් සමඟත් සබඳතා තිබුනාද ?

උ ඔව් බොහෝ සම්බන්ධතා තිබුනා.

ප්‍ර මොන වගේ සම්බන්ධතාවයක්ද තිබුනේ ?

උ වෙන ව්‍යාපාර අතිනුත් අපි මෙහෙන් ශ්‍රී ලංකාවෙන් අපි නිෂ්පාදන එහේට ආනයනය කලා. විශේෂයෙන්ම බිස්කට්ස් ප්‍රධාන බිස්කට් සන්නාමයක්. සහ ශ්‍රී ලංකා තේ .

ප්‍ර ඒ අනුව ඔබ ශ්‍රී ලංකාවට නිතරම එනවා යනවා වුණාද මේ අවුරුදු 30 තුල?

උ ඔව්

ප්‍ර කොයි වගේ කාලයකදිද එන්නේ සාමාන්‍යයෙන් ?

උ මම සාමාන්‍යයෙන් සුමාන 3 ක් මාසයක් විතර එහේ ඉන්නවා. ඊට පස්සේ තව ඒ හා සමාන කාලයක් මම ලංකාවේ ඉන්නවා .

ප්‍ර ඔබට මේ ගරු කොමිෂන් සභාවට කියන්න පුලුවන්ද ඔබ දැන් මේ දශක තුනක විතර කාලයක් රාජකාරි කරපු මේ මාලදිවයින කියන්නෙ මොන ආකාරයේ රටක්ද ? ඒ කියන්නේ කොච්චර විතර population එකක් ජනගහනයක් ඉන්නවාද ?

උ මේ වන විට ලක්ෂ 6 ක් පමණ ජනගහනයක් ඉන්නවා .

ප්‍ර මාලදිවයින කියන රාජ්‍යයට යම්කිසි ඒ රාජ්‍යයේ ඉන්න වැසියන් යම්කිසි ආගමක් අදහනවාද ?

උ ඔව්.

ප්‍ර මොකක්ද ඒ ආගම ?

උ ඉස්ලාමය. 100% ක් ඉස්ලාමිකයෝ ඉන්න රටක්.

ප්‍ර 100%ක්ම ඉස්ලාමිකයෝ ඉන්න රාජ්‍යයක් ?

උ ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර මාලදිවයින සාමාන්‍යයෙන් ෂරියා නීතිය ක්‍රියාත්මක වන රටක් ද?

උ ෂරියා නීතිය සම්පූර්ණ වශයෙන් ස්ථාපිත වෙච්ච රටක් නෙමෙයි. නමුත් ෂරියා නීතිය යම් යම් දේවල් බොහොම සුලු වශයෙන් කියලා කියන්න පුලුවන්. වැඩි වශයෙන් තියෙන්නේ අපේ වගේම නීති සම්ප්‍රදායක්.

ප්‍ර ඒ කියන්නේ සාමාන්‍ය විදියට ඡන්ද සහ ප්‍රජාතන්ත්‍රවාදිව ඡන්දයකින් තෝරා ගන්නා මහජන නියෝජිතයින් එවැනි ක්‍රියාවලියක් මාලදිවයින තුල සිද්ධ වෙනවාද ?

උ ඔව් දේශපාලනය පැත්තෙන් බැලුවොත් ඒ හා සමානවම අපේ ලංකාව වගේම සමානව .

ප්‍ර මාලදිවයින රාජ්‍යයේ අනිත් ආගම් ඇදහීමට නිදහස තිබෙනවාද ?

උ ප්‍රසිද්ධියේ ඇදහීමට කිසිම නිදහසක් නැහැ . නමුත් ඔබට අවශ්‍ය නම් තානාපති කාර්යාලය ඇතුලේ අදහන්න පුලුවන්

ප්‍ර ඒ කියන්නේ ඔබ අපි හිතමු රාජකාරි කරන ස්ථානයේ ඔබ නැවතිලා ඉන්න ස්ථානයේ ඔබට තමාගේ ආගමික වතාවත් කරන්න ඕනේ නම් එයට නිදහසක් නැද්ද ?

උ නිදහසක් නැහැ.

ප්‍ර ඒ කියන්නේ ?

උ ඒ කියන්නේ අවශ්‍ය නම් හොරෙන් කරන්න පුළුවන් ඒ ඇරෙන්න නීතිය යටතේ එහෙම කරන්න බැහැ.

ප්‍ර යමෙක් ප්‍රසිද්ධියේ හෝ තමන්ගේ ආයතනයේ හෝ තමන්ගේ නිවසේ තමන්ගේ ආගමික වතාවත් සිදුකරලා එය law enforcement officersලාට නැත්නම් එහේ ඉන්න පොලිස් නිලධාරින්ට අනාවරණය වුනොත් මොන වගේ දඩුවම්ද ලැබෙන්නේ?

උ ඒ ගොල්ලන්ට ඉතින් මාලදිවයිනේ සාමාන්‍යයෙන් දරුණු සෑයේ ෂරියා නීතියක් නැහැ මම ඉස්සෙල්ලා කිව්ව වගේ. සාමාන්‍ය වශයෙන් ඒ පොලිසියෙන් ඇවිල්ලා ඒ අයට අවවාද කරලා ඒක ඉදිරියට කරන්න එපා කියන තත්වයෙන් කටයුතු කරාවි

මින්පසු සටහන් ගැනීම ල/ලේ ඉන්ද්‍රාණි.

President Secretariat Copy
FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව : ප.ව. 4.00 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

රජයේ අධිනීතීඥ චතුරංග බණ්ඩාර මහතා :

ප්‍ර : දැන් මාලදිවයින කියන මේ මුස්ලිම් දේශයේ යමෙක්ට පුරවැසිභාවය ලබා ගන්න ඕන නම් යම්කිසි මූලික කාරණයක් තියෙනවා කිව්වොත් නිවැරදිද?

පි : ඔව්.

ප්‍ර : මොකද්ද ඒ මූලිකම කාරණය?

පි : ඔහු ඉස්ලාමිකයෙක් විය යුතුමයි.

ප්‍ර : ඉස්ලාම් භක්තිකයෙක් විය යුතුමයි.

පි : විය යුතුමයි.

ප්‍ර : එය කොයි කාලයේ විතර ඉඳන්ද මේ මාලදිවයිනට Introduce කරලා තියෙන්නේ නැත්නම් හඳුන්වා දුන්නේ?

පි : ඒක ඒ දවස්වල ඉඳලම තිබ්බ එකක්. නමුත් ඒක ව්‍යවස්ථාවට ගත්තා මම හිතන්නේ 2008 දී ඊට කලිනුත් ඒක සම්ප්‍රදානු Practice එකක් හැටියට ඒ විදියට තමයි තිබුණේ.

ප්‍ර : ඒ කියන්නේ ප්‍රියන්ත මහත්මයා අවුරුදු 30 ක් එහි රාජකාරි කටයුතු සිද්ධ කළත් ඔබට ඉස්ලාම් භක්තිකයෙකු නොවුණා නම් ඔබට එහි පුරවැසිභාවය ලබා ගැනීමේ හැකියාවක් නැහැ?

පි : කොහෙත්ම නැහැ.

ප්‍ර : දැන් ප්‍රියන්ත මහත්මයාට කියන්න පුළුවන්ද මාලදිවයින කියන රාජ්‍යය අතීතයේ තිබුණේ කුමන ආකාරයේ රාජ්‍යයක් විදියටද?

පි : මා මුලින්ම මාලදිවයිනට ගියහම මම එහේ භාෂාව ලිවීම, කියවීම සහ කථා කිරීම ඉගෙන ගත්තා. ඊට පස්සේ ඒගොල්ලොන්ගේ History එක, ඉතිහාසය ඉගෙන ගත්තා. ඒ ඉතිහාසයට අනුව එය බෞද්ධ රාජ්‍යයක් හැටියට කලින් තිබිලා තියෙනවා 1153 වසරේදී. ඒ හිටපු රජතුමාව ඉස්ලාම් ආගමට යම් සිද්ධි දාමයක් සිද්ධ වෙලා තියෙනවා. ඒකෙන් පස්සේ ඒ රජතුමාව ඉස්ලාම් ආගමට හරවලා තියෙනවා. ඉන් පස්සේ මුළු රටම හරවලා තියෙනවා. ඒ අතර මිනිස් ඝාතනත් සිද්ධ වෙලා තියෙනවා.

ප්‍ර : ඒ අනුව මේ වෙනකොට මෙය ඉස්ලාම්, සම්පූර්ණම ඉස්ලාම් රාජ්‍යයක් බවට පරිවර්තනය වෙලා අවසන් කිව්වොත් නිවැරදිද?

පි : ඔව්.

ප්‍ර : ප්‍රියන්ත මහත්මයා ඔබට සඳහන් කරන්න පුළුවන්ද ඔබ මාලදිවයිනට ගියාට පස්සේ මේ ඉස්ලාම් ආගම සහ ඉස්ලාම් ආගම අදහන පුද්ගලයින් සම්බන්ධයෙන් යම්කිසි කරුණු හොයා බැලීමක් ඔබ පටන් ගත්තද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අපේ Office එකේ හිටියා තරමක් වයසක කෙනෙක්. ඒ මහත්මයා මට මගේ බොහොම අපිත් එක්ක හිතවත්. ඒ මහත්මයාව තනතුර තිබුණේ එයාව Appoint කරලා තිබුණේ පුණ්‍ය ආයතනයක් Manage කරන්න, කළමනාකරණය කරන්න. ඔහු මට ආරාධනා කෙරුවා මේ ඉස්ලාම් ආගමට හැරෙන්න. ඔයා වගේ අය තමයි අපේ ආගමේ ඉන්න ඕන ඒ වගේ දේවල් කියලා. ඉතිං මට ....,

ප්‍ර : ඒ අනුව ඔබ ඉස්ලාම් ආගමට හැරුණද?

පි : නැහැ.

ප්‍ර : ඔබ මොකද්ද කළේ ඒ අනුව?

පි : ඔහු බොහොම සුහදශීලී කෙනෙක් නිසා මාත් ඒ විදිහටම කටයුතු කළා. ඔහු මට පොත්පත් දුන්නා. මම ප්‍රතික්ෂේප කළේ නැහැ. මම ඒවා කියවන්න පටන් ගත්තා.

ප්‍ර : ඉන්පසුව ඔය දැන් මේ පොත්පත් අරන් පරිශීලනය කරලා එය මුලින්ම කියවන්න පටන් ගත්තේ මොන වකවානුවේදීද?

පි : ඒ 1990, 91 ඒ වකවානුවේ.

ප්‍ර : ඒ දශකයේ. ඒ අනුව ඔබ ඔබගේ අධ්‍යයනය ගැඹුරින්ම කරන්න පටන් ගත්තේ කොයි කාලය වෙනකොටද?

පි : ඒ කාලයේ නෙමෙයි ඒක කළේ. 2005 න් පස්සේ තමයි මම ඒක ගැඹුරින් හදාරන්නට පටන් ගත්තේ.

ප්‍ර : ඒ අනුව ඔබ ඔබගේ Study එක, නැත්නම් කරුණු අධ්‍යයනය කරලා ඔබ යම්කිසි මට්ටමකට ආවේ කොයි කාලයේද?

පි : 2012 වගේ වෙනකොට මට යම්කිසි ඒ කියන්නේ පැහැදිලි අවබෝධයකින් යුතුව ඉස්ලාමය දිහා දකින්නත්, ඒවා විග්‍රහ කරන්නත්, කුරානය, සුන්නා සහ හදීස් වාර්තා අර්ථ විග්‍රහ කරන තරමකට මට අවබෝධය ලැබුණා.

ප්‍ර : ඔබ ඒ අනුව ඔබගේ ස්වයං අධ්‍යයනයේදී ඔබ මොනවද පාවිච්චි කරපු පොත්පත්?

පි : බොහෝ පොත්පත් මම පාවිච්චි කෙරුවා. අන්තර්ජාලයේ දේවලුත් උපයෝගී වුණා මුල් කාලයේදී. ඉන්පසුව ආගම සම්පූර්ණ ආගමික ඉගැන්වීම් මම ගත්තේ ශුද්ධ වූ කුරානය සහ හදිස්, සුන්නා වාර්තා.

ප්‍ර : ඔබට මේ සම්බන්ධයෙන් මුස්ලිම් ආගම සහ ඉස්ලාම් ධර්මය සහ මුස්ලිම් ජනතාව ගැන අධ්‍යයනය කරන්නට හිතුණේ ඇයි?

පි : ඒක ඇත්තටම මටත් දන්නේ නැහැ ඒක කොහොම වුණාද කියන එක. නමුත් මට ආරම්භය ලැබුණේ අර කියපු මහත්මයා මට දීපු පොත්පත් නිසයි. ඊට පස්සේ 2005 වසර වෙනකොට අපි Social Media සමාජ මාධ්‍යයක අපි Forum එකක් හදලා තිබුණා. ඒකේ

FAIR COMMENT — BY JEZEEM —

මම Admin කෙනෙක් විදියට හිටියා මගේ යාළුවෙක් එක්ක. ඒකට හුඟක් Intelectualලා හිටියා මුස්ලිම් අය ඇවිල්ලා හිටියා. ඒක ඇත්තටම අපි 2005 Election එකටයි ඒ අපි ආරම්භ කෙරුවේ. නමුත් Election එකෙන් පස්සේ සාකච්ඡා කරන්න දෙයක් නැහැ. ඉතිං අර මුස්ලිම් අය හිටපු නිසා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා වුණා. ඊට පස්සේ සම්පූර්ණයෙන් මේක ආගමික සංවාදයක් ඒක නරක දෙයක් නෙමෙයි. ඒ කියන්නේ බැණ අඩ ගහගන්න විදියකට නෙමෙයි. බොහොම තර්කානුකූලව අපි අදහස් හුවමාරු කර ගැනීමක් කෙරුවා. එහි හිටියා නම් වශයෙන් කියනවා නම් ඩොක්ටර් මොහොමඩ් මුක්තා කියලා කෙනෙක් හිටියා ඉන්දියානුවෙක්. ඒ වගේ ටිකක් බොහොම විද්වත් Level එකේ ....,

ප : මුස්ලිම් ආගමේ විද්වත් පුද්ගලයින් ඔබලාගේ කණ්ඩායමේ හිටියා?

පි : ඔව්. හිටියා.

ප : දැන් ඒ අනුව ඔබගේ අධ්‍යයනයේදී මේ ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාව සහ ශ්‍රී ලංකාවේ ඉස්ලාම් දහම කොහොමද අදහන්නේ කියන එක සම්බන්ධයෙන් ඔබ වැඩිදුරටත් අධ්‍යයනය කළාද?

පි : ඔව්. මගේ අධ්‍යයනයේ මූලික පරමාර්ථය වුණෙත් ලංකාවේ මට මුලින්ම කියන්න ඕන මට හුඟක්ම ගැඹුරින් මේ ගැන අධ්‍යයනය කරන්න අවස්ථාව හිතුණේ එහි හිටියා මුස්ලිම් පුද්ගලයෙක්. ඔහු ශ්‍රී ලාංකිකයෙක්. හිටියේ එක්සත් රාජධානියේ. ඔහු කියපු දේවල්, ඔහු පළමුවෙන්ම අපේ කණ්ඩායම Group එකට සම්බන්ධ වෙලා ඉස්ලාමය ප්‍රචලිත කරන දේවල් කටයුතු කෙරුවා. ඒ විදියට කටයුතු කෙරුවා. ඒ අවස්ථාවේදී ඔහු සමඟ අපි සාකච්ඡා කරනකොට ඔහු කියන දේවල්, ඔහු ඉස්ලාමික ඉගැන්වීම් කියලා කියන දේවල් සහ ඔවුන් ප්‍රායෝගිකව සමාජයේ ක්‍රියාත්මක වෙන විදිය, ඉස්ලාමික සමාජයේ ප්‍රායෝගිකව සමාජයේ ක්‍රියාත්මක වෙන විදිය සහ ඔහු ඉස්ලාමික ඉගැන්වීම් මෙහෙමයි මෙහෙයි කියලා කියන දේවල් අතර ලොකු පරස්පර විරෝධිතාවයක් මම දැක්කා. ඒ අනුව මට හිතුණා ඇයි මෙහෙම මෙයා ආගමික දේවල් කියලා මෙහෙම කියනවා. නමුත් ඒගොල්ලෝ ප්‍රායෝගිකව කරන්නේ ඊට හාත්පසින් වෙනස් දෙයක්. ඉතිං ඔතන තමයි මට අර ගැඹුරින්ම හදාරන්න අවස්ථාව ලැබුණේ ඉතිං මගේ මූලික පරමාර්ථය වුණෙත් මේ ලංකාවේ මොකද්ද මේ සිදු වෙමින් පවතින්නේ කියලා මට ඒ දවස්වල ඉඳලා හැඟීමක්, දැනීමක් මට ඒ ගැන විශේෂ වූ Interest එකක් තිබුණා. ඒ අනුව තමයි මම ඒක දහම ගැඹුරින් අවබෝධ කර ගත්තේ.

FAIR COMMENT BY JEZEEM

ප : ඒ කියන්නේ ඔබ මේ සම්බන්ධයෙන් ඔබගේ ස්වයං අධ්‍යයනය මේ පාස්කු ප්‍රහාරයට ප්‍රථමයෙන් ඉඳලා තිබ්බා කිව්වොත් නිවැරදිද?

පි : අනිවාර්යයෙන්ම.

ප : මේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ මේ කොමිසමට ඇවිල්ලා ඔබ ඔය එකතු කරගත් දැනුම Presentation එකක් නැත්නම් Power Point Presentation එකක් විදියට හදලා කොමිෂන් සභා විමර්ශන අංශයට ලබා දුන්නා කිව්වොත් නිවැරදිද?

පි : ඔව්.

ප : ඒඅනුව එම CD තැටිය නැවත දැක්කොත් ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි : ඔව්.

(ස්වාමීනි සාක්ෂිකරුට ඔහුගේ ප්‍රකාශය සමඟ කොමිෂන් සභා විමර්ශන අංශයෙන් ලබා දුන් CD තැටිය මේ අවස්ථාවේදී පෙන්වා සිටියි)

ප : හඳුනා ගන්න පුළුවන්ද?

පි : ඔව්.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද ඔහු විසින් අඩංගු කරවන ලද Power Point Presentation එක Power Point ආධාරයෙන් කරුණු ඉදිරිපත් කිරීම අඩංගු CD තැටිය C-854 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා)

(ස්වාමීනි එම C-854 CD තැටිය විවෘත කර තිරයේ පෙන්වා සිටිනවා)

ප : දැන් මහත්මයා මෙම තිරයේ දැක්වෙන්නේ ඔබ විසින් මේ කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කිරීමේ අරමුණ මත සාදන ලද Power Point Presentation එකක් කිව්වොත් නිවැරදියිනේ?

පි : ඔව්.

ප : මේ අනුව ඔබ මේ කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කරන Power Point ආධාරයෙන් සකසා ගන්නා ලද Presentation එකේ මාතෘකාව වෙන්නේ මොකද්ද?

පි : මා මේක හදලා හුඟාක් හිතුවා මොකද්ද දෙන්න ඕන ඒකට සුදුසු මාතෘකාව කියලා. පස්සේ මම තීරණය කෙරුවා මේක පාස්කු ප්‍රහාරය ඔස්සේ යන ගමනක්. මම අවුරුදු දාහතරක් බලාගෙන හිටියා මේක ඉදිරිපත්, ඒ කියන්නේ මට මේ රටට මේක හෙළි කරන්න. අවුරුදු හතක් මම ඒක හැදෑරුවා. තව අවුරුදු හතක් මට බලාගෙන ඉන්න වුණා. මම හිතනවා මට මේ අවස්ථාව ලැබුණයි කියලා.

ප : ඒ අනුව ඔබ සඳහන් කරන්නේ පාස්කු ප්‍රහාරය ඔස්සේ ඉස්ලාමික ප්‍රශ්නයේ නිරූවත සහ ගැලවීම් මාර්ගය කියලා තමයි ....?

FAIR COMMENT — BY JEZEEM —

පි : ඉස්ලාමික ප්‍රශ්නයේ නිරුවත සහ ගැලවීම් මාර්ගය කියලා මම ඒක නම් කෙරුවා.

ප්‍ර : ඒ අනුව දැන් ඔබ මුලින්ම මේ ඉස්ලාමික ප්‍රශ්නය කියලා මොකද්ද ඔබ අදහස් කළේ?

පි : එහෙම අදහස් කළේ ඇත්ත වශයෙන්ම අපි සමාජයක් විදියට මෙතෙක් මුස්ලිම් අය මේ රටට ඇවිල්ලා අවුරුදු හාරසීයක් පමණ වෙනවා. නමුත් අපි කවදාවත් අපේ සමාජයක් ලෙස අපි ඒ අයගෙන් ඇහුවේ නැහැ ඕගොල්ලොන්ගේ මේ ධර්මය මොකද්ද, එතකොට ඒ ගැන අපි සමාජයක් හැටියට අපි අවබෝධයක් ලබා ගන්න හරි, ඒ ගැන අවධානයක් යොමු කරන්න හරි අපිට අවස්ථාවක් ලැබුණේ නැහැ රටට. ඉතිං මම දැන් මේක හැදෑරුවායින් පස්සේ මට තේරුණා මේක ලොකු විශාල ප්‍රශ්නයක් කියලා රටට. මහා විනාශයක් වෙන්න යනවා. ඉතිං මේක ඇත්තටම ඉස්ලාමික ප්‍රශ්නය දිහා නොබලා මේකට අපිට විසඳුම් හොයන්න බැරි බව මට තේරුණා.

ප්‍ර : හරි. ඒ අනුව ඉස්ලාමික ප්‍රශ්නය විදියට ඔබ හඳුනා ගත්තේ මොකද්ද කියලා මේ Power Point Presentation එක ආධාරයෙන් ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : ඔව්. මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා මට ගරු කොමිසම ඉදිරියේ සාක්ෂි දීමට මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන්. මම බොහොම කණගාටු වෙනවා පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මිය ගිය තුන්සියක් සහ ඒ හා සමාන මනුෂ්‍ය ජීවිත ආබාධිතයට ලක්වීම සම්බන්ධයෙන්. නමුත් මෙතනදී ඒ අපේ ඒ ගැන දුක් වෙනවා වගේම මා කිව යුතුයි එය අපේ රටට Blessing in disguise වගේ දෙයක් සිද්ධ වුණා. ඒ තමයි මම 2012 දී මේ අධ්‍යයනය කෙරුවයින් පස්සේ මම මේක රටට ඉදිරිපත් කරන්න, මේක විනාශයක් වෙන්න යනවා, අපි වැළකිය යුතුයි කියන කාරණය මම ඉදිරිපත් කරනකොට මිනිස්සු දැක්කේ ජාතිවාදියෙක් විදියට. නමුත් එතනදී ජාතිවාදය කියන එක වැරදියට අපේ සමාජය තේරුම් අරගෙන තිබුණා. ඉතිං ඒ වගේම යම් යම් ආයතනවලට මම ඒක දුන්නා. නමුත් අවාසනාවකට දේශපාලන අධිකාරියේදී ඒක නැවතිලා තියෙන බව තමයි මට දැන ගන්නට ලැබුණේ. ඉතිං මේකේදී කුරානයේ 8 වෙනි සුරාවේ 67 වෙනි වගන්තියට අනුව සහ එහි සංදර්භයට අනුව මේ අය මේ ජිහාදය ආරම්භ කෙරුවහම මූලික අවස්ථාවේදී එය මහා සංහාරයක් හැටියට ක්‍රියාත්මක කළයුතු වෙනවා, දියත් කළයුතු වෙනවා. නමුත් මාගේ කියවීම අනුව ඒ අයට ඒක කර ගන්න, හරියට ඉෂ්ඨ කර ගන්න බැරි වුණා ඒ දේව නියමය. මම දකිනවා ඒ අය ඒ සඳහා තමයි අර පල්ලිවල

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කඩු, ආයුධ හංගගෙන හිටියේ. ඊට කලින් 2018 දී දිගන ගැටුමක් සිද්ධ වුණා. එතකොට මම දැන ගත්තා මේක අපි අර සාමාන්‍ය ව්‍යවහාරයෙන් කියනවා නම් මුට්ටිය දාලා බැලිල්ලක් වගේ දෙයක් බව මම දන්නවා, දැන ගත්තා. එතනදිත් මම හිතන්නේ අපි මේක ඉදිරිපත් කෙරුවා පොලීසියේ විශේෂ අංශයකට. ඊට පස්සේ බුදු පිළිම කඩනකොට මම දැන ගත්තා මේක බොහොම කිට්ටුවෙලා කියලා. නමුත් අපිට ඉතිං මට ඊට එහා දෙයක් කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. අර දේශපාලකයන්ට මේක ගෙනියන්න මට අවස්ථාවක් ලැබුණේ නැහැ. ඉතිං මේ ප්‍රහාරය සිද්ධ වුණා. මට කියන්න ඕන මේ 8 වෙනි සුරාවේ 67 වෙනි වගන්තියෙන් ඒගොල්ලොන්ට ඒ කර ගන්න බැරි වෙච්ච ඒ මහා සංහාරය ලේ වැගිරීම එගොල්ලෝ ඊළඟ එකේදී කරන්න බොහෝ ඉඩකඩ තියෙනවා. ඒ වගේම සහතික කරලා මට කියන්න පුළුවන් මේ ක්‍රියාදාමය අප්‍රේල් 21 පාස්කු ප්‍රහාරයෙන් අවසන් වෙන්නේ නැති බව. ඒක ඒ ආගමේ අනිවාර්යය ක්‍රියාදාමයක් නිසා. ඒ අයට එතනින් ඒක නවත්වන්නවත්, එතනින් ඒක අමතක කරන්නවත් හැකියාවක් නැහැ.

ප : දැන් ඔබ සඳහන් කළා මේ සම්බන්ධයෙන් ඔබ කලින් යම්කිසි පොලිස් අංශවලට දැනුම් දුන්නා කියලා මේ සිදුවීම වෙන්නට පෙර?

පි : ඔව්.

ප : කාටද ඔබ එසේ දැනුවත් කළේ? ඔබට මතකද?

පි : මුලින්ම 2014 දී මම SIS එකට ඉදිරිපත් කෙරුවා. මේකම නෙමෙයි. නමුත් පදනම එකයි. මොවුන්ගේ මේ ගමන සම්බන්ධයෙන්. ඔවුන් එය සහසුද්දෙන්ම තේරුම් ගත්තා. ඒ බව ඔවුන්....,

ප : ඔබට කියන්න පුළුවන්ද SIS එකේ කාටද කියලා මතකයක් තියෙනවද?

පි : එතකොට හිටියේ DIG වාකිෂ්ඨ මහත්මයා. ඊට පස්සේ නිලන්ත ජයවර්ධන මහත්මයත් මට ආරාධනාවක් කරලා ඒ මහත්මයා යටතේත් මේක කළා. ඒගොල්ලෝ මට කියන්න පුළුවන් සහතික කරලා ඒ අය ඉතාම උවමනාවකින්, උනන්දුවකින් ඒක කරුණු හැදෑරුවා. නමුත් ඉතිං ...,

****

ගරු සභාපතිතුමා :

ප : වාකිෂ්ඨ මහතා ඉන්නකොට කෙරුවේ කොයි අවුරුද්දෙද?

පි : 2014 මුල හරි 2013 හරි.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : ඒක කී දෙනෙකුට කෙරුවද?

පි : එතන හිටියා ඒගොල්ලන්ගේ Teem එකේ පස් දෙනෙක් විතර.

ප්‍ර : එතකොට නිලන්ත ජයවර්ධන මහත්මයාට කෙරුවේ කොයි කාලයේද?

පි : 2015 වගේ.

ප්‍ර : කොයි කාලයේද?

පි : මට දින වකවානු මතක නැහැ. 2015 මුල් කාලයේදී වගේ.

ප්‍ර : කී දෙනෙකුට කෙරුවද?

පි : එතනත් හිටියා පස් දෙනෙක් වගේ හිටියා.

****

රජයේ අධිනීතීඥ චතුරංග බණ්ඩාර මහතා :

ප්‍ර : දැන් ඔබ සඳහන් කරන්නේ මුලින්ම වාකිෂ්ඨ මහත්මයා ඉන්නකොට කරුණු ඉදිරිපත් කළා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ අවස්ථාවේ හිටපු ඒ පුද්ගලයින්ගෙන් කිහිප දෙනෙක් හරි ඔබ දෙවන අවස්ථාවේ කරුණු ඉදිරිපත් කරනකොටත් හිටියද?

පි : මම හිතන්නේ එක්කෙනෙක් හිටියා. නමුත් මම නම් වශයෙන් දන්නේ නැහැ.

ප්‍ර : දැන් ඔබ ඒ ඉදිරිපත් කරපු සොයා ගත්ත කරුණු අනුව ඔබ මේ හදලා තියෙනවනේ C-854 විදියට ලකුණු කරපු Presentation එක?

පි : ඔව්.

ප්‍ර : ඒ අනුව ඔබට කියන්න පුළුවන්ද දැන් මේ ඔබ හොයා ගත්ත ඉස්ලාමික ප්‍රශ්නය මොකද්ද කියලා සරළව මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : සරළව, මට මේක මම ඇත්ත වශයෙන්ම මේක තේරුම් ගැනීම ඉතාම අපහසු දෙයක්. තේරුම් කර දීමත් ඉතාම අපහසු දෙයක්. ඒ තරමට මේක මේක මට කියන්න පුළුවන් මේ ඉස්ලාමික ප්‍රශ්නය හරියට මේ අපි ඉස්සරහට විසි කරපු පටලවලා, පටලවාලා, ගැට ගහලා, ගැට ගහලා විසි කරපු නූල් බෝල පන්දුවක් වගේ. ඒකේ ගැට කොහේද තියෙන්නේ, අඹරලා කොහේද තියෙන්නේ, පටලවලා කොහේද තියෙන්නේ කියලා අපිට ඒක දිහා බලලා හිතා ගන්නත් අමාරුයි. නමුත් ඒක මුස්ලිම් විද්වත් අය දන්නවා. ආගමික නායකයෝත් දන්නවා. ඉතිං මට ඒ ගැට එකින් එක ලිහලා පෙන්වීම තමයි මට මගේ අරමුණ. ඒක ටිකක් වෙලාවක් යන දෙයක්. මම මුලින්ම පටන් ගන්න කැමතියි මේ වීඩියෝ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එකෙන් මම ඔබලාගෙන් කරුණාවෙන් ආරාධනා කර සිටිනවා මේකට සවන් දෙන්න කියලා.

ප : මේ ඔබ පෙන්වන වීඩියෝ පටය කුමක්ද?

පි : මෙය පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ජමෙයිතුල් උලමා සංවිධානයේ මම හිතන විදියට මොහු උප සභාපති විය යුතුයි. ඔවුන් විසින් ඉදිරිපත් කරපු මාධ්‍ය සාකච්ඡාවක්. මේක විනාඩි 18 ක් විතර යනවා. මම ඒක අතරින් පතර පොඩ්ඩක් Skip කරන්නම් ඔබතුමාලාගේ වටිනා කාලය ඉතුරු කර ගන්න. නමුත් අපි මේකෙන් පටන් ගන්නවා නම් අපිට පදනමක් තියේවි ...,

ප : ඔබ මේ පුද්ගලයාගේ, පෙනී ඉන්න පුද්ගලයාගේ නම දන්නවද කවුද කියලා?

පි : නමින් මම දන්නේ නැහැ. මවුලවී කෙනෙක්.

ප : ජමෙයිතුල් උලමා සංවිධානයට ඔහු සම්බන්ධයිද?

පි : ඔව්.

ප : ඔහුට එහි තනතුරක් තිබෙනවද ඉහළ තනතුරක්?

පි : ඔව්. උප සභාපති විය යුතුයි.

ප : මෙය ඔබ ලබා ගත්තේ සමාජ මාධ්‍ය හරහාද?

පි : ඔව්.

(වීඩියෝ පටය ප්‍රදර්ශනය කරයි)

පි : මට මේකේ මේ Highlight කර ගන්න ඕන මෙන්න මේ ටික. (වීඩියෝ පටය ප්‍රදර්ශනය කරයි) එක පුද්ගලයෙක්ව ඝාතනය කෙරුවොත් ඒගොල්ලොන්ගේ ආගමේ කියනවලු මුළු මිනිස් සංහතියම ඝාතනය කෙරුවා හා සමානයි කියලා. එතකොට එක පුද්ගලයෙක්ගේ ජීවිතය බේරුවොත් ආගමේ කියනවලු මුළු මිනිස් සංහතියම බේරා ගත්තා හා සමානයි කියලා. ඊට පස්සේ එතුමා ඉස්සරහට යනවා. (වීඩියෝ පටය ප්‍රදර්ශනය කරයි) අන්න ඒ නිසි කාරණාවක් නැතුව කියලා කිව්වා. (වීඩියෝ පටය ප්‍රදර්ශනය කරයි) එතනදී එතුමා ප්‍රකාශ කරනවා ඉස්ලාමයේ උගන්වන්නේ සිය දිවි නසා ගැනීම තහනම්. එහෙම සිය දිවි නසා ගත්තොත් සදාකල් අපායේ නිරාගත වෙනවා කියලා. ඒකෙන් එතුමා අපිට දෙන පණිවිඩය තමයි සහරාන්ලා ක්‍රියාත්මක වුණේ ඉස්ලාමික ධර්මයට අනුව නෙමෙයි කියන පණිවිඩය තමයි දෙන්නේ. (වීඩියෝ පටය ප්‍රදර්ශනය කරයි)

ප : දැන් ඔවුන් සඳහන් කරන්නේ කුරානයේ ඉගැන්වීම්වලට අනුව සිය දිවි නසා ගැනීම පාපයක් කියන කාරණය?

පි : ඔව්.

ප : ඊට අමතරව තව මොනවද ඔබ මේ වීඩියෝවෙන් අපේ කොමිෂන් සභාවට පෙන්නුම් කරන්නේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඉදිරියේදී ඔවුන් තවත් ප්‍රකාශයන් කරනවා. (වීඩියෝ පටය ප්‍රදර්ශනය කරයි)

ප්‍ර : ජිහාද් සංවිධානය සම්බන්ධව යම් ....?

පි : ජිහාදය ගැනත් ඔහු ප්‍රකාශයක් කරනවා. (වීඩියෝ පටය ප්‍රදර්ශනය කරයි) ඒ කියන්නේ මේ පොත.

ප්‍ර : ඒ පොත ඔබ සතුව තියෙනවද?

පි : ඔව්. (වීඩියෝ පටය ප්‍රදර්ශනය කරයි) ජමෙයිතුල් උලමා විසින් පරිවර්තනය කරලා නිකුත් කරපු අල් කුරානය. (වීඩියෝ පටය ප්‍රදර්ශනය කරයි) ඔබතුමන්ලාට බොහොම ස්තුතියි. මට අවශ්‍ය වුණේ මේ මවුලවීතුමාගේ මේ ප්‍රකාශයන් ටික ඔබ ඉදිරියේ කරන්න. මම ඒක Highlight කරන්නම්. ඔහු පළමුවෙන්ම කියනවා එක් පුද්ගලයෙකු ඝාතනය කෙරුවොත් මුළු මිනිස් සංහතියම ඝාතනය කෙරුවා හා සමානයි කියලා ඒගොල්ලන්ගේ ආගමේ උගන්වනවා. ඊට පස්සේ Suicide සිය දිවි නසා ගැනීම තහනම් කියලා කියනවා. ඒ හරහා අපිට අපේ සමාජයට පණිවිඩයක් දෙනවා. මේ සහරාන්ලා ඉස්ලාමික ඉගැන්වීම්වලට අනුකූලව නෙමෙයි කටයුතු කෙරුවේ ඊට ප්‍රතිවිරුද්ධ දිශාවකට කියලා. ඊට පස්සේ ජිහාඩ් කියන එක එයා අර්ථකථනය කරනවා ඒක චෛතසික අරගලයක් කියලා. අවසානයේ ඔහු බොහොම අමාරුවෙන් අවසානයට එනවා කඩුවෙන් කරන ජිහාඩයක් ගැන කියලා. ඊට පස්සේ ඒක කරන්නෙත් යුද්ධ පිටියේදී පමණයි කියන ප්‍රකාශය ඔහු කරනවා. ඊළඟට ඔහු පෙන්වනවා ඔවුන්ගේ සිංහල පරිවර්තනය කරපු සිංහල සමාජයට ඉදිරිපත් කරපු අල් කුරානයේ පරිවර්තනයක්. ඊට පස්සේ එයා ජිහාඩීන්ගේ ඉදිරියේ එයාවත් මුස්ලිම් කෙනෙක් නෙමෙයි කියලා ඒ කියන්නේ අන්තවාදීන් හෝ ISIS එහෙම නැත්නම් සහරාන්ලා ඒගොල්ලෝ ඉස්සරහා එතුමත් මුස්ලිම්වරයෙක් නෙමෙයි කියන අදහස එතුමා ඉදිරිපත් කරනවා. ඊට පස්සේ Fundamentals තුනක් ගැන කියනවා. පළවෙනි එක ධර්මය තවත් කෙනෙකුට බල කරන්න එපා කියලා කියනවා කියලා ආගමේ කියනවා. ඊට පස්සේ කියනවා අන් ආගම්වලට බණින්න, අපහාස කරන්න එපා කියලා ඉස්ලාමයේ කියලා තියෙනවයි කියලා. ඊළඟට ඔබට ඔබේ ආගම මට මගේ ආගම කියලා ලෝක ආගමික නිදහස ගැන ඔහු මතයක් ප්‍රකාශ කරනවා. ඉතිං මට කියන්න පුළුවන් මොහු හරිම Smart. ඒ කිව්වේ ඔක්කොම බොරු. ඔක්කොම බොරු. ඒකේ බොරුව වෙන්නේ ඒක ප්‍රායෝගිකව ඒක බොරුවක්. නමුත් ඔහු යම් යම් දේවල් කුරානයේ යම් යම් දේවල්වල එල්ලිලා ඒකේ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අනුසාරයෙන් තමයි බොරු ටික කියන්නේ ඔහුගේ විනාඩි 18 පුරාම කෙරුවේ බොරු. මම එකින් එක ...,

ප : ඔබට ඒක සනාථ කිරීමට මේ ගරු කොමිෂන් සභාවට අද කරුණු කාරණා දැන් ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : ඔව්. මම එකින් එක මගේ Presentation එකේදී පිළිවෙලින් මම ඉදිරිපත් කරන්නම් ඒවාට ආවහම. දැන් ගරු කොමිසමේ මහත්වරුණි, මේ අපි ඉස්ලාමයේ ඉස්ලාමික සමාජය දිහා බැලුවහම අපි දකිනවා මෙන්න මේ වගේ අන්ත දෙකක ක්‍රියාකාරකම් මුස්ලිම් අය, මුස්ලිම් සමාජය විසින් ක්‍රියා කරන අන්ත දෙකක ක්‍රියාකාරකම් දෙකොටසක්. එකක් ...,

ප : ඔබ ඒ අනුව දැන් මේ තිරයේ දැක්වෙන Slide එකේ වම් පසින් දක්වා ඇත්තේ මොකද්ද මේ?

පි : වම් පසින් මම දක්වලා තියෙන්නේ ඔවුන් අන්‍යාගමික සමාජය සමඟ සහජීවනයෙන් කටයුතු කරන අවස්ථාවක්. උඩම අපේ හාමුදුරුවෝ, ස්වාමීන් වහන්සේ කෙනෙක් එක්ක යම් තැනකට යනවා. දෙවෙනි එකේදී ස්වාමීන් වහන්සේලාට දානයක් පවා පිළි ගන්වනවා. තුන්වෙනි එකේ මම ඒක ගෙනාවේ ඔවුන් හැමවෙලේම කියනවා Islam means Peace කියලා. ඊට පස්සේ දකුණු අත පැත්තේ නියෝජනය වෙනවා ඔවුන්ගේ වෙනත් අනිත් අන්තයේ ක්‍රියාකාරකම්. අන්‍යාගම්වලට සහ අන්‍යාගමික ස්ථානවලට පහර දෙන අවස්ථාවක් සහ ත්‍රස්තවාදී බෝම්බ පුපුරණ අවස්ථාවක්. ඉතිං මේ දැන් අපේ සමාජයට මේක දිහා බැලුවහම ඇත්ත වශයෙන්ම ඉස්ලාමය කියන්නේ මොකද්ද කියන එක ගැන අපිට මේ සම්බන්ධයෙන් අපිට ඇති වෙන්නේ ව්‍යාකූල තත්ත්වයක්. ඉතිං මට සහතික කරලා කියන්න පුළුවන් මේ හැම දෙයක්ම සිද්ධ වෙන්නේ ඉස්ලාම් එකේ ඉගැන්වීම් අනුවයි කියලා.

ප : ඒ කියන්නේ මහත්මයා දැන් අර කලින් කථාව කරපු මවුලවීතුමා කිව්ව විදියට ඉස්ලාමය කියන්නේ මේ Slide එකේ මේ වම් පැත්තේ දක්වන කොටස් පමණයිනේ ඔහු පැහැදිලි කරපු විදියට?

පි : නැහැ. ඉස්ලාමයේ වම් පැත්තේ ...,

ප : මේ වම් පැත්තේ සහජීවනය...?

පි : ආ ඔව්. බොහොම හරි. එතුමාගේ අදහස වුණේ ඒක බොහොම හරි. සමාවෙන්න මම හිතුවේ මම අදහස් කළේ ...,

ප : ඒ අනුව දැන් ඔබ කියන්නේ මේ දකුණු අත පසින් දැක්වෙන බුදු පිළිම කැඩීම, ඝාතනය, ත්‍රස්තවාදය. ඒවාටත් යම්කිසි ඉස්ලාමික ආගමේ ඉගැන්වීම් බලපානවා කියලද?

FAIR COMMENT — BY JEZEEM

පි : සත්‍ය වශයෙන්ම, සම්පූර්ණයෙන්ම සහ සියයට සියයක්ම ඉස්ලාමික ඉගැන්වීම් අනුව තමයි ඒ ඉස්ලාම් ඉගැන්වීම් ප්‍රකාරව තමයි දකුණු අත පැත්තේ කටයුතු සිද්ධ වෙන්නේත්, වම් අත පැත්තේ කටයුතුත් සිද්ධ වෙන්නේ. මේකෙදී මේ වම් අත පැත්තේ කටයුතු සිද්ධ වෙන්නේ අනිවාර්යයෙන්ම බහුතර අන්‍යාගමික සමාජයක් තුළ ඔවුන් සුළුතරයක් වෙලා ඉන්න කාල පරාසය තුළම පමණයි. ඒ කවදාවත් බහුතර ඉස්ලාමික සමාජයක හරි ඉස්ලාමික ප්‍රදේශයක හරි ඔය වම් අත පැත්තේ සිද්ධ වෙන පෙන්නුම් කරන කටයුතු සිද්ධ වෙන්නේ නැහැ. ඒ වගේම මෙතන Islam means Peace කියලා තියෙනවා. එතනත් ඒක බොරුවක්. ඒක බොරුවක්. අපේ රටේ මාධ්‍යවල හැමතැනම ඒගොල්ලෝ මෙතෙක් කිව්වේ ඉස්ලාම් කියන අරාබි වචනයේ තේරුම Pease කියලා, සාමය කියලා. ඒක පට්ටපල් බොරුවක්. එහි නියම තේරුම තමයි Total Submission to the God. Total Submission කියන එක තමයි එහි නියම තේරුම. ඉතිං මේ තුනම, මේ වම් අත පැත්තේ ක්‍රියාකාරකම් තුනම බහුතර අන්‍යාගමික සමාජයක් මුලා කිරීමේ චේතනාවෙන් කළ යුතුයි කියන ඉස්ලාමික ඉගැන්වීම් යටතේ තමයි ඒ අය මේ වම් අත පැත්තේ ක්‍රියාකාරකම් කරන්නේ. ඒ අනුව මට කියන්න පුළුවන් ඔවුන්ගේ ඇත්ත වශයෙන්ම මේ මූලික කාල පරිච්ඡේදය, ඔවුන්ගේ මූලික කාල පරිච්ඡේදයේදී මෙය ආවරණයක් විදියට භාවිතා කරනවා. එතකොට දකුණු අත පැත්තේ ඇත්ත වශයෙන්ම මට නැවත සහතික කරලා කියන්න පුළුවන් ඉස්ලාමයේ නියම ඉගැන්වීම්, නියම සංදර්භයන්, නියම සංකල්පයන් නියෝජනය වෙනවා කියලා දකුණු අත පැත්තෙන්. ඒ වගේම මම මුලින්ම කිවයුතු දෙයක් තියෙනවා. ඒ තමයි මෙතනදී මම හෙළි කරන අකුරෙන් අකුර හැම දෙයක්ම හෙළි කරන්නේ අපේ රටෙත්, මනුෂ්‍ය ජීවිත ආරක්ෂාව සහ රටේ ආරක්ෂාව වෙනුවෙන් මිසක් මගේ හිතේ කිසිම ඒ කියන්නේ ඒගොල්ලොන්ට ඉස්ලාමික ආගමට අගෞරවයක් කරන චේතනාවෙන් හෝ ඉස්ලාමයට අපහාසයක් කරන චේතනාවෙන් හෝ නොවෙයි. මෙහි මම ඉදිරිපත් කරන ඒ හැම දෙයක්ම අපේ රටේ ආරක්ෂාවට සහ ඒ වෙනුවෙන් කරන දෙයක් කියලා මම ඔබතුමන්ලා ඉදිරියේ සහතික කරනවා.

ප්‍ර : දැන් ඔබ සඳහන් කළානේ මේ ඔබ මේ කථා කරන ඉස්ලාමික ප්‍රශ්නය ගැන පැහැදිලි කිරීමේදීනේ ඔබ මේ Slide එක ඉදිරිපත් කළේ.

පි : ඔව්.

FAIR COMMENT — BY JEZEEM

ප : දැන් ඒ අනුව අපිට ඊළඟ Slide එකට යන්න පුළුවන්ද?

පි : ඔව්.

ප : මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔබ හඳුනා ගැනීම සහ ප්‍රවේශය යන මාතෘකාව යටතේ තමයි කරුණු සඳහන් කරන්න පටන් ගෙන තියෙන්නේ?

පි : ඔව්.

ප : ඔබ ප්‍රශ්නයට ප්‍රවේශය කොහොමද මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්නේ?

පි : හොඳයි. පළමුවෙන්ම මා කිව යුතුයි අපි ඕනෑම ප්‍රශ්නයක් විසඳන්න ඉස්සරලා අපි මුලින්ම කළයුතු වෙනවා ඒ ප්‍රශ්නය හරිහැටි හඳුනා ගැනීමක්. ඒ ප්‍රශ්නය දිහා එක එක කෝණවලින් බලන්න පුළුවන්. නමුත් ඒ ප්‍රශ්නයේ නියම අර්ථයෙන්, නියම කෝණයෙන් බලලා, ඒ ප්‍රශ්නය හරි හැටි සියයට සියයක් හරිහැටි අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය කාරණයක් විසඳුමට යන්න කලින්. මගේ මූලිකම අරමුණ පදනම වෙන්නේ අන්න ඒ කාරණයයි. එතකොට අපේ ඉස්සරහාට යනකොට සහ මේ සම්බන්ධයෙන් අපි අවබෝධය ලබා ගන්නකොට අපිට මොහොමඩ් නබිතුමාව අමතක කරලා ඉස්සරහට යන්න බැහැ. ඉතිං මට එතුමා කවුද, එතුමාගේ ස්වභාවය මොකද්ද, එතුමා ක්‍රියාත්මක වූ ආකාරය සම්බන්ධයෙන් මට ගරු කොමිසම ඉදිරියේ හෙළි කරන්නට අවශ්‍යයි. එහිදී නැවතත් මම කියනවා මට කිසිම අවශ්‍යතාවයක් නැහැ මේ අපහාසයක් වගේ දෙයක් කරන්න. ඇත්ත වශයෙන්ම මගේ හොඳම යාළුවෝ මුස්ලිම් අය ඉන්නවා. සිංහල අය වගේම හොඳම යාළුවෝ සහෝදරයන් සේම යාළුවෝ ඉන්නවා. ඉතිං මම ඒ අයත් එක්ක බොහොම මිත්‍රශීලීව කටයුතු කරනවා. ඒ අයත් එහෙමයි මට. ඒ නිසා මට මොනයම්ම හෝ හිතේ තියෙන දෙයක් නිසා මේ දේවල් කියනවා නෙමෙයි. නමුත් නබිතුමා කවුද කියන එක සහ ඔහුගේ ස්වභාවය තරමක් ආන්දෝලනාත්මකයි. මම ඔබතුමන්ලාගේ අවසරය ඉල්ලා සිටිනවා ඒ ගැන කථා කරන්න. මම නැවතත් සිහි කරනවා මේ සත්‍යයම මිස අසත්‍යය නොවෙයි සහ මේ මම ඉදිරිපත් කරන්නේ තනිකරම කුරානයේ සහ හදීස්, සුන්නා ඒ කිව්වේ ඒ ඉස්ලාමික ඉගැන්වීම්වලින්ම පමණයි මේ ඔහුගේ ස්වභාවය මා ඉදිරිපත් කරන්නේ කියලා.

ප : ඔබ පැහැදිලි කිරීම පටන් ගන්න?

පි : මොහොමඩ් නබිතුමා උත්පත්තිය ලබනවා මක්කා නගරයේ පන්සිය හැත්තෑවන වසරේදී. ඒ ඔහු කුඩා කාලයේදීත්, තරුණ කාලයේදී තවලම් වෙළඳාමේ යෙදෙන කෙනෙක්. ඉන්පසු ඒ

FAIR COMMENT BY JEZEEM

වගේම ඔහු ඉතාම කුඩා කාලයේදී ඉතාම දුක්ඛිත ජීවිතයක් ගත කරපු කෙනෙක්. ඊට පස්සේ එහෙම ඉඳලා අවුරුදු 25 දී ඔහු විවාහ වෙනවා කදීජා කියන විවාහක, කලින් විවාහ වෙච්ච කාන්තාවක් සමඟ. ඔහුට වැඩිය අවුරුදු පහළොවකින් වැඩිමහල්. මොහුට අවුරුදු විසි පහේදී ඒ අවුරුදු හතළිහක කදීජා කාන්තාව සමඟ විවාහ වෙනවා. ඇය ඉතාමත් ධනවත්. තවලම් අයිතිකාර කාන්තාවක්. එතකොට ඇය ක්‍රිස්තියානි ලබ්දිකයෙක්. ඇයගේ සහෝදරයෙක් ඉන්නවා වරකා ඉබන් නවුෆල් කියලා. ඔහු පූජකයෙක්. ක්‍රිස්තියානි සහ යුදෙව් ආගම දෙකම ඒ ග්‍රන්ථ අරාබි භාෂාවට පරිවර්තනය කරපු විද්වතෙක්. ඉතිං මෙන්න මේ Link එක තුළ, මේ සම්බන්ධකම් තුළින් තමයි නබිතුමා 610 වන වසරේදී ඉදිරිපත් කරනවා ඉස්ලාම් කියන ආගම. එතකොට මක්කාවේ ආගම ගැන කියනවා නම් එය සඳහන් වෙන්නේ පිළිම වන්දනා කරන Pagan ආගමක් හැටියට පිළිම වන්දනා කරන. එහම හදාරපු විදියට, අනුව එය බෞද්ධ පූජනීය ස්ථානයක්. සිරිපතුල පවා තවමත් තියෙනවා. එය ඒබ්‍රහම්ගේ පාදය හැටියට සළකනවා. ඉතිං ...,

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද ඒ බෞද්ධ පන්සලක් එහෙම හරි ඒ කාලයේ තිබුණාද කියලා?

පි : ඔව්. මක්කාව කියන්නේ මකුලාරාමය. ඒ මකුලාරාමය පුණ්‍ය රහතන් වහන්සේ විසින් ස්ථාපිත කරපු පන්සලයි යෝනකපුරය. මේ පොතේ පවා සඳහන් වෙනවා සිරි පතුල් වන්දනා ගාථාවේ යෝනකපුරය ගැන. යං තත්ව යෝනක පුරේ මුනි නෝවා පාදං කියන එක. ඉතිං අදටත් තියෙනවා ඒ සිරිපතුල. ඉතිං කොහොම හරි 610 වන වසරේදී මේ නබිතුමා ඉදිරිපත් කරන සංකල්පය, ආගමික සංකල්පය ඇවිල්ලා ක්‍රිස්තියානි සහ යුදෙව් ආගමට පදනම් කරගෙන ඉදිරිපත් කරන ආගමක්. එතකොට මේ විදියට දැන් මුලින්ම නවුෆර් අර ඔහුගේ භාර්යාවගේ ඥාති සහෝදරයා වයසක කෙනෙක්. එතුමා තමයි, පූජකවරයා තමයි නබිතුමාට මේ ආගම් සම්බන්ධයෙන් කරුණු කාරණා කියලා දෙන්නේ. ඉතිං කොහොම හරි 610 දී ඉදිරිපත් කරපු ආගම නබිතුමාට අවශ්‍ය වෙනවා මක්කානු වැසියන් තමන්ගේ ආගමට එන්න ආරාධනා කරනවා. නායකයන්ට ආරාධනා කරනවා. නමුත් ඒ අය කවුරුත් කැමති වෙන්නේ නැහැ. මෙයාට බොහොම ටික දෙනෙක් තමයි එකතු වෙන්නේ. ඒ අනුව මොහු නැවතත් උත්සාහ කරනවා මේ අයව ගන්න. අවුරුදු 13 ක් තිස්සේ කරපු උත්සාහය පළ දරන්නේ නැහැ. ඒ අවස්ථාවේදී 622 වන වසරේදී මොහු කුමන්ත්‍රණයක් කරනවා මදීනා නගරයේ මේ මක්කාවට වඩා කිලෝමීටර් 400 ක්

FAIR COMMENT BY JEZEEM

උඩින් තියෙන්නේ සෞදි අරාබිය. මදීනා නගරයේ ඉන්න පාතාල වගේ කට්ටියක් එක්ක, දාමරික කට්ටියක් එක්ක මේ මොහොමඩ් නබිතුමා ප්‍රතිඥාවක් ගන්නවා Agreement එකක් වගේ එනවා මක්කානු නායකයන්ව භීෂණය හරහා මක්කාව අත්පත් කර ගන්න. අන්ත එතනදී ...,

දැන් වේලාව : ප.ව. 5.00 යි
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව ප.ව. 5.00 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>රජයේ නීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : ඒ වෙන කොට මක්කානු ප්‍රදේශයේ යම්කිසි බලයක් මොහම්මත් නබීතුමාට හිමිවෙලා තිබුණද?

පි : නැහැ මොහොමඩ් නබීතුමාට හිටියේ බොහොම අතලොස්සක් වූ පිරිසක් අනුගාමිකයෝ හැටියට. ඒ නිසාම මේ මක්කානු කාලපරිච්ඡේදයේදී නබිතුමා භාවිතා කරනවා උපායමාර්ගික ගමනක්. ඒ කියන්නේ මක්කානු වැසියන්ව රැවටීමකට ලක් කරන්න උත්සාහයක් ගන්නවා. නමුත් ඒ කිසි දෙයක් සාර්ථක වෙන්නේ නැහැ. දැන් 622 වෙනි වසරේදි අර මදීනාවල කට්ටියක් එක්ක සම්බන්ධවෙලා ඒ කරපු කුමන්ත්‍රණය මක්කානු වැසියෙකුට එයාට ඇහෙනවා, ඇහිලා එයා දුවලා ගිහිල්ලා කියනවා මක්කානු නායකයන්ට. ඒ අවස්ථාවේදී නබීතුමාව අල්ලලා නීති මගින් කටයුතු කරන්න යෑමේදී නබිතුමා පලා යනවා. ඒකට ඒගොල්ලන් කියනවා හිජ්රා කියලා. ඒගොල්ලන්ගේ ඉස්ලාමික වසර පටන් ගන්නේ 622 වසරින් පළවෙනි වසර කියලා හිජ්රා. මදීනාවලට පළා යනවා.

ප්‍ර : ඒ කියන්නේ ප්‍රියන්ත මහත්තයා මේ 622 AD එම අවස්ථාව වෙන කොටත් ඉස්ලාම් දහම එතරම් ප්‍රචලිත වී තිබුණේ නැහැ කියලා කිව්වොත් ?

පි : කොහෙත්ම ප්‍රචලිත වෙච්ච ආගමක් නෙමෙයි. එය ඔවුන් අතරේ පමණක් නබීතුමා සහ ඔහුගේ අනුගාමිකයන් අතර පමණක් තිබුනු ආගමක්.

ප්‍ර : ඉන් අනතුරුව හිජ්රා නැත්නම් පළායාම සිදු වෙනවා?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ මොකද වෙන්නේ?

පි : ඊට පස්සේ 622 දී පළා ගියායින් පස්සේ මදීනාවලදී ඔහු සංවිධානය වෙනවා අර කියපු කණ්ඩායමත් එක්ක. සංවිධානය වෙලා එන්න කියනවා අර එයාගේ මක්කාවේ හිටපු අනුගාමිකයන්ට. ඔවුන් පවුල් පිටින් ගිහිල්ලා පස්සේ ඒගොල්ලන්ට ආදායමක් මුකුත් නැති තැන ඔවුන් කියනවා නබිතුමනි අපිට මේ දරුවන්ට කන්න දෙන්න විදියකුත් නැහැ ඔබතුමා කියපු හින්දා ආවා කියලා. එතනදී තමයි නබිතුමා තීරණය කරන්නේ 624 දී පළවෙනි ප්‍රහාරය එල්ල කරනවා මක්කානු තවලම්වලට කොල්ලකෑමක් සිදු කරනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මේ වන කොට 624 AD ඒ කාල පරිච්චේජදය වෙන කොට නබිතුමා මුලින්ම කසාද බැඳපු කාන්තාව ඇය ජීවතුන් අතර හිටියද?

පි : නැහැ. ඇය 619 වසරේදී නැත්නම් 620 වෙන කොට මියයනවා කදීජා. එතෙක් එතුමාගේ ස්වභාවය එතනිනුත් අපිට අවබෝධ කර ගන්න පුළුවන්. එතෙක් අර බලවත් වූ කාන්තාව යටතේ ඒ කාන්තාව පමණයි විවාහක භාර්යාවක් හැටියට ඉන්නේ ඒ කාන්තාව පමණයි. ඒ කාන්තාව මියගියායින් පස්සේ ඔහු කසාද බඳිනවා අවුරුදු 6 ක දැරියක් අයිෂා අබුබක්කර් කියලා. එතකොට ඊට පස්සේ නබිතුමා මේ මදීනාවේදී සංවිධානය වෙනවා. ඒ කියන්නේ සන්නද්ධ කල්ලියක් වගේ හදා ගන්නවා. එහෙම කරලා අර තවලම්වලට පහර දීලා ඒ මක්කානු ආර්ථිකය අඩපණ කරනවා. අඩපණ කරලා ඔවුන් ඒ මුදල් සහ ඒ ආයුධ ඒ හැම දෙයකින්ම ඔවුන් බලවත් වෙනවා. බලවත් වෙලා ඒ ඔහු පැහැදිලිව ප්‍රකාශයක් කරනවා මක්කානුවේ ඔහුව බලාකියා ගත්තු පොඩි කාලෙදි බලාකියා ගත්තු ඔහුගේ මාමා කෙනෙකුට ඒ මාමාට භාර දෙනවා ඒ මක්කානු වැසියන්ව සහ නායකයින්ව මෙයාගේ ආගමට එන්න කියලා Influence කරන්න කියලා. ඒ අවස්ථාවේදී නබිතුමා පැහැදිලිවම කියනවා එහෙම කෙරුවොත් අපිට පුළුවන් අනිත් ප්‍රදේශවල ඉන්න මිනිස්සුන්ගේ වස්තුව අපිට කොල්ලකාලා අපේ tribe එකට කුරේශි ඒගොල්ලෝ, ඒගොල්ලන්ට පොහොසත් වෙන්න පුළුවන් කියන මතය ඉදිරිපත් කරනවා. ඉතින් ඊට පස්සේ මොහු සන්නද්ධව බොහොම සංවිධානය වෙලා 624 වසරේදී ක්‍රිස්තියානි සහ යුදෙව් සංහාරයක් සිදු කරනවා. ඊට පස්සේ 630 වසරේදී ඔහු නැවත එනවා 10000 ක හමුදාවක් එක්ක මක්කානු නගරයට. ඇවිල්ලා මක්කානු නගරය අත්පත් කර ගන්නවා. ඊලඟ දවසේ ඉදන් ඔහු නියෝග කරනවා හමුදාවට ඔහුගේ කණ්ඩායමට මුළු අරාබිකරයටම ගිහිල්ලා මුළු අරාබිකරයම ඉස්ලාමයට යටත් කර ගන්නයි කියලා. ඒ අනුව ඔහු ඉදිරිපත් කරන 8 වෙනි ශූරා 39 වන වගන්තියේදි ඔහු ප්‍රකාශ කරනවා නුඹලා සියළුම අන්‍යාගමිකයන්ට එරෙහිව සටන් කළයුතුයි, ඔවුන්ගේ සියළු ආගම් සහ ඔවුන්ගේ ජීවන රටාවන් විනාශ කළයුතුයි, එසේ කොට ඉස්ලාමය පමණක්, භූමියේ ඉස්ලාමය පමණක් ස්ථාපිත වනතුරු එය ඉදිරියට ගෙනියන්න සහ එය මුළු ලොව පුරාම ක්‍රියාත්මක කරන්නයි කියලා.

ප්‍ර : දැන් ඔබ සඳහන් කළානේ 8 වන ශූරාවේ 39 වන වගන්තිය සම්බන්ධයෙන්?

පි : ඔව්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : ඒ 39 වන වගන්තියේදී අල්ලා දෙවිඳු කිව්වා කියලා කියන කාරණය එළිදැක්වෙන්නේ මේ මදීනා සහ මක්කම එක්සේසත් කරලා එක රාජ්‍යයක් බිහි කළාට පස්සේ ද?

පි : නැහැ 624 දී.

ප්‍ර : දැන් ඔය 8, 39 කියන ශූරාවේ තියෙන කාරණය නැවතත් මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න?

පි : එහිදී ඔහුගේ ඒකේ අන්තර්ගතය වන්නේ මුස්ලිම්වරුන් විසින් අන්‍යාගමික සමාජයන්ට එරෙහිව සටන් කළයුතු බවත්, එහිදී ඒ අන්‍යාගමික සමාජයේ සියළුම ආගම් සහ ඔවුන්ගේ ඒකට කියනවා අල්ෆිට්නා කියලා. අල්ෆිට්නාව අවසන් වනතුරු කියලා. අල්ෆිට්නාව කියන අරාබි වචනයේ තේරුම තමයි මේ අන්‍යාගමිකයින්ගේ ජීවන රටාව කියන එක. ඒ කියන්නේ අන්‍යාගමිකයන්ගේ සමස්ථ ජීවන රටාවම විනාශ කරලා ඉස්ලාමය පමණක් එකම ආගම ලෙස ස්ථාපිත වනතුරු සටන් කරන්න සහ එය මුළු ලොව පුරාම ක්‍රියාත්මක කරන්න කියලා තමයි ඒකේ අන්තර්ගතය වෙන්නේ. එතකොට මෙතනදී මට කිවයුතුයි අපි බෞද්ධාගම ගැන කතා කලොත් අපි ඒක ආගමක් ලෙස සලකන්නේ. නැත්නම් දර්ශනයක් ලෙස සලකන්නේ. නමුත් ඔවුන් ඉස්ලාමය ගැන කතා කරන කොට එය අපි හිතුවට එය ආගමක් කියලා ඔවුන්ගේ දැක්ම එය ආගමක් පමණක් නොවෙයි. එය ඔවුන්ගේ ජීවන රටාවයි. එය ඔවුන්ගේ සමස්ථ ඔවුන් ඉස්ලාමය කියලා කියන්නේ දීන් කියන එක. අරාබි භාෂාවෙන් දීන් කියන එක, දීන් කියන්නේ ආගමම නෙමෙයි. එය සමස්ථ ජීවන රටාවම. එයට ඇතුලත් ආගම, චාරිත්‍ර වාරිත්‍ර, traditions, සම්ප්‍රදායන් සහ නීතිය. එතකොට 8 වන ශූරාවේ 39 වන වගන්තියෙන් විනාශ කරන්න කියලා කියන්නේ අන්‍යාගමිකයින්ගේ ආගම පමණක් නොවෙයි, ඒ පන්සල් පල්ලි පමණක් නොවෙයි, එය ඔවුන්ගේ මුළු සමස්ථ ජීවන රටාව, අල්ෆිට්නා කිව්වාම එය චාරිත්‍ර වාරිත්‍ර, නීතිය පවා ඒකට ඇතුලත් වෙනවා. එසේ කරලා ඉස්ලාමය එකම ජීවන රටාව ලෙස ස්ථාපිත වනතුරු සටන් කරන්නයි කියලා. ඔතනදී ඔය ACJU එකෙන් මට ඒක, මම එතනට ආවාම කියන්නයි හිටියේ, මේ එතුමා පෙන්නපු, මවුලවිතුමා පෙන්නපු කුර්ආනය එය ඇත්තෙන්ම ඒක ප්‍රෝඩාවක් කරලා තියෙන්නේ. ඒ translation එක සාවද්‍යයි. බොරු ලියලා තියෙන්නේ. එය සිංහල සමාජයට ඉදිරිපත් කරලා තියෙන්නේ නියම සන්ධර්භයන් තුළ පිහිටා කරපු පරිවර්ථනයක් නොවෙයි.

ප්‍ර : ඔබ එසේ කියන්නේ කොහොමද?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : එසේ කියන්නේ මා එය බලපු නිසයි. මම ඒකේ උදාහරණ 2 ක් අරගෙන ඉදිරියේදී මම දක්වන්නම්. ඔවුන් එය හිතාමතාම එය වැරදීමක් නොවෙයි, හිතාමතාම ඔවුන් අපෙන් ඒ නියම අර්ථ විග්‍රහයන් සඟවලා ඒ වෙනුවට වෙනත් අර්ථ විග්‍රහයක් තමයි දීලා තියෙන්නේ. ඒ නිසා ඕක බැලුවොත් අපිට හිතා ගන්න බැරිවෙනවා මේ අර මම කියපු අන්තර්ගතය.

ප්‍ර : ඔබට මේ සලයිඩ් එක සම්බන්ධයෙන් තව යමක් කියන්න තියෙනවද?

පි : ඔව්. මට අවශ්‍ය වුණේ ඔහුගේ ස්වභාවය පිළිබඳව සහ ඔහු ක්‍රියාත්මක වුණු ආකාරය ගැන කියන්න. ඊට පස්සේ මම කිව්වා මුළු අරාබිකරයම 630 දී මක්කාව යටත් කරලා පළවෙනි ඉස්ලාමිය රාජ්‍ය පිහිටුවායින් පස්සේ මුළු අරාබිකරයම යටත් කර ගන්නවා. ඔහු 632 දී මරණයට පත් වෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

මේ අවස්ථාවේදී කොමිෂන් සභාවේ කටයුතු පස්වරු 5 පසුවී විනාඩි 40 තෙක් කල් තබනවා.

****

කෙටි විවේකයකින් පසුව නැවත කොමිෂන් සභාව රැස්වේ.

දැන් වේලාව ප.ව. 5.55

<u>ලලිත් ප්‍රියන්ත වතුදුර නැවත කැඳවා ප්‍රතිඥා දෙයි.</u>

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : දැන් තේ විවේකයට කලින් ඔබ පැහැදිලි කළා මේ ගරු කොමිෂන් සභාවට මේ ප්‍රශ්නය හඳුනා ගැනීම සහ ප්‍රවේශය යටතේ මොහොමඩ් නබිතුමාගේ ආරම්භය සහ ඔහුගේ මරණය දක්වා කාලපරිච්ඡේදය, මක්කානු කාලපරිච්ඡේදය සහ මදීනා කාලපරිච්ඡේදය. දැන් ඔබට මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් ඔබ මෙය පැහැදිලි කිරීම සඳහා තවත් කරුණු රැගෙන ආව නේද?

පි : ඔව්.

ප්‍ර : අපි ඒකට යන්?

පි : හොඳයි. අපි කතා කෙරුවේ මොහොමඩ් නබිතුමාගේ ක්‍රියාන්විතය, ඔහු ක්‍රියාත්මක වූ ආකාරය සහ ඒ ඉස්ලාමය ස්ථාපිත කරපු විදිය. එතකොට ඔහුගේ ස්වභාවය ගැන අපි යමක් touch

FAIR COMMENT BY JEZEEM

කරලම ඉදිරියට යමු. ඔහු ගේ ස්වභාවය මේ කුර්ආනය ඇසුරෙන්ම අපිට අවබෝධ කර ගන්න පුළුවන්.

ප : ඔබ මේ තොරතුර ලබා ගත්තේ ශුද්ධ වූ කුර්ආනයෙන් කියලා කිව්වොත් හරිද?

පි : ඔව්. එතකොට ඒ කොහොමද කියනවා නම් ඔහුගේ පළමු බිරිඳ කදීජා මියගියායින් පස්සේ ඔහු දෙවන බිරිඳ හැටියට අවුරුදු 6 ක දරුවෙක්ව විවාහ කර ගන්නවා. එතන ඉදලා ඔහු මේ මූලාශ්‍රවල තියෙනවා 23 ක් කසාද බැඳලා තියෙනවා. ඊට අමතරව ගණනය නොකරපු තරමේ ලිංගික වහල්ලු තියාගෙන ඉදලා තියෙනවා. ඒ අතර සිදු වෙච්ච සිදුවීමක් තමයි මේ.

ප : දැන් ඔබ කලින් සඳහන් කරපු කාරණා කුර්ආනයේ නැහැනේ?

පි : මොකක්ද?

ප : ලිංගික වහලුන් තබා ගැනීම සහ කසාද මෙච්චර කලා කියන එක?

පි : කුර්ආනයේ 33 ශූරාවේ 50 වෙනි වගන්තියේ ඔහුට අනුමත කරලා තියෙනවා ඒ සියළු දේ. එතකොට හදීස්වල තියෙනවා ඒ කාරණය.

ප : මේ කාරණයට යමු කෝ?

පි : මේ ප්‍රශ්නය වුණේ ඔහුට හිටියා හදාගත්තු පුතෙක්. Adapted Son කෙනෙක්. By the name of Seth Bin Haritha.

ප : දැන් මේ හදාගත්ත නැත්නම් Adopted පුතා හදාගත්තේ පළවෙනි කසාදයෙන්ද නැත්නම් අයිෂා යන දෙවන කසාදයට අදාලවද?

පි : නැහැ පළවෙනි කසාදයේ කදීජා විසින් නිදහස් කර ගත්තු වහල් ළමයෙක් ඒ ළමයව තෑග්ගක් හැටියට දෙනවා ඒ විවාහයේදී මොහොමඩ් නබිතුමාට.

ප : කදීජා සහ මොහොමඩ් නබිතුමාගේ විවාහයේ ඔවුන් තවත් හදා නොගත් ඇත්තටම ළමයින් ඉන්නවද?

පි : ඔව් ළමයින් තුන්දෙනෙක් ඉන්න බව මූලාශ්‍රවල තියෙනවා. සඳහන් වෙනවා.

ප : කාන්තාවන්ද, පිරිමි ළමයින්ද?

පි : කාන්තාවන්. එතකොට මේ කියන Seth Bin Haritha කියන කෙනා බදිනවා සයිනප් කියන girl කෙනෙක්ව. ගෑණු ළමයෙක්ව. ඊට පස්සේ එක දවසක් මේ නබිතුමා ඒ තමන්ගේ හදාගත්තු පුතාගේ ගෙදර යන කොට පුතා හිටියේ නැහැ නමුත් ඒ පුතාගේ අළුත බැඳපු භාර්යාව සයිනප් ඉස්සරහාට එනවා. ඒ අවස්ථාවේදි නබිතුමා ඇයගේ රූපශ්‍රීයෙන් වශී වෙලා හිතනවා මට මැයව කසාද කරගත යුතුයි කියලා. ඒ අවස්ථාවේදී ඒ අදහස පුතාට දැම්මාම පුතා එවේලෙමඨ හදාගත්තු පුතා එවෙලේම ඒ භාර්යාව, තමන්ගේ

Prophet Muhammad's Biography
FAIR COMMENT BY JEZEEM

භාර්යාව දික්කසාද කරනවා. එතකොට නබිතුමා සයිනප්ව බඳිනවා. අන්න ඒ සංසිද්ධියේදී නබිතුමාගේ අනුගාමිකයින් ටිකක් කළබල වෙනවා. කළබල වෙලා ඊට එරෙහිව ප්‍රකාශ නිකුත් කරනවා. ඒ අවස්ථාවේදි නබිතුමා විසඳුමක් හැටියට ඒකෙන් බේරෙන්න, ගැලවෙන්න නබිතුමා ගේනවා මෙන්න මේ දෙවියෝ කිව්වයි කියලා 33 සූරාවේ 40 වන වගන්තිය. මේකේ පසුබිමේ තියෙනවා සන්ධර්භය තමයි එවකට මක්කානු සමාජයේ තිබුණා සම්ප්‍රදායක් ළමයෙක්ව හදාගත්තොත් ඒ ළමයා හදාගත්තු ළමයෙක් හැටියට නෙමෙයි තමන්ගෙම ළමයෙක් හැටියටයි සැළකිය යුත්තේ කියලා. තමන්ගේම ළමයෙක්. එතකොට ඒ සම්ප්‍රදාය නිසා තමයි මේ නබිතුමාගේ අනුගාමිකයෝ ඒ ක්‍රියාවට එරෙහි වුණේ. එරෙහි වුණේ ඇයි තමන්ගේම පුතාගේ භාර්යාව කොහොමද තාත්තා කසාද බඳින්නේ කියන ප්‍රශ්නේ උඩ තමයි මේ ප්‍රශ්නය ඇති වුණේ. එතනදීත් ගැලවීමේ මාර්ගයක් ලෙස නබිතුමා ගේනවා මෙන්න මේ වගන්තිය.

ප : එහි මොකක්ද සඳහන් වෙන්නේ 33, 40 හි?

පි : ඒකේ කියනවා නබිතුමා එයාගේ අනුගාමිකයින්ට කියනවා මට ජිබ්‍රීල් නැත්නම් දේව දූතයා පණිවිඩයක් ගෙනාවා අල්ලාහ් දෙවියන්ගෙන් මෙන්න මෙහෙම. මේකේ පණිවිඩය තියෙන්නේ, මොහොම්මද් නුඹලාගේ පිරිමින් අතුරින් කිසිවෙකුගේ පියෙකු නොවෙයි කියලා. එබැවින් ඔහු question කරනවා එබැවින් ඔහු කෙසේ නම් සෙයිත්ගේ පියා වන්නේ ද කියලා. ඊට පස්සේ එනමුත් ඔහු අල්ලාහ් ගේ පණිවිඩකරුද, නබිවරුන්ගේ අවසාන නබිවරයාද වේ. තවද අල්ලා සියළු දේ ගැන දන්නා මහා ප්‍රඥාවන්තයා වන්නේය කියලා. අපිට ඒ අවසාන වචන ටික අතහැරියොත් මුලින් තියෙන දේ තමයි අපිට වැදගත්. එහිදි මොහොම්මද් නුඹලාගේ පිරිමින් අතරින් කිසිවකුගේ පියෙකු නොවෙයි කියලා අර කියන්නේ සම්ප්‍රදායට, අරාබි සම්ප්‍රදායට, අරාබි සම්ප්‍රදායට තමයි එරෙහිව දේව නියෝගයක් ගේන්නේ. එතනින් එයා උත්සාහයක් ගන්නවා ඒ සම්ප්‍රදාය නිසා ඇති වෙච්ච කළබලය සමනය කර ගන්න. ඊට පස්සේ 33 වන සූරාවේ 37 වන වගන්තියෙත් දෙවියෝ කියපු දෙයක් තමයි, පණිවිඩයක් තමයි නමුත් ඒක දිග වැඩියි. අපි කාලය කෙටි කර ගන්න මම අන්තිම එකට යන්නම් 33 සූරාවේ 38 වන වගන්තිය, මොකද මේ අයට ඒගොල්ලන් සමනය වීමක් වෙන්නේ නැහැ. ඒගොල්ලෝ දිගින් දිගටම ප්‍රශ්න කරනවා. අන්න ඒ අවස්ථාවේදී කුර්ආනයේ 33 සූරාවේ 38 වන වගන්තියේ දෙවියෝ කිව්වයි කියලා එයා ප්‍රකාශයට නිකුත් කරනවා There is no blame on the propert

FAIR COMMENT
BY JEZEEM

in that which Allah has made legal for him. That has been Allah's way කියලා. මෙන්න මේ මැද්දේ තියෙන 33 සූරාවේ 37 වන වගන්තියෙන් මෙයා කියන්නේ පණිවිඩය කියන්නේ දෙවියෝ Manifest කරපු දෙයක් තමයි මේක. මේ විවාහය සයිනප්ව විවාහ කර ගන්න එක දෙවියන් වහන්සේ විසින් Manifest කරපු එකක්. කියන එක තමා මේකේ සාරාංශය. ඒ අනුව 33 වන සූරාවේ 38 වන වගන්තිය නිකුත් කරනවා මෙයා දෙවියෝ කිව්වයි කියලා Propet ට කිසිම කාටවත් blame කරන්න බැහැයි කියලා, එතනින් අරගොල්ලන්ව සමනය වීමක් වෙන්න වෙනවා මොකද ඒගොල්ලෝ දෙවියන්ට තියෙන බය නිසා. ඉතින් මෙන්න මේක තමයි නබිතුමාගේ ස්වභාවය. තවත් ඔය වගේ බොහොම කරුණු කාරණා තියෙනවා ඔය වගේ ටිකක් ඒ කියන්නේ controversial දේවල් ගොඩාක් තියෙනවා නබිතුමා සම්බන්ධයෙන්. ඒවා මේගොල්ලෝ වහගෙන තමයි මේ ඉස්ලාමය කියන එක අදහන්නේ. මෙතනදී මම ආපහු කියන්න ඕනේ මෙතනදි මේක Progress criticism එකක් මිසක් ඒක ඒගොල්ලොන්ට කරන අපහාසයක් විදියට මේවා reveal කළා නෙමෙයි.

ප්‍ර : තවදුරටත් මේ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න කරුණු ගෙනාවා නේද?

පි : ඔව්.

ප්‍ර : අපි එතනට යමු?

පි : එතකොට මේ නබිතුමා විසින් මේ අවුරුදු 23 ක කාල පරාසය ඒ කිව්වේ අවුරුදු 12 ක් මක්කානු කාලපරිච්ඡේදය ක්‍රියාත්මක වූ ආකාරය සහ අවුරුදු 11 ක් මදීනාවේ ක්‍රියාත්මක වූ ආකාරය සහ ඊට පස්සේ ඒ ක්‍රියාත්මක වීමෙන් පසු ඔහු ආගමක් ලෙස ඉස්ලාමය ස්ථාපිත කරපු ඒ සමස්ථ ක්‍රියාදාමයේ ජයග්‍රාහී පියවර සනිටුහන් වෙන්නේ මේ අල්ලාහ් ගේ සටහන එහෙම නැත්නම් ජිහාඩය කියන පදනම උඩයි

ප්‍ර : ඒ කියන්නේ ඔබ ප්‍රියන්ත මහත්මයා ජිහාඩය විදියට මේ අර්ථ දැක්වෙන්නේ මොකක්ද, ඔබ කරපු research එකට අනුව?

පි : ජිහාඩය කියලා කියන්නේ ඉස්ලාමය ස්ථාපිත කිරීමේ සත්‍ය ක්‍රමවේදයයි. එතකොට The cause of Allah කියලා කුර්ආනයේ සඳහන් වෙනවා සිය පාරකට වැඩිය The cause of Allah කියන එක සඳහන් වෙනවා මේ ඉංග්‍රීසි පරිවර්ථනයේ. ඒ cause of Allah කියන්නේ ජිහාඩයයි. අන්‍යාගමික සමාජයක් විනාශ කරලා එය අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තමයි ජිහාඩය කියලා කියන්නේ. එතකොට මේ නබිතුමා විසින් මේ අවුරුදු 23 ක කාලපරාසය තුළ

FAIR COMMENT BY JEZEEM

ඒ ස්ථාපිත කරපු ඒ ක්‍රියාදාමය සමස්ථ ක්‍රියාදාමය තමයි ඉස්ලාමය කියලා සංක්ෂිප්ත වෙන්නේ.

ප්‍ර : දැන් ඔබ කිව්වානේ Cause of Allah කියන එක තමයි ජිහාඩය කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් කුර්ආන් වැකි එහෙම තියෙනවද ඔබට හමු වූ?

පි : ඔව් බොහොම වැකි තියෙනවා කුර්ආනයේ. The Cause of Allah කියලා ඒක දාලා. ඇතුලත් කරලා.

ප්‍ර : ඔබ ඉස්ලාමය වශයෙන් සඳහන් කරන්නේ මොකක්ද?

පි : ඉස්ලාමය වශයෙන් සඳහන් කරන්නේ ඒ සමස්ථ ක්‍රියාදාමය. ඒ කියන්නේ බින්දුවෙන් පටන් අරගෙන අන්‍යාගමික සමාජයක් සම්පූර්ණ වශයෙන් අත්පත් කර ගැනීමේ ඉස්ලාම් කියලා මම අර කියපු නියම අර්ථය ඒ කිව්වේ The total Submission to Allah කියන එක. Total Submission කියන තත්ත්වය ඇති වෙනතුරු ඒ කරපු ක්‍රියාදාමය තමයි මේ ඉස්ලාමය කියලා ඒගොල්ලෝ නිර්මාණය කරලා තියෙන්නේ සහ ඉස්ලාමය කියලා මේ මුස්ලිම්වරුන් අදහන්නේ ඒ පල්ලි ගිහිල්ලා ඒ කරන්නේ පියවරෙන් පියවර එකක් ප්‍රධාන වශයෙන් ඒ ඉස්ලාමයට අනුගතවීම. ඒක හදලා තියෙන්නේ නිකම් ආමි එකක Structure එකක් තියෙන විදියට. Military Structure එකකට හදලා තියෙන්නේ.

ප්‍ර : ඇයි ඔබ එහෙම කියන්නේ?

පි : ඒකේ තියෙන ස්වභාවය අනුව. ඒ කියන්නේ..

ප්‍ර : මොන වගේ ලක්ෂණද ඔබ නිරීක්ෂණය කලේ?

පි : දැන් ඒ commands වලට පිටුපාන්න බැහැ එකක්. ඒක හරියටම Military Unite එකක තියෙන ගති ලක්ෂණ තමයි පෙන්නුම් කරන්නේ. එහෙම ඒක ප්‍රතික්ෂේප කෙරුවොත් එයාව මරලා දාන තත්ත්වයක් තමයි තියෙන්නේ. ඒක ඇත්ත වශයෙන්ම කියනවා නම් cult එකක් වගේ. Cult එකක ස්වභාවයක්. ඉතින් මේ ඉස්ලාමය කියලා ඒ මුස්ලිම්වරුන් කරන්නේ දැන හෝ නොදැන එහෙම මම කිව්වේ තේරුමක් ඇතුව. ඒ කියන්නේ මුස්ලිම්වරුන්, අපි සාමාන්‍ය මුස්ලිම්වරු දිහා බැලුවොත් ඒගොල්ලෝ ඇත්ත වශයෙන්ම මට සහතික කරලා කියන්න පුළුවන් මේ කුර්ආනය ඒ අය කියවලා නැහැ. ඒ කියන්නේ මේ අර්ථ සහ සන්ධර්භ අනුව අපි මේ විග්‍රහ ඉදිරිපත් කරන විදියට ඉගෙන ගෙන එහෙම නැහැ. මේක කියවලවත් නැහැ. නිකම් අර සමහර වෙලාවට අපි පාලි ගාථා තේරුම් නැතුව කියවනවා වගේ කියවිල්ලක් තමයි

FAIR COMMENT — BY JEZEEM —

කරන්නේ සාමාන්‍ය මුස්ලිම්වරු. ඒගොල්ලොන්ට අපි ඉස්සරහාදි දකිවි දැන් ඊලඟට දකින්නේ ඒක. ඒගොල්ලොන්ව ඒ ස්වභාවය මුස්ලිම්වරුන්ගේ හදනවා. ඒ ස්වභාවය මම ඊලඟට ගේන්න බලාපොරොත්තු වෙන්නේ. මුස්ලිම්වරුන්ගේ ස්වභාවය. මේ මුස්ලිම්වරුන්ගේ ස්වභාවය අපි හැදෙන්නේ කොහොමද කියලා දැන් හුහාක් මේ ඉගැන්වීම් නියෝග අනුව තමයි ඒගොල්ලන්ගේ මනස හැදෙන්නේ. නමුත් මම මෙතන නියෝජනයක් කරන්න විතරක් මේ 4 ක් ගෙනල්ලා තියෙනවා. අපි බැලුවොත් කුර්ආනයේ 33 වන සූරාවේ 38 වන වගන්තියෙන් කියනවා And the command of Allah is a decree determine කියලා.

ප : ඒකෙන් මොකක්ද අදහස් වෙන්නේ මහත්මයා ?

පි : ඒකෙන් අදහස් වෙන්නේ ඒ ගැන කාටවත් question කරන්න බැහැ. ඒක ස්ථිරයි, නිත්‍යයි, සදාකාලිකයි. දෙවියන් වහන්සේගේ තීරණය අවසාන තීරණයයි ඒ වගේ අදහසක් තමයි ඒකෙන් එන්නේ

ප : ඊලඟ කුර්ආන් වැකියට යන්?

පි : ඊලඟට 33 වන සූරාවේ 36 වන වගන්තියෙන් නැවතත් තවත් පැත්තකින් මුස්ලිම් මනස block කරනවා Now whenever god and his apostle have decided a matter, It is not for a believing man or a believing woman to claim freedom of choice in so far as they themselves are concerned for the who does rebels against god and he is a postal has already most obviously gone as way. මෙතනදි දෙවියන් වහන්සේ අල්ලාහු විසින් නියෝගයක් නිකුත් කරනවා අල්ලාහ් හරි එහෙම නැත්නම් එයාගේ පණිවිඩකරු මොහොමද් හරි තීරණය කරපු දේකට කිසිම මුස්ලිම් පිරිමියෙක් හෝ ගැහැණියෙක් challenge කරන්න බැහැ කියලා. ඒ කියන්නේ ඒගොල්ලොන්ට අවශ්‍ය විදියටම ඒක හිතන්න බැහැ. එතනදි මට ආපහු මතක් කරන්න ඕනේ අර මවුලවිතුමාගේ කතන්දරය. මොකේ මවුලවිතුමාත් තනිකරම මේකට against එකට කතා කෙරුවේ. මේකේ තියෙන සත්‍ය අර්ථ විග්‍රහයට හාත්පසින් වෙනස් තත්ත්වයක ඉදලා තමයි එතුමා කතා කලේ. ඒක මම පැහැදිලි කරන්නම් ඉස්සරහාදී ඇයි එයා එහෙම කලේ කියලා. මෙතනදි පැහැදිලවම කියනවා මුස්ලිම්වරයෙකුට තමන්ගේ නිදහසේ ඒ කියන්නේ තමන්ගේ සිතීමේ නිදහස පාවිච්චි කරලා තමන්ට ඕන විදියට මේවා අර්ථ කථනය කරන්න බැහැයි කියලා.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප්‍ර : ඔබ ඔය කියවන කුර්ආනය මොකක්ද?

පි : මේක ඩොක්ටර් මොහොම්මදු මුෂින්හාන් කියන පරිවර්ථකයා.

ප්‍ර : ලංකාවේ භාවිතා කරන කුර්ආනයක් නෙමෙයිද? ඕක Maldives වල එකක්ද?

පි : නැහැ මැඩම් මේක සෞදි අරාබියාවේ මුද්‍රණය කරපු ඩොක්ටර් මොහොමද් මුෂින්හාන් එයා ඇවිල්ලා Authentic Translator කෙනෙක්.

ප්‍ර : But 33, 36 මේක different meaning is same.

පි : Correct. හොඳයි මැඩම් මෙහෙමයි ඔතනදි මම ගත්තේ මොහොමද් අසාද්ගේ එක. නම දාලා තියෙනවා මොහොමද් අසාද්. මම ඒක හින්දමයි මම ඒ නම දැම්මේ නැත්නම් ඔතනදී මට අවශ්‍ය වුනේ නැහැ පැටලීමක් ඇති කරන්න. මොකද මෙහෙමයි සාමාන්‍යයෙන් ලෝකේ ඉංග්‍රිසියට පරිවර්ථනය කෙරුවේ Authentic Translators ලා හිටියේ 6 දෙනයි. ඒ 6 දෙනාගේ එක තමයි හරි Authentic පිළිගත්තු කුර්ආන් හැටියට භාවිතා කරන්නේ. මොකද මේක original ඇත්තටම අරාබිනේ. ඒ විද්වතුන් විසින් කරපු ඒවා විතරයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : කවුද ඒ හයදෙනා?

පි : ඒ හයදෙනා, එක්කෙනෙක් මොහොම්මද් අසාද්, යුසුෆ් අලී, මොහොම්මද් මුෂින්හාන්, ඊට පස්සේ සහී ඉන්ටනැෂනල් කියලා එකක් තියෙනවා ඒක තුන්දෙනෙක් විසින් ඒ හින්දා ඒගොල්ලන්ගේ නම්වලින් නෙමෙයි සහී ඉන්ටනැෂනල් කියලා, ඊට පස්සේ තව දෙන්නෙක් ඉන්නවා සර් මට ඒ නම් මතක නැහැ.

ප්‍ර : මතක් වුනොත් කියන්න?

පි : හොඳයි.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප්‍ර : එතකොට ඊට ඇරෙන්න මම Base කරන්නේ මේ හයදෙනාගේ. එක විශේෂයෙන්ම ඩොක්ටර් මුෂින්හාන්ගේ එක. ඒ මොකද මෙයාගේ footnote දීලා තියෙනවා. අනෙක් අයට වඩා මෙයාගේ පැහැදිලියි. මේ හැම එකකම යට පැහැදිලි කිරීම් දීලා තියෙනවා හදීද් මෙතන coat කරලා තියෙනවා ඒ හින්දා. ඒ

President's Copy
FAIR COMMENT BY JEZEEM

හින්දා මම එයාගේ එක Base කරලා තියෙනවා නමුත් මෙතනදි මම ගත්තේ ඇයි කියනවා නම් ඒ අයගේ හැමෝගෙම ඒවා බැලුවාම අපිට, අපි ලංකාවේ අය හැටියට මේක understand කරන්න පුළුවන් හොඳම එක තමයි මේක.

(කුර්ආන් පොතක් කොමසාරිස්වරිය පෙන්වා සිටී)

පි : ඕක තමයි මැඩම් මගෙත් එක. ඕක තමයි මේ තියෙන්නේ. same.

ප්‍ර : It is Kingdom of Saudi Arabiya

පි : yes. ඩොක්ටර් මුෂින්හාන්ගේ එක. One name is Pictal another **Authentic**

****

<u>**රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:**</u>

ප්‍ර : දැන් ඔබ පැහැදිලිව සඳහන් කළා ප්‍රියන්ත මහත්මයා, මේ මුස්ලිම්වරයෙක්ගේ මනස කොහොමද හැඩ ගස්වන්නේ කියලා මේ කුර්ආන් වැකිවලින් ඔවුන්ට ප්‍රශ්න කිරීමට ඇති හැකියාව තහනම් කරමින්.

(තිරයේ දිස්වන යම් කරුණක් පෙන්වා සිටී)

පි : මේක සර් attachment එකක් හැටියටයි මේක කරලා තියෙන්නේ. ඒකට page number එකක් නැහැ. සලයිඩ් නම්බර් 3. First attachment

ස්වාමිණි C854 වශයෙන් ලකුණු කරපු CD තැටිය තුළ පවර්පොයින්ට් ආකාරයෙන් ඇති ඉදිරිපත් කිරීමේ සලයිඩ් 63 ක් තිබෙනවා. මොහු දැන් සාක්ෂි ලබා දෙන්නේ එහි 3 වන සලයිඩයේ ඇති මුස්ලිම්වරුන්ගේ ස්වභාවය යන මාතෘකාව යටතේ ඇති පළමුවන ලින්ක් එක ආශ්‍රිතව ඇති ලේඛනය පරීක්ෂා කරමින් බව කොමිෂමේ අවධානයට යොමු කරනවා.

ප්‍ර : එම link එක click කලාට පසු මහත්මයා එනවා ලේඛනයක්?

පි : ඔව්.

ප්‍ර : දැන් මෙම ලේඛනයේ කුර්ආන් සූරා 33, 36 ඉදිරියෙන් ඔබ සඳහන් කරලා තිබෙනවා by Mohommad Asad කියලා?

පි : ඔව්.

ප්‍ර : හැබැයි අනික් ශ්‍රාවන්වල ඔබ සඳහන් කරලා නැහැ එම පාඨයන් ඔබ උපුටා ගත්තේ කොහෙන්ද කියලා. ඔබට කියන්න පුළුවන්ද ඒවා උපුටා ගත්තේ ඔබ කොහෙන්ද කියලා?

පි : ඒවා ප්‍රධාන වශයෙන් උපුටා ගත්තේ මම මේ කුර්ආනයෙන්.

ප්‍ර : මේ කුර්ආනය කියන්නේ මොකක්ද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සමාවෙන්න මේක Authored by ඩොක්ටර් මුෂින්ඛාන්. ඒක තමයි මම බොහෝදුරට භාවිතා කලේ ඒක. ඒ නිසා මම හැමතැනම නම් දාන්න බැරි නිසා මම ඒවායේ නම් දාලා නැහැ, නමුත් අර මැඩම් කියපු විදියට basically ඒකේ අදහස ඒ හයදෙනාගේම අදහස එකයි. සමහර තැන්වලදි විතරක් පුංචි පුංචි වෙනස්කම් තියෙනවා. නමුත් ඒකේ ඇතුලේ තියෙන ඒ අර්ථය එක වියයුතුයි. ඒ අයගේ, Authentic අයගේ. එතකොට නමුත් පාවිච්චි කරලා තියෙන වචන වෙනස්. ඉතින් අර මම කිව්වේ මම ඒක කීහිප දෙනෙක්ගේ ඒවා බැලුවාම මම තීරණය කෙරුවා අපි ශ්‍රී ලාංකිකයෝ හැටියට අපට සහ මුස්ලිම් නොවන අය හැටියට අපිට මේක ගත්තොත් පහසුවෙන් අපිට මේක කියවලා අපිට තේරුම් ගන්න පුළුවන් කියලා.

ප්‍ර : හරි ඒ කියන්නේ ඔබ එම නම් සඳහන් නොකර පාඨ උපුටා ගත්තේ ඩොක්ටර් මොහොම්මද් මුෂින්ඛාන් නැමැත්තා විසින් පරිවර්ථනය කරන ලද කුර්ආනයෙන් කිව්වොත් නිවැරදි ද?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබ මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමෙන් මේ කුර්ආන්වල තියෙන ශුරාවන් කිහිපයක් පැහැදිලි කළා. ඉස්ලාම් භක්තිකයන්ගේ ප්‍රශ්න කිරීමේ අයිතිය, දෙයක් විචාරය කිරීමේ අයිතිය කොහොමද මේ සුරාවන් මගින් සීමා කරන්නේ කියන එක ඔබ පැහැදිලි කළා?

පි : ඔව්.

ප්‍ර : තවත් ශුරාවන් 2 ක් තියෙනවා මේ ලේඛනයේම. ඒවායිනුත් පැහැදිලි කරන්නේ ඔය කාරණයමද?

පි : ඔව්. ඒවායිනුත් පැහැදිලි කරන්නේ මේ සාමාන්‍ය මුස්ලිම්වරුන්ගේ මනස ගොඩනැගෙන්නේ කොහොමද කියන එක. විශේෂයෙන්ම ඒ මනස block කරන්නේ කොහොමද කියන එක. තවත් පැත්තකින් මේ 5 වන සූරා 101 වන වගන්තියෙන් ඒ අයගේ මනස block කරනවා මේ විදියට. Who believe do not ask questions about what, about things which if made plain to you may cause you trouble. මේකේ තව පුංචි කොටසක් තියෙනවා පොඩි වචන ටිකක් තියෙනවා ඊට පස්සේ. මේකෙන් කියන්නේ ප්‍රශ්න කරන්න එපා කියන එකයි. නමුත් ඒ වචන ටිකෙන් කියවෙන්නේ ඕගොල්ලෝ කවුරු හරි ප්‍රශ්නයක් තියෙනවා නම් ඒ දෙයියෝ කියන වෙලාවේ මගෙන් ඇහුවා නම් මම කියලා දෙනවා කියන එකයි. ඉතින් ඒක මම හිතන්නේ මේක

FAIR COMMENT BY JEZEEM

trick එකක් විදියට ඇතුලත් කරපු එකක්. ඒක මම දැම්මේ නැහැ ඒක.

ප්‍ර : දැන් ඔබගේ කරුණු දැක්වීම ඊලඟ සලයිඩ් එකට යමු?

පි : ඊට පස්සේ මේගොල්ලන්ව බය ගන්වනවා

ප්‍ර : බය ගන්වන්නේ මොන ශූරාවෙන්ද?

පි : මේගොල්ලන්ගේ මනස බය ගන්වනවා සහ ඒක last nail එක ගහනවා බයි කුර්ආන් 5 ශූරා 102 වගන්තියේ Before you a community are such questions then on that account they became disbelievers කියලා

ප්‍ර : ඒ කියන්නේ ප්‍රශ්න අහන පුද්ගලයෝ එවැනි කාරණා සම්බන්ධයෙන් ප්‍රශ්න අහන පුද්ගලයෝ නිකම් Disbelievers..

පි : Disbelievers ඒ කියන්නේ ඉස්ලාමයට එරෙහි වන්නන් සහ ඉස්ලාමය ප්‍රතික්ෂේප කරන්නන් හැටියට මේ කුර්ආනයේ සඳහන් වෙනවා. ඒ නිසාම මුස්ලිම්වරයෙකුට මොනම ප්‍රශ්නයක් ආවත් දැන් අපි මේ සාකච්ඡාවට භාජනය කරපු අර controversial issues. ඒ controversial issues ඒගොල්ලන්ට ප්‍රශ්න කරන්න බැහැ.

ප්‍ර : ප්‍රශ්න කලොත් ඒගොල්ලන් Disbelievers ලා නැත්නම් කෆීර්වරු බවට පත් වෙනවා කිව්වොත්?

පි : කෆීර්වරු බවට පත් වෙනවා. සහ එවැනි අයව මරා දාන්න නියෝගයන් කුර්ආනයේ තියෙනවා.

ප්‍ර : ඔබගේ ඉදිරිපත් කිරීම ඊලඟ කරුණට යං?

පි : ඒ විදියට තමයි මේගොල්ලොන්ගේ මනස මේ හතරෙන් විතරක් නෙමෙයි තවත් බොහෝ ඉගැන්වීම් නියෝග තියෙනවා. අපි ඊලඟට බලමු මේක මේ ඉස්ලාමයේ තියෙන න්‍යායක්. ඒක.

ප්‍ර : ඔබ මෙම ලින්ක් එක ක්ලික් කරන්නෙත් මේ සලයිඩස් 62 ක් තියෙන පවර්පොයින්ට් එකේ 3 වන slide එකේ තියෙන link එකක්?

පි : link එක.

ප්‍ර : ඒක මොකක් පැහැදිලි කරන්නද මේ link එක ඔබ දාලා තියෙන්නේ?

පි : මේ න්‍යාය තමයි අල්වලා වල්බරා කියලා න්‍යායක්. ඒකෙන් කියන්නේ Love and hate in Islam කියලා.

ප්‍ර : මොකක්ද ඒකෙන් පැහැදිලි කරන්නේ?

පි : ඒකේදී පැහැදිලි කරනවා මේක හදීද් එකක්. Not කුර්ආන් . ප්‍රොපර්ට් මොහොමඩ් දේශනා කලා අන්තර්ගතය ආගමානුකූල හෝ ශ්‍රද්ධාවන්ත මුස්ලිම්වරුයෙකුගේ උත්තම ක්‍රියාවක් විය

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

යුත්තේ අල්ලාහ් කැමති දේට භක්තියෙන් යුතුව ආදරය එහෙම නැත්නම් එකඟවීමත්, අල්ලාහ් වෛර කරන දේට වෛර කිරීමත් කියලා. එතකොට ඒගොල්ලෝ ඒක follow කරන්න ඕන. අනුගමනය කරන්න ඕනේ. ඉතින් අල්ලාහ් වෛර කරන්නේ අල්ලාහ්ව විශ්වාස නොකරන ප්‍රතික්ෂේප කරන අන්‍යාගමිකයන්ව. එතකොට මේගොල්ලන්ගේ ඉඛේම අන්‍යාගමිකයන්ට වෛර කරන්න ඒ මනස ක්‍රමානුකූලව ගොඩ නැගෙනවා ටිකෙන් ටික. ඊට පස්සේ මට ඉදිරිපත් කරන්න පුළුවන් මේ නසීම් බෙන් ඊමාන් කියන්නේ ඉරාන ජාතිකයෙක්. මොහු අධ්‍යාපනය ලැබුවායින් පස්සේ මොහුට අවබෝධ වෙනවා මෙයා දැන් පිංතූරයක් අපිට වෙනස් කෝණවලින් බලන්න පුළුවන්. උදාහරණයකට දැන් අපි ප්‍රභාකරන්ව ගත්තොත් අපි ඔහුව දකිනවා මේ ත්‍රස්තවාදියෙක් විදියට. ඔහු මිනී මරන ත්‍රස්තවාදියෙක් විදියට. නමුත් ප්‍රභාකරන්ගේ අනුගාමිකයෝ එහෙම නෙමෙයි දකින්නේ. ඔහු දේවත්වයෙන් වුනත් සලකන්න පුළුවන්. අන්න ඒ වගේ. නමුත් ප්‍රභාකරන්ගේ ම කෙනෙක් ඒ කෝණයෙන් නැතුව අපි බලන කෝණයෙන් බැලුවොත් එතකොට ප්‍රභාකරන් එයා ත්‍රස්තවාදියෙක් කියලා එයාට වුනත් තේරෙනවා. අන්න ඒ වගේ නසීම් බෙම් ඊමාන් මේ ඉස්ලාමය දිහා අපි බලන angel එකෙන් බලනවා.

ප්‍ර : අපි බලන angel එක කියන්නේ කවුරු බලන angel එකද?

පි : ඒ කිව්වේ මුස්ලිම් නොවන අන්‍යාගමිකයෝට ඉස්ලාම් ආගම දිහා බලන විදියට එයා බැලීම කරලා ඒ අනුව එයා අවබෝධ කර ගන්නවා ඉස්ලාමයේ විදිය. එතකොට එයා ප්‍රකාශයක් කරනවා ඉස්ලාමිකයෙක් විදියට එයා ඉස්ලාමය හැර යනවා ඊට පස්සේ. ඉස්ලාමිකයෙක් විදියට මෙන්න මෙහෙම එයා යම් දෙයක් කියනවා මුලින්, ඊට පස්සේ පැහැදිලි කිරීමක් කරලා කියනවා අපිට අවශ්‍ය කොටස මේ, එබැවින් මගේ දැනුම සහ අත්දැකීම් තුළින් මට සහතික කරලා කියන්න පුළුවන් ඉස්ලාමික ඉගැන්වීම්වලට අනුව මුස්ලිම්වරුන් පල්ලිය ඇතුලේ දී කියන දේ හෝ ඔවුන් දොරවල් වසාගෙන ගෙවල් ඇතුලේදී කියන දේ හෝ ඔහු මුස්ලිම් සමාජය තුලදි කියනා දේ සහ ඔවුන් අන්‍යාගමික සමාජයක් ඉදිරියේ පවසන දේ අහසට පොළව මෙන් පරස්පර විරෝධි බව. විටෙකදී මම ඉතාමත් වික්ෂිප්ත වෙනවා අන්‍යාගමික සමාජයේ මිනිස්සුන් විසින් ඉස්ලාමයේ භයානකකම අවබෝධ කර නොගැනීම සහ ඒ පිළිබඳව තේරුම් ගැනීමට ඔවුන්ට විචාර බුද්ධියක් නොමැතිකම ගැන.

ප්‍ර : දැන් මහත්මයා මේක උපුටා ගත්තේ ඔබ කොහෙන්ද?

FAIR COMMENT — BY JEZEEM

පි : මේක උපුටා ගත්තේ ඔහුගේ Video එකක් නිකුත් කරලා තිබුණා අන්තර් ජාලයේ.

ප්‍ර : ඒ පුද්ගලයාගේ නම මොකක්ද?

පි : නසීම් බෙන් ඊමාන්.

ප්‍ර : ඒ නසීම් බෙන් ඊමාන් කියන පුද්ගලයා කවුද?

පි : ඒ එතුමා ඉරාන ජාතිකයෙක්. පසුව මේ ගැන අවබෝධ වුණායින් පස්සේ ඉස්ලාමයේ ඒ නිසරු බව ඉස්ලාමයේ තියෙන භයානකත්වය අවබෝධ කර ගත්තායින් පස්සේ එයා ඉස්ලාමයට එරෙහිව මනුෂ්‍යා වෙනුවෙන් එයා කටයුතු කරනවා. එතකොට එයාව මරන්න එන කොට එයා ජර්මනියට පැනලා යනවා මම හිතන විදියට

ප්‍ර : ඔහු කරපු ප්‍රකාශයක් ආධාරයෙන් තමයි මේ ලේඛනය සකස් වෙලා තියෙන්නේ?

පි : ඔව්. එතකොට ඔහු කියනවා එසේම මම පුදුම වෙනවා අන්ධයින් සේ තමන්ව නොමඟ යැවීමට ඉඩ දී තමන්ගේ විනාශය නොදැක ඒ බව නොදැන සිටින ආකාරය ගැන. ඉස්ලාම් ආගමේ සහ ඉස්ලාම් සමාජය තුල තිබෙන්නාවූ ඉහත ආකාරයේ ප්‍රයෝගකාරී සහ අතිශ්‍ය විනාශකාරී ඉගැන්වීම් සහ ක්‍රියාකාරකම් ආගමක තිබීම ගැන මා හට ඇත්තේ මහත් වූ ප්‍රහේලිකාවකි. ඒවා ආගමකට නොසුදුසු විනාශකාරී ඉගැන්වීම් බවට තේරුම් ගැනීමට මුස්ලිම්වරුන් තුල නැත. ඒවා පිළිබඳ ඔබ ඔවුන්ගෙන් ප්‍රශ්න කලහොත් ඔවුන් කිසි ලෙසකින්වත් එවැනි දේ ඉස්ලාමයේ ඇති බව පිළිගන්නේ ද නැත. ඒ වෙනුවට ඉස්ලාමය යනු සාමය යැයි ඔබට කියනු ඇත. ඒ මගින් ඔවුන් කරන්නේ අන්‍යාගමික සමාජයට සහ එහි දේශපාලකයන්ට නිදිපෙති දීමය. මෙලෙස අපි සැවොම ඉස්ලාම්කරණය ඉදිරියේ නිශ්ශබ්ද වන්නේය. ඉස්ලාමය විසින් ප්‍රදේශයෙන් ප්‍රදේශය සහ අවසානයේ දී මුළු රටම ගිළගන්නා තුරු අප අන්ධයින් සේ තම විනාශය ලඟා වනතුරු මුණිවත රකින්නේය.

ප්‍ර : ඒ කියන්නේ මහත්මයා දැන් මෙකෙන් කියන්නේ ඔය ඉස්ලාම් භක්තිකයින් පල්ලි ඇතුලේදී එකක්, පිටත සමාජයට එකක් ඒ කියන්නේ ඔවුන් එක් එක් ප්‍රතිරූප තමයි එක් එක් ස්ථාන අනුව පෙන්නන්නේ කියලා කිව්වොත් නිවැරදි ද?

පි : පැහැදිලිවම ඔවුන් සතුයි චරිත දෙකක්. ඔවුන් එක් චරිතයක් ඔවුන්ට ජීවත් වෙන්න වෙනවා එක් චරිතයක් තුල ඉස්ලාමය ඇතුලේදී. ඊට පස්සේ අනික් චරිතය ඒගොල්ලොන්ට ජීවත් වෙන්න වෙනවා අපි ඉස්සරහාදි.

ප්‍ර : ඒ කියන්නේ non-Believers ලා ඉදිරියේ?

FAIR COMMENT — BY JEZEEM —

පි : non-Believers ලා ඉදිරියේදි.

ප්‍ර : අපි ඊලඟ එකට යමු.

පි : ඒ මගින් ඔවුන් කරන්නේ මුස්ලිම්වරුන් විසින් තම ඉස්ලාමික අරමුණු න්‍යාගමික දේශයක් තුල ජයග්‍රහණය කර ගන්නා තුරු එනම් රටම ඉස්ලාමය විසින් අත්පත් කර ගන්නා තුරු එම අන්‍යාගමික සමාජයෙන් බලාපොරොත්තු වන්නේ ද එයයි. ඒ කියන්නේ අපි, ඒගොල්ලෝ බලාපොරොත්තු වෙනවා අපි අන්ධයෝ සේ ඒගොල්ලෝ කියන දේ අහගෙන මුණිවත රැකගෙන ඒගොල්ලෝ කරන කියන දේවල් ඉදිරියේ නිශ්ශබ්දව අපි ඉදීයි කියන බලාපොරොත්තුව ඒගොල්ලන්ට තියෙනවා. එතුමා අවසන් කරනවා මේ විදියට, ඉතාම වටිනා ඒ වගේම අපේ රටට මේ තියෙන ප්‍රශ්නයට මෙතුමාගේ වචන ඇත්තෙන්ම හරිම වැදගත් ඔහු මේ විදියට ඉවර කරනවා. ඉවසීම ඉතා වටිනා දෙයකි. එය සමාජයට අවශ්‍ය හොඳ දෙයකි. එහෙත් අප ඉදිරියේම සත්‍ය මුලාවෙන් යටකර පාගා ගෙන අපව විනාශ කිරීම සඳහා අවස්ථාව එනතුරු බලා සිටින ප්‍රෝඩාකාරී ක්‍රියාදාමයක් වෙනුවෙන් සහ අපේම විනාශයේ නාමයෙන් කරන්නා වූ ඉවසීමක් යනු වචනයෙන් විස්තර කල නොහැකි අසාමාන්‍ය මෝඩකමකි. දේශපාලකයන්ට සහ සමස්ථ සමාජය වෙත කරන මගේ ආයාචනය කරුණාකර ඇස් අරින්න කියලා. එතකොට මේක ඇත්ත වශයෙන්ම 100% ක් මට කියන්න පුළුවන් සත්‍ය වචන කියලා. සත්‍යවාදී මනුෂ්‍යයෙක් විසින් කරපු සත්‍ය වචන.

ප්‍ර : ඔබ සත්‍යයි කියලා කියන්නේ ඔබගේ අත්දැකීම් සහ ඔබගේ අධ්‍යයනවලින් අනාවරණය වුණු කරුණු අනුවද?

පි : ඔව්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අජේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : කොහෙන්ද ඔයා මේක ගත්තේ?

ප්‍ර : Madam It was a video clip. මම ඒකෙන් තමයි

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : video clip. තියෙනවද ඔයා ලඟ?

පි : දැන් මට Internet එකේ තියෙනවා. ඒකෙන් තමයි මම note down කර ගත්තේ එයා කියන දේවල්.

ප්‍ර : දැන් ඔබ මේ සලයිඩ් 62 ක් තියෙන Power Point Presentation එකේ 3 වන slide එකේ තියෙන තවත් link එකක් මත click

FAIR COMMENT BY JEZEEM

කලාට පස්සේ තවත් ලේඛනයක් මේ තිරයේ දිස්වෙනවා. මේ ලේඛනය ඔබ කොහෙන්ද ගත්තේ?

පි : මේක ගත්තේ අපේ ලංකාවේ On line Media එකකින්.

ප්‍ර : ඒ ලේඛනය කවුද , ඒ පුද්ගලයා සඳහන් වෙනවද යට?

පි : මම ගරු කොමිෂමට ඉදිරිපත් කරන්නේ අර අපි මේ දැන් කතා කරපු අර්ථයෙන්. මෙතෙක් අපි ඉස්ලාමය සම්බන්ධයෙන් අපි සාකච්ඡා කරපු අර්ථයෙන් බලලා බලන්න මේ අල්මෂුරා ප්‍රකාශය 4 කියලා. ත්‍රස්තවාදය පිළිබඳ ඉස්ලාමික මතය කියන මාතෘකාව යටතේ තාරික් මහමුද් සභාපති ජාතික සූරා සභාව. මෙයා ඉදිරිපත් කරලා තියෙනවා 2015 දී. 2015 දී මේක ඉදිරිපත් කරන්න පාදක වුනේ මේ ISIS

ප්‍ර : පොඩ්ඩක් ඉන්නකෝ, දැන් මේ ප්‍රකාශය ඉදිරිපත් කරපු දවසක් සඳහන් වෙනවද මේ ලේඛනයේ?

පි : ඔව්.

ප්‍ර : කවද්ද ඒ දවස?

පි : 2015 ජූලි මාසේ 01 වෙනිදා.

ප්‍ර : එහි සඳහන් වෙනවා සූරා කවුන්සිල්, සූරා සභාව කියන්නේ මොකක්ද?

පි : ජාතික සූරා සභාව කියන්නෙත් ජමෙතුල් උලමලා වාගේ සංවිධානයක්. එතකොට මේකේ මම ඊලඟ සලයිඩ් 4 දී මම ඉදිරිපත් කරනවා මේ ඉස්ලාමීය ගමන පිළිබඳ සම්පූර්ණ විවරණයක්. අන්න ඒකෙදී මට පුළුවන් සර් පැහැදිලි කරන්න මේගොල්ලොන්ගේ මේ ඒගොල්ලෝ අර මුල් කාලය නිම කෙරුවයින් පස්සේ, මූලික කාලය නිම කෙරුවයින් පස්සේ ඒගොල්ලෝ යම් පරිවර්ථනයකට සමස්ථ මුස්ලිම් සමාජයම යොමු කරනවා. ඒ යොමු කිරීමේදි ඒක කරන්න පුළුවන් Intellectual ලට විතරයි. ඒ සඳහා ඉස්ලාමික සංවිධාන පිහිටුවා ගන්නවා. න්‍යාමනයක් කරන්න. සමස්ථ මුස්ලිම් ප්‍රජාවම නියාමනය කරන්න. ඒගොල්ලොන්ව ඒ මාර්ගයේ ගෙනියන්න. එතකොට ඒ අනුව කරන දෙයක් තමයි ජාතික සූරා සභාව කියන්නේ. සූරා සභාවේ මම ඉතිහාසය ගැන කතා කෙරුවොත් ඒක නබිතුමාගේ කාලේ සූරා සභාවක් කියලා දෙයක් තිබුණේ නැහැ. නමුත් නබිතුමා 632 වසරේදි මැරුණයින් පස්සේ එතන ලොකු ගැටළුකාරී තත්ත්වයක් මතු වුණා. එක එක්කෙනා මරා ගත්තා. ලේ වැගිරීම් වුණා. බල අරගලයක් වුණා. එතනදී ඒගොල්ලෝ අවසානයේදී තීරණය කෙරුවා අපි සූරා සභාවක් පත්කර ගමු පාලකයට උපදෙස් දෙන්න කියලා. ඒ කියන්නේ සමස්ථ මුස්ලිම් ප්‍රජාවම යායුතු මාර්ගය පාලකයා පාලනය කරනවා යා යුතු

මාර්ගය නබිතුමාගේ සහ අල්ලාහ් දෙවියන්ගේ ඉගැන්වීම අනුව කොහොමද මේක ඉස්සරහාට යන්නේ කියන එක නියාමනය කරන්න තමයි මේ සූරා සභාව කියන එකක් මේවා කලේ.

දැන් වේලාව : රාත්‍රී 7.40 යි.
මෙතැන් සිට ල/ලේ :- ඉන්ද්‍රාණි මිය විසින්ය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 7.40 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු සභාපතිතුමා :

ප : ඒ කියන්නේ ඔබ අර ඉස්සරලා පැහැදිලි කරපු කොටියාශ තුන හොඳ මුස්ලිම්වරු, නරක මුස්ලිම්වරු සහ කැත මුස්ලිම්වරුන්ට වැටෙන්නේ නැති ඉස්ලාම් ආගම අදහන කොටියාශයක් ලංකාව තුළ දැනට ඉන්නවා?

පි : නැහැ නැහැ නැහැ. නරක මුස්ලිම්වරු අතර තමයි ඔය සාමාන්‍යයෙන් අපි හොඳ දැන් ඔය මම ඒකයි කිව්වේ නරක මුස්ලිම් කියලා කිව්වට ඒගොල්ලෝ නරකත් නැහැ කියලා. ඒ අය අතරේ තමයි ඔය අපි කියන මනුස්ස වටිනාකම් තියෙන මිනිස්සු ඉන්නේ ඒ අය අතර. හොඳ මුස්ලිම්වරු කියන්න් ජිහාඩිලානේ. ඒගොල්ලොන් ගැන කථා කරන්න දෙයක් නැහැ. නමුත් වැඩි වශයෙන් නරක මුස්ලිම්වරු කියලා මම ප්‍රභේද කරපු අය ඒ කොටසේ තමයි ඔය කියන සාමකාමී කට්ටිය තවම ඉන්නේ. තවම ඉන්නේ. ඉතිං අරගොල්ලෝ දැන් ඒ කෙනෙක් කැත මුස්ලිම් කෙනෙක් වෙන්න නම් ඒකට අර ඒකට Conditions fulfill වෙන්න එපැයි. ඒ කියන්නේ එයා තමන්ට තියෙන තානාන්තරයක්, බලයක් භාවිතා කරලා එයා අපේ සමාජය විනාශ කරන්න හරි, අපිව රවට්ටන්න හරි එහෙම නැත්නම් ඉස්ලාමයේ ගමනට ඉදිරියට ගෙනියන්න උදව් කිරීමක් කරන්න ඕන. ඉතිං ඒ උදව්වම නරක මුස්ලිම් අතරෙත් ඕන තරම් කරනවා ඇති. නමුත් අර තවම සාමකාමියි කියන කට්ටියත් ඉන්නේ අර අය අතරෙම තමයි ඉතුරුවෙලා ඉන්නේ.

ප : හරි මම ඔබට උදාහරණ දෙකක් දෙන්නම්. එතකොට මට මේක පැහැදිලි කර ගැනීමක් සඳහා තමයි මම මේ ප්‍රශ්න අහන්නේ?

පි : ඔව්.

ප : ඉස්ලාම් සමාජය තුළ අන්තවාදයක් තියෙන බවට පළමුවෙන්ම සමාජය තුළින්ම ප්‍රකාශයක් කරන්න යෙදුණේ කවුද කියලා මේ කොමිෂන් සභාවේදී එක්තරා අවස්ථාවක අනාවරණය වෙනවා හිටපු ආණ්ඩුකාර අලෙවි මව්ලානා කියලා?

පි : ඔව්.

ප : ඔහු ඔබ කියන ගණයෙන් මොන ගණයටද වැටෙන්නේ?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අලෙවි මව්ලානා මට දාන්න පුළුවන් අඩු වැඩි වශයෙන් ඒගොල්ලොන්ගේ ක්‍රියාකාරකම් අනුව අඩු වැඩි වශයෙන් තමයි ඒක එතන ඒගොල්ලෝ ස්ථාපිත වෙලා ඉන්නේ. මට දාන්න පුළුවන් අලෙවි මව්ලානත් කැත මුස්ලිම් ගණයටම තමයි.

ප්‍ර : ඒ කියන්නේ ඔහු තුළ කිසිම අන්තවාදී ක්‍රියාදාමයකට සහයෝගයක් දක්වන්නේ නැහැ කියලා උපකල්පනය කරත්, ඔබ දාන්නේ ඔහුව කැත මුස්ලිම් ගණයට?

පි : ඔව්. කැත මුස්ලිම් ගණයට මම දැම්මේ අන්තවාදී ක්‍රියා කරනවා කියන එක නෙමෙයි. ඉස්ලාමයේ ගමනට තල්ලු කරන උපකාර කරන එක. ඒගොල්ලෝ අන්තවාදී ක්‍රියා කරන්නෙත් නැහැ, අන්තවාදියට සහයෝගය දෙන්නෙත් නැහැ. නමුත් ඒගොල්ලෝ අපිට ඒ ඉස්ලාමයේ මේ ගමන දකින්න තියෙන අවස්ථාවල් ඒගොල්ලෝ Block කරනවා. එහෙම ...,

ප්‍ර : ඔහු Block කරනවා නම් ඇයි ඒ විදියට ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරන්නේ?

පි : ඒක තමයි. දැන් මෙහෙමයි ඒගොල්ලෝ ඒකයි මම කිව්වේ අඩු වැඩි වශයෙන් කියලා. දැන් අලෙවි මව්ලානලා අර කොළ පාට කාල පරිච්ඡේදයේ ඒගොල්ලොන්ගේ මුළු ඇත්තම කියනවා නම් එයාගේ මුළු Life එකම කොළ පාට Belt එකේනේ ඒගොල්ලෝ ගත කෙරුවේ. ගත කරලා දැන් ඒගොල්ලෝ ඒක Enjoy කෙරුවා. ඒ කියන්නේ ඒ සාමකාමී මේක Enjoy කෙරුවා. ඉතිං එහෙම කරලා ඒගොල්ලොන්ට දැන් මේක වෙනස් වේගෙන එනකොට ඉතිං ඒගොල්ලොන්ට හිතෙන්න ඇති එහෙම Revelation එකක් කරන්න.

ප්‍ර : මගේ දෙවන උදාහරණය. දැන් සයින්දමර්දු 2019 අප්‍රේල් 26 වෙනිදා සයින්දමර්දු නිවසේදී සිදු වූ බෝම්බ ප්‍රහාරයේදී අප දන්නා තරමින් ඒ නිවෙස් වටේ සිටපු මිනිස්සුන්ගේ සහයෝගය විශාල වශයෙන් ලැබුණා යුධ හමුදාවටත්, පොලීසියටත් ඒ නිවසේ සිටින තැනැත්තන් සම්බන්ධයෙන් තොරතුරු ලබා දීම සම්බන්ධයෙන්?

පි : ඔව්.

ප්‍ර : එම ජන කොට්ඨාශය ඔබගේ වර්ගීකරණයේදී කොයි ගණයටද වැටෙන්නේ?

පි : ඒගොල්ලෝ අනිවාර්යයෙන්ම අර මම Categorize කරපු නරක මුස්ලිම් ගොඩේ ඉන්න අය. නමුත් මම කිව්වනේ නරක වුණාට ඒගොල්ලෝ නරකමත් නැහැයි කියලා. ඉතිං ඒගොල්ලෝ දකින්නේ මේක ප්‍රචණ්ඩත්වයක් විදියට සහ මේක බෝම්බ පුපුරණවා, මේක ත්‍රස්තවාදී ක්‍රියාවක් හැටියට ඒගොල්ලෝ

FAIR COMMENT BY JEZEEM

දකිනවා. මොකද ඒගොල්ලොන්ට මේ ගැන තියෙන අවබෝධය අඩුයි.

ප : මේ කියලා ඔබ අදහස් කරන්නේ කුරානයේ තියෙන ....?

පි : ඔව්. ඔව් සර්. එතකොට ඒගොල්ලොන්ගේ ගමනේදී ඒගොල්ලොන්ගේ වගකීම පිළිබඳව ඒගොල්ලොන්ට අවබෝධයක් නැහැ. ඒක අපිට හොඳයි. නමුත් ඒ අයට මේ කවුරු හරි පෙන්නුම් කෙරුවොත් නැහැ ඔයා කරලා තියෙන්නේ අල්ලාහ් දෙවියන්ගේ ගමනට බාධාවක්. අල්ලාහ් දෙවියෝ කියලා තියෙන නියෝගවලට සම්පූර්ණ පටහැනි ක්‍රියාවක් ඔයා කරලා තියෙන්නේ කියලා අන්න එතකොට එයාට හිතන්න සිද්ධ වෙනවා. දැන් වෙලා තියෙන්නේ ඒගොල්ලොන්ට එච්චර අවබෝධයක් නැහැ. ඒගොල්ලෝ මෙච්චර කල් සාමාන්‍ය විදියට හිටියා. ඒගොල්ලෝ සමහරවිට පල්ලි ගියෙත් නැතුව ඇති. ගියයි කියලා එච්චර Exposure එකක් නැති තත්ත්වයක් තුළ ඒගොල්ලෝ අර ඉස්සරලා හිටිය විදියටම සහ ඒ මානසිකත්වයෙන්ම තමයි මේ දිහා බලන්නේ. ඉතිං බෝම්බ පුපුරණකොට මේගොල්ලොන්ට ඒක නරක දෙයක් විදියට තමයි දකින්න ඇත්තේ ඒ වගේ දෙයක්.

ස්තුතියි.

****

ගරු අදිකාරී මැතිණිය :

ප : සාක්ෂිකරු ඔබ සඳහන් කරපු අර Good, bad, ugly කියන Classifications අතුරෙන් ඔය සමස්ත ලංකා ජමාතේ උලමාවරුන්ගේ සංවිධානය කොයි එකකටද දාන්න පුළුවන්?

පි : අනිවාර්යයෙන්ම කැත මුස්ලිම් ගොඩට. අනිවාර්යයෙන්ම කැත මුස්ලිම් ගොඩට. දැන් තවත් එකක් මම කියපු අර මොහොමඩ් මසී. මගේ යාළුවා. එයාව මට දාන්න පුළුවනුත් අර නරක මුස්ලිම් ගොඩට තමයි. මොකද ඒගොල්ලෝ නොදන්නවා නෙමෙයි අපිට වෙන්න යන දේ. ඒගොල්ලොන්ට නොදන්නවා කියලා අපිට සහතික කරන්න බැහැ. ඒගොල්ලෝ යම් තරමකට ඒගොල්ලොන්ට දැනීමක් හැඟීමක් තියෙනවා මේ ඉස්ලාමික ගමනේ මේ අන්‍යාගමිකයන්ට සිද්ධ වෙන දේවල් ගැන. නමුත් ඒගොල්ලොන්ට ඒක ගැඹුරින්, ඒක හරියට පින්තූරය දකින්න ඒගොල්ලොන්ට අවශ්‍යතාවයක්, උවමනාවක් නැහැ. ඒ හින්දා ඒගොල්ලෝ අර ගමනෙම කොටසක්, ඉස්ලාමයේම කොටසක් විදියට ඒගොල්ලෝ ඉන්නවා. නමුත් ඒගොල්ලෝ ප්‍රචණ්ඩත්වයට නැඹුරුවීමක් වෙලා නැහැ. තව එකක් අපි දන්න කෙනෙක් හිටියා.

FAIR COMMENT BY JEZEEM

මගේ අපේ යටතේ සේවය කරපු සේවකයෙක්. ඒ ළමයා බොහොම හොඳට හිටියා. බොහොම හොඳට ඉඳලා සුබෙයිර් කියලා හිටි ගමන්ම සිරියාවට ගියා. මේ ISIS හරි අල්නුස්රා එකට හරි සම්බන්ධ වුණා. සම්බන්ධ වෙලා Maldivesවලින් කිහිප දෙනෙක් ගිහිල්ලා තිබුණා. ඊට පස්සේ ඒ ළමයව මරලා දාලා තිබුණා. ඒ සංවිධානයක් විසින්ම මරලා දාලා තිබුණා. මරලා දාලා ඒ Photo ත් එවලා තිබුණා. ඉතිං ඒ ළමයා බොහොම අහිංසක කෙනෙක්. බොහොම අහිංසකයි. නමුත් ඉතිං ඒ ළමයව කවුරු හරි මම ආරංචි කරලා බලපු විදියට එහේ එක සංවිධානයක් ඉන්නවලු ඒගොල්ලෝ ළමයින්ව එහෙම Select කරලා ඒගොල්ලොන්ට Brain Wash කරනවා. ඒගොල්ලොන්ට මේවා කියලා දෙනවා. දැන් අපි මෙච්චර කල් මේ බලලා තියෙන්නේ මේ ටික විතරයි. ඇත්ත වශයෙන්ම අල්ලාහ් දෙවියෝ කියලා තියෙන්නේ මෙන්න මේවත් කියලා තියෙනවා. මේ තමයි නියම ඉස්ලාමික ඉගැන්වීම් කියලා. මරාගෙන මැරුණොත් තමයි ස්වර්ගයට යන්න පාර තියෙන්නේ කියලා. එතකොට ඒ ළමයා එහෙම Brain Wash වෙලා තියෙනවා.

****

රජයේ අධිනීතීඥ චතුරංග බණ්ඩාර මහතා :

ප : දැන් ඔබ සඳහන් කරන විදියට මේ මරාගෙන මැරෙන කට්ටියට Brain Wash කරන්න අර වහාබ්වාදී ග්‍රන්ථයක් වන ඔය කිතාබොත් තවුහිද් එවැනි ග්‍රන්ථ පාවිච්චි කිරීමක් සිද්ධ වෙනවද නැත්නම් මේ කුරාන වැකිමද පෙන්වමින් මේ Brain Wash කිරීම සිද්ධ කරන්නේ?

පි : මගේ කියවීමට අනුව මේ වහාබ්වාදයක් කියලා දෙයක් මම දකින්නේ නැහැ. වහාබ්වාදයක් කියලා දෙයක් නැහැ. එය අබ්දල් වහාබ් කියලා කියන්නේ ඒ ඉස්ලාමයේ මේ අර රතුපාට Belt එකට සීමා වෙච්ච පුද්ගලයෙක්. ඒ කියන්නේ තනිකරම අන්‍යාගමිකවම මරන්නම ඒ විනාශකාරී ඉගැන්වීම පමණක් තමන් පරිහරණය කරන කෙනෙක් හැටියට තමයි මම දකින්නේ. එතකොට ඔබතුමා කිව්වා වගේ ඒ පොතේ තියෙන්න විදිහක් නැහැනේ 2 වන සුරාවේ 256 වෙනි වගන්තිය අනිවාර්යයෙන්ම ඒකේ තියෙන්න විදිහක් නැහැ. 2 වන සුරාවේ 256 වන වගන්තියෙන් කියනවා ඉස්ලාමයේ ආගම්වලට අනිවාර්ය කිරීමක් නැත කියලා. එහෙම දේවල් එයාගේ නැහැ. ඒ කියන්නේ අර කොළ පාට කොටසේ ඉගැන්වීම් එයා උගන්වන්නේ නැහැ. ඒ හින්දා ඒ පොතේ අනිවාර්යයෙන්ම

FAIR COMMENT — BY JEZEEM

තියෙන්න ඕන රතු පාට Belt එකේ ඉගැන්වීම් සහ දුඹුරු පාට Belt එකේ ඉගැන්වීම්. ඒ අනුව ඔව්. ඒක සම්පූර්ණයෙන්ම තියෙන්නේ ඒවා නම් ඒවා කියෙව්වහම Yes ඒ අයව Brain Wash වෙනවා.

ප්‍ර : හැබැයි ඔහුත් මේ පාවිච්චි කරන්නේ කුරානයේ තියෙනම වැකි කිව්වොත් නිවැරදිද?

පි : හරියටම හරි. නමුත් කුරානයේ තියෙනම වැකි. මේකේ වෙනස තියෙන්නේ කුරානයේ ඔක්කොම කවලම් වෙලා තියෙනවා. සාමකාමී ඒවා තියෙනවා, නරක ඒවා තියෙනවා. නමුත් අල් අබ්දුල් වහාබ්ගේ පොත්වල අර සාමකාමී වදන් නැහැ. ඒවා Filter වෙලා අරවා විතරක් තියෙනවා.

ප්‍ර : ඔබගේ ඊළඟ Slide එක Power Point Presentation එකේ 7 වන Slide එකේ ඔබ සඳහන් කරනවා ඉස්ලාමික ජිහාඩීන් සහ මුස්ලිම් අන්තවාදීන් විසින් ඉස්ලාමය වැරදි ලෙස වටහාගෙන ඇත කියලා ප්‍රශ්නාර්ථ ලකුණු කිහිපයකුත් දාලා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : මෙයින් මොකද්ද ඔබ අදහස් කරන්නේ?

පි : මම මේකෙන් අදහස් කෙරුවේ මේ මුස්ලිම් විද්වතුන් ජමෙයිතුල් උලමලා සහ ඒ මඟ යන අනිත් අය සාමාන්‍යයෙන් මුස්ලිම් සමාජයේ නායකයෝ ඒ හැම කෙනෙක්ම අපි ඉස්සරහාදි කියනවා ඉස්ලාමික ජිහාඩියෝ එහෙම නැත්නම් ත්‍රස්තවාදියෝ ඒගොල්ලෝ ඉස්ලාමය වැරදි විදියට වටහාගෙනයි අපි අර මුලින්ම අපි අහපු ඒ Video Clip එකෙත් ඒ මවුලවීතුමා එහෙම කිව්වා. ඉතිං මේක ඇත්තද කියන එකයි මම මේ මට ඉදිරිපත් කරන්න ඕන, මේක පට්ටපල් බොරුවක්. ත්‍රස්තවාදීන් කියන්නේ, ජිහාඩීන් කියන්නේ මද්‍රසාවල හොඳට ඉගෙන ගත්තු කට්ටිය. හොඳට ඒ කියන්නේ ගැඹුරින්ම ආගම පරිශීලනය කරපු කට්ටිය.

ප්‍ර : ඒ කියන්නේ ආගමට දක්ෂම කට්ටිය?

පි : ආගමට දක්ෂම කට්ටිය. හොඳ මුස්ලිම්වරු. Pious එතකොට ඒගොල්ලොන්ට වරදින්න විදිහක් නැහැ, වැරදුණෙත් නැහැ. ඒගොල්ලොන්ට වරදින්න නම් ඒගොල්ලෝ කරපු දේ වැරදි නම් මේ ජමෙයිතුල් උලමලා පිළිගන්න ඕන නබිතුමා කරපු දේත් වැරදියි කියලා. නබිතුමාට පුළුවන් වුණා නම් ඒ අහළ පහළ ඔක්කොම ගම්වල මිනිස්සුන්ව කැති ගහන්න, මරන්න ජිහාඩ් ජිහාඩ් කිය කිය එතකොට මේ සහරාන් ඒක කෙරුවහම වැරදියි කියනවා නම් ඒ කටින් කියන්න ඕන ඔව් අපේ නබිතුමා ඉස්ලාමය වැරදියට වටහාගෙන තියෙනවයි කියලා.

****

FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

ප : සාක්ෂිකරු මේ Madeena Chart එක කියන්නේ මොකද්ද?

පි : Madeena Chart එකද.

ප : Madeena Chart එක කියන්නේ?

පි : Madeena Charter කියන්නේ සර් දැන් ඒක අර කොටස් දෙකකට බෙදලා තියෙනවනේ. එතකොට පැහැදිලි වෙනස්කම් තියෙනවා, පැහැදිලි වෙනසක් තියෙනවා Madeenion Teachings and Makkan Teachings. එතකොට එයාගේ ඒ Madeena වලදී කරපු ක්‍රියාන්විතයයි, මේ Makkaවල කරපු ක්‍රියාන්විතයයි අහස පොළොව වගේ වෙනස් අන්ත දෙකක්. එතකොට ඕකෙන් අදහස් කරන්නේ ඒ Madeenion කාලයේ ඒ ක්‍රියාන්විතය.

ප : නමුත් මේ Madeena Chart එකේ ප්‍රකාශිතවම තියෙනවා නේද ප්‍රජාතන්ත්‍රවාදය තියෙන්න ඕන. අන්‍යාගමිකයින්ට නිදහසේ ඒ රටේ ජීවත් වෙන්න පුළුවන් ආදී කරුණු Madeena Chart එකේ තියෙනවා නේද?

පි : මොහොමඩ් නබිතුමාගේ. නැහැ ස්වාමීනි.

ප : ඔබ Madeena Chart එක මේ ..?

පි : Madeena Charter කියලා මම දෙයක් ඇත්තටම දැකලා නැහැ. නමුත් Madeenion Teachings මම පරිශීලනය කරලා තියෙනවා. එතකොට 2 වෙනි සූරාවේ 256 වෙනි වගන්තියද දන්නේ නැහැ ඔය කියන්නේ. ඒක ඇත්ත වශයෙන්ම ප්‍රකාශයට පත් කෙරුවේ Madeenaවලට ගියායින් පස්සේ. නමුත් ඒ ගිය අළුතම. ඒක බොහොම සාමකාමී ප්‍රජාතන්ත්‍රවාදී වගේ ඉගැන්වීමක්. නමුත් ඒක ඒ හින්දම ඒක නිකම් සළකන්න පුළුවන් මක්කානු කාලයේ ඉගැන්වීමක් කියලා. ඉතිං එතන නම් කියනවා අර ආගම්වලට අනිවාර්ය කිරීමක් නැත කියන සංකල්පය එතන දීලා තියෙනවා. නමුත් ඒකේ අපි හිතන විදියේ දෙයක් නෙමෙයි එතන තියෙන්නේ. ඒ කියන්නේ සංදර්භය ගත්තහම ඒක බොරුවක්. මම ඒක පැහැදිලි කරන්නම් එතනට ආවහම.

ප : Madeena Chart එක ගැන ඔබ ...?

පි : මම එහෙමනම් සර් ඇත්ත වශයෙන්ම මම Madeena Charter කියලා දෙයක් මම දන්නේ නැහැ.

ප : Madeena Declaration එක?

පි : Madeenion Declaration කියලා ...,

ප : හරි කමක් නැහැ.

****

FAIR COMMENT — BY JEZEEM

රජයේ අධිනීතීඥ චතුරංග බණ්ඩාර මහතා :

ප්‍ර : ඔබ දැන් මේ මුලින්ම සඳහන් කරපු මුස්ලිම් අන්තවාදීන් සහ ඉස්ලාමය වැරදි ලෙස වටහාගෙන ඇත කියන කාරණයේදී ඔබ පැහැදිලි කරන්නට Link දෙකක් දක්වලා තියෙනවා?

පි : ඔව්. මේ තස්ලිමා නස්රින් මෙයා ..,

ප්‍ර : පළවෙනි Link එක Click කරයින් පස්සේ මේ කාගේ වැකියක්ද මේ ඔබට පෙන්වන්නේ?

පි : මේ තස්ලිමා නස්රින් බංගලා දේශයේ ....,

ප්‍ර : තස්ලිමා නස්රින් කියන්නේ කවුද?

පි : එයා ඇවිල්ලා බංගලා දේශයේ කලින් මුස්ලිම් කෙනෙක්. පස්සේ එයා ඉස්ලාම් ආගමේ තියෙන අර නසීන් බෙන් ඊමාන් වාගේම ඒක අවබෝධ කරගෙන ඒ තියෙන ඒකේ තියෙන දුර්ගුණවලට එරෙහිව හඬ නගපු කෙනෙක්. මනුෂ්‍යත්වයේ නාමයෙන් ලෝකයට සාමය ගේන්න ඕනෙයි කියන එක සහ ඉස්ලාමයේ මේක මේ තියෙන භයානකත්වය Expose කරන්න ඕනෙයි කියන චේතනාවෙන් තමයි මෙයා කටයුතු කරන්නේ. එයා කියනවා Terrorist are not misinterpreting Quran it's clearly written in Quran that non Muslims must be killed. Secularities who defend Islam have never studied Quran. නැත්නම් Islam is the root cause of terrorism කියන එක. මේ කථාව හරි.

ප්‍ර : ඊළඟ Link එක අපි Click කරමු. (වාදනය වේ)

පි : ඉස්සරලා ඒක යැව්වද නැද්ද දන්නේ නැහැ. එයා කියන්නේ ISIS එකට විරුද්ධව ප්‍රකාශනයක් යවන්න ඉස්සරලා කියන එක. එතනින් එයා යවනවා කියන්නේ නැහැ. එහෙම තමයි අල්ටකියා ඒගොල්ලෝ භාවිතයේ යෙදෙන්නේ. (වාදනය වේ) කියලා අපිට කියන්නේ. (වාදනය වේ) දැන් මේ මවුලවී එකේ ඒ ප්‍රකාශයන් සහ ඒ ස්වභාවය ඔබතුමන්ලට හොඳට ඔළුවට අවධාරණය වෙන්න ඇති කියලා මම හිතනවා. අපිට ඉස්සරහාදී හෙළි වේවි මේ මවුලවී කොයි තරම් සාවද්‍ය විදියට හිතාමතාම මේ දේවල් බොරු කරනවද කියලා තමන්ගෙම ආගම අපි ඉදිරියේදී වහලා, ඒකේ සත්‍යය ස්වභාවය වහලා අපි ඉදිරියේ මේ කියන කතන්දර කොයි තරම් සුක්ෂමව, කොයි තරම් සාවද්‍ය විදියට ඒගොල්ලෝ කථා කරනවද කියලා අපිට ඉස්සරහාදි බලන්න පුළුවන්. තව එකක් ඊළඟට සිංහල ජනයා ඇතුළු අන්‍යාගාමිකයන් විසින් ඉස්ලාමය වැරදි ලෙස වටහාගෙන ඇත. ඒකත් මේ මුස්ලිම් අයම කියන කතන්දරයක්. ඒගොල්ලෝ කියනවා ඉස්ලාමික ජිහාඩීන් සහ මුස්ලිම් අන්තවාදින් ඉස්ලාමික ඉගැන්වීම් වැරදි ලෙස

FAIR COMMENT BY JEZEEM

වටහාගෙන ඇත කියලා, ඒ එක පැත්තක්. ඒ ඉස්ලාමයේ එතනින් එගොල්ලොන්ගේ අරමුණ ඉස්ලාමය ලිහිල් කරන්න. අරගොල්ලෝ වැරදි ලෙස වටහාගෙන කියලා. එතකොට සිංහල අයට කියනවා සිංහල ජනයත් ඇතුළු අන්‍යාගමිකයන් විසින් ඉස්ලාමය වැරදි ලෙස වටහාගෙන ඇත. මේ තව පැත්තක් කථා කරන්නේ. ඒ කියන්නේ අපි ඉස්ලාමයේ මේ දේවල් මේ භයානක ඉගැන්වීම් තියෙනවා කියන දේ අපිට ඔළුවට එන්න හදනකොට අපි ඒ ගැන ප්‍රශ්න කරනකොට මේගොල්ලෝ ඒකත් වැරදියි කියනවා. එතකොට මේගොල්ලෝ දෙපැත්තකින් අපිට රැවටීමක් මේ කරන්නේ. ඇත්ත වශයෙන්ම සිංහල ජනයා නමුත් මට කියන්න පුළුවන් දැන් ඒගොල්ලෝ බලන්නේ එක පැත්තක්. මමත් දකිනවා. මමත් කියනවා ඇත්ත සිංහල ජනයා ඇතුළු අන්‍යාගමිකයන් විසින් ඉස්ලාමය වැරදි ලෙස තමයි වටහාගෙන තියෙන්නේ. ඒ මමදකින පැත්තෙදි මම දකින්නේ මෙහෙමයි සිංහලයා ඇතුළු අන්‍යාගාමිකයෝ සියයට අනූ පහක් ඉස්ලාමයේ මේ භයානක දේවල් තියෙනවා කියලා දන්නේ නැහැ. ඒගොල්ලෝ හිතාගෙන ඉන්නවා ඉස්ලාමය බොහොම සාමකාමියි. මේ ඉස්ලාමයේ මේ අන්තවාදී කටයුතු කරන්නේ බොහොම සුළු පිරිසක්. ඒකත් ඉස්ලාමික් ඉගැන්වීම්වලට විරුද්ධව කරන දෙයක් කියලා අපේ සියයට අනූ පහක් දෙනා හිතාගෙන ඉන්නවා. අන්න ඒක අපි ඉස්ලාමය වැරදි ලෙස වටහාගෙන ඇත කියලා මට කියන්න පුළුවන්.

ප : අපි 8 වන Slide එකට යමු?

පි : අපි ඔන්න දැන් එනවා...,

ප : මෙහිදී ඔබ සඳහන් කරනවා ඉස්ලාමයේ පළමු කොටසට අයත් ඉගැන්වීම් සහ මුස්ලිම්වරුන්ගේ ස්වභාවය කියලා. මේ පළමු කොටස විදියට ඔබ අදහස් කරලා තියෙන්නේ මොකද්ද?

පි : පළමු කොටස විදියට මම අදහස් කරලා තියෙන්නේ මේගොල්ලොන්ට මම මුලින්ම කිව්වා මේගොල්ලෝ අර කොළ පාට පරිච්ඡේදයේ ඉන්නකොට ඉස්ලාමයේ තියෙන සාමකාමී ඉගැන්වීම් පමණක් පරිශීලනය කරගෙන ඒවා Practice කරගෙන ඒ මතින් ඒගොල්ලෝ ප්‍රසාරණයට මඟ පාදා ගැනීමක් කරනවායි කියලා. ඒ අනුව ...,

ප : ඔබ මෙහිදී දැන් මේ සඳහන් කරලා තියෙන්නේ කුරානයේ දැක්වෙන ඔවුන් පළවෙනි කාල පරිච්ඡේදයේදී භාවිතා කරන සාමකාමී ඉගැන්වීම් දැක්වෙන කුරාන පාඨ කිව්වොත් නිවැරදිද?

පි : බොහොම හරි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : ඒ අනුව සරළව අපට කියන්නකෝ වැඩි වෙලාව ගන්නේ නැතුව?

පි : ඔව්. ඒ අනුව කුරානයේ 2 වන සූරාවේ 256 වෙනි වගන්තියෙන් කියනවා ආගම සඳහා අනිවාර්යය කිරීමක් නැත. මේකේ ටිකක් දිගට තියෙනවා. නමුත් මම අවශ්‍ය කොටස විතරක් ගත්තා. මොකද ඒගොල්ලොත් ඕකම තමයි අපි ඉස්සරහා උරව්වි කරන්නේ ආගම් සඳහා අනිවාර්යය කිරීමක් නැත කියලා. මේක ඇත්ත වශයෙන්ම කුරානයේ තියෙනවා. කුරානයේ තියෙනවා, 2 වන සූරාවේ 256 වෙනි වගන්තියේ තියෙනවා. නමුත් මේකේ සංදර්භය ගත්තොත් මේගොල්ලෝ මේ කියන මේගොල්ලෝ මේ අපට ඉදිරිපත් කරන අර්ථය නෙමෙයි ඒ සංදර්භයේ තියෙන්නේ නබිතුමාගේ කාලයේදී. මේකේ අපිට සංදර්භය මොකද්ද කියන එක අපිට කාලය යන හින්දා එහෙම යන එක එච්චර ගැඹුරට යන එක වැඩක් නැහැ. නමුත් මේකේ මට පැහැදිලිවම සහතික කරලා කියන්න පුළුවන් මේ ඒගොල්ලෝ අපිට පෙන්වන්න හදන්නේ ඉස්ලාමයේ ආගම සඳහා අනිවාර්යය කිරීමක් නැත ඒ තරමට අපි Democratic මේ Structure එකක් තමයි ඉස්ලාමයේ තියෙන්නේ කියලා මේ නමුත් ඒක එහෙම නෙමෙයි. ඒක යම් අවස්ථාවක නබිතුමාට කරකියා ගන්න දෙයක් නැතිම තැන නබිතුමා කියපු දෙයක් මේක. එතකොට කුරානයේ 109 යි 6 වෙනි වගන්තියේ තියෙනවා To you be your religion and to me my religion. එතකොට මේකෙදි අපි (වාදනය වේ) ඔන්න ඕක තමයි එයා කියන්නේ 109, 6 වෙනි වගන්තිය. මොකද්ද මේ ඔබට ඔබේ ආගමේ, මට මගේ ආගමේ කියන එකේ බොහොම සාමකාමියි. දැක්කහම අපි කවුරුත් කැමති වෙනවා. එතකොට මේ අනුව අපේ සමාජය පෙළඹෙනවා ආ එහෙනම් මේ ඉස්ලාම් ආගම අවුලක් නැහැනේ. ඒ හින්දම සහරාන්ලා එහෙනම් අනිවාර්යයෙන් ඉස්ලාම් ඉගැන්වීම්වලට පටහැනිව තමයි ක්‍රියාත්මක වෙන්නේ කියලා. නමුත් මේකේ තියෙන සංදර්භය මොකද්ද. මේගොල්ලෝ පෙන්වන දේ නෙමෙයි. මේකේ සංදර්භය මම කියලා යන්නම්, ඒක බොහොම කෙටියෙන්. මෙහෙමයි නබිතුමා, මෙතන තියෙනවා සංදර්භය...,

ප්‍ර : ඔබ දැන් ඔය දක්වන ලේඛනය කොහෙන්ද ලබා ගත්තේ?

පි : මේක මම ලබා ගත්තේ නබිතුමාගේ චරිතාපදානය එහෙම නැත්නම් The life of Mohomed.

ප්‍ර : ඒක කවුරු විසින් ලියන ලද්දක්ද?

පි : ඒක ඉබන් ඉෂාක්. ඒක Famous. මේක සුන්නා. මේකේ තමයි මේ ග්‍රන්ථය කුරානය තරම්ම නැති වුණත් කුරානයට පස්සේ ආගමික

FAIR COMMENT BY JEZEEM

ග්‍රන්ථයක් ලෙස මුස්ලිම්වරු පරිශීලනය කරන්නේ මේ ග්‍රන්ථය සූරා මොනවද සීරා කියලා කියන්නේ සීරා. ඒ කියන්නේ The life of Mohomed.

ප්‍ර : එහි මොකද්ද දැක්වෙන්නේ?

පි : මේකේ එක්තරා අවස්ථාවක මේකේ අර 109 වෙනි සූරාවේ 6 වෙනි වගන්තියේ සංදර්භය තමයි මේකෙන් එළියට පනින්නේ. එක්තරා අවස්ථාවක එතකොට ඒක මක්කානු කාල පරිච්ඡේදයේ මට මතක විදියට 619 වසරේදී. කබාව තුළ නබිතුමාට නබිතුමාගේ ආගම අදහන්න අවසර දීලා තිබුණා. ඉඩ දීලා තිබුණා. නිදහස දීලා තිබුණා. අපේ සමාජයේ මුස්ලිම්වරුන්ට අපි ඒ ආගමික නිදහස දීලා තියෙනවා වගේ. එකම කබාවේ දෙවියෝ කිහිප දෙනෙක් ගොඩක් දෙවියෝ ඉඳලා තියෙනවා. ඒ හින්දා නබිතුමත් ගිහිල්ලා කබාවේ යාඥා කරනවා. එතකොට මක්කානු අයත් ගිහිල්ලා යාඥා කරනවා ඒගොල්ලොන්ගේ දෙවියෝ. එතකොට Their met the apostil as he was going round to the kabha so I have been told ඉබන් ඉෂාක් කියනවා So I have been told Allaswad deen අපි ඒ නම් ටික අයින් කරමු. Men of reputation among their people මේගොල්ලෝ මේ වැදගත් ප්‍රභූ කට්ටියක්. වැදගත් හොඳ Reputation එකක් තියෙන මක්කානු පිරිසක්. ඒගොල්ලෝ මොහොමඩ් ළඟට එනවා නබිතුමා ළඟට ඇවිල්ලා නබිතුමාව ආමන්ත්‍රණය කරනවා. They said, Mohommad come let us worship what you worship, and you worship what we worship, you and we will combined in the matter. If what you worship is better than what we worship, We will take the share of it. And if what we worship is better than what you worship you can take a share of that. So god revealed. එතකොට මේ මක්කානු පිරිස ගිහිල්ලා ඒ විදියට ආරාධනාවක් කරනවා මේක ඇවිල්ලා ඔබතුමාලට ඒක පැහැදිලිව තේරුම් යන විදියට බොහොම සාමකාමී ආමන්ත්‍රණයක්. මේ ගැටුම්කාරී 2619 වෙනකොට මේ ගැටුම්කාරී තත්ත්වයට ඒගොල්ලෝ මුහුණ දීලා තිබුණා. එතකොට ඒක සමනය කර ගන්න යෝජනාවක් තමයි මේ කෙරුවේ. කොච්චර හොඳද. ඒ නබිතුමා ඒක Accept කළානම්. නබිතුමාත් එක්ක ඒගොල්ලෝ නබිතුමාගේ දෙවියන්ව අදහනවා. නබිතුමා ඒගොල්ලොන්ගේ දෙවියන් එකට අදහනවා. එතකොට මොකද්ද මේ නබිතුමා ඒකට දෙන උත්තරය. ටක් ගාලා කියනවා

FAIR COMMENT — BY JEZEEM

නැහැ නැහැ මට දෙවියෝ පෙනී ඉඳලා මට ඕකට උත්තරය දුන්නා. මෙන්න මෙහෙම The god reveal concerning that say or disbelievers I do not worship what you worship and you do not worship what I worship and I do not worship what you worship and you do not worship what I worship you have your religion and I have mine කියලා. ඔන්න ඕකයි සංදර්භය. එතන එයා කෙරුවේ ඒ සංහිදියාත්මක යෝජනාව ප්‍රතික්ෂේප කරපු එක. එයා එහෙම හරි කිව්වේ එහෙම හරි ඒ මට්ටමින් සාමකාමීව කිව්වේ මොකද එයා එතකොටත් හිටියේ මක්කාවේ අරගොල්ලොන්ගේ මක්කානුවන්ගේ බලය යටතේ. ඒ හින්දා මෙයා අර කරපු සාමකාමී යෝජනාව ප්‍රතික්ෂේප කරපු එකයි මෙයා කෙරුවේ Your religion is for you and my religion is for me කියන එක. නමුත් ඒක ඒ සංදර්භය වහලා, ඒ ඇත්ත සත්‍යය දේ වහලා අපි ඉස්සරහා මේ මුස්ලිම්වරු උරච්චි කරනවා මේ අපේ ඉස්ලාම් ආගමේ කියන්නේ ඔබට ඔබේ ආගමේ මට මගේ ආගමේ කියලා කොයි තරම් සාමකාමී Message එකක්ද කියලා ඒගොල්ලෝ කියනවා. ඒක අර Twist කරලා Twist කරලා ඒගොල්ලොන්ගේ වාසියට පාවිච්චි කරනවා.

ප්‍ර : අපි ඊළඟ?

පි : Shall I.

ප්‍ර : Yes. ඔබ ඒ අනුව තවත් පළමු කොටසට අයත් තවත් කුරාන පාඨයක් උපුටා දක්වලා තියෙනවා මේ 9 වන Slide එකේ?

පි : ඔව්. මේක මම දැන් මෙතෙක් මේ කුරාන වැකි මම ඒ විදියටම ගෙනාවා. ඒ විදියටම ඒ කුරානයේ තියෙන විදියටම වචනයක්වත් වෙනස් නොකර මම ගෙනාවා. නමුත් මේ 3 වන සුරාවේ 28 වෙනි වගන්තියේදී මට එහෙම කරන්න බැහැ.

ප්‍ර : ඇයි ඒ?

පි : ඒක ඒ වගන්තියේ අන්තර්ගතය සහ ඒ වගන්තියෙන් ඇත්ත වශයෙන්ම ඒගොල්ලොන්ගේ ඒ ගමනේදී ඒ වගන්තිය තුළ තියෙන අන්තර්ගතය විසින් කියන දේ ඒ කියන වචනවල විතරක් නෙමෙයි ගැඹි වෙලා තියෙන්නේ. ඒ හින්දා ඒකට මම අර අර්ථ විග්‍රහයක් වගේ දෙයක් කරන්න වෙලා තියෙනවා. ඒ හින්දා මේක අර වචනයෙන් වචනයට මම කරපු Translation එකක් නෙමෙයි.

ප්‍ර : එහි අදහස ඔබ අරගෙන අදහස මේකේ කිව්වා කිව්වොත් නිවැරදියි?

පි : ඔව්. හරි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ අනුව එහි මොකද්ද දැක්වෙන්නේ?

පි : කුරානයේ 03-28. මේකෙන් කියන්නේ මෙම නියෝගය මුස්ලිම්වරුන්ට අණකර ඇත්තේ ඔවුන් විසින් මුස්ලිම්වරුන්ම හැර කිසිදු අන්‍යාගමිකයෙකු මිත්‍රයින්, විශ්වාසවන්තයින්, කිට්ටුවන්තයින් ලෙස තබා නොගත යුතු බවත්, එම ක්‍රියාව අල්ලාහ්ගේ කෝපය හා ඔහුගේ දරුණු දඩුවම් ලැබිය හැකි වරදක් බවත්, එසේ නමුත් මෙන්න මෙතන අපිට තියෙන ප්‍රශ්නය එසේ නමුත් ඔවුන් වෙසෙන්නේ බහුතර අන්‍යාගමික ප්‍රදේශයක සුළුතරයක් ලෙසින් හෝ අන්‍යාගමිකයන්ගේ බලය ඉදිරියේ මුස්ලිම්වරුන්ගේ බලය දුර්වල අවස්ථාවකදී නම් හෝ එවැනි කාල පරිච්ඡේදයකදී නම් පමණක් එවැනි ප්‍රදේශයක හෝ එකී කාලයක ජීවත්වන මුස්ලිම්වරුන්ගේ සහ ඉස්ලාමය ආරක්ෂාව වෙනුවෙන් යොදා ගන්නා උපාය මාර්ගික ක්‍රමවේදයක් ලෙසින් අන්‍යාගමිකයන් ඉදිරියේ කිසිසේත්ම තම හදවතින් නොවන මතුපිටින් පමණක් පෙන්වන්නා වූ මිත්‍රත්වයක් පෙන්වා රවටා මුළාකොට ඉස්ලාමයේ ජයග්‍රහණය වෙනුවෙන් ඉදිරියට යන ලෙසයි. එතකොට මේක හරි Crucial ඉගැන්වීමක්.

ප්‍ර : ඉතාමක් වැදගත් එකක්?

පි : වැදගත් එකක්. මෙන්න මේකෙන් තමයි මේගොල්ලෝ Survive වුණේ මෙච්චර කාලයක් අපේ සමාජයේ ඉදිරියේ ඒගොල්ලෝ අපිත් එක්ක හරි හොඳට හිනහ වුණා මෙච්චර කල් හොඳට හිනහ වුණා. ඒ තමන්ගේ හදවතින් නෙමෙයි මතුපිටින් Outwardly. අපි බලමු මම ඒක මම අරෙහෙම කරපු නිසා ...,

ප්‍ර : ඔබ කියන්නේ ඒ එසේ ඔවුන් මතුපිටින් හිනහ වෙවී හිටියේ මෙම භූමි භාගයේ ඔවුන් සුළුතරයක් වශයෙන් ජීවත් වන නිසාද?

පි : නිසා සහ ඒ හරහා ඒගොල්ලොන්ට ප්‍රසාරණය වීමට ඒ ඉස්ලාමික ගමනේ අත්‍යවශ්‍ය කාරණයක් තමයි ප්‍රසාරණය වෙන එක. අන්න ඒ ප්‍රසාරණයට මඟ පාදා ගැනීමේ පදනම තියෙන්නේ මේ තත්ත්වය තුළින්. ඉතිං මම මෙහෙම මගේ වචන දාලානේ මේකේ තියෙන්නේ. අනිත් ඒවා ඔක්කොම කුරානයේ වචනනේ.

ප්‍ර : ඔවුන්ගේ කුරානයේ Original මූලධර්ම නැත්නම් මුල් ඉගැන්වීම් අනුව පැහැදිලියි අන්‍යාගමිකයන් තමන්ගේ මිත්‍රයන් ලෙස තියා ගැනීම තහනම්?

පි : තහනම් කියලා. ඒක ඇවිල්ලා මූලධර්මයක්. එතකොට මම මේකේ ගේනවා මේ Source එක. මේක ඇවිල්ලා තස්සීර් කියන්නේ අර්ථ විග්‍රහය තස්සීර්. එතකොට ඉබන් කාතීර්ගේ අර්ථ විග්‍රහය මම ගේනවා. ඉබන් කාතීර්ගේ අර්ථ විග්‍රහය තමයි එයා

FAIR COMMENT BY JEZEEM

කුරානයේ හැම වැකියකටම ඒ අර්ථ විග්‍රහය දීලා තියෙනවා. එතකොට එයා ඒ සංදර්භයන්, එයා ඒවායේ අර්ථයන් නිසිලෙස ඒක ලියවිලා තියෙනවා. එයාගේ මේකම තමයි සෑම මුස්ලිම්වරයෙක්ම, සෑම මද්‍රසා එහෙකම හෝ පාසලක මේ ඉස්ලාමයේ උගන්වනකොට භාවිතා කරන්නේ. එතකොට එයාගේ මේ Verse එක 03 යි 28 ට අර උඩින්ම තියෙන්නේ Verse එක As It is හොදේ. ඒකේ තස්සීර්වයි, අර්ථ විග්‍රහය ඉබන් කාතීර් දීලා තියෙනවා මෙහෙම The prohibition of supporting the disbelievers Allah prohibited his believing servants from becoming supporters of the disbelievers or to take them as comrade, with whom they developed friendships, rather than the believers. Allah warned against such behavior when he said and who ever does that will never helped by Allah anyway meaning who ever commits that at that Allah has prohibited then Allah will discard him similarly Allah said, or you who believe take not my enemies and your enemies as friends, showing affection towards them until and who ever of you does that then indeed he has gone astray from the straight path. ඊට පස්සේ කියනවා මෙන්න මෙතන. මෙන්න මේ රතු පාටින් තියෙන ටික Allah said next unless you indeed fear a danger from them meaning except those believers who in some areas or times fear for their safety from the disbelivers in this case such believers are allowed to show friendship to the disbelivers outwardly. But never inwardly for a instance Al Bhuhari recorded that Abu Ad Dardha said, we smile in the face of some people although our hearts close them. Al Buhari said that Al Hazen said that takiya is allowed until the day of resurrection Allah said. බලන්න මේ තමයි ඒකේ අර්ථ විග්‍රහය.

ප : දැන් අර්ථ විග්‍රහයෙන් දැක්වෙන දේ සරළව සිංහලෙන් වාක්‍යය දෙකකින් කියන්නකෝ මේ Record එකට යන්න?

පි : මේකෙන් කියන්නේ මුස්ලිම්වරුන්ට ඔවුන් සුළුතරයක් ලෙස බලයෙන් අඩු සුළුතරයක් ලෙස ඉන්න ප්‍රදේශයක හෝ ඉන්න කාල පරිච්ඡේදයකදී ඔවුන්ගේ ආරක්ෂාව පිණිස මොකද එහෙම නැති වුණොත් එහෙම ඔවුන්ව ප්‍රතික්ෂේප කරන්න පුළුවන් අන්‍යාගාමිකයෝ. ඒ හින්දා ඔවුන් ඒ මොකද ප්‍රතික්ෂේප

FAIR COMMENT BY JEZEEM

කරන්නේ ඉස්ලාමයේ ගමන් මාර්ගය හඳුනා ගත්තොත්. ඒ හින්දා අන්‍යාගාමිකයෝ ඉස්සරහා හිනහා වෙලා ඉන්න. නමුත් ඒ හිනහ වෙන එක ඔබලා හදවතින් කරන්න එපා. ඒක Outwardly විතරක් පෙන්වන Friendship එකක් විදියට කරන්න. ඒ තුළින් ඉස්ලාමයේ ගමන ඉදිරියට ගෙනියන්න කියන එක.

ප්‍ර : ඔබ ඒ පැහැදිලි කළේ සූරා 3-28 හි අර්ථ විග්‍රහය?

පි : ඔව්.

ප්‍ර : ඊළඟ පැහැදිලි කිරීමට අපි ගියොත්?

පි : අන්න ඒ අර්ථයෙන් තමයි මෙන්න මේ වගේ දේවල් සිද්ධ වෙන්නේ. මේ Outwardly....?

ප්‍ර : මොකද්ද ඔබ ඒ Link එකෙන් පෙන්වන්න හදන්නේ?

පි : මේකෙන් මම පෙන්වන්න හදන්නේ මේගොල්ලෝ මේ අපිත් එක්ක මිත්‍රශීලීව ඉන්නවා. දැන් කාට හරි හිතෙන්න පුළුවන් මම එහෙම කියනකොට අනේ මේ මම මෙයා ඇවිල්ලා මේ ඒ සාමකාමී දේට එරෙහිව කථා කරනවා කියලා නැහැ. දැන් මේක තමයි අපිට වෙන්න ඕන දේ. මෙහෙම සත්‍ය වශයෙන්ම මෙහෙම ඉන්නවා නම් තමයි හරි. නමුත් අපි දැන ගත යුතුයි මේගොල්ලෝ මේ විදියට එන්නේ බොරුවෙන් බව. අන්න එතන එතනදී අපි ප්‍රවේශම් වෙන්න ඕන. එහෙම නැත්නම් අපි සාමකාමීව ...,

ප්‍ර : බොරුවෙන් හෝ ඔවුන් ඔබ ඔය කිව්ව කුරාන පාඨය ගැන අවබෝධයක් නැතුව වෙන්නත් පුළුවන්නේ?

පි : නැහැ මෙතන ඉන්නවා මෙවැනි වූ පුද්ගලයින් සාමාන්‍යයෙන් ඉස්ලාමය ගැන අවබෝධයක් තියෙන කට්ටිය. මෙන්න මේ කට්ටිය. මේගොල්ලෝ අවබෝධයක් නැතුව මෙහෙම කරන්නේ නැහැ.

ප්‍ර : ඔබ කියන්නේ ඔවුන් ඒ කුරාන පාඨවල තේරුම් දැනගෙන, දැන දැන...?

පි : දැනගෙන ඒ ප්‍රකාරව ඒ නියෝගවලට ප්‍රකාරව ඒගොල්ලෝ ඒවා ...,

ප්‍ර : සිද්ධ කරන බව?

පි : ඔව්.

ප්‍ර : හරි.

පි : මේකත් මේ මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ අපවත් වෙච්ච වෙලාවේ මේගොල්ලෝ මේ කෑම බෙදනවා. ඉතිං දැන් මෙතනදී දැන් අපි මේක මේක හොඳ දෙයක්. බැලූ බැල්මට මේක බොහොම හොඳ දෙයක්. සාමකාමී දෙයක්. නමුත් මම මේකේ ඉස්සරහාදී තමයි අපිට ඉස්සරහට ගියහම අපිට තේරෙයි මේ

FAIR COMMENT — BY JEZEEM —

කියන දේවල්වල සත්‍යතාවය. මේගොල්ලෝ හිතාමතාම මේ උඩින් පෙන්වන මිත්‍රත්වයක් තියාගෙන තමයි මේගොල්ලෝ මෙහෙම කරන්නේ. එහෙම නැතුව මේගොල්ලෝ නොදැනිව නෙමෙයි. දැන් මේ මෙයාව ගත්තොත් මෙයා අනිවාර්යයෙන්ම කැප් එක දාගෙන ඉන්න මුස්ලිම්වරයා මෙයා හොඳ දැනුමක් තියෙන කෙනෙක් කියලා මට මෙයාගේ විදියෙන් මට කියන්න පුළුවන්. ඒ ආගම ගැන දැනුමකින්....,

ප : ඔබ ඇයි ඒ කැප් එක දාගෙන ඉන්න මුස්ලිම්වරයාට හොඳ දැනුමක් තියෙනවා කියලා කියන්නේ මොනවා හරි ...?

පි : එකක් එයා බොහොම තලතුනා කෙනෙක්. ඒ හින්දා එයාට ඒගොල්ලොන්ගේ ධර්මය ගැන සෑහෙන අවබෝධයක් තිබියම යුතුයි සහ ඉතිං මේක දැක්කහම මට කියන්න පුළුවන් මේක අතිශෝක්තියක් මේක Exaggeration කියලා. මේක මේගොල්ලෝ අනිවාර්යයෙන්ම 3 වෙනි සුරාවේ 28 වෙනි වගන්තියට ප්‍රකාරව කරන ක්‍රියාවක් කියලා මට කියන්න පුළුවන්.

ප : හරි. අපි ඊළඟ කාරණයට යොමු වෙමු. දැන් ඔබ මේ 10 වෙනි Slide එක තමයි පෙන්නුම් කරන්නේ ගරු කොමිෂන් සභාවට?

පි : ඔව්.

ප : එහිදී ඔබ ඒත් සඳහන් කරනවා මේ ඉස්ලාමයේ අර පළවන කොටසට අදාළව ඉගැන්වීම් තිබෙන කුරාන පාඨ කිහිපයක්? මොනවද ඒ?

පි : ඔව්. මේකෙන් මම මේ ගරු කොමිසම ඉදිරියේ හෙළි කරන්න බලාපොරොත්තු වෙන්නේ ඉස්ලාමයේ තියෙන කූඨ ප්‍රකටම ඉගැන්වීමක්. ප්‍රයෝගමකාරී තවත් ඉගැන්වීමක්. කුරානයේ 16 වෙනි සූරාවේ 106 වෙනි වගන්තිය. මේ බලන්න මේකෙන් කියනවා කිසිම මුස්ලිම්වරයෙකු විසින් අල්ලාහ්ගේ ඉස්ලාමය විශ්වාස කිරීමෙන් පසුව අත්‍යවශ්‍යයෙන්ම ඉස්ලාමය සහ අල්ලාහ් කෙරෙහි භක්තිය ස්ථිරසාර ලෙස හදවතේ රඳවාගෙන එතන මම Addition එකක් දාලා තියෙනවා මගේ වචනවලින් ඉස්ලාමයේ සහ මුස්ලිම්වරුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් කියලා. අනිවාර්යයෙන්ම ඒක හින්දා තමයි එහෙම කරන්න කියලා තියෙන්නේ. හදවතේ රඳවාගෙන මතුපිටින් පමණක් පෙන්වීමේ චේතනාවෙන් ගතයුතු උපක්‍රමශීලී පියවරක් ලෙස මිස ඉස්ලාමයට පටහැනි දේ ප්‍රකාශ කිරීම හෝ මිත්‍යා දෘෂ්ඨිකත්වයට හදවත විවර කරන්නේ නම් අනිවාර්යයෙන්ම අල්ලාහ්ගේ වියරු කෝපය ඔහු ලබා ගත්තා වන්නේය. ඔවුන්ට අතිශය දරුණු දඩුවම් නියමිතය. මේක ඇත්ත වශයෙන්ම මම ගේන්න ඕන අල් ටකියා Theory

FAIR COMMENT BY JEZEEM

එක මම හෙළි කරනකොටයි. නමුත් මම මෙතනට ගෙනාවා මොකද මේක මේ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පස්සේ අපි දැක්කා මෙන්න මේ වගේ දේවල්. මේගොල්ලෝ ඒත් එක්ක ආපු වෙසක් එකට උත්සවයට බොහොම කැමැත්තෙන් ඇවිල්ලා ඒගොල්ලෝ සහභාගී වුණා. ඇයි ඒ. එහෙම කොහොමද එහෙම එන්නේ. එන එක හොඳයි. මේගොල්ලෝ එදා ඉඳලා මේ විදියට හිටියා නම් ඒක තමයි වෙන්නම ඕන දේ. නමුත් මේගොල්ලෝ එදා විතරක් ආවා. ඇයි ඒ. ඒ ආවේ මෙන්න මේ කුරානයේ 16 වෙනි සුරාවේ 106 වෙනි ප්‍රයෝගකාරී ඉගැන්වීමට අනුව අපිව මුලා කරන්න. අපිව මුලා කරන්න. මේක මම ඔප්පු කරන්න මම ගෙනාවා කුරානයේ 04 යි 48 වගන්තිය. ඒකෙන් මොකද්ද කියන්නේ. මේ ක්‍රියාවේ තියෙන ඒ ප්‍රයෝගකාරීකම මම Highlight කරන්න ඕන හින්දයි මේ දෙවෙනියට ගෙනාවේ කුරානයේ 04 යි 48 කියනවා, නියත වශයෙන්ම අල්ලාහ් තමන් හා හවුල්කරුවන් ඇතිකර වන්දනාමාන කිරීමේ සහ එවැනි දේ අනුගමනය කිරීමේ වරදට කිසිසේත්ම සමාව නොදෙන්නේය කියලා තියෙනවා. අනෙක් ආගම්වල වාගේ නෙමෙයි මේ ඉස්ලාමයේ වෙනත් මුස්ලිම්වරයෙකු වෙනත් ආගමක දෙයක් අනුගමනය කෙරුවොත් හරි හවුලේ මොනවා හරි දෙයක් කෙරුවොත් අපි මොකද්ද ඒකට කිව්වේ සර්වාගමික සංකල්පයට සහමුලින්ම සර්වාගමික සංකල්පය සහමුලින්ම ප්‍රතික්ෂේප කරනවා මේ කුරානයේ 04 යි 48 න්. එතකොට කියනවා නමුත් ඔහු මෙම පාපය හැර මෙලොව වෙනත් ඕනෑම ක්‍රියාවකට ඔහු කැමති අයට පමණක් සමාව දෙන්නේය. තවද කිසිවෙකු විසින් අල්ලාහ් සමඟ හවුල්කරුවන් ඇති කර ඒවා අනුගමනය කරයිද ඔහු අනිවාර්යයෙන්ම දරුණු පාපයක් කර ගත්තා වන්නේය කියලා.

ප : ඒ කියන්නේ මහත්මයා දැන් මේ සර්වාගමික සංකල්පය නැත්නම් වෙනත් ආගමික වාරිත්‍රවාරිත්‍රවලට සම්බන්ධවීම මේ කුරානයේ Teaching නැත්නම් කරානයේ ඉගැන්වීම්වලට අනුව සමාව දිය නොහැකිම ගණයේ ඉතාමත් බරපතල අකුසලයක් කියලා සඳහන් වෙනවා කිව්වොත් නිවැරදිද?

පි : ඔව්. එතකොට එච්චර ඒ බරපතලම ආගමක තියෙන බරපතලම වැරැද්ද කොහොමද මේගොල්ලෝ කරන්නේ. මේගොල්ලෝ කොහොමද කරන්නේ. තවත් එකක් අපි ගත්තොත් මේ, මේගොල්ලෝ කොඩිත් අරගෙන යනවා. මෙහෙම කරන්න බැහැ 48 සූරාවේදී මෙහෙම කරන්න බැහැ.

ප : ඔබ දැන් ඒ 10 වෙනි Slide එකද?

FAIR COMMENT — BY JEZEEM

පි : 10.

ප්‍ර : 10 වෙනි Slide එකේ තියෙන Link එකක් තමයි ඔබ පැහැදිලි කරන්නේ?

පි : ඔව්.

ප්‍ර : එහිදී මොනවද දැක්වෙන්නේ ඡායාරූප තියෙනවා කිහිපයක්. ඡායාරූපවල මොනවද දැක්වෙන්නේ කියලා සරළව කියන්න?

පි : ඒ ඡායාරූපවල දැක්වෙන්නේ පාස්කු ඉරිදා ....,

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : දැන් කුරානයේ 04 යි 48 ඔබ ගන්නේ කුමන ග්‍රන්ථයෙන්ද?

පි : මම ගන්නේ මේකෙන්. කවුද ඩොක්ට මොහොමඩ්...,

ප්‍ර : ඒක කියවන්න. ඒකේ ඉංග්‍රීසි පරිවර්තනයක් තියෙනවද?

පි : ඔව්. Verily Allah forgives not that partners should be setup with him in worship. But he forgive except that anything else to whom he wills. And who ever setsup partners with Allah in worship he has indeed invented a tremendous sin. ඊට පස්සේ

ප්‍ර : ආපහු කියවන්න?

පි : Verily Allah forgives not that partners should be setup with him in worship. But he forgive except that anything else to whom he wills. And who ever setsup partners with Allah in worship he has indeed invented a tremendous sin.

****

රජයේ අධිනීතීඥ චතුරංග බණ්ඩාර මහතා :

ප්‍ර : හරි. ඔබ දැන් මේ 10 වෙනි Slide එකේ තියෙන Link එකක් Click කරනවා?

පි : ඔව්.

ප්‍ර : ඒ Link එක Click කරන්නකෝ? එම Link එක Click කරහම පස්සේ තිබෙන ඡායාරූප හතරක් දක්නට ලැබෙනවා?

පි : ඔව්.

ප්‍ර : ඒ මොනවද ඡායාරූප කියලා පැහැදිලි කරන්නකෝ එකින් එක?

පි : මේක අහපවු මම කියනවා මෙන්න මේ තත්ත්වය අපි ඉස්ලාමික ආගමිකයෝ සහ බෞද්ධාගමිකයොන්ට මේක සත්‍යවාදී ලෙසම ස්ථාපිත කර ගන්න පුවවන්නම් මේ තත්ත්වය මේක තමයි අපිට

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අවශ්‍යම දේ. නමුත් මට සහතික කරලා පැහැදිලිවම කියන්න පුළුවන් මේක තමයි ඉස්ලාමික දැක්මට අනුව බරපතලම පාපය. අල්ලාහ් ප්‍රතික්ෂේප කරන, අල්ලාහ් කෝපාවිෂ්ඨ වන බරපතලම වැරැද්ද. නමුත් මේගොල්ලොන්ට ඒ එච්චර ලොකු වැරැද්දක් කරන්න 16 වෙනි සුරාවේ 106 වෙනි වගන්තියෙන් ප්‍රකාරව ඉඩ දීලත් තියෙනවා. අන්න එහෙම තමයි ඉස්ලාමයේ මේ ඉගැන්වීම ක්‍රියාත්මක වෙන්නේ. ඒ කියන්නේ ඒක හරි ප්‍රයෝගකාරියි. හරි උපක්‍රමශීලීයි. මෙහෙන් එකක් කියනවා, මේ පැත්තෙන් තව එකක් කියලා එතකොට ඒ දෙක බැලන්ස් කරලා මුස්ලිම්වරු ඒකේ වාසි වෙන දේ තමයි කරන්නේ. දැන් පාස්කු ඉරිදා එකක් ආවේ නැත්නම් මේගොල්ලෝ කවදාවත් මේ විදියට කොඩි උස්සගෙන එන්නේ නැහැ. ඒ මොකද එතකොට ඒගොල්ලෝ අනුගමනය කරන්නේ 04 වෙනි සුරාවේ 48 වෙනි වගන්තියට යටත් වෙනවා. නමුත් දැන් පාස්කු ඉරිදා එකත් එක්ක ඉස්ලාමයේ ප්‍රතික්ෂේප වෙන ඉස්ලාමයේ Criticize වෙන තත්ත්වයක් මේ අපේ රට තුළ උද්ගත වුණා. ඒගොල්ලොන්ගේ ඒගොල්ලෝ දිහා බලන්න, ඒ ගමන දිහා අපි අවබෝධයක් ලබා ගන්න, මේකේ සත්‍ය වශයෙන් අපි ඒකේ නියම ආකාරයෙන් අපි ඉස්ලාමය ගැන තේරුම් ගන්න අපි අවස්ථාවක් අපිට පාස්කු ඉරිදායින් එනකොටම මේගොල්ලෝ මේ විදිහට හැසිරෙනවා. එතකොට අපි නිර්වින්දනය වීමක් සිද්ද වෙනවා. මේ අල් ටකියා ක්‍රියාත්මක වෙන විදිහ. මේක මේ ළමයි නොදැන කරනවා නෙමෙයි. සමහරවිට ළමයින්ට ගැඹුරින් දන්නෙත් නැහැ. මේ Girlsලා බොහොම කැමැත්තෙන් ඔය හිනහා වෙවි එන්නේ. නමුත් ඒගොල්ලන්ගේ පිටිපස්සේ අනිවාර්යයෙන්ම Religious Leadersලා ඉන්නවා. ඒගොල්ලෝ තමයි මේගොල්ලොන්ව නියාමනය කරන්නේ ඕගොල්ලෝ දැන් මේ විදියට කරන්න. මේගොල්ලෝ ඒ විදියට කරනවා.

ප : අල් ටකියා කියන සංකල්පය පොඩ්ඩක් පැහැදිලි කරන්න?

පි : මම එනවා සර් එතන වෙනම.

****

රජයේ අධිනීතීඥ චතුරංග බණ්ඩාර මහතා :

ප : ඔබ ඒ කියන්නේ සඳහන් කරන්නේ මෙවැනි ඔය වෙසක් කූඩු එල්ලීම්, ආහාර බෙදීම් මෙවැනි ක්‍රියාවන් සිද්ධ කරන්නේ 16 - 106 සූරාවට අනුව මේ අන්‍යාගාමිකයන් රටටා ඉස්ලාම් සහ මුස්ලිම්වරුන් ආරක්ෂා කර ගැනීමේ පරමාර්ථය ඇතිව කියලද?

පි : ඒගොල්ලොන්ගේ ගමන ආරක්ෂා කර ගැනීමේ චේතනාවෙන්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : හරි. අපි ඊළඟ..?

පි : එතකොට පළමු කොටසේ අවසානයට එනකොට මේගොල්ලෝ දැන් ක්‍රියාත්මක වෙනවා දැන් මේගොල්ලෝ ටිකක් ප්‍රසාරණය වෙලා ඒගොල්ලෝ හෙමින් හෙමින් ඒගොල්ලොන්ගේ නීතිය ස්වදේශීක සමාජයට ඔබන්න කටයුතු කරනවා. එතකොට මේකේදී අර මම කිව්වනේ සාමකාමී කොටසින් දැන් දෙවන කොටසට යනකොට මේ ඒගොල්ලොන්ගේ ඒ මුස්ලිම් සමාජය හැඩ ගස්වන්න ඕන. ඇයි මෙච්චර කාලයක් ඒගොල්ලෝ පරම්පරා ගාණක් තිස්සේ ඒගොල්ලෝ අර Green Belt එකේ හිටියා. Green Belt එකේ ඉඳලා ඒගොල්ලෝ ඉතිං අනුගමනය කෙරුවේ යම්කිසි සීමාවක ඉඳගෙන ඒගොල්ලෝ ජීවත් වුණා. දැන් ඒ සීමාවන් මේගොල්ලෝ අරින්න ඕන. ඇරලා ඒගොල්ලොන්ව දුඹුරු පාට පැත්තට ගෙනියන්න කටයුතු කරන්න නම් මෙන්න මේ විදියට මදුසා ස්ථාපිත කරන්න වෙලා තියෙනවා. මේකේ, මේක අපේ බලන්න අපේ පාර්ලිමේන්තුවටම දාලා අපේ ...,

ප්‍ර : දැන් ඔබ ඔය සාක්ෂි දෙන්නේ 11 වෙනි, 12 වෙනි ....?

පි : 12 වෙනි Slide එක.

ප්‍ර : නැහැ 11 වෙනි Slide එක බලාගෙන. ඒ අනුව දැන් ඔබ ඔය ඡායාරූපයේ පෙන්වනවා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යම්කිසි පනතක්. මොකද්ද ඒ පනත?

පි : ඒ පනතින් කියන්නේ අකුරණ ජාමියා රහුමානියා අරාබි විදුහල සංස්ථාගත කිරීමේ පනත.

ප්‍ර : පනතද? කෙටුම්පතද?

පි : එතකොට බලන්න අපේම පාර්ලිමේන්තුව හරහා මේ දේවල් ස්ථාපිත කර ගන්නවා. මොකද මේවා ස්ථාපිත කර ගන්නේ නැතුව ඒගොල්ලොන්ට අර දුඹුරු පාට කාල පරිච්ඡේදයට අවතීර්ණ වෙන්න අවශ්‍ය වටපිටාව හදා ගන්න ඒගොල්ලොන්ට බැහැ. එතන Obstacies තියෙනවා. ඒ හින්දා මේගොල්ලොන්ට ප්‍රසිද්ධියේ T.V. එක හරහා තමන්ගේ ජනතාවට කියන්න බැහැනේ. ඒක කරන්න බැහැ. එතකොට මේගොල්ලොන්ට අවශ්‍ය වෙනවා මේ මදුසා අරාබි පාසල් වගේ දේවල්. මේවා බලන්න මේගොල්ලෝ දාලා තියෙනවා ඒකේ අවශ්‍යතාවය මොකද්ද කියන එක.

ප්‍ර : ඒ අනුව ඒ පනත් කෙටුම්පතෙන් දැක්වෙන්නේ මොකද්ද මේ අකුරණ ජාමියා රහුමානියා අරාබි විදුහලේ සංස්ථාගත කිරීමේ පරමාර්ථය?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. පරමාර්ථය ඒගොල්ලෝ දාලා තියෙනවා ආ - අරාබි, සිංහල, ඉංග්‍රීසි, දෙමළ සහ උර්දු භාෂාවෙන් ඉගැන්වෙනවා. ප්‍රශ්නයක් නැහැ. ඒක උඩින් දාලා තියෙන්නෙත් අපිට ඒක පේන්නමයි. ඒක ප්‍රශ්නයක් නැහැ. ඊට පස්සේ දාලා තියෙනවා ඇ-ඉස්ලාමිය ෂරියා නීතිය යටතේ ජීවිතයේ සියළු අංශ පිළිබඳව සමාජයට මඟ පෙන්වීමට සමත් ඉස්ලාමිය ආලිම්වරු බිහි කිරීම. අන්න...,

ප්‍ර : ඒකෙන් මොකද්ද අදහස් වෙන්නේ මහත්මයා?

පි : ඒකෙන් අදහස් වෙන්නේ මේගොල්ලොන්ට දැන් සාමාන්‍ය සමාජයට තියෙන්නේ බොහෝම සාමාන්‍ය දැනුමක්. අර කොළ පාට කාල පරිච්ඡේදයේ තිබ්බ දැනුම. ඒක දැන් මදි. එතකොට ඒගොල්ලොන්ට අවශ්‍ය වෙනවා මේ ෂරියා නීතිය සහ ඉස්ලාමය පිළිබඳ ගැඹුරින් කටයුතු කරන්න, ගැඹුරින් අවබෝධය ලබා ගන්න පුළුවන් විද්වත් Level එකේ කට්ටිය. ඒගොල්ලෝ හරහා තමයි සමාජය දැනුවත් කරන්නේ. මේක මේ සමාජය දැනුවත් කරන Step එක නෙමෙයි. මේක සමාජය දැනුවත් කිරීමේ අරමුණ ඉෂ්ඨ කර ගන්න කරන වෑයමක්. එතකොට මේකේ කියෙනවා ඉස්ලාමිය ෂරියා නීතිය අපේ මුහුණටම කියනවා. නමුත් අපි දන්නේ නැහැ මේ ෂරියා නීතිය කියන්නේ මොකද්ද කියලාවත්. ඒකේ තියෙන භයානකකම. එතකොට ඊට පස්සේ කියනවා ඇ-පස්වෙනි එකේ ඇ- කියනවා ශුද්ධ වූ කුරානය කට පාඩමින් දන්නා හාෆිස්වරුන් බිහි කිරීම. ඒකත් කමක් නැහැ කියන්නකෝ. ඉස්ලාමිය ආර්ථික පිළිවෙතක් බිහි කිරීමට උපකාරීවීම. මේ එන්නේ අර ආක්‍රමණයේ එක පැත්තක්. මේ ආර්ථික ඉස්ලාමික ආර්ථික පිළිවෙතක් කියාගෙන එන්නේ ඒ අර කල්ට සංකල්ප. එතකොට ඉස්ලාමය තම ජීවන මාර්ගයක් කරගත් පුද්ගලයින් බිහි කිරීම. මම කිව්වනේ ඉස්ලාමය කියන්නේ ආගමක් පමණක් නෙමෙයි. Deen කියන එකේ වචනයේ තේරුම ආගම නෙමෙයි. මේගොල්ලෝ මේ සාමාන්‍ය ව්‍යවහාරයේදී Deen කියන්නේ ආගම කියලා. එහෙම නෙමෙයි. ඒ ඉස්ලාමය කියන්නේ ආගමක් පමණක් නෙමෙයි ඒක සම්පූර්ණ ජීවන රටාවක්. ඒකේ තියෙනවා නීතිය, ඒකේ තියෙනවා ආගමික මුහුණුවරක්, ඒකේ තියෙනවා දේශපාලනය, ඒකේ තියෙනවා Military Operations, ඒකේ තියෙනවා වෛරය, ඒකේ තියෙනවා ක්‍රෝධය, ඒකේ තියෙනවා බෙදීම් හැම එකම. එතකොට එවන් වූ පුද්ගලයන් බිහි කිරීම ඉස්ලාමිය සමාජයේ ගැටළුවලට නිසි විසඳුම් සෙවීම. එතකොට ඒගොල්ලොන්ගේ ඒ ආගමික ගමනේ ගමනට අවශ්‍ය විසඳුම් මිසක් ඒක මේ රටට සුභදායක දේවල් විසඳුම් නෙමෙයි මේ.

FAIR COMMENT — BY JEZEEM

ඉස්ලාමික විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැළැස්වීම. ඒ කියන්නේ සුන්නා, සංස්කෘතිය කියන්නේ සුන්නා. සුන්නා ආපහු සුන්නා කියලා කියන්නේ නබිතුමා විසින් ස්ථාපිත කරපු සම්ප්‍රදායන්. එතකොට නබිතුමාගේ සම්ප්‍රදායන් මක්කානු කාල පරිච්ඡේදයට බොහොම Peaceful, එයාගේ ක්‍රියාකාරකම්. එතකොට මදීනා කාල පරිච්ඡේදයේදී ඒක සාහසිකයි. එතකොට මේගොල්ලෝ මේ හරහා මේ කරන්නේ මදීනා කාලයේදී සම්ප්‍රදායයන් මේ ඉස්ලාමික සමාජයට බෝ කරන්න. එතකොට අධ්‍යාපන හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා පුස්තකාලයක් පවත්වාගෙන යාම. ඊට පස්සේ දැන් මේ විදියට තමයි මේක මේගොල්ලෝ මේ පනත් කෙටුම්පත් Approve කරගෙන අපේම Approval එක අරගෙන මේගොල්ලෝ ඉස්සරහට යන්නේ. තව එකක් තියෙනවා ....,

දැන් වේලාව : ප.ව. 8.40 යි
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය

President Secretariat Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව රාත්‍රී 8.40 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : එහි සඳහන් වෙනවද කවුරු විසින්ද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ කියලා?

පි : ඒක අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉෂාක් රහුමාන් මහතා විසින් 2016 මාර්තු 23 වන දින

ප්‍ර : තමයි ඉදිරිපත් කරලා තියෙන්නේ. තවත් ඡායාරූපයක් තියෙනවා ඒක මොකක්ද?

පි : ඒක ඇවිල්ලා එම්.එස්. තවුෆික් පාර්ලිමේන්තු මන්ත්‍රී ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙන්.

ප්‍ර : ඒ කුමන අරාබි විදුහල සඳහාද ඔහු මේ යෝජනා ගේන්නේ?

පි : එයා තවත් මාවාහිබුල් උලූම් අරාබි විදුහල සංස්ථාගත කිරීම සඳහා පනතක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒකෙත්

ප්‍ර : එහි තියෙනවා නේද ඉස්ලාමීය ෂරියා නීතිය යටතේ සමාජයට මඟ පෙන්වීමට සමත් ඉස්ලාම් දේව ධර්මවාදීන් බිහි කිරීමේ අරමුණ.

පි : අරකම තමයි ඉස්ලාමිය ෂරියා නීතිය යටතේ ඉස්ලාමික ෂරියා නීතිය කියන්නේ ඒක වර්ගවාදී නීතියක්. ඒක ඔය සාමාන්‍ය නීතිය වාගේ නෙමෙයි. සාමාන්‍ය නීතිය ඉදිරියේ හැමෝම එකයි. සාමාන්‍ය නීතියේදී වර්ගවාදීකමක් පෙන්නුම් කරන්නේ නැහැ. ඒ කළු වුනත් සුදු වුනත්, බෞද්ධ වුනත් කවුරු වුනත් එකයි. මේකේදී එහෙම නෙමෙයි ෂරියා මම එතනට ආවාම මම පෙන්නුම් කරන්නම් ඒ ෂරියා එකේ භයානකත්වය. ඉතින් එවන් වූ භයානක දෙයක් මේ ඒ නීතිය මිනීමරු නීතියක් ඒක. ඒ නීතිය යටතේ සමාජයට මඟ පෙන්වීම යටතේ කියලා මේ හොඳ ලස්සන වචන දාන්නේ අපේ හදවතට කතා කරලා අපිව මුලා කරන්න. මේ ලස්සන වචන පිටිපස්සේ තියෙන්නේ හරි භයානක කතන්දරයක්.

ප්‍ර : සාමාන්‍යයෙන් මෙවැනි මද්‍රාසා මුස්ලිම් මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන්නේ ඔබ අර කියපු සාමකාමී කාලපරිච්ඡේදය අවසානයේද, නැත්නම් අර ඔබ දෙවනියට ගත්ත දුඹුරුපාට බෙල්ට් එක ආරම්භයේද?

පි : ඒක දෙකම වෙන්න පුළුවන්. සාමකාමී කාලපරිච්ඡේදය අවසානයේ දී ඒගොල්ලෝ ලෑස්ති වෙන්න ඕන නිසා අනික් කොටසට දුඹුරු පාට කොටසට ඒගොල්ලෝ එහෙම කරන්නත් පුළුවන් නැත්නම් මුල් කාලේදි එහෙම කරන්නත් පුළුවන්. මේකේ දෙවනියට එයා කියනවා ඉස්ලාමීය ධර්මය ආරක්ෂා කිරීම.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කාගෙන්ද මොකක්ද ඉස්ලාමිය ධර්මය මොකක්ද ආරක්ෂා කරන්න ඕනේ, කාගෙන්ද නෑ මෙතන ආරක්ෂා කරන්න කියන්නේ මේ ඇවිල්ලා ජිහාඩින්ව බෝ කරන්න එකක්. මේක පිටුපස්සේ තියෙන්නේ මෙය උගන්වන්නේ, මේකෙන් එළියට එන්නේ පාස් අවුට් වෙලා එළියට එන්නේ ජිහාඩියෝ. මේ ඉස්ලාමිය ධර්මය ආරක්ෂා කරන්න නම් මේ ඉස්ලාමීය ධර්මයට තර්ජනයක් තියෙන්න ඕනේ. එහෙම තර්ජනයක් නැහැ. මේගොල්ලොන්ගේ මේ ගමන යන කොට ඒගොල්ලෝ විසින් ඇති කරන ගැටුම්, ගැටුම්කාරී තත්ත්වයන් යටතේ ඇති වන ප්‍රශ්නවලදි එතනදී ඒගොල්ලෝ ප්‍රචණ්ඩත්වයෙන් කටයුතු කරන්න ඕනේ අයව බෝ කිරීම තමයි, ඒ අයව නිෂ්පාදනය කිරීම තමයි මේකෙන් බලාපොරොත්තු වෙන්නේ. ජාතීන් අතර සාමය වර්ධනය කිරීමට යනාදිය වේ. මේ තුන්වන එක මට 100% ක් සහතික කරලා කියන්න පුළුවන් පට්ටපල් බොරුවක්, මෙහෙම දෙයක් ඉස්ලාමයේ නැහැ, මෙහෙම දෙයක් මේ මද්‍රාසාවල උගන්වන්න කොහෙත්ම නැහැ, කොහෙත්ම අවකාශයක් නැහැ. කොහෙත්ම විදියක් නැහැ. මෙය බොරුවක්. මේ පනත approve කර ගන්න දාපු ඇමක්.

ප : අපි ඊලඟට 12 වෙනි සලයිඩ් එකට යනවා ඔබගේ Presentation එකේ, එහි සඳහන් වෙනවා ඒත් ඉස්ලාමීය ඔය පළමු කොටසට අයත් ඉගැන්වීමක් කියලා ඔබ සඳහන් කරන්නේ. එහි දී ඔබ මේ හලාල් ප්‍රශ්නය ගැන කතා කරනවා?

පි : ඔව්.

ප : මොකක්ද ඔබට හලාල් ගැන මේ කොමිෂන් සභාවට කියන්න තියෙන්නේ?

පි : මේකෙදී ඉස්ලාමයේ පළමු කොටස දැන් අවසාන වී ගෙන යන කාලේ.

ප : පළමු කොටසේ අවසාන භාගය කියලා කිව්වොත් හරිදි?

පි : ඔව් අවසාන භාගය කිව්වොත් හරි. ඒ අවසාන වෙන කොට මේගොල්ලෝ අර කලින් කිව්වා මේගොල්ලෝ ඊලඟ කොටසට ඒගොල්ලන්ගේ පදනම ලෑස්ති කර ගන්න කරන උත්සාහයක් තමයි මේ. හලාල්. හලාල් එක එන්නේ ෂරියා නීතිය යටතේ. හලාල් එතකොට මේ හලාල් කියාගෙන ඒක බැලූ බැල්මට අපි හිතන්නේ ආ.. මේගොල්ලෝ මේ කෑමනේ. කෑම ඒගොල්ලන්ට ඕන විදියට හදාගෙන කන එකනේ කියන නිකම් අහිංසක දෙයක් වාගේ මේගොල්ලෝ ඒක ඉදිරිපත් කරනවා. නමුත් ඒක ෂරියා නීතිය ඔබන්න අවශ්‍ය අර ඔටුවා කූඩාරමට ඔළුව දාගන්නවා වගේ වැඩක්. මෙහෙම දානවා කියන්නේ හලාල් සහ ෂරියා ෆයිනෑන්ස්,

FAIR COMMENT BY JEZEEM

ෂරියා ෆුඩ් ඔය ඔක්කොම අර බූවලු අඩු වගේ අපේ තියෙන දේවල් ඒ මතින් ඒගොල්ලන්ගේ දෙයක් ස්ථාපිත කරලා ඊට පස්සේ ඒක විනාශ කිරීමේ චේතනාවෙන් ආක්‍රමණය කිරීමේ චේතනාවෙන් තමයි කරන්නේ. දැන් ඒගොල්ලන්ගේ Shariya Finance කියන එක ඒක fail.

ප්‍ර : Islamic Banking ගැන කියන්නේ?

පි : ඔව් ඒක ෆේල්. මොකද ඒක fail කියන්නේ ඒක ඉස්ලාමික රටවලවත් සාර්ථකව වුණේ නැහැ. අනිත් එක ඔය Shariya Banking එහෙම නැත්නම් Islamic Banking කියන එකේ සංකල්පය.

ප්‍ර : මම චුට්ටක් ඔබට බාධා කරන්නම්, ඔබ මූල්‍ය ක්ෂේත්‍රයේම නේ රැකියාව කරන්නේ?

පි : ඔව්.

ප්‍ර : දැන් මාලදිවයින ඉස්ලමික් රටක් නේ?

පි : ඔව්.

ප්‍ර : එම රටේවත් තියෙනවද ඔය Islamic Shariya banking system එකක්?

පි : මෑතකදී වෙන කල් තිබුණේ නැහැ. සාමාන්‍ය conventional banking system එක තිබුනේ. එතකොට ලඟකදී ඒගොල්ලෝ Islamic Bank එකක් ස්ථාපිත කෙරුවා. නමුත් එතකොට Maldivians ගෙන්ම ලැබෙන තොරතුරු අනුව ඒක useless කියන එක තමයි ඒගොල්ලෝ කියන්නේ. සහ දැන් ඒගොල්ලෝ කියනවානේ පොළිය ප්‍රතික්ෂේප කරන පොළිය ඕන නැහැ කියලා. පොළියට විරුද්ධවනේ කතා කරන්නේ. ඒකෙත් සන්දර්භය ඇවිල්ලා ඒ කාලේ මේගොල්ලන් ණයට ගන්නවා යුදෙව්වන්ගෙන්. මදීනාවල යුදෙව්වන්ගෙන් ණයට බඩු ගන්නවා. ඉතින් යුදෙව්වන් ඒකට පොළී එකතු කරනවා. නිකන් දෙන්නේ නැහැනේ ණයට. ඒකට මේගොල්ලෝ කැමති නැහැ. ඔන්න ඔය කතන්දරය උඩ තමයි ආවේ. ඊට පස්සේ මේගොල්ලෝ කියනවා ලාභය බෙදා ගන්නවා කියලා. ලාභය හැමෝත් එක්කම බෙදා ගන්නවා කියන සංකල්පයක් මේගොල්ලන්ගේ තියෙනවා. ඒක ආවේ කොහොමද, ඒක ආවේ 624 වෙනි වසරේදි අර අල්බදර් සටන, කෙරුව පළවෙනිම සටන, මම කිව්වේ තවලම්වලට ගැහුවා කියලා. ඒ ගහලා වස්තුව කොල්ලකෑවා. වස්තුව කොල්ලකෑවම වස්තුව බෙදා ගන්න ගිහිල්ලා මේගොල්ලෝ රණ්ඩු කෙරුවා. නබිතුමාත් එක්ක නබිතුමාගේ අනුගාමිකයෝ රණ්ඩු කෙරුවා. මොකද නබිතුමා කෙරුවේ අර ගත්තු ඔක්කොම කරත්ත 100 ක

FAIR COMMENT — BY JEZEEM —

වස්තුව ගෙනල්ලා ගබඩා කරලා කිව්වා මේ වස්තුව අයිතිය මටයි, අල්ලහ්ටයි විතරයි කියලා. මම දෙන දෙයක් උඹලා කාලා බීලා හිටපල්ලා කියලා. ඊට පස්සේ මම මේ දික් ගැස්සෙන හින්දා ගෙනාවේ නැහැ. 8 වන ෂූරාවේ තියෙන්නේ ඒක. ඊට පස්සේ මේගොල්ලෝ රණ්ඩු කරනවා. රණ්ඩු කරන කොට ඔන්න කියනවා නබිතුමා ඔන්න ඊයේ මට පෙනිලා කිව්වා දෙයියෝ මුස්ලිම්වරයෙක් කියන්නේ කවුද කියලා. මුස්ලිම්වරයෙක් කියන්නේ දෙවියන්ගේ නම කිව්වාමත් බයෙන් වෙව්ලන්න ඕනේ. හදවත බියෙන් සලිත වෙන්න ඕනේ. දෙයියන්ගේ පණිවිඩකාරයා ඒ කියන්නේ ප්‍රොපර්ට් කියන එක අහන්න ඕන. අන්න එහෙම කියලා මෙයා මේගොල්ලන්ව දමනය කරන්න හදනවා. ඒත් අහන්නේ නැහැ. නෑ නෑ අපිට පොඩි ගානක් දුන්නේ. අපිට මෙහෙම වැඩක් නැහැ, කියලා රණ්ඩු කරනවා. රණ්ඩු කරන කොට ආයෙත් මෙයා කියනවා එක එක දේවල් ගේනවා. හරි ගියේම නැහැ, ඊට පස්සේ මට මතක විදියට 8 වන ශූරාවේ 41 වන වගන්තිය වෙන්න ඕන. ඒ අන්තිමටම මෙයා කැමති වෙනවා අර වස්තුව බෙදා ගන්න කොහොමද පහෙන් එකක් අල්ලහ්ටයි එයාටයි වෙන් කරලා ඉතුරු හතර සමසේ බෙදනවා කියලා කට්ටියට. ඔන්න ඔය සංකල්පය තමයි ඔය Shariya Banking වල ලාභය බෙදා ගන්නවා කියලා කියන්නේ. එහෙම නැතුව මේ මම A to Z ඉදලා Z to A බැලුවත් මම නෙමෙයි කවුරු බැලුවත් ඉස්ලාමික මූලාශ්‍රවල එහෙම දෙයක් නැහැ. නබිතුමාගේ කාලයේදී එහෙම දෙයක් නැහැ ඉස්ලාමික බෑංකින් කියලා දෙයක් තිබුනේ නැහැ. ඉස්ලාමික එහෙම දෙයක් තිබුණේ නැහැ, ඔක්කොම යුදෙව්වෝ තමයි පරිපාලනය කෙරුවේ. බිස්නස් හැම දෙයක්ම. ඉතින් ඒ හින්දා තමයි ඒක ෆේල් වෙන්නේ. පදනම මේ යථාර්තවාදී හරි තාත්වික හරි නැහැ. නමුත් ඒක පාවිච්චි කරනවා tool එකක් විදියට අපේ රටේ ඒගොල්ලොන්ගේ ආක්‍රමණය ඉෂ්ඨ සිද්ධ කරන්න.

ප්‍ර : දැන් ඔබ හලාල් ගැන සඳහන් කරමින් හිටියේ,

පි : ඕව්. සමාවෙන්න මේක තව දෙයක්. හලාල් කියන එක මම ට්‍රෝජාන් හෝස් උස්සගෙන ආවෙත් ඒකයි තනිකරම ට්‍රෝජාන් හෝස්ගේ සංකල්පය තමයි මේ හලාල් හරහා මේගොල්ලෝ ස්ථාපිත කරන්නේ.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : තව පැහැදිලි කරන්න?

පි : මේක පැහැදිලි කරනවා නම් ඒ කියන්නේ banking system එක කියන්නකෝ මේගොල්ලන්ගේ banking system එක. ඒකෙදී එතන ඉස්ලමික් අයට favourations යනවා. ඊට පස්සේ අපේ දැන් අපේ අය කවුරු හරි සිංහල ව්‍යාපාරිකයෝ එතනට ගිහිල්ලා මේවා කලොත් ඒගොල්ලන්ගේ details ඒගොල්ලන් share කර ගන්නවා. රහස්. අන්න ඒවාගේ දැන් මේකෙත් එහෙමනේ ට්‍රෝජන් හෝස් අස්සේ ඇතුලේ හැංගිලා ඉදලනේ අන්තිමට ඒක විනාශයක් කෙරුවේ. ඒ වාගේ මේක හරහා එන්නේ මේ ආක්‍රමණයේ තවත් පැත්තක් තමයි මේකෙන් සිද්ධ වෙන්නේ. ඊට පස්සේ Halal food වලින් කෙරුවෙත් ඒකමයි. ඊට හපන් වැඩක් Halal food වලින් කෙරුවේ ඒගොල්ලෝ බල කෙරුවා ඒගොල්ලෝ වට පිටාව හදා ගත්තා අපිව රවට්ට රවට්ට අපේ හැම සමාගමක්ම, හැම product එකක්ම Halal certification එක ගන්න ඕන කියලා. මොකද අපේ පැත්තෙන් අපි ඒකට එරෙහි වුණේ නැහැ ඉස්සෙල්ලා. අපි එරෙහි වුනේ නැහැ අපි හිතුවේ මේක සාමාන්‍ය දෙයක් කමක් නැහැ එහෙම කියලා හැම වෙලේම හිතුවා. මේගොල්ලන්ගේ පැත්තෙන් මේගොල්ලන්ගේ ආක්‍රමණශීලී විදියට ආවා ඊට පස්සේ මෙගොල්ලන්ගේ නියෝජිතයෝ දෙන්නෙක් ඒ හැම සමාගමකම ස්ථාපිත කරන්න ඕනේ ඒ දෙන්නට පඩි ගෙවන්න ඕනේ ඒගොල්ලන්ගේ මේකෙන්. අපි හිතමු කෝ දැන් Biscuit බිස්කට් Manufacturing ආයතනයක් කියලා. ඒ Biscuit Manufacturing ආයතනයේ ඒගොල්ලොන්ගේ recipe ඒගොල්ලන්ගේ මොනවා හරි තියෙනවානේ ඒගොල්ලන් කාලාන්තරයක් තිස්සේ develop කරපු දේවල්. එතකොට මේගොල්ල access වෙනවා ඒ නිෂ්පාදන අංශයට. එතකොට ඒකට දාන ingredients ඒ හැම දෙයක්ම මේගොල්ලෝ check කරනවා. මේ ගොල්ලන්ට ඒ information එකක්ම යනවා. ඊට පස්සේ ඒ test එකටම, ඒ විදියට ම මේගොල්ලොන්ගේ ව්‍යාපාරිකයෙකුට ඒක සපයනවා, එහෙම වෙලත් තියෙනවා. එතකොට ඒ විදියටම තවත් ඒ මුස්ලිම් ව්‍යාපාරිකයා ඒ විදියේම product එකක් Identical product එකක් ඉදිරිපත් කරනවා වෙළඳපලට.

ප : තවත් ඔබගෙන් ප්‍රශ්නයක් අහන්නම් මේ හලාල් සම්බන්ධයෙන්, දැන් ඔබ මාලදිවයින් වගේ රටකනේ වැඩ කරන්නේ?,

පි : ඔව්.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : එතකොට ඔබලා වෙන රටවල්වලින් භාණ්ඩ ගෙන්වා ගන්න කොට Importing goods ඕගොල්ලෝ බලනවද මේ හලාල් සහතිකයම තියෙන්න ඕන, නැත්නම් වතුර බෝතලය වුනත් හලාල් සහතිකය තියෙන්න ඕනේ, එවැනි කාරණා ගැන ඕගොල්ලෝ සැළකිලිමත් වෙනවද?

පි : බොහොම හොඳ ප්‍රශ්නයක් එහෙම දෙයක් නැහැ. මමයි Import section එක පාලනය කරන්නේ. කවදාවත් අපෙන් අහලා නැහැ, Halal Certification එක තියෙනවද, සමහර අය අහනවා Halal Certification එක ඕනද කියලා Manufactures ලා අහනවා, දෙන්න පුළුවන් කියලා අපි ඉතින් කියනවා මෙහේ අවශ්‍යතාවයක් නැහැයි කියලා.

ප්‍ර : අපි ඊලඟ සලයිඩ් එකට යමු?

පි : හරි. දැන් මුස්ලිම්වරුන් විසින් අන්‍යාගමිකයන්ට අභියෝග කලහැකි බලයක් ගොඩ නහා ගෙන තියෙන තත්ත්වයක් පසු.

ප්‍ර : දැන් මේ ඔබ ඉන්නේ අර පළවන පරිච්ඡේදය අවසන්.

පි : ඔව්.

ප්‍ර : දැන් මේ දෙවන පරිච්ඡේදය?

පි : ඔව්.

ප්‍ර : ඒ කියන්නේ මුස්ලිම්වරුන් විසින් ඔවුන්ගේ ජනගහනය සහ ඔවුන්ගේ බලය, ධනය,බලය යම්කිසි මට්ටමකට ගොඩනඟා ගෙන ඇති අවස්ථාවක් සම්බන්ධයෙන් තමයි ඔබ එන්නේ?

පි : ඔව්. එතකොට ඒ කාලේදී, දැන් ඒ කාලෙට අදාල ඉගැන්වීම් කිහිපයක් තමයි මම මේ ඉදිරිපත් කරන්නේ. හදීද් එකක් තියෙනවා අබුදාවුත්ගේ The Prophert said the best of the action of the pious Muslim is to love for the මම හිතන්නේ අපි ඒක ගත්තා attachment එකක් විදියට.

ප්‍ර : ඔබ අර අල්වරා වල්බරා වශයෙන් හැඳින්වූයේ මේක තමයි

පි : ඔව්. ඒක තමා අල්වරා වල්බරා තියෙරි එක. Pious Muslim is to love for the sake of Allah and to make for the sake of Allah. ඊට පස්සේ කුර්ආනයේ 48, 29 වන නියෝගය මේ විදියට මුස්ලිම්වරයෙකුගේ ස්වභාවය සම්බන්ධයෙන් description එකක් දෙනවා. ඒ කෙසේද කියනවා නම් මොහොම්මද් යනු අල්ලාහ් ගේ පණිවිඩකරුවාය. ඔහුගේ අනුගාමිකයන් අන්‍යාගමිකයන්ට එරෙහිව සාහසික වන්නේය. එසේම ඔවුනොවුන් අතර ඒ කියන්නේ මුස්ලිම්වරුන් අතර කරුණාබර වන්නේය කියලා. එතකොට මේක දුඹුරු පාට කාලපරිච්ඡේදයේ ජීවත් වන මුස්ලිම්වරුගේ මනසට දැම්මාම නැවතත් ඒගොල්ලෝ කවදාවත්

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අර කොළපාට කාලපරිච්ඡේදයේදී වගේ අපේ දිහා බැලිල්ලක් කරන්නේ නැහැ. එතනින් ඒක බිඳෙනවා. ඒ සීමාවල් මේගොල්ලෝ කඩනවා.

ප්‍ර : ඒ කියන්නේ මහත්මයා අර එකට ජීවත් වෙච්ච සමාජය දැන් ඔන්න වෙන් වෙන්න පටන් ගන්නවා?

පි : හරියට හරි. බෙදීමකට ලක් කරනවා. ඉතින් ඊට පස්සේ අපි යනවා කුර්ආනයේ 60 වෙනි ෂූරාවේ 4 වන වගන්තියට.

ප්‍ර : ඔබ දැන් යන්නේ 14 වෙනි සලයිඩ් එකට කිව්වොත් හරි?

පි : ඔව්. මෙතනදී අර ඔබ මේ දැන් කිව්වා වගේ බෙදීමකට ලක් වෙන එක සහතික වශයෙන්ම කෙරෙනවා. නියත වශයෙන්ම අප මුස්ලිම්වරුන් නුඹලාගෙන් ඒ කිව්වේ අන්‍යාගමිකයන්ගෙන් වෙන් වූයේය. අප නුඹලාව සතුරන් සේ සලකා ප්‍රතික්ෂේප කරන්නෙමු. එසේම නුඹලා විසින් අල්ලාගෙන් තොරව අදහන සහ පිළිපදින සියළු දේද ඒ කිව්වේ අල්ෆිටිනා ඒ කිව්වේ අන්‍යාගමිකයන්ගේ ජීවන රටාව. එනම් ස්වදේශිකයන්ගේ ආගම, ස්වදේශිකයන්ගේ චාරිත්‍ර වාරිත්‍ර සහ නීතිය අපේ ජීවන රටාව ප්‍රතික්ෂේප කරන්නෙමු. තවද නුඹලා විසින් අල්ලා දෙවියන් විශ්වාස කරන තාක්කල් එනම් ඉස්ලාමය වැළඳ ගන්නා තෙක් අප සහ නුඹලා අතර වෛරය සහ එදිරිවාදිකම් ආරම්භ විය කියලා ඉගැන්වීම බලගන්වනවා අර පළවෙනි කොළපාට සාමකාමී පරිච්ඡේදය ඉවර වුණායින් පස්සේ.

ප්‍ර : ඒ අනුව මහත්මයා දැන් මේ කුර්ආන් වැකියට අනුව ශ්‍රී ලංකාවේ නම් බෞද්ධාගමික චාරිත්‍ර වාරිත්‍ර, ආගමික සිද්ධස්ථානවල තියෙන ස්තූප නැත්නම් කිතුණු බැතිමතුන්ගේ තියෙන සිද්ධස්ථාන ඊට අමතරව අපගේ නීතිය, ප්‍රජාතන්ත්‍රවාදය, ඡන්ද ක්‍රමය, පාර්ලිමෙන්තුව ඒ සියල්ලම ප්‍රතික්ෂේප කරන්න ඕනද?

පි : මේ සියල්ලම, අල්ෆිටිනා ගණයකට වැටෙන්නේ ඒ සියල්ලම ඒගොල්ලෝ ප්‍රතික්ෂේප කරනවා මොකද අරමුණ 8 වන ශූරාවේ තිබෙන 39 වෙනි වගන්තියෙන් කියනවා කිව්වේ ඉලක්කය කරා යන්න, අරමුණ මේ සියල්ල විනාශ කරලා ඒගොල්ලොන්ගේ ජීවන රටාව ඒගොල්ලොන්ගේ ක්‍රමවේදය ඒ මත ස්ථාපිත කරන්න.

ප්‍ර : ඔබ ඒ සම්බන්ධයෙන් ලින්ක් එකක් තියෙනවද? මොකක්ද එහි සඳහන් වෙන්නේ?

පි : මම ආපහු ඉබන් කාතිර් තමයි මේකේ මූලිකම විග්‍රහයන් කර තිබෙන්නේ. අර්ථ විග්‍රහයන්. ලෝකයේ හැම මුස්ලිම් රටකම ඒගොල්ලෝ පරිශීලනය කරන්නේ, ඉගෙන ගන්නේ මේ ඉබන් කාතීර්ගේ විග්‍රහයක් අනුව තමයි කුර්ආනය කියවන්නේ. එතකොට එයාගේ මේ විග්‍රහය 60 වන ශූරාවේ 8 වන වගන්තියට

FAIR COMMENT — BY JEZEEM —

මොකක්ද කියලා බලමු. එයා කියනවා අල්ලාහ් Allah commanded the Muslims to disown the non-Muslims to be enemies with them. And to distant themselves and separate from them, verily we are free from you, meaning we are disowned you. කියලා.

ප්‍ර : ඒ මොකක්ද සඳහන් වෙන්නේ තේරුම?

පි : ඒ කියන්නේ මුස්ලිම් නොවන ජනයා මුස්ලිම්වරුන්ගේ සතුරන් සේ සලකා ඔවුන්ව ප්‍රතික්ෂේප කොට ඔවුන්ගෙන් වෙන්ව වෙනස්ව සිටින ලෙසට මෙලෙස අල්ලාහ් විසින් මුස්ලිම්වරුන්ට නියෝග කලේය. අන්න ඒ හින්දා තමයි දැන් මගේ යාළුවෙක් මේක ගැන කියපු ගමන් ම මට කිව්වා ඒ ඔයා කියපු කතාව ඇත්ත. එයා හිටපු ඒ ප්‍රදේශය කලින් සිංහල බහුතරයක් හිටපු ප්‍රදේශයක් කිව්වා. ඒ මුස්ලිම්වරු ඒගොල්ලොත් එක්ක හරි සුහදශීලිව ඒගොල්ලෝ පොඩි කාලෙදී හරි සුහදශීලිව කිව්වා ජීවත් වුනේ. ඊට පස්සේ එයා කොහේ හරි පිටරට ගිහිල්ලා එයා කාලෙකට පස්සේ හරි බැඳලා හරි ඒ ගමට ගියාම එයාට හරි පුදුමයිලු මුස්ලිම්වරු වෙනස් වෙලා ඒගොල්ලෝ දිහා එතකොට බහුතරය මුස්ලිම් වෙලා ඒගොල්ලොන්ගේ දිහා බලන්නේ නිකම් මේ වෛරක්කාරයෝ ආව වගේ කියලා. හරි සැර, pleasant බැලිල්ලක් නෙමෙයි, ඒගොල්ලන්ගේ බැල්මේම තියෙනවා හරි ප්‍රත්ක්ෂේප කරන බැල්මක්. අපේ රටේ ඒ තැන් තැන්වල ඒගොල්ලෝ බලවත් වෙන හැම ප්‍රදේශයකම ඔය තත්ත්වය ඔය විදියටම ස්ථාපිත වෙනවා. දැන් කොටහේනේ මට මතක විදියට 2015, 2016 වගේ යම් ප්‍රශ්නයක් උද්ගත වුණා ආගමික ප්‍රශ්නයක්. අවුරුදු ගානක් තිස්සේ හිටපු දෙමල හින්දු භක්තිකයෝ වගයක් සිංහල අයත් එක්ක ඉදලා තියෙනවා. ඊට පස්සේ පස්සේ කාලෙකදී ඒ හරියට ඇවිල්ලා තියෙනවා මුස්ලිම්වරු. ඒගොල්ලෝ අර විදියට ප්‍රසාරණය වෙලා 3 වන ෂූරාවේ 28 වන වගන්තිය ප්‍රකාරව එහෙම ප්‍රසාරණය වෙලා ඒගොල්ලෝ ටිකක් බහුතරය වුණාට පස්සේ අර වේල් කරත්තය යන්න එපා කියා ලොකු ප්‍රශ්නයක් ඇති කෙරුවා. එතනදී ඒ ආගමික නායකයා කියලා තියෙනවා ඇත්ත කතන්දරේ. ඒගොල්ලන්ගේ ආගමික පැත්තෙන් සත්‍යම එයා කියලා තියෙනවා. අපිට මේ මිත්‍යාදෘෂ්ටිකත්වය අපේ ඇස් ඉදිරියේ පෙන්නන්න බැහැ කියලා. අපිට මේ වේල් කරත්තය යන්න එපා, අපිට මේක අපේ ඇස් ඉස්සරහා අපිට බලන්න බැහැ කියලා. ඉතින් මේ තත්ත්වය ඇති වෙන්නේ අර කොළපාට කාලපරිච්ඡේදයේ ඕවා කිව්වේ

FAIR COMMENT BY JEZEEM

නැහැනේ. දැන් ඒගොල්ලෝ අර ප්‍රසාරණය වීමත් සමඟ මේ විදියට වෙනස්වීමට භාජනය වෙනවා. ඉතින් ඒ ගොල්ලෝ දැන් පරිශීලණය කරන්නේ එවැනි වූ ආගමික ඉගැන්වීම්. ඒ ආගමික ඉගැන්වීම් සාහසිකයි. තර්ජනාත්මකයි. ඉතින් ඒ අනුව ඒගොල්ලෝ කටයුතු කරනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

කොමිෂන් සභාවේ කටයුතු රාත්‍රී 9 පසු වී විනාඩි 30 තෙක් කල් තබනවා.

****

රාත්‍රී විවේකයෙන් පසුව කොමිෂන් සභාවේ කටයුතු නැවත ආරම්භ කරයි.
දැන් වේලාව රාත්‍රී 9.40 යි

<u>පෙර කැඳවූ සාක්ෂිකරු නැවත කැඳවයි.</u>
<u>ලලිත් ප්‍රියන්ත වතුදුර නැවත කැඳවා ප්‍රතිඥා දෙයි.</u>

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : ප්‍රියන්ත මහත්මයා දැන් ඔබ සඳහන් කලා කුර්ආනයේ ෂූරාව 64, සහ 7, 182 යන කාරණා සම්බන්ධයෙන්. ඔබ මේ සම්බන්ධයෙන් මේ ශූරාවල තියෙන කාරණය ඔබට සරලව කියන්න පුළුවන්ද මේ කොමිෂන් සභාවට ඔබ ඒ ෂූරාවලින් කියන්න අදහස් කරන්නේ කියලා? අපි පළවෙනි එක විස්තර කරලා ඉවරයි දැන් 2 වෙනි එක?

පි: 2 වෙනි එක කුර්ආනයේ 4 ෂූරාවේ 182 වෙනි වගන්තිය මම මේක කෝට් කරන්නේ සහී ඉන්ටනැෂනල් කියන කුර්ආනයෙන්. අර මං කිව්වේ Authors ලා තුන්දෙනෙක් translate කරලා තියෙන එක. But those who deny our signs ඒ කිව්වේ කුර්ආනය සහ එහි අල්ලාහ් විසින් නියෝග කරන ලද වගන්ති එනම් පොදුවේ ඉස්ලාමය .We will progressively lead them to destruction from where they do not know එතකොට මුලින් එකේ 64 වන වගන්තියෙන් පැහැදිලිව මුස්ලිම්වරුන් ඒ ස්වදේශික අන්‍යාගමික සමාජයෙන් වෙන් වෙලා වෙනස් වෙලා ප්‍රතික්ෂේප කරලා ඒ අන්‍යාගමික සමාජය සතුරන් සේ සලකලා ඒගොල්ලෝ ඉස්ලාමය වැළඳ ගන්න දවස වෙන කල් ඒ අන්‍යාගමිකයන් සහ මුස්ලිම්රුන් අතර වෛරය හා එදිරිවාදීකම ආරම්භ කරනවා. ඊට පස්සේ 7 වන

Project Secretary's Copy
FAIR COMMENT — BY JEZEEM —

ෂූරාවේ 182 න් කියනවා ඒගොල්ලෝ අපි හිතන්නේවත් නැතුව මේකේ තේරුම ඇවිල්ලා අපි හිතන්නේවත් නැති අපිට හිතාගන්න බැරි ක්‍රම සහ විදිවලට අපිව Progressively අපිව විනාශයට දක්කාගෙන යනවයි කියලා. ඉතින් ඒ අනුව අපි බැලුවොත් කොහොමද ඒගොල්ලෝ උදාහරණයකට මේ බලන්න ගැබ් නසන සිසුන් නසන මත් පෙති තමිල්නාඩුවෙන්. වටිනාකම කෝටි 1 ½ යි.

ප : ඔබ ඔය click කලාට පසු යම්කිසි link එකකින් open වුණානේ document එකක් ලේඛනයක් ?

පි : ඔව්.

ප : ලේඛනයක්. ඒ ලේඛනය ඔබ කොහෙන්ද ගත්තේ?

පි : මේක ගත්තේ Online News paper එකකින්.

ප : දිනය වශයෙන් සඳහන් වෙන්නේ කුමක්ද?

පි : 2015 අගෝස්තු මස 09 වන දින කතෘ දීපා අධිකාරී.

ප : මොකක්ද ඒ ලිපියේ සඳහන් වෙන්නේ?

පි : ඒකෙන් කියනවා රුපියල් එක්කෝටි තිස්තුන් ලක්ෂයක් වටිනා ගබ්සා පෙති සහ සිසු දරුවන්ගේ මනස විකෘති කරන පෙති තොගයක් ඉන්දියාවේ චේන්නායි නුවර සිට රැගෙන ආ ශ්‍රී ලාංකිකයෙක් කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේදී අද අළුයම අත්අඩංගුවට ගත් බව රේගු මාධ්‍ය ප්‍රකාශක ලෙස්ලි ගාමිණි මහතා පැවසුවේය. සැකකරු කල්මුණේ පදිංචි 40 හැවිරිදි පුද්ගලයෙකි. ඔහුගේ ගමන් මල්ලේ තිබී ගබ්සා පෙති 6800 ක් සහ සිසු දරුවන්ගේ මනස විකෘති කරන පෙති 116,465 ක් තිබූ බව රේගුව කියයි. ඉතින් මං මේක ගෙනාවේ එක example එකක් විතරයි. මා ලඟ තියෙනවා සිය ගානක් මේ වගේ දේවල්. මම නිතර පිටරට යන කෙනෙක් හැටියට මම Airport Custom එකේ අයත් එක්ක මම සමහර වෙලාවට කතා කරනවා. මේ ප්‍රශ්නෙ ගැන කතා කලාම ඒ අය මට කිව්වා සෑහෙන්න මේ විදියට ගේනවා කියලා සමහර ඒවා News වලට යන්නෙත් නැති ඒවා තියෙනවා, ගේනනෙම මේ මුස්ලිම් අයයි කියලා. ඉතින් මත්ද්‍රව්‍ය මත්පෙති ඔය ගබ්සා මේවා කරන ඒවා සිංහ සමාජයේ නැතුව නෙමෙයි අපි එහෙම සුද්ධ කරනවා එහෙම නෙමෙයි, අපි අපේ වැරදි අපි දන්නවා. අපේ සමාජයේ ඇතුලේ වෙන දේවල්. නමුත් ඒ වැරැද්ද වෙන්නේ පුද්ගලයින්ගේ සිතුම් පැතුම්වලට මිසක් මේ ජාතියක් වැනසීමේ චේතනාවෙන් නෙමෙයි. මේ අය කරන්නේ තනිකරම ජාතියක් වනසන චේතනාවෙන් සිදු කරන මේ ක්‍රියාවන් අර 7 වන ෂූරාවේ 182 වගන්තිය ප්‍රකාරව කරන

FAIR COMMENT BY JEZEEM

දේවල්. අපිට හිතා ගන්න බැරි අපි කවදාවත් නොසිතන දේවල් හරහා අපිව විනාශයට යොමු කරවනවා. ඩොක්ටර් ෂාෆි ක්‍රියාත්මක වුණේ මේ අනුව. එවැනි දේ සිදු වෙනවා.

ප : ඔබ කොහොමද නිසැක වශයෙන්ම කියන්නේ මේ මත්පෙති, ගබ්සා පෙති එවැනි දේ ගේන්නේ මේ ජනතාව ව්‍යසනයකට ලක් කරන්න කියලා ද නැත්නම් ඔහුට පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා ගේනවා වෙන්න බැරිද?

පි : ඔව් ඒක මම වෙනස දකින්නේ මෙහෙමයි. එහෙම තත්ත්වයක් තුළ වාණිජමය තත්ත්වයක් තුළ ඒගොල්ලෝ ක්‍රියාත්මක වෙනවා නම් ඒගොල්ලෝ විතරක් ඔතන ක්‍රියාත්මක වෙන්න අවශ්‍යතාවයක් නැහැ. තවත් අය ඉන්නවා, තවත් ජාතිකයින් ඉන්නවා, ක්‍රිස්තියානි අය, බෞද්ධ අය, හින්දු අය මේ හැම කෙනෙකුටම පුළුවන් ඔය විදියට කටයුතු කරන්න නමුත් ඒ එලෙස කටයුතු කිරීමක් සිද්ධ වෙන්නේ නැහැ, එහෙම අහු වුනත් එක්කෙනෙක් දෙන්නෙක් ඒක කරයි. නමුත් සමස්ථයක් විදියට Custom නිලධාරීන්ගේ ඒ මතයත් අනුව මට කියන්න පුළුවන් සහතික වශයෙන් මේ මුස්ලිම් අය තමයි මේ විදියට සංවිධානාත්මකව මේ දේ කරන්නේ කියලා.

ප : ඔවුන් ගෙනල්ලා ඒවා විකුණන්නේ අන්‍යාගමිකයන්ට පමණයිද ඔවුන්ගේ ජනතාවට විකුණන්නේ නැද්ද?

පි : බොහෝ වෙලාවට ඒ අය සිංහල සමාජ වෙළඳපලට තමයි ඒවා බෙදා හරින්නේ.

ප : අපි ඊලඟ එකට යමු?

පි : කුර්ආනයේ 60 (1)

ප : අපිට ඒ සම්පූර්ණ එකේ තියෙන අදහස කියන්න පුළුවන්ද සරලව ඒක ප්‍රමාණවත්.

පි : හොඳයි. මේ කුර්ආනයේ 60 (1) වන වගන්තියෙන් නැත්නම් නියෝගයෙන් කියන්නේ මුස්ලිම්වරුන්ට කිසිම අවස්ථාවක මේ ජිහාඩය මේක දුඹුරුපාට අපි කාලපරිච්ඡේදයේ ඉන්නේ, එතකොට ස්වදේශික සමාජයට එරෙහිව දැන් ක්‍රියාත්මක වෙනවා යම් යම් ගැටුම්කාරී, හිංසණකාරී ක්‍රියාවන්. අන්න එවැනි අවස්ථාවන්වලදී මේ අවවාද කරනවා, මේ නියෝග කර සිටිනවා මුස්ලිම් අයට ඔවුන් ඉස්ලාමික සමාජයේ රහස් මුස්ලිම් නොවන සමාජයට ස්වදේශික මුස්ලිම් නොවන සමාජයට හෙළිකිරීම සපුරා තහනම් කියලා. එහෙම සම්බන්ධකම් පැවැත්වීම, ඔත්තු සැපයීම, එවැනි දේවල් තහනම් කියලා. ඉතින් මෙතනදි මට කියන්න පුළුවන් දැන් පාස්කු ඉරිදා ප්‍රහාරයේදි සමහර විට සමහර නිලධාරීන් ඉන්න පුළුවන් මුස්ලිම් නිලධාරීන්. අන්න ඒ වගේ අවස්ථාවකදී ඒ අය

FAIR COMMENT — BY JEZEEM —

මේ particular verse මත නියෝගය දැනගෙන ඉන්න කොට ඒ අය මැදිවෙනවා ඒගොල්ලන්ගේ ආගමට සහ ඒගොල්ලන්ගේ ඩියුටි එකට. ඒ අවස්ථාවේදි ඒ අය තෝරගන්න එක මොකක්ද කියන එක අපිට කියන්න බැහැ, නමුත් බොහෝදුරට ඔහු ඉස්ලාමික භක්තිකයෙක් නම් වැඩි වාසිය තියෙන්නේ ඔවුන්ගේ දේව නියෝගය අනුගමනය කිරීමයි. ඒගොල්ලොන්ගේ duty එක අනුගමනය කිරීම නෙමෙයි කියලා මට කියන්න පුළුවන්. මොකද duty එක අනුගමනය කරන්න ගියොත් එයාගේ මුස්ලිම් භාවය අහෝසි වෙනවා. උදාහරණයකට මොනවා හරි රහසක් ඒ නිලධාරියා, මුස්ලිම් නිලධාරියා අපිට හෙළිකල යුතුයි ආරක්ෂක අංශවලට. එතකොට වෙන්නේ ඒ ජිහාඩින්ව අහුවෙනවා. ජිහාඩින්ව කොටු වෙනවා. එතකොට ඒක ඉස්ලාමයේ ගමනට අවහිරයක් ඒ මුස්ලිම් නිලධාරියා විසින් සිද්ධ කරනවා. ඉතින් එවැනි අවස්ථාවක ඒ අය ගිරේට අහුවුණා වගේ වෙන්න පුළුවන්. මම එහෙම කෙනෙක් කරලා කියලා මම දන්නේ නැහැ, නමුත් එහෙම අවස්ථාවල් බොහෝ දුරට ඉදිරියේදී අපේ රටේ එන්න පුළුවන්. විශේෂයෙන් අපේ රටේ ආරක්ෂක අංශවල බුද්ධි අංශවල...

ප : ඒ කියන්නේ ඔබ සඳහන් කරන්නේ මේ කුර්ආනයේ තියෙන මේ 61 සූරාවට අනුව මුස්ලිම් නිලධාරියෙක්ට බුද්ධි අංශයකට සම්බන්ධ වෙලා මුස්ලිම් ජනතාවට විරුද්ධව ඔත්තු ලබා ගන්න ගියොත් කුර්ආන පාඨය උල්ලංනය වෙනවා කියලාද?

පි : උල්ලංඝනය වෙනවා.

ප : අපි ඊලඟ කුර්ආන් වැකියට යමු?

පි : කුර්ආනයේ 8. 60 ඒකෙන් කියන්නේ දැන් කොළපාට කාලපරිච්ඡේදය ඉවර වුණයින් පස්සේ ඒගොල්ලෝ දුඹුරුපාට කාලපරිච්ඡේදයට අවතීර්ණ වෙනවා. එතනදී ඒ ගමනේ තියෙන ක්‍රියාකාරකම් ස්ථාපිත කලයුතු වෙනවා. ඒ ගමනේ එක අංගයක් තමයි ත්‍රස්තවාදී ක්‍රියා. ඒ සඳහා ඔවුන් සුදානම් විය යුතුයි ඒ හින්දා අල්ලාහ් දෙවියන් වහන්සේ ඒගොල්ලන්ට නියෝග කර සිටිනවා ස්වදේශික අන්‍යාගමිකයින්ව එහෙම නැත්නම් සතුරන්ව විනාශ කරන්න ආයුධ එක්රැස් කරන්න කියලා. ඒක තමයි මේ 8 වන සූරාවේ 60 වන වගන්තියෙන් කියවෙන්නේ. ඒකම ආපහු මම අර විග්‍රහය ඉබන්කාතීර්ගේ තක්සීර් විග්‍රහය ගේනවා As I ban karthir puts it in his Thakseer on this passage that is Quran 8th suras 60th verse, Allah commands Muslims to prepare for war against disbelievers as much has possible according to

affordabkility and availability. ඒ අනුව ඒ අය 2013, 2010 න් පස්සේ ඒගොල්ලෝ ආයුධ එක්ෲස් කිරීම පටන් අරගෙන තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ දැන් සහරාන් වගේ පුද්ගලයෙක් වුනත් තමන්ට හැකි පමණින් ආයුධ එක්ෲස් කරන්නට පටන් ගන්න ඇත්තේ මේ කුර්ආන වැකිය අනුව කිව්වොත් නිවැරදිද?

පි : අනිවාර්යයෙන්. මේක තමයි මාර්ගෝපදේශය දෙන්නේ අර ගමනේ. දැන් මම මේ ඉදිරිපත් කරන්නේ ඒකෙන් පෙරලා අරගෙන ඒ මාර්ගයේ නියෝජනය කරන, ඒ මාර්ගයේ step එකෙන් step එක නියෝජනය කරන ඉගැන්වීම්.

ප්‍ර : අපි ඊලඟ එකට යමු?

පි : හොඳයි. ඊට පස්සේ කුර්ආනයේ 9, 123 කියනවා මුස්ලිම්වරුනි නුඹලා ආසන්නයේ වෙසෙන අන්‍යාගමිකයන්ට එරෙහිව සටන් කරන්න ඔවුන්ට පහර දෙන්න නුඹලාගේ සාහසික බව ඔවුන්ට දැනෙන්න ලෙස ක්‍රියාත්මක වන්න. එසේම අල්ලාහ් දෙවියන් සිටින්නේ එවැනි ශ්‍රද්ධාවන්ත මුස්ලිම්වරුන් Pious Muslim සමඟ බව මතක තබා ගන්න.

ප්‍ර : එතකොට එයත් මේ මුස්ලිම් ජනතාව අන්‍යාගමිකයන්ට විරුද්ධව සටන් කරන්න කියලා උසිගන්වන සුළු ආකාරයේ වැකියක්?

පි : හරියට හරි 100% ක් නිවැරදියි. එය උසිගැන්වීමක් තමයි එතනින් කරන්නේ. ඉතින් ඒ අයගේ මනස ඒ විදියට හැදෙනවා. මොකද මේ කියලා තියෙන්නේ දෙවියන් වහන්සේ කරපු නියෝගයි.

ප්‍ර : හරි අපි ඊලඟ ෂූරාවට ගියොත්?

පි : 4 වන ෂූරාවේ 87 වන වගන්තියෙන් කියනවා අල්ලාහ් දෙවියන් හැර වෙනත් කිසිවකුට හෝ කිසිම ආගමකට වැඳුම් පිදුම් ලැබීමට අයිතියක් නොමැත කියලා. බලන්න 2 වෙනි ෂූරාවේ අපේ කොළපාට පරිච්ඡේදයේදී අපි දැක්කා 2 වන ෂූරාවේ 256 වන වගන්තියේ තිබ්බා ආගම්වලට අනිවාර්ය කිරීමක් නැත කියලා. එතකොට මෙතන කුර්ආනයේ 4 වන ෂූරාවේ 87 වන වගන්තිය ඒකට සහමුලින්ම පරස්පර විරෝධී අර්ථයක් සහ නියෝගයක් නිකුත් කරනවා අල්ලාහ් දෙවියන් හැර වෙනත් කිසිවෙකුට හෝ කිසිම ආගමකට වැඳුම් පිදුම් ලැබීමට අයිතියක් නොමැතැයි කියලා.

ප්‍ර : එකම කුර්ආනයේ එක් ස්ථානයක තියෙනවා ආගම ඕන ආගමක් පිළිගන්න ඒක කමක් නෑ කියලා. ඒ කුර්ආනයේම තවත් ස්ථානයක තියෙනවා වෙනත් කිසිදු ආගමකට වැඳුම් පිදුම් කරන්න එපා කියලා. ඉතින් ඒ දෙකෙන් මොකක්ද ඇත්තටම හරි ?

FAIR COMMENT
BY JEZEEM

පි : බොහොම හොඳ විශිෂ්ඨ ප්‍රශ්නයක්. මෙහෙමයි අපි දැන් මම හිතන විදියට අපි අවතීර්ණ වෙලා තියෙනවා හොඳ තැනකට. මෙහෙමයි ඒක ඊලඟ පිටුවේදී එළියට ඒවි.

ප්‍ර : පැහැදිලි කරන්න පුළුවන්?

පි : පැහැදිලි කරන්න පුළුවන් එය සිද්ධ වෙන්නේ

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ඔබ මේ කොමිෂන් සභාව ඉස්සරහා සාක්ෂි දෙන බව මතක තියාගන්න. අහන ප්‍රශ්නෙට උත්තර දෙන්න ඒකට වර්ණනා කිරීම් එහෙම අවශ්‍ය නැහැ.

පි : හොඳමයි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : කියන්න?

පි : ඒක සිද්ධ වෙන්නේ ඒ theory එකක් තියෙනවා ඉස්ලාම් ආගමේ. Abrogation theory එකක්. ඒකට ප්‍රකාරව සිද්ධ වෙන දෙයක් තමයි එහෙම සිද්ධ වෙන්නේ. එතනදී තමයි ඒක sort out වෙන්නේ මොකක්ද හරි ඉගැන්වීම, මොකක්ද අයින් කලයුතු ඉගැන්වීම කියලා. අපි මේකත් බලමු සහී අල්බුහාරි 4,52,311 Allah is ….said there is no migration after the conquest of Makka. But only Jihad. When you are called by the Muslim leader for Jihad fighting you should go for immediately responding to the call. ඉතින් මේක declare කරන්නේ මේ හදිත් එක නබිතුමා දේශනා කරන්නේ 630 මක්කාව අල්ල ගත්තයින් පස්සේ. එයා එතනදී කියන්නේ අර එයා පැනලා ගියානේ බය වෙලා එයාව අල්ල ගන්න යන කොට. දුර්වල තත්වයක හිටපු නිසා. මෙතැන් පටන් එදායින් පස්සේ ඒ මැක්කාව අල්ල ගත්තයින් පස්සේ මැක්කාව අල්ලගෙන පළවෙනි ඉස්ලාමීක රාජ්‍යය ස්ථාපිත කලායින් පස්සේ නැවත පැනලා යාමක් නැත. ඊට පස්සේ අපි ජිහාඩයම පමණයි කියලා ඒගොල්ලෝ ක්‍රියාත්මක කරන්නේ. ඊට පස්සේ අර මම කියපු එකට එනවා දැන්. ඉස්ලාමීය ඉගැන්වීම් අවලංගු කිරීමේ න්‍යාය.

ප්‍ර : ඔබ දැන් පැහැදිලි කරන්නේ 17 වන සලයිඩ් එකේ දැක්වෙන Islamic Theory of Abrogation නැත්නම් අවලංගු කිරීමේ න්‍යාය?

පි : න්‍යාය.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මේක කොහේද තියෙන්නේ මේ අවලංගු කිරීමේ න්‍යාය?

පි : මේක තියෙන්නේ කුර්ආනයේ.

ප්‍ර : අල්කුර්ආනයේම දැක්වෙන න්‍යායක්.

පි : ඔව්.

ප්‍ර : ඒ න්‍යාය පැහැදිලි කරන්න පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට?

පි : හොඳයි, හරි මේ න්‍යායට සම්බන්ධව තියෙන්නේ නියෝග 2 යි. එකක් 16 වන ෂූරාවේ 101 වන වගන්තිය සහ කුර්ආනයේ 2 වන ෂූරාවේ 106 වන වගන්තිය. දෙකේම අර්ථයන් එකයි. ඒ හින්දා මම එකක් කියන්නම්, තවද අප කුර්ආනයේ යම් වගන්තියක් අමතක කොට එකේ බලරහිත කොට ඒ වෙනුවට වෙනත් වගන්තියක් ඒ සඳහා බලගන්වන විට ඒ තමයි ඒකේ අර්ථය. ඊට පස්සේ ඒක එච්චර අදාල නැහැ අල්ලාහ් දෙවියන් විසින් මෙළොවට එවන දේ ඔහු හොඳින්ම දන්නේය. මොහොමඩ් බොරු ගොතන්නෙකු සහ කපටියෙකු බව අවිශ්වාසවන්තයන් විසින් කියන්නේය. එහෙම කියලා තියෙනවා. දෙවෙනි එකෙත් කියනවා නම් කුමන හෝ වගන්තියක් අප විසින් බලරහිත අමතක කරන කල අප ඒ සඳහා හොඳ වගන්තියක් ඉදිරියට එන්නේය. බලගන්වන්නේ. අල්ලාහ් දෙවියන්ට ඕනෑම දෙයක් කළහැකි බව නුඹලා නොදන්නෙහිද කියලා තියෙනවා. දැන් මේකේ අර්ථ විග්‍රහයට ගියාම ඒකෙන් කියවෙන්නේ ඒ ඉස්ලාමයේ අර ඔබතුමා කිව්වා වගේ එක තැනක තියෙනවා ඕනෑම ආගමක් අදහන්න පුළුවන් කියලා, අනෙක් පැත්තේ තියෙනවා ඉස්ලාමය හැර වෙනත් ආගම් අදහන්න බැහැයි කියලා. අන්ත දෙකක ඉගැන්වීම් දෙකක් කොහොමද එක ආගමක තියෙන්නේ. එහෙම තියෙන්න බැහැ. නමුත් ඉස්ලාමයේ තියෙනවා. එතකොට ඒක sort out කර ගන්න ක්‍රමවේදය තමයි Theory of Abrogation එකෙන් කරන්නේ. ඒකේදී වෙන්නේ දැන් මුලින් ඉදිරිපත් කරපු නියෝගය තියෙනවානේ. එතකොට ඒක අර මුල් කාලයට අවශ්‍ය විදිටයි ඒ නියෝගය කරලා තියෙන්නේ. උදාහරණයක් විදියට 2 වන ෂූරාවේ 256 වගන්තියේ තියෙන ආගම්වලට අනිවාර්ය කිරීමක් නැත කියන වගන්තිය ඉස්සෙල්ලා නිකුත් කරපු එකක්. එතකොට ඒක ඒ කාලයට උචිත විදියට.

ප්‍ර : ඒ කාලයට කියන්නේ?

පි : ඒ කාලයට කිව්වේ ඒගොල්ලෝ සුළුතරයක් වෙලා බලයෙන් අඩු ජන කොටසක් හැටියට ඉන්න කොට ක්‍රියාත්මක වෙන කොට අවශ්‍යතාවය සපුරන්න තමයි ඒක ඉදිරිපත් කරන්නේ. එතකොට මේ 16 වන ෂූරා 101 වන වගන්තිය ඊට පස්සේ එකක්. එතකොට පසු කාලෙක නිකුත් කරපු වගන්තියෙන් ඊට පෙර නිකුත් කරපු

FAIR COMMENT — BY JEZEEM —

වගන්තිය අවලංගු වෙනවා. නමුත් ඒක අවලංගු වුණයි කියලා කුර්ආනය අයින් කරන්නේ නැහැ. කුර්ආනයේම තියෙනවා. එතකොට අර අපි සාමාන්‍ය ජනවහරේ එන විදියට කියනවා නම් කරබගොයා තලගොයා කර ගන්නවා කියලා කියන්නේ. අන්න ඒ වගේ දෙයක් තමයි මුස්ලිම්වරු කරන්නේ ඒ හරහා.

ප : ඒ කියන්නේ ඔබ සඳහන් කරන්නේ මුල් ශූරාව අපි හිතමුකෝ 5 වෙනි ෂූරාවේ යම්කිසි දෙයක් තියෙනවා කියලා. ඒකයි 15 වෙනි ෂූරාවේ යම්කිසි දෙයක් තියෙනවා නම් ඒ දෙක අතර යම්කිසි ඝට්ටනයක් ඇති වුනොත් මේ 15 වෙනි ෂූරාවේ තියෙන එකද වලංගු වෙන්නේ. ?

පි : 15 වෙනි ෂූරාවේ තියෙන එක වලංගු වෙන්නේ ඒ කාලය ආවාම. මේ කාලය එන්න ඕනේ දැන් අපි දුඹුරුපාට section එකට කාලපරිච්ඡේදයට ඇවිල්ලා හින්දයි අරක Abrogate වෙන්නේ.

ප : අපි ඊලඟ එකට යමු?

පි හොඳයි. දැන් අපි බලමු ඉස්ලාමීය කුසල් සහ අකුසල්. අපි බෞද්ධයෝ හැටියට සහ අනිත් ආගම්වල තියෙනවා හැටියට අපි කුසල් සහ අකුසල් කියලා අපි තේරුම් ගන්න දේ මොකක්ද අපේ ඒක හොඳ දේ. දැන් හොඳ කිව්වාම ආපහු ඒකත් සංපේක්ෂයි. අපි හොඳ කියලා කියන්නේ දැන් සතෙකුට ජීවිතය බේරා ගන්නවා නම්, සතෙක්ව මරන්න යන එක බේර ගන්නවා නම් අන්න එහෙම දේවල් නැත්නම් මොනවා හරි උපකාරයක් ඒ වගේ දේවල්. නමුත් ඉස්ලාමයේ එහෙම නෙමෙයි. ඒක ආපහු ඒකේ හාත්පසින් අනික් පැත්ත. ඒකේ මම ගේන්නේ හදිත් එකක්. සහි අල්බුහාරී. සහි කියන්නේ Authentic කියන එක. අල්බුහාරි කියන්නේ හදිත් වාර්තා තියපු කෙනා. අල්ලාහ්ගේ පණිවිඩකරු වන මොහොමද්ගෙන් යම්කිසිවකු මෙසේ අසන ලදි. ඉස්ලාමයට අනුව මුස්ලිම්වරයෙකු සඳහා වන උත්තම කුසල කර්මය වන්නේ කුමක්ද? නබිතුමා පිළිතුරු දුන්නා අල්ලාහ් දෙවියන් සහ ඔහුගේ නියෝජිතයා වන මොහොමද්ව විශ්වාස කිරීමයි. එම පුද්ගලයා නැවත ප්‍රශ්නයක් ඇසුවා. ඉස්ලාමයට අනුව මුස්ලිම්වරුන් සඳහා ඊලඟට ඇති උත්තම කුසල කර්මය කුමක්ද? නබිතුමා පිළිතුරු දුන්නා අල්ලාහ් දෙවියන් විසින් වදාළ මාර්ගයට අනුව එක ඉස්ලාමීක අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් අන්‍යාගමිකයන් විනාශ කිරීම සඳහා මුස්ලිම්වරු විසින් දියත් කළයුතු වන ජිහාඩ් කළකෝලාහල හා සටන්වලට සහභාගී වීමයි කියලා. ඒක දෙවන උත්තම කුසල කර්මයක් හැටියට මුස්ලිම්වරුන්ට දේශනා කරලා තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මහත්මයා කියන්නේ මේ සහීඩ් අල්බුහාරි 1, 2, 25 ට අනුව මේ සහරාන් යන පුද්ගලයා මෙම ඉස්ලාම් ආගමට අනුව කරන්න පුළුවන් උපරිම කුසල් කර්ම 2 ක් කරපු පුද්ගලයෙක්ද?

පි : දෙකක් කරලා තියෙනවා.

ප්‍ර : අපි ඊලඟ එකට?

පි : දැන් මේ ඒ කුසල කර්මය ඉෂ්ඨ කර ගන්න යන කට්ටිය තමයි මේ. මට මෙතනදී මේ ලින්ක් එක මට කියන්න බැරි වුනා මෙන්න මේ අර ආගමික ඉගැන්වීම අනුව තමයි මෙන්න මේ ක්‍රියාකාරකම් සිද්ධ වෙන්නේ. අර අනිත් ආගම්වලට අයිතියක් නොමැත කියලා තිබුණේ. අර ඔබ කිව්වා වගේ හැම ක්‍රියාකාරකමක්ම මුස්ලිම්වරුගේ ඉස්ලාමයේ ඒ සිද්ධ වෙන්නේ අපි නොදන්නවට ඒ හැම දෙයක්ම සිද්ධ වෙන්නේ සහ සිද්ධ කරන්නේ ඉස්ලාමික ඉගැන්වීම්වලට අනුව.

ප්‍ර : දැන් ඔබ පැහැදිල කරන්නේ 19 වන slide එක?

පි : ඔව් 19 වන slide එක. සිංහලය ඇතුළු මේ අර දුඹුරුපාට කාලපරිච්ඡේදය සිංහලයා ඇතුළු සෙසු අන්‍යාගමිකයන්ට එරෙහිව සැලසුම්ගත ඉස්ලාමික ජිහාඩය. දැන් අපිට මතකයි අර මවුලවිතුමා කිව්වා ජිහාඩය සම්බන්ධයෙන් කරුණු කාරණා ප්‍රමාණයක්. එයා කිව්වා ජිහාඩය කියන්නේ චෛතසික අරගලයක්.

ප්‍ර : ජිහාඩය පස් ආකාරයකින් විස්තර කළා?

පි : ඔව්. එහෙම ඒවගේ දේවල් කිව්වා. අපි බලමු කුර්ආනයේ දෙවියන් වහන්සේ විසින් ජිහාඩය කොහොමද අර්ථ කථනය, ජිහාඩය කියන්නේ මොකක්ද කියලා කියලා තියෙන්නේ කොහොමද කියලා.

ප්‍ර : කුර්ආනයේ කොහේද තියෙන්නේ ඒ අර්ථ කථනය?

පි : 2 වන ෂූරාවේ 216 වන වගන්තියේ.

ප්‍ර : හරි ඒක පැහැදිලි කරන්න?

පි : අර්ථ කථනය කිව්වේ අර මවුලවිතුමා. මේ අර්ථ කථනය දෙවියන් වහන්සේ. ජිහාඩ් ඒ කිව්වේ අල්ලාහ් ගේ අරමුණු ඉෂ්ඨ කිරීම වෙනුවෙන් කරන්නාවූ ශුද්ධ වූ සටන. සෑම මුස්ලිම්වරයෙකු සඳහාම නියෝග කොට ඇත්තේය. ඔබ ඒ සඳහා කැමති වූද, අකමැති වූද එය ඔබට අල්ලාහ් දෙවියන් විසින් අනිවාර්යය කොට ඇත්තේය. සමහර විට ඔබ ඔබට හොඳ දේකට ඔබේ නොදැනුවත්කම නිමා අකමැති වන්නට පුළුවන. එලෙසම ඔබේ නොදැනුවත්කම නිසා ඔබට නරක දේකට ඔබ කැමති වන්නටද පුළුවන. නමුත් ඔබට හොඳ දේද නරක දේද අල්ලාහ් දෙවියන් දන්නේය. ඔබ නොදන්නේය කියලා කියනවා. එතකොට

Project Secretary Copy
FAIR COMMENT BY JEZEEM

කුර්ආනයේම 2 වන ෂූරාවේ 190 වගන්තිය යටතේ footnote එකක් දාලා තියෙනවා. ඒ කෙසේද කියනවා නම් ඒත් ජිහාඩය සම්බන්ධයෙන් වැඩි විස්තරාත්මක විග්‍රහයක් ඉස්ලාමික දැක්මෙන්. ජිහාඩ් යනු අල්ලාහ් ගේ අරමුණු ඉෂ්ඨ කිරීම වෙනුවෙන් ප්‍රචණ්ඩත්වය සහ පුර්ණ බලය සහ ආයුධ සන්නද්ධව අල්ලාහ් සහ මොහොමද්ව එනම් ඉස්ලාමය විශ්වාස නොකරන ජනයා විනාශ කිරීම සඳහා මුස්ලිම්වරුන් විසින් කළයුතු වන ශුද්ධ වූ සටනයි. ජිහාඩය ඉස්ලාමයේ ඉතාම වැදගත් වන ක්‍රියාවලියකි. එය ඉස්ලාමේ පැවැත්ම රැඳී ඇති එක් බලකණුවකි. ජිහාඩය හරහා ඉස්ලාමය ස්ථාපිත වන්නේය. එය අල්ලාහ්ගේ වචනයට එනම් මේ මගේ එකතු කිරීමක්. එනම් කිසිම මනුෂ්‍යයෙකුට අල්ලාහ් සහ ඉස්ලාමය හැර වෙනත් කිසිම දෙවියකුට හෝ කිසිම ආගමකට වන්දනාමාන කිරීමට අයිතියක් නොමැත යන නියෝගය. ඒ වචනයට අල්ලාහ්ගේ වචනයට උත්තරීතර භාවය ලබාදෙයි. තවද එය අල්ලාහ්ගේ ආගම ඉස්ලාමය ව්‍යාප්ත කරයි. ජිහාඩය අත්හැර දැමුවහොත් ඉස්ලාමය විනාශ වී යනු ඇත. තවද මුස්ලිම්වරු දුර්වල තත්ත්වයකට ඇද වැටෙනු ඇත. ඔවුන්ගේ අභිමානය ඔවුනට අහිමි වී යනු ඇත. ජිහාඩය සෑම මුස්ලිම්වරයෙකුගේම බන්ධනීය ඉස්ලාමික වගකීමක් වන්නේය.

(මේ attachment එක බලමු)

(මේ අවස්ථාවේදී එම වීඩියෝ පටය තිරයේ ප්‍රදර්ශනය කිරීමට සලස්වයි)

පි : ඔබතුමන්ලා දැක්කා අල්ලාහ් දෙවියන් විසින් ඉදිරිපත් කරපු ඒ කුර්ආනයට අනුව ජිහාඩය අර්ථකථනය කරපු විදියයි. මෙතුමා අර්ථ කථනය කරපු විදියයි. මේක මෙතුමගේ අර්ථකථනය. අපි දැන් සාකච්ඡාවට භාජනය කෙරුවේ අල්ලාහ් දෙවියන්ගේ අර්ථ කථනයයි. එතකොට අපි එයාගෙන් අහන්න ඕනේ ඔය කියපු ජිහාඩ් කොහේද තියෙන්නේ කියලා. මොකද කුර්ආනයේ නම් නැහැ.

ප්‍ර : හරි අපි ඊලඟ එකට යමු?

පි : සහී අල්බුහාරී හදීත් එකක්.

ප්‍ර : දැන් මේත් ඔබ 20 වෙනි slider එකෙනුත් ඔබ පැහැදිලි කරන්න හදන්නේ මේ සිංහලයා ඇතුළු අන්‍යාගමිකයන්ට එරෙහිව සැලසුම් සහගතව කොහොමද මේ ඉස්ලාමික ජිහාඩය ක්‍රියාත්මක වෙන්නේ කියා?

පි : ඉස්ලාමික ජිහාඩය ක්‍රියාත්මක වෙන්නේ අපිට නොදැනුම යටින්.

ප්‍ර : ඔබ ඒ සඳහා තමයි ආගමික මූලාශ්‍රවලින් කරුණු ගෙනහැර පාන්නේ?

Presidential Secretariat
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. ඒකේ කියනවා මොහොම්මද් නබී ප්‍රකාශ කරනවා අල්ලාහ් දෙවියන් හැර වෙනත් කිසිවකුට හෝ කිසිම ආගමකට වැදුම් පිදුම් ලැබීමට අයිතියක් නොමැති බවටත් මොහොම්මද් අල්ලාහ් දෙවියන්ගේ පණිවිඩකරු බවටත් සාක්ෂි දරන බවට දිවුරා සපථ කොට ඒ ෂහාදය කියන ඒ අල්ලාහ් දෙවියන් ඉදිරියේ ගිවිසුමකට බැඳෙනවා ෂහාදය කියලා. අන්න ඒ ෂහාදයේ ඇත්ත වශයෙන්ම තියෙන්නේ අල්ලාහ් දෙවියන් හැර වෙනත් කිසිවෙකුට හෝ කිසිම ආගමකට වැදුම් පිදුම් ලැබීමට අයිතියක් නොමැත කියලා. නමුත් අපේ සාමාන්‍ය ව්‍යවහාරයේදි මුස්ලිම්වරු කියන්නේ ලාහිලාර් ඉල්ලල්ලාහු කියන්නේ අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නැත කියලා. නමුත් මෙතන නබී ප්‍රකාශ කරනවා අල්ලාහ් දෙවියන් හැර වෙනත් කිසිවකුට හෝ වෙනත් ආගමකට වැදුම් පිදුම් කිරීමට අයිතියක් නොමැති බවටත් මොහොම්මද් අල්ලාහ් දෙවියන්ගේ පණිවිඩකරු බවටත් සාක්ෂි දරන බවට දිවිරා සපථ කරන බවට ෂහාදය කියා ඉස්ලාමය වැළඳ ගන්නා තුරු සියළුම අන්‍යාගමික මිනිස්සුන්ට එරෙහිව සටන් කිරීමට අල්ලාහ් විසින් මට නියෝග කොට ඇත. එලෙස මිනිසුන් ඉස්ලාමය වැළඳ ගන්නේ නම් ඔවුන්ගේ ජීවිත සහ දේපල මගෙන් ඝාතනයට පත් නොවී ඉස්ලාමික නීතියට පමණක් යටත්ව බේරා ගත්තා වන්නේ ය. ඉන්පසු ඔවුන් පිළිබඳ විනිශ්චය අල්ලාහ් දෙවියන් විසින් කරනු ඇත. මේක සහසුද්දෙන්ම ඒ හදීත් එකේම නිවැරදි translation එකක්. ඉතින් මෙක මොහොමඩ් නබී ප්‍රකාශ කෙරුවට එයාට අල්ලාහ් කියලා තිබ්බයි කියලා 33 වන ෂූරාවේ 21 වන වගන්තියෙන් කියනවා සියළුම මුස්ලිම්වරු නබිතුමාව පරමාදර්ශී චරිතයක් හැටියට සලකන්න. නබිතුමාගේ ක්‍රියාකාරකම් ඒ විදියටම ඉෂ්ඨ කරන්න. එහෙම කෙරුවාම නබිතුමා කරපු ඒ සුන්නා ක්‍රියාත්මක කරන්න. එතකොට එහෙම කෙරුවාම තමයි ස්වර්ග රාජ්‍යයට යන්න පුළුවන් කියලා 33 වෙනි ෂූරාවේ 21 වෙනි වගන්තියෙන් කියනවා.

ප්‍ර : දැන් ඔය 8, 39 ෂූරාවෙත් සඳහන් වෙන්නෙත් ඒ වාගේම කාරණයක්නේ?

පි : 8, 39 තමයි මම අර මෙතනට එන්න කලින් මුලින්ම සඳහනක් කෙරුවේ අර අන්‍යාගමික භූමියක තියෙන සියළුම ආගම් වාරිත්‍ර වාරිත්‍ර ඒ ස්වදේශික අන්‍යාගමික ජීවන රටාවම විනාශ කරලා ඒ මත ඉස්ලාමය එකම ජීවන රටාව වනතුරු සටන් කරන්න කියලා මුස්ලිම්වරුනට නියෝගයක් දීලා තියෙන සහ එය මුළු ලෝ පුරාම ක්‍රියාත්මක කරන්න කියලා තියෙන නියෝගය නිකුත් වෙන්නේ.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ මේ 8, 39 කියන ශ්‍රාව ඉතාමත් වැදගත්ම ශ්‍රාවක් කිව්වොත් හරිද?

පි : ඔව්.

ප්‍ර : ඒ අනුවද ඉස්ලාමික මේ ලෝකය පුරා ඉස්ලාමය පතුරුවන්න ඕන කියන සංකල්පය ගැබ් වෙන්නේ ඒ ශ්‍රාවෙන් කිව්වොත් හරිද?

පි : ඔබතුමා හරි. ඉබන් ඉෂාක් නබිතුමාගේ චරිතාපදානය by G.Mohomad

ප්‍ර : ඉබන් ඉෂාක් කියන්නේ කවුද මහත්මයා?

පි : ඉබන් ඉෂාක් කියන්නේ Author. නබිතුමාගේ චරිතාපදානය කියන්නේ ඒ පොතේ නම. පිටුව 208 ඒකෙත් මේ ජිහාඩයට සම්බන්ධ දේවල් කොහොමද මේගොල්ලන්ගේ ඉස්ලාමික හැඟීම. මේගොල්ලෝ අපෙන් වහගෙන ඒ අය අතරේ ඉස්ලාමික සමාජය තුල පමණක් පරිශීලනය කරන මේ අදහස් මොනවද කියලා. ඉස්ලාමය ප්‍රතික්ෂේප කරන්නන්ට එරෙහිව සටන් කිරීම සඳහා ඒ කිව්වේ භීෂණය සහ ප්‍රචණ්ඩත්වය ආරම්භ කිරීම සඳහා අල්ලාහ් දෙවියන් විසින් මොහොම්මද් නබිතුමාට 2 වන අඛභාවයේදී 2 වන ප්‍රතිඥාවේදි අවසර දුන් විට අපගේ මූලික ප්‍රතිඥවේ නොතිබූ භීෂණය සහ ප්‍රචණ්ඩත්වය අපගේ 2 වන ප්‍රතිඥාවේ ඇතුලත් විය. දැන් අපි එම නියෝගවලට බැදී සිටිමින් අල්ලාහ් දෙවියන් සහ මොහොම්මද් නබිතුමා වෙනුවෙන් ඉස්ලාමික නොවන සියළුම මනුෂ්‍යයන්ට එරෙහිව එම නියෝග යටතේ සටන් කරන්නට වගකීමෙන් යුතුව බැදී සිටින්නෙමු. අපගේ එම ශක්තිමත් ශ්‍රද්ධාවන්ත සේවය වෙනුවෙන් අල්ලාහ් දෙවියන් අපට ස්වර්ගයේදි අපට බොහෝ ප්‍රධානයන් ලබා දෙන බවට මොහොම්මද් නබිතුමා අපට පොරොන්දු විය.

ප්‍ර : ඒ අනුව මහත්මයාට කියන්න පුළුවන්ද මේ ඔබ විස්තර කරපු කෑල්ලේ තේරුම සරලව කියන්න කොමිෂන් සභාවට?

පි : තව පොඩි කෑල්ලක් තියෙනවා, එබැවින් එම නියෝග කෙතරම් මිලේච්ඡ වුවත් මානව සමාජයන්ට එරෙහිව භීෂණය සහ ප්‍රචණ්ඩත්වයෙන් යුතුව සටන් කරන්නට සම්පූර්ණ කැපවීමෙන් සහ කීකරුකමින් අප අවනත වන වී සිටිමි. දැන් මේ නබිතුමාගේ චරිතාපදානයේ පිටුව 208 වන පිටුවේ මේ සටහන් වෙලා තියෙනවා මේ තමයි මේ ඉස්ලාමික ගමනේදී මේගොල්ලෝ පරිශීලනය කරන ඉගැන්වීම්. මේගොල්ලෝ ඉස්ලාමික සමාජය දුඹුරුපාට කාලපරිච්ඡේදයේ හැඩෙගස්වන ඉගැන්වීම්. මේකේදී මේ ඉගැන්වීම අනුව ඒ අයත් ඒ කියන්නේ මේ වර්ථමාන කාලයේ ඉන්න මුස්ලිම්වරුත් හැඩ ගැසිය යුතු වෙනවා. ඉතින් ඒ ස්වභාවය අනුව කටයුතු කළයුතු වෙනවා. මෙතනදී මනුෂ්‍යත්වයෙන් එහාට

FAIR COMMENT BY JEZEEM

ගිහිල්ලා මේ අය කටයුතු කරන්න පෙළබෙනවා මොකද දැන් කොළපාට කාලපරිච්ඡේදයේදී මේගොල්ලෝ මෙහෙම දේවල් හිතුවේවත් නැහැ. එතකොට නබිතුමාගේ කාලේදීත් එහෙමයි. අර මම කිව්වේ 622 දී කුමන්ත්‍රණයක් කෙරුවා කියලා. අන්න ඒ කුමන්ත්‍රණය තමයි මේ. දෙවන අඛභාව කියන්නේ ඒක. 2 වන ප්‍රතිඥාව. එතකොට ඉතින් මේ ඉගැන්වීම් තමයි අනුගමනය කරමින් මේගොල්ලෝ මේ ස්වදේශික සමාජය විනාශ කරන්න බලාපොරොත්තු වෙන්නේ අපි බලමු

ප : ඔබ ඒ සම්බන්ධයෙන් තව ලේඛනයක් හොයා ගත්තද?

පි : ඔව් වීඩියෝ එකක්.

(මේ අවස්ථාවේදී එම වීඩියෝ පටය තිරයේ ප්‍රදර්ශනය කිරීමට සලස්වයි)

දැන් වේලාව : රාත්‍රී 10.20 යි.

මෙතැන් සිට ල/ලේ :- යමුනා දසනායක මිය විසින්ය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වෙලාව ප.ව. 10.20
පෙර සටහන් ගැනීම ල/ලේ දම්මිකා.
සටහන් ගැනීම ල/ලේ යමුනා දසනායක විසිනි.

උ මොහොමඩ් නබිතුමා කියපු මේවිදියට මිනිසුන් මැරුවහම මේ දේවල් ප්‍රධානය කරනවා කියලා කියපු දේවල් තමයි අර 72 virgins ගැන කියන්නේ

ප්‍ර ඔබ ඒ කියන්නේ විඩියෝ පටයේ සඳහන් වෙන්නේ ?

උ ස්වර්ගයේදි දෙන දේවල් . විශේෂයෙන්ම එතනදී කියන්නේ අර virgins ලා ගැන විතරමයි. දැන් මෙතන එනවා සම්පූර්ණ විස්තරය.

ප්‍ර දැන් ඔබ තවත් එකක් click කරනවා?

උ දැන් මේ මුස්ලිම් අයව ඒකට පොළඹවන්න මේ මරාගෙන මැරෙන්න පොළඹවන්න මොනවද මේ paradise එකේ heaven එකේ දෙන්නේ කියලා මේකේ විස්තරයේ සඳහන් වෙනවා. කුරානයේ 7833 වෙනි වගන්තියේ සටහන් වෙනවා And young full breasted black eyed fair virgins of equal age with whom Muslims can has sex forever. සිංහලෙන් කිව්වොත් කුරානයේ 78 වෙනි සුරාවේ 33 වෙනි වගන්තියෙන් මුස්ලිම් වරුනට කියනවා ඒගොල්ලෝ අල්ලා දෙවියන් කියන විදියට ඒ මාර්ගයේ සටන් කෙරුවොත් ඔවුන්ට ස්වර්ගයට ගියාම තරුණ කන්‍යාවියන් ලැබෙනවා කියලා එකම වයසේ ඒ ගොල්ලෝ කවදාකවත් වයස වෙනස් වෙන්නේ නැහැ හැමදාටම එකම තරුණ වයසේ ඉන්නවා සහ ඒ ගොල්ලොත් එක්ක ලිංගිකව ඕනේ වෙලාවක සහ සදාකල් ඒ ගොල්ලන්ට හැසිරෙන්න පුලුවන් කියලා.

ප්‍ර ඔබ කියන්නේ මෙවැනි කුරාන් වැකියන් යොදා ගන්නවාද මේ අන්‍යාගමිකයන්ට එරෙහිව කරන සටනට මුස්ලිම් ජාතිකයන් පොළඹවා ගන්න ?

උ හරියට හරි.

ප්‍ර ඒ අනුව තවත් ඔබ දැන් පොතක් ගැන සඳහන් කලා මෙම ලේඛණයෙන් ?

උ අනිත් එක මේ හදීත් එකක්

ප්‍ර කුමක්ද ඒ හදීත් එක ?

උ සුනාන් ඉබන්මජා ඒකේ තියෙනවා Abu Umama narrated මේකේ කියනවා Prophet Mohammed ප්‍රකාශ කරනවා heaven එකට ස්වර්ගයට දෙවියන් වහන්සේ විසින් ස්වර්ගයට ගන්න හැම මුස්ලිම් වරයෙකුටම virginsලා 72ක් ලැබෙනවයි කියලා ඒවගේම ඒ ගොල්ලෝ හැම කෙනකුටම ආකර්ශණීය ලිංගික අවය සහ ඒ පිරිමින්ට සදාකල් ප්‍රාණවත් පුරුෂ ලිංගයක් ලැබෙනවා කියලා

FAIR COMMENT BY JEZEEM

ප්‍ර තව මොනවද ඒකේ සඳහන් වෙන්නේ ?

උ තව තියෙනවා ඉමාම් අල් සුයිටි අර verginsලා හැම වෙලාවේම මේගොල්ලොත් එක්ක ලංගිකව එකතුවුනාට ඒ ගොල්ලෝ ආපහු verginsලා වෙනවා ඊට පස්සේ ඒ ගොල්ලන්ගේ පුරුෂ අවයවය ඒ ක්‍රියා කර්මයෙන් පස්සේ ඒක ප්‍රාණවත් වෙලාම තියෙනවා. ඒවගේ සහ එයා සදාකල්. ඒ ප්‍රාණවත් වීම සදාකාලයටම තියෙනවා. සදාකාලික ජීවිතයක් දෙනවා කියලා පොරොන්දු වෙනවා ස්වර්ගයේ ඉතින් මේ විදියට තමයි මේ ගොල්ලන්ව පොළඹවන්නේ .

ප්‍ර ඒ කියන්නේ මේ සරලවම කියනවා නම් ස්වර්ගයේ තමන්ට විදින්න තියෙන සැප ගැන තමයි මේ සඳහන් කරන්නේ.

ප්‍ර ඊට පස්සේ තියෙනවා කුරානයේ 56 සහ 57 වගන්ති දෙකට එක ඒනාබද්ද කරලා තියෙනවා ස්වර්ගයේ ඉන්නවයි කියලා කන්‍යාවියෝ කවදාකවත් ඒ අයව අපි මුස්ලිම් අය එනකල් බලාගෙන ඉන්නවා ඒ කන්‍යාවියන්ව එහේ ඉන්න දෙවියන්ගේ සේවකයන් හරි කව්රු හරි අතවත් තියලා නැහැයි කියලා. ඊට පස්සේ 78 වෙනි සුරාවේ 31 වෙනි වගන්තියෙ ්තියෙනවා "ශ්‍රද්ධාවන්ත මුස්ලිම් වරුන්ට ඒගොල්ලෝ අනිවාර්යයෙන්ම ඒ ගොල්ලෝ ජයග්‍රහවය කරනවාකියලා ඒ ගොල්ලෝ ස්වර්ගයට ගෙනියනවා කියලා මිදිවතු සහ virgins ලා කන්‍යාවියෝ ඒ ගොල්ලන්ට ලැබෙනවයි කියලා. ඊට පස්සේ තව තියෙනවා කුරානයේ ගොඩාක්තැන්වල සටහන් වෙනවා .

ප්‍ර මේ තියන කුරාන් වැකිවල සඳහන් වෙන්නේ ?

උ virgins ලා ලැබෙනවයි කියලා ඊට පසසේ වයින් පවා offer කරලා තියෙනවා කුරානයේ 4715 කියනවා ඒ ගොල්ලන්ට වයින් ගංගාවක් ලැබෙනවයි කියලා තව තැනක තියෙනවා ඉහුරුත් සමඟ වයින් ලැබෙනවා කියලා ඒ වගේ තියෙනවා . ඉතින් මේ හැමදේම ඒගොල්ලන්ට ලැබෙනවා කියන එක කියනවා.

ප්‍ර ඉතින් ඔබ මුස්ලිම් රාජ්‍යයක ජීවත් වෙන පුද්ගලයෙක් විදියට ඔබ දන්නවා නේද සාමාන්‍ය ඉස්ලාම් බැතිමතෙක්ට මේ වයින් පානය කිරීම එහෙම නැත්නම් ඇල්කොහොල් පානය කිරීම හරාම් වෙනවා කියලා. මේක හෙවත් එකේදි එහෙම ප්‍රශ්ණයක් වෙන්නේ නැද්ද දිව්‍ය ලෝකේදි.?

උ ඔව් ඉතින් එතනත් තියෙන්නේ contradictory situation එකක්. නමුත් ඔබ කියපු හරාම් කියපු දේ කුරානයේ එහෙම කරලා නැහැ ඇත්ත වශයෙන්ම අපි ගැඹුරින් අධ්‍යයනය කෙරුවහම තේරෙනවා මුස්ලිම්වරුන්ට වයින් හරාම් කරලා නැහැ. දෙවනි සුරාවේ 219 වෙනි වගන්තියෙන් කියනවා alcohol මධ්‍යසාර පිරිමින්ට ලාභයකුත් පාඩුවකුත් සිද්ධ කරනවා කියලා ඒ කියන්නේ පාපයයි හොඳ දේ

FAIR COMMENT
BY JEZEEM

benefit එකයි දෙකම තියෙනවා ඒ හින්දා හරියට ඒක කල්පනාවෙන් බලලා ඒක කරන්න කියලා එතකොට 4 වෙනි සුරාවේ 34 වෙනි වගන්තිය මට මතක විදියට 4 වෙනි සුරාවේ ඒක එන්නේ 34 වෙනි වගන්තිය වෙන්න ඕනේ ඒකේ තියෙනවා මුස්ලිම් වරුන්ටඅණකරලා ඔබලා මත් වෙලා මධ්‍යසාරය බීලා මත්වෙලා ඉන්නකොට Mosque එකට එන්නඑපා කියලා එතකොට 5 වෙනි සුරාවේ අවසාන නියෝගයේ අවසානවගන්තියේ තියෙන්නේ කුරානයේමධ්‍යසාරය සම්බන්ධයෙන් 45 වෙනි සුරාවේ 90 වෙනි වගන්තිය ඒකේදි කියනවා මධ්‍යසාරය යනු සාතන් ගේ ක්‍රියාවකි. ඒ හින්දා බොහොම ප්‍ර වේසම් වෙන්න ඒක පුලුවන් නම් avoid කරන්න කියලා.

ප්‍ර ඒ කියන්නේ මධ්‍යසාර මේ සාතන් නැමති යක්ෂයාගේ ?

උ හරාම් කියලා වචනයක් පාවිච්චි කරලා නැහැ.

ප්‍ර යක්ෂයාගේ එකක් කියලා ?

උ අන්න හරි.

ප්‍ර සාතන්ගේ දෙයක් කියලා එහෙම තියෙන්නේ ඇයි කියලා අහන එක අපි සන්ධර්භයට ගියොත් ඒ කාලේ නබි තුමා සහ ඔහුගේ සගයින් මේ මත්පැන් පානය කරලා තියෙනවා 624 වසර වෙනකල් මත්පැන් පානය කරලා තියෙනවා 624 වෙනිවසරේ තමයි මේ ගොල්ලෝ යුද්ධ කරන්න පටන් ගත්තේ 24 , 25දි තමයි මේක මටමතක විදියට25 දි 625 දි තමයි මේ විදියට ඒක restriction එකක් එන්නේ මොකද යුද්ධ කරන්න යනකොට මේ ගොල්ලෝ බීලා බීලා වැටිලා ඉන්න කොට යුද්ධ කරන්න බැහැනේ . ඔන්න ඒවගේ දෙයක් හින්දා තමයි මේක ඒ විදියට දෙවියන් වහන්සේ නියෝග කරලා තියෙන්නේ .

ප්‍ර අපි ඊලග?

උ ඊට පස්සේ ආපසු හදීත් එකක් මොහොමඩ් නබි තුමා දේශනා කරනවා අන්‍යාගමිකයන්ට එරෙහිව සිදුකරන ප්‍රචණ්ඩත්වය සහ භීෂණය මඟින්මා ජයග්‍රහණය ලැබුවා කියලා. එතකොට මේක ආගමික ඉගැන්වීමක් මේක famous ඉගැන්වීමක් මේක එතකොට මේවා තමයි මේ කාල පරිච්ඡේදයේදි මුස්ලිම් ජිහාඩින්ට උගන්වන්නේ. මේවා ඉස්කෝලේ උගන්වන්න බැහැනේ මද්‍රසා වල උගන්වන්නේ මේවා තමයි . මේ අනුව ඒ ගොල්ලෝ විශ්වාස කරනවා අන්න ඒ ගොල්ලන්ගේ ජයග්‍රහනය ඉස්ලාමයේ ජයග්‍රහනය රදා පවතින්නේ අන්‍යාගමිකයන්ට එරෙහිව කරන ප්‍රචන්ඩත්වය සහ භීෂණය හරහා කියලා

ප්‍ර දැන් ඒනනේ 22 වෙනි slide එකට ?

Project Secretary Copy

FAIR COMMENT — BY JEZEEM —

උ 8 වෙනි සුරාවේ65 වෙනි වගන්තියෙහි කියනාව ඕ නබියනි අන්‍යාගමිකයන්ට එරෙහිව ගැටුම්සඳහා මුස්ලිම්වරු උනන්දු කරවන්න කියලා ගැටුම් සඳහා උනන්දු කරවන්න කියලා කියනවා.

මේ ලින්ක් එකක් ක්ලික් කරනවා බලන්න හිස්බුල්ලා .

ප මොකක්ද මේ ලැබෙන්නේ ?

උ ඇමති හිස්බුල්ලා 2016 වසරේදි මේකත් මම note කරපු දෙයක් මේ මම මේකෙනුත් මම එදා අවබෝධ කර ගත්තා මේ ගොල්ලන්ගේ මේ වැඩ සටහන ඒ කියන්නේ ජිහාඩය

ප මුලින්ම කියන්නකෝ මේ කොහේ පල වෙච්ච පුවතක්ද?

උ මේක 2016 දෙසැම්බර් 14 වෙනිදා මොහු මෙතන ප්‍රකාශ කරනවා

ප ලංකා සිනිව්ස් වෙබ් අඩවියේද ?

උ මේක ලංකා සී නිව්ස් .

ප මොනවද එහි දි සඳහන් වෙන්නේ මෙයාමේ සඳහන් කරනවා මොකද ඒ දවස්වල අර අලුත්ගම සිද්ධියෙන් පස්සේ මුස්ලිම් අය ඉස්ලාමය ගැන බොහොම කතිකාවතත් ඇතිවුනා අපේ රටේ. ඉතින් ඒ කතිකාවේදි හුඟක් විවේචනයක් එල්ල වුනා මුස්ලිම් සමාජයට අන්න ඒක පාදක කරගෙන දඩමීමා කරගෙන මෙතුමා අර එතුමාලගේ අංගය ඒ කියන්නේ අනිවාර්ය කරපු ජිහාඩය ගැන පොඩි ඉඟියක් එල කරනවා එයා කියනවා මෙරට තුල දිගටම ඉස්ලාම් ආගමට සිදු කරන අපහාස නතර නොකරන්නේ නම් මුස්ලිම් තරුණයින් ආයුධ ගැනීම වැලැක්වීමට කිසිවෙකුට නොමැති බව රාජ්‍ය අමාත්‍ය එම්. එල්. එම්. හිස්බුල්ලා මහතා පවසයි. එහෙම කියලා කියනවා . ඉතින් මේ ගොල්ලෝ මේ අපේම රජයේ ඉඳගෙන කැත මුස්ලිම් වරුන් විග්‍රහ කරන කොට කිව්වා වගේ මේ ගොල්ලෝ මේ හැම දෙයක්ම බුක්ති විදගෙන මේ විදියට කටයුතු සිද්ධකරනවා මේ ගොල්ලෝ දන්නවා මේ ජිහාඩ් attack එක ප්‍රහාරය මග එනවයි කියලා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප සාක්ෂිකරු ඒඔබ පෙන්නපු ඒ ප්‍රවෘත්තිය එම ඇමතිවරයා කරලා තියෙන්නේ ගලබොඩ ඥාණසාර හාමුදුරුවන් විසින් කරපු ප්‍රකාශයක් සම්බන්ධයෙන්නේද ?

උ ඔව් සර්.

ප දැන් ඔබ කියන විදියට මේ ඉස්ලාම් ආගමේම මේ සියලු ක්‍රියාකාරකම් තියෙනවා නම් අන්‍යාගම්වලින් මුස්ලිම් ජන කොට්ඨාශ වෙත යම් කිසි කතරන ප්‍රකාශ මගින් එම ක්‍රියාදාමය ඉක්මන් වෙන්න පුලුවන් ද ?

FAIR COMMENT — BY JEZEEM

උ මෙහෙමයි ඒක එහෙම ඒකෙන් ස්වදේශික අන්‍යාගමික සමාජය විසින් කරන ප්‍රකාශ තුලින් ඒ ගොල්ලන්ට ඉක්මන් වීමක් සිද්ධ වෙන්න පුලුවන් ඒක කිරලා මැනලා බලන කොට අපිට ඒ ගොල්ලන්ගේ ගමන ගැන ඉක්මනින් අපේ සමස්ත සමාජයට මේ අවබෝධයක් එයි කියලා හැඟුනොත් ඒ කරන ප්‍රකාශ හරහා ඒ ගොල්ලන්ව like ඒ ගොල්ලන්ව expose වෙයි කියලි ඒ ගොල්ලන්ගේ ගමන expose වෙයි කියලා අන්න ඒ වගේ අවස්ථාවක ඒගොල්ලන් ඉක්මන් වෙන්න පුලුවන් එහෙම නැතුව කව්රුත් කියපු පලියට ඒ ගොල්ලෝ එහෙම කරන්නේ නැහැ හේතුවක්නැතුව.

ප්‍ර මම ප්‍රශ්ණය කෙලින්ම අහන්නම්කෝ ඔබගෙන් ?
ගලබොඩවත්තේ ඥාණසාර හාමුදුරුවෝගේවාග් මාලාව ඔය කියන ඉස්ලාම් අන්තවාදි ක්‍රියාවන්ට උපකාරයක් වෙනවාද නැද්ද ?

උ ඒ ගොල්ලන්ට උපකාරයක් වෙන්න පුලුවන්.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංගබංඩාර මහතා.</u>

ප්‍ර අපි ඊලඟ කරුණ පැහැදිලි කිරිමට යම්?

උ කුරානයේ 8 වෙනි සූරාවේ 12 වෙනි වගන්තිය මේක මං ගෙනාවේ විශේෂ හේතුවක් නිසා මේකෙන් disclose ඇයි මෙහෙම කරන්නේ කියන එක ඒ ගොල්ලන්ට ඇත්තටම කියනවා නම් කට උත්තර නැති වෙන තැනකට එනවා මේ වාක්‍ය දෙක නිසා කුරානයේ 8යි 12 දි කියනවා අනිවාර්යයෙන්ම මම ඒ කියන්නේ අල්ලා ඔබ සමඟ සිටිමින් ඉස්ලාමය විශ්වාශ නොකලවුන්ගේ හදවත් වලට භීතිය ඇතුළු කරන්නෙමි. එබැවින් නුඹලා ඔවුන්ගේ බෙලි කපන්න , ඔවුන්ගේ සියල්ලම ඇඟිලි කපා දමන්න කියලා කියනවා එතකොට ඊට පස්සේ වගන්ති ය කියනවා ඒකට හේතුව ඒකට හේතුව නම් එසේ අන්‍යාගමිකයන් ඝාතනය කිරිමට හේතුව අන්‍යාගමිකයන් විසින් අල්ලාව සහ නබිතුමාව විශ්වාස නොකර ප්‍රතික්ෂේප කිරීමයි. කිසිවකු විසින් අල්ලාව සහ නබි තුමා ව විශ්වාශ නොකරන්නේ නම් සහ ප්‍රතික්ෂේප කරන්නේ නම් අනිවාර්යයෙන්ම ඔවුන්ට එරෙහි දඩුවම් දරුණු වන්නේය. දැන් අරමවුලවි තුමා කියන විදියට එතුමා කියන විදියට මේ ඒ මුස්ලිම් අන්තවාදියෝ මේවා ඔක්කෝම misinterpret කරගෙන misunderstand කරගෙන කරන්නේ සහ ඒ ගොල්ලන්ම කියන විදියට මේවා එහෙම ඒ ක්‍රියාකාරකම් ඉස්ලාමයේ තියෙන්නේ අර යුධමය වාතාවරණයක් තුලඒය කියලා කියනවා . යුදමය වාතාවරණයක් තුල තියන ක්‍රියාකාරකම් ගැන එයා 09 සූරාවේ 5 වෙනි වගන්තිය ගැන පැහැදිලි කිරීම කරනකොට කියනවා එහෙම යුද වාතාවරණයක් තුලදි තමයි මේක එහෙම වගන්තිය ක්‍රියාත්මක

FAIR COMMENT BY JEZEEM

කරන්නේ කියලා නැහැ මේකේ පැහැදිලිවම තියෙනවා එහෙම බේලි කපන්නයිඇඟිලි කපන්නයි කියන්නේ අන්‍යාගමිකයන් විසින් අල්ලාව සහ නබිතුමාව විශ්වාස නොකරන ප්‍රතික්ෂේප කිරීමයි කියලා. ඒ ගොල්ලෝ කියන විදියට අන්‍යාගමිකයෝ යුද්ධ කරන්න ආපු නිසා නෙමෙයි. එයා පැහැදිලිව කියනවා නේ එහෙම කලේ ඒමුස්ලිම්වරුන්ට එරෙහිව යුද්ධකරපු නිසා කියලා . දැන් මෙතනින් ඔප්පු වෙනවානේ එහෙමමුස්ලිම් වරුන්ටඑරෙහිව යුද්ධ කරපු නිසා නෙවෙයි මේ බෙල්ලකපන්නයි ඇඟිලිකපන්නයි කියලා පැහැදිලිවම තියෙනවා නේ අපිඒ අයව විශ්වාශ නොකරන නිසා තමයි එහෙම කරන්නේනමුත් එයා තව point එකක් ගන්නවා මේ අර්ථය දැන් මාධ්‍යවේදියාට කියනවා ඔයා අන්‍යාගමිකයන් මගේ ඉස්සරහ ඉන්නවා ඔයා මගේ බෙල්ල කපන්න ඕනේ එහෙම වෙන්නේ නැහැ. එහෙම කරන්නේ නැහැ මේ ජිහාඩය ඉස්සරහට යන ගමන් තමයි ඕක එහෙම කරන්නේ ඒ ගොල්ලෝබලවත් වෙලා එහෙම තමයි ප්‍රහාරයක් කරන්නේ මාධ්‍යවේදියෙක් මරන්නේ නැහැනේ එතෙන්ට ආවාට.

ඉතින් එයා නිකම් ඒක සාධාරණීය කරණය කරන්න ඒ වගේ point එකක් ගන්නවා . කුරානයේ 4735 ඒකම ShariyaReliance of the travellingShriya එකේපිටුව 605 වෙනි එකේ තියෙනවා So do not be faint hearted and call for peace when it is Muslims who are the upper most. ඒ ගොල්ලෝ ශක්තිමත් ස්ථානයක ඉන්නකොට ඒ ගොල්ලොන්ට කියනවා සාමය වෙනුවෙන් අන්‍යාගමිකයොත් එක්ක සාමය වෙනුවෙන් කටයුතු කරන්න එපා කියලා . කුරානයේ දෙකයි 193 නියෝගයෙන් කියනවා තවද, ස්වදේශික අන්‍යාගමිකයෝ භූමිය තුල ඉස්ලාමයට පටහැනි සියලුම දේ 8 වෙනි සූරාවේ 39 වෙනි වගන්තිය තිබ්බා වගේ අල් ෆිත්නා

ප්‍ර තේරුම කියන්නකෝ මහත්මයා ?

උ එකෙත් කියන්නේ 8 වෙනි සූරාවේ 39 වෙනි වගන්තිය වගේමඅපෙත් ඒ දේවල් ස්වදේශික අන්‍යාගමික සියලු දේ ඒ ගොල්ලන්ගේ උරුමයන් ජාතික උරුමයන් අතීත උරුමයන් ඒ ගොල්ලන්ගේ ආගම් හැමදේම විනාශ කරන්න විනාශ කරලා සහ ඉස්ලාමයේ ගමන් මඟට බාධා කරන ඔවුන්ගේ සියලු ආකාරයේ බලපෑම් විනාශ කොට භූමියෙන් අතුගා දමන තුරු ඉස්ලාමයෙන් පමණක් භූමියේ එකමආගම සහ ජීවන රටාව ලෙස ස්ථාපිත වන තුරු ඔවුන්ට එරෙහිව සටන් කරන්න එතෙන්දි කියනවා ඔවුන් අතරින් තම ආගම අතඑැර දමන්නෝ වෙත්නම් එවැනි අයට එරෙහිව ක්‍රියා නොකරන්න කියලා. ඒ කියන්නේ අපි ඉස්ලාමය වැළඳ ගන්නවා නම් ඒඅයව මරන්න එපයි කියලා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර මේ 8 වෙනි සුරාවේ 67 වෙනි වගන්තිය තියෙනවා It is not for a prophet he should have prisoners of war until he had made a great sloter in the land. මෙන්න මේක ගැන තමයි මම කිව්වේ මේ සන්දර්භය සහ අර්ථ විග්‍රහයට ගියාම තමයි මම තේරුම් ගත්තේ ඒ ගොල්ලන්ගේ මේ ජිහාඩය 8 වෙනි සූරාවේ 67 වෙනි වගන්තිය නිකුත් කරන්නේ බදර් සටනේදි බදර් සටන තමයි පලවෙනිම battle එක පලවෙනිම ජිහාඩ් battle එක. එතකොට ඒකේදි තමයි මේ දෙවියන් වහන්සේ කියන්නේ මොකද මේ ඒ ගොල්ලෝ වෙනත් කාරණාවක් හින්දා ඒ ගොල්ලන්ට මරන්න බැරි වෙනවා ලොකු ගානක් ලොකු සංහාරයක් කරන්න බැරිවෙනවා එතනෙදි දෙවියෝ කියනවා උඹ වැරැද්දක් කෙරුවේ මීට පස්සේ මේ මෙහෙම මේ වගේ අවස්ථාවකදි මහා සංහාරයක් කල යුතුයි කියලා.

ප්‍ර දැන්ඔබ මේ ඉදිරිපත් කරන මේසියලුම කුරාන සහ හදීද් පාඨ වලින් දැක්වෙන්නේ මේ අර දෙවන කාල පරිච්ඡේදය තුල ?

උ ඔව්.

ප්‍ර ඒ කියන්නේ මුස්ලිම් ආගමක ඉස්ලාම් භක්තිකයන් යම්කිසි බලයක් ලබාගත්තායින් පස්සේ ඔවුන් ක්‍රියා කලයුතු ආකාරය දැක්වෙන පාඨයන් කිව්වොත් හරි. මෙතනදි දැන් අපිහිතමුකෝ අපි අර මවුලවි ගෙන් ඇහුවාකියලා යමක් එතකොට මවුලවි අපිව confuse කරනවා අපිව කොලපාට පරිච්ඡේදයට ගෙනිහින්.අන්න එතෙන්දි අපි ප්‍ර වේසම් වෙන්න ඕනේ. ඒ ගොල්ලෝ කිව්වොත් කොල පාට පරිච්චේදයේ ඉගැන්විම් මෙතෙන්ට මේ mixup කෙරුවොත් අපි කියන්න ඕනේ නැහැ අපි කතා කරන්නේ දැන් මේ තත්වය තුල කියලා

ප්‍ර ඒ කියන්නේ ඔවුන්ට යම්කිසි අභියෝගයක් එල්ල වෙන කොට ඔවුන් පෙන්වන්නේ කොලපාට පරිච්චේදය එහෙම නැත්නම් දුඹුරු පාට පරිච්චේදය.?

උ ඔව්.

ප්‍ර ඔබ දැන් මේ පරිච්චේදය දැන් මේ හා සාමනම වැකිද තියෙන්නේ නැත්නම් විශේෂිත වැකියක් තියෙනවාද තව?

උ අපි එතනින් ඒක ඉවරයි ජිහාඩයටම සම්බන්ධයි නමුත් මේ ගොල්ලෝ කියනවානේ අර මවුලවිම කිව්වා ඉස්ලාමයේ suicide කරගන්න බැහැයි කියලා ඒක තහනම් කියලා ?

ප්‍ර ඔව්.

උ දැන්අපි එන්නේ එතෙන්ට අනාගාගමිකයන් ඝාතනය කරමින් තමන්ගේ ජීවිතය පුද කිරිමේ ඉස්ලාමික කුසල කර්මයක් කුරානයේ 9. 88 කියනවා නබි තුමා සහඅල්ලා දෙවියන් සහ ඉස්ලාමය විශ්වාස කල ඔහුගේ අනුගාමිකයන් විසින් ස්ථීර අධිෂ්ඨානයෙන් යුතුවතම ජීවිතය සහ දේපල

FAIR COMMENT BY JEZEEM

කැපකොට අල්ලාගේ අරමුණු එනම් අන්‍යාගමික සමාජයන් විනාශ කොට එම භූමිය සහ එහි සියලු සම්පත් අත්පත් කර ගැනීමේ ක්‍රියාදාමය ස්ථාපිත කිරීම උදෙසා අන්‍යාගමිකයන්ට එරෙහිව ඉතා දරුණු ලෙස ක්‍රියාත්මකවෙමින් ඒ කිව්වේ ජිහාඩ් කල කෝලාහල හරහා පහර දුන්නෝය. මුස්ලිම් වරු සඳහා වන ශ්‍රද්ධාවත හොඳ ක්‍රියාකාරකම් එනම් කුසල කර්මයන් වනාහි එවැනි ක්‍රියාකාරකම්ය. එවැනි ක්‍රියාකාරකම් වල යෙදෙන්නන් සාර්ථක ජයග්‍රාහී මුස්ලිම් වරුන් වන්නේය.

ප්‍ර මෙහි තියෙනවා තම ජීවිතය කැප කොට අල්ලා ගේ ආගම වෙනුවෙන් ක්‍රියා කරන්න කියලා ඒක ද ඔබ ඔය කියන්නේ ? මේ suicide කියන concept එකක් තියෙනවා කියලා.?

උ ඔව් එතන suicideconcept එක තියෙනවා තම ජීවිතය සහ දේපල කැප කොට එතකොට 4වෙනි සූරාවේ 74 වෙනි වගන්තියෙත් කියනවා ස්වර්ගය ජීවිතය වෙනුවෙන් මෙලොව ජීවිතය පුදන්න න් අල්ලාගේ මාර්ගයේ යුද්ධ කල යුතුයි.ඔවුන් අල්ලාගේ මාර්ගයේ යුද්ධ කරමින් ඒ කියන්නේ අන්‍යාගමිකයන් ඝාතනය කරමින්මරුමුවට පත්වීද නැත්නම් ජයග්‍රහනය කරමින් පණපිටින් අන්‍යාගමිකයන් ඝාතනය කර යහතින් පැමිණියද අල්ලා විසින් ඔහුට නියත වශයෙන්ම ඉතා වටිනා ත්‍යාගයන් ලබා දෙනු ඇත. කියලා එතනත්.

ප්‍ර දැන් ඒ කියන්නේ මහත්මයා මේ කුරානයේ 9- 88 සූරාව සහ 4-77 සූරාවන් අනුව අල්ලා දෙවිදුන් වෙනුවෙන් තමන් ගේ ජීවිතය suicide බෝම්බ කෙනෙක් විදියට ස්වයං ඝාතකයෙකු වශයෙන් තමන්ගේ ජීවිතය නැති කර ගැනීමත් ඉතා අනර්ඝ කුසලයක්. ඔබට දිව්‍යලෝකේදි යම්කිසිත්‍යාග ලැබෙනවා එසේ කලොත්.

උ බොහොම හරි.

ප්‍ර ඒ ස්ථාවරය හරිද ?

උ හරි.

9 වෙනි සූරාවේ 111 වෙනි වගන්තිය සත්‍ය වශයෙන්ම මුස්ලිම් වරුන්ගේ මෙලොව ජීවිතයද, ඒ කිව්වේ ඒ ගොල්ලන්ගේ ප්‍රාණය ඔවුන්ගේ සියළු වස්තුවද ඒ කිව්වේ දේපල , සහ ඔවුන්ගේ ජීවිත සමඟ බැඳි ඇති සියලු වටිනා දේද ඒ කිව්වේ භාර්යාව සහ දූ දරුවන් අල්ලා විසින් ඔවුන්ට ස්වර්ගයේ සදාකාලික ජීවිතය දෙන බව පවසා අල්ලා විසින් මිලයට ගත්තේය. එබැවින් ඔවුන් අල්ලාගේ නියෝග පිළිපදිමින් අල්ලාගේ මාර්ගය සටන් කර අන්‍යාගමිකයන් ඝාතනය කරන්නේය. එසේම ඔවුන්ද ඒ කිව්වේ මුස්ලිම් වරයාද ඝාතනය කරන්නේය they killed and are killed .ඒක එහෙමම තියෙනවා ඒ නියෝගයේ එය අල්ලා විසින් තව්රාතේද බයිබලයේද සහ කුරානයේද පොරොන්දු දේ තමන් කෙරෙහි මුස්ලිම්වරු බන්ධනය කරගෙන ඇත්තේය. අල්ලාට

FAIR COMMENT — BY JEZEEM —

වඩා පොරොන්දු පූර්ණ වශයෙන් ඉටුකරන්නා කවරෙක්ද එබැවින් ඔබලා අල්ලා සමඟ ඇති කරගත් මෙම ව්‍යාපාරය ගනුදෙනුව එතන තියෙන්නේ transaction කියලා ගැන උදම් අනන්න නියත වශයෙන්ම එය ඔබලාගේ උත්තරිතර ජයග්‍රහනය වන්නේය. කියලා කියනවා.ඉතින් මෙතන පැහැදිලිවම suicide attack කරන්න කියලාම තමයි කියන්නේ.

ප්‍ර ඊලඟ සංකල්පයට ගියොත්?

උ ඊට පස්සේ .

ප්‍ර මෙහි දැක්වෙන්නේ suicide කර ගැනීමේ අනුබලදෙනකුරාන පාඨය කිව්වොත් හරි ?

උ ඔව්.

ප්‍ර විශේෂ යමක් තියෙනවාද නැත්නම් අර පාඨ වල අන්තර්ගතයමද තියෙන්නේ ?

උ නැහැ මට කලින් එක මට ගේන්න වුවමනා වුනේ ඉන්සාෆ් සහඑයාගේ සහෝදරයා මේක තනිකරම මේකමයි ඒ ගොල්ලෝ අනුගමනය කලේ.

ප්‍ර ඔබ කොහොමද එහෙම කියන්නේ ?

උ එහෙම කියන්නේ ඒ ගොල්ලන්ගේ වටිනා ජීවිත ඒ ගොල්ලන්ගේ දේපල එතකොට ඒ ගොල්ලන්ගේ භාර්යාව සහ දූ දරුවන් ඒ ඔක්කෝම අයින්කරලාදාලා අල්ලා වෙනුවෙන් එයා suicide කලා . ඉතින් එයා බලාපොරොත්තු වෙනවා අර කියපු විදියට ස්වර්ගයේදි ඔය දේවල් සදාකාලිකවම ලැබෙයි කියලා.

ප්‍ර සදාකාලිකවම බලාපොරොත්තු වෙනවා ?

උ ඔව්. ඊට පස්සේ මෙතනදි මේක ටිකක්වැදගත් වාක්‍යයක් . මෙතනදි දැන් මුස්ලිම් සමාජයට ජිහාඩයට එන්න කියලා සමහර අය එන්නේ නැති වෙන්න පුලුවන් අපි බලමු ඒ ගොල්ලන්ට කොහොමද ඉස්ලාමය සලකන්නේ කියලා . 48 , 17 වෙනි වගන්තිය අන්‍යාගමිකයන් විනාශ කිරීම සඳහා ඉදිරිපත් වි සටන් කිරීමට නොයාම පිළිබඳව අන්ධයන් කෙරේ කිසිම වරදක් නැත. කොරුන් ,බිහිරන්, අබ්බගාතයන් සහ ලෙඩුන් කෙරෙහිද වරදක් නැත. අල්ලා සහ මොහොමඩ් ගේ නියෝග වලට කීකරුව අ අන්‍යාගමිකයන් විනාශ කිරීමට සටනට යන සියලුම දෙනාට අල්ලා විසින් දිය දහරා ගංගාවල් සදාකාලයටම ගලා යන ස්වර්ග රාජ්‍යයට ඇතුල් කරනු ඇත. කිසිවකු අල්ලා ගේ සහ මොහොමද් ගේ නියෝගවලට අවනත නොවිඅන්‍යාගමිකයන් විනාශ කිරීම සඳහා සටනට යාම ප්‍රතික්ෂේප කරන්නේද ඔහුට අල්ලා විසින් ඉතාමත් දරුණු ලෙසින් වේදනා ගෙන දෙමින් කුරිරු දඩුවම් දෙන්නේය. කියලා warn කරනවා ඒ මුස්ලිම් අයට මේ ජිහාඩ් වලට සහභාගිවුනේ නැත්නම්.

FAIR COMMENT — BY JEZEEM —

ප ඒ කියන්නේ ජිහාඩ් වලටසහභාගි නොවීමත් අකුසල ර්මයක් මේ ?

උ පාපයක් දඩුවම් ලැබිය හැකි පාපයක් .

ප මේ කුරාන පාඨයට අනුව ?

උ ඔව්.

ප එතකොට 4 වෙනි සුරාවේ 95 තියෙනවා ඒකේ කියන්නේ දැන් ගෙදර අන්‍යාගමික්යන් ඝාතනය කරන්න සහ කල කෝලාහල වලට සහභාගි වෙන මුස්ලිම් වරයායි ගෙදර ඉදගෙන ඉන්න මුස්ලිම් වරයායි සමාන නැහැ කයලා ඒ ගෙදර ඉන්න මුස්ලිම්වරයාට වඩා දහස් ගුණයක ත්‍යාග අර අන්‍යාගමිකයන් ඝාතනය කරන්න සහ ඒ කලකෝලාහල වලට සහභාගිවන මුස්ලිම් වරයාට ස්වර්ග රාජ්‍ය යේදි අල්ලා විසින් ත්‍යාග පිරිනමනවා කියලා තමයි මේකේ කියන්නේ. එතකොට ඒකෙන් පොළඹවනවා ගෙදර ඉන්නේ නැතුව .

ප අල්ලා වෙනුවෙන් සටන් කරන්න ?

උ අන්න හරි.

ප ඉබන් ඉෂාක් ගේ අර නබි තුමාගේ චරිතාපදානය පිටුව300 ඒකේ ඉගැන්වීමක් තියෙනවා මම අල්ලා දෙවියන් වෙනුවෙන් සටන් කරමි එය ආගමානුකූලව ශ්‍රද්ධාවන්ත හොඳ මුස්ලිම්වරයෙකු සදහා වන උත්තම වූ කුසල කර්මයකි.අල්ලා දෙවියන් වෙනුවෙන් කරන සටනේදි මම අන් අය මෙන් බිය නොවන්නෙමි. මන්ද මෙම සටන ශුද්ධවූ යහපත් හොඳ ක්‍රියාවක් බැවිනි.

ප මේ slide එකෙන් කියන්න බලාපොරොත්තු වෙන දේ සරලව කිව්වොත් ?

උ සරලව කිව්වොත් මේ ජිහාඩය අපිට එරෙහිව මේ ගොල්ලෝ ක්‍රියාත්මක කරන්න බලපොරොත්තු වෙන ජිහාඩයේ ඒ මුස්ලිම් වරුන්ගේ මනස හදන විදිය ඒ ගොල්ලන් මොන විදියේ මනසකින්ද අපේ සමාජය විනාශ කරන්න එන්නේ.නිකම් එනවානෙමේ මෙන්න මේ මනස මෙන්න මේ වගේ මනසකින් තමයිමේ ගොල්ලෝ එන්නේ එතකෙතාට ආපහු ඉබන් ඉෂාක් ගේ පිටුව 587 නබිතුමාගේ චරිතාපදානය සිංහලෙන් කියනවා නම් අපේ මේ සටන දුර්වල ආපහු හැරෙන එක්ක නෙමේ අපි ජීවත් වෙලාඉන්න තාක් කල් අපි මේ සටන ගෙනියනවා අපි නුඹලා ඉස්ලාමියට හැරෙන තාක් දක්වා මේ සටන ගෙනියනවා නුඹලා දුර්වලාවෙලා බැගෑපත්වෙන තත්වයට එනකල් අපි මේ සටන ගෙනියනවා කියනවා අපි මේ සටන කරනවා කව්රු මොනවා ඉදිරියේ වුනත් මොන බාධකතිබුනත් අපි මේ සටන ඉදිරියට ගෙනියනවා .

ප මෙහි සඳහන් වෙන්නේ මේ අල්ලා දෙවිඳුන් වෙනුවෙන් අන්‍යාගමිකයන්ට එරෙහිව කරන සටනේ තිබෙන උත්තරීතර භාවය?

Presidential Secretariat Copy
FAIR COMMENT — BY JEZEEM —

උ කුරිරුභාවය එගොල්ලෝ එන්නේ රාක්ෂ වේශයකින් එන්නේ . ඉතින් මේකේ තියෙනවා (ඉංග්‍රිසියෙන් කියවයි) We have mutilated every opponent.

ප ඒ කුරිරු ආකාරයෙන් තමයි තියෙන්නේ ?

උ ඔව්.

ප අපි ඊලඟ slide එකට යමු.

උ අපි අපේ සටන් කරනවා අපේ ආගම මේ ස්ථාපිත වනතුරු අපි නුඹලාව විනාශ කරලා දානවා සහ නුඹලාට නින්දා සහගත පරාජයක් අත් කරලා දෙනවා කියලා .මේ ඉස්ලාමයේ concept එක්ක මේ ඉංග්‍රිසියෙන් කියවයි) We will fight until our religion is established. The fiercestjpu I Islams is to kill and to be killed for Allah.

ප ඒක කව්රු විසින් කියපු පාඨයක්ද?

උ අයිතුල්ලා කුමේනි කියපු පාඨයක් ඒක පදනම් වෙන්නේ අර 9 වෙනි සුරාවේ 111 වෙනි වගන්තිය සහ ඊට අනුබද්ධ වගන්ති ප්‍රකාරව මේ ආගමික නායකයෙක් හැටියට අයතුල්ලා කුමේනි ඒක එයා විග්‍රහයක් හැටියට ඉදිරිපත් කරලා තියෙනවා

ප ඔබ ඊට පස්සේ මේ 30 වෙනි slide එකේදි සඳහන් කරනවා අන්‍යාගමිකයන්ගේවස්තුව සහ දේපල මුස්ලිම් වරුන් විසින් කොල්ල කෑම සඳහා වන ඉස්ලාමික ඉගැන්වීම් කියලා මෙහිදි මොනවද ඔබ මේමාතෘකාව යටතේ කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ ?

උ මේ ගමනේදි ඉදිරියට මේ තත්වයෙන් හරි මේ ගොල්ලන්ගේ ගමන නවත්තා ගත්තේ නැත්නම් ඉදිරියේදි මේගොල්ලෝ අනිවාර්ය යෙන්ම එන point එකක් තමයි මේක . එක අවස්ථාවකට මේ ගොල්ලෝ එනවා ඒ අවස්ථාවතමයි මේවිග්‍රහ කරලා තියෙන්නේ කුරානයේ 48 යි 20 න් කියනවා අන්‍යාගමික දේශයන් සතු ඔවුන්ගේ භූමිය සහ දේපල මුස්ලිම්වරුන් කොල්ල කා අත්පත් කර ගැනීමට සඳහාඉඩ සලසන බව අල්ලා ඔබට ඒ කියන්නේ මුස්ලිම්වරුන්ට පොරොන්දු වී ඇති අතර අල්ලා ඔබ වෙනුවෙන් ඒ අවස්ථාව ඉක්මන් කරනු ලබයි තවද, ඔබලාටඑරෙහිව කිසිවක් කල නොහැකි වන ලෙස අල්ලා විසින් ඔබට විරුද්ධව මිනිසුන් ප්‍රතිභාධනය කරන්නේය . එබැවින්එය අල්ලා විසින් මුස්ලිම්වරුන්ට සෘජුව මාර්ගයේ මඟ පෙන්වන බවටවූ සංඥාවක් සේ සලකන්න කියලා . ඉතින් දැන් එහෙම දේවල් වෙන්නේ නැහැ දැන් ඊටඅඩුමට්ටමේදේවල් වෙනවා දැන්ඒ ගොල්ලෝ බලවත් වෙලා ඉන්න ඉස්ලාමික ප්‍රදේශයන් තුල සිංහලයන්ගේ ඉඩම් කොල්ල කෑම් සුලු වශයෙන් සිද්ධවීමක් වෙනවා ඔප්පු වෙනස් කිරිලි බලහත්කාරයෙන් ඉඩම් වලට ඒ ගොල්ලන්ගේ ඔප්පු සකස් කර

Research Society's Copy
FAIR COMMENT BY JEZEEM

ගැනිමවගේ දේවල් සිද්ධ වෙනවා නමුත් ඉදිරියේදි අනිවාර්යයෙන්ම මේ ගොල්ලෝ ගහලා කොල්ල කෑමක් සිද්ධ කරනවා .

ප්‍ර ඔබ සඳහන් කරන්නේ මේ කුරාන පාඨයට අනුව අන්‍යාගමිකයන්ගේ ඉඩම් නැත්නම් දේපල මුස්ලිම්වරුන් විසින් නීත්‍යානුකූල නොවන ක්‍රමවලින් අත්පත් කරගැනිම ඉස්ලාම් ධර්මයට අනුව හොඳ ක්‍රියාවක් වශයෙන්ද?

උ මෙහෙමයි නීත්‍යානුකූල නොවන ආකාරයෙන් කියන්නේ අපේ නීතිය ට ඒ ගොල්ලන්ගේ ඒක නීතිය ඒක ෂරියා නීතියටත් අනුකූලයි ජිහාඩයේදි ඒවා අත්පත් කර ගැනිම ඒ ගොල්ලන්ට හලාල් කුරානයේ 33 වෙනි සූරාවේ 27 වෙනි වගන්තියේ කියනවා තවදුරටත් අල්ලා දෙවියන් විසින් අන්‍යාගමිකයන් භූමිය සහ ඔවුන්ගේ ගේ දොර වතුපිටි සහ ඔවුන්ගේ සියලු වස්තුව සහ නුඹලා මෙතෙක් කිසි දිනක පය නොගැසූ භූමියන් that is lands which the Muslims were to conquer and hold in the future අනාගතයේදි අත්පත් කරගෙන අල්ලා ගෙන අත්පත් කර ගැනිමේදි තියෙන ඉඩම් නුඹලාට උරුලුම කර දීමට පියවර අරන් තියෙනවා අල්ලාට මේ සියල්ල කල හැකියා මට මේ පැහැදිලිව කියන්න පුලුවන් රිෂාඩ් බදුර්දින් ඒ ක්‍රියාත්මක වුනේ ඒ ආකාරයට කියලා.

ප්‍ර දැන් ඔය 30 වෙනි slide එකේ තියන link එක එබුවා. එවා මෙහි දැක්වෙන ඡායාරූපය මොකක්ද මහත්මයා ?

උ විල්පත්තුවේ රිෂාඩ් බදුර්දින් විසින් ශුද්ධ කරලා අත්පත් කර ගත්තු ඉඩම්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මහතා.</u>

ප්‍ර දැනට නඩු කටයුත්තක් පවතින බැවින් ඒ සම්බන්ධව සාක්ෂි මෙහෙයවන්න එපා කියලා දන්වනවා

උ එසේය.

****

<u>රජයේ අධිනිතිඥ චතුරංග බංඩාර මහතා.</u>

ප්‍ර ඔබ ඊලඟ කාරණයට යමු.

උ කුරානයේ 2 වෙනි සූරාවේ 252 වෙනි වගන්තියට foot note එකක් සපයලා තියෙනවා ඒකේ හදීත් එකක් cort කරලා තියෙන්නේ ඒකේ මේ විදියට කියනවා මොහොමඩ් නබි දේශනා කළා අන්‍යාගමිකයන්ට පහර දී අත්පත් කර පැහැර ගන්නා භූමීන් සහ ඔවුන්ගේ සියලුම දේපල සහ වස්තුව අල්ලා දෙවියන් විසින් මට හලාල් කර තිබෙනවා කියලා. එතකොටඅපි දැන් බලමු අපි නොහිතන දෙයක් අපි බලාපොරොත්තු

FAIR COMMENT — BY JEZEEM

නොවන කාල පරිවේඡ්දයක් මේක නමුත් අපි දැනගත යුතුයි ඉස්ලාමය විසින් ශ්‍රී ලංකාවේ බලය අත්පත් කර ගතහොත් සිංහලයාගේ ඉරණම කුමක් වේවිද කියලා.

ප්‍ර ඔබ ඒක මේ සඳහන් කරන්නේ ලෝකය එසේ වෙනත් ආගමික background එකක් ආගමික පසුබිමක් තිබ්බ රටවල් ඉස්ලාම්විසින් අත්පත් කර ගත්තානේ ඒ ඔවුන්ට වෙච්ච සිද්ධිදාමය අධ්‍යනය කිරිමෙන් පසුවද ඔබ මේ?

උ සහ ඒඅනුව සහ මේ ඉස්ලාමික ගමනේ ස්වභාවය අනුව.

ප්‍ර ඒ අනුව ඉස්ලාමය විසින් ශ්‍රී ලංකාවේ බලය අත්පත් කර ගත්තොත් එහි ස්වදේශිකයන්ට කුමක්ද සිද්ධ වෙන්නේ ?

උ මුලින්ම ආගම් තහනම් වෙනවා ඒක 3 වෙනි සූරාවේ 85 වෙනි වගගන්තියෙන් තහනම impose වෙනවා තවද කිසිවකු විසින් ඉස්ලාමය හැර වෙනත් ආගමක්අපේක්ෂා කරයිද ඉස්ලාමයේ කිසිසේත්ම එය පිළිනොගන් ඇත කියලා.

ප්‍ර මේ රට තුල වෙනත් කිසිදු ආගමක් අදහන්නට බැරි තත්වයක් ඇති වෙනවා?

උ ඊට පස්සේ ඒ ගොල්ලෝ ඒත් එක්ක blasphemylaw එක ෂරියා එකේ blasphemylaw එක ස්ථාපිත කිරිමක් කරනවා ඒකෙදි මේ ෂරියා ඒක

ප්‍ර ඔබ මේ දැනට තිරයේ දැක්වෙන් slide එකෙන් මොකක්ද පැහැදිලි කරන්නේ ?

උ මේක මේ ෂරියා නීති පොතෙන් ගත්තු එකක්?

ප්‍ර එහි මොකක්ද සඳහන් වෙන්නේ

ප්‍ර ඒකේ සඳහන් වෙනවා blasphemy law එකේ කොටසක්.ඒ කේදි දැන් අපි මේ කතා කරන්නේ ඉස්ලාමය විසින් ශ්‍රී ලංකාවේ බලය අත්පත් කර ගත්තොත් අපිට කුමක් වේවිද කියන එක. ඒ ගොල්ලෝ blasphemy lawඑක establish වුනාට පස්සේ මෙන්න මේක අපිට ඉස්ලාමය සම්බන්ධයෙන් අල්ලා සම්බන්ධයෙන් සහ මොහොමඩ් නබි තුමා සම්බන්ධයෙන් කිසිම දෙයක් ප්‍රකාශ කරන්න බැරිවෙනවා කිසිම දෙයක් ප්‍රකාශ කෙරුවොත් එය මරණය දණ්ඩනයකින් දඩුවම් ලැබිය හැකි වරදක් විදියට පත් කරනවා ඒ තරමට ඒ ස්වදේශික අන්‍යාගමික ජනතාව අසරණ තත්වයට පත් වෙනවා.

ප්‍ර පත් වෙන්න පුලුවන්?

උ පත් වෙන්න පුලුවන්.

ප්‍ර දැන් ඔබ ඉන්න රටේ ඉස්ලාම් ආගම තියෙන රටක් නේ සම්පුර්ණම ඉස්ලාම් රාජ්‍යයක් . එහිදි වුනත් ඔබ ඒ සම්බන්ධයෙන් යමක් කතා කලොත් ඔබටත් ඔය consequence ප්‍රතිඵල වලට මුහුණ දෙන්න පුලුවන් වෙනවාද ?

FAIR COMMENT
BY JEZEEM

උ මම මුලදිම කිව්වා මාලදිවයින් මුස්ලිම් රාජ්‍යයක් වුනත් එහි දේශපාලන ක්‍රමවේදය නිසා ෂරියාවේ සම්පූර්ණ වශයෙන් ෂරියාවේ නීතිය ස්ථාපිත කරලා නැහැ කියලා නමුත් එහිදි මරණිය දණ්ඩනය නොවුනත් එය සිර දඩුවමක් සහ සිර දඩුවමට අමතරව එතනදි ඒවගේ දේකදි අපහාස කරලා කියලා වුනොත් ඒ සිර කඳවුරු වලදී නොයෙකුත් ගැටලු වලට මුහුණ පාන්න සිද්ධ වෙන්න පුලුවන් මරණය දඩුවමක් හැටියට නොදුන්නට.

ප දැන් ඔබ ශ්‍රී ලංකාවේ තත්වය පැහැදිලි කරමින් සිටියේ ඉස්ලාම් රාජ්‍යයක් බවට පත්වුනොත් ස්වදේශිකයන්ට කුමක් වේවිද කියලා මේ පැහැදිලි කරලා ?

උ ඊට පස්සේ සිද්ධ වෙන්නේ ඒ ගොල්ලෝ අපිට ඉස්ලාමයට එන්න ආරාධනා කරනවා.නෙමේ ඉස්ලාමයට එන්න නියෝග කරනවා. ඒකේ උදාහරණයක් මේ ගෙනාවේ ඒ ගොල්ලන්ගේ හාලිද් බින් අල් වලීඩ් කියන මුස්ලිම් ජෙනරල් කෙනෙක් හිටියා නබිතුමාගේ කාලේදි එයා කියපු කතාවක් එයා යම් ප්‍රදේශයකට ගිහිල්ලා ඒ ප්‍රදේශය අයට යටත් කරගෙන කියන කතන්දරය . නුඹලා ඉස්ලාමය වැළඳ ගත යුතුයි . ඒ නියෝගයට අවනත වුනොත් නුඹලාව මුස්ලිම්වරු හැටියට අපි පිලිගන්නවා . එතකොට මුස්ලිම්වරුන් වන අප විසින් බුක්ති විඳින සියලුම වරප්‍රසාද උඹලට ලැබෙනවා එහෙම නැතුව සහ වගකීම් උඹලට ලැබෙනවා එහෙම නැතුව උඹලා මේ නියෝගයට විරුද්ධ වුනොත් එය ප්‍රතික්ෂේප කෙරුවොත් මම ගේනවා උඹලට එරෙහිව මිනිසුන්ව . ඒ කියන්නේ උඹලව මරලා දාන්න මගේ මිනිසුන්ව එවනවා කියලා ඔන්න ඔය දේ ඕක ඒ ගොල්ලන්ගේ සාමාන්‍ය ඉගැන්වීමක් අන්‍යාගමික සමාජයක් ඒගොල්ලන්ට යටත් වුනහම ඒ කරන නියෝගය ඒක අනිවාර්ය නියෝගයක්. එතකොට මෙතනදි කියන්න ඕනේ එතනදි මට කියන්න පුලුවන් සහතික කරලා ඉස්ලාමික නීතිය යටතේ ෂරියා නීතිය යටතේ බෞද්ධාගමට පැවැත්මක් නැහැ. හින්දු ආගමට පැවැත්මක් නැහැ . එතනදි මට කියන්න පුලුවන් සහතික කරලා ඉස්ලාමික නීතිය යටතේ ෂරියා නීතිය යටතේ බෞද්ධාගමට පැවැත්මක් නැහැ. හින්දු ආගමට පැවැත්මක් නැහැ. එහෙම මම කිව්වේ පිළිම වන්දනා කරන ආගම් කියලා ඒ ගොල්ලෝ නිර්දේශ කරලා ඒ ගොල්ලෝ නම් කරලා තියෙන්නේ බෞද්ධාගම. ඒ බෞද්ධාගමට ෂරියා ලෝ එකේ ඉඩක් තියලා නැහැ. ඒහින්දා අනිවාර්යයෙන්ම ඒ ගොල්ලෝ ඒ නියෝගය නිකුත් කෙරුහම අපි අනිවාර්යයෙන්ම ඉස්ලාම් ආගමට හැරෙන්න ඕනේ එහෙම නැතිවුනොත් අපි ඒගොල්ලන්ගේ සාතනයන්ට අපි මුහුණ දෙන්න ඕනේ .ඒ අනුව අපේ බෞද්ධ පුජනිය ස්ථාන සියල්ල තහනම් වෙනවා . තහනම් වෙලා අපේ පන්සල් ඒ තහනම් වුනාට පස්සේ එතන ඉතුරු කරන්නේ නැහැ

FAIR COMMENT — BY JEZEEM —

පන්සල්, වෙහෙර විහාර , ඒ හැම දෙයක්ම ශ්‍රී මහ බෝධියද, රුවන් වැලි සෑයද, ඒ ඔක්කෝම අනිවාර්යයෙන් කුඩු පට්ටම් කරලා දානවා. විනාශ කරලා දානවා ඊට පස්සේ දැන් ඒක සිද්ධ වුනා සිද්ධ වෙලා තියෙනවා මාලදිවයිනෙත් පන්සල් පරණ පන්සල්

ප්‍ර මාල දිවයිනේ වෙච්ච සිද්ධිය පොඩ්ඩක් පැහැදිලි කරන්න පුලුවන්ද?

උ මාලදිවයිනේ කලින් පරණ තිබ්බ පන්සල් ඒ අය විසින් පල්ලි බවට පරිවර්තනය කරලා තියෙනවා . ඉතින් ඒ ක්‍රමයම ශ්‍රීලංකාව තුල ඇතිවෙන්න අවස්ථාව තියෙනවා. එතකොට කුරානයේ 9- 05 අර මවුලවි තුමා ඉදිරිපත් කරපු එක. වැකිය කුරානයේ 9-05 ශුද්ධ වූ මාසය නික්ම වූ පසු පිළිම වන්දනාකරුවන් සහ ඉස්ලාමය විශ්වාස නොකරන්නාවුන් දුටු තැන ඝාතනය කරව් තවද, ඔවුන්ව අල්ලා බැඳ ගනිව් ඔවුන් යන එන මඟ සැඟවී සිට පහර දියව් එවිට ඔවුන් එම භීෂණයෙන් පීඩාවට පත්වී තම ආගම අත්හැර ඉස්ලාමය වැළඳ ගනී නම් එවැනි අයව පමණක් නොමරව් සැබැවින්ම අල්ලා අති සමාශීලිය, මහා කාරුණිකය , කියලා කියනවා මෙන්න මේ 09 වෙනි සුරාවේ 05 වෙනි වගන්තිය ස්ථාපිත වෙන්නේ බල ගන්වන්නේ අපේ සමාජය ඔවුන්ට යටත් වෙලා , අපි අසරණ වෙලා, අපි දුර්වල වෙලා , අපි ඒවගේ දුර්වල අවස්ථාවකට පත්වුනායින් පස්සේ . ඒ කියන්නේ ජිහාඩයේ අවසාන කාල පරිච්ඡේදයේ 9 වෙනි සුරාවේ 05 වෙනි වගන්තිය ස්ථාපිත වෙන්නේ එතකොට මේකේදී කියනවා අපි ඒ ගොල්ලොන්ගේ ආගමට එනවා කියන පොරොන්දුව දෙන්නත් ඕනේ ඒ ගොල්ලන් අපිව අල්ලාගන්න ඉස්සෙල්ලා. ඒක ෂරියා නීතියෙත් තියෙනවා .

ප්‍ර දැන් මහත්මයා මෙහි තියෙනවානේ පිළිම වන්දනා කරුවන්ව සැඟවී සිට පහර දෙන්නවුන්ට ඉස්ලාමය වැළඳගන්න බල කරන්න ඒ වගේ කාරණා?

උ ඔව්.

ප්‍ර ඔය ශුද්ධ වූ කුරානයම 9-29 එහි තියෙනවා අන්‍යාගමිකයන්ට ජිස්යා නැමති බද්ද ගෙවලා ඔවුන්ට ඉන්න පුලුවන් කියලා දැන් මේ දෙක අතරේ ගැටුමක් තියෙනවා නේ ?

උ 09 වෙනි සූරාවේ 26 වෙනි වගන්තිය මට ගේන්න අවශ්‍ය වෙච්ච එකක් නමුත් අපි මේකේ ගොඩක් stuff කෙරුවොත් කාලය යන හින්දා මම ඒක ගෙනාවේ නැහැ. මෙහෙමයි 09 වෙනි සූරාවේ 29 වෙනි වගන්තිය ප්‍රකාශයට පත් කරලා තියෙන්නේ පිළිම වන්දනා කාරයන්ට නෙමෙයි ඒක ප්‍රකාශ කරලා තියෙන්නේ ක්‍රිස්තියානි ලබ්ධිකයන්ට සහ යුදෙව්වන්ට. එතකොට ඒකේදි මම ස්තුතිවන්ත වෙනවා ඔබ ඒ ප්‍රශ්නය අහපු එකට. එතකොට එතන වෙනසක් තියෙනවා ඒ කිව්වේ 09 වෙනි සූරාවේ 05 වෙනි වගන්තිය අපි සංසන්දනය කරන්න ඕනෙත් මෙතනදි 09 වෙනි සූරාවේ 29 වෙනි වගන්තියත් එක්ක . මෙතනදී 09 වෙනි

FAIR COMMENT BY JEZEEM

සූරාවේ 05 වෙනි වගන්තිය නිකුත් කරලා තියෙන්නේ පිළිම වන්දනා කාරයන්ට අපිට. ඒ හින්දයි මම ඒකට තැනක් දුන්නේ .09 වෙනි සුරාවේ 29 වෙනි වගන්තියේ කියන්නේ ක්‍රිස්තියානි සහ යුදෙව් ලබ්ධිකයෝ වුනත් ඔවුන්ට එරෙහිව සටන් කරන්න ඔවුන් දිම්මීස්ලා හැටියට යටත් වෙනකල් . දිම්මීස්ලා කියන්නේ second classcitizensලා එක්ක ඊටත් වඩා පහළ ඉතා අසරණ වෙච්ච ඉස්ලාමික නීතිය යටතේ ඉස්ලාමිකයන් යටතේ ඉන්න සුළු කොටසක් හැටියට ඉතුරු කරනවා බොහොම ටික දෙනෙක් ක්‍රිස්තියානි සහ යුදෙව් ජනතාවගේ. ඒක එහෙම වෙන්නේ නබිතුමා එහෙම කරපු නිසා. අපි හිතමුකෝ යුදෙව්වෝ ඉන්නවා කියලා ඒ 10,000 ක් 10,000 ටම ඒ chance එක ලැබෙන්නේ නැහැ. 10,000ටම ලැබෙන්නේ නැහැ සමහර විට 100 කට ලැබෙයි. ඒත් ඒක ලැබෙන්නෙත් ඒ 100 JizyaTax එකක් කියලා තියෙනවා බද්දක් ඒ බද්ද මුස්ලිම් නායකයා විසින් කියන කියන හැටියට ගෙවන්න ඕනේ. එතකොට ඒ Jizya බද්ද ගෙවන්න අර ගොල්ලෝ උදේ හවස මහන්සි වී වැඩ කරන්න ඕනේ.එතකොට එතනදී ඒ ගොල්ලන්ට දීලා තියෙනවා වර 3ක් . මොකක්ද ඒ වර 3 එකක් ඉස්ලාමය වැළඳගන්න දෙවනි එක Jizya බද්ද ගෙවලා දිම්මීස්ලා හැටියට යටත් වැසියෝ හැටියට ඉන්න . තුන්වෙනි එක ඒ දෙකම ප්‍රතික්ෂේප කරනවා නම් මරණයට මුහුණ දෙන්න අපි සංසන්දනය කරනවා නම් කුරානයේ 09 වෙනි සූරාවේ 05 වෙනි වගන්තිය අපිට බෞද්ධයින්ට එල්ල කරපු වගන්තියත් එක්ක ඒ වගන්තිය 09 වෙනි සුරාවේ 05 වෙනි වගන්තියෙන් කියන්නේ දෙන්නේ වර දෙකයි ඒ වර දෙක මොකක්ද ඉස්ලාමයට හැරෙන්න නැත්නම් මරණයට මුහුණ දෙන්න අර තුන්වෙනි මැද්දේ.

ප්‍ර බද්ද ගෙවලා තියෙන ?

ප්‍ර බද්ද ගෙවන option එක ?

උ බද්ද ගෙවන option එක අපට නැහැ.

ප්‍ර පිළිම වන්දනා කරුවන්ට නැහැ ?

උ නැහැ. නැවතත් ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා ඒක ගෙනාවට.

ප්‍ර අපි ඊලඟ කරුණට යං?

උ මේ වගන්තියත් ස්ථාපිත වෙන්නේ මේ කාල පරිච්ඡේදයේම තමයි මේ කියන කාල පරිච්ඡේදය ඔවුන් විසින් අපේ රටේ බලය ස්ථාපිත කරලා ජිහාඩයේ අවසාන කාල පරිච්චේදය red belt එකේ මැද්ද පහු කෙරුවායින් පස්සේ එතනදි වෙන්නේ මොකක්ද 09 වෙනි සූරාවේ 05 වෙනි වගන්තිය විසින් අපට නියෝගය නිකුත් කලහාම අපි ඒකෙන් බය වෙලා ඒ භීෂණයට මුහුණ දී ගන්න බැරුව අපේ අපි ඉස්ලාමය වැළඳ ගැනීමක් කරාවි. හැමෝම නැතත් කොටසක් හරි. එහෙම

FAIR COMMENT
BY JEZEEM

ඉස්ලාමය වැළඳ ගෙන ඒ ගොල්ලෝ ඒක ඒ වැළඳී ගැනීම කරන්න පුලුවන් ඒ මරණෙන් ඒ වෙලාවට ගැලවෙන්න අන්න එහෙම කරලා ඊලඟට පස්සේ ආපහු අර බෞද්ධ වන්දනාව කරන්න පුලුවන් අන්න ඒ අයට එරෙහිව තමයි 5 වෙනි සූරාවේ 33 වෙනි වගන්තිය නිකුත් කරලා තියෙන්නේ නමුත් බැලූ බැල්මට කෙනෙකුට ඕක කියවලා ඉංග්‍රීසි නියෝගය කියවලා මේ මම කියපු දේ තේරුම් ගන්න බැහැ. මේකේ තියෙන්නේ අල්ලාව සහ ඔහුගේ පණිවිඩකරුව එනම් ඉස්ලාමය ප්‍රතික්ෂේප කරන අයට සහ අල්ලාට සහ ඔහුගේ පණිවිඩකරුට එරෙහිවන අයට නියමිත දඩුවම වන්නේ ඔවුන්ව ඝාතනය කිරීම හෝ කුරුසියේ එල්ලා මැරීම හෝ ඔවුන් ගේ එක් පැත්තක අතක් සහ අනිත් පැත්තේ කකුලක් කපා දැමීම හෝ භූමියෙන් එළවා දැමීමයි. එම දඩුවම් ඔවුන්ට මෙලොවදී අවමානය සඳහායි. මරණින් පසු ඔවුන්ට ඊටත් වඩා දරුණු වදහිංසා ලැබෙනු ඇත. කියලා එතකොට මම අර කිව්වා නේ අපි ඉස්ලාමය වැළඳගන්නවා නම් ඒ ගොල්ලෝ අපිව අල්ලා ගන්න ඉස්සෙල්ලා අපිව මරන්න හොයාගෙන එන්න ඉස්සෙල්ලා ඒ ගොල්ලො අපි වැළඳගන්න ඕනේ කියලා . ඒක මේ ෂරියා නීතියේ තියෙනවා . මම ඒකයි කිව්වේ ෂරියා නීතිය ගැන අපි දන්නේ නැහැ අපේ සමාජය දන්නේ නැහැ . ඒක හරි මිනීමරු නීතියක් කියලා . ඒකේ පිටුව 604

ප්‍ර ඔබ මොකක් බලලාද සාක්ෂි දෙන්නේ ඔබ පරිහරණය කරන්නේ මොකක්ද ?

උ Reliance of the traveller එහෙම නැත්නම් ෂරියා නීති පොත .

ප්‍ර කවද ලියලා තියෙන්නේ ?

උ මේක ලියලා තියෙන්නේ නු කාමින් කියලා.

ප්‍ර ෂරියා නීතියට අදාල පොතක්?

උ ෂරියා නීතිය නීති පොත.

ප්‍ර එහි මොකක්ද සඳහන් වෙන්නේ මේ සම්බන්ධයෙන්

උ ඒකේ කියලා තියෙනවා whoever enters Islam before being captured may not be killed o his property confisticated or his young children are taken captive. ඊට පස්සේ එහෙම කියනවා ඉතින් අපිව අල්ලාගත්තායින් පස්සේ අපි කිව්වොත් නැහැ නැහැ අපි එන්නම් ඉස්ලාමෙට කියලා ඒක හරියන්නේ නැහැ. ඊට පස්සේ දැන් අපි මේක දැනටම කිව්වා. අපිට වර දෙකයි හම්බ වෙන්නේ ඉස්ලාමය වැළඳ ගැනීම නොඑසේ නම් මුස්ලිම් .

ප්‍ර ඔබ අරකලින් සඳහන් කරපු සංකල්පය ?

උ සංකල්පය.

ප්‍ර අපි ඊලඟ එකට යමු.?

FAIR COMMENT
BY JEZEEM

උ ඉස්ලාමික ෂරියා නීතිය යටතේ බෞද්ධාගමට සහ බෞද්ධයන්ට පැවතිය නොහැකි බව ඉස්ලාමය වෙනස් කල නොහැකි ස්ථිරසාර නියෝගයයි.

ප මේකේ තියෙන්නේ 17වෙනි සූරාවේ 16 වෙනි වගන්තියෙන් කියන්නේ කොහොමද ඒ ඒගොල්ලෝ ජාතීන් විනාශ කෙරුවේ කියලා ඒ ගොල්ලෝ ජාතින් සමූල ඝාතනය කෙරුවේ කොහොමද කියලා ඒ ගොල්ලෝ කියනවා අපි ඒ ගොල්ලෝ කොහේහරි ජාතියක් විනාශ කරන්න තීරණය කෙරුවහම ඒ ගොල්ලෝ ඉස්සරලාම එවනවලු දෙවියන්ගේ පණිවඩය අර කියපු නියෝගය ඉස්ලාමෙට හැරෙන්න කියලා එතකොට ඒ ගොල්ලෝ ඒක ප්‍රතික්ෂේප කරනවා ඒ ගොල්ලෝ ප්‍රතික්ෂේප කරන නිසාම ඒ ගොල්ලන්ට එරෙහිව ස්වදේශිකයන්ට එරෙහිව අන්‍යාගමික ජාතියට එරෙහිව ක්‍රියාත්මක කරන්න ඒ ගොල්ලන්ව විනාශ කරන්න මේමුස්ලිම් වරුන්ට සාධාරණ අයිතියක් ලැබෙනවා කියලා ඒ අනුව ඒ ගොල්ලෝ ඒ ජාතිය සම්පූර්ණයෙන්ම විනාශ කරනවා කියලා .

ප ඊට පස්සේ මේ ජිහාඩයත් එක්ක සිදු වෙන තවත් ක්‍රියාදාමයක් සිද්ධ වෙනවා

ප ඔබ දැන් තවමත් විස්තර කරන්නේ ශ්‍රී ලංකාවේ බලය ඉස්ලාම් භක්තියන් අතට පත් වෙන්න?

උ පත්කර ගත්තොත් අපට වෙන දේ.

ප සිද්ධ වෙන්න පුලුවන් දේවල් ?

උ අනිවාර්යයෙන් සිද්ධ වෙන දේවල් එතකොට මෙතනදි තවත් දෙයක් සිදු වෙනවාජහාඩය අස්සේ මුස්ලිම්වරුන් විසින් ස්වදේශික අන්‍යාගමික කාන්තාවන් දූෂණය කරනවා .

ප දැන් ඒ ස්වදේශික අන්‍යාගමික කාන්තාවන් දූෂණය කිරීමට ආගමික ග්‍රන්ථයක් වන ශුද්ධවු කුරානයේ ඉඩ අවසර ලබා දීලා තියෙනවා ?

උ ඔව්.

ප කොහේද ඒ ලබලා දීලා තියෙන්නේ ?

උ සම්පූර්ණ ඉඩ ලබලා දීලා තියෙනවා 4 වෙනි සුරාවේ 24 වෙනි වගන්තියේ තියෙනවා 4 වෙනි සූරාවේ 24 වෙනි වගන්තියෙන් ඇත්ත වශයෙන්ම කියන්නේ මුස්ලිම්වරුන්ට කැප කාන්තාවන් කව්ද කියලා සහ අකැප කාන්තාවක් කව්ද කියලායි එතකොට ඒකෙදි කියනවා තවද අන්‍යාගමික සමාජයකට එරෙහිව සිදු කරන පහරදීමේ අල්ලා ගන්නා ලද කාන්තාවන් හැර විවාහක කාන්තාවන් නුඹලාට තහනම් ය. නුඹලා පිලිපැදිය යුතු බවට පනවන ලද අල්ලා ගේ නීතිය එයයි ,කියලා මේක ටිකක් දිගට තියෙන්නේ මේක කොට කරලා මම ගත්තේ. අදහස විතරක් එන විදියට මේකේ පලවෙනියට තියෙන්නේ අන්‍යාගමිකයන් සමඟ එරෙහිව පහර දී අල්ලා ගන්නා ලද කාන්තාවන් හැර එතකොට

FAIR COMMENT BY JEZEEM

ඒ කාන්තාවන්ව ඒ ගොල්ලන්ට ලිංගිකව ඒ කටයුත්ත කරන්න පුලුවන්. එතකොට හදීත් එකක් තියෙනවා මේකේ කියනවා අපි නබිතුමත් සමඟ බානුඅල් මුස්ටලිත් කියන ගමට ප්‍රහාරයක් එල්ල කරන්න ගිය අවස්ථාවේදි ඒ ගමේ මිනිසුන්ව මරලා ඒක යටත් කරගෙන ඒකේ හිටපු කාන්තාවන්ව අපි අත්පත් කර ගත්තා එතනදි අපිට ඒ අයව දූෂණය නොකර බැරි තත්වයක් උදා වුනා නමුත් ඒ අවස්ථාවේදි අපිට හිතුනා coitus interrupts පාවිච්චි කරන්න

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මහතා</u>

ප්‍ර එහි සඳහන් වෙනවාද දූෂණය කිරීම කියලා දූෂණය කිරීම කියලා සඳහන් වෙනවාද ? to coitus interrupted

උ ඒකේ තියෙනවා මෙහෙම We went out with Allah's epostal for the invasion of Banu-Al-Mustalik and we received captives from among the Arab captives and we deserved women and delibes became hard on us and we loved to coitus interrupted

මේ ගොල්ලෝ ඒ ගොල්ලන්ගේ භාර්යාවන් නෙමේනේ coitus interrupted . කරන්නේ ඒහින්දා ඒක අනිවාර්යයෙන් දූෂණයක් වෙන්නේ so when we entented to do coitus interruptus we say how can we do coitus interruptus before asking Allahs apostal who is present among us. එතකොට ඔප්පු වෙනවා ඒ නබිතුමත් එතන ඉඳලා තියෙනවා එතකොට නබිතුමා ගෙන් අහනවා එතකොට නබි තුමා කියනවා it is better for you not to do so ඒ කියන්නේ coitus interrupts කරන්න එපා කියලා ඇයි ඒ නබිතුමාකියනවා for if any soul till the day of resurrection is free destine to exist it will exist එතකොට ෂරියා නීති පොතේ සඳහන් වෙන දෙයක් මේ විදියට ඒ කාන්තාවන් අල්ලා ගත්ත සැනින් ඒ කාන්තාවන්ගේ ඒ වෙන කොට නිබ්බ විවාහය අවලංගු වෙනවා . when a child or a women is taken capture and the women's previous marriage is immediately canceled.

ප්‍ර ඉන්පසුව ඔබ දැන් යොමුවෙනවා තවත් මාතෘකාවකට ඒ ඉස්ලාම් ධර්මය මේ සහජීවනය කියන සංකල්පය කොහොමද ඒ ගොල්ලෝ අනුගමනය කරන්නේ ඒ සම්බන්ධයෙන් ඔබගේ research එක තුලදී ඔබ කුමන මූලාශ්‍රද ඔබ පරිශීලනය කරේ. ඒ අනුව ඔබට කුමක්ද අනාවරණය වුනේ ?

උ මම ඉස්සෙල්ලාම ඉදිරිපත් කරන්න කැමතියි ඉමාම් රබ්බානි ෂේ අහමද් අල් ෆරුකි අල් සිර්හින්දි කියන මේ ඉස්ලාමික විද්වතාගේ එයාගේ

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ලියවිල්ලක් එයා ඒ ප්‍රකාශය කරන්නේ තනිකර ඉස්ලාමික දැක්මෙන් සහ ඉස්ලාමික ආගමික ඉගැන්වීම් වලට අනුකූලවයි. මොකද 33 වෙනි සූරාවේ 36 වෙනි වගන්තියට ප්‍රකාරව ඉස්ලාමික විද්වතෙක් වුනත් නැතත් ඉස්ලාමික ඉගැන්වීම් වලට පටහැනිව අදහසක් ප්‍රකාශ කරන්න බැහැ. එතකොට ඒ අර්ථයෙන් එයාගේ විවරණය එයාගේ අර්ථකථනය දෙනවා කුෆර් , කුෆර් කියන්නේ අර ඉස්ලාමික නොවන ජන සමාජය.

ප්‍ර non-believers?

උ non-believersලාගේ ජීවන රටාව. and Islamic ඒ කියන්නේ ඉස්ලාමිකයන්ගේ ජීවන රටාව. are oppose to each other; the progress of one is possible only at the expense of the other and the co-cxistance between the two contradictory face is unthinkable

ප්‍ර මේ slide එකෙන් මේ 38 වෙනි slide එකෙන් දැක් වෙන අදහස සරලව කිව්වොත් මේගරු කොමිෂන් සභාවට.?

උ අදහස කිව්වොත් මෙතුමා මේ ඉස්ලාමික ආගමික දැක්මෙන් කියන ප්‍රකාශය නම් මේකයි එතුමා කියනවා ඉස්ලාමික ජීවන රටාව සහ ඉස්ලාමික නොවන ජීවන රටාව කියන්නේ එකිනෙකට පරස්පර විරෝධි ජීවන රටාවල් දෙකක් ආගම් දෙකක් එතකොට ඒ දෙකට දෙකෙන් එකකට ඉස්සරහට යන්න නම් අනිවාර්යයෙන්ම අනිත් එක විනාශ වෙලාම යන්න ඕනේ. ඒ හින්දා ඒ දෙකේ සංකලනය මේ එකට පැවැත්මක් සහජීවනයක් කවදාකවත් සිද්ධවෙන්නේ නැහැ ඒක හිතාගන්නවත් බැහැ කියලා ඒක ඉස්ලාමික දැක්මෙන් ඒ ගොල්ලෝ කියන්නේ ඒ වගේම කියනවා ඉස්ලාමයේ අභිමානය රඳා පවතින්නේ අන්‍යාගමික යකුට සහ ඔවුන්ගේ සමාජයට කෙරෙන අපහාස මතය කියලා.

ප්‍ර ඒ කියන්නේ සරලවම කියනවා නම් සහජීවනය කියන සංකල්පය ඒ වචනයවත් මේ කියන ඉගැන්වීම් වලට දාන්න බැහැ ?

උ ඔව් එතකොට කව්රුහරි කෙනෙක් අන්‍යාගමික ආගමකට හොඳයි කිව්වොත් අපි හිතමුකෝ තුන්දෙනෙක් ඉන්නවා එක්කෙනෙක් මුස්ලිම් අනික් එක්කනා Christian සහ තව එක්කෙනෙක් බෞද්ධ එතකොට ක්‍රිස්තියන් එක්කනා බෞද්ධ එක්කනාට කියනවා අනේ මම ඕගොල්ලන්ගේ ආගමට බොහොම කැමතියි කියලා .
බොහොම හොඳ ආගමක් කියලා එයා කියන්නේ මේ මුස්ලිම්වරයා ඉදිරියේ එතකොට මෙයා කියන ඉගැන්වීමට අනුව මෙයාගේ විග්‍රහයට අනුව අර මුස්ලිම්වරයා ඒක ඒ ගොල්ලන්ට කරපු අපහාසයක් විදියට සලකන්න ඕනි. ඉතින් ඒකේ තව තියෙනවා මේ අන්‍යාගමිකයන්ට

FAIR COMMENT — BY JEZEEM —

කිසිම සංහිදියාවක් , මිත්‍රශීලත්වයක් දක්වන්න එපා ඔවුන්ව බල්ලන් මෙන් අතේ දුරින් තියන්න ඊට පස්සේ කියනවා ඕගොල්ලෝ නැතුව මුස්ලිම් අයට මොනවාහරි Business එකක් රාජකාරියක් කර ගන්න බැරිනම් අන්‍යාගමිකයෝ නැතුව ඒ රාජකාරිය නිමවනතුරු අවම මට්ටමෙන් සම්බන්ධ වෙලා ඒ මුස්ලිම් නොවන අයත් එක්ක ඒ කටයුත්ත කරන්න නමුත් නියම ඉස්ලාමික දැක්ම නම් එම කටයුත්ත අමතක කරලා ඒ Business එකත් අමතක කරලා ඒ අයත් එක්ක කිසිම සම්බන්ධකමක් නොකර ඉන්න කියලා මේක ටිකක් extreme Level එකෙන් යන එකක් මම ගෙනාවට ඒක සාමාන්‍ය සමාජයේ අපිට හිතාගන්නවත් බැරි තරමට extreme ඉගැන්වීමක්.

මින්පසු සටහන් ගැනිම ල/ලේ ඉන්ද්‍රානි.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 11.20 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

රජයේ අධිනීතීඥ චතුරංග බණ්ඩාර මහතා :

ප්‍ර : දැන් මහත්මයා මේ ඉස්ලාම් දහම තුළ මෙතරම් මේ අන්‍යාගාමිකයන්ට පහර දෙන්න, ඔවුන්ව වෙන් කරන්න මේ අන්‍යාගාමිකයන්ව තලා පෙළා දාන්න කියලා මෙතරම් ස්ථාන ගණනාවක සඳහන් වෙන්න මොකක් හරි ඓතිහාසික හේතුවක් තියෙනවද? ඉතිහාසයේ එන සංදර්භයක්?

පි : නැහැ. සංදර්භය ඇවිල්ලා නබිතුමා ජයග්‍රහණය කෙරුවේ අන්‍යාගාමිකයන්ව විනාශ කෙරුවට පස්සේ. නැත්නම් අන්‍යාගාමිකයන්ව ඉස්ලාම් ආගමට වැළඳගන්න කටයුතු කෙරුවයින් පස්සේ. ඉතිං ඒ තත්ත්වයම තමයි මේ යන්නේ. ඉතිං මෙතනම කියනවනේ දැන් ඉස්ලාමය සහ අනිත් ආගමක් එක්ක බැලුවහම ඒ දෙකෙන් එකකට ඉස්සරහට යන්න පුළුවන්. අනිත් ආගමේ විනාශය හරහා කියලා. ඉතිං ඒ හින්දා මේක අන්‍යාගාමිකයන්ව විනාශ කරලා ඒ භූමිය අල්ලා ගැනීම තමයි අල්ලාහ්ගේ මාර්ගය. ඒ අල්ලාහ්ගේ අරමුණ ඇවිල්ලා ඒ භූමිය සහ සම්පත් සියළු දේ අල්ලා ගන්න එකයි. ඉස්ලාමය මේක ඊළඟට මම ගේනවා මුස්ලිම්වරුන් සහ අන්‍යාගාමිකයන් අතර විවාහ කොහොමද සිද්ධ වෙන්නේ කියලා. එතකොට දැන් අපේ සමාජයෙන් අපි ...,

ප්‍ර : ඒ සඳහා භාවිතා කරන මූලාශ්‍රය මොකද්ද?

පි : කුරානයේ 2 වෙනි සුරාවේ 221 වෙනි වගන්තිය.

ප්‍ර : එහිදී මොකද්ද සඳහන් වෙන්නේ?

පි : ඒකේ දැන් අපේ සමාජයේ දැක්ම තමයි අපි කවුරු හරි කෙනෙකුට ආදරය කරනවා නම් එතන ජාතියක්, ආගමක් බලන්න එපා. ඒක කමක් නැහැ කියන මතයේ අපි ඉන්නවා, යම් තරමකට අපි ඉන්නවා. නමුත් මේගොල්ලොන්ගේ ඒක කොහොමද කියනවා නම් අන්‍යාගාමික තරුණ ඉස්ලාමය වැළඳ ගතහොත් මිස කිසි කලකින්වත් එවැනි තරුණියක් සමඟ විවාහ නොවිය යුතුය. මේ දෙවියන් වහන්සේ නියෝගයක් කරන්නේ මුස්ලිම්වරයෙකු විසින් අන්‍යාගාමික තරුණියක් විවාහ කර ගන්නවා නම් අනිවාර්යයෙන්ම ඒ තරුණිය ඉස්ලාමයට බැඳෙන්න ඕන. එහෙම නැත්නම් එයාව බඳින්න එපා කියලා එයා කොයිතරම් ඔබට ආදරය වුණත්, ඔබ කොයි තරම් ඇය කෙරෙහි ආදරයක් දැක්වුවත්

Parliament Sound Copy
FAIR COMMENT BY JEZEEM

ඒක කරන්න එපා කියලා. ඒ වගේම කියනවා ඉස්ලාමික තරුණියක් අන්‍යාගමික තරුණයෙක් බඳිනවා නම් ඒ තරුණයා අනිවාර්යයෙන්ම ඉස්ලාමයට එන්න ඕන. වැළඳගත යුතුයි. එහෙම නොවන්නේ නම් එය තහනම් කියලා.

ප්‍ර : ඊළඟ කාරණාවට ගියොත්?

පි : මේත් සහජීවනයටම, ඉස්ලාමික සහජීවනයටම අදාළ කුරාන වගන්තියක් 9 වෙනි සුරාවේ 14 වෙනි වගන්තිය. පිළිම වන්දනාකරුවන්ට සහ බහුදේවවාදීන්ට විරුද්ධව සටන් කරන්න. එලෙස අල්ලාහ් විසින් ඔබ මුස්ලිම්වරුන් ලවා ඔවුන්ව විනාශ කරනු ඇත. එසේම අල්ලාහ් විසින් නුඹලා ලවා ඔවුන්ට අවමන් කොට ඔවුන්ට එරෙහිව මුස්ලිම්වරුන්ට ජයග්‍රහණය අත්කර දෙනු ලබයි. මෙලෙස ඔවුන්ට එරෙහි නුඹලාගේ හදවත් තුළ කැකෑරෙන වෛරය සංසිදවනු ඇත. දැන් මේ 9 වෙනි සුරාව එන්නේ ජිහාඩය අවසාන කාලයේදී. ඒ කියන්නේ අන්‍යාගමික සමාජයක අවසාන කාලයේදී තමයි මේ 9 වෙනි සුරාව ස්ථාපිත වෙන්නේ. ඒක සංදර්භයත් එහෙම්මමයි. එතකොට ඒ අන්‍යාගමික සමාජයට අවමන් කිරීමක් ගැන තමයි මේ කථා වෙන්නේ සහ මුස්ලිම්වරුන්ගේ හදවතේ කැකෑරෙන වෛරයක් ගැන කථා වෙනවා. ඉතිං ඒකෙන් අපට දැන් තේරුම් ගන්න පුළුවන් මේ අවස්ථාව වෙනකොට ඒගොල්ලෝ අන්‍යාගාමිකයන් ඉවසන්නේ නැහැ. ඒ අන්‍යාගමිකයන්ට ගරහනවා, අවමන් කරනවා. මේ වගේ දේවල් මේ කාලය තුළ සිද්ධ වෙනවා.

****

ගරු සභාපතිතුමා :

කොමිෂන් සභාවේ කටයුතු හෙට පස්වරු 12.30 තෙක් කල් තබයි.

මෙම සාක්ෂිකරුගේ සෙසු සාක්ෂි ජූලි මස 18 වෙනි සෙනසුරාදා ප.ව. 3.00 ට ලබා ගන්නා බව සටහන් කරන අතර, එදින පෙනී සිටින ලෙසට සාක්ෂිකරුට අවවාද කරනවා.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.07.18 වේලාව :- පෙ.ව. 10.30

සටහන් කළේ :- එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා (පැමිණ නැත) - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම :-

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතීඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතීඥ ෂමිල් පෙරේරා මහතා සහ නීතීඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම : ඉමිතියාස් අහමඩ් කලිලූර් රහුමාන්

නැවත කැඳවයි

සාක්ෂිකරු ප්‍රතිඥා දෙයි

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : රහුමාන් මහත්මයා පසුගිය අවස්ථාවේදී ඔබ සඳහන් කරනු ලැබුවා සාක්ෂියේදී ෂූරා සභාව පිළිබඳව. පෙරේදා දවසේ මේ ගරු කොමිෂන් සභාවේ සාක්ෂියකට සවන් දෙනකොට අපේ ගරු කොමසාරිස්තුමියට ප්‍රශ්නයක් ඇති වුණා ෂූරා සභාවේ ප්‍රධාන කාර්යාලය කොහේද තියෙන්නේ කියලා. ගරු කොමසාරිස්තුමන්ලා දිහා බලලා මම අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න. ඔබට කියන්නට පුළුවන්ද ෂූරා සභාවේ ප්‍රදාන කාර්යාලය කොහේද තියෙන්නේ කියලා?

පි : මම දන්නා තරමින් මෑතක් වනතුරු අංක 141, White Park Residence , මාළිගාකන්ද පාර, කොළඹ 10 ඒ ලිපිනයේ තමයි ඒක තිබුණේ. දැනට සාමාන්‍යයෙන් කොහේ ක්‍රියාත්මක වෙනවද, ස්ථාන මාරුවක් තියෙනවද කියන එක දන්නේ නැහැ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ.

ප්‍ර : මෑතක් වනතුරු. නමුත් පාස්කු ප්‍රහාරය වනතුරු එතන තිබුණු බවද ඔබ කියන්නේ එම ස්ථානයේ?

පි : ඒ කියන්නේ තැන මම දැකලා නැහැ. මේ Address එක මම අන්තර්ජාලය හරහා ලබාගෙන තියෙන්නේ.

ප්‍ර : හොඳයි. ඒ වගේම තවත් සාක්ෂියකදී මෙන්න මේ තත්ත්වය උදා වුණා. ඒ තමයි කිලාෆතයක් බිහි කරන අවස්ථාවේදී ලංකාවෙහි ප්‍රාන්තයක් විදියට හදා ගන්නට ෂූරා සභාවක් ලංකාවේ පිහිටුවන්නට කියලා උපදෙසක් ඒ කිලාෆතයට උදව් කරන තැනැත්තා විසින් තවත් තැනැත්තෙක්ට ලබා දුන් පණිවිඩයක් අපි දැක්කා. ඇයි ඒ වගේ ප්‍රාන්තයක් හදනවා නම් ISIS රාජධානියට, ඒ කියන්නේ කිලාෆතයට. ෂූරා සභාවක් ලංකාවේ ඇති කළයුතු වන්නේ?

පි : ඒ කියන්නේ ඇවිල්ලා ඒගොල්ලන් බලන්නේ ඇවිල්ලා සාමූහික තීරණයකට එළඹෙන්න. ඒ කියන්නේ දැන් ඒගොල්ලන් සාමාන්‍යයෙන් කොටස් කොටස් වශයෙන්නේ එන්නේ. තනි නායකත්වයක් බිහි කරන්න අමාරුයිනේ ඒගොල්ලන්ට. එතකොට තනි නායකත්වයක් යටතේ අර මිනිස්සු සහ සංවිධාන ඒකරාශී වෙන්නේ නැහැනේ. එතකොට ඒකට විකල්පයක් වශයෙන් තමයි මේගොල්ලන් සියළු සංවිධාන ටිකි ඒකරාශී

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කරලා, ඒ කට්ටියව ඔක්කොම එක තැනකට අරගෙන ෂූරා සභාව අරගෙන සාමූහික තීරණයකට එන්න තමයි මේවා පටන් ගන්නේ. ඒ කියන්නේ සූරා සභා ආවේ මැතකදිනේ. ඊට කලින් L.T.T.E. ත්‍රස්තවාදය තියෙන කාලයේ කින්නියා ප්‍රදේශයේ තිබ්බා මජිරත් ෂූරා කියලා. ඒක ජමාත් ඉස්ලාම් සංවිධානයේ මොකද්ද කියන්නේ බලකොටුවක් කින්නියාව කියන්නේ. කාත්තන්කුඩිය වහාබි එකේ බලකොටුව වගේ ...,

ප : ත්‍රිකුණාමලය වගේ?

පි : ත්‍රිකුණාමලයේ කින්නියා ප්‍රදේශයේ. එතකොට එහේ තමයි අර FJP කියලා Front for Justice and Pease කියලා Political එකක් Non Political කියලා ....,

ප : අපි ඒක ගැන කථා කරමු ඉස්සරහට?

පි : එතකොට මම කියන්නේ අඩිතාලම වෙන එක. ඒගොල්ලෝ දැන් කිලාෆත් ගැන කථා කළාට ඒ අඩිතාලම වැටුණේ ඇවිල්ලා කාලයකට ඉස්සරදී. එතකොට ඊට පස්සේ තමයි කිලාෆත් එක ගැන, ඒ වාතාවරණය එනකොට ඒගොල්ලන්ගේ දේ ඒගොල්ලන් ක්‍රියාත්මක කරනවා.

ප : ඒ කියන්නේ ස්ථාවරව ප්‍රාන්තය පිහිටුවා ගැනීම පහසු කිරීම සඳහා යම් මණ්ඩලයක් පත් කර ගන්න ඕන ෂූරා සභාව විදියට?

පි : ඔව්.

ප : ඒ සඳහා තමයි මේ එහෙනම් ඒ වගේ උපදෙසක් ලබා දීලා තියෙන්නේ නේද?

පි : ඔව්. NFGG කියන Political Movement එකේත් තියෙන්නේ නායකත්ව මණ්ඩලයක්. ඒ කියන්නේ ෂූරා සභාවට සමගාමී Ideology එකක් තියෙන්නේ එතන. ඒකේ නායකයා කියලා තනතුරක් නැහැ. පස්සේ ලංකාවේ තිබෙන සමහර දේශපාලන පක්ෂත් ඒ නායකත්වය මණ්ඩලය කියන දේවල්වලට අනුගත වුණා. ඒක තමයි ෂූරා සභාවේ ප්‍රධානම වූ අරමුණ ඇවිල්ලා අර සාමූහික තීරණ ගන්න තමයි අපි පිහිටුවා ගන්නේ. ඒ කියන්නේ කැඩිච්ච කැඩිච්ච කුඩා සංවිධාන ටික ඔක්කොම එකතු කරගෙන තනි තීරණයකට එන්න පුළුවන්, බැරි නිසා ඒ කියන්නේ සංවිධාන ගොඩාක් රාශියක් තියෙනවනේ. එතකොට ඒගොල්ලන්ව සමූහය කරගෙන මේකට දායකත්වයක් ලබා ගන්න තමයි මේක කරන්නේ.

ප : ඔව්. සාමාන්‍යයෙන් කරන්නේ එහෙමයි.?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ ක්‍රමවේදය තමයි එහෙමනම් මේ අනුගමනය කරන්නට කියලා තියෙන්නේ?

පි : ඔව්.

ප්‍ර : සාමූහිකව එක්වෙලා කවුන්සිලයක් පිහිටුවා ගන්න?

පි : ඔව්.

ප්‍ර : හොඳයි. පසුගිය අවස්ථාවේ ඔබ මේ ගරු කොමිෂන් සභාවට තබ්ලික් ජමාත් සංවිධානය පිළිබඳව සඳහන් කෙරුවනේ. ඒ වගේම ඔබ යම් යම් පොත්පත් මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කරපු පොත්පත්වලට අමතරව ඔබ ළඟ, ඔබ සතුව තවත් පොත්පත් තියෙනවද ඉදිරිපත් කරන්න?

පි : තව එකක් පොතක් තියෙනවා. තබ්ලික් කියන්නේ කුමක්ද කියන පොතක්.

ප්‍ර : තබ්ලික් කියන්නේ කුමක්ද?

පි : තබ්ලික් යනු කුමක්ද.

ප්‍ර : මොන භාෂාවෙන්ද තියෙන්නේ?

පි : දෙමළ භාෂාවෙන් තියෙන්නේ.

ප්‍ර : කොහොමද එතකොට දෙමළෙන් කියන්නේ ඒක?

පි : තබ්ලික්කු එන්රාල් එන්න.

ප්‍ර : කවුද ඒක ලියලා තියෙන්නේ?

පි : මේක ලියලා තියෙන්නේ ඇවිල්ලා සියහු අබ්දුල් කාදර් සූෆි සිද්දි කියලා එක්කෙනෙක්.

(ස්වාමීනි තබ්ලික්කු එන්රාල් එන්න යන පොත සියහු අබ්දුල් කාදර් නැමැති කර්තෘ විසින් සම්පාදනය කොට තිබෙනවා. එම පොත IAKR-08 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරන්න අවසර ඉල්ලනවා ස්වාමීනි)

පි : මේ පොත 1968 තමයි මුලින්ම නිකුත් කරලා තියෙන්නේ. ඒකේ Addition 05 ක් ලියලා තියෙනවා. අන්තිමට Addition එක ඇවිල්ලා තියෙන්නේ 1991. මේකත් අර හිස්බුල්ලා සභාව ඉන්දියාවේ කායිපට්නවලින් තමයි මේකත් ඇවිල්ලා තියෙන්නේ. ඒ කියන්නේ 1968 කියන්නේ තබ්ලික් ජමාත් සංවිධානය පටන් අරගෙන ස්වල්ප කාලයකින්ම ඒ සම්බන්ධව විරුද්ධව මතවාදයක් ගොඩ නැගිලා තියෙනවා.

****

Presidential Secretariat Copy

FAIR COMMENT — BY JEZEEM —

ගරු සභාපතිතුමා :

මේ අවස්ථාවේදී IAKR-08 වශයෙන් ලකුණු කරන ලද ලේඛනය දමිළ භාෂාවෙන් ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. මෙම ලේඛනයේ සිංහල පරිවර්තනයක් සකස් කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ භාෂා පරිවර්තකට නියෝග කරන අතර එසේ ඉදිරිපත් කළ පසු එය IAKR-08(a) වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : මා දැන් ඊළඟට කැමතියි ඔබෙන් දැන ගන්න තබලික් ජමාත් සංවිධානයට සම්බන්ධකම් තියෙනවාය කියලා කියැවෙන NIDA කියන ආයතනය ගැන. ඔබට ඒ ගැන විස්තර කරන්නට පුළුවන්ද?

පි : ඒ සංවිධානය ඇවිල්ලා රාජගිරිය, කුරේ මාවතේ තමයි තිබ්බේ. දැනට ඒක වක්කුත් සභාව යටතේ වක්කුත් කරලා තියෙනවා. ඒක ලියාපදිංචි කරන අවස්ථාවේදී වක්කුත් කරලා තිබ්බේ නැහැ. ඒ ප්‍රදේශවාසීන් සහ එයත් එක්ක ඇති වුණු ගැටුම්වලට පස්සේ තමයි එයාගෙන් ඒක දැනට හසන් ෆරීඩ් කියන උලමා සභාවට සම්බන්ධ තබ්ලික් එකට සම්බන්ධ පූජකවරයෙක් තමයි ඒක ලියාපදිංචි කළේ. ඒකෙන් බොහෝ දුරට කරන්නේ ඇවිල්ලා ඒ කියන්නේ වෙනත් ආගම්වලින් එන කට්ටියට සහන දෙන වැඩ පිළිවෙල තමයි ඒකේ තියෙන්නේ.

ප්‍ර : මොන වගේ සහනද ලබා දෙන්නේ. ඒ කියන්නේ වෙනත් ආගම් අදහලා, ඉස්ලාම් ආගම ඇදහීමට නැඹුරු වන අයට?

පි : ඔව්.

ප්‍ර : මොන වගේ සහනද ලබා දෙන්නේ?

පි : ඒ කියන්නේ උදව් උපකාර සමාජයේ ඉන්න ව්‍යාපාරිකයන් හරහා උදව් උපකාර අරගෙන නිවාස, නැත්නම් යම් යම් මුල්‍යමය උපකාර තමයි ඒකෙන් කරන්නේ. දැන් ඒක ක්‍රියාත්මක වෙනවද කියන එක පිළිබඳව මට දන්නේ නැහැ. ඒක වක්කුත් කරාට පස්සේ ඒකේ තත්ත්වය කොහොමද කියලා දන්නේ නැහැ. හසන් ෆරීඩ් පූජකතුමාගේ බාරයෙන් පස්සේ ඒකට දැනට තියෙන තත්ත්වය මම දන්නේ නැහැ. මීට කලින් එවැනි කටයුතු තමයි ඒගොල්ලන් විසින් සිදු කරලා තිබුණේ.

ප්‍ර : ඒ පදනම මගින් මද්‍රසා පවත්වාගෙන යනවද?

පි : මද්‍රසා පාසලක් පවත්වාගෙන යනවා.

FAIR COMMENT BY JEZEEM

(ස්වාමීනි අන්තර්ජාලයෙන් බාගත කර ගන්නා ලද වීඩියෝ පටයක් මෙම NIDA පදනම මගින් සාක්ෂිකරු කිව්ව විදියට අනිත් ආගම්වලින් පැමිණි අයට යම් යම් සහන ලබා දෙනවා කියලා කිව්වා. ඒ සම්බන්ධයෙන් යම් අවබෝධයක් ලබා ගැනීම සඳහා ගරු කොමිෂන් සභාවට අප විසින් මෙය බාගත කරගෙන තියෙනවා අන්තර්ජාලයෙන්)

(වීඩියෝ පටය වාදනය කරනු ලබයි)

ප්‍ර : මොකද්ද ඒ කියන්නේ?

පි : ඒ කියන්නේ ඇවිල්ලා මම හිතන විදියට ඒකේ දිනය කවද්ද කියලා පොඩ්ඩක්...,

ප්‍ර : දිනය බලමුකෝ අපි.

පි : හරි. දැන් සාමාන්‍යයෙන් පාස්කු ප්‍රහාරයට පස්සේ මුස්ලිම් ජනතාවට අතර ඇවිල්ලා උලමා සභාව විසින් ක්‍රියාතමක කරනවා ඇවිල්ලා එන්න අපේ මස්ජිතයට කියලා.

ප්‍ර : ඔව්. ඒ කියන්නේ එන්න අපේ පල්ලියට?

පි : එන්න අපේ මද්‍රසා එකට කියලා Visit කියලා. එතකොට ඒකෙන් ඒගොල්ලන් බලාපොරොත්තු වෙන්නේ ඇවිල්ලා මද්‍රසා එක විවෘත කරලා, පෙන්වලා මේකෙන් කිසිම අන්තවාදී දෙයක් උගන්වන්නේ නැහැ කියන එක තමයි පෙන්වන්නේ. ඕකේ හසන් ෆරීඩ් කියන පූජකයාගේ වීඩියෝ එකත් එතන ගියා. එතකොට එයා විසින් නඩත්තු කරන ඒ අරාබි පාසලෙන් කිසිම අන්තවාදයක් සිද්ධ වෙන්නේ නැහැ කියන එක පෙන්වන්න තමයි ඒක ඒගොල්ලන් සමාජයට විවෘත කළේ. එතකොට ඒකෙන් ඒගොල්ලන් බලාපොරොත්තු වෙන්නේ ඇවිල්ලා මද්‍රසා පාසල් ක්‍රමය කියන්නේ ඇවිල්ලා හරි ක්‍රමයක් කියන එක. එතකොට ඒකෙන් අන්තවාදය උගන්වන්නේ නැහැ කියන එක පෙන්වන්න තමයි ඔය වැඩසටහන කරලා තියෙන්නේ. ඊට අමතරව හසන් ෆරීඩ් කියන පූජකවරයා ඇවිල්ලා ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පොත්හලක් පවත්වාගෙන යනවා බිම් මූරියා කියලා. ඒකෙත් පොත්පත් තියෙනවා, තබ්ලික් ජමාත් සම්බන්ධ දේවල් තමයි තියෙන්නේ. ඊට අමතරව එයා ඇවිල්ලා හජ් සහ උම්රා වන්දනා සඳහා වන්දනාකරුවන් රැගෙන යන ව්‍යාපාරයකුත් කරගෙන යනවා.

ප්‍ර : හජ් වන්දනාව කියන්නේ මොකද්ද? උම්රා වන්දනාව කියන්නේ මොකද්ද?

පි : හජ් වන්දනාව කියන්නේ ඉස්ලාමිය වගකීම් පහෙන් අනිවාර්යය වූ දෙයක්. මුදල් තිබෙනවා නම් යන්න පුළුවන්. උම්රා කියන්නේ ඇවිල්ලා සාමාන්‍යයෙන් ඒක නිකම් ඒ පූජනීය ස්ථානය ගිහිල්ලා

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

බලලා එන්න කරන වන්දනාවට තමයි උම්රා කියන්නේ. ඒකට කාල වකවානුවක් නැහැ. ඒක අනිවාර්යත් නැහැ. ඒක තමන් කැමති නම් යන්න පුළුවන්.

ප : එතකොට ඔබ කියන්නේ අපි අන්තර්ජාලයෙන් බාගත කරගෙන මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවට පෙන්නුම් කරනු ලබන මෙම Programme එක පාස්කු ප්‍රහාරයෙන් පසුව එන්න අපේ පල්ලිවලට කියන ඒ තේමාව යටතේ එන්න අපේ මද්‍රසාවට කියලා තමයි මේක සංවිධානය කරලා තියෙන්නේ?

පි : ඔව්.

(වීඩියෝ පටය වාදනය කරනු ලබයි)

****

ගරු අදිකාරී මැතිණිය :

ප : සාක්ෂිකරු ඔබ දුටුවානේ අර මුස්ලිම් මවුලවීතුමා සිංහලෙන් කියපු එක සහ අනෙක් පුද්ගලයා දෙමළෙන් කියපු එක අතර විශාල වෙනසක් තිබුණා කියලා. ඒකම නෙමෙයිනේ පරිවර්තනය කරලා කිව්වේ. එයා මොනවද ඒ දෙමළෙන් කියපු දෙවල්. කෙටියෙන් කියන්න පුළුවන්ද මේ කොමිෂන් සභාවට?

පි : ඒකට මම දැඩි අවධානයක් යොමු කළේ නැහැ. සාමාන්‍ය අවධානයකින් හිටියේ. එතකොට එයා කියනවා ඇවිල්ලා අර මද්‍රසා ගැන ගණනය ගැන කියනවනේ මුස්ලිම් ජනතාව අතර අර විරුද්ධ මතයක් තියෙනවා කියලා මද්‍රසා වැඩිවීම සම්බන්ධව. එතකොට එයා කියනවා ඇවිල්ලා ඒ කියන්නේ ඇවිල්ලා මද්‍රසාවලින් පිටත්වන පුද්ගලයන් හරහා සමාජයට 10,000 ක් පූජකවරු එළියට ආවට ඒකෙන් සමාජයට යම්කිසි සෙතක් වෙන්නේ නැහැ කියන එක කියනවා. එතකොට එයා ඒක සිංහලෙන් කිව්වද කියන එක මට තේරුණේ නැහැ. මම දන්න තරමින් එයා සිංහලෙන් කිව්වේ නැහැ. එතකොට ඒ කියන්නේ අපිට 371 කියන්නේ අපේ ඒක හොඳටම ඇති කියන තර්කය ගේනවා. ඒ කියන්නේ වැඩි නෙමෙයි. මද්‍රසා කියන්නේ වැඩි නෙමෙයි. මම හිතන්නේ ලියාපදිංචිය තමයි 371 ක් වෙන්න ඕන. ඊට වඩා ලියාපදිංචි නොකළ ඒවා මම දන්න තරමින් තියෙනවා.

ප : විසි ලක්ෂයක් පමණයි මුස්ලිම් ජනතාව ඉන්නේ. ඒගොල්ලන්ට 371 යි මද්‍රසා තියෙන්නේ.

පි : ඔව්.

ප : ඔහු අර ආගමික පූජකවරයා ගැනත් කියනවා නේද? සිංහල භාෂාවෙන් මවුලවීතුමා කිව්වා ඉස්ලාම් ආගමේ ආගමික

FAIR COMMENT — BY JEZEEM —

නායකයෝ වගේ තමයි අපි ඉන්නේ. නමුත් අර දෙමළෙන් එහෙම කිව්වේ නැහැනේ නේද? දෙමළ භාෂාවෙන්. මොකද ඉස්ලාම් ආගමට නබිතුමන් අල්ලාහ් දෙවියන් වහන්සේ හැර වෙන ආගමික නායකයෝ නැහැනේ.

පි : නැහැ.

ප්‍ර : නමුත් අර පූජකතුමා සිංහලෙන් කිව්වේ අපි තමයි ඉස්ලාම් ආගමේ ඉන්න ආගමික නායකයෝ. අපි තමයි මේ ඉස්ලාම්වරුන් සහ අනෙකුත් ආගමිකයන් අතර සංහිදියාව ඇති කරන්නට කටයුතු කරන පිරිස. එහෙම කිව්වා නේද?

පි : කිව්වා.

ප්‍ර : දෙමළෙන් එහෙම කිව්වේ නැහැ නේද?

පි : දෙමළෙන් එයා කියනකොට පරිවර්තනයේදී කිව්වා ඇවිල්ලා ඉස්ලාම් ආගමේදී ඇවිල්ලා අපි දෙවියෙක් අදහන නිසා ඒ ආගම ගෙනියන්න අපි තමයි ඉන්නේ කියන එක. ඒ කියන්නේ පුජකයන් තමයි ඒක කරන්නේ කියන කථාව තමයි එයා කිව්වේ දෙමළෙන්.

ප්‍ර : දෙමළ භාෂාවෙනුත්?

පි : ඔව්. මම දන්න තරමින්.

****

(වීඩියෝ පටය වාදනය කරනු ලබයි.

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

(ස්වාමීනි එම CD පටය IAKR-09 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා)

ප්‍ර : රහුමාන් මහත්මයා දැන් ඔබ දැක්කා ඒ මද්‍රසා පිළිබඳව NIDA Foundation පිළිබඳව ඔබ දැක්කා මේ NIDA Foundation එක මගින් පවත්වාගෙන යන මේ මද්‍රසාව පිළිබඳව වූ ඉදිරිපත් කිරීම 2019 අප්‍රේල් මාසේ 24 වෙනිදා තමයි සිදු කරලා තියෙන්නේ. එතකොට ඒ කියන්නේ පාස්කු ප්‍රහාරයට පසුව. ඒ වගේම ඔබ දැක්කා සිංහලෙන් තමයි මේ ඉදිරිපත් කිරීම කරලා තියෙන්නේ. එහෙමනම් විශේෂයෙන්ම මේ එදින මේ මද්‍රසාවට පැමිණි බෞද්ධ, කිතුණු ආගමිකයන් අරමුණු කරගෙන තමයි ඒ ඉදිරිපත් කිරීම සිදු කරලා තියෙන්නේ. ඒ ඉදිරිපත් කිරීමේ ඔවුන් විසින් පවසන ලද කරුණු ඒ ඉදිරිපත් කිරීම් සියයට සීයක්ම නිවැරදිද?

පි : ඒ කියන්නේ ඇවිල්ලා දැන් ඒගොල්ලන් කියන දේවල් ඇවිල්ලා උඩින් පෙනෙන කරුණු ටික විතරයි කියන්නේ. ඒගොල්ලෝ

Parliament Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ඇවිල්ලා සාමාන්‍යයෙන් මද්‍රසා පාසල්වල උගන්වනවා ඇවිල්ලා තබ්ලික් මතවාදය උගන්වන මද්‍රසාවක් තමයි ඒක. ඒක ඒගොල්ලන් කියන්නේ නැහැ. ඒක තාලිම් කියන එක උගන්වන එක කියන්නේ නැහැ. ඉල්ලියාස් කියන එක්කෙනා රචිත තාලිම් කියලා ග්‍රන්ථයක් තියෙනවනේ.

ප්‍ර : ඔව්?

පි : ඒගොල්ලන් කියන්නේ කුරානයේ උගන්වලා දෙනවා, හදීස් උගන්වලා දෙනවා කියන එක විතරයි. අනිත් එක සහිරා විද්‍යාලය සමාන කරනවා මද්‍රසා පාසලකට. එතකොට එවකට අධිරාජ්‍යය කාලයේදී මිෂනාරී ක්‍රමයට විරුද්ධව ඕල්කට්තුමා සහ ඒ වගේ පුරුදුද ඇති වුණා අධ්‍යාපනවලදී. එතකොට සිංහල බෞද්ධ ජනතාවට ආනන්ද වගේ පාසල් බිහි වෙනකොට, ශාන්ත තෝමස් වගේ පාසල් බිහි වෙනකොට, එතකොට දෙමළ ජනතාවට විවේකානන්ද වගේ පාසල් බිහි වෙනකොට, කොළඹ මුස්ලිම් ජනතාවට සහිරා විද්‍යාලය කියන පාසල බිහි වුණා. එතකොට අරාබි භාෂාවෙන් මද්‍රසා ඉගැන්වුවේ සාමාන්‍යයෙන් පාසලක්. එතකොට මෙතන ඒ පාසලේ කවදාවත් පූජක අධ්‍යාපනය උගන්වලා නැහැ. එතකොට ....,

ප්‍ර : ඒ කියන්නේ සහිරා විද්‍යාලයේ ඒ මද්‍රසාවක්. නමුත් එහි පූජක අධ්‍යාපනය කරන්නේ නැහැ. ඒකයි ඔතන කියන්නේ?

පි : පිරිවෙන් අධ්‍යාපනයක් නැහැ. ලංකාවේ ප්‍රථම කාන්තා විද්‍යාලය වන කයිරියා එකත් මුස්ලිම් කාන්තා විද්‍යාලයත්. ඒකත් මද්‍රසා කියලා තමයි පටන් ගත්තේ. මද්‍රසා නැත්නම් කයිරියා කියලා. එතකොට එතනදිත් ඒගොල්ලන් එක්කෝ අනවබෝධයෙන් කථා කරනවා නැත්නම් ඒගොල්ලන්ට උගන්වලා දීපු දේ එයා කථා කරනවා. මම හිතන්නේ උගන්වලා දීලා ඇත්තේ Training එක කරලා ඇත්තේ ඔතන හිටියා මුනීෆ් මුනාෆර් කියලා.

ප්‍ර : ඔහු කුමක් ගැනද කථා කළේ මෙතන ඉදිරිපත් කළේ?

පි : එයා තමයි Welcome to our masjith කියන Programme එක Centre for Islamic Studies කියලා වැල්ලවත්තේ තියෙනවා රෝහිණී මාවතේ ආයතනයක් CIS කියලා. ඒ ආයතනයේත් එතුමා කටයුතු කරනවා. ඒකෙනුත් කරන්නේ අන්‍යාගාමිකයන් ඇවිල්ලා ඉස්ලාම් දහමට ආවොත් ඒගොල්ලන්ට Training දෙන ආයතනයක් තමයි CIS කියන්නේ. ඒ කාලයේ සම්බන්ධ වෙලා වැඩ කරපු කට්ටිය. ඊට අමතරව ..,

ප්‍ර : මේ වනවිට CIS එම ආයතනයෙන් අධ්‍යාපනය ලබපු කෙනෙක් ඔබතුමන්ලාගේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීලා

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

තියෙනවා බෞද්ධාගමිකයෙක් වෙලා ඉඳලා මුස්ලිම් ආගමට ගිහිල්ලා ඒ ආගම ඉතා දැඩිව හදාරන ලද කෙනෙක්?

පි : ඊට අමතරව එතුමා ඇවිල්ලා Zam Zam Foundation කියලා උලමා සභාවට ඊළඟ නායකත්වයක් රිස්වි මුෆ්තිට පස්සේ එනවා නම් යූසුෆ් මුෆ්ති කියලා පුද්ගලයෙක් ඉන්නවා. ඔහු වටා නලිමීවරු ගොනු කරලා ස්ථානගත කරලා තියෙනවා. හේතුව ඇවිල්ලා පසුකාලයේදී ඇවිල්ලා දැන් උලමා සභාවේදී රිස්වි මුෆ්තිගේ අතින් පරිපාලන බලය ගිලිහිලා එයා නායකත්වයට සුදුසු නැහැ කියලා මතයක් ගොඩ නැගුණොත් ඔහුගේම තබ්ලික් නිකායට අයිති එක්කෙනෙක් තමයි යූසුෆ් මුෆ්ති කියන්නේ. එතකොට ඔහු වටා මුනීර් නවුෆර් වගේ අම්හර් මවුලවී වගේ ඔය චතුර ලෙස සිංහල භාෂාවෙන් කථා කරන්න පුළුවන් හොඳ ධනාත්මක චින්තන උඩින් කථා කරන කට්ටියව තමයි දැනට දෙවන පෙළ වශයෙන් සූදානම් කරලා තියෙන්නේ.

ප්‍ර : ඒ ඔය Zam Zam Foundation එකේද?

පි : Zam Zam Foundation එක වටා ඒක යූසුෆ් මුෆ්ති කියන තබ්ලික් නිකායට අයිති එක්කෙනෙක්. එතකොට එතුමාත් ඇවිල්ලා උලමා සභාවේ නායකත්වයට එන්න අදහසක් දැඩිව ඉන්න පුද්ගලයෙක්. එතකොට රිස්වි මුෆ්ති නිසා එතුමාට එන්න බැරි අවකාශයක් තියෙනවා. එහෙම නම් අර මත ගැටුමක් ඇති වෙලා ඒ සංවිධාන අතර එයාට ඒ තැනට එන්න සිදු වුණොත් ඒ එන්න කලින්ම එයා වටා ඉන්නවා නලිමීවරු. එතකොට මම කියන්නේ ඇවිල්ලා නලිමීවරු ගාව තියෙන අර Ideology Work කියන එක එතනම ඒගොල්ලන් අර එන්න පෙර සූදානම් ඇතුව තමයි එන්නේ. ඒ කියන්නේ ඒ එන එක්කෙනාවත් අල්ල ගන්න බලාගෙන තමයි ඇවිල්ලා ඉන්නේ. එතකොට දැන් Samson Foundation එකෙනුත් කරන්නේ NIDA Foundation වගේ සමාජ සත්කාර. ඒ කියන්නේ වතුකරයේ ගිහිල්ලා ගෙවල් හදලා දෙනවා. ඒ වගේ ඒගොල්ලන්ගේ ලොකු බිල්ඩිමක් තියෙනවා දෙහිවල නැත්නම් ගල්කිස්ස ප්‍රදේශයේ. එතකොට දැන් ඒවට මුදල් එන්නේ කොහොමද. ඒගොල්ලන් සාමාන්‍යයෙන් පූජකයෝ.

ප්‍ර : Zam Zam Foundation එකේ ඉන්නේ?

පි : ඔව්. එතකොට ඒගොල්ලන්ගේ තාත්තා පූජකයෙක්. එහෙම පූජක පරම්පරාවෙන් නුවර ප්‍රදේශයේ පදිංචි එක්කෙනෙක් තමයි යූසුෆ් මුෆ්ති කියන්නේ.

ප්‍ර : යූසුෆ් මුෆ්තිගේ තාත්තා පූජකයෙක් ඔබ කියන්නේ?

පි : පූජකයෙක්. එයාගේ සීයත් පූජකයෙක්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : පරම්පරාවම පුජකයෝ?

පි : පූජකයෝ. එතකොට ඒගොල්ලන් ඇවිල්ලා මද්‍රසා පාසලුත් ලංකාවේ ඒගොල්ලන් තනියෙම තාත්තා වෙනම, සීයා වෙනම, දැන් ඉන්න යූසුෆ් මුෆ්ති වෙනම හදලත් තියෙනවා. එතකොට මෙයා යන්නේ වෙනස් ආකාරයකින් තමයි යන්නේ.

ප්‍ර : ඒ කියන්නේ යූසුෆ් මුෆ්ති?

පි : මුෆ්ති.

ප්‍ර : ඇයි ඔබ එහෙම කියන්නේ?

පි : තාත්තලා ඉස්සර ගියේ ඇවිල්ලා සූෆි කට්ටියත් එක්ක තමයි ගියේ. මෙයා ඇවිල්ලා යන්නේ නලීමිවරු එක්ක තමයි මෙයාගේ ගමන තියෙන්නේ. එතකොට යූසුෆ් මුෆ්ති කියන පුද්ගලයා තමයි Ceylinco Profit Sharing ආයතනයේ අර ඉස්ලාමිය ෂරියා බැංකු කියලා හැදුවනේ. ඒකට මුදල් ආයෝජනය කරන්න මුස්ලිම් ජනතාවට ඒ ෂරියා Supercity Board කියලා තියෙනවා හැම මුල්‍ය ආයතනයකම ඉස්ලාමීය. ඒකේ එන එක්කෙනෙක් තමයි මේ යූසුෆ් මුෆ්ති කියන පුද්ගලයා. ඊට අමතරව යූසුෆ් මුෆ්ති ඇවිල්ලා අර පිරිමිඩ් ක්‍රමය ලංකාවේ තහනම් කරානේ.

ප්‍ර : මොන ක්‍රමයද?

පි : පිරමිඩ්.

ප්‍ර : පිරමිඩ්. ඔව් මුදල් සම්බන්ධයෙන්?

පි : මුලින් ඒකට Gold Coins ඒකට සල්ලි දාන්න කියලා මුලින් කිව්වා. පස්සේ ඒක ඒ කියන්නේ ඒක නීතිමයභාවය ගැන ප්‍රශ්නයක් තිබුණ නිසා එයා ඊට පස්සේ ඒක ඉල්ලා අස්කර ගත්තා. එතකොට ඒ වගේ තමයි මුස්ලිම් සමාජය වැරදි ලෙස Guide කරනවා. දැන් ඔය Ceylinco Profit Sharing එක වහලා. එතකොට ඒකේ මුදල් ආයෝජනය කරපු ජනතාව අද පාරේ. එතකොට හිස්බුල්ලා අමාත්‍යවරයා පවා එයාගේ බිරිඳ හෝ කවුරු හරි ඒකෙන් මුදල් අරන් තියෙනවා. මොකක් හරි ආපදා තත්ත්වයක් පළ කරලා එයාගේ මොකක් හරි ගින්නක් අරගෙන තියෙනවා කියලා එයා Lost එක පෙන්නලා තියෙනවා.

ප්‍ර : ඔව්. ඔබ පසුගිය අවස්ථාවේ ඒ ගැන කිව්වා. ඒ නිසා ඒ ගිණි ගැනීම නිසා එහි ආයෝජනය කරන ලද අනෙක් මුස්ලිම් ප්‍රජාවට තමන්ගේ ආදායම අහිමි වුණා කියලා?

පි : ඔව්. එතකොට ඒ වගේ සමාජය වැරදි ලෙස මඟ පෙන්වන කට්ටිය තමයි මේගොල්ලන්. එතකොට දැන් ඔය CIS ආයතනය හරහා දැන් ඔය ඒගොල්ලන් ඇවිල්ලා Professional කොහොමද

FAIR COMMENT BY JEZEEM

බෞද්ධ කට්ටියට ආමන්ත්‍රණය කරන්නේ කියලා, Marketing කරන්නේ කියලා.

ප්‍ර : ආ. කොහොමද කරන්නේ?

පි : ඒගොල්ලන් ඒකටම අනුගත වෙලා ඒගොල්ලන් කවුරු හරි ඒගොල්ලන්ව Train කරනවා. එතකොට ඒගොල්ලන්ගේ අර ඒ Training එක බලන්න ගියහම ඒක ඕනම අන්‍යාගමිකයෙක් ඒකට ආකර්ෂණය වෙනවා. අම්හාර් මවුලවීගේ කථා විලාශයට, යූසුෆ් මුනිර් මුනාෆර්ගේ කථා විලාශයට ඕනම අන්‍යාගමිකයෙක් ආකර්ෂනය වෙනවා. ඒ ආකාරයට ඔවුන්ට උගන්වලා තියෙනවා කවුරු හරි.

ප්‍ර : පුහුණු කිරීමක් කරලා තියෙනවා?

පි : කරලා තියෙනවා.

ප්‍ර : හොඳයි. එහෙමනම් ඔබට කියන්න පුළුවන්ද International Relief Organization IIRO කියන ආයතනය පිළිබඳව?

පි : ඒක මම හිතන විදියට නවුෆර් මවුලවී යටතේ තිබ්බ ආයතනයක්.

ප්‍ර : ඔව්?

පි : ඒකෙනුත් කරන්නේ...,

ප්‍ර : නවුෆර් මවුලවී උලමා සභාවේ වගේ ෂූරා සභාවේත් ඉතා ප්‍රබල චරිතයක්නේ?

පි : ඔව්. එතකොට ඒකෙනුත් කරන ඒ වචනයෙන්ම එනවා Relief කියන වචනය. ඒකෙනුත් ඇවිල්ලා සාමාන්‍යයෙන් පල්ලි හදන ක්‍රම, ඔය ළිඳවල් හදලා දෙන ඒවා, ඒවා තමයි ඒගොල්ලෝ කරන්නේ.

ප්‍ර : ඒගොල්ලන්ට මුදල් කොහෙන්ද? ඒක දේශීය ආයතනයක්ද නැත්නම් ඒකට ජාත්‍යන්තර වශයෙන් ....?

පි : ඒකට ජාත්‍යන්තර, මැද පෙරදිග රටවල්වලින් තමයි සල්ලි එන්නේ. ඊට අමතරව වෙන රටවල්වලින් එනවද දන්නේ නැහැ. දේශීය වශයෙනුත් ඔවුන් මුදල් ගන්නවද දන්නේ නැහැ සාමාන්‍යයෙන් දේශීය වශයෙන් මුදල් සාමාන්‍යයෙන් වහාබි NGO සහ කට්ටිය ගන්නේ නැහැ. ඒගොල්ලන්ට වැඩිපුර එන්නේ ඇවිල්ලා විදේශීයවලින්.

ප්‍ර : විදේශවලින් තමයි ඒගොල්ලන්ට මුදල් ලැබෙන්නේ. ඒගොල්ලන්ගේ එම ආයතනයේ ප්‍රධාන කාර්යාලය කොහේද පිහිටලා තිබෙන්නේ?

පි : ඉස්සරලා නම් තිබ්බේ මහවිල ගාර්ඩන් උද්‍යානයේ තමයි තිබ්බේ. දැන් කොහේද දන්නේ නැහැ.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : අර Zam Zam Foundation එක ගැන අපි කථා කළොත් ඒක සම්බන්ධයෙනුත් ඒක තියෙන්නේ කොහේද ප්‍රධාන කාර්යාලය?

පි : දෙහිවල නැත්නම් ගල්කිස්ස ප්‍රදේශයේ.

ප්‍ර : දෙහිවල කියලා තමයි ඔබ කියලා තියෙන්නේ.

(ස්වාමීනි එයට අදාළවත් මේ අවස්ථාවේ වීඩියෝ පටයක් පෙන්වා සිටීම සඳහා අවසර අයැද සිටිනවා. මෙයත් අන්තර්ජාලයෙන් බාගත කරගන්නා ලද එකක්)

(ස්වාමීනි එම වීඩියෝ පටය IAKR-10 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා)

ප්‍ර : එතකොට ඔබට කියන්නට පුළුවන්ද Islamic Reserve Organization, IIRO කියන සංවිධානය ගැන?

පි : ඊට කලින් Zam Zam Foundation එක සම්බන්ධව මේ ළඟදී පුද්ගලයෙක් ඇවිල්ලා දැඩිව විවේචනය කරලා තිබ්බා.

ප්‍ර : කොහේද?

පි : මිස්ට යූසුෆ් මුෆ්ති පිළිබඳව Watsapp එකෙන්. එතකොට ඒ වීඩියෝ එක මගේ Phone එකේ තියෙනවා. ඊට පස්සේ ඒ විවේචනයෙන් පසුව ඒ පුද්ගලයාට මෙයාට උදව් කරන ව්‍යාපාරික ප්‍රජාවක් ඉන්නවා. ඒ ව්‍යාපාරික ප්‍රජාව හරහා එයාට යම්කිසි ඒක Withdraw කරන්න කියලා. පස්සේ එයා Withdraw කළේ නැහැ. ඒ කියන්නේ ඒකේදී එයා කියනවා තුර්කි කථාවක් එහෙම කියනවා.

ප්‍ර : මොකද්ද කියන්නේ?

පි : තුර්කියට ගියේ නැත්තේ ඇයි. ඔයා මේකට ගියේ. ඒ වගේ කථා ගොඩක් කියනවා. ඒ කියන්නේ මොකක් හරි මෙතන සහසිද්ධි සම්බන්ධතාවයක් ඊට පස්සේ එයා දන්න දෙයක් තියෙනවා. හැබැයි එයා දැඩි ලෙස විවේචනය කරනවා. මොකද හේතුව එයාට විවේචනය කරන්න හේතුව එයා මුස්ලිම් දේශපාලනඥයන් ගැන විවේචනයක් කළා. කවුද යුසුෆ් මුෆ්ති කියන පුද්ගලයා. මම හිතන්නේ මෙයා මුස්ලිම් කොන්ග්‍රස් එකේ ආධාරකරුවෙක්. ඊට පස්සේ එයා පෙරළා මෙයාට WhatsApp එකේ මෙයාට දැඩි විවේචනයක් කළා. ඒක විනාඩි 10 ක 12 ක මේකක්. ඒක Video Type එකේ එක්කෙනෙක් හදලා ඒක Social Mediaවලට ගියා. එතකොට ඒ පුද්ගලයා කියන සමහර අර තුර්කි සම්බන්ධ දේවල් ඒ මොකක් හරි දෙයක් මටත් ගැටළු සහගතයි. ඒ වගේම එයාගේ අර මූල්‍ය සම්බන්ධ දේවලුත් කථා කරනවා. ඉස්සර මුස්ලිම් දානපතියන් තමයි මුස්ලිම් ජනතාවට යම්කිසි දේවල් ලබා දුන්නේ.

FAIR COMMENT BY JEZEEM

දැන් මේගොල්ලන් මොනවද කරන්නේ සංවිධාන හදාගෙන මුස්ලිම් දානපතියන් ටික තමන්ගේ Control එකේ තියාගෙන මේගොල්ලන් සමාජ Control එක ගන්න තමයි මේගොල්ලන්ගේ තියෙන මේක Plan එක.

ප : ඒ අනුව දැන් සමාජය තේරුම් ගන්නේ මුස්ලිම් ප්‍රජාව තේරුම් ගන්නේ ඒගොල්ලන්ගේ ගැලවුම්කාරයෝ විදියට මේ ආයතන එතකොට?

පි : මේ ආයතන කියලා. එතකොට ඒ වගේම තමයි මේගොල්ලන් මුස්ලිම් ජනතාවට වඩා වැඩි සේවයක් කරන්නේ ඇවිල්ලා අන්‍ය ජාතිකයන්ට. මුස්ලිම් සමාජයේ දැන් නිවාස ප්‍රශ්න තියෙනවා. ඒවා විසඳන්නේ නැහැ. මොහු කියන්නේ මේ අන්‍ය සමාජයේ නිවාස ප්‍රශ්න විසඳන්න ඕන. මුස්ලිම් සමාජයේ පීඩිතයන්ව පීඩිතභාවයෙන්ම තියා ගන්නවා. මොකද ඒගොල්ලන්ගේ යම්කිසි දේවල්වලට ඒගොල්ලන්ව ප්‍රයෝජනයට ගන්න පුළුවන්නේ. පීඩිත භාවයට විසඳුමක් ලබා දුන්නොත් ඔය ඉස්ලාමීය කියන සකාත් ක්‍රමය ක්‍රියාත්මක කරන්න ගියොත් ඒ ජනතාව ඔක්කොටම සහන ලැබුණොත් ඒ පීඩිත කොටියාශය එහෙමම ඉන්නවනේ.

දැන් වේලාව : පෙ.ව. 11.30 යි
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව පෙ.ව. 11.30 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : සකාත් ක්‍රමය කියන්නේ මොකක්ද?

පි : සකාත් ක්‍රමය කියන්නේ ඉස්ලාම් ආගමේ තියෙනවා 2% ක් අර රාමලාන් මාසයේදී බද්දක් වශයෙන් හරි මොකක් හරි වශයෙන් දුප්පත් ජනතාවට බෙදා දෙන්න. ඒකේ අවම වශයෙන් කියන්නේ හාල් කිලෝ 2 ½ ක් හරි ලබා දෙන්න කියලා. ඒක ලබා දෙන්නේ අවුරුද්ද දවසේ හරි ඒගොල්ලන් බඩගින්නේ ඉන් නැතුව අවුරුද්ද සමරන්න ඕන කියන තේමාව යටතේ. එතකොට දැන් මේගොල්ලන්ගේ මේ සංකල්පය තුලින් සැම්සැම් Foundation වගේ ආයතනවල සංකල්පය තුලින් මුස්ලිම් ජනතාව අතර තියෙන අර දැන් control එක අතට යනවානේ. සමාජයේ ව්‍යාපාරිකයන් තනි තනි වශයෙන් ඒක දුන්නොත් ගන්නේ නැහැ. එක්කෝ මේගොල්ලන් මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුව හරහා මේවගේ දේවල් කරන්න ඕන. එතකොට මේගොල්ලන් ආයතන බිහි කරලා කරන්නේ ඇවිල්ලා සමාජ control එකක් අරගෙන සමාජය මෙහෙයවන්න.

ප්‍ර : සමාජ පාලනය ඒගොල්ලන් අතට ගැනීම තමයි ඔවුන් සිදු කරන්නේ කියලයි ඔබ කියන්නේ?

පි : ඔව්.

ප්‍ර : හොඳයි බොහොම ස්තූතියි. එහෙමනම් ඔබට පුළුවන්ද මේ Islamic Reserve Organization IRO කියන සංවිධානය පිළිබඳව පැහැදිලි කරන්න ගරු කොමිෂන් සභාවට?

පි : IRO කියන එකේ ඉන්නවා ආදිල් හසන් කියලා.

ප්‍ර : කවුද ඒ? එයා තමයි නායකයා?

පි : එයා මම හිතන්නේ අපේ සමකාලීන වයස තියෙන එක්කෙනෙක්. එතකොට එයා කරන්නේ ඇවිල්ලා ධර්ම ප්‍රචාරණය අබ්දුල් රාසික් වගේ ධර්ම ප්‍රචාරණය කිරීම තමයි එයා කරන්නේ.

ප්‍ර : ඒ කියන්නේ මේක ධර්මය ප්‍රචාරය කිරීම සඳහා තියෙන සංවිධානයක්ද?

පි : සංවිධානයක්. එතකොට..

ප්‍ර : මේක වඩා ප්‍රචලිත මුස්ලිම් ප්‍රජාවේ කුමන වයස් කාණ්ඩ අතරද?

පි : තරුණයන් අතර.

ප්‍ර : ඇයි ඒ?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : මෙතුමා ඇවිල්ලා Amal International එකේ කඳවුරක් පැවතුනා අපි ඉස්කෝලේ ඉගෙන ගන්න කාලේ.

ප්‍ර : ඒ කියන්නේ ඇමැල්?

පි : අමාල් හැව්ලොක් සිටි එකේ ඉස්සරහා. එතකොට ඒ ඉස්කෝලේ තිබ්බා පොඩි කඳවුරක්. Leadership Camp වගේ Training Camp වගේ අපි ඉස්කෝලේ යන කාලේ මමත් ගිහිල්ලා තියෙනවා. තවුසි කියන එක්කෙනාත් එතනට ආවා කියලා මට මතකයක් තියෙනවා. එතකොට එතන මේ ආදිල් හසන් කියන එක්කෙනත් ආවා. ඒක එක්කෙනා එක එක කතා පැවැත්තුවා.

ප්‍ර : ඔබ ගියෙත් ඒකේ පුහුණුවකටද?

පි : මමත් ගියේ පුහුණුවකට.

ප්‍ර : ඇයි ඔබට හිතුනේ එතන පුහුණු වෙන්න යන්න?

පි : සාමාන්‍යයෙන් ඒ කාලේ අපේ අර තරුණ කාලේදී අපි මොකක් හරි සහතිකයක් දෙනවා, ඒවා දෙනවා, ට්‍රේනින් එකක් නිකම් ඉන්න හින්දා, යම්කිසි දෙයක් ඉගෙන ගන්න ඕන කියන මතයෙන් ගියා.

ප්‍ර : ඒ කාලේදී ඔබ පාසැල් යනවද?

පි : පාසැල් යනවා.

ප්‍ර : ඒ යන ගමන් තමයි මේ සංවිධානයට ගියේ ඉගෙන ගන්න?

පි : ඉගෙන ගන්න නෙමෙයි දවසක කඳවුරක්. දවස් දෙකක් නැත්නම් තුනක නිකම් පාට් ටයිම් එකක්. ඉතින් ඒකේ මම හිතන්නේ තවුසි සම්බන්ධ කරලා තමයි අපි යන්න ඇත්තේ. එතකොට නැත්නම් මට එහෙම සම්බන්ධකමක් තිබ්බේ නැහැ. මට මතකෙත් නැහැ මම කොහොමද එතනට ගියේ කියන එක. එතකොට දැන් ඒකට මෙයා ආවා කියන එක හොඳ මතකයක් තියෙනවා.

ප්‍ර : ඒ ආවේ ආදිල් හසන්?

පි : ආදිල් හසන් ඇවිල්ලා ගුවන් විදුලි සංස්ථාවෙත් වැඩ සටහනක් ලබා දීලා තිබ්බා මුස්ලිම් සේවයේ. මම හිතන්නේ 11 ට නැත්නම් 10 ½ උදේ කාල වකවානුවේ තමයි.

ප්‍ර : ඒ කියන්නේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ?

පි : ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මුස්ලිම් සේවයේ. මොකක් හරි එයාගේ කතාවක් හරහා එයාගේ වැඩ සටහන නැවැත්තුවා. ඊට පස්සේ එයා ඒකට උද්ඝෝෂණ කරන්න පවා ලෑස්ති වුණා. ඒක මට මතක තියෙන විදියට මුජුබර් රහුමාන්ගේ මාළිගාවත්ත කාර්යාලයටත් ඇවිල්ලා එයා ඒ සම්බන්ධව පැමිණිලි කළා. එතකොට මෙයා ඇවිල්ලා මුස්ලිම් ජනතාව අතර ඒ කියන්නේ

FAIR COMMENT — BY JEZEEM —

තරුණයන් අතර මෙයාගේ CD පට ඔක්කොම හරි ප්‍රසිද්ධයි. ආදිල් හසන් කියලා. එතකොට මෙයා සිකුරාදා දේශනා පවත්වනවා. මම හිතන්නේ මෙයා පූජක අධ්‍යාපනයකුත් ලබලා තියෙනවා. ඒ කියන්නේ අපේ පාසැල් අධ්‍යාපනයෙන් පස්සේ. ඒක අවුරුදු කීයක් ලැබුවද, කොහොමද ලැබුවද instant ඒවාද කියන එක මම දන්නේ නැහැ.

ප්‍ර : දැන් ඔබ කිව්වනේ ඔහු ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මුස්ලිම් සේවයෙත් යම් යම් දේශනා කරනවා කියලා. ඒවා මොන තත්ත්වයට බර දේශනාද, ඒවා ධර්මය පිළිබඳවද නැත්නම් අන්තගාමී අදහස් ද?

පි : සූෆී කට්ටියගේ වත්පිළිවෙත් වලට attack කරලා කතා කරන මට්ටමේ තිබ්බා. ඒ කියන්නේ රාජ්‍ය මාධ්‍යය භාවිතා කරන ඒකට උදව් කලෙත් සූෆී කෙනෙක්ම තමයි. ඒ කියන්නේ ඒ කාලේ Director වශයෙන් හිටියා අහමඩ මුනව්වර් කියලා. එයා කහටෝවිට ප්‍රදේශයේ පුද්ගලයෙක්.

ප්‍ර : ඇයි ඉතින් සූෆී නිකායෙන් එන කෙනෙකන් සූෆී වරුන්ට පහර දීම සඳහා මේ ආදිල් හසන්ව යොදා ගත්තේ?

පි : මම හිතන්නේ මට මෑතකදී හෙළි වුණා ඔය අහමඩ් මුනව්වර් කියන පුද්ගලයාගේ පුතා නැත්නම් දුව බැඳලා ඉන්නේ ඇවිල්ලා මේ දෙහිවල බෝම්බකරු ඉන්නවානේ

ප්‍ර : ජෙමිල්.

පි : ජෙමිල්ගේ නංගීව. එතකොට ඒ වගේ සම්බන්ධකම් ඔස්සේ තමයි මේ ගුවන් විදුලි සංස්ථාව ආක්‍රමණය කරන්නේ. එතකොට ඊට අමතරව ඇවිල්ලා එයාට සන්තෝෂම් වශයෙන් එයාට වෙන වෙන මුදල් යටින් ලැබිලා ඇතියි කියලා තමයි මම හිතන්නේ. ඊට අමතරව මේකට Advertisement Commission එහෙම ලැබෙනවා නේ. ඉස්සර මුස්ලිම් සේවය තිබ්බේ Free. Airtime එකක්. මෙයා ඒක වාණිජකරණය කළා.

ප්‍ර : ඒ අනුව දැන් මුදල් ගෙවලා ඕනේ ඒ කාලය ලබා ගන්න?

පි : කාලය ලබා ගන්න. හැබැයි සමහරක් වැඩ සටහන්වලට විතරයි. Organization වලට විතරයි. එතකොට ඒකෙන් තමයි ඩොක්ටර් මරීනා රිෆායිගේ සංවිධානයට, ද සැම්සැම් Foundation එහෙම, එහෙම සංවිධානවලට මේක දුන්නා. එතකොට ඒගොල්ලන් හොඳටම දන්නවා සූෆී කට්ටිය ඒවට වියදම් කරන්නේ නැහැ කියලා.

ප්‍ර : එතකොට මේ අයට තමයි ප්‍රමුඛත්වය ලැබෙන්නේ මුදල් ගෙවන හින්දා. ඒ අනුව ගුවන් කාලය වෙන් වෙනවා?

Prestige Agency Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒ කියන්නේ සුෆී කෙනෙක් හරහාම තමයි ඒගොල්ලෝ උපයෝගී කර ගත්තේ. ඒගොල්ලෝ එහෙම තමයි trend එක යන්නේ. කොහොම හරි ක්‍රමයකින් වක්‍ර ක්‍රමයකින් අල්ල ගන්නවා කොහොමද ඒ team එක අල්ල ගන්න ක්‍රමයට. ඔහොම තමයි අර සැම්සැම් Foundation එක හරහා අර උලමා සභාවේ යම්කිසි රිස්වි මුක්තිගේ පාර්ශවයෙන් පසුබෑමක් වුනොත් ඒක අල්ල ගන්න පෙර සුදානමක් තියෙනවා. ඒ වගේ සමාජ සූදානමක් මේ කට්ටියගේ, හැබැයි සුෆී මුස්ලිම් අතරේ එහෙම බලය අල්ලා ගැනීම ඒ වගේ දේවල් සම්බන්ධයෙන් ඒගොල්ලන්ට නැඹුරු නැහැ. ඒගොල්ලන්ට තියෙන්නේ ඇවිල්ලා හොඳ ජීවිතයක් ගත කරලා දෙවියන් ගාවට යන්න ඕන එක විතරයි ඒගොල්ලන් ගාව තියෙන්නේ.

ප්‍ර : ඒ කියන්නේ අධ්‍යාත්මික දියුණුව තමයි ඒගොල්ලන් බලන්නේ ඔබ කියන්නේ?

පි : ඔව්.

ප්‍ර : ඔබ දන්නවද ආදිල් හසන් කුමන ආයතනයකද පුහුණු වෙලා තියෙන්නේ කියලා?

පි : මම හිතන විදියට WAMY ආයතනයෙන් බොහෝදුරට පුහුණුව ලබලා ඇති එයා.

ප්‍ර : එහෙනම් ඔබට කියන්න පුළුවන්ද මොකක්ද මේ WAMY ආයතනය කියන්නේ?

පි : WAMY ආයතනය සම්බන්ධයෙනුත් මම CD පටයක් මෙතන තියෙනවා ෆෝල්ඩරයක් යටතේ. ඊට අමතරව WAMY ආයතනය සම්බන්ධව ..

(ස්වාමිණි WAMY ආයතනයට අදාල Video පටයක් ඡායාරූප පෙන්වීම සඳහා මේ අවස්ථාවේ ගෞරවයෙන් අවසර අයැද සිටිනවා)

ස්වාමිණි Google ආයතනයෙන් ඒ සභායෙන් ලබා ගන්නා ලද ඒ දර්ශනයි මේ පෙන්නුම් කරන්නේ. මාළිගාකන්ද පාරේ තියෙන්නේ ස්වාමිණි. අංක 169 කියන ස්ථානයේ

පි : ඒක Address 2 ට සම්බන්ධ වෙලා තියෙනවා.

ප්‍ර : මොනවද ඒ Address 2?

පි : මේ පැත්තෙන් තියෙන්නේ ආනන්ද ඉස්කෝලේ පාරත් පාවිච්චි කරනවා. ආනන්ද මාවතද වයිට් පාර්ක් Road කියලද කියන්නේ ඒකට. ඒ පැත්තේ තියෙනවා ඒ ෆ්ලැට් එකට ගමන් කරන්න දිශාවන් 2 ක් තියෙනවා. ඒ Address දෙකම පාවිච්චි කරනවා.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ඒගොල්ලන් පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ඒගොල්ලන්ගේ බෝඩ් එකත් ගලවලා තමයි තියෙන්නේ.

ප්‍ර : මේ බිල්ඩිං එක කෝ?

පි : ඒ ෆ්ලැට් එකේ වම් පැත්තේ entrance එකක් තියෙනවා. ඒක යන්නේ ආනන්ද ඉස්කෝලේ ඉස්සරහා පැත්තට.

ප්‍ර : ඒක තමයි ෆ්ලැට් එක?

පි : ඒ ෆ්ලැට් එකේ අයිතිකරුගේ පුත්‍රයා සහ මේ පාස්කු ප්‍රහාරය සම්බන්ධව අත් අඩංගුවට ගත්තා කියන පොඩි News එකකුත් මගේ අර නිසාර්ඩීන් කියන මිත්‍රයා හරහා මම දැන ගත්තා.

ප්‍ර : නම මොකක්ද ඔහුගේ?

පි : නම නම් මට දන්නේ නැහැ.

ප්‍ර : නමුත් ඔබ දන්නවා පාස්කු ප්‍රහාරයට පස්සේ අත්අඩංගුවට ගත්තා කියලා ඔහුගේ පුත්‍රයාව?

පි : ඔව් මේ අයිතිකරුගේ හරි WAMY ආයතනයට දුන්න එක්කෙනා හරි. ඒ කියන්නේ එයාගේ හිතවත්කම මෙතන WAMY ආයතනයට ආවද කියන්න එක මම දන්නේ නැහැ. මම අනුමාන කරනවා. ඒ වගේ මෙන්න මේක තමයි මාළිගාකන්ද ඇඩ්‍රස් එක. මේ පැත්තේ තියෙන එක වම් පැත්තේ මෙහෙම යන කොට ඒකේ පාරත් වැටෙන්නේ ආනන්ද ඉස්කෝලෙ පාරට.

<u>ස්වාමීණි එම ඡායාරූපවල මුද්‍රිත පිටපතක්, මේ පුළුල් තිරයේ දැක්වෙන ඡායාරූපවල මුද්‍රිත පිටපතක් IAKR 11 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.</u>

ඊලඟට ස්වාමීණි WAMY එකට අදාලව CD පටයක්

පි : ඇඩ්‍රස් එකක් ඒකේ තියෙනවා 104/1 ආනන්ද මාවත, අනික් ඇඩ්‍රස් එක ඇවිල්ලා 210, මාළිගාකන්ද පාර.

ප්‍ර : මේ පෙන්නුම් කරන්නේ කවුද?

පි : මේ තමයි නිලාම් කියන පුද්ගලයා WAMY ආයතනයට සම්බන්ධ ඉෂාක් කියන එක්කෙනාගේ සහෝදරයා.

ප්‍ර : මේ පෙන්නන්නේ එතකොට කවුද ?

පි : ISIS එකට ගිහිල්ලා.

ප්‍ර : නිලාම්?

පි : නිලාම්. කරාටේ මාස්ටර්.

ප්‍ර : මේ ඔක්කොම ඡායාරූප නිලම්ගේ?

පි : මම අන්තර්ජාලයෙන් ලබා ගත්තු ඒවා.

ප්‍ර : ඔහු තමයි මැරුනේ සිරියාවේදී නේද?

පි : ඔව්.

ප්‍ර : මේ කවුද?

FAIR COMMENT — BY JEZEEM —

පි : මෙයා තමයි නඳුමාන් කියන එක්කෙනා වර්ථමාන WAMY Director. එයා සම්බන්ධව කියනවා නම් එයා ඇවිල්ලා ඩොක්ටර් මරීනා රිෆායිගේ ආයතනයක් තියෙනවා දාරුන්මුස්රා කියලා. ඒ ආයතනයේ ළමා අපචාර සම්බන්ධව පොඩි චෝදනාවක් එල්ල වෙලා තාම උසාවියේ විභාග වෙනවා නඩුව. ඒ සම්බන්ධව ඒගොල්ලන් වෙනුවෙන් ඒ කියන්නේ එහෙම දෙයක් සිද්ධ වුණේ නැහැ කියලා අපිත් එක්ක තර්ක කරලා නිසාර්ඩීන් මහත්තයයි අපි කණ්ඩායමක් ගියා ඒ අවස්ථාවේ. එගොල්ලන්ව ආරක්ෂා කරන්න මෙයා කතා කලා.

ප්‍ර : මේ පුද්ගලයා කතා කළා?

පි : කතා කලා. එයා තමයි වර්ථමානයේ දැන් ඉන්නවද දන්නේ නැහැ, එයා තමයි නඳීමාන්. එයා නලිමිවරයෙක්.

ප්‍ර : මේ පෙන්වන ඡායාරූපයේ ඉන්නේ ඔහු නලිමිවරයෙක්?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබ ඩොක්ටර් රිෆායි ගැන කතා කරපු නිසා මේ අවස්ථාවේදිම ඔබට කියන්නට පුළුවන්ද ඉස්මත් සම්බන්ධයෙන් ඔය ඩොක්ටර් රිෆායිට යම් සම්බන්ධතාවයක් තියෙනවද කියලා?

පි : ඒ කියන්නේ රිස්වි ඉස්මත් ඇවිල්ලත් අපිත් උද්ඝෝෂණයකට සහභාගී වුණා. ඒකට උසාවිය ඉස්සරහා. දාරුන්මුෂ්රා සම්බන්ධව.

ප්‍ර : ඒ අර ඔබ කිව්ව අනාථ නිවාසයේ සිදු වුණු ළමා අපචාර සිද්ධිය සම්බන්ධයෙන් තමයි මේ ..

පි : ඔහු සහභාගී වුණා කියන එක මම පස්සේ දැන ගත්තේ. මේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ. ඊට කලින් තමයි උද්ඝෝෂණය තිබ්බේ. එතකොට රිස්වි ඉස්මත් සහභාගී වෙලා ඔහුට යම්කිසි තර්ජනයක් ඔහු හරහා සිද්ධ වුණා කියන එක මාධ්‍යය වලින් මේ සිද්ධියෙන් පස්සේ අනාවරණය වුණා.

ප්‍ර : ඔබට දැන ගන්නට ලැබුණා?

පි : ලැබුණා.

ප්‍ර : ඒ මරණීය තර්ජනයක් යම් අවස්ථාවකදි එල්ල වුණා කියලා ඔබ දැන ගත්තද?

පි : ඔව් දැන ගත්තා. ඔහුත් කියලා සඳහන් කරලා තිබ්බා.

ප්‍ර : මේ කවුද?

පි : මෙයා තමයි උමර් රිදිරිස්

ප්‍ර : ඒ කවුද?

පි : එයා ඇවිල්ලා WAMY එකේ නඳුමාන්ට කලින් හිටපු අධ්‍යක්ෂක. එයා සම්බන්ධව විකිලිසුත් හෙළිදරව්වක් කරලා තියෙනවා.

President Secretariat Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : මොකක්ද කරලා තියෙන්නේ හෙලිදරව්ව? විකිලීස් මොකද කියන්නේ?

පි : එයා ඇවිල්ලා ජිහාඩිස් ට්‍රේනින් කරන එක්කෙනෙක් කියලා මේ හෙළිදරව්වේ තියෙනවා.

ප්‍ර : ජිහාඩිස් කෙනෙක් එයා. ඊලඟ එක්කෙනාට අපි කතා කරමු? ඊලඟ ඡායාරූපය?

පි : මේ ඔක්කොම WAMY එකේ Training photos.

ප්‍ර : මොන වගේ පුහුණුවක්ද දෙන්නේ WAMY එකේ?

පි : ඒගොල්ලන් ඇවිල්ලා පෙර සඳහන් කරපු ඒවා ඇවිල්ලා පාසැල් ළමයින්ට දෙන, ඒ කියන්නේ අ.පොෘ.ස සාමාන්‍ය පෙළ විභාගයෙන් පස්සේ හරි උසස් පෙළ විභාගයෙන් පස්සේ හරි සාමාන්‍යයෙන් අපි වෘත්තීය පුහුණුවලටනේ යන්නේ, එතන උමර් ඉදිරිස්ගේ ඡායාරූපයක් තියෙනවා. උමර් ඉදිරීස්ට ඔය යම්කිසි දෙයක් ලබා දෙන්නේ ඇවිල්ලා උලමා සභාවේ වර්ථමාන ලේකම් මුබාරක් මවුලවි.

ප්‍ර : උමාර් තමයි මේ කොටු කොටු ෂර්ට් එකක් ඇදලා ඉන්න එක්කෙනා?

පි : ඇඳන් ඉන්නේ. එයාට යම්කිසි ත්‍යාගයක් ප්‍රදානය කරනවා හැබැයි මේක WAMY එකෙන් තමයි උත්සවය සංවිධානය කරන්නේ. මම හිතන්නේ එයාගේ සේවා කාලය නිම වෙලා යන අවස්ථාවේදී වෙන්න ඕනේ. එතකොට වම් පැත්තේ වාඩි වෙලා ඉන්නේ ඇවිල්ලා ජාමියා නලීමියා ආයතනයේ දැන් අභාවප්‍රාප්ත වෙලා ඉන්න ඩොක්ටර් ශුක්රී. අර පොත ලබා දෙන්නේ උලමා සභාවේ මුබාරන් මවුලවි. අතන ඉන්නවා තාසිම් මවුලවි අල්ෂබාබ් ආයතනයේ. ඊට එහායින් ඉන්නවා අගාර් මොහොමඩ්. එයාත් ජාමියා නලීමියා එකේ සහ උලමා සභාවේ සහ ජමාතුත් සලාමා කියන සංවිධාන වල තනතුරු දරන පුද්ගලයෙක්. මම මෙතනට කියන්නේ ඇවිල්ලා මේගොල්ලෝ ගාව තියෙන සම්බන්ධකම. එතකොට මේකේ තියෙන සම්බන්ධකම් මේගොල්ලන් අතර තියෙනවා. එතකොට දැන් WAMY සංවිධානය මුස්ලිම් තරුණයන්ව ත්‍රස්තවාදී වැඩ කටයුතුවලට පාවිච්චි කළා කියන එක මේගොල්ලනුත් නොදැන ඉන්නවා කියන එක විදියක් නැහැ. ඒ කියන්නේ මොකක් හරි නායකත්ව පුහුණු වැඩ සටහන් හෝ කිසියම් හෝ දෙයක් ලබා දෙනවා නම් උලමා සභාව WAMY යටතේ තියෙන බැනර් එකක් යටතේ වාඩි වෙලා ඉන්නවා නම් ඒගොල්ලන් ඒක දැනගෙන ගිහිල්ලා වාඩි වෙන්න ඕනේ. උලමා සභාව විදියට කවුරු හරි ආරාධනා කළා පමණින් හැම එකටම යන

Proof Copy
FAIR COMMENT BY JEZEEM

එක නෙමෙයි උලමා සභාවෙන් සමාජයට මඟ පෙන්වන සංවිධානයක් වශයෙන් විය යුත්තේ. ඒ නිසා තමයි මම මේ ඡායාරූපය ලබා ගත්තේ.

ප : ඊලඟ ඡායාරූපය?

පි : මේ ඔක්කොම ඇවිල්ලා ඒගොල්ලන්ගේ Provisional Training Program .

ප : ඒ පුහුණුවීම් සඳහා සහභාගී වන්නේ තරුණයෝ නේද? තරුණ තරුණියෝ?

පි : තරුණයෝ.

ප : ඒගොල්ලන් පාසැල් යන අයද නැත්නම් පාසැල් ගිහිල්ලා අවසාන අයද?

පි : මේක ඇවිල්ලා මම හිතන්නේ Provisional Training එකක්. මේක වෘත්තිය වේදීන්ට දෙන Training එකක්.

ප : වෘත්තීය වේදීන්ට දෙන්නේ නමුත් මුස්ලිම් ප්‍රජාවට?

පි : මුස්ලිම් අධ්‍යාපන ක්‍රමය කෙසේද කරන්න ඕන, මම හිතන්නේ මේගොල්ලෝ සමාජය control කරන්න, control එකට ගන්න, ඒගොල්ලන්ට මඟ පෙන්නලා, ඒගොල්ලන්ට දන්නේ නැහැ ඒගොල්ලන් මොකටද පෙනී සිටින්නේ කියන එක. එතකොට ඒගොල්ලන් ඒගොල්ලන්ගේ WAMY එකෙන් කියන දේවල්වලින් පෙනී සිටලා ඒවා ක්‍රියාත්මක කරනවා.

ප : දැන් ඔබ අර පුහුණුවකට ගියා කිව්වානේ WAMY ආයතනයේ?

පි : ඔව්.

ප : එතකොට ඔබට මොනවද ඒ පුහුණුවට ලැබුණේ?

පි : ඒකේ හිටියා ඉෂාක් කියන එක්කෙනා. පස්සේ තමයි මම දැන ගත්තේ තවුසිගේ මස්සිනා කියලා මේ ISIS ප්‍රහාරවලින් පස්සේ. එතකල් මම දන්නෙත් නැහැ තවුසිගේ ඥාතීන් කියලා. තවුසි ඒක අපිට කිව්වෙත් නැහැ. ඒ වුණාට මට පේන විදියට තවුසි ඒ කාලේ ඉඳලා මේක රහසිගත භාවයක් රැකගෙන හිටියා කියන එක.

ප : දැන් ඔබ තවුසි ගැන නිතර කතා කරන නිසා මම හිතන්නේ අපි ගරු කොමසාර්ස්වරුන්ට ඒ ගැන කියන්න ඕන. තවුසි කියන්නේ කවුද? මොන සංවිධානයේ, මොන එක්කෙනාටද ඔහු සම්බන්ධ, කොහොමද ඔහු ත්‍රස්තවාදී කටයුතු සම්බන්ධයෙන් සම්බන්ධ කියන එකත් අපි මේ අවස්ථාවේම කියමු. කියන්ඩකෝ?

පි : එතකොට ඒකේ මම දන්න තරමින් මම මල්වාන අල්මුබාරක් එකට නායකත්ව පුහුණුවලට ගිහිල්ලා තියෙනවා. එහෙම බලංගොඩ ජෙයිලානි විද්‍යාලයට ගිහිල්ලා තියෙනවා Media

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Forum එක හරහා පැවැත්තුවා පන්නල YMMA එකේ training එකක්. ඒකටත් මම ගිහිල්ලා තියෙනවා.

ප්‍ර : ඔබ ඔය පුහුණුවීම් වලට ගියේ කොයි කාලෙද?

පි : මගේ පාසැල් වකවානු කාලෙන් පස්සේ සහ මීඩියා ෆෝරම් එකට ගියේ පාසැල් වකවානුවෙන් පස්සේ.

ප්‍ර : එතකොට ඒ යෑමට මඟ පෙන්නුවේ තවුසිද?

පි : තවුසි ඇවිල්ලා පාසැල් කාලේ ගියපු එකකට.

ප්‍ර : තවුසි සහිරා විද්‍යාලයේ ඔබත් එක්ක ඉගෙන ගත්ත කෙනෙක් නේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට තවුසි ඔබේ යාළුවෙක්?

පි : යාළුවෙක්.

ප්‍ර : දැන් තවුසිගේ මඟ පෙන්වීම අනුව තමයි ඔබ ප්‍රථමයෙන්ම ඔය පුහුණුවීම් වලට ගියේ?

පි : මම සහ මගේ පාසැල් මිත්‍රයන් සෑහෙන පිරිසක් ගියා.

ප්‍ර : එතකොට ඒ පුහුණුවීම්වලදී මොනවද ඔබලාට ඉගෙන ගන්න ලැබුණේ?

පි : කෙටියෙන් කියනවා නම් අර සිංදුවක් තියෙනවා ඇවිල්ලා, සඳ මුවාවෙලා වැහි වළාවකින් වාගේ ඔබේ රුව මොනවද කියන සිංදුවක්. ඒක ඇවිල්ලා You tube එකෙන් search කරලා බලන්න පුළුවන්. ඒ සිංදුවේ කියන්නේ ඇවිල්ලා මුස්ලිම් කාන්තාවක් සම්බන්ධව තමයි කියන්නේ. එතකොට මෙයා අපිට උගන්වලා දුන්නේ ඇවිල්ලා ඉෂාක් කියන එක්කෙනා ඒ සිංදුව පෙන්නලා මේ වගේ දේවල් මුස්ලිම් කාන්තාවන්ට අපචාර වශයෙන් වචන යොදලා කතා කරනවා. එතකොට මම කියන්නේ මේ කලාව සම්බන්ධව මොහිදින් බෙක්ලගේ කලාව සම්බන්ධව සහ එයා ගායනා කරපු ගීත සම්බන්ධව එහෙම දෙයක් ගෙනිච්චා. දැන් අපිට තේරෙනවා එදා අපිට තේරුන් නෑ මොකටද මේක උගන්වන්නේ කියලා, අපි ඕක නිකන් ඕක listening කරලා එනවා. නිකන් අපේ විනෝදෙටනේ අපි යන්නේ. දවස් 3 ක් නවතින්න ලැබෙනවා, කන්න බොන්න ලැබෙනවා ඒ ඔක්කොම හින්දා අපි යනවා. පස්සේ මේගොල්ලන් මට පේන විදියට selected crowd එකක් මෙතනදී ඒගොල්ලන් හඳුනා ගන්නවා ඇති. Identify කරන්න තමයි මේගොල්ලන් ඇවිත් මේක යොදා ගන්නේ. තේ වත්තක් උඩ අපිව නග්ගලා prayers කළා. මෙතන ඇඩිෂන් බංගලාවේ prayers තිබ්බනේ. ඒ වගේ අපිට prayers කරනවා. ඒ වගේම දුවනවා. Scout training ,

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ ශාරීරික අභයාස ලබා දෙනවා?

පි : ඔව් එතකොටත් මට මතකයි ඉෂාක් කියන පුද්ගලයා කියනවා අපිව සම්බන්ධව CID එකෙන් එනවා. අපිව හොයනවා, අපි මේ දුවන ඒවා සම්බන්ධව කියලා. එදා අපිට අවබෝධයක් තිබුණේ නැහැ ඇයි මෙයා මෙහෙම කරන්නේ කියන එක. පස්සේ කාලෙකදී මට තේරුණා මේ ඔක්කොම වෙලා තියෙන්නේ මේ හේතුව මත කියලා.

ප්‍ර : ඔබ කිව්වොතින් දළ වශයෙන් අවුරුදු වශයෙන් ගත්තාම ඕක දෙදහස් කොයි කාලේ වගේද?

පි : මම හිතන්නේ 2000 මුල් භාගයේදි. 98, 99 , 90 ගණන්වල අවසාන භාගයේ වගේ.

ප්‍ර : 90 ගණන්වල අවසාන භාගයේදි වගේ තමයි ඔබට මේ පුහුණුවීම ලැබුණේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ අවස්ථාවේ තමයි ඔය ඉෂාක් කියන ඔබව පුහුණු කරන තැනැත්තා කිව්වේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔබලා ගැන විමසිලිමත් කියලා ඒ කරන වැඩ ගැන?

පි : ඒ වගේම ඒගොල්ලන් මත්ද්‍රව්‍ය වලට විරුද්ධව වැඩ කරන්න ඕනේ කියලා ඇඩික් කියලා ආයතනයක් තියෙනවා. ඒකේ අපිට යැව්වා. එතකොට මම මොනවද කලේ මත්ද්‍රව්‍ය විරෝධී සංවිධානයක්, registered නෙමෙයි නිකම් සංවිධානයක් හදා ගත්තා. ඒක මම නගර සභා ජන්දය ඉල්ලන වෙලාවේ මම WAMY ආයතනයේ නම පාවිච්චි කළා. එතකොට මට ඉෂාක් කතා කරලා කිව්වා ඒ නම යොදන්න එපා කියලා. එතකොට මට තේරුනේ නැහැ ඇයි එහෙම කිව්වේ කියලා, පස්සේ මට තේරුනා මේගොල්ලන් නම ප්‍රසිද්ධ කරලා වැඩ කරනවට කැමති නැහැ කියලා. එතකොට දැන් ඒගොල්ලන්ගේ පුහුණු ආයතනයේදී සහතිකය දෙනවා. එතකොට ඒකේ ඉෂාක්ගේ අත්සන තියෙනවා.

(සාක්ෂිකරු සහතිකයක් පෙන්වා සිටී)

ප්‍ර : මේ ඔබට ලැබුණු සහතිකයක්ද? මේක ඒ කාලේ ඔබට ලැබුණු සහතිකයක්?

පි : Issue කරපු එකක්.

ප්‍ර : එතකොට ඒ සහතිකයේ මැද නැත්තේ ඇයි කියලා ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : මගේ රහසිගත භාවය වෙනුවෙන් තමයි මේක මේවා කරලා තියෙන්නේ.

ප්‍ර : ඔබ ඒක මැකුවද?

පි : මැකුවේ නැහැ

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : ඒ ටික අයින් කරලා ඔබ ඒකේ ඉතුරු ටික ගත්තා. ඒකද කියන්නේ?

පි : මේ අත්සන් ටිකනේ වැදගත් වෙන්නේ. ඒ නිසා ගත්තා.

ප්‍ර : කවදද මේක දුන්නේ දිනයක් නැහැනේ?

පි : ඒක මම හිතන්නේ 98 වෙන්න ඕන. මේක 99 .

ප්‍ර : 1998 සහ 99 ?

පි : ඔව්. මේකෙත් ඉෂාක් කියන එක්කෙනාගේ අත්සන තියෙනවා.

ප්‍ර : එතකොට Education Coordinator කියන තනතුර යටතේ තමයි එම්.එම්.ඉෂාක් අහමඩ් කියන තැනැත්තාගේ අත්සන තියෙන බව පෙන්නන්නේ ඔබ කියන්නේ?

පි : එයා ඒ වගේමේ ISIS වලත් ගිහිල්ලා Education එකෙන් තමයි Unite එකේ තමයි ඉදලා තියෙන්නේ කියලා අර නෙත් FM බැලුම්ගල වැඩ සටහනේ තිබ්බා මෙහෙම චිත්‍රයක්. මෙන්න මේකේ තියෙනවා. ISIS අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරි කියලා. ඉෂාක්. ඊට අමතරව මේක මීඩියා ෆෝරම් එකේ පවත්වපු පුහුණු කඳවුරේදි එන්.එම්. අමීන් මහතා මේගොල්ලන් එක්ක සම්බන්ධ වෙලා නිසා එයාගේ අත්සන සහ ඉෂාක්ගේ අත්සන මේ දෙකේම තියෙනවා.

ප්‍ර : කවුද එන්.එම්.අමීන් කියන්නේ?

පි : එන්.එම්.අමීන් කියන්නේ ශ්‍රී ලංකා Muslim Media Forum එකේ President. ශ්‍රී ලංකා Muslim Council ඒ වගේ ආයතනවල තවමත් President වෙලා ඉන්න එක්කෙනෙක්. හසාම් අමීන්ගේ තාත්තා BBC වාර්තා කරු හිටපු.

ප්‍ර : දැන් අපි එකින් එක පොඩ්ඩක් පැහැදිලි කර ගනිමු නේද, එතකොටනේ පහසු වෙන්නේ. දැන් ඔබ කිව්වානේ ඉෂාක් කියන තැනැත්තා ඔබ දැන් ඉදිරිපත් කරන්නට යන සහතික දෙකම අත්සන් කරලා තියෙනවා කියලා. ?

පි : ඔව්.

ප්‍ර : ඉෂාක් කියන තැනැත්තා සමඟ ඔබ කතාබහ කරලා තියෙනවද?

පි : තියෙනවා.

ප්‍ර : එතකොට මේ අත්සන් ඔහුගේ කියලා ඔබ කොහොමද දන්නේ?

පි : ඒක දන්නේ නැහැ.

ප්‍ර : නමුත් ඔබට මේ WAMY ආයතනය මගින් පවත්වන ලද කඳවුරේද ඒක ලැබුණේ? ඒ පුහුණුවීමට පස්සේ ද?

පි : ඔව්. මම හිතන්නේ ඒකට පස්සේ ලැබුණේ. කොයි වෙලාවේ දුන්නද කියලා මට මතක නැහැ, සමහරක් වෙලාවට

ප්‍ර : කියන්නේ පුහුණු වීමෙන් පස්සේ ලැබුණේ?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. මට බලංගොඩ සහතිකය ලැබුනේ නැහැ.

ප්‍ර : බලංගොඩ සහතිකය ලැබුනේ නැහැ හරි, ඔබට ඉස්සරවෙලා ලැබුනේ WAMY ආයතනයෙන් කුමන සහතිකයද?

පි : මෙන්න මේ සහතිකය.

(සහතිකයක් පෙන්වයි)

පි : Eastern Province කියලා තියෙනවා මම දැක්කෙත් නැහැ, දැන් තමයි දැක්කේ.

ප්‍ර : ඒ කියන්නේ පළමුවන පුහුණුවීම ඔබට මතක විදියට මොන අවුරුද්දේ ද සිදු කළේ? එක්දහස් නවසිය..

පි : 99

ප්‍ර : 2 වන පුහුණුවීම?

පි : සමාවෙන්න ඒක 98, මේක 99 ය.

ප්‍ර : එතකොට ඔබ ඉස්සෙල්ලම ඉදිරිපත් කරන්නේ 1998 පුහුණුවීමට අදාල සහතිකය?

පි : ඔව්.

<u>ස්වාමිණි 1998 වසරේදි WAMY ආයතනය මගින් පවත්වන ලද ඒ පුහුණු කඳවුරට සහභාගී වීමෙන් පසුව සාක්ෂිකරුට ලැබුණායි කියන සහතිකය IAKR12 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා</u>.

ප්‍ර : ඊලඟට ඔබ 1999 වසරෙත් මේ පුහුණුව ලැබුවයි කියලා කිව්වනේ ඒ කොහේදි ද?

පි : බලංගොඩ ජෙයිලානි නේ. ඒක ලැබුනේ නැහැ.

ප්‍ර : 3 වන පුහුණුව?

පි : මේක උසස් පෙළින් පස්සේ Media Forum අමීන් හරහා තමයි. ඒකට තවුසිත් සම්බන්ධ නැහැ. මේකට අමීන් මහතා හරහා තමයි මේකට අපි සම්බන්ධ වෙන්නේ.

<u>ස්වාමිණි 2002 වසරේ පවත්වන ලද පුහුණුවෙන් පසුව සාක්ෂිකරුට ලැබුණායි කියන සහතිකය IAKR13 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා</u>.

ප්‍ර : දැන් ඔබ ඉෂාක් ගැන කතා කරපු නිසා මා ඔබේ අවධානයට ඔබ ලඟ තියෙන මේ ලේඛනය පෙන්නන්න කැමතියි. ඒක අනුව ඉෂාක් කියන එක්කෙනා ඉෂාක් අහමඩ් මොහොමඩ් මුෂින් ඔහුට අබු නමිනුත් නම් දෙකක් තියෙනවා නේද?

පි : ඒක දන්නේ නැහැ. මම එයා දන්නේ ඉෂාක් කියලා. ඒගොල්ලන්ට අපි කතා කරන්නේ සාමාන්‍යයෙන් JVP එකේ කතා කරනවා වගේ බ්‍රදර්, ජමාතේ ඉස්ලාමී එකේ කතා කරන්නේ බ්‍රදර්, සහෝදරයා තෝලන් එහෙම කියලා.

Prosecutor's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : එතකොට මේ ISIS අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරී කියන මේ ඉෂාක් මහත්මයා ඔහුගේ ඡායාරූපය තියෙනවානේ, ඔහුයි ඔබට ඔය WAMY සංවිධානයේ පුහුණුව ලබා දුන්න ඉෂාකුයි එක්කෙනාමද?

පි : ඒ වෙලාවේ එයාට කොණ්ඩය තිබ්බා. දැන් තට්ටේ තමයි තියෙන්නේ.

ප්‍ර : දැන් කොණ්ඩේ ගිහිල්ලා?

පි : ගිහිල්ලා හරි මොකක් හරි වෙලාද මට දන්නේ නැහැ හරියට.

ප්‍ර : එතකොට ඔබට කොහෙන්ද මේ.

පි : නෙත් FM බැලුම්ගල වැඩ සටහනේදි මම ගත්තු එකක්.

ප්‍ර : ඔබ කිව්වානේ නෙත් FM එකත් එක්ක ඔබේ සම්න්ධකම් තියෙනවා කියලා?

පි : හැබැයි නෙත් FM එකට මම දුන්නෙත් නැහැ නෙත් FM එකෙන් තමයි මටත් ඊට පස්සෙම දැන ගන්න ලැබුනේ මේගොල්ලන්ගේ එකමුතුව,මෙයා අයියා, මෙයා නංගි, මෙයා බෑණා කියලා මට දැන ගන්න ලැබුනේ ඊට පස්සේ.

ප්‍ර : ඔබ කිව්වා ඊට පස්සේ නිලාම් ගැන ඔබ කිව්වානේ ඉස්සර වෙලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ නිලාම්ට අදාල ඔහුගේ නෑදෑයින් සම්බන්ධයෙන් තමයි එහෙමනම් නෙත් FM එක මේ ඡායාරූප සමූහයෙන් පෙන්නන්නේ නේද?

පි : පෙන්නන්නේ ඔව්.

ප්‍ර : ඒ අනුව නිලාම්ගේ සහෝදරයෙක් තමයි ඉෂාක් අහමඩ් මොහොමඩ් මුෂින් කියන ඔබට පුහුණුව ලබා දුන්න ඉෂාක් කියන තැනැත්තා?

පි : ඔව්.

ප්‍ර : ඒ කියන්නේ ISIS අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරී විදියට මේ හඳුන්වන?

පි : ඔව්.

ප්‍ර : නිලාම්ගේ මස්සිනා ඒ කියන්නේ බිරිඳගේ සහෝදරයා කියන්නේ එතකොට තජුඩීන් මොහොමඩ් තවුසි?

පි : තවුසි ඔව්.

ප්‍ර : ඔහු ISIS දුරකථන දෙපාර්තමේන්තුවට සම්බන්ධවයි කියලා මේ රූප සටහනේ පෙන්නන්නේ?

පි : ඔව්. මම තව දෙයක් අනාවරණය කරන්න කැමතියි. මම ඒක දිගින් දිගටම සම්බන්ධ වෙච්ච ආයතනවලට කිව්වා. ඒ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්බන්ධව හරියට හොයලා බැලුවේ නැහැ මේ දක්වා මම දන්න තරමින්.

ප්‍ර : මොකක්ද?

පි : තවුසි කියන පුද්ගලයා 2014 ඔක්තෝබර් 02 මගේ බිරිඳ අභාවප්‍රාප්ත වෙනවා. උපන් දිනය දවසේ. ඊට සති දෙකකට පස්සේ මම එතකොට පොඩ්ඩක් මානසිකව වැටිලා හිටපු වෙලාවේ අපේ ඉස්කෝලේ කණ්ඩායම ඒ කියන්නේ 2000 කණ්ඩායම

ප්‍ර : ඒ කියන්නේ සහිරා විද්‍යාලයේ?

පි : සහිරා විද්‍යාලයේ පොඩි එකතුවීමක් Day out එකක් දවස් 2 ට එතකොට ඒ දවස් 2,3 ට යන්න මට කතා කලා. පස්සේ මම පළවෙනි දවසේ ගියේ නැහැ ළමයින් දෙන්නා හිටිය නිසා. මම ඊට පස්සේ ඊලඟ දවසේ ඒ කියන්නේ මම හිතන විදියට සෙනසුරාදා වෙන්න ඕනේ. සෙනසුරාදා උදේ මම ගියා. එතකොට තවුසි තමයි මාත් එක්ක කොළඹදී සම්බන්ධ වෙන්නේ. බස් එකේ නැග්ගා. මාතර බස් එකේ. ඉස්සරහා සීට් එක ඩැයිවර් මේ පැත්තේ මෙතන අශෝක් ලේලන්ඩ් බස් එකක ගියේ, මගේ දකුණු අත පැත්තේ හිටියේ තවුසි. වම් අත පැත්තේ මම වාඩි වෙලා හිටියේ. එයා Tab එකක් ලොකු

ප්‍ර : තවුසි ගාව තිබ්බා?

පි : ඔව්. තියලා එයා කුර්ආන් වචන ටික දාලා මට පෙන්නනවා අන්‍යාගමිකයන්ව මරන්න පුළුවන්. ලංකාවේ එහෙම මරන්න බැහැ. ලංකාවේ මරන්න බැරි හේතුව ලංකාව ඇවිල්ලා තාම මුස්ලිම් නැහැ, බැරි වුනොත් අපි ගුටි කාලා යන්න වෙනවා. එතකොට ඒ සම්බන්ධයෙනුත් ඒගොල්ලන්ට දැනුමක් තිබිලා තිබෙනවා. ඒ කියන්නේ target එකට යනවා නම් අපි යන්නේ කොහොමද කියන එක. ඊට

ප්‍ර : මේ මොන වසරද ඔය?

පි : 2014 අවුරුද්දේ.

ප්‍ර : 2014 ඔබේ බිරිඳ මියගිය වසර?

පි : ඔව්. එතකොට ඒ කාලේදී තමයි ඔහු එවැනි අදහසක් තියෙන පුද්ගලයෙක් කියන එක මම දැන ගත්තේ. මමත් බය වුණා මම කිව්වා ඕක වහලා නිකන් ඉන්න මේ බස් එකේ යන්නේ කියලා ඊට පස්සේ මම එයාට කිව්වා මීට පස්සේ මේ ගැන කතා කරන්න එපා කියලා මම කිව්වා. ඊට පස්සේ එයා කතා කලේ නැහැ.

ප්‍ර : ඒ කියන්නේ ඔහු පොදු ප්‍රවාහන සේවයක මේ ගියේ?

පි : ගියේ.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ යන අවස්ථාවේදි තමයි මේ තවුසි ඔහුගේ Tab එක අරගෙන ඒ කුර්ආන් වචන පරිවර්ථනය කරලා ඔබට මේ ගැන කිව්වේ?

පි : මම ඇහුවා කොහොමද බෙල්ල කපන්නේ සාමාන්‍ය එක්කෙනෙක්ගේ කියලා. එතකොට මම ඒ වගේම කිව්වා එයා තව දෙයක් කිව්වා මට ඇවිල්ලා. එහෙම නැත්නම් මේ කට්ටිය අපිට බදු ගෙවන්න ඕන කියලා. ඒකටත් මොනවදෝ අරාබි වචනයක් කිව්වා. ඒ වගේ කතා ටිකක් කියලා තමයි ගියේ. එතකොට මටත් සැකයක් තියෙනවා අපේ කණ්ඩායම හදන්න මූලික වුනේ තවුසික්. අපේ කණ්ඩායම ඒකරාශී කරන්න. 2000 අපේ batch එක. Out වෙච්ච batch එක. ඒ what App Group එක Create කලෙත් අද වනතුරු තවුසිගේ නොම්බරය තියෙන්නේ. එතකොට මට දන්න විදියට එකේ එක්කෙනෙක් දෙන්නෙක් තවුසි එක්ක සම්බන්ධකම් අද වනතුරු තියෙනවා. මට ඒක සැක සහිත පුද්ගලයන් ගැනත් මම අදාල තැන්වලට යොමු කළා. මොකද ඒ පුද්ගලයා මම ලඟදී දැන ගත්තා එයා ඇවිල්ලා අනාථ නිවසක් හදලා තියෙනවා.

ප්‍ර : කොහේද?

පි : කොහේද කියලා මම දන්නේ නැහැ.

ප්‍ර : නම මොකක්ද?

පි : එයාගේ නම ෆිරිදවුස්. එතකොට තවුසිත් එක්ක තියෙන සම්බන්ධකම් තියෙන එක්කෙනෙක්. එතකොට මම කිව්වා ඇවිල්ලා දැන් ඔය දැන් පුත්තලමේ ලඟදී සේව්ද පර්ල් කියලා මොකක්ද ආයතනයක් තිබ්බානේ, ඒකත් අනාථ නිවාසයක් නේ, මටත් සැකයක් තියෙනවානේ මරීනා රිෆයිනුස් කරන්නේ අනාථ නිවාසයක්. එතකොට මම කියපු සිරිදවුස් කියන එක්කෙනාත් මම කියන්නේ අනාථ ළමයින්ව වැරදි දේකට පාවිච්චි කරන්න යම්කිසි අදහසක් තියෙනවද කියන එක මට පොඩි සැකයක් තියෙනවා. ඒක මට දැන් ඊයේ පෙරේදා what App Group එකේදී මම හිතන්නේ මේ කොරෝනා එකෙන් පස්සේ what App Group එකේ හුවමාරු වෙච්ච massage එකේ මම අහම්බෙන් දැක්කේ. සාමාන්‍යයෙන් මම ඒ Group එක බලන්නේ නැහැ ගොඩක් load වෙන හින්දා, ගොඩක් chat නේ යන්නේ. එතකොට ඒකේදි මගේ යාළුවෙක් දාලා තිබ්බා මෙයා ඇවිල්ලා මෙහෙම එකක් වකුත් කරලා තියෙනවා

ප්‍ර : කොයි පුද්ගලයාද, කවුද?

පි : ෆිරිදවුස් කියන පුද්ගලයා. එයා ඒ වගේ දාන පරිත්‍යාග වගේ දේවල් කරනවා කියලා, හැබැයි එයාට සම්බන්ධකමක් තිබ්බයි

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කියලා මට මතකයක් තියෙනවා නෙමෙයි මං යාළුවන් අතර එහෙම කතාවක් රාවයක් තිබ්බා. හැබැයි තවුසි සම්බන්ධව ගොඩක් කට්ටිය කතා කරනවා. මම තවුසි සම්බන්ධව දැඩි විවේචනයක් මගේ ෆෘප් එකේදී මම කලා. ඊට පස්සේ මම නිහඬ වුණා මගේ ආරක්ෂාව වෙනුවෙන්. මොකද තවුසි එක්ක සම්බන්ධකම් තියෙන කට්ටියෙ මේකේ ඉන්නවද දන්නේ නැහැ කියන මතය මත මම කිව්වා තවුසි කලේ වැරදි වැඩක්, මම කිව්වා අපිවත් ඒ කාලවල්වල ඉස්කෝලවලට අරන් ගියා, අපි දන්නෙත් නැහැ, තවුසි මේ ඔක්කොම දැනගෙන ඉදලා තියෙනවා, කියලා මම දැඩි විවේචනයක් කළා. ඊට පස්සේ මම නිහඬ වුණා. මට තේරුනා මට ඒකට sports ආවේ නැහැ. ඊට පස්සේ මම පොඩ්ඩක් නිහඬ වෙලා නිකම් හිටියා. එතකොට එයා තමයි ඒ what App Group ෆෘප් එක create කලේ. එතකොට තවුසි create කරපු what App Group එකක් ලංකාවේ phone එකක තියෙනවා කියන එක අදවනතුරු හොයලා බලලා නැහැ. එතකොට තවුසිගේ මිත්‍රයන් වෙච්ච අපි කට්ටිය අතරේ එයාට සම්බන්ධකම් තියෙනවා කියන එකත් අද වනතුරු හොයලා බලලා නැහැ. මම කියන්නේ මේකත් අපිට අනාගතයේ තර්ජනයක් වෙන්න ඉඩ තියෙනවා. මම කියන්නේ ඒගොල්ලන්ගේ කට්ටිය මේකේ ඉන්නවද දන්නේ නැහැනේ. ඒ නිසා ඒ පිළිබඳව සොයා බලන්න කියලා මම දැඩි අවධානයක් යොමු කරන්න කියලා කියනවා. අනිත් එක එයා දුරකථන සම්බන්ධව ඉන්න නිසා මම හිතන්නේ එයාට දුරකථනය සම්බන්ධයෙන් යම්කිසි Intelligence knowledge එකක් තියෙන්න පුළුවන් සමහරක් වෙලාවට. එතකොට Intelligence knowledge එක හරහා අපි අතර තියෙන දේවල් එයාට බලා ගන්න පුළුවන්ද, හුවමාරු කර ගන්න පුළුවන්ද ඒ කියන දේවල් මම දන්නේ නැහැ. මොකද what App Group එක අදවනතුරුම create කරලා තියෙන්නේ එයා.

ප්‍ර : ඒ නිසා, හොඳයි ඒ කියන්නේ එතකොට සොයලා බලයි දැන්. ඔබ අවධානයට ගෙනාවානේ ගරු කොමසාරිස්වරුන්ගේ.
එතකොට නිලාම්ගේ මස්සිනා ඒ කියන්නේ බිරිඳගේ සහෝදරයා කියලා තව එක්කෙනෙක් ඉන්නවා ඔහු තාකීර් අහමඩ් තාජුඩීන්. නැත්නම් අබුදුජාන් සෙයිලානි. මේ අනුරූප සටහන අනුව සිරියාවේදි ඔහු ISIS සංවිධානයේ සාමාජිකව එහි ග්‍රාමාරක්ෂකයෙක්ව ඉදලා සිරියාවේ මියගිහිල්ලා තියෙනවා.

පි : තවුසිගේ මල්ලී.

FAIR COMMENT
BY JEZEEM

ප : ඒ තවුසිගේ මල්ලී. එතකොට ඉෂාක්ගේ බෑණා බවට පෙන්නනවා මොහොමඩ් සුහේර් මොහොමඩ් අරූෂ් නැත්නම් අබු ආසියා. ඔහු ISIS රෝහලේ භෞත චිකිත්සක කියලා තමයි මේ රූප සටහනෙන් අනාවරණය වෙන්නේ නේද? එහෙම නම් ඔබට පුළුවන්නේ මේක කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න?

<u>ස්වාමිණි ISIS සංවිධානයට සම්බන්ධ වුණ මොහොමඩ් මුෂින් සහාස් නිලාම් යන තැනැත්තා සහ ඔහුට අදාල ඔහුට ඥාතිත්වයක් තිබෙන ISIS සංවිධානයට බැඳිලා ඉන්න අනෙකුත් තැනැත්තන් සහ ඔවුන්ගේ විස්තර දක්වන මෙම රූප සටහන IAKR14 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා.</u>

ස්වාමිණි අර YAMA එකේ Video තියෙනවා එය පෙන්වීමට අවසර අයැද සිටිනවා.

(මේ අවස්ථාවේ එම දර්ශනය තිරසේ දිස්වේ)

ප : ඔබ මේ ඡායාරූපවල අඳුරන කවුරු හරි ඉන්නවා නම් ඒ අවස්ථාවේදී අපේ අවධානයට යොමු කරවන්න.

පි : මේකේ සඳහන් වෙනවා දාමිනලීමියා එකේ Director.

ප : සුක්රියා?

පි : මේ ලඟදී තමයි අභාවප්‍රාප්ත වුණ. අභාවප්‍රාප්ත වෙලා මාස 2 ක් විතර වෙනවා. එතකොට මම මෙතන කියන්නේ නලීමියාට තියෙන සම්බන්ධකම WAMY ත් එක්ක තියෙන.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:

ප : මේ සුක්රී නේද අධ්‍යාපන ප්‍රකාශනවල මේ හුඟක් ප්‍රධාන ස්ථාන ගත්තේ?

පි : ඔව්. සමාවෙන්න ඒ ගැන මට අවධානය යොමු කරන්න අමතක වුණා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප : අගා මොහොමඩ් ගැනත් අපි පොඩ්ඩක් මේ වෙලාවේම කියමු එතකොට ඉවර කරන්න පුළුවන් නේ?

පි : අගා මොහොමඩ් ඇවිල්ලා අර ජමෙයිතුල් උලමා සභාවෙත් ඉන්නවා. ශූරා සභාවෙත් ඉන්නවා. ඒ වගේම ජාමි නලීමියා එකේ අර දැන් Director වශයෙන් පත් කරලා ඇති බොහෝදුරට මෙයාගේ අභාවෙන් පස්සේ.

ප : එතකොට රජයේ ඉස්ලාම් පෙළ පොත්වල කතෘ වශයෙන්?

පි : පෙළ පොත්වලත් එයා ඉන්නවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මොනවද ඒ කිව්වේ?

පි : අරාබි භාෂාව මම දන්නේ නැහැ .

ප්‍ර : මේ අරාබි භාෂාවෙන් තමයි කිව්වේ?

පි : ඔව්.

තව දෙයක් කියන්න පුළුවන්ද ඒගොල්ලන්ගේ හැම දෙයක්ම අරාබි භාෂාවෙන් තමයි ඔක්කොම යන්නේ.

ප්‍ර : ඇයි ඒ?

පි : ඒක ඇයි දන්නේ නැහැ, මම හිතන්නේ සෞදි අරාබි රජයට පෙන්නන්නද දන්නේ නැහැ. ඒගොල්ලන් Program කරනවා establish වෙනවා හැබැයි රටේ මව් භාෂාව වන දෙමල හෝ සිංහල භාෂාව සඳහන් වෙන්නේ නැහැ.

ප්‍ර : ඇයි Eastern Province එකනේ මේක සෞදි අරාබියාවේ ඒක නිසාද?

පි : වෙන්න පුළුවන්.

ප්‍ර : ෆලීල් කියන්නේ කවුද?

පි : එයාත් ජාමියා නලීමියා එකේ Director. ජමාතේ ඉස්ලාම් එකේ හිටියා. මුස්ලිම් කවුන්සිල්, ශූරා සභාව, උලමා සභාවේ ඔක්කොම ඉන්නවා. හැබැයි දැන් උලමා සභාවට සම්බන්ධ වෙන්නේ නැහැ, එයා ඉන්නේ දෙවන පෙළ කණ්ඩායමට සම්බන්ධ වෙන්න ඉන්නේ. ඒ කියන්නේ එයා ඉන්නේ යුසුෆ් මුක්තික් එක්ක. බල අරගලයක් තියෙන නිසා.

මේ මහවිල ගාඩ්න්ස් කැම්පස් එක. මහවිල ගාඩ්න්ස් එකේ තමයි ගොඩක් සංවිධාන තිබ්බේ. පාස්කු ප්‍රහාරයට කලින්. නවුෆර් මවුලවිගේ, මෙයාගේ WAMY එක්ක.

මෙයා නලීමිවරයෙක්. මම කිව්වා මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ පහුගිය කාලේ ඔක්කොම ඉන්නේ නලීමිස්ලා කිව්වානේ. එතකොට දැන් සම්බන්ධය ඇවිල්ලා WAMY ත් එක්ක ඉන්නවා. නලීමි එකේ ඉගෙන ගන්නවා. මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ඉන්නවා. එතකොට මේගොල්ලන්ගේ යුහානිසම් කියන ඒ concept එක ඒගොල්ලන් ඉදගෙන ස්ථානගත කරලා ඒ වැඩේ කරන motto එකේ ඉන්නවා ඒගොල්ලන්.

මෙයාට මදනි කියලා නමක් දාලා තියෙන්නේ ඇවිල්ලා නමේ අගට දාලා තියෙන්නේ මෙයා මදීනාවේ ඉගෙන ගෙන ආපු නිසා. නලීමි වගේ.

ප්‍ර : ඔබ පසුගිය අවස්ථාවේ පැහැදිලි කළා. ඔබ දන්නවද ඔහු මේ ලංකාවේ පදිංචිව ඉන්නවද කියලා?

FAIR COMMENT BY JEZEEM

පි : දැන් නැහැ. ඒ කියන්නේ එයා විකිලීක්ස් හෙළිදරව්වෙන් පස්සේ කාලයක් ලංකාවේ ඉදලා තමයි යන්නේ. එයාගේ සමු ගැනීම සම්බන්ධයෙන් තමයි මේ කතා කරන්නේ. එයාගේ farewell එකේදී.

ප්‍ර : ඔබ පහුගිය අවස්ථාවේදි කිව්වා විකිලීස් මගින් හෙළිදරව් කලාට පස්සේ මේ උමාර් කියන තැනැත්තා ඔබව පුහුණු කරලා, ඔබ ඒ පුහුණුවීම් කඳවුරුවලට ගියානේ?

පි : උමර් ඉදිරීස් නෙවෙයි, ඒ එතකොට හිටියේ වෙන කෙනෙක්.

ප්‍ර : තවුසිත් එක්ක?

පි : තවුසිත් එක්ක ඉන්න කොට උමර් ඉදිරීස් හිටියේ නැහැ.

ප්‍ර : ඔබ කිව්වා පසුගිය අවස්ථාවේදි විකිලීස් විසින් හෙළිදරව් කලාට පස්සේ මොහු ත්‍රස්තවාදියෙක් කියලා, ත්‍රස්තවාදී කටයුතු කරනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඔහු ක්ෂණයෙන්ම ලංකාවෙන් බැහැර වෙලා ගියා කියලා?

පි : ගිහිල්ලා ආපහු ඇවිල්ලා තියෙනවා.

ප්‍ර : ඒ කොයි කාලෙද?

පි : නැහැ ආයේ ඇවිල්ලා තියෙනවලු. ඊයේ තමයි මට මිස්ටර් නිෂාඩීන් මට කිව්වා. ඇවිල්ලා තමයි මෙයා farewell එක අරන් තමයි ගිහිල්ලා තියෙන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා</u>:

ප්‍ර : ආයෙත් ගිහිල්ලා?

පි : ඔව් මෙයා නැහැ දැන් ලංකාවේ. දැන් අළුත් Director කෙනෙක් තමයි ඉන්නේ ලංකාවේ පුරවැසියෙක් තමයි ඉන්නේ දැන්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඒ කියන්නේ සමුගැනීම ගන්න තමයි මේ ආවේ, ඇවිල්ලා ගියා?

පි : ඔව්. එයාගේ farewell එක සම්බන්ධයෙනුත් ඡායාරූප තියෙනවා එයාගේ. ඔස්තාත් උමර් ඉදිරීස්, ඔස්තාත් මන්සුර් කියලත් කියනවානේ, ඒ වගේ මෙයාටත් කියන්නේ ඔස්තාත් උමර් ඉදිරීස් සාලි ඩිරාක් කියලා. Postal Head Quarters එකේ මෙයාගේ ඒක තිබ්බේ.

ප්‍ර : ඔබ එතකොට ගරු කොමිෂන් සභාවට එහෙමනම් ඉදිරිපත් කරනවා ඔස්තාත් උමර් ඉදිරීස් සලී ඩිරාර් යන තැනැත්තාට නිළ වශයෙන් සමු ගැනීමක් පවත්වල තියෙන එක පිළිබඳව වූ දැන්වීම,

FAIR COMMENT BY JEZEEM

ඒ නිළ වශයෙන් වූ සමුදීම සිදු වෙලා තියෙන්නේ 2013 දෙසැම්බර් මාසේ 11 වෙනි බදාදා නේද?

පි : ඔව්.

ස්වාමිණි එම ලේඛනය IAKR 15 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා.

ප්‍ර : දැන් මේ WAMY ආයතනයට ඔබ දන්නවද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ යම් කාලයක් ලබාදීලා තියෙනවද කියලා?

පි : ඒ පිළිබඳ මතකයක් නැහැ, පොඩි වැඩ සටහන් රූපවාහිනී සංස්ථාවෙන් හෝ ගුවන් විදුලි සංස්ථාවෙන් හෝ ගිහිල්ලා ඇතියි කියලා මම විශ්වාස කරනවා. මොකද අනෙකුත් සංවිධානවලට ලබා දුන්න නිසා මට මතක නැහැ.

ස්වාමිණි WAMY සංවිධානය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද Video පටය IAKR 16 වශයෙන් ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර : ඊලඟට මා ඔබෙන් දැන ගන්න කැමතියි මේ මුස්ලිම් Aid කියන සංවිධානය ගැන. ඔබට මොනවද ඒ ගැන මේ ගරු කොමිෂන් සභාවට කියන්න තියෙන්නේ?

පි : ඒ කියන්නේ සැම්සැම් Foundation වගේ ඒ කියන්නෙ International organization එකක්.

ප්‍ර : ජාත්‍යන්තරව සහාය ලැබෙන සංවිධානයක්?

පි : ඔව්. ඒ කියන්නේ IRO වගේ

ප්‍ර : ජාත්‍යන්තර සහාය ලැබෙන සංවිධානයක්ද නැත්නම් ජාත්‍යන්තර සංවිධානයක්ද?

පි : ජාත්‍යන්තර සංවිධානයක්. එතකොට ඒක ලංකාවේ තියෙන්නේ දැනට මම හිතන්නේ කෝට්ටේ ප්‍රදේශයේ වෙන්න ඕනේ. ඒකෙන් ඇවිල්ලා කරන්නේ ඇවිල්ලා බොහොදුරට මුස්ලිම් ජනතාවට සහ අන්‍යාගාමික ජනතාවට Relief වැඩසටහන් තමයි කරන්නේ.

ප්‍ර : සහන ලබා දෙනවා?

පි : ඔව් සහන ලබා දෙනවා.

ප්‍ර : සැම්සැම් වගේ නැත්නම් IAS වගේ වෙන ආගම්වල ඉදලා ඉස්ලාම් ආගම වැළඳ ගත්ත අයට නෙමෙයි මේ අය උදව් කරන්නේ?

පි : පොදුවේ උදව් කරනවා.

ප්‍ර : එතකොට ඒ දෙගොල්ලන්ටම?

පි : දෙගොල්ලන්ටම.

ප්‍ර : මුස්ලිම් ජන කොට්ඨාශයටත් උදව් කරනවා, ඉස්ලාම් ආගම පසුව වැළඳ ගත්ත අයටත් උදව් කරනවා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් මට දන්න විදියට මේගොල්ලන් ලංකාවට ආවේ සුනාමි ව්‍යසනයත් එක්ක.

ප්‍ර : Muslim Aid එක ආවේ?

පි : ඔව්.

ප්‍ර : ඊට පසුව දැන් ඒ අය ඔබ කියන්නේ ඔහුගේ ප්‍රධාන කාර්යාලය කෝට්ටේ තියෙනවා කියලා?

පි : ඔව්. මුස්ලිම් ජනතාව බහුලව ගැවසෙන තැන්වල ඒගොල්ලන්ගේ ආයතනය තිබ්බේ නැහැ.

(ස්වාමිණි Muslim Aid ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ නාමපුවරුව සහ ඡායාරූප කිහිපයක් මේ අවස්ථාවේදී පුළුල් තිරයේ දක්වනවා.)

පි : තව දෙයක් තියෙනවා මේගොල්ලන් WAMY වගේ සමහර වැඩ සටහනුත් කරනවා.

ප්‍ර : කොහේද කරන්නේ? ඒ කියන්නේ ළමයින්ට පවත්වනවද?

පි : ළමයින්ට නෙමෙයි Relief සම්බන්ධ වැඩ සටහන් ඒවා තමයි කරන්නේ.

ප්‍ර : සහන සැලසීම තමයි ඔවුන් කරන්නේ?

පි : ඔව්.

ප්‍ර : මොන වගේ සහනද සලසන්නේ?

පි : මුදල් උපකාර කරනවාද කියලා මම දන්නේ නැහැ, ගොඩක් ඇවිල්ලා භාණ්ඩ තමයි කරන්නේ සහ සමහරක් වෙලාවට ළිඳවල් හදලා දෙන වැඩ සටහනුත් කරනවා.

ප්‍ර : එතකොට සැම්සැම් සංවිධානය වගේ ගෙවල් හදලා දෙනවා වගේ දේවල් කරනවද?

පි : ඒවා දන්නේ නැහැ. මේගොල්ලොන් අර කුරුබාන් වැඩ සටහනුත් කරනවා. අර හජ්ජි අවුරුද්දට කරන ඒවත් කරනවා.

ප්‍ර : ඒ කොහොමද කරන්නේ මරනවද?

පි : හරක් මරනවා. කුරුබාන් කියන වැඩ සටහන් තියෙනවානේ ඒවත් මේගොල්ලෝ කරනවා. ඉල්හියා ඒකට කරන්නේ.

ප්‍ර : මරන්නද උගන් වන්නේ?

පි : නැහැ නැහැ ඒගොල්ලන් මරලා ඒගොල්ලන් පාර්සල් කරලා ජනතාවට බෙදනවා.

<u>ස්වාමිණි එම Muslim Aid සංවිධානයේ Website එකේ පළවෙනි පිටුවේ මුද්‍රිත පිටපතක් IAKR 17 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා.</u>

දැන් වේලාව : ප.ව. 12.30 යි.

මෙතැන් සිට ල/ලේ :- නිල්මිණි මෙනවිය විසින්ය.

FAIR COMMENT BY JEZEEM

දැන් වේලාව: ප.ව.12.30
පෙර සටහන් ල/ලේ: ධම්මිකා මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර: ඊළඟට ඇමීස් කියන සංවිධානය ඒ කියන්නේ Associations of Muslim Youth of Seialan ඒ සංවිධානය ගැන ඔබට මොනවද කියන්න තියෙන්නේ ?

පි: ඒක තමයි අල් සාබාෂ් කියන්නේ. අල් සාබාෂ් කියන්නේ තරුණයා කියන අදහස එන එකක් තමයි. දැන් ලංකාවේ ඒන්ජීයෝ එකක් වශයෙන් ලංකාවේ තියෙනවා ඒක නමක්. හැබැයි දැන් සෝමාලියාවේ නැත්නම් අප්‍රිකානු රටක ත්‍රස්තවාදී සංවිධානයකුත් තියෙනවා සාබාෂ් කියලා. ඒකයි මේ අතර සම්බන්ධයක් නැති වෙන්න පුළුවන්. ඒ වුණාට නම මම අර කියන්නේ. එතකොට තරුණයා කියන අර්ථය තමයි එතෙන්ට එන්නේ. එතකොට ඒගොල්ලනුත් කරන්නේ ඇවිල්ලා පල්ලි ඉදිරිකිරීම්. දැන් තාසිම් මවුලවි තමයි ඒ යටතේ ඉන්නේ. එතකොට මම දන්න තරමින් එකම contractor කෙනෙක් තමයි මේ පල්ලි ඔක්කෝම ඉදිකරලා තියෙන්නේ. එතකොට ඒකට හේතුව ඇයි දන්නේ නැහැ contractor වල මේක දුන්නේ කියන එක. ඒ වගේම

ප්‍ර: ඉතින් මොකක් ද එකේ තියෙන වැරැද්ද?

පි: නැහැ ඒක මොකක් හරි පිටට තමන්ගේ දේවල් නොදැන ඉන්න මේ සල්ලි එවනවා. මෙහෙම පල්ලි හදනවා. මේ අන්න ඒ වතාවරණය. ඒ රහසිගත භාවය සුරකින්න එහෙම දුන්නද දන්නේ නැහැ.

ප්‍ර: එහෙම එකම කොන්ත්‍රාක්කරුවෙක්ට දෙන්න පුළුවන් කියලා ඔබ කියන්නේ?

පි: ඔව්. එතකොට දැන් ප්‍රදේශයෙන් ප්‍රදේශය දැන් වෙනස් වෙනවානේ. එතකොට ඒගොල්ලන් එකම කොන්ත්‍රාත්තුකරුව හරහා තමයි ඒගොල්ලන් ලංකාවේ පල්ලි ඉදි කරලා තියෙන්නේ. එතකොට මේ තාසීම් මවුලවි තමයි මං දන්න කාලේ ඉඳලා ඒකේ හිටියේ. එකේ සංවිධානය ඉස්සර තිබ්බෙනම් බොරැල්ලේ. ග්‍රැනරි road එහෙම නැත්නම් මොකක් හරි එහෙම පාරක තමයි තිබ්බේ බොරැල්ල.

ප්‍ර: මා කිව්වොතින් ඒක මාළිගාකන්දේ තිබුණා කියලා?

පි: දැනට තියෙන්නේ මාළිගත්තේ.

ප්‍ර: එතකොට Fairfield Garden බොරැල්ලේ තිබුණේ කොයි කාලේද?

පි: ඒක වාමී තිබ්බානේ ටර්නර් road එකේ. ඒ කාලේ තමා එහෙත් තිබ්බේ. එතකොට මම එක්කනාගේ නම දන්නේ නැහැ. එක්කෙනෙක් හිටියා සුදු මහත එක්කෙනෙක්. එයා තමයි Incharge වශයෙන් හිටියේ. තාසීම්

Proof Copy
FAIR COMMENT BY JEZEEM

මවුලවි හිටියේ සාමාන්‍ය මට්ටමින් තමයි. දැන් තාසීම් මවුලවි තමයි ඒ ආයතනයේ භාරකරු විදිහට කටයුතු කරගෙන යන්නේ. ඒගොල්ලන් ආයතනය තුල ඕනෑම සංවිධාන වලට රැස්වීම් තියන්න ඔක්කෝම කරන්න ඉඩ හදලා දීලා තියෙනවා.

ප්‍ර: දැන් මේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ජනාධිපති නීතිඥ අලි සබ්‍රි මහත්මයා යම් කටයුත්තකට ආරාධනා කරනු ලැබුවද ඔය සංවිධානයේ ?

පි: ඔව්.

ප්‍ර: මොකටද ?

පි: ඒකමට මතක නැහැ හරියට. යම්කිසි කටයුත්තක් සඳහා අනිවාර්යයෙන්ම සහභාගී වුණා කියලා මතකයක් තියෙනවා. හරියට ඒ විස්තරය මට දැනට මතකයට එන්නේ නැහැ.

ප්‍ර: ඔබට මතක නැහැ නමුත් ඔබට මතකයි යම් කටයුත්කට සහභාගී වුණා ?

පි: ඔව් සහභාගී වුණා.

ප්‍ර: ඒ මිසක් ජනාධිපති නීතිඥ අලී සබ්‍රී මහත්මයා මේ සංවිධානයේ සාමාජිකයෙක් නෙවෙයිනේ?

පි: සාමාජිකයෙක් නෙවෙයි.

ප්‍ර: නමුත් ප්‍රධාන අමුත්තා විදිහට ඔහු ආරාධනා කෙරුවා නේද?

පි: ඔව්. හැබැයි මට පොඩි සඳහනක් කරන්න තියෙනවා ඇවිල්ලා. දැන් මේ සංවිධාන ඔක්කෝම වුණේ label වෙච්ච සංවිධානනේ. දැන් අලී සබ්‍රි මහත්මයා කියන්නේ ඇවිල්ලා හොඳ මහත්මයෙක්. ඒ කියන්නේ සාමාන්‍යයෙන් අන්තවාදී වලට අදහස් වලට නැඹුරු නොවිච්ච එක්කෙනෙක්. එතකොට එවැනි පුද්ගලයෙක් ඇවිල්ලා තමන්ට ආරාධනා ලැබෙන කොට තමන්ගේ චරිතයට, තමන්ගේ ඉදිරි දේශපාලන පැවැත්මන් වලට බාධාවක් ඇති නොවින විදිහට ඒ කියන්නේ පාස්කු ප්‍රහාරයෙන් පස්සෙනේ මේක වෙන්නේ. එතකොට එවැනි සංවිධාන තුළට ගියොත් අර මිනිස්සු label වැටෙනවානේ. ඇයි මෙයා ගියේ කියන එක. එතකොට එයාට වැළැකිලා ඉන්න තිබ්බා කියන එක මගේ අදහසක් තියෙනවා.

ප්‍ර: හොඳයි එතකොට ඔබ දන්නවද මේ සංවිධානය මඟින් යම් යම් වීඩියෝ පට පොත් වගේ දේවල් බෙදා හරිනවා කියලා මහජනතාව අතර. ඒ ආගමට සම්බන්ධ දේවල් ද නැත්නම් මේ දැඩිමත ප්‍රචාරය කිරීම සඳහාද?

පි: සිංහල භාෂාවෙනුත් ඔවුන්ගේ ප්‍රකාශන තියෙනවා. Leaf Lets තියෙනවා. අත්පත්‍රිකා තියෙනවා. ඒ වගේ CD තැටි ඒවගේ දේවල් රාශිකයක් ඒගොල්ලන් මුද්‍රණය කරලා තියෙනවා. ඒගොල්ලනුත් අර අන්‍යාගමිකයන්ට ඉස්ලාම් දහම පිළිබඳ හැඳින්වෙච්ච අත්පත්‍රිකා Leaf

FAIR COMMENT BY JEZEEM

Lets, CD ඒගොල්ලන් වෙනමම ඒ බෙදා හැරීමකුත් සිද්ධ වෙලා තියෙනවා.

ප්‍ර: ඒ Face Bookකේ නේද එතකොට මේ Face Book බැහැනේ ලොග් වෙන්න ?

පි: ඒගොල්ලන්ටත් උල්හියා ඒ කියන්නේ කුර්බාන් වැඩසටහන් කරනවා.

ප්‍ර: මොන වැඩසටහන් ද?

පි: උල්හියා කුර්බාන් වැඩසටහන්.

ප්‍ර: ඒ කියන්නේ උල්හියා කුර්බාන් වැඩසටහන්?

පි: උල්හියා

ප්‍ර: ඒ කියන්නේ කුර්බාන් වැඩසටහන්?

පි: කුර්බාන් වැඩසටහන් කරනවා.

ප්‍ර: ස්වාමිනි Associations of Muslim Youth of Seialan ඒ සංවිධානය අර සෙයිලාන්?

පි: අර සෙයිලාන් කියන නම දැන් ලංකාවේ භාවිතා වෙන්නේ නැහැනේ. ලංකාවේ භාවිතා වෙන්නේ ශ්‍රී ලංකා කියලා හැබැයි ISIS කට්ටිය ඇවිල්ලා තමන්ගේ නමට අගට නලීමි යනකොට සෙයිලානි කියලා තමයි යන්නේ. එතකොට සෙයිලානි කියන්නේ ඒ කාලේ අරාබි ලංකාවට සම්බන්ධකම් තියෙන වෙලාවේ සැරන්ඩිබ් සෙයිලානි කියලා වචනය යෙදුවා. හැබැයි මේගොල්ලොන්ට ලංකාවේ දැන් නම ශ්‍රී ලංකානේ. ඒ ශ්‍රී ලංකා කියන නම යොදන්නේ නැතුව අරාබියට අනුගත වෙච්ච නමක් යෙදීම පිළිබඳවත් මට යම්කිසි අදහසක් තියෙනවා ඇයි එහෙම දැම්මේ කියන එක පොඩි සැකයක්.

ප්‍ර: මොකක්ද ඔබේ අදහස?

පි: දැන් ඒගොල්ලන්ට ශ්‍රී ලංකා කියලා නම යොදන්න පුළුවන්නේ. එතකොට දැන් ඉස්සරනේ අරාබියට ලංකාව සෙයිලානි කිව්වේ. දැන් මෙතන ඇවිල්ලා රට ඉඳි ගහක් තියෙනවා. ඒක ප්‍රශ්නයක් නැහැ කියමුකෝ. දැන් ලෝගු එක කියලා. එතකොට සෙයිලාන් කියන නම ඇයි යෙදවුයේ කියන එක ගැන මට ප්‍රශ්නකයක් තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ අතීතයේ දී ශ්‍රී ලංකාව සෙයිලාන් කියන නමින් තමයි හැඳින්වුයේ ඒක නමක්?

පි: ඔව් අරාබි කට්ටිය එහෙමනේ හැඳින්වුයේ. දැන් ඒක වර්තමානයේ දී නැහැනේ.

ප්‍ර: ඔබ කියන්නේ දැන් වර්තමානයේ මේ සංවිධානයට බැඳෙන අය සෙයිලාන් කියලා තමන්ගේ නම අන්තිමට ?

පි: නැහැ එහෙම නෙවෙයි මම කියන්නේ. මම කියන්නේ IS කට්ටිය යොදනවානේ සෙයිලානි කියලා. ඒගොල්ලනුත් යොදන්නේ ඇවිල්ලා අර අරාබියේ ඉස්සර හැඳින්වෙච්ච නමනේ. තමන් ලංකාවේ කියලා

FAIR COMMENT — BY JEZEEM —

පෙන්වන්න. එතකොට දැන් අරාබි ලෝකේ කට්ටිය දැනුවත්නේ දැන් ලංකාවේ නම ශ්‍රී ලංකා කියලා. ඒක පරණ කාලයක්නේ. එතකොට මේගොල්ලන් සංවිධානයක නමක් දානකොටත් ඒක ශ්‍රී ලංකා කියන නමින් ලංකාවේ අනන්‍යතාවය රැකගත්තේ නැහැ කියන එක ප්‍රශ්නකයක් තියෙනවා.

ප්‍ර: ඇයි එහෙනම් ඒක කරන්නේ නැතුව ශ්‍රී ලංකා කියලා පාවිච්චි කරන්නේ නැතුව සෙයිලාන් කියන දැම්මේ කියලා ඔබ මේ ප්‍රශ්න කරන්නේ?

පි: ඔව්.

ස්වාමීනි Associations of Muslim Youth of Seilan සංවිධානයේ මුහුණු පොතෙහි මෙම පිටුව ස්වාමීනි IAKR – 18 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා.

පි: මුහුණු පොතෙත් තියෙන්නේ අරාබි භාෂාව විතරයි. ඒ කියන්නේ මව් භාෂාව ශ්‍රී ලංකාවේ ඒවා සඳහනුත් නැහැ.

ප්‍ර: ද්‍රවිඩ භාෂාවෙනුත් නැහැ නේද?

පි: නැහැ.

ප්‍ර: ඊළඟට මම ඔබෙන් දැන ගන්නට කැමැතියි Sakeena Institute කියන ආයතනය මොකක්ද ඒ Sakeena Institute කියන්නේ?

පි: ඒක මම මෑතක දී දැන ගත්තු ආයතනයක්. ඒගොල්ලනුත් ඇවිල්ලා සාමාන්‍යයෙන් ඇවිල්ලා මොනවද කියන්නේ අර motivation type එකේ lectures කරන කට්ටිය English වලින් දවිවා අභිප්‍රේරණය කරනවා.

ප්‍ර: මොනවට ද අභිප්‍රේරණය කරන්නේ?

පි: දැන් අර මොස්ටිමෙට් වගේ. මොස්ටිමේට් කියලා එක්කෙනෙක් ඉන්නවා. එතකොට ඒ type එකෙන් තමයි ඒගොල්ලන් lectures කරන්නේ. එතකොට එයා ඇවිල්ලා මේ වර්තමානයේ.

ප්‍ර: මොනවටද motivate කරන්නේ ඒගොල්ලෝ ආගම අදහන්නද නැත්නම් අන්තවාදී අදහස් ද?

පි: ආගම අදහන්න. අන්තවාදී අදහස් වල අන්තර්ගතය ඇවිල්ලා ප්‍රසිද්ධව කතා කරන්නේ නැහැනේ සාමාන්‍යයෙන්. එතකොට ඒගොල්ලන් අර motivation වලට ආකර්ෂණය වෙනවානේ මිනිස්සු. තරුණ කොටස් ආකර්ශනය වුණාම එයාව follow කරන්න යන්න යනවා. follow කරන්න ගියාම ඊට පස්සේ තමයි එයා තුලින් එන අන්තවාදී දැන් එයත් සමාජ සත්කාර ගොඩක් වැඩසටහන් කරන එක්කෙනෙක්. ඒ ආයතනයේ ප්‍රධානියෙක් වශයෙන් කටයුතු කරන එක්කෙනා. එතකොට එයා ඇවිල්ලා ලංකාවේ නිල උත්සවයකටත් සහභාගී වෙලා තිබ්බා දේශනයකට. එතකොට එයාව එතෙන්ට කවුද ගෙන්වුයේ කියන එක මම දන්නේ නැහැ. ඒ වේදිකාවේම සුෆි මුස්ලිම්වරුන්ගේ අර වැඩසටහනුත්

FAIR COMMENT BY JEZEEM

ගියා. ඒ කියන්නේ ඒගොල්ලන්ගේ සංගීතය. ඒගොල්ලන්ගේ මේ කසීදා කියන වැඩසටහන්. ඒවගේ දේවල් ගියා. එතකොට ඒවගේම මෙයාගේ අදහස් motivation අදහසකුත් එතනදී සමාජගත, සමාජගතව කියන්නේ මං හිතන්නේ Gall Face Hotel දී. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ජනාධිපතිතුමාගේ මැතිවරණ ප්‍රචාරක වැඩසටහනක තිබුණා.

ප්‍ර: එතකොට වහබ් අදහස් තමයි මොහු විසින් දන්නේ?

පි: ඔව්. වහාබි සුෆි

ප්‍ර: එතකොට ඒ වගේ කෙනෙක් සහභාගී වෙන එකට තමයි වර්තමාන ජනාධිපතිවරයාව ආරාධනය කරලා කැඳවලා තිබුණේ?

පි: ජනාධිපතිවරයාගේ තමයි ප්‍රධානම උත්සවය. ඒක ජනාධිපතිතුමාගේ campaign එකක් මුස්ලිම් ජනතාව වෙනුවෙන්. ඒ campaign එකට ජනාධිපතිතුමා ආමන්ත්‍රණය කරනවා මුස්ලිම් ජනතාව.

ප්‍ර: හැබැයි එන්නේ මේ වහාබි අදහස් දරන එක්කනාත් එනවා?

පි: එක්කනාත් එනවා. සුෆි කට්ටිය වෙන කට්ටියකුත් එක්කගෙන එනවා. එතකොට මෙයාව එක්කගෙන ආවේ කවුද කියන එක මම දන්නේ නැහැ.

ප්‍ර: එතකොට මේ දැන් අපි පුළුල් තිරයේ දකින්නේ Sakeena Institute එකට අදාළ තොරතුරු නේද යම් ඡායාරූප කිහිපයක් ඔබ දන්නවද මේ Sakeena Institute එකත් පොත්, CD වගේ දේවල් බෙදා හරිනවා කියලා මහජනතාවට?

පි: ඔව් දන්නවා. අනිත් එක මං ඒ ආයතනය ගැන හොයන්න පටන් ගත්තේ ඒ උත්සවයේ දී මෙයාගේ ස්වභාවය දැකලා. මෙයාගේ අර

ප්‍ර: ඔය ගොල්ලන්ගේ පාඨමාලාවන් තියෙනවා. මොනවද ඒ ?

පි: Instant Courses තියෙනවා.

ප්‍ර: මොනවද ඒ?

පි: ඒක සාමාන්‍යයෙන් මම deeply කියලා ඒක බැලුවේ නැහැ. මොකද මම අර උත්සවයේ දී මෙයාගේ අර Face cut එක තිබුණේ අර වහාබි, සලෆි Face cut එකක් රැවුල ඔක්කෝම. ඊට පස්සේ මං මෙයා කවුද කියන එක මම හොයලා බැලුවේ.

ප්‍ර: කවුද මෙයා කියන්නේ ?

පි: මුයිස් බුහාරි කියන එක්කනා තමයි එක්කනා. එයා තමයි බගතලේ road එකේ පල්ලියේ ජුම්මා දේශනා තියෙන එක්කෙනා. එතකොට බගතලේ road පල්ලිය තියෙන්නේ කොල්ලුපිටියේ. ඒක පල්ලිය Structure එකක නැහැ. ඒක නිකන් Normal Building Structure එකක තමයි තියෙන්නේ. එතකොට.

ප්‍ර: ඇයි ඒ?

පි: ඒක මම දන්නේ නැහැ. ඇයි ඒගොල්ලන් එහෙම හැදුවේ. ඒ ප්‍රදේශවාසීන් නොමඟ යවන්න හැදුවද පස්සේ ඒක පල්ලියක් වශයෙන්

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පසුකාලීනව ක්‍රියාත්මක කරන්න හැදුවද ඕකට තමයි යුසුෆ් මුස්තිලා ඔක්කෝම එන්නේ. දැන් යුසුෆ් මුස්තිගේ පුතා ඔක්කෝම English band තමයි ඔක්කෝම කරන්නේ. ඒ කියන්නේ International crowd ළමයි ටිකක් educate දැන් ඔය පාස්කු ප්‍රහාරයෙන් පස්සේ හිටපු දැන් ඔය ඉගෙන ගත්තු කට්ටියක් ඉන්නවානේ ඔතන. එතකොට ඒ educate crowd කට්ටිය motivate කරන්නේ කියලා තමයි මේගොල්ලන්ගේ Agenda තියෙන්නේ. මේගොල්ලන් දැනුවත් දන්නේ නැහැ. ඒ Agenda එකේද ඉන්නේ කියන එක.

ස්වාමීනි Sakeena Institute එකට අදාළ web පිටුවේ පළමුවන web පිටුව IAKR – 19 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා.

ප්‍ර: United Thawheed Jamathe කියන සංවිධානය මොකක්ද ?

පි: ඒක තිහාරිය මුල් කර ගත්තු සංවිධානයක්. ඒකත් වහාබි අන්තවාදී මතය තිහාරිය වගේ ගැමි ප්‍රදේශයක් වාරණ වගේ පන්සල් තියෙන තැනක පටන් ගත්තු සංවිධානයක්. එතකොට ඒක ඇවිල්ලා අබ්දුල් රාසීක්ගේ සංවිධානයක් එක්ක ගැටෙනවා. හේතුව ඒගොල්ලන් මුහුණ වහන්න කැමැති කට්ටියක්.

ප්‍ර: ඒ කියන්නේ United Thawheed Jamathe කට්ටිය?

පි: United Thawheed Jamathe කට්ටිය. අබ්දුල් රාසීක් මුහුණ වහනවට විරුද්ධ මතයේ ඉන්න එක්කෙනෙක්. එතකොට තවුහිද් වහාබි මතවාදය තුලත් එවැනි ගැටුමක් තියෙනවා කියන එක මං මේ UTJ එක හරහා තමයි දැන ගත්තේ. එතකොට UTJ එක ඇවිල්ලා තිහාරිය base කරලා තමයි තිහාරියේ තියෙනවා පරණ සුෆි පල්ලි. ඒවා ටාගට් කරලා සහ ඒවා වලට යන මිනිස්සුන්ව ටාගට් කරලා තමයි එහේ establish වුණේ.

ප්‍ර: මේගොල්ලෝ පතුරන්නේ වහාබිවාදය නේද?

පි: වහාබිවාදය. එතකොට මේගොල්ලෝ වැඩිපුරම සිංහල ජනතාව මේ සම්බන්ධයෙන් නම්ම ගන්න කටයුතු කරනවා කියලා කිව්වොතින් හරිද?

ප්‍ර: ඒ ප්‍රදේශය වක්‍රාකාරව දාන මාන ඒ ආකාරයෙන් උදව් කරලා ඒ කටයුතු කරනවද දන්නෙත් නැහැ. ඒ පිළිබඳව මට අවබෝධයක් නැහැ. හැබැයි ඒගොල්ලන් මුස්ලිම් ජනතාව අතර වහබිවාදය මතය දැඩිලෙස පතුරවන්න ඒ කියන්නේ පාරම්පාරික මුස්ලිම් ඉන්න ප්‍රදේශ වල පතුරන්න දැඩිලෙස පතුරන්න යම්කිසි දෙයක් කරනවා කියන එක විතරක් මම දන්නවා.

ප්‍ර: එතකොට පාරම්පාරිකව පැවතෙන පුරාවස්තු වලට යම් හානියක් ඔවුන් සිදු කරනු ලබනවද?

පි: ඒ සම්බන්ධව අදහස් කතා කරනවා. ඒ කියන්නේ ඇවිල්ලා අර සොහොන් ඒ කියන්නේ ශාන්තුවරුන්ගේ සොහොන් සම්බන්ධව. ඒවා

FAIR COMMENT BY JEZEEM

ඇවිල්ලා ඉස්ලාම් දහමේ නැහැ කියන මතය. ඒවා විනාශ කළ යුතුයි කියන මතය. එයා විතරක් නෙවෙයි සමස්ත වහාබ්වාදී සලෆි හුවාන් කට්ටිය සියල්ලම ඒ මතය තමයි දරන්නේ. ඒ නිසා තමයි ඔය මාවනැල්ල බුදුපිළිම සිද්ධිය පවා එන්නේ. තමන්ගේ සමාජය තුල තිබෙන පුරාවස්තු වලට ගරු බැරි තත්වයක් උදා කරන පුද්ගලයෙකුට අන්‍යාගමිකයන්ගේ පුරාවස්තු පිළිබඳව ඔවුන්ට එච්චර දෙයක් නැහැ. ඒ නිසා තමයි අර ස්තූප වල ගිහිල්ලා වාඩිවෙලා ඉඳලා Photos ඔක්කෝම ගත්තේ. එතකොට ඒගොල්ලන්ට පොඩි කාලේ දී ඒ දැනුම ලැබෙන්නේ නැහැ. ඒගොල්ලන්ට ලැබෙන්නේ ඇවිල්ලා මේ පුරාවස්තු කියන දේ ඇවිල්ලා රැකගතයුතු සම්පතක් කියන එක නෙමෙයි. විනාශ කළ යුතු කියන සම්පතක් වශයෙන්. ඒක මොකක්ද ඉතිහාසය ඒගොල්ලන්ට ඕනි විදිහට හදන්න පුළුවන්නේ පුරාවස්තු විනාශ කළොත්. එතකොට බාමීයන් බුදු පිළිම දැන් නබිතුමාගේ කාලයේ තමා බාමීන් බුදුපිළිම ආරක්ෂා කරලා තියෙනවා. එතකොට ඒවාගේ ආරක්ෂා කරපු දේ තබ්ලික් මතවාද දරන තලෙබාන් සංවිධානය හරහා කඩලා බිඳලා බිමට සමතලා කරනවා. එතකොට ඒවගේ දේවල් තමයි ලංකාවෙත් වුණේ.

ප්‍ර: හොඳයි ඔබ දන්වද ඒක දැනටමත් ආරම්භ කරලා ද නැද්ද කියලා කියන්න?

පි: ඒ කියන්නේ

ප්‍ර: යම් යම් ප්‍රදේශවල ?

පි: සාමාන්‍යයෙන් සුෆි මුස්ලිම්වරුන්ගේ ඒ කියන්නේ පාරම්පරික තිබ්බු ගොඩාක් තැන් විනාශ කරලා තියෙනවා. විශේෂයෙන් කාත්තන්කුඩි ප්‍රදේශයේ විශාල වශයෙන් විනාශ කරලා තියෙනවා. ඒවාගේම ගාල්ල, ඒවගේම දැන් ඔය කියන තිහාරියෙත් සිදු වෙලා ඇති. ඒ කියන්නේ බොහොමයක් ප්‍රදේශවල එවැනි විනාශකාරී සිදුවීම් වුණා. ඒවගේ ඒ පුද්ගලයන්ගේ ගම් අල්ල ගත්තාම ගමේ හිටියා සුෆි පරම්පාරවක් නැති වුණාම ඒ පල්ලියක් අරගෙන ඒ පල්ලිය විනාශ කරලා ඒකට උඩින් පල්ලි හදලා තියෙනවා. ඒ සොහොන් විනාශ කරලා. ඒවගේම දැන් welcome to මස්ජිත් කියලා Programe කරාට මේ උලමා සභාවේ කට්ටිය කවදාවත් නුවර මීරා මක්කම් පල්ලිය හෝ කොල්ලුපිටිය අරලියගහ මන්දිරය ගාව තියෙන පල්ලියේ සොහොන් තියෙනවා. ඒවා පෙන්නුවේ නැහැ. මේවා අපේ පල්ලියේ තියෙනවා කියන එක පෙන්නුවේ නැහැ. ඒ කියන්නේ ඒගොල්ලන් ඒවා ඔවුන් වසන් කරනවා. එතකොට අන්‍යාගමිකයන්ටත් වසන් කරනවා. ඉතිහාසය වසන් කරනවා. ඒගොල්ලන් තමයි ඉතිහාසය කියලා පෙන්වන්නේ. මේ පල්ලිය මෙතෙන්නට එන්න හේතුව වුණ ඉතිහාසය ඇත්ත ඉතිහාසය ඒගොල්ලන් උගන්වන්නේ නැහැ. එතකොට මීරා මක්කම් වගේ දළදා මාළිගාවේ සිංහල රජවරු විසින් ඉඩම් ලබා දුන්නු ප්‍රදේශවලනේ ඒවා

FAIR COMMENT BY JEZEEM

ඉදිකළේ. එතකොට ඒ ඉතිහාසය කියලා දෙනවද දන්නේ නැහැ. ඒ වුණාම මේ ඉතිහාසය හංගනවා. හංගලා ඒ ගැන ඒ අධ්‍යාත්මිකව තියෙන සුෆි කියන මතය කඩනවා. ඉතින් ඒක තමයි ඒගොල්ලන්ගේ ප්‍රබල වශයෙන් කරන්නේ.

ප්‍ර: ඔබ කියන්නේ ඒවගේ තමන්ගේ ආගමේ දේවල් වලට එහෙම කරන අය ඊළඟට අනිත් ආගම්වල තියෙන පුරාවස්තු වලටත් අත තියෙනවා කියන කරුණු?

පි: ඔව්.

ප්‍ර: එතකොට අකුරණ තවුහිද් ජමාත් කියන සංවිධානය?

පි: අකුරණ ඇවිල්ලා බහුල වශයෙන් තියෙන්නේ තබ්ලික් කට්ටිය තමයි බහුල වශයෙන් ඉන්නේ. ඊට අමතරව ජමාතේ ඉස්ලාම් කට්ටිය තමයි ඉන්නේ. එතකොට ඒ මත වලට විරුද්ධව තමයි අකුරණ තවුහිද් ජමාත් ATJ කියලා ආයතනයක් ආවේ. මං ඒකේ සාමාජිකයන් තමයි සහරාන් එක්කත් යම්කිසි සාකච්ඡාවකටත් ගියේ ඒ දවස්වල.

ප්‍ර: ඒ මොන කාලේ වගේද?

පි: මං හිතන්නේ මාධ්‍ය වල ඒ වීඩියෝ පටය ආවා.

ප්‍ර: එතකොට රඛ්දාතු අලී සුන්නා ?

පි: ඒ නින්දවූර් සංවිධානයෙනේ.

ප්‍ර: ඒක ගැන පොඩ්ඩක් කියන්න පුළුවන් ද අපිට?

පි: ඒක ගැන වීඩියෝ පටයක් තියෙනවා. එයා ඇවිල්ලා අන්තවාදය පිළිබඳව කතා කරනවා දැඩි ලෙස. ඒ කියන්නේ ඇවිල්ලා අපි නිකන් ඉන්න ඕනි නැහැ. අපි මේ සටහන් කරන්න ඕනි කියලා.

(සාක්ෂිකරුට වීඩියෝ දර්ශනයක් පෙන්වයි)

ප්‍ර: ඒ වීඩියෝ පටයේ කවුද කතා කරන්නේ පෙන්වන්නේ?

පි: අලී අහමඩ් රශාදී කියලා.

ප්‍ර: මොනවද ඔහු කියන්නේ ?

පි: එයා කියන්නේ දිගන සිද්ධිය මුල් කරගෙන අපි ඇවිල්ලා මේ කෝලේ, කෝලේ කියන්නේ ඇවිල්ලා බියගුල්ලන් වෙන්න නරකයි. අපි සටහන් කරන්න ඕනි. අපි අපේ පල්ලිය පුච්චනවා. අපි ගහනවා. අපි බියගුල්ලන් වෙන්න නරකයි කියන ඒ ප්‍රචණ්ඩත්වයට යොමු කරන දේශනාවක්.

ප්‍ර: මේ එතන ඉන්න අය එතකොට මුස්ලිම් බැතිමතුන්?

පි: බැතිමතුන්. නින්දවූර් කියන්නෙත් පාරම්පාරික වශයෙන් තිබ්බ බැතිමතුන් හිටපු ප්‍රදේශයක්. එහෙත් සුෆි පාරම්පාරික පුරවස්තු විනාශ කරලා තියෙනවා.

ස්වාමීනි එම වීඩියෝ පටය IAKR – 20 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

ප්‍ර: ඔබ කිව්වා අර ඔබ ළඟ තියෙනවා කියලා අර අබ්දුල් රසීක් ISIS සංවිධානයට පක්ෂව කතා කරන එකක්. ඒක අපිට බලන්න පුළුවන්ද?

FAIR COMMENT BY JEZEEM

පි: ඒකේ මුලින්ම තිබ්බා පාරම්පාරික පූජකවරයෙක් කතා කරනවා. මේගොල්ලන්ට විරුද්ධව මොහෝඩිරික් කියන පුද්ගලයා.

ප්‍ර: කාට විරුද්ධවද කතා කරන්නේ?

පි: ISIS එකට විරුද්ධව.

(සාක්ෂිකරුට වීඩියෝ දර්ශනය පෙන්වයි)

ප්‍ර: මේ අබ්දුල් රසීක් මොනවා ගැනද ඒ කියන්නේ ඕකේ ප්‍රශ්නයක් ඇහුවානේ ළමයෙක් මොනවද ඇහුව ප්‍රශ්නය?

පි: ඒගොල්ලන් අහන්නේ බොකෝහරාම් ඒවගේ එක එක ගැන අහනවා. ජිහාඩිස් ෆයිටර්ලා ගැන අහනවා, Organizations ගැන එතකොට මෙයා ගැන ISIS ගැනත් අහනවා. එතකොට මෙයා මුලින්ම උත්තරය දෙන්න පටන් ගන්නේ මේ අල්කයිඩා එක ගැන කියලා. අල්කයිඩා ඇවිල්ලා කිලාෆත් එක පටන් ගත්තා. හොඳට කරගෙන ගියා. හැබැයි ඒගොල්ලන් කාර් බෝම්බ තියන්න ගියා. මරාගෙන මැරෙන ඒවා කරන්න ගියා. ඒ නිසා ඒකට එයා විරුද්ධයිලු. එයා කියන්නේ මරණ එක හරියට මරන්නලු. ඒ කියන්නේ ඉස්ලාම් ආගමානුකූල කියන විදිහට ඒයාගේ ඉස්ලාම් අනුව මරන්න කියලා. එතකොට එහෙම නැතුව කළොත් අපි ඒකට පක්ෂ නැහැ. ඒකට අල්කයිඩාත් කැඩිලා ගියා. අන්තිමට කිලාෆත් එකත් නැතිවෙලා ගියා.

ප්‍ර: එතකොට එයා කියනවද කොහොමද හරියට මරන්න ඕනි විදිහ?

පි: දැන් එයා කියනවා ISIS කියන සංවිධානය දැන් ඒගොල්ලන් ලංකාවේ සංවිධානයක් නෙවෙයි. ඒගොල්ලන්ට අපි සහතික දෙන්න. ඒගොල්ලන් ඇවිල්ලා මේ පිටස්තර සංවිධානයක්. ඒ වුණාට දැන් මේවන තුරු කතා කරන අවස්ථාව වෙනතුරු එයා කියනවා මගේ මේ අවස්ථාව වනතුරු ඉස්ලාම් ආගම අනුකූලව තමයි සටහන් කරන්නේ කියන මතයේ එයා ඉන්නවා. එතකොට එයා ඇවිල්ලා හැමදාම ඇවිල්ලා බුදු හාමුදුරුවන්ගේ මිනිස්සු අර කතාවක් කියනවානේ අර අපහස කරලා කතා කරානේ. එතකොට එයා ඊට පස්සේ තමන් කතා කරපු අදහස වෙනස් කරන එක්කෙනෙක්. දැන් මෙතනත් මෙයා කතා කරන අදහස වෙනස් කරන්න තමයි ඔය දෙබඩි අදහස් කතා කරන්නේ. එතකොට දැන් ඒ වගේ දෙබඩි අදහස් කියන පුද්ගලයෙක් සමාජයේ ඉන්න බැහැනේ. සමාජයට මහ පෙන්වන්නත් බැහැනේ. එතකොට එයා එයාගේ safe gard එකට කරන්නේ හේතුව තමයි මං හිතන්නේ . මෙතනත් එයා මත 2ක් කියනවා. මට එයාට සහතිකය දෙන්න බැහැ. ඒ වුණාට මේ අවස්ථාවේ දී මං මේ කතා කරන අවස්ථාව වෙනකම් ISIS කියන සංවිධානය ඉස්ලාම් ආගමානුකූලව තමයි ජිහාඩ් කරන්නේ. එතකොට එයා කියනවා ඔය පරිසරයේ කාලවකවානුව අරන් බලලා එතකොට ඒක ත්‍රස්තවාදී විදිහට ඒගොල්ලන් ජිහාත් කරනේ කියන එක

FAIR COMMENT — BY JEZEEM —

නැද්ද කියන එක හොයලා බලන්න පුළුවන්. එයා කියන්නේ ISIS කියන හරි කියලා තමයි එයා කියන්නේ.

එහෙනම් මේ වීඩියෝ පටය පෙන්වන්න පුළුවන්නේ මේ ගරු කොමිෂම් සභාව ලබාදෙන්න.

ස්වාමීනි එම වීඩියෝ පටය ලකුණු කර ඉදිරිපත් කිරීමටත් එය ද්‍රවිඩ භාෂාවෙන් තිබෙන නිසා එහි අන්තර්ගතය පරිවර්තනය කරලා සිංහල භාෂාවෙන් ඉදිරිපත් කිරීම සඳහා භාෂා පරිවර්තක මහතාට උපදෙස් දෙන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ස්වාමීනි අබ්දුල් රසීක් විසින් මේ කණ්ඩායමක් අමතන බව දැක්වන මෙම වීඩියෝ පටය IAKR – 21 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා. එසේම ඔහු ඒ ඇමතීම සිදු කරන්නේ ද්‍රවිඩ භාෂාවෙන් නිසා අබුදුල් රසීක් විසින් කියනු ලබන එම දේවල් සිංහල භාෂාවට පරිවර්තනය කොට ගරු කොමිසම් සභාවට ඉදිරිපත් කරන ලෙසට භාෂා පරිවර්තක මහතාට නියෝගයක් කරන ලෙසට අපේ භාෂා පරිවර්තක මහතාට නියෝගයක් කරන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

IAKR – 21 වශයෙන් ලකුණු කරන ලද CD පටයේ අබ්දුල් රාසීක් යන අයගේ සම්පූර්ණ කතාව සිංහලයට පරිවර්තනය කර ඉදිරිපත් කරන ලෙසට කොමිසම් සභාවේ භාෂා පරිවර්තකට නියෝග කරන අතර එය එසේ සිදු කළ පසු එම සිංහල පරිවර්තනය IAKR – 21 (A) වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

ප්‍ර: ඔබට පුළුවන්ද මීළඟට Muslim Foundation For Cultural Development යන ආයතනය සම්බන්ධයෙන් මේ ගරු කොමිෂන් සභාව දැනුවත් කරන්න ?

පි: MFCD

ප්‍ර: ඔව්.

පි: ඒක ඇවිල්ලා යුහාන් මුස්ලිම් මතදරන කට්ටියක්. ජමාතු සලාමාමා කියන නම ඒ යටතේ තමයි ඒගොල්ලන් ඉන්නේ.

ප්‍ර: ඒ කියන්නේ Muslim Brotherhood එකට?

පි: ඔව්. එතකොට ඒගොල්ලනුත් වාමී හා සමානව Program කරලා motivate කරලා ඒවගේ ඒ Program එක කරන කට්ටියක් තමයි. ඒ කියන්නේ ඒගොල්ලන්ගේ සංවිධනයේ නමින්ම ඒක සඳහන් වෙලා තියෙනවා. අපොස සාමාන්‍ය පෙළ, උසස් පෙළ ඒවගේම ඒකෙන්

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

විභාගය ඉවර වෙලා ඉන්න කාල පරිච්ඡේදයේ එවගේ course කරන කට්ටිය තමයි MFCD

කට්ටිය. දන්න තරමින් ඒක ධර්මාරාම දෙමටගොඩ පාරේ තමයි ඒක තිබ්බේ.

ප්‍ර: එතකොට මේ අයට කොහෙන්ද මේ කටයුතු කිරීම සඳහා ඔය පුහුණුවීම් කිරීම සඳහා මුදල් ලැබෙන්නේ?

පි: මේ සංවිධානයට විදේශ වලින් මුදල් එනවද කියන එක සාමාන්‍යයෙන් මට නිශ්චිතව කියන්න බැහැ. ඒ වුණාට මේගොල්ලට දේශීය ආධාර මුදල් ලැබෙනවා.

ප්‍ර: එතකොට හීරා සංවිධානය ඒක තියෙනවද?

ස්වාමීනි එම සංවිධානයේ web පිටුව එහි මුද්‍රිත පිටපතක් IAKR – 22 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා.

පි: එකේ මට පේන ඡායාරූපයේ ඉන්න එක්කෙනෙක් ඇවිල්ලා NFGG එකේ ඉන්න එක්කෙනෙක් හා සමානව පේනවා.

ප්‍ර: හරියටම කියන්න පුළුවන්ද?

පි: කණ්ණාඩි දාලා ඉන්නවනේ එක්කෙනෙක්.

ප්‍ර: අර කතා කරන එක්කෙනාද? අතන වාඩිවෙලා ඉන්න එක්කනාද?

පි: වාඩි වෙලා ඉන්නවනේ

ප්‍ර: දම් පාට වගේ shirt එකක්?

පි: ඔව්.

ප්‍ර: ඒයා කවුද?

පි: NFGG political සංවිධානයේ ඉන්න එක්කෙනෙක්. NFGG මේගොල්ලන් ඔක්කොම එකම link එකක්.

ප්‍ර: ඔහුගේ නම් මොකක්ද?

පි: මෙයාගේ නම මට මතක නෑ. මෙයා NFGG එකේ ඉන්නවා.

ප්‍ර: ඔබ NFGG සංවිධානයේ ඉන්නවා කියලා හඳුනා ගන්නේ අසුන් ගෙන ඉන්න අයගෙන් මැද වාඩි වෙලා ඉන්න තැනැත්තා?

පි: තැනැත්තා.

ප්‍ර: මේ වෙබ් පිටුවේ?

පි: ඔව්.

ප්‍ර: ඊළඟට මා ඔබෙන් දැන ගන්න කැමති හීරා සංවිධානය ගැන හීරා foundation ?

පි: හීරා සංවිධානය දැන් මේ වන තුරු දැනට ක්‍රියාත්මක නෑ දැන්.

ප්‍ර: ඇයි ඒ?

පි: මීට කලින් ජමාතේ ඉස්ලාම් සංවිධානයේ යටතේ තිබ්බ ආයතනයක්. ඒකෙන් ඒකට නම් විදේශ ආධාර ආව විදිහට මේ තොරතුරු තියෙනවා. එතකොට ඒ ගොල්ලන් ඇවිල්ලා මේ විශාල වශයෙන් කළේ ඇවිල්ලා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මේ ඉස්ලාම් ආගමට පුද්ගලයන් බඳවා ගැනීම සහ ඒ ආශ්‍රිත පොත් පත් මුද්‍රණය කිරීම CD තැටි නිර්මාණය කිරීම තමයි මේ ගොල්ලොන්ගේ ප්‍රධානම දේවල් වශයෙන් තිබ්බේ.

ප්‍ර: එතකොට මේ මේ හීරා foundation එකේ වෙබ් පිටුවේ මුහුණු පොතේ පිටුව තමයි දැන් මේ පෙන්වන්නේ මේ හීරා foundation එකේ? ඔබ කියන ආකාරයට ඔවුන් අනෙකුත් ආගමිකයන්ව ඉස්ලාම් ආගමට හරවා ගැනීම සිදු කරනවා?

පි: සිදු කිරීම මේ විශාල ඉන්ජීයෝස් වැඩක් ඒ කියන්නේ දැන් මේ ඔය පෙන්වන ඉන්ජීයෝස් වැඩ ඊට අමතරව

ප්‍ර: ඒ කියන්නේ ඔවුන් ගෙවල් හදලා දෙනවා නේද ජනතාවට?

පි: ඔව්.

ස්වාමිනි හීරා පදනමේ සංවිධානයේ මුහුණු පොත එහි පිටුව IAKR – 23 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා.

ප්‍ර: මීළඟට ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ගරු කොමිෂන් සභාවට seran dib කියන සංවිධානය ගැන?

පි: ඒක ඇවිල්ලා අධ්‍යාපන සම්බන්ධ ආයතනයක්. ඒ කියන්නේ මුස්ලිම් තරුණ ප්‍රජාව ඇවිල්ලා අධ්‍යාපන වශයෙන් දිරි ගන්වන මේ NGO එකක්.

ප්‍ර: ඔවුන්ට විදේශ ආධාර ලැබෙනවාද?

පි: ඔවුන්ට විදේශ ආධාර ලැබෙනවාද කියලා මම දැනුවත් නෑ. දේශීය ආධාර නම් ලැබෙනවා.

ප්‍ර: ඔවුන් ජමාතේ ඉස්ලාම් සංවිධානයට සම්බන්ධද?

පි: ඔව් සම්බන්ධයි.

ප්‍ර: සම්බන්ධයි. එතකොට organization for Muslim student education and development කියන සංවිධානය ගැන ඔබට මොනවද කියන්න පුළුවන් නැත්නම් OMSED?

පි: OMSED ඔව් ඒ ගොල්ලන් ඇවිල්ලා මේ ඉහ්වාන් මුස්ලිම් අදහසට සමාන යන ජමාතේ ඉස්ලාම් මතවාදයට යන සංවිධානයක්. ඒ ගොල්ලනුත් ඇවිල්ලා අර වාමී type එකෙන් යන සංවිධානයක්. ඒ කියන්නේ education camps කරනවා. ඒ ගොල්ලොන්ගේ මං හිතන්නේ වෙබ් සයිඩ් එකක් නැත්නම් මේ facebook පිටුවක් තියෙනවා. ඒ ගොල්ලනුත් ඒ සම්බන්ධයෙන් මේ වාර්තාමය දේවල් තියෙනවා.

ප්‍ර: මොනවගෙ විදිහටද ඔවුන් ආධාර කරන්නේ?

පි: ඔවුන්ගේ ඉහ්වාන් මුස්ලිම් concept එකට තමයි ඒ මතයට තමයි ඒ camp වල තියෙන මේ lectures යන්නේ. ඒ ගැන නලිමීස්ලා තමයි ඒකට ඇවිල්ලා presentation ඔක්කොම කරන්නේ. ඒ දේශනයන් බොහොමයක් ඇවිල්ලා මේ තරුණයන්ව ඒ අර ඒ

FAIR COMMENT BY JEZEEM

ගොල්ලොන්ගේ සංවිධානයට motivate කරන්න තමයි ඒ motivation එක කරන්නේ.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් අභිප්‍රේරණය කරන්නේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට IIFSO සංවිධානය International Islamic Federation of student organization?

පි: ඔව් ඒක වාමී වගේ International සංවිධානයක්. ඒක මෑත කාලීනව තමයි ලංකාවටත් එක්ක සම්බන්ධව MFCD නැත්නම් OMSED කියන සංවිධාන අතර සම්බන්ධයක් තියා ගෙන තමයි ඒ ගොල්ලන් වැඩ කටයුතු කරන සංවිධානයක්.

ප්‍ර: කොහෙන්දට ඒක සංවිධානයේ Head Quarters තියෙන්නේ කොහේද?

පි: Quarters එක ගැන මට හරියටම මතකයක් නෑ.

ප්‍ර: නමුත් ඔබ දන්නවා ඒක?

පි: දන්නවා.

ප්‍ර: ජාත්‍යන්තර සංවිධානයක් කියලා?

පි: ජාත්‍යන්තර සංවිධානයක්.

ප්‍ර: එතකොට peoples moments for justices and development PMJD ඒ සංවිධානය?

පි: ඒක අකුරණ ප්‍රාදේශීය සභාව මුල් කර ගෙන මේ බිහි වෙච්ච සංවිධානයක්. අකුරණ අර ජමාතේ ඉස්ලාම් ඉහුවාන් මුස්ලිම් ඔය කට්ටිය තමයි මුල් කාලයේදී ඒකට දායකත්වය ලබා දුන්නේ.

ප්‍ර: නමුත් මේ මැතිවරණ කොමසාරිස් කාර්යාලය එය දේශපාලන පක්ෂයක් විදිහට පිළි අරගෙන තියෙනවද?

පි: නෑ ඒ ගොල්ලන් ඇවිල්ලා මෙහෙම තමයි. ඒ ගොල්ලන්ගේ ඇවිල්ලා ත්‍රිකුණාමලයේ සංවිධානයක් තියෙනවා front for justices and face නජා මොහොමඩ් එයා ජමාතේ ඉස්ලාම් එකේ සංවිධානයේ සාමාජිකයෙක්. කින්නියාව මුල් කර ගෙන එයා සංවිධානයක් හදා ගෙන හිටියා. එතකොට කාත්තන්කුඩි වල තිබ්බා ඇවිල්ලා PMGG කියලා peoples moments for good govents කියලා.

ප්‍ර: good govents?

පි: එතකොට ඒ ගොල්ලන් ස්වාධීනව තමයි හැම මැතිවරණයටම ඉදිරිපත් වෙලා කාත්තන්කුඩි විපක්ෂ දේශපාලනය තමයි කළේ.

ප්‍ර: එතකොට මං කිව්වොත් නිවැරදිද දැන් කාත්තන්කුඩියේ විපක්ෂය නියෝජනය කරමින් ඔවුන් දේශපාලනය කරනවා කියලා PMGG?

පි: දේශපාලනය NFGG වශයෙන් ඒ තුන්දෙනාම එකතු වෙලා දේශපාලන පක්ෂයක්

ප්‍ර: කවුද ඒ NFGG වෙන්නේ national frond for good govents?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: good govents ඒ කියන්නේ PMGG, FJPඑකේ හිටපු නජා මොහොමඩ් PMGG එකේ හිටපු සමහරක් කොටසක් තමයි ඒ ගොල්ලන් එක්ක එකතු වුණේ. ඔක්කොම නෙවෙයි. එතකොට ඒ ඔක්කොම එකතු වෙලා තමයි මේ NFGG කියලා මැතිවරණ කොමිෂන් සභාවේ පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් ඒ ගොල්ලන්ව පිළිගන්නේ. හැබැයි දිගින් දිගටම මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ එයා ඉල්ලම් කරපු ඉල්ලුම් පත් දිගින් දිගටම ප්‍රතික්ෂේප වුණා. යහපාලන ආණ්ඩුවෙන් පස්සේ තමයි ඒක පිළිගත්තේ. එතකොට කාත්තන්කුඩියේ දිගින් දිගටම විපක්ෂයේ ඉඳගෙන එයා ඉදිරිපත් කරපු දේවල් ඇයි මැතිවරණ කොමිෂමෙන් පිළි අරගෙන මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ ඉන්නවා නලිමීවරයෙක් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයෙක්. ඔහු හා මේ ගොල්ලන් හා දැඩි සම්බන්ධයක් තිබ්බා කියලා මා අනුමාන කරනවා. මොකද ඒ ව්‍යංගයෙන් යම් කිසි උදව්වක් ඔහු හරහා ලැබිලා ඇති කියලා මං හිතනවා. ඒ හේතුව වශයෙන් මං දක්වන්නේ දිගින් දිගටම ප්‍රතික්ෂේප වූ අයදුම්පතක් යහපාලන ආණ්ඩුව කාලයේ දී පමණක් ඒ ගොල්ලොන්ට කොහොමද පිළිගන්න ඒ ගොල්ලන් මොකක්ද සම්පූර්ණ කරන ලද්දේ. ඊට පෙර ඒගොල්ලන් අසම්පූර්ණ කරන ලද්දේ මොකක්ද කියන එක.

ප්‍ර: නම?

පි: Mr. මොහොමඩ් නලීම්

ප්‍ර: සම්පූර්ණ නම දන්නවද මොන මොහොමඩ්ද කියලා?

පි: දන්නේ නැහැ.

ප්‍ර: එතකොට අපි එහෙනම් front for justices and peace සංවිධානය ගැන?

පි: FJP ඒක තමයි අර කින්නියාව මුල් කරගෙන නජා මොහොමඩ් විසින්. දැන් නජා මොහොමඩ් ඉන්නේ ඔය NFGG කියන දේශපාලන පක්ෂයේ.

ප්‍ර: දැන් ඒගොල්ලෝ ඔක්කෝම ඒකට සම්බන්ධ වෙලා?

ප්‍ර: කාත්තාන්කුඩි අබ්දුල් රහුමාන් සම්බන්ධව අන්තර්ජාලයේ ලියැවිල්ලක් ඇවිල්ලා තියෙනවා මෙච්චර ගාණක් වියදම් කරලා තියෙනවා මැතිවරණයට. ආසන 2ක් ගන්න කියන. ඒ වාර්තා එතන තියෙනවා.

ප්‍ර: මොකක්ද ඒ වාර්තා?

පි: ඒකත් web අඩවියක පළවුණ වාර්තාවක්.

ප්‍ර: එතකොට ඔබට දැන් ඒ වගේම අපේ ගරු කොමිෂන් සභාව දැනුවත් කරන්න පුළුවන්ද ඉස්ලාම් දේවාර්ය සහ වෘත්තිය පිළිබඳව අධ්‍යාපන ලබාදෙන ස්ථාන පාසල්?

පි: අරාබි විදුහල. ඒ කියන්නේ පිරිවෙන් අධ්‍යාපනය. මුස්ලිම් පූජක අධ්‍යාපනය. ලංකාවේ පාරම්පාරික වශයෙන් තිබ්බ ආයතන තියෙනවා. මහරගම ගපූරියා. පුත්තලමේ තිබ්බා කිසිමියා, මඩකලපුව තිබ්බා ෆලාහි, එතකොට ගාල්ල තිබ්බා බහිජි, වැලිගම බාරී ඒවගේ ගොඩක් අධ්‍යාපන

FAIR COMMENT BY JEZEEM

ආයතන තිබ්බා රටපුරා. එතකොට ඒවා පසුකාලින වෙද්දී ඔය කාසීමියා කියන පුත්තලම ආයතනය පලාහි ආයතනය ගෆූරියා මහරගම ඒවගේ සමහරක් ආයතන තුලට ඇවිල්ලා වහාබ්වාදීන් සහ ඒකේ ඉගෙන ගත්තු පූජක අධ්‍යාපනය ලබපු කට්ටිය විදේශවලට ගිහිල්ලා ඒගොල්ලන් වහාබ්වාදී අදහස් වලින් පෝෂණය වෙලා ඒ ආයතන අත්පත් කර ගත්තා. ඒ කියන්නේ මහරගම ගෆූරියා කියන්නේ ඇවිල්ලා බහුතර සිංහල බෞද්ධ ජනතාවක් ජීවත් වෙන ප්‍රදේශයක් තුල එවකට දී ඒ ගෆූර් කියන ඒ ධානපතියා විසින් ඔය ඉඩම පරිත්‍යාග කරා. එයා තමයි

ප්‍ර: අර පමුණුව තියෙන ස්ථානය නේද?

පි: ඔව්. එතකොට කොළඹ සහීරා විද්‍යාලයෙත් විශාල ශ්‍රවණාගාරය ගෆූර් බිල්ඩිම ඒ ගෆූර් කියන පුද්ගලයා තමයි ඒ ධානපතියා තමයි මේවා කළේ. අශෝක විද්‍යාලයට ඔය ඉඩම ලබා දුන්නෙත් ඔය ගෆූර් කියන ධානපතියා. එතකොට මං අර කළින් සඳහන් කරානේ මුස්ලිම් ධානපතියන් තනි තනියෙන් වැඩ කරා කියලා. එතකොට සමාජයට යම්කිසි ප්‍රශ්නයක් දැනුණේත් නැහැ. ඒවා යම්කිසි මට්ටමකට සිද්ධ වුණා. මේගොල්ලන් ධානපතියන්ගේ control එකෙන් මිදිලා ඒක Organization වලට ධානපතියන් පරිත්‍යාග කරන්න ගිහින් තමයි සමාජයට NGOස් හරහා වැඩ කටයුතු වෙන්න පටන් ගත්තේ. ලංකාවේ තුළ දේශිය වශයෙන්. එතකොට අර මහරගම ගෆූරියා කියන අධ්‍යාපනය ආයතනය පුත්තලම කාසීමියා වැනි බොහෝ අධ්‍යාපන ආයතන මුස්ලිම් අධ්‍යාපන ක්‍රමයෙන් ඒ කියන්නේ නිජාමියා කියලා අධ්‍යාපන ක්‍රමයෙන් මිදලා තියෙනවා. ඒ කියන්නේ නිසාමියා කියලා අධ්‍යාපන සංකල්පයක් තියෙනවා.

ප්‍ර: මොකක් ද ඒ සංකල්පය?

පි: ඒ සංකල්පය ඇවිල්ලා මට පූජකවරයෙක් තමයි මට කිව්වේ. මේක ලංකාවේ අධ්‍යාපන පූජක අධ්‍යාපන ලබාදෙන ආයතන වල මේවා practice කරන්නේ නැහැ කියලා. ඒගොල්ලන් උගන්වන්නේ වෙන වහාබ්වාදී ඒවගේ ideologies. මේක practice කරාම ලංකාවේ තියෙන අර අධ්‍යාත්මික අධ්‍යාපනයත් එකේ උගන්වනවා. ඒක practice කරන්න Implement එකක් ආවොත් නීතියානුකූලව විදිහට ඒක syllabus එකක් වශයෙන් ගත්තොත් මේකට මද්‍රසා ඒ කියන්නේ අරාබි පාසල් වල තියෙන අර අන්තවාදී මතය ගලවන්න පුළුවන් කියලා.

ප්‍ර: නමුත් ඒ සඳහා ඉඩ අවස්ථාව නැහැ කියලායි ඔබ මේ කියන්නේ ?

පි: නැහැ කියන්නේ.

ප්‍ර: එතකොට ඔබට කියන්න පුළුවන් ද මාදම්පේ ඉස්ලාහියා පිරිමි විදුහල, පුත්තලම ඉස්ලාහියා ගැහැණු විදුහල, මාවනැල්ලේ ආයිශා සිද්දිකා, නිහාරියේ ෆාති Institute, කොළොන්නාවේ අබිරාජ් Institute, බේරුවල

FAIR COMMENT — BY JEZEEM

ජාමියා නලීමියා කියන ඒ ආයතන මඟින් ඒ පාසල් මඟින් ඔය වහාබ්වාදය පතුරනවද නැද්ද කියලා?

පි: ඔය කියන සංවිධාන සියල්ලම ඇවිල්ලා නලීම් ඉහ්වාන් මුස්ලිම් ජමාත් ඉස්ලාම් මතවාදය පතුරන ආයතන. එතකොට ඒගොල්ලන් අරගෙන ඇවිල්ල ඉස්ලාහී එකේ අර ආරම්භක කාලීන විදුහල්පති මම මීට ඉහත අනාවරණය කරපු නදීර් මවුලවි එයා කියලා තියෙනවා ඉස්ලාහියා එකේ ප්‍රින්සිපල් වශයෙන් මේ අන්තවාදය ඉගැන්වුවා කියලා. එතකොට ඒ තුළින් එයාගේ ප්‍රකාශය තුළින්ම ඒ අන්තවාදය ඉගැන්වුවා කියන මතය තහවුරු වෙලා තියෙනවා. ඒවගේම ඔය ෆාති Institute කියන්නේ ඇවිල්ලා වෘත්තිමය අධ්‍යාපනය ලබාදෙන ආයතනයක්. එතකොට මේ ආයතන තුලින් ඇවිල්ලා ඒගොල්ලන්ගේ අර මතය ideology ඒගොල්ලන්ගේ ඒ මතය plan කරන්න අනාගතයට ඒගොල්ලන්ගේ ඉහ්වාන් මුස්ලිම් කියන සංවිධානය ලෝකයට දායද වෙන්නේ හසනොන් බන්න හරහා 1924 ඉඳලා 28 කාලවකවානුවේ. හැබැයි ඒගොල්ලෝ ඊජිප්තුවේ බලය අල්ල ගන්නේ මේ අරාබි වසන්තයත් එක්ක. එතකොට දිග කාලයක් ගියා. ඒගොල්ලනට දිග කාලය කියන එක ප්‍රශ්නයක් නෙවෙයි. ඒගොල්ලන්ට ඕනි ලේ හොලවන්නේ නැතුව බලය අල්ල ගන්න. ඉතින් ඒ concept එකට අනුගත වෙච්ච ඔය සංවිධාන ඕවාට වලට උපකාර වශයෙන්. ඒ කියන්නේ ආධාරක වශයෙන්. කෙහෙලි වශයෙන් පාවිච්චි වෙන්න අනාගතයේ දී පාවිච්චි වෙන ඉඩ තියෙන සංවිධාන තමයි ඔය කියන අරාබි විදුහල් සහ වෘත්තිමය පාසල්. මාවනැල්ලේ තියෙන අයිෂා ෂිද්ධියා කියන්නේ ගැහුණු දරුවන්ට උගන්වන පාසලක්. ඒ වගේම ජාමතේ ඉස්ලාමික් සංවිධානය ගැන කතා කරපු නිසා ඒ සංවිධානයෙන් පළවෙන ප්‍රකාශන තියෙනවා. එතකොට ඒක අල්හසනාත් කියලා ඒගොල්ලොන්ගේ ප්‍රකාශයක් තියෙනවා. මරාගෙන මැරීම සම්බන්ධව කතා කරපු ඒවා. 1971 පළවුණ මේකක්.

ප්‍ර: දැන් ඔබ ගාව තියෙනවද ඒක ?

පි: මේකේ තියෙනවා මේක මං හිතන්නේ මීල්පාරු එකේ මේ වයිහාරී කියන magazine එකේ තමයි මේ පිටුව. මේක අල්හසනාත්. මෙකේ තට්කොලෙයි තක්කුදල් ඊඩුපඩලාම් කියලා කලානිදි යුසුෆ් කර්ලාවි ඒ කියන්නේ යුසුෆ් කර්ලාවිගෙ මතය තමයි මේකේ තියෙන්නේ. මේක 1971 අල්හසනාත් සංවිධානයේ තට්කොලෙයි සෙයියලාම් ඒ කියන්නේ මරාගෙන මැරෙන්න පුළුවන් කියන ඒ පවුල් සංකල්පය මත ඒ කියන්නේ ගර්භාෂය විනාශ කරන්න පුළුන්ද කියන ඒවා මේවා වල තියෙනවා. ඒ කියන්නේ තමන්ගේ පවුලේ ළමයි වැඩිනම් ඒවගේ කෙනෙක් කතා කරපු මාතෘකාවක මේ කොටසක් අරගෙන ඒක heading එකක් දාලා 1971 එතකොට ඒවගේ කාල වකවානුවේක පළකරපු මේකක්.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ අල්හසනාත් සහරාවේ තමයි ඒ පළ කිරීම සිදු කරලා තිබ්බේ?

පි: ඔව් ඒක ජමාතේ ඉස්ලාම් සංවිධානයේ සහරාවක්.

ප්‍ර: එතකොට මොන මාතෘකාවෙන් ඒ පළ කිරීම කරන්නේ?

පි: මරාගෙන මැරීම කියන මාතෘකාව යටතේ.

ස්වාමීනි එම අල්හසනාත් සහරාවේ එම ප්‍රකාශනය IAKR -24 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටී.

ප්‍ර: ඒවගේම ඔබ කිව්වා වෛකරාවී කියන සහරාවෙත් යම් සටහනක් තියෙනවා කියලා මේ ස්වයං ඝාතනය පිළිබඳව?

පි: ඔව්

ප්‍ර: මොකක්ද ඒ කියන්නේ මොන කාලේද ප්‍රකාශයට පත් කරපු එකක්ද?

පි: මේක 2008

ප්‍ර: කවුද වෛකරාවී සහරාව ප්‍රකාශයට පත් කරන්නේ?

පි: මීර් පාර්වි කියන ඒ හුවාන් මුස්ලිම් ජමාතුස් සලාම් කියන කට්ටියගේ ප්‍රකාශනයක්

ස්වාමීනි එම වෛක්‍රාවී සහරාවේ එම ප්‍රකාශනය IAKR -25 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්න අවසර අයදිනවා

පි: ඒවගේම ජමාතේ ඉස්ලාම් සංවිධානය තියෙනවා. Sri Lanka Islam Student movement කියලා ඒ කියන්නේ මාවනැල්ල බුදු පිළිම

ප්‍ර: මිල් පරායේ කියලා එකක් කිව්වානේ ඔබ?

පි: මීල් පාරුවේ කියන්නේ ඒ ඉහුවාන් මුස්ලිම් කට්ටියගේ මතය සමාජ ගත කරන පත්තරයක්. ඒක මාසිකව

ප්‍ර: එකේ මොකුත් පළවීමක් තියෙනවද මේ ස්වයං ඝාතක පිළිබඳව?

පි: ඒගොල්ලන්ගේ දැන් පසුගිය කාලයේ දී ඒගොල්ලන්ගේ ගොඩක් ප්‍රකාශයක් තමයි මම මීට කළින් අවස්ථාවේ දී මීර් පාරුවේ එකේ ප්‍රකාශයක් තමයි ඉදිරිපත් කළේ. එතකොට එකේ තිබ්බා ඇවිල්ලා ස්වයං ඝාතනය ගැන. එතකොට ඒක ඇවිල්ලා ඒගොල්ලන්ගේ ප්‍රකාශනයක්. ඒ කියන්නේ ඒගොල්ලන්ගේ ප්‍රකාශන අතර තියෙන ප්‍රකාශනයක්. එතකොට ඒගොල්ලන්ගේ පත්තර දිගට මම පරිශීලනය කරලා බැලුවේ නැහැ මොකද පත්තර එක හෝ ජාතික පුස්තකාලයෙන් ලබාගන්න තිබ්බොත් ඒ පරිශීලනය තුලදී හොයා ගන්න පුළුවන් ඒගොල්ලන් ඒගොල්ලන් සම්බන්ධව කතා කරලා ඇති කියලා. මොකද ඒගොල්ලන් හමාස් සංවිධානය පලස්තීන නිදහස් සටන වෙනුවෙන් වැඩි වශයෙන් කතා කරනවා. මේ පොත් පත් තියෙනවා. කතා කරලා තියෙන

ප්‍ර: දැන් ඔබ ඒ සඳහන් කරපු පුවත් පත් ඒ ප්‍රකාශන ලංකාවේ පළවෙන ඒවානේ?

FAIR COMMENT
BY JEZEEM

පි: ලංකාවේ නැපැල් දෙපාර්තමේන්තුවේ තමයි සාමාන්‍යයෙන් පුවත්පත් හෝ සඟරා ලියාපදිංචි වෙන්නේ. ඒ වගේ ලියාපදිංචි වෙලා පළ වෙච්ච සඟරා.

ප්‍ර: දැන් මේ ඔබ සඳහන් කරපු සඟරා 3 ම අල්ඛසනාත් ඒ ගමන්ම මීල් පාරවි, වෛක්‍රාවී කියන 3නම ඒ ආකාරයට ලියා පදිංචි වුණ ඒවාද?

පි: ලියාපදංචි වුණ ඒවා.

ප්‍ර: ඉතින් එතකොට ඒවා නියාමනය කිරීමක් සිදු වෙන්නේ නැද්ද?

පි: නියාමනයක් සිදු වෙන්නේ නැති එක තමයි දැන් ඒකනේ

ප්‍ර: ස්වයං ඝාතකය ඔබ කියන ආකාරයට ඒ සම්බන්ධයෙන් අනුග්‍රහයක් දක්වලා ඒ වෙනුවෙන් කතා කිරීමක් මේ පළවෙන ලිපි වලින් සිදු වෙනවානම් ඒකෙන් ජනතාව නොමඟ යැවීමක්නේ සිද්ධ වෙන්නේ?

පි: මං හිතන්නේ ලංකාවේ තියෙන කිසිම පත්තරයක් නියාමනයක් සිදු වෙන්නේ නැහැ කියලා තමයි මම හිතන්නේ. ඒ කියන්නේ දැන් මේකත් මං හිතන්නේ මේකට මුවා වෙලා තමයි ඒක නියාමනය වෙන්නේ නැහැ කියන එක දන්නැති නිසා තමයි ඒගොල්ලන්ට මං හිතන්නේ පිටපතක් තමයි දෙන්න ඕනි කොහෙදො ඒ පිටපතක් දුන්නොත් ඇති.

ප්‍ර: හැබැයි ඉතින් ඒ අය කියන්න ඕනිනේ ඒකේ තියෙන අන්තර්ගතය?

පි: ඒක කියවන්නේ නැහැ. මං හිතන්නේ ඒක භාෂා පරිවර්තක ඉන්නවද ඒයට jobs කියලා තියෙනව ද දන්නේ නැහැ. එහෙම ඒගොල්ලන්ගේ රාජකාරිය වෙලා තියෙන්නේ මං හිතන විදිහට පිටපත් භාර ගැනීම තමයි මං හිතන්නේ.

ප්‍ර: ඒකේ අන්තර්ගතය කියවලා ඒකේ තියෙන ගුණ අගුණ ගැන කියන්න එහෙම නියාමනයක් නැහැ?

පි: ඔව් දැන් ලංකාවේ ව්‍යවස්ථාවේ තියෙනවානම් රජයට විරුද්ධව කටයුතු කරන එක වැරදියි කියලා දිවුරුම් දෙනවානේ. ඒ දිවුරුම් දීම තුළින්ම රාජ්‍ය සේවකයාට දිවුරුම් දෙන්නෙත් එහෙමනේ job එක ගන්න. එතකොට ඒ දිවුරුම්දීමම උල්ලඝංණය කරලා තමයි ඒ ගොල්ලන් job දිගටම කරගෙන යන්නේ. එතකොට දැන් ඒගොල්ලන්ගේ රාජකාරිය ඇවිල්ලා පිටපත් භාර ගැනීම නම් එතකොට ඒ රාජකාරිය තුළ තියෙන පිටපත් භාරගත්තු ප්‍රකාශ වල තියෙනවානම් ලංකාවේ රජයට විරුද්ධව හෝ මරාගෙන මැරෙන යම්කිසි අනතුරක් තියෙනවානම් ඒක සොයා බැලීමත් ඒගොල්ලන්ගේ වගකීමක්.

ප්‍ර: එතකොට ඔබට පුළුවන්ද මේ ගරු කොමිසන් සභාවට කියන්න ශ්‍රී ලංකා ජාමතෙයි ඉස්ලාම් සහ ඉහ්වාන් මුස්ලිම් සංවිධාන වලින් කැඩිලා ආපු දැඩි මතදාරී සංවිධාන මොනවද කියලා ලංකාවේ තියෙන?

පි: ජමාතු මුස්ලිම් ඉස්ලාහියා කියන අරාබි විදුහලේ මුල් කාලීන විදුහල්පති. ඒ විදුහල්පති ඇවිල්ලා ජමාතේ ඉස්ලාම් එක ඇවිල්ලා දැන් අර ඉමාන් හසුන් බන්නා 1928 පටන් අරගෙන ඒකේ මේ පළ දරන් ඇවිල්ලා අරාබි

FAIR COMMENT BY JEZEEM

වසන්තයත් එක්කම ඒක හරියට වෙන්නෙත් නැහැ. එතකොට එයාගේ කාලෙදීත් මේක slow වෙනවානේ. එයාට ඕනි වෙලා තිබ්බේ speed වෙන්න. කවුද එකේ හිටපු නදීර් මවුලවිට. එතකොට ඒ නිසා තමයි එයා ඒ වගේ සංවිධානයක් පටන් අරගෙන ඡායාරූප ගැනීම පවා විරුද්ධයි කියලා තමා එයාගේ මතය තිබ්බේ. එතකොට එයාම හෙළිදරව්වක් නෙත් එෆ්.එම්. බැලුම්ගලේ දී කරනවා ජමාතේ ඉස්ලාම් සංවිධානය පිළිබඳව. ඒ කියන්නේ ඇෆ්ගනිස්ථානයට ජිහාඩිස් අරන් ගිය විදිහ. ඒකේ අගාර් මොහොමඩ් ගැනත් එයා වක්‍රාකාරව සඳහන් කරනවා. අග්‍රාර් මොහොමඩ් කියන්නේ පෙළ පොත් හදපු එක්කෙනා. එතකොට ඒගොල්ලන්ගේ තරුණ කාලේ ඒගොල්ලන් ඇෆ්ගනිස්ථාන් කොමිනිසම් වාදයට විරුද්ධව වැඩ කරපු කට්ටිය. එතකොට කොමිනිසම්වාදයට විරුද්ධව ලියපු පොත්පත් තියෙනවා මෙතන. එතකොට ඒගොල්ලන්ගේ තමයි මේ ප්‍රකාශය. ඉහුවාන් මුස්ලිම් ජමාත් ඉස්ලාම්. එතකොට ඒක තමයි ජාමතෙයි මුස්ලිම් කියන සංවිධානය කැඩිලා ඒගොල්ලන් speed වෙන්න ගියා. Speed වෙන්න ඉතින් එයාට Ideology වශයෙන් තමයි එයාට Speed වෙන්න පුළුවන්. එතනින් එහාට එයාට ශ්‍රම බලකායක් නැහැනේ ඕකට දායක වෙන්න. ඕකට මිනිස්සු ඉන්න එපැයි. ඒවා ඉතින් ක්‍රියාත්මක වුණේ නැහැ එයාගේ තරුණ කාලේ

ප්‍ර: ඒ කියන්නේ ප්‍රමාණවත් සංඛ්‍යාවක් නැහැ කියලයි කියන්නේ ඒ සම්බන්ධයෙන් සහාය දෙන?

පි: එයාට නැහැනේ එහෙම දෙයක් කරන්න බැහැනේ සාමාන්‍යයෙන්. Practical නැහැනේ. ප්‍රායෝගික නැහැනේ.

ප්‍ර: එතකොට දැන් ඒ වගේම අල් මුස්ලිමාත් සංවිධානය ශ්‍රී ලංකාවේ ජමාතේ ඉස්ලාම් සංවිධානය ඉහ්වාන් මුස්ලිම්වරුන්ගෙන් හරි කැඩිලා ආපු එකක්ද?

පි: ඒ මතය පිළිගත්ත සංවිධානයක්. ඉහ්වාන් මුස්ලිම් ඒ නිසා තමයි අර වාමි එකේ ඉන්න වර්තමාන නජීමාන් පවා ඒගොල්ලන් වෙනුවෙන් කතා කරන්නේ. ඒ නිසා තමයි මේයාට තර්ජනය එන්නේ. කවුද රිස්මින් ඉස්මත්. රිස්මින් ඉස්මත් කියන්නේ හිටපු ජමාත් ඉස්ලාම් සාමාජිකයෙක්. එයා අනාගාමික වෙන්න හේතුවක් තියෙනවා නම් එයා ඉගෙන ගත්තු මතය එයාට රිස්වුයේ නැහැ. එතකොට එවැනි මතයක් නිසා තමයි එයා අනාගමික වුණේ. ඉස්ලාම් නිසා නෙවේ අනාගමික වුණේ. එයා දීපු වැරදි මතය හින්දා. අන්න ඒවගේ කට්ටියටත් තර්ජනය කරන මට්ටමේ අන්තවාදී ඒ කියන්නේ ජාතික ගීයට විරුද්ධව නැගිටින්න එපා කියන මතයේ හිටපු එක්කනා තමයි Dr. මරිනා රිෆායි. ඒ සම්බන්ධයෙන් අසාද් සාලී පවා හෙළි කරලා තිබ්බා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඔය මරීනා රිෆායි දෙනවා නේද ගුවන් විදුලි සංස්ථාවේ යම් කාලයක් වෙන් දෙනවා නේද ?

පි: මදන්වතුන් නිසා කියලා වැඩසටහනක් දෙනවා. එතකොට මාදර් මදිලීස් කියලා පාරම්පාරික මිනිස්සු කරපු, පාරම්පාරික කලාකරුවන් කරපු, ජනමාධ්‍යවේදීන් කරපු වැඩසටහනක් තියෙනවා. ඒකට attract එකට තමයි මදන්වතුන් නිසා කියන වචනය වැඩ සටහන Dr. මදීනා රිෆායි කරන්නේ.

ප්‍ර: ඇය එමඟින් කරන්නේ ශ්‍රී ලංකාවේ ඉන්න මුස්ලිම් කාන්තාවන් ඇමතීමක් කරනවද?

පි: motivation එකෙන් අමතනවා. එක්කෝ එයාගේ ඒ සාකච්ඡාවට ආරාධිත දේශකයෙක් එනවා. නැත්නම් කවුරුහරි ඇවිල්ලා දෙන්නාම පිළිසඳරක යෙදනවා.

ප්‍ර: හැබැයි ඉතින් එමඟින් ප්‍රකාශ වෙන අදහස් ජනතාවට හිතකර දේවල් ද එහෙම නැත්නම් ඔවුන් නොමඟ යන අදහස් ද?

පි: හිතකර දේවල් motivation ධනාත්මක චින්තන දේවල් කතා කරනකොට ඒගෝල්ලන්ට recognize එකක් මේකෙන් ලැබෙන කොට ඒගොල්ලන්ගේ ඉඩ ප්‍රස්තාව තුල දී ඒගොල්ලන්ගේ අන්තවාදය ජාතික ගීය නැඟිටින්න එපා මතය තමයි ඒගොල්ලන් පළ දරන්නේ. ඒකට ඒගොල්ලන් පාවිච්චි කරනවා ගුවන් විදුලි සංස්ථාවේ recognize එක.

ප්‍ර: එතකොට ඔබ අවස්ථා කිහිපයක දී කිව්වා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ air time එක පාවිච්චි කරනවායි කියලා විවිධ අදහස් ප්‍රකාශ කිරීම සඳහා. ඒක ඉස්ලාම් ආගමේ සැබෑ තත්වය නොවෙයි. නමුත් වහාබ්වාදය වැපිරීම සඳහා. එතකොට එහෙනම් දැන් මේ රජයේ ආයතනයක්නේ. ඔබ මුස්ලිම් ජන කොට්ඨාශයට අයත් ඉස්ලාම් ආගම අදහන තැනැත්තෙක් විදිහට ඔබට කියන්නට පුළුවන් ද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මුස්ලිම් අංශයේ ඒ වැඩකටයුතු නියාමනය වීමක් සිදුවෙනවද නැද්ද කියලා ?

පි: ඒක සිදු වෙන්නේ නැහැ.

ප්‍ර: එහෙම නම් මම කැමැතියි මේ කුරානයත් ඔබේ අවධානයට යොමු කරලා මේ කුරානය කවුරු විසින් පිළියෙළ කරන ලද එකක් ද?

පි: මේක සෞදි අරාබියාවේ ප්‍රකාශයක්. මේක දාලා තියෙනවා

ප්‍ර: එතකොට මේක තියෙන්නේ මොන භාෂාවෙන්ද?

පි: පරිවර්තනය තියෙන්නේ ඉංග්‍රිසි භාෂාවෙන්.

ස්වාමිනි එම සෞදි අරාබියාවෙන් ඒ කුරානය ඉංග්‍රිසි පරිවර්තනය සමඟ තියෙන්නේ ස්වාමීනි එය C-865 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: රහුමාන් මහත්මයා අවසාන වශයෙන් මා කැමැතියි දැන ගන්නට ඔබ විසින් මේ දවස් 2 තුල දී මේ ගරු කොමිසන් සභාව වෙත ඉදිරිපත් කරන ලද මුස්ලිම් ජන කොටඨාශයේ පවතින මේ භේදයන් නිසා ආගම පදනම් කරගෙන ඇතිවෙන මේ භේදයන් නිසා එයින් පීඩාවට පත්වෙන මුස්ලිම් ජන කොටඨාශය වෙනුවෙන් මොනවගේ රෙකමදාරුද ඔබට කරන්නට පුළුවන් මේ ගරු කොමිසන් සභාවට ඔවුන්ගේ සලකා බැලීම සඳහා මේ ප්‍රශ්නය විසඳන්න.

පි: ඒ කියන්නේ ඇවිල්ලා මේ මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ඉඳලා මුල ඉඳලා මේක ක්‍රියාත්මක කරන්න ඕනි කියලා එක තමා මගේ අදහස. මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුව ඇවිල්ලා ඒ කියන්නේ ඒගොල්ලෝ තමයි මෙතන තියෙන ලොකුම වැරැද්ද කරේ. උලමා නීතියානුකූල වැරැද්ද කළේ ඒගොල්ලෝ තමා.

ප්‍ර: ඇයි ඔබ එහෙම කියන්නේ?

පි: එහෙම කියන්න හේතුව ඇවිල්ලා ඉස්ලාමීය ආගමේ තියෙන ෂරියා මූලධර්ම. ඒගොල්ලන් කියනවානේ ෂරියා ෂරියා කියලා . ෂරියා බැංකු ඕනි හලාල් ඕනි එහෙම කියනවානේ. එතකොට ඒ මූල ධර්මය කඩලා පල්ලි හදන්න දුන්නා. ඒ මූලධර්මය කඩලා මද්‍රසා පාසල් හදන්න දුන්නා. ඒ වගේම ඒගොල්ලන් නියාමනය කළේ නැහැ මක්තොප් මද්‍රසා ආවා. ඒ මක්තොප් මද්‍රාසා සම්බන්ධයෙන් වීඩියෝ පටයක් තියෙනවා. පාරම්පරික එක්කෙනෙක් කියලා තියෙනවා. එතකොට C.W.W. කන්ගර මහතා මේ අපේ රටට නිදහස් අධ්‍යාපනය දායද කළා. එතකොට ඒ වගේම මුස්ලිම් පාරම්පාරික උලමාවරු අපි පාසල් ඇරලා ගෙදර කෑමත් කලා අරාබි භාෂාව ඉගෙන ගන්න යනවා. ඒ කියන්නේ කුරාණය මටත් කියන්න පුළුවන්. හැබැයි මම කුරානයේ අර්ථය දන්නේ නැහැ. මට ඒක පරිවර්තනය දන්නේ නැහැ. මට අරාබි කියවන්න පුළුවන්. එතකොට ඒකට අපේ පාරම්පරික උලමාවරු මේ ලියලා තිබුණු තාලිමුලන් කුරාන් තියෙනවා මෙතන. එතකොට පාරම්පරික practice තිබ්බා. ඒ කියන්නේ ඒ ඇවිල්ලා කොහොමද සලාතේ යෙදන්න ඕනි . කොහොමද නබිතුමාට ගරු කරන්න ඕනි. එතකොට ඒ ඔක්කෝම කඩලා බිඳලා අලුත් මතයක් ගෙනවා මක්තබ් කියලා. එතකොට ඒකට මාසික ගාස්තුවක් ගන්නවා උලමා සභාවෙන්. ඒ ගොල්ලන් එකේන් ඒ ගොල්ලන්ගේ උලමා කට්ටියට job දෙන්න. Job Bank එකක් කර ගත්තා ඒ syllbes එක අයින් කරලා ඒ පැරණි syllbes එක අයින් කරලා ඒගොල්ලන්ගේ control එකට ගත්තා මක්තබ් එක. එතකොට ඒක සමාජයේ සාමාන්‍ය මට්ටකම තිබ්බ control එක ආයතනයකට ගත්තා. එතකොට ඒවා කරනකොට ඔක්කෝම ලංකාවේ නීතියානුකූල නීතිමය බලය තියෙන ආයතනයක් වශයෙන් මේගොල්ලන් ඇස් වහගෙන හිටියා. එතකොට ඒ වාගේම

FAIR COMMENT
BY JEZEEM

ඇවිල්ලා උලමා සභාව හලාල් සහතික දෙනකොට ඇස්කන් පියාගෙන හිටියා. එතකොට ඒවා හලාල් නෙවෙයි. හලාල් කියන්නේ ඇවිල්ලා ප්‍රාග්ධනයත් හලාල් වෙන්න ඕනි. මං කියන්නේ දැන් මේගොල්ලන් කියන හලාල් එකට. ඉස්ලාම් ආගමේ පොළියට ඩෙල්ටා ටොෆිය ගහන මේ උපාලි ජයවර්ධන මහත්මයාගේ companyයේ එයා පොළී business එකත් එක්ක ගනුදෙනු කරනවා. එතකොට එයාගේ ප්‍රාග්ධනය පොළිය තියෙනවා. පොළියේ තියෙන ප්‍රාග්ධනයෙන් තමයි ඩෙල්ටා ටොෆිය හදන්නේ. පොළිය කියන දේ ඉස්ලාම් දහමේ හරාම්. ඒ කියන්නේ අනුමත නැහැ. එතකොට මේගොල්ලන් බොරුවටනේ මුස්ලිම් ජනතාව මුලා කරන්නේ ඩෙල්ටා ටොෆියකට හලාල් දෙන්න ගියේ. අනවශ්‍ය ප්‍රශ්නයක්නේ මෙතන උද්ගත කරේ. එතකොට අපි එහෙම බලලා නෙවෙයිනේ ඩෙල්ටා ටොෆිය කෑවේ. අපි ඒක කෑවේ රහ බලලා. ඒකේ ඌරුමස් දේවල් අඩංගු නැහැ කියලා. අපි දන්නවා ඒකේ මත්පැන් අඩංගු නැහැ කියලා. ඒ වගේම අනවශ්‍ය ශරීරයට හිතකර නැති දේවල් අඩංගු නැහැ කියන එක දන්නවා. අපිට ඌරුමස් කන්න දේවල් අනවශ්‍ය නම් එහෙනම් ඒගොල්ලන්ට තිබ්බා ඇවිල්ලා යම්කිසි ඒ ආයතනයත් එක්ක කතා කරලා ඕගොල්ලන් පොඩි ඔයගොල්ලන්ගේ Ingredients දාන්න. මේකේ ඌරුමස් subject එක නැහැ. එහෙම නැත්නම් ඇල්කොහොල් නැහැ. එතකොට මේවා තුළින් තමයි මේ රටේ සංහිඳියාවට බාධාවක් වුණේ. එතකොට ඒක මං ගත්තේ ප්‍රාග්ධනය වගේ. ඒවගේම තමයි කුකුළු මස් ව්‍යාපාර. දැන් ඒක බහු ජාතික සමාගම් වලට දැන් සාමාන්‍යයෙන් ගමේ තියෙනවා මේ කුකුළු මස් business කරන සාමාන්‍ය ව්‍යාපාරිකයා ඉන්නවා. එතකොට එයා ඇවිල්ලා ආගම කියලා සතාට රිදෙන්න කොහොමත් ඒක හිංසනයක් තමයි. නමුත් ඒ හිංසාවත් වතුර දීලා තමයි කරන්නේ. එතකොට එහෙම කරපු කුකුළු මස් ව්‍යාපාර ටික එහෙම කරපු ආගම කියලා කරපු දේවල් ටික බහුජාතික සමාගම් වලට මේගොල්ලන්ගේ මුදල් වලට තියෙන ගිජු කමට මේගොල්ලන් මොනවද දන්නවද කළේ ඒගොල්ලන්ටත් සහතික දෙන්න පටන් ගත්තා.

ප්‍ර: එතනදී උලමා සභාව නේද?

පි: උලමා සභාව. මං කියන්නේ මේ උලමා සභාව සහතික දෙන ඔක්කෝම බලාගෙන හිටියානේ මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුව කියන නිශේධ බලය තියෙන ආයතනය. ඒගොල්ලන්ට නීතියානුකූල බලයක් තියෙනවානේ මුස්ලිම් ආගම නමින් කරන ඕනෑම දේකට. කවුරුහරි අනවශ්‍ය ලෙස ඒක කරනවානම් ඒක බලාගෙන ඉන්න එක නෙවෙයිනේ. ඒකට ඒගොල්ලන්ට මැදිහත් වෙන්න පුළුවන්නේ. මැදිහත්කරු වශයෙන්. ඒගොල්ලන් ඒක කරේ නැහැ. එතකොට ඒගොල්ලන්ට වක්‍රාකාරව මේගොල්ලන් එක්ක සම්බන්ධකම් තිබ්බද

FAIR COMMENT BY JEZEEM

කියලා අපි දන්නේ නැහැ. ඒ වගේ තමයි ඉස්ලාමීය ෂරීයා බැංකු ක්‍රමය. ඉස්ලාමීයා ෂරීයා බැංකු ක්‍රමය අපි කොපි කඩේ නාට්‍යයෙත් බලලා තියෙනවා. පොළී මුදලාලි කෙනෙක් ඉන්නවා. එතකොට ඒකාලේ පොළී මුදලාලිත් එක්ක අපේ ඉස්සර කියන්නේ ලෙබ්බේ කියලානේ කියන්නේ. ලෙබ්බේ ඇවිල්ලා පොළී මුදලාලිත් එක්ක set වෙලා කෝපි කඩේ මුදාලි ඇවිල්ලා පොළී මුදලාලි මොනවද කරන්නේ ගෙදර පොළියට සල්ලි දෙනවානේ. එතකොට ලෙබ්බේ මොකද කරන්නේ මෙයා පොළී මුදලාලි එක්ක set වෙලා එයා කියනවා අපි මුස්ලිම් කට්ටියවත් මේකට නැඹුරු කර ගමු. මම හලාල් කියලා ඔයාගේ සල්ලිම දෙන්නම් කියලා කරපු වැඩක් තමයි මේ ඉස්ලාමීය බැංකු ක්‍රමයෙත් කියන්නේ. බැංකුවල තියෙන සල්ලි පොළීමත පදනම් වෙච්ච ආර්ථිකයක්නේ තියෙන්නේ. එතකොට ඒක කොහොමද ඉස්ලාම් වෙන්නේ. ඉස්ලාම් දහම පොළියට විරුද්ධයිනේ. එතකොට ඒගොල්ලන් ඇවිල්ලා saving account තියෙනවානම් ඒ තිබ්බිවි විදිහට තියාගෙන ගියදෙන්නේ. එතකොට පොළිය කියන දේ නබිතුමා දේව වාක්‍ය වල සඳහන් කරලා තියෙනවා අවසාන කාලයේ පෙර නිමිති තමයි පොළිය කියලා අරාබි නම් වලින් මේ හලාල් කියලා ඔයගොල්ලන්ට බැංකු ක්‍රමවල් වලින් එයි කියලා. දැන් ඒ ක්‍රම තමයි මේවා. මේවා නිසා තමයි අනවශ්‍යය ප්‍රශ්න අපිට ඇතිවෙලා තියෙන්නේ. එතකොට මේවා අනවශ්‍යයි. තියෙන බැංකුම ඇති. දැන් අමානා කියන බැංකුව මුස්ලිම් පුද්ගලයෙක් පටන් අරගෙන එයා කරන එක හරි. ඒක හරි කියමුකෝ. සම්පත් බැංකුවට ගිහිල්ලා හරි HNB එකට ගිහිල්ලා හරි මේ Unit අරින එක. එතකොට ඒගොල්ලන් ඇවිල්ලා එක සිටින් එකකට ලක්ෂ ගණන් උපයනවා. එතකොට මෙහෙන් මුස්ලිම් ජනතාව ඇවිල්ලා තැම්බෙනවා. මේගොල්ලන් උපයනවා. ඒගොල්ලන් තැම්බෙනවා. එතකොට දැන් ඒකෙන් මුස්ලිම් ජනතාවට කිසිම සෙතක් වෙන්නේ නැහැ. අන්තිම වෙන්නේ ඇවිල්ලා ස්ලෝගොන් ඇතිවෙන එක. ඒ කියන්නේ ජිහාඩිස් කට්ටියට මේකත් එක්ක බෞද්ධ සිංහල ජනතාවත් එක්ක මුස්ලිම් ජනතාව ගැටෙන කොට ඒගොල්ලන්ට ඇවිල්ලා වෙන්නේ මොකක්ද අපිට මේක කරන්න දෙන්නේ නැහැ. මේයා අපිට හලාල් දෙන්න දෙන්නේ නැහැ. ඉස්ලාම් බැංකු වහන්න යනවා. ඒ හින්දා අපි සටහන් කරපු. ඒ හින්දා අපි ජිහාඩ් is moment වලට ස්ලෝගන් අරන් දෙනවා. අධ්‍යාපන ක්‍රමය තුලට රිංගලා තියෙනවා.

දැන් වේලාව: ප.ව.1.30
මෙතැන් සිට ල/ලේ: වන්දිමා මෙනවිය.

FAIR COMMENT
BY JEZEEM

වේලාව:ප.ව: 1.30
පෙර සටහන් : ල/ලේ නිල්මිණි
මෙතැන් සටි: ල/ලේ චන්දිමා දිල්හානි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඔබ ක්‍රමය කියන්නේ මේ හලාල් අවශ්‍ය වෙන්නේ නැහැ මේ හැම අහාරයක් සම්බන්ධයෙන්ම?

පි: ඔව් ඒක ඇත්තටම හලාල් නෙමේනේ ඒක

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියන්නේ සීමා කරන්නට ඕනේ .

පි: ඒ කියන්නේ ingredients වල තිබ්බා නම් ඇති.

ප්‍ර : හරි ඊලඟට තමා අධ්‍යාපනය ක්‍රමය අධ්‍යාපන ක්‍රමය තුල ඇවිල්ලා තියෙනවා දහම්පාසල් අධ්‍යාපන ක්‍රමය මම කිව්වේ අර තාලිමුල්කුරාන් අධ්‍යාපනය ක්‍රමය ඒ වගේ අධ්‍යාපන ක්‍රම තියෙනවා විවිධ කොට්ඨාශවලට එතකොට මේ ඔක්කෝම පැරණි ශිස්ටම් එක කොහොම ද තිබ්බේ සංශෝධනය නොකරපු විදියටද තිබ්බේ ඒ තැනට යන්න ඕනේ සංශෝධනය කරන්න පැරණි සිස්ටම් වලත් යම් කිසි එකෙත් වැරදි තියෙනවා නම් ඒවත් හදන්න ඕනේ .

ප්‍ර: ඒ කියන්නේ පාරම්පාරික අධ්‍යාපනය අපි අනුගමනය කිරීම සුදුසුයි ඒවායේ යම් අඩුපාඩු තියෙනවා නම් ඒවා සම්පූර්ණ කරන්න ඕනේ.?

පි: සම්පූර්ණකරන්න ඕනේ

ප්‍ර: ඒකයි ඔබ කියන්නේ?

ප්‍ර: ඊළඟ කරුණ?

පි: ඒ වගේම ජනමාධ්‍ය ආයතනවල සිද්ධ වෙනවානේ එක එක දැන් පෞද්ගලික ආයතනවලත් ඒක දැනුවත් හෝ නොදැනුවත්ව හෝ සිද්ධ වෙනවා ස්වර්ණ වාහිනි හෝ සිරස,සිරසේ සිද්ධ වෙන්නේ.

ප්‍ර: මොකක්ද සිද්ධ වෙන්නේ?

පි: ඒ කියන්නේ නෝම්බිකාලවල් වලට පූජකයෝ ගෙන්නලා විවිධ වැඩසටහන් කරනවා . මුස්ලිම් පෙක්ෂකයන්ව ඒ ගොල්ලන් තුල තියා ගන්නවනවා ඉතින් ඒකට දැන් සිරස නාලිකාවේ අසාද් සාලි මහරාජා ඒ වගේ සම්බන්ධයක් තියෙන නිසා ඒකේ යන්නේ පාරම්පරික සටහන් UTV වගේ ඒ වගේම වෙනත් නාලිකා දැන් සියත වගේ නාලිකාවලට ගිහිල්ලා මේ නලිම්වරු මේ අනිත් කට්ටිය ගිහිල්ලා ආක්‍රමණය කරනවා. ආක්‍රමණය කරලා ඒ ගොල්ලන්ගේ මතය ප්‍රචලිත කරනවා එතකොට මේවා නියාමනයක් වෙන්න ඕනේ මේවා කියන්න ඕනේ මේ මතය තමයි මේ අන්තවාදී වහබ්වාදී, ඉස්ලාම්දහම, උගවනවන්න ඔය ගොල්ලන්ගේ මතවාදය උගන්වන්න එපා.

Parliament Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ ඔබ එයින් අදහස් කරන්නේ ජනමාධ්‍ය පාවිච්චි කරනකොට එසේ පාවිච්චි කිරීමේදී ඒ සම්බන්ධයෙන් හොඳ නියාමනයක් තියෙන්න ඕනේ?

පි: ජනතාවේ සංකේතනේ මේවා මොකද ජනතාවට අයිතියක් තියෙනවා ඒ වෙනුවෙන් පෙනී සිටින්න ඒ වෙනුවෙන් පෙනී සිටිනවා අඩුයි. රජය පෙනීසිටින්නේ නැහැ, රජය නියාමනයක් කරන්නේ නැහැ ඒ නිසා රාජ්‍ය ගුවන් විදුලි තුලම ඒ ගොල්ලන්ගේ වැඩසටහන් පටන් අරගෙනම තමයි තියෙන්නේ ඒ වගේම තමයි විශ්වවිද්‍යාලවල තියෙන කථිකාචාර්යවරු කවුද ඇවිල්ලා දේශනා කරන්නේ ඒ වගේම පාසැල්වල ගුරුවරු කවුද ඇවිල්ලා දේශනා කරන්නේ. එතකොට ඒවා ගැන සොයා බැලීමක් නැහැ මේ වගේ පොත්පත් මරාගෙන මැරෙන

ප්‍ර: ඔබ කියන්නේ අධ්‍යාපන ආයතනය සම්බන්ධයෙන් ඒවායේ උගන්වන දේවල් ඒවාට උගැන්වීම සඳහා භාවිතා කරන පොත් පත් සම්බන්ධයෙනුත් විධිමත් ආකාරයේ නියාමනයක් තියෙන්නට ඕනේ?

පි: සමස්ථයක් වශයෙන් මම අර කථා කරපු මේ කොමිෂන් සභාවට භාර දුන්නු ලියවිල්ලෙත් තියෙනවා මාතෘකා යටතේ කතා කරපු ඒවා ඒ යටතේ කරපු දේවල් ටික නියාමනයක් කරන්න ඕනේ පල්ලීවල වැඩ සටහන් පල්ලි ඇවිල්ලා ගිමන් හල් නෙමේ එතකොට ඒ ගිමන් හල් වශයෙන් දැන් හදිසි අවස්ථාවකදී පාසැල් ළමුන්ට නැවතතෙන්න ඔය පන්සල්වල වගේ තියෙන සිස්ටම් එකට යනවා නම් ප්‍රශ්නයක් නැහැ ඒ වුනාට මේ ගොල්ලන් ඇවිල්ලා මේ ගොල්ලන්ගේ තබ්ලික් මතවාද ප්‍රචලිත කරන්න පල්ලිවල ලැගුම් ගන්නවා නවතිනවා දවස් 3ක් , දවස් 40 ක් එහෙම ලැහුම් ගන්නවා ඒ වගේ සඳහා පල්ලි පාවිච්චි කරන්න බැහැ.

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියන්නේ පල්ලි වගේ දේවල් පාවිච්චි කරන්න ඕනෑ යොදා ගන්නට ඕනේ මොනවගේ දේවල් සම්බන්ධයෙන් ද කියලා ?

පි: අපේ නැමදුම් සඳහා , විවාහ සඳහා , ඒ වගේම සිකුරාදා විශේෂ දේශනා ඒ වගේ වල් තියෙනවා ඒවා සඳහා විතරයි පල්ලි භාවිතා කරන්න ඕනේ පල්ලි භාවිතා කරන්න නැතිව ඊට පරිභාහිරව භාවිතා කරන්න පුළුවන් විදියට වකුග් කරලා තියෙනවා සමහර පල්ලි එ කියන්නේ මේ අධ්‍යාත්මික දේවල් සඳහා.

ප්‍ර: ඔබ පසුගිය අවස්ථාවේදීත් කිව්වානේ අර සියෝන් දේවස්ථානයේ පිපිරිම සඳහා ආපු ප්‍රහාරකයා පල්ලියේ නවාතැන් ගෙන තමයි ආවේ.ඒ නිසා ඔබ කියන්නේ ඒවායේ නවතින අය සම්බන්ධයෙනුත් යම් අකාරයක විදිමත් ක්‍රියා මාර්ගයක් තියෙන්නට ඕනේ කියලා? ඊ ළඟ කරුණ?

පි: ඒ වගේම තමා සිකුරාදා දේශනා තියෙන පල්ලිවලිනුත් යම් කිසි අන්තවාදී උගන්නවානේ දැන් අබ්දුල් රාසික් ඇවිල්ලා පූජකයෙක් නෙමේ. එතකොට මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමෙන්තුව පූජකයෙක්

FAIR COMMENT — BY JEZEEM —

නොවන එක්කෙනෙක් එක්ක ඇවිල්ලා මේ වගේ තැනක වාඩිවෙලා සමාජයට ආමන්ත්‍රණය කරන ගමන් බලන් ඉන්නේ කොහොමද ඒ ගොල්ලන් කොහොමද සිකුරාදා දේශනා පවත්වන තැනක් බවට පරිවර්තනය කරන්න ලයිසන් දෙන්නේ.

ප්‍ර: ඒ කියන්නේ සිකුරාදා දේශනා පවත්වන්නේ කවුද කියලා අර පිටරටවල් වල කියන්නේ මොනවද කියන එක සිංගප්පූරුවේ වගේ ?

පි: චීනය

ප්‍ර: ඔව් මේ ගරු කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් වෙලා තියෙනවා දැන් විදේශවලදී සිකුරාදා මෙහෙය පවත්වන කොට කවුද කථා කරන්නේ මොනවද ඔවුන් කියන්නේ කියන එක ගැන කලින් දැනුවත් කිරීමක් කරනවා දැන් ඔබ කියන්නේ ලංකාවේත් ඒ වගේ යම් දැනුවත් කිරීමක් යම් පාලනය කිරීමක් සිදුවෙන්නට ඕනේ?

පි: චීනෙත් මම ගිහිල්ලා තියෙනවා චීනයේත් ඒ වගේ දේවල් තියෙනවා. චීනේ තියෙනවා පුරාවස්තුවක් පුරාවස්තුවක් කියන්නේ නබි තුමාගේ කාලේ නබිතුමාගේ මිත්‍රයෙක් චීනේට ගිහිල්ලා ඉස්ලාම් දහම ව්‍යාප්ත කරලා තියෙනවා. චීනේ ඉස්ලාම් දහම තියෙනවා. එතකොට ලෝකේට යන්නේ චීනේ ඉස්ලාම් නැහැ කියලා. චීනේ තියෙනවා ලොකු පල්ලි එතකොට ඒකේ තියෙනවා ශාන්තුවරයෙක්ගේ නබිතුමාගේ මිත්‍රයාගේ අර සොහොන තියෙනවා අද වෙනතුරු ආරක්ෂාව සහිතව මොකද එහේ අන්තවාද මතවාදවලට ඉඩ දීලා නැහැ. ලංකාවේ ඉඩ දීලා තියෙනවා .

ප්‍ර: ඉතින් ඒ කියන්නේ නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට ජනතාවට තියෙන ඉඩත් යම් ප්‍රමිතීන්වලට යටත්ව ක්‍රියාත්මක වෙන්න ඕනේයි කියලා ඔබ කියන්නේ ?

පි: හැමදේම නිදහසයි ප්‍රජාතන්ත්‍රවාදයයි කියලා කොටු කරන කොට ඒ ගොල්ලන් ඇවිල්ලා නිදහසයි ඒ ප්‍රජාතන්ත්‍රවාදයයි මානව හිමිකම් කියන ඒ බෝඩ් ලෑල්ල තුල ඒ තමන්ගේ අන්තවාදය වපුරන්න බලනවා එතකොට ඒකෙන් අගතියක් වෙනවා ලංකවේ ජනතාවට

ප්‍ර: එයින් අයුතු ප්‍රයෝජන ගැනීමක් සිදුවෙනවා ඒ ඉඩප්‍රස්ථාව වලකන්න ඕනේයි කියලා ඔබ කියන්නේ?

පි: ඔව්. ඒ වගේම පල්ලි වශයෙන් ලියාපදිංචි වෙන්න ඕනේ සිකුරාදා දේව මෙහෙය තියෙන පල්ලි තියෙනවා. දැන් මරදාන ප්‍රතාපවත් පල්ලියක් තියෙද්දි උලමා සභාවේ රිසිව්මුස්තිගේ වක්‍ර අනු දැනුම මත ඊට යාබද කුඩා පල්ලික සිකුරාදා දේශනා මෙහෙය තියෙනවා. එතකොට ඒක අමු අමුවේ ඉස්ලාමිය ෂර්යා මූල ධර්මය පවා උල්ලංඝනය කිරීමක් එතකොට ඒයා උලමා සභාවේ පුටුවේ වාඩිවෙලා හිදගෙන ඉස්ලාම් දහමත් විකෘති කරනවා. මුස්ලිම් ජනතාවත් බෙදනවා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: එතකොට ඔබ කියන්නේ උලමා සභාව ව මීට වඩා අවදිමත්ව සිකුරාදා පල්ලි දේශන පවත්වන පල්ලි හදුනාගෙන් ඒවා ලියාපදිංචි කිරීම කල යුතුයි?

පි: ඒ කියන්නේ ලඟ ලඟ තියන්න බැහැ සිකුරාදා දේශන පල්ලි කොරෝනා වෛරසය හේතුවෙන් සමාජ සෝසල් Distance එකට හේතුව මුල් කරගෙන සමාන්‍ය පල්ලිවලට ඔක්කෝම දැන් සිකුරාදා දේශනා පවත්වන්න ඉඩදීලා තියෙනවා. දැන් මේ කොරෝනා වෛරසය නැතිවුනාට පස්සේ ඒ ඉඩ දුන්නු පල්ලිවල සිකුරාදා දේශනා නවත්වයි ද නැද්ද කියන එක අපි දන්නේ නැහැ. එකෙනුත් ප්‍රයෝජන ලැබුනේ අන්තවාදීන්ට.

ප්‍ර: එකයි මේ ඔබ කියන්නේ ඒ මං අහුරන්නට ඕනේ.ඊළඟ කරුණ ?

පි: ලංකාවේ අර කුරුවාන් ට්‍රාන්ලේෂන් තියෙනවානේ අර අතන සෞදි ආරාබියාවේ කුරාන් ට්‍රාන්ලේෂන් එක ඒ සෞදි ආරාබියාවේ වාමී එකේ කුරුවාන් සිංහල ට්‍රාන්ලේෂන් එකක් ගහනවා. ඒක මුල් පිටපත මගේ ළඟ තියෙන්නේ එතකොට විවිධ ට්‍රාන් ලේෂන් තියෙනවා හැබැයි ලංකාවේ හෙලෙයෙක් විසින් රචිත ඊජිප්තුවේ ගිහිල්ලා ඉගෙන ගත්තු එක්කෙනෙක් මොනවහරි වික්‍රමසිංහ කියලා එක්කෙනෙක් පරිවර්ථනය කරලා තියෙන කුරානයක් තියෙනවා MICH මුස්ලිම් යෝනක ඉස්ලාම් කල්චරල් හෝම් කියන එක මුවඉස්ලාමික් කල්චරල් හෝම් ඒක තියෙන්නේ බ්‍රිස්ටල් වීදිය කොටුව එතකොට ඒගොල්ලන් පරිවර්තනය කරපු කුරානයක් තියෙනවා සිංහල ඒක ටිකක් විචාර ශීලි වැඩියි එතකොට ඒක මුල් කරගෙන දැන් එයා පරිවර්ථය කරපු එක්කෙනෙක්නේ සිංහල එක්කෙනෙක් පරීවර්ථනය කරලා තියෙනවා එතකොටත් දැනිලා නැතිව ඇතිනේ බෙල්ල කපන දේවල් මේකේ තියෙනවාද අරවා තියෙනවාද නැද්ද කියන එක එතකොට මං හිතන්නේ එයා ඇවිල්ලා අල්අස් හාර් විශ්ව විද්‍යාලයේ සම්බන්ධ වෙච්ච නිසා එයා ඇවිල්ලා ඒ සම්බන්ධව යම් කිසි මතයක ඉඳලා තියෙනවා ඒ කියන්නේ යම් කිසි අර්ථ විවරනයක් කරන කොට ඒකේ උඩ අර්ථයයි මැද අර්ථයයි බහු අර්ථයයි බලන්නැතිව අදාල අර්ථය ගලවලා ගන්නවා cut and paste කරනවානේ එතකොට අර Edit ක්‍රමය දැන් මාධ්‍ය කරන්නේ දැන් එයා කියපු ඇත්ත අදහස වෙන්නෑ ඕකම තමයි මේ උගන්වන.

ප්‍ර: ඔකම තමයි අනිත් පර්තනවලත් සිද්දවෙලා තියෙන්නේ?

පි: උගන්වන කට්ටිය කරන්නෙත් ඕක තමයි. එතකොට ඒකට කියනවා තස්සීර් කියලා තස්සීර් කියලා විචාරශීලි විදියට ඒ අදහස බලන්න ඕනේ කියලා එතකොට මවුලානා මවුදූදි ඒ පොතක ලියලා තියෙනවා ඒක බලන්න ඕනේ නැහැ කියලා එතකොට ජමාතේ ඉස්ලාමේ ඉන්නේ ඒ

FAIR COMMENT
BY JEZEEM

මතේ එතකොට ඒ නිසා තමයි ජමාතේ ඉස්ලාමේ ශිෂ්‍ය සංවිධාන වල හිටපු මිනිස්සු බුදු පිළිම කැඩුවේ.

ප්‍ර: ඒ අරෙන්න ඔබට රෙකමදාරු කරන්න තව කරුණු තිබෙනවද?

පි: මට කියන්න තියෙන්නේ මේ පොත ලංකාවේ ආණ්ඩුවෙන් මුද්‍රණය කරලා හරි මේ කුඩා දරුවන්ට උගන්වන්න කියලා මම යෝජනා කරනවා?

ප්‍ර: ඒ මොකක්ද පොත?

පි: ඒ කියන්නේ මත්තබ් ක්‍රමය සහමුලින්ම නැති කරලා දාලා රිස්විමුත්ති පවා පූජක අධ්‍යාපානය ලබන ප්‍රගුන තත්ත්වයට පත්වුනේ මේ තාලි මුල්කුරාන් කියන මේ ප්‍රාථමික අධ්‍යාපානය අරගෙන ඒ වගේම මෙකේ තියෙනවා කොහොමද ආගම කරන්න ඕනේ පිළිවෙල මේකේ තියෙන දුප්පත් භාවයම තියෙනවා මෙකේ තියෙන මාකර්ටින් එක ඒ කියන්නෙ මේ සූෆි මුස්ලිම් වරුන් විසින් ප්‍රකාශ කරපු එකක් එතකොට මම මේක ඇවිල්ලා මේ අපේ වයිෆ්ගේ දානේට ළමයින්ට බෙදන්න මං මේ පොත තමයි ගත්තේ. එතකොට මේ පොත ඇවිල්ලා මම කියනවා මේක ඕ එන් ෆාසි කියලා මේ පුද්ගයෙක් තමයි මේක ලියලා තියෙන්නේ පෞරාණික උලමා කෙනෙක් සම්මන්තුරේ එතකොට මේ පොත ඇවිල්ලා ලංකාවේ ආණ්ඩුවේ මැදිහත් වීමකින් හරි මේ පොත ළමයින් උගන්වන් කියලා ඒ කියන්නේ මත්තබ් ක්‍රමය සහ මුලින්ම අහෝසි කරන්න ඕනේ මොකද ඒ තුලින් ඒ ගොල්ලන් බලන්නේ ඇවිල්ලා සමාජය තමන්ගේ කොන්ට්‍රෝල් එකට ගන්න

ප්‍ර: ඒ අනුව ඔබ කියන මේකේ පොත් තමයි එහෙනම් ප්‍රචලිත කරන්න අවශ්‍ය වෙන්නේ ඒ අනුව ඔබ ඉදිරිපත් කරන්නේ මොන පොත්ද යෝජනාව කරමින්?

පි: අහුකාම්ලාසාලාතේ කියලා කොහොමද සලාතේ කරන්නේ.

ප්‍ර: කොහොමද සලාතේ කරන්නේ ?

පි: සලාතේ නබිතුමා ගරු කරලා කියන විදිය තමයි මේ උගන්වලා තියෙන්නේ නබිතුමාට ගරු කරන්න එපා කියලා ඒ කියන්නේ ගරු කිරීම් කඩනවා ඒ කියන්නේ ගරු කිරීම් සීමා කරනවා අන්තවාදීන් එහෙම සීමා කිරීම් තුලින් තමයි ඒගොල්ලන්ට පුළුවන් අන්‍ය දේවලුත් සීමා කරන්න ගරු කිරීම් ටිකට යන්න අන්‍යාගමිකයන්ට බුදුහාමුදුරුවන්ට ජේසුස් ක්‍රිස්තු වහන්සේට කාට හරි ගරු කරන්න නැතිවෙන්න ඉන්න විදියට උගන්වන්න කොටස් කඩනවා එතකකොට නබිතුමාට මෙහෙම වැඩිය මේවා දේනන ඕනේ නැහැ ප්‍රයෝරිටි දෙන්න ඔනේ නැහැ. එයාට මෙච්චරක් ගරු කරොත් ඇති කියලා සීමා කරනවා එතකොට ඒ වගේ පොත් නෙමේ මේවා එතකොට අර අපි නෝම්බි කියලා

ප්‍ර: අපි දැන් ඒවා එක එක ඉදිරිපත් කරමු නේද? දැන් ඔබ පළවෙනියෙන්ම කියපු පොත කියන්නකෝ

FAIR COMMENT BY JEZEEM

පි: අහුකාමුස් සලාත්.

ප්‍ර: එය ස්වාමිනි IAKR 26 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා?

පි: එකේ පරිවර්තනය දෙමල ඒකේම පරිවර්තනය දෙමල තොල්හෙයි සාෆි කියලා එකේ තියෙනවා.

ප්‍ර: ස්වාමිනි එම පොත IAKR 27 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්නට අවසර ඉල්ලා සිටිනවා.

පි: ඊළඟට අර ප්‍රාථමික අධ්‍යාපන කුරාන් ඉගෙන ගන්න බේසික් Knowledge අර අ,ආ A,B,C,D වගේ තාලි මුල් කුරාන් කියලා

ප්‍ර: එය මොන භාෂාවෙන්ද තියෙන්නේ?

පි: ඒක ආරාබි භාෂාවෙන් තියෙන්නේ.

ප්‍ර: ස්වාමිනි අරාබි භාෂාවෙන් ඇති එම පොත IAKR 28 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා

පි: ලංකාවේ අරාබි භාෂාව තුල ලංකාවේ හිටපු පුජකවරුන් ඇවිල්ලා ඒක කලාවක් වශයෙන් අරබුත් තමිල් කියලා ඒ කියන්නේ අරාබි භාෂාව ආරාබියෙන් ලියලා ඒක කියවන කොට එන්නෙ දෙමළෙන් ඒ වගේ භාෂාවකුත් ලංකාවේ හදලා තියෙනවා අනුභාෂාවක් එතකොට ඒ වගේ පොතක් තමයි මූලික බේෂික් මේවා එක

ප්‍ර: ඔබ කියන්නේ එවැනි පොත් පත් ළමයින්ට උගැන්වීම සඳහා භාවිතා කිරීම වඩාත් සුදුසුයි?

පි: ඒ වගේම ඉස්ලාම් දහම උගන්වනවානේ මේ පාසැල් වල පැරනි පාසැල් විෂය නිර්දේශ පොත තමයි ලබා ගන්න ඕනේයි කියලා ඒ කියන්නේ මේ වගේ ත්‍රස්තවාදී ලේබල්වල නම් ගැවෙච්චි මිනිස්සුගේ නම් තියෙන කොට නම් පවා මේකේ ආණ්ඩුවේ මෙයාගේ නම තියෙනවා ඒ නිසා මෙයා හොදයි කියන රැකන් නයිස් එක ලැබෙනවා. අපි ඒ රැකන්ග්යිස් එක දෙන්න ගිහිල්ලා තමයි සමාජයේ ඒගොල්ලන් බටා ඒකරාශි වුනේ

ප්‍ර: ඒක නොකලයුතුයි කියලා ඔබ කියන්නේ?

පි: ඔව්

ප්‍ර: ඒවාද ඔබ විසින් ඉදිරිපත් කරන යෝජනා?

පි: ඒ වගේම සංවිධාන තියෙනවානේ නෑ එක එක සංවිධාන හතු පිපෙනවා වගේ සංවිධාන ඇවිල්ලා තියෙනවා එතකොට ඒ ගොල්ලන් තමයි ඉස්ලාම් දහම ප්‍රචලිත කරන්නේ ඉස්ලාම් දහම ප්‍රචලිත කරන්න කියලා තමයි මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුව තියෙන්නේ එතකොට ඒ ගොල්ලන් හරහා ඒක ප්‍රචලිත වුනොත් ප්‍රමාණවත් එහෙම NGO වැඩසටහන්.

ප්‍ර: ඒ කියන්නේ මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුව හරහා ඒ ප්‍රචලිත වීමයි යෝගී වන්නේ?

FAIR COMMENT — BY JEZEEM —

පි: ඔව්. ඒ වගේම උලමා සභාව තුල යම් වෙනස් කමක් සිද්ධ කරන්න ඕනේ ඒ කියන්නේ උලමා සභාව තුල තියෙන කට්ටිය තුල අන්තවාදී දේවල් ගෑවෙනා කියන දැන් ඔප්පුවෙලා තියෙනවානේ සාමාන්‍ය මට්ටමක හරි එතකොට ඒක ආයේ පැරණි කට්ටිය දැන් ඕක දාලා ගියානේ මට ආරංචි වුන විදියට මෙතන ඇවිල්ලා පැරනි කට්ටිය කතා කරලා ඇවිල්ලා ගිහිල්ලා ඇවිල්ලා තියෙනවා කීපදෙනෙ.ක ඒ ගොල්ලන් එ ගොල්ලන් දැන් ඉන්ට්‍රස් කරනවා එන්න ඔය ගොල්ලන් මොනවද ගිහිල්ලා කිව්වේ එහේ ඇයි එහෙම කතා කරන්නේ ඒ වගේම සිකුරාදා ගිය සිකුරාදා මේ සිකුරාදා නෙමේ ඊට කලින් සිකුරාදා කොල්ලුපිටිපල්ලියේ දේශනාවලදි රිස්වි මුෆ්ති කියන පූජකයා කොල්ලුපිටිය පල්ලියේ ඉදගෙන අමානා එකේ ඉන්ෂුරන්ස් එකේ අමානා ඉන්වස්ට්මන් එකේ අමානා ඇඩ්වටීස්මන්ට් එක හරි මං හිතන්නේ අමානා බෑන්ක් එකේ SLBC එකේ එයාට Air ටයිම් එකක් දෙනවා ඒ ගොල්ලන්ට ලයිව් ඒ දුම්මාදේශනාව ලිව් හරි ලයිව් රේකෝඩින් හරි ඒක යනවා එතකොට ඒකේ ඒයා කියනවා කාටි කුඩුගායින්ඩ් කියලා පාවලා දෙන්න එපා කියලා අපි අතරේ තියෙන ප්‍රශ්න ටික අපි අතරේ විසඳන්න ඕනේ එහෙම කියලා වක්‍ර බලපෑමක් මේ කොමිෂමට කරනවා.

ප්‍ර: ඒ කියන්නේ එළියට ගිහිල්ලා මේවා කතා කරන්න එපා කියන එකයි මේ ඒගොල්ලෝ කියන්නේ?

මෙන්න මේ කොමිෂමට තමයි කරන්නේ මොකද පසුගිය දවස්වල මේ කොමිෂමේ දේවල් මාධ්‍ය හරහා ප්‍රචලිත වුනා ඒ සම්බන්ධයෙන් මුස්ලිම් මුස්ලිම් කියන ප්‍රචලිත වුනේ ඒ වගේම මම දන්න මෙතන කීප දෙනෙක් කට්ටිය ගෙන්නලා ඒ ගොල්ලන් කථා කරනවා.කථා කරලා ඒ ගොල්ලන්ව ඉන්ට්‍රස් කරනවා එන්න අපි වාඩි වෙමු අපි කථා කරලා මේවා විසඳමු හදමු

ප්‍ර: ඒ කියන්නේ මුස්ලිම් ජාතිකයින්වද?

පි: මේකට ඇවිල්ලා ගිය මුස්ලිම් ජාතිකයන්ම ඇවිල්ලා කතා කරලා ඒ ගොල්ලන් ගෙන්නලා කථා කරනවා පූජකයන් මෙහෙට ආව පූජකයන් මෙහෙට ආපු සමහරක් දේශකයන් ඒ කියන්නේ සූෆි සබ්ජෙක්ට් සම්බන්ධ කට්ටිය ඒ ගොල්ලන් දන්නවා මෙතන ගැලවුමක් එන්නෑ. මෙකේ අවසානයේදී අපිට යම් කිසි අපි ලොක් වෙනවා. ඒ නිසා මේගොල්ලන් අපි අරගෙන පොඩි ගැටයක් ගහගෙන මෙතන කොමිසම සහ අනික් කට්ටිය නොමඟ යවන වැඩ පිළිවෙලක් එයාලා වක්‍රව දැන් ක්‍රියාත්මක කරන්න පටන් අරන් තියෙනවා.

ප්‍ර: කොහොමද ඒක වක්‍රව ක්‍රියාත්මක වෙන්නේ ?

පි: ඒ ඇවිල්ලා දැන් සූෆි කට්ටිය දැන් ඇවිල්ලා මේගොල්ලන් එක්ක වාඩිවෙලා එකට ඉන්න ගියොත් එයාලාට කියන්න පුළුවන් අපිත් එක්ක

FAIR COMMENT BY JEZEEM

සුෆි කට්ටිය ඉන්නවා එහෙම කථා කරපු කට්ටිය අපිත් එක්ක වාඩිවෙලා ඉන්නවා. අපි දැන් වැරදි හදාගෙන ඉදිරියට යන්න යන්නේ .

ප්‍ර: ඒ වගේ ප්‍රතිරූපයක් ඒ ගොල්ලෝ දැන් ඉදිරිපත් කරන්න පුළුවන් කියලා ඔබ කියන්නේ?

පි: ඒකට තමයි මේ ගොල්ලන් සැරසෙන්නේ එයාලන්ගේ පසුගිය කාලයේ ඒ ගොල්ලන් හිතුවේ නෑ මේක යම් කිසි ලංකාවේ පාලන බලයක් යම් කිසි වෙනසක් වෙයි කියලා හිතුවේ නෑ. ඒ ගොල්ලන්ගේ අවාසනාවකට එහෙම දෙයක් වෙනසක් වුනා රටේ වාසනාවට හරි මොනවහරි දෙයක් වෙලා තියෙනවා එතකොට ඒනිසා ඒ ගොල්ලන් ඇවිල්ලා දැන් පාස්කු ප්‍රහාරයෙන් පස්සේ අපි ගණන් ගත්තේ නැහැ. ඒගොල්ලන්ගේ ඔපිස් බේයාරස් එකට කීපදෙනෙක් හෝ දානවා කියලා කිව්වා. මමත් සාමාන්‍යයෙන් ඒ සාකච්ඡාවලට ගිහිල්ලා තියෙනවා. එතකොට ඒකට දැම්මේ නැහැ හැබැයි මේ මැතිවරණයෙන් පස්සේ ඒ ගොල්ලන් මේ හෙලි දරව්වලින් පස්සේ ඒ ගොල්ලන්ට තේරුණා මේක දැන් කොහොම හරි තැනක ලොක් වෙන්න ඉඩ තියෙනවා ඒ නිසා ඒගොල්ලන් සේෆ් ගාඩ් කරන්න මේ පූජකයන් ටික අපි ළඟට ගමු ඒ වගේ ඒ ගොල්ලන් මේ කොමිසමෙන් කතා කරන්න කලින් ඒ ගොල්ලන් සිරබස් එකටත් රෙඩ් වෙනවා. ඒ ගොල්ලන් කියනවා කමිටුවක් හදලා තියෙනවා සිලබස් හදන්න අපි ඒ සම්බන්ධව ඔය ගොල්ලන්ගේ අදහස් දාන්න දැන් ඒ ගොල්ලන් හදන්නේ ආයි කොන්ට්‍රෝල් එක තියා ගන්න රිමෝට් එක කොහොම හරි ක්‍රමයකින් එතකොට එවැනි දේවල් අපේ සමාජය තුල වෙනවා.

ප්‍ර: ඒ කියන්නේ මේ කොමිෂම හරහා ඒ කරුණු හෙලි දරව්වීමත් සමඟ ඔවුන් ක්‍රියාත්මක වෙන්නට පටන් අරන්?

පි: ඔවුන් කැළඹීමකටත් පත්වෙලා තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිමා</u>

ප්‍ර: රහුමාන් මහත්මයා ඔබට කියන්න පුළුවන් ද මේ කොමිෂන් සභාවට ඔය ඔබ අදයි මීට පෙර දිනයි විස්තර කරන ලද ඔය විවිධ සංවිධාන සහ පුද්ගලයින් හරහා මේ සිදුවන ක්‍රියාදාමයට දේශපාලනික වශයෙන් උදව් වන කවුරුහරි ආයතනයක් නැත්නම් පක්ෂ නැත්නම් පුද්ගලයින් ඉන්නවාද?

පි: ඒ ගැන රිසාද් බදුර්දීන් හිස්බුල්ලා වගේ දේශපාලන නායකයන්ම සඳහන් කරන්න පුළුන් ඒ කියන්නේ මුජුබර් රහුමාන්ලා වගේ දේශපාලන නායකයින් නිකාබයට විරුද්ධ බව මා පෞද්ගලික දන්නවා. එතකොට ඒයා නිකාබයට විරුද්ධව කථා කරා කථා කරායින් පස්සේ එයාව මේ සමාජය තුල උලමා සභාවේ කට්ටිය ඔක්කෝම බලපෑම්

FAIR COMMENT — BY JEZEEM —

කරන්න පටන් ගත්තා ෆෙස් බුක්වල ලියන්න පටන් ගත්තා එතකොට මේ රිසාද් බදුර්දීන්ගේ භාර්යාව මේ නිකාබ් එකක් ඇඳගෙන තමයි ගිය මැතිවරණයට ගියේ. හැබැයි එයා CID එකේ යන කොට නිකාබය ගලවලා තමයි ගියේ. නිකාබය නෑ දැන් එයා නිකාබය අදිනවාද නැද්ද කියලා මම දන්නේ එතකොට මැතිවරණ වේදිකාවේදී නිකාබය අද මේ සටන් පාඨයක් වෙලා තියෙනවා එතකොට ඒ ගොල්ලන් ඇවිල්ලා දැන් ඒ ගොල්ලන්ගේ භාර්යාවගේ නිකාබය ගලවලා යනවා ඒ ගොල්ලන්ගේ මුස්ලිම් ජනතාවට පොළඹවනවා අපිට අයිතින් නැතිවෙලා කියලා ඒ වගේම තමයි අමාත්‍ය රහුල් හකීම් අමාත්‍යවරයත් එවැනි මතයක් මැතිවරණ සමයේදී ගෙනියනවා සමාජය තුල.

ප්‍ර: මොනව වගේ මතයක් ද ?

ප්‍ර: ඒ කියන්නේ මුස්ලිම් ජනතාවගේ අයිතීන් උල්ලංඝනය වෙනවා කියලා. ඒ කියන්නේ නිකාබය එයාගේ දුව ගියේ දේවිබාලිකා නැත්නම් විශඛා කියන සිංහල බෞද්ධ පාසලකට එතකොට එයාගේ දුව ඇවිල්ලා ඉස්ලාම් ආගමානුකූලව ඇඳුම් ඇඳගෙන ගියේ නැහැ. චම්පික රණවක මහත්මයාගේ ඒ කට්ටියත් එක්ක තමයි දුවගේ මේ ගොල්ලන් එකට ඉගෙන ගත්තේ එතකොට ඒ ගොල්ලන් ඒ සමාජයට පණිවිඩයක් දෙන්න ඇවිල්ලා මේ අපේ අයිතීන් ආරක්ෂා කරන්න අපි සටහන් කරමු කියලා. ඒ ගොල්ලන්ගේ ගෙදර තුල ඒ දේ ක්‍රියාත්මක කරන්නේ නැතිව ඒ දේ කරන්න් බැලන්ස් කරන්න පුළුවන් නම් සමාජය තුලත් ඒ ගොල්ලන්ට සංහිදියාව වෙනුවෙන් යම් කිසි තැන් වල යම් කිසි සෙට්ල්මන්ට් එකට එන්න පුළුවන් එතකොට ඒ ගොල්ලන් ඒ දේ කරන්නෑ. ඒ ගොල්ලන් ඒදේ වෙනුවට සමාජය කුපිත කරන වැඩ කරනවා එතකොට උලමා සභාව වගේ සංවිධාන වක්‍රව බලපෑම් කරනවා. ඒ කියන්නේ මුස්ලිම් දිස්කසාද හා පනත සම්බන්ධවදී කාරණයේදී උලමා සභාව නිසා තමයි පාර්ෂවයන් දෙකට කැඩුනේ. ඒ කියන්නේ සලිම් මර්සුෆ් පාර්ෂවය සහ ෆායිස් මුස්තපා වශයෙන් පාර්ශව දෙකට කැඩුනේ මතය. ඒ නිසා තමයි අද වෙනතුරු මුස්ලිම් දික්කාසද හා විවාහ නීතිය ක්‍රියාත්මක කරන්න බැරිවෙලා තියෙන්නේ එතකොට මුස්ලිම් දේශපාලන නායකයන් අනිවාර්යෙන්ම වගකීයන්න ඕනේ බසිර්සෙයි උදාවුත් ඊයේ පෙරේදා එයා සූෆී සබ්ජෙක්ට් සම්බන්ධව මතවාදව ඉන්න එක්කෙනෙක් එතකොට එයා විශාල හෙලි දරව්වක් කරලා තියෙනවා. මුස්ලිම් දේශපාන නායකයන් නිසා තමයි මුස්ලිම් ජනතාව අද ත්‍රස්තවාදීන් ලේබල් ඒක ගැවිලා තියෙන්නේ කියලා ඒ විඩියෝ පටයත් මෙතන තියෙනවා.

මේ අවස්ථාවේ කොමිෂන් සභාවේ කටයුතු දිවා අහාරය සඳහා පස්වරු 2 පසු වී විනාඩි 30 තෙක් කල් දමනවා.

දැන් වේලාව: ප.ව 1.00

FAIR COMMENT — BY JEZEEM

****

දිවා විවේකයෙන පසු නැවත කොමිෂන් සභාව රැස්වේ.
සාක්ෂිකරු නැවත ප්‍රතිඥා දී කැඳවයි.
දැන් වේලාව .2.50

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: රහුමන් මහත්මයා ඔබ දිවා විවේකයට පෙර ගරු සභාපති කොමසාරිස් තුමා විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් සඳහන් කරනු ලැබුවා මේ නිකාබය ඇදිම පිළිබඳව නිකාබය සහ හිජාබය ඇඳීම නිසා යම් යම් අවස්ථාවල් වලදී සමාජයේ ඒ ඇඳුම අවබාවිතා වෙලා තියෙනවද කියලා ඔබ දන්නවද?

පි: ඔව් වෙලා තියෙනවා.

ප්‍ර: ඒ අනුව ඕබේ අවධානයට යොමු වෙලා තියෙනවාද ඇතැම් අවස්ථාවල් වලදී (ප්‍රශ්නය නැවත සකස් කර අසනු ලැබේ) ඔබේ අවධානයට යොමු වෙලා තියෙනවාද කාන්තාවන් විසින් හදිනු ලබන මේ නිකාබ සහ හිජාබ පුරුෂ පාර්ෂවය ඇඳගෙන සමාජයට ප්‍රවිශ්ඨ වුන අවස්ථාවක් ?

පි: හිජාබය නෙමේ නිකාබය සහ බුර්කාවක්.

ප්‍ර: නිකාබය සහ බුර්කාව ඒ ගැන ඔබේ අවධානයට යොමු වෙලා තියෙනවද?

පි: ඒ කියන්නේ පාස්කු ප්‍රහාරයෙන් පසුව වත්තල ප්‍රදේශය සහ මහනුවර ප්‍රදේශයේ වගේ සිද්ධින් වාර්තා වුනා ඒ වගේම මාළිගාවත්ත ප්‍රදේශයේ පතාලට සම්බන්ධ මාමාස්ට් කියන අනුවර්ථ නාමය පෙන්වන පුද්ගලයා පවා ඒ ඇඳුම තමයි ආවරණයක් කර ගෙන සැරිසැරුනේ කියලා මාධ්‍යවලින් පවා හෙළිදරව් වෙලා තියෙනවා.

ඒ ඇතැම් විඩියෝ කිලිප්ස් අද ඉදිරිපත් කරන්න පුවළුන්ද ස්වාමිනි විඩියෝ කිලිප්ස් එකක් අද දින ඉදිරිපත් කරන්න ඉල්ලා සිටිනවා.

ප්‍ර: මේ නෙත් FM.LK නාලිකාව හරහා ?

පි: වාදනය වූවක් .

ප්‍රචාරය වූවක්. ස්වාමිනි එම විඩියෝ පටය IAKR29 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා.

ප්‍ර: ඒ විඩියෝ පටයේ මේ ඉදිරිපත් කිරීම කරන ලබන පුද්ලයා ස්වදේශිකයෙක්ද ?

පි: ඔහු භාරත කියලා කියනවා.ඉන්දියාව

ප්‍ර: ඒ කියන්නේ ඉන්දියාවේ? ඔබ ඒ සිද්ධිය සිදුවුනේ කොහේද කියන එක නිශ්චිතව කියන්න දන්නවද?

Presidential Secretariat Copy

FAIR COMMENT — BY JEZEEM —

පි: නෑ වත්තල ප්‍රදේශයෙත් එහෙම විශේෂ සිද්ධියක් සිදුවුනා මහනුවර ප්‍රදේශයෙත් සිද්ධ වුනා මෙයින් පෙන්වන සිද්ධිය කොහෙද කියලා මට හරියට දැනුවත් නැහැ.

ප්‍ර: නමුත් මෙය අන්තර්ජාලයට මුදා හැරලා තියෙනවා නෙත් එෆ් .LK විසින් ඒ වගේම තවත් විඩියෝ පටයක් ස්වාමිනි පෙන්වා සිටීමට අවසර පතනවා. ඔබ අර දෙවනියට වාදනය කරන ලද ඒ විඩියෝ පටය අනුව ඒ සිද්ධිය සිදුවෙලා තිබ්බේ කොහේද කියලා කියන්න දන්නවද?

පි: ඒක වත්තල ප්‍රදේශයේ.

ප්‍ර: වත්තල ප්‍රදේශයේ සිදුවෙලා තියෙන්නේ අපි මීට වඩා වෙනස් තත්ත්වයකින් මුස්ලිම් සමාජයේ කාන්තාවන් ඒ බුර්කාව සම්බන්ධයෙන් අනිත් අය විරුද්ධතාවය පළකරාම ඔවුන් හැසිරෙන අකාරය සම්බන්ධයෙනුත් විඩියෝ පටයක් තියෙනවා ඔබතුමන්ලාගේ ගරු අවධානයට යොමු කරන්න

ඒ වත්තල ආපිකෝ එකේ සිදු වූ සිද්ධියේ විදියට ඉදිරිපත් වන විඩියෝ පටය එය IAKR 30 වශයෙන් ලකුණු කිරීමට ඉදිරිපත් කරනවා

පි: මේකේ තව බුර්කාව සම්බන්ධව උලමා සභාවේ මත සම්බන්ධ විඩියෝවකුත් තියෙනවා.

ප්‍ර: උලමා සභාවේ මත?

පි: ඔව්.

ප්‍ර: විවිධ මතද තියෙන්නේ

පි: ඒ කියන්නේ ඒ ගොල්ලන් ඇවිත් කියනවානේ වාජිප් කියලා අනිවාර්යයි කියලා ෆත්වා එකක් දුන්නානේ උලමා සභාවේ වෙබ් සයිඩ් එකෙන් මීට කලින් තිබ්බා මත දෙකක්.

ප්‍ර: හැබැයි උලමා සභාවට පුළුවන්ද ෆතුවා නිකුත් කරන්න ඒ සඳහා ඒ ගොල්ලන්ට බලයක් තියනවද? නැනේ?

පි: එකේ හදා ගත්ත ක්‍රමය ඒ කියන්නේ ෆතුවා කියන ඒ ක්‍රමය තුලින් ඒ ගොල්ලන් හදා ගත්තු දෙයක්.

ප්‍ර; ෆතුවා නිකුත් කරන්න ඒ ගොල්ලන් සංස්ථාගත කරන කොට ඒ සඳහා නීතිමය බලයක් ඒ ගොල්ලන්ට ලැබිලා නැනේ?

පි: නෑ ඒ ෆතුවා කියන දේ කියන සංකල්පය ඒ ගොල්ලන් අවභාවිතාවට ලක් කරනවා. ඒ ගොල්ලන්ගේ ප්‍රයෝජනය තකා. ඒ කියන්නේ දන් උලමා සභාවේ වෙබ්සයිඩ් එකේ තිබිලා තියෙනවා ඒ ටෙක්නිකල් IT ටෙක්නිකල්ස් වලට හොයාන්න පුළුවන් ඒක දැන් අරන් දාලා තියෙනවා. දාන්න පුළුවන් කැමති කට්ටියට අත්‍යවශ්‍ය නෑ අවශ්‍යයත් නෑ කියලා එතකොට අනිවාර්යෙන් නොවූ දෙයක් මේ ගොල්ලන් වාජිබ් කරා ඒ කියන්නේ අනිවාර්ය කෙරුවා. අනිවාර්යෙන කොටස් කීපයක් තියෙනවා ඒක වාජිප් කියලා කොටසකට ගෙනාවා. එතකොට දැන් එහෙම ගේන්න ඒ ගොල්ලන්ට කොහොමද පුළුවන් වුනේ අනිත්

FAIR COMMENT BY JEZEEM

කට්ටියගෙන් අහන්නේ නැතිව ලංකාවේ තබ්ලික් මතවාද තියෙනවා,වහාබ් මතවාද තියෙනවා ඒ ගොල්ලන්ගේ ඇතුලේම. එතකොට ඒ මතවාද කට්ටියත් ඔකට විරුද්ධයි එතකොට එයා තනි තීරණයකට බලය අරගෙන උලමා සභාවට කොන්ට්‍රෝල් එකට අරගෙන ඒ ගොල්ලන් ඒක පෙළඹේව්වා ඒ වගේ තමයි අර මත්තබ් විද්‍යාලයේ තියෙනවානේ ඒකේ අපි සාමාන්‍ය මට්ටමකින් ඇදුමක් දාගෙනි අපි ඉස්කොලේ ගිහිල්ලා ඇවිල්ලා ගෙදර කාලා පල්ලියට ගියේ එහෙමනේ මේගොල්ලන් නිලඇදුමකුත් දුන්නා කලු පාට එතකොට පොඩි ළමයෙක් කලු පාට ඇඳගෙන යනවා සාමාන්‍යයෙන් සිංහල ගම්මානයක මෙච්චර දවස් ඉස්කොලේට ගිහිල්ලා පල්ලියට ගිය ළමයා කලර් ඇදුමකින් ගිය ළමයා එක පාරටම කලු පාට ඇඳන් යන කොට එ සමාජයේත් කැළඹීමකට ලක්වෙනවා. මොකද මේ වුනේ එකපාරට කියන එක එතකොට මේ ගොල්ලන් පොඩි කාලේ ඉදලම මේ ගොල්ලන් සමාජය කොන්ට්‍රෝල් එකට ගන්නවා එතකොට නිකාබය අනිවාර්ය කරලා තියෙනවා.

ප්‍ර: අපිට ඒ විඩියෝ පටය බලන්න පුළුවන්ද?

පි: පුළුවන් මේ ඒක නෙමේ මේ රිසාද් බදුර්දීන්ගේ බිරිඳගේ,එයා බුර්කා දාන එක්කෙනෙක්

ප්‍ර: මේ රිසාද් බදුදීන්ගේ

පි: මේ බුර්කා දාගන යනවා.

ප්‍ර: මේ යන්නේ CID එකට

පි: ඔව්.

ප්‍ර: එතකොට මූන නිරාවරණය වෙලා තියෙන්නේ?

පි: මීට කලින් මූණ ආවරණය කරගෙන තමයි හිටියේ

ප්‍ර: ඊ ළඟ විඩියෝව මොකක්ද? අර බර්කස් School කියන්නේ අසාද් සාලි කථා කරන්නේ නැද්ද?

පි: නෑ එකේ අර යාකුබ් කියන එක්කෙනා ඇවිල්ලා මේ මුහුණ වහනවට විරුද්ධව ඉන්නවා ජර්නලිස්ට් කෙනෙක් එයා ඇවිල්ලා කලාත්මක ඔය ජර්නලිට් කෙනෙක් එයා එතකොට ප්‍රශ්නයක් අහනවා මුහුණ වහන එක අනිවාර්යද නැද්ද කියන එක එතකොට මෙයා ඇවිල්ලා වටින් යනවා කුරාන් එකේ තියෙනවද නැද්ද කියලා යාකුබ් අහනවා ජර්නිස්ට් මෙයා කියනවා කුරාන් එකේ මුහුණ වහන්නද එපා ද කියන ඩිරෙක්ට් ආන්සර් එකක් නැහැ මෙයා යනවා වෙන තැනකට තක්සීර් කියලා මෙයා එතකොට ඉන්ටර් ප්‍රසර් දෙන්න යනවා වෙන තැන් වල තියෙනවා කියන එක කියන්න එතකොට ඒකේදී එයා කියනවා මුහුණ වහන්න නැතිව ඉන්න එක්කෙනා පාපයක් නෙමේ කරන්නේ මුහ වහන් ඉන්න එක්කෙනත් කරන්නේ හොද දෙයක් කියලා ඒ වගේම එයා කියනවා ප්‍රජාතන්ත්‍රවාදී රටක් මේක අපිට හැම අයිතියක්ම තියෙනවා ඒක

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කරන්න ප්‍රශ්නයක් වුනා කියලා අපිට අපේ අයිතිය නැති කරන්න බැහැ ඒ වගේම අපි මුහුණ ඇරියා කියලා ප්‍රශ්න ඇති වෙන්නෙත් නැහැ. ඒ හින්දා අපි අපේ අයිතිවාසිකම් වලට මොකක්ද සටන් කරන්න ඕනේ කියලා එතකොට ඒ වගේ තව විඩියෝ කිලිප් එකකදී එයා මහින්ද රාජපක්ෂ අගමැතිතුමාව අර දින 52 දෙකේ ආණ්ඩුවේදී මීට වෙලා ඇවිල්ලා කියනවා මුහුණ වහන එක ඇවිල්ලා අපේ ගෑනු කොහොමද අදින්න ඕනේ කියන එක ජනාධිපතිතුමා කියන්න ඕනේ නැහැ කියලා එතකොට එහෙම.

ප්‍ර: කවුද කියන්නේ එහෙම ?

පි: පාසිල් ෆාරුජ් පාසිල් ෆාරුජ් කියන්නේ උලමා සභාවේ එක්කෙනා. එතකොට ඒ ගොල්ලනුත් ඇවිල්ලා හරියට FCID වලින් investigate කලොත් මේගොල්ලන්ට තියෙනවා මේ මුල්‍ය දේවල් මේ ගොල්ලන්ගේ ඒවා මේ ගොල්ලන්ගේ මුල්‍ය අපරාධ ඒ කියන්නෙ කොහොමද මේ ගොල්ලන් කොහොමද හම්බ කරේ මේ ගොල්ලෝ අමානා වල හිටපු දේවල් මේ ගොල්ලන්ගේ තාත්තා ඇවිල්ලා තබ්ලික් ජමාත් එකේ අමීර් කෙනෙක් නායකයෙක්. සූරා සභාවක් තියෙනවා තබ්ලික් ජමාතේ තුලත් මසූරා සභාව කියලා ඒක ඒකේ ඉන්න ලොකුම අමීර් කෙනෙක් තමයි මෙයාගේ තාත්තා පාසුල් ෆාරුජ් එයාට කියන්නේ ඇමරිකන් පාරුජ් කියලා. එතකොට මේ ගොල්ලන් තමයි මත හදන්නේ කියලා සමාජය තුල එතකොට එයා එතන එකක් කියනවා ඊට පස්සේ උලමා සභාවේ නායකයා කියනවා වාජිප් කියලා අනිවාර්යයි කියලා මෙයා කියනවා මත දෙකක් තියෙනවා කියලා එතකොට ඒ කාලේ මුස්ලිම් කාන්තාවන් ඇවිල්ලා ගෙවල්වලට ඇවිල්ලා හිටියා අර යන්නැතිව මේ ගොල්ලන්ට ගෙවල්වල ඉන්නැතිව තනියෙන් යන්න උවමනාවක් නැනේ මේ ගොල්ලන් මුහුණ වහන එක්කෙනෙක් නම් ඔක්කෝම සර්ව සම්පුරණයි කියලානේ මුහුණ වහන්නේ එතකොට එයාට පිරිමියෙක්ගේ සහයෝගයක් නැතිව යන්න බැහැ. අතන සුපර් මාකර්ට් එකේදි එයගේ අම්මා මුහුණ ඇරලා නැත්නම් නැද්දා එයා මුහුණ වහලා අනිත් එක එයාගේ discipline එකක් එයා අත දික් කරලා කතා කරනවා. එතකොට එයා වෙල්නවුන් කෙනෙක් නම් එයා එතන එයාගේ බිගේඩියර් එක මෙන් ටෙන් කරන්න ඔනේ එතකොට එයා ඇවිල්ලා ඒක කරේ නැහැ. එතකොට ඒ මුහුණ වහන චින්තනයන් ඒ ගොල්ලන් තුල තියෙන්නේ නිකම් ඇවිල්ලා පැෂන් එකට නැත්නම් ආකර්ෂනයට නැත්නම් අපි භක්තිකයන් කියලා පෙන්වන්න. ඒ වගේම ATM මැෂින් එකට ගියොත් ලංකාවේ තියෙන බැංකු පද්ධතිය පවා ලංකාවේ නීතිය පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තියෙනවා. හෙල්මට් එක දාගෙන සිංහල තරුණයෙක් සල්ලි ගන්න කොට නිකාබය බුර්කාව දාගෙන තරුණියක් සල්ලි ගන්නවා ඒක ගලවන්නේ නැතිව එතකොට එයාට

එක නීතියක් සිංහල තරුණයන්ට තව නීතියක් වෙන්න බැහැ මේ රටේ ඔක්කෝම එක නීතියක් තමයි තියෙනවා මේ නීති දෙකක් තියෙනවා බැංකුවට ගියාම දැන් ඒ කාන්තාව යන්නේ ඒකේ තියෙන කොමර්ෂල් බැංකුවට අතේ සිලිප් එකක් තියෙනවා එතකොට එයා මුහුණ වහගෙන තමයි ගිහිල්ලා තියෙන්නේ එතකොට මුහුණ වහගෙන එකෙන් අරනුත් තියෙනවා. එතකොට ලංකාව තුල ඒකට ඉඩ දීලා තියෙනවා මේක පාස්කු ප්‍රහාරයෙන් පස්සේ

ප්‍ර: කොමර්ෂල් බැංකුවේ එක බලන්න පුළුවන්ද?

පි: එයාගේ අතේ තියෙනවා මේක අර සිලිප් එක තියෙන්නේ එයා කොමර්ෂල් බැංකුවට තමා ආවේ.

ප්‍ර: සුපර් මාකර්ට් එකේ?

පි: ඒ කාන්තාව ආවේ සුපර් මාකර්ට් එකට ආවේ කොමර්ෂල් බැංකු අවුට්ලට් එකට එතකොට එයා එතන ගනු දෙනු කරලා යනවා මුහුණ වහලා ඒ වගේම තමයි දැන් බයික් පිදිනවා ඩ්‍රයිවින් ලයිසින් දෙනවා. සංඝයා වහන්සේලාට ඩ්‍රයිවින් ලයිසින් දෙන්නේ නැහැනේ ඒක හරි නෑ කියන එක එතකොට දහමට අනුව එතකොට ලංකාවේ මුහුණ වහපු එක්කෙනාට දෙනවා ඩ්‍රයිවින් ලයිසන් එතකොට පොලිස් මහත්තයාට බැහැ විභාගයක් කරන්න මොනවාහරි අනතුරක් වුනත් හරි ඉස්ලාම් ආගමේ කියලා තියෙන්නේ ස්වාමිනි එයා යන්න ඕනේ අවිල්ලා කාන්තාවක් යන්න ඕනේ ඇවිල්ලා පිරිමි කෙනෙක් එක්ක අනුමත පිරිමි කෙනෙක් එක්ක තනියෙන් යන්න කියලා නැහැ එතකොට මහත්මයාට තියෙන කම්මැලි කමට නෝනාට බයික් එකක් අරන් දීලා එහෙම නැත්නම් පොඩි කාර් එකක් අරන් දීලා යවනවානම් ඒක වැරදියි එතකොට ඒයා මුහුණ වහන් ඉන්න එක්කෙනෙක් නම් එතකොට පිරිමියා බලන්නේ එයාව සංවර විදියට හදන්නනේ ඒකනේ කියන්නේ ට එතකොට කොහොම ද එයා ගෑනිව යවන්නේ මාකර්ට් එකට යවන්නේ එතැනින් නේ ප්‍රශ්න හටගන්නේ එතකොට අනන්‍යතාව තහවුරු කරන්න බැහැ. කවුද එළවන්නේ කවුද කරන්නේ එතකොට ගැහැණු පොලිස් නිලධාරීනියක් එනකම් ඉන්න ඕනේ ප්‍රශ්නේ විසඳන්න එතකොට ඒ ගොල්ලන්ට ඕන විදියට ප්‍රශ්න විසඳන්න.

ප්‍ර: ප්‍රායෝගික නෑ ඔබ කියන්නේ?

පි: ප්‍රායෝගික නෑ ඔබ කියන විදියට අසාද් සාලි ක්ලිප් එකේ කියනවා අසාද් සාලිගේ ඔය විඩියෝ කිල්ප් ඔතන නෑ එකේ විහිලුවක් යනවා ඒ විහිලුවේදී කියන්නේ අර පාදිල් ෆාරුප් කියනවා මුහුණ වහන එක මෙයාගෙන් නම් අහන්න එපා මොකද එයාගේ දෙකක් තියෙන නිසා මොකද ඒ නිසා තමයි එතන ඔය කතිකාවේ යන්නේ එතනත් අසාද් සාලි කරන වැරැද්ද මවුලවි තමා හාස්‍යයට තමා ලක් කරන්නේ මොක ද මෙයාගේත් තියෙනවා ඒ වගේ මොරොක්කු සබ්ජෙක්ට් දෙකක් මේ

FAIR COMMENT — BY JEZEEM —

ගොල්ලන් ඇවිල්ලා ඔක්කොම එකම පුටුවේ වාඩිවෙලා වැඩ කරන කට්ටිය ඒ කියන්නේ නම්බර් ටු වැඩකරන කට්ටිය එතකොට මුහුණ වහලා ඉස්කෝලේට ලංකාවේ දීලා තියෙන්නේ මං දන්න විදියට චක්‍රලේඛනයක් තියෙනවා පංජාබි ඇදුමට විතරයි අනුමැතිය දීලා තියෙන්නේ. රාජ්‍ය පාසැල් වල එතකොට හිටපු ගමන් කොහොමද මුහුණ වහලා ළමයි ගියේ මාළිගා වත්තේ හේමා බාලිකාවටත් යනවා මුහුණ වහලා එතකොට ඒක ප්‍රශ්නයක් තියෙනනවානේ එතන එතකොට රජයේ කොහොමද කවුද මේකට නිසි බලධාරියා අධ්‍යාපන අමාත්‍යාවරයෙක් නැද්ද අධ්‍යාපන අධ්‍යක්ෂකවරයෙක් නැද්ද එතකොට කොහොමද මුහුණ වහගෙන යන්නේ මහනුවර පාසැල්වලත් එනවා ඒ වගේ එතකොට දැන් ලංකාව පුරාම ඒවා තියෙනවා ඉස්සර තිබ්බේ ඇවිල්ලා සාමාන්‍යයෙන් බෞද්ධ පාසලකට ඔය පංජාබි ඇදුම යන එකම ප්‍රශ්නයක් එතකොට දැන් මේ ගොල්ලන් මුහුණ වහන එකත් කර ගෙන ඒක තව ප්‍රශ්න වැඩිකිරීමක් එතකොට එතන අනන්‍යතාවක් සිද්ධ වෙන්නේ නැහැ. දැන් මම මගේ ළමයා දාලා තියෙන්නේ සහිරා විද්‍යාලයට එතකොට සහිරා විද්‍යාලයේත් මුහුණ වහලා ටීචර්ස්ලා ඉන්නවා උගන්වන්න මගේ ළමයාට ඒ වගේ අවස්ථාවක් ආවොත් මං ඒ වෙනුවෙන් කථා කරන්න බලාපොරොත්තුවක් තියෙනවා මොකද මුහුණ වහන කෙනෙක්ව ඉල්ලුම් කරලා නෙමේ මම සහිරා විද්‍යාලයට ඇප්ලිකේෂන් දැම්මේ මගේ ළමයාට සම්පූර්ණ අයිතිය තියෙනවා ඒ ටිචර් කවුද කියන එක බලාගන්න අනාගතයේදී තමන්ට අ,ආ, උගැන්වුවේ කවුද නැත්නම් ගණිතය ඉගැන්වූයේ කවුද කියන ගුරුවරයා කවුද කියන එක දැන ගැනීමේ පුර්ණ අයිතිය තියෙනවා මොකද සෞදි ආරාබියේ නෙමේ අපි ජීවත් වෙන්නේ අපි ජීවත් වෙන්නේ ලංකාවේ.

ප්‍ර: ඔබ කියන්නේ වෙනත් තැනක දී දැක්කොත් ඒ ගුරුවරයාව හදුන ගන්න විදියක් නැහැ?

පි: කොමිනිකේෂන් එකක් නැතිවෙනවා ඒ මිතුදම නැතිවෙනවා. ගරුගෝල මිතුදම කියනවානේ ඒක නැතිවෙනවා එතකොට මේවා තුලින් තමයි අර ළමයින් තුළ තියෙන සම්බන්ධකම නැතිවෙන්නේ ඒ සම්බන්ධකම නැතිවුනායින් පස්සේ තමයි අර ගරු කිරීම නැතිවුනාට පස්සේ තමයි ඔය අන්තවාදී මත වලට ළමයින් යොමු වෙන්නේ. එතකොට මම කියනවා මේක තහනම් කරන්න ඕනේ කියලා ලංකාව තුල විශේෂ මූලික වශයෙන් හරි පාසැල් තුල රාජ්‍ය පාසැල් තුල අර සම්බන්ධකම නැතිවෙන්නේ ඒ සම්බන්ධකම නැතිවුනායින් පස්සේ තමයි අර ගරු කිරීම නැති වුනායින් පස්සේ තමයි ඔය අන්තවාදී මතවලට ළමයින් යොමු වෙන්නේ. එතකොට මම කියනවා මේක තහනම් කරන්න ඕනේ ලංකාව තුල. ඒ කියන්නේ ඔය විශේෂයෙන් මූලික වශයෙන් හරි පාසැල්තුල රාජ්‍ය පාසැල් තුල ඒවා ඔක්කෝම තහනම් කරන්න ඕනේ

FAIR COMMENT BY JEZEEM

බැංකු පද්ධතිතුල සම්පත් බැංකුවෙත් අනවශ්‍ය ප්‍රශ්නයක් ඇති වුනේ මෙන්න මේ හේතුව නිසා එතකොට අපේ මිනිස්සු තර්ක කරනවා මේක පේසල් මාස්ක් එක ඔක්කෝම ටික දාගන්න ස දාගත්තානේ පේෂල් මාස්ක් එක ඒක වෙනයි නිකාබ් බුර්කා කියන දේ වෙනයි මේක පැළඳුවාම පුද්ගලයා පේනවා අපේ මිනිස්සු තර්ක කරන්නේ අපිට පාස්කු ප්‍රහාරයේදී කරපු තර්ක නිසා මේවා නිසා මේ ගොල්ලන්ට මේවා ඔක්කෝම වහන්න වුනානේ ඔකනේ කියන්නේ සම්පත් බැංකුව සිද්ධියේදීත් ඔක තමයා කතා වෙන්නේ එතකොට අපි කියන්නේ ඇවිල්ලා මේක හරියට නීතිය ක්‍රියාත්මක කරපු නැති නිසා තමයි මේ ඔක්කෝම ඇති වුනේ.

ප්‍ර: රැස්ව සිටින පිරිස ආමන්ත්‍රණය කරන්නේ කවුද?

පි: මුස්ලිම් කොන්ග්‍රසයේ හිටපු සභාපති බෂීර් සේවුදාද් වර්තමාන එක්සත් සාම සංවිධානයේ කියන පක්ෂයේ සභාපති .

ප්‍ර: මොනවද ඔහු කියන්නේ?

පි: ඔහු කියන්නේ අවිල්ලා මුස්ලිම් ජනතාවට වර්තමානයේදී ත්‍රස්තවාදය කියන ලේබලය වැටුනේ ඇවිල්ලා මුස්ලිම් දේශපාලඥයන් නිසා කියලා. ඒකට ඔහු රවුල් හකීම් අමාත්‍යවරයා සහ සහරාන් සමඟ පැවැත්වපු මොහු මඩකලපු දිස්ත්‍රික්කයේ එරාවුර් ප්‍රදේශයේ මේ දේශපාලනඥයෙක්. ඔහු විතරයි මඩකලපු ප්‍රදේශයේ ෂෙව්දාද් විතරයි අර අන්තවාදයට විරුද්ධව දේශපාලනය කරන එක්කෙනෙක් ඒ වගේම ඔහු සඳහන් කරනවා ඔහු සහරාන්ව හමුවෙලා ඔයා කරන දේ තම්බි කියලා තමයි කථා කරලා තියෙන්නේ. ඒ කාලයේදී මල්ලි ඔයා කරන්න යනදේ සමාජයට ලොකු විනාශයක් වෙනවා කියලා. ඒ කියන්නේ බෝම්බ පුපුරන්න මෑත කාලයේදී ඔහුගේ අන්තවාදී ක්‍රියා දෙස බලාගෙන මං හිතන්නේ හිටපු රේගු නිලධාරින් වෙච්ච මූබින් මහතාගේ නම තමයි ඔහු සඳහන් කරන්නේ එතකොට ඒ කට්ටියව සඳහන් කරලා තමයි ඔහු ඇවිල්ලා කියන්නේ ඊට පස්සේ ආයේ සහරාන් ඇවිල්ලා හමුවුනාලු පස්සේ කියන්නම් කියලා ඒ කථාවෙන් අයින් වෙලා ඔහු නැගෙනහිර පළාතේ දේශපාලනය කරපු සියලු දෙනාම දැඩි විවේචනයක් කරනවා ඔයගොල්ලන් නිසා තමයි අද මුස්ලිම් ජනතාව මේ තත්ත්වයට වැටුනේ කියලා. ඒ කියන්නේ ඔහු කියන්නේ දන්නේ ඇවිල්ලා මුස්ලිම් ජනතාව අතරේ මේ සංවිධාන හා මේවාට ආවරන ලැබුණේ මේ දේශපාලන රැකවරණය හරහා ඒ කියනනේ පාතාලය දේශපාලන රැක වරණය බලනු ලැබෙන සමානව මේ වගේ අන්තවාදී සංවිධානවලට ලැබුණා කියන එක මතය තමයි ඔහු අවසාන වශයෙන් ප්‍රකාශ කරන්නේ.ඔහු සහරාන්ගේ මල්ලී වෙච්ච සෙයිනි වම ඇවිල්ලා ඔහු කියනවා ඔහුට හකීම් දන්නේ නැද්ද ඔයාට බුද්ධියක් නැද්ද ?

ප්‍ර: සෙයිනිද රිල්වාන්ද?

FAIR COMMENT
BY JEZEEM

පි: ඒයා කියන්නේ රෙයිනි හරි රිල්වාන් හරි මොකක් හරි පටලවලා කියනවා ඊට පස්සේ එයා ඇවිල්ලා කියනවා සාමන්‍යයෙන් බෝම්බයක් පිපිරුණාම අත් මේවා කරලා තියෙන්නේ ඔයාට බුද්ධියක් නැද්ද ඒයා කියනවානේ විඩියෝ පටයක් තියෙනවානේ රවුෆ් හකීම් අමාත්‍යවරයා කියනවානේ මම ගියේ දරුවා ප්‍රසූත කරන්න ආපු කාන්තාවන් බලන්න කියලානේ එතකොට අහනවා ඇවිල්ල මේ දරුවා ප්‍රසූත කරන වාට්ටුවේ කොහොමද අරයා ඉන්නේ කියලා උඹට ඒ තරමට මොලේ නැද්ද කියලා ඒහෙම එතකොට තමයි මිනිස්සු එතැන හිනා වෙන්නේ ඒ වගේ දැඩි ලෙස අහනවා ඒ කියන්නේ හකීම් ඒ සියල්ල දැනගෙන හිටියා ඔහු දැන් මේ අමාරුවෙ වැටිලා ඉන්නේ මේ දැන් ගොතගහනවා තමයි මෙතන කියන්න එන්න හදන්නේ

ප්‍ර: කවදද මේ කථාව කරලා තියෙන්නේ සේගුඩාවුඩ් මහත්මයා?

පි: මේ ගිය සතියේ .

ප්‍ර: ඒ කියන්නේ 2020.07 වෙනි මාසේ?

පි: මම ඔහු ගැන තවත් දෙයක් සඳහන් කරන්න ඕනේ මමත් දේශපාලනය සම්බන්ධ කෙනෙක් ඔහුවත් නොදන්නවා ඇති මේ කට් එක මම ගත්තා කියලා මම ඔහුගේ ෆේස් බුක් එකට ගිහිල්ලා ගත්තා ගත්තු කට් එකක් එතකොට මම ඒ කියන පක්ෂයේ මම භාණ්ඩාගාරික වශයෙන් තනතුරු හොඹවනවා ඔහු සභාපති ඔහු පවා මෙක නොදන්වා මට්ටමින් තමයි මේක හෙලි දරව් කරන්නේ මොකද කොහේ හරි තැනකින් ලංකාවේ දේශපාලනයට විරුද්ධව මුස්ලිම් දේශපාලනයට විරුද්ධව ඩග්ලස් දේවානන්ද වගේ LTTE එකට විරුද්ධව කථා කරපු දේශපාලනඥයන් වගේ මුස්ලිම් දේශපාලනඥයන් ඉන්න ඕනේ කියන මතය තුල මම ඉන්නවා. එතකොට ඒ මතය මම මහින්ද දේශප්‍රිය මැතිවරණ කොමසාරිස් සභාපතිතුමාටත් පාස්කු ප්‍රහාරයට සිද්ධියේදී මම ඔහුව පෞද්ගලිකව මුණ ගැහිලා කිව්වාම මම කිව්වා අපිටත් ඩග්ලස් දේවාන්නදලා වගේ මේ කියන පුද්ගලයන්ට විරුද්ධව අන්තවාදීන්ට විරුද්ධව දේශපාලනය කරන්න උවමනාවක් තියෙනවා. නමුත් අපිට ඒ සඳහා ආරක්ෂාවක් නෑ ඒ සඳහා ආරක්ෂාව ලැබුණොත් අපි ඒ සඳහා මැදිහත්වෙනවා කියලා මම කිව්වා ඒ නිසා තමා මේ කට් එක ගත්තේ. මටත් පුදුමයි ඔහු මේ ගැන කථා කරපු එක ගැන

ස්වාමිනි 2020.07 වෙනි මාසේ සේගුඩාවිඩ් මහත්මයා රැස්වීමක් ඇමතීමේදී ගන්නා ලද පඩිගත කිරීමක් මෙය එය IKR31 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

පි: ඒ වගේම මොහු සමඟ මැතිවරණයට තරඟ කරනවා හිස්බුල්ලාත් මේ පක්ෂයෙන්ම එතකොට ප්‍රශ්නයක් තියෙනවානේ හිස්බුල්ලා කියන්නේ අන්තවාදීයට ඇයි මෙයත් එක්ක සම්බන්ධ වුනේ කියන බෂීර් සේවුදාවුඩ් කියන එක ඇයි මෙතන සම්බන්ධ වුනේ

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කියන එක එතකොට පාර්ලිමේන්තු ආසනයක් දිනාගන්න නම් ඡන්ද අවශ්‍යයි එතකොට ඒ ස්ටැටජර්ජි එකට තමයි මෙයා එතුමාව පාවිච්චි කරන්නේ ඉතින් එකෙන් කවුරු දිනයිද කියන එක දන්නේ නැහැ. නමුත් එතැන ස්ටැටර්ජි එකට තමයි මොහුව පාවිච්චි කරන්නේ කියන එකත් සඳහන් කරන්න කැමති.

වේලාව: ප.ව. 3.30
මෙතැන් සිට: මුතුමාලි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව.03.30 යි.
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : දැන් ඔබ මේ මම ඒ ප්‍රශ්නේ කලින් අහපු වෙලාවේ ඒ කියන්නේ මේ මුස්ලිම් මේ අන්තවාදී ක්‍රියාදාමය සම්බන්ධයෙන් ඔබ විස්තර කරපු ක්‍රියාදාමය සම්බන්ධයෙන් සහයෝගය දක්වන දේශපාලඥයෝ කවුද කිව්වාම තමා ඔබ එක්තරා අවස්ථාවක රීෂාඩ් බදුර්දීන් මහතාගේ නම ප්‍රකාශ කෙරුවා. ඔබට අනුව රීෂාඩ් බදුර්දීන් මහතා එම ක්‍රියාදාමයට උදව් වෙන්නේ කොහොමද?

පි : දැන් මාධ්‍යය අනාවරණය තුළින් මෙතුමාගේ අනාවරණයේදීත් මේක සඳහන් වෙනවා රීෂාඩ් බදුර්දීන්ගේ මල්ලි ඇවිල්ලා මේ පුන්නකුඩා කියන තැනකදීත් සහරාන්ව ගෙනත් තියනවලු. මේ කතාවේදී එතුමා කියනවා බසීර් අවුදාවුත්.

ප්‍ර : කිව්වද ඒ කතාව?

පි : ඔව් මේ කතාවෙන් පස්සේ කියනවා. එතකොට ඒ වගේම සහරාන්ව ඉන්දියාවට පලා යවන්නත් තවත් මල්ලි කෙනෙක් සහයෝගය දක්වන කතාවත් කියනවා. ඒ වගේම කොමිටුව හරහා ඒවා මේ විමර්ශන හරහා හෙළිදරව් වෙලා තියෙනවා. එතකොට එවැනි ආකාරයක උදව්වක් ලැබිලා තියෙනවා. ඒ වගේම රීෂාඩ් බදුර්දීන් කියන දේශපාලඥයාට විදේශ රටවල්වලින් මුදල් එනවා. ඒ කියන්නේ සවුදි අරාබියාව වගේ රටවල් වලින්. මමත් මේ විල්පත්තු ගිහිල්ලා තියෙනවා. එතකොට විල්පත්තු ගිය වේලාවේ ඔහු අඩි 100 න් 100 පල්ලි ඉදි කරලා තියෙනවා. එතකොට ඒකට ස්කීම් එකක් ඒකට

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : කවුද ?

පි : විල්පත්තුවේ.

ප්‍ර : රීෂාඩ් බදුර්දීන්?

පි : ඔව්. ඒ ස්කීම් එකත් එක්ක. එතකොට පල්ලි විශාල සංඛ්‍යාවක් එතන ඉදි වෙලා තියෙනවා. මට තත්ත්වය අනුව දැනට කොරෝනා නිසා ඒ ඔක්කොම ජුම්මා පල්ලි වෙලා ඇති කියලා මම හිතනවා. එතකොට දැන් ඒ වගේ අන්තවාදී පසුබිමකට මුස්ලිම් ජනතාව තල්ලු කරන්න රීෂාඩ් බදුර්දීන් එතන ඒ පල්ලි ඔක්කොම වහබ්වාදී මත දරන පල්ලි. හැබැයි ඒ ප්‍රදේශවල හිටිය

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ඔක්කොම සාමකාමී මුස්ලිම් ජනතාව ඒ නිසා තමයි කොටි ත්‍රස්තවාදීන් ඔවුන්ව පලවා හරින කොටත් ඔවුන් ගම් බිම් අතහැරලා ගියේ. මං හිතන්නේ ඔවුන් ඒ පුද්ගලයන් එක්ක හිටියා නම් අද ඔවුන් ඉන්නවා. ඒ කියන්නේ ඔවුන්ගේ ඉඩම් තියෙනවා. එතකොට ඒ ගම් ඔක්කොම පුජා කරලා තමයි ඔවුන් මේ පැත්තට ආවේ. එතකොට ඒ වුනාට ඔවුන්ව නැවත පදිංචි කිරීමේදී ඔවුන්ගේ ඉඩම්වලදී ඔවුන්ව පදිංචි කළේ නෑ වෙනත් ඉඩම්වල පදිංචි කරපු විදිහට තමයි රීෂාඩ් බදුර්දීන් අමාත්‍යවරයාට චෝදනා තියෙනවා. එතකොට ඒ ඉඩම් ඔවුන්ගේ ඉඩම් ඇවිල්ලා මොවුන් විසින් මිලදී අරගෙන තියෙනවා කියලා විමර්ශනත් තියෙනවා. එතකොට ඒ වගේ දේශපාලඥයෙක් වශයෙන් රටේ අන්දෝලනාත්මක විදිහට මේ නිවාස යෝජනා ක්‍රම හදපු පුද්ගලයෙක් තමයි රීෂාඩ් බදුර්දීන්. ඒ වගේම දැන් ඔහුත් දේශපාලනය පාවිච්චි කරනවා වර්තමානයේදී කොවිඩ් 19 නිසා ඇති වෙච්ච අර ආදාහනය සම්බන්ධව. ඒ ආදාහනය ඔහු මීට කලින් ජනාධිපති මැතිවරණයට කලින් ඔහු මැතිවරණ වේදිකාවේදී ලංකාව මියන්මාරයක් වෙයි කියලා. ඒ වගේ ඔහු වගකීම් විරහිත ලෙස මුස්ලිම් සමාජය නොමඟ යවන ප්‍රකාශ කරලා මුස්ලිම් ජනතාව වෙනත් තැනකට තල්ලු කරනවා ඔහුගේ කතා තුළින්. දැන් ලංකාවේ ප්‍රශ්නයක් වෙනයි මියන්මාරයේ ඇති වුණ ප්‍රශ්නය වෙනයි. එතකොට ඒ ප්‍රශ්න දෙකම අහසයි පොළොවයි අතර වෙනසක් තියෙනවා කියන එක දැන දැනම ලංකාව මියන්මාරයක් වෙන්න යනවා. ඒ නිසා අපිට දේශපාලනික වශයෙන් අපිව ශක්තිමත් කරන්න කියන උදව්ව ඉල්ලනවා. එතකොට යම් කිසි දේශපාලඥයෙක් උදව් ඉල්ලන්න ඕනේ ඇත්ත තර්ක ඉදිරිපත් කරලා. වැරදි තර්ක නොමඟ යවලා සමාජය සමහරක් මිනිස්සු බුද්ධිමත් නෑ. ඒ බුද්ධිමත් භාවය නැති බව එයා දැනගෙන එතුමා සමාජයේ නොමඟ යවනවා. ඒ නොමඟ යවන දේශපාලන ක්‍රියාවලියේදී රීෂාඩ් බදුර්දීන් මුලින්ම ඉන්නවා. ඒ වගේම දැන් ලංකාව තුළ ආණ්ඩුව කොවිඩ් 19 මේ ආදාහනය සම්බන්ධව රැඩිකල් තීරණයක් ගත්තා ඒ සම්බන්ධයෙන් අරන් තිබෙනවනේ. ඒ වුනාට ලංකාවේ තියෙන ආණ්ඩුව මේ සංවිධාන තහනම් කරන්න රැඩිකල් තීරණයක් ගන්නේ නැත්තේ ඇයි කියන එක මට ලොකු ප්‍රශ්නයක් තියෙනවා. ඒ කියන්නේ ආදාහනය සම්බන්ධ ක්‍රියාවලියේදී ඒ කියන්නේ මැද පෙර දිග රටවල් මැලේසියානු, ඉන්දුනිසියාව වගේ රටවල් ඒ රටවල විරෝධය ඇවිල්ලා ලංකාව තුළ කොරෝනා කියන වෛරසය මර්දනය කිරීම වෛරසය ඒ

FAIR COMMENT
BY JEZEEM

කියන දේ නැති කරන්න මේක ආදාහනය කළ යුතුමයි කියන තීරණයට එන්න ආණ්ඩුව එතකොට ඒක මළකුණුවක්. මැරිලා ඉවරයි එයා. එතකොට එයා අදාහනය කරන්න විතරයි තියෙන්නේ. ඒත් මේ වගේ සංවිධාන තහනම් කිරීමේදී ඇයි උනන්දුවක් නැත්තේ කියන එක මට ලොකු ප්‍රශ්නයක් තියෙනවා. ඉතින් ඒක මම ප්‍රශ්නයක් වශයෙන් මගේ අදහස මේ කොමිෂම හමුවේ ඉදිරිපත් කිරීමට කැමති.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : එතකොට ඔබ තවත් දේශපාලඥයෙකු නම් කෙරුවා රවුෆ් හකීම් මහතා?

පි : ඔව්.

ප්‍ර : ඔහුගේ මොන ක්‍රියාකාරකම්ද ඔබ මේ කොමිෂන් සභාවට විස්තර කරපු ක්‍රියාවලියට සහයෝගය දක්වන්නේ?

පි : ඔහු සහරාන් සමඟ සම්බන්ධකම් පැවැත්තුවා ඇවිල්ලා හිස්බුල්ලා කියන දේශපාලඥයාට විරුද්ධව තමන්ගේ බලය පිහිටුවා ගන්න. ඒ කියන්නේ දැන් අශ්‍රෆ් අමාත්‍යාවරයා මුස්ලිම් කොංග්‍රසය තුළින් මුස්ලිම් තරුණයන් LTTE යට යන්නේ නැති වෙන්න ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ මුස්ලිම් තරුණයන්ව අන්තර්ගත කරන්න තමයි මුස්ලිම් කොංග්‍රසය මුල් කාලයේදී පිහිටෙව්වේ. පසු කාලයේදී ඒකට නායකත්වයට පත් වෙන රවුෆ් හකීම් අමාත්‍යාවරයා සහරාන් වගේ ත්‍රස්තවාදීන් සමඟ මුස්ලිම් තරුණයන්ව joint කරනවා. සම්බන්ධ කරනවා. ඒ කොහොමද සම්බන්ධ කරනවා නම් මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් සහරාන්ගේ සහයෝගය ගන්නවා. ඔහු දේශපාලන නායකයෙක් නම් ඔහු ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන නායකයෙක් නම් ඔහු කළ යුතුව තිබුණේ ඔහුගේ ප්‍රචාරක ව්‍යාපාරය මුස්ලිම් කොංග්‍රසය කියන තමන්ගේ සංවිධානය හරහා තමන්ගේ සංවිධායකයන් හරහා කරන්න තිබුණේ. ඔහු කළේ ඇවිල්ලා සහරාන් ගාවට ගොස් ඔවුන්ගේ උදව් පතලා ඔවුන් එක්ක ගිවිසුම් ගහලා ඒ වගේ අන්තවාදීන් එක්ක ඔහු දන්නවා ප්‍රචණ්ඩ ලෙස කාත්තන්කුඩියේ ඉන්න සූෆි ප්‍රජාවට විරුද්ධව දැඩි ප්‍රචණ්ඩත්ව මුදා හැරපු පුද්ගලයෙක් කියලා රවුෆ් හකීම් අමාත්‍යාවරයා හොඳටම දන්නවා සහරාන් ගැන.

ප්‍ර : ඔබ ඒක කොහොමද කියන්නේ මොකද මම දැක්කා එක් අවස්ථාවකදී මාධ්‍යයෙන් කියලා තිබ්බා රවුෆ් හකීම් මහතා සහරාන් ත්‍රස්තවාදීයෙක් බව ඔහු දැන ගෙන හිටියේ නෑ කියලා?

FAIR COMMENT — BY JEZEEM

පි : ත්‍රස්තවාදීයෙක් කියලා දැන් සියළු දෙනාම කතා කරන්න පටන් ගත්තේ එයා බෝම්බේ තියාගෙන මිනි මැරුණයින් පස්සේනේ. ඒ වුනාට එයා ත්‍රස්තවාදී ක්‍රියාවට සමාන ක්‍රියා ප්‍රචණ්ඩකාරී ක්‍රියා සහ එයාගේ අදහස් ප්‍රචණ්ඩ විදිහට තිබුණා කියන දේ ඒ කාත්තන්කුඩියේ ඉන්න සියළු දෙනා තතුදත් කට්ටිය සහ දන්න කට්ටිය දන්නවා. ඒ වගේම අර සූෆි මුස්ලිම් වෙච්ච අබ්දුල් රවුෆ් මවුලවිතුමාගේ ඒ කණ්ඩායම පවා දන්නවා. එතකොට ඒ හෙළිදරව් පොලිස්වල පැමිණිලි පොත්වල සටහන් වෙලත් තියෙනවා. එතකොට එවැනි ප්‍රචණ්ඩක් ක්‍රියාවක් යොමු කරපු කට්ටියත් එක්ක කොළඹ දේශපාලනය කරන කට්ටිය පතාලෙත් එක්ක දේශපාලනය කරනවා වගේ මොහු ආගමික පතාලය වෙච්ච සහරාන්ලා වගේ ප්‍රචණ්ඩකාරීන් එක්ක තමන්ගේ දේශපාලනයට ගිවිසුම් ගහ ගත්තා. ඔහු ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙක් වශයෙන් ඔහු කොහොමද ගිහිල්ලා සහරාන්ගේ තියෙන condition වලට අත්සන් කළේ. ඒ කියන්නේ ඔහුගේ අර සිබ්ලි ෆාරුක් ලවා හරි කොහොමද අත්සන් කළේ කියන එක ප්‍රශ්නයක් තියෙනවා. ඒ වගේම ජයග්‍රහණයෙන් පසුව හිස්බුල්ලා අමාත්‍යවරයාට ජාතික ලැයිස්තුවක් දෙන්න එපා කියන කථිකාවට ඔහු ගිහිල්ලා බිම ගිහිල්ලා වාඩි වෙල සුහදශීලිව කතා කරනවා. ඒත් ඔහු කියනවා මම සහරාන්ව දන්නේ නෑ කියලා. සහරාන්ගේ මේ තැන කියලා දන්නේ නෑ කියලා. එතකොට ඒ වගේ ඒ කියන්නේ වගකීම් විරහිතව තමන්ගේ ඒ කියන්නේ දිවෙන් අමාරු විදිහට ඒ ප්‍රශ්නේ විසඳ ගන්නවා. ඒ වගේම මෙතන අර ඉස්පිරිතාලේට ගිහිල්ලා ඒ පුද්ගලයා හමු වෙලා ඔහු නැවත සඳහන් කරනවා මම ගියේ ගර්භණීය කාන්තාවක් බලන්න කියලා. එතකොට මේකෙන්ම තේරෙනවා ඔහුගේ ඔහු ප්‍රබල නීතිඥ වෘත්තියේ ඉඳගෙන ඒ තරම් වෘත්තියක ඉඳගෙන ඉහළ වෘත්තියක ඉඳගෙන ඔහු තර්ක ඉදිරිපත් කරන්නේ බොළඳ විදිහට.

ප්‍ර : බොහොම ස්තූතියි.

මෙම කොමිෂන් සභාවේ ලකුණු කරන ලද IAKR 31 දරන CD තැටියේ ඇති බසීර් සෙගුදාවුඩ් මහතාගේ කතාව දමිළ භාෂාවෙන් සිදු කළ කතාවක් බව නිරීක්ෂණය කරන අතර එය සිංහල භාෂාවට පරිවර්තනය කර කොමිෂමට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ භාෂා පරිවර්තකට නියම කරන අතර එය එසේ ඉදිරිපත් කළ පසු සිංහල පරිවර්තනය IAKR 31 (A) වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : රහුමන් මහත්මයා ඔබ දන්නවද නදීර් මවුලවි ගැන?

පි : ඔව් මම නදීර් මවුලවි ගැන දැන ගත්තේ ඇවිල්ලා Neth FM බැලුම්ගල වැඩසටහනේදී හෙළිදරව් කරපු කාරණා අනුව තමයි මම දැන ගත්තේ ඔහු ජමාතුල් මුස්ලීමීන් කියන සංවිධානයේ සාමාජිකයෙක් සහ එහි නිර්මාතෘවරයා කියලා.

ප්‍ර : එතකොට ඔහුගේ ක්‍රියා කලාපය ගැන ඔබ මොනවද කියන්නේ?

පි : ඔහුගේ ක්‍රියාකාලපය ඔහු තුළින්ම පාපොච්චාරණය කරලා තියෙනවා. ඔහු ඇවිල්ලා අන්තවාදී ගමනකට සැරිසරපු පුද්ගලයෙක් කියලා. එතකොට ඔහු ජමාතේ ඉස්ලාම් සංවිධානයේ හිටපු එක් කෙනෙක් කියලත් කියනවා. ඒ වගේම ජීහාඩ් කියන ලංකාව තුළ කිලාෆත් පාලනය ඒ වගේ අදහස් අපි දැරුවා කියලා ඔහු විසින්ම පාපොච්චාරණය කරනවා. එතකොට එවැනි පුද්ගලයෙක් බිහි වුණේ ඉහ්වාන් මුස්ලිම් කියන මතවාදය තියෙන සංකල්ප තියෙන ඒ සංවිධාන තුළින්.

ප්‍ර : දැන් අප්‍රේල් 21 බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ ඔහු නිහඬ වෙලාද?

පි : ඔහු කොහොමත් දිගටම නිහඬ වෙලා තමයි හිටියේ. කිසියම් හෝ ක්‍රමවේදයකින් Neth FM බැලුම්ගල ආයතනයට ඔහු ඇවිල්ලා ඔවුන් විසින් හොර රහසින් video කරන ලද video එකකින් තමයි ඒක සමාජයට සමාජ මාධ්‍යය සහ Neth FM තුළින් ඒක හෙළිදරව් වුණා. ඔහු බියගුලු ස්වභාවයකින් තමයි කතා කළේ. ඒ කියන්නේ තමන් පාපොච්චාරණය කරන්ට තමයි මෙතෙන්ට ආවේ කියන කාරණෙන් තමයි ඔහු කතා කළේ.

ප්‍ර : ඒ අය තවමත් ඔබ දන්න විදිහට මේ සමාජයේ සක්‍රීයව වැඩ කරනවද?

පි : ඔහු දැනට සක්‍රීයව වැඩ කරන්නේ නෑ. ඔහු කියනවා මම දැන් මොකුත් නෑ මම නිකම් නිහඬව ජීවිතයක් ගත කරන්නේ කියලා?

ප්‍ර : ඇත්තද?

පි : ඔව්. ඔහුගේ ප්‍රකාශය අනුව මම කිව්වේ මේක සටහන.

ප්‍ර : ඔබ දන්නා විදිහට දැන් මේ අන්තවාදී අදහස් තියෙන ඉස්ලාම් භක්තිකයන් අප්‍රේල් 21 ක ප්‍රහාරයෙන් පස්සේ නිකම් බොහොම නිශ්ක්‍රීය වෙලා ඒ කියන්නේ වැඩ කරන්නේ නැතුව එහෙමම නිකම් අඩපණ වෙලා තියෙනවද එහෙම නැත්තම් ඔවුන් නිකම් අර අළුයට ගිනි වගේ සැඟවිලාද ඉන්නේ?

පි : සමහරක් කට්ටිය අළුයට ගිනි වගේ සැඟවිලා ඉන්නවා. සමහරක් කට්ටිය නිශ්ක්‍රීය වෙලා ඉන්නවා. ඒ කියන්නේ නදීර් මවුලවිලගේ

FAIR COMMENT BY JEZEEM

කට්ටිට එළියට ඇවිල්ලා ප්‍රකාශ නිකුත් කරනවා. අපි අතීතයේදී මේ වගේ දේවල් සිද්ධ කරන්න හිටියා. සිද්ධ කරන්න ගියා කියන දේවල් ඒ කියන්නේ ස්වයංව ඇවිල්ලා පාපොච්චාරණය කරනවා. සමහරක් කට්ටිය මම මුලින් කිව්වා වගේ අර උලමා සභාව ඇවිල්ලා අර මෙතෙන්ට ඇවිල්ලා ප්‍රකාශ නිකුත් කරන කට්ටිය අල්ල ගෙන තමන් ළඟට ගෙන්ව ගෙන අපි එකට වැඩ කරමු කියන න්‍යායකට යනවා. එතකොට ඒ කියන්නේ ඒක අළුයට ගිනි තියාගෙන වැඩ කරන න්‍යායක්. එතකොට එවැනි දේවලුත් සිද්ධ වෙනවා.

ප්‍ර : ඔබ දිවා ආහාරයට ඉස්සෙල්ලා සාක්ෂි දෙන අවස්ථාවේදී කිව්වා මෙම කොමිෂමට ඇවිල්ලා සාක්ෂි දීපු මුස්ලිම් ඉස්ලාම් භක්තිකයන් සමහර අයව ඔය උලමා සංවිධානයේ ඉහළ නිලධාරීන් කැඳවලා සාකච්ඡා පවත්වලා ඔවුන් බොහොම හොඳට කතා කරනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : දැන් එවැනි වතාවරණයක් ඔබටත් උද්ගත වෙලා තියෙනවද ?

පි : නෑ මම මේක රහසිගතව කරන කෙනෙක් නිසා මාව සම්බන්ධව සමාජයේ කවුරුත් මාව දන්නේ නෑ. අද වෙනතුරු මේ දැන් කතා කරන මොහොත වනතුරු මගේ චරිතාපදානය කවුරුත් දන්නේ නෑ. ඒ නිසා මම සියළු තැන්වල ඉන්නවා. ඒ වුනාට මම කවුද කියන එක සාමාන්‍යයෙන් කට්ටිය දන්නේ නෑ. ඉතින් එවැනි ආරක්ෂාවක් තියෙනවා. එවැනි ආරක්ෂාවක් මෙම කොමිෂම හරහා තියෙන නිසා තමයි මම මෙතනට ඇවිල්ලා මේ හෙළිදරව්වත් කරන්නේ ස්වයංව ඇවිල්ලා.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද මේ කොමිෂමේ කටයුතු නිසා මුස්ලිම් සමාජය තුළ කිසියම් ආකාරයක කැළඹීමක් මේ වෙන කොට ඇති වෙලා තිබෙන බව?

පි : ඔව් මුස්ලිම් සමාජය තුළ බිම් මට්ටමේ කැළඹීමක් මුස්ලිම් සමාජය මේ සම්බන්ධයෙන් දැනුවත් නෑ. ඉතින් සමාජය දැනුවත් කරන්නේ ඇවිල්ලා මේ සුෆි කට්ටිය නැත්නම් පාරම්පරික කට්ටිය මේ සමාජය පාවලා දෙනවා. ඒ වගේ මතයක් ගොඩනඟලා තියෙනවා උලමා සභාවේ. ඒක නිසා තමයි ඔහු කොල්ලුපිටියේ පල්ලියේදී වක්‍රා ආකාරයෙන් කියන්නේ පාවලා දෙන්න එපා. කාට්ටිකුඩුක වානම් කියන වචනය use කරනවා. එතකොට ඒක භයානක වචනයක්. රාජ්‍ය ගුවන් විදුලිය තුළට ඇවිල්ලා කෝකද ඔයා පාවලා දෙන්න එපා කියලා කියන දේ අපිට අහන්න වෙනවා එයාගෙන්. මොකද එයා කියන්නේ නෑ කෝකද කියලා. ඒත්

FAIR COMMENT — BY JEZEEM —

මිනිස්සු දන්නවා වර්තමානයේදී මොකක්ද මේ කියන එක ව්‍යාංග භාෂාවෙන් එයා.

ප්‍ර : ඔබට තේරෙන විදිහට ඔබට දැනෙන විදිහට සහ ඔබට ලැබෙන තොරතුරු අනුව දැන් මේ මුස්ලිම් අන්තවාදීන් ඉදිරියට මෙහෙමම අක්‍රීය වෙලා යයිද නැත්නම් ඔවුන් නැවත හිස ඔසවන්න අවස්ථාවක් තියෙයිද ?

පි : ඔවුන්ගේ මතවාදය මේ තහනම් කරනකම් ඔවුන්ගේ මතවාදය දිගටම යයි. දැන් සහරාන්ට අවස්ථාවක් ලැබුණු නිසා තමයි ඔහු පිපිරුණේ. මතවාදය තවම තියෙනවා. පිපිරීම සිද්ධ වෙන්නේ නෑ. මතවාදය තියෙනවා. ඉතින් ඒක පිපිරීම සිද්ධ වෙයිද නොවෙයිද කියන එක අපිට කියන්න බෑ. හැබැයි මතවාදය තියෙනවා.

ප්‍ර : ඒක ඉදිරි කාලයේ ඒ මතවාදය ඒ විදිහටම පැවතුණොත් එය ආර්ථික වශයෙන් ශ්‍රී ලංකාට බලපෑමක් ඇති කරයි කියලා ඔබ හිතනවද?

පි : ලංකාවේ පිහිටීම භූගෝලීය වශයෙන් වැදගත් නිසා ඒ කියන්නේ චීන ආර්ථිකය ලංකාවට පැමිණීම ඒ වගේම ඉන්දියානු ඇමරිකානු ලෙන්ගතුභාවය පකිස්ථානු,චීන,රැසියානු ඒ වක්‍රය තුළ ලංකාව දේශපාලන වශයෙන් නැඹුරු වීම ඒ වගේ භූගෝලීය දේශපාලන වුවමනාවන් මත මුස්ලිම් අන්තවාදය ලෝකයේ ප්‍රයෝජනයට ගත්ත විදිහට ඒ කියන්නේ විෂම බලවේග ප්‍රයෝජනයට ගන්න පුළුවන් මේ මතවාදය.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු එක් ප්‍රශ්නයයි තියෙන්නේ මේ මුස්ලිම් මතවාදී අන්තවාදී කල්ලිවල අන්තවාදී බව ප්‍රයෝජනයට ගෙන විදේශීය බලවේග ක්‍රියාත්මක වුණාද කියලා තමන්ට කියන්න පුළුවන්ද?

පි : මම ඒකට හේතුව වශයෙන් මම ඉන්දීය Raw සංවිධානය ඒකට සම්බන්ධ වුණාද කියලා මම දන්නේ නෑ. ඒ වුනාට මුස්ලිම් එක්සත් විමුක්ති පෙරමුණේ මුජුබර් රහුමාන්ලා දේශපාලනය කරන කොට ඇමරිකා එක්සත් ජනපදයට විරුද්ධව ඒ කියන්නේ ලංකාව තුළ ව්‍යාපාරයක් ගෙනියන්න කියලා. ඒ කියන්නේ සාමාන්‍යයෙන් දේශපාලන පක්ෂවලට ඒ වගේ සම්බන්ධකම් එනවා. විදේශ න්‍යාය පත්‍රයන්වලට. එතකොට ඒ.ආර්.රහුමන් කියන පුද්ගලයාගේ සංගීත කණ්ඩායම කොළඹට ගෙන්වලා අපි ඕගොල්ලොන්ට යම් කිසි found එක අරන් දෙන්නම් කියලා එවැනි Company කරන්න කියලා සාමාන්‍ය පක්ෂයකට කියන්න පුළුවන් නම් ඉතින් මේ වගේ මතවාද තියෙන සංවිධානවල් ටික

FAIR COMMENT BY JEZEEM

follow කරලා ඒ ගොල්ලන්වත් maintain කරන්න පුළුවන් වාතාවරණයක් විදේශ බලවේගයන්ට පුළුවන් කියන ආක්‍රමණික බලවේගයන්ට පුළුවන් කියන මතයත් තියෙනවා.

ප්‍ර : මෙම ප්‍රහාරයේදී එවැනි දෙයක් සිදු වුවාද කියලා ඔබට කියන්න පුළුවන්ද ?

පි : මට සැකකයක් තියෙනවා ෂැංග්‍රීලා හෝටලේට බෝම්බ දෙකක් පිපිරීම සම්බන්ධව සහ ටාජ් හෝටලයට බෝම්බය නොපිරීම සම්බන්ධව සැකයක් තියෙනවා.

ප්‍ර : මොකක්ද ඒ සැකය?

පි : ඒ සැකයට අපේ අසල්වැසියන්ගේ යම් කිසි සහයෝගයක් ලැබුණද කියන එක අසැල්වැසි රාජ්‍යයන්වලින්.

ප්‍ර : ඒ කියන්නේ ටාජ් හෝටලයේ බෝම්බය නොපිරීම සම්බන්ධවද?

පි : ඔව් නොපිරීම සහ ෂැංග්‍රීලා හෝටලයට චීන හෝටලයට බෝම්බ දෙකක් පිපිරෙනවා ඒ හේතුව. ඒ ආර්ථික සම්බන්ධ ප්‍රශ්නයක්ද ලංකාවේ ආර්ථික ගැටලුවට සහරාන්ලන්ගේ අදහස පාවිච්චි කළාද?

ප්‍ර : ඒ කියන්නේ ඔබ කියන්නේ බෝම්බ දෙකක්ම එක හෝටලයක පමණක් පිපිරීමයි මෙම බෝම්බය ටජ් එකේ නොපිරීමයි අතර යම් කිසි සැකයක් පවතිනවා කියලා ඔබ කියන්නේ?

පි : සැකයක් තියෙනවා ඒ කාරණයේදී.

ප්‍ර : දැන් ටජ් එකේ බෝම්බය ඇත්ත වශයෙන්ම පුපුරවා ගන්න ගිය ජමිල් නැමැත්තා ගැන මෙයට කලින් දන්නවද?

පි : ජමිල් නැමැත්තා ගැන දන්නේ නෑ ඔහුගේ සහෝදරයාව අපි අඳුරනවා. අර තේ බිස්නස් කරන්නේ තාම එයා ඇතුළේ ඉන්නවා එයාගේ අයියා.

ප්‍ර : හකීම්?

පි : හකීම්.

ප්‍ර : ජමිල්ගේ ක්‍රියාකාරිත්වය ගැන ඔබලා දැන ගෙන හිටියද?

පි : නෑ.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ සඳහන් කළා මෙම කොමසාරිස්තුමන්ලාගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් මෙම මතය දරන මෙම මතය තහනම් කළේ නැත්නම් මේ තත්ත්වය ගොඩ එන්නට හම්බ වෙන්නේ නැහැ කියලා. ඔබ අදහස් කරන්නේ මොකක්ද මේ මතය කියන එකෙන්?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මතය කියලා කිව්වේ වහබ්වාදය ඉහුවාෆිසම්, සලෆිසම් කියන මතවාද.

ප්‍ර : ඒ කියන්නේ දැන් ඔබ ලංකාවේ තියෙනවනේ සංවිධාන කිහිපයක්ම ඔය තවුහිද් ජමාත්, තබ්ලික් ජමාත් ඊට පස්සේ ජමාතේ ඉස්ලමීක් ජමාතේ ඉස්ලාමී ඉහ්වානුයි කියන්නේ දෙකක්ද?

පි : ජමාතේ ඉස්ලාම් කියන්නේ සංවිධානයේ නම. ඒ ගොල්ලො practice කරන්නේ ඉහ්වාන් මුස්ලිම් කියන මතවාදය.

ප්‍ර : එතකොට ඔබ සඳහන් කරන්නේ මේ සංවිධාන දැන් තව SLTJ ත් තියෙනවනේ?

පි : ඔව් .

ප්‍ර : තවුහිද් කියන සංවිධාන ඔක්කොම සහ මෙම ජමාතේ ඉස්ලමීක්, තබ්ලික් ජමාත් ඒ කියන සංවිධාන ඔක්කොම තහනම් කරන්න ඕනේ කියලද?

පි : ඒ කියන්නේ ඇවිල්ලා දැන් නැෂනල් තවුහිද් ජමාත් කියන්නේ සහරාන්ගේ සංවිධානයේ බෝම්බ පිපිරීමෙන් අවසානයි. ඒකත් වහබ්වාදී සංවිධානයක්. හැබැයි ඒක තහනම් කළා කියන එකෙන් කිසිම පලක් මේ දක්වා වෙන්නේ නෑ. මොකද ඒක ඉවරයි. සහරාන් එක්ක අවසානයි. එතකොට ජමාතේ ඉස්ලාම් එකට සම්බන්ධ කට්ටිය තමයි අර ජමාතේ මිල්ලතේ ඊබ්‍රහීමියා JMI. එතකොට ඒ ගොල්ලන්ගේ

ප්‍ර : ජමාතේ ඉස්ලාමියා එකට සම්බන්ධයිද ජමාතේ මිල්ලති ඊබ්‍රහීම්?

පි : ඒ Ideology එකේ හිටපු තරුණයන් තමයි ඒකේ හිටියේ. ජමාතේ මිල්ලති ඊබ්‍රහීමියා කියන එක. එතකොට දැන් ඒ මතවාදය ගෙනිච්ච සංවිධානය තුළ හිටපු තරුණයන් තමන්ගේ සංවිධානයේ නම භාවිතා කළේ නෑ. ඔවුන් වෙන සංවිධානයක් හදාගෙන තමන්ගේ බෝම්බ පිපිරීම ක්‍රියාව සිදු කළා. එතකොට මතය ආවේ ඇවිල්ලා ඒ ඉගෙන ගත්ත මතය ඔක්කොම ආවේ ඇවිල්ලා ඒ ජමාතේ ඉස්ලාම් කියන සංකල්පය තුළින්. එතකොට ජමාත් ඉස්ලාම් සංවිධානයේ ශිෂ්‍ය සංවිධානයේ හිටපු දෙන්නෙක් තමයි මාවනැල්ල බුදු පිළිම ක්‍රියාවට සම්බන්ධ වෙන්නේ. එතකොට එයා ඇවිල්ලා ජමාතේ ඉස්ලාම් සංවිධානයේ නායක අවුරුදු 25 ක් එක දිගට නායකත්වය දැරූ හජ්ජුල් අක්බර් කියන පුද්ගලයා එයාට මේ මතවාදී අන්තවාදය ගෙන්නුවා කියලා කියනවා. ඒ කියන්නේ අර සාදීකුයි තව එක්කෙනෙකුයි. එතකොට ඒ දෙන්නා ඒක කියනවා. එතකොට ඇවිල්ලා එයාගේ ඒ කියන්නේ හජ්ජුල් අක්බර්ගේ අයියා තමයි ඊබ්‍රහීම්. එතකොට ඊබ්‍රහීම්ගේ පුත්තු දෙන්නා තමයි මේ කියන තරුණයන් දෙන්නා. එතකොට ඒ තරුණයන් දෙන්නා ඔක්කොම හිටියේ ඇවිල්ලා ශ්‍රී ලංකා ඉස්ලාමීය ශිෂ්‍ය සංවිධානයේ

FAIR COMMENT BY JEZEEM

කියලා ජමාතේ ඉස්ලාම් ශිෂ්‍ය සංවිධානයේ ශිෂ්‍ය සංවිධානයේ. ජමාතේ ඉස්ලාමීය ශිෂ්‍ය සංවිධානයෙන් නිකුත් කරපු පොත් තියෙනවා. ඒ පොත් වල කියලා තියෙනවා කොහොමද බෝම්බ හදන්නේ කියලා. හමාස් සංවිධානයෙන් කොහොමද බෝම්බ Factory හැදුවේ කියලා. බූහම්බම් කියලා පොතක් තියෙනවා. මරාගෙන මැරීම සම්බන්ධව මේ දායකත්වයක් ලබා දෙනවා. සහයෝගයක් ලබා දෙනවා.

ප්‍ර : කොහේද තියෙන්නේ ඒ පොත්?

පි : මේ පොත් තියෙනවා.

ප්‍ර : නෑ ඒ කියන්නේ කවුද ඒවා publish කරන්නේ පොත්?

පි : ඒක ජමාතේ ඉස්ලාමීය සංවිධානයෙන් publish කරපු පොත්.

ප්‍ර : publish කරපු පොත්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අජේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : අපි දැන් ඒවා එකින් එක ඉදිරිපත් කරමුද?

පි : හරි. මේක ඇවිල්ලා නාන්කන්ඩ මවුලානා මවුදුදී රහුමත් උල්ලා කියලා ශ්‍රී ලංකා ජමාත් ඉස්ලාම් සංවිධානය පකිස්ථානයේදී ජමාතේ ඉස්ලාම් සංවිධානයේ නිර්මාතෘ කරපු ඒ නිර්මාතෘවරයා පිළිබඳව චරිතාපදාන පොතක් 1982 දී ලියනවා.

ප්‍ර : කා විසින්ද ලියලා තියෙන්නේ රචිත?

පි : අල්තාක් කහුහර් කියන පුද්ගලයෙක්.

ප්‍ර : ඔය පොත අපිට තියා ගන්න පුළුවන්ද නැත්නම් ඔබට අවශ්‍යද නැත්නම්?

පි : මම මේ පොත සුරක්ෂිතව කොහොමහරි ක්‍රමයකින් තිබ්බ නිසා තමයි මේක අනාගත

ප්‍ර : පිටපතක්?

පි : පිටපතක්.

එහි පිටපතක් ස්වාමිනි IAKR 32 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර : අනෙක් පොත?

පි : අනික් එක මේක print කරලා තියෙන්නේ IPC කියලා. ඉස්සර ඇවිල්ලා මේ IPC කියලා තමයි ජමාතේ ඉස්ලාම් print shop එකේ නම. එතකොට මෙතන පාස්කු ප්‍රහාර සම්බන්ධව කොමිටුවට එකේ print එකේ වැඩ කරපු එක්කෙනත් විමර්ශන කටයුතු සඳහා දායකත්වය ලබා දෙනවා.

ප්‍ර : කවුද ඒ?

පි : නීසාර් ඩීන් මහත්මයා?

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නීසාර් ඩීන් මහත්මයා.

පි : තාම මෙතෙන්ට ආවේ නෑ. එතකොට එයා තමයි මේකේ හිටපු කට්ටිය. එතකොට එයා මේ විශේෂ හෙළිදරව් කරලා තියෙනවා එයා ඒකට විරුද්ධව මේ ලිපි පල කරලා තියෙනවා. එතකොට මමත් මේකේ සළකුණු සමහරක් තැන්වල දාලා තියෙනවා මේක පලවුණු වර්ෂය සහ අර තෆ්සීර් සම්බන්ධව එයාගේ අදහස් සහ මේක ජමාත් ඉස්ලාමීය සංවිධානයේ අමීර් විසින් මේකට පෙරවදනක් ලියනවා.

ප්‍ර : පෙරවදනක් ලියලා තියෙනවා. එතකොට පොතේ නම කියන්නකෝ?

පි : ඒක තමයි නාන් කන්ඩම් මවුලානා මවුදූදී කියන පොත.

ප්‍ර : නාන් කන්ඩ මවුලානා මවුදූදී?

පි : මවුදූදී. ඊළඟට සූෆි මුස්ලිම්වරයෙකු වශයෙන් ඒක ලංකාවේ දිගින් දිගටම සූෆි මුස්ලිම් සංවිධානයක් තිබිලා තියෙනවා හිස්බුල්ලා සබෙයි කියලා. ඒක ලංකාවේ කාත්තන්කුඩිවල එකේ Branch තිබිලා තියෙනවා. ඒ කියන්නේ දැඩිව ක්‍රියාත්මකව ඉඳලා තියෙන සංවිධානයක්. ඒ වගේම නුවරත් ක්‍රියාත්මක වෙලා තියෙනවා. එයාගේ ශාන්තුවරයාගේ ඒ සොහොන කුප්පියාවත්ත පල්ලියේ ඒ සොහොන තියෙනවා. ඒ සූෆි ඒ ශාන්තුවරයාගේ. එයාගේ අනුගාමිකයන් සහ එයා මැදිහත් වෙච්ච ලියපු පොත් තමයි මේ. එතකොට එයා කියනවා මව්දූදි සාහිබෙයුම් අවරදු ජමාතේ ඉස්ලාමී ඉයෙක්කෙන්තෙයුම් පට්ට්‍රි මාර්ක්‍ර අරින්ජහයියෙදුම් තීර්පු කියලා පොතක්

ප්‍ර : නම?

පි : ඒ කියන්නේ මවුලානා මවුදූදී කියන පුද්ගලයා සහ ඔහුගේ සංවිධානය වෙච්ච ජමාතේ ඉස්ලාම් සංවිධානය සම්බන්ධව ආගමික වියතුන්ගේ තීරණයන්.

එම පොත ස්වාමිනි IAKR 33 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර : එහි කර්තෘ කවුද ?

පි : මවුලානා මවුලවි අබුල් ජමිල්.

ප්‍ර : මවුලානා මවුලවි අබුල් ජෙමිල්?

පි : ජෙමිල් මේ තීරණයනේ. තුන්දෙනාගේම තීරණය දෙනවා. අනිත් එක්කෙනා ඒ පුද්ගලයා මොහොමදු රිලුවානුල් රහ්මාන් කියන එක්කෙනා. ඒ කියන්නේ රහුමාන් ෆාරුකි.

ප්‍ර : තුන්දෙනෙක්ගේ තීරණය මේ තියෙන්නේ?

පි : මේ නම් තුනයි. එක නමක් ඇවිල්ලා මවුලානා මවුදූදී අබුල් ජමිල් අනිත් එක්කෙනා මොහොමදු රිල්වානුර් රහ්මාන් ෆාරුකි දෙක. තුන්වෙනි එක මුස්ති මල්වා කියන එක්කෙනා.

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මේ තුන්දෙනාගේ තීරණය තමයි මෙහි අඩංගු වෙලා තියෙන්නේ?

පි : ඔව්.

ප්‍ර : මොන වසරේද ඔක පල කරලා තියෙන්නේ?

පි : 1976 තමයි මුල්ම පිටපත දෙවෙනි එක 1983 තුන්වෙනි එක 1992.

ප්‍ර : ඊළඟ පොත?

පි : මේක ඇවිල්ලා පකිස්ථානයේ ජමාතේ ඉස්ලාම් සංවිධානය බිහි වුණේ පකිස්ථානයෙන්. එතකොට පකිස්ථානයේ බිහි වෙච්ච ඒ සංවිධානය තුළ තියෙනවා අර අන්තර් විශ්ව විද්‍යාලීය බල මණ්ඩලය වගේ JVP එක වගේ student wing එකක්. එතකොට ඒ student wing එකේ නම තමයි ලංකාවෙත් තියෙන්නේ. ශ්‍රී ලංකා ඉස්ලාමීක් student movement කියලා. හැබැයි ලංකාවේ ජමාත් ඉස්ලාම් සංවිධානය දිගින් දිගටම කියනවා අපි ජමාතේ ඉස්ලාම් වෙනයි. අපි ලංකාව තමයි. හැබැයි ඒ ගොල්ලන් මවුදුදීට certificate දෙනවා. පොත් නිකුත් කරලා. හැත්තෑ ගණන්වල . එතකොට ඒ වගේම import කරලා පොත් ගෙන්වලා ලංකාව තුළ විකුණනවා. එයාලගේ Book shop එකේ. මේක ඉන්දියාවෙන් නිකුත් වුණ පොතක්. මේ පොතේ තියෙන හරය ඇවිල්ලා මේ මවුලානා මවුදුදී කියන පුද්ගලයා ඒ පකිස්ථානයේ ඉන්න තරුණ ප්‍රජාවව ආමන්ත්‍රණය කරපු පොත.

ප්‍ර : මොනවා සම්බන්ධයෙන්ද ආමන්ත්‍රණය කරන්නේ?

පි : ඔහු සම්බන්ධයෙන් තරුණයන් ඇවිල්ලා සටන් කරන්න ඕනේ . තරුණයන් ඇවිල්ලා තරුණයන් කියන්නේ ලේ කියන දේ මෙතන සඳහන් කරනවා එයා.

ප්‍ර : ඒ කියන්නේ තරුණයන්ගේ හැඟීම් ඇවිස්සෙන

පි : ඇවිස්සෙන ආකාරයට.

ප්‍ර : ප්‍රකෝප වන ආකාරයටද ඔහු එය ලියලා තියෙන්නේ?

පි : ඔව් ඉලෙන්ජර්හල් එම්බදු මෙතන සමහරක් සටහන් දාලා තියෙනවා. මම කියනවන කොට ගත්ත ඒවා. මම instant ටක් ගාලා කියවත්තේ. මේ පොත් මගේ ළඟ තිබ්බට මම කියවලා නෑ. මොකක් හරි මට්ටමකින් දේව ආශීර්වාදයකින් මේ පොත් මං ළඟ තිබිලා තියෙනවා.

ප්‍ර : ඒ නිසානේ දැන් ඉදිරිපත් කරන්නේ?

පි : ඉදිරිපත් කරන්නේ.

ප්‍ර : එතකොට මාතෘකාව කියමු අපි පොතේ?

පි : පොතේ නම ඉලංජනෙයි විලෙත්තෙලු.

ප්‍ර : ඉලංජනෙයි විලෙත්තෙලු කවුද ලියලා තියෙන්නේ?

Proof Copy
FAIR COMMENT BY JEZEEM

පි : මේක ජමාතේ ඉස්ලාම් සංවිධානයෙන් Input කරලා ගත්තු පොතක්.

ප්‍ර : ජමාතේ ඉස්ලාම් සංවිධානයෙන් මේක ආනයනය කරන ලද එකක්?

පි : ආනනයනය කරන ලද එකක්. මේක ඉන්දියාවේ ප්‍රකාශ කළ පොතක්.

ප්‍ර : ඉන්දියාවෙන් ප්‍රකාශ කරලා තියෙනවා පොතක්

පි : මේක Tamil කියලා තියෙන්නේ.

ප්‍ර : දෙමළෙන් තියෙන්නේ.

පි : උර්දුවලා කතා කරපු ඒ දෙමළ කථිකාව දෙමළෙන් පරිවර්තනය කළා ඉන්දියාව. ඉන්දියාවේ පරිවර්තනය කරපු පොත ලංකාවට ගෙන්නුවා ජමාතේ ඉස්ලාම්.

ප්‍ර : ලංකාවට ගෙන්නුවා ජමාතේ ඉස්ලාම්?

එය ස්වාමිනි IKAR 34 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර : ඊළඟ පොත?

පි : මේක ඇවිල්ලා සියෝන් උසෙත්තෙයි උලුක්කිය සක්කර නාට්කාලි ඒ කියන්නේ ඇවිල්ලා සියෝන් වාදය ඒ කියන්නේ ඒ චින්තනය හෙල්ලපු රෝද පුටුව. ඒ කියන්නේ මෙයා වයෝවෘද්ධිය පුද්ගලයෙක්.

ප්‍ර : ඒ කියන්නේ රචකයා?

පි : නෑ මේ සටන මේ කතාවට මුල් වෙච්ච මේ පුද්ගලයා.

ප්‍ර : ආ.... සටනට මුල් වෙච්ච කෙනා වයෝවෘද්ධ පුද්ගලයෙක්?

පි : පුද්ගලයෙක්. අහමද් යාසින් ෂෙහ් අහමදි යාසින් කියන පළස්තීන විමුක්ති සටනේ පුද්ගලයෙක්. එතකොට දැන් මේක මේ ගොල්ලන් කියන්න හේතුව මේ වයෝවෘද්ධ පුද්ගලයා දැන් මේගොල්ලොන්ගේ ජමාතේ ඉස්ලාම් සහ මේ ජිහාද් movements පිළිබඳව කතා කරන ගොඩක් ආයතනවල කරන්නේ එකම දෙයයි. පළස්තීන නිදහස් සටන ගැන කතා කරනවා. දැන් පලස්තීන් නිදහස් සටන ගැන අපේ රටේ හිටපු ජනාධිපති වර්තමාන අගමැති මහින්ද රාජපක්ෂ මහතාත් සහයෝගය දැක්වුවානේ යසර් අර්ෆත් මහත්තයලත් එක්ක. එතකොට ඒ විමුක්ති අරගලය මහින්ද රාජපක්ෂ මහත්මයාගේ නමකුත් පලස්තීනයේ තියෙනවා. එතකොට ඒ තරමට ඒ සටන ලංකාවට සම්බන්ධයි. එතකොට ඒ සටන භාවිතා කරලා මේ සටන ගැන කතා කරනවා. හැබැයි ඒ සටනට තරුණයන් අරන් යන වැඩවත් මොකුත් කරන්නේ නෑ. ඒ ගොල්ලන් කරන්නේ ඇෆ්ගන්වලට හරි සිරියාවට හරි වෙනත් රටවලට හරි ලංකාව තුළ හරි ඔය ජිහාත් චින්තනය මේක පෙන්වලා රෝපණය කරනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඇති කරනවා?

පි : ඔව්. එතකොට මේ අහමද් යාසින් ඒ වයෝවෘද්ධ පුද්ගලයාට මේ පොත කියවලා ඉවර වුණාට පස්සේ තරුණයෙක් ගෙන්වලා වාඩි කරලා කියයි මෙයා ගැන කතා කරලා ඉවරයි. ඊට පස්සේ අපි ලංකාවට එමුකෝ. ලංකාවේ මේ වයෝවෘද්ධ පුද්ගලයාට පුළුවන් නම් මේ රෝද පුටුවේ ඉඳලා මෙහෙම දෙයක් ඔයා මේ තරුණයෙක් වෙච්ච ඇයි ඔයාට බැරි එහෙම කියලා මෝඩයෙක් කරනවා.

ප්‍ර : එහෙම අභිප්‍රේරණය කරනවා?

පි : ඔව්.

ප්‍ර : එතකොට මොන වසරේද ඕක ප්‍රකාශයට පත් කරලා තියෙන්නේ?

පි : මේක 2005 දී.

ප්‍ර : ඒ පොතත් ද්‍රවිඩ භාෂාවෙන් තියෙන්නේ නේද?

පි : ඔව්. එතකොට මේක මානවර් ආයුවර් කියලා තමයි පෙන්වන්නේ student research මේක ගැන. මේකට පෙරවදන ලියලා තියෙන්නේ නලිමිවරයෙක්. ෆායිස් නලිමි කියලා.

ස්වාමිනි එම පොත IAKR 35 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

පි : ප්‍රකාශන කතාව ලියලා තියෙන්නේ මෙතන වැදගත්ම දේ ඒකයි. ප්‍රකාශන කතාව ලියලා තියෙන්නේ ජමාතේ ඉස්ලාමි සංවිධානයේ නායකයා. ඒ කියන්නේ නායකයා කියන්නේ sorry ජමාතේ ඉස්ලාමි සංවිධානයේ ශිෂ්‍ය සංවිධානයේ නායකයා.

ප්‍ර : ඒ කවුද?

පි : අයියුබ් අස්මින්.

ප්‍ර : අයියුබ් අස්මින්.

පි : මේ අයියුම් අස්මින් කියන පුද්ගලයා ඇවිල්ලා NFGG කියන කට්ටියත් එක්ක දේශපාලනය කළා. උතුරු පළාත් සභාවේ එයා පළාත් සභා මන්ත්‍රීවරයෙකුත් වුණා. NFGG කියන දේශපාලන සංවිධානය කරන්නේ කෙටි මාර්ගවලින් දේශපාලන බලය අල්ලා ගැනීම. එතකොට ඒගොල්ලන් ඒක කළා උතුරු පළාත් සභාවේ. ඊට පස්සේ කළා නැගෙනහිර පළාත් සභාවේදී මුස්ලිම් කොංග්‍රසය එක්ක ගිවිසුමකට එළඹිලා ඒක කළා. ඊට පස්සේ ගිය වර මහමැතිවරණයේදීත් උත්සාහයක යෙදුණු ඒක මේවා කරන්න. මෙවර මහ මැතිවරණයේදීත් එවැනි උත්සාහයක නිරත වෙනවා. එතකොට මේ NFGG කියන දේශපාලන සංවිධානයේදී මේගොල්ලන් සම්බන්ධ වෙනවා පසු කාලයේදී. එතකොට ඒ අයියුබ් අස්මින් කියන පුද්ගලයා තමයි මේකට මේ ඒ කියන්නේ ප්‍රකාශන මේක ලියන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අපි ඊළඟ පොතට යමු.

පි : ඒ වගේම මේකට මේක ලියලා තියෙන්නේ ඉදිරිස් කියලා ජාමීයා නලීමි එකේ කථිකාචාර්යවරයෙක්.

ප්‍ර : මොකක්ද ලියලා තියෙන්නේ?

පි : මේ පොත. ආසිරියර්

ප්‍ර : ආ.. පොත ලියලා තියෙන්නේ?

පි : ආසිරියර් උරෙයි. Sorry ආසී උරෙයි. ආසී උරෙයි කියන්නේ ඇවිල්ලා මේ

ප්‍ර : පෙරවදන?

පි : පෙරවදන නෙවෙයි. ඒකට සුබ පතලා වගේ.

ප්‍ර : සුබ පැතුමක් සුභාශිංශනයක් ?

පි : සුබ පැතුමක් එක් කරනවා ඇවිල්ලා සුභාශිංශන ඉදිරිස් කියන කථිකාචාර්යවරයා. ජාමීයා නලිමීයා එකේ.

ප්‍ර : ඔහු නලිමීවරයෙක්?

පි : නලිමීවරයෙක්. එතකොට මේ ගොල්ලනගේ අර joint එක මම අර link කරන්නේ.

ප්‍ර : පෙන්වනන් හදන්නේ?

පි : මේක තමයි මට දන්න විදිහට බුද්ධි අංශ පවා හොයා ගෙන හිටපු පොත.

ප්‍ර : මොකක්ද ඒ පොත?

පි : මේ පොත ඒ ගොල්ලන්ගේ ප්‍රකාශන ආයතනයේ නෑ. මේක භූහම්බම්. භූහම්බන් කියන්නේ පිපිරීම.

ප්‍ර : භූහම්බම් කියන්නේ පිපිරීම

පි : එතකොට තව පොතක් තියෙනවලු මේගොල්ලොන්ගේ එරිමලෙයි කියලා බුද්ධි අංශ හොයනවා තාමත් ඒක අපිටත් ගන්න බෑ. මට මේක මේ පූර්ව පිනකට මේ මම අරන් තිබිලා තියෙන පොතක්. මොනවා හරි ක්‍රමයකට. අපි පිපිරුණේ නෑ මං කියන්නේ ඇවිල්ලා මේ පොත මොනවා හරි ක්‍රමේකට අපි අරන් තියෙන්නේ. මං කියන්නේ ඒ කාලේ අපේ වෙච්ච තරුණයින්

ප්‍ර : ඔබ එකතු කළයි කිව්වනේ ඒ කාලේ පොත්?

පි : අන්න ඒකට.

ප්‍ර : එතකොට ඒක කවුද ලියලා තියෙන්නේ?

පි : මේක ඉස්ලමීන් book house තමයි මේක ප්‍රකාශයට පත් කරලා තියෙන්නේ ජමාතේ ඉස්ලාම් සංවිධානයෙන්.

ප්‍ර : හරි එතකොට මොකක්ද ඕකෙන් කියන්නේ?

පි : මේක ඇවිල්ලා

ප්‍ර : මොකක්ද අන්තර්ගතය?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මේ කියන පුද්ගලයා යෙහියා අයියාස් කියන මේ පුද්ගලයා තමයි මරාගෙන මැරෙන්නේ. එයාගේ චරිතාපදානය තමයි මෙතන ගොනු කරන්නේ. එයා කොහොමද මේකට මේවා වුණේ. කොහොමද මේකට set වුණේ කොහොමද මරාගෙන මැරුණේ කියන දේ කියනවා. ඒකට කුර්ආන් වැකි දානවා. එතකොට මේක මුන්නුරෙයි කියලා මාකකොලෙයි ඒ කියන්නේ පෙරවදන ලියනවා. හැබැයි මේක ලියන කර්තෘවරයා මේ ඔක්කොම සඟවනවා.

ප්‍ර : ඇයි ඒ?

පි : ඇයි කියලා දන්නේ නෑ. එතකොට මුන්නුරෙයි තියෙනවා පෙරවදන තියෙනවා සුභාශීංශන තියෙනවා ලිව්වේ කවුද කියන එක තේරෙන්නේ නෑ. එතකොට මේක ලියන්නේ ආසීම් අලෙවි කියන මාකොළ ඉන්න එක්කෙනෙක්.

ප්‍ර : එතකොට මේක ලිවීමේ පරමාර්ථය මොකක්ද?

පි : මේක තව විශේෂත්වයක් තියෙනවා මේකේ Edision කියලා තියෙනවා හතරක්.

ප්‍ර : සංශෝධන?

පි : නෑ ඒ කියන්නේ Edision නෙවෙයි

ප්‍ර : නැවත මුද්‍රණය ?

පි : ඔව් නැවත මුද්‍රණය එතකොට first print 97, second print 97 June එතකොට third print 2000 ඊට පස්සේ correct Edision ඇයිද දන්නේ නෑ correct edision එකක් ආවේ 2005 දී Correct edision එකක් දානවා. එතකොට මේ ඔක්කොටම ISBN

ප්‍ර : Number එකක් දීලා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : ඒ කියන්නේ ලියා පදිංචි කරලා තියෙනවා?

පි : තියෙනවා.

ප්‍ර : එම පොතේ තියෙනවද බෝම්බ හදන එකක් ගැන?

පි : මේකේ තියෙනවා.

ස්වාමිනි එම පොත IAKR 36 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

පි : ඒ කියන්නේ දැන හමාස් සංවිධානය බෝම්බ පුපුරන කම්හල් හදනවා. ඒවා ඒගොල්ලන් ඒවා ක්‍රියාත්මක කරනවා කියන්නේ ඒ Research එක බෝම්බ හදන ක්‍රමය කියන්නේ නෑ. ඒ කියන්නේ බෝම්බ හදන කම්හල් පටන් ගන්නවා.

ප්‍ර : ඔබ මේ කතා කරන්නේ ඔබ ඊළඟට ඉදිරිපත් කරන පොත ගැන?

පි : පොත ගැන. හමාස් කියන සංවිධානයේ නම තමයි තියෙන්නේ හමාස් කියලා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : පොතේ නම හමාස්?

පි : ඔව්. එතකොට මේයා ඇවිල්ලා රවුෆ් හුසෙන් කියන පුද්ගලයා. මෙයා මීල්පාරුවෙයි ඔය NFCD වලට සම්බන්ධවෙච්චි එක්කෙනෙක්. මෙයාට ගුවන් විදුලි සංස්ථාවේ Islamic International Politics කියලා වැඩ සටහනක් දෙනවා. දැන් දෙනවද දන්නේ නෑ. රවුෆ් හුසෙයි ඒ ගොල්ලොන්ගේ කතා ඔක්කොම මේ නලිමීවරුන්ගේ කතා ඔක්කොම මේ තරුණයන්ව ආකර්ෂනය කරන්න පුළුවන් කතා තියෙන්නේ විලාසයෙන්. ඒක කොහොම ඒ ගොල්ලොන්ගේ ශෛලීය භාෂාව ඒ ගොල්ලන් කොහොම යොදා ගන්නවද දන්නේ නෑ ඔක්කොම ඒකාකාරී. එතකොට මේ රවුෆ් හුසෙන් කියන පුද්ගලයාත් මේ හමාස් සංවිධානයේ සංවිධාන ව්‍යුහය ගැන ලියනවා පොතක්. එතකොට හමාස් සංවිධානය මේ සංවිධානය ගැන ඒ ගොල්ලන් කතා කරලා ඒ පොත ලියනවා. ඒ වගේම ඒ පොතේ ගොඩක් දේවල් තියෙනවා. මරාගෙන මැරුණු කට්ටිය මෙයා ගැන ඒ කියන්නේ මේ යෙහියා අයියාස් ගැන මේ රෝද පුටුවෙන් විප්ලව කරපු එක්කෙනා ගැන ඒ වගේම හමාස් සංවිධානය මේ ක්‍රියාකාරකම් ගැන ඒ කියන්නේ යම් කිසි තරුණයන්ට දෙනවා.

ප්‍ර : ඔය පොත් කියවීමෙන් තරුණයන් උද්දීපනය කිරීමක් කරන්න තමයි උත්සාහ කරන්නේ?

පි : උද්දීපනය කිරීමක් තමයි කරන්නේ. එතකොට ඒ ගොල්ලන් බෝම්බ කම්හල් හදපු එක ගැනත් කතා වෙනවනේ.

ප්‍ර : හමාස් එකේ තියෙනවා?

පි : ඔව්. එතකොට ඒ හමාස් සංවිධානයේ ඒ රටට ආවේණික වෙච්ච සංවිධානයක් වෙන්න පුළුවන්. ලංකාවේ සහයෝගයත් ඒකට තියෙන්න පුළුවන්. ඒ වුනාට මේ ගොල්ලන්ගේ බලාපොරොත්තුව මේක කතා කිරීම තුළින් දැන් කවුරුත් සිරියාවට ගියා ලංකාවෙන් ජීහාඩිස්ලා ගියේ සිරියාවට විතරයිනේ. දැන් මෙච්චර වැඩ කොටසක් වෙලා කවුරුත් ගියේ නැනේ පලස්තීනයට. එහෙම දෙයක් කතා වුනෙත් නැනේ. එතකොට මේ ගොල්ලන්ගේ ඒම් එක වෙනස්. මේවා ගැන කතා කළාට මේ පොත්වල ඒම් එක වෙනස්.

ප්‍ර : මොකක්ද ඒම් එක?

පි : ඒ කියන්නේ ඒ ගොල්ලන් ඇවිල්ලා වෙන තැන්වලට Divert කරන ඒම් එකක්නේ ඒ ගොල්ලොන්ට තියෙන්නේ. ඒ කියන්නේ දැන් පලස්තීනයට යවන්න ඕනේ කියන වුවමනාවක් නැනේ ඒ ගොල්ලොන්ට. ඒ කියන්නේ බොරුවක්නේ මෙතන කතා

FAIR COMMENT BY JEZEEM

කරන්නේ. එතකොට මේ වගේ පොත් ලංකාවට අවශ්‍ය නෑ ළමයින්ට මේවා.

ප්‍ර : නමුත් ඔබ කියන්නේ ඒවා කියවීමෙන් තරුණයන්ගේ හැඟීම් උද්දීපනය වෙලා ඔවුන් මේ අන්තගාමී අදහස් තවදුරටත් ප්‍රවර්ධනය කරනවා කියලා ?

පි : ඔව් දැන් රජයේ පෙළපොත්වල උසස් පෙළ හදාරන්න ඒ කියන්නේ මේ සමහර පොත් පරිශීලනය කරන්න කියලා කියනවා. ඒකෙන් තමයි අර කියපු නාලෙයි නාහරිහෙයුම් පොත්. දැන් ඒ පොත ගන්න යන එක්කෙනෙක් මේ 77, දෙමටගොඩ පාර, මේ ජමාතේ ඉස්ලාම් book shop ඔක්කොම ගන්නත් ඉඩ තියෙනවා.

ප්‍ර : ඔබ ගත්තා වගේ.

පි : ඔව් අරගෙන සමරක් වේලාවට නොමඟ යවන්නත් ඉඩ තියෙනවා. නැත්නම් අපි ගත්තා වගේ පොත් රාක්කයේ ඔහොම්ම තියන්නත් ඉඩ තියෙනවා. එතකොට මේ දෙකෙන් එකක් වෙනවා. එතකොට මං කියන්නේ දැන් මේ ඔක්කොම motivation කරලා තියෙන්නේ අන්න ඒ විදිහට .

ස්වාමිනි ඒ හමාස් කියන පොත IAKR 37 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්නට අවසර පතනවා.

පි : මේක ඇවිල්ලා ඒ කියන්නේ සමකාලීන මුස්ලිම් ලෝකය ගැන ඒ කියන්නේ සිද්ධ වුණ සටන් ගැන චෙච්නියාවේ සිදු වුණු සටන්, පලස්තීනයේ, කාශ්මීරයේ, කොසෝවල, පිලිපින්ස් වල, තායිලන්ඩ් වල ඒ කියන්නේ බෞද්ධ රටක් වෙච්චි තායිලන්තවල සිදු වුණු

ප්‍ර : ඒ කියන්නේ මුස්ලිම් ප්‍රජාව සහ අනෙකුත් ප්‍රජාවන් අතර සිදු වූ සටන් පිළිබඳවයි මේ වගේ සටහන් වෙන්නේ?

පි : සටහන් වෙන්නේ. එතකොට මේකේ සමහරක් තැන්වල සඳහන් වෙලා තියෙනවා පිලිපින්ස් වල අර මේ තායිලන්තවල සිද්ධ වුන බෞද්ධ ජනතාව මුස්ලිම් ජනතාවට කරපු හිරිහැර කරදරකාරකම් ගැන සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර : ඒත් හැඟීම් ඇවිස්සීමක් තමයි කරන්නේ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : මොකක්ද ඒ පොතේ නම?

පි : ඒකත් ලියලා තියෙන්නේ අර රවුෆ් හුසෙන් කියන පෙර පොත ලියපු එක්කෙනාම තමයි ලියලා තියෙන්නේ. සමකාල මුස්ලිම් උලහු විඩදලෙයි පෝරාට්ටංගලිල් වරලාරු පාදෙයි

ස්වාමිනි එම පොත IAKR 38 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්නට අවසර පතනවා.

FAIR COMMENT — BY JEZEEM

පි : අර ඇඩ්වඩ් සයිඩ් කියන එක්කෙනා ස්වයං නිර්ණය ගැන සම්බන්ධව කතා කරපු දෙයක් මෙයාලා මේකේ කතා කරලා තියෙනවා. ඒකත් code කරලා මේකේ පිටිපස්සට දාලා තියෙනවා. ඊට අමතරව තබ්ලික් සහ වහාබි කට්ටිය ලෝකයේ කරපු ප්‍රචණ්ඩ ක්‍රියාවන්වල මෙ ඉංග්‍රීසියෙන් දාලා තියෙන්නේ පොතක්. මේක ලියලා තියෙන්නේ South Africa ඉන්න සුන්නි කට්ටිය තමයි මේ පොත publish කරලා තියෙන්නේ.

ප්‍ර : ප්‍රකාශයට පත් කරලා තියෙන්නේ එතකොට මොකක්ද ඒකේ මාතෘකාව?

පි : මේකේ මාතෘකාවක් හරියටම කියලා නෑ. මේක තියෙන්නේ Exposing the තබ්ලි කියන දේව බන්දි වහබි සැක් කියලා තියෙනවා. Their attack on our sunni believes and practise with proof from the books printed by then කියන එකට our reply කියලා දීලා තියෙනවා.

ප්‍ර : එතකොට ඔබ කියන්නේ එහි විවිධ ස්ථානවල සිදු වූ සටන් පිළිබඳව

පි : ප්‍රහාරයන් සම්බන්ධව. සුෆි කට්ටියටයි මේ ගොල්ලන් කට්ටිය අතර සිදු වූ ගැටුම්. දැන් ලංකාවේ මේ වගේ ගැටුම් සම්බන්ධ පොතක් නෑනේ. මේකේ අප්‍රිකානු රටකින් මේක නිකුත් කරලා තියෙනවා. දැන් අපි කියන්නේ දැන් ඇවිල්ලා සුෆි ඉන්නේ ලංකාවේ කියලනේ කියන්නේ. ඒ වුනාට අප්‍රිකාවෙත් ඉන්නවා. එතකොට ඉන්දුනිසියාවේ, මැලේසියාව එතකොට සිංගප්පුරුව එතකොට චීනය ඒ වගේම සොවියට් දේශයෙන් කැඩුණු රාජ්‍යයවල් එතකොට ඒවා ඔක්කොම ඇවිල්ලා මේ සුෆි කට්ටිය. එතකොට සොවියට් දේශයෙන් රාජ්‍ය කැඩෙන්න මේ ජමාතේ ඉස්ලාම් සංවිධානය කොමියුනිස්ට් එකට විරුද්ධව ලංකාව තුළ මතවාදයක් ගෙනිච්චා. එතකොට අර නදීර් මවුලවි කියන එක්කෙනා කියනවා අපි ඒ දවස්වල ඇෆ්ගන් යන්න හිටියා කියලා. එතකොට ඒ දවස්වල ඒ ගොල්ලන් පලස්තීන් යන්නත් ඉඳලා නෑ. ඉඳලා තියෙන්නේ

ප්‍ර : නමුත් ඔහු ඇෆ්ගනිස්ථානයේ පුහුණුවක් ලැබුවේ නැද්ද නදීර් මවුලවි?

පි : එහෙම දෙයක් සඳහන් වෙනවා එයා අගාර් මොහොමඩ් ගැනත් සඳහන් කරනවා. එතකොට දැන් ඒ කවුද කවුද කියන එක ගියේ කවුද කියන එක එතුමාගේ පරීක්ෂණයෙන් තමයි හෙළිදරව් කර ගන්න පුළුවන් වෙන්නේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අපි දැන් නැවත පොතට ආවොත් exposing the නැවත කියන්න ඒකේ මාතෘකාව?

පි : Exposing the තබලීහි/දේවබන්දි වහබි සැට්

ස්වාමිනි එම IAKR 39 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර : ඒක ඉදිරිපත් කරන්න.

පි : ඊට අමතරව වහබිසම් මේ තවුහිද් කියන සංවිධානය ගැන මේ අක්කරපත්තුවේ ලංකාවේ රවකයෙක් ලියපු පොතක්. රබීදින් ජමාලි කියලා. ඒ කියන්නේ තවුහිද් සංවිධානයේ ඉලක්කය මොකක්ද ඒක හොඳයිද නරකද කියන පොතක්. එතකොට ඊට අමතරව

ප්‍ර : එය ද්‍රවිඩ භාෂාවෙන් නේද තියෙන්නේ?

පි : ඔව්.

ස්වාමිනි එම පොත IAKR40 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර : පොතේ නම?

පි : නවීන තවුහිද් ඉයකත්තින් ඉලක්කු එන්න

ප්‍ර : ඊළඟ පොත?

පි : ඊළඟට ඒ රවකයාම මේ ලේඛකයාම ලංකාවේ පල කරපු මේක ඇවිල්ලා මේක පල කළේ මේක ප්‍රකාශ කරල තියෙන්නේ සුප්‍රීම් කවුන්සිල් ඔෆ් සුෆි තරීකා ස්කොට් ඒ කියන්නේ ඇවිල්ලා පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ලංකාවේ සුෆි මුස්ලිම්වරුන්ගේ සම්මේලනයක් තිබ්බා. ඒක තිබ්බේ දෙවටගහ පල්ලියේ. එතකොට ඒකේ ගොඩක් කට්ටිය එකේ CD එකක් මගේ ළඟට ලැබුණේ නෑ මේ අවස්ථාව වෙනකම්. ඒක දෙවටගහ පල්ලියෙන් තමයි මේවා කළේ. ඒකට කියන්නේ ස්කොට් කියලා. Short name එක. එතකොට ඒකේ විශාල හෙළිදරව් සිද්ධ වුණා ලංකාවේ සිද්ධ වුණු මේ වහාබිසම්, සලෆිසම්, ජමාතේ ඉස්ලාම් සංවිධාන පිළිබඳව. එතකොට පේරාදෙණියේ කථිකාචාර්යවරයෙක් වෙච්ච මුෆිසල් කියලා එක්කෙනෙකුත් ඇවිල්ලා කතා කළා. එයා ඇවිල්ලා මුස්ලිම් පුරා වස්තු ගැන කතා කරන කථිකාචාර්යවරයෙක්. එතකොට ඒ වගේම තව කිහිප දෙනෙක් මේ සම්බන්ධව හීසාන් කාදීර්, ඉන්දීකාබ ඒ වගේ තව කිහිප දෙනෙක් එතනදී ඒ coferance එකේ සාකච්ඡා කළා. ඒ ඊට පස්සේ මේ පෙබරවාරි මාසයේදී මේ පොත එළිදක්වනවා. උංගල් තෙරියුව් එන්න. වහබිසවම්, සුෆිසම ඔබේ තේරීම මොකක්ද වහබිසම් එකද සුෆිසම් එකද කියන පොත. එතකොට ඒකෙත් විශාල මේ හෙළිදරව්වක් සිද්ධ වෙලි තියෙනවා ලංකාවේ සිද්ධ වුණු වහබි අන්තවාදය සම්බන්ධව.

FAIR COMMENT — BY JEZEEM

එම පොත ස්වාමිනි IAKR 41 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

පි : අනිත් එක මට ජමාත් ඉස්ලාම් සංවිධානය ගැන පොඩි මේකක් මට ලැබුණු සහතිකයක්. මේක ජමාතේ ඉස්ලාම් සංවිධානය විසින් center for Islamic studies ආයතනයේදී පවත්වපු එක් දින වැඩමුළුවක්.

ප්‍ර : මොනවද ඒකේ ඉගැන්නුවේ?

පි : ඒකේ සාමාන්‍යයෙන් මේ leadership ඒ කියන්නේ මේ තියෙන්නේ Contemporary challenges face by Muslim youth. Conducted by Sri Lanka Islamic student movement

ප්‍ර : ඔව් එහෙම මාතෘකාවේ තිබුණට උගන්නපු දේනේ අපිට වැදගත් වෙන්නේ?

පි : ඔව්.

ප්‍ර : මොකක්ද ඉගැන්නුවේ?

පි : මම කියන්න හේතුව ඇවිල්ලා මේක WAMY එකට සම්බන්ධ වෙලා තමයි වැඩ සටහන කරන්නේ කියන එක.

ප්‍ර : ජමාතේ ඉස්ලාම් එක?

පි : ඔව්.

ප්‍ර : WAMY එකට සම්බන්ධ වෙලා?

පි : සම්බන්ධ වෙලා.

ප්‍ර : කොහොමද කියන්නේ ඒක?

පි : මේක ඒ ගොල්ලන්ගේ මේකේ තියෙනවා අත්සන ඒකෙත් ඉස්මජ් වෙලා තියෙන්නේ. මේක Mr.අමානුල්ලා කාන් representative of SAARC reagun WAMY

එම සහතිකය ස්වාමිනි IAKR 42 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර : ඒ ටික තමයි ඉදිරිපත් කරන්නේ?

පි : අනිත් එක ජමාතේ ඉස්ලාම් සංවිධානය ඇවිල්ලා හජ්ජුල් අක්බර් කියන පුද්ගලයා අවුරුදු 25 ක් එක දිගට නායකයා වශයෙන්

ප්‍ර : 24 ක්?

පි : 24 ක් සමාවෙන්න 24 ක් එක දිගට අමීර් වශයෙන් ඉන්නවා. එතකොට මේ ගොල්ලන් අතර යම් කිසි Leak එකක් වුනාද දන්නේ නෑ මේ තරුණයන් කොටස යම් කිසි අනතුරක් කරන්න යනවා කියලා. එතකොට ඒ හෙළදරව්වෙන් පස්සේ තමයි මං හිතන්නේ 2018 දී මාවනැල්ල, පොල්ගොල්ල ඒ සම්මන්ත්‍රණ ශාලාවේදී සමුළුවක් තියලා ඔහුව නායකත්වයෙන් අයින් කරලා අවුරුදු හතරෙන් හතරට හරි තුනෙන් තුනෙන් හරි වෙනස් වෙන විදිහට නායකයෙක් පත් කරනවා.

ප්‍ර : අවුරුදු හතරෙන් වෙනස් වෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ඒ පිළිබඳව සැකයක් තියෙනවා ඇයි එහෙම එක පාරට වෙනස් කළේ කියන එක. මොකද ඔවුන්ගේ සහෝදර බැඳියාවක් තියෙන නිසා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී IAKR 32 සිට 41 දක්වා ලකුණු කරන ලද ලේඛනවල ඡායා පිටපත් ලබා ගෙන එය කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරන අතර ඉන් පසු මුල් ලේඛන නැවත සාක්ෂිකරුට මුදා හරින ලෙසටද නියෝග කරමි. ඊට අමතරව IAKR 32 සිට IAKR 38 සහ IAKR 40 සහ IAKR 41 දරන ලේඛන දමිළ භාෂාවෙන් සකස් කොට ඇති හෙයින් ඒවා සිංහලයට පරිවර්තනය කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ භාෂා පරිවර්තකට නියෝග කරන අතර එසේ ඉදිරිපත් කළ පසු ඒවා පිළිවෙළින් IAKR 32 (A), IAKR 33 (A), IAKR 34 (A), IAKR 35 (A), IAKR 36 (A), IAKR 37 (A), IAKR 38 (A), IAKR 40 (A) සහ IAKR 41 (A) වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

****

<u>ගරු විනිසුරු අදිකාරී මහත්මිය</u>

ප්‍ර : දැන් සාක්ෂිකරු ඔබ ප්‍රකාශ කළා ඕල් සිලෝන් ජමාතේ ඉස්ලාමීක් සංවිධානයේ ශිෂ්‍ය සංවිධානය තමයි ජමාතේ මිල්ලති ඊබ්‍රහීම් කියලා සංවිධානයක් හදාගෙන අප්‍රේල් 21 ප්‍රහාරය කළේ කියලා. එතකොට ඔබට කියන්නට පුළුවන්ද ෂැංග්‍රීලා හෝටලයේ බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ වෙච්ච ඉල්හාම් මොහොමඩුත් සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ වෙච්ච ඉන්ෂාෆ් මොහොමඩුත්, Tropical Inn එකේ බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ වෙච්ච ජමිල් මොහොමඩ් කියන මේත තුන්දෙනාම ජමාතේ ඉස්ලාමී ශිෂ්‍ය සංවිධානයේ සාමාජිකයන් වෙලා හිටියද?

පි : අර ජමිල් කියන එක්කෙනා තමයි හිටියේ.

ප්‍ර : ජමිල් තමයි හිටියේ?

පි : ඔව්. අර අනිත් දෙන්නා හිටියේ නෑ. අනිත් දෙන්නා ඇවිල්ලා සාමාන්‍යයෙන් ඔය සංවිධානවලට සම්බන්ධ වෙලා හිටියේ නැනේ ඊබ්‍රාහීම් හජ්ජියාර්ගේ පුත්තු දෙන්නා. ඔවුන් ව්‍යාපාරවලනේ නියළුණේ. ඔවුන් සම්බන්ධයෙන්නේ සහරාන් NTJ හරහානේ. එතකොට මේ ඔය කියන එක්කෙනා තමයි අර හකීම්ගේ සහෝදරයා. ජමිල් තමයි මේ ජමාත් ඉස්ලාම් එක්ක හිටියේ. පසුකාලීනව ඔය ජමාත් ඉස්ලාම් එකෙන් අයින් වෙනවා.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

හැබැයි ඒ චින්තනයෙන් තමයි ඔහු හැදෙන්නේ. පෝෂණය වෙන්නේ. ඒ චින්තනය තුළින් තමයි ඔහුගේ රෝපණය එන්නේ.

ප : එතකොට ඔබට කියන්න පුළුවන්ද ඔය මාවනැල්ල බුදුපිළිම කැඩීමට සම්බන්ධ වෙච්ච ඔය හජ්ජුල් අක්බර්ගේ සහෝදරයාගේ දරුවන් දෙදෙනා ඔය ජමාතේ මිල්ලති ඊබ්‍රහීම් කියන සංවිධානයත් එක්ක හිටියද?

පි : ජමාතේ මිල්ලති ඊබ්‍රහීම් සංවිධානය තුළ ඒ කට්ටිය තමයි අනුගත වෙලා හිටියේ. ඒ කියන්නේ මේ අර කවුද අර සිසුන් දෙදෙනා.

ප : සහෝදරයෝ දෙන්නා?

පි : සහෝදරයෝ දෙන්නා. බුදුපිළිම කඩපු සිද්ධිය සම්බන්ධව.

ප : සාදික් සහ සාහීඩ්.

පි : ඔව් .

ප : එතකොට දැන් ඔය ජමාතේ මිල්ලති ඊබ්‍රහීම් සංවිධානයේ ඉන්නවනේ උමයිර් මොහොමඩ් කියලා නායකයෙක් ඉන්නවා නේද?

පි : වර්තමාන නායකයා.

ප : උමයිර් මොහොමඩ්?

පි : වර්තමාන එක්කෙනා නේ.

ප : නෑ එයා එදා ඉඳලම නායකයා නේද? ඔබ දන්නේ එයා වර්තමාන නායකයා හැටියටද?

පි : නෑ මම එහෙම පුද්ගලයෙක් ගැන දැන් තමා

ප : ඇහුවේ?

පි : ඇහුවේ.

ප : එතකොට ඔබ දැන් කියන්නේ මේ මතය නැති කරන්න ඕනේ කියලනේ. දැන් මේ ඔබ මේ කොමිෂම හමුවට ලැබිලා තියෙන සාක්ෂි අනුව සහ ඔබ පවසන දේවල් අනුව මේ මතය කියන්නේ සම්පූර්ණ ෂරියා නීතිය ක්‍රියාත්මක වෙන ඉස්ලාම් රාජ්‍යයක් කියන එකද මේ මතය කියන්නේ. මේ සංවිධාන ඔක්කොගේම තියෙන අදහස?

පි : නෑ ඉතින් ඉස්ලාමීය රාජ්‍යයක් දැන් ලංකාව තුළ එහෙම කරන්න බෑ කියන එක හොඳටම තේරෙනවනේ. එතකොට දැන් ඒ ගොල්ලන් මතවාද හදන්නේ ඇවිල්ලා ඒක පෙන්වලා. ඒ කියන්නේ දැන් අපිට කිලාෆත් එකක් අවශ්‍යයි. දැන් ලංකාවේ නාම නෑ. අපි ඒක වුණු දවසට අපි වෙමු කියන එකනේ කියන්නේ ඒ ගොල්ලන්. එතකොට ඒ නිසානේ තරුණයන් ටික බැලුවේ මේ ගොල්ලන් ඉක්මන් වෙනවා මදී අපි ඉක්මන් වෙමු කියලනේ ඉක්මන් වුණේ. ඒ කියන්නේ ලෝකයේ තියෙන Trend එකක් වෙච්ච ISIS එක්ක සම්බන්ධ වෙලා හරි මොකක් හරි බුද්ධි

FAIR COMMENT BY JEZEEM

අංශයක් එක්ක හරි සම්බන්ධ වෙලා හරි ඒ ගොල්ලන් ඉක්මන් වෙන්නේ මේ මතවාදය නිසා.

ප්‍ර : ඒ කියන්නේ ඉස්ලාම් රාජ්‍ය කියන මතවාදය?

පි : ඔව් ඉස්ලාම් කිලාෆත්

ප්‍ර : කිලාෆත්?

පි : එතකොට ඉස්ලාම් කිලාෆත් කියන මතවාදය ඇවිල්ලා ඔය ඉහ්වාන් මුස්ලිම් concept එක හරහා ආපු එකක්. එතකොට ඊට අමතරව දැන් ඔබ අබ්දුල් රාසීක් කතා කළා වගේ අබ්දුල් රාසීකුත් කියනවා ඉස්ලාමී කිලාෆත් ගැන. එතකොට දැන් ඉස්ලාමීය කිලාෆත් කියන්නේ කථිකාවක් විතරයි. ඒක නිකම් කථිකාවක්. ඒ කථිකාව ඒ තරුණයන්ව ඒ කියන්නේ උස්සලා ගන්න අවුස්සලා ගන්න මේ ගොල්ලන් භාවිතා කරනවා. ඒ කියන්නේ ඉස්ලාමීය රාජ්‍ය කියන කිලාෆත් සංකල්පය අපි කියන මාතෘකාව Topic එක අරන් ඒ ගොල්ලන් කතා කරනවා.

ප්‍ර : කවුද මේ ගොල්ලන් කියන්නේ?

පි : ඒ කියන්නේ ජමාතේ ඉස්ලාමී සංවිධානය, ඉහ්වාන් මුස්ලිම් චින්තනය

ප්‍ර : තබ්ලික් ජමාත්

පි : සාමාන්‍යයෙන් වහබිස් කට්ටිය ඇවිල්ලා ඒ කතාව කතා කරනවා අඩුයි. ඒ ගොල්ලන් ඇවිල්ලා ගොඩක් අර මතවාද වශයෙන් ගැටෙන අවස්ථා තමයි වැඩි. වහබිස් කට්ටිය ඇවිල්ලා තර්ක විතර්ක වලට තමයි යන්නේ වැඩියෙන්. හැම තැනම ලංකාවේ කොහේ ගියත් ඇවිල්ලා ඔය වහබිස්ලාගේ වැඩ actives තියෙන්නේ තර්ක වලින්. එතකොට ඒ ගොල්ලන් ඇවිල්ලා දැන් දේශපාලන චින්තනයක් වහබිසම්වල නෑ. ඒක දැන් සවුදිවල ඉඳලා ආවාට දේශපාලන චින්තනය තියෙන්නේ මේ ජමාතේ ඉස්ලාම් ඉහ්වාන් මුස්ලිම් කියන ඔය මතවාද තුළින්. ඒ නිසානේ ඒ ගොල්ලන් ඇවිල්ලා ඔය දැන් ඔය අධ්‍යාපන අමාත්‍යාංශයට යන්නේ. මේ රටේ ප්‍රධාන තැන්වලට ගිහිල්ලා ආයතනවල ලොකු පුටුවල වාඩි වෙන්නේ. වාඩි වෙලා ඒ ගොල්ලොන්ගේ දේවල්වලට පක්ෂ හදන්න පක්ෂ ලියා පදිංචි කරන්න හරි මොනවා හරි දේකට help කරන්නේ ව්‍යාංගයෙන් හෝ මොනවා හරි ක්‍රමයකින්.

ප්‍ර : දැන් ඔය ඉස්ලාම් රාජ්‍යය හෝ කැලිෆට් එක කියන සංකල්පය ශුද්ධ වූ කුර්ආනයේ තියෙන එකක් නෙවෙයි නේද?

පි : නෑ.

ප්‍ර : ඒක ත්‍රස්තවාදී සංකල්පයක්?

FAIR COMMENT — BY JEZEEM —

පි : ඒක ඇවිල්ලා සාමාන්‍යයෙන් දැන් ඔටෝමෝන් අධිරාජ්‍ය බිඳ වැටුණට පස්සේ මේ ඉස්ලාමීය රාජ්‍ය කියන කිලාෆත් ක්‍රමය නෑ. ඉතින් ඒ වෙනුවෙන් මේ ගොල්ලො වෙහෙසෙනවා.

ප්‍ර : වෙහෙසෙනවා?

පි : එච්චරයි.

ප්‍ර : ඒක නැවත ඇති කර ගන්න?

පි : ඇති කර ගන්න.

ප්‍ර : එතකොට ඔබට කියන්නට පුළුවන්ද මෙම කොමිෂමට දැන් ඔබ ගොඩාක් දේවල් කතා කළා මේවා නැති කරන්න ඕනේ Regulate කරන්න ඕනේ කියලා. මේ ඉස්ලාම් රාජ්‍යය කියන ත්‍රස්තවාදී සංවිධානයේ සංකල්පය තියෙනවනේ මේ සංවිධානවල ලංකාවේ තියෙන වහබ්වාදයත් එක්ක යන ඉස්ලාම් රාජ්‍ය කියන සංකල්පය ලංකාවේ තහනම් කරනවා නම් ඔබට කියන්න පුළුවන්ද ඒක නිසා මේ මෙවැනි අලුතෙත් තරුණ පිරිස් මෙම කැලිෆට් එක හැදීමේ සිහිනයෙන් ඉස්ලාම් ආගමික අන්තවාදයට යෑම නතර කර ගන්න පුළුවන් වෙයි කියලා?

පි : නෑ ඒක වචනයක් විතරයිනේ. ඒක මාතෘකාවක් විතරයි. එතකොට දැන් අපිට ඕනේ ඇවිල්ලා ලංකාව තුළ ඉස්ලාම් දහම තියෙන්න ඕනේ. ඉස්ලාම් දහම තිබ්බට ප්‍රශ්නයක් නෑ.

ප්‍ර : ඉස්ලාම් දහම.

පි : ඒ වුනාට දැන් සංවිධාන තුළින් එන අනුමාතෘකා වෙච්චි ඒ මතවාද ලංකාව තුළ තියෙන්න බෑ කියන එක තමයි මම අර කියන්න හදන්නේ. ඒ කියන්නේ දැන් ඉහ්වාන් මුස්ලිම් කියන මතවාදය ලංකාවට කුමන හේතුවක් මත අවශ්‍යද අවශ්‍ය නෑ. ඒක ඊජිප්තුවෙන්ම පරාදයි. පකිස්ථානයෙන්ම ජමාතේ ඉස්ලාම් පරාදයි. එතකොට ලංකාවට ඒක අවශ්‍ය වෙන්නේ නෑ කියන මතය තමයි මම අර උලුප්පලා කතා කරන්න හදන්නේ.

ප්‍ර : දැන් ඔබ කතා කළා ඕල් සිලෝන් ජමෙයිතුල් උලමා සංවිධානය ගැන මෙම කොමිෂමට කරුණු ඉදිරිපත් කළා සුෆි මුස්ලිම්වරුන් ඕල් සිලෝන් ජමෙයිතුල් උලමා එක 1979 වසරේදී ෆත්වා එකක් නිකුත් කළා කියලා සුෆි මුස්ලිම්වරුන් මරන්න ඕනේ කියලා. ඔබ ඒක ගැන දන්නවනේ?

පි : දැනුවත් ඒක. ඒක පාස්කු ප්‍රහාර පාර්ලිමේන්තු කොමිටි එකේදී කාත්තන්කුඩියේ ඉඳලා එන කණ්ඩායම ගැන කතා කෙරුවා.

ප්‍ර : එතකොට මේ ඕල් සිලෝන් ජමෙයිතුල් උලමා එක ඒ වගේම ඔය හලාල් සහතිකය නිකුත් කිරීමෙන් ආදායම් ලබා ගන්නවා එවැනි මේ මෑත කාලයකදී අපි මෙම කොමිෂමට ඉදිරිපත් වුණා ඔවුන් මුස්ලිම් සමාජයට උපදෙස් දීමට අමතරව අපේ මේ ඉහළම

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ආරක්ෂක බුද්ධි ස්ථානවලට පවා ත්‍රස්තවාදීන් පිළිබඳව කරුණු කාරණා ඉදිරිපත් කරලා තිබෙනවා කියලා. ඔවුන් ඔවුන්ව පිරිසිදු කිරීම සඳහා. එතකොට සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සංවිධානය regulate කළ යුතුයි කියලා ඔබ කියනවද? මේ ගොල්ලන් කරන කටයුතු නියාමනය කළ යුතුයි කියලා?

පි : ඔව් ඒ කියන්නේ දැන් ඒක හරි කෙනෙක්ගේ පුටුවට පත් වෙන්නත් ඕනේ. එයා පත් වෙන්නේ ඇවිල්ලා සාමාන්‍යයෙන් අවුරුදු හතරකටදෝ පහකටද පස්සේ තමයි එයාගේ නායකත්වය වෙනස් වෙන්නේ. එතකොට දැන් එයාත් ඇවිල්ලා ලංකාවේ සමහර දේශපාලන නායකයන් සහ දිගටම හිටියා වගේ ශත වර්ෂයකට වඩා එයාත් නායකත්ව පුටුවේ වාඩි වෙලා ඉන්නවා. එතකොට ඒක ඇවිල්ලා ඒ එකම මතවාදය වෙච්ච තබ්ලික් මතවාදය අතර තමයි ඒක තට්ටු හුවමාරුවක් වශයෙන් තමයි දිගටම පැවැත්ව ගෙන ඉන්නේ. එතකොට ඒක ලංකාවේ ඇවිල්ලා මෙවච්ර දවස් ලංකාව තුළ ඉස්ලාම් දහම ව්‍යාප්ත කරපු ඔය සූෆි කට්ටියගේ නියෝජනයක් එකතු වෙලා නෑ. දශමයක්වත් නෑ. එතකොට ඒ තුළ නියෝජනය වෙන්නේ ඇවිල්ලා වහබ්වාදී ඔය ඉහ්වාන් මුස්ලිම් ජමාත් ඉස්ලාම් කියන චින්තනවලින් පෝෂණය වෙච්ච තබ්ලික් වලින් මුල් කර ගත්ත කට්ටිය තමයි ඒකේ ආධිපත්‍ය පතුරුවගෙන දැන් ඒ ගොල්ලො හඳ කොමිටුව පවා ඒ ගොල්ලොන්ට තියෙන්නේ එකම එකයි. හඳ කොමිටුව බලය අත් පත් කර ගන්න විරතයි. ඒක පවා ඒ ගොල්ලන්ට බැරි වෙලා තියෙනවා දැන් ඒක තියෙන්නේ කොළඹ මහ පල්ලියේ Control එක යටතේ. එතකොට දැන් ලංකාවේ

ප්‍ර : මොකක්ද ඔය හඳ කොමිටුව කියන්නේ?

පි : හඳ කොමිටුව කියන්නේ මාසිකව ඇවිල්ලා නව සඳ බලනවා. එතකොට අපි ඒක වැඩිපුරම දන්නේ ඔය රාමලාන් සඳ බලන එක විතරයි වැඩි පුරම දන්නේ. එතකොට හැම මාසේම රාමලාන් සඳ බලලා මුස්ලිම් ජනතාවට එක් රැස් වෙලා මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශයේ, උලමා සභාව කොළඹ මහ පල්ලිය කියන ආයතනය, කොළඹ මහ පල්ලිය සුෆි මුස්ලිම්වරුන්ගේ Control එකේ තියෙන නිසා ඒ ගොල්ලන් ඒක රාශිවෙලා තමයි මේ තීරණ ගන්නේ. දැන් ඒක පවා ඒ ගොල්ලන් බලන්නේ ඇවිල්ලා තමන් යටතට ගන්න. එක එක උප්පරවැට්ටිවලින්. ඒත් ඒක ව්‍යාර්ථ වෙලා තියෙනවා. එතකොට ඒ ගොල්ලන් බලන්නේ සමාජය තමන්ගේ Control එකට ගත්තොත් ඒ චින්තනය දිගටම ගෙනියන්න පුළුවන් කියන මතයක් තියෙන නිසා උලමා සභාවේ

FAIR COMMENT
BY JEZEEM

ඒ පුටු වල හරි නැත්නම් ඒ ගොල්ලොන්ගේ බලය හරි ඒකට රජය යම් කිසි දායකත්වයක් මත හෝ වෙනස් විය යුතුයි.

ප්‍ර : ඒ කියන්නේ දැනට උලමා සභාවේ ඉන්නේ ඔය තවුහිද් ජමාත්, තබ්ලික් ජමාත්, ජමාතේ ඉස්ලාමී කියන අර වහබ්වාදයත් එක්ක යන ආගමික අන්තවාදී මතධාරී මුස්ලිම් මවුලවිවරුන් බහුතරයක්?

පි : ඔව් ඒ කියන්නේ වක්‍රව හෝ දැන් මම අර ඉදිරිපත් කරපු ලංකාවේ ඉදිරිපත් කරපු පොඩි ළමයින්ගේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කළා. වෙනස් කරන්න ඕනේ යම් කිසි දෙයක් වෙනසක් අවශ්‍ය නම් විතරයි. ඒකේ වැරැද්දක් තියෙනවා නම් විතරයි. එතකොට තමන්ගේ වාසියට මේ හැමදෙයක්ම මේ ගොල්ලන් වෙනස් කර ගෙන සමාජය තමන්ගේ ආධිපත්‍යට හසුරුවා ගැනීම තමයි තියෙන්නේ. එතකොට ඒ හසුරුවා ගැනීම ආණ්ඩුවට ගිලිහෙනවා මුස්ලිම් සමාජයේ තියෙන අර මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශය හරහා කර ගන්න පුළුවන් තියෙන ඒ ගනුදෙනු ටික. ඒ කියන්නේ ඇවිල්ලා ඒ යම් කිසි වැඩසටහන් ක්‍රියාත්මක කරනවා නම් ඒක ආණ්ඩුව හරහා මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශය හරහා මුස්ලිම් ජනතාවගේ තීන්දු තීරණ ගතයුතුයි කියන එක තමයි මම ඉදිරිපත් කරන්නේ.

ප්‍ර : දැන් මේ අරාබි පාසල් සහ මද්‍රසා පාසල් විශේෂයෙන්ම මෙම නිකායන්ට මේ තවුහිද් ජමාත්, තබ්ලික් ජමාත් සහ ජමාතේ ඉස්ලාමීක් එම පාසල් දැඩි නියාමනයකට ලක්විය යුතුයිද?

පි : ඔව්

ප්‍ර : සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ටත් තියෙනවනේ අරාබි පාසල්?

පි : අරාබි පාසල් ඒ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ටත් මේ තිබුණු සාම්ප්‍රදායික පාසල් පවා ඒ ගොල්ලො බලය අල්ලා ගෙන තියෙනවා. එතකොට එකේ තියෙන පරණ නිසාමියා අධ්‍යාපන ක්‍රමය කියලා තියෙනවා පිරිවෙන් අධ්‍යාපනයට. එතකොට ඒ syllabus එක ගෙනල්ලා මේක සංස්කෘතික අමත්‍යාංශය හරහා මේවා ටිකට syllabus හදලා අධ්‍යාපන අමාත්‍යාංශයත් එකතු වෙලා syllabus හදලා මේවාට යම් කිසි නිගමනයකට එළඹෙන්න ඕනේ.

ප්‍ර : එතකොට ඔබට කියන්නට පුළුවන්ද දැන් ඔය අන්තවාදී දේශකයන් ඇවිල්ලා දේශනා පැවැත්වීම සහ අන්තවාදී ආගමික මතධාරී අරාබි පාසල් සහ මද්‍රසා නියාමනය කිරීම තුළින් ශුද්ධ වූ කුර්ආනයයි හදීස් සහ සුන්නා ඉස්ලාම් භක්තිකයන්ගේ දරුවන් කුඩා කාලයේ සිටම අධ්‍යයනය කිරීම තුළින් මෙම කණ්ඩායම ආගමික අන්තවාදයකට යෑමට ඉඩ තිබෙනවද නැද්ද?

පි : පිටරට දේශකයන් ගෙන්වලා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නෑ. පිටරට දේශකයන් ගෙන්වන එකත් නතර කරනවා. ඊට පස්සේ ඔය අන්තවාදී syllabus තියෙනවනේ අරාබි පාසල්වල. ඒවත් නියාමනය කරනවා ඔබ සඳහන් කරපු ආකාරයට. එහෙම කරලා ශුද්ධ වූ කුර්ආනයයි හදීස් සුන්නා ඒවා නිදහසේ ඉගෙන ගන්නට අවස්ථාව ලබා දෙනවා ඔය අරාබි පාසල්වලට යන ඉස්ලාම් දරුවන්ට?

පි : ඔව්.

ප්‍ර : කාලයාගේ ඇවෑමෙන් ඔවුන් කුඩා කාලයේ සිටම මේ පොත් අධ්‍යනය කරනවනේ. එතකොට ඔවුන් කිසියම් අවස්ථාවකට ගියාම ඔවුන්ට ඉබේම කාගේවත් බලපෑමක් නැතුව ස්වයං අභිප්‍රේරණයක් වෙලා ආගමික අන්තවාදීන් වෙන්නට ඉඩ තිබෙනවද?

පි : ඒක ඇවිල්ලා අන්තර්ජාල පරිශීලනය තුළින් වෙනන් ඉඩ තියෙනවා. ඒ කියන්නේ මෙතනින් ඇහුරුණාට වැඩක් නෑ අන්තර්ජාලය තුළට ඔවුන්ට ප්‍රවිශ්ට වීමට අවස්ථාවක් තිබ්බොත් ඒවාට block නැවැත්තුවොත් ඒ කියන්නේ ඒ වගේ දේවල් බැරියස් තිබ්බේ නැත්නම් එතකොට ඒ ගොල්ලන්ට පුළුවන් වෙනවා තව වැඩිදුර පරිශීලනය අන්තර්ජාලය හරහා ඉගෙන ගන්න. එතකොට අන්තර්ජාලය හරහා ලෝකයේ තියෙනවා TV Channels තියෙනවා Frees TV ලංකාවේ තිබ්බනේ. එතකොට ඒවා ඒවාත් තහනම්

ප්‍ර : නියාමනය වෙන්න ඕනේ?

පි : චීනයේ ඒ ක්‍රමය සිද්ධ වෙනවා මං දන්න තරමින්.

ප්‍ර : මොකක්ද චීනයේ වෙන්නේ?

පි : ඒ කියන්නේ අන්තවාදී මතවාද දැන් වට්ස් ඇප් පවා සාමාන්‍යයෙන් චීනයේ use කරන්න අමාරුයි. එතකොට ඒ වගේ බැරියස් තියෙනවා. එතකොට ලංකාවෙත් ඒ වගේ බැරියස් ටිකක් මේ ඒ අන්තවාදී blocks වලට යොමු කළොත් අපිට යම් කිසි පාලනයකට ඒක ගෙන්න පුළුවන් කියලා කියලා කියන්න පුළුවන්.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබට කියන්න පුළුවන්ද ඉස්ලාම් ධර්මය හා කතෝලික ධර්මය අතර යම් කිසි ගැටුමක් තියෙනවද ඒ ගැටුම කතෝලික දේවස්ථානවලට ප්‍රහාරයක් එල්ල කිරීමට හේතු වුවාද කියලා?

පි : නෑ මම අර මුලින් සඳහන් කළා වගේ කුරුස යුද්ධ සම්බන්ධ ඉතිහාසයක් තියෙනවනේ මුස්ලිම් ජනතාව සහ කතෝලික

FAIR COMMENT — BY JEZEEM —

ජනතාව අතර . එතකොට සහරානුත් කතා කරන්නේ අර කුරුස යුද්ධය සහ අර ජාත්‍යන්තරව සිද්ධ වුණු යම් කිසි අර නවසීලන්තයේ සිද්ධ වුණු යම් කිසි දේවල් මුල්කර ගෙන තමයි කතා කරන්නේ. එතකොට ලංකාව තුළ එවැනි ප්‍රශ්නයක් නෑ. මුස්ලිම් ජනතාව සහ කතෝලික ජනතාව අතර. ආගමික වශයෙනුත් එහෙම දෙයක් නෑ. ආගම් දෙකම හරියට එක හා සමානව වචනවල වෙනස්කම් විතරයි තියෙන්නේ. සමහරක් ඒ ගොල්ලන්ගේ මේ වත්තුවරුන්ගේ නම් අපේ ආගමෙත් තියෙනවා. අපි ජිබ්රිල් කියනවා ඒ ගොල්ලන් ජෙබ්රිල් කියනවා. ඒ වගේ සමගාමී වෙන මට්ටමේ කිතුනු දහමයි ඉස්ලාම් දහමයි අතර තියෙනවා හැරෙන්න මේ ගොල්ලන් අර කුරුස යුද්ධය කියන මානෘකාව දැන් හමාස් සටන වගේ පලස්තීන් සටන වගේ කුරුස යුද්ධ මානෘකාවන් මේ අරගෙන කතා කරනවා. අර මම කලින් සතියේදී අර සිලුවි යුත්තන් කියල පොතක් සම්බන්ධව පොතක් හෙළිදරව් කළානේ. අර ජමාත් අන්සර් සුන්නත් මොහොමඩියා සංවිධානයෙන් වහාබි සංවිධානයෙන් ඒ පොත මුද්‍රණය කරලා තිබ්බා. එතකොට ඒ වගේ මානෘකා යටතේ මේ සංවිධාන කතා කරනවා. ඒ කතා කිරීම තුළින් තමයි වර්තමානයේ දී ඔය ඇමරිකාවේ තියෙන දේශපාලනයයි ඒකට කිතුනු දහම සම්බන්ධ කර ගෙන ඒ භූගෝලීය දේශපාලනය ආගමට සම්බන්ධ කර ගන්නවා. ඒ සම්බන්ධ කරලා මේ කතා කරලා ඒ ගොල්ලන් මේ තරුණයන්ව වැරදි මාර්ගයට පැමිණවීමේ ප්‍රවණතාවය තමයි තියෙන්නේ.

ප : ඒ කියන්නේ භූ ගෝලීය දේශපාලනයත් මේ ප්‍රහාරය හේතු වුවා කියලද ඔබ කියන්නේ ?

පි : ඔව් ඒ නිසානේ සහරාන් දැන් ඔය කියන්නේ දැන් භූ ගෝලීය වශයෙන් අර නවසිලන්තයේ සිද්ධ වුණු ප්‍රහාරය. ඒක අපිට අදාළ දෙයක් නෙවෙයි. එතකොට ඒක නවසීලන්තයට අදාළ දෙයක්. ඒක නවසීලන්තයේ තරුණයෙක් විසින් කරපු දෙයක්. එතකොට ඒක ලංකාවට අදාළ නෑ. ඒ වුනාට ලංකාවේ තියෙන අර මේ දැන් භූගෝලීය දේශපාලනය පරිසරයට වෙන වෙන සංවිධාන ඔය කියන දැන් ඒ ගොල්ලන්ට යම් කිසි කෙනෙක් මඟ පෙන්වලා ඇතිනේ. යම් කිසි අදිසි හස්තයක් මඟ පෙන්වලා ඇතිනේ. එතකොට ඒ ගොල්ලන් මේ සහරාන් කතා කරන මානෘකාව හෝ වෙන යම් දේවල් බලලා mortivate කරලා ඒ ගොල්ලන් කියන දේ මොකක්ද නවසීලන්තයට ඕගොල්ලොන්ට කතෝලික ජනතාව ගහපු නිසා ඕගොල්ලන් ලංකාවේ කතෝලික ජනතාවට ගහන්න. නැත්නම් වෙන පලස්තීන් සටන පෙන්වනවා.

FAIR COMMENT BY JEZEEM

නැත්නම් මොකක් හරි දෙයක් කතා කරලා ඒ ගොල්ලන්ව නොමඟ යවන චින්තනයක් තමයි තියෙන්නේ භූ ගෝලීය දේශපාලනය හසුරුවන අදෘශ්‍යමාන බලවේග.

ප්‍ර : එතකොට සහරාන් සෑම අවස්ථාවකදීම ඔහුගේ ප්‍රකාශන මඟින් විවේචනය කළේ බෞද්ධ භික්ෂූන් ඥාණසාර හාමුදුරුවෝ වැනි ස්වාමීන් වහන්සේලා විවේචනය කරමින් ඒ අනුව ඔවුන් දැඩි තීරණ ගන්න ඉදිරියට කරන්න ඕනේ කියලා කිව්වා. නමුත් ඔවුන් බෞද්ධ ජනතාව නෙවෙයි කතෝලික ජනතාව එල්ල කරලා තමයි ප්‍රහාරය එල්ල කළේ. එයට හේතු වුණේ මොකක්ද?

පි : ඒකට හේතුව අර භූගෝලීය පිහිටීම තමයි. ඒ කියන්නේ ISIS සංවිධානය ලංකාවේ මේ දැන් බෝම්බ පිපිරීම ලංකාවේ ISIS එකේ Control එකක් තියෙනවා. ISIS එකෙත් ලංකාවේ Branch එකක් තියෙන විදිහටනේ ඒ ගොල්ලන් වැරදි මතයක් ආරෝපණය කරන්න ගියේ. ඒ කොඩි ඔක්කොම දාගෙන. එතකොට ඒ ගොල්ලන් බලන්නේ ඇවිල්ලා ලංකාව තුළ බෞද්ධ ජනතාවට ප්‍රහාරයක් එල්ල කරනවට වඩා ජාත්‍යන්තර අවධානය දිනා ගන්න පුළුවන් ඇවිල්ලා කතෝලික දේවස්ථානයට ප්‍රහාර එල්ල කිරීමෙන් ලංකාවට එන්නේ විදේශීක සංචාරකයන් බොහොමයක් කතෝලිකයන්. එතකොට ඒ කතෝලික රටවල්වලින් තමයි එන්නේ. එතකොට ඒක ඉලක්ක කර ගෙන ලංකාවේ ආර්ථිකයට එල්ල කරපු ප්‍රහාරයක් ඒක සහරාන්ලා දැනුවත්ව නොදැනුවත්ව කියන එක මම ප්‍රකාශ කරන්න අමාරුයි.

ප්‍ර : එතකොට අවසාන වශයෙන් ඔබට කියන්න පුළුවන්ද මෙම ප්‍රහාර වලට ආර්ථික හා දේශපාලන හේතූන්ද ,ආගමික හේතූන්ද හේතු වුණේ කියලා?

පි : ඒ කියන්නේ අදෘශ්‍යමාන වශයෙන් තිබිලා තියෙන හේතුව තමයි ආර්ථික හා දේශපාලන හේතුව. එතකොට සමාජයට පෙන්වලා ගත්ත හේතුව තමයි ආගමික පදනම.

****

දැන් වේලාව : ප.ව. 04.30 යි.
මෙතැන් සිට ල/ලේ :- සවිනි මෙය.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව. 04.30
පෙර සටහන් ගැනීම: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>ගරු සභාපති විනිසරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යය ද යන්න අති උතුම් මැල්කන් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාගෙන් විමසමි. අවශ්‍යය බව ප්‍රකාශ කරයි. අවස්ථාව ලබා දෙයි.

****

<u>ජනාධිපති නීතිඥ ශම්ල් ප්‍රනාන්දු මහතා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබගෙන් අන්තිම ගරු කොමිෂන් සභාවේ අහපු ප්‍රශ්නයට ඔබ කිව්වා පොතක් සම්බන්ධයෙන් ඔබ ඉදිරිපත් කරපු පොතක් සම්බන්ධයෙන්. ඒ පොතද IAKR 02 ක ?

උ: ඔව්.

ප්‍ර: දැන් මේ පොත ලියලා තියෙන්නේ කවුද?

උ: මේ පොත ලියලා තියෙන්නේ මේක සංවිධානයක් විසින් තමයි පොත ලියලා තියෙන්නේ. ලංකාවේ මුලින්ම ආපු වහාබි සංවිධානය. ජමාතු අන්සාරි සුන්නත් මොහොමදියා. කුරුණෑගල පරගදෙණිය තමයි තියෙන්නේ. සහරාන් ඒ අවට වාසය කරපු ප්‍රදේශය තමයි. පරගදෙණිය. එතකොට මේක ලියලා තියෙන්නේ ශමීන් රමලාන් සලෆි කියන පුද්ගලයා. සලෆි කියන්නේ අර සලෆි මතවාදය වෙනුවෙන් පෙනී සිටින ලෙස එයාගේ අගට නමට සලෆි යන වචනය දාලා තියෙනවා. එතකොට මේකේ සඳහන් කරන ඔක්කොම ඇවිල්ලා කුරුස යුද්ධය සම්බන්ධව. මුස්ලිම් ජනතාව සහ කතෝලික ජනතාව අතර කුරුස යුද්ධය ගැන.

ප්‍ර: දැන් බලන්න ඒ පොතේ අංක iii ඒ අංක iii නේ 4 වන සහ 6 වන ඡේද මොකද්ද ඒකේ සඳහන් කරලා තියෙන්නේ?

උ: ඒ කියන්නේ ඉස්ලාමිය සමාජය ආයුධ වශයෙනුත් චින්තන වශයෙනුත් ගොඩාක් යුද්ධ වලට .

ප්‍ර: දැන් මම මෙහෙම කිව්වොත් කුරුස යුද්ධය ඉවර වුණාට තවමත් ඉස්ලාමික බැතිමතුන් සහ කිතුණු බැතිමතුන් අතර යුද්ධය පවත්වාගෙන යනවා තවමත්. එහෙම නේද සඳහන් කරලා තියෙන්නේ?

උ: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ කුරුස යුද්ධ අවසන් වෙලා අවුරුදු ගාණක් ගිහිල්ලා තවමත් ඉස්ලාම් බැතිමතුන් සහ ක්‍රිස්තියානි බැතුමතින් අතර යුද්ධය තවමත් පවත්වාගෙන යනවා?

FAIR COMMENT BY JEZEEM

උ: මේ පොතෙන් ඩයිවට් කරනවා මේක ඇවිල්ලා සාමන්‍යය ක්‍රිස්තියානි ජනතාව පලස්තීන ප්‍රශ්නයට සම්බන්ධ කරගෙන. දැන් පලස්තීන වැසියන්ටත් ක්‍රිස්තියානි ජනතාවටත් ප්‍රශ්නයක් තිබෙනවා යුදෙව් ජාතිකයන් සම්බන්ධ ගැන. අර ඇදහිලි ඒ පලස්තීනයේ තියෙන දේවස්ථාන සම්බන්ධව ඒ ඒ මෙතැන ඒ සම්බන්ධ කරලා තමයි මේ කතා කරන්නේ. ඒ කියන්නේ මේ සටන ඉවර නැහැ කියන එක.

ප්‍ර: දැන් බලන්න ඊට අමතරව 96 වන පිටුවේ 3 වැනි ඡේදය?

උ: ලෝකේ විනාශ වෙනකම් යුද්ධය තියෙන එක.

ප්‍ර: ලෝකේ විනාශ වෙනකම්ය මේ යුද්ධයත් තියෙනවා කියන එක. එතකොට බලන්න අන්තිම ඡේදය ඒක තියෙන්නේ 98 වන පිටුවේ අන්තිම ඡේදයේ මොකද්ද සඳහන් වෙලා තියෙන්නේ?

උ: සහරාන් කියපු දේ තමයි කියන්නේ.

ප්‍ර: මොකද්ද කියන්නේ?

උ: ඒ කියන්නේ මෙච්චර දේවල් අපිට සිද්ධ වෙලා ඉන්න කොට අපි මොනවද කරන්නේ. ඒ කියන්නේ අපි නිහඬව ඉන්නවා කියලා ඉන්නවා වක්‍රව කියන්න එන්නේ. ඒකට අපිට මුහුණ දෙන්න අපි ළඟ තියෙන්නේ මොනවද සුදානම. ඒ කියන්නේ උත්තර බදින්න අමාරු ප්‍රශ්න තමයි මේවා කියලා අවසන් කරනවා.

ප්‍ර: අවසන් කරන්නේ මුස්ලිම් ජනතාවට කියනවා නැගිටින්න කියලා නේද?

උ: ඔව් අනිවාර්යෙන්.

ප්‍ර: මෙහෙම ඉන්නෙ නැතුව නැගිටින්න. මේ යුද්ධය කරගෙන යන්න ඕන කියලා ?

උ: ඔව් වක්‍රාකාරව දෙනවා අදහස.

ප්‍ර: දැන් මේ පොත බලන්න ix අංක 3 වන ඡේදය බලන්න.

උ: ඒ කියන්නේ මේක ඇවිල්ලා ඉස්ලාමීය ඉතිහාසය ඒ සිද්ධ වුණු කුරුස යුද්ධය ගැන දැනගන්න ඉන්න කට්ටියත් උසස් පෙළ අර ඉස්ලාමීය තාහරීහම් ගැන සඳහන් කරා අපි පොතක් ගැන ඒක ගැන වුණත් මේක හොඳ පොතක් කියලා කියනවා.

ප්‍ර: ඔය කියන්නේ උසස් පොළ විභාගය හදාරණ සිසුන්ට මේ පොත හොඳ පොතක් කියලයි සඳහන් කරලා තියෙන්නේ. එහෙම නේද?

උ: ඔව් එහෙමයි.

ප්‍ර: ඒ වගේම දැන් මේ පොතේ මුල තිබෙනවා IS BN කියලා ?

උ: ඔව්.

ප්‍ර: ඒ IS BN කියන්නේ මේක ලියාපදිංචි විශේෂිත පොතක් කියලා එහෙම නේද?

උ: ඔව්.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මම ඔබට කිව්වොත් මෙම පාස්කු ප්‍රහාරය කිතුණු ජනතාව ඉලක්ක කරගෙන කිරීමට මේ පොතේ සඳහන් දේවල් අනුව ඒ අනුව නේද සිද්ධ වෙලා තියෙන්නේ?

උ: අනිවාර්යෙන්ම.

ප්‍ර: ලංකාවේ එහෙම නේද?

උ: ඔව්. සහරාන්ගේ මල්ලි හරි අර සමන්තුරේ බෝම්බ පිපිරීමේ දී අවසාන වශයෙන් කියනවා නේ සිලවෙයි කාරල්හල් කියලා මෙහෙම ඇඟිල්ල දික් කරලා කියන්නේ කුරුසකාරයනි කියලා .කුරුසකාරයනි කියලා දබර ඇඟිල්ල දික් කරලා ඔහු කතා කරනවානේ මරාගෙන මැරෙන්න කලින්.

ප්‍ර: ඒ මොකද්ද ඒකේ තේරුම?

උ: ඒ කියන්නේ ඇවිල්ලා ඕගොල්ලන්ත් එක්ක තමයි අපේ සටන තියෙන්නේ. අපි ඔබලවා විනාශ කරනවා කියලා වචනයක් පාවිච්චි කරනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

කොමිෂම් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්ය සම්බන්ධයෙන් දැක්වූ දායකත්වයට සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තූතිය පල කරනවා.

සාක්ෂිකරු ලබාදුන් සාක්ෂිය හේතුවෙන් 2015 අංක 4 දරණ අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 25 (4) උපවගන්තිය ප්‍රකාරව සාක්ෂිකරුට හිමිවිය යුතු අයිතීන් සහ වරප්‍රසාදයන් සාක්ෂිකරුට ලබා දෙන ලෙසට අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහායදීමේ සහ ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත කොමිෂන් සභාව නියෝග කරන අතර එකී ඉල්ලීම මෙම සාක්ෂිකරු විසින් එකී අධිකාරිය වෙත ඉදිරිපත් කළ පසු ඒ සම්බන්ධයෙන් ගන්නා ලබනු ක්‍රියාමාර්ග ලිඛිතව රහස්‍යය ලෙස කොමිෂන් සභාවේ ලේකම්ට දන්වන ලෙසට ද එකී අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්වරයා වෙත නියෝග කරමි.

සාක්ෂිකරු මුදාහරී.

වේලාව: ප.ව. 04.40

කොමිෂන් සභාවේ කටයුතු පස්වරු 05.00 තෙක් කල් තබමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශයේ නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.07.18 වේලාව: ප.ව.05.40

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා (පැමිණ නැත.) -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින නීතිඥ ශමිල් ප්‍රනාන්දු මහතා සමඟ නීතිඥ රවිශානි පිරිස් මහත්මිය සහ නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය පෙනී සිටී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වැඩිදුර සාක්ෂි මෙහෙයවීම.

නම : ලලිත් ප්‍රියන්ත වතුදුර.

ප්‍රතිඥා දී කැඳවයි.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: ප්‍රියන්ත මහත්මයා ඔබ මීට කලින් දිනයේ මේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් සඳහන් කරා කොහොමද ඉස්ලාම් ආගම විසින් ඔවුන්ගේ ආගම පතුරවන්නේ කුමන ආකාරයෙන් ද කියන එක ඔබ පැහැදිලි කරා නේද?

උ: ඔව්.

ප්‍ර: එය ආකාර දෙකකින් ඔබ පැහැදිලි කරා පියවර තුනකට කඩලා කොළ පාට තීරුව සහ දුඹුරු පාට තීරුව වශයෙන් එහෙම කිව්වොත් නිවැරදිද?

උ: ඔව්.

ප්‍ර: කොළ පාට තීරුව කියන්නේ ඔවුන් සාමකාමීව තමන්ගේ ආගම පතුරවන ආකාරය තමයි ඔබ කොළ පාට තීරුවෙන් ?

උ: මූලික අවධිය.

ප්‍ර: දෙවන තීරුවෙන් මොකද්ද දැක්වෙන්නේ?

උ: දෙවන තීරුවෙන් දැක්වෙන්නේ ඔවුන් මූලික අවධියෙන් තිබෙන ඉස්ලාමික ආගමික ඉගෙන්වීම අනුසාරයෙන් ප්‍රසාරණය වෙලා ස්වදේශීක අන්‍යාගමික සමාජයකට අභියෝග කරන්නට පුළුවන් බලයක් ගොඩනගාගත් පසුව කාලය සහ ඒකට අදාළ ඉගැන්වීම් සහ ස්වභාවය.

ප්‍ර: එතකොට ස්වදේශීක අන්‍යාගමිකයින්ට බලපෑම් කිරීමට අදාළ වූ කුරාන පාඨයන් උදාහරණ ද සමඟ ඔබ ගිය දිනයේ පැහැදිලි කරා කිව්වොත් නිවැරදිනේ?

උ: ඔව්.

ප්‍ර: ඒ අනුව ඔබ අවසාන වශයෙන් ඔවුන් සහජීවනය කියන එක ගැන කතා කරත් කුරානයේ සහජීවනයට තියෙන තැන ගැනත් විස්තරාත්මකව කතා කරා කිව්වොත් නිවැරදි?

උ: ඔව්.

ප්‍ර: ඒ අනුව ඔබට පැහැදිලි කරන්න පුළුවන් ද මේ ගරු කොමිෂන් සභාවට මේ අල්ටකියාව කියන සංකල්පය සම්බන්ධයෙන් ?

උ: පුළුවන්.

ප්‍ර: දැන් ඔබ මේ කීවෙනි slide එකද ගරු කොමිෂන් සභාවට පෙන්වා සිටින්නේ?

උ: 43 වැනි slide එක.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: දැන් මේ ඉස්ලාමීය ආගමේ තියෙන අල්ටකියා කියන සංකල්පය සරලව පැහැදිලි කරන්න මේ ගරු කොමිසන් සභාවට?

උ: මට එය සරල විග්‍රහ කරලා පැහැදිලි කරන්න පුළුවන් අල්ටකියා යනු ඉස්ලාම් විසින් මුස්ලිම් නොවන සමාජයක් ඉස්ලාමයට සම්පූර්ණමය යටත් කරගන්නා ක්‍රියාවලිය එනම් අල්ලාහ්ගේ මාර්ගය. The course of Allah සාර්ථකව නිම කර ගන්නා තුරු එම සමාජය තුළ තම ඉස්ලාමීය බලය සහ පිරිස ප්‍රසාරණය කරගැනීමට සහ ඊට සමගාමීව එම මුස්ලිම් නොවන සමාජ දුර්වල කොට එහි විනාශය කරා හැසිරිවීම යනු උපායමාර්ගික අරමුණු මූලික කරගනිමින් ඉස්ලාමයේ අවසාන අරමුණු එහි සත්‍යය ස්වභාවය සහ එහි ඇති විනාශකාරී ඉගැන්වීම් මේ සියල්ල එම මුස්ලිම් නොවන සමාජයෙන් ඉතා සංවිධානාත්මක සහ උපක්‍රමශීලිව සඟවා තබා ගැනීමේ ක්‍රමවේදයයි.

ප්‍ර: දැන් ඔබ මේ කොමිෂන් සභාවට ඉදිරිපත් කරපු අල්ටකියා කියන සංකල්පයේ අර්ථ දැක්වීම ඔබ කොහෙන්ද හොයාගත්තේ?

උ: මෙය මා ඉස්ලාමීක අල්ටකියා න්‍යායට අදාළ ඉගැන්වීම් සහ හදීස් සුන්නා ඒ ආදිය පරීශීලනය කරලා ඒ අනුව තමයි මම මේ නිගමනයට එළඹෙන්නේ.

ප්‍ර: ඒ අනුව මෙය ඔබ විසින් ඔබගේ අධ්‍යනය තුළදී හොයාගත් අර්ථ කථනයක් මිස කුරානයේ හෝ හදීස් වල සෘජුවම දැක්වෙන අර්ථ කථනයක් නෙවෙයි කිව්වොත් හරිද?

උ: සෘජුවම දැක්වෙන්නේ නැහැ මේ විදියට නමුත් මේ තමයි එකේ එසෙන්ස් එක.

ප්‍ර: ඔබට දැන් පැහැදිලි කරන්න පුළුවන් ද මේ අල්ටකියා කියන සංකල්පය කොහොමද දෙවන අවධියේ දී සහ පළවෙනි අවධියේ දී මුස්ලිම්වරු යොදාගන්නේ කියලා?

උ: පළවැනි අවධියේ දී ඔවුන්ගේ ඉගැන්වීම් සාමකාමී. එහෙම ඒ සාමකාමී ඉගැන්වීම් අනුසාරයෙන් මම කිව්වා ඒ ගොල්ලෝ ප්‍රසාරණයට මගපාදා ගන්නවා සහ ස්වදේශීක අන්‍යාගමික ජනතාවට අභියෝග කළ හැකි බලයක් ඔවුන් ඒ හරහා ගොඩනාගා ගන්නවා කියලා. ඊට පස්සේ මේ ඉස්ලාමීක ගමන් මගේ අනිවාර්ය අංගයක් වෙන්නේ ඒ ස්වදේශීක සමාජයට එරෙහිව භීෂණය සහ බලහත්කාරකම ත්‍රස්තවාදී වැනි දේ දියත් කිරීමයි. එහෙම නැතුව ඒ ගමන් මගේ ඒ ගොල්ලොන්ට මග නතර වෙන්න බැහැ. ඒ ඉස්සරහාට යෑමට අවශ්‍යය නිසා ඒ ඒ එවැනි වූ ක්‍රියාදාමයන් සහ එවැනි වූ දෙවන කොටස අයත් වූ ඉගැන්වීම් භාවිතා කිරීම අනිවාර්ය වෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ අනුව ඔබ මෙහි දී මොකද්ද ඉදිරිපත් කරන්නේ Deliberate lying and deceiving for the benefit of Islam මේ අල්ටකියා සංකල්පයම නේද ඔබ පැහැදිලි කරලා තියෙන්නේ?

උ: ඔව්. ඒ අල්ටකියා සංකල්පය ටිකක් අපිට අලුත් දෙයක් නිසා අපි ඒකට අවශ්‍යය සාධක තමයි මම මේ ඔහ ඉදිරියේ සාක්ෂි දෙන්න සුදානමින් ඉන්නේ.

ප්‍ර: ඒ කියන්නේ අල්ටකියා භාවිතා කරපු අවස්ථා සම්බන්ධයෙන් උදාහරණ ද ඔබ පෙන්වන්නේ?

උ: අවස්ථා සහ උදාහරණ එහි විග්‍රහයන් සහ ඒකට අදාළ කුරාණික ඉගැන්වීම් සහ හදීස් සුන්නා වාර්තා.

ප්‍ර: අපි යන්කොා මුලින්ම ඒ සම්බන්ධයෙන් කුරාණික ඉගැන්වීම් වලට?

උ: මම මුලින්ම Reliance of the Traveler Sharia පොතෙන් ගන්නද.

ප්‍ර: ඔබ මේ දැන් පැහැදිලි කරන්නේ 45 වන side එක.

උ: ඔව්.

ප්‍ර: දැන් ඔබ මේ සඳහන් කරන මුස්ලිම්වරුන් සඳහා වන ඉස්ලාමික ෂරියා නීතිය. නැත්නම් Reliance of the Traveler කියන කෘතිය. ?

උ: ඔව්.

ප්‍ර: මේ කෘතිය මොකද්ද මහත්මයා?

උ: මේක තමයි ඉස්ලාමික නීති පොත.

ප්‍ර: ඔබ සතුව අද තියෙනව ද ඒක?

උ: ඔව්.

ප්‍ර: ඔබට පැහැදිලි කරන්න පුළුවන් ද මේ ග්‍රන්ථය මොකද්ද කියන එක?

උ: මේක තමයි මුස්ලිම් ආගමේ නීති මාලාව අන්තර්ගත වෙලා තිබෙන නීති පොත. එහෙම නැත්නම් ෂරියා නීති පොත.

ප්‍ර: කවුරු විසින් ඕක සකස්කරලා තියෙන එකක්ද?

උ: මේක ඇත්ත වශයෙන්ම ලියලා තියෙන්නේ අහමඩ් ද ඉබන් නකීෆ් අල් මිෂ්රි කියන පුද්ගලයා. මේකට පාදක කරගන්නේ ඒ අය සම්පූර්ණයෙන්ම 100% ක්ම කුරාණයේ ඉගැන්වීම් හදීස් සහ සුන්නා ඉගැන්වීම් අර මම කියපු ඉස්ලාමයේ මුලාශ්‍ර තත්ත්වයමයි. මෙතැනදි වෙන්නේ මුල් කාල පරිච්ඡේදයේ දී ඒ ගොල්ලෝ ෂරියාව සම්බන්ධයෙන් එතරම් සැලකිල්ලක් දක්වන්නේ නැහැ. ආගමික ඉගැන්වීම් අනුසාරයෙන් පමණක් ඒ ගොල්ලොන්ගේ ගමන යන නිසා. නමුත් දෙවන සහ තුන්වන අවස්ථාවට ඒ අයට නීතිය අත්‍යඅවශ්‍ය වෙනවා. ඉතිං විශේෂයෙන්ම අර මම පෙන්වපු Cpolat එකේ point of law return එකෙන් පස්සේ පස්සේ ඒ අය අපේ ස්වදේශික අන්‍යාගමික සමාජයේ බලය ස්ථාපිත කරගත්තයින් පස්සේ ඒ අයට තව දුරටත් අපිත් එක්ක ආගමික ඉගැන්වීම් අනුව ගනුදෙනු කිරීමටත් අවශ්‍යතාවයක් ඇති වෙන්නේ නැහැ ඒ

FAIR COMMENT — BY JEZEEM —

වෙනුවට මට ඒ ගොල්ලෝ මේ නීතිය භාවිතා කරනවා ඒක නීතිය ඊට වඩා බලවත් නිසා.

ප්‍ර: දැන් ඔය Reliance of the Traveler කියන ග්‍රන්ථයේ එන ෂරියා නීතිය ඔය කෘතියේ ආකාරයටම යම් කිසි විදියට බලපවත්වන රටවල් තියෙනව ද?

උ: සවුදි අරාබියාව මට කියන්න පුළුවන්. ඊට පස්සේ ඉරානය, බූනායි, සවුදි අරාබියේ සම්පූර්ණ වශයෙන් බලපවත්වනවා. ඊට අමතරව සියළුම ඉස්ලාමික රටවල් අඩුවැඩි වශයෙන් මේ ෂරියා නීතිය ඒ අයගේ නීතිය හැටියට භාවිතා කරනවා.

ස්වාමිනි ඒ අනුව සාක්ෂිකරු විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන අහමඩ් ඉබන් නකීෆ් අල්මිස්රි විසින් රචිත Reliance of the Traveler A **Classic Manual of Islamic Secret Law යන ග්‍රන්ථය අමානා publication විසින් public කර ඇති ග්‍රන්ථය මෙම ග්‍රන්ථය C 866 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට ගෞරවයෙන් අවසර පතමි.**

ප්‍ර: දැන් ඔබට පැහැදිලි කරන්න පුළුවන් ද කොහොමද මේ මුස්ලිම්වරුන් සඳහා වන ෂරියා නීතිය සහ අල්ටකියා සංකල්පය කොහොමද සම්බන්ධ වෙන්නේ කියලා?

උ: මුලින්ම මම අල්ටකියාව කොහොමද ඒ අය භාවිතා කරන්නේ. ඒ අයගේ වාසියට සහ ඒ ඉස්ලාමික ගමනේ දී අල්ටකියාව භාවිතායට ගන්නා විදිය ඒ ඒ ස්වභාවය පිළිබඳ අපිට අදහසක් ගන්න පුළුවන් මේ ෂරියා ලෝ එකෙන් page 745 Chapters point 2

ප්‍ර: එහි සඳහන් වෙන දේ කෙටියෙන් කියන්නකෝ මේ කොමිෂන් සභාවට?

උ: එකේ අදහස මෙහෙමයි මම ට්‍රාන්ස්ලේට් කළේ. කතා කිරීම හෝ වචන පරිහරණය යනු අරමුණු ඉෂ්ඨ කරගැනීමේ මගකි. යම්කිසි ප්‍රශංසනීය අරමුණක් ඒ කිව්වේ ඉස්ලාමික දැක්මට අනුව අත්‍යාවශ්‍යම අරමුණක්. ඇත්තකීමේ සහ බොරුකීමෙන් යන ක්‍රම දෙකෙන්ම ඉෂ්ඨ කරගත හැකිනම් ඒ බොරු කියා ඉෂ්ඨ කරගැනීම ඉස්ලාමික නීතියට පටහැනි වේ. එසේ වන්නේ එවැනි අවස්ථාවකදී බොරුකීම අවශ්‍යය සාධකයක් නොවන බැවිනි. එහෙත් එම අත්‍යඅවශ්‍යම අරමුණ ඔබට ඇත්තකීමෙන් ඉෂ්ඨ කරගත නොහැකි නම් සහ එහි ඉෂ්ඨ කරගත හැකිවන්නේ බොරුකීමෙන් පමණක් නම් එවැනි අවස්ථාවකදී ඔබට එය බොරු කියා ඉෂ්ඨ කරගැනීමට අවසර ඇත. උදාහරණයක් ලෙස දෙවියන් අවසර දී ඇති ඉලක්කයක් ඉෂ්ඨ කරගැනීමට යන ගමනේ දී ඒ සඳහා යම්කිසි බාධකයක් ඇති විට එම බාධකය මගහැර නැතිනම් නිශේධ කර අරමුණ ජයගැනීම සඳහා ඔබට අනිවාර්යෙන් බොරු කීමට අවසර ඇත. ඔබ විසින් ඉෂ්ඨ කරගත යුතු අරමුණ නැතිනම් ඉලක්කය ඉස්ලාමික දැක්මෙන් එය අනිවාර්ය නම් ඒ සඳහා බොරු කීමනම් අනිවාර්ය වේ.

LAW COMMENT BY JEZEEM

ප්‍ර: සරලවම කියනව නම් එහි තිබෙන්නේ ඒ දෙවියන් විසින් අනුමත කර ඇති ඉලක්කයක් සඳහා යන ගමනේ දී කියන්න සිදුවෙන බොරු ඒවා කීම ප්‍රශ්නයක් නැහැ කියන එක?

උ: ඔව්.

ප්‍ර: අපිට තව දුරටත් පැහැදිලි කරන්න පුළුවන් ද ඊළඟ slide එක?

උ: ඊළඟ එකෙනුත් මම Stress කරන්නේම

ප්‍ර: ඔබ තව දුරටත් පැහැදිලි කරන්නේ 46 වන slide එකෙන් අල්ටකියා කියන සංකල්පය?

උ: සංකල්පය කොහොමද මෙහි ඉගැන්වීම මුස්ලිම් අයට උගන්වන්නේ කියලා. සහී මුස්ලිම් 326303

ප්‍ර: සහී මුස්ලිම් කියන්නේ මොකද්ද?

උ: සහී කියන්නේ Authentic කියන එකයි. මුස්ලිම් කියන්නේ ඒ වාර්තා තබපු පුද්ගලයන්ගේ නම.

ප්‍ර: ඒ කියන්නේ මෙය හදීස් ග්‍රන්ථයක්?

උ: හදීස් ග්‍රන්ථයක්. ඔබ හරි.

ප්‍ර: එහි මොකද්ද සඳහන් වෙන්නේ?

උ: මොහොමඩ් නබිතුමා දේශානා කලා අවස්ථා තුනකදී සමාවෙන්න මේක හදීස් එකේ අන්තර්ගතය පමණයි මම මෙතැනට ගෙනාවේ. ඒකේ ට්‍රාන්ස්ලේෂන් එකයි මේ . මොහොමඩ් නබිතුමා දේශානා කරා අවස්ථා තුනකදී හැරෙන්නට බොරුකීම සුදුසු නොවන බව. ඉස්ලාමයේ බොරුකීම සඳහා හලාල් කොට ඇති එම අවස්ථා තුන වන්නේ එක ප්‍රශ්නයක් විසඳා ගැනීම පිණිස පුරුෂයා විසින් භාර්යාවට බොරුකීම සහ භාර්යාව විසින් එසේ කිරීම.

වේලාව: ප.ව:6.00
මෙතැන් සිට: ඉන්ද්‍රනි මිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව : ප.ව. 6.00 යි
පෙර සටහන් කළේ : සචිනි මෙය
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

රජයේ අධිනීතීඥ චතුරංග බණ්ඩාර මහතා :

ප්‍ර : ඒ කියන්නේ පුරුෂයාට සහ භාර්යාවට දෙන්නටම ප්‍රශ්න විසඳීම සඳහා බොරු කියන්න පුළුවන්?

පි : ඔව්. දෙක ගැටුම්කාරී වාතාවරණයකදී යම් පාර්ශව දෙකක් අතර ගැටුම්කාරී වාතාවරණයකදී විරුද්ධ පාර්ශවය මුලා කිරීම සඳහා බොරු කියන්න පුළුවන්. ඊට පස්සේ තුන්වෙනි එක මිනිසුන් අතර යම් ප්‍රශ්නයක් පැන නැගුණු කල එය විසඳා ගැනීමේදී එහෙම නැත්නම් විසඳා ගැනීම සඳහා බොරු කීම වේ. මෙතනදී මිනිසුන් අතර යම් ප්‍රශ්නයක් පැන නැගුණයි කිව්වහම ඒක මුස්ලිම්වරුන්ට අවාසි වන ප්‍රශ්නයක් විය යුතුයි. ඒ ඉස්ලාමික දැක්ම එහෙම තමයි තියෙන්නේ. එතකොට මිනිසුන් අතර මුස්ලිම්වරුන්ට අවාසි වන යම් ප්‍රශ්නයක් පැන නැගුණාට එය විසඳා ගැනීම කිව්වේ එයින් ගැළවීමේ උපාය මාර්ගයෙක් ලෙස. විසඳා ගැනීමේ නැත්නම් එයින් ගැළවීමේ උපාය මාර්ගයක් ලෙස බොරු කීම වේ. මේ තුන් වර්ගයට ඒ අයට බොරු කියන්න පුළුවන්. ඉතිං ප්‍රධාන වශයෙන් ඔවුන් අප ඉදිරියේ ස්වදේශික ශ්‍රී ලාංකික ජනතාව ඉදිරියේ සහ රජය, ආරක්ෂක අංශ ඒ හැම දෙයක්ම ඉදිරියේ ඔවුන් භාවිතා කරන්නේ මේ අංක 2 සහ අංක 3 යටතේ ඔවුන්ට අවසර දිලා තියෙන බොරු කීමයි.

ප්‍ර : ඒ කියන්නේ ඔවුන්ගේ ආගමෙන්ම මුස්ලිම්වරුන්ට වාසි වන පරිදි බොරු කියන්නත්, ගැටුම්කාරී අවස්ථාවලදීත් ඔවුන්ට බොරු කියන්නත් අවස්ථාව ලබා දීලා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : හරි. අපි ඊළඟ Slide එකට යමු?

පි : මේක මට Translate කරන්න බැරි වුණා.

ප්‍ර : මොකද්ද තියෙන අදහස සරළව කියන්න. ඔක්කොම කියවන්න අවශ්‍ය නැහැ?

පි : තවදුරටත් මා කියන දේ ස්ථාපිත කිරීම සඳහායි මම මේ ගෙනාවේ. මේ මූලාශ්‍ර...,

ප්‍ර : ඒ එකම සංකල්පය නම් අපිට ඉදිරියට යන්න පුළුවන්. මට හිතෙන්නේ ඔබ කියන කාරණය කොමිෂන් සභාවට පැහැදිලියි. එකම කාරණය?

FAIR COMMENT BY JEZEEM

පි : ඒක එකම කාරණය තමයි. නමුත් ස්ථාපිත වෙනවා ඒ බොරු කීම අනිවාර්යය බව.

ප්‍ර : Source එක විතරක් කියන්නකෝ බලන්න?

පි : Source එක ඇවිල්ලා ජමී අල් බයාන්, අන්ටා විල් අයි කුරාන් අල් මාරුෆ් තෆ්සීර් තබරි. මේ තබරි කියන්නේ ඒගොල්ලොන්ගේ මම අර කලින් දවසේ කිව්ව Mention කරපු ඉබන් කාතීර් කියන එයා තමයි පළවෙනියටම ඉන්න ඒගොල්ලොන්ගේ කුරාන් විග්‍රහයකයා. විග්‍රහයන් ලියලා තියෙන කෙනා. ඊට පස්සේ එනවා අල් ටබරි. අල්ටබරි කුරානය විග්‍රහ කරලා තියෙනවා. ඊට අමතරව හදීස් සුන්නා වාර්තා Record කරලා තියෙනවා. දෙවෙනියට ඉන්නේ මේ අල් ටබරි. මේ අල් ටබරිගේ එකක් තමයි මම උපුටාගෙන තියෙන්නේ.

ප්‍ර : එයිනුත් පැහැදිලි වෙන්නේ අර මුස්ලිම්වරුන්ට බොරු කීමට අවස්ථාව සකසා දෙන ව්‍යාතිරේක අවස්ථා තමයි පැහැදිලි වෙන්නේ?

පි : ඔව්. මේක කෙළින්ම සම්බන්ධ වෙනවා මම කලින් දවසේ ඔබතුමන්ලා ඉදිරියේ හෙළි කරපු කුරානයේ තුන්වෙනි සුරාවේ 28 වෙනි වගන්තියෙන් අප ඉදිරියේ කරන්නා වූ ප්‍රෝඩාකාරී මිත්‍රත්වය තහවුරු කිරීමක් තමයි මේ විග්‍රහයෙන් කරලා තියෙන්නේ.

ප්‍ර : හරි. අපි ඊළඟට යමු?

පි : යට එකෙනුත් තියෙන්නේ ඒකමයි. අර 3 වෙනි සූරාවේ 28 වෙනි වගන්තිය. වගන්තියේ කරන ඒ ප්‍රෝඩාකාරී, අප ඉදිරියේ කරන ප්‍රෝඩාකාරී ස්වභාවය මේ Sourcesවලින් ස්ථාපිත වෙනවා. ඊට පස්සේ මම හදිත් එකක් ගේනවා. ඒක කුරානයේ 5 වෙනි සූරාවේ 89 වෙනි වගන්තියේ Foot Note එකක් හැටියටත් තියෙනවා 2 වෙනි Foot Note එක හැටියට. ඒකත් මට Translate කර ගන්න බැරි වුණා. මම සිංහලෙන් ඒක කියන්නම්. මෙහෙමයි. මොහොමඩ් නබිතුමා දේශනා කරනවා මුස්ලිම්වරුන්ට ඔබට හොඳම දේ නම් පොරොන්දු නොවී සිටීමයි. නමුත් යම් හෙයකින් ඔබ පොරොන්දුවක්, යම් දෙයකට පොරොන්දුවක් වුණොත් සහ ඊට පස්සේ ඒ පොරොන්දුවට ඒ වෙච්ච පොරොන්දුවට වඩා වාසිදායක හෝ හොඳ දෙයක් ඔබට පෙනුණොත් ඔබට මුස්ලිම්වරයෙකු හැටියට ඔබට පුළුවන් කියලා ඒ පොරොන්දුව අමතක කරලා දාලා අර ඔබට හොඳ දේ කරන්න.

ප්‍ර : ඊට පස්සේ නැවතත්?

පි : දෙවෙනියට තියෙන්නෙත් බුහාරි, අල් බුහාරි විසින් මේකත් සහි එකක්, Authentic එකක්, එයා Record කරපු එකක්. මේකේදී අලී

FAIR COMMENT BY JEZEEM

කියන්නේ නබිතුමාගේ බෑණනුවන් සහ හතරවන කාලිෆ්වරයා. එතකොට එතුමා එවැනි වූ නායකයෙක් කියන දෙයක් මේ. එතුමාගේ මේ ඒ හදීත් එකේ අන්තර්ගතය පමණයි මෙතන තියෙන්නේ. ඒ කියන්නේ ඔහු අලි ඉබන් අබිතාලිප් Confirm කරනවා, සහතික කරලා කියනවා අන්‍යාගමිකයින්ට එරෙහිව, මේ Enemy කියලා කියන්නේ තනිකරම අන්‍යාගමිකයෝ පමණයි. වෙන Enemiesලා ඒගොල්ලන්ට නැහැ. එතකොට අන්‍යාගමිකයන්ට එරෙහිව බොරු කියන්න අවසර දීලා තියෙනවයි කියලා.

ප : එම හදීස්යෙනුත් පැහැදිලි වෙන්නේ මේ බොරු කීමට ඉස්ලාමය අවසර දීලා ඇති ආකාරය?

පි : අන්‍යාගමිකයන් මුලා කරන්න බොරු කියන්න පුළුවන් කියලා.

ප : හරි. අපට දැන් ඒ කාරණාව කොමිෂන් සභාවට එහි තියෙන Sources එක්ක පැහැදිලියි. ඔබ තව අළුත් යම් කාරණාවක්....?

පි : මට ඊට පස්සේ ගරු කොමිසම ඉදිරියේ හෙළි කරන්න අවශ්‍යයි මේ ජමෙයිතුල් උලමා සංවිධානය මම මුලින්ම කිව්වා ඉස්සරලාම අපි වීඩියෝ එකක් දාලා ඔහු ප්‍රකාශයන් වගයක් කෙරුවා. ඒ ප්‍රකාශයන් සියල්ල සාවද්‍යයි. ඒවා ප්‍රෝඩාකාරී ප්‍රකාශයන් කියලා මම සමහර ඒවා මේ ගරු කොමිසම ඉදිරියේ ඔප්පු කෙරුවා අර 109 වෙනි සුරාවේ 4 වෙනි වගන්තියෙන් කියන්නේ ඔබට ඔබේ ආගමේ මට මගේ ආගමේ කියන බොරුව. ඊට පස්සේ ආගම්වලට අනිවාර්යය කිරීමක් නැත කියන 2 වන සුරාවේ 250 වෙනි වගන්තියෙන් Copy කරලා එතුමා කියපු ඒ ප්‍රෝඩාව. ඊට අමතරව තව කිහිපයක් තියෙනවා මට කරන්න. ඒකේ එකක් මේ. මම මේ අවස්ථාවක් ලැබෙනවා නම් හොඳයි මට අර 2 වන සුරාවේ 256 වෙනි වගන්තියත්, 109 වෙනි සුරාවේ 6 වෙනි වගන්තියෙනුත් කරපු ඒ සාමකාමී වදන් ඇත්ත වශයෙන්ම අර 16 වෙනි සුරාවේ 101 වෙනි වගන්තියෙන් සහ 2 වෙනි සුරාවේ 106 වෙනි වගන්තියෙන් මම එදා පැහැදිලි කරපු Theory of Aggregation යටතේ අවලංගු කිරීමේ න්‍යාය යටතේ අර කියපු කාරණා දෙක, සාමකාමී වදන් දෙක. ඒක ඇත්තටම මුලාකාරී ප්‍රකාශයන් දෙකක්. ඒකේ තියෙන්නේ ආගම්වලට අනිවාර්යය කිරීමක් නැත සහ ඔබට ඔබේ ආගමේ මට මගේ ආගමේ කියන ඒ සාමකාමී වදන් දෙකම 3 වන සුරාවේ 85 වෙනි වගන්තියෙන් එදා අපි ඒක සාකච්ඡාවට භාජනය කෙරුවා සහ 4 වෙනි සුරාවේ 87 වෙනි වගන්තියෙන් ඒ දෙකෙන්ම කියන්නේ වෙනත් කිසිම ආගමක් ඇදහීමට මිනිස්සුන්ට අයිතියක් නැත කියලා. අර ඒකෙන් අර 4 වෙනි

FAIR COMMENT BY JEZEEM

සුරාවේ 87 වෙනි වගන්තියෙන් සහ 3 වෙනි සුරාවේ 85 වෙනි වගන්තියෙන් නලිෆයි වෙනවා අර කලින් කියපු සාමකාමී ප්‍රකාශය.

ප : හරි. අපි දැන් ඒ සම්බන්ධයෙන් ඊයේ දවසේ පැහැදිලි කළානේ ඔබගේ Theory එක. දැන් ඔබ මේ Link එකෙන් මොකද්ද පැහැදිලි කරන්න හදන්නේ?

පි : මේක ඒ මවුලවීතුමා ප්‍රකාශයක් කරනවා අන්‍යාගම්වලට බණින්න එපා කියලා. ඒ කියන්නේ හිංසා කිරිල්ලක් එහෙම කරන්න එපා කියලා. ඔහු ඒක ඇත්ත වශයෙන්ම ඔහු ඒ අපි ඉදිරියේ කියන්නේ මේ කුරානයේ 6 වෙනි සුරාවේ 108 වෙනි වගන්තිය පාදක කරගෙනයි.

ප : එහි මොකද්ද සඳහන් වෙන්නේ?

පි : ඔව්. මේකෙදී ඇත්ත වශයෙන්ම මේකේ තියෙනවා And insult not those whom they non Muslims worship besides Allah හැර වෙනත් දෙවියෙකු හෝ වෙනත් ආගමක් අදහන අන්‍යාගමිකයින්ට හිංසා කරන්න එපා කියලා මෙතන තියෙනවා. නමුත් ඒ සංදර්භය අප ගත යුතුයි. සංදර්භය දිහා බැලුවහම ඇත්ත වශයෙන්ම ඔවුන් අප ඉදිරියේ පෙන්වන දෙයින් නොවෙයි මේ සංදර්භය තියෙන්නේ. මේ සංදර්භය තියෙන්නේ ඇත්ත වශයෙන්ම නබිතුමා සහ ඔහුගේ ගෝලයන් සහ ඒ අනුගාමිකයින් එකල ඒ අන්‍යාගමික සමාජයට නින්දා අපහාස ගැරහිලි, ඒ හැම දෙයක්ම කරනවා. අපහාස ඒ හැම දෙයක්ම කරනවා. ඒ අවස්ථාවේදී ඒ මක්කානු නායකයෙක් අබුජහල් ඇවිල්ලා නබිතුමා ඉදිරියේ කියනවා මොහොමඩ් ඔයා කරුණාකරලා ඔයා ඔය අපේ ආගම්වලට කරන අපහාස නවත්වන්න. එහෙම නැත්නම් අපිත් අපහාස කරන්න පටන් ගන්නවා. ඒගොල්ලොන්ගේ මූලාශ්‍රවල තියෙන්නේ ඒක තමයි අපිට ඉස්සරලා 41 වෙනි Slide එකේ තියෙන්නේ ඒක. එතකොට එහෙම තත්ත්වයක් තුළ නබිතුමාට සිද්ධ වෙනවා එයා එතෙක් කර කර හිටපු සහ එයාගේ අනුගාමිකයින් එතෙක් කර කර හිටපු ඒ අපහාස කිරීම්, නින්දා කිරීම් නවතන්නට. මොකද එහෙම නැති වුණොත් ඒගොල්ලන්ගේ ආගමටත් නින්දා අපහාස කරනවා කියලා ඒ මක්කානු වැසියන් කියනවා. එතනින් අපට ප්‍රත්‍යක්ෂ වෙනවා...,

ප : එතකොට ඒ සංදර්ශය ඇතුළේ තමයි ඔහු කියන්නේ මේ අන්‍යාගම්වලට නින්දා කරන්න එපා කියලා?

පි : එපා කියන එක.

ප : හරි. එතකොට ඒක මුලාවක් වෙන්නේ කොහොමද?

FAIR COMMENT — BY JEZEEM

පි : ඒක මුලාවක් වෙන්නේ මේ අපේ දැන් අපේ රටේදී ඔවුන් අර නබිතුමා කළ විදියටම මුල් කාලයේදී අපට නින්දා අපහාස කරනවා. උදාහරණයක් හැටියට අබ්දුල් රාසික් කියනවා බුදු හාමුදුරුවන් වහන්සේ මිනී මස් කෑවා කියලා. එහෙම කියන්නේ ගැටුම්කාරී තත්ත්වයක් ඇති කරන්නට සහ ඒ මුස්ලිම්වරුන් සහ අන්‍යාගමිකයන් අතර ගැටුම්කාරී වාතාවරණයට තල්ලු කරගෙන යන්න. ඉතිං ඒක තමයි අරමුණ. ඉතිං නබිතුමාගේ කාලයේදී කරපු විදියටම ඒගොලේලෝ ඒ විදියට කරලා ඊට පස්සේ අපි ඉදිරියට ඇවිල්ලා කියනවා අපේ ආගමේ කියන්නේ අන්‍යාගමිකයන්ට අපහාස කරන්න එපයි කියලා. මෙතන පැහැදිලිවම තියෙනවා Benefit එකක් තියෙනවයි කියලා. ඒ හින්දා මම ඒකේ And insult not those whom that they non Mulims worship besides Allah. ඉතිං මේක අර කෙළින්ම ඇත්ත වශයෙන්ම මේ හදවතින්ම ඒගොල්ලෝ හිංසා කරන්න එපා කියන එක නෙමෙයි මේ කියන්නේ. ඒගොල්ලොන්ගේ ඒ හිංසා කරන එක ඒක අවියක්, Tool එකක්, මෙවලමක්. ඒක භාවිතා කරලා අර ගැටුම්කාරී වාතාවරණයට යනවා. නමුත් අවස්ථාව ආවහම අපි ඉදිරියේ කියනවා අපේ ආගමේ කියන්නේ අපහාස කරන්න නෙමෙයි කියලා. එතකොට අපි හිතනවා ඒ අපහාස කරන අය ඇත්ත වශයෙන්ම අපහාස කරන්නේ ඉස්ලාම් ආගම්වලට පටහැනිව කියලා. නැහැ එහෙම නෙමෙයි. ඒක නබිතුමා ස්ථාපිත කරපු ක්‍රමවේදයයි.

ප්‍ර : ඒ අනුව ඔබ කියන්නේ අපහාස කිරීමටත් ඉඩ ප්‍රස්ථාව ලබා දීලා තියෙනවා කියලා?

පි : ඔව්. 41 වෙනි එකේ තිබ්බා.

ප්‍ර : අපි ඊළඟ Slide එකට යමු.

පි : ඊට පස්සේ මට අවශ්‍යයි ඒ මවුලවීතුමා ...,

ප්‍ර : මේ ඔබ දැන් ඉදිරිපත් කරන 49 වන Slide එකේ තියෙනවා ඉස්ලාමී සිය දිවි නසා ගැනීම සහ මරාගෙන මැරීම පිළිබඳව අපෙන් සඟවන සත්‍යය කියලා?

පි : ඔව්.

ප්‍ර : මොකද්ද මේ ඔවුන් අපෙන් සඟවන සත්‍යය?

පි : ඔබතුමන්ලා එදා දැක්කා ඒ මවුලවී කියනවා පැහැදිලිවම ඉස්ලාම් ආගමේ කියන්නේ ඉස්ලාම් ආගමේ කියනවයි කියලා කෙනෙක් සිය දිවි නසා ගත්තොත් ඔහුව සදාකල්ම අපායේ දුක් විඳින්න සලස්වනවයි කියලා. එහෙම කියලා ඔහු අපේ සමස්ථ සමාජයම රවටන්නේ අර සහරාන් සහ ඔහුගේ කල්ලිය විසින් ඒ බෝම්බ

FAIR COMMENT — BY JEZEEM —

පුපුරලා ඒ මනුෂ්‍ය ඝාතනයක් කරපු එක ඉස්ලාමික ඉගැන්වීම්වලට නෙමෙයි ඊට පටහැනිව සිද්ධ කළ දෙයක් හැටියට අපට උලුප්පලා දක්වන්න. නමුත් මෙතනදී ඔහු සඟවන දේ තමයි සිය දිවි නසා ගැනීම සහ මරාගෙන මැරීම කියන්නේ දෙකක්. එතකොට සිය දිවි නසා ගැනීමට අදාළ කුරානික ඉගැන්වීම තමයි මේ උඩින් තියෙන්නේ කුරානයේ 4 වෙනි සුරාවේ 29 වෙනි වගන්තියේ සහ 30 වෙනි වගන්තිය.

ප්‍ර : ඒකේ තියෙන්නේ සිය දිවි හානි කර ගැනීමද?

පි : ඒකේ තියෙන්නේ සිය දිවි හානි කර ගැනීම පිළිබඳව.

ප්‍ර : සිය දිවි හානි කර ගැනීම කුරානයේ ඉගැන්වීමට අනුව පාපයක්?

පි : පාපයක්. ඔව්.

ප්‍ර : ඊට පස්සේ මරාගෙන මැරීම ගැන කොහේද තියෙන්නේ කුරානයේ?

පි : මරාගෙන මැරීමට මම ගොඩාක් Example තියෙනවා. එදා අපි ඒකත් පරිහරණය කෙරුවා. 9 වෙනි සුරාවේ 101 වගන්තිය සහ 9 වෙනි සුරාවේ 88 වෙනි වගන්තිය වැනි දේවල්. මෙතනදී මම ගේනවා 4 වෙනි සුරාවේ 74 වෙනි වගන්තිය. ඒකෙන් කියන්නේ මුස්ලිම්වරුන් හැටියට තමන්ගේ ජීවිත පරිත්‍යාග කරලා අන්‍යාගමිකයන්ට එරෙහිව සටන් කරන්න පුළුවන් අය මේ අල්ලාහ්ගේ මාර්ගයේ එහෙම නැත්නම් මේ ඉස්ලාමික ගමන් මාර්ගයේදී සටන් කළයුතුයි කියලා. එහෙම සටන් කරලා මැරුණහම හෝ මැරුණේ නැතුව ජයග්‍රහණය කරලා ආවත් ඒ දෙකෙන් මොකක් වුණත් අල්ලාහ් විසින් ඔවුන්ට මහා ත්‍යාගයන් පිරි නමනවා කියලා.

ප්‍ර : ඒ කියන්නේ මේ කුරානයේ 4 වන සුරාවේ 74 වන වගන්තියට අනුව Course of Allah වෙනුවෙන් නැත්නම් අල්ලාහ් දෙවිඳුන්ගේ අරමුණු වෙනුවෙන් මරාගෙන මැරීම හෝ ඒ වෙනුවෙන් සටනට යාම,,..?

පි : ජීවිත පූජාව අවසර දීලා තියෙනවා.

ප්‍ර : අවසර දීලා තියෙනවා කියලා ඔබ මේ ගරු කොමිෂන් සභාවට කියන්නේ?

පි : සහ උත්තම වූ කුසල කර්මයක්.

ප්‍ර : එය උතුම් කුසල කර්මයක් කියලත් සඳහන් වෙනවා?

පි : ඔව්.

ප්‍ර : හරි. එය පැහැදිලියි. අපි ඉදිරියට යමු.

පි : ඊට පස්සේ මට අවශ්‍යයි, ඔහුගේ තවත්, මම මවුලවිව ඇත්තටම ගත්තේ මවුලවී තමයි මවුලවිතුමා තමයි මේ ඉස්ලාමික සමාජයේ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සංකේතයක් වගේ ඉන්නේ සහ ඒ සංවිධානය ජමෙයිතුල් උලමලා. ඉතිං මම ඔහුවම ගන්නේ ඒ සංකේතය එහෙම නැත්නම් ඒගොල්ලෝ ඒ සමස්ථ මුස්ලිම් සමාජයම නියෝජනය කරන නියෝජිතයෝ සහ ඒ සංවිධානය මේ කියන බොරු මම ඔප්පු කරලා මම මේ කියන්නේ සමස්ථ සමාජයම එක්කෙනෙක් දෙන්නෙක් හැරෙන්නට සැදී පැහැදී අපි ඉදිරියේ ඒ ප්‍රෝඩාකාරී ක්‍රියාදාමය ක්‍රියාත්මක කරනවා කියලා ඔප්පු කරලා පෙන්වන්නයි. මෙතනදී මම ගන්නේ කුරානයේ 9 වෙනි සුරාවේ 5 වෙනි වගන්තියේ තියෙන ඒ කුරානයේ ඉගැන්වීම මේ ජමෙයිතුල් උලමලා කොහොමද විකෘති කරලා තියෙන්නේ කියලා පෙන්වන්න. එදා ඔහු ඔසවලා පෙන්නුවා ඔවුන් විසින් සම්පාදනය කරපු, ඔවුන් විසින් Translate කරපු කුරානික ග්‍රන්ථයක්. එහිදී ඔහු කියනවා මිනිස්සු Misunderstand කරලයි තියෙන්නේ කුරානයේ නියම අර්ථයන්. ඒ හින්දා ඒගොල්ලෝ එයට විසඳුමක් ලෙසයි මේක දෙන්නේ කියලා. නැහැ. එයට විසඳුමක් විදියට නෙමෙයි දෙන්නේ. මිනිස්සු සත්‍යය වටහා ගනියි කියන බයට ඒ අය කරන්නේ අපේ සමාජය මුලා කරන්න, සමස්ථ සිංහල සමාජය මුලා කරන්න ඒ සිංහලෙන් බොරු ප්‍රෝඩාකාරී කුරානයක් Translate කරලා අපට අප ඉදිරියේ තබනවා සිංහලයෙන්. එතකොට ඒකේ 9 වෙනි සුරාවේ 5 වෙනි වගන්තියේ ...,

(ස්වාමීනි සාක්ෂිකරුට C-138 පෙන්වා සිටීමට අවසර පතනවා)

ප්‍ර : මෙම කුරානයේ තියෙන සමහර පරිවර්තනයන් නිවැරදි නැහැ කියන එකද ඔබ සඳහන් කරන්නේ?

පි : ඔව්. සමහර කියන්නේ අත්‍යවශ්‍යම ඒ කියන්නේ Crucial Points ඔක්කෝම විකෘති කරලා තියෙන්නේ. එතකොට අපිට මේක කියවලා ...,

ප්‍ර : ඒ අනුව ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ඔය C-138 කුරානයේ තියෙන ඒ වගේ Crucial වගන්ති කිහිපයක් මොනවද ඔවුන් සිංහලයට පරිවර්තනය කරනකොට විකෘති කරපු කුරාන් වැකි මොනවද කියලා?

පි : ඔව්. ඒක නියෝජනය කරන්න ගෙනාවා කුරානයේ 9 යි 5. 9 යි 5 අන්තිමටම තියෙන්නේ Original එක. By the authentic translator Dr. Muhammad Muhsin Khan.

ප්‍ර : අපිට පැහැදිලි කරලා අදහස කිව්වොත් හරි. Original එකේ අදහස මොකද්ද?

FAIR COMMENT BY JEZEEM

පි : ඒ මේ කුරානයයි. එතකොටට ඒකේ තියෙන විදියට තමයි මේ අවසානයට තියෙන්නේ මේ Slide එකේ යටින්ම තියෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන්. ඒක ඒ සංදර්භය, ඒ අදාළ සංදර්භයට අනුව සහ ඒ අර්ථයට අනුව මා විසින් නිවැරදිව පරිවර්තනය කරපු එකක් තමයි මේ උඩින්ම තියෙන්නේ. එය කියැවෙන්නේ මේ විදියට ශුද්ධ වූ මාසයන් ඉක්ම වූ පසු පිළිම වන්දනාකරුවන් සහ ඉස්ලාමය විශ්වාස නොකරන්නවුන් දුටු තැන ඝාතනය කරවූ. තවද ඔවුන්ව අල්ලා ගනිව්. ඔවුන් යන එන මඟ සැඟව සිට පහර දියව්. එවිට ඔවුන් එම භීෂණයෙන් පීඩාවට පත් වේ. මේ එකතු කරපු, මේ සඳහා එකතු කරපු එකම වචන හතර තමයි මේ, මා විසින් එකතු කරපු එකම වචන හතර තමයි මේ දුඹුරු පාටින් සටහන් වෙලා තියෙන්නේ වරහන් ඇතුළේ. එම භීෂණයෙන් පීඩාවට පත් වී තම ආගම අතහැර ඉස්ලාමය වැළඳ ගනීනම් එවැනි අයව පමණක් නොමරව්. සැබැවින්ම අල්ලාහ් අති සමාජශීලීය, මහා කාරුණිකය කියන එක තමයි නියම සංදර්භය මත පිහිටා නියම අර්ථය දැක්වෙන Translation එක විය යුත්තේ. නමුත් .....?

ප්‍ර : දැන් මේ 50 වෙනි Slide එකේ මුලින්ම තියෙන්නේ කුරානයේ 9 - 05 කියන සූරාවේ තියෙන නියම පරිවර්තනයට අනුව, කුරානයේ නියම පරිවර්තනයට අනුව කරපු සිංහල පරිවර්තනය.

පි : ඔව්. එය එසේ විය යුතුයි.

ප්‍ර : එතකොට All Ceylon Jamiyyathul උලමාවරුන් විසින් එහි සඳහන් තේරුමට වඩා විකෘති තේරුමක් ලබා දීලා තියෙනවා කියලනේ ඔබ කියන්නේ?

පි : ඔව්.

ප්‍ර : මොකද්ද ඔවුන් විකෘති කරලා තියෙන්නේ?

පි : ඔවුන් එය හිතාමතාම ඔවුන් කියනවා ශුද්ධ වූ මාසයන් ඉක්ම වූ පසු නුඹලා සමඟ යුධ වැදී සිටින කියලා ඒගොල්ලෝ ඒක අතින් දාලා තියෙනවා. ඒකයි මම අර රතුපාටින් දැම්මේ. අර මම උඩට දැම්මා වගේ මේක Connect කරන්න දැම්මා වගේ.

ප්‍ර : Original කුරාන් එකේ නැත්නම් සත්‍යය එකේ නුඹලා සමඟ යුධ වැදී සිටින කියලා කෑල්ලක් නැහැ?

පි : එහෙම දෙයක් නැහැ.

ප්‍ර : හරි?

පි : එතන එකක්. ඊට පස්සේ ඔහු ආදේශකයින්ව කියලා ප්‍රෝඩාකාරී වචනයක් භාවිතා කරලා තියෙනවා සිංහල වචනයක්. ඒගොල්ලොන්ට පුළුවන් මේක කුරානයේ කියලා තියෙන්නේ

FAIR COMMENT BY JEZEEM

දෙවියන් වහන්සේම කියලා තියෙනවා කුරානයේ බොහොම සරළව තමයි ඉදිරිපත් කරන්නේ කියලා. ඉතිං එහෙමනම් බොහොම සරළ ආකාරයෙන් ඒගොල්ලොන්ට පුළුවන් මේ අල් මුෂිකුන් කියන වචනය, අරාබි වචනය අර යටම තියෙන ඒගොල්ලොන්ට පරිවර්තනය කරන්න. නමුත් එහෙම පරිවර්තනයක් කරලා නැහැ. ඒ වෙනුවට ඔවුන් කියලා තියෙන්නේ ආදේශකයින්ව කියලා. ආදේශකයින්ව නුඹලා දුටු තැන මරා දමව්. තවද ඔවුන්ව අල්ලා ගනිව්. ඒ ඉතුරු ටික ඔක්කොම මගේ විදියටම තියෙනවා. නමුත් මෙතනදී මෙන්න මේ දෙකෙන් නුඹලා සමඟ යුධ වැදී සිටින සහ ආදේශකයින් කියන වචනවලින් අපිව සම්පූර්ණයෙන්ම මුලාවට පත් වෙනවා. මේ මුෂිකුන් කියන වචනයේ අරාබි වචනයේ නියම තේරුම ඒගොල්ලෝ නොදන්නවා නෙමෙයි. ඒ නියම තේරුම තමයි පිළිම වන්දනාකරුවන් සහ ඉස්ලාමය විශ්වාස නොකරන්නවුන් කියන එක. ඒක 2 වෙනි සුරාවේ 105 වෙනි වගන්තියේත් තියෙනවා. ඊට වඩා හොඳට මෙන්න මේකේ තියෙනවා 106 වෙනි සුරාවේ 108 වෙනි වගන්තියේ අල් මුෂිකුන් කියන වචනය පැහැදිලිව අර්ථ කථනය කරලා තියෙනවා මේ V106 කියන එකට අදාළව.

ප : ඔබ කියන්නේ සාමාන්‍ය සත්‍යය කුරානයට අනුව තියෙන්නේ යුධ වැදී සිටින අවස්ථාවක නෙමෙයි පිළිම වන්දනාකරුවන් සහ ....?

පි : පිළිම වන්දනාකරුවන් සහ ඉස්ලාමය විශ්වාස නොකරන සියළු අයව මරා දමන්නයි කියලා.

ප : හැබැයි All Ceylon Jameithu උලමා එක ඔබ සාක්ෂි දුන් ආකාරයට ඔවුන් අල්ටකියාව පාවිච්චි කරමින් ඔවුන් සඳහන් කරනවා මේ මරා දමන්නවුන් අපි සමඟ යුධ වැදෙන කට්ටිය විතරයි කියලා?

පි : බොහොම හරි.

ප : ඔබ කියන්නේ ඒක මායාවක්?

පි : මායාවක්, ප්‍රෝඩාවක්.

ප : සත්‍යය වසන් කරනවා කියන එක ඔබ කියන්නේ?

පි : සම්පූර්ණයෙන් සත්‍යය වසන් කිරිල්ලක්.

ප : ඒ කාරණය කොමිෂන් සභාවට පැහැදිලියි. අපි ඊළඟ කාරණයට යමු?

පි : ඊළඟට මම ඒකේ හැම එකම ගෙනාවේ නැහැ. මට ඒකේ Crucial ඔක්කොම වදනුත් ඒ විදියටම මට කරන්න පුළුවන්. නමුත් මම නියෝජනයක් විදියට දෙකක් ගෙනාවේ, කුරානයේ 9 යි 5 සහ 8

FAIR COMMENT BY JEZEEM

යි 39. මෙය ඊටත් වඩා සාපරාධි විදියට මුලා කරලා තියෙනවා අපිව. ඒ කුරානයේ Original Authentic Translator Dr. Muhammad Muhsin Khan or any other translator authentic translator කරලා තියෙන විදියට මේ 8 වෙනි සුරාවේ 39 වෙනි වගන්තිය විය යුත්තේ මේ විදියට And fight them until there is no more fitna. Fitna මෙතන අර්ථකථනය කරලා තියෙනවා Disbelief and qualities in that is worshipping others besides Allah කියලා. And the belief worship in will all be for Allah. The whole world but if they sees worshipping others beside Allah then certainly Allah is all seers and of what they do කියලා. මේ 8 වෙනි සුරාවේ 39 වෙනි වගන්තියේ නියම සංදර්භයන් සහ ඒ අර්ථය අනතර්ගතයේ අර්ථය අනුව එය කියවිය යුත්තේ මේ විදියටයි. තවද අන්‍යාගමිකයන්ගේ භූමිය තුළ ඔවුන්ගේ සමස්ථ ජීවන රටාවම එනම් ඔවුන්ගේ ආගම, චාරිත්‍ර වාරිත්‍ර, නීතිය සහ ඔවුන්ගේ ජීවන පැවැත්ම විනාශ වනතුරු සහ ඔවුන් ඉස්ලාමය වැළඳගෙන අල්ලාහ් දෙවියන්ට යටත් වනතුරු සහ භූමියේ ඉස්ලාමයේ පමණක් එකම ආගම, නීතිය සහ ජීවන රටාව ලෙස මුළු ලොව පුරාම ඉතිරි වනතෙක් ඔවුන්ට එරෙහිව සටන් කරන්න. නමුත් ඔවුන් තම ආගම අතහැර ඉස්ලාමය වැළඳ ගන්නේ නම් ඔවුන් සමඟ සටන් නොකරන්න. එවිට නියත වශයෙන් අල්ලාහ් ඔවුන් කරන් දේ පිළිබඳව අති සුපරික්ෂාකාරීව කියලා තමයි මේක නියම අර්ථය කියැවෙන්න ඕන.

ප : හරි. ඒ නියම අර්ථය මුලා කරමින් All Ceylon Jamiyyathul Ulama ඔවුන්ගේ කුරානය විසින් ඔවුන් ඒ විකෘති කරපු කුරාන පාඨය ලෙස ඔබ හඳුන්වන එක කියන්න පුළුවන්ද මොකද්ද කියලා?

පි : ජමෙයිතුල් උලමලා විසින් පරිවර්තනය කරපු ප්‍රෝඩාකාරී කුරානය අපි ඉස්සරහා කියනවා මේ විදියට. එහි තිබෙන්නේ භීෂණය තුරන්ව ගොස් දහම සම්පූර්ණයෙන්ම අල්ලාහ්ට සතු වනතෙක් ඔවුන් සමඟ නුඹලා සටන් වදිව්. ඔවුන් එනම් භීෂණයෙන් වැළකුණේ නම් ඔවුන් සමඟ නුඹලා සටන් නොවදිව්. එවිට සැබැවින්ම ඔවුන් කරමින් සිටි දෑ පිළිබඳව අල්ලාහ් සුපරීක්ෂාකාරී වේ කියලා. මෙතන මහා බරපතල විදියට ඔවුන් විසින් මේ දූෂණයට ලක් කරලා තියෙනවා ඒ නියම අර්ථය. ඒ කියන්නේ සිංහලයෙන්නේ දාලා තියෙන්නේ. ඒ අපිව මුලා කරන්නනේ.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ නියම කුරානයේ අර්ථය වන අන්‍යාගමිකයන්ගේ භූමිය තුළ ඔවුන්ගේ ආගම, ඔවුන්ගේ චාරිත්‍ර, නීතිය සියල්ලම විනාශ කරලා මුළු ලෝකයම ඉස්ලාම් කරන්න කියන ඒ පණිවිඩය මේ All Ceylon Jamiyyathul උලමාවේ තියෙන කුරානය විසින් ලබා දෙන්නේ නැහැ කිව්වොත් හරිද?

පි : ඔව්.

ප්‍ර : ඔවුන් ඒ කියන්නේ ඒක නොකියන්නේ මුලා කිරීමේ අදහසකින්ද?

පි : සම්පූර්ණයෙන්ම මුලා කිරීමේ අදහසින්.

ප්‍ර : කාව මුලා කිරීමේ අදහසකින්ද?

පි : සිංහල ජනතාව. දැන් කෙනෙකුට හිතන්න පුළුවන් ඔවුන් මේ විදියට ඒකේ සත්‍යය භයානකකම අඩු කරලා ඒ භයානකකම නොහැගෙන ලෙස මේ විදියට Translate කරලා තියෙන්නේ සාමය ස්ථාපිත කර ගන්න කියලා කෙනෙකුට තර්ක කරන්න පුළුවන්. නමුත් ඒක එහෙම වෙන්නේ නැහැ කියන එක මට සහතික කරලා කියන්න පුළුවන්. මොකද 33 වෙනි සුරාවේ 36 වෙනි වගන්තියට ප්‍රකාරව කිසිම මුස්ලිම් පිරිමියෙකුට හෝ ගැහැණියෙකුට කිසිම අවස්ථාවකදී බැහැ කුරානයේ කිසිම වචනයක් හෝ අකුරක ඒ නියම අර්ථය විකෘති කරන්න හෝ ඔවුන්ට අවශ්‍ය විදියේ අදහසක් ලබා ගන්නට. අපි ඒක සාකච්ඡාවට භාජනය කෙරුවා 33 වෙනි සුරාවේ 36 වෙනි වගන්තිය. ඒ වගේම අපි සාකච්ඡාවට භාජනය කෙරුවා එදා ඔවුන් මේ කරන්නේ මේක 16 වෙනි සුරාවේ 106 වෙනි වගන්තියට ප්‍රකාරව ඒක ප්‍රෝඩාකාරී අල්ටකියා වගන්තියක්. ඒකේදී කියන්නේ ඔබලාගේ සහ ඉස්ලාමයේ ගමන් මගට ආරක්ෂාවට සහ උපක්‍රමශීලී එහි ඉදිරියට යාම සඳහා ගන්නා වූ උපක්‍රමශීලී පියවරක් ලෙස ඔබලාට එවැනි දේ කරන්න පුළුවන් කියලා. ඒ කියන්නේ ඉස්ලාමයේ තියෙන දේවල් විකෘති කරලා අප ඉදිරියේ කියන්න පුළුවන් කියන එක.

ප්‍ර : ඒ කියන්නේ ඔබටග් අදහස වෙන්නේ මෙසේ පරිවර්තනය කරන්නේ සිංහල සමාජය ඉදිරිපිට මේ ඉස්ලාමය කියන සාමකාමී ආගමක් යැයි...,

පි : කියලා පෙන්වන්නම මිසක් සැබෑ සාමයක් ස්ථාපිත කරන්නවත්, මේ සැබෑ ලෙසම ඔවුන්ගේ තියෙන ඒ මිනී මරු විනාශකාරී අර්ථයන් සඟවන්න නෙමෙයි. එහෙම කරනවා නම් ඒක කරන්න ඕන මදුසාවල.

ප්‍ර : හරි. අපට ඒ කාරණාවත් ප්‍රියන්ත මහත්මයා ඉතා පැහැදිලියි කොමිෂන් සභාවට. අපි තවත් කාරණයකට යමු.

FAIR COMMENT BY JEZEEM

පි : දැන් මම ගන්නේ 52 වන Slide එකයි. ඒකේදිත් මම ආපහු තවම ඉන්නේ එතුමාගේ ප්‍රෝඩාකාරී දේවල් හෙළි කරමින්. ඔහු මුලින්ම ඒ වීඩියෝවේ මුලින්ම ඔහු ප්‍රකාශයක් කරනවා මෙන්න මේ විදියට.

(CD තැටිය දර්ශනය වේ)

ප්‍ර : දැන් ඔබ සඳහන් කරන්නේ මේ වීඩියෝවේ දැක්වෙන ඒ මවුලවීතුමා විසින් කියපු කාරණය මුසාවක් කියලද?

පි : ඔව්. ඒක සම්පූර්ණම මුසාවක්.

ප්‍ර : ඒක කොහොමද කියන්නේ?

පි : ඒක මුසාවක් වෙන්නේ නැවතත් සිංහල සමාජයක් ....,

ප්‍ර : කියන්න?

පි : එයත් ඒ කලින් වගේම අපේ සමාජයේ මුලා කිරීම සඳහා කරන්නා වූ පියවරක්. කුරානයේ 5 වෙනි සුරාවේ 32 වෙනි වගන්තිය සම්බන්ධයෙන් තමයි එතුමා කථා කරන්නේ. එතුමා කියනවා ඉස්ලාමයේ කියන්නේ එක් පුද්ගලයෙක් කවුරු හරි එක් පුද්ගලයෙක් ඝාතනය කළොත් සමස්ථ මිනිස් සමාජයම ඝාතනය කෙරුවා හා සමානයි. එක් පුද්ගලයෙක්ගේ ජීවිතය ආරක්ෂා කෙරුවොත් සමස්ථ මිනිස් සමාජයේම මිනිස්සුන්ගේ ජීවිත ආරක්ෂා කෙරුවා හා සමානයි කියලා. නමුත් අපි ඉස්ලාමික අර්ථ කථනයට ගියහම එතනදී කියන්නේ වෙනත් දෙයක්. ඊට හාත්පසින් වෙනස්. එතනදී කියන්නේ මේ විදියට. එමනිසා ඒ Verse එක මම කියන්නම් සිංහල පරිවර්තනය. එම නිසා අප අල්ලාහ් දෙවියන් විසින් එනම් අල්ලාහ් දෙවියන් විසින් ඊශ්‍රායල් ජනයාට මෙසේ නියම කරන ලදී. යම්කිසි කෙනෙකු ඝාතනයට පළිගැනීම සඳහා මිනිස් ඝාතනයකට පළිගැනීම සඳහා කෙරෙන ඝාතනයක් හෝ එසේ නැතිනම් ඉස්ලාමික බලය අත්පත් කර ගත් භූමියක් තුළ අල්ලාහ් දෙවියන්ට අකීකරුවීම හෝ ප්‍රතික්ෂේප කිරීම නිසා කරන ඝාතනයක් හැර පුද්ගලයෙකු ඝාතනය කළේ නම් ඔහු ජන සමූහයම ඝාතනය කළා හා සමාන වන්නේය. එසේම ඔහු එක් පුද්ගලයෙකුගේ ජීවිතය බේරා ගත්තේ නම් ඔහු මුළු ජන සමුහයේම ජීවිත බේරුවා හා සමානය. මේකේ Contents එකට ගියහම සහ මේකේ තෆ්සීර්වලට ගියහම අපිට පේනවා මෙන්න මේ විදියට, මෙන්න මේ අර්ථයයි එළියට එන්නේ. මේ මේකෙන් ඇත්ත වශයෙන්ම කියන්නේ...,

ප්‍ර : වැඩක් නැතුව වැඩක් නැහැ. අත්‍යවශ්‍ය Trust එක විතරක් කියන්න?

FAIR COMMENT
BY JEZEEM

පි : ඔව්. මේකේදී කියන්නේ ඉස්ලාමය ප්‍රතික්ෂේප කරන හෝ ඉස්ලාමයට එරෙහි වන මිනිස්සුන්ව මැරුවට කමක් නැහැ. ඒ කිව්වේ අන්‍යාගමිකයෝ. අන්‍යාගමිකයන්ව මැරුවට කමක් නැහැ සහ මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ වරදට ඒ ඝාතකයාව මරණ එක කමක් නැහැ. ඒ දෙක හැරෙන්න අන් අයගෙන් කෙනෙකු මැරුවොත් ඒ ජන සමූහයා ඝාතනය කෙරුවා හා සමානයි කියන එකයි මෙතන කියන්නේ. කොටින්ම කියනවා නම් එක් මුස්ලිම්වරයෙකු ඝාතනය කෙරුවොත් සමස්ත මුස්ලිම් වර්ගයාම ඝාතනය කළා හා සමානයි කියන එක තමයි මේ මෙතන සත්‍යය තේරුමෙන් කියන්නේ, අර්ථයෙන් කියන්නේ.

ප්‍ර : ඒ කියන්නේ අන්‍යාගමිකයෙක් මැරුවට ප්‍රශ්නයක් නැහැ කියන එකද?

පි : පැහැදිලිවම.

ප්‍ර : දැන් ඔබ ඔය මුස්ලිම් කෙනෙක්ව මැරුවට තමයි පාපයක් වෙන්නේ. අන්‍යාගමිකයෙක් මැරුවට කමක් නැහැ ඒක පාපායක් නැහැ කියන එකට ඒ ඔබේ මතයක්ද නැත්නම් එය කුරානයේ සඳහන් වෙනවද?

පි : එය සියයට සීයක්ම කුරානයේ හදීස් හා සුන්නාවලට අනුකූලව තියෙන ඉගැන්වීමක්. එය මතයක් නොවෙයි. මගේ මතය නොවෙයි.

ප්‍ර : ඒ කියන කුරාන පාඨයක්ද මේ 5-32 කියන්නේ?

පි : ඔව්. 5 වෙනි සුරාවේ 32 වෙනි වගන්තියේ අපි තස්සීර්වලට නොගියත් ඒ කුරානයේම සඳහන් වෙනවා ඒ දේ. කුරානයේම සඳහන් වෙනවා. ඒ නිසයි ඒ මවුලවිතුමාත් ඒ තක්කියා භාවිතයේදී එතුමා ඒ Theory එකට, න්‍යායට අනුවම කරනවා. එතුමා පැහැදිලිවම කියනවා යම් හේතුවක් නැතුව කියලා. ඒ හේතුව තමයි මේක. Because of that we ordain for the children of Isreal that if anyone kill the person මේ තමයි දැන් එන්නේ Clauses not in retaliation of murda එක. දෙක or and to spread mischief in the land. ඒක නිකම් හරි Coded දෙයක් ඒක. මේ Or to spread mischief in the land කියන එකේ තමයි මේ අර්ථය සඟවලා තියෙන්නේ. අන්න ඒක තමයි මෙතන තෆ්සීර්වලින් ගත්තේ. The meaning of mischief මොකද්ද කියලා මේ තෆ්සීර් ඉබන් කාතීර්තුමා විග්‍රහ කරලා, පැහැදිලි කරලා දීලා තියෙනවා.

ප්‍ර : හරි. අපිට ඒ සම්බන්ධයෙන් පැහැදිලියි. දැන් ඊළඟ කාරණයට යන්න පුළුවන්ද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒ දේම ඊටත් වඩා තෆ්සීර්වලට නොගියත් ඊට වඩා හොඳට අපට මෙතනදී පැහැදිලි වෙනවා ඊළඟ ...,

ප්‍ර : ඒ කුරාන පාඨය මොකද්ද?

පි : ඒත් එක්කම තියෙනවා කුරානයේ 5 වෙනි සුරාවේ 33 වෙනි වගන්තිය.

ප්‍ර : එයින් සඳහන් වෙන්නේ කුමක්ද?

පි : එයින් සඳහන් වෙන්නේ අල්ලාහ්ට සහ ඔහුගේ පණිවිඩකරුට එනම් ඉස්ලාමයට එරෙහි වන අයට සහ අල්ලාහ්ව සහ ඔහුගේ පණිවිඩකරු එනම් ඉස්ලාමය ප්‍රතික්ෂේප කරන අයට නියමිත දඩුවම වන්නේ ඔවුන්ව ඝාතනය කිරීම හෝ කුරුසයේ එල්ලා මරා දැමීම හෝ ඔවුන්ගේ එක් පැත්තක අතක් සහ අනිත් පැත්තේ කකුලක් කපා දැමීම හෝ භූමියෙන් එළවා දැමීමයි. එම දඩුවම් ඔවුන්ට මෙලොවදී අවමානය සඳහායි. මරණයෙන් පසු ඔවුන්ට ඊටත් වඩා දරුණු වධ හිංසා ලැබෙනු ඇත කියලා කියනවා. ඉතිං 5 වෙනි සුරාවේ 32 වෙනි වගන්තියෙන් කියනවා නම් පොදුවේ මනුෂ්‍යයෙක්ම මැරුවොත් එහෙම මුළු මනුෂ්‍ය සංහතියම මැරුවා හා සමානයි කියලා මේකේදී දෙවියන්ට කියන්න බැහැනේ ඒත් එක්කම තියෙන 32 එහෙම කියලා 33 කියන්න බැහැනේ අල්ලාහ්ට සහ ඔහුගේ පණිවිඩකරුට එරෙහි වන අයට හෝ ඒ ඉස්ලාමය ප්‍රතික්ෂේප කරන අයට නියමිත දඩුවම වන්නේ ඝාතනය කිරීම හෝ එහෙම කියලා.

ප්‍ර : ඔබ ඒ කියන්නේ මේ අල්ලාහ් දෙවිදුන්ගේ පණිවිඩයට හෝ අල්ලාහ් දෙවිදුන්ට හෝ ඔහුගේ පණිවිඩකරුට ප්‍රතික්ෂේප කරන ඕනම කෙනෙක්ව ඝාතනය කරන්න පුළුවන් කියලා කියන කුරාන වැකියක්ද මේකද?

පි : ඔව්. බොහොම හරි. නමුත් මෙතනදී මම එකක් කිව යුතුයි. මේ ඝාතනය, 5 වෙනි සුරාවේ 33 වෙනි වගන්තිය සහ 9 වෙනි සුරාවේ 5 වෙනි වගන්තිය බල ගන්වන්නේ දුඹුරු පාට කාලයේ අවසාන කාලයේදී හෝ රතු පාට ඒ කියන්නේ තුන්වෙනි අවස්ථාවේ මුල් කාලයේදී හෝ.

ප්‍ර : ඔබ ඒ කියන්නේ මෙවැනි කුරාන පාඨයන් ක්‍රියාත්මක කරන්නේ ඉස්ලාමීය මුස්ලිම් ජනතාව ඇවිල්ලා බහුතරයක් ඔවුන් ඇවිල්ලා ඔවුන් බලය අල්ලා ගත්තට පස්සේ, රටේ බලය අල්ලා ගත්තට පස්සේ තමයි මේ පාඨයන් ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ?

පි : ඔව්. පසුව හෝ ඒ අවස්ථාවට ළඟා වෙනකොට.

ප්‍ර : නැතුව මුල්ම අවස්ථාවේදී....?

FAIR COMMENT BY JEZEEM

පි : මුල්ම අවස්ථාවේදී කිසි ලෙසකින්වත් ඔවුන් එහෙම කරන්නේ නැහැ.

ප්‍ර : මුල්ම අවස්ථාවේදී ඔවුන් මේවා සඟවලා තියෙනවද?

පි : ඒවා සඟවලා තියෙනවා.

ප්‍ර : සඟවලා අර සාමය පිළිබඳ පමණයි කථා කරන්නේ?

පි : සත්‍යය එයයි.

ප්‍ර : දැන් මේ සම්බන්ධයෙන් පැහැදිලියි. අපි ඊළඟ Slide එකට යමු.

පි : මේ තියෙන්නේ අප්‍රිකාවේ ඒ දඩුවම, ෂරියා දඩුවම දිපු මිනිස්සු හතර දෙනෙක්.

ප්‍ර : මොකද්ද වෙලා තියෙන්නේ?

පි : ඒගොල්ලොන්ගේ දකුණු අත පැත්තේ අතයි, වම් අත පැත්තේ කකුලයි කපලා අත ඇරලා.

ප්‍ර : කුමක් සඳහා ගිහිල්ලද මේ දඩුවම ලබා දීලා තියෙන්නේ?

පි : අනිවාර්යයෙන්ම මේ දඩුවම ලබා දෙන්නේ ෂරියා නීතියට සහ කුරානයේ 5 වෙනි සුරාවේ 33 වෙනි වගන්තියට අනුව ඉස්ලාමය ප්‍රතික්ෂේප කරපු අවස්ථාවේ. මොකද ඔවුන් කියනවනේ අපට වර දෙකක් දෙනවා කියලා මම කිව්වේ ඉස්ලාමයට බැදෙන්න කියලා. අන්න ඒ අවස්ථාවේදී තමයි මේක ක්‍රියාත්මක කරන්නේ.

ප්‍ර : හරි. ඒ කියන්නේ මහත්මයා දකුණු අතයි, වම් කකුලයි කපලා තියෙන්නේ ඔවුන්ට කිසිම වැඩක් කර ගන්න බැහැ ඔවුන්.....?

පි : ඒකයි. ඒකේ කියනවනේ නිග්‍රහ කරන්න කියලා. එම දඩුවම් ඔවුන්ට මෙලොවදී අවමානය සඳහායි. මරණයෙන් පසුව ඔවුන්ට ඊටත් වඩා දරුණු වධ හිංසා ලැබෙනු ඇත කියලා.

ප්‍ර : හරි. පැහැදිලියි. අපි ඊළඟ?

පි : ඊට පස්සේ දැන් මම බලාපොරොත්තු වෙනවා ...,

ප්‍ර : ඔබ තවම අල්ටකියා සංකල්පයෙන් යන්න කලින් මම යම්කිසි කාරණයක් කෙරෙහි ඔබේ අවධානය යොමු කරනවා.

(ස්වාමීනි C-866 වශයෙන් ලකුණු කරපු ග්‍රන්ථයේ පිටු අංක 599 ජිහාඩ් යනුවෙන් සඳහන් වන කොටස සාක්ෂිකරුට පෙන්වයි.

ප්‍ර : මහත්මයා මෙහි කියනවා මෙන්න මෙසේ සඳහන් වෙලා. Jihad means to war against non Muslims and it is etymologically derived from the word Mujah significantly warfare to establish religion and is is the lesser Jihad ඒ කියන්නේ මුස්ලිම් නොවන කට්ටිය වෙනුවෙන් කරන සටන It is lesser Jihad as for the greater Jihad it is spiritual ware fore against the lower self which is why the prophet blessed him and

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

give him peace said as he was returning from Jihad. එතකොට සඳහන් වෙනවා දැන් මේ ජිහාඩයේ Spiritual aspect එක නැත්නම් ආධ්‍යාත්මික Aspect එක තමයි වඩා උත්තරීතර. දැන් ඔබ සඳහන් කළ කරුණු එක්ක එය පටහැනියි නේද?

පි : මෙහෙමයි. මේක මම දන්නවා, දැක්කා. මෙහෙමයි. දැන් මෙතන Greater ජිහාඩ් කියලා මෙතන කියනවා සහ එහෙම කියන්නේ We have returned and rom the lesser Jihad to the greater Jihad කියලා කියපු නිසා කියලා. නමුත් මෙතන Quote කරන්නේ නැහැ ඒ කියන්නේ දෙවියන් වහන්සේගේ නියෝගයක් හෝ ඒ ප්‍රකාශයක් මෙතන Quote කරන්නේ නැහැ. මෙතන Quote කරන්නේ නබිතුමා එහෙම කිව්වයි කියලා යම් වාක්‍යයක් පමණයි. මේ වාක්‍යයෙන් පමණක් අපට මේකේ සත්‍යතාවය ඇත්ත වශයෙන්ම සනාථ කර ගන්න බැහැ. මෙතන ඔවුන් අනිවාර්යයෙන්ම Quota කරන්න ඕන දෙවියන් වහන්සේගේ ප්‍රකාශයක්. මොකද දෙවියන් වහන්සේ තමයි උත්තරීතර.

ප්‍ර : ඔබ කියන්නේ ඔය Higher Jihad සහ Lower Jihadයන සංකල්පය දෙවියන් වහන්සේ විසින් කියපු කුරානයේ කොහේවත් සඳහන් වෙලා නැහැ කියලද?

පි : කුරානයේ එහෙම සඳහනක් නැහැ.

ප්‍ර : හැබැයි එතකොට ඕක කියලා තියෙන්නේ කවුද?

පි : මේක කියලා තියෙන්නේ අහමද් ඉබන් නකීබ් අල්මිස්රි. මේක ලියන අවස්ථාවේ එතුමා මේ වැකිය මේ විදියට දාලා තියෙනවා. ඉතිං දැන් අපි එදා සාකච්ඡාවට භාජනය කළ කුරානයම 2 වෙනි සූරාවේ 216 වෙනි වගන්තියෙන් මට නැවතත් ඉදිරිපත් කරන්න පුළුවන්. එය පැහැදිලිවම කියනවා ජිහාඩය කියන්නේ මොකද්ද කියලා. එතකොට ඒක තමයි මෙතුමා ගත යුත්තේ. ඒකෙම 2 වන සූරාවේ 190 වගන්තියට Foot Note එකක් හැටියට සපයලා තියෙනවා මේ ජිහාඩය යනු කුමක්ද කියලා ඊටත් වඩා බරපතල විදියට විග්‍රහ කරලා. ඒ බරපතල විග්‍රහයේ තියෙනවා ජිහාඩය යනු ඉස්ලාමයේ එක් බලකණුවක් කියලා. 6 වෙනි බලකණුව කියලා. අප ඉදිරියේ කියන්නේ බලකණු පහක් තියෙනවා කියලා. නමුත් 2 වන සූරාවේ 190 වගන්තියේ Foot Note එකේ තියෙනවා එය තවත් බලකණුවක් කියලා. ඉතිං එතන අර්ථයෙන් ජිහාඩය තමයි Greater ජිහාඩ්. ඊට එහා ජිහාඩ් එකක් එහෙම තියෙනවා නම් එතන සඳහන් වෙන්න ඕන මේ Spiritual Jihad එකයි, Jihad mean spiritual Jihad කියලා එතන සඳහන් වෙන්න ඕන. ඉතිං

FAIR COMMENT — BY JEZEEM

ඇත්තම කියනවා නම් මටත් මේක දැක්කහම මටත් මේක පොඩි සංකූලතාවයක් ආවා. නමුත් මම හිතුවා හිතුවා හිතුවා හිතලා මේ ආපු නිගමනය තමයි මේ. ඒ කියන්නේ මේක මේ කුරානය මේ සමස්ත ආගමම Interpret කිරිල්ලක් තමයි මේ තියෙන්නේ. ඒකට තමයි අර මුෆ්ටි කියලා ඉස්ලාමික සමාජයේ ඉන්න මවුලවීලා මුෆ්ටිලා නෙමෙයි. මවුලවීලා ඇවිල්ලා මුස්ලිම්වරුන්ට මඟපෙන්වන්න උගන්වන්න එහෙම කට්ටිය. නමුත් මුෆ්ටිලා තමයි මේක නීතිමය වශයෙන් Analyse කරන්නේ කුරානය. දැන් මේ අපිට මේ සියල්ල යට කරන්න සිද්ධ වෙනවා එහෙම නැති වුණොත් We have returned from the lesser Jihad to the greater Jihad කියන වචන ටිකට.

ප : හරි. අපිට ඒ සම්බන්ධයෙන් පැහැදිලියි. ඔබ දැන් පැහැදිලි කරමින් ගියේ මේ අල්ටකියා කියන සංකල්පය ගැන. ඒ යටතේ ඔබ පැහැදිලි කරනවා Why do Muslims kill Muslims කියලා. ඒ කියන්නේ මුස්ලිම්වරු ඇති තවත් මුස්ලිම්වරුන්ව මරන්නේ කියලා. ඒ සම්බන්ධව ඔබ මොකක් මේ ගරු කොමිෂන් සභාවට කියන්නේ?

පි : මෙතනදී මට මේකට සමාවෙන්න ඕන. මට මේක සිංහල පරිවර්තනය කරන්න බැරි වුණා. මේකෙන් මම අදහස් කෙරුවේ මේ මුස්ලිම්වරු කියනවා, එතනත් අර මවුලවීතුමා කියනවා, මවුලවීතුමා ප්‍රශ්න කරනවා මාධ්‍යවේදීන්ගෙන් මේ ISIS එක වැඩියෙන්ම මැරුවේ කවුද කියලා. ඇත්ත වශයෙන්ම, සත්‍යය වශයෙන්ම ඒගොල්ලෝ වැඩියෙන්ම මැරුවේ මුස්ලිම්වරුන්ව නෙමෙයි අන්‍යාගමිකයන්ව. නමුත් එතන ඉන්න කවුරු හරි මාධ්‍යවේදියෙක් කියනවා මුස්ලිම්වරුන් කියලා. ඒ අය මුස්ලිම්වරුන්වත් මැරුවා. විශේෂයෙන්ම ෂියා මුස්ලිම්වරු මැරුවා. ඒ ෂියා මුස්ලිම්වරු මරන්නේ මෙන්න මේ මෙතන දක්වලා තියෙන වෙනස්කම් නිසා. ඒ කියන්නේ සමස්ත ඉස්ලාමයම මේ එක අවුල් ගොඩක්. අවුල් ගොඩක්. මේ මවුලවීතුමත් කියනවා සහරාන්ලා සහ ISIS එක ඉදිරියේ එයත් මුස්ලිම් කෙනෙක් නෙමෙයි කියලා. ඉතිං ඒක අපේ වැරැද්දක් නෙමෙයිනේ. ඒක ඉස්ලාමය තුළ ඇති ලොකු බරපතල ගැටළුවක්. අන්න ඒ නිසා අපි මම විසඳුමේදී මට ඉදිරිපත් කරන්න ඕන කාරණාවක් ...,

ප : ඔබ Recommendsවලදී කියන්න. මේක පැහැදිලි කරන්න?

පි : ඔව්. ඉතිං මෙතනදි මේක ඒගොල්ලෝ භාවිතා කරනවා මේ ඉගැන්වීම් නිසා ඉගැන්වීම්වල තියෙන ව්‍යාකූලත්වය සහ ඒ

FAIR COMMENT BY JEZEEM

තියෙන ගැටළුකාරී බව නිසා මුස්ලිම් මුස්ලිම් අය මරා ගන්නවා. මම අර ඉස්ලාමික ගමන ගැන කියනකොට කොළ පාට, දුඹුරු පාට, රතු පාට ඉවර වෙලා මම කිව්වා දරල්ලා ඉස්ලාම් ස්ථාපිත කරනවා කියලා ඒ කියන්නේ සම්පූර්ණ ඉස්ලාමික දේශයක්. මම ඊට පස්සේ කිව්වා එතනිනුත් ඕක නවතින්නේ නැහැ කියලා ඔය Violence මොකද එහෙම කියන්නේ ඒක තමයි ඒගොල්ලොන්ගේ විදිහ. නබිතුමාගේ මරණින් පස්සේ 632 එවෙලේම Death Bed එකේ මෙයා ඉන්නවා දෙගොල්ලෝ මරා ගන්න පටන් ගත්තා. ඉතිං ඒ මරා ගැනිල්ල තමයි මේ අද වනතුරුත් සිද්ධ වෙන්නේ. ඒක අපි ඉස්සරහා කියනවා, අපි ඉස්සරහා ඒක උපයෝගී කර ගන්නවා ඒ අන්තවාදීන් කියලා ත්‍රස්තවාදීන් කියලා ඒගොල්ලෝ වෙනයි, IS වෙනයි, සහරාන්ලා වෙනයි, අපි වෙනයි කියලා. ඒක එහෙම වෙන්න බැහැ. එහෙම නෙමෙයි. ඒ ඔක්කොම එකම කාසිය, සාමාන්‍ය මුස්ලිම්වරුත්, සහරාන්ලා, ISIS එකම ඉස්ලාමික කාසියේ දෙපැත්ත.

ප්‍ර : හරි. දැන් මහත්මයා මේ කුරාන් පාඨයක් තියෙනවා 9 වන සුරාවේ 68 වෙනි වගන්තිය. එහි සඳහන් වෙනවා Allah has promised the hypocrites men and women and the disbelievers the fire of hell. The fire of hell කියලා දැන් අපේ සාක්ෂිවලින් ආවා මේ Bell fire එක ගැන සාක්ෂි දිගටම ආවා. මොකද්ද මේ Fire of hell කියන්නේ?

පි : ඒ කියන්නේ ඒගොල්ලොන්ගේ ආගමේ හැටියට අල්ලාහ් දෙවියන් කියලා තියෙනවා අල්ලාහ් දෙවියන්ගේ වචනවලට ගරු කරලා ඒ කියන විදියටම ඒ නියෝගයන් ක්‍රියාත්මක කරන සද්ධාවන්ත මුස්ලිම්වරුන්ට ස්වර්ග රාජ්‍යයත්, එසේ නොකරන අයට නිරයත් ලබා දෙනවා කියලා. මෙන්න මේ නිරයට තමයි ඒ නිරය සදාකාලිකවම ගිණි ගන්නවා. ඒ ගින්නෙන් පුච්චලා දානවා කියන එක තමයි කියන්නේ මෙතන.

ප්‍ර : ඒ කියන්නේ සියළුම disbelieversලා මේ සදාකාලික ගින්නේ පැසෙන නිරයට යනවා කියන එකයි....?

පි : disbelieversලා විතරක් නෙමෙයි. මෙතනදී මට Highlight කරන්න ඕන වුණේ මෙන්න මේ hypocrites කියන එක. ඒ කියන්නේ මෙතන hypocrites කියලා කියන්නේ මුස්ලිම්වරුන් අතර සටනට නොඑන අන්‍යාගමිකයන්ව මරන්න යන්නේ නැති හරි නියෝගයක් ක්‍රියාත්මක, නියෝගයක් කිව්වහම ඒ නියෝගයට අනුගමනය කරන්නේ නැති අන්න ඒ වගේ මුස්ලිම්වරුන්ට තමයි මේ hypocrites කියලා කියන්නේ.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : ඒ කියන්නේ disbelieversලයි, hypocritesලයි ....?

පි : එතකොට එක ගොඩකට දානවා ඒ වෙලාවේදී.

ප්‍ර : ඒ ඔක්කොම මේ hellfire එකට දානවා කියලා?

පි : දානවා කියලා.

ප්‍ර : හරි.

පි : එතකොට 9 යි 82 කියනවා ඒගොල්ලොන්ට පොඩ්ඩක් හිනහා වෙලා ඉන්නයි කියලා දැනට හිනහා වෙලා ඉන්නයි කියලා. නමුත් ඒ පාපයට That is not fighting in the cause Allah ජිහාඩය නොකරනවට අනිවාර්යයෙන්ම ඒගොල්ලොන්ට දඩුවම් කරනවයි කියලා.

ප්‍ර : හරි. අපිට ඒ සංකල්පය පැහැදිලියි ප්‍රියන්ත මහත්මයා. අපිට ඊළඟ කාරණයට යන්න පුළුවන් නම්?

පි : අනිත් එක මෙන්න මේක හරිම වැදගත් පාඨයක් අවසාන පාඨය. සහියා බුහාරිගේ 984 යි 57 කියනවා මොහොමඩ් නබිතුමා ප්‍රකාශ කෙරුවයි කියලා ඕනෑම මුස්ලිම්වරයෙක් ඔහු ඉස්ලාම් ආගම හැර ගියහොත් ඔහුව මරා දමන්න කියලා.

ප්‍ර : මුත්‍රත් කියලා කියන්නේ?

පි : අන්න හරි. මුර්තද්. එතකොට මේක හරි මේක දැන් මේක බල ගන්වන්නේ ඇත්තටම ක්‍රියාත්මක කරන්නේ නබිතුමාවත්, අල්ලාහ්වත් නෙමෙයි. මේක ක්‍රියාත්මක කළ යුත්තේ මුස්ලිම්වරු. මොකද 33 වන සුරාවේ 21 වෙනි වගන්තියෙන් කියනවා අල්ලාහ්ගේ ස්වර්ග රාජ්‍යයට යන්න බලාගෙන ඉන්න ඕනම මුස්ලිම් කෙනෙක් අනිවාර්යයෙන්ම නබිතුමාව පරමාදර්ශී චරිතයක් හැටියට අරගෙන එතුමා කියපු කරපු හැමදේම ඒ විදියට අනුගමනය කරන්නයි කියලා. එතකොට එතුමා එදා කිව්වා මේක දැන් එතුමා නැහැ ජීවතුන් අතර. එතකොට අනුගාමිකයෝ තමයි කවුරු හරි මුස්ලිම් කෙනෙක් ඉන්නවා නම් ඉස්ලාමය හැර ගිය එයාගේ බෙල්ල කපලා ඒ කුසල කර්මය ලබා ගන්න ඕන.

ප්‍ර : දැන් මහත්මයා ඉස්ලාමික පෙළ පොත්වල මේ ඉගැන්වීම මෙසේම තියෙනවා නම් පාසල් ළමයින්ට මේ ඉගැන්වීම මේ ආගම හැර ගිය කට්ටිය මරා දමව් කියන ඉගැන්වීම එසේම උගන්වලා තියෙනවා නම් ඒ ඉගැන්වීම ඉස්ලාමික ආගමට අනුව හරි ඉගැන්වීමක්ද?

පි : හරි ඉගැන්වීමක්.

ප්‍ර : ඔබ කියන්නේ ඒක නිවැරදි ඉගැන්වීමක්?

පි : ඔව්.

ප්‍ර : නැතුව මේ වහාබි දර්ශනයට අනුකූලව දිපු අර්ථකථනයක් නෙමෙයිද ඒක?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : නැහැ. මම එදත් කිව්වා වහාබි කියලා දර්ශනයක් වෙනම නැහැ. වහාබ්වාදයක් කියලා වෙනම දෙයක් නැහැ. අබ්දල් වහාබ් ඉදිරිපත් කරපු ඒ හැම දෙයක්ම Based on Quaran, Hadees and Sunna ඒ මූලාශ්‍රවලින් පිට අබ්දල් වහාබ්ට පිට පනින්න බැහැ 33 වන සුරාවේ 36 වෙනි වගන්තියේ අබ්දල් වහාබ්ටවත් පිට පනින්න බැහැ.

ප්‍ර : හරි. අපිට ඒ සංකල්පය පැහැදිලියි මහත්මයා. ඊළඟ Slide එකට කැමතියි යන්න මේ 55 වෙනි Slide එක. එහි මොකද්ද සඳහන් වෙන්නේ?

පි : මම මේ ටකියාව ගැන හුඟාක් දේවල් කථා කරන්න පුළුවන්. ඔවුන් එය භාවිතා කරන විදිය අපේ සමාජයේ ගොඩාක් දේවල් භාවිතා කරන්න පුළුවන්. මම මේ ගෙනල්ලා තියෙන්නේ ඇත්තටම නියෝජනයක් විතරයි. අපිට ඒක මේ අවස්ථාවේදී අවබෝධ කර ගන්න. ඔවුන්ගේ ඒ අල්ටකියා භාවිතා කරන විදිහ.

ප්‍ර : ඒ කියන්නේ ඔවුන් මේ අල්ටකියා විදියට පාවිච්චි කරන Phrases නැත්නම් වාක්‍යය ඛණ්ඩ කිව්වොත් හරිද?

පි : ඔව්. හරි.

ප්‍ර : ඒ කියන්නේ Islam Is Peace කියලා ඔවුන් සඳහන් කළාට ඒක අල්ටකියාවක්ද නැත්නම් සත්‍යයක්ද?

පි : ඒක අල්ටකියාවක් වගේ සත්‍යයක් නොවෙයි.

ප්‍ර : තව මොනවද ඒ වගේ කාරණා?

පි : එතකොට We respect women කියලා කියනවා අපි ඉස්සරහා. ඒක සම්පූර්ණ අසත්‍යක්. ඇත්තම කියනවා නම් ඉස්ලාමික ඉගැන්වීම් නිසා, ඉස්ලාමික දර්ශනය නිසා ලෝකයේ හුඟාක්ම හුඟාක්ම අපහසුතාවයකට පත් වෙලා තියෙන්නේ මුස්ලිම් ගැහැණුන්. ඒගොල්ලොන්ට ඒක කියා ගන්න බැහැ. මම කථා කරලා තියෙනවා පෞද්ගලික එවැනි අයත් එක්ක. ඒගොල්ලෝ මුලින් ඒගොල්ලෝ කියන්න කැමති වෙන්නේ නැහැ. නමුත් මම Bag ground එක කියලා මා ඔවුන් සම්බන්ධයෙන් යමක් දන්නා බව කිව්වහම මිත්‍රශීලී වුණහම ඒගොල්ලෝ හැමදේම වමාරනවා. ඒගොල්ලෝ කියනවා ඒගොල්ලෝ විදින දුක.

ප්‍ර : ඔබ ඒ කියන්නේ මුස්ලිම්වරු අන්‍යාගමිකයන් සම්බන්ධයෙන් නෙමෙයි. තමන්ගේම ඒ කියන්නේ ඉස්ලාම් ආගම අදහන මුස්ලිම් ගැහැණුන්ටවත් ගරු කිරීමක් සිද්ධ කරන්නේ නැද්ද?

පි : ගරු කිරීමක් සිද්ධ කරන්නේ නැහැ. මොකද ඒ ඉගැන්වීම් නිසා. ඉගැන්වීම නිසා දැන් උදාහරණයකට නබිතුමා ප්‍රකාශ කරනවා එයාව එක දවසක භූතයා ඇවිල්ලා ජීබ්‍රිල් ඇවිල්ලා පියාඹන

FAIR COMMENT — BY JEZEEM

අශ්වයෙක්ගේ පිටේ නග්ගගෙන හත්වෙනි දිව්‍ය ලෝකය දක්වා ගියා. ඒ එන ගමනේදී අපාය උඩිනුත් ආවා කියලා. එතකොට අපායේ වැඩිපුරම ඉන්නේ ගැහැණුන් කියලත් කියනවා. නමුත් ඒ ඉගැන්වීම්වලම තියෙනවා දෙවියන් වහන්සේ විසින් අපායට යවන අයවයි, ස්වර්ගයට යවන අයවයි තීරණය කරන්නේ Day of Resurrection කියලා. මළවුන්ගෙන් නැගිටින දිනයේදී කියලා. නමුත් එතුමා කියනවා එතුමා දැක්කයි කියලා මේ නිරයේ පැසෙමින්, මේ පිච්චෙමින් ඉන්නේ වැඩිපුරම කාන්තාවෝ කියලා. ඊට පස්සේ එතුමා ඒ කාන්තාවන්ට විරුද්ධව බොහෝ දේවල් කියලා තියෙනවා. බොහෝ දේවල් සුන්නා කරලා තියෙනවා. බොහෝ හදීත් තියෙනවා කාන්තාවන්ට එරෙහිව. උදාහරණයක් විදයට හදීත් එකක් තියෙනවා පුරුෂයා විසින් කාන්තාවට පහර දීමේදී පහර දුන්නහම ඒ ගැන කාටවත් ප්‍රශ්න කරන්න බැහැයි කියලා හදීත් එකක්. එහෙම කියනවා. ඊට පස්සේ කියලා තියෙනවා මේ ගැහැණුන් කියන්නේ පිරිමින්ගෙන් භාගයයි කියලා. මොළේ නැහැ කියලා. එහෙම එවැනි...,

ප : ඔබ එය සඳහන් කරන්නේ මොන ග්‍රන්ථවලද ඔය තියෙන්නේ?

පි : කුරානයේ සහ හදීත්වල. ඊට පස්සේ බරපතලම දෙයක් තමයි තියෙනවා ඒක කුරානයේ දෙවියන් වහන්සේ කියලා තියෙනවා ඒ කියන්නේ එයා ගැහැණියක් පිරිමියාට කියන දේ අහන්නේ නැත්නම් හරි පිරිමියා කියන දෙයක් ගැහැණිය කරන්නේ නැත්නම් ඇයට පහර දෙන්න පුළුවන් කියලා. ඊට පස්සේ හදිස් එකේ තමයි තියෙන්නේ පහර දුන්නයින් පස්සේ කිසි කෙනෙකුට පුරුෂයාගෙන් ඒ ගැන ප්‍රශ්න කරන්න බැහැයි කියලා. ඒ නිසා තමයි අර ඇසිඩ් ගහලා පාක්ස්ථානයේ, ඉන්දියාවේ සහ අප්‍රිකාවේ, ඉරානයේ වැනි රටවල්වල කොතෙකුත් ඒ කාන්තාවන්ව ඇසිඩ් ගහලා විරූපී කරලා දානවා.

ප : දැන් මේ ඔබ ගෙනහැර දැක්වුවේ අල්ටකියාවන් මුස්ලිම්වරුන් පාවිච්චි කරන අල්ටකියාවන් තමයි මේ ගෙනහැර දැක්වුවේ?

පි : මේක ගැන තව කියන්න තියෙනවා.

ප : කියන්න තියෙනවා. කියන්නකෝ?

පි : එහෙම කියනවා. ඊට පස්සේ Islamic Tolerance කියලා තියෙනවා. ඒක පට්ටපල් බොරුවක්. We are proud of මෙතනයි මට එන්න ඕන. We are proud of British, American, Sri Lankan කියලා. දැන් ඔබතුමන්ලා දැකලා ඇති සමහර වෙලාවට ඔවුන් ජාතික කොඩිය Display කරගෙන ඉන්නවා හරි ආඩම්බරයෙන් අපි ඉස්සරහා. ඒ පට්ටපල් ප්‍රෝඩාවක්. විය

FAIR COMMENT — BY JEZEEM

යුත්තේ එයයි. විය යුත්තේ එයයි. නමුත් මට සහතික කරලා කියන්න පුළුවන් ඒ පට්ටපල් ප්‍රෝඩාවක්. එතනින් ඒගොල්ලෝ කියන්නේ අපේ සමාජය කොටසක් වගේ පෙන්වන්න කියලා අපිට. පෙන්වන්නයි කියලා. මම ටකියාවේ ...,

ප්‍ර : ඔබ ඒකේ සඳහන් කරන්නේ ඔවුන් මේ Nations State නැත්නම් රාජ්‍යයන් ශ්‍රී ලංකාවේ ඒ වගේම රාජ්‍යයන් ඒවා පිළිබඳව ඔවුන් විශ්වාස කරන්නේ නැහැ කියලද?

පි : ඔව්. ඒගොල්ලෝ කිසිසේත්ම අපේ කොඩියට ගරු කිරීමක්වත්, අපේ කොඩිය Alfithna ඒගොල්ලොන්ට අපේ කොඩිය Alfithna ඒ කියන්නේ Un Islamic. එතකොට ඒගොල්ලෝ ඒ කොඩිය කවදා හරි ඒගොල්ලෝ බලවත් වෙච්ච ගමන් ඒ කොඩිය විසි කරලා දානවා. ඊට පස්සේ නම පවා ශ්‍රී ලංකාව කියන එක ඒගොල්ලොන්ට Alfithna මොකද දෙවියන් වහන්සේ නෙමෙයි ඒ නම දාලා තියෙන්නේ හෝ මුස්ලිම්වරයෙක් නෙමෙයි. ඒ හින්දා Alfithna ඒ විදියට තමයි මේ මුස්ලිම්වරු සියල්ල දෙස බලන්නේ. මෙතන තියෙනවා අල්ටකියා ගැන පුංචි විග්‍රහයකුත් කරලා Islamic Doctrine of Deception Lying in Islam is permitted under certain circumstances gaining the most important මෙන්න මේක තමයි gaining the trust of non believers in order to draw out their vulnerability to defeat them 100% correct සියයට සීයක් නිවැරදියි ඒ වාක්‍ය. මේ තියෙන්නේ මෙන්න මේකයි මට ගේන්න ඕන ඔය කොඩිය ගැන කියනකොට. මේ බලන්න If you muslimes are under there ඒ කියන්නේ infidels අන්‍යාගමිකයින්ගේ Authority එක යටතේ නම් ඉන්නේ Fearing for yourself ඒ කියන්නේ ඉස්ලාමයේ ගමන ගැන මේ Fearing for yourself කියන්නේ අපි කවුරුත් කිසිම අන්‍යාගමික රටක අපි ඒගොල්ලොන්ට Respect කරනවා ලංකාවේ විතරක් නෙමෙයි ඕනෑම අන්‍යාගමික රටක ඒගොල්ලොන්ට Respect කරනවා ඒගොල්ලොන්ට නිදහස දීලා තියෙනවා ඒ හින්දා එහෙම දෙයක් Fearවෙන්න දෙයක් නැහැ. නමුත් මෙය Fear වෙන්නේ ඒගොල්ලොන්ගේ ඉස්ලාමීය ගමන ගැන Fearing for yourself be have loyalty to them with your tongue while harboring inner anmisity to them කියලා කියනවා. මෙන්න මේ තමයි නියම ඉස්ලාමික දැක්ම අර දුඹුරු පාට කොටස පටන් ගත්තු මොහොතේ සිට. එහෙම නැත්නම් ඒගොල්ලෝ අපිට අභියෝග කරන්න පුළුවන් බලයක් ලබා ගත්තු මොහොතේ සිට

FAIR COMMENT BY JEZEEM

ඒගොල්ලොන්ගේ ස්වභාවය මේ විදියට වෙනස් වෙනවා. ඊට පස්සේ අපි දැන් අවසානයට එනවා.

ප්‍ර : හැබැයි දැන් ඉස්ලාමික රාජ්‍යයක් වුණොත් ඔවුන් ඉන්න රාජ්‍යය ඉස්ලාමික රාජ්‍යයක් නම් සම්පූර්ණ ඉස්ලාම් රාජ්‍යයක් නම් මේ කියන කුරාන පාඨයක්වත් අදාළ වෙන් නැහැනේ ඔවුන්ට නේ?

පි : මට තේරුණේ නැහැ.

ප්‍ර : ඔවුන් ඉන්නේ සමස්ත ඉස්ලාම් රාජ්‍යයක නම් මේ පුද්ගලයන් ඉන්නේ එතකොට මේ කියන ටකියාව කියන කාරණය ඔවුන්ට අදාළ වෙන්නේ නැහැනේ. අවශ්‍යතාවයක් නැහැනේ?

පි : මේක තනිකරම අන්‍ය ආගමිකයන්ට එරෙහිව ඒ හැම නියෝගයකම ඒක තියෙනවා ලියලා. අර Hypocrites ගැන සඳහන් කරලා තියෙන දේවල් හැරෙන්න Hypocrites සම්බන්ධයෙන් සඳහන් වෙලා තියෙන එක ඒගොල්ලන්ගේ ආගම ස්ථාපිත වුණායින් පස්සෙත් තියේවි. නමුත් මේකේ වැඩි හරියක් තියෙන්නේ අපි ගෙනාපු ඒවායේ අන්‍ය ආගමිකයන්ට එරෙහිවනේ. ඒවා ඒගොල්ලන්ට අදාළ වුණේ නැහැ.

දැන් වේලාව : ප.ව. 7.00 යි.
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය.

President Secretariat Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රානී මිය විසින්ය.
වේලාව රාත්‍රී 7.00 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : එතකොට මහත්මයා දැන් ඔය Islam is Peace කියන සංකල්පය සම්පූර්ණ ඉස්ලාම් ජනතාවක් ඉන්න රාජ්‍යයක් තුල 100% ක් හරි වෙන්න පුළුවන්ද? සම්පූර්ණම ඉස්ලාම් පුද්ගලයින් පමණයි ඉන්නේ?

පි : ඔව් බොහොම හරි. අන්න ඒ අර්ථයෙන් තමයි Peace කියන්නේ. ඒ කියන්නේ මුස්ලිම් නොවන අන්‍යාගමික සමාජයකට ගිහිල්ලා ස්ථාපිත වෙලා ඉදලා ඒ සියළු දේ ලබාගෙන ඉන්පස්සේ ඒගොල්ලෝ වර්ධනය වෙලා ස්වදේශික අන්‍යාගමික ජාතිය මරලා ලබා ගන්නා වූ position එක ඒ තත්ත්වය තමයි දරල් ඉස්ලාම් කියන්නේ. එතකොට ඉස්ලාම් කියන්නේ Peace නෙමෙයි. ඉස්ලාම් කියන්නේ Total Submission. නමුත් දරල් ඉස්ලාම් තත්ත්වයට ආවායින් පස්සේ ඒගොල්ලෝ බලාපොරොත්තු වෙනවා ඔය කියන සාමය. නමුත් ඒ අර්ථයෙන් තමයි ඒගොල්ලෝ අපි ඉස්සරහා මේ ඉස්ලාමය කියන්නේ සාමයයි කියලා. ඒ කියන්නේ උදාහරණයකට මේ විදියට අපි උඹලාව මරලා උඹලව අයින් කරලා අපි ලබා ගන්නා වූ සාමය තමයි අපි සාමය හැටියට සලකන්නේ කියලා තමයි ඒ අර්ථයෙන් තමයි ඒගොල්ලෝ ඒක දිහා දකින්නේ.

ප්‍ර : අපිට ඒක පැහැදිලියි. අපි මේ සංකල්පය අවසන් කරමු?

පි : මට මේක අවසාන කරන්න ඕන. තව ගොඩාක් දේවල් තියෙනවා, මේක මහා සාගරයක් වාගේ ඇත්තෙන්ම කියනවා නම්. නමුත් මේ නියෝජනයක් විතරයි මේ හැමඑකේම ගෙනාවේ. මේක මට සංක්ෂිප්ත කරන්න පුළුවන් මේක, Conclude කරන්න පුළුවන් ඉස්ලාමයේ නියම ස්වභාවය. අපි green belt එකේ ඉන්නවා නම් ඒක ප්‍රශ්නයක් නෙමෙයි. නමුත් ඒක වර්ධනය වෙනවානේ. ඒ නිසාවෙන් මට කියන්න පුළුවන් ඉස්ලාමයේ නියම ස්වභාවය ඇවිල්ලා නිසි වෙලාව එනතුරු කුරුමානන් අල්ලන මිනීමරු වෘකයෙක් කියලා. නමුත් මේගොල්ලෝ අපේ ඉස්සරහා හැසිරෙන්නේ සහ අපිට ඒත්තු ගන්වන්නේ, අපිට කියන්නේ හැම දෙයකින්ම මුස්ලිම් සමාජයේ නායකයෝ, ආගමික නායකයෝ දේශපාලන නායකයෝ මේ හැම කෙනෙක්ම සංවිධාන හැම කෙනෙක්ම අපි ඉස්සරහා කියන්නේ අපි මේ ගොඩ නගන්නේ

FAIR COMMENT BY JEZEEM

බැටළුවෙක්ය කියලා. අපිට මෙතෙක් කල් අපට එහෙමයි කිව්වේ. අපි ඒක විශ්වාස කෙරුවා. නමුත් ඇත්ත වශයෙන්ම ඒ ගොඩනැගුනයින් පස්සේ ඉන්නේ බැටළුවා නෙමෙයි මෙන්න මේ බැටළු හම පොරවා ගත්තු මිනීමරු වෘකයා.

ප : හරි ඔබ දැන් 56 වන සලයිඩ් එක බලලා තමයි සාක්ෂි දුන්නේ. අපි ඊලඟ සලයිඩ් එකට ගියොත්.
ඔබ මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කලා මේ ඉස්ලාමික ප්‍රශ්නය මොකක්ද, ඔවුන්ගේ ක්‍රියාකලාපයන් මොනවද, ඔවුන්ගේ අරමුණු මොනවද කියලා ඒ ඔක්කොම පැහැදිලි කළා. දැන් ප්‍රශ්නයට ඔබගේ හැදෑරීම තුලින් යම්කිසි විසඳුම් හොයා ගත්තද? ඒ හොයා ගත්තා නම් ඒ විසඳුම් මොනවද?

පි : ඔව් මම මේ දීර්ඝ අධ්‍යනයෙන් පස්සේ මම මේකට විසඳුම් හෙව්වා. ඒවා ප්‍රායෝගික විසඳුම්. නමුත් එකල ඒ කියන්නේ 2012, 2013 පාස්කු ඉරිදා ප්‍රහාරය වෙනකන්ම ඒවා ප්‍රායෝගික විදියට සමාජය දැක්කේ නැහැ. සමහර දේවල් ප්‍රායෝගික විදියට දැක්කේ නැහැ. නමුත් ඒවා ප්‍රායෝගික විය යුතුයි. මනුෂ්‍යාගේ නාමයෙන්. මේකේදි මම මුලින්ම කියන්න ඕනේ අපි මේ විසඳුම් ගේන්නේ මහා විනාශයකින් රට මුදා ගන්න. මහා ලේ වැගිරීමකින් නොනවතින ලේ වැගිරීමක් වළකා ගන්න. සහ සිංහල බෞද්ධයෝ ගැන හිතලා විතරක් නොවෙයි. මෙතනදී මුස්ලිම් ජනතාවගේ කොටසක් ඉන්නවා ඔවුන් සැබෑ සාමයට කැමති අය. නමුත් මම අර ඉදිරිපත් කරපු ඉගැන්වීම්වලින් ඒගොල්ලොන්ව බන්ධනය කරලා තියෙනවා, ඒගොල්ලොන්ව block කරලා තියෙනවා ඒගොල්ලොන්ට එළියට එන්න බැරි විදියට මනසින් සහ ශාරීරිකව. එතකොට එතනදී අපි ඒ අය ගැනත් අපි සලකා බැලිය යුතු වෙනවා. ඒ අයට අපිට වගේම මට සහතික කරලා කියන්න පුළුවන් අපිට වගේම ඒ අයටත් මේ මිලේච්ඡත්වය සහ මේ ගමන් මහ සාමාන්‍ය මුස්ලිම්වරුන්ට සඟවලා තියෙනවා. ඒ අයගෙන් සමහර අය ඒක දන්නවා ඇති. නමුත් ඒගොල්ලොන්ට හැඟීමක් තියෙනවා මුස්ලිම් නොවන සමාජය විනාශ කරනවා කියලා. නමුත් ඒගොල්ලොන්ට දීලා තියෙන අර මනසේ ස්වභාවය, ඒගොල්ලොන්ට දීලා තියෙන ඉගැන්වීම් තුළින් ඒගොල්ලන්ගේ මනස brain wash කරලා තියෙනවා ඒගොල්ලන්ට හිතන්න හැමවේලේම ඒගොල්ලෝ තමයි victim's කියලා. අන්න ඔතන අපි බොහොම පරිස්සම් වියයුතුයි. බැරෑරුම් වියයුතුයි. ඒ සාමාන්‍ය මුස්ලිම්වරු ඒ නිසාම ඒගොල්ලෝ අපි අන්තවාදයට යම් පියවරක් ගන්න කොට සමස්ථ මුස්ලිම් ජනතාවම කඩාගෙන ඉස්සරහට පනිනවා. එහෙම පනින්නේ

FAIR COMMENT BY JEZEEM

සමහර අය, එහෙම පනින්නේ ඒගොල්ලෝ හිතනවා ඉස්ලාමයට හරි මුස්ලිම් අයට හරි අගතියක් කරන්න යනවයි කියන චේතනාවෙන්. මේ අන්තවාදයට අපි යමක් අපි පියවරක් ගන්න හදන කොට. ඉතින් කිව්වනේ ජිහාඩයට නුඹලාට කෝල් කරන කොට උඹලා කර කර ඉන්න වැඩ නවත්තලා වහාම joined වෙන්න ඕන කියලා. අන්න ඒවාගේ ඒගොල්ලොන්ට කියන නිසා ඒගොල්ලෝ එනවා. නමුත් අපි දැනගත යුතුයි ඒගොල්ලොන්ගෙන් සෑහෙන කොටසක් මේ සම්බන්ධයෙන් නිසි අවබෝධයක් නැති බව. ඒක ඔළුවේ තියාගෙන ඒක අපි මනසේ තබාගෙන මම ආරාධනා කරනවා ගරු කොමිෂමට අපි මේ විසඳුම් මාලාවට යමු කියලා.

ප්‍ර : අපි එකින් එක කෙටියෙන් මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරමු.

පි : පළවෙනි කාරණය මුස්ලිම්වරුන් විසින් අපෙන් සඟවාගෙන සිටින ඉස්ලාමයේ නියම ස්වභාවය සහ එහි අරමුණු පිළිබඳව සිංහල බෞද්ධ සමාජය ඇතුළු මුස්ලිම් නොවන අනෙකුත් ජනයා දැනුවත් කිරීම. මේක වියයුතුම දෙයක්. ඒ මොකද මේ මට සහතික කරලා ආපහු කියන්න පුළුවන් දැනුවත් සමාජයක් ඉස්ලාමය පිළිබඳව දැනුවත් සමාජයක ඉස්ලාමයේ යාන්ත්‍රණය ඇණ හිටිනවා. ඒ රෝද හතර ලොක් වෙනවා. ඒක ඉස්සරහට යන්න බැහැ. නමුත් ඒගොල්ලොන්ට ඉස්සරහාට යන්න පුළුවන් අර අපේ සමාජයේ ඉස්ලාමය පිළිබඳව හරිහැටි අවබෝධයක් නොමැති විශාල කොටසක් ඉන්නවා. අන්න ඒ අයගෙන් වැඩි කොටසක් ඉස්ලාමය වෙනුවෙන් ඉදිරිපත් වෙනවා. ඒ නොදන්නකමට ඒගොල්ලෝ. නොදන්න කමට අපි පියවරක් ගන්න හදන කොට ඒගොල්ලෝ ඉදිරිපත් වෙනවා ඒගොල්ලෝ safe guard. මුස්ලිම්වරු පැත්තකට වෙලා බලා ඉන්නවා මොකද සට්ටනය යන්නේ අපේ සමාජය තුළමයි. එතකොට ඒගොල්ලොන්ට ඒකෙන් වාසියක් වෙනවා. ඒ නිසා සමස්ථ සිංහල බෞද්ධ ජනතාවත්, අනෙකුත් දෙමළ, හින්දු, කතෝලික මේ සියල්ලන්ටම සහ මුස්ලිම් අයටත් ඇතුළුව අපි මේ ඉස්ලාමය කියන්නේ මොකක්ද, මේකේ ගමන් මඟ මොකක්ද, මේකේ සත්‍ය තත්ත්වය මොකක්ද, අරමුණු මොනවාද, අවසානය මොකක්ද කියන එක පැහැදිලි කරලා දෙනවා. දැන් අපි දන්නවානේ මුස්ලිම්වරුන්ගෙන් බොහෝ සාමාන්‍ය මුස්ලිම්වරු කියනවා ඒගොල්ලෝ සාමයට කැමතියි. ඉස්ලාමය මිනීමරු මිලේච්ඡ ඉගැන්වීම් නැහැ කියලා ඒගොල්ලෝ කියනවා. ඒත් සමහර අය ඒක අල්ටකියා අපිව රවට්ටන්න. නමුත් සමහර අය ඇත්ත වශයෙන්ම like මගේ යාළුවා මසි එයා අවංකව

FAIR COMMENT — BY JEZEEM —

ම මට කිව්වා මම ඔය දේ ගැන දැනගෙන හිටියේ නැහැ කියලා. ඉතින් මම 9 වන ශූරාවේ 5 වන වගන්තිය ගැන කියන කොට එයා කිව්වා මම නම් මේක ගැන ඇත්තටම දැනගෙන හිටියේ නැහැ කියලා. ඉතින් ඒ වගේ ඒ අයටත් එක්ක, ඒ අය එහෙම කියනවානේ සාමයට ඒගොල්ලෝ සාමකාමී මිනිස්සු අපි ඒක පිළිගතයුතුයි ඒ අයව කපටියන්ව අයින් කරලා අන්න ඒ අයට අපි මේක ඉදිරිපත් කෙරුවාම ඒ අයට සිද්ධ වෙනවා එක්කෝ මේක ප්‍රඥාවෙන් බලලා ඒගොල්ලෝ තීරණයක් ගන්න. එහෙම නැත්නම් අපිත් එක්ක ඉදිරියට යන්න අනිත් සම සමාජයත් එක්ක ඉදිරියට එහෙම නැත්නම් ඒගොල්ලන්ට සිද්ධ වෙනවා ඉස්ලමික යන්ගේ පැත්ත ගන්න. ඊට පස්සේ විවෘත සමාජය තුළ විද්වත් කතිකාවක් ගොඩනඟා ඉස්ලාමය පිළිබඳව සත්‍ය නිරාවරණය කිරීම. ඒකත් අර පළවෙනි එකටම අනුබද්ධයි. මේකෙන් මම ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ මෙන්න මේ විදියට විවෘත සමාජය තුල කරන්නාවූ මාධ්‍ය සාකච්ඡා, සංවාද, රූපවාහිනී සංවාද තුළින් ඉස්ලාමික මුල්වාචරුන්ගේ කටින්ම, කටින්ම ඉස්ලාමය මිලේච්ඡත්වය හා එහි නියම ස්වභාවය පිළිගන්නට සිදුවන තැනට හැසිරවීම. මේ සඳහා මාධ්‍යවේදීන්ගේ ඒගොල්ලොන් දැනුවත් විය යුතුයි. මොකද මේක word game එකක් මෙතන යන්නේ. අපි ඉස්ලාමිකයෙක් මෙතනට ගෙනාවොත් මවුලවි කෙනෙක් ගෙනාවොත් එයා තනිකරම පාවිච්චි කරන්නේ වචන හරබයක්. අපි දැනුවත් විය යුතුයි ඒගොල්ලෝ කියන දේ ටක් ගාලා අපි හරි දෙයින් බ්ලොක් කරන්න. ඒ කියන්නේ වැරැද්ද, අසත්‍යය, සත්‍යයෙන් ජයගත යුතුයි. ඒ සඳහා ඒ දැනුම අවශ්‍ය වෙනවා.

ප : අපිට ඒ ටික පැහැදිලියි, ඊලඟ එකට යමු?

පි : ඉස්ලාමික ව්‍යසනය පිළිබඳ සියළුම ජනයාගේ ප්‍රශ්නයක් බව සමාජයට අවබෝධ කිරීම. අර උඩින් කියපු දේවල් හරහා මේකේ අරමුණ ඒකයි. ඉස්ලාමික ව්‍යසනය සියළුම ජනයාගේ ප්‍රශ්නයක් බවට සමාජය අවබෝධ කර ගන්න ඕනේ. මොකද ප්‍රශ්නයකට විසඳුමක් හොයන්න බැහැ ඒ ප්‍රශ්නය තමන්ගේ ප්‍රශ්නයක් නොවෙයි කියලා මිනිස්සු හිතන තාක්කල්. මොකද ඒගොල්ලෝ ඒ දිහා බලන්නේ නැහැ, ඒගොල්ලොන්ගේ හඬක් එන්නේ නැහැ, ඒගොල්ලොන්ගේ සහයෝගය, ඒගොල්ලොන්ගේ තල්ලුව මේකට එන්නේ නැහැ. අපි සමස්ථ සමාජය මේ ගැන දැනුවත් වෙලා ඒ සමස්ථ සමාජයම මේක ප්‍රශ්නයක් කියන තැනට අපිට පුළුවන් නම් ඒ අවබෝධය ලබා ගන්න අපි හැමෝම එකතු වෙලා අපි නැගිටලා මේකට විසඳුමක් ඉල්ලාවී. ඉස්ලාමික ප්‍රශ්නය හරහා රටට සිදු වන්නට යන මහා විනාශය නොතකා පටු දේශපාලනය

FAIR COMMENT BY JEZEEM

ගැන පමණක් සිතමින් ඉස්ලාමික් අන්තවාදයට කිරි පොවමින්, නළවමින් මුක්ත ලෙස කටයුතු කරන සිංහල දේශපාලන පක්ෂ සහ ඒවායේ නායකයින්ට තවදුරටත් එලෙස කටයුතු කිරීමට නොහැකි වන ලෙස සමාජය දැනුවත් කිරීම. මේකත් අරකෙම ප්‍රතිඵලයක් ලෙසයි මම දකින්නේ. ඉස්ලාමික ෂරියා නීතිය මෙරටේ ස්ථාපිත නොවන ලෙසට රටේ පොදු නීතිය බලගැන්වීම සහ මේවන විටත් මෙරට ස්ථාපිත කොට ඇති ෂරියාවේ කොටස් මුස්ලිම් විවාහ නීති, බහු භාර්යා නීති සහ ෂරියා මූල්‍ය හා බැංකු නීති මුළුමනින්ම තහනම් කොට එක නීතියක් යටතේ සියළුම ජනයාට ජීවත්වීමට සැලැස්වීම. මේක ප්‍රායෝගික වියයුතුයි. මේක ප්‍රායෝගික නොවන දෙයක් නොවෙයි. මේක ප්‍රායෝගික වියයුතුයි. ඔවුන් ඒ කපටිකමට ඔවුන්ගේ පුංචි පුංචි දේවල් ඉස්සෙල්ලම දාලා විවාහ නීති දාලා ඒවගේ දේවල් දාලා ඊට පස්සේ හලාල් දාගෙන ඒ ඔක්කොම කරන්නේ මේ බෙදීම සමාජය බෙදාගෙන ඉස්සරහට යන්නයි. ඉස්ලාමික සංස්කෘතික ආක්‍රමණයේ කොටසක් වන බුර්කාව නීතියෙන් තහනම් කොට තවදුරටත් එය මෙරට සංස්කෘතික ආක්‍රමණය කිරීමට යොදා ගන්නා මෙවලමක් ලෙස භාවිතය නතර කිරීම. මේ හරහා සිදුවන්නේ මේ ඉස්ලාමය අඩු ගණනක් තියෙන බූවල්ලෙක් හා සමානයි. ඒගොල්ලෝ ඒ ආක්‍රමණය කරන්නේ එක් එක් ආකාරයෙන්. ආර්ථිකය, ස්වදේශිකයන්ගේ ආර්ථිකය අඩපන කරමින් ඔවුන් ආර්ථිකය ඒ විදියට හසුරවන්නට, අතට ගන්නට උත්සාහයක ආක්‍රමණයක යෙදෙනවා. ඊට පස්සේ බැංකු පද්ධතියේ ඒ විදියට යනවා. ඒක එච්චරම සාර්ථක නොවෙන්න පුළුවන් ඒගොල්ලොන්ට. නමුත් ඒගොල්ලෝ යම් තරමික් එහෙම කරනවා. නමුත් අනික් දේවල්වලදී ඒගොල්ලෝ බොහෝ ඉදිරියෙන් සිටිනවා. විශේෂයෙන් ඉඩම් ගනුදෙනුවලදී මට අද උදෙන් කෙනෙක් කිව්වා ඒගොල්ලෝ පොඩි කාලෙදී කළුතර ඉදලා තියෙන්නේ. ඒගොල්ලෝ පොඩි කාලේදී මුස්ලිම් කිහිප දෙනෙක් ඇවිල්ලා තියෙනවා ඒ ගමට. එතකොට ඒගොල්ලෝ ඉතින් හිනාවෙලා හිටියලු, ඒගොල්ලෝ බොහොම මිත්‍රශීලිව ඉදලා දැන් ඒගොල්ලොන්ගේ ඉඩමත් අල්ලගෙනලු. ඉඩම අල්ලගෙන දැන් මේගොල්ලොන්ගේ වහල තියෙන්නේ ඒගොල්ලොන්ගේ මුස්ලිම් අයගේ ඉඩමේලු. ඒ විදියට ආක්‍රමණයක් කරලා තියෙනවා. ඒක සාමාන්‍ය සුළු දෙයක්. නමුත් බොහෝ බරපතල විදියට කව්චේරිවල documents වෙනස් කෙරිල්ල කරනවා. ඒක සිද්ධ වෙනවා. ඊට පස්සේ මම අර කිව්වානේ 60 වන ශූරාවේ 1 වෙනි වගන්තියේදී කියනවානේ මුස්ලිම්වරුන්ට රහස්

හෙළිකරන්න එපා, මුස්ලිම්වරුන් අන්‍යාගමිකයන්ට තොරතුරු දෙන්න එපා, අන්‍යාගමිකයින්ගේ පැත්ත ගන්න එපා කියලා. අන්න ඒ නීතියට අනුව, ඒ නියෝගයට අනුව මුස්ලිම් ග්‍රාමසේවක නිලධාරීවරු, මුස්ලිම් ප්‍රාදේශිය ලේකම්වරුන් බරපතල විදියට වර්ගවාදී ලෙසින් ඒ ආක්‍රමණයට සහයෝගය දෙනවා. අපේ සිංහල මිනිස්සුන්ගේ ඒ ඉඩම් නැති කරලා ඒ තත්ත්වයක් ඇති වෙලා තියෙනවා.

ප්‍ර : හරි ඔබ තවදුරටත් සඳහන් කරනවා මේ Muslim Only, නැත්නම් මුස්ලිම් ජනතාව පමණක් යන පදනමින් මෙරට භූමිය තුළ වර්ගවාදී කොළණිස්ථාපිත කිරීම එයින් ඔබ අදහස් කරන්නේ මොකක්ද?

පි : ඒකෙන් මම අදහස් කරන්නේ මේගොල්ලෝ 60 වන ශූරාවේ 4 වන වගන්තියට ප්‍රකාරව මේගොල්ලෝ වෙන්වෙලා වෙනස් වෙලා අපිව ප්‍රතික්ෂේප කරලා අපිව පරම හතුරෝ විදියට සලකලා මේගොල්ලෝ වෙනම ජීවන ක්‍රමය ඒ කියන්නේ ඉස්ලාමික ජීවන ක්‍රමය ස්ථාපිත කරගෙන කරගෙන යනවා තැන් තැන්වල. ඉතින් අපි බලාගෙන ඉන්නවා ඒගොල්ලෝ ඒ විදියට වර්ධනය වෙමින් යනවා. ඕක අපිට හැමදාම ඔය විදියට තිබෙන්නේ නැහැ. ඉතින් මේක භයානක තත්ත්වයක්. දැන් විල්පත්තු.

ප්‍ර : ඔබ කියන්නේ මුස්ලිම් ගම්මාන, දෙමළ ගම්මාන, සිංහල ගම්මාන කියලා එහෙම වෙන් වෙන් වශයෙන් තිබීම හොඳ නැහැ කියලද?

පි : වෙන් වෙන් වශයෙන් තිබීම හොඳ නැහැ එකක්. වෙන් වෙන් වශයෙන් ප්‍රදේශ වෙන්කර ගැනීම ඊට වැඩිය හොඳ නැහැ. දැන් නැති ප්‍රශ්නයක් අපි ඇති කර ගත්තා විල්පත්තුවේ මුස්ලිම් කොළණිය. එදා මම පෙන්නුවා ඒකේ Picture එක.

ප්‍ර : ඒ ගැන කතා කරන්නේ නැතුව ඔබ වෙන උදාහරණයක් අරන් කතා කරන්න.

පි ; ඔව් ඒ විදියට මේගොල්ලෝ දැන් මම ඊස්ට් එකට ගියා. ඊස්ට් එකට ගියාම මම ඇහින් දැක්කා, මම තොරතුරු ගත්තා එතනදී අක්කර ගණන් රක්ෂිත කොල්ල කනවා. ඊට පස්සේ ඒගොල්ලෝ මේ කොන්ක්‍රීට් පෝස්ට් ගහන්නේ පාරේ. පාරේ ගගහා කැලේට ගෙනිහිල්ලා මහා පරිමාණයෙන් ඉඩම් ආක්‍රමණයක් කරනවා. ඉතින් මේ ඔක්කෝම forcus වෙන්නේ මේ ඔක්කොම යන්නේ අර ආක්‍රමණය දෙසටයි. ඒගොල්ලෝ ලකලැස්ති වෙනවා. අපේ සමාජය ඒ ගැන දැනුවත්කම නැති නිසා අවබෝධය නැති නිසා ඒ ගැන නිහඬ පිළිවෙතක් රකිමින් සිටිනවා. ඉතින් මේක හරි භයානක තත්ත්වයක්. ඊට පස්සේ සමස්ථ සමාජයම අවශ්‍යතාවයක් ලෙස සහ යහපත ලෙස සලකා විනාශකාරී

FAIR COMMENT — BY JEZEEM

ඉස්ලාමික න්‍යාය පත්‍රය මෙරට තවදුරටත් ඉදිරියට යාමට නොහැකි ලෙස අලුතින් නීති රීති හඳුන්වා දීම හරහා ඉස්ලාමික න්‍යාය පත්‍රය දියකර හැරීම සහ ඒ කුඛ ක්‍රියාකාරකම් ඉදිරියේ රටේ නීතිය ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම. මෙතනදී අපි නීතිය බලවත් විය යුතුයි. ඒගොල්ලෝ අල්ෆිට්ටා ලෙස දකිනවා අපේ නීතිය. අපේ නීතියට ඒගොල්ලෝ අභියෝග කරනවා. ඒගොල්ලන්ට අවශ්‍යයි අපේ නීතිය දියකරලා දියවෙලා යනවා දකින්න. නමුත් අපි කළයුත්තේ ඒකේ අනික් පැත්තයි. අපි කලයුත්තේ අපේ නීතිය ශක්තිමත් කිරීමයි.

ප්‍ර : ඔවුන් ඒ කියන්නේ ඔබ දැකලා ඇති සමහර වෙලාවට යම් යම් ප්‍රදේශවල හෙල්මට් එක පවා දාගෙන යන්නේ නැහැ. ඒකට හේතුවක් වෙන්නේ ඔය අල්ෆිට්නා කියන සංකල්පයද?

පි : ඔව්. ඒකට හේතුවත් අල්ෆිට්නා එකට මම කිව්වා අයිති වෙනවා කියලා අපේ නීතිය. ඉතින් ඒකේ 8 වන ශූරාවේ 39 වෙනි වගන්තියෙන් සහ 2 වන ශූරාවේ 191 වන වගන්තියෙන්. ඒ දෙකෙන්ම කියනවා ඒ අල්ෆිට්නා විනාශ කරන්න කියලා. ඒ නීතියත් ඇතුළුව විනාශ. එලෙස අභියෝග කරනවා කියන්නේ එය විනාශ කරන්නට කටයුතු කරනවා කියන එකයි.

ප්‍ර : දැන් මුස්ලිම් කොළඹ ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ඔබ දකිනවද විසඳුමක් වශයෙන් සිංහල පුද්ගලයින් ගිහිල්ලා ඔය මුස්ලිම් ගම්මානවල පදිංචි කරවීම සිද්ධ කලොත් නැත්නම් දමිල මිනිස්සු සහ සිංහල මිනිස්සු ඔය ගම්මානවල පදිංචි කරවීම දැන් ගිහිං පදිංචි කිරීම විසඳුමක් ලෙස ඔබ දකිනවද?

පි : විසඳුමක් විදියට මම දකිනවා එහෙම මිශ්‍ර කිරීම. නමුත් එය සිදුවිය යුත්තේ අර මුලින්ම මම කියපු විසඳුමත් එක්ක. ඒ කියන්නේ අපේ සමස්ථ සමාජයටම මේ ඉස්ලාමයේ ගමන සහ එහි ස්වභාවය තේරුම් බේරුම් කර දීමෙන් පසුවයි. එතකොට යන්නේ එලෙස යන්නේ ඔවුන් සමඟ ජීවත් වෙන්න යන්නේ දැනුවත් වූ ජනතාවයි. මම කිව්වා දැනුවත් වූ ජනතාව ඉදිරියේ අකර්මන්‍ය වෙනවා කියා ඒගොල්ලොන්ගේ යාන්ත්‍රණයට.

ප්‍ර : හරි අපි ඊලඟ විසඳුමට යන්.

පි : මනුෂ්‍යත්වයට එරෙහි ඉස්ලාම් ඉගැන්වීම හරහා අගතියට පත් වී ඇත්තේ අන්‍යාගමිකයන් පමණක් නොව මනුෂ්‍යත්වයට ගරු කරන මුස්ලිම්වරුන්ද එම ඉගැන්වීම් හරහා නින්දා සහගත අගතියට පත් වන බව මුස්ලිම්වරුන්ට පහදා දීම. මේකෙන් මම අදහස් කෙරුවේ ඒගොල්ලෝ ඉස්ලාමයේ එල්ලීගෙන ඉන්නවා. තමන්ගේ ආගම ඒක කවුරුත් කැමති දෙයක්නේ. අපේ ආගමට අපි ආදරෙයි, කාටත් ඒ හැඟීම තියෙනවා. නමුත් මේගොල්ලෝ

FAIR COMMENT — BY JEZEEM —

මේ එල්ලිලා ඉන්නේ මිනීමරු ත්‍රස්තවාදී මහා භයානක ආගමක. ඒ නිසාම ඔවුන්ගෙන් කොටසක් අහිංසක මනුෂ්‍යන්ව ඝාතනය කරන කොට, බෙලි කපන කොට අතපය කපන කොට, ඒ බෝම්බ පුපුරවන කොට මේ අය. මේ අයටත් ඒ නින්දාව එනවා. ඉතින් ඒ මනුෂ්‍යත්වයට ගරු කරන මුස්ලිම්වරයෙකුගේ මනස අපිට හරියටම කියවන්න බැරි වුණත් ඒගොල්ලන්ටත් ඒක මට විශ්වාසයි ඒගොල්ලන්ට ඒ නින්දාව යනවයි කියලා. ඉතින් ඒ හින්දා අපි ඒ දේත් තේරුම් ගතයුතුයි සහ ඒ බව ඔවුන්ට පැවසිය යුතුයි. ඔවුන්ගේ මොළය අපි සේදිය යුතු වෙනවා.

ප්‍ර : හරි අපි ඊලඟ එකට යමු?

පි : විශේෂයෙන්ම ඉස්ලාමය යටතේ කාන්තාවන්ට සිදුවන අසීමිත පීඩනය සහ අකටයුතුකම් විවෘත සමාජය තුළ සාකච්ඡාවට භාජනය කලයුතුය. ඒ හරහාත් තෙරපී තිබෙන මුස්ලිම් කාන්තාවන්ගේ හඬ අවදි කොට මුස්ලිම් සමාජය ඇතුලෙන්ම විවේචනයක් එල්ලවීමට ඉඩ සැලසිය යුතුය. මේක හරි වැදගත් මේ ඇතුලෙන්ම මොකද ඉස්ලාමීක සමාජය ඇතුලතින් ම විවේචනයක් අපි ස්ථාපිත කලයුතුම වෙනවා. එය ඔවුන්ගේ පැත්තෙන් දෙවියන් වහන්සේගේ ආඥාවලට ඒ ඉගැන්වීම්වලට විරුද්ධයි. නමුත් විරුද්ධ වුනත් අපි එය සාධාරණීයකරණය කළයුතුයි. ප්‍රායෝගිකව ඔවුන් විඳින දුක අපිට උලුප්පලා පෙන්නන කොට ඔවුන්ගේ මනස දෙවියන්ගේ නියෝගය හෝ දෙවියන්ගේ තර්ජනයට වඩා ඔවුන්ගේ මනස කතා කරාවි.

ප්‍ර : හරි අපි ඊලඟ එකට යමු?

පි : ඉස්ලාමිය ඉගැන්වීම්වලට අනුකූලව මුස්ලිම්වරුන් විසින් සිදු කරන බරපතල පාදඩකම් සහ මනුෂ්‍යත්වයට එරෙහි ක්‍රියාකාරකම් නිසි විමර්ශනයකින් පසුව අදාල චුදිතයාගේ පාපොච්චාරණයක්ද සහිතව එම පාදඩකම්වලට හේතුව ඉස්ලාමික ඉගැන්වීම් බව ප්‍රසිද්ධියේ හෙළි කිරීම තුළින් මුස්ලිම් සමාජයට තම ආගමික ඉගැන්වීම්වල නිරුවත ඉදියේ සිට ගන්නටට සැලැස්වීම. මම කිව්වා දැන් මේ නොයෙකුත් පාදඩකම් අනවශ්‍ය මහා භයානක දේවල් ඔවුන් සිදු කරනවා මේ රටට. මනුෂ්‍යයින්ට. එතකොට ඒවා කෙනෙක්ව අල්ල ගත්තාම ඒ අල්ලගෙන මොනවා කරලා හරි එයාගෙන් පාපොච්චාරණයක් ගතයුතු වෙනවා තමන් හෝ මම කලේ මේ ඉස්ලාමික ඉගැන්වීම්වලට අනුකූලවයි, මට අහවල් මවුලවි තමයි මෙහෙම කරන්න කිව්වේ අන්න ඒ විදියට ඒ ලින්ක් එක හොයලා ඒ මවුලවිවත් අරගෙන මවුලවිවත් ඒ විදියට පාපොච්චාරණයක් කරෝගෙන ඒක සමාජගත කිරීම ඒක සමස්ථ මුස්ලිම් සමාජය ඉදිරියට ඒක පෙන්නලා දැන් මොකද

ඕගොල්ලෝ කියන්නේ කියන තත්ත්වයට අපි ඒ සමාජය ගෙනා ආ යුතුයි. නැත්නම් ඒගොල්ලොන්ව..

ප : ඔබ කියන්නේ යම්කිසි ප්‍රචණ්ඩකාරී විදියට හැසුරු ඉස්ලාම් අන්තවාදියෙක්ගෙන් ඒ සම්බන්ධයෙන් කරුණු විමසලා ඒකට හේතු වූ ඉස්ලාමික පාඨයන්ද අරගෙන සමාජයේ කතිකාවතක් වගේ එකක් ඇති කල යුතුයි කියලද?

පි : ඔව්. ඒ කියන්නේ ඒ විතරක් නෙමෙයි දැන් සාමාන්‍යයෙන් අපි දැක්කා මත්පෙති එවැනි දේවල් දරු ගැබ විනාශ කරන දේවල්, වඳ පෙති, වඳ බෙහෙත් ඒවා අපේ සමාජයම කිව්වා නැහැ එහෙම වඳ බෙහෙත් නැහැ කියලා. නැහැ එහෙම තියෙනවා. එහෙම තියෙනවා. මේ හඳට ගිය ලෝකයක වඳපෙති හොයා ගන්න බැරි නැහැනේ. තුර්කියෙන්, පකිස්ථානයේ තියෙනවා නොයෙකුත් ඖෂධ කර්මාන්ත ශාලා. ඒවායෙහි ඒවා හදනවා. ඒවා දහස් ගණනන් ලක්ෂ ගණන් ගෙනල්ලා ඒ බෙහෙත් කවලම් කරනවා. ඉතින් එවැනි කෙනෙක් අල්ල ගත්තාම ඒක කෙරුවේ 40 වන ශූරාවේ 182 වගන්තිය ප්‍රකාරව අනෙකුත් ඊට අනුබද්ධ මුස්ලිම් ඉස්ලාමික ඉගැන්වීම්වලට අනුවයි මම ඒක කළේ කියන තැනට මොකද එහෙම නැතුව එයාට එහෙම කරන්න අවශ්‍යතාවයක් නැහැ. එයාගේ පිටිපස්සෙන් මොකක් හරි ඒ background එකක් link එකක් තියෙනවා.

ප ; හරි අපි ඉක්මණට අනික් එකට යමු.

පි : හොඳයි. මේ අරණායක ප්‍රාදේශිය සභාවේ සභාපතිගේ ප්‍රකාශයක්. ඔහු කියා සිටිනවා.

ප : අපි ඒ කාරණාව පැහැදිලි කළානේ, අපි ඊලඟ එකට යමු.

පි : හා. ඉස්ලාමික ඉගැන්වීම් තුලින් මොළ සෝදනයකට ලක් වී අන්ධානුභාවයෙන් විනාශකාරී ඉස්ලාමික න්‍යාය පත්‍රය තම කර මත තබාගෙන එහි පසුපස යන මුස්ලිම් ජනයා ඉදිරියේ ඉස්ලාමීයේ නියම ස්වභාවය නිර්වස්ත්‍ර කිරීම සහ මුස්ලිම් ප්‍රජාවට ඉස්ලාමික බන්ධනයෙන් මිදී විමානය කියන්නේ ඒගොල්ලොන්ගේ ඒ භක්තිය ඒ බන්ධනීය භක්තිය ඒ ඉස්ලාමික බන්ධනය දුර්වල කිරීම සහ ඉන් ගැලවී ඉවත් වී යාමට මාර්ගය විවෘත කර දීමයි.

ප : හරි මේ විසඳුම් දෙකේමත් තියෙන්නේ ඔය ඉස්ලාමය ඒ ඉස්ලාම් භක්තිකයන්ටම නිවැරදිව එහි තිබෙන කරුණු කාරණා අවබෝධ කරලා දීම සම්බන්ධයෙන් තමයි?.

පි : ඔව්.

ප : එහි භයානකත්වය ගැන අවබෝධ කරලා දෙන්න කියන එක නේ ඔයබ විසඳුම් වශයෙන් යෝජනා කරන්නේ?

පි : ඔව්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : හරි අපි ඊලඟ එකට ගියොත්?.

පි : මේ වන විට ඉස්ලාමීය නියම ස්වභාවය අවබෝධ කරගෙන මෙන්න මේක හරිම වැදගත්. ඉතාමත්ම වැදගත්. මේ වන විට ඉස්ලාමයේ නියම ස්වභාවය අවබෝධ කරගෙන අප රට තුළ ඉස්ලාමය හැරගොස් සිටින පිරිස් හඳුනා ගෙන ඔවුන්ගේ හඬ රටටම ඇසෙන්නට ඉඩ සැලැස්වීම සහ ඒ හරහා මුස්ලිම් සමාජයට ඉස්ලාමික ඉගැන්වීම් සම්බන්ධයෙන් තර්කානුකූලව හිතන්නට අවස්ථාවක් ලබාදීම තුලින් ඉස්ලාමයේ කොදු නාරටිය දුර්වල කොට එය ඇතුලතින් ම කඩා වැටෙන්ට මඟ සැලසීම. මෙන්න මේක උදාහරණයකට අපිට ගන්න පුළුවන් මාර්ගෝපදේශයක් වගේ. බලන්න මේ මුස්ලිම් සමාජය ඉදිරියේ ඉස්ලාමය කසේ තියාගෙන ඉන්නවා, එතකොට මේගොල්ලෝ සැදී පැහැදී සිටිනවා. එතකොට එක එක් මුස්ලිම් කෙනෙක් නිර්භීතව හිට ගන්නවා, ඒත් ඉස්ලාමය තර්ජනය. ගර්ජනය කරනවා. ඒ එක් මුස්ලිම්වරයාව අනුගමනය කරමින් කිහිපදෙනෙක් නැගී සිටිනවා එතකොට ඒ ඉස්ලාමය ඒත් තර්ජනය කරනවා නවතින්නේ නැහැ. නමුත් හැමෝම හෝ බහුතරයක් නැගීසිටි ගමන් ඉස්ලාමය දණගහන්න වෙනවා.

ප්‍ර : හරි. මේ කාගේ ප්‍රකාශයක්ද පෙන්නුම් කරන්නේ?

පි : යුසුෆ් අල්කර්දාවි කියන්නේ සුන්නි මුස්ලිම්වරුන්ගේ ආගමික නායකයෙක්. බලන්න එයා කියන දේ. මේ අය මෙහෙම කියන එකත් පුදුමයි ඇත්තෙන්ම. මේ වගේ ඇතුලේ දේවල් එළියට දාන එක. මෙයා කියනවා apostasy law එක ඒ කිව්වේ මම කිව්වානේ අර හරිම වැදගත් කියලා නබිතුමා ප්‍රකාශ කරනවා කවුරු හරි කෙනෙකන් ඉස්ලාමය හැර ගියොත් එයාව ඒවෙලාවේම මරලා දාන්න කියලා. අන්න ඒ law එක. ඒ නීතිය එදා ඉදලා තිබුණේ නැත්නම් නම් අද වෙන කොට ඉස්ලාමයක් නැහැයි කියලා. අර මං පෙන්නපු කණ්ඩායමක් ඉදිරියේ කසේ තියාගෙන ඉන්නවා, එක්කෙනෙක් නැගිටිනවා, දෙන්නෙක් නැගිටිනවා ඒක එහෙම ඒගොල්ලෝ කණ්ඩායම කසේ යටතට තියාගෙන ඉන්නේ මෙන්න මේ apostasy law එක නිසා. ඉතින් මේක මම ගෙනාවේ අපි තේරුම් ගතයුතුයි අපිට විසඳුමක් මේක. ඒක දුර්වල කරලා අපි මුස්ලිම් සමාජයෙන් දැනටම වෙන් වෙච්ච එක්ස් මුස්ලිම් කණ්ඩායමක් ඉන්නවා. තරුණ කණ්ඩායම් බොහොම උගත් ළමයින් කණ්ඩායමක්. ඒ අය හරිම සර්ව සාධාරණ විදියට ඒගොල්ලන්ගේ අදහස් ප්‍රකාශ කරනවා, සහ ඒගොල්ලොන්ගේ දැක්ම සහ ඒගොල්ලන්ගේ පිලිවෙත මම බොහෝ අගය කරනවා අන්න ඒ වාගේ තව තවත් මුස්ලිම්

FAIR COMMENT — BY JEZEEM —

සමාජය තුලින් අපි එවැනි අය බිහිවීමට අපි උදව් කිරීම සහ ආරක්ෂා කිරීම විශේෂයෙන්ම මේ Law එක ඉස්සරහාට එන්න පුළුවන්. දැන් තවම එහෙම දන්න තරමින් තවම ප්‍රසිද්ධියේ මරලා නැති වුණාට ඉදිරියේදි ඒ තත්ත්වයට මේගොල්ලෝ එන්න පුළුවන්. එහෙම වුනොත් ඒ අයව ආරක්ෂා කරගෙන අපිට පුළුවන් වෙන්න ඕනේ ඒ තත්ත්වය උනන්දු කරවන්න, තව තවත් වර්ධනය කරන්න අපි පමාවෙන්න ඉස්සෙල්ලා.

ප්‍ර : අපිට ඒ කාරණය පැහැදිලියි. අපි ඊලඟ විසඳුමට යන්?.

පි : මේක තවත් බොහොම වැදගත් දෙයක්. ඉස්ලාමීය අන්තවාදී, මිලේච්ඡ ඉගැන්වීම් උගන්වන ත්‍රස්තවාදීන් බෝ කිරීමේ මධ්‍යස්ථානය වන ඉස්ලාමික මද්‍රාසා, අරාබි පාසැල්, ඉස්ලාමික ෂරියා පාසැල් තහනම් කිරීම. මේ කිව්වේ මම report එකක් දැක්කා 1680 ක් මේ විදියට 1680 ක් ලියාපදිංචි වෙලා තියෙනවා කියලා. මේක හරි භයානක තත්ත්වයක් 1680 ක් ලියාපදිංචි වෙලා තියෙනවා, තවත් ඊට අමතරව ලියාපදිංචි නැති දේවල් තියෙන්න පුළුවන්. ඒ හින්දා ඒ ගැන අපි බලලා ඒක අවශ්‍ය නැහැනේ. ඇයි ඒක අධ්‍යාපන පද්ධතිය තුලින් උගන්වන්න පුළුවන්කම තියාගෙන මේ ඉස්ලාමික ආගමක් විදියට, විෂයක් විදියට මද්‍රාසා, අරාබි පාසැල් මෙතනට අවශ්‍ය වෙන්නේ නැහැ. ඒගොල්ලෝ අපිව මුලා කරන්න ඒකට දහම් පාසැල් කියන වචනනෙත් භාවිතා කරනවා. ඒ අල්ටකියා ඇක්ටි එකක්. එතකොට අපි හිතනවා දහම් පාසැලක් නේ. අපේ හදවතට ඒගොල්ලෝ ආමන්ත්‍රණය කරන්නේ, අපිව නිර්වින්දනය කරන්න. ඊට පස්සේ අන්තවාදී ඉස්ලාමික ඉගැන්වීම් මුස්ලිම් ජනයාට ප්‍රචලිත කරන විදේශික ඉස්ලාම් ෂේක්වරුන්ට රටට ඇතුළුවීම නීතියක් මගින් තහනම් කිරීම සහ ශ්‍රී ලංකාවේ වෙසෙන එවැනි අන්තවාදී ඉස්ලාම් පූජකයින්ගේ ක්‍රියාකලාප ගැන බුද්ධි අංශ විමසිලිමත් වීම සහ ඔවුන්ට ආගමික පූජකවරුන් ලෙස කටයුතු කිරීම නීති මගින් තහනම් කොට ආගමික කටයුතුවලින් සහමුලින්ම ඉවත්කර තැබිය යුතු වෙනවා. ඊට පස්සේ ඉස්ලාම් ආගම විෂයක් ලෙසින් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ විද්වත් අධීක්ෂණ මණ්ඩලයක් යටතේ විසින් අනුමත කරන රටේ සාමයට සංහිදියාවට සහ සහජීවනයට සහ දේශයේ මූලික සංස්කෘතියට පටහැනි නොවන ලෙස. මේක වැදගත් පටහැනි නොවන ඉගැන්වීම්වලින් පමණක් සමන්විත විෂය නිර්දේශයකට අනුව පාසැල් පද්ධතිය හරහා පමණක් ඉගැන්වීම සහ එයම ඉස්ලාමික පල්ලි තුළ කෙරෙන ආගමික කටයුතු සදහාද භාවිතා කිරීම. මොකද අපේ මූලික සංස්කෘතියට පටහැනි දේ ඉගැන්වුවොත්

FAIR COMMENT
BY JEZEEM

එයින් බිහිවෙන්නේ අවසානයේදී ඊට පටහැනි මනසකින් හෙබි මුස්ලිම්වරුන්.

ප : ඔවුන්ට ශ්‍රී ලාංකීය මූලික සංස්කෘතියත් මේ සම්බන්ධයෙන් ම උගන්වන්න ඕනේ කියලද?

පි : නැහැ ඒකට පටහැනි නොවන දේ උගන්වන්න ඕන කියලා. ඒ කියන්නේ අර සිරිහින්දිගේ අපි ප්‍රකාශයක් බැලුවානේ. එයා කියනවානේ කෝච්චි 2 ක් වගේ මෙහෙම ප්‍රතිවිරුද්ධ දිසාවට එන ආගම් දෙකක් හැටියටනේ ඒගොල්ලෝ අන්‍යාගම් සහ ඉස්ලාමය දකින්නේ. එහෙම දකින්නේ ඒ විදියට, ඒ විදියේ දේවල් ඒ මුස්ලිම් මනසට උගන්වන නිසානේ. අපිට පුළුවන් නම් ඒ වෙනුවට මේක අපේ ඉස්ලාමය සහ අනිත් ආගම කෝච්චි පීලි දෙකක් වගේ සමාන්තරව යන විදියට හදා ගන්න පුළුවන් නම් එවැනි වූ ඉගැන්වීම් පමණක් ඉතුරු කරලා අර ප්‍රතිවිරෝධිතාවයක් clash එකක් වන ඉගැන්වීම් අපි තහනම් කිරීමට. කුර්ආනය, සුන්නා සහ හදිස් ඉගැන්වීම්වල ඉස්ලාමික මූලාස්‍රවල ඇති ආගමික සහ ජාතිවාදී ගැටුම්වලට සහ ත්‍රස්තවාදයට අනුබල දෙන සියළුම මිලේච්ඡ සාහසික ඉගැන්වීම් ඒවා ශිෂ්ට සමාජයක පිළිගත් කිසිම මිණුම් දණ්ඩකට අනුව ආගමික ඉගැන්වීම් ලෙස පැවතිය නොහැකි බැවින් විශේෂයෙන්ම මදීනා සමයේ සාහාසික ඉගැන්වීම්. මදීනා සමයේ ඉගැන්වීම් තමයි හුඟක්ම සාහාසික වෙන්නේ. එවා තහනම් කිරීම සහ එවැනි සාහසික ඉගැන්වීම් කුර්ආනයෙන් ඉවත් කිරීම හරහා මෙරට මුස්ලිම් සමාජයේ සාමකාමී මක්කානු සමයේ ඉගැන්වීම්වලට සීමා කිරීම එහෙම නැත්නම් අර කොළපාට කොටුවට කොටු කිරීම. මේකේදි මම තවදුරටත් කිවයුතුයි දැන් මේ අපි අහන අහන කෙනා මුස්ලිම් සමාජයෙන් අහන අහන කෙනා අපිට කියන්නේ අනේ අපි සාමකාමී අය, සාමයට කැමතියි ඉස්ලාමය කියන්නේ සාමයයි. ඉස්ලාමය කියන්නේ සාමය නම් ඔබ මොකද හිතන්නේ 9 වන ශූරාවේ 5 වන වගන්තිය ගැන. එතකොට කියාවි ඒක යුද්ධය ඒගොල්ලොන්වත් brain wash කරලා තියෙන්නේ මුස්ලිම්වරු අනික් අය brain wash කරලා නෙමෙයි දන්නවා මවුලවිලා. මවුලවිලත් කියයි ඕකේ යුදමය තත්ත්වයක් යටතේ තියෙන ඉගැන්වීම් කියලා. ඕකේ යුදමය තත්ත්වයක් යටතේ තියෙන ඉගැන්වීම් ආගමික ඉගැන්වීම් හැටියට මෙතන තියෙන්න ඕන නැහැ. ඔබ කැමතිද ඒවා ඉගෙන ගන්න. අවශ්‍ය නැහැ. ආගමකට මොකක්ද අපි තර්කානුකූලව ඒගොල්ලොන්ට කියන්න කියලා අපි ඇසිය යුතුයි. මොකක්ද තියෙන උවමනාව ආගමක් අදහන්න ඕගොල්ලොන්ගේ සාමකාමී. ඕගොල්ලෝ ඔය ආදරය කරන

FAIR COMMENT — BY JEZEEM —

සාමකාමී ආගම අදහන්න කපපිය, කොටපිය, මරපිය කියන ඉගැන්වීම් මොකටද කියලා අපි ඇසිය යුතු වෙනවා. ඒගොල්ලන්ට කට උත්තර නැති වෙනවා. අපිට පුළුවන් delete කරලා දාන්න. ලේසි නෑ ඒක නමුත් නීතියක් හරහා අපි කලයුතු වෙනවා.

ප්‍ර : අපි ඊලඟ එකට යමු.

පි : මුස්ලිම්වරුන් විසින් මෙරට බෞද්ධ සංස්කෘතිය සහ ස්වදේශික අතීත උරුමයන් විනාශ කරමින් ඒ මත ඉස්ලාමික සංස්කෘතිය ස්ථාපිත කරමින් භූමියේ අයිතිය උදුරා ගනිමින් අපගේ ඉතිහාසය පවා විකෘති කරමින් සාවද්‍ය ඉතිහාසයක් මුස්ලිම් ජනයාගේ සහ මුස්ලිම් දරුවන්ගේ මනස තුළ ස්ථාපිත කරමින් ක්‍රියාත්මක කරන ආක්‍රමණය වහාම නවතා දැමීම. ඒක ගැන මම හිතන්නේ ගරු කොමිෂම හුඟක් දැනුවත්, ඒ හින්දා අපි ඉස්සරහාට යං.

ප්‍ර : හරි කියපු එක පැහැදිලිය. අපි ඉස්සරහාට යං.

පි : මුස්ලිම්වරුන් විසින් ඉතා සූක්ෂම ලෙස බෞද්ධ පූජණීය ස්ථානයන් ආසන්නයේ ඉස්ලාමික පල්ලි සහ මුස්ලිම් කොළණි ඉදිකිරීම කරගෙන යන අතර එම ක්‍රියාකාරකම් නීතියෙන් තහනම් කිරීම මෙක විශේෂයෙන්ම වියයුතුම දෙයක්. මේ අය මේ මම ඒ රහස හෙළිකරන්නම්. මේ අය මේ අපේ පූජණීය ආගමික ස්ථාන අසල ඒගොල්ලොන්ගේ ආගමික ස්ථාන ස්ථාපිත කරන්නේ සහ කොළණි ස්ථාපිත කරන්නේ අර 9 වෙනි ශූරාවේ 5 වන වගන්තියට ඉලක්ක කරගෙන. ඒ කියන්නේ ඒ කුසල කර්මය ඉලක්ක කරගෙන එතන කියනවා වට කරලා පහර දෙන්න කියලා. ඒගොල්ලෝ යන එන මඟ රැක සිට පහර දෙන්නේ කියලා. මොකද ඒගොල්ලන්ට කියපු ගමන්ම ජිහාඩය ඒ අවස්ථාවට ආවාම මේගොල්ලන්ට බොහොම පහසුයි අපිව වටකරලා ඒ කුසල කර්මය කපලා කොටලා ලේ වැගිරීම කරලා ඒ දෙවියන්ගේ නියෝගය ස්ථාපිත කරන්න. ඒ හින්දයි මේ ඒගොල්ලෝ කපටිකමින් ඉතාමත්ම උපක්‍රමශීලි විදියට අපේ නොදැනුවත්කම සහ අපේ ඉවසීම සංහිදියාව, සාමය ඔය ඔක්කෝම ඒගොල්ලෝ නිකම් ඇපයකට තියාගෙන ඒගොල්ලොන්ගේ මේ ගමන යන්නේ සහ පල්ලි හැමතැනම විශේෂයෙන්ම දඹුල්ල ඒ වගේ සිද්ධියක් වුණා. බලන්න මුහුදු විහාරය එය අනවශ්‍ය දෙයක්. එවැනි දේ සිදු නොවිය යුතුයි. මෙරට ප්‍රදේශ සහ මාර්ගවල ස්ථාපිත කොට තිබූ සිංහල නම් ගම් ඉවත් කොට මුස්ලිම්වරුන් විසින් ස්ථාපිත කරන ලද ඉස්ලාමික නම් තහනම් කොට ඒවායේ කලින් තිබූ සිංහල නම් නැවත ස්ථාපිත කිරීම සහ එවැනි වෙනස් කිරීම් ඔවුන්ට රිසි පරිදි සිදු කිරීම

FAIR COMMENT BY JEZEEM

නීති මගින් තහනම් කිරීම. මේක මේ රටේ ගොඩාක් දේ වෙලා තියෙනවා. හැම තැනම වෙලා තියෙනවා. දැන් මට එක උදාහරණයක් කියන්න පුළුවන් ඒගොල්ලෝ ඉස්සෙල්ලාම කරන්නේ මේ බොහොම අහිංසක විදියට මොකක් හරි දෙයක් ඒකට නමක් දා ගන්නවා. දාන එක මට කියන්න පුළුවන් යගම්වෙල, දුම්මලසූරිය තියෙන්නේ. යගම්වෙල තමයි ඒ සිංහල නගරය. ඉතින් මේකට මේගොල්ලෝ ටික දෙනා ඇවිල්ලා ටිකක් ව්‍යාජ්ත වෙලා දැන් ඒක අහාදියා ටවුන් කියලා ඒගොල්ලන්ට දා ගන්න ඕනේ. එක සැරේ දාගන්නේ නැහැ ඒගොල්ලෝ ඉස්සෙල්ලාම බෝඩ් එකක් ගහනවා මොකක් හරි ඒගොල්ලන්ගේ ආයතනයක. ආයතනයක නමක් ගහලා බෝඩ් එක ගහලා අර යගම්වෙල කියන බෝඩ් එක ලඟින් යටින් ගහනවා ඒ ආයතනයේ නම යගම්වෙල - අහාදියා ටවුන්. ඔන්න ඔහොම තමයි ඒගොල්ලන්ගේ ඕක ක්‍රියාත්මක වෙන්නේ. එක පාර කර ගන්න බැරි නම්. ඊට පස්සේ ටික දවසක් යන කොට ඕක යගම්වෙලම තමයි ඒගොල්ලෝ උරච්චි කරන්නේ. අපි ඉස්සරහත් යගම්වෙල, මට කියන්නේ ආ..ඔයා අර අහාදියා ටවුන් යන්නකෝ එතනින් ගන්න පුළුවන් ඔයාට ඕන දේ. අන්න එහෙම තමයි කියන්නේ. එතකොට හිමින් සීරුවේ ඒගොල්ලන්ගේ පල්ලියෙන්ම ඒවා කියනවා. පල්ලියෙන්ම නියාමනය කරනවා. එතකොට ඒගොල්ලොන්ගේ සමස්ථ මුස්ලිම් සමාජය විසින්ම ඒ ප්‍රදේශයේ ඉන්න ඒ යගම්වෙල නෙමෙයි පාවිච්චි කරන්නේ අහාදියා ටවුන්. ඔය විදියට ගිහිල්ලා අවසානයේදී අපේ අයත් යගම්වෙල වෙනුවට ඒක අමතක වෙලා අහාදියා ටවුන්, අහාදියා ටවුන් කියනවා ඒගොල්ලොන්ට එච්චර හැඟීමක් දැනීමක් නොමැති නිසා. අවසානයේදි ඒක යගම්වෙල අමතක වෙලා අහාදියා ටවුන් බවට පත් වෙනවා.

ප : පැහැදිලියි. අපි ඊලඟ...

පි : මේක controversial එකක් නෙමෙයි. මේක ප්‍රායෝගික නොවන දෙයකුත් නොවෙයි, මෙය විය යුතුම දෙයක් මුස්ලිම් පවුලකට උපරිමය ලෙස දරුවන් දෙදෙනෙකුගේ සීමාවක් පැනවීම එය කලයුතුම වෙනවා. එහෙම නැත්නම් අපි ඒ එන consequence වලට අපිට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මේක අපි සාධාරණීකරණය කලයුතුයි. මේක අවසාන අපේ මේක මුල් විසඳුමක් විදියට අප ගතයුතු නැහැ. නමුත් අනිත් ඔක්කොම වටෙන් ඒ විසඳුම ඉදිරිපත් කරලා වටෙන් ගහලා අපි අවසානයට මෙතනට එන්න ඕනේ සමස්ථ සමාජයම ඒගොල්ලොන්ගේ ඇතුලෙනුත් අපි සාධාරණීකරණයක් කරලා මේක වියයුතුයි

FAIR COMMENT — BY JEZEEM

නැත්නම් ඕගොල්ලනුත් ඉවරයි අපිත් ඉවරයි කියන සංකල්පය මත.

ප : දැන් ප්‍රියන්ත මහත්මයා මෙවැනි දරු උපත්වලට සීමා මායිම් ලෝකයේ වෙනත් රටවල්වල පනවා තිබෙනවද?

පි : මම දන්න තරමින් බුරුමයේ එසේ කර තිබෙන බව මම දැන ගත්තා. මොකද බුරුමයේ ඔය ප්‍රශ්නය ආවා. ඒ ප්‍රශ්නයට ඒගොල්ලෝ තේරුම් ගත්තා ඒක සමස්ථ සමාජයේම ප්‍රශ්නයක් කියලා. එතකොට සමස්ථ සමාජය විසින්ම ඉල්ලීමක් කෙරුවාම ඒක නීතියක් බවට පත් කර ගන්න පහසු වෙනවා.

ප : අපි අවසාන වශයෙන් ඔබ මොකක්ද මේ ප්‍රශ්නෙට විසඳුම් විදියට කියන්නේ?

පි : මුස්ලිම්වරුන්ගේ කූට උපක්‍රමයන්ට රැවටී මුස්ලිම්වරුන් සමඟ විවාහ වී ජාතියට අහිමි වන සිංහල බෞද්ධ තරුණ තරුණියන්ට සහ අනෙකුත් ආගම්වල ජනයාට එසේ විවාහවීමට පෙර ඉස්ලාමයේ නියම ස්වභාවය පිළිබඳව අවබෝධයක් ලබාදීම සඳහා වැඩ පිළිවෙලක් ස්ථාපිත කිරීම. මේකත් අපි අන්ධානුභාවයෙන් අමතක කරලා හිටියා අවුරුදු ගානක් දෙමල ළමයිත්, සිංහල ළමයිත්, ක්‍රිස්තියානි ළමයිත්, බෞද්ධ හින්දු කතෝලික ඔය හැමෝම ළමයින් අවසානයේ අපිට අහිමි වුණා. ඉතින් ජාතියට අහිමි වුණා. ඒගොල්ලොන්ගෙන් ඊට පස්සේ ඒගොල්ලොන්ගේ ඒ link එක ඒ කියන්නේ දරු පරම්පරාව එතනින් cut off එතනින් නවතිනවා. එතනින් ඒක divert වෙනවා ඉස්ලාමික ජාතියට ඒ දරුවන් යන්නේ ඉස්ලාමිය ජාතියට ඒ මොකද 2 වන ශූරාවේ 221 වෙනි වගන්තියෙන් අපි සාකච්ඡාවට භාජනය කෙරුවා කොහොමද මේ විවාහවලදි නීතිය ක්‍රියාත්මක කරන්නේ. ඒගොල්ලෝ කිසිම ගැහැණියකුට, මුස්ලිම් කිසිම ගැහැණියෙකුට කිසිම අන්‍යාගමික පිරිමියෙක් බඳින්න බැහැ. බැන්දොත් මරනවා. මරනවා ඒක දැනටම වෙලා තියෙනවා බොහොම secretly . බොහොම secretly එහෙම වෙලා තියෙනවා, මරලා තියෙනවා ගිනි තියලා තියෙනවා, පුච්චලා තියෙනවා. එතකොට ඒවා ව්‍යාප්ත වෙනවා මේ ඉස්සරහාට යන්න යන්න. ඒවා ඊට පස්සේ එදිනෙදා කටයුතු හැටියට day today activities හැටියට ඒගොල්ලෝ ඒක ව්‍යාප්ත කරනවා ඉදිරියේදී. එතකොට දැන් හරි අපි වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළයුතුයි ඒ දරුවන් ඒගොල්ලෝ out of love ඒගොල්ලෝ අපි හිතන්නේ ආදරයට ජාතියක් ආගමක් කුළ භේදයක් නැහැ. ඉතින් ඒ අපි ඒ හිතන විදිය. නමුත් මෙතනදි අපිට තවදුරටත් ඒ විදියට හිතන්න බැහැ, අපි

FAIR COMMENT — BY JEZEEM —

ඒගොල්ලන්ට කියවිය යුතුයි මේකේ තත්ත්වය පැහැදිලි කරලා දීලා අපි නිදහස දිය යුතුයි. එදා අපිට වළක්වන්න බැහැනේ. අපිට එපා කියන්න බැහැ, මෙන්න මෙහෙමයි කාරණේ මෙහෙමයි ඕගොල්ලන්ට ඕගොල්ලොන්ගේ දෙමාපියන් අහිමි වෙනවා දෙමාපියන්ට හතුරෝ වගේ සලකන්න වෙනවා. මොකද දෙමාපියන් එහෙම නැත්නම් ඉස්ලාම් ආගමට එන්න ඕනේ. එහෙම නැත්නම් ඔබ කොහොමත් එයා සිංහල girl කෙනෙක් කියලා හිතන්න, ඒ සිංහල girl මුස්ලිම් boy කෙනෙක්ව මැරි කෙරුවාම අනිවාර්යයෙන්ම 2 වන ශූරාවේ 221 වන වගන්තිය යටතේ එයා ඉස්ලාම් වෙන්න ඕනේ. ඉස්ලාම් වුණායින් පස්සේ එයා ලවා එයාගේ පවුලේ අය ගෙන්වා ගන්න ඕනේ. එහෙම නැත්නම් එයාට බල කරනවා කුර්ආනයේ තියෙනවා දෙමව්පියෝ අම්මා, තාත්තා, සහෝදර සහොදරියන්ව හතුරන් විදියට සලකන්න කියලා. ඉතින් ඔය තත්ත්වය අපි ඒගොල්ලන්ට කිව්වාම ආයි පැනලා දුවනවා මිසක් මම හිතන්නේ නැහැ විවාහ කරයි කියලා.

<u>ස්වාමිණි ඒ අනුව අවසාන වශයෙන් මෙම සාක්ෂිකරු විසින් ලබා දුන්නු presentation එක නැත්නම් ඉදිරිපත් කිරීමේ මුද්‍රිත පිටපත C854A වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කිරීමට ඉතාමත් ගෞරවයෙන් අවසර පතනවා</u>.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අවශ්‍යද යන්න අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාගෙන් විමසමි.

අවශ්‍ය යැයි ප්‍රකාශ කරයි. අවසර ලබා දෙමි.

****

<u>ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා:</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබතුමා කිව්වා අල්ටකියා ගැන. දැන් මේ අල්ටකියා ශුද්ධ වූ කුර්ආනයේ හරි කොහේ හරි අර්ථ නිරූපනය කරලා තියෙනවද මොකක්ද මේ කියලා?

පි : කුර්ආනයේ එහෙම නමින්ම කියලා නැහැ එකල. එකල අල්ටකියාව මම පැහැදිලි කරලා දීපු විදියට මක්කානු සමයේදී නබිතුමා විසින් අල්ටකියාට පාදක වුණු ක්‍රමවේදයන් භාවිතා කළා. නමුත් එය එතරම්ම අවශ්‍යතාවයක් වුණේ නැහැ මොකද 622 දී මෙයා මදීනාවට ගිහිල්ලා

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මෙයා කිව්වේ කවුද?

පි : නබිතුමා. නබිතුමා 622 දී මදීනාවට ගිහිල්ලා බලවත් වෙලා එයා සේනා සංවිධානය කරලා 630 දී මක්කාව අල්ලා ගන්නවා. මක්කාව අල්ලගෙන තමයි අර ප්‍රකාශය කරන්නේ මින් පස්සේ exile වෙන්න අවශ්‍ය නැහැ, පැනලා දුවන්න අවශ්‍ය නැහැ ජිහාඩය පමණයි කියලා. එතැන් සිට අවුරුදු සිය ගානක් ජිහාඩයම තමයි භාවිතා කෙරුවේ. ඒ හින්දා අල්ටකියාවක් ගැන හිතන්න අවශ්‍ය වුණේ නැහැ. නමුත් පදනම තිබුණා. ඒ වගේම අලී මම කිව්වානේ බෑණනුවන් ටකියාව පාවිච්චි කරන්න පුළුවන් කියලා කිව්වයි කියලා. අන්න එහෙම තමයි මේක තියෙන්නේ. එතන තියෙනවා පැහැදිලිවම අලී ප්‍රකාශ කලා ඒක හදීත් එකක්. හදීත් එකේ අලී කියනවා අන්‍යාගමිකයින්ව රවට්ටන්න අල්ටකියාව පාවිච්චි කිරීම අවසරයි කියලා.

ප්‍ර : ඒ කියන්නේ හදිත් එකෙත් කියලා තියෙනවා ඒ විදියට?

පි : ඔව් අල්ටකියාව පාවිච්චි කරන්න පුළුවන් කියලා. ඒ වගේම හදිත්වල ගොඩාක් ලියලා තියෙනවා. නමුත් ටකියා කියන වචනය කුර්ආනයේ නැහැ. නමුත් මෙහෙම දෙයක් තියෙනවා. මට මතක විදියට 3 වන ශූරාවේ 54 වන වගන්තියේ වියයුතුයි කියනවා අල්ලාහ් වන මම තමයි කුමන්ත්‍රණකරුවන්ගේ ඒ කියන්නේ ලොකුම කුමන්ත්‍රණකරුවා කියලා. එයා තමයි ලොකුම කුමන්ත්‍රණකරුවා කියලා. ඉතින් මේ ක්‍රමන්ත්‍රණ, රැවටීම්, මුලාකිරීම් මේ ඔක්කොම මේ ආගමේ තියෙනවා. සුන්නා විදියට තියෙනවා, සහ කුර්ආන වැකි විදියට තියෙනවා. රවටන්න කියන එක. ඉතින් ඒකේ හරය තමයි මේ ටකියා. ටකියා කියන එක ඒ දවස්වල ඉදලම අලීගේ හදිත් එකෙන් අපිට කියන්න පුළුවන් ටකියා කියන වචනයත් එදා ඉදලා තිබුණා. දැන් වගේ මහා පරිමාණයෙන් භාවිතයට ගන්න අවශ්‍යතාවයක් තිබුණේ නැහැ, මොකද ඒ දවස්වල එහෙම දැන් අල්ලපු ගමට ගහන්න ඕන නම් ආයේ ටකියාවක් අවශ්‍ය නැහැ. නමුත් දැන් එහෙම නෙමෙයි මුලින් දැන් ඒගොල්ලෝ මුලින් ස්ථාපිත කරපු, පුංචියට ස්ථාපිත කරපු ටකියාව දැන් මහා ලොකුවට අවශ්‍ය වෙනවා මොකද දැන් එකපාර ප්‍රදේශයකට හරි රටකට හරි එකපාර පහර දෙන්න අමාරුයි. ඒ වෙනුවට ඒගොල්ලෝ බොහොම ඉවසීමෙන් ඒගොල්ලෝ අර දුඹුරුපාට කාලය පසු කලයුතුයි ඒ නිසයි.

ප්‍ර : දැන් ඔබ කිව්වා මේ යගම්වෙල කියලා ගම්මානයක් සම්බන්ධයෙන්. ඒකට දැන් මුස්ලිම් ජනතාව වෙන නමක් දාලා තියෙනවා කියලා දෙකම එකතු කරලා.

FAIR COMMENT
BY JEZEEM

පි : එකතු කරලා නෙමෙයි මේගොල්ලොන්ට ඒක ටකියාව Act එකක් කියලයි මං කිව්වේ. ඒක අර උපක්‍රමශීලීව තමයි ඒගොල්ලන්ට change කර ගන්න ඕනේ. එක සැරේ change කර ගන්න බැරි තත්ත්වයක් තියෙන නිසා ඉරියා Law එකෙත් තියෙනවානේ. දෙයක් කර ගන්න බැරි නම් ඒක බාධකයක් තියෙනවා නම් ඒකට වෙට්ටුවක් දාලා බොරුවෙන් මුලාවෙන් වෙට්ටුවක් දාලා ඉෂ්ඨ කරගන්න කියලා 745 වෙනි පිටුවේ. ඉතින් ඒ වගේ වෙට්ටුවක් තමයි මේ දාන්නේ. ඒක ටිකක් දීර්ඝ කාලීන වෙට්ටුවක්. ඒගොල්ලෝ අර ර යගම්වෙල - අභාදියා ටවුන් කියන එක දැන් දෙකම එකසැරේට පාවිච්චි කරනවා. මොකද එක සැරේ අභාදියා ටවුන් කිව්වොත් කවුරුත් දන්නේ නැහැනේ මොකක්ද කියලා. එහෙම නම් ඒක ප්‍රාදේශිය සභාවෙන්ම අනුමත කර ගන්න ඕන. ඒ හින්දා තමයි මේ අපි යගම්වෙල කියන්නෙත් අභාදියාම තමයි කියලා තමයි ඩෑෂ් එකෙන් එකට දාලා කියන්නේ. පස්සේ කාලෙකදි යගම්වෙල හැලෙනවා අභාදියා ටවුන් හිටිනවා.

ප්‍ර : දැන් ඒකට සමානද ඔබ දන්නවද මේ නීතිපති දෙපාර්තමේන්තුවේ පිටිපස්සේ තියෙනවා මුස්ලිම් මහා විද්‍යාලයක්. ඒකේ නම ශාන්ත සෙබස්තියන් මුස්ලිම් මහා විද්‍යාලය. අපිට ඒ දෙක සමාන කරන්න පුළුවන්ද ඔබතුමා කියපු යගමේවල සිද්ධියයි මේකයි?

පි : ශාන්ත සෙබස්තියන් කිව්වාම ඒක මුස්ලිම් කොලේජ් එකක් වෙන්න බැහැ. එහෙම නම් ඉස්සර ඒක

ප්‍ර : නාම පුවරුව තියෙන්නේ ඒ විදියට ශාන්ත සෙබස්තියන් මුස්ලිම් මහා විද්‍යාලය. ඒකට යාබදව තියෙනවා අපේ කතෝලික පල්ලියක්. ඒක ගැන අහලා නැද්ද?

පි : එහෙම නම් අනිවාර්යයෙන්ම මහත්මයා ඒක කලින් කතෝලික ඉස්කෝලයක් වෙලා කතෝලික ළමයින් අඩු වෙලා ඒගොල්ලොන්ගේ ළමයින් වැඩි වෙලා එහෙම.

ප්‍ර : මම ඇහුවේ නම ගැන.

පි : එහෙම සම කරන්න පුළුවන්. තව ටික කාලෙකින් ඒක ඇත්තටම සෙන් සෙබස්තියන් නේද?

ප්‍ර : ඔව්.

පි : සෙන් සෙබස්තියන් කියන නම ඒක අල්ෆිට්නා ඒක අන්ඉස්ලමික්. ඒ හින්දා අනිවාර්යයෙන්ම ඒගොලේලෝ හලන්නම ඕනේ.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් දැක් වූ සහයෝගය සඳහා කොමිෂන් සභාවේ ස්තූතිය සාක්ෂිකරුට පල කරනවා.

****

<u>සාක්ෂිකරු මෙසේ දන්වා සිටී.</u>

සර් ඇත්තම කියනවා නම් ඒගොල්ලොන්ගේ ඉගැන්වීම්වලට අනුව මම කෙරුවේ ලොකුම පාපයක්. එතකොට මේක එළියට ගියොත් පමණක්, ඒ කියන්නේ මගේ අනන්‍යතාවය එළියට ගියොත් පමණක් මට ඒ තත්ත්වය උදා වෙන්න පුළුවන්. අනිවාර්යයෙන්ම උදා වෙන්න පුළුවන්. ඉතින් මම ඒකයි මුලින්ම ඉල්ලීමක් කෙරුවේ මාධ්‍ය ආවරණයක් දෙන්න එපා කියලා. මගේ අනන්‍යතාවය එළියට යන්නේ නැත්නම් ප්‍රශ්නයක් වෙන එකක් නැහැ, එහෙම නැති වුනොත් මට රහසේ හරි එහෙම දෙයක් වෙන්න පුළුවන්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

මේ අවස්ථාවේදි සාක්ෂිකරු විසින් ලබාදෙන ලද සාක්ෂිය හේතුවෙන් ඔහුගේ ජීවිතයට යම් අනතුරක් හෝ තර්ජනයක් මතු අවස්ථාවක සිදු වියහැකි බව කොමිෂන් සභාවට හැඟී යන හෙයින් 2015 අංක 4 දරන අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 25(4) උපවගන්තිය ප්‍රකාරව මෙම සාක්ෂිකරුට හිමි වියයුතු සියළු අයිතීන් සහ වරප්‍රසාදයන් ඔහුට ලබාදෙන ලෙසට අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරමි.

මෙම කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් මෙම නියෝගය ලිඛිතව සටහන් කොට එම ලිපිය එකී ජාතික අධිකාරිය වෙත ආමන්ත්‍රණය කර පිටපතක් මෙම සාක්ෂිකරුට සහිතව ලිපි දෙකක් එනම් මුල් පිටපත සහ අනු පිටපතක් යන දෙකම මෙම සාක්ෂිකරුට ලබාදිය යුතු අතර, එය එකී ජාතික අධිකාරිය වෙත මෙම කොමිෂමෙන් සෘජුව යැවීම නොකලයුතු අතර සාක්ෂිකරුට අවශ්‍ය වූ විටක පමණක් මතු දිනයකදී එකී ලිපිය භාවිතා කළ හැකි බව සටහන් කර තබමි.

President's Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

එකී ලිපි සාක්ෂිකරුට ලබාදීමේදි මෙම කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් එහි සටහනක් තැබිය යුතුයි සාක්ෂිකරුගේ ආරක්ෂාව උදෙසා එම මුල් පිටපත සහ සාක්ෂිකරුට ලැබිය යුතු පිටපතක් දෙකම සාක්ෂිකරු වෙත ලබා දෙන බවත් එය කොමිෂන් සභාවෙන් මේ අවස්ථාවේදි එකී ජාතික අධිකාරිය වෙත යවන්නේ නැති බවත්.

සාක්ෂිකරු මුදා හරිමි.

කොමිෂන් සභාව නැවත ජුලි මස 20 වෙනි දින පස්වරු 12 පසුවී විනාඩි 30ට රැස්වන බව සටහන් කර තබමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.07.22 වේලාව: ප.ව. 01.20

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා (පැමිණ නැත) -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය,රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින නීතිඥ චමත් ප්‍රනාන්දු මහතා සමඟ ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා පෙනී සිටී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>වැඩිදුර සාක්ෂි විමසීම.</u>

නම : හේරත් මුදියන්සේලාගේ චන්දිම නිලංග හේරත්.

ප්‍රතිඥා දී කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර: ඔබ ඊයේ දින ඔබගේ සාක්ෂියේ දී සඳහන් කරනු ලැබුවා ඔබ අම්පාර ප්‍රදේශය භාරව කටයුතු කෙරුවා වුණාට සහරාන් සම්බන්ධයෙන් සොයලා බලන්නට කියලා නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා ඔබට උපදෙස් දුන්නා කියලා. නැවත සඳහන් කරන්නට පුළුවන් ද එම නියෝජ්‍යය අධ්‍යක්ෂකතුමාගේ නම?

උ: නියෝජ්‍යය අධ්‍යක්ෂක සම්පත් කුමාර ලියනගේ මහත්මයා.

ප්‍ර: ඔබේ ඒ ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ තනතුර මොකද්ද?

උ: නියෝජ්‍යය පොලිස්පති ධුරයට උසස්වීම් ලැබුවේ මගේ මතකයේ හැටියට 2019 ජූලි නැත්නම් අගෝස්තු.

ප්‍ර: කෙසේ වුවත් ඔය 2016 ඔබ අම්පාර ප්‍රදේශයේ සේවයට අනුයුක්ත වුණ අවස්ථාවේ පටන් මේ මහත්මයා ද ඔබේ නියෝජ්‍ය අධ්‍යක්ෂක විදියට කටයුතු කෙරුවේ. ඔහුට තමයි ඔබ කරුණු වාර්තා කළේ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ ඒ වගේම ඊයේ දින ඔබ සඳහන් කරනු ලැබුවා සහරාන් විසින් යම් යම් ක්‍රියාවන් සිදුකරන ලද ප්‍රදේශය වුණේ කාත්තන්කුඩිය ප්‍රදේශය. කාත්තන්කුඩි ප්‍රදේශය අම්පාරට නෙවෙයි අයත් වුණේ මඩකලපුවට කියලා?

උ: නිවැරදියි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබට කියන්නට පුළුවන් ද 2019 අප්‍රේල් 21 වන විට කාත්තන්කුඩිය ප්‍රදේශය ඒ කියන්නේ මඩකලපුවේ ඒ ප්‍රදේශය භාරව කටයුතු කරපු රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරියා කවුද කියලා?

උ: සහකාර අධ්‍යක්ෂක ඩබෙරා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුර ලිඛිතව කොමිෂන් සභාවට ලබාදෙයි. එම පිළිතුර සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් සටහන් විය යුතු බව ලඝුලේඛිකාවට නියෝග කරමි.

ප්‍ර: ඊයේ දින C 931 ලෙස ලකුණු කරලා ඉදිරිපත් කරා අපි වාර්තාවක් ඒ තමයි 2016 දෙසැම්බර් 28 වැනිදා ඔබ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂක නැගෙනහිර පළාතට ඉදිරිපත් කරන ලද වාර්තාවක්. ඔබ ඊයේ දින සාක්ෂියේ දී සඳහන් කෙරුවා 2016.12 වැනි මාසේ 14 වැනිදා ඒකාබද්ධ

FAIR COMMENT BY JEZEEM

බුද්ධි සාකච්ඡාවක් පැවැත්වුණා අනතුරුව තමයි එම වාර්තාව ඉදිරිපත් කරනු ලැබුවේ කියලා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: දැන් මං ඔබෙන් අහන්නේ එදින වන විට සහරාන් සම්බන්ධයෙන් ඔය බුද්ධි සාකච්ඡාවේ සාකච්ඡා වුණා ද? මේක සිද්ධ වුණේ 2016 දෙසැම්බර් 14 වැනිද නේ. සහරාන් ගැන ඒ සාකච්ඡාවේ දී සාකච්ඡා වුණා ද?

උ: මුස්ලිම් අන්තවාදය ගැන මාතෘකාව යටතේ කතා කරන කොට මම තමයි සහරාන් සම්බන්ධ මේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ අන්තවාදී පැත්තට යොමු වෙලා තියෙන සඳහන් කළේ. මම මගේ කතාව ඉවර වුණාට පස්සේ ඒක ගුවන් හමුදා බුද්ධි අංශයේ සහභාගි වූ නිලධාරීවරයෙකුත් ඒක සනාථ කළා. එයාටත් තොරතුරු තියෙනවා කියලා. මේ සම්බන්ධව.

ප්‍ර: එහෙම නම් ඔබට පෙන්වන්න පුළුවන් ද අපි ඔය C 931 ලෙස ලකුණු කරලා ඉදිරිපත් කරපු වාර්තාවේ ඔය කියන කරුණු කුමන මාතෘකාවක් යටතේ ද ඔබ ඇතුළත් කරලා තියෙන්නේ කියලා?

උ: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: පෙන්නනකෝ. මොකද්ද කියන්න ඒකේ section එක Topic එක ගැන?

උ: පස්වැනි කරුණ ප්‍රදේශය තුළ ජාතිවාදී අදහස් ආකල්ප ව්‍යාප්ත කිරීම. ඊට අමතරව කාත්තන්කුඩි මූලික කරගෙන ක්‍රියාත්මක වන ජාතික තවුහිද් ජමාත් සංවිධානය විසින් ජාතිවාදී අදහස් ව්‍යාප්ත කරන බවට ද මෙම සංවිධාන දැඩි ලෙස නිරීක්ෂණය කළ යුතු බවට අදහස් දක්වන ලදි . මෙම සංවිධානයේ සිටින මොහොමඩ් සහරාන් ෂයිනි මවුලවී, සාපි මවුලවි යන අයගේ ක්‍රියාකාරකම් දැඩි අන්තවාදී ස්වරූපයක් ගන්නා බැවින් මෙම සංවිධානය පිළිබඳ දැඩි අවධානයක් යොමු කළ යුතු බව කරුණු දක්වන ලදී. මෙම ශ්‍රී ලංකා තවුහිද් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

උ: පස් වෙනි කරුණ ප්‍රදේශය තුළ ජාතිවාදි අදහස් ආකල්ප ව්‍යාපත් කිරීම. ඒ යටතේ කාත්තන්කුඩි මූලික කරගෙන ක්‍රියාත්මක වන ජාතික තවුහිද් ජාමාත් සංවිධානය විසින් ජාතිවාදි අදහස් ව්‍යාප්ත කරන බවට ද මෙම සංවිධානයේ කටයුතු දැඩි ලෙස නිරීක්ෂණය කළ යුතු බවට ද අදහස් දක්වන ලදී. මෙම සංවිධානයේ සිටින මොහොමඩ් සහරාන් , ෂයින් මවුලවි, සාපි මවුලවි යන අයවලුන්ගේ ක්‍රියාකාරකම් දැඩි අන්තවාදී ස්වරූපයක් ගන්නා බැවින් මෙම සංවිධානය පිළිබඳව වැඩි අවධානයක් යොමුකල යුතු බවට කරුණු දක්වන ලදී. එමෙන්ම ශ්‍රී ලංකා තවුහිද් ජමාත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්ද සාකච්ඡා කරන ලදී .

ප්‍ර: දැන් ඔය මුස්ලිම් අන්තවාදය සම්බන්ධයෙන්නෙ ඔබ ඔය කරුණ යටතේ කථා කරේ. නමුත් ඔය කරුණ යටතේම ඔබ මේ සිංහල

FAIR COMMENT BY JEZEEM

බෞද්ධ අන්තවාදවය පිළිබඳවත් කථා කරලා තියෙනවා නේද, එයත් ගරු කොමිෂන් සභාවේ අවධානයට යොමු කරන්නකෝ?

උ: මඩකලපුවේ ශ්‍රී මංගලාරාම විහාරාධිපති අම්පිටියේ සුමනනන්ද හිමි හරහා ද ජාතිවාදී වැඩසටහන් ක්‍රියාත්මක කරන බවට සාකච්ඡා කරන ලදී.

ඉතාමත් ගෞරවයෙන් ගරු කොමසාරිස්තුමනි මෙම කරුණ පිළිබඳව එනම් මඩකලපුව ශ්‍රී මංගලාරාමේ විහාරාධිපති අම්පිටිය සුමනරතන හිමි මෙවැනි ආකාරයට ක්‍රියාකරන බව ස්වාමිනි පසුගිය අවස්ථාවේ සාක්ෂි දෙන ගමන් ඥානසාර ස්වාමීන් වහන්සේ ඒ දිවුරුම් මත කියනු ලැබුවා. එම නිසා මෙයත් අදාළ කරුණක් වෙනවා ස්වාමිනි. මෙම පස්වන කරුණ ස්වාමිනි ඒ අනුව C 931 A අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර: C 931 A ඔබ තවත් කරුණක් කියලා තියෙනවද මීට අදාළව?

උ: කියලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඒ කුමන අංකයක් යටතේද?

උ: 16 වන කරුණ යටතේ බුද්ධිමය වශයෙන් අවධානය කළ යුතු වෙනත් කරුණු යටතේ. නැවත් ඒ යටතේ සඳහන් කරලා තියෙනවා. නැගෙනහිර පළාත තුළ එක් එක් ජාතීන් අතර අනවබෝධයක් ඇති වී සිංහල, දෙමළ ,මුස්ලිම් ජනතාවගේ සමගිය නැතිවන තත්ත්වයක් වර්ධනය වී ගෙන එන බවත් ඒ සම්බන්ධයෙන් අවධානය කළ යුතු බවටත් කරුණු දක්වන ලදී. එමෙන්ම ජාතිවාදය පතුරන අන්තවාදී සංවිධානවන ජාතික තවුහිද් ජමාත් සංවිධානය ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානය සිවසේනා සංවිධානය ආදි සංවිධාන පිළිබඳව දැඩි අවධානයෙන් සිටිය යුතු බවට කරුණු දක්වන ලදී.

ප්‍ර: දැන් ඔබ ඒ කරුණු ඒ ආකාරයට බුද්ධිමය වශයෙන් අවධානය යොමු කළ යුතු වෙනත් කරුණු කියලා කියන්න හේතු වුණ තව එක කරුණක් නේද ඔබේ වාර්තාවේ 06 වෙනි කරුණ ඒ කියන්නේ වත්මන් සිංහල ද්‍රවිඩ මුස්ලිම් අන්තවාදී පක්ෂය හා කණ්ඩායම් වල ක්‍රියාකාරකම්?

උ: ඒ කරුණු යටතේත් කරුණු දක්වලා තියෙනවා.

ප්‍ර: මොකද මේ ගරු කොමිෂන් සභාව මුස්ලිම් අන්තවාදය විතරක් නෙවේ සියලුම අත්නවාදීන් කටයුතු සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. මේ ඔවුන්ගේ වාර්තාව ගරු ජනාධිපතිතුමාට දෙන කොට. ඒ නිසා අපට අවශ්‍ය වෙනවා ගරු කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙනුත් දැනුවත් කරන්න.

උ: 6 වෙනි කරුණ වත්මන් සිංහල ,ද්‍රවිඩ, මුස්ලිම් අන්තවාදී පක්ෂය හා කණ්ඩායම්වල ක්‍රියාකාරකම්. ඒ යටතේ කරුණු දක්වලා තියෙනවා. කාත්තන්කුඩි මූලික කරගනිමින් ක්‍රියාත්මක වන මුස්ලිම් සංවිධානයක් වන ජාතික තවුහිද් ජමාත් සංවිධානය නැගෙනහිර පළාතේ අන්තවාදී

FAIR COMMENT — BY JEZEEM —

අයුරින් ක්‍රියාකාරකම් සිදුකරන බවට ද ඔවුන් සතුව අල්සලපා නමින් කෙටි පණිවිඩ ක්‍රමයක් ක්‍රියාත්මක කරන බවට ද කරුණු වාර්තා කරන ලදී. සිංහල බෞද්ධ සංවිධානය වන මහසොහොන් බලකාය සිංහලයේ ජාතික සංවිධානය සිංහලයේ ජාතික බලමුලුව නැගෙනහිර පළාත්වල වැඩසටහන් ක්‍රියාත්මක කරන බවට ද කෙලියාමඩුව අභයාරාමයට අලුතින් පැමිණි කිරිඇල්ලේ සුධර්ම ජෝති හිමි සිංහලයේ බොදු එකමුතුව නමින් සංවිධානයක් පිහිටුවා ගෙන ජාතිවාදය ප්‍රචලිත කරන බවටද අදහස් දක්වන ලදී එමෙන්ම උතුරු පළාතේ ආරම්භ කර ගෙන ඇති සිවසේනා සංවිධානයේ කටයුතු නැගෙනහිර පළාත තුළ ද ව්‍යාපත්ත කිරීමට සුදානමක් පවතින බවට සාකච්ඡා කරන ලදී.

ස්වාමීනි **එම අංක 06 යටතේ සඳහන් වී ඇති කරුණු C 931 B අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්න අවසර අයදිනවා.**

ප්‍ර: මීළඟට ඔබ සඳහන් කරා C 932 එනම් 2016.12.29 වෙනිදා ඔබ විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව. එමඟින් ඔබ යම් ආකාරයක නිරීක්ෂණයක් ඉදිරිපත් කරලා තියෙනවද මේ වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාව වන විට කාත්තන්කුඩියේ පමණක් ක්‍රියාත්මක වූ ජාතික තවුහිද් ජමාත් සංවිධානය වෙනත් ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීමේ අදහසක් ඔවුන් සතුව තිබුණාද කියලා ?

උ: එම සංවිධානයේ අවුරුදු 15 ත් 25 ත් අතර 50 ක පමණ පිරිසක් නිරන්තයෙන්ම.

ප්‍ර: ඒක අපි ඊයේ කිව්වානේ ඒක ගරු සභාපතිතුමාට පැහැදිලි කරානේ. ඊට පස්සේ ඡේදය ?

උ: දැනට කාත්තන්කුඩි ප්‍රදේශයේ පමණක් ක්‍රියාත්මක කරන මෙම සංවිධානයේ කටයුතු වෙනත් ප්‍රදේශ සඳහා ව්‍යාප්ත කිරීමේ අදහසක් ඔවුන් තුළ පවතියි .

ප්‍ර: එතකොට ඔවුන්ගේ පල්ලිය ඉදිකිරීමක් සම්බන්ධයෙන්?

උ: දැනට තාවකාලික ඉදිකර ඇති පල්ලිය වෙනුවට ඉතා විශාල පල්ලියක් එම අසන්නයේම ඔවුන් ඉදිකර ගෙන යනු ලබයි.

ප්‍ර: එය ඔබේ නිරීක්ෂණයක් අනුව ද කිව්වේ?

උ: එහෙමයි ස්වාමීනි.

ස්වාමීනි මේ ලේඛනය ලකුණු කරන අවස්ථාවේදී යම් අත්වැරැද්දක් වුණා. ඒ නිසා අවසර ඉල්ලා සිටිනවා C 931 ලෙස ලකුණු කරන ලද ලේඛනය X 121 ලෙස ලකුණු කිරීමටත් එහි පස්වෙනි ඡේදය එහි ලකුණු කිරීම X 121 A ලෙස වෙනස් කිරීමටත් එහි 6 වන ඡේදයේ කරන ලද ලකුණු කිරීම X 121 B ලෙස ලකුණු කිරීමටත් එසේම C 932 ලෙස දැනට ලකුණු කර ඇති ලේඛනය X 122 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට.

FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ඉල්ලීමට අවසර දෙමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ස්වාමිනි සාක්ෂිරු විසින් කියවන්නට යෙදුණු X 122 ලේඛනයේ 6 වන ඡේදය එනම් දැනට කාත්තන්කුඩිය ප්‍රදේශයේ පමණක් ක්‍රියාත්මක වන යන වචන වලින් පමණක් ආරම්භ වන ඡේදය X 122 A වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා.

ප්‍ර: ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා ඔබට යම් උපදෙසක් දුන්නා කියලා ඔබ කිව්වා. සහරාන් සම්බන්ධයෙන් කරණු සොයා බලා විමර්ශනය කරන්නට කියලා. තොරතුරු රැස්කරන්න කියලා. ඒ අනුව ඔබ ඔබේ නිලධාරීන් ඒ සම්බන්ධයෙන් අනුයුක්ත කරාද?

උ: අනුයුක්ත කරලා තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර: මොන ප්‍රදේශවලට ද අනුයුක්ත කරේ?

උ: විශේෂයෙන්ම කාත්තන්කුඩි ප්‍රදේශයට.

ප්‍ර: එසේ අනුයුක්ත කරන ලද නිලධාරීන්ගෙන් ඔබට යම් තොරතුරු ලැබුණාද?

උ: ජාතික තවුහිද් ජමාත් සංවිධානය සම්බන්ධයෙන් තොරතුරු ලැබුණා.

ප්‍ර: එතකොට මොන වගේ තොරතුරු ද ලැබුණෙ කියලා කියන්න පුළුවන්ද ඔබට ?

උ: ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ ජාලය සම්බන්ධව එම ජාලයට සම්බන්ධව එම ජාලයට සම්බන්ධ කටයුතු කරන පුද්ගයින් සම්බන්ධව.

ප්‍ර: ඒ පුද්ගලයින් සම්බන්ධව ඔබට තොරතු ලැබුණා?

උ: ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්

ප්‍ර: එතකොට ඔබ එම තොරතුරු පෙරළා ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා අර නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට දැනුම් දුන්නාද?

උ: දැනුම් දුන්නා ස්වාමිනි.

ප්‍ර: ඒ ඔස්සේ වැඩි දුර ඔබලා තොරතුරු රැස් කිරීම් කරාද?

උ: වැඩිදුරටත් තොරතුරු රැස්කිරීම සිදු කරා.

ප්‍ර: එතකොට ඔබ දැනගෙන හිටියද 2017 මාර්තු මාසේ 10 වෙනිදා කාත්තන්කුඩිය අලියාර් හන්දියේ ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානයත් සුන්නත් වල් ජමාත් සංවිධානයත් අතර එකේ සමාජිකයන්ගේ ගැටීමක් සිදුවුණා කියලා?

උ: ගැටුමක් සිදු වුණේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයත් රවුෆ් මවුලවී නායකත්වයෙන් දුන්න සුන්නතුල් වල් ජමාත් සංවිධානයත්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඒකේ යම් යම් පුද්ගලයින්ට තුවාල වුණු බව එහෙම නම් ඔබ දැන ගත්තාද?

උ: නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒ තුවාල ලැබීමෙන් පස්සේ කාත්තන්කුඩිය පොලිසිය ඒ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කරලා යම් යම් අයව අත්අඩංගුවට ගත්තා කියලත් ඔබ දැනගත්තද?

උ: දන්නවා ස්වාමිනි.

ප්‍ර: එහෙම නම් ඒ කරුණු සොයා ගැනීමේ දී තොරතුරු රැස් කිරීමේදී ඔබට දැනගන්නට ලැබුණද අත්අඩංගුවට ගැනීමට නියමිතව හිටි ඇතැම් තැනැත්තන් ඒ අත්අඩංගුවෙන් ගැනීමෙන් වැළකී හැංගිලා ඉන්න බව?

උ: අත්අඩංගුවට ගන්න නියමිතව සිටි පුද්ගලයෝ 4 දෙනෙකුට වරෙන්තු නිකුත් කරලා තිබුණා.

ප්‍ර: අධිකරණය විසින් නිකුත් කරලා තිබ්බා. කවුද ඔබට දැනගන්න ලැබුණු ආකාරයට ඒ තැනැත්තා ?

උ: මොහොමඩ් සහරාන් , මොහොමඩ් රිල්වාන්, මොහොමඩ් ෂයිනි, යුෂුෆ් අන්වර්

ප්‍ර: යුෂුප් අන්වර් කියන එක්කෙනාට තව අන්වර්ත නාමයක් තියෙනවද , කමක් නැහැ ඔබට මතක නැත්නම්?

උ: ඔහු ඇදුම් මසන්නෙක්. යුෂුප් අන්වර් කියලා තමයි කියන්නේ සමාවෙන්න ස්වාමිනි ෂයිනි නෙමේ. මොහොමඩ් සහරාන් ,මොහොමඩ් රිල්වාන්, ආමී මොහිදීන් යුෂුෆ් අන්වර්.

ප්‍ර: ෂයිනිත් මුල් අවස්ථාවේ දී අත්අඩංගුවට ගැනීමෙන් වැළකිලා හිටියා. නමුත් යම් අවස්ථාවක දී ඔහුව කාත්තන්කුඩිය පොලිසියෙන් අත්අඩංගුවට ගත්තා ඔබ දන්නව ද ඒක?

උ: අත්අඩංගුවට ගත්තා.

ප්‍ර: මොන වසරේ ද?

උ: 2017 අප්‍රේල් මාසයේ.

ප්‍ර: නමුත් ඔබ කිව්ව අර අනිත් පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමෙන් වැළකිලා හිටියා?

උ: හතරදෙනාම කිව්වා සහරාන්, රිල්වාන්, ආමී මොහිදීන් , යූෂුෆ් අන්වර් අත්අඩංගුවට ගැනීමක් සිදු කළේ නැහැ.

ප්‍ර: එතකොට ඔබලා ඔය කරුණු රැස් කරන කොට භූමියෙන් මේ අය ඉන්න ස්ථාන පිළිබඳව සොයලා බැලුව ද?

උ: සොයලා බැලුවා ස්වාමීනි.

ප්‍ර: මොනවද අනාවරණය වුණේ? ඒ අය ඉන්න ස්ථාන අනාවරණය වුණාද?

උ: ආමී මොහිදීන් ඉන්න තැන අපි හොයා ගත්තා. ඒ වගේම රිල්වාන් ඉන්න තැන අපි හොයා ගත්තා.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: රිල්වාන් සම්බන්ධයෙන් බැලුවොත් ඔහුගේ චර්යා රටාවන් පිළිබඳව ඔබේ අවධානය යොමු වුණා ද? ඒ කියන්නේ ඔහු එක ස්ථානයක ස්ථානගත වෙලා ඉන්නව ද එහෙම නැත්නම් ඔබේ තොරතුරු වලදී අනාවරණය වුණා ද ඔහු යම් ස්ථානයකට යන එන බවක්?

උ: රිල්වාන් ෆොරිනස් පාරේ ඔහුගේ බිරිඳ නැවතිලා ඉන්න ගෙදරට රාත්‍රී කාලයේ පැමිණෙන බවට අපිට තොරතුරු වාර්තා වුණා.

ප්‍ර: ඒ අවස්ථාව වන විට රිල්වාන්ගේ බිරිඳ දරු ප්‍රසූතියකින් පසුව ද හිටියේ?

උ: දරු ප්‍රසූතියකින් පසුවයි හිටියේ. එදා ඒ දරුවා බලන්න තමයි ඒ රාත්‍රී කාලයේ මේ නිවසට පැමිණියේ.

ප්‍ර: ඔය මොන කාලයේ ද ඔබලා ඔය සෙවීම කරන්නේ?

උ: මේක තොරතුරු අපි තොරතුරු 2019 ජනවාරී වලින් පසුව අපි දැඩි විදියට මේ සංවිධානයේ කටයුතු නිරීක්ෂණය කරා. 2019 ජනවාරි මාසින් පසුව තමයි මේ තොරතුරු අනාවරණය කරේ.

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියන කරුණු වලින් ප්‍රධාන වශයෙන් පැහැදිලි වෙන්නේ 2017 මාර්තු මාසයේ 10 වැනිදා සිදුවුණු අලියාර් හන්දියේ මේ ගැටීමෙන් පස්සේ ඔබලා ඔය 2019 ජනවාරී මාසයේ කරුණු සොයන අවස්ථාවේ දී තොරතුරු රැස්කරන අවස්ථාව වන විටත් ඔය කියන තැනැත්තන් හතර දෙනා අත්අඩංගුවට ගැනීමට පොලීසිය අපොහොසත් වී තිබුණා?

උ: අත්අඩංගුවට ගැනීමක් සිදු වෙලා තිබුණේ නැහැ.

ප්‍ර: ඊළඟට ඔබ කිව්වනේ රිල්වාන් යම් ස්ථානයකට යන එන බවක් දැනගන්න ලැබුණා කියලා. ඒ වගේම ඔහුගේ බිරිඳත් එතැන හිටියයි කියලා?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඒ අවස්ථාව වන විට ඔබේ තොරතුරු අනුව අනාවරණය වුණා ද රිල්වාන්ගේ බිරිඳට දරු ප්‍රසූතියක් එහෙම සිදු කරලා තිබ්බ ද කියලා ඇය?

උ: දරු ප්‍රසූතිය සම්බන්ධයෙන් තමයි දරුවා බැලීමට මේ රිල්වාන් ඒ නිවසට පැමිණෙන බව තමයි තොරතුරු අනාවරණය වුණේ.

ස්වාමීනි ඒ ප්‍රශ්නය අසන්නට හේතු වුණේ ඊයේ දින අපි මියගිය අය පිළිබඳව ලැයිස්තුව ගන්න අවස්ථාවේ දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කියවුණා ස්වාමීනි මාස තුනක බිළිදෙක් මේ සිද්ධියෙන් මිය ගියා කියලා. එතකොට ඒ බිළිඳ වෙන්නේ මේ රිල්වාන්ගේ දරුවා.

ප්‍ර: එතකොට දැන් ඔබලා සාමාන්‍යයෙන් සාමාන්‍ය සාම නිලධාරීන් විදියට පොලිස් නිලධාරීන් සාම නිලධාරීන් විදියට ගන්නවනේ. ඒ ආකාරයට සාමාන්‍ය පොලීසිය කරන ආකාරයට වැටලීම් කිරීම් ගරු අධිකරණයට කරුණු වාර්තා කිරීම් තැනැත්තන් අත්අඩංගුවට ගැනීම්, භාණ්ඩ අත්අඩංගුවට ගැනීම් ඒ වගේ දේවල් කරනව ද විමර්ශන ?

FAIR COMMENT — BY JEZEEM —

උ: කිසිවිටකත් ඒ වගේ ඒවට දායක වෙලා නැහැ. බුද්ධි තොරතුරු ලබාදීම් පමණයි සිදුවෙන්නේ.

ප්‍ර: ඔව් ඒ කියන්නේ සාමාන්‍ය පොලීසියේ නිලධාරීන් කරන රාජකාරී වලට වඩා ඉදුරාම වෙනස් තත්ත්වයේ වූ රාජකාරියක තමයි ඔබලා නියලෙන්නේ?

උ: ඔව්.

ප්‍ර: එහෙම නම් ඔබලා අත්අඩංගුවට ගැනීමක් කරන්නේ නැත්නම් දැන් තොරතුරු රැස් කිරීමේ දී මේ අය ආමී මොහිදීන් රිල්වාන් යන අය යන එන තැන් ඔහු සැඟවී ඉන්න තැන් පිළිබඳව ඔබට කරුණු අනාවරණය වුණා නම් ඊළඟට ඔබ ගත්ත පියවර මොකද්ද?

උ: තොරතුරු නියෝජ්‍යය අධ්‍යක්ෂකතුමාට ලබාදුන්නා. ඒ නියෝජ්යය අධ්‍යක්ෂකතුමා දුන්නට ලබා දුන්නට පස්සේ මෙම කාලය වෙන කොට අපි මේ සහරාන්ගේ සංවිධානය ජනවාරී මාසයෙන් පස්සේ මේ සංවිධානය ගැන අපිට තේරුණා ඔහු දැඩි අන්තවාදී ක්‍රමයකට යනවා කියලා. ඊට පස්සේ නියෝජ්‍යය අධ්‍යක්ෂතුමා අධ්‍යක්ෂකතුමයි දෙන්නම මට කිව්වේ සහරාන් ඉන්න තැනක් හොයාගන්න කොහොම හරි. නමුත් ඒ වන කොට සහරාන් කාත්තන්කුඩියට අපි උත්සහා කරාට සහරාන් සම්බන්ධයෙන් අපිට හොයාගන්න බැරි වුණා. ඊට පස්සේ මම නියෝජ්‍යය අධ්‍යක්ෂකතුමාට කිව්වා අපි හොයා ගත්තා ආමී මොහිදීන්, රිල්වානුයි ඊට අනතුරුව ෂයිනි ඉන්න තැන් තුනක් අපි හොයාගෙන තියෙනවා. මේ තුන්දෙනාගෙන් ප්‍රශ්න කළොත් අත්අඩංගුවට අරගෙන ප්‍රශ්න කරොත් මේ සහරාන් ගැන තොරතුරක් ලබා ගන්න පුළුවන් කියලා.

ප්‍ර: ඔව් ඒක තමයි ඔබේ මතය වුණේ? ඒ අනුව ඔබ ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියට දැනුම් දුන්නා. ඊට පස්සේ මොකද වුණේ?

උ: ඊට පස්සේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට දන්වලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් කණ්ඩායමක් 2019 . 03 වැනි මාසේ 07 වැනිදා ආවා පාසිකුඩා වලට.

ප්‍ර: ඊට පස්සේ මොකද වුණේ?

උ: පාසිකුඩා වලට ආවට පස්සේ ඒ වන කොට අපි ඉස්සෙල්ලාම ආමී මොහිදීන් පාසිකුඩා ප්‍රදේශයේ පොල් වත්තක හදා ගත්ත තාවකාලික නිවසක තමයි නැවතිලා හිටියේ.

ප්‍ර: ඔය දවස් වෙන කොට?

උ: මේ දවස් වෙන කොට.

ප්‍ර: ඒ කියන්නේ ඔහු ඔහුගේ ස්ථිර නිවාසයේ හිටියේ නැද්ද?

උ: ස්ථිර නිවාසය කාත්තන්කුඩි. මේ කාත්තන්කුඩි ඉඳන් ඔහු සැඟවී සිටි නිවසට කිලෝමීටර් 35 ක් පමණ දුර තිබෙනවා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඒ සැඟ වී ඉන්න ප්‍රදේශයේ නම මොකද්ද?

උ: පාසිකුඩා.

ප්‍ර: දැන් ඔය ඒ ස්ථානය පිළිබඳව ඔබලා දැනුම් දුන්නා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එහෙමද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ නිලධාරීන් ආවද ඔබලා මුණ ගැහෙන්නට?

උ: ඔව් නියෝජ්‍යය අධ්‍යක්ෂතුමා මට දැනුම් දුන්නා. මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කණ්ඩායමක් පැමිණෙන බවත් ඔවුන්ට මොවුන් සැඟ වී සිටින ස්ථාන පෙන්වා දෙන්න කියලා. පසුව මට ඉස්සෙල්ලම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක මාරසිංහ නිලධාරියා තමයි එනවා කියලා මට දුරකථන ඇමතුමක් දුන්නා. පස්සේ දැනුම් දුන්නා ඔහු එන්නේ නැහැ කියලා. පස්සේ එනවා කිව්වේ උප පොලිස් පරීක්ෂක ඩයස් ඇතුළු කණ්ඩායමක්. ඒ අනුව ඔහුගේ දුරකථන අංකය ලබාදීලා මට ඒ අදාළ තැන් පෙන්වීමේ කටයුතු අපේ නිලධාරීන් ලවා කරන්න කියලා කිව්වා.

ප්‍ර: ඒ අනුව ඒ කණ්ඩායම ආවද ඔබලා මුණ ගැසෙන්නට ?

උ: 2019.03 වැනි මාසේ 07 වැනිදා පාසිකුඩා වලට ආවා. එතකොට මේ ආමී මොහිදීන් මුල ඉඳන්ම ජාතික තවුහිද් ජමාත් සංවිධානයටත් Physical training Exercise ශරීරික අභ්‍යාස කෙරුවේ අපි මොහිදින් ඒ කාලේ ඉඳන් අපි දන්නවා. මොහුත් අපි සොයා ගත්තේ සැඟවිලා සිටියත් උදේ 5.00 ට මොහු ඒ ආසන්නයේ වෙළඳ තීරයට ඇවිල්ලා ශරීරික අභ්‍යාස කරා ඒ කාලේ.

ප්‍ර: ඒ කියන්නේ ඔහු තනියම ද ඒ ශාරීරික අභ්‍යාස කළේ එහෙම නැත්නම් ඔහු කාටහරි කෙරෙව්ව ද ඒවා?

උ: සැඟවිලා ඉන්න කාලේ ඔහු තනියම තමයි කළේ.

ප්‍ර: දැන් ඔබ ආමී මොහිදීන්ගේ නම කිව්වා හින්දා මේ ගරු කොමිෂන් සභාවට ඔබට කියන්න පුළුවන් ද ඔබලා භූමියෙන් රැස්කර ගන්නා ලද තොරතුරු අනුව ආමී මොහිදීන් කියන්නේ කවුද? ඔහු ඔබලා සොයන අවස්ථාව වන විට යම් රැකියාවක නියලිලා හිටිය ද? කොයි වගේ පුද්ගලයෙක් ද කියන්න?

උ: ආමී මොහිදීන් යුධ හමුදාවේ සේවය කළ නිලධාරියෙක්. ඒ අවස්ථාව වන විට යුධ හමුදාවෙන් අයින් වෙලා හිටියේ.

ප්‍ර: යුධ හමුදාවේ මොන කොටඨාශයේ ද, ඔබේ වාර්තා බලලා මතකය අලුත් කරගෙන නිවැරදි තොරතුරු ලබා දෙන්න?

උ: ඔව් 1994 09 වන ශ්‍රී ලංකා ජාතික බල මුළුවේ අංක 02117 යටතේ පුහුණුව ලබලා 2004 වර්ෂය දක්වා සේවය කරලා ඊට පස්සේ නොදන්වා සේවයෙන් ඉවත් සිට පොදු සමාව යටතේ නීත්‍යානුකූලව යුධ හමුදාවෙන් ඉවත්ව සිටි කෙනෙක් බවට තොරතුරු වලින් අනාවරණය වෙනවා.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: එච්චරද අනාවරණය වුණේ?

උ: ඉන්පසු ඔහු විදුලි කාර්මිකයෙකු ලෙස කාත්තන්කුඩිය ප්‍රදේශයේ එසේ රැකියාවක් කරනු ලැබුවා.

ප්‍ර: ඒ තැනැත්තාව තමයි ඔබලා මේ අත්අඩංගුවට ගැනීම සඳහා ඔහු අධිකරණය මහහරින නිසා මේ තොරතුරු දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබාදෙන්නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට රිල්වානුත් ඔබ කිව්වනේ ඒ ආකාරයට සැඟ වී ඉන්නවා බිරිඳ ඉන්න ස්ථානයට යනවා එනවා කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ප්‍රදේශය කොහේද තිබ්බේ?

උ: රිල්වාන් කාත්තන්කුඩි. කාත්තන්කුඩි ෆන්නැස් පාරේ දෙවන හරස් වීදියේ තියෙන තුන්වැනි ගෙදර.

ප්‍ර: එතැන්ට තමයි ඔහු යනවා එනවා කියලා ඔබට තොරතුරු ලැබුණේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට දැන් දෙන්නයි. තුන්වැනි එක්කෙනා?

උ: ෂයිනි මවිලවි.

ප්‍ර: ෂයිනි අධිකරණයට ඉදිරිපත් වුණානේ?

උ: ඔව්. මේ කාලය වන නෙවෙයි අලියාර් Case එකට නෙමේ. අන්තවාදය සොයන කොට 2019 මේ මාර්තු මාසයේ ප්‍රහාරයකට මාසෙකට කලින් එතකොට ෂයිනිත් හැංගිලා හිටියේ ඒ වන කොටත්. නමුත් ඔහු ධීවර සංස්ථා පාරේ කාත්තන්කුඩි NTJ පල්ලියට පිටිපස්සේ ගෙදරක් තිබ්බා. ඒ ගෙදරට එනවා කියලා අපිට තොරතුරු අපිට වාර්තා වෙලා තිබ්බා.

ප්‍ර: නමුත් ෂයිනිට වරෙන්තුවක් තිබුණේ නැහැනේ ඒ වන කොට?

උ: ෂයිනිට විතරයි වරෙන්තුවක් තිබ්බේ නැත්තේ.

ප්‍ර: එහෙනම් වරෙන්තුවක් තිබ්බ අනිත් එක්කෙනා කවුද? ඔය 4 දෙනාගෙන් දැන් දෙන්නෙක් කිව්වා. ෂයිනිට වරෙන්තුවක් ඔය කාලයේ නැහැ. 4 වැනියා

උ: වරෙන්තු තිබ්බේ සහරාන්ටයි , යුෂුෆ් අන්වර් ආමී මොහිදීන්, රිල්වානුයි. වරෙන්තු තිබ්බ 4 දෙනා තමයි සහරාන් ,රිල්වාන් ,ආමී මොහිදීන්, යුෂුෆ් අන්වර්.

ප්‍ර: එතකොට යුෂුෆ් අන්වර්?

උ: යූෂුෆ් අන්වර්ගේ විශේෂයෙන්ම හැංගිලා හිටියේ නැහැ මොහු පොලීසියට පෙන්නම Smart tailor ඇඳුම් මසන තැනක් කරලා තමා සිටියේ ඒ කාලේ කාත්තන්කුඩියේ.

ප්‍ර: ඔබ කියන්නේ ඒ වුණත් පොලීසිය ඔහු අත්අඩංගුවට ගත්තේ නැහැ කියලද?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඔහු ඇඳුම් මැසීම කරගෙන ගියත් ඒ වන කොට එහෙම අත්අඩංගුවට ගැනීමක් සිදු වුණේ නැහැ මා දැනුවත්ව.

ප්‍ර: ඒ tailor Shop එක කොහේද තිබ්බේ?

උ: කාත්තන්කුඩියේ නගරය ආසන්නයේ.

ප්‍ර: දැන් ඔබේ විමර්ශනයේ දී ඔය තොරතුරු රැස් කිරීමේ දී තමයි ඔබ කිව්ව ඔය කරුණු අනාවරණය වුණේ කියලා. නමුත් පොලීසිය ඔහුව අත්අඩංගුවට ගත්තේ නැහැ ඔබගේ නිරීක්ෂණය අනුව? හොඳයි එතකොට දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ඔය ඔබලා දන්න තොරතුරු 07 වැනිදා. 2019 මාර්තු මාසයේ 07 වැනිදා ඔබලා ලබාදුන්නනේ?

උ: ඔව්.

ප්‍ර: ඔබ කිව්වා පොලිස් පරීක්ෂක මාරසිංහ මහත්මයාට එන්නට බැරි හින්දා උප පොලිස් පරීක්ෂක ඩයස් කියලා මහත්මයෙක් ආවා කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔහු තනියමද ආවේ නැත්නම් වෙන නිලධාරීනුත් ඔහු කැටුව පැමිණියාද?

උ: තව නන්දලාල් කියලා නිලධාරියකුත් හිටියා. තව නිලධාරී මතක හැටියට මම නෙවෙයි එතැන්ට ගියේ. මගේ මෙතැන හිටිය නිලධාරීන් දෙන්නෙක් තමයි මම මේ සම්බන්ධව දන්න දෙන්න තමයි එතැන්ට යොමු කළේ පෙන්වන්න. එතකොට ඒ නිලධාරීන් පැවසූ අකාරයට ඩයසුයි පොලිස් කොස්තාපල් කෙනෙක් මගේ මතකයේ හැටියට නන්දලාල් කියලා ඊට අමතරව තව දෙන්නෙක් හරි තුන්දෙනෙක් හරි ඇවිල්ලා තිබ්බා කණ්ඩායමක්.

ප්‍ර: ඔබට ඔවුන්ව මුණගැහුණ ද?

උ: මට ඔවුන්ව මුණ ගැහුණා ප්‍රහාරයෙන් පස්සේ. 2019/04/24 ආමී මොහිදීන් අත්අඩංගුවට ගැනීමක් කරා. ඒ අත්අඩංගුවට ගන්න කොට ආමී මොහින්දින්ව භාර ගන්න ආවේ කල්කුඩා පොලීසියට මේ කණ්ඩායම තමයි ආවේ. එම අවස්ථාවේ මට ඔවුන්ව මුණ ගැහුණා.

ප්‍ර: නමුත් 07 වැනිදා ඔබට මුණ ගැහුණේ නැහැ ඔවුන්?

උ: මට මුණ ගැහුණේ නැහැ. මගේ නිලධාරීන් තමයි පෙන්නීම සිදු කළේ.

ප්‍ර: එතකොට ඔබේ නිලධාරීන් මේ පෙන්වීම සිදු කරාට පස්සේ ඔබට කරුණු වාර්තා කරාද?

උ: කරුණු වාර්තා කරා. ඒ වගේම එතැන ඉඳන් මමත් උප පොලිස් පරීක්ෂක ඩයස්ට දුරකථනයෙන් අමතලා ඒ කාර්යය කිරීම සම්බන්ධයෙන් ඔහුව දැනුවත් කරා.

ප්‍ර: මොනවද ඔබ කිව්වේ ඩයස් මහත්මයට?

උ: ඉස්සෙල්ලම ඔහු ආවට පස්සේ ඔහු දුරකථනයෙන් අමතලා පෙන්වීම මගේ නිලධාරීන් විසින් සිදුකරයි කියලා දැනුම් දුන්නා. කාර්යෙන් පස්සේ පෙන්නලා ආවට පස්සේ ඒ සම්බන්ධයෙන් විමසුවට පස්සේ මම කිව්වා

FAIR COMMENT — BY JEZEEM —

මේක සහරාන්ගේ අන්තවාදී සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්න මේ පුළුවන්. එහෙම ප්‍රශ්න කරන්න ඕනේ නම් කාත්තන්කුඩි පොලිසියේ මෙහෙට වරෙන්තුවක් තියෙනවා අලියාර් Case එකට. ඒ සම්බන්ධව වුණත් කාත්තන්කුඩි පොලිසියට ගිහිල්ලා වරෙන්තුව අරගෙන වුණත් අත්අඩංගුවට ගැනීමක් කරන්න පුළුවන් කියලා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඒ කාත්තන්කුඩි පොලිසියේ තිබෙන වරෙන්තුව ගැන කාටද දුරකථනයෙන් කිව්වේ?

උ: උප පොලිස් පරීක්ෂක ඩයස්ට.

ප්‍ර: වරෙන්තු තිබ්බේ ආමී මොහිදීන්ට විරුද්ධව ?

උ: ආමී මොහින්දීන්ට විරුද්ධව ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ 2019 මාර්තු 07 වැනි දින වන විට උප පොලිස් පරීක්ෂක ඩයස් දැනුවත් වෙනවා ආමී මොහිදීන්ට විරුද්ධව වරෙන්තුනක් තියෙනවයි කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර: එතකොට රිල්වාන්ට විරුද්ධව ඔහුට විරුද්ධවත් වරෙන්තුවක් තිබ්බනේ?

උ: ඔහුට විරුද්ධවත් තිබ්බා.

ප්‍ර: එතකොට ඒ පිළිබඳව ඔබ දැනුම් දුන්නේ නැද්ද උප පොලිස් පරීක්ෂක ඩයස් මහත්මයට?

උ: පළවැනියම කළේ ඒ ආමී මොහින්දීන්ගේ කාර්යය. ඊට පස්සේ මොහු එතැන ඇවිල්ලා නිලධාරී කණ්ඩායම මම නිලධාරීන් දෙන්නෙක් යෙදෙව්වා එක නිලධාරියෙක් ජ්‍යෙෂ්ඨ නිලධාරියගෙන් අහලා තිබ්බා මොන පදනමකින් ද මේ කට්ටිය අත්අඩංගුවට ගන්නේ කියලා.

ප්‍ර: ඔබෙ නිලධාරීන්ගෙන් ඒ ප්‍රශ්න කරලා තිබුණා මොන පදනමක් මත ද මේ ආමී මොහිදීන් කියන එක්කෙනාද අත්අඩංගුවට ගන්නේ ඇයි කියලා අහන්නේ?

උ: ආමී මොහිදීනුයි අනිත් කට්ටිය රිල්වාන් සම්බන්ධවත්. ඊට පස්සේ අපෙන් මගේ නිලධාරියාත්

ප්‍ර: ඔබ කියන්නේ එහෙම නම් ඒ තොරතුරු දන්නේ නැතුව ද මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඔය පාසිකුඩා වලට 2019 මාර්තු මාසේ 07 වැනිදා අවේ?

උ: මම හිතන්නේ පැමිණි නිලධාරියට ඒ සම්බන්ධව ලොකු අවබෝධයක් තිබ්බේ නැහැ කියලා. මොකද ඡායාරූප පවා මේ ආමී මොහිදීන්ගෙනුයි

FAIR COMMENT BY JEZEEM

ෂයිනිගෙයි එම ඡායාරූප පවා ලබාදුන්නේ ඒ අවස්ථාවේ මගේ නිලධාරියාගේ whatsapp එකෙන් තමයි ලබාදුන්නේ. ඒ නිලධාරියා පැමිණියේ නන්දලාල් කියන රාලහාමිගේ ෆෝන් එකට ලබාදීමක් සිදු කළේ ඒ අවස්ථාවේ.

ප්‍ර: එතකොට ඒ කියන්නේ ඔබ කියන දේ මට හරියට තේරුණා නම් 2019 මාර්තු මස 7 වැනිදා වෙන කොට ඔබ කියන්නේ ඔය කියන කරුණු අනුව උප පොලිස් පරීක්ෂක ඩයස් මහත්මයා ඇතුළු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඔය පාසිකුඩා වලට පැමිණි අය ආමී මොහිදීන් ගැන දැනගෙන හිටියේ නැහැ කියලද?

උ: ඒක මට හරියටම කියන්න අමාරුයි. නමුත් මේ ආමී මොහිදීන්ගේ ඡායාරූපයකුත් මේ කට්ටිය ෂයිනිගේ ඡායාරූපයකුයි අපෙන් ඉල්ලීමක් කරා. ඊට පස්සේ ඒක අපි ලබාදුන්නා ඒ අවස්ථාවේදී.

ප්‍ර: ඒ ඉල්ලීම් ඔබ කියන්නේ ඒ ඉල්ලීම මත තමයි මේ ඡායාරූප ලබාදුන්නේ. ෂයිනිගෙයි, ආමී මොහින්දීන්ගෙයි එතකොට රිල්වාන්ගේ?

උ: රිල්වාන්ගේ ඡායාරූපයක් ඉල්ලීමක් කළේ නැහැ. මේ දෙන්නගේ තමයි ඉල්ලීමක් කළේ.

ප්‍ර: ඒ ඉල්ලන විදියට තමයි ඔබලා ලබාදෙන්නේ?

උ: ලබාදෙන්නේ.

ප්‍ර: එහෙම නම් ඔබ කිව්වේ පාසිකුඩාවලනේ ආමී මොහිදීන් ඉන්නවයි කියලා. එතකොට ඔබට දැන් තොරතුරු ලැබුණ ද දැනුවත් වුණා ද පාසිකුඩාවල ආමී මොහිදීන් ඉන්න ස්ථානය සැගවිලා ඉන්න බවට ඔබලා අනාවරණය කරගත්ත ස්ථානයට මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ කණ්ඩායම ගෙන ගියාද කියලා?

උ: ඔව් පැමිණි උප පොලිස් පරීක්ෂක ඩයස් මගේ නිලධාරියාගේ බයිසිකලේ පිටුපස්සේ වාඩිකරගෙන තමයි ආසන්නයට ගිහිල්ලා ඒ පෙන්වීම සිදු කළේ.

ප්‍ර: අනතුරුව මොකද්ද වුණේ?

උ: අනතුරුව මගේ නිලධාරියා පැහැදිලි කරලා දුන්නා මේකෙන් අත්අඩංගුව කරන්න යන කොට මෙයාට පනින්න පුළුවන් මාර්ග කොහේ ද තියෙන්නේ මුහුදු වෙරළ පැත්තෙන් යන්න පුළුවන් ද වටේට මොනවද තියෙන්නේ . ඒ පිළිබඳව සම්පූර්ණ විස්තරයක් නිලධාරියා විසින් උප පොලිස් පරික්ෂක ඩයස්ට කරලා තිබ්බා.

ප්‍ර: එසේ ස්ථානය පෙන්නුවට පස්සේ ඊළඟට මොකද වුණේ?

උ: ඊට පස්සේ නැවතිලා ඉන්න පාසිකුඩා

ප්‍ර: මා ඔබෙන් ඇහුවේ ඒ ස්ථානය පෙන්නුවට පස්සේ ඊළඟට මොකද්ද වුණේ කියලා?

උ: ඊට පස්සේ නැවතත් උපපොලිස් පරීක්ෂක ඩයස් ඒ නිලධාරියා වාහනය නරත කරන තැනට නැවත පැමිණිලා තිබ්බා. පැමිණිලා ඊට පස්සේ අපේ

FAIR COMMENT BY JEZEEM

නිලධාරීයගෙන් තමයි විමසලා තිබ්බේ මේ අර ඡායාරූප සම්බන්ධයෙන් හුවමාරුවයි මේ මොන පදනමින් ද අත්අඩංගුවට ගන්න කියලා විමසලා තිබ්බා. මගේ නිලධාරීයත් පැහැදිලිවම කියලා තිබ්බා මේ කාත්තන්කුඩි පොලීසියේ මොවුන්ට වරෙන්තු තියෙනවා කියලා. ඊට පස්සේ රිල්වායනුගෙයි ෂයිනිගෙයි නිවෙස් සම්බන්ධව මේ ෆන්නැස් පාරේ සම්බන්ධව පෙන්නන්ඩ ගෙනියනකොට ඔවුන් කියලා තියෙනවා කියන්න විස්තර ටික ඒක ඇඳගන්න කියලා.

ප්‍ර: එතකොට කොහේද ඔය රිල්වානුයි ෂයිනි ඉන්නේ ඒ වන කොට?

උ: කාත්තන්කුඩියේ.

ප්‍ර: එතකොට පාසිකුඩා ඉඳලා කාත්තන්කුඩියට කොච්චර දුරද?

උ: කිලෝමීටර් 35 ක් පමණ.

ප්‍ර: දැන් මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් පැමිණිලා හිටියේ ඇවිල්ලා තිබුණේ වාහනයක ද?

උ: වාහනයකින්.

ප්‍ර: එතකොට ඇඳලා දෙන්න කියලා ඒ ස්ථානයට යන විදිය ඔබේ නිලධාරියාට උපදෙස් දීලා තිබුණේ කවුද?

උ: එතැන පැමිණි උප ඩයස් කියලා තිබ්බා. ඒ පාර ඒ කට්ටිය මාක් කර ගන්නම්. ඒ යන විදිය ඒ කට්ටියට ඒ වෙලාවේ අපේ නිලධාරින් කියලා තියෙනවා ඉන්න ස්ථානය මාක් කරගන්න කියන්න කියලා. ඊට පස්සේ අපේ නිලධාරියා කියලා තිබ්බා එයා මාක් කරගෙන තිබ්බා. මේ ෆර්නාස් පාරේ කාත්තන්කුඩියේ පාරේ ඇවිල්ලා දෙවන හරස් වීදිය හැරුනට පස්සේ ඒ දෙවන හරස් වීදියේ තුන්වැනි ගෙදර ඒ රිල්වාන් ඉන්න ගෙදරට අනිත් අල්ලපු වත්ත හිස් ඉඩමක් තියෙන්නේ. ඒ හිස් ඉඩමට අනිත් පැත්තේ ගෙදර 309 D කියන නිවස තමයි මේ රිල්වාන් ඉන්නේ. කියලා.

ප්‍ර: ඒකේ පැහැදිලිව ඒ තොරතුරු දීලා ඒ ස්ථානය ඇඳලා ඔබේ නිලධාරියා දුන්න කියලයි ඔබ කියන්නේ?

උ: එයා තමා ඇඳගත්තේ.

ප්‍ර: ඒ ඩයස් මහත්මයමයි ඇඳගෙන තිබුණේ?

උ: නිලධාරීන් දෙදෙනා මුස්ලිම් නිලධාරී දෙන්නෙක් ගියේ. එයා තමා අපේ නිලධාරීන් කියපු විදියට ඇඳගෙන තිබ්බේ.

ප්‍ර: එයා කියලා ඔබ අදහස් කරන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක ඩයස් මහත්මයා?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඊට පස්සේ ඒ තොරතුරු ලබා ගත්තට පස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මොකද කරලා තියෙන්නේ,

උ: ඊට පස්සේ ෂයිනි ඉන්න තැනත් පැහැදිලි කිරීමක් කරලා තිබ්බා. එයා ඒක Map එක විදිහට නෙවෙයි ඒක ඇඳගත්තා කිව්වා. ධිවර සංස්ථා පාරේ NTJ පල්ලිය පිටුපස්සේ මේ ෂයිනි ඉන්න නිවස සම්බන්ධයෙනුත්

FAIR COMMENT — BY JEZEEM

ලියා ගත්තා කිව්වා. ඊට පස්සේ අපේ නිලධාරීන් කියලා තිබ්බේ අපි ඒක ගැන බලාගන්නම් කිව්වට පස්සේ අපේ රාජකාරිය ඉවර වුණා මට කතා කරලා කිව්වා මොකද කරන්නේ කියලා මං කිව්වා අපේ නිලධාරියාට අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව පෙන්නුවා ඊට පස්සේ අපේ රාජකාරිය ඉටු කරා මං කිව්වා අපේ නිලධාරීන්ට එතැනින් ඉවත් වෙන්න කියලා.

ප්‍ර: එහෙම නම් ඔබට පුළුවන් ද ඔය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් සමඟ එදා සම්බන්ධීකරණය කරපු ඔබේ නිලධාරීන්ගේ නම් ලියලා දෙන්න ගරු කොමිෂන් සභාවට ?

උ: පුළුවන් ස්වාමීනි. පොලිස් සැරයන් 53985 අන්සර්. පොලිස් සැරයන් 54000 දුලිකාන්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකරු පිළිතුර වශයෙන් ලියා ලබාදුන්නු නම් දෙක ලසුලේඛිකාවට ලබා දෙන අතර සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් එය සටහන් කළ යුතු බව නියෝග කරමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර: අනතුරුව ඔබ කිව්වා යම් අවස්ථාවකදී ආමී මොහිදීන් නැමැත්තාව ඔබලා විසින් අත්අඩංගුවට ගත්තාය කියලා. ඔබලා සාමාන්‍යයෙන් අත්අඩංගුවට ගන්නේ නැහැ කියලා කිව්වනේ මගේ මූලික ප්‍රශ්නයට පිළිතුරු දෙන ගමන්. එහෙම නම් ඒ අත්අඩංගුවට ගැනීම සිදු වුණේ කොහොම ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමගද?

උ: කල්කුඩා පොලිස් නිලධාරීන්ගේ සහාය ඇතිව.

ප්‍ර: කවදද අත්අඩංගුවට ගත්තේ. කොහේදිද අත්අඩංගුවට ගත්තේ. ඔබලා අත්අඩංගුවට ගන්නට සහාය වුණේ කුමන නිලධාරීන්ට ද ?

උ: 2019.04.21 පසු මේ ප්‍රහාරය සම්බන්ධයෙන් ජාතික තවුහිද් ජමාත් සංවිධානයට අමතරව මේ තවුහිද් කියන වචනයක්වත් එහෙම මේ පොලීසියවත් දැනගෙන තිබුණේ නැහැ. නමුත් මේ ජාලය සම්බන්ධයෙන් අපි සම්පූර්ණයෙන්ම ඒ වන කොට දැනගෙන තිබ්බේ. එතකොට අධ්‍යක්ෂකතුමා, නියෝජ්‍යය අධ්‍යක්ෂකතුමයි දෙන්නම මට දැනුම් දුන්නා මේක මේ සති දෙකක් ඇතුළත මේ කණ්ඩායම අපි දන්න නිසා පොලිසියට සහාය වෙන්න මේක වළක්වන්න කියලා. මොකද ඒ වන විට දෙවන ප්‍රහාරයක් සම්බන්ධයෙනුත් තොරතුරු ලැබිලා තිබුණ නිසා අපි අර කලින් රාජ්‍ය බුද්ධි සේවයේ මූලික න්‍යායෙන් බැහැර වෙලා අර ත්‍රස්තවාදී දෙවන ප්‍රහාරය වළක්වලා මේ ත්‍රස්තවාදී ජාලය අත්අඩංගුවට

FAIR COMMENT — BY JEZEEM —

ගැනීමට සහාය වෙන්නයි කියලා. ඊට පස්සේ අපි ඉස්සෙල්ලම හිතුවේ ෂ්‍රැංග්‍රිලා එකේ මේ බෝම්බ පුපුරවා ගත්තේ සහරාන් නෙවෙයි. ආමී මොහින්දිර් කියලා. ඡායාරූප වලින් හිතුවේ.

ප්‍ර: ඔබලා හිතුවේ?

උ: හිතුවේ. නමුත් ඊට පස්සේ නියෝජ්‍යය අධ්‍යක්ෂකතුමා දැන්නුවා ආමී මොහිදීන් ඒ ගෙදරක් ඒ වන කොටත් හරියට අපිට ඒක සනාථ කරගැනීමට ආමී මොහිදීන් ඉන්නව ද කියලා බලන්න කියලා. අපි 21, 22 රෑත් මේ පාසිකුඩා බැලුවා. එතකොට මේ ආමී මොහිදීන් එළියට ආවේ නැති වුණාට ඔහු තාවකාලිකව හිටපු තැන Light දාලා තිබ්බා. අපි 22 රෑ , 23 රෑ ඒ නිලධාරීන් එළිවෙනකම් ඒ බලන් හිටියා. කොහොම නමුත් එළියට ආවේ නැහැ. නමුත් ගෙදර Light දාලා තිබ්බා. ඊට පස්සේ අධ්‍යක්ෂකතුමා ඒ දවස් වල අම්පාරයි මඩකලපුවයි දෙකම බැලුවේ නියෝජ්‍යය පොලිස්පති ආයාස කරුණාරත්න මහත්මයා. එයාට කියලා මේ ආමී මොහිදීන්ව අත්අඩංගුවට ගන්න මට කිව්වා අයාස කරුණාරත්න මහත්මයා හම්බුවෙලා මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන්න කියලා. මම එතුමා හම්බුවෙලා එතුමා පාසිකුඩා පොලීසියෙන් කණ්ඩායමක් දෙනවා කියලා කිව්වා. ඒපාර 24 අපි පාන්දර මේකට ගිහිල්ලා ඒ කියන පාසිකුඩා මඩුවට ගියා කල්කුඩේ පොලිස් නිලධාරීන් සමඟ. කල්කුඩා ඒක පරික්ෂා කරන්න අපි තමයි ඒ තොරතුර ලබාදුන්නේ.

ප්‍ර: ඔබ මේ කියන්නේ 2019 අප්‍රේල් 24 වැනිදා?

උ: අප්‍රේල් 24 වැනිදා.

ප්‍ර: ප්‍රහාරයකට දවස් තැනකට පස්සේ ?

උ: පස්සේ ක්‍රියාත්මක වෙන්නේ ඔබලා. පස්සේ යන කොට ආමී මොහිදීන්ගේ ගෙදර මගේ මතකෙ හැටියට ආමි මොහිදීන්ගෙ ෆොටෝ වගයක් තිබ්බා. ඒ වගේම Aire රයිෆල් එකක් තිබ්බා.

ප්‍ර: ඒ තාවකාලික නිවසේ?

උ: ඒ තාවකාලික නිවසේ. එතැන හිටියා තව කට්ටිය දෙන්නෙක් හිටියා . ඒ දෙන්නගෙන් ප්‍රශ්න කරන කොට කිව්වා ආමී මොහිදීන් 4/21 ප්‍රහාරයෙන් පස්සේ පුනානි වලට ගියා කියලා. ඒ පාර පුනානි වලට ගියාට පස්සේ ඒ ආමී මොහිදීන්

ප්‍ර: ඊට පස්සේ ඔබලා පුනානි වලට ගියා?

උ: පුනානි වලට ගියේ නැහැ. අපි සැලැස්ම වෙනස් කරලා ආමී මොහිදීන් දන්න වෙන තොරතුරුකරුවෙක් හිටියා. ඒ එයා ආමී මොහිදින්ව ළඟින්ම ආශ්‍රය කරලා තියෙනවා. ඒ හරහා අපි තොරතුරුකරුවා ලවා ආමී මොහිදීන්ට කතා කරලා මඩකලපුවෙන් ආමී මොහිදීන් ගියේ වෙන තැනකට ගෙන්න ගන්න අපි සැලැස්මක් හදලා ඒ වාහනයක් අනුව අපි තොරතුරුකරුවා ලාවාම ඒ වාහනයකින් ගියා පුනානි වලට. ඊට පස්සේ ඔහු පුනානි ඉඳන් එන කොට අතරගමදී වාහනය නවත්වලා අත්අඩංගුවට

FAIR COMMENT BY JEZEEM

ගන්න සැලැස්මක් තමයි අපි හදලා තිබ්බේ. ඒ වෙලාවේ නමුත් එතකොට ඒ සැලැසුම හදලා තිබ්බේ අතරමගදී කල්කුඩා පොලිසිය ආසන්නයේ දී ඒ පාරෙන් ආවේ නැති වුණොත් එහෙම මඩකලපුව ප්‍රදේශයට ගියොත් එහෙම ඒ ආසන්නයේම යුධ හමුදා මුර පොළක් තිබ්බා. ඒ යුධ හමුදා මුරපොලේ නිලධාරින් දැනුවත් කරලා තිබ්බේ වාහනයක් ආවොත් නවත්වන්නෙයි කියලා. නැත්නම් අපේ නිලධාරීන්නුත් රඳවලා තිබ්බේ. එතැන ආමී මොහිදීන් ඇවිල්ලා ඒ කාර් එකෙන් පැමිණිලා මේ පොලිසිය පැත්තට තමයි කල්කුඩා පොලීසිය පැත්තට තමයි කාර් එක ආවේ. කාර් එක නවත්වලා බලන කොට ආමී මොහිදින් හිටියේ නැහැ කාර් එකේ. ඊට පස්සේ දැන් මගේ තොරතුරුකරුත් එක්ක තව කෙනෙක් හිටියා වාහනේ. එතකොට ඒ තොරතුරුකරුවන්ට කියා ගන්න බැරිවුණා තව එක්කෙනෙක් ඉන්න නිසා වාහනේ ආමී මොහිදීව් ඔට්ටමාවඩි බැස්ස කියලා. ඊට පස්සේ තොරතුරුකරුවන් පැත්තකට කරලා ප්‍රශ්න කරනවා අරගෙන ප්‍රශ්න කරනකොට තමයි තොරතුරුකාරයා කිව්වේ මොහු හදිසියේ ඔට්ටමාවඩි වලින් ආමී මොහිදින් බැස්ස කියලා.

ප්‍ර: ඊට පස්සේ මොකද්ද කෙරුවේ ඔබලා?

උ: ආයෙ අපි අර තොරතුරුකරුවා ලවා ආමී මොහිදීන්ගේ දුරකථනයට කතා කරලා කිව්වා වාලච්චේනයේ පොලීසිය ආසන්නයේ තිබෙනවා පෙට්‍රල් සෙඩ් එකක් . ඒ වාහනේ තෙල් ඉවර වුණා තෙල් ගහන්න සල්ලි නැති නිසා රු 5000 ක් අරගෙන සෙඩ් එක ළඟට එන්න කියලා. ඊට පස්සේ ඒ කාර් එකත් සෙඩ් එක ළඟ නවත්වලා අපි වටින් ඉන්න කොට පුද්ගලයෙක් ඇවිල්ලා සල්ලි අරගෙන ආවා නමුත් ආමී මොහිදීන් නෙමෙයි ආවේ. වෙනත් පුද්ගලයෙක් තමයි සල්ලි අරන් ආවේ. ඊට පස්සේ ඒ පුද්ගලයා වෙනම අරගෙන ප්‍රශ්න කරන කොට කිව්වා ආමී මොහිදීන් ඉන්න තැන. ඔට්ටමාඩි හැංගිලා ඉන්න තැන කිව්වා. ඊට පස්සේ අපි ඒ පොලීසිය සම්බන්ධ කරගෙන ඔහු අත්අඩංගුවට ගැනීම ඔට්ටමාවඩි ගෙදර ඉන්න කොට තමයි අත්අඩංගුවට ගැනීම සිදුකළේ.

වේලාව:ප.ව. 02.20
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.2.20
පෙර සටහන් ල/ලේ: සචිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: එතකොට දැන් ඔබ කිව්වා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මේ ආමි මොහිදින් ඉන්න තැන පෙන්නුවේ 2019 මාර්තු මාසේ 7 වෙනිදා කියලා. දැන් ඔබලා කියන ආකාරයට ආමි මොහිදින්ව ඕට්ටමාවඩි වලින් ඔබලා අත්අඩංගුවට ගත්තේ ඔබ ඇතුළු පොලිස් නිලධාරීන් කණ්ඩායම කල්කුඩා පොලිස් ස්ථානයේ නිලධාරීන් 2019 අප්‍රේල් 24 වෙනිදා. ඒ කියන්නේ ඔය මුළු කාලය තුලදීම අර ඔබලා තොරතුරු ලබා දුන්නට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ආමි මොහිදින්ව අත්අඩංගුවට ගැනීමක් සිද්ධ වෙලා තිබුණේ නැහැ?

පි: අත්අඩංගුවට ගැනීමක් සිදු වෙලා තිබුණේ නැහැ.

ප්‍ර: මා ඔබේ අවධානට මීළඟට යොමු කරන්නේ 2019 පෙබරවාරි මාසේ 25 වෙනිදා. ඔබ විසින් ඉදිරිපත් කර තිබෙන වාර්තාවක් ගැන. හැබැයි ඒ වාර්තාව ගැන ඔබ මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න ඉස්සරවෙලා මා කැමැතියි ඔබෙන් දැන ගන්න ඔබේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා ජාතික තවුහිද් ජමාත් සංවිධානය සම්බන්ධවත් මුස්ලිම් අන්තවාදය සම්බන්ධවත් වැඩිදුර විමර්ශන කරන්න, තොරතුරු සොයා ගන්නට කියලා ඔබලාව උනන්දු කෙරෙව්වද?

පි: මේක 2019.02.25 හදපු වාර්තාවක්. වැඩිදුර හදපු වාර්තාවක්. මොකද මීට කළින් අපි 2017.11 මාසේ ජාතික තවුහිද් ජමාත් සංවිධානය සම්බන්ධයෙන් ඉන්න පුද්ගලයෝ සම්පූර්ණ ජාලය සම්බන්ධයෙන් නම් 94ක් මම කොළඹ ඇවිල්ලා මේ අදාළ අංශයත් සමඟ එකතු වෙලා මේ සංවිධානය සම්බන්ධ නම් 94ක් අපි හැදුවා. හදලා අපි පොලිස්පතිතුමාට යොමු කරා. ඒක කරේ 2017.11 මාසේ.

ප්‍ර: නම් 94ක් නේ?

පි: ඊට පස්සේ 2019 ජනවාරි මාසයේ නම් 129ක් ආයේ අපි හැදුවා. ඒ වෙනකොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තමයි මේ පරීක්ෂණය භාරගෙන හිටියේ. ඒ නම් හදලා අදාළ අංශයත් සමඟ එකතු වෙලා මම ඒකට සහභාගී වුණා. නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා ඒ අදාළ අංශයයි මායි තමා හැදුවේ. ඒ නම් 129 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යැව්වා. ඒකට අමතරව..

ප්‍ර: ඒක පොලිස්පතිතුමාට යැව්වේ නැද්ද?

පි: ඒක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යැව්වේ. මොකද ඒක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට තමයි මං මතක හැටියට මම දන්නේ නැහැ

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පොලිස්පතිතුමාට යැව්වද කියලා. ඒ වෙලාවේ මතක හැටියට කියන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට තමයි යැව්වේ. මොකද පරීක්ෂණ කරන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නිසා.

ප්‍ර: එතකොට අර 2017 නොවැම්බර් මාසේ යවපු නම් 94 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යවන එක ?

පි: ඒක පොලිස්පතිතුමාට කෙලින්ම යැව්වේ. පොලිස්පතිතුමා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යැව්වද කියලා මම දන්නේ නැහැ.

ප්‍ර: හරි දැන් පැහැදිලි කරන්නකෝ

පි: ඊට පස්සේ ඒ නම් වල තිබ්බා මේ සංවිධානයේ සම්පූර්ණ ජාලය සම්බන්ධයෙන්. මෙම පරීක්ෂණය හැදුවේ 2.15 report එකෙන් වැඩිදුර විස්තර වාර්තාවක් අනුව තමයි හැදුවේ. මේකේ දැන් ආමි මොහිදින් කොහොමද ඉන්නේ. ඊට අමතරව ඒ සංවිධානය සම්බන්ධකම දක්වලා වැඩිදුර විමර්ශන වාර්තාවක් මගෙන් ඉල්ලපු නිසා තමයි මං මේක ඉදිරිපත් කළේ.

ප්‍ර: එතකොට ඒ වැඩිදුර විමර්ශන වාර්තාව අනුව ඔබ මොනවද නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා වෙත දැනුම් දීලා තියෙන්නේ?

පි: එම වාර්තා මඟිනුත් මෙම ආමි මොහිදින් ගැන සඳහන් කරලා තියෙනවා. ඊට අමතරව සහරාන්, මේ සහරාන්ගේ සම්බන්ධකම් පවත්වන මේ ගෆූර්, ෆයිරූස්, මුස්තකීන්, රිෆාස්, ෆයිසාර් ඒ සම්බන්ධයෙන් සඳහන් කරලා තියෙනවා. ඊට අමතරව මේ ආදම් ලෙබ්බේ අහර්කම්, මොහොමදු නියාස් මේ සම්බන්ධයෙන් කරුණු වාර්තා කරලා තියෙනවා.

ප්‍ර: ඔබේ ඔය වාර්තාවේ පිටු කීයක් තියෙනවද?

පි: 17ක් තියෙනවා.

ප්‍ර: එකේ 3 වෙනි පිටුව බලන්න. ඒ කියන්නේ මොහොමඩ් කාසිම් සහරාන් සම්බන්ධයෙන් ඔබ කරුණු ඉදිරිපත් කරමින් ඒ කියන කොටසේ තුන්වන ඡේදය ඒ ඡේදයේ ඔබ සඳහන් කරනවා නේද ගෆූර් කියලා තැනැත්තෙක් ගැන ?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ ගෆූර් කියන එක්කනාට අන්වර්ත නාමයක් තියෙනවද?

පි: ගෆූර් මාමා කියලා තමයි කියන්නේ. ෂයිනිගේ මාමා. ගෆූර් මාමා කියලා තමයි කතා කරන්නේ එයාට.

ප්‍ර: ගෆූර් මාමා කියලා තමයි කතා කරන්නේ. ඔහුට සාමාන්‍යයෙන් කියන්නේ ගෆූර් මාමා කියලා ?

පි: ඔව්.

ප්‍ර: එතකොට මා කිව්වොතින් හරිද මොහොමඩ් ෂයිනිගේ බිරිඳගේ තාත්තා තමයි ගෆූර් මාමා?

පි: බිරිඳගේ තාත්තා.

ප්‍ර: ඒ කියන්නේ ෂයිනිගේ මාමාණ්ඩිය?

President's Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

පි: ඔව්.

ප්‍ර: එතකොට ගගුර් මාමායි සහරානුයි අතර දැඩි සමීප සම්බන්ධතාවයක් තිබුණා කියලා ඔබේ කරුණු සොයා ගැනීමේ දී අනාවරණය වුණාද?

පි: අපිට තොරතුරු ලැබුණා. මේ සහරාන් ගමන් බිමන් යන්නේ විශේෂයෙන්ම පාවිච්චි කරන්නේ වැඩිහරියක් මේ ගගුර් මාමා කියලා. උන්නැව්වියේ ගගුර් මාමාට ගෙයක් තියෙනවා කියලා සඳහන් කරලා තියෙනවා. ඒ නිවසට සැරින් සැරේ සහරාන් එනවා කියලාත් සඳහන් කරලා තියෙනවා. කීප වටයක් පැමිණිලා ගියා කියලා.

ස්වාමිනි එම වාර්තාව එනම් සාක්ෂිකරු විසින් 2019 පෙබරවාරි මස 25 වන දින ඔහුගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා වූ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා වෙත ඉදිරිපත් කර කොට ඇති එම වාර්තාව X – 123 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර: මීළඟට ඔබ මාර්තු මාසේ වාර්තාවක් ඉදිරිපත් කරාද ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට?

පි: මාර්තු 19 ඉදිරිපත් කරා රිල්වාන් සම්බන්ධව කළින් මම මේක කටින් කියලා තිබ්බේ නමුත් මේක ඇඳලා මාර්ගය ලකුණු කරන්න ඕනි නිසා report එකක් විදිහටත් වාර්තාවක් විදිහටත් ඉදිරිපත් කරා.

ප්‍ර: දැන් එම වාර්තාව මඟින් ඔබ අද දින අද කොමිෂන් සභාවේ සඳහන් කරපු මේ රිල්වාන් නිතර එනවා යැයි කියලා කියන ස්ථානය පිළිබඳව එහෙනම් දැන් ලිඛිතව ඉදිරිපත් කරනවා ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට නේද?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ අංක 309/ D, ෆාරීනාස් පාර, දෙවන හරස් වීදිය, ආයරියම්පති නැගෙනහිර, ආයරියම්පති කියන ලිපිනයට තමයි නිතර පැමිණිලා යනවා කියලා ඔබ කියන්නේ?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ වගේම ඔබ කියනවා එහි රිල්වාන්ගේ බිරිඳ වන නෆ්නා යන තැනැත්තිය මවගේ නිවසට එනවා. එතකොට නෆ්න දරු උපතක් සිදු වෙලා මේ 2019.03 මාසේ 19 වෙනිදා වෙනකොට ඔබ කියනවා මාස 2ක විතර කාලයක් මෙහෙ නැවතිලා ඉන්නවා කියලා?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ බිරිඳයි දරුවයි බලන්න තමයි රිල්වාන් මේ ගෙදරට එනවා කියලා ඔබ මේ වාර්තාවේ කියන්නේ ?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ වගේම මේ ස්ථානයට යන්නට පුළුවන් විදිහත් ඔබ රූප සටහනක් ඇඳලා ඔබ මේ සවිස්තරාත්මකව දක්වලා තියෙනවා නේද?

පි: ඔව්.

ස්වාමිනි මෙම වාර්තාව එනම් 2019.03 මස 19 දින දරන මෙම වාර්තාව X – 124 ලෙස ලකුණු කිරීමට අවසර අයදිනවා.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: දැන් මේ ඔබ මේ වාර්තාව පිළියෙළ කරන අවස්ථාව වන විට ඒ කියන්නේ මාර්තු මාසේ 19 වෙනිදා වෙනකොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පාසිකුඩා වලට ඇවිල්ලා ආමි මොහිදීන් ඉන්න ස්ථානය 2019 මාර්තු 07 වෙනිදා වෙනකොට ඔබලා පෙන්වලා තියෙන්නේ?

පි: පෙන්වලා තියෙන්නේ.

ප්‍ර: ඔබ කිව්වා ඒ වගේම ඔබේ නිලධාරීන් දෙදෙනෙක් මෙම කටයුත්ත සඳහා අනුයුක්ත කරා කියලා. ඔබේ නිලධාරීන් භූමියේ රාජකාරි සඳහා සේවා ස්ථානයෙන් බැහැර වුණාම අනෙක් පොලිස් නිලධාරීන් වගේ සටහන් යෙදීමක් කරනවද ඒගොල්ලෝ එළියට යනකොට බැහැර වීමේ සටහනක් යොදනවද? නැවත ආවාට පස්සේ පැමිණීමේ සටහනක් යොදනවද? භූමියේ සිදු වූ දේවල් පිළිබඳව සටහන් යොදනවද කොහොමද සිද්ධ වෙන්නේ?

පි: අපි වැඩි හරියක් පැමිණිමයි. යනකොටයි ආවාට පස්සෙයි සටහන් දානවා. ඊට අමතරව විශේෂයක් මොකක් හරි සිදු කළොත් සටහනක් දානවා. නමුත් රැස් කරපු බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් සටහන් යොදන්නේ නැහැ. නමුත් විශේෂයක් තිබ්බොත් දාන අවස්ථා තියෙනවා.

ප්‍ර: ඔව් එතකොට 7 වෙනිදා ඔබ කිව්වානේ නිලධාරින්ව අනුයුක්ත කරා කියලා මා කළින් අහපු ප්‍රශ්නේට. පාසිකුඩා වල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මේ ආමි මොහිදීන් සැඟවීලා ඉන්න ස්ථානය පෙන්වන්නට. ඔබ දන්නවද ඔය අනුයුක්ත කරන නිලධාරීන් පෙරළා පැමිණි පසු යම් සටහන් යෙදීමක් කරලා තියෙනවද කියලා?

පි: එක් නිලධාරියෙක් සටහනක් දාලා තියෙනවා. අනිත් නිලධාරියා දිගටම කාත්තන්කුඩි ප්‍රදේශයේම මාස කිහිපයක් ස්ථාන ගත කරලා තිබ්බු නිලධාරියෙක්. එක නිලධාරියෙක් දවස් කිහිපකයට පස්සේ ඇවිල්ලා ඒ සම්බන්ධයෙන් සටහනක් යොදලා තියෙනවා.

ප්‍ර: ඔහු එතකොට 7 වෙනිදාම නෙවෙයි පෙරළා පැමිණියේ නමුත් පෙරළා පැමිණීමෙන් පසු සටහනක් යොදලා තියෙනවා?

පි: ඔව්.

ප්‍ර: ඒ සටහන මඟින් මොනවද සඳහන් කරලා තියෙන්නේ සටහනේ කියලා කෙටියෙන් 1, 2, 3 කියලා කියන්න පුළුවන්ද?

පි: පුළුවන් ස්වාමිනි.

ප්‍ර: අපි කරුණු වශයෙන් කියමුකෝ

පි: මගේ නියෝග උපදෙස් පරිදි ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ ක්‍රියාකාරකම් සොයා බැලීමට විශේෂ මෙහෙයුම් රාජකාරියට පිටව ගිය නිලධාරියා නැවත ස්ථානයට පැමිණෙන ලදී. 2019.03.04 දින සිට

ප්‍ර: එතකොට ඔහු පැමිණිලා තියෙන්නේ 2019.03 මාසේ 10 වෙනිදා නැවත?

පි: 10වෙනිදා.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: ඊට පස්සේ?

පි: 4 වෙනිදා ගිහිල්ලා තියෙන්නේ. 10 වෙනිදා පැමිණිලා තියෙන්නේ. 4 වෙනිදා සිට සහරාන් නැමැත්තා පිළිබඳව සහ ඔහුගේ සංවිධානය පිළිබඳ කාත්තන්කුඩි ප්‍රදේශයේ තොරතුරු සොයා බලන ලදී. 2019.03.07 වන දින පැය 9.30ට පමණ මගේ උපදෙස් පරිදි කාත්තන්කුඩි ප්‍රදේශයේ විශේෂ මෙහෙයුම් රාජකාරි රඳවා සිටි අනිකුත් නිලධාරියා සමඟ පාසිකුඩා ප්‍රදේශයට ගොස් කොළඹ සිට පැමිණි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ ආමි මොහිදීන් නැවතී සිටි ස්ථානය පෙන්වා දෙන ලදී. එමෙන්ම සහරාන්ගේ සහෝදරයා වන රිල්වාන් නැමැත්තා රහසිගතව පැමිණෙන කාත්තන්කුඩියේ ඩිම්පාලි නිවස පිළිබඳව සහ ෂයිනි මවුලවි නැවතී සිටින ස්ථානය පිළිබඳව තොරතුරු ලබා දෙන ලදී.

ප්‍ර: කියලා ඔහු සටහනක් දාලාත තියෙනවා?

පි: ඔව්.

ස්වාමිනි එම අනෙක් නිලධාරියා දමා ඇති එම සටහන X - 125 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා.

ප්‍ර: මහත්මයා ඒ සටහන යොදා තිබෙන නිලධාරියා කවුද කියන එක කොළයක සටහන් කරලා අපේ වාර්තාවට එකතු කරන්න පුළුවන්ද?

පි: පුළුවන් ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු සාක්ෂිකරු ලේඛනයක සටහන් කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරයි. එය ඔහුගෙන් අසන ලද ප්‍රශ්නය පිළිතුරක් ලෙස සටහන් කළ යුතු බව ලඝු ලේඛිකාවයට නියෝග කරමි.

පි: පොලිස් සැරයන් 53985 අන්සාර්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඔබ දන්නවාද 2019 අප්‍රේල් මාසේ 21වෙනිදා පාස්කු ප්‍රහාර සිදු වුණා?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඊට පෙර 2019 අප්‍රේල් මාසේ 16 වෙනිදා පාලමුනෙ ප්‍රදේශයේ දී බයිසිකල් බෝම්බයක් පිපිරුණු බව ඔබේ තොරතුරු වලට හෙළි වුණාද?

පි: හෙළි වුණා ස්වාමිනි.

ප්‍ර: ඒ පිළිබඳව තොරතුරු දැන් ඔබ අම්පාරෙන් හිටියේ. එතකොට මේ බයිසිකල් බෝම්බය පිපිරීම සිදුවුණේ මඩකලපුව දිස්ත්‍රික්කයේ. එය බයිසිකල් බෝම්බය පිපිරෙන අවස්ථාව වන විට ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා සහරාන් සම්බන්ධයෙන් විමර්ශන කරන්න තොරතුරු හොයා

FAIR COMMENT BY JEZEEM

ගන්නට කියලා ඔබට උපදෙස් දීලානේ තිබුණේ. මා කිව්වොතින් නිවැරදිද ඒ කාර්ය සඳහා ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා තවත් නිලධාරීන් කොළඹ ප්‍රදේශයෙන් එවලා ඔය කටයුත්ත සඳහාම අනුයුක්ත කරලා තිබුණා කියලා?

පි: සහරාන් සෙවීම සඳහා වෙනම අනුයුක්ත කරලා තිබුණා.

ප්‍ර: එතකොට ඔබලාට පුළුවන්ද වුණාද එහෙනම් 2019 අප්‍රේල් මාසේ 16 වෙනිදා පාලමුනෙ ඔය සිදු වුණ බයිසිකල් බෝම්බය පිපිරීම සම්බන්ධයෙන් තොරතුරු ඒක පිපිරෙන්නට ඉස්සර වෙලා දැන් දැන ගන්නට?

පි: පිපිරෙන්න ඉස්සර වෙලා දැන ගන්න හම්බුණේ නැහැ.

ප්‍ර: එහෙනම් ඔබලා කොයි වෙලාවේ ද දැන ගත්තේ?

පි: පිපිරුණාට පස්සේ ඉස්සෙල්ලා 16 වෙනිදා මේක පිපිරුණේ. මම හිටියේ ඒ වෙලාවේ අම්පාරේ. ඒ නිලධාරීන් දැන්වුවා මට. එතකොට ඒක මුලින්ම රාත්‍රියේ එතන දී ඒ කට්ටිය මේක වැස්සත් එක්ක මුලින්ම අනාවරණය වුණේ මේක මේ හෙන පිපිරීමකින් වෙච්ච එකක් කියලා ඉස්සෙල්ලාම විශ්වාස කරා එතන හිටපු නිලධාරීන්. ඊට පස්සේ උදේ උපදෙස් දුන්නා මේක මෙම ස්ථානයේ මේ කොහොමද නිරීක්ෂණය කරන්නේ කියලා.

ප්‍ර: ඒ කියන්නේ ඔබේ නිලධාරීන් එහෙනම් 16 වෙනිදා රාත්‍රියෙනේ ඕක පිපිරුණේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට 17 වෙනිදා උදේ ඒගොල්ලන් එතෙන්නට ගියාද?

පි: නැහැ එදා රාත්‍රියෙත් මගේ නිලධාරීන් එතෙන්ට ගිහිල්ලා තිබ්බා.

ප්‍ර: රාත්‍රියේම?

පි: රාත්‍රියේම. කාත්තන්කුඩියේ මගේ නිලධාරීන් ඒ අවස්ථාවේ හිටියා. ඒ අවස්ථාවේ දී එතන පරීක්ෂණ කටයුතු ඇත්තටම වෙනම ASP කෙනෙක් මඩකලපුවේ හිටියා. ඒ නිසා මට එතෙන්ට යන්න අපේ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා මට කිව්වේ නැහැ. මොකද මට එදා රාත්‍රියේ අනාවරණය වුණේ මේක ඉස්සෙල්ලාම මුලින්ම අනාවරණය වුණේ වෙන හෙන පිපිරීමකින් වගේ වෙච්ච දෙයක් වගේ තමයි මුලින්ම අනාවරණය වුණේ. පස්සේ ඒ වෙලාවේ නිරීක්ෂණය කරාම මේක විසිරිලා තිබ්බා. අර බයිසිකල් බෝල වැදිච්චම. ඊට පස්සේ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමාට කිව්වා මේක දැනුම් දුන්නා මේක එහෙම එකක් නෙවෙයි. මේක උදේම දැනුම් දීමක් කරා මේක මොකක් හරි test පිපිරීමකින් වෙච්ච දෙයක් කියලා. ඊට පස්සේ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා මඩකලපුවේ සහකාර අධ්‍යක්ෂකතුමාට තමයි දැනුම් දීලා තිබ්බේ ඉක්මනට ඒකේ වැසි Number එක හොයලා දෙන්න කියලා. ඊට පස්සේ එතුමා ඇවිල්ලා ඒ Number එක හොයලා දීලා අපි පස්සේ මට දැන

FAIR COMMENT — BY JEZEEM

ගන්න ලැබුණා ඒකට සම්බන්ධ වෙන බයිසිකලයක් තියෙනවා ඒ තොරතුර ඔක්කෝම ලබා දීමක් සිදු කරා කියලා අදාළ අයික් එකෙන් දැනුම් දුන්නා.

ප්‍ර: එතකොට ඒ පිපිරීම සම්බන්ධයෙන් එහෙනම් විමර්ශනය සම්බන්ධයෙන් විමර්ශනය කෙරුවේ කවුද? විමර්ශනය කියන්නේ තොරතුරු රැස් කිරීම කෙරුවේ ඔබේ රාජ්‍ය බුද්ධි අංශයෙන් කවුද ඔබ නෙවෙයි නම් මොන අංශයට අදාළව?

පි: බයිසිකලයට අදාළවද?

ප්‍ර: ප්‍රධාන කාර්යලයෙන්ද එහෙම නැත්නම් මඩකලපුවෙන්ද?

පි: චැසි අංකය ලබා දුන්නා මඩකලපුවෙන්. පරීක්ෂණ කරා කොළඹින්.

ප්‍ර: හොඳයි. දැන් ඔබ දැනගෙන හිටියේ නැහැ නේද 16 වෙනදා පිපිරීම ගැන. දැන් භූමියෙන් ඔබට තොරතුරු ආවානම් කාත්තන්කුඩියේ තමන්ගේ කටයුතු ඉතා මනා ලෙස ක්‍රියාත්මක කෙරුවානම් සහරාන් පොලිසියට අල්ල ගන්න බැරි විදිහට සැඟවී සිටිමින් ඔහුගේ අනුගාමිකයන් ඒ ප්‍රදේශයේ ක්‍රියාත්මක වුණානම් ඔබට තොරතුරු ලබා ගන්නට පුළුවන් වුණාද 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා සිදු වූ පාස්කු ප්‍රහාරය පිළිබඳව. ඊට පෙර ඒ පිපිරීම් සිදුවන්නට පෙර ඔබේ රාජ්‍ය බුද්ධි සේවයට විශේෂයෙන්ම ඔබට ?

පි: පාස්කු ප්‍රහාර සම්බන්ධයෙන් ද

ප්‍ර: ඔව් ඒ ප්‍රහාරය සිදු වන්නට පෙර. ඔය වගේ තොරතුරු ඔබලාට සොයා ගන්නට පුළුවන්නම් භූමියෙන් තොරතුරු රැස්කිරීම සඳහා ඔබේ නිලධාරීන්ව අනුයුක්ත කරලා ඉන්නවානම් ඔබ කිව්ව ආකාරයට විශාල නිලධාරීන් සංඛ්‍යාවක් ඔබට ඉන්නවා. මඩකලපුව ප්‍රදේශයේ ඔබේ නිලධාරීන්ට ඉන්නවා. එතකොට ඒවාට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඉන්නවා. ඔබලාට තොරතුරු දෙන තොරතුරුකරුවන් ඉන්නවා. ඉතින් එතකොට මේ ඒ ප්‍රදේශයේ පදිංචි වුණ යම් පුද්ගලයින්ගේ මූලිකත්වයෙන් බස්නාහිර පළාතේ සිදු වූ මේ ප්‍රහාරය පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවයට විශේෂයෙන්ම ඔබලාට විශේෂයෙන්ම ඔබ ඇතුළු අම්පාර මඩකලපුවේ රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන් විදිහට සේවය අනුයුක්ත කොට තිබූ ඔබලාට පුළුවන් වුණාද තොරතුරු ලබා ගන්නට ප්‍රහාරයට පෙර ඒ ප්‍රහාරය ගැන?

පි: ප්‍රහාරයට පෙර ඒ තොරතුරක් ගැන එහෙම මේ කට්ටිය ගහනවා කියලා තොරතුරක් හම්බුණේ නැහැ.

ප්‍ර: ඇයි එහෙම ඔබලාට එහෙම ගන්න බැරි වුණේ ඔබලා කියන ආකාරයට ඔය තරම් ඔබලා ශක්තිමත් නම් තොරතුරු ලැබුණානම් අනිත් කරුණු ගැන ඇයි 21වෙනිදා ප්‍රහාරයට පෙර ඔබලාට ඒ තොරතුරු ලබා ගන්නට බැරි වුණේ ඔබලා ස්ථානගත වෙලා ඉන්නෙත් නැගෙනහිර ප්‍රදේශයෙනේ ඇයි බැරි වුණේ?

FAIR COMMENT — BY JEZEEM —

පි: වනාතවිල්ලුව පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීමෙන් පසු ඒක පරීක්ෂණ පැවැත්වුයේ කොළඹ. අපට අනාවරණයක් වුණා මේ සහරාන්ලා නුවර එළියේ පුහුණු වෙලා තියෙනවා කියලා තොරතුරු වගයක් අපිට ලැබුණා.

ප්‍ර: කොයි කාලේද?

පි: වනාතවිල්ලුව සොයා ගත්තේ 2019 ජනවාරි මාසේ. ඒක පරීක්ෂණ කළේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව. ඒ අත්අඩංගුවට ගත්ත කට්ටියගෙන් ප්‍රශ්න කරනකොට තමයි අපිට දැන ගන්න හම්බුණේ. නමුත් මේ සම්බන්ධයෙන් ඊට පස්සේ අපටත් තොරතුරු ලැබුණා මේක මේ සහරාන්ලා නුවර එළිය ප්‍රදේශයේ කඳවුරු වල පුහුණු වැඩ සටහනක් ක්‍රියාත්මක කරලා තියෙනවා කියලා. නමුත් අපිට නිලධාරීන් අපි යොදවලා තිබ්බට අපිට මේ 4.21 ප්‍රහාරය සම්බන්ධයෙන් තොරතුරක් ලබා ගන්න බැරි වුණා.

ප්‍ර: ඔබ කියන්නේ මේ පුහුණු කඳවුරු පැවතුණ බව ඔබලාට තොරතුරු ලැබිලා තිබුණා වුණාට ප්‍රහාරය සම්බන්ධයෙන් තොරතුරු ලබා ගන්න බැරි වුණා කියලද 21 වෙනිදා ඉස්සරවෙලා?

පි: ප්‍රහාර සම්බන්ධයෙන් තොරතුරක් ලැබුණේ නැහැ.

ප්‍ර: එහෙනම් මොනවද පුහුණු වුණේ කියලාත් ඔබලාට තොරතුරු ලැබෙන්න ඇතිනේ. ඒ පුහුණුව සාමාන්‍යයෙන් පාසල් යන ළමයෙක් ගිහිල්ලා වැඩිදුර අධ්‍යාපනය දී කරන පුහුණුවක් නෙවෙයිනේ? මොන වගේ දේවල් ද ඒ කඳවුරු වල පුහුණු කරලා තිබ්බේ?

පි: පුහුණු කඳවුරු වල පුත්තලමෙන් අත්අඩංගුවට ගත්ත දෙන්නෙක්ගෙන් තමයි

ප්‍ර: වැඩි දුර ඒවා කියන්නේ නැතිව ලැබුණු තොරතුරු ගැන කියන්කෝ

පි: කොළඹ අපේ අදාළ අංශයෙන් තමා පරීක්ෂණ පැවැත්වුවේ. ඒකෙන් තමයි අනාවරණය කරගෙන තිබ්බේ. ඒ අංශයෙන් මට දැනුම් දීමක් සිදු කළා මෙහෙම මේ කට්ටිය පුහුණු කඳවුරු වගයකුත් පවත්වාගෙන තියෙනවා. මේ කට්ටිය අන්තවාදී අය නිසා දැඩි අවධානයේ ඉන්න කියලා ඊට පස්සේ වෙනම කොළඹින් අර මං කිව්ව ඉස්සරවෙලා නම කිව්ව අර නිලධාරීන් දෙන්නාගෙන් එක්කෙනෙක්

ප්‍ර: ඔබ අනුයුක්ත කරපු නිලධාරියා?

පි: එක් කෙනෙක් වෙනම ඊට පස්සේ අපි කාත්තන්කුඩියේ වෙනම මාස ගණන් නවත්වලා මේ හෙව්වා. නමුත් මේ සම්බන්ධයෙන් 4.21 ප්‍රහාරයට කළින් අපිට 4.21 තොරතුරක් මේ කට්ටිය සම්බන්ධයෙන් ලැබුණේ නැහැ.

ප්‍ර: එතකොට දැන් ඔබලාට තොරතුරු ලැබුණේ නැහැ කියලා කිව්වා. අවාසනාවට වගේ මේ 21 වෙනිදා ප්‍රහාරය සම්බන්ධයෙන්. නමුත් ඔබ දැනගෙන හිටියද රාජ්‍ය බුද්ධි සේවයට 2019 අප්‍රේල් මාසේ මුල නිශ්චිතවම කියනවානම් 4 වෙනිදා වෙනකොට යම් ප්‍රහාරයක් සහරාන්

FAIR COMMENT BY JEZEEM

ඇතුළු කණ්ඩායමක් විසින් විවිධ ආකාර ඔස්සේ සිදු විය හැකි බවට විදේශයක තොරතුරු සේවාවක් මඟින් තොරතුරුක් ලබාදීලා තිබුණා කියලා.?

පි: මම දැනගෙන හිටියා ස්වාමිනි.

ප්‍ර: ඔබ කොහොමද ඒ දැන ගත්තේ ඔබ කවදාද ඒක දැන ගත්තේ ?

පි: මට මතක හැටියට 5 වෙනිදා වෙන්න ඕනි. නියෝජ්‍ය අධ්‍යක්ෂක සම්පත් කුමාර මහත්මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා දැනුම් දුන්නා ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සහරාන්ගේ නායකත්වයෙන් ප්‍රහාරයක් එල්ල කරන බවට තොරතුරක් ලැබිලා තියෙනවද කියලා.

ප්‍ර: ඒ දැනුම් දුන්නේ ඔබට ඔබ කියන විදිහට 5 වෙනිදා?

පි: 5 වෙනිදා.

ප්‍ර: 2019 අප්‍රේල් 5 වෙනිදා?

පි: ඔව්. ඊට පස්සේ මම ඇහුවා ඒක අපේ අභ්‍යන්තරයෙන් බුද්ධි අංශයකින්ද කියලා. නමුත් එතුමා කිව්වා නැහැ ඒක විදේශීය තොරතුරක්. අධ්‍යක්ෂකතුමාට පැමිණි තොරතුරක්. මේ සම්බන්ධයෙන් අපේ නිලධාරින් දැනුවත් කරලා මගේ සහායට අර කොළඹ නිලධාරියෙකුත් එවනවා කිව්වා ඒ අවස්ථාවේදී. ඒ නිසා මේක පිළිබඳව අදාළ අපේ ඉන්න බුද්ධි අංශ ස්ථානාධිපති නිලධාරීන් දැනුවත් කරලා මේ වැඩි අවධානයක් යොමු කරන්න මේ තොරතුර සම්බන්ධයෙන් කියලා උපදෙස් දුන්නා.

ප්‍ර: ඒ උපදෙස ලැබුණාම ඔබ මොකද කළේ?

පි: ඒ උපදෙස ලැබුණාට පස්සේ මගේ ස්ථානාධිපතිවරුන්ටයි මගේ යටතේ ඉන්න මේ සම්බන්ධයෙන් දාලා තිබුණ නිලධාරීන්ටයි විශේෂයෙන් උපදෙස් දීලා මේ කාත්තන්කුඩි ප්‍රදේශයේ මේ සංවිධානය ගැන මේ තොරතුරු ගැන මේ ප්‍රහාරයකට සූදානම් වෙනවද කියලා හොයන්න උපදෙස් දීලා ඒ අදාළ තැන් වලට යැව්වා.

ප්‍ර: අදාළ ස්ථාන වලට යොමු කරා?

පි: යොමු කෙරෙව්වා.

ප්‍ර: දැන් ඒ අනුව ඔබට දැන් භූමියෙන් තොරතුරු ලැබෙමින් පැවතුනාද ඔය වෙනකොට එකේ ප්‍රතිඵලයක් විදිහට ?

පි: නැහැ ඒ අවස්ථාව වෙනකොට අපි මිල්හාන් ගැන අවධානයක් යොමුකරා. මිල්හාන් අපිට තොරතුරු ලැබුණා.

ප්‍ර: කවුද මේ මිල්හාන් කියන්නේ?

පි: මිල්හාන් තමයි ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ පස්සේ කාලේ අනාවරණය වුණේ එකේ මේ සන්නද්ධ අංශයේ සිටි නායකයා කියලා. ඒක අපි ඒ වෙනකොට අනාවරණය කරගෙන තිබ්බේ නැහැ. ඊට පසු ප්‍රහාරයෙන් පසුවයි දැන ගත්තේ. මොහු තමයි

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ කිව්වා අර පුහුණු කඳවුර නුවරඑළියේ සහ හම්බන්තොට ගැන ඔබලාට දැන ගන්න ලැබුණා කියලා සහරාන් විසින් පවත්වන ලද. එතකොට ඒ පුහුණු කඳවුරු වල සහභාගී වූ තැනැත්තන්ව පුහුණු කිරීමට මිල්හාන් ඒකට යෙදිලා හිටියාද කියන එක ඔය ප්‍රහාරයට පෙර ඔබට දැන ගන්නට ලැබුණද?

පි: නැහැ ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබගේ දැනීම අනුව 2019 ජනවාරි මාසේ 16 වෙනි දින වනාතවිල්ලුව අවි ගබඩාව හොයා ගන්නවා කියලා ඔබ දන්නවානේ. එහි දී අත්අඩංගුවට ගැනීමක් සිදු කරන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්. ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත්ත සැකකරුවන්ගෙන් යම්කිසි තොරතුරු ලබා ගැනීමේ හැකියාවක් රාජ්‍ය බුද්ධි සේවයට යම්කිසි අවස්ථාවක ලබා දුන්නද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට?

පි: ලබා දුන්නා ස්වාමිනි. ඒ ලබා දුන්නට පස්සේ තමයි ඒ හරහා අපේ අදාළ අංශයෙන් යම් කිසි සීමිත තොරතුරු ප්‍රමාණයක් ලබාගෙන තිබුණේ.

ප්‍ර: කොයි කාලේද ඒ තොරතුරු ලබාගත්තේ?

පි: ඒ අත්අඩංගුවට ගත්තට පසු මම අදාළ අංශයෙන් ඇහුවා පස්සේ විමසුවා සති 2කින් පමණ කියලා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: එතකොට ඔබ කිව්වා ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා 05 වෙනිදා ඔබට දුන්නු උපදෙස් අනුව ඔබේ නිලධාරින්ව අනුයුක්ත කරා තව තවත් තොරතුරු රැස් කිරීම සඳහා එතකොට ඔබේ ඔය තොරතුරු රැස් කිරීම මඟින් 21 වෙනිදා වන්නට පෙර ඔබලාට තොරතුරු ලබා ගන්නට පුළුවන් වුණාද මේ දියත් කරන්නට නියමිත වූ ප්‍රහාරය පිළිබඳව?

පි: ප්‍රහාරය සම්බන්ධයෙන් තොරතුරක් වාර්තා වුණේ නැහැ ස්වාමිනි. මම පෙර කිව්වා වගේ අපි මිල්හාන් සම්බන්ධයෙන් වැඩි දුර හොයන කොට අපිට ඒ වෙනකොට අනාවරණය වුණා මිල්හාන් රට යන්න ගියා කියලා.

ප්‍ර: ඒ කියන්නේ දැන් ඔය 21 වෙනිදාට ඉස්සර වෙලා?

පි: ඉස්සරවෙලා. මට දැනුම් දුන්නාට පසුව අපි වෙන වෙනම හෙව්වා. මම සාරා ගැන හොයන්න වෙනම දැම්මා. ඒ වගේ සහරාන් ගැන හොයන්න වෙනම දැම්මා. රිල්වාන් ගැන හොයන්න වෙනම දැම්මා. ඒ වගේ මගේ නිලධාරීන් දාලා තමයි මේ අවස්ථාව වෙනකොට හෙව්වේ. එතකොට මිල්හාන් ගැන තොරතුරුක් ආවා. මිල්හාන් විදේශ ගත වුණා කියලා. ඒක

FAIR COMMENT — BY JEZEEM —

මතක හැටියට 18 වගේ තමයි දැන ගන්න හම්බුණේ. පස්සේ ඒ තොරතුර මම අදාළ අංශයට දැනුම් දුන්නා. ඊට පස්සේ අපි වෙක් කරලා බලනකොට මිල්හාන් සෞදියට ගිහිල්ලා තිබ්බා. ඊට අමතරව මගේ දෙමළ නිලධාරියෙක් ඔය සාරාගේ කලවංචිකුඩි ගෙදරට යැව්වා.

ප්‍ර: ඒත් ඔය 21 වෙනිදාට ඉස්සර වෙලා?

පි: 21ට කළින්. නමුත් එහෙම මේ ප්‍රහාර සම්බන්ධයෙන් තොරතුරුක් අනාවරණය කරගන්න බැරිවුණා ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා ඔබ ඇතුළු කණ්ඩායමට අවස්ථා දෙක දී උපදෙස් පන්ති පැවැත්වුවාද?

පි: ඔය නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා

ප්‍ර: ඒ කියන්නේ 2019 අප්‍රේල් මාසේ 05 වෙනිදා ඔබට ඒ උපදෙස් ඔහු ලබා දුන්නට පස්සේ නමුත් 21 වෙනිදා ප්‍රහාරයට පෙර?

පි: 5 වෙනිදා දුරකථනයෙන් තමයි උපදෙස් ලබා දුන්නේ. පස්සේ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා නැගෙනහිර පළාතට පැමිණියා. නැගෙනහිර පළාතට පැමිණිලා මඩකලපුවෙයි, අම්පාරෙයි වෙනම උපදෙස් පන්ති පැවැත්වුවා.

ප්‍ර: ඒ උපදෙස් පන්තියේ දී ඔය ප්‍රහාරයක් දියත් කිරීමට ඉඩ තිබෙන බවට ලැබෙන තොරතුරු පිළිබඳ සාකච්ඡා කෙරුවද නිලධාරීන්ට උපදෙස් දුන්නද මොකද වුණේ?

පි: ඒ සම්බන්ධයෙන් පැහැදිලි උපදෙස් දුන්නා දැඩි අවධානයෙන් ඉඳලා තොරතුරු රැස් කරන්න කියලා.

ප්‍ර: ප්‍රහාරයක් වෙන්න ඉඩ තියෙන බව ඔහු කිව්වද?

පි: පැවසුවා ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ උපදෙස් පන්තියෙන් පස්සේ 21 වෙනිදාට ඉස්සරවෙලා නැවතත් ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා ඔබට යම් තොරතුරක් ලබා දුන්නද ඒක අංක1, 2 වෙනි එක එහෙම ඔහු ලබා දුන්නේ නැත්නම් රාජ්‍ය බුද්ධි සේවය ඔබේ ප්‍රධාන කාර්යාලයෙන් ඔබලා වෙත යම් තොරතුරක් ද ලැබුණද?

පි: නැවත 2019.04.20 නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා රාත්‍රියේ කතා කරලා කිව්වා ජාතික තවුහිද් ජමාත් සංවිධානය සම්බන්ධයෙන් ප්‍රහාරයක් එල්ල වන බවට අධ්‍යක්ෂකතුමාට නැවතත් තොරතුරක් ලැබිලා තියෙනවා කියාල. ඊට පස්සේ මගේ නිලධාරීන්..

ප්‍ර: ඔබට ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා ඔය ගැන කියන කොට 20 වෙනිදා කියට විතර ඇතිද?

පි: 20 වෙනිදා රාත්‍රී .

ප්‍ර: දළ වශයෙන් වේලාව කිව්වොත් කමක් නැහැ?

පි: රාත්‍රී 8, 9 වගේ මතක හැටියට.

ප්‍ර: මොකක්ද ඔහු කිව්වේ ඒ තොරතුරු මොකක්ද ජ්‍යෙෂ්ඨ නිලධාරියා කිව්වේ?

Presidential Secretariat's Copy

FAIR COMMENT BY JEZEEM

පි: සහරාන්ලගේ ජාතික තවුහිද් ජමාද් සංවිධානය ප්‍රහාරයක් සිදු කරන බවට අධ්‍යක්ෂකතුමාට නැවතත් තොරතුරක් ලැබිලා තියෙනවා කියලා.

ප්‍ර: ඊට පස්සේ

පි: අපිගේ නිලධාරීන් එදාම ඒ වෙලාවේම දැනුවත් කරලා මේ සම්බන්ධයෙන් දැඩිව පරීක්ෂා කරන්න කියලා.

ප්‍ර: කියන ඒ උපදෙස ඔහු දුන්නා?

පි: දුන්නා.

ප්‍ර: ඔහු විසින් හෝ එහෙම නැත්නම් ඔබේ ප්‍රධාන කාර්යාලයෙන් ඔයිට වැඩි තොරතුරක් ඔබලාට ලැබුණද?

පි: ඊට පසුව අපේ සාමාන්‍යයෙන් සියලුම ස්ථානාධිපතිවරුන්ටයි, සහකාර අධ්‍යක්ෂකවරුන්ටයි එහෙම එවන එක sir ඉතින් එවන messages එකක් එවන්න පුළුවන් SMS ක්‍රමයක් තියෙනවා. ඒකෙන් එව්වා අර සහරාන්ලාගේ තාලම්කුඩා සොයාගත්ත අනිත් යතුරු පැදියේ පුපුරුවා ගැනීමත් එක්ක හොයා ගත්ත අනිත් යතුරු පැදියේ අංකයක් දාලා මේක මේ සහරාන්ලා මේ යතුරු පැදියෙන් මොකක් හරි කරන්න පුළුවන් නිසා මේ ගැන අංකයත් බලලා මේ ගැන අවධානයෙන් ඉන්න කියලා SMS එකක් වෙනම එවලා තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ මේ කණ්ඩායම විසින් බයිසිකල් 2ක් ලබාගෙන තියෙනවා. එයින් එකක් පාලමුණේ පුපුරුවා හැරියා. අනිත් බයිසිකලය කොහේද තියෙන්නේ මොකක් ද වෙන්නේ කියන එක පිළිබඳව?

පි: අනිත් බයිසිකලය පාවිච්චි කරලා ප්‍රහාරයක් එල්ල කරන්න පුළුවන් කියලා තමයි ඒ SMS එකේ සඳහන් කරලා තියෙන්නේ.

ප්‍ර: ඒ නිසා ඒ බයිසිකලය පිළිබඳව යමක්?

පි: බයිසිකලයේ අංකයයි ඒ විස්තර අර අර ඇවිල්ලා තිබ්බා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු දැන් ඔබ මීට පෙර කොමිසමට කිව්වා 2019 මාර්තු 07 වෙනිදා වෙන විට ඔබ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ආමි මොහිදින් සිටින තැනයි, රිල්වාන් විටින් විට එන ස්ථානයයි, ෂයිනි මවුලවි සිටින ස්ථානයත් පිළිබඳ තොරතුරු ලබාදුන්නා කියලා?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: ඒ තොරතුරු දැන් ඔබගේ මාර්ගයෙන් රාජ්‍ය බුද්ධි සේවයේ කොළඹ ප්‍රධාන කාර්යලයටත් ලැබුණානේ?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ එදාම නෙවේ ඊට කළින් හරි ලැබෙන්න ඇතිනේ?

පි: ලැබුණා ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: ඒ තොරතුරු එවකට රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කළ නිලන්ත ජයවර්ධන මහත්මයා ඒ වෙනකොට දැනගෙන හිටියද?

පි: මම නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා එක්ක තමයි සම්බන්ධකම් පවත්වන්නේ. නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා අනිවාර්යෙන්ම සාමාන්‍යයෙන් මම ඒවගේ වැදගත් තොරතුරු කියනවා. නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා දැනුවත් ද කියලා මට අදහසක් නැහැ. නමුත් අපේ රාජ්‍ය බුද්ධි සේවාවේ මගේ මම අධ්‍යක්ෂකතුමාව දැනුවත් කරලා තිබ්බේ.

ප්‍ර: ඔබේ නියෝජ්‍ය අධ්‍යක්ෂක දැනුවත් කරලා තියෙන්නේ?

පි: ඔව්.

ප්‍ර: ඔබගේ නියෝජ්‍ය අධ්‍යක්ෂක රපෝර්තු කරන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ නිලන්ත ජයවර්ධන වෙත නේද?

පි: එහෙමයි ස්වාමිනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: එතකොට දැන් අර බයිසිකලය පිළිබඳව සොයා බලන්නට කියලා උපදෙස් ලැබුණාම ඔබලා මොකද කළේ ?

පි: ඒක මේ පණිවිඩය සියලුම ස්ථානාධිපතිවරුන්ගේ දුරකථන වලටත් එන එකක්. ඒක සම්බන්ධයෙන් ආයේ නැවත ආවත් අර කළින් තොරතුර ලබාදුන් සමඟ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා දැනුම් දුන්නත් එක්ක ඒ messages එක එන්න කළින් තමයි නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා මට මේ දුරකථනයෙන් දැනුම් දුන්නේ. ඒ වෙනකොට මට අදාළ මගේ Ground එකේ සිටින නිලධාරීන්ටයි අනිත් ස්ථානාධිපතිවරුන්ටයි ඒ සම්බන්ධයෙන් උපදෙස් දීලා තිබුණේ මේ පිළිබඳව අවධානයෙන් හොයලා බලන්න කියලා.

ප්‍ර: ඔව් දැන් ඒ අතරේ තමයි මේ 21 වෙනිදා මේ ප්‍රහාරය සිදුවුණේ ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ ප්‍රහාරය සිදු වුණාට පස්සේ ඔබ කිව්වා එතෙක් රාජ්‍ය බුද්ධි සේවය විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය ඒ කියන්නේ සාමාන්‍යයෙන් ක්ෂේත්‍රයට ගිහිල්ලා අනිත් අයත් සමඟ ගැටිලා විමර්ශකයොත් එක්ක ඒ විමර්ශන සඳහා සහභාගී වෙලා එසේ නොකර සිටීමේ පිළිවෙතින් බැහැර වෙලා විමර්ශන සඳහා ගිහින් ඒ අයගේ විමර්ශන වලට ආධාර උපකාර කිරීමේ පිළිවෙතකට ඔබලා පිලිවිසුනාය කියලානේ ඒකට පිළිපැන්නාය කියලා කිව්වා. එතකොට ඒ අනුව ඔබලා කරන ලද විමර්ශන අනුව සාර්ථක ප්‍රතිඵල ඇති කරගන්නට ලබාගන්නට පුළුවන් වුණාද?

FAIR COMMENT
BY JEZEEM

පි: ඒ අපි ඒවගේ උපදෙස් අනුව කටයුතු කළ නිසා තමයි ඇත්තටම දෙවන ප්‍රහාරයක් වළක්වාගන්න පුළුවන් වුණේ. මොකද මේ සහරාන්ගේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සම්බන්ධයෙන් වගේම JMI ජමාතේ මිල්ලතේ ඊබ්‍රහීම් සංවිධානය සම්බන්ධයෙන් ඒ ජාලය සම්බන්ධයෙන් අපි ළඟ තොරතුරු තිබ්බා. ඒ සම්බන්ධයෙන් මම පෙර කී ආකාරයට නම් 129ක් 2019 ජනවාරි මාසෙත් අපි ලබා දීලා තිබ්බා. මේ සම්බන්ධයෙන් සම්පූර්ණම සිටි කාත්තන්කුඩි ජාලය අපි හඳුනගෙන තිබ්බේ. එතකොට එහෙම අපි කටයුතු කළේ නැත්නම් මේ දෙවන ප්‍රහාරය අනිවාර්යයෙන්ම සිදු වෙන්න තිබ්බා. එකෙන් තමයි මේ දෙවැනි ප්‍රහාරය වළක්වා ගන්න හැකි වුණේ.

ප්‍ර: එතකොට එතෙක් පැවති රාජ්‍ය බුද්ධි සේවයේ පිළිවෙත වෙනස් කිරීමට හේතු වුණේ මේ දෙවැනි ප්‍රහාරයක් සිදු විය හැකි බවට තිබුණු තොරතුරු අනුව එය වළක්වා ගැනීමේ අපේක්ෂාවෙන් ඔබලා කටයුතු කළ නිසාය කියලා ඔබ කියන්නේ?

පි: මොකද පොලිසිය සම්බන්ධයෙන් බැලුවොත් එහෙම ඒ වෙනකොට සාමාන්‍ය පොලිස් නිලධාරීන් ඇත්තටම මේ මුස්ලිම් අන්තවාදී සංවිධානයේ එහෙම වචන පවා දැනන් හිටියේ නැහැ. මොකද මේ සම්බන්ධයෙන්

ප්‍ර: ඔබ ඇයි කියන්නේ සාමාන්‍ය පොලිස් නිලධාරීන් මේ අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් දැනුවත් වෙලා හිටියේ නැහැ කියලා මොන කරුණු පදනම් කරගෙන ද?

පි: මොකද අත්දැකීමෙන් කියන්නේ. දැනුවත් කරපු නිලධාරීන් සමඟ මම ඊට පසු දැනුවත් කරපු නිලධාරීන් සමඟ කතා කරනකොට තේරුණා මේ සම්බන්ධයෙන් කිසිම දැනුමක් නැහැ කියලා.

ප්‍ර: ඔබ ඒ පොලිස් නිලධාරීන් සමඟ කතා කරනකොට ඔබට අවබෝධ වුණේ ඒ නිලධාරීන් විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ ඉන්න නිලධාරීන් මේ අන්තවාදී කටයුතු ඒ ප්‍රදේශයේ සිදු වෙන අන්තවාදී කටයුතු පිළිබඳව නොදැන සිටි බව ඒක ද ඔබ කියන්නේ?

පි: දැන් මේකේ ඉන්න මුස්ලිම් එකේ මෙහෙම තබ්ලික්, තවුහිද්, සුන්නතුල් නැමැති ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාම් මේ වගේ තියෙනවා කියලා. ඒ කියන්නේ මොකක්ද මේ තවුහිද් ජමාත් එකේ තබ්ලික් ප්‍රතිපත්ති මොකක්ද ජමාතේ අන්තල් සුන්නතුල් මොහොමදියා කියලා කියන්නේ මොකකද. මුස්ලිම් ආගමේ තියෙන ප්‍රධාන මේ තබ්ලික් ජමාත් කියන්නේ මොකක්ද මේ තවුහිද් ජමාත් කියන්නේ මොකක්ද , සුන්නතුල් වල්ජමාත් කියන්නේ මොකක්ද ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා කියලා කියන්නේ මොකක්ද මේ වගේ මේ ප්‍රහාරයට ජාතික තවුහිද් ජමාත් සංවිධානය සම්බන්ධ කොයි කොටසද එතකොට ඒ තවුහිද් එකේ තියෙනවා තව කොටස් ගොඩක්. ඒ කියන්නේ මේ තවුහිද් එකේ මේ ප්‍රහාරයට සම්බන්ධ

FAIR COMMENT BY JEZEEM

වුණේ ජාතික තවුහිත් ජමාත් සංවිධානයේ පමණයි. ඊට අමතරව තියෙනවා ජමාතේ අන්තර් සුන්නතුල් මොහොමදියා කියලා. එතකොට රබිතුල් අහුමදු සුන්නතුල් කියලා තව එකක් තියෙනවා. ශ්‍රී ලංකා තවුහිද් ජමාත් කියලා වෙනම තියෙනවා. සමස්ත ලංකා තවුහිද් ජමාත් කියලා වෙනම තියෙනවා. සිලෝන් තවුහිද් ජමාත් කියලා වෙනම තියෙනවා. ඒ වගේ ගොඩක් තියෙනවා. එතකොට මේ ප්‍රහාරයට අදාළ වෙන්නේ ජාතික තවුහිද් ජමාත් සංවිධානය ඉන්නේ මේකෙන් තවුහිද් එකේ තවුහිද් ප්‍රතිපත්තිය අදහන තමයි ජාතික තවුහිද් ජමාත් සංවිධානය ඇති වුණේ. ජමාතේ මිල්ලතුල් ඊබ්‍රහිම් එන්නේ වෙනම එකක්. ඒකම මං පෙර කිව්වා වගේ ශ්‍රී ලංකා ජාමත් ඉස්ලාමියා එක හරහා තමයි ඒ කට්ටිය එන්නේ බිහි වෙලා තියෙන්නේ. ඉතින් මේ සම්බන්ධයෙන් එහෙම අවබෝධයක් තිබ්බේ නැහැ.

ප්‍ර: ඔබට තියෙන ඒ පුළුල් අවබෝධය ඒ පොලිස් නිලධාරීන්ට නොතිබුණ බවයි ඔබ කියන්නේ?

පි: නොතිබුණා වගේම ඒ වෙනකොට පැහැදිලි තොරතුරක් ආවා 2019.04.21 මට අධ්‍යක්ෂකතුමාම කතා කරලා කිව්වා දුරකථන අංකයක් දීලා දෙවන ප්‍රහාරයක් ඒ නම්බරයෙන් ක්‍රියාත්මක වෙන්න පුළුවන්. මේ නම්බරය කොහොම හරි හොයාගෙන රෑ කීයට හරි මෙයාව අත්අඩංගුව ගන්න කියලා. කොහොමහරි පොලිසිය සම්බන්ධ කරගෙන. ඊට පස්සේ මම මේ තොරතුරු කොහොම ආවාද කියලා මම දන්නේ නැහැ. ඒ නම්බරය අරගෙන මම සාමන්ත විජේසේකර මහත්මයාත් අම්පාර කොට්ඨාශ පොලිස් අධිකාරි සාමන්ත විජේසේකර මහතා දැනුවත් කරාට පස්සේ රාත්‍රී 7ට පමණ තමයි ඒ ඇමතුම ලබලා දුන්නේ. ඒ නම්බර් එක හොයාගෙන පසුගිය Addess හොයාගෙන ගිහිල්ලා කල්මුණේ මරදමුනෙ ඒකට විශේෂ කාර්ය බලකායේ සහයෝගය ලබාගෙන එතකොට ඒක භාරව මහත්මයෙක් එයාගේ සහයෝගය ලබාගත්තා. ගිහිල්ලා ඒ නම්බර් එක තියෙන පාවිච්චි කරපු ඒ පුද්ගලයාව අත්අඩංගුවට ගත්තා. ඊටත් පස්සේ විමර්ශන කරන කොට තේරුණා ඔහු අර ඒ නම්බර් එක පාවිච්චි කරලා තියෙනවා. ඔහු සෞදිනම් පස්සේ අපිට තොරතුරු ගත්තා රිලාමර්ෂුක් කියලා. ඒ රිලාමර්ෂුක්ගේ මස්සිනා තමයි ළඟ තමයි ඒ නම්බර් එක තිබ්බේ. ඒ කියන්නේ අපි අත්අඩංගුවට ගත්ත පුද්ගලයාගේ නංගී තමයි මේ සෞදි ඉන්න රිලාමර්ෂුක් විවාහ වෙලා සිටියේ. ඒ තොරතුරු ලැබිලා තිබුණේ දෙවන ප්‍රහාරය ඒ නම්බර් එක පදනම් කරගෙන තමයි ක්‍රියාත්මක වෙන්නේ කියලා. මට උපදෙස් දුන්නේ මේ නම්බර් එක තියෙන පුද්ගලයා කොහොම හරි ඒ ආදළ පුද්ගලයා රෑ වෙන්න කළින් මේවා කරන්න කියලා. ඒ කාර්යය එදා රෑම අපි කරා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කවුද ඒ වගේ එහෙම අනිත් විශේෂ කාර්ය බලකායේ නිලධාරීනුයි, පොලිසියයි ඔබලයි එකතුවෙලා කාවද එහෙම අත්අඩංගුවට ගත්තේ?

පි: තාජුඩීන් කියලා.

ප්‍ර: ඔහුගේ සම්පූර්ණ මොකක්ද?

පි: මොහොම්මදු හනීෆා මොහොම්මදු තාජුඩීන්.

ප්‍ර: ඔබ කිව්වා ඔහු මරදමුනෙ ප්‍රදේශයේ පදිංචි කෙනෙක්?

පි: මරදමුනෙ පදිංචි කෙනෙක්. මොහුගේ මම කිව්ව ආකාරයට මොහුගේ සහෝදරිය තමයි පස්සේ මෙම සංවිධානයට සම්බන්ධ ප්‍රබල සාමාජිකයෝ වෙන රිලාමර්ෂුක් විවාහ වෙලා ඉන්නේ.

ප්‍ර: එතකොට ඔබ කිව්වා ඒ වගේම රිලාමර්ෂුක් කියන තැනැත්තා ඔය වෙනකොට දිවයිනෙන් බැහැරව විදේශ ගතව හිටියේ. මොන රටේද?

පි: සෞදි අරාබියේ. මෙම පුද්ගලයා මෙම සෞදි අරාබියේ තමයි හිටියේ. නමුත් මෙම පුද්ගලයා 3පාරක් ඉන්දියාවට ගිහිල්ලා තිබ්බා.

ප්‍ර: ඒ කොයි එක්කනාද?

පි: රිලාමර්ෂුක් මොකද 3 පාරක් ඉන්දියාවට ගිහිල්ලා තිබ්බේ මෙයාගේ අනුවර්ත නාමය අබුලීබා.

ප්‍ර: ඒ කියන්නේ රිලාමර්ෂුක්ගේ?

පි: ඔව්. රිලාමර්ෂුක්ගේ. මොහුගේ දරුවෙක් ඉන්නවා හදවතේ රෝගයක් තියෙන හදවතේ සිදුරක් තියෙන. එතකොට මේ ඒකට තමයි ඉන්දියාවට යනවා කියලා කියලා තිබ්බේ. 2017.08. 24 ගිහිල්ලා තිබ්බා. ඊට අමතරව 2018.09.18 ගිහිල්ලා තිබ්බා. 2පාරක් ගිහිල්ලා තිබ්බා මීට ප්‍රථම. මේ රිලාමර්ෂුක්ව කොහොමත් අපි අර කළින් අර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යවපු 129 ලැයිස්තුවේ හිටපු කෙනෙක්.

ප්‍ර: රිලාමර්ෂුක්?

පි: රිලාමර්ෂුක්.

ප්‍ර: එතකොට අර මොහම්මදු හනීෆා මොහොම්මදු තාජුඩීන් අත්අඩංගුව ගැනීම සම්බන්ධයෙන් ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට වාර්තාවක් අර වෙන අවස්ථාවල දී දැම්ම විදිහට ඉදිරිපත් කෙරුවද?

පි: ඉදිරිපත් කරා ස්වාමිනි.

ප්‍ර: කවදාද ඒක ඉදිරිපත් කෙරුවේ?

පි: 2019.04.25

ස්වාමිනි එම වාර්තාව X – 126 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: ඔබ අනතුරුව ඒ කියන්නේ ඊට පහුවදා ඉදිරිපත් කරලා තියෙන 2019 අප්‍රේල් 26 වාර්තාව පිළිබඳව මම ඔබෙන් තේ විවේකයන් පසුව ප්‍රශ්න කරන්න අදහස් කරනවා. ඒ අනුව මා ඔබෙන් ඊළඟට ප්‍රශ්න කරන්නේ ඔබ 2019 අප්‍රේල් 27 වෙනිදා ඉදිරිපත් කරලා තියෙන වාර්තාව ගැන. ඒ වාර්තාව ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට ඉදිරිපත් කරන්නට හේතු වුණේ මොන කරුණද 2019.04 මාසේ 26 වෙනිදා?

FAIR COMMENT — BY JEZEEM

පි: 26 ඉදිරිපත් කළේ අපි ලබපු තොරතුරු මත මේ දෙවන ප්‍රහාරයට සූදානමින් පැමිණි සූදානම් කරලා තිබ්බ මේ ආරක්ෂිත ගබඩාවයි, මිනින්දොරු ආරක්ෂක ගබඩාව අත්අඩංගුව ගත්තා අපි තොරතුරු මත. ඒ වැටලීම සම්බන්ධව විස්තර තමයි ඉදිරිපත් කරේ.

ප්‍ර: දැන් එතකොට ඔබ ඒ වාර්තාවත් එක්ක අප දැනටමත් මේ ගරු කොමිෂන් සභාවට C – 873 සහ C- 877 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙන වාර්තාත් ඊයේ දින හඳුනා ගත්තා. ඔබ විසින් දැන් මේ සඳහන් කරන 2019.04 මාසේ 26 වෙනිදා ඉදිරිපත් කරන ලද වාර්තාව වලට සමානව ඉදිරිපත් කරන ලද වාර්තා කියලා නේද? ඊයේ සංසන්දනය කිරීමක් ඔබ කරානේ නේද ?

පි: ඔව්

ස්වාමිනි ඒ අනුව අවසර අයද සිටිනවා සාක්ෂිකරු විසින් පිළියෙළ කොට ඇති 2019 අප්‍රේල් මස 26 වෙනි දින දරන මෙම වාර්තාව C- 873 (A) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට

ප්‍ර: මීළඟට මා ඔබේ අවධානය යොමු කරන්නේ ඔබ විසින් 2019 අප්‍රේල් මාසේ 27 වෙනිදා ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙත ඉදිරිපත් කොට තිබෙන වාර්තාවක් පිළිබඳව. ඒ වාර්තාව ඔබ කුමන සිද්ධියකට අදාළව ද ඉදිරිපත් කෙරුවේ?

පි: දෙවන ප්‍රහාරයට සම්බන්ධ සූදානමකින් පැමිණි මේ රිල්වාන්ගේ නායකත්වයෙන් පැමිණි ත්‍රස්තවාදී කණ්ඩායම මේ සමන්තුරේ පොලිස් වසමේ නින්දවූර් දෙවන හරස් විදියේ අරක්ෂක නිවාසයක හිටියා. ඒක අපි නිවස අපි වැටලුවාට පස්සේ ඒ සම්බන්ධ වාර්තාව එකේ තිබ්බ මොනවද අත්අඩංගුව නොගත්ත වාර්තාව තමයි ඉදිරිපත් කරේ.

දැන් වේලාව : ප.ව.3.20
මෙතැන් සිට ල/ලේ : චන්දිමා මෙනවිය

President Secretary Copy
FAIR COMMENT BY JEZEEM

ප.ව.3.20
පෙර සටහන් :ල/ලේ නිල්මිණි
මෙතැන් සිට: ල/ලේ චන්දිමා දිල්හානි.

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ස්වාමිනි සාක්ෂිකරු ගේ අවධානය මීළඟට 2019 අප්‍රේල් මාසයේ 27 වෙනිදා ඔහු ඉදිරිපත් කරන ලද තවත් වාර්තාවක් කෙරෙහි යොමුකරනවා. ඔබ ඊයේ දින සාක්ෂි ලබා දෙමින් සඳහන් කරා 2019. අප්‍රේල් මාසේ 26 වෙනිදා ඔබට ලැබුණු තොරතුරක් අනුව ආරක්ෂික ස්ථාන දෙකක් පිළිබඳව සොයා බැලුවා කියලා එකක් තමයි සමන්තුරේ දෙවනි එක ඔබ කිව්වා නින්දවූර් කියලා නින්දවූර් කියන නින්දවූර්හි පිහිටි එම ආරක්ෂිත වස්තයෙන් අයිතමයන් 91 සොයා ගත්තායි කියලා ඔබ කිව්වා තොරතුරු ඊට අදාල වාර්තාවක් ඉදිරිපත් කරාද ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට?

පි: ඉදිරිපත් කලා ස්වාමිනි.

ප්‍ර: එම අයිතම 91ක පිළිබඳ වාර්තාවක් දැනටමත් අපි C 877 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙනවා ගරු කොමිෂන් සභාවට ඔබට මතකයි නේද ඊයේ ඔබ එම කොමිෂන් සභාවට ඉදිරිපත් කරලා තියෙන වාර්තාවයි ඔබ ළඟ තියෙන වාර්තාවයි ඒවායි සැසඳුවා?

පි: මතකයි.

ප්‍ර: ඔබ ළඟ තිබෙන වාර්තාවන් ඔබට අද දින ඉදිරිපත් කරන්න පුළුවන්ද ගරු කොමිෂන් සභාවට?

පි: පුළුවන් ස්වාමිනි.

ස්වාමිනි එම වාර්තාව C 877 A අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: එතකොට ඔබ ඊයේ දින සඳහන් කරනු ලැබුවා ඔබේ සාක්ෂියේදී සයින්ද මරුදු ප්‍රදේශයේ සිදුවූ බෝම්බ පිපිරීමට අදලා වූ අංක 183 B වොලිවේරියන් නිවාස සංකීර්ණයට යනු ලැබුවාය කියලා එහිදි ඔබලා යම් යම් දේවල් නිරීක්ෂණ කරා කියලත් කිව්වා ඒ සම්බන්ධයෙනුත් වාර්තාවක් ඉදිරිපත් කරා ද ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට ?

පි: වාර්තාවක් ඉදිරිපත් කරා ස්වාමිනි.

ප්‍ර: එහි දිනය කවදද?

පි: 2019.04.27

ප්‍ර: එය ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද අද ගරු කොමිෂන් සභාවට?

පි: පුළුවන් ස්වාමිනි.

ස්වාමිනි එම වාර්තාව C 932 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මී ළඟට අවධානය යොමු කරන්නේ ඔබ විසින් 2019.04.28 වෙනිදා ඔබ වෙත ලැබී ඇති වාර්තාවක් පිළිබඳව?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: කාගෙන්ද ඔබට ඒ වාර්තාව ලැබිලා තියෙන්නේ?

පි: U 01, මගේ යටතේ තියෙන අම්පාර මගේ ඒකකයේ.

ප්‍ර: අම්පාර ඒකකයේ ඔබේ යටතේ තියෙන ඒකකයක් එහි නිලධාරියාගේ ස්ථානාධිපතිවරයාගෙන්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මොනවා ගැනද ඔහු ඒ වාර්තාව මගින් ඔබට වාර්තා කරලා තියෙන්නේ?

පි: වාර්තා කරලා තියෙන්නේ සයින්ද මර්දු ප්‍රදේශයේ තිබිලා සොයා ගත් සුදු ඇඳුම් ස්වාමිනි.

ප්‍ර: මොනවද ඔබට අනාවරණය කරලා තියෙන්නේ ඒ නිලධාරියා නැත්නම් වාර්තා කරලා තියෙන්නේ ඒ වාර්තාව මගින්?

පි: ඒ හම්බෙව්ව සුදු ඇඳුම් සම්බන්ධයෙන් .

ප්‍ර: කොහේ තිබිලාද සුදු ඇඳුම් හම්බිලා තියෙන්නේ?

පි: පුපුරා ගැනීම් සිදු කර ඒ වොලිවේරියන් ගම්මානේ තිබ්බ නිවසේ තිබිලා හම්බෙව්ව සුදු ඇඳුම් ස්කර්ට් 05 හා යි බ්ලවුස් .05,යට ඇඳුම් හමුවී තිබෙනවා.

ප්‍ර: කොහෙන්ද මේ ඇඳුම් මිලදී ගත්තායි කියලා අනාවරණය වෙලා තියෙන්නේ?

පි: ගිරිවුල්ල ජයසුන්දර ,ජයසුන්දර ටෙක්ස්ටයිල් එකෙන්.

ප්‍ර: කවදද මිලදී ගත්තා කියලාද අනාවරණය වෙලා තියෙන්නේ?

පි: 2019.4.19 වෙනිදා.

ප්‍ර: මේ ඇඳුම් සාමාන්‍යයෙන් කවුරු අඳින ඒවා විදියට ද ඔබේ නිලධාරියා ඔබට ඒ කියන්නේ කුමන ජනකොට්ඨාශයක් සාමාන්‍යයෙන් අඳින ඇඳුම් විදියට ද ඔය වාර්තාව මගින් ඔබේ කණිෂ්ඨ නිලධාරියා ඔබේ අවධානයට යොමු කරලා තියෙන්නේ?

පි: සිංහල කාන්තාවන් අඳින ඇඳුම් බෝඩර් නිරීක්ෂණය වෙලා තියෙනවා මුස්ලිම් වගේ නෙවෙයි සිංහල කාන්තාවන් අඳින විදියට.

ප්‍ර: ඇඳුම් වගයක් විදියට තමයි ඒ ඔබට කරුණු වාර්තා කරලා තියෙන්නේ ස්වාමිනි 2019.04 වෙනි මස 28 වන දින ඔහුගේ කණිෂ්ඨ නිලධාරියා විසින් මෙම නිලධාරියා වෙත සයින්ද මර්දු ප්‍රදේශයේ පිහිටි බෝම්බ පුපුරන ලද නිවසේ තිබූ කාන්තා සුදු ඇඳුම් හමුවීම යන මාතෘකාව යටතේ ඉදිරිපත් වී ඇති එම වාර්තාව X 127 ලෙස ලකුණුකොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර: කාත්තන්කුඩිය මුහුදු වෙරළේ නාදියා කියලා තැනක් තියෙනවද නැත්නම් මුහුදු වෙරළලට ද නාදියා කියන්නේ?

පි: නදියා බිව් කාත්තන්කුඩි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ මුහුදු වෙරලේ තිබිලා මොනවා හරි හොයා ගත්තද?

පි: නදීයා බිච් එකේ අපේ තොරතුර අනුව සැකකරුවෙක් අත්අඩංගුවට ගත්තා මේ ත්‍රස්තවාදී ජාලයට සම්බන්ධ අබූමියුදන් අනුවර්තනාමය

ප්‍ර: අබූ මියුදන්

පි: අබුමියුදන්

ප්‍ර: රසාහුසේන් කියන්නේත් ඔහුද?

පි: මේ රාසික් රාසාන් හුසේන්.

ප්‍ර: රාසික් රාසා හුසේන්?

පි: අත්අඩංගුවට ගත්තා .

ප්‍ර: ඔබේ තොරතුරු මත?

පි: ඔව්. ඒ ඔහුගෙන් අනාවරණය වුනා 2018 ඔක්තෝම්බර් මාසේ වගේ රිල්වාන් පුපුරන ද්‍රව්‍යයක් කාත්තන්කුඩි පුරුක්කාන් පල්ලිය අසල බෝක්කුවක් මේ ටෙස්ට් එකක් කරන්න ගිහිල්ලා තියෙනවා. පුපුරන ද්‍රව්‍යය සම්බන්ධයෙන් ඒක වැරදීලා ඔහුගේ ඔහුට තුවාලවෙලා තිබුණා එක ඒ වෙලාවේ නදියා බිච් එකේ වලදා තිබ්බා ඉතුරු භාණ්ඩ ටික ඒ සම්බන්ධයෙන් තොරතුරුමත් ඒ අපි ගිහිල්ලා ඒ වැටලීම් සිදුකරලා ඒ නදියා බිච් එකේ වලදාපු ඒ පුපුරන ද්‍රව්‍ය හොයා ගත්තා.

ප්‍ර: මොනවද හොයා ගත්ත දේවල්?

පි: ඩෙටර්නේටර් 07 යි,තඹ වයර් රෝල් දෙකකයි, වොට් 9 බැට්‍රි 09 යි පෙන්ටෝච් බැට්‍රි 09 යි, හදුනානොගත් වර්ග තුනකට අයත් පුපුරන ද්‍රව්‍ය.එල් ඩි බල්බ් වැල් 01 යි, ඔරොලෝසු 04 යි අගල් 6 ක් දිග ගැල්වර්නයිස් බට එකයි ,අගල් 05 ක් දිග යකඩ බෙන්ච් එකයි, අරාබි භාෂාවෙන් ලියන ලද පොත් 30 යි,චීනච්චට්ටි බෙන්ඩ් එකයි. ඇල්මීනයම් බාස්කට් 01 යි.

ප්‍ර: දැන් ඔබ භාණ්ඩ සොයාගත් ස්ථානයට ගියාද අනෙක් නිලධාරින් සමඟ?

පි: ගියා ස්වාමිනි.

ප්‍ර: ඒ ගියපු අවස්ථාවේ ඒ භාණ්ඩ සොයගැනීම ඔබ දැක්කද?

පි: දැක්කා ස්වාමිනි.

ප්‍ර: ඒ භාණ්ඩ සොයාගත්තට පස්සේ ඒ සොයා ගන්නා ලද භාණ්ඩත් ඔබ දැක්කද?

පි: දැක්කා ස්වාමිනි.

ප්‍ර: මා ඔබට ඡායාරූප දෙකක් පෙන්නුවොත් ඔබට කියන්ට පුළුවන්ද ඔය කියන දවසේ ඔබලා විසින් ලැබුණු තොරතුරු මත සොයා ගන්නා ලද භාණ්ඩද කියලා ඒවා

පි: පුළුවන් ස්වාමිනි.

ප්‍ර: ස්වාමිනි C915 සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා.

පි: මේක නිවැරදියි ස්වාමිනි.

සාක්ෂිකරු විසින් හඳුනා ගන්නවා ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ අනුව ඔබ මේ සොයා ගැනීම් ගැන ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට අර වෙනදා කරුණු වාර්තා කරනවා වගේම වාර්තා කෙරුවා?

පි: වාර්තා කරා ස්වාමිනි.

ප්‍ර: ලිඛිතව වාර්තා කෙරුවා ඒ සම්බන්ධයෙන් වූ ලිඛිත වාර්තාව ඔබට ඉදිරිපත් කරන්නට පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට?

පි: පුළුවන් ස්වාමිනි.

ප්‍ර: කවදද ඒ ඉදිරිපත් කරලා තියෙන්නේ?

පි: 2019.05.11

ස්වාමිනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනු ලබන එම වාර්තාව X128 ලෙසින් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: තොරතුරු රැස්කිරීමේ දී ඔබට අනාවරණය වුනාද නැගෙනහිර පළාතේ එක් එක් ඒ කියන්නේ අම්පාරට, මඩකලපුවට ඒ වගේ එක එක ප්‍රදේශවලට මේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ නායයෝ දිස්ත්‍රික් නායකයෝ හිටියද කියලා?

පි: ඔව් අම්පාරට තොරතුරු ලබා ගැනීමේ දී අම්පාරට වෙනම නායකයෙක් පත් කරල තිබ්බා.

ප්‍ර: කවුද ඔහු?

පි: ඔහුට කිව්වේ කල්මුණ ශියාම් කියලා.

ප්‍ර: ඔහුගේ නම මොකක්ද?

පි: සාහුල් මීස් හමිදු මොහොමඩ්.

ප්‍ර: සාහුල් හමිදු හමීස් මොහොමඩ්

පි: මොහොමදු.

ප්‍ර: නැත්නම් කල්මුණ සියාම් ඔහු කොහේද පදිංචිව?

පි: කල්මුණ තයිකා පාරේ

ප්‍ර: ඔබ ගරු කොමිෂන් සභාවට කලින් ඔය කිව්වානේ සමහර අයගේ නම් කියනකොට අබු නාමයක් ? ඔබලාට රැස් කරන ලද තොරතුරු වලදි අනාවරණය වුනාද? සාමාන්‍යයෙන් මුස්ලිම් ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ ඇතැම් සාමාජිකයන්ට ඔය අබු කියන නාමය කොහොමද ලැබිලා තිබුණේ?

පි: අබු කියන මේක පුහුණු ප්‍රධාන අපි අනාවරණය වෙච්ච නාමය ප්‍රධානවෙච්ච කරුණු අනුව ප්‍රධානම කඳවුරු තුනයි තිබ්බේ නුවරඑළිය දෙකයි, හම්බන්තොට එකයි,

ප්‍ර: ඒ කියන්නේ පුහුණු කඳවුරු?

පි: පුහුණු කඳවුරු ඒ පුහුණු කඳවුරේ අන්තිම පුහුණුවලින් පස්සේ මේ සහරාන් ඉදිරියේ දිවුරුම් දෙනවා .

ප්‍ර: ඒ පුහුණු වෙච්ච අය?

පි; පුහුණු වෙච්ච අය ඒක දෙන්නේ මරාගෙන මැරෙන ඉන්තිසාත් කියන දිවුරුම දෙනවා. ප්‍රහාරක කට්ටිය ඉම්තිමා කියලා පුහුණු දිවුරුම

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දෙනවා. ඒ දිවුරුම් දුන්නාට පස්සේ ඒ සහරාන් විසින් තමයි අදාල අනුවර්ත නාමය ලබා දෙන්නේ

ප්‍ර: මේ අබු කියන නාමය ලබා දෙන්නේ?

පි: ඒ අනුව දැන් ඔබ දන්නවද ඔබ කිව්වානේ අබු හසන් සාහුල් හමිදු හමීස් නැත්නම් මොහොමදු කල්මණේ සියාම් කියන තැනැත්තා අම්පාර දිස්ත්‍රික් නායකයා කියලා අණාවරනය වුනා කියලා එතකොට එහෙම නම් ඔහුටත් අනිවාර්යෙන්ම අබු නාමයක් තියෙන්නට ඇති නේද?

පි: අබුහසන්.

ප්‍ර: ඔහුට දීලා තියෙන නාමය සංවිධානයෙන් අබු හසන් හස්ස එතකොට ඔහු යම් අවස්ථාවකදි නීතිය බල ගන්වන ආයතනවලට අත්අඩංගුවට ගැනීම සඳහා ආධාර කන්නට ඔබලාට රාජ්‍ය බුද්ධි සේවයට හැකි වුනාද?

පි: ප්‍රශ්නය තේරුනේ නැහැ.

ප්‍ර: පොලීසියට හරි කාටහරි ඒ ගොල්ලන්ව අඩංගුවට ගන්න උදව් කරන්න පුළුවන් වුනා ද කියලා මං ඇහුවේ?

පි: මේ තොරතුරු මත අත්අඩංගුවට ගන්න හැකි වුණා.

ප්‍ර: ඔව් කවදද?

පි: 2019.05.20 .

ප්‍ර: කොහේදීද?

පි: මොහු අත්අඩංගුවට ගත්තේ කල්මුණේදී.

ප්‍ර: මොන නිලධාරීන්ටද ඔබ සහය වුණේ ඔහු අත්අඩංගුවට ගන්න?

පි: අම්පාර පොලීසියේ.

ප්‍ර: අම්පාර මූලස්ථාන පොලීසියේ ?

පි: මුලස්ථාන පොලිසිය.

ප්‍ර: එතකොට ඒ අත්අඩංගුවට ගැනීමේදී යම් නඩු භාණ්ඩ පිළිබඳව අනාවරණය වුනාද මොනවාහරි තිබුණාද එවා ඉවත් කරලා තිබුණාද මොකද මොනවද දැන ගන්න ලැබුණේ?

පි: අත්අඩංගුවට ගැනීමේදී මුලින් ප්‍රශ්න කිරීමේදී හොයා ගන්න හම්බුණා වළදාපු සහරාන්ගේ CD 3000 ක් හොයා ගත්තා.

ප්‍ර: හොයා ගත්තා?

පි: ඒ තුන්දාහ අපි මොහු තොරතුරු දුන්නා CD 3000 ක් සයිනි පෙබරවාරි මාසේ මොහුට ගෙනත්ලා දුන්නා කියලා ආරක්ෂිතව තියන්න.

ප්‍ර: සහාර්නගේ CD ?

පි: CD ඊට පස්සේ මොහු අපිට තැන පෙන්නලා අපි ගිහින් තැන බලන කොට එතන හැම අවස්ථාවේ සුළු මොහොතකට කලින් ඒක ඉවත් කර ගෙන තිබුණා. මේ වළදාපු තැනින් කවුරුහරි පිරිසක් .

ප්‍ර: ඔබ නිරීක්ෂණය කරා ඒවා අයින් කරලා තිබුණායි කියලා?

පි: අයින් කරලා තිබ්බා.

Presidential Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: ඉතින් ඔබට හොයන්නට බැරිවුණාද ඒ පාර?

පි: ඊට පස්සේ අපි තොරතුර හොයලා බලනන කොට ඒ සංවිධානයේම තව දෙන්නෙක් ඇවිල්ලා .

ප්‍ර: දාහක් හම්බුනා බාල්දියක බාල්දියක තිබිලා?

පි: ඔව් CD 1000 ක යේ ප්ලාස්ටික් බාල්දි හම්බුණා.

පි: CD 1000ක ප්ලාස්ටික් බාල්දිවල දාලා තිබ්බා ඒවා ඔබට සොයා ගන්නට පුළුවන් වුණා.

ප්‍ර: ඒවා ඔබට සොයා ගන්නට පුළුවන් වුණා?

පි: ඔව්.

ප්‍ර: දැන් ඒවයේ මොනවද අන්තර්ගත වුණේ කියලා බැලුවද ඒ CD 1000 ?

පි: සහරාන්ගේ දේශන.

ප්‍ර: එතකොට ඔබ කිව්වා ඒ වගේම නිරීක්ෂණය කෙරුවායි කියලා අර ඔබට ලැබුණ තොරතුරු අනුව 3000 ක් විතර ඉයිනි කියන තැනැත්තා ඒ කියන්නේ සහරාන්ගේ සහෝදරයා ගෙනල්ලා දීලා තිබුණා CD නමුත් එයින් ඇතැම් CD ඉවත් කරල තිබුණ බවක් කියලා?

පි: පස්සේ ඒ ඉවත් කරපු පුද්ගලයා අපි හොයාගත්තා වළදාපු තැනුත් අපි හොයා ගත්තා එකෙන් ගොඩාක් CD වලක් කපලා ගිනි තියලා විනාශ කරලා තිබ්බා සෑහෙන බලන්න පුළුවන් මට්ටමින් තිබ්බා. ඒ කට්ටියත් අත් අඩංගුවට ගත්තා.

ප්‍ර: ඊට පස්සේ?

පි: ඊට අමතරව මොහුගේ තොරතුරු මත තව .

ප්‍ර: මොහු කියලා කියන්නේ කවුද ?

පි: මේ කල්මුනේ සියාම්ගේ තොරතුරු මත අන්තිම මොහොතේ සහරාන් පාවිච්චිකරපු ලැප්ටොප් වර්ගයේ පරිගණකයක් දිලා තිබ්බා.

ප්‍ර: කාට ද දීලා තිබ්බේ?

පි: සියාම්ට ඒක කල්මුණේ අඩවාල, පාලමුනේ කලපුවක හන්ගලා තිබ්බේ ඒක හොයා ගනන්න පුළුවන් වුණා. ඊට අමරතව මඩකලපුව මරාගෙන මැරෙන බෝම්බකරු ආසාද්ගේ බිරිඳ සිරෝසා,සයින්ද මර්දු වෝරිවෝරියන් ග්‍රාමයට යන්න පිටත් වීමට පෙර ඇහේ රත්තරන් බඩුවගයක් දීලා තිබ්බා සියාම්ට. ඒ රත්රන් බඩු සොයා ගැනීමට හැකි වුණා. ඊට අමතරව මොහු මාර්ගයෙන් පනස් අසු දාහක (5,080,000/-) මුදලක් අන්තිම මොහොතේ සයිනි මොහුට ලබා දුන්න මේ පනස් ලක්ෂ අසු දහසක මුදලක් සොයා ගැනිමට හැකිවුණා.

ප්‍ර: කා ළඟ තිබිලද?

පි: මෙයා දීලා තිබ්බේ ලක්ෂ 35 ක් මොහුගේ මාමා ෆරිත් කියන පුද්ගලයකු ළඟ තිබ්බා. තව ලක්ෂ පහක් වෙනත් පුද්ගලයකු ළඟත් තවත් ලක්ෂ 10

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ක් වෙනත් පුද්ගයකු ළඟත් අසුදහස මොහුත් සමඟ අත්අඩංගුවට ගත් මුජහිදීන් කියන පුද්ගලයාටත් දීලා තිබ්බා.

ප්‍ර; ඒ මුදල් සියල්ල ඔබලාට එකතු කර ගන්නට පුළුවන් වුණාද?

පි: හැකි වුණා ස්වාමිනි.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් ඔබ වාර්තාවක් ඉදිරිපත් කෙරුවද ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට?

පි: ඉදිරිපත් කරා ස්වාමිනි.

ප්‍ර: ඒ කවදද ඉදිරිපත් කරේ?

පි: 2019.06.02 .

ස්වාමිනි එම වාර්තාව X 129 ලෙස ලකුණු කොට ඉදිරිපත් කරන්නට අවසර පතනවා.

ප්‍ර; දැන් ඒ අනුව කල්මුණේදී ෂියාම්ගේ පින්තූරයක් ඔබට පෙන්වන්න පුළුවන්ද ?

පි; පුළුවන් ස්වාමිනි.

ප්‍ර: ඒ දැන් විමර්ශන වලදී ඔබ කිව්වා කල්මුණේ ෂියාම් කියවන්නේ අම්පාර දිස්ත්‍රික් නායකයා කියලා එතකොට ඔබේ තොරතුරු ලබා ගැනීමේදී අනාවරණය වුණාද ඔහු නායකයා නම් ඔහුගේ යටතේ තවත් අය ක්‍රියාත්මක වෙලා තිබුනද කියලා?

පි: ඔහුගේ යටතේ තව කණ්ඩායමක් හිටියා.

ප්‍ර; කණ්ඩායමක් කවුද ඒ කණ්ඩායමට අයත් වුණේ?

පි: කාලිත් නම් කීපයක් තියෙනවා.

ප්‍ර: කාලිත් ?

පි: මුජහිදීන්, නලීන් ,නෂ්පර්,

ප්‍ර; ඒ අය අම්පාර දිස්ත්‍රික්කයේද ක්‍රියාත්මක වෙනවා කියලා ඔබ කරුණු අණාවරණය

පි: අම්පාර දිස්ත්‍රික්කයේ.

ප්‍ර: ඒ අයගේ ඡායා රූප මේ ගරු කොමිෂමේ කොමෂාරිස් වරුන්ට බලාගන්නට ඉදිරිපත් කරන්නට පුළුවන්ද?

පි: පුළුවන් ස්වාමිනි.

ප්‍ර: **මෙම දැන් පෙන්වන ඡායාරූප මේ දැන් ඔබ පෙන්වන රූප රාමුවේ** ඉහලින්ම ඉන්නේ කවුද?

පි: කල්මුණේ සියාම්.

ප්‍ර: කල්මුණේ සියාම් ඔහුව තමයි ඔබලා අත්අඩංගුවට ගත්තේ කියලා කිව්වේ ප්‍රථමයෙන් කවදද ඔහුව අත්අඩංගුවට ගත්තේ ඔහුව?

පි: 2019.05.20.

ප්‍ර: ඔබ කිව්වානේ අම්පාර දිස්ත්‍රික්කයේ නායකයා විදියට මේ කල්මුණේ ෂියාම් සම්බන්ධයෙන් ඔබට තොරතුරු ලැබිලා තිබුණා ඒවගේම ඔහු යටතේ ක්‍රියාත්මක වන කණ්ඩායමක් ගැන තොරතුරු ලැබිලා තිබුණා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කියලා? එත කොට ඒ අනුව ඔහුට පල්ලෙහායින් වම් පැත්තේ ඉන්න මුජාහිත් කියලා නම් කරලා තියෙන තැනැත්තා මොනවගේ කෙනෙක්ද?

පි: මොහුත් කල්මුණේ සියාම් යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ මෙම ත්‍රස්තවාදී සංවිධානයට නායකය සම්බන්ධව කටයුතු කල පුද්ගලයෙක්.

ප්‍ර: ඔව් ඒ සම්බන්ධයෙන් ඔබට මොනවහරි තොරතුරු දෙන්න පුළුවන් ද ගරු කොමිෂන් සභාවට?

පි: කල්මුණේ සියාම් අවසාන මොහොතේ 2019.6.26 සමන්තුර සෙනල්ග්‍රාමයේ නිවසයි 4/26 සමන්තුර සෙනල් ග්‍රාමයේ ආරක්ෂිත නිවසයි ,නින්ද ඌර් ගෙදරයි වටලන අවස්ථාවේ මෙකෙන් පිරිසක් හිටියේ මේ කල්මුණ සියාම්ගේ පාලමුණ නිවසේ එතකොට එම අවස්ථාවේ කල්මුණ සියාම්ට උපදෙස් දීලා තිබ්බා මුහුදු ආසන්න මාර්ගයෙන් එම පිරිස සයින්දර් මර්දු වොලිවෝරියන් ග්‍රාමයේ පුපුරවා ගත් නිවසට රැගෙන යන ලෙසට එතකොට මේ මොහු තමයි කල්මුණ සියාම් තමයි ගිහින් ඇරලවපු පුද්ගලයා නමුත් එදා රාත්‍රියේ ආහාර මේ ගෙදර කට්ටියට රැදි සිටි පුද්ගලයින්ට ආහාර ලබා දීමට මේ මුජාහිතුත් සම්බන්ධ වෙලා තිබ්බා.

ප්‍ර: ඒ කියන්නේ 26 වෙනිදා?

පි: 26 වෙනිදා.

ප්‍ර: එතකොට මේ කාලිත් කියන තැනැත්තා ?

පි: මේ කාලිත් කියන තැනැත්තාත් මේ මොහුත් නුවරඑළිය පුහුණු කඳවුරේ පුහුණු වෙච්ච කෙනෙක් මොහු නම අබු සාලි.

ප්‍ර: ඔහු අබු සාලි ?

පි: අබු සාලි ඉහත නම් සඳහන් කරපු මුජහිද් අබු රුමේස්?

ප්‍ර: අබු රුනේස්?

පි: මොවුන් ඔක්කෝම සහරාන් ඉදිරියේ දිවුරුම් දුන් පුද්ගලයෝ දෙන්නෙක් මේ.

ප්‍ර; එතකොට මේ දිවුරුම් දුන්න අයට විතරයි ඔබ මේ කියන ආකාරයට අබුකියන නාමය එන්නේ?

පි: ඔව් දිවුරුම් දුන්නාම තමයි අබු කියන නාමය සහරාන් තමයි මේ අබු නාමය ලබා දෙන්නේ.

****

<u>**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**</u>

ප්‍ර: ඒ දිවුරුම් දෙන්නේ මරාගෙන මැරෙන ප්‍රහාරකයන්ටද විතරද?

පි: ස්වාමිනි දිවුරුම ක්‍රම දෙකකට දෙනවා මරාගෙන මැරෙන දිවුරුම දෙන කට්ටියට දිවුරුම දෙන්නේ ඉන්තිසාත් කියලා ඊට අමරතරව ප්‍රහාරක මරාගෙන මැරෙන වෙන ප්‍රහාරකයකුට දිවුරුම් දුන්නොත් ඉම්ටිකිස් කියලා ඔවුන් කැමති අහනවා ඉන්කිමාස් ද ඉම්ටසාප් කියන දිවුමරුම ද

FAIR COMMENT BY JEZEEM

දෙන්නේ කියලා එම අවස්ථාවේදී කැමති මරාගෙන මැරෙන්න කැමති නම් තමයි ඉන්තිසාප් දිවුරුම දෙන්නේ ප්‍රහාරක නම් ඉම්කිමා දිවුරුම දෙන්නේ.

ප්‍ර; ඒ දිවුරුම් දෙකෙන් මොකක් දුන්නත් අර අබු කියන නම ලැබෙනවද.?

පි: දිවුරුම් දෙකෙන් මොකක් දුන්නත් අර අබු නම ලැබෙනවා.

****

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: එතකොට මේ නලීම් ?

පි: නලීම්ගේ අබු නම අනාවරණය කරගන්න බැරිවුණා. අනිත් දෙන්නාගේ අබු නම අනාවරණය කර ගන්න බැරි වුණා මොකද මේ කට්ටිය ගෙන් ප්‍රශ්නකරාට එක අනාරවරණය කර ගන්න බැරි වුණා.

ප්‍ර: නලීම් නලීම් මොනවගේ දේවල්වලට සම්බන්ධ ඇයි ඔබ කියන්නේ අම්පාර දිස්ත්‍රික් නායාකයගේ කණ්ඩායමේ කෙනෙක් කියලා නලීම්?

පි: නලීම්ගේ ඊට පසුව නලීම් මේ ෂයිනි විසින් ලබා දුන් CD තැටි සඟවන්න නලීම් උදව් කරලා තිබ්බා නලීනුයි නස්සාරුයි දෙන්නම උදව් කරලා තිබ්බා.

ප්‍ර: අර ඔබලා ඒවා සොයා ගෙන ගිය අවස්ථාවේදි ?

පි: ඊට අමතරව අපි 2019.08. 19 වන ඔලුවිල්වලදී තව පුපුරන ද්‍රව්‍ය තොගයක් සොයා ගත්තා. ඔලුවිල් වල සඟවා තිබියදී ඒ හොයාගත්තෙත් නලීම්ට අයිති ඉඩමක තිබිලා.

ප්‍ර; එතකොට මේ නෆ්සාර්?

පි: නෆ්රාසුත් මේ ජාලයට සම්බන්ධයි කියලා මේ කල්මුණ සියාම් මාර්ගයෙන් අනාවරණය වුණා. ඊට අමතරව මේ මොවුන් නොයෙක් ආකාරයෙන් මේ සංවිධානයට උදව් කරලා තියෙනවා.

ප්‍ර: එතකොට ඔබට හොයා ගන්න පුළුවන් වුණාද මේ නෆ්සාර්ට අබුනාමයක් දීලා තිබුණාද කියලා සහරාන් ?

පි: නෆ්සාර්ගේ And නලීම්ගේ අබු නාමය අනාවරණය කර ගන්න බැරිවුණාට මේ කට්ටියගේ වෙනත් බුද්ධි තොරතුරු අනුවයි මේ අනිත් සාක්ෂි කරුණු අනුවයි මේ සංවිධානයට සම්බන්ධයි කියලා කරුණු අනාවරණය කරගත්තා. නලීම්ගේ ඉඩමේ තමයි පුපුරන ද්‍රව්‍යයත් හම්බුණේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: නලීම්ගේ සම්පූර්ණ නම මොකක්ද?

පි: සාලිත් මොහොමඩ් නලීම්.

****

FAIR COMMENT BY JEZEEM

President's Secretariat Copy

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ස්වාමිනි මෙම අම්පාර දිස්ත්‍රික් නායකයා වශයේම ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ ඔහු යටතේ ඒ කණ්ඩායම් නිලධාරීන් විදියට කැනැත්ත් පිළිබඳව සාක්ෂිකරු දැන් විස්තර කරා. එම රූප රාමුව ඒ දක්වන ලද රූප රාමුවෙහි මුද්‍රිත පිටපත C 933 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්නට ගෞරවයෙන් අවසර අයැදිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

කොමිෂන් සභාවේ කටයුතු සවස 4. පසු වී විනාඩි 20 කෙන් කල් තබනවා. දැන් වේලාව.ප.ව.4.00

****

විවේකයයෙන් පසු හේරත් මුදියන්සේලාගේ චන්දික නිලංක හේරත් ප්‍රතිඥා පිට නැවත සාක්ෂි කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඔබ කෙටි විවේකයට පෙර ඔබ ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා නුවරඑළිය සහ හම්බන්තොට යන ප්‍රදේශවල සහරාන් හසීන් විසින් මෙහෙයවන ලද පුහුණු කඳවුරු දෙකක් පිළිබඳව දැනගන්නට ලැබුණාය කියලා?

පි: දැන ගන්න ලැබුණා ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ කිව්වා නුවරඑළියේ කඳවුරු අවස්ථා දෙකක දි හම්බන්තොට පමණ පවත්වලා තියෙනවාද කියලා කිව්වේ?

පි: නුවරඑළියේ ස්ථාන දෙකකදි සහ එක් ස්ථානයකදි

ප්‍ර; ස්ථාන දෙකක දි සහා හම්බන්තොට එක් ස්ථානයක දි කියලා තමයි මේ පුහුණුවීම් කරලා තිබුණේ කියලා ඔබට අනාවරණය වුණු කරුනු අනුව? එතකොට ඒවගේම ඔබ සඳහන් කෙරුවානේ අර යම් ආකාරයකදී පුහුණුව අවසාන වුණාට පස්සේ දිවුරුමක් ලබා ගන්නවා කියලා හෙලි වුනාය කියලා සහරාන් ලඟ ප්‍රහාරයට යවනවද නැත්නම් මරාගෙන මැරෙනවද කියන කරුණු අනුව?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඔය අනාවරණය වූ කරුණු පාදක කරගෙන ඔබ අර අනෙක් අවස්ථාවලදී වගේම ඔබේ ඉහල නිලධාරින්ට ඒ පිළිබඳව ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කරාද?

පි: ඉදිරිපත් කරලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර; ඒ කවදද?

FAIR COMMENT — BY JEZEEM

පි: 2019.08.29

ස්වාමිනි එම වාර්තාව X 130 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර අයදිනව

ප්‍ර: දැන් මං ඔබේ අවධානය ඒ වාර්තාව කෙරෙහි යොමු කරන්නට කැමතියි. ඒ වාර්තාව මගින් ඔබ අර සාමාන්‍යයෙන් ඉදිරිපත් කරන්නේ ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියාටනේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාටනේ නමුත් මේ X 130 වාර්තාව ඔබ ඉදිරිපත් කරලා තියෙන්නේ කාටද?

පි: රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකතුමාට.

ප්‍ර: ඇයි ඒ?

පි: මේකේ නියෝජ්‍ය අධ්‍යක්ෂක තුමාටත් වාර්තාවක් ඉදිරිපත් කරා

ප්‍ර පිටපත් කරලා තියෙනවා නේද?

පි: පිටපත් කරලා තියෙනවා ඊට පස්සේ .

ප්‍ර: නෑ මං අහන්නේ සාමාන්‍යයෙන් ඔබ අමන්ත්‍රණය කරනවා අපි දැකලා තියෙන්නේ මේ තාක් ලකුණු කරන ලද ඔබේ වාර්තාවල්වල නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට නමුත් අපිට පේනවා මේකේ වෙනසක් ඔබ මේ වාර්තාව අධ්‍යක්ෂකවරයාටමයි ආමන්ත්‍රණය කරන්නේ මං ඔබෙන් අහන්නේ ඇයි එහෙම කරලා තියෙන්නේ කියලා?

පි: දැන් මේකේ විශේෂයෙන්ම මේ වාර්තාවේ ඉන්නේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයට වැඩිය මේකේ JMI ජමාතේ මිල්ලති ඊබ්‍රාහිම් සංවිධානය ලංකාව පුරා විසිරිලා තිබ්බේ මේකේ සාමාජිකයන් සොයා ගන්න බැරිව හිටියේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සමාජිකයින් මේ කාත්තන්කුඩිය බේස් කර ගෙන තමයි හිටියේ නමුත් JMI ජමාතේ මිල්ලති ඊබ්‍රාහිම් සංවිධානයේ නායකයින් මාවනැල්ල, පොළොන්නරුව, අනුරාධපුර ඒ වගේ නුවර ඒ හැම තැනම විසිරිලා ව්‍යාප්තවෙලා මේ ප්‍රහාරයෙන් පසුවත් සැඟවීලා හිටියේ ඔක්කෝම නමුත් මොවුන් සියලු දෙනාම සහරාන් ඉදිරියේ පුහුණුව ලැබුව අය.

ප්‍ර: ඔබෙන් මට ප්‍රශ්නයක් අහන්නට ඕනේ? දැන් ඔබ කිව්වා ප්‍රහාරයෙන් පස්සේ මේ ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් සංවිධානයේ සාමාජිකයෝ හැංගිලා හිටියා කියලා එතකොට ඔබේ අනාවරණය වූ තොරතුරු අනුව භූමියෙන් ලබා ගත්ත මේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයයි ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් සංවිධානයයි අතර යම් සම්බන්ධතාවයක් සොයාගත්තද?

පි: ඔව් ජාතික තවුහිද් ජමාත් සංවිධානයයි ජමාතේ මිල්ලති ඊබ්‍රාහිම් සංවිධානයයි එකතු වෙලා සහරාන් තමයි මේ සංවිධානයට දිගටම නායකයත්වය දුන්නේ දෙගොල්ලෝ එකතු වෙලා තමයි 2019.04.21 ප්‍රහාරය එල්ල කරේ.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: කියන එකයි ඔබට අනාවරණය වෙලා තිබුණේ? හොඳයි එතකොට ඔබට අනාවරණය වුණාද මෙම පුහුණු කඳවුරුවල එයට සහභාගිවන්නන් පුහුණු කරලා තිබුණු පුහුණුකරුවන් කවුද කියලා?

පි: අනාවරණය වෙලා තිබ්බා ස්වාමිනි.

ප්‍ර: ඒ කවුද නම් කරන්න?

පි: මේකේ විශේෂයෙන්ම ඉදිරිපත් අපි කරගත් කරපු තොරතුරු අනාරවණය අනුව මෙකේ මුලින්ම IS මතවාදය මේ ජිහාද් සම්බන්ධව අදහස් දක්වලා තිබ්බේ නවුෆර් මවුලවි සහ සහරාන් විසින් ඊට පස්සේ දෙවනියාට මේකේ අවි සම්බන්ධව දේශනා කරලා තිබුණු ඒ කියන්නේ අවි සම්බන්ධව පෙන්නලා ඒ සම්බන්ධව කොටස් ගහලවලා කොහොමද ඇමිනීෂන් දාන්න ඒ සම්බන්ධව සන්නද අංශයේ පුහුණුව දීලා තිබ්බේ මිල්හාන් ඊට අමරතව පුපුරන ද්‍රව්‍ය පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධව කරලා තිබ්බේ හස්තූනුයි රිල්වානුයි ඊට පස්සේ පිහි පිහි සම්බන්ධව උගන්නලා තිබ්බේ සාදික් අබ්දුල් හක්

ප්‍ර: පිහිවලින් මොනවද කරන්නේ? පුපුරණ ද්‍රව්‍ය අපිට තේරෙණවා,ගිනි අවි අපිට තේරෙණවා පිහිවලින් මොනවද කරන්නේ?

පි: පිහිවලින් ඒ කට්ටිය උගන්වලා තිබ්බේ විශේෂයෙන්ම බල නහර නහර කපලා ඒ කියන්නේ ලේසියෙන්ම මරන්න පුළුවන් ස්ථාන සම්බන්ධයෙන්. පිහියකින් ඇන්නට හැමතැනමට ඇන්නට මැරෙන් නැහැ මනුස්සයෙක් මිනිහෙක් මැරෙන්ඩ අනිවානම් මැරෙන්න කපන්න පුළුවන් ස්ථාන කොහොමද පැවත ගන්නේ කියලා තමයි මේකේදී කියලා දීලා තිබ්බේ.

ප්‍ර: ඒ කියන්නේ අදික ලෙස රුධිරය වහනය වන ස්ථාන පිළිබඳව මේ පුහුණුවන අයට අවබෝධයක් ලබා දුන්නා කියන එකයි ඔබ කියන්නේ?

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ආපහු උත්තරය කියන්න ඒ පුහුණු කඳවුරේ එක් එක් පුහුණු විම් කරපු අයයි මොකක්ද ඒ කට්ටිය කරපු ඒවා කියලා තියෙන්නේ?

පි: පුහුණු වීම්වලදී කියලා තියෙන්නේ IS මතවාදයි මේ ජිහාඩ් සම්බන්ධයි මුස්ලිම් ආගමේ ජිහාඩ් කිරිමේ වැදගත් කම කියලා දීලා තිබ්බේ සහරානුයි නවුෆර් මවුලවියි.

ප්‍ර: IS මතවාදයයි?

පි: ජිහාඩ් කිරීමේ වැදගත්කම ගැනයි කියලා දීලා තිබ්බේ සහරානුයි නවුෆර් මවුලවියි. ඊට අමතරව අවි පුහුණුව දීලා තිබ්බේ මිල්හාන්,පුපුර ද්‍රව්‍ය සම්බන්ධයෙන් කියලා දීලා තිබ්බේ හස්තූනුයි රිල්වානුයි. පිහි සම්බන්ධයෙන් කියලා තිබ්බේ සාදික් අබ්දුල් හක් .

****

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගරු අතිරේක සොලිසිටර් ජෙනරාල් අයේෂා ජිනසේන මෙනවිය

ප්‍ර: ඔය සාදික් අබ්දුල් හක් මොන ප්‍රදේශයෙන් පැවත එන එක්කෙනෙක්ද?

පි: මාවනැල්ලේ.

ප්‍ර: මාවනැල්ල ප්‍රදේශයේ ඔහු යම් දේශන එහෙම පවත්වලා තිබුණාද කියලා ඔබේ අවධානයට යොමු වුණාද?

පි: ඔව් මාවනැල්ල ප්‍රදේශයේ 2019,2018.23 යි 25 යි අතර බුදු පිළිම කඩපු සිද්ධින් වගයක් වාර්තා වෙලා තිබුණා. මේකට සාදික් අබ්දුල් හක් තමයි නායකත්වය දිලා තිබ්බේ.

ප්‍ර: නෑ මං ඇහුවේ දේශන පැවැත්වීම ගැන ඔබට දැන ගන්න ලැබුණාද

පි: ඔව් දේශන පිළිබඳ සාදික් අබ්දුල් හක් සහරාන්ගේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ නෙමේ ජමාතේ මිල්ලති ඊබ්‍රාහිම් සංවිධනය මං අර කලින් පැහැදිලි කරා වගේ මුස්ලිම් ආගමේ ජමාතේ ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමියා එකේ ශිෂ්‍ය අංශයක් තියෙනවා ශ්‍රී ලංකා ඉස්ලාමික් student movement jamaithul සංවිධානය කියලා මේ සංවිධානයේ කැඳවුම්කරු විදියට තමයි මෙයා හිටියේ ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමිය එකේ මෙයාගේ ලොකු තාත්තා අජ්ජුල් අක්බාර් තමයි නායකයා විදියට හිටියේ මොහු මේකේ කැඳවුරුම්කරු විදියට හිටියා 2014,2015,2016 කාලවල්වල. එතකොට මොහු මේ ශ්‍රී ලංකා ඉස්ලාමික් ස්ඩුනට් වුමන්ට් නැත්නම් ජමෙයිතුල් තලබා සංවිධානය හරහා මේ කට්ටියගේ ප්‍රධාන ආරාබිය ඉස්කෝල දෙකක් තිබ්බා මාදම්පේ ඉස්ලාහියායි බේරුවල නාපියා නාලිමි එකයි මේකට ඉගන ගන්න ආව ශිෂ්‍යයෝ දැඩි වශයෙන් යොමු කරගෙන තිබ්බා මේ JMI එකට ඒ කියන්නේ මේ සංවිධානයේ පුහුණු පාඨමාලා හදාරලා කියලා දීලා තිබ්බා එකක් ඉස්සෙල්ලාම YDB යුත් ඩිවර්ලොප්මන්ට් ප්‍රෝගෑම්, ඊට පස්සේ Human resource development program HRDB කියලා ඉස්සෙල්ලම පුහුණු පාඨමාලා දීලා ඊට පස්සේ එකෙන් එන පැත්තට මේ අන්තවාදී පැත්තට බර කට්ටිය මේ කට්ටියට අඳුනගනන තිබ්බා. අඳුනන ගත්තාට පස්සේ මේ කට්ටිය මේ සහරාන් ළඟට මේ ජිහාඩ් වලට යවන්න පුළුවන් කට්ටිය වෙනම තෝරගෙන fallow up කියලා තව තුන්වෙනි පාඨ මාලාවකට යොමු කරලා තිබ්බා.

ප්‍ර: ඒ අයව තෝරා ගැනීමේ යම් ක්‍රමවේදයක් අනාවරණය වුණාද?

පි: අනාවරණය වුණා ස්වාමිනි.

ප්‍ර: කොහොමද ඒක කෙරෙන්නේ?

පි: විශේෂයෙන්ම මේ කට්ටිය පළවෙනි program බලනවා මෙසේ මේ පස් පාරක් ආගම ඇදහිමේ දී පාන්දර අදහන කොට ඒවාට දැඩිව ආගම් භක්තියෙන් අදහන්න කවුද ඊට පස්සේ ඊට පස්සේ මේ කට්ටිය මේ ලංකාවේ සංහල කට්ටියගෙන් මුස්ලිම් පල්ලියට සිදුවන හානිය විඩියෝ

FAIR COMMENT BY JEZEEM

කිලිප් පෙන්නලා මේවා සම්බන්ධයෙන් දැඩිව අන්තවාදී විදියට අදහස් ප්‍රකාශ කරන්නේ කවුද මේවා හොදට බලලා ඉස්සෙල්ලාම මේ ජිහාඩ් ඒ කට්ටියගේ අදහස් තේරුම් අරගෙන අන්තිමට මේ කට්ටියට මේ පැත්තට නම්මව ගන්න පුළුවන් කට්ටිය තමයි මේ කට්ටිය fallow up crocus එකට ගන්නේ.

ප්‍ර: එතකොට ජිහාඩ් කිරීම ඒ කියන්නේ ජිවිත පුජාව උතුම් දෙයක් කියන එක බව පිළිබඳවත් ඒ අයට අදහස් දෙනවද මේ සංවිධානයේදී?

පි; අදහස් දෙනවා ස්වාමිනි.

ප්‍ර; ඒ පුහුණු වීම් වලදී?

පි: දෙනවා.

ප්‍ර: එතකොට ඒ පුහුණු වීම් වලදී 2025 දී ලංකාවේ ඉස්ලාම් රාජ්‍යයක් කරන්නට ඕනී කියන කරුණු පිළිබඳවත් ?

පි: කරුණු පිළිබඳ උපදෙස් දෙනවා.

ප්‍ර: ඔය ක්‍රමවේදයේදී ඔවුන්ගේ අවධානයට යොමු කරනවද?

පි: ඔව් දැනට යොමු කරනවා ස්වාමිනි.

ප්‍ර: ඔබ කිව්වා ඊට පස්සේ follow up අපි එකේ කොහොමද කරන්නේ?

පි: ඒ follow up course එකේ දී ස්වාමිනි මේක මේ කට්ටිය වෙනම තැන්වලට ගෙනිහිල්ලා ඒත් එතකම් නුවරඑළිය හම්බන්තොට ඒ වගේ ප්‍රධාන සහරාන් ඉස්සරහට නෙමේ පළමුවන course එකේදී තමයි අන්තිමට මේ කට්ටිය සාදික් අබ්දුල්හහක් තීරණය කරනවා මෙයා සහරාන් ඉස්සරහට දාන්න පුළුවන් කියලා ඒ කියන්නේ මෙයා ජිහාත් කිරීමට වුනත් කැමති පුද්ගලයෙක් ද කියලා මේ සංවිධානය පවලා පුද්ගලෙයක්ද කියලා තේරුම් ගත්තාට පස්සේ එකේ අන්තිම course එකේ follow up course එකෙන් එකෙන් පස්සේ තමයි සහරාන්ගේ මේ නුවරඑළියට, හම්බන්තොට කඳවුරු වලට එකට යොමු කරන්නේ.

ප්‍ර: ඇයි මේ ඔබ සාදික් අබ්දුල් හක්ගේ නම කියන්නේ? ඒ කියන්නේ තීරණ ගන්නේ කවුද ඉස්සරහට ගෙනියන්න ඕනේ කාටද පුහුණුව තවදුරටත් දෙන්න ඕනේ කියලා ඒ හක්ද?

පි: නැහැ මම මේ කතා කරන්නේ ශ්‍රී ලංකා ස්ලාමික් ස්ඩුන්ට් මූමන්ට් එකේ ශිෂ්‍යයෝ බදවා ගත් ආකාරය ගැන එතකොට ඒක කරේ ගොඩාක්ම සාදික් අබ්දුල් හක්

ප්‍ර: ඔබට යම් අවස්ථාවකදි ඔබේ අවධානය සාදික් නෙමේනේ?

පි: ඔය සාදික්ගේ සහෝදරයා.

ප්‍ර: මෙකේ සාහිඩ් ගැන කියන්නේ නැනේ සාදික් ගැන විතරයි කියන්නේ?

පි: සාදික්ගේ සහෝදරයා තමයි සාහිඩ්

ප්‍ර: ඒක හරි නමුත් රිපෝට් එකේ කියන්නේ නැහැනේ සාදික් ගැන විතරයි කියන්නෙ. ඔය සාහිඩ් කියන තැනැත්තා යම් අවස්ථාවක දී සිරියාවට

Prasident Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පුහුණුව සඳහා ගිහිල්ලා තිබුණාද අවි පුහුණු සඳහා ගිහිල්ලා තිබුණද කියන එක ඔබේ තොරතුරු රැස් කිරීමේ දී අනාවරණය වුණාද?

පි: අනාවරණය වුණා ස්වාමිනි.

ප්‍ර: මොකක්ද වෙලා තිබ්බේ?

පි: ඔහු මේ තුර්කීය හරහා සිරියාවට ගොස් තිබුණා පුහුණුවට .

ප්‍ර: එතකොට ඔය වාර්තාව ඉදිරිපත් කරන කොට ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ඔබේ අවධානය යොමුවුනාද මොන ආකාරයකට ද ඔබ කියන විදියට ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ නායකා වුණ මොහොමඩ් සහරානුයි අර ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් සංවිධානයේ සමාජිකයනුයි එකට හමුවෙලා මේ සම්බන්ධතාවය ඇතිවෙලා තියෙන්නේ කියලා?

පි: මේකේ 2016 .10.16 දින මරදමුල්ල කබීර් පල්ලියේදී හුස්නි මුහාරගේ විවාහ මංගල්‍ය උත්සවය තිබ්බා. ඒ විවාහ මංගල්‍ය උත්සවයේදී තමයි මේ ගොල්ලෝ එකට හමුවුණේ.

ප්‍ර: කවුරු කවුරුද හම්බෙලා තිබුණේ?

පි: JMI පැත්තෙන් අක්‍රම් අක්‍රම්,ඉම්ෆාස්,ඉත්තිකා, ඉක්බාල් උමයිර්,සාදික් අබ්දුල් හක්. ඒ කට්ටිය තමයි ඒ වගේම දෙහිවල පුපුරවා ගත් මොහමඩ් ජමිල් , ඒ කට්ටිය ඔක්කෝම JMI JMI එකට මේ සහරාන් හම්බුණේ මේ හුස්නි බාරක්ගේ විවාහ උත්සවයේදී 2016.10.16

ප්‍ර: මරද මුතෙයි තව අනාවරණය වුනාද ඔබට යම් පුද්ගලයෙක්ගේ ජංගම දුරකථනයක තිබුණ ඇප්ලිකේෂන් එකක් අරබි භාෂාවෙන් යම් වැකී හුවමාරුවෙලා තිබුණ අවස්ථාවක් ගැන ?

පි: තිබුණා ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඒ ගැන පොඩ්ඩක් පැහැදිලි කරන්න පුළුවන්ද ගරු කොමිෂන් සභාවට?

පි: මේ JMI සංවිධානයේ හිටියා නැගෙනහිර පළාත භාරව හිටියා වාලච්චේනයේ මොහොමඩ් උස්නාර් මොහොමදු නවුෂාඩ් මොහුව අත්අඩංගුවට ගෙන ජංගම දුරකථන පරීක්ෂා කරන කොට අරාබිවලින් ලියපු වචන තිබ්බා රාජතාන්ත්‍රිකයින් ඝාතනය කරමු. තානාපති කාර්යාලවලට ප්‍රහාරයක් එල්ල කරමු ගුණාත්මක හමුදා බලයක් ගොඩනගමු න්‍යෂ්ටික අවි ආයුධ දහස් ගණනක් ඉරාකයේ ජනයා මරා දමයි. මියෙන් මාරයේ බෞද්ධ අන්තවාදීන් විසින් මුස්ලිම් ජනතාවගේ දේපල සහ පල්ලි විනාශ කරයි. මුස්ලිම් ජනයාගේ වෙළඳ සැල් ,නිවාස පල්ලි ඉලක්ක කර ගනිමින් සිංහල අන්තවාදී කණ්ඩායම් කටයුතු කරයි.

දැන් වේලාව: ප.ව..4.50

මෙතැන් සිට:ල/ලේ මුතුමාලි මෙනවිය

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව.04.50 යි.
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : මේවා ඔබ කියන්නේ තිබුණේ අරාබි භාෂාවෙන්?

පි : අරාබි භාෂාවෙන්.

ප්‍ර : අරාබි භාෂාවෙන් කියලා. දැන් ඔබ සඳහන් කරන ලද කරුණු වලදී ඔබ කිව්වනේ අර පුහුණු කඳවුරු පැවැතුණාය කියලා නුවරඑළියේ සහ හම්බන්තොට. එතකොට ඔය පුහුණු කඳවුරු වල ආරක්ෂාව සම්බන්ධයෙන් කවුරු හරි කටයුතු කළාද කියලා ඔබට අනාවරණය වුණාද?

පි : රිල්වාන්.

ප්‍ර : ඒක ගැන කියන්න ඕනේ ඒකේ ලියලා තියෙන විදිහටම කියන්න.

පි : IS මතවාදය සම්බන්ධයෙන් නවුෆර් මවුලවි ෂයිනි සහ සාරා යන උපදෙස් ලබා දී ඇත. සහරාන්ගේ සහෝදරයෙකු වන මොහොමඩ් රිල්වාන් නැමැත්තා පුහුණු කඳවුරේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කර ඇති අතර ඔහු දිවා රෑ අවදියෙන් සිට ඒ සම්බන්ධයෙන් සෝදිස්සියෙන් සිට ඇත.

ප්‍ර : එතකොට ඒ වගේම මේ පුහුණුවීම් වලදී IS සංවිධානය විසින් මරාගෙන මැරෙන ප්‍රහාරයන් එල්ල කරන ආකාරය පෙන්වන Video පට ප්‍රදර්ශනය කරලා තිබුණයි කියලා අනාවරණය වුණාද?

පි : අනාවරණය වුණා ස්වාමිනි.

ප්‍ර : මේ කරුණු අන්තර්ගත කරලා ඔබ වාර්තාවක් පිළියෙල කළේ කවදද?

පි : 2019/08/29 වාර්තාවේ මෙම කඳවුරු වලදී IS සංවිධානය මරාගෙන මැරෙන ප්‍රහාර එල්ල කරන ආකාරය සම්බන්ධ Video පට පෙන්වා ඇති අතර ඉස්ලාම් ආගමිකයින්ට වෙනත් ජාතීන්ගෙන් සිදු වන හිරිහැර සම්බන්ධ Video පටද පෙන්වා ඇත.

ප්‍ර : ඒ බවත් ඔබ අන්තර්ගත කෙරුවා ඔය දැනට X 130 විදිහට ලකුණු කරලා ඉදිරිපත් කරන ලද වාර්තාවේ නේද?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : දැන් මම ඔබෙන් මේ කෙටි විවේකයට පෙර අද දින සාක්ෂි ඔබ ලබා දෙන්නට පටන් ගත්තට පස්සේ ඔබේ අවධානය යොමු කෙරුවා රාජ්‍ය බුද්ධි සේවය විසින් විශේෂයෙන් ඔබලා දැනුවත් කිරීමෙන් පස්සේ ඔබේ ප්‍රධාන කාර්යාලය අපරාධ පරීක්ෂණ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ තොරතුරක් පිළිබඳව. ඒ තමයි ඔබ කිව්වා ඒ තොරතුරට ඒ තොරතුර පාදක කර ගෙන 2019 මාර්තු මාසේ 07 වෙනිදා උප පොලිස් පරීක්ෂක ඩයස් ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් පාසිකුඩා නේ?

පි : පාසිකුඩා

ප්‍ර : පාසිකුඩා වලට ආවයි කියලා. ඒ අවස්ථාවේ ඔබ දුරකථනය මඟින් උප පොලිස් පරීක්ෂක ඩයස් මහතා සමඟ සම්බන්ධ වුණා. නමුත් ඔබේම නිලධාරීන් දෙදෙනෙක් ඔවුන් සමඟ සම්බන්ධීකරණය කරන්නට ඔබ අනුයුක්ත කළා කියලා කිව්වා. ඔබ වැඩිදුරටත් ඒ නිලධාරීන් දෙදෙනාගේ නම් ලියලා මේ ගරු කොමිෂන් සභාවට රහසිගතව ඉදිරිපත් කරනු ලැබුවා එහෙම නේද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම ඔබ වැඩිදුරටත් සඳහන් කෙරුවා 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා පාස්කු ප්‍රහාරයෙන් පස්සේ තමයි ආමී මොහිදීන් යන තැනැත්තාව අත්අඩංගුවට ගන්නට පුළුවන් වුණේ කියලා එහෙම කිව්වද?

පි : කිව්වා ස්වාමිනි.

ප්‍ර : ඒ කවදද?

පි : 2019/04/24

ප්‍ර : 04/24. නමුත් ඔබ කලින් දුන්න සාක්ෂිය අනුව ඔබ පැහැදිලි කරලා තියෙනවා මේ ආමී මොහිදීන් කියන තැනැත්තා සැඟවීලා සිටපු ස්ථානය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත ඔබේ නිලධාරීන් පෙන්වා සිටියේ 2019 මාර්තු මාසේ 07 වෙනිදා කියලා?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : එහෙම නම් ඔබ දැන් කියන ආකාරයට 2019 මාර්තු 07 වෙනිදා ඉඳලා 2019 අප්‍රේල් 24 වෙනිදා ඔබලා ආමී මොහිදීන්ව අත්අඩංගුවට ගන්න අවස්ථාව වන තෙක් අර තොරතුරු ලබා දුන්නට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කිසිදු නිලධාරියෙක් ආමී මොහිදීන්ව අත්අඩංගුවට ගැනීමක් සිදු කරලා තිබුණේ නෑ කියලනේ ඔබ කියන්නේ?

පි : අත්අඩංගුවට ගැනීමක් සිදු කර තිබුණේ නෑ ස්වාමිනි.

ප්‍ර : අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් අත්අඩංගුවට අරගෙන තිබුණෙත් නෑ ආමී මොහිදීන්ව ඒ වගේම වෙන කිසිත් ප්‍රාදේශීය පොලිසියකිනුත් අරගෙන තිබුණේ නෑ ඔහුව?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබ කෙටි විවේකයට පෙර ඒ වගේම සඳහන් කරනු ලැබුවා 24 වෙනිදා ආමී මොහිදීන්ව අත්අඩංගුවට ගැනීම සඳහා ඔබ ආධාර

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කෙරුවයි කියලා ඔබේ අංශය ආධාර කෙරුවයි කියලා කල්කුඩා පොලිස් ස්ථානයට ඒ නිලධාරීන්ට?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඒ අත්අඩංගුවට ගත්තට පස්සේ යම් යම් කරුණු අනාවරණය වුණාද?

පි : කරුණු අනාවරණය වුණා.

ප්‍ර : මොනවද අනාවරණය වුණු කරුණු ආමී මොහිදීන් සම්බන්ධයෙන්?

පි : ආමී මොහිදීන්ගේ දුරකථනය පරීක්ෂා කළා.

ප්‍ර : කවුද පරීක්ෂා කළේ?

පි : මම විසින් මමයි මම පරීක්ෂා කරන කොට ඒකට සහයෝගය දැක්කුවා මම රහසිගතව ලබා දුන් මගේ කලින් පෙන්නු නිලධාරියා. එතකොට ඒ Phone එකේ පරීක්ෂා කරලා බලන කොට වට්ස්ඇප් තීරුවේ අර මම මගේ නිලධාරියා දන්නවා එදා 2019/03/07 වෙනිදා නිලධාරියාව ඔහු දැකලා තියෙන නිසා ඔහු දන්නවා.

ප්‍ර : ඒ කියන්නේ උප පොලිස් පරීක්ෂක ඩයස් මහත්මයාද?

පි : නෑ.

ප්‍ර : එහෙනම් කවුද?

පි : ඔහු සමඟ පැමිණි කොස්තාපල් හරි සාජන් හරි නන්දලාල්. ඊට පස්සේ ඒ වට්ස්ඇප් එකේ Contact List එකේ මේ ආමී මොහිදීන්ගේ ඔහුගේ ඡායා රූපය සඳහන් වෙලා තිබ්බා ඒ වට්ස්ඇප් එකේ ඔහුගේ Phone එකේ පරීක්ෂා කරන කොට.

ප්‍ර : දැන් ඔබ කිව්වනේ මාර්තු 07 වෙනිදා ඔබට යන්න බැරි වුණා කියලා පාසිකුඩාවලට මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මුණ ගැහෙන්නට. එතකොට ඒ 07 වෙනිදා ආවේ මේ ආමී මොහිදීන්ගේ දුරකථනය වට්ස්ඇප් ජාලයේ තියෙන Contact එකේ පෙන්වන ඒ නන්දලාල් කියන නිලධාරියා කියන එක කවුද අඳුන ගත්තේ?

පි : ඒයා මගේ Phone එක බැලීමට සහය වුණ ඒ පෙන්නුම් කරන නිලධාරියා.

ප්‍ර : ඒ කියන්නේ ඔහු එදා 07 වෙනිදා මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ව මුණ ගැහිලා තිබ්බද?

පි : මුණ ගැහුණ නිලධාරියා.

ප්‍ර : ඒ 07 වෙනිදා උප පොලිස් පරීක්ෂක ඩයස් මහතා සමඟ නන්දලාල් කියන මේ නිලධාරී මහත්මයාත් ඇවිල්ලා තිබුණද?

පි : ඇවිල්ලා තිබ්බා ස්වාමිනි.

Provided by Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : ඔහුගේ ඡායාරූපයක් තිබුණා කියලා ඔබ කියන්නේ එතකොට ඡායාරූප විවිධ ආකාරයට තියෙන්න පුළුවන්නේ. එක Telephone Contact එකකටද තිබ්බේ නැත්නම් නිකම් Image එකක් විදිහටද තිබ්බේ මොන විදිහටද තිබ්බේ?

පි : Telephone Contact එකක් විදිහට.

ප : වෙන මොනවද අනාවරණය වුණේ?

පි : ඔහු එම අවස්ථාවේ මේ ඔහු භාර ගන්න පැමිණියෙත් මේ

ප : ඔහු භාර ගන්න කියන්නේ?

පි : ආමී මොහිදීන්ව අත්අඩංගුවට ගත්තට පසුව ඔහුව රැගෙන යාමට පැමිණියේ මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ එදා ඒ කියන්නේ 2019/03/07 පැමිණි නිලධාරීන්ම තමයි පැමිණියේ.

ප : ඒ කියන්නේ උප පොලිස් පරීක්ෂක ඩයස් ඒ වගේම ඔය

පි : නන්දලාල්

ප : නන්දලාල් කියන නිලධාරීන් තමයි පැමිණියේ?

පි : එසේය ස්වාමිනි.

ප : හැබැයි ඔබ කිව්වා අර 07 වෙනිදා මොකටද ආමී මොහිදීන්ව අත්අඩංගුවට ගන්නේ කියන එක පිළිබඳව නැත්නම් ආමී මොහිදීන් අත්අඩංගුවට ගන්න මොකක්ද තියන හේතුව කියන ප්‍රශ්නය උප පොලිස් පරීක්ෂක ඩයස් මහත්මයා ඔබේ නිලධාරී මහත්මයාගෙන් ඇසුවාය කියලා?

පි : ඇසුවා ස්වාමිනි. මොන පදනමකින්ද අත්අඩංගුවට ගන්නේ කියලා.

ප : ඒ අවස්ථාවේදී ගරු අධිකරණය විසින් මේ ආමී මොහිදීන් විෂයෙහි වරෙන්තුවක් නිකුත් කරලා තියෙන බවත් ඔය උප පොලිස් පරීක්ෂක ඩයස් මහත්මයාට දැනුම් දුන්නා කියලා ඔබ කිව්වා ඔබේ නිලධාරියා?

පි : ඔහු විතරක් නෙවෙයි මමත් දැනුම් දීලා තිබ්බා.

ප : ඔබත් කිව්වා පෞද්ගලිකව?

පි : දුරකථනයෙන් මමත් කිව්වා මගේ නිලධාරියාත් පැවසුවා වරෙන්තු තියෙනවා කියලා.

ප : දැන් එදා ඔවුන් අත්අඩංගුවට ගත්තේ නෑ. ඒ වගේම ඔබලා ආමී මොහිදීන්ව කල්කුඩා පොලිසියත් සමඟ ගිහින් අත්අඩංගුවට ගන්න තුරුත් ඔය වරෙන්තුව මත අත්අඩංගුවට ගැනීමක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වෙනත් පොලිස් ස්ථානයක් කළේ නෑ නේද?

පි : සිදු කර තිබුණේ නෑ ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : දැන් ඔබ කියන්නේ එහෙම නොකරපු මේ නිලධාරීන් දැන් නැවත ඔබලා අත්අඩංගුවට ගත්තට පස්සේ ආමී මොහිදීන් දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ එම නිලධාරීන්ම පැමිණියා ආමී මොහිදීන්ව භාර ගන්නට?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඊට පස්සේ මොකද වුණේ?

පි : අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැක්කාම මම ඒ කට්ටියට ඇහෙන්න මම කිව්වා ඔය කට්ටිය මේ එදා පෙන්නපු වේලාවේ අල්ල ගත්තා නම් මෙහෙම ප්‍රහාරයක් වෙන්නේ නෑ කියලා ඒ කට්ටියට ඇහෙන්න මං ඒ වේලාවේ පොඩ්ඩක් තරහෙන් වගේ තමයි ඒක පැවසුවේ ඒ නිලධාරීන්ට.

ප්‍ර : ඔබ විශ්වාස කරනවද ආමී මොහිදීන්ව ඔය 07 වෙනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අත්අඩංගුවට ගත්තා නම් එහෙම නම් ඔය ප්‍රහාරය යම්තාක් ආකාරයකට වළක්වා ගැනීමේ හැකියාවක් තිබුණා කියල?

පි : ඒ අවස්ථාවේ අපට ඕනේ වෙලා තිබුණේ සහරාන් සම්බන්ධව තොරතුරු ලබා ගැනීම. ඉතින් මේ ආමී මොහිදීන්ව ඒ අවස්ථාවේ අත්අඩංගුවට ගත්තා නම් මේ සම්බන්ධයෙන් යම් තොරතුරක් දැන ගන්න හැකියාව තිබුණා කියලා අපේ විශ්වාසය තියෙනවා.

ප්‍ර : ඒ අනුවද ඔබ ඔබේ අර ඒ ආකාරයට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ඇසෙන ලෙස යම් යම් දේ කිව්වා කියලා කිව්වේ?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : දැන් ඔය සිද්ධිය පිළිබඳව ඒ කියන්නේ ආමී මොහිදීන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධව ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ඔබ ලිඛිතව වාර්තා කළාද?

පි : වාර්තා කළා ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : දැන් ආමී මොහිදීන් අත්අඩංගුවට ගන්න වේලාව ගත්තායින් පස්සේ ඔය උප පොලිස් පරීක්ෂක ඩයස් සහ පොලිස් සැරයන් නන්දලාල් සම්බන්ධයෙන් යම් කිසි ප්‍රකාශයක් සිදු කිරීමක් වුණාද ඒ අවස්ථාවේදී?

පි : ඡායාරූපයේ දැක්කට පස්සේ විමසීමක් කළා අපි. විමසීමක් කළාට පස්සේ මේ ආමී මොහිදීන් කිව්වා මේ නන්දලාල් මේ ආමී මොහිදීන්ට කතා කරලා තියෙනවා මේ ප්‍රහාරයට මම සම්බන්ධ

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

නැහැ ස්වාමිනි මේ නන්දලාල්ගෙන් බොරුනම් අහලා දැන ගන්න කියලා.

ප : නන්දලාල් කියන්නේ අර පොලිස් සැරයන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ?

පි : අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ.

ප : ආමී මොහිදීන්ගේ දුරකථනයේ තිබ්බ Contact එකක් වශයෙන් හිටපු පුද්ගලයා?

පි : පුද්ගලයා.

ප : එතකොට දැන් ඔහුව භාර ගන්න උප පොලිස් පරීක්ෂක ඩයස් සහ පොලිස් සැරයන් නන්දලාල් පැමිණි පසු ඔබ ඒ සම්බන්ධයෙන් ඔවුන්ගෙන් විමසුවාද?

පි : පැමිණි නිලධාරීන්ගෙන්ද ස්වාමිනි.

ප : ඔව්.

පි : නෑ පැමිණි නිලධාරීන්ගෙන් ඒ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කැඳෙව්වේ කල්කුඩා පොලිසියෙන්. ඒ අවස්ථාව වන කොට මම ආමී මොහිදීන්ගෙන් ප්‍රශ්න කර ගෙන හිටියේ. මම ඊට පස්සේ මම ඔවුන් සමඟ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ කතා කරන්න ගියේ නෑ. නමුත් මම අර වගේ ඒ කට්ටිය මගේ ළඟින් එන කොට ඒ කට්ටියට ඇහෙන්න මම කිව්වා ඒ කට්ටිය මගෙත් එක්ක කතාවට ආවේ නෑ. මම මේ බැනලා වගේ සැරෙන් කිව්වා මේ එදා මේ කට්ටිය අත්අඩංගුවට නොගත්තා නම් මේ ප්‍රහාරය එල්ල වෙන්නේ නෑ කියලා.

ප : ඔබ ඒ බව උප පොලිස් පරීක්ෂක ඩයස්ට සහ පොලිස් සැරයන් නන්දලාල්ට කිව්වයින් පස්සේ ඔවුන්ගෙන් යම් ප්‍රතිචාරයක් ආවාද ඔබ කියපු දේට?

පි : ප්‍රතිචාරයක් දැක්කුවේ නෑ.

ප : කිසිම ප්‍රතිචාරයක් දැක්කුවේ නෑ?

පි : නෑ ස්වාමිනි .

ප : 2019 මාර්තු 07 වෙනි දින ඔබ කියන හැටියට ආමී මොහිදීන් සැඟව සිටි ස්ථානය සම්බන්ධයෙන් සියළු තොරතුරු උප පොලිස් පරීක්ෂක ඩයස්ට සහ පොලිස් සැරයන් නන්දලාල්ට ඔබගේ නිලධාරීන් සහ ඔබ විසින් ලබා දුන්නා?

පි : ලබා දුන්නා ස්වාමිනි.

ප : සැඟවී සිටපු තැනත් පෙන්වීමක් කෙරුවා?

පි : පෙන්වීමක් සිදු කළා.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : ඔබට ඒ වෙලාවේදී දැන ගන්න ලැබුණද ආමී මොහිදීන් සහ මේ සැරයන් නන්දලාල් අතර මොනවා හරි සම්බන්ධතාවක් කලින් තිබුණාය කියලා?

පි : නෑ Contact List එකේ ඒ call ඒවා බැලුවා මොනවා හරි සංවාද තිබුණාද කියලා ඒවා Delete වෙලා ඒවා මොකුත් තිබ්බේ නෑ. මොකද ඒවා List එකේ Delete කරලා වගේ තිබ්බේ ඔක්කොම. මොකුත් එහෙම සම්බන්ධ වෙලා තියෙනවා කියලා දැන ගන්න බැරි වුණා. නමුත් අර List එකේ තියෙන කොට මම ඇහුවා ඔයා කොහොමද මෙයා අඳුරන්නේ කියලා. එතකොට තමයි කිව්වේ මේ අර මේ මහත්මයාගෙන් ඕනේ නම් අහන්න මම මේකට සම්බන්ධ නෑ අහලා දැන ගන්න කියලා ආමී මොහිදීන් තමයි මට පැවසුවේ ස්වාමිනි.

ප්‍ර : ඒකට උත්තරයක් ලැබුණ?

පි : කාගෙන්ද ස්වාමිනි.

ප්‍ර : අර මේ මහත්මයාගෙන් අහන්න මම මේකට සම්බන්ධ නෑ කියලා ආමී මොහිදීන් කියන කොට සැරයන් නන්දලාගෙන් උත්තරයක් හම්බ වුණාද?

පි : සැරයන් නන්දලාල් ඒ අවස්ථාවේ එතන හිටියේ නැහැ. ඊට පස්සේ තමයි එතන භාර ගන්න ආවේ. අපි ආයේ ඒ ගැන අහන්න ගියේ නෑ ඒක අපි පොලිසියට භාර දීලා අපි එතනින් අර මම අර ඒ කට්ටියට ඇහෙන්න පැවසූ එක විතරයි කිවේ. මම ඒ කට්ටියගෙන් ප්‍රශ්න කිරීමක් කරන්න ගියේ නෑ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්.

ප්‍ර : එතකොට ආමී මොහිදීන් ඔබට කිව්ව දෙයින් ඔබට හැඟුණාද ඒ අවස්ථාවේදී ආමී මොහිදීන් සහ සැරයන් නන්දලාල් අතරේ කිසියම් හෝ මිත්‍රත්වයක් හෝ සම්බන්ධකමක් හෝ මොනවා හෝ යම් බැඳීමක් තිබුණා කියලා කලින්?

පි : බැඳීමක් තිබුණා කියලා හැඟුණා ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : 2019 මාර්තු 07 වෙනි දින ඔබ කිව්වා ආමී මොහිදීන්ගෙත් ඡායා රූපයක් ලබා දුන්නද උප පොලිස් පරීක්ෂක ඩයස්ට සහ පොලිස් සැරයන් නන්දලාල්ට?

පි : නන්දලාල්ගේ Phone එකට තමයි ආමී මොහිදීන්ගේ ඡායා රූපයක් ලබා දුන්නේ ස්වාමිනි.

ප්‍ර : ඔබද ලබා දුන්නේ?

FAIR COMMENT — BY JEZEEM

පි : මගේ නිලධාරියා.

ප්‍ර : ඒ අවස්ථාවේ පොලිස් සැරයන් නන්දලාල් ඔබගේ නිලධාරියාට නැත්නම් ඔබට යම් කිසි ප්‍රකාශයක් කෙරුවද මම මේ පුද්ගලයා දැන් වෙනකොටත් දන්නවා කියලා?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : ඒ වේලාවේ කිව්වේ නෑ?

පි : කිව්වේ නෑ ස්වාමිනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : ආමී මොහිදීන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඔය ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට අදාළ වාර්තාව ඉදිරිපත් කළේ කවදද?

පි : 2019/04/26 වෙනිදා.

ප්‍ර : 2019/04/26

ස්වාමිනි එම වාර්තාව X 131 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා.

ප්‍ර : මම මීළඟට ඔබෙන් ප්‍රශ්න අහන්නේ එම වාර්තාව පදනම් කරගෙන. ඒ වාර්තාවේ ඔබ සඳහන් කරලා තියෙනවද කල්කුඩා පොලිසියේ නිලධාරීන්ගේ සහයෝගය ඇතිව තමයි මේ තැනැත්තාව අත්අඩංගුවට ගන්නට හැකි වුණේ කියලා. ඒ කියන්නේ ආමී මොහිදීන් කියන තැනැත්තාව 2019/04/26?

පි : සඳහන් කරලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : කීයට විතරද ඔහුව අත්අඩංගුවට ගත්තේ?

පි : පැය 18.00 ට පමණ. මෙතන ඒ වේලාව සම්බන්ධයෙන් මේ Report එකේ ප්‍රශ්නයක් තියෙනවා. ඒ Report එකේ තියෙන වේලාවට කලින් තමයි අත්අඩංගුවට ගැනීම සිදු වුණේ.

ප්‍ර : ඒ කියන්නේ පැට 18.00 ට පෙර වගේ?

පි : පෙර.

ප්‍ර : ඔබ අද මීට පෙර සාක්ෂි දෙන අවස්ථාවේදී සඳහන් කෙරුවා මේ ආමී මොහිදීන් කියන තැනැත්තා ශ්‍රී ලංකා යුධ හමුදාවට සම්බන්ධ වෙලා හිටියයි කියලා. එහි කුමන අංශයකටද ඔහු සම්බන්ධ වෙලා ඉඳලා තියෙන්නේ සහ මොන අවුරුද්දෙද ඒකට බැඳිලා තියෙන්නේ?

පි : ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළ මුළුවට බැඳිලා තියෙනවා. 1994 මොහුගේ අංකය වෙලා තිබුණේ 02117. මොහු 2004 වර්ෂය දක්වා සේවය කරලා නොදන්වා සේවයෙන් ඉවත් වෙලා පොදු සමාව යටතේ නීත්‍යානුකූලව යුධ හමුදාවෙන් ඉවත් වී ඇති බව අනාවරණය වුණා.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : අනතුරුව ඔහු රැකියාව විදිහට මොකක්ද තෝරගෙන තිබිලා තියෙන්නේ?

පි : මොහු විදුලි කාර්මිකයෙකු ලෙස තමයි කාත්තන්කුඩියේ ප්‍රදේශයේ රැකියාවක් කළේ.

ප්‍ර : එතකොට අදහස් දැරීමේදී ඔහු මොන වගේ පුද්ගලයෙක්ද මොන වගේ අදහස්ද ඔහු දරලා තියෙන්නේ?

පි : මොහු ඉතා අන්තවාදී අදහස් දරන පුද්ගලයෙක්.

ප්‍ර : ඒ විදිහටද හඳුනා ගෙන තියෙන්නේ. එතකොට මොහොමඩ් සහරාන් සමඟ ඔහුගේ තිබ්බ සම්බන්ධතාවය පිළිබඳව මේ වාර්තාවේ සඳහන් වෙනවද?

පි : සංවිධානයේ නායක මොහොමඩ් සහරාන්ගේ ආගමික දේශනවලට සහභාගි වෙලා ඒ ක්‍රියාකාරී කටයුතුවලට සම්බන්ධ වෙලා සිටිය බවට සඳහන් කරලා තියෙනවා.

ප්‍ර : එතකොට ඔබ අර කිව්වනේ ඔය සාමාන්‍යයෙන් ශාරීරික අභ්‍යාස ලබා දෙනවයි කියලා මේ ආමී මොහිදීන් කියන තැනැත්තා?

පි : ඔව් ඒකත් සඳහන් කරලා තියෙනවා ස්වාමිනි. එම කාත්තන්කුඩි මුහුදු වෙරළේ ශාරීරික අභ්‍යාස පුහුණුවීම් කටයුතු මොහු සිදු කරලා තියෙනවා මේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සාමාජිකයින්ට. ඒ වගේම සිංහල භාෂාව මනාව හැසිරවීමේ හැකියාව නිසා සිංහල සංවිධානවල කටයුතු වලට එරෙහිව ඔහුගේ මූලිකත්වයෙන් යම් යම් ක්‍රියාදාමයන් ඒ කියන්නේ අන්තර්ජාලය හරහා අන්තවාදය පැතිරීම බෞද්ධ සංවිධානවලට එරෙහිව සිදු කරන බවට තොරතුරු අනාවරණය වෙනවා කියලා මේකේ සඳහන් කරලා තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු මම නැවතත් ඔබගෙන් අර කලින් අහපු සිද්ධියට ගෙනියනවා 2019 මාර්තු 07 වෙනි දින ඔබ ඒ තොරතුරු උප පොලිස් පරීක්ෂක ඩයස්ට සහ පොලිස් සැරයන් නන්දලාල්ට දෙන විට ආමී මොහිදීන්ගේ දුරකථන අංකය ඔබ ඒ දෙදෙනාට ලබා දුන්නාද?

පි : ආමී මොහිදීන්ගේ දුරකථන අංකය ස්වාමිනි ලබා දීමක් සිදු කළේ නෑ.

ප්‍ර : ලබා දීමක් සිදු කළේ නෑ?

පි : නෑ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ තොරතුරු ඔබ ඒ නිලධාරීන් දෙදෙනාට ලබා දෙන විට ඔවුන් ආමී මොහිදීන්ගේ දුරකථන අංකය ඔවුන් ගාව තියෙනවා කියලා ඔබව යම් දැනුවත් කිරීමක් කළාද ඒ අවස්ථාවේදී?

පි : නෑ ඒ සම්බන්ධයෙන් මාව දැනුවත් කිරීමක් කළේ නෑ ස්වාමිනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : එතකොට ඔබට අනාවරණය වුණාද මේ ආමී මොහිදීන් සතුව ගිනි අවි එහෙම තිබුණද කියලා?

පි : අනාවරණය වීමක් සිදු වෙලා තිබ්බා ස්වාමිනි. ඒක මං වාර්තාවේ සඳහන් කරලා තියෙනවා. මොහු සතුව මේ ආකාරයෙන් මොහු සතුව T 56 අවි දෙකක් පවතින බවට තොරතුරු අනාවරණය වී ඇති අතර එම අවි 2018/06/08 වන දින මෙතන අලියාර් case එක දින කාත්තන්කුඩි අලියාර් හංදියේ පදිංචි පුද්ගලයෙකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් දැනට මඩකලපුව බන්ධනාගාර ගතව සිටින මොහොමඩ් හුසේන් යන අයගෙන් ලබා ගත් අවි දෙකක් බවට තොරතුරු ලැබී ඇත. එම ඝාතනයටද ආමී මොහිදීන්ගේ සහයෝගය ලබා දී ඇති බවට තොරතුරු අනාවරණය වේ.

ප්‍ර : එතකොට ඔය මේ ඔබ සඳහන් කරපු හුසේන් කියන තැනැත්තා උප්පත්තියෙන්ම මුස්ලිම් ජාතිකයෙක්ද නැත්නම් පසුව ඉස්ලාම් ආගම වැළඳ ගන්නා ලද තැනැත්තෙක්ද?

පි : පසුව ඉස්ලාම් ආගම වැළඳගත් තැනැත්තෙක් ස්වාමිනි. ඒ සම්බන්ධයෙන් සඳහන් කරලා තියෙනවා වාර්තාවේ. මෙම මොහොමඩ් හුසේන් 2005 වර්ෂයේ මුස්ලිම් ආගම වැළඳගත් දෙමළ ජාතිකයෙකු වන අතර ඔහුගේ මුල් නම රවින්ද්‍රන් ගුගන් වේ.

ප්‍ර : කුගන්?

පි : ගුගන් වේ. ඔහු පොලිස් ෆායිස් කණ්ඩායම සමඟ සහ යුධ හමුදා බුද්ධි අංශ සමඟ සමීපව කටයුතු කළ පුද්ගලයෙකු වන අතර ආමී මොහිදීන් සමඟ දැඩි සම්බන්ධතාවයක් පැවැත්වූ පුද්ගලයෙක් වේ.

ප්‍ර : මොකක්ද ඔය පොලිස් ෆායිස් කියන්නේ?

පි : මේ පොලිස් ෆායිස් කියන්නේ පොලිසියේ හිටපු පොලිස් පුද්ගලයෙක්. මොහු 1990 කාත්තන්කුඩි පල්ලිවලට ගැහුවට පස්සේ මේ පොලිස් ෆායිස් Group කියලා මොහු Team එකක් හැදුවා කාත්තන්කුඩිය පදනම් කර ගෙන. ඊට පස්සේ මොහු පොලිස් සේවයෙන් ඉවත් වුණා. මොහුගේ පොලිස් ෆායිස්ගේ තාත්තා LTTE එකෙන් මරලා තිබ්බේ. පොලිස් ෆායිස්ගේ බලය තමයි ඒ කාලේ කාත්තන්කුඩිවල තිබ්බේ. මොහුගේ ඒ

FAIR COMMENT BY JEZEEM

කණ්ඩායමට කාත්තන්කුඩි කට්ටිය බිය වෙලා හිටියේ. ඒ වගේ මේ පොලිස් ෆායිස් Group එකට ආමී ඉන්ට් එකේ සහයෝගය තිබ්බා. ඊට අමතරව මොවුන් ළඟ අවි ආයුධ තිබ්බා. එතකොට මේ පොලිස් ෆායිස් Group එකේ තමයි අර මම කලින් සඳහන් කළ මිල්හාන් ඔය අවි පුහුණුව කඳවුරු වල පුහුණු කළේ. ඒ මිල්හානුත් මේ පොලිස් ෆායිස් Team එකේ හිටිය සාමාජිකයෙක්.

ප : ඔබ ඔය පිළිතුරේ කිව්වා නේද පොලිස් ෆායිස්ට Army unit එකේ සහාය තිබ්බා කියලා ආමී Int එකේ. ආ.. Army Int එකේ. ඒ කියන්නේ බුද්ධි?

පි : ඔව් යුධ හමුදා බුද්ධි අංශයේ.

ප : යුධ හමුදා බුද්ධි අංශය. ඇයි ඔය ?

පි : ඔව්. ඒක යුධ හමුදා බුද්ධි අංශය ඒ කාලේ පාවිච්චි කළේ පොලිස් ෆායිස් Team එක මේ LTTE එකට විරුද්ධව කටයුතු කරන්න නැත්නම් අන්තවාදය පැතිරෙන්න නෙවෙයි. මේ LTTE තිබ්බ කාලේ තමයි පොලිස් ෆායිස් Team එක LTTE එකට විරුද්ධව තමයි මුල් කාලයේ හිටියේ.

ප : ආ.. ඒ නිසා ඔවුන්ව

පි : යුධ හමුදා බුද්ධි අංශය පොලිස් ෆායිස් කණ්ඩායම LTTE එකට විරුද්ධව පාවිච්චි කරන්න තමයි යොදා ගත්තේ.

ප : හරි පැහැදිලියි.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප : නැහෙනහිර ජීහාඩ් සංවිධානය කියන එක ඔය පොලිස් ෆායිස් විසින් මෙහෙයවෙව්වද නැගෙනහිර ජීහාඩ් සංවිධානය කියන එක?

පි : නැගෙනහිර ජීහාඩ් සංවිධානය කියලා සංවිධානයක් තිබ්බා. පොලිස් ෆායිස් ඒ ජීහාඩ් සංවිධානයෙත් හිටියා. නමුත් ඊට පස්සේ මෙයා වෙනම පොලිස් ෆායිස් කියලා සංවිධානයක් එයා වෙනම හදාගෙන තියෙනවා.

ප : ඔහු කොයි කාලේද ඔය මිල්හාන් කියන එක්කෙනත් එක්ක සම්බන්ධ වුණේ?

පි : මිල්හාන් පොලිස් ෆායිස් රටින් යන්නේ පැනලා යන්නේ ලන්ඩන්වලට 2009 ඒ යන්න කලින් ඒ කියන්නේ 2005 ඉඳන් 2009 ට ප්‍රථම මිල්හාන් මේ පොලිස් ෆායිස් කණ්ඩායමේ ප්‍රබල සමාජිකයෙක් වෙලා හිටියා කියලා අනාවරණය වෙලා තියෙනවා ස්වාමිනි.

****

Proceedings Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : 2009 කවුද පැනලා යන්නේ මොකද පැනලා යන්නේ?

පි : පොල්ස ෆායිස් යුද්ධය ඉවර වුණාට පස්සේ මේ ආයුධ භාර දෙන්න කියලා කියනවා. පොලිස් ෆායිස්ලට දීපු. නමුත් මේ පොලිස් ෆායිස් එහෙම ආයුධ භාර දුන්නට ඔහුට ඊට පස්සේ තර්ජන ඇති වෙනවා මොකද මොවුන් කරලා තියෙන වැඩ අනුව ඔවුන්ට තර්ජන වෙයි කියලා තමයි පොලිස් ෆායිස් රට ඇරලා යන්නේ ස්වාමිනි.

ප්‍ර : දැන් පොලිස් ෆායිස් තාමත් පිරටරද ඉන්නේ?

පි : පිටරට ඉන්නේ ස්වාමිනි. බ්‍රිතාන්‍යයේ ඉන්න බවට තමයි තොරතුරු තියෙන්නේ.

ප්‍ර : 2009 න් පස්සේ ලංකාවට පැමිණිලා නැද්ද?

පි : දන්න විදිහට නම් ඇවිල්ලා නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබගේ දැනීම අනුව ආමී මොහිදීන් යම් කිසි අවස්ථාවක බුද්ධි අංශ සමඟ කටයුතු කිරීමක් සිදු කරනවද?

පි : ආමී මොහිදීන් Army බුද්ධි අංශ සමඟ මට එහෙම ස්ථිරවම කියන්න බෑ. නමුත් යම් යම් තොරතුරු වල තොරතුරක් ආවා බුද්ධි අංශවලට සහයෝගය දුන්නා කියලා නමුත් ඒක සනාථ කර ගන්න එහෙම යුධ හමුදා බුද්ධි අංශය සමඟ ළඟින් ආශ්‍රය කළා කියන තොරතුරු එහෙම ලොකුවට මට එහෙම හම්බ වෙලා නෑ ස්වාමිනි.

ප්‍ර : කොයි කාල සීමාව තුළද ඔය යම් සම්බන්ධතාවයක් තිබ්බා නම් තිබ්බා කියලා ඔබට තොරතුරු ලැබෙන්නේ?

පි : ආමී මොහිදීන් ස්වාමිනි මේ 2009 ට ඒ කියන්නේ යුද්ධ පැවැති කාලයේ.

ප්‍ර : ඊට පසුව?

පි : ඊට පස්සේ ආමී යුධ හමුදාවත් එක්ක එහෙම මට හරියටම කීමට තරම් තොරතුරක් ලැබිලා නෑ ස්වාමිනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : දැන් ඔබ සඳහන් කළානේ මේ ආමී මොහිදීන් හොඳින්ම දන්න රවීන්ද්‍රන් කෑගන් කියලා කලින් දෙමළ ජාතිකයෙක් වුණ පසුව ඉස්ලාම් ආගම වැළඳගත්තට පස්සේ මොහොමඩ් හුසේන් වුණ තැනැත්තා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔහු යම් මැතිවරණයකට තරඟ කරලා තියෙනවද?

පි : 2015 මහ මැතිවරණයේදී ස්වාධීන කණ්ඩායම.

ප්‍ර : කුමන දිස්ත්‍රික්කයකින්ද?

FAIR COMMENT — BY JEZEEM —

පි : මඩකලපුව දිස්ත්‍රික්කයෙන්. ආමී මොහිදීන් සම්බන්ධව තව දෙයක් අනාවරණය වෙනවා මේ සිබ්ලි ෆාරුක්ගේ ළඟින්ම ආශ්‍රය කරලා තියෙනවා මේ ආමී මොහිදීන් කියන පුද්ගලයා.

ප්‍ර : සිබ්ලි ෆාරුක් කියලා කියන්නේ දේශපාලඥයෙක්?

පි : දේශපාලඥයෙක්. ඔහුගේ රියදුරු වශයෙනුත් ටික කාලයක් ආමී මොහිදීන් කටයුතු කරලා තියෙනවා.

ප්‍ර : මොන වකවානුවේද කියලා ඔබට කියන්න පුළුවන්ද සහ සිබ්ලි ෆාරුක් මොන පක්ෂයෙන්ද කියලා කියන්න පුළුවන්ද ?

පි : සිබ්ලි ෆාරුක් ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රස්.

ප්‍ර : ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය. එතකොට මොන වකවානුවේ වගේද ආමී මොහිදීන් මේ මුස්ලිම් කොංග්‍රස් දේශපාලඥයා වූ සිබ්ලි ෆාරුක් මහතාගේ රියදුරා විදිහට සේවය කරලා තියෙන්නේ?

පි : 2015/16 වගේ කාල වල ඔහු ස්ථිර රියදුරු නෙවෙයි නමුත් සිබ්ලි ෆාරුක්ගේ රියදුරු වශයෙන් කටයුතු කරලා තියෙනවා.

ප්‍ර : සේවය ලබා දීලා තියෙනවා?

පි : ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ඔබ දැන් සඳහන් කරන්නට යෙදුණු සිබ්ලි ෆාරුක් කියන තැනැත්තා යම් අන්තවාදී තැනැත්තන් සමඟ සම්බන්ධතාවයක් පවත්වාගෙන ගියාද නැද්ද කියන එක සම්බන්ධයෙන් තොරතුරු වෙනත් තොරතුරු තියෙනවද?

පි : මේ ජාතික තවුහිද් ජමාත් සංවිධානය සමඟ ළඟින් ආශ්‍රය කරපු පුද්ගලයෙක් තමයි මේ සිබ්ලි ෆාරුක් කියන පුද්ගලයා. මේ 2017/03/17 අලියාර් case එකේදී සුන්නතු වල් ජමාත් එකයි ජාතික තවුහිද් ජමාත්ගේ මේ සහරාන්ගේ Team එකයි ගහ ගත්ත වෙලාවේ මේ සහරාන්ව ආරක්ෂිතව වාහනයේ දාගෙන ගිහිල්ලා සිබ්ලි ෆාරුක්ගේ ගෙදර නවත්ව ගෙන හිටියා කියලා තොරතුරක් ලැබිලා තියෙනවා ස්වාමිනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : අර X 130 ලෙස ඔබ ලකුණු කරලා ඉදිරිපත් කරන ලද කඳවුරු වල තැනැත්තන් පුහුණු කිරීම සම්බන්ධයෙන් වූ වාර්තාව ගැනයි මා ඔබෙන් වැඩිදුරටත් ප්‍රශ්න කරන්නේ. ඔබ එම වාර්තාව සමඟ ඉදිරිපත් කරලා තියෙනවද මේ කඳවුරු වල පුහුණු වුවා බවට හෙළි වුණ පුද්ගලයින්ව?

පි : හෙළි කරලා තියෙනවා ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප : ඒ කවුද නම කියන්න කඳවුර කියන්න අන්වර්ථ නාමයත් තියෙනවා නම් එයත් කියන්න?

පි : 2019/08/03 වෙනිදා ඉඳන් 2019/08/23 වෙනිදා දක්වා අම්පාර මුලස්ථාන පොලිසියේ සහයෝගය ඇතිව මේ ජමාතේ මිල්ලති ඊබ්‍රහීම් සංවිධානයේ සාමාජිකයින් අපි 18 ක් අත්අඩංගුවට ගත්තා. මේ 18 දෙනා ලංකාවේ විවිධ පැතිවල ව්‍යාප්ත වෙලා හිටිය පිරිස. මේකෙන් හිටපු තැනැත්තෙක් තමයි මොහොමඩ් ඉස්මයිල් මොහොමඩ් සල්මාන්.

ප : මොන කඳවුරේද ඔහු පුහුණු වෙලා තිබෙන බවට අනාවරණය වුණේ?

පි : හම්බන්තොට කඳවුරේ. මොහු පදිංචිය අනුරාධපුරේ. ඊට අමතරව මේ සියළු දෙනාම ස්වාමිනි

ප : අපිට කියන්නකෝ නමයි කඳවුරයි?

ස්වාමිනි දැනටමත් මේ X 130 කියන ලේඛනයට මේ කඳවුරු වල පුහුණුව ලැබූ බවට අනාවරණය වූ තැනැතන්ගේ ඡායා රූප ඇතුළත් වෙලා තියෙනවා. නමුත් මේ අය කවුද කුමන කඳවුරුවලද පුහුණු වෙලා තියෙන්නේ කියන එක බැලූ බැල්මට දැන ගැනීම සඳහා වාර්තාවේ සටහන් කිරීමට සාක්ෂිකරුගෙන් ඒ තොරතරු මේ අවස්ථාවේදී කෙටියෙන් ලබා ගන්නට අපේක්ෂා කරනවා.

ප : තැනැත්තගේ නම කියන්න පුහුණුව ලබපු එක්කෙනාගේ මොන කඳවුරේද කියලා කියන්න?

පි : මොහොමඩ් ඉස්මයිල් මොහොමඩ් සල්මාන් - හම්බන්තොට කඳවුර

මොහොමදු හුසනාර් මොහොමදු නවුසාඩ් - නුවරඑළිය කඳවුර

ප : එතකොට අන්වර්ථ නාමයක් තියෙනවද ඔහුට?

පි : අබුතුරෙයි බා.

මොහොමදු ඉස්මයිල් මොහොමඩ් සල්මාන් - නුවරඑළිය කඳවුර අබුහල්ලලා.

ප : අබුහල්ලලා?

පි : අබුහල්ලලා .

මොහොමඩ් මන්සුර් සෙයිෆුල්ලා - නුවරඑළිය කඳවුර අබුසාහීඩ්

මුස්තාක් අලිඅම්හර් - නුවරඑළිය කඳවුර - අබුහින්ත්

මොහොමදු තාහීර් හිදයිතුල්ලා - නුවරඑළිය කඳවුර - අබුතුරාෆ්

මොහොමඩ් රියාල් මොහොමඩ් සාජීත් - නුවරඑළිය කඳවුර - අබුසල්මාන්

මොහොමඩ් රම්සීන් රුස්දි අහමඩ් - හම්බන්තොට කඳවුර - අබුඅල්වකාර්

මොහිදීන් බාවා මොහොමඩ් රුමී - නුවරඑළිය කඳවු - අබු අබ්‍රාන්

අබ්දුල් හලීම් මොහොමඩ් හීමාස් - අබු මිත්තා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මොන කඳවුරද?

පි : හම්බන්තොට කඳවුර

හිස්බුල්ලා කාන් හුස්නි අහමඩ් - නුවරඑළිය කඳවුර - අබුහම්දා

මොහොමඩ් කාසීම් මොහොමඩ් අකීල් - නුවරඑළිය කඳවුර - අබුසුලෙයිමාන්

මොහොමඩ් නවුෆර් අබ්දුල්ලා - නුවරඑළිය කඳවුර - අබුහසාම්

මොහොමඩ් සාහීර් මොහොම්මදු අක්සන් - නුවරඑළිය කඳවුර - අබුඅමාරා

මොහොමඩ් මොහොමදු අවුතාක් අනීස් මොහොමඩ් - නුවරඑළිය කඳවුර - අබුසුබෙයිර්

මොහොමඩ් රෆායිඩීන් මොහොමඩ් අලී - නුවරඑළිය කඳවුර - අබුඉක්‍රීමා

මොහොමදු රයිසුද්දීන් අබ්දුල් රහමත් - නුවරඑළිය කඳවුර - අබුඅනස්

සෙයිනුල් ආබිදීන් හෆ්සල් - හම්බන්තොට කඳවුර - අබුරාව

ප්‍ර : බොහොම ස්තූතියි. මීළඟට මා කැමති ඔබෙන් දැන ගන්නට ඔබට කියන්නට පුළුවන්ද ඔබලා 21 වෙනිදා ප්‍රහාරයෙන් පස්සේ දෙවෙනි ප්‍රහාරයක් වැළැක්වීමේ පරමාර්ථයෙන් කරුණු සොයා බලා සැක මත පුද්ගලයින් අත්අඩංගුවට ගත්තා. අනාවරණය වූ කරුණු මත යම් පුපුරන ද්‍රව්‍ය සහ තවත් නඩු භාණ්ඩ ඔබේ පොලිස් නිලධාරීන්ගේ මැදිහත් වීමෙන් භාරයට ගත්තා. ඒ අවස්ථාවේදී ඔළුවිල් ප්‍රදේශයේ පුපුරණ ද්‍රව්‍ය තොගයක් සොයා ගැනීමක් කෙරුවද කියලා?

පි : සොයා ගැනීමක් සිදු කළා ස්වාමිනි.

ප්‍ර : ඒ කවදද?

පි : 2019/09/18.

ප්‍ර : 09/18. කීයට විතරද?

පි : පැය 09.30 ට.

ප්‍ර : විතර?

පි : විතර.

ප්‍ර : කාගෙන්ද ඔය තොරතුරු ලැබුණේ?

පි : මේක තොරතුරු පුද්ගලික තොරතුරු කාරයෙක්ගෙන්.

ප්‍ර : කොහේ තිබිලද එතකොට ඕක හම්බ වුණේ හරිටයම කොහේ තිබිලද?

පි : මේක කල්මිසියම් නැත්නම් සාවුල් හමිදු හමීස් මොහොමදු නොහොත් කල්මුණේ ශ්‍රීයාම්ගේ අනුගාමිකයෙකු වන අංක 366/2න් 1 තෙක්කා වීදිය, කල්මුණ 07 ලිපිනයේ පදිංචි සාලී මොහොමඩ් නලීමියා යන අයට අයත් මේ ඉඩම ඔළුවිල්වල ඉඩම

President's Secretary's COPY
FAIR COMMENT BY JEZEEM

තිබියදී ඉඩමේ වළදා තිබියදී තමයි මෙම පුපුරන ද්‍රව්‍ය හොයා ගත්තේ.

ප්‍ර : මොන මොනවද හම්බ වුණේ ඔතනදී?

පි : T 56 ගිනි අවි 01 යි, T 56 උණ්ඩ 23 යි, පතුරම් ගැබ් 01 යි, ජෙලඩ් නයිට් කූරු 04 යි, ඇමෝනියා 2KG ක් සමඟ අඩංගු ඉටි බෑග් 01 යි, යූරියා 3KG කින් යුත් ඉටි බෑග් 01 යි, කහ පැහැති ඉටි කොළයක ඔතන ලද හඳුනා නොගත් පුපුරන ද්‍රව්‍ය 500g සහ හඳුනා නොගත් පුපුරන ද්‍රව්‍ය 100gක් පමණ වටිනා වර්ග 2 යි, විදුලි පරිපථ 03 යි, ඩෙටනේටර් 07 යි, සුවිච් 01 යි, බයිසිකල් බෝල පැකට් 02 යි, කළු සහ රතු කුඩා වයර් රෝල 02 යි, කුඩා හතරැස් රතු පැහැති ඔරලෝසු 02 යි, බැටරී 01 යි, සෙලෝටේප් 01 යි, ඉටිපන්දම් 02 යි, ගිනිපෙට්ටි 05 යි.

ප්‍ර : ඒ සොයා ගන්නා ලද ද්‍රව්‍යවල ඡායාරූප එහෙම ගත්තද?

පි : ලබා ගත්තා ස්වාමිනි.

ප්‍ර : ඔබට දැන් එය ඉදිරිපත් කරන්න පුළුවන්ද?

ස්වාමිනි ඡායාරූපයක් සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා.

පි : පුළුවන් ස්වාමිනි.

ප්‍ර : මේ ඡායාරූපය ඔබ අඳුනනවද?

පි : අඳුරනවා ස්වාමිනි.

ප්‍ර : කොයි අවස්ථාවේ ඒ ඡායාරූපය ගත්තේ ?

පි : 2019/09/18 අප විසින් ඔළුවිල් වලින් හොයා ගත්ත ද්‍රව්‍ය.

ප්‍ර : එහෙනම් මේ ඡායා රූප තුනක් තියෙනවා නේද ඔය රූප රාමුවේ ඔබට එයින් එකක් විස්තර කරන්න පුළුවන්ද?

පි : මේ මඩුව යට තමයි මේ පුපුරන ද්‍රව්‍ය පළවෙනි එකෙන් තියෙන්නේ පෙන්නුම් කරන්නේ මඩුවක් තියෙන ආකාරය.

ප්‍ර : ඒ කියන්නේ ඒකේ භූමියේද වළලලා තිබ්බේ?

පි : භූමිය. දෙවෙනි ඡායා රූපයෙන් තියෙන්නේ T 56 අවිය මතු වෙලා තියෙන ආකාරය ඒක අපි ගන්න ප්‍රථම. ඊට පස්සේ ඡායා රූපවලින් තියෙන්නේ ඔක්කොම හොයා ගත්තට පස්සේ තියෙන ආකාරය.

ප්‍ර : ගොඩ ගන්නා ලද නඩු භාණ්ඩ?

පි : ඔව්.

ප්‍ර : නේද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඔය සම්බන්ධයෙන් ඔබ ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කළාද?

පි : ඉදිරිපත් කරලා තියෙනවා ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප : කවදද?

පි : 2019/09/19

ස්වාමිනි එම වාර්තාව X 132 වශයෙනුත් සාක්ෂිකරු විසින් පෙන්වන ලද එම ඡායා රූපය X 132 (A) වශයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කරන්නට අවසර පතනවා.

ප : මීළඟට මා ඔබේ අවධානය යොමු කරන්නේ ඔබ අර කලින් සඳහන් කරන ලද පුහුණුවීම් කඳවුරු පැවැත්වුවාය කියන ස්ථාන පිළිබඳව. එහිදී ඔබ කිව්වා නුවරඑළියේ දී ස්ථාන දෙකක පුහුණුවීම් කඳවුරු පවත්වා තිබුණු බවට ඔබට කරුණු සොයා ගන්නට පුළුවන් වුණා කියලා. ඔබට කියන්නට පුළුවන්ද ඒ මොන මොන ස්ථානවලද කියලා?

පි : පුළුවන් ස්වාමිනි.

ප : මොනවද ඒ ස්ථාන?

පි : නුවරඑළියේ බ්ලැක්ෆුල් එක ස්ථානයක්.

ප : අනික?

පි : අනික් ස්ථානය නුවරඑළියේ ශාන්තිපුරම්.

ප : ශාන්ති පුරම් අනිත් එක. දැන් ඔය ස්ථාන කිසිවක ඔබ ඡායාරූප ලබා ගෙන තිබ්බද?

පි : ලබා ගෙන තිබුණා ස්වාමිනි.

ප : මොන ස්ථානවලද ඔබ ඡායාරූප ලබා ගත්තේ? මොන ආරක්ෂිත නිවාසයේද නැත්නම් නිවාස වලද?

පි : මේ පුහුණු කඳවුරුවලින් නුවරඑළිය බ්ලැක්ෆුල් පුහුණු කඳවුරයි. හම්බන්තොට පුහුණු කඳවුරයි හොයා ගත්තේ අප විසින් ලබා දුන් තොරතුරු මත. මේකෙන් මේ නුවරඑළිය බ්ලැක්ෆුල් පුහුණු කඳවුර අපි තොරතුරු ලබා දුන්නත් හොයා ගන්න අපහසු වුණා නුවරඑළිය පොලිස් නිලධාරීන්ට එම නිසා අපේ තොරතුරුකාරයියි මා ඇතුළු කණ්ඩායමක් ගිහිල්ලා තමයි මේ නුවරඑළිය බ්ලැක්ෆුල් පුහුණු කඳවුර හොයා ගත්තේ.

ප : එතකොට හම්බන්තොට පුහුණු කඳවුරත් ඔබලාට දැක බලා ගන්න පුළුවන් වුණාද?

පි : හම්බන්තොට පුහුණු කඳවුර අපි ඒ අදාළ සැකකරුගෙන් ප්‍රශ්න කරලා ඒ තොරතුරු මත මේ අම්පාර කොට්ඨාශ පොලිස් අධිකාරි සාමන්ත වීරසේකර මහත්මයා ඒ හම්බන්තොට පොලිස් අධිකාරිතුමාට දුරකථනයෙන් දැනුම් දීමක් මත ඒ දුරකථනයෙන් අදාළ ස්ථානය පවසලා තමයි ඒ අදාළ ස්ථානය හොයා ගත්තේ.

ප : ඔබට ඒවායේ ඡායාරූප මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමිනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : එහෙනම් ඉදිරිපත් කරන්නකෝ බිලැක්ෆුල් පුහුණු කඳවුර පැවැත්වූ නිවස. ඒ තුනම එකට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමිනි.

ස්වාමිනි රූපරාමුවක් පෙන්වනවා.

ප : එතකොට දැන් මේ තිරයේ දැක්වෙන ඡායාරූපවලින් උඩ පෙන්වනවා නේද නිවාසයක් ඒ නිවාසය මොකක්ද?

පි : බිලැක්ෆුල් පුහුණු කඳවුර.

ප : දකුණු පැත්තේ උඩ?

පි : නුවරඑළිය බිලැක්ෆුල් පිහිටි පුහුණු කඳවුර ස්වාමිනි.

ප : ඊට පස්සේ අර ඒ රූප රාමුවේ වම් පැත්තේ පල්ලෙහා පෙන්වන ස්ථානය?

පි : නුවරඑළිය ශාන්තිපුර පුහුණු කඳවුර.

ප : එතකොට දකුණු පැත්තේ පෙන්වන්නේ?

පි : හම්බන්තොට පුහුණු කඳවුර.

ප : ඔබ කියන්නේ මේ ස්ථාන තුනටම ඔබ පෞද්ගලිකව සහ භෞතිකව ගිහිල්ලා ඒවා නැරඹූ බවද?

පි : මම මෙකෙන් බිලැක්ෆුල් පුහුණු කඳවුරයි හම්බන්තොට පුහුණු කඳවුරයි සොයා ගත්තේ අපි විසින් ලබා දුන් තොරතුරු මත. මේ නුවරඑළියේ බිලැක්ෆුල් පුහුණු කඳවුර හොයා ගන්න බැරි වුණ නිසා ඒක වැටලීමට මම පෞද්ගලිකව සහභාගි වෙලා තමයි ඒ කඳවුර හොයා ගත්තේ. ඊට අමතරව හම්බන්තොට පුහුණු කඳවුර ඒ අදාළ තොරතුරු අපි දුරකථනය මාර්ගයෙන් අදාළ හම්බන්තොට කොට්ඨාශ පොලිස් අධිකාරිතුමාට දැනුම් දුන්නට පස්සේ තමයි

ප : විජේසේකර මහත්මයාට කියලා

පි : ඒක හොයා ගත්තේ.

ස්වාමිනි මේ පුහුණුවීම් පවත්වන ලද බවට තොරතුරු අනාවරණය වුණ මේ ස්ථාන තුනම දක්වන මේ රූප රාමුවේ මුද්‍රිත පිටපත C 934 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප : ඔබට මතකයි නේද සහරාන්ට සහෝදරියක් හිටියා මිය ගියේ නැති?

පි : මතකයි ස්වාමිනි.

ප : ඔය පිපිරීමෙන් මිය ගිය නැති සහෝදරියක් හිටියනේ නේද?

පි : මතකයි ස්වාමිනි.

ප : ඒ සහෝදරියගේ නම මොකක්ද?

පි : මදනියා.

ප : මදනියාගේ ස්වාමි පුරුෂයාගේ නම මොකක්ද?

පි : නියාස්.

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මොන නියාස්ද දැන් නියාස් කෙනෙක් ගැන අපි මීට ඉස්සෙල්ලත් අපි දැන ගෙන තියෙනවා අර අංක 183B, වෝලිවේරියන් නිවාස සංකීර්ණයේ ඉදිරිපස ගේ ඉස්සරහා වෙඩි වැදිලා මැරිලා හිටියා එයාත් නියාස්. එහෙනම් කියන්නකෝ ඔය ඔබ කියන මදනියාගේ නියාස්ගේ නම මොකක්ද කියලා?

පි : ඔය වාර්තාවේ ස්වාමිනි පොඩි වැරැද්දක් තියෙනවා. මොකද ඕකේ මදනියාගේ ස්වාමි පුරුෂයත් මොහොමදු නියාස්. අර සයින්දමර්දු වොලිවොරියම් ග්‍රාමයේ ගෙවල් ගත්ත පුද්ගලයාගේ නමත් මොහොමදු නියාස්. නමුත් මේ සියළු නිවාස කුලියට ගත්තේ අර සයින්දමර්දුර් වල මැරිච්ච මොහොමදු නියාස්. ඔය වාර්තාවේ අර වරහන් ඇතුලේ දාලා තියෙන එක ඒක සහරාන්ගේ සහෝදරියගේ මොහොමදු නියාස් නෙවෙයි. නිවැරදි වෙන්න ඕනේ සයින්දමර්දු වොලිවොරියම් ග්‍රාමයේ මැරිච්ච මොහොමදු නියාස් විදිහට.

ප්‍ර : හරි එහෙනම් අපි ඒක කරුණක් විදිහට කියමුකෝ වාර්තාවක් විදිහට නැතුව. ඔබට කියන්න පුළුවන්ද ගරු කොමිෂන් සභාවට ඔය 21 වෙනිදා ප්‍රහාරයෙන් පස්සේ යම් අවස්ථාවකදී මදනියාගේ ස්වාමි පුරුෂයා වන මොහොමඩ් සරීෆ් නියාස් කියන තැනැත්තාගේ තොරතුරක් මත යම් මුදල් ගනුදෙනුවක් සම්බන්ධයෙන් යම් දේපලක් මිලදී ගන්නට කරුණු හෙළි වුණාද කියලා?

පි : කරුණු හෙළි වුණා ස්වාමිනි.

ප්‍ර : මොකක්ද හෙළි වුණ කරුණ?

පි : මෙම දෙවෙනි ප්‍රහාරයට සුදානම් වෙලා පැමිණි මේ පිරිස රැඳී සිටීමට නිවසක් දැන් අර කලින් අපි හොයා ගත්ත ගෙවල් ඔක්කොම කුලියට ලබා ගත්ත ගෙවල්.

ප්‍ර : ආරක්ෂිත නිවාස ඔක්කොම කුලියට?

පි : ආරක්ෂිත නිවාස නමුත් මොවුන් නිවසක් සල්ලිවලට ගැනීමට අත්තිකාරම් මුදලක් දීලා තිබ්බා.

ප්‍ර : කොහේද ඒ නිවස මිලදී ගන්න ඔවුන් හදලා තිබ්බේ?

පි : පාලමුනෙයි.

ප්‍ර : පාලමුනෙයි. පාලමුනවල් දෙකක් තියෙනවා නේද ඔය නැගෙනහිර පළාතේ?

පි : නැගෙනහිර පළාතේ.

ප්‍ර : කොහේද ඒ පාලමුනෙයි?

පි : අඩ්ඩාලච්චේන පාලමුනෙයි. ඒකට රුපියල් 10,000 ක මුදලක් අත්තිකාරකම් මුදලක් ලබා දීලා තිබුණා.

ප්‍ර : කවුද දීලා තියෙන්නේ?

පි : මොහොමදු නියාස්.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ අර මදනියාගේ ස්වාමි පුරුෂයා?

පි : ඒක නිවැරදි වෙන්න ඕනේ මදනියාගේ ස්වාමි පුරුෂයා නෙවෙයි මේකේ සඳහන් කරලා තියෙන්නේ ඒ විදිහට නමුත් මේ මදනියාගේ ස්වාමි පුරුෂයා නෙවෙයි ඒක නිවැරදි වෙන්න ඕනේ සයින්දමර්දු වල වෙඩි වැදිලා හිටිය මොහොමදු නියාස් කියලා.

ප්‍ර : ඔහු තමයි එතකොට අර සමන්තුරේ ගෙදර ගන්න කුලියට සල්ලි දුන්නේ, නින්දවුර් ආරක්ෂිත නිවාසය සඳහා කුලියට දුන්නේ. නින්දවුර් නිවාසයේ තිබුණ ලියා පදිංචි නොකළ වාහනය මිලදී අරගෙන තිබුණේ එතකොට සයින්දමර්දුවල තිබුණ නිවාසය කුලියට ගන්නට කටයුතු කරලා තිබ්බේ

පි : මේ සියළු දේවල්වලට සල්ලි දීලා තිබ්බේ මේ මොහොමදු නියාස්. මොහු තමයි මේ නිවසටත් මුදල් දීලා තිබ්බේ අත්තිකාරම් මුදලක්. මේ නිවස ගන්න හිටියේ අපි වැටලීම් සිදු කර දිනයට පස්සේ දවසේ තමයි ඒ කියන්නේ 2019/04/27 වෙනි දින තමයි මේ ගෙදර ගන්න මේ කට්ටිය හිතන් හිටියේ. එතකම් අත්තිකාරම් මුදලක් තමයි 10000 ක් දීලා තිබ්බේ. ඉතින් ඊට පස්සේ මේක මේ නිවස මේ කට්ටිය අපි වැටලීම් සිදු කරලා මිය ගිය නිසා ගන්න නොහැකි වුණා.

ප්‍ර : කොහොමත් ඔහු මිය ගියානේ?

පි : ඔව් මිය ගිය නිසා 26 වෙනිදා 27 වෙනිදා නිවස මිලදී ගැනීමට නොහැකි වුණා.

ප්‍ර : ගන්නට බැරි වුණා?

පි : ඔව්.

ප්‍ර : ආ.... ඔබ වැටලීම කියලා කිව්වේ අර 26 වෙනිදා ගිහිල්ලා කරපු එක නේද?

පි : එසේය ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ඔබට ලැබුණු තොරතුරු අනුව ඔය නියාස් ඒ කියන්නේ සයින්දමර්දුවල මිය ගිය තැනැත්තා. සයින්දමර්දු අර නිවසේ මිය ගියේ නින්දවුර් ආරක්ෂිත නිවාස එහෙම ලබා ගත්තු තැනැත්තා?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : එහි තිබ්බ වාහනය එහෙම මිලදී ගත්තු තැනැත්තා. ඒ නියාස්ට ඒ සියළු වැඩ කරන්න සල්ලි කොහෙන්ද ලැබුණේ?

පි : නියාස්ට දන්න විදිහට මේ සල්ලි ෂයිනි තමයි ලබා දීලා තිබ්බේ. මොහොමදු නියාස් ලංකාවට ආවේ 2019/03/14 කටාර්වල තමයි මෙයා Job එකක් කළේ. මේයා ආවේ 2019/03/14 තමයි ලංකාවට

FAIR COMMENT — BY JEZEEM —

ආවේ. ඊට පස්සේ අපට මේයා ඉස්සෙල්ලම කාත්තන්කුඩියේ ඉඳන් අම්පාරට ආවේ 2019/03 වෙනි මාසේ අන්තිමට. ඒ කියන්නේ 14 ඇවිල්ලා 30 වගේ තමයි මෙයා අම්පාරට ආවේ. අම්පාරට ඇවිල්ලා ඉස්සෙල්ලම අම්පාරේ කල්මුණ see bees කියල හෝටලයක් තියෙනවා. ඒ හෝටලයට යාබදව නිවසක් කුලියට අරගෙන ඒකේ නැවතිලා ඉන්න කොට මේ ෂයිනි කියලා තිබ්බා කල්මුණ ෂියාම්ට අම්පාරේ නායකයාට කියලා තිබ්බා නියාස් එක්ක එකතු වෙලා අවශ්‍ය නිවාසයි වාහනයි මිලදි ගන්න කියලා. එතකොට මේ මොහොමදු නියාස්ට ඒ සම්බන්ධව සම්බන්ධීකරණය කළේ ෂයිනි කියලා තමයි වාර්තා වෙන්නේ ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : ඔබ සඳහන් කළානේ මේ නියාස් කියන පුද්ගලයා අප්‍රේල් මාසේ 27 වෙනි දින යන්න නිවසකට අත්තිකාරමක් බැන්දා කියලා?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : කොයි නිවාසයද ඔබ සඳහන් කරන්නේ අක්කර 07 ක රවුම් කියලා එක්කෙනෙකුට අයිති ඉඩමකට යන්න මේ ගොල්ලො සැලසුම් කළා කියලා ඒ ස්ථානයමද මේ?

පි : ඒ රවුම්ගේ ඉඩම තියෙන්නේ ඔල්ලිකුලම්. ඒ කාත්තන්කුඩි. මේක මේ නිවස තියෙන්නේ අම්පාර අඩ්ඩාලච්චේන පාලමුණ.

ප්‍ර : එතකොට මේ රවුම්ගේ අක්කර 7 ක ඉඩම කියන එක මොකක්ද කියලා ඔබට විස්තර කරන්න පුළුවන්ද?

පි : ඒක රවුම්ගේ අක්කර 7 ක ඉඩම තියෙන්නේ කාත්තන්කුඩි ප්‍රදේශයේ ඉඳන් අම්පාර දෙසට එනකොට කොක්කඩිචෝල පැත්තට වෙන්න අක්කර හයක විතර ඉඩමක් තියෙනවා. ඒක ස්වාමිනි ඒක වෙනම ඉඩමක් අක්කර 6 ක විතර. ඒකෙත් පසුව සෝදිස්සී කිරීම්වලදී මේ පුපුරන ද්‍රව්‍ය මිල්හාන් විසින් වළදාලා තිබ්බ පුපුරන ද්‍රව්‍යයක් හොයා ගත්තා.

ප්‍ර : කොතරම් ප්‍රමාණයක්ද පුපුරන ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් හොයා ගත්තද එතනත් තිබ්ලා සහ මෙම අක්කර 7 ක ඉඩම සහ නිවස Safe House එකක් හැටියට ගත්ත එකක්ද?

පි : ඔව් Safe House එකක්. රිල්වාන් මේ රවුම්ගේ ඉඩමේ තමයි මේ අර මම කලින් සඳහන් කළා අර 2018 පුර්කාන් පල්ලියේ බෝක්කු පුපුරන්න ගිහිල්ලා තුවාල වුණා කියලා. ඉස්සෙල්ලම මෙයාව ගෙනාවේ ඔල්ලිකුලම් රවුම්ගේ ඉඩමට. ඊට පස්සේ මිල්හාන් තමයි කොළඹ ගෙනල්ලා තියෙනවා කියලා ආරංචි වුණේ

ස්වාමිනි. මේක මේ කට්ටිය Safe House එකක් විදිහට තමයි භාවිතා කරලා තියෙන්නේ.

ප්‍ර : මේක බදු ගත්ත ඉඩමක්ද නැත්නම් සම්පූර්ණයෙන්ම මිලදී ගත්ත ඉඩමක්ද?

පි : මේක රවුෆ්ට අයිති ඉඩමක්.

ප්‍ර : රවුෆ්ට අයිති ඉඩමක්?

පි : ඔව්.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : ඔබට මතකද මේ නියාස් කොපමණ කාලයක් විදේශ ගතව හිටියද කියලා?

පි : පුළුවන් ස්වාමිනි. මොහොමදු නියාස් 2017/03/19 ගිහිල්ලා 2019/03/14 එනවා. ඊට ප්‍රථම මම දන්න විදිහට ගිහිල්ලා තියෙනවා. අවසාන වශයෙන් 2017/03/19 ගිහිල්ලා එන්නේ 2019/03/14 වෙනි දින.

ප්‍ර : ඒ කියන්නේ අවුරුදු 2 ක් ඉඳලා ඇවිල්ලා තියෙන්නේ? එතකොට ඔබ සොයා ගත්තු විමර්ශන තොරතුරු අනුව ඔබට ලැබිච්චි තොරතුරු අනුව මේ නියාස් සහරාන් එක්කද වැඩියෙන්ම සම්බන්ධ එහෙම නැත්නම් ෂයිනි එක්කද?

පි : මේ දෙදෙනාත් එක්කම සම්බන්ධයි.

ප්‍ර : ලංකාවට එන්නේ මේ අය එක්ක මොනවා හරි මේ විදිහ විනාශයක් කිරීමේ අරමුණ ඇතිව කියලා තොරතුරු ලැබුණද?

පි : මේ මොහොමදු නියාස් කලින් ඉඳන්ම රට ඉන්න කාලේ අපි Monitor කරන් හිටියා අන්තර්ජාලය හරහා අන්තවාදය වපුරලා තිබ්බේ. අපි මෙයාගේ කටයුතු දැන ගෙන හිටියා රට ඉන්න කාලේත් වෙන වෙන අන්තර්ජාල මාධ්‍යය හරහා මේවා එක එක share කර ගෙන තිබ්බේ. මේක මොහොමදු නියාස් 03/14 එන්නෙම සහරාන්ගේ හරි ෂයිනිගේ හරි මේ ප්‍රහාරයම target කරන් කියලා තමයි පෙන්නේ ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔහුත් මේ මරාගෙන මැරෙන්න ලැස්ති වෙලා හිටපු කෙනෙක්ද එහෙම නැත්නම් ඔහුට මේ අහම්බෙන් මැරෙන්න සිද්ධ වෙච්ච දෙයක්ද?

පි : මරාගෙන මැරෙන්න සිද්ධ වෙච්ච.

දැන් වේලාව : ප.ව.05.50 යි.

මෙතැන් සිට ල/ලේ :- සචිනි මෙය.

FAIR COMMENT BY JEZEEM

වෙලාව: ප.ව 05.50
පෙර සටහන් : මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: ඔබ ඔය කිව්ව අවස්ථාවල් වලදී සොයාගනු ලැබූ නඩු භාණ්ඩ වලට අමතර 2019/05 වැනි මස 04 වන දින තව වැඩිදුරටත් සොයා ගැනීමක් සිදු කරනු ලැබුව ද පුපුරන ද්‍රව්‍ය ආශ්‍රිතව?

උ: සොයාගත්තා ස්වාමීනි.

ප්‍ර: කොහෙන්ද ?

උ: හොයාගත්තේ කාත්තන්කුඩි ඔල්ලිකුලම් වල අබ්දුල් රාවුෆ්ගේ ඉඩමක් තියෙනවා. ඒ ඉඩමේ තිබිලා තමයි මේ පුපුරන ද්‍රව්‍ය සොයා ගත්තේ.

ප්‍ර: මොනවද හොයා ගත්ත පුපුරන ද්‍රව්‍යය ?

උ: මේ ඩෙටනේටර් 1500 ක්. සේවානුල් 35 යෙන් කැබලි 06 ක් . වෝටර් ජෙල් 369 ක්. චීනයේ නිෂ්පාදිත කඩු 19 ක්. මෙරට නිෂ්පාදන කඩු 11 ක්. වෝටර් ජෙල් ලීටර් 04 කුත් ප්ලාස්ටික් බකට් 2 ක් . ටී 56 උණ්ඩ 475 ක්. ටී 56 පුහුණු උණ්ඩ 04 ක්. එම් 16 වර්ගයේ උණ්ඩ 33 ක්.

ප්‍ර: එම වාර්තාව කවදද ඔබ ඉදිරිපත් කරලා තියෙන්නේ ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට?

උ: 2019/06/30 ස්වාමීනි.

ස්වාමීනි එම වාර්තාව X 133 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා.

ප්‍ර: ඊයේ දින මා ඔබෙන් ප්‍රශ්න කරපු අවස්ථාවේ දී ඔබ ගරු කොමිෂන් සභාවට කිව්වා සයින්දමරු නින්දවූර් යන ස්ථාන ආරක්ෂිත ස්ථානවලට ගිහිල්ලා ඒ ස්ථාන වල තිබුණ ඒ වැටලීම් සිදුකරාට පස්සේ ලැබුණු තොරතුරක් අනුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විජේසේකර මහතා සහ විශේෂ කාර්යය බලකාය යුධ හමුදාව සයින්දමර්දු ප්‍රදේශයට යන කොට ඔබත් ගියාය කියලා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: එතකොට අර වොලිවේරියන් නිවාස සංකීර්ණයේ අංක 183 බී කියන ස්ථානයේ සිදු වූ පිපිරීම සිදුවෙන කොට සාරා ජෙස්මින් කියන තැනැත්තිය එම ස්ථානයේ සිටියාය කියන කරුණු මුල් අවස්ථාවේ අනාවරණය වුණා ද?

උ: එම පිපිරීම් සිදු වූ ස්ථානයට පැමිණියා එතැන සිටි බවට තොරතුරු අනාවරණය වෙලා තිබුණා ස්වාමීනි .

ප්‍ර: ඒ හැරෙන්නට ඇය එතැන සිටියාය කියන කරුණු ස්වාධීනව ඉදිරිපත් වන වෙනත් ආකාරයක් පිළිබඳව ඔබේ අවධානයට යොමු වුණා ද?

උ: අවධානයට යොමු වුණා ස්වාමීනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒක කරුණාකරලා ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න.

උ: සයින්දමරු පුපුරා ගැනීමට පෙර රිල්වානුයි, ෂයිනි, සහරාන්ගේ තාත්තා හයාත් කාසීම් මොහොමඩ් වීඩියෝ පටයක් කරනවා. එම වීඩියෝ පටයේ රිල්වාන් ප්‍රකාශ කරනවා මෙම ස්ථානයේ මිය ගිය පුද්ගලයන්ගේ බිරින්දෑවරු තිදෙනෙක් ඉන්නවා. එම බිරින්දෑවරු තිදෙනා ඉක්මන්ට ස්වර්ගයට යවන්න ඕන කියලා.

ප්‍ර: එතකොට 21 වැනිදා සිදු කරන ලද ප්‍රහාරයේ දී මියගිය අයගෙන් කවුද ඒ වගේ ඉතුරු වෙලා හිටිය බිරින්දෑවරු?

උ: එම ස්ථානයේ හිටිපු කට්ටියගෙන් සහරාන්ගේ බිරිඳ හාදියා, කටුවා පිටියේ Suicider හස්තූන්ගේ බිරිඳ සාරා. මඩකලුපව Suicider මොහොමඩ් අසාද්ගේ බිරිඳ ෆිරෝෂා.

ප්‍ර: ඒ තුන්දෙනා තමයි එතකොට ඉතුරුවෙලා හිටියේ නැගෙනහිර පළාතේ ?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔහොම ඔය කරුණ ඔබට අනාවරණය වුණේ මොන කරුණු පදනම් කරගෙන ද? ඔබ ඔය කතාව කියන්නේ?

උ: මේ රිල්වාන් වීඩියෝ පටක් හෙළි දක්වනවා. ඒ පුපුරා ගැනීමට ස්වල්ප වේලාවකට ප්‍රථම. එම අවස්ථාවේ රිල්වාන් පවසනවා මේ 4/21 ප්‍රහාරයට සම්බන්ධ වෙච්ච බිරින්දෑවරු තුන්දෙනෙක් ඉන්නවා මෙම ස්ථානයේ එම කට්ටිය ඉක්මනට ස්වර්ගයට යවන්න අවශ්‍යයි කියලා.
ඒ වීඩියෝ පටය දැන් වාදනය කලොත් ඔබට කියන්නට පුළුවන් ද ඒ විඩියෝ පටයේ කුමන විනාඩියේ ද ඔබ ඔය කියන කතාව කියන්නේ කියලා.

වීඩියෝ පටයක් වාදනය කරයි.

ප්‍ර: ඒ වාදනය කරන ලද ඒ පෙන්නුම් කරන ලද CD තැටියේ තියෙන ඔබ කිව්වා දැන් ඔබේ අවධානයට යොමු කරන ලද CD තැටියේ තිබුණු දර්ශනයේ දී කොයි අවස්ථාවේ ද එතැන කතා කරන අය කියන්නේ ප්‍රහාරයට සම්බන්ධ වුණ තුන් දෙනෙක්ගේ බිරින්දෑවරු ඉන්නවා ඔවුනුත් දැන් ඉක්මනටම ස්වර්ගයට යන්ට කටයුතු කරනවා කියලා?

උ: රිල්වාන් ඒ අවසානයේ දී කියනවා.

ප්‍ර: අපිට වෙලාව බලාගන්න පුළුවන් ද?

උ: සහරාන්ගේ පියා කතා කරලා අන්තිම ටිකේ තමයි කියන්නේ.

ප්‍ර: ඒක තාත්තද කියන්නෙ. අන්තිම ටිකේද ? මොකද්ද ඒ කියන්නේ?

උ: මුල ඉඳන්ම කිව්වොත් එහෙම කපීරියෝ නැත්නම් අන්‍යාගමිකයෝ ඇවිල්ලා අපිව වට කරගෙන ඉන්නේ. මේක මේ ජිහාඩ් කිරීම හැර වෙන විකල්පයක් නැහැ. මේ අල්ලාහ් වෙනුවෙන් අපි දැන් ජිහාඩ් කරනවා. ජිහාඩ් වෙනුවෙන් ඔක්කොම එක්වෙන්න. මේකේ අපේ මියගිය සහෝදරයන්ගේ බිරින්දෑවරු තුනක් මෙතැන ඉන්නවා. ඒ තුන්දෙනත්

FAIR COMMENT — BY JEZEEM —

ඉක්මන්ට ස්වර්ගයට යවන්න ඕන කියලා තමයි ප්‍රකාශ කරන්නේ මේ වීඩියෝ එකේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: කවුද ඒ බිරින්දෑවරු ගැන කියන්නේ?

උ: රිල්වාන් ස්වාමීනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ස්වාමීනි එම CD තැටිය C 935 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

C 935 වශයෙන් ලකුණු කරන ලද CD තැටියන් අන්තර්ගතය දමිළ භාෂාවෙන් තිබෙන බැවින් එහි සම්පූර්ණ සංවාදය සිංහලට පරිවර්තනය කොට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ භාෂා පරිවර්තකට නියෝග කරන අතර එසේ ඉදිරිපත් කළ පසු සිංහල පරිවර්තනය C 935 A වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: දැන් ඔය සාරා කියන තැනැත්තිය සැබැවින්ම මිය ගියාද කියන කරුණ පිළිබඳව ඔබේ අවධානය යොමු වුණා ද?

උ: සාරා මෙම පිපිරීම සිදු වූ ස්ථානයට පැමිණියා කියලා ප්‍රධාන වශයෙන් තහවුරු වන සාක්ෂි කිහිපයක් තියෙනවා ස්වාමීනි. එකක් තමයි කල්මුණ සියාම්ගෙන් තහවුරු වුණා සාරා 2019/04/26 වන දින අපි සමන්තුර වැටලීම සිදු කරන අවස්ථාවේ අර ගෙදර අයිතිකාර කාන්තාව ඒ බව මොහොමඩ් නියාස්ට දුරකථනයෙන් දැනුම්දුන්නට පසු මොහොමදු නියාස් උපදෙස්දීලා තිබ්බා සාරාටයි, ෆිරෝසටයි ඒ පුපුරන ද්‍රව්‍යය බඩේ බැඳගෙන ලෑස්තිවෙන්න කියලා යන මාර්ගයේ පොලීසිය හෝ හමුදා මාර්ග බාධකයෙන් වැළැක්වුවොත් පුපුරාගන්නා ලෙසට තමයි උපදෙස්දීලා තිබ්බේ. එතකොට ඒ සාරායි ෆිරෝසයි මේක බැඳගෙන තමයි මේ ගමන ඇවිල්ලා තිබ්බේ. කල්මුණ සියාම්ගේ ප්‍රකාශ අනුව සයින්දමරු පුපුරාගත් නිවසට පැමිණියා කියලා ඔහුගේ ප්‍රකාශයෙන් තහවුරු වෙනවා. ඊට අමතරව හාදියා සහරාන්ගේ බිරිඳ හාදියාගේ ප්‍රශ්න

Registrar Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කිරීම් වලදී ඒ ගෙදර පුපුරාගැනීමට පෙර මේ සාරා සයින්දමරුදු නිවසේ සිටි බව ප්‍රකාශ කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඊට අමතරව ඔබ සඳහන් කරපු දැන් ප්‍රදර්ශනය කරන ලද වීඩියෝ පටය අනුවත්?

උ: එම ස්ථානයේ 2019/04/21 මියගිය බිරින්දෑවරු තිදෙනා කිව්වාහම එතැන වෙනත් කවුරුත් හිටියේ නැහැ. මියගිය බිරින්දෑවරු තුන්දෙනා තමයි සහරාන්ගේ බිරිඳ හාදියයි , මඩකලපුව Suicider මොහොමඩ් අසාද්ගේ බිරිඳ ෆිරෝසයි. කටුවාපිටිය Suicider හස්තුන්ගේ බිරිඳ සාරායි තමා එම ස්ථානයේ හිටියේ ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: කවුද මියගියේ කියලා කිව්වේ නැහැ වැරදිලා කියවුනා ආයි කියන්න. එතැන මියගිය අයගේ ශරීර වලින් කාගෙද කාගේ ද හම්බවුණේ. කාගේ ශරීරයක් ද, මළ සිරුරු වශයෙන් හම්බවුණේ කාගේ ඒවද?

උ: වොලිවරින් ද ස්වාමීනි, වොලිවොරියන් නිවසේ ද මළ සිරුරු හම්බ වුණේ රිල්වාන්ගේයි , ෂයිනිගෙයි,

ප්‍ර: නෑ එච්චර ඕනි නෑ මියගිය කාන්තාවන් කියන්න?

උ: මිය ගිය කාන්තාවන්ගෙන් මළ සිරුරු හම්බවුණේ තහවුරු වුණේ එතැන පේන්න තිබ්බේ සහරාන්ගේ මවගේ පේන්න තිබ්බා. ඊට අමතරව හාදියාගේ තිබ්බා. අන්තිමට DNA report අනුව සාරාගේ හැර එතැන්ට පැමිණි අනෙක් සියළු දෙනාගේ මියගිය බව සනාථ වුණා. සහරාගේ විතරයි සනාථ වුණේ නැත්තේ මිය ගිය බවට DNA ගැළපුනේ නැති බවට.

ප්‍ර: DNA නොගැළපුණේ සාරාගේ පමණයි?

උ: ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: එතැන මළ සිරුරු වලින් හම්බවුණ මුලසිරුරු වලින් කී දෙනෙක් ස්වයං ඝාතකයින්ගේ බිරින්දෑවරුන් ද?

උ: මළසිරුරු ස්වාමීනි මිය ගිය බව සනාථ වුණේ එක්කෙනයි එතැන. ෆිරෝසගේ පමණයි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: හාදියා ජීවතුන් අතර ඉන්නවා නේද?

උ: ජීවතුන් අතර ඉන්නවා.

ප්‍ර: එතකොට සාරාගේ ?

උ: සාරාගේ බොඩි එකවත්, DNA ගැළපිමක් සිදු වුණේ නැහැ ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතැන තිබුණු මළසිරුරු සමඟ සාරාගේ DNA ගැළපීමක් සිද්ධ වුණේ නැහැ. එතකොට දැන් එහෙම නම් ඕන ඒක වැදගත් කරුණක්නෙ බුද්ධි අංශ වලට. එතකොට රාජ්‍ය බුද්ධි සේවය මේ සම්බන්ධයෙන් සොයා බලන්නට කටයුතු කරාද? ?

උ: මේ මුලදී අපි සිතාගෙන සිටියේත් මේ සාරා මියගියා කියලා. 2019 මේ සම්බන්ධව තොරතුරු මට මුලින්ම දැන්නුවේ අම්පාර එම කාලයේ වැඩ කළ සොකෝ අංශයේ ස්ථානාධිපති I.P. සමරසේකර කියන නිලධාරියෙක් හිටියා. එම නිලධාරියා තමයි දැනුම් දුන්නේ. ඔහු දැනුම් දුන්නා 2019/12/20 රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් සාකච්ඡාවක් තිබ්බා. රස පරීක්ෂක කාර්යාලයේ දී. එහි දී පැමිණි නිලධාරීන් සනාථ කරා කියලා අනිත් අය එතැන මිය ගිය අනිත් ඔක්කොමගේම DNA ගැලපෙනවා. සාරාගේ ගැලපෙන්නේ නැහැ කියලා. එදා ඒක සාකච්ඡාව තියලා තියෙන්නේ 2019/12/20 . ඊට පස්සේ නමුත් එම නිලධාරියගෙන් මම ජනවාරී මාසේ තමයි විමසුවේ මේ මිය ගිය කට්ටියගේ රස පරීක්ෂක වාර්තා DNA ලැබුණ ද ඒ ගැන මොකද්ද වෙලා තියෙන්නේ කියලා. එතකන් අපි හිතන් හිටියේ මේ සාරා මියගියා කියලා. පස්සේ එම නිලධාරී තමා මා හට දැනුම් දුන්නේ එදා සාකච්ඡාවේ දී DNA ගැළපිලා නැහැ සාරාගේ කියලා. එම අවස්ථාවේ දී මම අපේ ප්‍රධාන කාර්යාලයට වාර්තාවක් ඉදිරිපත් කරා මෙම සාරාගේ DNA ගැළපිලා නැහැ කියලා. ඊට පසු එතැන ඉදන් තමයි අපි සාරා දෙසට පරීක්ෂණ යොමු කළේ.

ප්‍ර: එතකොට සාරා මිය යන්නට පෙර ඇයගේ හැඳුනුම්පත් ඇයගේ ඡායාරූප කෙරෙහි ඔබේ අවධානය යොමු වුණා ද?

උ: මම යවපු ඒ වාර්තාවේ මම යැවුවේ ඒ වාර්තාව රාජ්‍යය බුද්ධි සේවයට 2020/01/28 එහි සාරා සම්බන්ධව වැදගත් කට්ටියගෙ දුරකථන අංක සාරාගේ ඡායාරූප හැඳුනුම්පත් ඡායා පිටපත් ඒ සියල්ලම අඩංගු කරලා තමයි ඒ වාර්තාව යොමු කළේ.

ප්‍ර: ඔබේ ඒ කරුණු සොයා ගැනීමේ දී සහාරට ජාතික හැඳුනුම්පත් කියක් නිකුත් වෙලා තිබුණ ද කියලා අනාවරණය වුණා ද?

උ: සාරාට හැඳුනුම්පත් දෙකක් නිකුත් වෙලා තිබ්බා. සාරා කියන්නේ දෙමළ කාන්තාවක්. දෙමළ වෙලා ඉඳලා තමයි මුස්ලිම් ආගමට ආවේ. සාරා ඉස්ලාම් ආගමට පැමිණීමට පෙර හැඳින්වුයේ මහේන්ද්‍රන් පුලස්තිනී කියලා. ඊට පසු මුස්ලිම් ආගමට ආවට පස්සේ තමයි සාරා ජෙස්මින් කියලා හඳුන්වන්නේ. මැයට හැඳුනුම්පත් දෙකක් තියෙන බවට වාර්තා වුණා.

ප්‍ර: පළමුවන ජාතික හැඳුම්පතේ අංකය මොකද්ද?

උ: 965672702 V

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: 965672702 V නේ?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: එතකොට දෙවන ජාතික හැඳුම්පතේ අංකය කුමක්ද?

උ: 199656702702

ප්‍ර: එම ජාතික හැඳුම්පත් දෙකේම ඡායාරූප ඔබ එහෙම නම් ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත 2020 ජනවාරි මාසයේ 28 වැනි දා ඉදිරිපත් කරන ලද වාර්තාව සමඟ ඉදිරිපත් කරලා තියෙනවා?

උ: ඉදිරිපත් කරා ස්වාමීනි.

ස්වාමීනි එම වාර්තාව X 134 ලෙස ලකුණු කොට ඉදිරිපත් කරන්න අවසර ඉල්ලනවා.

ප්‍ර: මීළඟට මා කැමති ඔබෙන් දැන ගන්නට වැඩිදුර තොරතුරු කියන්නේ නැතුව අපි කියමු මේ පළවෙනි වාර්තාව ඒ කියන්නේ X 134 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරපු වාර්තාව ඉදිරිපත් කරාට පස්සේ ඔබ තවදුරටත් මේ සාරා ජෙස්මින් ඉන්නව ද නැද්ද කියන කරුණ පිළිබඳව සොයලා බැලුවද?

උ: තවදුරටත් සොයලා බැලුවා ස්වාමීනි.

ප්‍ර: ඒ සොයලා බැලීමේ දී ඔබ යම් යම් පුද්ගලයින් සමඟ කතා කෙරුවද?

උ: එම වාර්තාව නිලධාරීන් කිහිපදෙනෙක් මේ සාරා සම්බන්ධව සොයා ගැනීමට යෙදෙව්වා. එම අවස්ථාවේ දී මෙම සහරාව දුටු තොරතුරු රාශියක් හම්බවුණා. ඒ තොරතුරු ඇතුළත් කරලා මම වාර්තාවක් රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධාන කාර්යාලයට එවලා තියෙනවා.

ප්‍ර: ඒ කවදාද?

උ: 2020/05/31

ස්වාමීනි එම වාර්තාව X 135 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයද සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු දැන් ඔබ යම් අවස්ථාවක කිව්ව නේද 2019 අප්‍රේල් මාසයේ 04 වැනිදා රාජ්‍යය බුද්ධි සේවයට යම් තොරතුරු විදේශීය බුද්ධි අංශයකින් ලැබුණා කියලා ඔබ පස්සේ දැනගන්න ලැබුණ කියලා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: එසේම ඔබ ප්‍රකාශ කර සිටියා 2019 අප්‍රේල් 20 වැනිදා තවත් බුද්ධි තොරතුරක් ලැබුණා කියලා ඔබට දැන ගන්න ලැබුණා කියලා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඊට අමතරව ඔබට දැන ගන්න ලැබුණ ද 2019 අප්‍රේල් 21 වැනිදා උදේ 08.30 පමණත් තවත් එම ලැබුණු තොරතුරු තහවුරු වීමක් ඒ විදේශීය බුද්ධි අංශ වලින් ලැබෙනවා කියලා?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

උ: උදෑසන මට කතා කළේ නැහැ ස්වාමීනි කවුරුත්.

ප්‍ර: උදෑසන කථා කරේ නෑ පස්සේ දැනගත්ත ද කියලා අහන්නේ මං?

උ: තහවුරු කිරීමක් කියලා ප්‍රහාරයෙන් පසුව තමයි දැනගන්න ලැබුණේ.

ප්‍ර: නැහැ මං අහන්නේ ඒක තමා. 21 වැනිදා උදේ ඒ එම තොරතුරු තහවුරු වීමීමක් රාජ්‍යය බුද්ධි සේවයට ලැබුණා කියලා ප්‍රහාරයෙන් පසුව ඔබට දැනගන්න ලැබුණ ද?

උ: 20 හම්බුවෙච්ච රාජ්‍ය බුද්ධි සේවාවට තොරතුර පමණයි මං දන්නේ ස්වාමීනි.

ප්‍ර: ප්‍රහාරයෙන් පස්සෙත් 21 වැනිදා ලැබුණු තොරතුරු ගැන දන්නේ නැද්ද?

උ: 21 ලැබුණු තොරතුරක් සම්බන්ධව මම දැනුවත් නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබ ප්‍රහාරයෙන් පස්සේ දැනුවත් වුණේ 20 ලැබුණු තොරතුරු පමණයි?

උ: 20 තොරතුරක් පමණයි.

ප්‍ර: දැන් ඔබ බුද්ධි අංශයේ වැඩ කරලා තිබෙනවා අවුරුදු කියද?

උ: අවුරුදු 2 1ක් ස්වාමිනි.

ප්‍ර: මං හිතන්නේ කොමිෂන් සභාවේ ඉදිරියට පැමිණි දිර්ඝ කාලයක් බුද්ධි අංශයක් සේවය කරපු නිලධාරීන්ගෙන් එක්කෙනෙක් ඔබ. ඔය ලැබිලා තිබ්බ තොරතුරු වලට හැටියට මේ ප්‍රහාරය සම්බන්ධයෙන් ලැබිලා තිබ්බ තොරතුරුවල හැටියට එම විදේශිය බුද්ධි අංශයට එවැනි තොරතුරක් ලැබෙනව නම් ලැබෙන්නේ එම කණ්ඩායම ඇතුළෙන්ම ලැබෙන තොරතුක් හින්දා නේද?

උ: ස්වාමීනි මෙම ප්‍රහාරයට අදාළව 93 දෙනෙක් අත්අඩංගුවට ගන්න මම දායකවෙලා තොරතුරු දීලා තියෙනවා. ඒ සියළු දෙනාගෙන්ම මම ප්‍රශ්න කරලා තියෙනවා. එතකොට මේ Second line එකෙන් කිසිම කෙනෙක් මේ සහරාන්ගේ 04/21 ප්‍රහාරය ගැන දැනුවත් නැහැ. ඒ දන්නේ ඒ නවුෆර් මවුලවී තමයි දැනන් හිටිය එකම කෙනා . ඊට අමතරව බෙරිච්ච හාදියා.එතකොට මේ ප්‍රහාරය ගැන 04/21 ඒ විදේශ බුද්ධි අංශයට දැනුවත් වෙන්නම් මේ අනිවාර්යෙන්ම මේ ප්‍රහාරයට සම්බන්ධ පුද්ගලයෙක් තොරතුරු දුන්න කියලා තමයි හිතන්න පුළුවන්.

ප්‍ර: හිතන්න පුළුවන් ඒකනේ? ඔබ එහෙම කියන්නේ ඇයි?

උ: Second line එක තොරතුරු දන්නෙත් නැත්නම් ඒ සම්බන්ධයෙන් දීපු තොරතුර ඒ වගේ 04/21 හරියට කියන්න පුළුවන් නම් මේ ප්‍රහාරයට සම්බන්ධ ඒ කියන්නේ සියළු තොරතුරු දන්නේ මේ ප්‍රහාරයේ හිටිය කෙනෙක් වෙන්න ඕන.

****

FAIR COMMENT
BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: දැන් මම ඔබේ අවධාන X 135 ලෙස ඔබ ලකුණු කරාල ඉදිරිපත් කරපු වාර්තාව කෙරෙහි යොමු කරනවා. එහෙම නම් ඔබ කියන ආකාරයට 2020 මැයි මාසේ 31 වැනිදා වෙන කොට ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරීයා වෙත ඔබ ඉදිරිපත් කරලා තියෙනවා සාරා ජෙස්මින් කියන තැනැත්තිය ජීවතුන් අතර සිටින බවට ඇසු දුටු පුද්ගලයින් කියන අය හඳුන්වා දෙමින් ඔවුන්ව සම්බන්ධ කර ගන්නට පුළුවන් මාර්ගය පිළිබඳ තොරතුරු දක්වමින් මේ වාර්තාව නේද?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඔබ දන්නව ද මොකද ඒ වාර්තාවේ අඩංගු තොරතුරු වලට වුණේ කියලා?

උ: මේ වාර්තාව රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධාන කාර්යාලයට යොමු කරා. ඊට අමතරව මේක මොකද මම දන්නවා මේ Security Council එකේ අධ්‍යක්ෂතුමා මේ පිළිබඳව සාකච්ඡා කරා කියලා මම දන්නවා මොකද ඒ presentation එක මේ සම්බන්ධව වැඩි තොරතුරක් අඩංගු කරලා presentation එකක් හදලා මම යවපු නිසා මම හිතනවා අධ්‍යක්ෂකතුමා Security Council එකේ සාකච්ඡා කරා කියලා.

ප්‍ර: එතකොට Security Council එකේ සාකච්ඡා කරලා මේ සම්බන්ධයෙන් වැඩිදුර පියවර ගැනීම සම්බන්ධයෙන් ගත්ත යම් තීරණ ගැන ඔබ දන්නවද?

උ: අධ්‍යක්ෂතුමා කවර තීරණ අරන් ද කියලා මම දැනුවත් නැහැ ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ මේ වාර්තාව යවන අවස්ථාවේ අධ්‍යක්ෂකවරයා විදියට හිටියේ කවුද? ඒ කියන්නේ 2020 මැයි මාසේ 31 වැනිදා වන කොට ?

උ: මා මෙම වාර්තාව යැව්වේ ස්වාමීනි මගේ නියෝජ්‍යය අධ්‍යක්ෂතුමාට තමයි යැව්වේ. එවකට නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා විදිහට දැන් වර්තමානයේ කටයුතු කරන්නේ මගේ අර කලින් කිව්ව නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා නෙවෙයි. වර්තමානයේ මගේ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා වශයෙන් ඉන්නේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික පල්ලිආරච්චි මහතා. එම මහතාට තමයි මම මේ වාර්තාව යැව්වේ. ඊට අමතරව එම මහත්මයා කිව්වා අධ්‍යක්ෂකතුමන්ට මේ වාර්තාව Security Council එකේ සාකච්ඡා කරන්න. අවශ්‍ය ඡායාරූප මේ විස්තර දමලා power point එකක් හදලාත් එවන්න කියලා. එම කටයුත්ත මම කරා. ඊට පස්සේ මෙම නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා මට දැනුම් දුන්නා අධ්‍යක්ෂතුමා ඒක Security Council එකේ සාකච්ඡා කරලා තියෙනවා කියලා.

ප්‍ර: එතකොට අධ්‍යක්ෂකතුමාගේ නම මොකද්ද?

උ: සුරේෂ් අලී.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: මේ 2019 අප්‍රේල් මාසයේ 21 වැනිදා ප්‍රහාරයෙන් පස්සේ ඔබ කිව්වා රාජ්‍ය බුද්ධි සේවය එතෙක් අනුගමනය කරපු අර සංවෘත තත්ත්වයින් ඔබ්බට ගිහිල්ලා විවෘත පදනමක් මත තොරතුරු විමර්ශකයින් වෙත වැටලීම් සඳහා ලබාදීම සිදුකරනු ලැබුවාය කියලා. ඒ 21 වැනිදා ප්‍රහාරයෙන් පස්සේ ඔබ දන්නව ද යම් යම් අවස්ථාවලදී පළාත් මට්ටමින් සාකච්ඡා මේ සම්බන්ධයෙන් පැවැත්තුවා කියලා?

උ: 21 ප්‍රහාරයට ප්‍රථමව ද පසුවද?

ප්‍ර: නෑ නෑ පසුව. කලින් කෙරුවෙ නැනේ ඕගොල්ලො. කලින් කරාද?

උ: කලින් කරේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඉතින් කලින් නොකරපු එකක් අඩුගානේ ප්‍රහාරයෙන් පස්සේ හරි කෙරුවද?

උ: ප්‍රහාරයෙන් පසුව පළාත් මට්ටමෙන් බුද්ධි සාකච්ඡාවක් පැවැත්තුවා.

ප්‍ර: එකක් ද කෙරුවේ නැත්නම් ඊට වැඩිය සංඛ්‍යාවක් ද?

උ: දැනට සෑම මාසිකවම ඉන්න පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍යාය පොලිස්පතිතුමාගේ ප්‍රධානත්වයෙන් බුද්ධි සාකච්ඡා පවත්වනවා වෙන පළාත් සම්බන්ධව මට වැටහීමක් නැහැ. නැගෙනහිර පළාතේ නම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍යාය පොලිස්පතිතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා පැවැත්වුණා.

ප්‍ර: ඒ කියන්නේ පළාත් 09 ක් තියෙනවනේ ලංකාවේ? ඒ පළාත් 09 යට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍යාය පොලිස්පතිවරු 09 දෙනෙක් ඉන්නවානේ. දැන් ඔබේ නිලධාරීනුත් ඒ පළාත් 09 යේම ස්ථානගත වී ඉන්නව ද?

උ: රාජ්‍ය බුද්ධි සේවාවේ පළාත් 09 යේම ඉන්නවා.

ප්‍ර: එතකොට ඔබ කියන්නේ අනිත් පළාත් අට ගැන දන්නේ නැහැ. නමුත් නැගෙනහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍යාය පොලිස්පතිවරයා සමඟ ඔය සියළුම කණ්ඩායම් ඒකරාශී වෙලා බුද්ධි සාකච්ඡා පවත්වනවා කියලා?

උ: බුද්ධි සාකච්ඡා පවත්වනවා දැනට කරගෙන යනවා.

ප්‍ර: කවුරු කවුරු ද සාමාන්‍යයෙන් ඔය සාකච්ඡා සඳහා සහභාගි වෙන්නේ?

උ: මෙම සාකච්ඡා වලට නියෝජ්‍යාය පොලිස්පතිවරු ඉන්නව නම් ඒ දිස්ත්‍රික් වලට නියෝජ්‍ය පොලිස්පතිවරු සහභාගි වෙනවා. කොට්ඨාශ පොලිස් අධිකාරීවරු සහභාගී වෙනවා. සියළුම සහකාර පොලිස් අධිකාරීවරු සහභාගි වෙනවා. ඊට අමතරව බුද්ධි අංශ නිලධාරීන් වන කොට්ඨාශ බුද්ධි නිලධාරීන් සහභාගි වෙනවා. රාජ්‍ය බුද්ධි සේවාව වෙනුවෙන් මමයි මඩකලපුව සහකාර අධ්‍යක්ෂකයි. ත්‍රිකුණාමලයේ සහභාගි වෙනවා. ඊට අමතරව අර විශේෂ ඒක Special Branch කියන්නේ විශේෂ, විශේෂ කාර්යංශය බුද්ධි තොරතුරු, පොලිස් ඒකකය සහභාගි වෙනවා. ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය සහභාගි වෙනවා. ඒ ටික තමයි සහභාගි වෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ පොලීසිය සහ ඊට අනුබද්ධිත විශේෂ පොලිස් නිලධරයන් ඉන්න ආයතන පමණ ද ඕකට සහභාගි වෙන්නෙ. යුධ, නාවික, ගුවන් ඒ අය සහභාගි වෙන්නේ නද්ද?

උ: දැන් වර්තමානයේ රාජ්‍ය බුද්ධි සේවාවේ සිටි අධ්‍යක්ෂකතුමා තමයි දැන් නැගෙනහිර පළාත භාරව පැමිණියේ. එතුමා පැමිණියට පසුව මේ සාකච්ඡාවට සියළුම අය ගෙනාවා. ආමී, නේවි, Air force , විශේෂ කාර්ය බලකාය සියළු දෙනාම සහභාගි කරගන්නවා එතුමා පැමිණීමෙන් පසුව පැවති සාකච්ඡා දැනට පවත්වපු සියළු දේවල් එකටම එම නිලධාරිනුත් සහභාගි කරගත්තා. ඊට ප්‍රථම සහභාගි වුණේ මං පෙර කී කට්ටිය පමණයි.

ප්‍ර: ඒ කියන්නේ පොලිස් දෙපාර්තමේන්තුව ආශ්‍රිතව විතරයි මෙය පැවැත්වුණේ. ඔබ කියන්නේ මාසික වශයෙන් මේ රැස්වීම් තියෙනවා කියලද?

උ: මාසික වශයෙන්.

ප්‍ර: මීළඟට මා ඔබේ අවධානයට යොමු කරන්නට කැමතියි මෙන්න මේ ද්‍රවිඩ භාෂාවෙන් තියෙන ලේඛනය.

****

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ සඳහන් කරානේ මාසිකව මෙම ප්‍රහාරයෙන් පසුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නැගෙනහිර පළාතගේ ප්‍රධානත්වයෙන් මාසිකව සියළුම බුද්ධි අංශ අයත් සමඟ රැස්වීම් පවතවනවා කියලා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඊට අමතරව දැන් තියෙනව ද නිදහසක් රාජ්‍ය බුද්ධි සේවාවට සහ අනෙකුත් ත්‍රිවිධ හමුදා බුද්ධි අංශ STF එක එහි ප්‍රධානීන්ට දැන් ඔබ වැනි අයට නිදහසේ ඔබගේ බුද්ධි තොරතුරු තවත් ආයතනයක් සමඟ කතා කිරීමට. ඔවුන්ගෙන් තොරතුරක් ඔබට ලබාගැනීමට දෛනිකව හෝ සතිපතා එවැනි ක්‍රමයක් දැන් තියෙනව ද?

උ: දැන් තිබෙනවා ස්වාමීනි. දැන් නිතරම යුධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා නිලධාරීන් දුරකථන මාර්ගයෙන් සම්බන්ධවෙලා සුහදශීලිව කටයුතු කරනවා. ඒ කලින් පෙර පැවති නෑ දැන් ඒ තත්ත්වය තියෙනවා. ස්වාමීනි

ප්‍ර: එතකොට මේ දැන් තියෙනව ද ඔබ මීට පෙර සඳහන් කරේ ඔබට බුද්ධි තොරතුරක් ලැබුණාම ඔබ ඒක ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු සමඟනේ කතා කරනවා කිව්වේ. තාම තියෙන්නේ එම ක්‍රමය ද එහෙම නැත්නම් ඔබට පුළුවන් ද එම තොරතුරට අදාළව එම ත්‍රස්තවාදියෙක් හෝ ක්‍රියාත්මක වන පොලිස් ස්ථානාධිපතිවරයෙකුට කතා කරලා මේ තොරතුර පිළිබඳව දැනුම්දීමට?

FAIR COMMENT — BY JEZEEM

උ: ප්‍රථමයෙන් අප කොහොමත් කරන්නේ තොරතුර මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් නියෝජ්‍ය අධ්‍යක්ෂකටතුමාට දැනුම්දීම තමයි. අපි දැනටමත් පොලිස් ස්ථානාධිපතිවරුන්ට කොහොමත් අපි දැනුම්දීමක් කරන්නේ නැහැ. මොකද පොලිස් ස්ථානාධිපතිවරුන්ට දැනුම් දුන්නාම ඒක වෙන මාර්ගයකින් පිටවුණොත් එහෙම ඒක අපිට හානියක් වෙනවා. අපේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා මට දැනුම් දුන්නොත් ඒක පොලිසියට කියන්න කියලා එම පණිවිඩය කියන්නේ ඒ ප්‍රදේශය භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍යය පොලිස්පතිතුමාට හෝ නියෝජ්‍ය පොලිස්පතිතුමාට හෝ කොට්ඨාශ භාර පොලිස් අධිකාරීතුමාට තමයි ඒ සම්බන්ධව දැනුවත් කරන්නේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: ඔබලා සමන්තුරේ සහ නින්දවූර් යන ස්ථානවලදී තිබ්බ ආරක්ෂිත නිවාස වැටලීම් සිදුකරාට පස්සේ යම් යම් දේවල් අත්අඩංගුවට ගත්තාය කියලා කිව්වනේ.

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: එසේ අත්අඩංගුවට ගනු ලැබූ ද්‍රව්‍යය අතර Lap Top පරිගණක තිබුණා නේද?

උ: සමන්තුර නිවසේ එකක් තිබ්බා නින්දවූර් නිවසේ එකක් තිබ්බා, ලැබුණා.

ප්‍ර: ඒවායේ මොනවද අඩංගු වෙන්නේ කියලා පරීක්ෂා කරලා බැලුව ද?

උ: 27 වෙනි මේ සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව දැනුවත් කරාට පස්සේ නියෝජ්‍යය අධ්‍යක්ෂතුමා පරිගණක සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් තියෙන දෙන්නෙක් අම්පාරට එව්වා.

ප්‍ර: රාජ්‍ය බුද්ධි සේවයට අනුයුක්ත නිලධාරීන් ද ඔවුන්?

උ: රාජ්‍ය බුද්ධි සේවයට අනුයුක්ත නිලධාරීන්. ඊට පස්සේ අම්පාර සොකෝ නිලධාරීන්ගේ භාරයේ තිබ්බ එම පරිගණක යන්ත්‍ර දෙක අම්පාර මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාත් සහභාගි කරගෙන අපි පරීක්ෂා කරා.

ප්‍ර: ඒ අවස්ථාවේ දී මොකද්ද අනාවරණය වුණේ?

උ: පරීක්ෂා කරන කොට ඒකේ Folder එකක සගවලා තිබ්බ විස්තර වගයක් ගත්තා. ඒකේ දී ඒක තිබ්බෙ දෙමළ භාෂාවෙන්. දෙමළ භාෂාවෙන් ඒකේ තිබ්බේ මේ සංවිධානයේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයට සම්බන්ධ භාණ්ඩ බෙදාදීමකට අදාළව මස් වගයක් බෙදාදීම සම්බන්ධයෙන් තිබ්බෙ හජ්ජි උත්සවය වෙනුවෙන් රාත්තලයක් බෙදාදීම තිබ්බේ. මස් රාත්තලයක් ගාණේ දෙන්නෙයි කියලා තිබ්බේ. ඒකට අදාළ කෙටි නම් 60 ක් තිබ්බා ඒ පණිවිඩය ඇතුළේ.

ප්‍ර: ඇයි ඒ මස් රාත්තලක් ?

උ: 60 ක් ස්වාමීනි.

ප්‍ර: ඇයි මස් ගෙනත් දෙන්නේ කියන්න?

FAIR COMMENT — BY JEZEEM —

උ: ඒකේ තිබ්බේ ස්වාමිනි මුස්ලිම් ආගමේ සම්ප්‍රදායක් විදියට හජ්ජි උත්සවයට ඒ වගේ බෙදා හැරීමක් කරනවා සාමාන්‍යයෙන්. ඒ වගේ එකක් තමයිඒක මේ කට්ටියට මේ ලැප් එකේ පෙනුන විදියට delete කරන්න බැරිවෙලා තිබ්බේ. මකන්න අතපසුවීමක් වෙලා තිබ්බේ. නමුත් ඒක සාමාන්‍යයෙන් දැනුමත් තියෙන කෙනෙක් ලැප් ටොප් එක බැලුවොත් පේන්න තිබ්බේ නැහැ ඒක. ඒක විශේෂ විදියට ලැප් ටොප් එකේ සහවලා තමයි ඒ නම් ටික තිබ්බේ.

ප්‍ර: ඉතිං ඒක සඟවන්න තරම් කරුණක් ද?

උ: නැහැ එකේ සාමාජිකයින්ගේ නම් 60 ක් තිබ්බා.

ප්‍ර: එතකොට ඒ නම් තිබ්බේ දැන් ඔබ කිව්වනේ කලින් සංවිධානය මගින් අබු කියන නාමය දුන්නා කියලා. එතකොට ඒ අබු කියන නාමයෙන් ද එහෙම නැත්නම් ඔවුන්ට සාමාන්‍යයෙන් භාවිතා කරන උප්පැන්න සහතිකය හරි සමාජයේ දී ඔවුන්ව හඳුන්වනු ලබන හරි එවැනි නාමයකින් ද එහෙම නැත්නම් යම් අන්වර්ථ නාමයකින් ද එහෙම නැත්නම් යම් කෙටි නම් යෙදීමෙන් ද?

උ: යම් කෙටි නාමයෙන් තිබ්බේ නම් 60 තිබ්බේ යම් කෙටි නාමයෙන්. ඒකට අදාළ ලිපියේ මුල් කොටසේ තිබ්බා සහරාන්ගේ නම තමයි අබු උබෙයිදා අස් සෙයිලාන් ඒ සෙයිලාම් නම තමයි සහරාන්ට තිබ්බ නම. ඒ වගේම රිල්වාන්ට තිබ්බේ අබු කිතල් කියලා. මේ අබු ශිල්ලා තමයි මිල්හාන්. ඒ වගේ එහෙම නම් ටිකකුත් තිබ්බා. ඒ ලිපියේ මුල් කොටසේ සඳහන් වෙලා තිබ්බා. නමුත් ඔය නම් ලැයිස්තුව තිබ්බේ ඔක්කොම නම් 60 තිබ්බේ කෙටි නම්.

ප්‍ර: කෙටි නම් වලින්?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: එතකොට මොන භාෂාවෙන් ද තිබ්බේ ඔය ඔබ කියන සටහන?

උ: ද්‍රවිඩ භෂාවෙන් තිබ්බේ. පසුව අපි ඒක සිංහලයට පරිවර්තනය කරා.

ප්‍ර: ඔබට පෙන්වන්නට පුළුවන් නේද ද්‍රවිඩ භාෂාවෙන් තිබෙන ඔබලා ඒ ලැප් ටොප් එකෙන් දැක්ක එම ලිපිය?

උ: පුළුවන් ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු දැන් මේ සාරාට වෙච්ච දෙයක් නැහැ කිව්වනේ. අර බෝම්බ පුපුරපු නිවසේ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: දැන් 18 දෙනෙක් බෝම්බ 03 කින් මිය ගොස් එතකොට ඇගේ බැඳගෙන ඇවිල්ලා බෝම්බයක් ඒ කට්ටියට එක්කහු වෙලා ඉඳලත් උකුළුමහක්වත් කැඩෙන්න නැතුව එයාට යන්න පුළුවන්කම තිබ්බ ද?

FAIR COMMENT — BY JEZEEM

උ: ස්වාමීනි පරීක්ෂණ අනුව සහරාන්ගේ නෝනා හිදායා බේරිච්ච කාමරයට එන කොට සහරාන්ගේ නෝනා හිදායගේ ප්‍රකාශය අනුව පැහැදිලි වෙනවා සාරා ඉඳලා තියෙන්නේ කුස්සියේ . එතකොට රස පරීක්ෂක වාර්තා අනුව කියනවා කුස්සියේ හිටියොත් එහෙම සාරට එහෙම damage එකක් වෙන්නේ නැහැ කියලා. එතකොට පුපුරුවා ගැනීම සිදුවන අවස්ථාවේ දී සාරා කුස්සියේ හිටිය නම් එහෙම තුවාල සිදුවීමකින් නැතුව පැන යන්න හැකියාවක් අවස්ථාවක් තිබ්බා ස්වාමීනි.

ප්‍ර: නමුත් මහ ඔබලා අර මේ පාලම හරියෙ දී ඔබලා රැකල හිටිය නේද?

උ: නෑ අපි එතෙන්ට, යුධ හමුදාව, පොලීසිය, විශේෂ කාර්ය බලකාය සියළු දෙනාම පළවැනි පිපිරීම සිදුවෙන කොට හිටියේ නින්දවුර්වල ස්වාමීනි. ඒක සිදුවුණේ 18.45 ට පමණ. එතකොට දෙවන පිපිරීම සිදුවෙන කොටත් අප එමින් සිටියේ. එතකොට අර පළවෙනි දෙකයි පිපිරීම සිදු වෙන අවස්ථාවේ දී කිසිදු යුධ හමුදා හෝ පොලිස් නිලධාරීන්ව වටලල තිබ්බේ නැහැ. යමින් තමයි හිටියේ. එතකොට මේ අවස්ථාව වන කොට යන කට්ටිය පැන ගන්න පුළුවන් කෙනෙක්ට පැන යෑමේ හැකියාවක් තිබ්බා.

ප්‍ර: කොච්චර කාල පරාසයක් ඇතුළත ද දෙවැනි බෝම්බයයි පළවෙනි බෝම්බයයි අතර ?

උ: පළවැනි බෝම්බය පිපිරීම සිදු වුණේ 18.45 ට පමණ. දෙවන පිපිරීම සිදු වුණේ 19.10ට නැත්නම් 19.15 පමණ වගේ අතර තමයි පිපිරීම සිදුවුණේ.

****

<u>**ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.**</u>

ප්‍ර: ඔබට ලැබුණු තොරතුරු අනුව දැන් කල්මුණේ සියාම් මේ අවස්ථාවේ හිටිය ද?

උ: කල්මුණේ සියාම් මේ කට්ටිය මෙතැන්ට රැගෙන පැමිණ මේ කට්ටිය බස්සලා ගියා කියලා තමයි කල්මුනේ සියාම් ප්‍රකාශ කළේ ස්වාමීනි. නමුත් ඔහුගේ අන්තිම ප්‍රකාශය අනුව ලොකු පරස්පරතාවයක් තියෙනවා. ඔහුගේ ප්‍රකාශ සැක සහිතයි ගොඩක්. එතකොට මේ කල්මුණේ සියාම් පොලීසියේ රඳවා තබා තිබෙන කාල සීමාව අවසන් වුණාට පස්සේ 2019/09 වැනි මාසේ මඩකලපුව බන්ධනාගරයේ රඳවලා තියෙන කොට අපි ඒක සැලැස්මක් හදලා කල්මුණේ සියාම් ඉන්න C block එකට අපේ ඒ වරදට හසුවෙච්ච අපේ තොරතුරුකරුවෙකුත් ඒ සියාම් එක්ක අශ්‍රය කරන්න ඒ බන්ධනාගාර C block එකට යෙදෙව්වා. ඒ අවස්ථාවේ දී කල්මුණේ සියාම් කියලා තියෙනවා මමත් පුපුරුවා ගැනීම් සිද්ධ වෙන කොට හදන කොට සයින්දමරුදු වොලිවෝරියන් නිවසේ හිටියා. මට ළමයි මතක් වුණා මම පිටුපස තාප්පයෙන් පැනලා කලපුව හරහා පිටත්

FAIR COMMENT BY JEZEEM

ගියා කියලා එම පුද්ගලයාට කියලා තියෙනවා. නමුත් මේක තහවුරු කරන්න මුකුත් සාක්ෂි ලැබුණේ නැහැ. ඊට පස්සේ අපි ඒ තොරතුරු අනුව නැවතත් කල්මුණේ සියාම් නවත්වගෙන තියෙන්නේ මේ වැලිසර ත්‍රස්ත විමර්ශන අංශයේ ඔහුගෙන් අපි ගොස් නැවතත් ප්‍රශ්න කරා මේ සම්බන්ධයෙන් නමුත් ඔහු ඒක ප්‍රතික්ෂේප කරනවා. එහෙම දෙයක් කිව්වේ නැහැ කියලා. ඔහු ඒ තොරතුර ඒ දැනට ත්‍රස්ත විමර්ශන අංශයේ ඉන්න නිසා අපිට පරීක්ෂණ කිරීමේ හැකියාවක් නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ අයට ඒ තොරතුරු ලබාදීලා තියෙනව ද?

උ: ලබාදිලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔය වෙලාවේ අර හමුදාවේ ඉදිරිපෙළ සාමාජිකයෝ කවුරු හරි දැකලා තියෙනව ද පුද්ගලයෙක් දුවනවා හරි ?

උ: එතැන ඉදිරිපෙළ හිටිය කට්ටිය එම අවස්ථාවේ දී ප්‍රහාරයෙන් පසුව 27 වැනිදා කිව්වා . යතුරු පැදියක නැගලා දෙන්නෙක් ගියා කියලා. නමුත් ඔවුන් ඒ දෙසට වෙඩි තිබ්බත් ඔවුන්ව අල්ලන්න බැරි වුණා. නමුත් ඒ දෙන්නා සියාම් ද නැත්නම් වෙන ගමේ ඒ වෙලාවේ බේරිලා පලා ගිය දෙන්නෙක් ද කියලා හරියටම තහවුරු නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ හැරෙන්න CCTV එකක් කොහේ හරි මග තිබ්බිව CCTV දර්ශනයකින් යමක් අනාවරණය වුණා ද?

උ: CCTV පසුව අපි පරීක්ෂන පැවැත්වුවා. මෙම සයින්දමර්දු පිපිරිච්ච ලේන් එකට යාබද ලේන් එකේ පිටිපස්ස පාරේ ගෙදරක CCTV කැමරාවක පුද්ගලයෙක් දිව යන දර්ශනයක් දිස්වෙනවා. ඒ දිවයන දර්ශනය දෙසට ඉස්සරහින් වෙඩි තියෙන ආකාරයක් ඒ වීඩියෝ පටයේ දැක්වෙනවා. ඒ වීඩියෝ පටය මම ඉදිරිපත් කරා ස්වාමීනි.

වේලාව:ප.ව.06.50
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

දැන් වෙලාව : ප.ව.6.50
පෙර සටහන් ල/ලේ : සචිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ : නිල්මිණි.

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

ප්‍ර: දැන් මේ බෝම්බයක් බැඳගෙන සාරා ආවානම් සාරා යනකොට ඔය බෝම්බය බැඳගෙන යන්නේ නැහැනේ. කොහාට හරි විසිකරලා හරි යන්න පුළුවන්නේ. එහෙම දෙයක්වත් අහුවුණේ නැද්ද?

පි: එහෙම දෙයක් සොයා ගන්න බැරිවුණා ස්වාමිනි. ඒ ඡායාරූපයේ දිස් වෙනවා ඉස්සරහින් වෙඩි තියෙනකොට තමයි කොළ අත්තක් බිමට වැටෙන්නේ. එතකොට ඔහු දිවඵන දිසාවට තමා ඉදිරියේ සිට වෙඩි තියෙන්නේ. ඔය එළි පත්තුවෙන්නේ වෙඩි තියනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: මේ සායින්දමරුදු නිවසට පිටි පස්ස තියෙන පාරද?

පි: පිටිපස්ස තියෙන පාර ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ අර පිපිරීම සිදු වුණ ගෙදරින් තාප්පෙන් පැන්නානම් මේ පාරට එන්න පුළුවන්ද?

පි: එන්න පුළුවන් ස්වාමිනි.

ප්‍ර: මේක ත්‍රස්ත විමර්ශන ඒකකයේ සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තියෙනවද?

පි: අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දුන්නා ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර: ඔබට හිතෙන විදිහට ඔය බෝම්බ පිපිරුණු ගෙදරට සම්බන්ධ පුද්ගලයෙක් නොවෙයි කියලද ඔබගේ තියෙන තොරතුරු සහ අත්දැකීම් අනුව හිතෙන්නේ?

පි: දුවන එක්කනාද

ප්‍ර: දුවන කෙනා.

පි: ඔව්. දුවන කෙනා ස්වාමිනි මෙතන ආපු කට්ටියගෙන් සාරා ඇරෙන්න අනිත් කට්ටිය මිය ගියා කියලා DNA ගැලපිලා තියෙනවා. එතකොට මෙතන අර කල්මුණේ සියාමේග් තොරතුරක් තියෙනවා බන්ධනාගාරයේ දී ප්‍රකාශය. නමුත් මේ කල්මුනේ සියාම් මේ කියලා අපිට හරියටම දිස්වෙන්නේ නැහැ. එතකොට මෙම පුද්ගලයා සම්බන්ධව ඒ අපේ ආව කට්ටිය ඒ කියන්නේ මේ සායින්දමරුදු පිපිරිච්චි නිවසට ආව පිරිස අපි හඳුනගෙන ඉන්නවා. ඒ කට්ටියෙන් සාරා

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඇරෙන්න හාදියායි සාරායි ඇරෙන්න අනිත් කට්ටිය මිය ගොස් තිබෙනවා. එතකොට වෙන කෙනෙක් අනාවරණය වෙන්නේ නැහැ. ඒක නිසා මේ කවුද කියලා අපට තාම අනාවරණය කර ගන්න බැරිවුණා ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: හරි මම ඒ ප්‍රශ්නය මේ විදිහට අහන්නම්. ඔබ කිව්ව පරිදි කල්මුණේ සියාම්
පාලමුනෙ ඉඳලා සායින්දමරුදු වලට එන්නේ බයිසිකලයෙන්?

පි: බයිසිකලයෙන් ස්වාමිනි.

ප්‍ර: ඒ මොන විදිහයේ බයිසිකලයක් කියලා ඔබලා හොයා ගත්තද?

පි: සොයා ගත්තා ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ බයිසිකලේ බෝම්බ ප්‍රහාරයෙන් පසුව ඔබ හොයා ගත්තද?

පි: හොයා ගත්තා ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ මොකුත් අනතුරුක් නොවී යථා තත්වයෙන් තියෙන බයිසිකලයක්?

පි: තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඒක කොහෙන්ද සොයා ගත්තේ?

පි: කල්මුණේ සියාම්ගේ ඒ වෙනකොටත් එයා පාවිච්චි කර කර සිටියේ අපි අත්අඩංගුවට ගන්න කොටත් එයාගේ භාරයේ යතුරු පැදිය තිබ්බා.

ප්‍ර: එතකොට අර නිවස ඇතුලෙත් තව යතුරු පැදියක් තිබ්බා නේද?

පි: ඒ නිවස ඇතුල තිබබේ මට මතක හැටියට තිබ්බේ මොහොමදු නියාස්ගේ යතුරු පැදිය.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඔබ මගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙන අවස්ථාවේ දී ඔබ කිව්වා නින්දවූර් සහ සමන්තුරේ යන ආරක්ෂිත නිවාස වලින් සොයා ගන්නා ලද laptop සොකෝ නිලධාරීන් සමඟ ඔබේ මූලස්ථානය ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ මූලස්ථානයෙන්, ප්‍රධාන කාර්යාලයෙන් එවන ලද විශේෂඥ නිලධාරීන් සමඟ පරීක්ෂා කරලා බැලුවා කියලා?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: එසේ පරීක්ෂා කිරීමේ දී ඔබ කිව්වා යම් ලේඛනයක් සොයා ගත්තා ඒක මේ laptop බැලු බැල්මට පෙන්නේ නැහැ. නිකන් සහවලා වගේයි තිබ්බේ කියලා?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: ඒ ලේඛනය නැවත ඔබට පෙන්නුවොතින් ඔබට හඳුනන්නට පුළුවන්ද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: පුළුවන් ස්වාමිනි.

ප්‍ර: ස්වාමිනි පුළුල් තිරයේ තිබෙන ලේඛනයක් සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා. මේ ලේඛනයයි එහි පිටපත් කොළ 2ක් තියෙනවානේ. එම ලේඛනයයි ඔබලා විසින් ඔය laptop එකේ තිබිලා සොයා ගන්නා ලද ලේඛනයයි අතර යම් සම්බන්ධතාවයක් තියෙනවද?

පි: මේ එම හොයා ගත්ත ලේඛනය ස්වාමිනි.

ස්වාමිනි එම ලේඛනය X – 136 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර: එම ලේඛනයේ දකුණු පස උඩ යම් සළකුණක් තිබෙනවා නේද?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: ඔබට කියන්නට පුළුවන්ද ගරු කොමිෂන් සභාවට ඒ මොකක්ද කියලා? පළමුවන පිටුවේ දකුණ පස උඩ ?

පි: මෙම ලාංඡනය තමයි සහරාන් පිරිස දිවුරුම් දෙන අවස්ථාවෙත් මේ ප්‍රහාරයට ප්‍රථම දිවුරුම් දෙන අවස්ථාවේ තිරයට යොදාගෙන තිබ්බෙත් මෙම සළකුණ ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔය ලිපියේ මාතෘකාව මොකක් ද එය පරිවර්තනය කරලා තිබෙනවාද ඔබලා?

පි: පරිවර්තනය කරලා තිබෙනවා.

ප්‍ර: ඔබ ඒ පරිවර්තනය අනුව යම් මස් බෙදා දැමීමක් සම්බන්ධයෙන් තමයි ඒකේ කියන්නේ ?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: ගවයන් හා එළුවන් මරා මස් වශයෙන් දෙන දානය. ඒ දානය මස් බෙදා දීම කාටද කරන්න ඕනි කියලා කියන්න ඒක නියෝගයක්?

පි: මේකේ ඉන්න සංවිධානයේ කාත්තන්කුඩියේ හිටිය සාමාජිකයින් පිරිසකට දෙන්න කියලා තමයි කියන්නේ?

ප්‍ර: එතකොට මේක නිකුත් කරලා තියෙන්නේ සංවිධානයට කැප වූ කාත්තන්කුඩි සහෝදරවරු ?

පි: නැහැ එකේ අන්තිමට අත්සන් කරලා තියෙන්නේ සහරාන්.

ප්‍ර: අමීර් අබු උබෙයිදා අස්සෙලායනි කියන්නේ ?

පි: සහරාන්ගේ අන්වර්ත නාමය.

ප්‍ර: එතකොට ශ්‍රී ලංකාව කියලා දලා තියෙන්නේ ඇයි 2018.08 මාසේ 18 වෙනිදා ශ්‍රී ලංකාව?

පි: මේ ශ්‍රී ලංකා අබු උබෙයිදා අස්ලානි කියන්නේ ශ්‍රී ලංකාවේ නායකයා විදිහට පරමාර්ථයෙන් තමයි මෙකේ අත්සන දලා තියෙන්නේ?

ප්‍ර: එතකොට යම් යම් අයට බෙදලා දෙන්නේයි කියලා කියනවානේ. ඒ බෙදලා දෙන අයගේ ඔබ කිව්වා මේ කෙටි නම් වලින් තමයි ඔවුන් හඳුන්වලා තියෙන්නේ කියලා?

පි: එසේයි ස්වාමිනි.

Presidential Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ කිව්වානේ අර මදනිගේ ස්වාමි පුරුෂයා නියාස් කියලා නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට දැන් ඔබ මේ පෙන්වන නම් 60 නියාස් මස්සිනා කියලා එක්කෙනෙක් ඉන්නවානේ?

පි: ඔව්

ප්‍ර: හැබැයි පළවෙනියෙන්ම යන්නේ මිල්හාන්ගේ නම, දෙවැනියට යන්නේ සහෝදරයා වූ රිල්වාන්ගේ නම, තුන්වැනියට යන්නේ අබ්දුල් ගපූර් අර ගපූර් මාමාද?

පි: ගපූර් මාමා ස්වාමිනි.

ප්‍ර: ඩයලොග් එකේ ඉන්න එක් කෙනෙකුටත් හම්බ වෙනවා අසීම්?

පි: ඒ අසීම් කියන්නේ මේ සංවිධානයේ ප්‍රබල සාමාජිකයෙක්. අසීම්, රිල්වාන් තුවාල වෙච්ච අවස්ථාවෙත් එතන හිටිය සාමාජිකයෙක් තමයි රිල්වාන් තුවාල වුණ කියන්නේ පුපුරා ගැනීමට හදන අවස්ථාවෙත් අසීම් එම අවස්ථාවේ එතන හිටපු කෙනෙක්.

ප්‍ර: ඒ බවට කරුණු හෙළි වුණා. එතකොට අංක 21 සියාම් කරාටේ කියලා තියෙන්නේ?

පි: වෙන සියාම් කෙනෙක්. කල්මුණ් සියාම් වෙන කෙනෙක්. ඔතන සියාම් වෙන කෙනෙක්.

ප්‍ර: එතකොට අංක 12 ඉන්නවා ෆිර්දවුස් මඩකලපුවේ ?

පි: ෆිර්දවුස්

ප්‍ර: ඒ කවුද?

පි: ඔහුත් මේ කාත්තන්කුඩි ජාතික තවුහිද් ජමාත් සාමාජිකයින්.

ප්‍ර: එතකොට 13 ෆිර්දවුස් බාලුද?

පි: දෙන්නෙක් ස්වාමිනි.

ප්‍ර: එතකොට කටාර් වල ඉන්න උවෙස් කවුද? උවෙයිස් එක්කෙනෙක් කටාර් අනිත් එක්කෙනා බිබිලෙ උවෙයිස් දෙන්නෙක් ඉන්නවා.

පි: උවෙස්ත් අත්අඩංගුවට ගත්තා.

ප්‍ර: එතකොට සෙයිනි මවුලවිත් ඉන්නවා අංක 27නේ, තවුෆික් මවුලවිත් ඉන්නවානේ, තව නියාස් කෙනෙක් අස්මියා කියලා ඒ කවුද අනාවරණය වුණාද, කල්මුණේ සියාමුත් ඉන්නවා 40 ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට පාලමුනෙ ෆයිරූස් ඉන්නවා. අන්න සහලාන් ඉන්නවා 46 නේද රිස්වාන්, සහලාන් කියන තැනැත්තා. හරි දැන් ඔබ කියන ආකාරයට මේක බැලූ බැල්මට පෙන්න විදිහක් නෙවේ තිබුණේ නමුත් නිකන් සහවලා වගේ තිබුණායි කියලා ඔබ කියනවා. දැන් ඔය ලේඛනය මේකේ කියලා තියෙනවද ගරු භාරකරු අබුල් හිම්මා වෙත නායකයා වන අබු උබෙයිදා අස්සෙයිලානි විසින් නිකුත් කරන නියෝගය කියලා. නියෝගය පහත වේ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: එහෙම සඳහන් වෙලා තිබෙනවා ස්වාමිනි?

පි: තිබෙනවා ස්වාමිනි.

ප්‍ර: ඔබ රාජ්‍ය බුද්ධි සේවයට බැඳුණු අවස්ථාවේ පටන් මේ වෙනතුරු මේ ක්ෂේත්‍රයේ ලබා තිබෙන අත්දැකීම් අනුව ඔබ හිතනවද රාජ්‍ය බුද්ධි සේවය, පොලිසිය, යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව කියන මේ හැම ආයතනයකම තියෙන බුද්ධි අංශ ඒක රාශීව එකතුමුතුව තමන්ට ලැබුණු තොරතුරු හුවමාරු කරගෙන විමර්ශන සිදු කරන්නට රටේ ජාතික ආරක්ෂාව ආරක්ෂා කරන්නට කටයුතු කරලා තිබුණා නම් 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා සිදු වුණ ඔය පාස්කු ප්‍රහාරය නවත්වන්නට පුළුවන්කම තිබ්බා කියලා?

පි: පැහැදැලිවම වළක්වා ගන්න තිබ්බා. මොකද මේ ප්‍රහාරය සහරාන්ගේ ජාලය සම්බන්ධයෙන් අපි දැනගෙන හිටියේ. එතකොට මම පෙර කිව්වා වගේ මම 2016.05.30 තමයි නැගෙනහිර පළාතට ගියේ. එදා ඉඳන් මම අර කළින් සඳහන් කළ ඒකාබද්ධ නැගෙනහිර ආඥාපති කාර්යාලයේ තිබ්බ බුද්ධි සාකච්ඡාව ඇරෙන්න කිසිම සාකච්ඡාවට එක්කෝ මම දැනුවත් තිබිලා නැහැ. එහෙම නැගෙනහිර පළාතේ බුද්ධි සාකච්ඡාවක්. එහෙම සාකච්ඡා ගියානම් අපි මේ තොරතුරු වාර්තා කරන්න අවස්ථාවක් තිබ්බා. ඒ තිබ්බ ප්‍රහාරයෙන් පස්සේ තිබුණු සාකච්ඡා වලදී විශේෂයෙන්ම මම ඉදිරිපත් කළ සිටි ලේඛන වල අර පහුගිය කාලසීමාවල ජමාතේ මිල්ලති ඊබ්‍රහීම් සාමාජිකයන් ගැන ලැබුණු තොරතුරු මොකද විශේෂයෙන්ම මේ වෙන පළාත් වල සැඟවිලා හිටිය කට්ටිය අත් අඩංගුවට ගැනීම සම්බන්ධව තොරතුරු බෙදා හැරලා තියෙනවා. එම වගේම ඔලුවිල් පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් තොරතුරු වාර්තා වුණා කියලා කළින් ඒ බුද්ධි සාකච්ඡා වල මං ප්‍රකාශ කරලා තියෙනවා. ඊට පස්සේ පොලිසිය උත්හාස එක පාරක් මං තොරතුරු කිව්වට පස්සේ ඒ තොරතුරු ඒක හොයා ගන්න නමුත් නැවතත් මට තොරතුරක් ඇවිල්ලා තමයි ඔලුවිල්වල ඒ පුපුරණ ද්‍රව්‍ය සොයා ගත්තේ. නමුත් මේ වගේ එහෙම බුද්ධි සාකච්ඡා තිබ්බානම් මේ ප්‍රහාරය වළක්වා ගන්න තිබුණා ස්වාමිනි.

ප්‍ර: එතකොට එහෙනම් අර රාජ්‍ය බුද්ධි සේවය ඔබලාගේ සාමාන්‍යයෙන් තියෙන ප්‍රතිපත්තිය වුණ Need no basics ඒ කියන්නේ අභ්‍යන්තරව ඔබලාට යම් කරුණු දැන ගන්නට අවශ්‍ය නම් විතරයි ඒ පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවයෙන් වුණත් ඔබලාව දැනුවත් කරන්නේ. ඒ පදනමත් දැන් නැද්ද 21 වෙනිදා ප්‍රහාරයෙන් පස්සේ?

පි: නැහැ ස්වාමිනි දැන් අපේ ඔය ප්‍රධාන කාර්යාලයෙන් අපි වගකීම දැන් දෙනකොට මට කියන රාජකාරියක් භාර දුන්නාම ඒක මම අහන්න යන්නේ නැහැ. මට කියන රාජකාරිය සමහර විට ඒ මඩකලපු සහකාර

FAIR COMMENT BY JEZEEM

අධ්‍යක්ෂකතුමාට නොකියනවා වෙන්න පුළුවන්. නමුත් ඒ අදාළ ඒ රාජකාරිය කරන්න පුළුවන් කෙනෙකුට තමයි මේ රාජකාරිය භාරදෙන්නේ ස්වාමිනි.

ප්‍ර: නමුත් එයින් ලබා ගන්නා තොරතුරු රටේ ආරක්ෂාව සඳහා වැදගත් වෙනවා කියලා තේරෙනවානම් එතකොට ඔය 21 වෙනිදා ප්‍රහාරයෙන් පස්සේ දැන් ඔබලා ඒවා අනිත් අයත් එකක් ඔබේම නිලධාරීන් එක්කත් ඒ වගේම ඔබේ ආයතනයෙන් පරිබාහිර වූ බුද්ධි අංශ සමඟත් එහෙම නැත්නම් විමර්ශන කරන ආයතන සමඟත් ඒ තොරතුරු හුවමාරු කර ගන්නවද?

පි: දැන් ලබා ගන්න තොරතුරු හුවමාරු කර ගන්නවා. විශේෂයෙන්ම ප්‍රහාරය සම්බන්ධයෙන් කතා කළොත් රාජ්‍ය බුද්ධි සේවාවට මේ arrest කරන්න power එක තිබ්බානම් මේ ප්‍රහාරය සෑහෙන දුරට අපිට මීට කළින්ම මොකද අපිට arrest power එක නැති නිසා තමයි මේ එක එක ආයතන වලට කියලා මේක කර ගන්න බැරිවුණේ. ඒත් ඒ දවස් වලට අපිට මේක බලය තිබ්බානම් මේ ප්‍රහාරය වළක්වා ගන්න තිබුණා ස්වාමිනි.

ප්‍ර: හැබැයි ඒ වගේම ඔබ ඊයේ දින මගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන ගමන් සඳහන් කරා කොතරම් තොරතුරු අනිකුත් ආයතන වලට දෙනවා ද කියන එක තීරණය කරන්නේ ඔබේ අධ්‍යක්ෂකවරයා ඔහුගේ අභිමතය මත කියලා නේද?

පි: එසේයි ස්වාමිනි.

****

<u>**ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා**</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ දැන් මොහොතකට ඉස්සෙල්ලා සාක්ෂි දෙනකොට කිව්වා බුද්ධි අංශ වලට අත්අඩංගුවට ගැනීමේ බලතල තිබුණානම් හුඟාක් වැදගත් වෙනවා කියලා. ඔබට තියෙන අත්දැකීම් සහ තොරතුරු අනුව ලෝකයේ වෙනත් රටවල ඒ බලතල ලබා දීලා තියෙනවද?

පි: දන්න විදිහට CI එකට එහෙම බලතල තියෙනවා. විශේෂයෙන්ම මම මේ දැනට ඉදිරිපත් කර මගේ ළඟ වාර්තාවක් තියෙනවා. අපි තොරතුරු අනුව අපිට අනාවරණය වුණා මේ ලංකාවේ මේකේ Training වෙච්ච 5 දෙනෙක් Training වුණාට පස්සේ විදේශ ගත වෙලා ඉන්නවා.

ප්‍ර: නම් මොනවද?

පි: මුනාස් මුවාත් මොහු පාකිස්ථානයට ගිහිල්ලා ඉන්නවා. මොහොමඩ් හකීම් ගිහිල්ලා ඉන්නවා කටාර් වලට , අමස්දීන් හනර් ගිහිල්ලා තියෙනවා ඩුබායි වලට , ෆස්ලූල් රහුමාන් ගිහිල්ලා තියෙනවා ස්පාඤ්ඤයට. එතකොට මේකේ මේ මුනාස් මුවාත් කියන කෙනා පාකිස්ථානයට ගිය කෙනා බුද්ධි අංශ, පාකිස්ථානයේ බුද්ධි අංශ සමඟ

FAIR COMMENT — BY JEZEEM —

සම්බන්ධ වෙලා ඒ තොරතුර දන්නේ. මමයි ඒ තොරතුරු ලබාදුන්නේ පාකිස්ථානයේ නියෝජ්‍ය ඒ දෙවැනියාට. එහෙන් ඔහුව හොයලා මොහු IS එකටත් සම්බන්ධයි කියලා මොහුව අත්අඩංගුව අරන් තිබුණා පාකිස්ථානයේ බුද්ධි අංශ විසින්.

ප්‍ර: ලංකාවට එව්වේ නැහැ?

පි: ලංකාවට එව්වේ නැහැ ස්වාමිනි.

ප්‍ර: දැන් අනිත් අය අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් මොනවත් පියවරක් අරන් තියෙනවද?

පි: හකීම්බුයි, අමස්දීන් හනන්නුයි තොරතුරු ලබාදීලා දැන් වාර්තා වෙලා තියෙනවා අත්අඩංගුවට අරන් තියෙනවා කියලා.

ප්‍ර: එතකොට සාක්ෂිකරු ඔබ ඉස්සරවෙලා සාක්ෂි දෙමින් කිව්වා මේ ප්‍රහාරය වළක්වා ගන්න තිබුණා. ඔබ ඉස්සෙල්ලා සඳහන් කළ ආකාරයට 2019 මාර්තු මාසේ ඔබ සඳහන් කළ පුද්ගලයෝ අත්අඩංගුවට ගත්තානම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: දැන් ඒක කර ගන්න බැරි වෙච්චි එක ගැන ඔබට යම්කිසි කණගාටුවක් ඇතිනේ?

පි: ඒක කරගන්න බැරිවුණා.

ප්‍ර: ඒක කරගන්න බැරිවුණා. ප්‍රහාරය සිද්ධ වුණා ඔබට යම් කණගාටුවක් ඇති ඒ සම්බන්ධයෙන්?

පි: තියෙනවා ස්වාමිනි.

ප්‍ර: නමුත් ඔබ දෙවන ප්‍රහාරයක් වෙන්න ගිය එක ඔබගේ සහ ඔබගේ සහායක නිලධාරීන්ගේ උපකාර ඇතුව වළක්වගන්න පුළුවන් වුණා කිව්වොත් ඒක හරිද?

පි: දෙවන ප්‍රහාරය සම්පූර්ණයෙන්ම වළක්වාගන්න පුළුවන් වුණේ අපේ රාජ්‍ය බුද්ධි සේවාව නිසා. එහෙම නැත්නම් දෙවැනි ප්‍රහාරය අනිවාර්යයෙන්ම සිදු වෙන්න තිබ්බේ. දෙවැනි ප්‍රහාරය අපිට සාක්ෂි තියෙනවා. දෙවන ප්‍රහාරය එල්ල වෙන්න තිබ්බේ දළදා පෙරහැරට තමයි බොහෝ විට එල්ල වෙන්න තිබ්බේ. මොකද එතකන් තමයි මෙම රිල්වාන් කියලා තිබ්බා සහරාගේ නෝනාටත් මේ එක නවුෆර් මවුලවි පැත්තෙනුත් තොරුතුරු ඇවිල්ලා තියෙනවා. රිල්වාන් කියලා තිබ්බා අගෝස්තු මාසේ දළදා පෙරහැර එනකම් කොහොම හරි හැංගිලා ඉන්න තමයි මේ ගෙවල් ගත්තේ කියලා. එතකොට ඊට කළින් හදිස්සියක් වුණොත් මේ පන්සල් වලට ප්‍රහාරයක් එල්ල කරන්න තමයි හිටියේ. දළදා පෙරහැර එනකම් යන්න බැරි වුණොත් එහෙම. ඊට අමතරව සාරා ළඟ තිබිලා තියෙනවා photo වගයක්. ඒ සාරාගේ photo අතේ තියාගෙන ඉන්න කොට තේතාතු දේවස්ථානයේ photo. සහරාන්ගේ නෝනා හාදියා අහලා තිබ්බා ඇයි ඒ photo තියාගෙන ඉන්නේ කියලා.

FAIR COMMENT BY JEZEEM

එතකොට සාරා කියලා තිබ්බා මේක මට ඉස්සරහට වැදගත් වෙනවා කියලා.

ප්‍ර: කොහේද ඒ පල්ලිය?

පි: කලවංචිකුඩි සාරාගේ ගෙවල් කිට්ටුව තමයි මේ තේතාතු දේවස්ථානය තියෙන්නේ එතකොට අපිට පෙන්නේ ඒක සමහර විට සාරාගේ ටාගට් එකක් වෙන්න පුළුවන් කියලා තිබ්බා කියලා. ඒ කිව්ව විදිහ අනුව ඒ වෙලාවේ.

ප්‍ර: කතෝලික පල්ලියක් ද?

පි: කතෝලික දේවස්ථානයක්. එතකොට මේ ප්‍රහාර දෙවන ප්‍රහාරයට තමයි මේ මොවුන් බඩු ගෙනල්ලා 2019.04.19 මේකට ලෑස්ති කරලා තමයි රිල්වාන් අනිත් කට්ටිය සහරාන් අම්පාර දිස්ත්‍රික්කයට එවන්නේ. ඒ වගේම ආරක්ෂක නිවාස 8ක් අරන් තිබ්බා. අම්පාර දිස්ත්‍රික්කයෙන්. වාහන අලුතින් අරන් තිබ්බා. මේ සියලු දේ සූදානම් කරලා තිබ්බේ දෙවන ප්‍රහාරයට. ඒ දෙවන ප්‍රහාරයට රාජ්‍ය බුද්ධි සේවාවට ඒ තොරතුරු ලැබුණ නිසා තමයි ඒ වළක්වා ගන්න පුළුවන් වුණේ. එහෙම නැත්නම් පළවෙනි ප්‍රහාරය ඒ දෙසීය ගාණට වඩා ලොකු විනාශයක් වෙන්න තිබ්බා. මොකද මේ සායන්දමරුදු වල අපි සාරාත් එක්ක ගණන් හැදුවොත් එහෙම suicide මරාගෙන මැරෙන්න පුළුවන් 12ක් හිටියා. ළමයි අයින් කරාම. එතකොට ඒ 12 දෙනකේගෙන් suicide මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල වුණොත් දළදා පෙරහැරට එල්ල කරානම් කොච්චර හානියක් වෙන්න පුළුවන් කියලා හිතා ගන්න පුළුවන්. ඒක සම්පූර්ණයෙන්ම මේ ජාලය සම්බන්ධයෙන් අපට අවබෝධයක් තිබෙන නිසා තමයි වැළැකුණේ. විශේෂයෙන්ම LTTE සංවිධානය 1983 ඉඳන් අවුරුදු 30ක්ම ඇදීගෙන ආවේ තොරතුරු තිබුණේ නැති නිසා. මේ සහරාන්ගේ ජාලය මේ සංවිධානය 2කම ජාතික තවුහිද් ජමාත්, ජමාතේ මිල්ලතේ ඊබ්‍රහිම් සංවිධානය සති 3ක් වගේ කෙටි කාලයක් තුල සම්පූර්ණයෙන්ම නැති කරන්න පුළුවන් වුණේ රාජ්‍ය බුද්ධි සේවාවේ අප ළඟ තොරතුරු තිබ්බ නිසයි.

ප්‍ර: දැන් එහෙනම් ඔබට ඒ ගැන සතුටුයි දෙවන ප්‍රහාරය වළක්වාගන්න ඔබ විශේෂ කැපකිරීමක් කරා කියලා?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: ඒ වෙනුවෙන් ඔබට ප්‍රශංසා හෝ උසස්වීම් හෝ යමක් ලැබුණද ඔබ හා ඔබගේ අනිකුත් නිලධාරීන්ට?

පි: මේ වෙනකොට ලැබිලා නැහැ ස්වාමිනි.

ප්‍ර: මොකද ඒ ? ඒ ගැන මොකද ඔබට කියන්න තියෙන්නේ ?

පි: තැගි මුදල් යවලා තිබ්බාට තාම හම්බුණේ නැහැ කියන එක තමයි දැන ගන්න තියෙන්නේ.

ප්‍ර: හේතුවක් තියෙනවද?

FAIR COMMENT — BY JEZEEM —

පි: එහෙම විශේෂ යමක් නම් දන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: අවසාන ප්‍රශ්නය මට අහන්න ඕන ඔබෙන් දැන් මේ සහරාන් සම්බන්ධ වෙච්ච අලියාර් හන්දියේ සිද්ධිය ඒ සිද්ධියට සහරාන්ගේ පාර්ශවය වෙනුවෙන් ප්‍රසිද්ධි නීතිඥමහත්වරු කවුරුත් නඩු වලට පෙනී හිටියද?

පි: ප්‍රසිද්ධ නීතිඥ මණ්ඩලය කොළඹින් ආවා.

ප්‍ර: කවද?

පි: මෛත්‍රී ගුණරත්න.

ප්‍ර: වෙන?

පි: ඔහු සමඟ තම මුස්ලිම් නීතිඥයෙක් පැමිණියා. නම මතක හැටියට දෙවන තුන් වන නඩු වලට තමයි මොවුන් පැමිණියේ. ඒක සහරාන්ගේ බිරිඳ හාදියාගේ සහෝදරයා සමඟ තමයි මේ නඩුවට ඒ නීතිඥවරයා පැමිණ තිබ්බේ.

ප්‍ර: කොහොමද ආවේ කියලා ඔබට දැන ගන්න ලැබුණද තොරතුරු?

පි: ඒක තමයි නීතිඥ සම්බන්ධ කරලා තිබ්බේ දන්න විදිහට අපට ලැබිච්චි අරාංචි අනුව මේ සහරාන්ගේ බිරිඳගේ සහෝදරයා.

ප්‍ර: ඔවුන් මඩකලපුවට ආවේ කොහොමද කියලා නඩුවට?

පි: නඩුවට පැමිණීම සම්බන්ධව එහෙම ලොකු මතකයක් නැහැ ස්වාමිනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඔබගෙන් ගරු කොමසාරිස්තුමා ප්‍රශ්න කරනු ලැබුවා, පුහුණුවීම් ලබාගෙන ඔබ කිව්ව ආකාරයට අනතුරුව ලංකාවෙන් බැහැර වූ අය පිළිබඳව ඔබෙන් ප්‍රශ්න කරනු ලැබුවා?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: ඊට අදාළව ඔබෙන් වාර්තාවක් තියෙනවද ඔබ දැනටමත් එක වාර්තාවක් පිළියෙළ කරලා තියෙනවා. ඒ වාර්තා අමතරව තව වාර්තාවක් තිබෙනවද ඉදිරිපත් කරන්නට ?

පි: සහරාන්ගේ හම්බන්තොට සහ නුවරඑළිය කඳවුරු වල පුහුණුව ලැබ දැනට අත්අඩංගුවට ගැනීමට නොහැකිව විදේශගතව සිටින පිරිසක් සම්බන්ධයෙන් මම වාර්තාවක් ඉදිරිපත් කරා 2019. 09.19 වන දින.

ස්වාමිනි එම වාර්තාව X- 137 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

ප්‍ර: චානක හේරත් මහත්මයා දැන් ඔබගේ සාක්ෂියෙන් කියවුණා මේ කාත්තන්කුඩි ප්‍රදේශයේ අවුරුදු 15යි 20 අතර තරුණයන් 300කට වැඩි ප්‍රමාණයක් මේ සහරාන්ගේ අනුගාමිකයන් හැටියට කියලා?

පි: එසේයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඒ ප්‍රදේශයේ නැද්ද මේ Recreation club එකක් වගේ Sport club එහෙම මොනවත් නැද්ද මේ තරුණයෝ සම්බන්ධයෙන් කටයුතු කරන?

පි: තිබෙනවා ස්වාමිනි.

ප්‍ර: ඒවගේ සාමාජිකයෝ සිටියද?

පි: මේ සංවිධානය තුළද

ප්‍ර: නැහැ නැහැ සංවිධානය තුළ නෙවෙයි. සාමාන්‍යයෙන් ?

පි: සාමාන්‍යයෙන් එහෙම Sport club තියෙනවා ස්වාමිනි.

ප්‍ර: මේ පුද්ගලයෝ සාමාන්‍යයෙන් සාමාජිකයෝද කියලා බැලුවේ නැද්ද?

පි: මේකේ සහරාන්ගේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයට සම්බන්ධ කට්ටියත් ඒ club ඉන්නවා ස්වාමිනි.

ප්‍ර: මොනවද foot ball club ද මොනවද ඒවා?

පි: වැඩි හරියක් මුස්ලිම් කට්ටිය ඉන්නේ foot ball තමයි සම්බන්ධ වෙලා තියෙන්නේ.

ප්‍ර: ඒ තත්වයක් තිබෙද්දීත් මේ ආගම ගැන තමයි මුල් වුණේ?

පි: ඔව් එතන සහරාන්ගේ දේශන වල තමයි මේ තරුණයෝ වශී වෙලා තිබ්බේ. සහරාන්ගේ අපි මූලික පරීක්ෂණ වල දී අපිට අනාවරණය වෙලා තියෙන්නේ සහරාන් ආගම සම්බන්ධයෙන් ලොකු දැනීමක් නැහැ. මොකද සහරාන්ගේ ළඟම උගන්වපු මවුලවිලා සමඟ මවුලවිලගෙන් අපිට අනාවරණය වුණා මේ සහරාන්ට ආගම සම්බන්ධයෙන් හරි ආගම සම්බන්ධයෙන් ලොකු දැනීමක් නැහැ කියලා. නමුත් ඔහුගේ අර කරිෂ්මත්වය අර දේශන කිරීමේ හැකියාව තමයි තියෙන්නේ. එකෙන් තමයි මේ ආකර්ෂණය කර ගන්නේ තරුණයන්ව.

ප්‍ර: දැන් අර නුවර එළියේ හම්බන්තොටයි තිබ්බා කිව්වානේ පුහුණු කඳවුරු?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: ඒවායේ දී ආයුධ එහෙමත් පාවිච්චි කරලා තියෙනවද?

පි: මිල්හාන් T-56 අවිය වෙඩි තියලා නැහැ. නමුත් වෙඩි තියෙන ආකාරය මැගසින් එකකට පතොරම් පුරවන ආකාරය ටාගට් එකක් ගන්න ආකාරය ගැන උගන්වලා තියෙනවා.

ප්‍ර: ප්‍රායෝගික වෙඩි තැබීමක් සිද්ධ වෙලා නැහැ ?

පි: නැහැ ඉදිරියට අපි Live Activities කරනවා කියලා තමයි කියලා තියෙන්නේ. නමුත් ඊට කළින් මේ ප්‍රහාර එල්ල කිරීම නිසා ඒවා කර ගන්න බැරිවුණා. Drive Activities තමයි කරලා තිබ්බේ.

ප්‍ර: ආයුධ කොහෙන්ද හොයා ගන්නේ කියලා එහෙම දන්වලා එහෙම කියලා එහෙම නැද්ද?

පි: ඒ කට්ටිය ළඟ අර මොහොමදු නියාස් වෙඩි තියෙන කොට T- 56 ක් තිබ්බා. ඊට අමතරව අපි ආයේ ඔලුවිල් වලින් හොයා ගත්තා T- 56ක්

Prashant Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

හොයා ගත්තා. නිතරම එක T- 56ක් අරගෙන තමයි අතින් අතට යවලා එකෙන් තමයි මේ සම්බන්ධව පුහුණුවීම් කරලා තිබ්බේ ඒ කඳවුරු වලදී.

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ ප්‍රකාශ කළා ගරු සභාපතිතුමා විසින් අසන ලද ප්‍රශ්නයක දී ඉන්දීය බුද්ධි සේවාව විසින් ඉතාමත්ම නිවැරදි ලෙස මෙම ප්‍රහාරය පිළිබඳව අවසාන දිනයේදීත් තොරතුරු වාර්තා කරලා තිබුණා. එම තොරතුරු වාර්තා කිරීමේ දී ඔවුන්ගේ ඔත්තුකරු මෙම කණ්ඩායම ඇතුලේම සිටි අයෙකු විය හැකියිද කියලා ඔබ එයට පිළිතුරක් දුන්නානේ?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: එතකොට එම ඔත්තුකරුවා මෙම කණ්ඩායමේම සිටියානම් එම ඔත්තුකරුවා කිසිදු උපද්‍රවයකින් තොරව ගලවා ගැනීමේ මෙහෙයුමකුත් ඔබ දීර්ඝ කාලීන බුද්ධි අත්දැකීම් තියෙන කෙනෙකු ලෙස ඔබට කියන්නට පුළුවන්ද එම ඔත්තුකරුවා නිරුපද්‍රිතව ගළවා ගැනීමේ මෙහෙයුමකුත් ඔවුන් එබඳු බුද්ධි සංවිධානයක් විසින් කළ හැකියිද කියා?

පි: ඔව් දැන් අපේ රාජ්‍ය බුද්ධි සේවාවේ අත්දැකීම් අනුව අපි ඒ වගේ operation එකක් කරානම් අපි handle කර ගෙන අපි ගලවා ගන්නවා එතනදී. නමුත් මට කියන්න අපහසුයි මෙහෙම කරානම් එහෙම දෙයක් කරාද කියලා.

ප්‍ර: එහෙම නිරුපද්‍රිතව ගළවා ගැනීමේ මෙහෙයුමක් කරන බුද්ධි ආයතනයක් ඔත්තු ලබා දුන් අයට ශ්‍රී ලංකාව තුල දීර්ඝ කාලයක් තැන් තැන් වල රැඳී සිටීමීට ඉඩ හරී කියලා ඔබ හිතනවද?

පි: එහෙම ඉඩ හරී කියලා හිතා ගන්න අමාරුයි ස්වාමිනි.

ප්‍ර: ඔබ සඳහන් කරා ඔබ ලබා දුන්නු වාර්තාවක කරුණු17ක් ඉදිරිපත් කරා කියලා එම යුධ හමුදා ප්‍රධානියාගේ ප්‍රධානත්වයෙන් පසුව තිබුණු රැස්වීමේ දී එක කරුණුක් තමයි මගේ මතකය නිවැරදි නම් මුස්ලිම් ජනාවාස අලුතින් ඇති කිරීම සහ ඒ අශ්‍රිත කරුණු පිළිබඳව කිව්වොත් නිවැරදිද ඔබ ඇතුල් කරාද ඔබගේ වාර්තාවට? මිනිසුන් අලුතින් පදිංචි කරවීම වැනි නැගෙනහිර ප්‍රදේශය තුළ ජනාවාස වගේ ඇති කරලා ඔබගේ අර වාර්තාවක් දුන්නා නේද කරුණු 17ක් තියෙන?

පි: එසේයි ගරු ස්වාමිනි. මේ කරුණු 16කි යටතේ ස්වාමිනි මම මේක වාර්තා කරේ. අපි කතා කළ මාතෘකා යටතේ. එදා දවසේ කතා කළ මාතෘකා යටතේ. ඒ යටතේ..

ප්‍ර: ඒ යටතේ සඳහන් වෙනවද මුස්ලිම් අලුතින් ජනාවාස වගේ ඇති කිරීම රජයේ ඉඩම් වල පදිංචි කරවීම වැනි මාතෘකාවන් ?

පි: නීති විරෝධි ඉඩම් අත්පත් කර ගැනීමක් සඳහන් කරලා තියෙනවා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: ඒ මොකක්ද ඔබ පැහැදිලි කරන්නේ එදා රැස්වීමේ දී සාකච්ඡා වුණේ මොකක්ද ඒ නීති විරෝධි ඉඩම් අත්පත් කර ගැනීම ?

පි: විශේෂයෙන්ම මුස්ලිම් ජාතිකයින් විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ නීති විරෝධිව ඉඩම් අත්පත්කර ගැනීමක් දැඩිව ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම පොතුවිල් පැත්ත අත්පත් කර ගැනීම සිද්ධ වෙනවා. ඊට අමතරව අක්කරපත්තු වට්ටමඩු ප්‍රදේශයේ මේක සිදු වෙනවා. පොතුවිල් කරන්කෝ, කෝමරියාවේ ඉඩම් නීතිවිරෝධි ලෙස අත්පත් කර ගැනීම සිදු වෙනවා. මුහුදු මහා විහාරය ආශ්‍රිතවත් මේක සිදු වෙනවා.

ප්‍ර: ඒවා එක්කෝ රජයේ ඉඩම් රක්ෂිත හෝ එහෙම නැත්නම් මේ පුරාවස්තු බෞද්ධ සිද්ධස්ථාන වලට අයිති ඉඩම්ද?

පි: ඒවා රජයේ පුරාවිද්‍යා වටිනාකමකින් යුක්ත ඉඩම්. මේවාට හොර ඔප්පු හරි රජයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල මුස්ලිම් නිලධාරින්ගේ සහාය ඇතිව වෙනත් ඔප්පු හදාගෙන මේ අත්පත් කර ගැනීම සිදු කරනවා.

ප්‍ර: ඔබට නිරීක්ෂණය වුණාද මෙසේ ඉඩම් අත්පත් කරගෙන පදිංචි කරවන මෙම පුද්ගලයන් 2009 ට පෙර දීර්ඝ කාලයක් පැවති යුද්ධය නිසා අවතැන් වූ මුස්ලිම් ජනතාවද කියලා ?

පි: යුද්ධය නිසා අවතැන් වූ මුස්ලිම් ජනතාව නෙවේ. ඉඩම් අලුතින් අත්පත් කර ගැනීමක් තමයි සිද්ධ කරන්නේ

ප්‍ර: ඔබට නිරීක්ෂණය වුණාද නැගෙනහිර පළාතේ විශේෂයෙන්ම ඔය පූනානි ප්‍රදේශයේ අර විශ්ව විද්‍යාලය Baticaloa Campus කියන එක. ඒ යටතේ ඔවුන්ට ලබා දුන් ඉඩම ප්‍රමාණයට වඩා විශාල ඉඩම් ප්‍රමාණයක් ඔය විදිහට අයිති කරගෙන තියෙන බවට ඔබගේ නිලධාරින් මඟින් තොරතුරු ලැබුණාද?

පි: ඉඩම් අත්පත් කර ගැනීමක් සම්බන්ධයෙන් දැනුවත් නැහැ ස්වාමිනි.

ප්‍ර: නැහැ ඉඩම් අල්ලා ගැනීමක් ඔබ ඔය පවසන ආකාරයට?

පි: ඉඩම් අල්ලා ගැනීමක් සිදු කරා එක පාරටම ඒ හරියේ. නමුත් පසුව එහෙම මං දැනුවත් විදිහට එහෙම පස්සේ අල්ල ගත්ත කට්ටිය ඉවත් කිරීමක් සිදු කරා.

ප්‍ර: ඒ කොයි අවුරුද්දේද?

පි: පූනානි වල යුද්ධය ඉවර වුණත් එක්කම.

ප්‍ර: නමුත් දැන් අර විශ්ව විද්‍යාලය තිබෙන ස්ථානයට යාබද ඉඩම් වල අලුතින් ජනාවාස ඇති කිරීමක් වෙනවා කියලා ඔබ දැකලා තියෙනවද ඔබ එම මාර්ගයෙන් යන අවස්ථාවක දී හෝ මුස්ලිම් පල්ලි 2ක් හදලා අලුත් ජනවාස?

FAIR COMMENT
BY JEZEEM

පි: එහෙම ව්‍යාප්ත වීගෙන එනවා. ඒ හරියේ සිංහල කට්ටියත් වටේට සිංහල ජනපද තියෙනවා. සිංහල කට්ටියත් මුස්ලිම් කරන්න උපක්‍රමයක් ක්‍රියාත්මක වී ගෙන එනවා ඒ පැත්තේ.

ප්‍ර: එම ප්‍රදේශයේ ද ඔය රීදිතැන්න කියන ගම්මානය තියෙන්නේ ?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: ඒ රීදිතැන්න ගම්මානය සිංහල පාරම්පරික ඓතිහාසිකව සිංහල මිනිස්සු ජීවත් වෙච්චි ගම්මානයක්ද ?

පි: රීදි තැන්නේ සිංහල ජනාවාස තියෙනවා.

ප්‍ර: ඔබලාට බුද්ධි තොරතුරු වාර්තා වුණාද ඔය ෂයිනි කියන සහරාන්ගේ සහෝදරයාගේ බිරිඳගේ පියා ගපූර් මාමා කියන පුද්ගලයා ඔය රීදීතැන්නේ මහවැලි ව්‍යාපාරය යටතේ කිසියම් පුද්ගලයෙකුට ලබා දී තිබෙන ඉඩමක් එම ඔය ගපූර් මාමා විසින් ලක්ෂ 25/20ක මුදලකට වෙනත් මුස්ලිම් තරුණයෙකුට ලබා දී ගෙන තිබෙනවා කියලා?

පි: ලක්ෂ 20කට ලබා දීලා තිබ්බා. අක්කර 20 ක පමණ ඉඩමක්. ඒක අබ්දුල් කාදර් නොහොත් සාෆිට තමයි භාර දීලා තිබ්බේ මේ ඉඩම.

ප්‍ර: දැන් මොකක් ද දැන් එතකොට මේ ගපූර් මාමා නේද මේකට මුදල් දීලා තියෙන්නේ?

පි: ගපූර් මාමායි, ෂයිනියි තමයි ඒකට මුල් වෙලා තිබ්බේ.

ප්‍ර: එතකොට දැන් ඒ රජයේ දේපළ නැවත රජය විසින් මොකක් හරි නීතියානුකූල මාර්ගයකින් ලබා ගැනීමකට කටයුතු සිදු වෙමින් පවතිනවද ?

පි: නාම නඩුවට අදාළව මේ ඉඩමත් අබ්දුල් කාදර් අපේ තොරතුරු මත තමයි අත්අඩංගුවට ගත්තේ. දැනට ඉඩම දැනුවත් විදිහට සහරාන්ලාගේ සංවිධානයට සම්බන්ධයි කියලා තමයි ඒකේ අපි දැනට නඩු භාණ්ඩයක් විදිහට තමයි මේක තියෙන්නේ මං දැනුවත් විදිහට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අබ්දුල් කාදර්ට භාර දුන්නාට පස්සේ ඒ සහරාන්ලාට අයිති දේපළක් විදිහට තමයි මේක ගැනෙන්නේ ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරානේ ඔබ පූනානි ප්‍රදේශයේ දැන් ඔය ඉස්ලාම් ආගමට බෞද්ධ අය හැරවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා කියලා. ඔබලාට බුද්ධි තොරතුරු ලැබෙනවද එම වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නේ මේ ජාතික තවුහිද් ජමාත් වගේ සංවිධානයක් ද කවුද මේ මෙවා කරන සංවිධානයක් හඳුනාගෙන තිබෙනවාද?

පි: පූනානිවල හරවන්නේ ජාතික තවුහිද් ජමාත් සංවිධානය නෙවේ. දැනට විශේෂයෙන්ම ඒ පැත්තේ ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සිලෝන් තවුහිද් ජමාත් කියලා තියෙනවා. එකේ සිලෝන් තවුහිද් ජමාත් ඉන්නේ අර බුදු හාමුදුරුවෝ මිනී මස් කනවා කියලා කිව්වේ අබ්දුල් රාසික්

ප්‍ර: ශ්‍රී ලංකා තවුහිද් ජමාත් ?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව් ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානයෙන් මොහු අයින් වෙලා දැන් අලුතින් හදා ගත්තා සිලෝන් තවුහිද් ජමාත් කියලා.

ප්‍ර: නමුත් අබ්දුල් රාසීක් කියන එක්කෙනා මේ කොළඹ Operate වෙනවා. නමුත් අර වගේ පැතිවලටත් ගිහිල්ලා කරනවා?

පි: කරනවා. මොකද මේ අබ්දුල් රාසීක් තමයි ඔය සාරාත් ඒ පැත්තට ඒ හරහා තමයි දෙමළ එයා තමයි උදව් කළේ හස්තූන්ට සාරාව දෙමළ ඉඳන් මුස්ලිම් ආගමට ගෙන ඒමට.

ප්‍ර: හොදයි ඔබ සඳහන් කරා සිබ්ලි පාරුක් කියන දේශපානඥයකු සමඟ සහරාන්ට 2017.03.10 දිනෙන් පසුව එම ප්‍රදේශයෙන් පලා යාමට උදව් කලා කියලා?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: ඔබට බුද්ධි තොරතුරු වාර්තා වෙලා තිබෙනවද මෙම සහරාන් කියන පුද්ගලයා ඔය 2017.03.10 සිදුවීමෙන් පසුව මන්නාරම ප්‍රදේශයේ සිලාවතුර කියන පැත්තෙන් ධීවර යාත්‍රාවක නීති විරෝධී විදියට ඉන්දියාවට ගියා කියන තොරතුරු ඔබලාට ලැබී තිබෙනවද?

පි: සහරාන්ද

ප්‍ර: ඔව්?

පි: සහරාන් ඉන්දියාවට ගියා කියලා තොරතුරු කිසිවක් ලැබිලා නැහැ

ප්‍ර: ඔබ දැන් අර කියපු සිබ්ලි ෆාරුක් ගැන තොරතුර බුද්ධි තොරතුරක් හැටියට ඔබ වාර්තා කරලා තියෙනවද ඔබගේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා වෙත මේ සිබ්ලි ෆාරුක් සහරාන්ට පලායාමට උදව් කරා කියන එක ?

පි: ඒ කියන්නේ වාර්තාවක් වශයෙන් ඉදිරිපත් කරලා නැහැ සිබ්ලි ෆාරුක් අපි කටින් කියලා තියෙනවා සිබ්ලි ෆාරුක් මේ සහරාන්ලාට උදව් කරනවා කියලා.

ප්‍ර: ඔබ සඳහන් කරානේ කල්මුණේ සියාම් කියලා එක්කෙනෙක් ඔහු මැද පෙර දිග රටකට හිටිය බවත් ඔබ සඳහන් කරා නේද කල්මුණේ සියාම් කොහේද හිටපු රට?

පි: මට ස්වාමිනි මතකයට එන්නේ නැහැ හිටපු රට

ප්‍ර: ඔබ අසන්ට ලැබිලා තිබෙනවද රිලා මර්ෂුෆ් කියන පුද්ගලයා කියලත් ඔබ කිව්වානේ ඔහුත් කල්මුණේ පුද්ගලයෙක් නේද?

පි: කල්මුණ මරදමුණේ

ප්‍ර: ඔහුත් ඉන්නේ විදේශ රටක නේද මැදපෙරදිග?

පි: මැදපෙරදිග

ප්‍ර: මොකක්ද ඒ රට?

පි: සෞදි

ප්‍ර: මේ කල්මුණේ සියාමුයි ,රිලා මර්රුෆ් දෙන්නම කල්මුණේ ප්‍රදේශයේ නේද?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි: කල්මුණ ප්‍රදේශයේ.

ප්‍ර: ඔබලාගේ බුද්ධි තොරතුරු වලට වාර්තා වුනාද මෙම කල්මුණේ ප්‍රදේශයේ සිටින වෛද්‍යවරයකු සහ මේ රිලා කියන පුද්ගලයාගේ අතර පවත්නා හිතවත්කමක් පිළිබඳව කල්මුණේ ප්‍රදේශයේ සිටින ඔහු වැඩ කරන්නේ කොළඹ නමුත් ඔහුගේ ගමත් මේ කල්මුණේ ?

පි: එහෙම තොරතුරක් වාර්තා වෙලා නැහැ ස්වාමිනි.

ප්‍ර: වෛද්‍ය සූෆියාන් කියලා?

පි: සූෆියාන්ද

ප්‍ර: සුෆියාන් කියලා වෛද්‍යවරයෙක් මේ රිලා කියන පුද්ගලයා මේ වෛද්‍යවරයා සමඟ සකච්ඡා කර රිල්වාන්ගේ අර බෝම්බයක් ටෙස්ට් කරපු අවස්ථාවේ දී වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට උදව් කරපු බවට තොරතුරු ඔබලාට වාර්තා වෙලා තියෙනවද?

පි: එහෙම මම නම දන්නේ නැහැ නමුත් එහෙම උදව්වක් කරා කියලා මට තොරතුරක් ආවා.

ප්‍ර: සෆ්රාස් කියලා වෛද්‍යවරයෙක් මේ කොළඹ General Hospital එකේ ඔහු විශේෂඥ වෛද්‍යවරයෙක් ?

පි: මට එහෙම නම මතක නැති වුණාට රිල්වාන්ට ඔහුගේ පිපිරීම සිදුවුනාට පස්සේ උදව් කරා කියලා තොරතුරු වාර්තා වෙලා තියෙනවා.

ප්‍ර: ඔබ ඒ වගේම සඳහන් කරනේ මේ රිලා කියන රිලාන් මර්රුෆ්ගේ එක දරුවෙකුගේ හෘදය වස්තුවේ රෝගයක් තියෙන බව එම වෛද්‍යවරයා මෙම හෘදවස්තුවේ රෝගය තියෙන දරුවා පිළිබඳවත් රිලා සමඟ කටයුතු කරන වෛද්‍යවරයෙක් ඒ තොරතුරු ඔබලාට ලැබුණේ නැහැ නේද?

පි: එම වෛද්‍යවරයා සම්බන්ධ තොරතුරු ලැබිලා නැහැ ස්වාමිනි අපි ඉන්දියාවේ මේ ප්‍රතිකාර ගන්න ඒ රෝහලයි ඒ වෛද්‍ය මධ්‍යස්ථානය ගැන ඒ තොරුතුරු අපි ළඟ තියෙනවා.

ප්‍ර: දැන් ඔබට කියන්නට පුළුවන්ද මේ රිලා මර්රුෆ් කියන පුද්ගලයා ජාතික තවුහිද් ජමාත් සංවිධානය සමාජිකයෙක්ද නැතිනම් ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම්ගේ සමාජිකයෙක්ද?

පි: ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සාමාජිකයෙක්

ප්‍ර: රිලා මර්රුෆ්

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: ඔහු වෘත්තියෙන් ඉංජිනේරුවරයෙක්ද ?

පි: qs කෙනෙක්

ප්‍ර: ඔබ සඳහන් කරා විවිධ අන්තවාදී සංවිධාන පිළිබඳවත් ඔය ඉස්ලාම් අන්තවාදයට පරිබාහිරව ඔබලාගේ බුද්ධි තොරතුරුවලට සොයා ගත්තායි කියලා බෞද්ධ අන්තවාදී සංවිධාන කීපයක් සහ ඔය සිවසේනා සංවිධානය ගැන මෑතක දී ප්‍රවෘත්ති වලින් ප්‍රචාරය වුවා මේ ඉන්දීය

FAIR COMMENT BY JEZEEM

සිවසේනා සංවිධානය හඳුන්වනවා කියලා ඊලාම් ශිවසේනා සංවිධානය කියලා එහෙම තියෙනවද ඉන්දියාවේ ඊලාම් ශිවසේනා සංවිධානය?

පි: ඉන්දියාවේ තමයි ශිවසේනා සංවිධානයක් තිබෙන්නේ. නැගෙනහිර පළාතේ පාර්ලිමේන්තු මන්ත්‍රී යෝගේෂ්වරන් මහතා තමයි සහයෝගය දක්වන්නේ මේ ශිවසේනා සංවිධානය නැගෙනහිර පළාතට ව්‍යාප්තියට. දැනට උතුරේ තමයි ක්‍රියාත්මක වෙන්නේ නමුත් මේ යෝගීෂ්වරම් මන්ත්‍රීවරයා හරහා නැගෙනහිර පළාතට ව්‍යාප්ත වෙමින් පවතිනවා ඔහු උත්සාහ කරමින් ඉන්නවා නැගෙනහිර පළාතට මේක ගෙන්න

ප්‍ර: ඒ යෝගේෂ්වරම් කියන මන්ත්‍රීවරයා ඊට ඉස්සෙල්ලා LTTE එකට සම්බන්ධ වෙච්ච පුද්ගලයෙක්ද LTTE සංවිධානයත් සමඟ?

පි: සාමාජිකයෙක් නෙවේ උදව් කරපු පුද්ගලයෙක්.

ප්‍ර: TMBP සංවිධානයක් තිබුණානේ යුද්ධ කාලයේ දී ටැමිල් මක්කල් විඩුගලිල් පිලිගන් කියලා පිල්ලෙයාන්?

පි: පිල්ලෙයාන්ගේ.

ප්‍ර: ඒ සංවිධානය තවමත් ක්‍රියාකාරී සංවිධානයක් හැටියට නැගෙනහිර පළාතේ තියෙනවද තහනම් කලේ නැද්ද යුද්ධෙන් පස්සේ?

පි: නෑ ස්වාමිනි ඔවුන් පහුගිය පළාත් පාලන මැතිවරණයේ දී චෙන්කලඩි ප්‍රාදේශිය සභාවත් ඔවුන්ගේ භාරයේ තිබෙන්නේ.

ප්‍ර: ඔබ සඳහන් කරා නේද 2019.04.05 වෙනි දින ඔබගේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ප්‍රධාන කාර්යාලය ඔබට අර 2019.04.04 වෙනිදා විදේශිය බුද්ධි සේවාවකින් ලැබුණු තොරතුරු පිළිබඳව දැනුවත් කරා කියලා ඒ වගේම ඔබට අර 20 වෙනිදා ලැබුණු තොරතුරක් දැනුවත් කරා 21 වෙනිදා තොරතුර තමයි ඔබට දැන්වුයේ නැත්තේ කියලා ඒ වගේම ඔබ මෙම කොමිෂමේ දී සඳහන් කරා ඔබට කිසියම් බුද්ධි තොරතුරක් ලැබුණොත් ඔබ එම රාජකාරි කරන ප්‍රදේශයේ සිටින ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා සමඟ අවශ්‍ය කටයුතු කිරීම සඳහා සාකච්ඡා කරනවා කියලා මෙම බුද්ධි තොරතුර පිළිබඳව දැන් ඔබලා විශේෂයෙන්ම 2016 වසරේ සිට මේ සහරාන්ගේ මේ ආගමික අන්තවාදය විශේෂයෙන්ම ඔහු මේ ජිහාඩ් කිරීම ඉස්ලාම් රාජ්‍ය එවැනි දේවල් ඔහුගේ අන්තවාදී දේශනාවල් වලින් කරලා තිබෙන බව ඔබලාගේ බුද්ධි සේවාව හොඳටම හඳුනාගෙන තිබුණා. ඒ වගේම ජමාතේ මිල්ලතු ඊබ්‍රහිම් කියන සංවිධානය සහ සහරාන් අතර සබැඳියාව 2017 වසරේ ආරම්භ වුණා කියලත් ඔබලා ළඟ තොරතුරු තිබුණා ඒ වගේ විශේෂ තොරතුරු තිබියදී දැන් ඔබලාට ඇත්තටම මේ බිම් මට්ටමට ගිහිල්ලා අත්අඩංගුවට ගැනීමට වැනි දේවල් කරන්න අපහසුයිනේ. නමුත් ඔබ හිතුවේ නැද්ද කිව්වා නම් පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට මේ මිනිසුන් ගැන සොයා බලන්නට තිබුණා කියලා හිතුණේ නැද්ද ඔබට?

FAIR COMMENT
BY JEZEEM

පි: මේක ස්වාමිනි දැන් 4. 4 තොරතුර සහරාන්ලා ප්‍රහාරයක් එල්ල කරන කරන බවටත් තොරතුර, ඉතින් මේක ප්‍රාදේශිය මට්ටමින් බෙදා හැරීමක් අපි සාමාන්‍යයෙන් සිදු කරන්නේ නැහැ . මේක අපි Ground එකේ තොරතුරු තමයි එක්රැස් කරන්නේ. ඒක අපි තොරතුර ඒ වාගේ ඒවා රහසිගත තොරතුරක් පොලිසි වලට එනවානම් එන්නේ අපි අධ්‍යක්ෂකතුමා පොලිස්පතිතුමා දැනුවත් කරාම. පොලිස්පතිතුමා හරහා තමයි පල්ලහාට එන්නේ.

ප්‍ර: හරි ඔබලාගේ බලසීමාව තුළ ඔබ සිද්ධ කරාද ඔබගේ නිලධාරීන් යොදවලා සහ ඔබගේ ඔත්තුකරුවන් යොදවලා මේ තොරතුරු ඔබට ලැබුණු දිනයේ සිටම මේ කණ්ඩායම මේ ඔය ප්‍රදේශයෙන්ම කණ්ඩායමක්නේ. සෙවීම සඳහා මොකක් හරි විශේෂ මෙහෙයුමක් ඔබ ක්‍රියාත්මක කරා ද?

පි: විශේෂයෙන්ම මෙහෙයුමක් ක්‍රියාත්මක කරා. විශේෂයෙන්ම කාත්තන්කුඩි නවත්වලාම team එකක් හිටියා. ඊට අමතරව කොළඹිනුත් මට සහයෝගයට එව්වා. ඒ අනුව තමයි සහරාන්, රිල්වාන්, ෂයිනි මේ කට්ටිය කවුරුත් මේ වෙනකොට කාත්තන්කුඩි හිටියේ නැහැ. අපට අනාවරණය වුණා මිල්හාන් ගැනත් අපි විශේෂ අවධානයක් අපි යොමු කරා. මිල්හාන් විදේශ ගත වුණා කියලා ආරංචි වුණාම තොරතුරු අනාවරණය වුණාම ඒක අපි රාජ්‍ය බුද්ධි සේවාව අනුව මූස්ථානය දැනුවත් වීම මත තමයි මිල්හාන් ප්‍රහාරයට පසුව සෞදියේදී අත්අඩංගුවට ගැනීමට හැකිවන්නේ තොරතුරු මත. නමුත් අපි සාරා ගැන හොයන්න විශේෂයෙන් මේ බැලුවා. නමුත් එහෙම සාරා සම්බන්ධයෙන් තොරතුරකුත් අනාවරණය කර ගන්න බැරිවුණා. අපි කාත්තන්කුඩි විශේෂයෙන්ම අනිත් ජාලායේ අය අපි හඳුනාගෙන තිබුණු පිරිස කාත්තන්කුඩි වලම තමයි රැඳිලා හිටියේ.

ප්‍ර: ඔබට කියන්නට පුළුවන්ද පාලමුනෙවල අර 2019. අප්‍රේල් 16 වෙනිදා රාත්‍රියේ මෝටර් බයිසිකල් බෝම්බයක් පිපිරුණානේ නේද. එම පාලමුනෙ කියන්නේ ආරියම්පති කියන ප්‍රදේශයේ තියෙන ගමක්ද ?

පි: ආරියම්පති.

ප්‍ර: ඔබට හැබැයි අයිති වෙන්නේ නැහැ ඕක මඩකලපුව දිස්ත්‍රික්කට අයිති වෙන්නේ. එතකොට ඔබට කියන්නට පුළුවන්ද අපි මේ කොමිෂන් එකේ සියලුම සාමාජිකයින් අපි නිරීක්ෂණ වාරිකාවක යෙදුණ අවස්ථාවේදී විශේෂයෙන්ම දුටුවා එම අක්කර 43 අර ඉඩමක් තිබුණානේ. විශාල ඉඩමක්. ඒ අර මෙම කොමිෂම හමුවේදි ඒක හිස්බුල්ලා කියන ඒ ප්‍රාදේශිය දේශපාලඥයට තමයි අයිති වෙලා තිබුණේ. එයා පස්සේ වෙන කෙනෙකුට වික්කා කියලා. එම ඉඩමේ ඇතින් තියෙනවා හින්දු දේවාලයක්. හින්දු කෝවිලක් ඒ අනුව ඔබට කියන්නට පුළුවන්ද ඒ ඓතිහාසිකව එය දෙමළ ජනතාව ජීවත් වෙච්ච ප්‍රදේශයක් ද කියලා

FAIR COMMENT BY JEZEEM

මේ ආරයම්පති කියන්නේ මේ දෙමළ ජනතාව බහුලව ඉන්න ප්‍රදේශයක් නේද?

පි: ආරයම්පති කියන්නේ සම්පූර්ණ දෙමළ. ආරියම්පති පැන්නහම කාත්තන්කුඩි තමයි මුස්ලිම් ඉන්නේ.

ප්‍ර: නැහැ මේ පලාමුනෙ තියෙන්නේ ආරයම්පතිවල නේ?

පි: පාලමුනෙ අයිති ආරයම්පති.

ප්‍ර: ඒ අනුව ඔබට කියන්නට ඔය අක්කර 43ක විශාල ඉඩමක මුහුදට යාබදව තියෙන්නේ ප්‍රාදේශිය ලේකම්වරයෙක් ඉන්නවද ආරයම්පතිවලට? කොහේද ඉන්නේ ප්‍රාදේශිය ලේකම් කාත්තන්කුඩිද?

පි: ආරයම්පතිවලට ප්‍රාදේශිය ලේකම්වරයෙක් වෙනම ඉන්නවා වගේ මතකයක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර: මොකද එම ඉඩමේ නමත් තියෙන්නේ තිරුකෝණ ඒ වගේ මුස්ලිම් බවක්..?

පි: මේකේ ආරයම්පති සම්පූර්ණයෙන්ම මුස්ලිම් ජනතාව තමයි ඉඳලා තියෙන්නේ.

ප්‍ර: දෙමළ ජනතාව?

පි: sorry දෙමළ ජනතාව. පස්සේ මෑත කාලයේ තමයි ඒ ඉඩම් මුස්ලිම් කට්ටිය අත්පත් කරගෙන ඉඳලා තියෙන්නේ. මේ කාත්තන්කුඩි ගත්තත් අපි ඉතිහාසය බැලුවොත් එහෙම මේ කාත්තන්කුඩි, දෙමළ මේ කහතාන් කියන දෙමළ සම්භවයක් ඉන්න මිනිස්සු තමයි මේ කාත්තන්කුඩි ජනවාස කර ගත්තේ.

ප්‍ර: මොකක්ද කහතාන් කියන සම්භවය කියන්නේ?

පි: කහතාන් කියන දෙමළ සම්භවයක් තියෙන මිනිස්සු කොට්ඨාශයක් තමයි වාසය කරලා තියෙන්නේ. ඒ ලන්දේසින් ඉංග්‍රීසින් එන්න කළින්. ඊට පස්සේ ඒ කාලයේ වෙළඳාමට ආව මුස්ලිම් කට්ටිය තමයි මේ දෙමළ ඒ සම්භවයක් ඇති ගෑණු සමඟ විවාහ වෙලා මේ කාත්තන්කුඩි මුස්ලිම් බවට පත්වෙලා තියෙන්නේ.

ප්‍ර: එම තොරතුරු අපිට වැඩිදුරට හොයා ගන්න ඕන නම් ප්‍රාදේශිය ලේකම්ගෙන් සොයා ගන්නට පුළුවන් වෙයි නේද? මෙම අක්කර 43 අර ඉඩම පිළිබඳව ?

පි: පුළුවන් ස්වාමිනි.

ප්‍ර: ඔබ මෙම කොමිසම හමුවේදී ප්‍රකාශ කරා අර දෙවනි ප්‍රහාරය සඳහා සාරා අතේ පින්තූරයක් තිබුණායි කියලා මේ ක්‍රිස්තියානි දේවස්ථානයක් ගැන ?

පි: තේතාතිව්.

ප්‍ර: කාත්තන්කුඩිය පැත්තේද?

පි: කලවංචිකුඩි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: සාරා අතේ තියෙන්න පුළුවන්ද පළවෙනි ප්‍රහාරයට අදාලව ඔබ ඔය සඳහන් කරපු ආකාරයේ සියලුම සැලසුම් සහරා අතෙත් තිබුණා වෙන්නට පුළුවන් ද?

පි: බොහෝවිට තියෙන්නට පුළුවන් ස්වාමිනි. මොකද මේ කාදියා ප්‍රකාශ, මේ කට්ටිය ඇවිල්ලා 23 වෙනිදා නින්දුර් ගෙදර තමයි ඉන්නේ නින්දුර් ගෙදර ඉන්න කොට මේ හාදියත් සයින්දමර්දු ගෙදර ඉඳන් එනවා නින්දවුර් ගෙදරට 23 සාරාත් එනවා අඩ්ඩාලව්වේන ගෙදර ඉඳන් නින්දවුර් ගෙදරට එතකොට .

ප්‍ර: නින්දවුර් ගෙදර කියන්නේ අර ?

පි: අපි අල්ල ගත්ත .

ප්‍ර: දෙවනි අර ගෙවල් දෙකක් තිබුණේ ,

පි: නැගෙනහිර ස්වාමිනි. එතකොට ස්වාමිනි සාරා හාදියාට පෙන්වනවා මේ අර අපි දිවුරුම දුන්න වෙලාවේ අර කලුපාට ඇඳ ගත්ත සහරාන්ගේ ඉස්සරහා දිවුරුම් දුන්න phone එකට ආව photo එකක්. ඒ කියන්නේ හස්තූන් එවලා තියෙනවා දිවුරුම් දුන්නාට පස්සේ මේ සාරාට ඒ photo එකක්. එතකොට ඒ ගිහිල්ලා අපේ කට්ටිය මේ දිවුරුම් දුන්න විදියට කියලා photo එකක් හාදියාට පෙන්නුවා. ඒකේ සහරාන් විතරයි පේන්න ඉන්නේ. අනිත් කට්ටිය මුහුණ වහගෙන ඉන්නේ.

ප්‍ර: හස්තූන් කාටද එවන්නේ?

පි: සාරාට.

ප්‍ර: ඒ කියන්නේ ප්‍රහාරයට ඉස්සරවෙලා එවනවා ප්‍රහාරය දෙන්න සූදානම් වෙන පින්තූරයක් ?

පි: ඔව් පින්තූරයක් ප්‍රහාරයට කලින් අර දිවුරුම් දෙන අවස්ථාවේදී ගත්ත photo එකක් තමයි සාරාට එවලා තියෙන්නේ. සාරා ඒක මේ හාදියාට පෙන්නවා photo එක අපේ කට්ටිය මේ කලින් Oaths දෙන කොට ගත්ත මේ photo එකක් කියලා.

****

දැන් වේලාව : ප.ව.7.50
මෙතැන් සිට ල/ලේ : චන්දිමා මෙනවිය

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව. 7.50
පෙර සටහන් : ල/ලේ නිල්මිණි
මෙතැන් සිට : චන්දිමා දිල්හානි

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: ඒ අනුව ඔබ කියන්නේ සාරා දන්නවා මේ ස්ථාන ප්‍රහාරය එල්ල කරන්නට යන ඔක්කෝම විස්තර එයා දන්නවා?

පි: දන්නවා මොකද ඒ පොටෝ එකක් හස්තූන් එව්වා නම් මේ හස්තූන්ගේ මාර්ගයෙන් සාරා දැන ගන්න හැකියාව තියෙනවා ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබගේ බුද්ධි තොරතුරු අනුව හෙලිවෙමින් පවතිනවද සාරා තාම ලංකාවේ ඉන්නවද එහෙම නැත්නම් සාරා වෙන රටකට පැනලා ගියාද එහෙම නැත්නම් සාරාව යොදවපු කට්ටිය සාරාව රැගෙන ගියාද එවැනි තොරතුරු?

පි: සාරා විදේශ රටකට යැව්වා කියලා තමයි තොරතුරු තියෙන්නේ.

ප්‍ර: යැව්වා කියලා? කවුරු යැව්වා කියලද?

පි: ඒකට සම්බන්ධ වුණ පුද්ගලයන් සම්බන්ධව මම කලින් කිව්ව වාර්තාවක් ඉදිරිපත් කරා ඒ ඇසින් දුටු සාක්ෂි ඊට අමතරව දැනට තියෙන තොරතුරු අනුව අනාවරණය වෙලා තියෙනවා උදව් කල පුද්ගලයෝ සම්පූර්ණ වාර්තාවක් මම 2019.05.31 ඉදිරිපත් කරලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඔබ යැව්වා ඔබගේ ප්‍රධානියාට?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ දිර්ඝකාලීන අත්දැකීම් ඇති බුද්ධි නිලධාරියෙක් නිසා ඔබට කියන්නට පුළුවන්ද දැන් මෙම සහරාන්ලාව පිළිබඳව 2016 සිටම රාජ්‍ය බුද්ධිසේවා සිට ඉතා හොඳින් තොරතුරු දන්නවා ඔහුගේ ආගමික අන්තවාදය ත්‍රස්තවාදයක් කරාම යමින් තිබෙන බව?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: සහ රාජ්‍ය බුද්ධි සේවාව ඔය ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධානය පිළිබඳව 2015 ඉඳලා ආවේක්ෂණය කරමින් තිබෙනවද?

පි: ජමාතේ මිල්ලති ඊබ්‍රාහිම් සංවිධානය කියන්නේ සංවිධානයක් නෙමේ.

ප්‍ර: ඒ පුද්ගලයෝ කීප දෙනෙක් ගැන?

පි: මේක සමාජ ජාල මාධ්‍ය හරහා ෆන්ෂන් වුණ එකක් ඒ පුද්ගලයෝ සම්බන්ධයෙන් අපිට අවබෝධයක් තිබ්බා මුල ඉදන්ම

ප්‍ර: නමුත් ඔබට මෙම කොමිෂම හමුවට ලැබී ඇති තොරතුරු අනුව යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය මෙම පස්දෙනා ඔය බෝම්බ ප්‍රහාරයේ 08 දෙනාගෙන් පස්දෙනක්ම ජමෙයිතුල් මිල්ලතු ඊබ්‍රාහිම් සංවිධානයේ සහ ඔවුන්ව අවේක්ෂණය කරලා තිබෙනවා එතකොට

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඔබලාගේ ආයතනයේ සහරාන්ලා පිළිබඳව ඉතා හොඳින් දන්නවා ඒ වගේම තවත් බුද්ධි අංශයක් JMI කණ්ඩායමක් ගැන ආවේක්ෂණයක් කරලා තියෙනවා 2019 .අප්‍රේල්.19 අවේක්ෂණය කරලා තියෙනවා එහෙම තිබිය දී ඇයි අපේ රටේ බුද්ධි සංවිධානවලට ඉන්දියාව සාර්ථකව මේක දැනගත්තා වුවද අපේ රටට මේ ගොල්ලෝ දැන් මේ ප්‍රහාරය කරනවා කියන එක දැනගන්නට නොහැකි වුණේ අප්‍රේල් 04 වෙනිදා තොරතුරු ලැබී තිබියදි මොකක්ද ඔබට ඒගැන මෙම කොමිෂමට කියන්න තිබෙන්නේ?

පි: ඒක තොරතුර දැන් රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකතුමා දැනුම් දීලා තිබ්බා පොලිස්පතිතුමාට දන්න විදියට ඉතින් මේක මුලඉදන්ම ඒක සම්බන්ධව සක්‍රිය දායකත්වයක් දක්වලා තිබ්බේ නැහැ මේ ප්‍රහාරය සාමන්‍ය තොරතුරක් විදියට තමයි සලකලා තිබ්බේ ඉතින් මීට වඩා 4.4 ට අමතරව 4.18,4.19 ,4.20 ම‍ං දැනුවත්ව තොරතුරු යවලා තියෙනවා මේ සම්බන්ධයෙන් ඊට වඩා අවධානයක් යොමු කරා නම් මේ මොකද අපි දන්න විදියට මේක පොලිස්පතිතුමාගේ ඉදන් OIC ට යනකම් තොරතුර ඇවිල්ලා තියෙනවා තොරතුරු ඉතින් අර වැඩි දායකත්වයක් ලැබුණා නම් මේවා කරන්න පුළුවන් ඊයේ අමතරව මේ අනිකුත් ඒ බුද්ධි අංශ මම දන්නැහැ ඒ දවස්වල එහෙම සම්බන්ධවෙලා ඒ සිකුරිටි කවුන්සල් තිබ්බ නම් එහෙම තිබ්බද කියලා ඒ කට්ටියට දැනගන්නට හැකියාවක් තිබෙනවා.

ප්‍ර: මම මේ ප්‍රශ්නය වෙන විදියකට අහන්නම් දැන් ඔබ රාජකාරි කරන රාජ්‍ය බුද්ධි සේවාව විසින් කිසියම් ඔත්තුකරුවෙකු මෙම කණ්ඩායම ඇතුලට යොදවලා ආවේක්ෂනයක් කරා නම් ඔය JMI එකේ කණ්ඩායමට 2019 අප්‍රේල් 19 දක්වා ඔවුන් ආවේක්ෂනය කරානම් ඇතුලට පුද්ගලයෙක්ව දාලා ඔය කණ්ඩායම මේ ප්‍රහාරය කරනවා කියන එක එම පුද්ගලයා මඟින් හෙලි කරගන්නට බැරිද ? ඉන්දියාව කරපු ආකාරයට?

පි: ඔව් ඒ JMI ප්‍රහාරයට සම්බන්ධ කණ්ඩායමට තොරතුරු කරුවෙකු දම්මලා හිටියානම් අනිවාර්යෙන්ම යම් කිසි හෝඩුවාවක් සම්පූර්ණ තොරතුර නැතත් සෑහෙන තොරතුරක් ගන්න තිබ්බා ස්වාමිනි.

ප්‍ර: එහෙම ගන්න බැරි වුනානම් ඒ මොන වගේ අවස්ථාවකදී ද ගන්න බැරිවෙන්නේ කියලා ඔබට කියන්න පුළුවන් ද බුද්ධි නිලධාරියෙක් හැටියට දාලා තියෙනවා පුද්ගලයෙක් ඇතුලට එහෙම දාලා නිබුණත් ඒ නිවැරදි තොරතුරු එම බුද්ධි ආයතනය වෙත නොලැඹියාමට මොන වගේ අවස්ථාවලදී සිදුවන්නට පුළුවන්ද?

පි: එක්කෝ දාලා තියෙනවා කියලා බොරු කියන්න ඕනේ එහෙම නැත්නම් දාලා යපු කෙනා හරි ආකාරව වැඩේ කරලා නැහැ ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඔබ ඊයේ දින මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා නැගෙනහිර පළාතේ IS ක්‍රියාකාරකම් පිළිබඳව අර 2016 තිබුණ රැස්වීමේදී සාකච්ඡා කරාය කියලා?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබට මතකද ඔබ 2018 ජනවාරි මාසේ 09 වෙනිදා ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට වාර්තාවක් ඉදිරිපත් කරනවා නැගෙනහිර පළාතේ IS ක්‍රියාකාරකම් සම්බන්ධව

පි: ඔව් ඒක ඒ රිපෝට් එකේ එවලා තිබ්බෙ වැඩි දුර විස්තර වාර්තාවක් ඉදිරිපත් කරේ ඒක අපේ ආයතනයට එවලා තිබ්බා මේ කලවන්චිකුඩි ප්‍රදේශයේ IS ව්‍යාප්තියක් තියෙනවා කියලා.

ප්‍ර: විදේශිය බුද්ධි අංශයන්ගෙන් යම් වාර්තාවක් ඇවිල්ලා තිබුණාද ඒක ආකාරයට ඔබට වාර්තා කරන්නට සිදුවුණේ ඒ පිළිබඳ ?

පි: මගෙන් ඉල්ලා තිබුණේ කොහොම තොරතුරු ආවාද කියලා මම දන්නේ නැහැ.මගෙන් ඉල්ලා තිබුණේ කලවන්චිකුඩි ප්‍රදේශයේ IS ව්‍යාප්තියක් තියෙනවද කියලා නමුත් මේ කලවන්චිකුඩි කියන්නේ සීයට සියක් දෙමල ඉන්න ප්‍රදේශයක් මේ කලවන්චි කුඩි මුස්ලිම් කෙනෙක්වත් නැතිව IS ව්‍යාප්ත්තියක් තියෙන්න නැහැ මම ඒ වාර්තාවේ සඳහන් කරලා තියෙන්නේ මේ කලවන්චිකුඩි IS ව්‍යාප්තියක් නැහැ. IS එකට සම්බන්ධ එනකොට නැගෙනහිර පළාතේ වුණත් සහරාන් වුනත් අමීස් හරහා තමයි ජමීල් හරහා තමයි මේ IS සම්බන්ධ වෙන්නේ කියලා අපට තොරතුරු තියෙනවා. එහෙම නැතිව මේ IS එකට සම්බන්ධව සහරාන් ගිහිල්ලා IS එක්ක හොද සම්බන්ධකමක් පැවැත්තුවා කියලා අපිට තොරතුරු නැහැ. නමුත් මම ඒ රිපෝට් හැදුවේ ඒ කලවන්චිකුඩි එහෙම එකක් නැහැ නමුත් මේ IS සම්බන්ධයෙන් නැති වුනත් මේ අන්තවාදීය පතුරවන අපි දන්න මේ මේ අන්තර්ජාලය හරහා IS මතවාදය ව්‍යාපත් කරන පුද්ගලයෝ සම්බන්ධ මම වාර්තාවක් ඉදිරිපත් කරා.

ප්‍ර: ඒ සඳහා ඔබ භාවිතා කෙරුවේ විවෘත තොරතුරු ද නැත්නම් සංවෘත තොරතුරුද ?

පි: නෑ ඒ සම්බන්ධව IS මතවාදය කරන්නේ

ප්‍ර: කොහොමද හොයා ගත්තේ?

පි: විවෘතයි සංවෘතයි දෙකම පාවිච්චි කරා එතකොට ඒකේදී අන්තර්ජාලය හරහා තොරතුරු වගේම ඒ වෙන කොට රිල්වාන් හුස්නි මුබාරක් අපි හදුන ගෙන තිබ්බෙ. ඒ කට්ටියත් ඉදිපත් කරා ඒවා තොරතුරු Ground

FAIR COMMENT BY JEZEEM

source ඊට අමතරව අනෙක් තොරතුරු අන්තර්ජාලය හරහා IS මතවාදය හරහා පතුරන තොරතුරුත් ඇතුලත් කරා.

ප්‍ර: හුස්නි මුබාරක් ගැන ඔබ වැඩිය විස්තර කෙරුවේ නැහැ ඔහු ගැන කෙටි විස්තරයක් කරන්න පුළුවන් ද ගරු කොමිෂන් සභාවට?

පි: හුස්නි මුබාරක් තමයි මේ කලින් කිව්වා වගේ හුස්නි මුබාරක්ගේ 2016 ඔහුගේ විවාහ උත්සවයෙන් තමයි මේ සංවිධාන දෙක එකතු වුණේ කියලා මං කලින් පැවසුවේ.

ප්‍ර: ඒ කියන හුස්නි මුබාරක් තමයි ඔබ ඔය සඳහන් කරන්නේ ඒ විවාහ උත්සව තිබුණ අර මරඳමුණේ? දැන් මේ 2018 ජනවාරි 09 වෙනිදා ඔබ ඉදිරිපත් කරපු ඒ වාර්තාවේ ඔබ කිව්වා සංවෘත වගේම විවෘත තොරතුරුත් ආශ්‍රය කරගෙන IS සංවිධානයට හිතවත්ව අදහස් පලකරන අය පිළිබඳව තොරතුරු ඇතුලත් කරාය කියලා එතකොට ඒ අය ගැන සවිස්තරාත්මකව ඔබ ඇතුලත් කරන්නට අන්තර්ජාලය පිළිබඳව විමසිලිමත් වුණාද?

පි: ඔව් අපි ඔපරේෂන් එකක් වෙනම කරනවා අන්තර් ජාලය හරහා මේ IS අන්තවාදය පැතිරෙන කවුද කියලා බලන්න ඒක අපි කල්මුණ මගේ දිසාපති කාර්යංශය හරහා තමයි කරන්නේ එතකොට ඒක හරහා අපි monitor කරගෙන ආවා මුල ඉදන්ම මේ IS සංවිධානයේ මතවාදය මේ ලංකාවේ ව්‍යාප්ත කරන්නේ අන්තර් ජාලය හරහා කවුද කියලා

ප්‍ර: එතකොට වෙබ් සයිඩ් පිළිබඳව ඔබ සලකලා බැලුවද? මොනවද ඒ වෙබ් සයිඩ්ස් කියලා මොනවද ඒ?

පි: IS සංවිධානයේ ප්‍රධාන WWN නවුලික්ස්. COM ඩිපෙන්ස් අරාබි . කොම් WW වුඩෝ. නෙට් ඇරබික් ඒ වගේ වෙබ් අඩවි ගැන අවධානය යොමු කරනවා. ඊට අමතරව බුන්නාත් මීඩියා කියලා තියෙනවා. අල්තක්කා ෆවුන්ඩේෂන් කියලා එක තියනෙවා. වැටි රූම් එකක් තියෙනවා අර රයට් . කොම් කියලා ඒ වගේ IS සංවිධානය ප්‍රචාරය කරන ඒවා තියෙනවා. මොනවද ඒවා ගැනත් අපි අවධානය යොමු කරන්න ඕනේ විශේෂයෙන්ම ලංකාවේ මේ රයට් ඩොට් කොම්මම කිව්ව බුණාත් මී ෆවුන්ඩේෂියා අල් තක්කාර් අමීන් මීඩියා ෆවුන්ඩේෂන් ඒ වගේ ඔවුන් IS සංවිධානය ප්‍රහාරයක් එල්ල කරන්න කලින් සාමන්‍යයෙන් සමහර තැන්වලදී හෝඩුවාවක් දෙනවා උදාරහණයත් විදියට නත්තල් උත්සවයට සමගාමීව සැන්ඩගේ බෙල්ල කපලා තියෙනවා. ඒ පොලිස් නිලධාරින්ට වෙඩි තියෙනවා ඒ වගේ යම් යම් හෝඩුවල් දෙන අවස්ථා තියෙනවා මේවා හරහා. ඉතින් ඒවා ගැනත් අපි අවධානය කරන්න ඕනේ ඊට පස්සේ ඒවා අනුව IS සංවිධානය හෝ රටක එයට අදාලව එකක් වෙන්න පුළුවන් මොකද නත්තල් උත්සව කාලයේදී ඉන්දියාවේ පොලිස් නිලධාරියෙක් සම්බන්ධව ටාගට් කරලා වෙඩි තියන දර්ශනයක් IS

FAIR COMMENT BY JEZEEM

සංවිධානයකට පක්ෂපාති වෙබ් එකක දාලා තිබ්බා. ඒ වගේම ඉන්දියාවේ ඒ කෙනෙක්ට වෙඩි තිබ්බා.

ප්‍ර: ඒ හින්දා ඔබ විමසිලිමත් වුණා එතකොට මෙම ව වෙබ්සයිඩ් හරහා IS මතවාදය පළකරන දේවල් පිළිබඳව ඒ ඇසුරුකරන සහ සිය මතවාදය IS මතවාදයට පක්ෂ ග්‍රාහිව අදහස් පලකරන තැනැත්තන් පිළිබඳ තොරතුරු මේ වාර්තාව සමඟ ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට ඉදිරිපත් කෙරුවද?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: ඒ වගේ කීදෙනෙක් පිළිබඳව ඔබ ඒ වාර්තාවේ ඇතුලත් කරාද? අපිට කියන්න පුළුවන් නම් ඒ නම මොකක්ද කොහෙන්ද අන්තර්ජාලයට පිවිසිලා තියෙන්නේ සහ ඒ කුමන ප්‍රදේශයෙන්ද? මුහුණු පොතෙන්ද ඒ හැම දෙනාම අන්තර්ජාලයට පිවිසිලා තියෙන්නේ?

පි: අර්හම් අහමඩ් එක්කෙනෙක් ඉන්නවා සනාජිත් සජිත් එක්කෙනෙක් ඉන්නවා කාත්තන්කුඩියේ මොහොමඩ් අසාද්,මොහොමඩ් ලරීෆ් කියලා තව පුද්ගලයෙක් ඉන්නවා ,මොහොමඩ් පාහින් කියලා පුද්ගලියේ ඉන්නවා.

ප්‍ර: ඔබේ ඔය තොරතුරු සොයා ගැනීමේදී දැන ගන්න පුළුවන් වුණාද ඒ සියලුම දෙනා නැගෙනහිරෙන්ද නැගෙනහිර ප්‍රදේශයේද මේ අන්තර්ජාලයට පිවිසිලා තිබ්බේ එහෙම නැත්නම් රටේ විවිධ ස්ථානවලින්ද කියලා?

පි: සමහර පුද්ගලයෝ ඉන්න වැඩි හරියක් අපි බැලුවේ නැගෙනහිර පළාතේ සමහර අය දැඩිව ප්‍රතිචාර ඉගෙන ගන්න කට්ටිය වෙනපැතිවලිනුත් දාලා තියෙනවා උදාහරණයක් විදියට මේ ෂනාස් අහම්ඩ් කොළඹ ඉඳන් තමයි මේවා කරේ ඊට අමරතව මම කලින් කිව්වා හුස්නි මුබාරක් ප්‍රචාරය කරා ලොකු විදියමට මේ IS මතවාදය මේ අන්තර් ජාලය හරහා එහෙම රිලා මර්ෂුද් ඔහු සෞදි ඉඳන් මේක කරා. අබ්දුල් හමීඩ් මිල්හාන් මිල්හාන් නෙමේ මිල්හාත් සෙන්අබ්දීන් හිල්ට් කියලා මොහු ප්‍රචාරය කරා මරදමුනේ එ වගේ තොරතුරු ඉදිරිපත් කරලා තියෙනවා.

ස්වාමිනි 2018 ජනවාරි මස 09 වන දින සාක්ෂිකරු විසින් ඔහුගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට ඉදිරිපත් කොට ඇති මෙම වාර්තාව X 138 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්නට අවසර පතනවා

****

FAIR COMMENT
BY JEZEEM

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

ප්‍ර: සාක්ෂිකරු ඔබගේ මේ තොරතුරු රැස්කිරීමේ දී මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් ආමී මොහිදීන් යන තැනැත්තාව කාත්තන්කුඩි පොලීසිය විසින් අත්අඩංගුවට ගැනිමක් සිදුනොකළේ යම් හේතුවක් නිසා බව මං ඔබට වාර්තා වෙනව ද?

පි: ආමී මොහිදීන් මුල් කාලේදි අලියාර් Case එකෙන් ඒ කියන්නේ මුල් සිදුවීම් කාලයේ 2017 .03.10 ටික කාලයක් යන කම් කාත්තන්කුඩි ප්‍රදේශයේම හිටියා. නමුත් කාත්තන්කුඩි පොලිසියෙන් අත්අඩංගුවට ගත්තේ නැහැ අපිට දැනගන්න ලැබුණේ පොලීසියට කරන උදව් කිරීම අනුව තමයි අත්අඩංගුවට ගන්න නැත්තේ කියලා.

ප්‍ර: මොකද්ද උදව් කිරිම ?

පි: සල්ලි දිලා තියෙනවා.

ප්‍ර: දැන් පාස්කු ප්‍රහාරයට පෙර මං අහන සමහරක් ප්‍රශ්න වලට ඔබ උත්තරය දැනටමත් දෙන්න ඇති. සම්පූර්ණ වශයෙන් ආවරණය වුණා ද කියලා බලන්නයි මේ ප්‍රශ්න අහන්නේ. ඒක හින්දා ඔබ කලින් පිළිතුරු දිලා තිබ්බත් ඒකට පිළිතුරු ලබා දෙන්න.

පි: එසේය ස්වාමීනි.

ප්‍ර: පාස්කු ප්‍රහාරයට පෙර රාජ්‍ය බුද්ධි සේවාව සහ ප්‍රාදේශීය පොලිසිය අතර තොරතුරු හුවමාරු කරගැනිමක් සිදු වුණා ද?

පි: රාජ්‍ය බුද්ධි සේවාවෙන් ප්‍රාදේශීය පොලිස් ස්ථාන වලට තොරතුරු ලබාදීමක් කරන්නේ නැහැ. ස්වාමීනි ඒක අපි ground එකේ තොරතුරු රාජ්‍ය බුද්ධි සේවා මූලස්ථානයට දැන්නුවයින් පස්සේ රාජ්‍යය බුද්ධි අධ්‍යක්ෂතුමා පොලිස්පතිතුමා හෝ ඒක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයක නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට තොරතුරු ලබාදීමක් සිදු කරනවා.

ප්‍ර: පාස්කු දින ප්‍රහාරයට පසු එම ක්‍රමවේදයේ වෙනසක් වුණාද?

පි: පාස්කු දිනට පසුව එදාම අධ්‍යක්ෂතුමා ඉන්නේ නියෝජ්‍යය අධ්‍යක්ෂකතුමා දෙන්නම කතා කරලා කිව්වා දෙවන ප්‍රහාරය වළක්වාගන්න පුළුවන් අපිට විතරයි. ඒ නිසා මේකට සක්‍රිය ලෙස අපේ අවධානය ගැන හිතන්නේ නැතුව දායක වෙන්නෙයි කියලා.

ප්‍ර: එයින් මොකද්ද ඔබ අදහස් කරන්නේ?

පි: ඒ කියන්නේ අපි පොලීසියට සම්බන්ධ වෙලා ඇමුණුම 01. ඒ තොරතුරු පොලිසිය ලව්වා වැටලීම් කරන්න, අපිත් ප්‍රධාන වශයෙන් දායක වෙන්න කියලා.

ප්‍ර: ඒ කියන්නේ ඒ අවස්ථාවේ පාස්කුදින ප්‍රාරයෙන් පසුව රාජ්‍යය බුද්ධි සේවයේ තිබුණ තොරතුරු ප්‍රාදේශීය පොලිසියවලට සැපයීමක් සිදු වුනා?

පි: ප්‍රාදේශිය පොලිස් සේවා ස්ථානවලට ඒක සැපයීම OIC ලට නෙවෙයි මම අර කලින් කියපු වගේ කොට්ඨාශ පොලිස් අධිකාරිතුමන්ලාට

FAIR COMMENT BY JEZEEM

නියෝජ්‍යය පොලිස්පතිතුමාට දැන්වුවාට පස්සේ ඒක වැටලීම් වැඩක් මොකද ඔවුන් දන්නේ නැති නිසා අපිටත් සහභාගි වෙන්න සිදු වුණා.

ප්‍ර: දැන් සයින්දමරුදු බෝම්බ පිපුරුණු ස්ථානයේ අවටින් යම් CCTV කැමරා දර්ශන සොයා ගත්ත ද පාස්කු දින ප්‍රහාරයෙන් පසුව මේ සයින්දමර්දු බෝම්බ පිපිරීමෙන් පසුව?

පි: ඒ ආසන්නයේම මාර්ගයකින් CCTV විඩියෝ පටයක් හොයාගත්තා ස්වාමීනි.

ප්‍ර: ඒක කාටද භාර දීලා තියෙන්නේ?

පි: ඒකට දැනට හොයාගත්තට පස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට භාරදීලා තියෙනවා.

ප්‍ර: දැන් ඔබ සාරා ජෙස්මින් සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් කෙරුවා?

පි: එසේ ස්වාමීනි.

ප්‍ර: 2019 අප්‍රේල් 26 ට පසුව සහරා ජෙස්මින් ජීවත්ව සිටින බවටනේ ඔබට තොරතුරු ලැබුණේ?

පි: ඔව් මුලින් ලැබුණේ ඒ විදියට තමයි තොරතුරු.

ප්‍ර: එතකොට ඊට පස්සේ ඔබ කිව්වා ඇයට ඉන්දියාවට යෑම සඳහා යම්කිසි පුද්ගලයෙක් පුද්ගලයින් අධාර ලබාදුන්න කියලා තොරතුරු ලැබුණා කියලා?

පි: ඒසේ ස්වාමීනි.

ප්‍ර: එම අධාර ලබාදුන් පුද්ගලයින් අතර යම් පොලිස් නිලධාරීයෙක් ඉන්න බවට තොරතුරු ලැබුන ද?

පි: ලැබුණා ස්වාමීනි.

ප්‍ර: කවුද ඒ පොලිස් නිලධාරියා?

පි: අම්පාර පොලිස් ගරාජයේ ස්ථානාධිපතිවරයාව ඉන්න ප්‍රධාන පොලිස් පරීක්ෂක අබුබකර් ස්වාමීනි.

ප්‍ර: කල්මුණේ සියාම් ඔබ කියන හැටියට අත්අඩංගුවට ගත්තේ 2019 මැයි 20 වැනිදා?

පි: එසේ ස්වාමීනි.

ප්‍ර: ඊට පෙර කල්මුණේ සියාම් යම් කිසි අවස්ථාවක අත්අඩංගුවට පත් වෙනව ද?

පි: අපි අත්අඩංගුවට ගත්තට පස්සේ තමයි අපිට කිව්වේ කල්මුණේ පොලිසියෙන් අත්අඩංගුවට අරන් තියෙනවා සැකපිට කියලා. සැකපිට හරි මට හරියටම මතක නැහැ. මොකක් හරි වෙන වැටලීමකට දන්නේ නැහැ. මේ ත්‍රස්තවාදී ජාලයට සම්බන්ධව නෙවෙයි. නිකන් මේ වෙන වැරැද්දකට කල්මුණේ සියාම් අත්අඩංගුවට අරන් නිදහස් කරලා තිබ්බා.

ප්‍ර: ඒ සිද්ධිය සිදු වුණේ කවද්ද කියලා ඔබට මතක ද?

පි: ප්‍රහාරයෙන් පසුව. ඒ කියන්නේ 04/21 යි අපි අත්අඩංගුවට 5.20 අතර.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබගේ සාක්ෂියේ දී ඔබ තවත් පුද්ගලයෙක් ගැන නම් කෙරුවා යුෂුෆ් අන්වර් කියන පුද්ගලයා?

පි: එසේ ස්වාමීනි.

ප්‍ර: ඒ යූෂුෆ් අන්වර් කියන පුද්ගලයා අර 2017 මාර්තු 10 වැනි දින අලියාර් හන්දියේ සිදු වූ සිද්ධිය සම්බන්ධයෙන් වරෙන්තුව සිටි පුද්ගලයෙක්?

පි: වරෙන්තු ලැබිලා තිබ්බේ ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔහුව අත්අඩංගුවට ගත්තයින් පස්සේ ඔහු සම්බන්දයෙන් යම් තොරතුරක් ඔබට ලැබෙනව ද ඔහු ඒ අලියාර් හන්දියේ සිද්ධිය සම්බන්ධයෙන් උසාවියට ඉදිරිපත් වෙන්න ගියා කියලා?

පි: ඉදිරිපත් වෙන්න ගියා කියලා තොරතුරක් ලැබුණා. රුස්ති කියන Lawyer හම්බවෙන්න ගිහිල්ලා තිබ්බා. ඇවිල්ලා

ප්‍ර: මොකද්ද නම?

පි: රුස්ති,අක්කරපත්තුවේ. එම නීතිඥවරයා කියලා තිබ්බා මේක නඩුව 4 වැනි මාසේ අන්තිම වෙන කොට අවසන් වෙයි ඒ නිසා උසාවියට ඉදිරිපත් වෙන්න එපා කියලා.

ප්‍ර: ඒ වෙන කොට යූසුෆ් අන්වර්ට වරෙන්තුවක් තිබ්බ ද?

පි: වරෙන්තුවක් තිබ්බා ස්වාමිනි.

ප්‍ර: ඔබගේ තොරතුරු අනුව ඒ වරෙන්තුව තිබ්බා බව නීතිඥ මහත්මයා දැනගෙන හිටියද?

පි: දැනගෙන හිටියේ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ මෙම කොමිෂමේ දුන්නු සාක්ෂි අනුව ඔබ දෙවන ප්‍රහාරය සම්බන්ධව වැළැක්වීම සම්බන්ධයෙන් විශාල කාර්ය භාර්යක් කෙරුවා කියලා ඔබ කොමිෂම ඉදිරියේ ප්‍රකාශ කෙරුවා?

පි: එසේ ස්වාමීනි.

ප්‍ර: ඒ සමඟම අර ආරක්ෂිත නිවාස සම්බන්ධයෙන් ඉස්සෙල්ලම බුද්දි තොරතුර ලැබෙන්නේ කොහෙන්ද කියලා ඔබට කියන්න පුළුවන් ද?

පි: ඒ අවස්ථාවේ මට බුද්ධි තොරතුරක් ලබා දෙන්නේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා. ඊට පස්සේ කාලක නියෝජ්‍යය අධ්‍යක්ෂතුමා තොරතුර ලබාදිලා පස්සේ ඒකට තැගි මුදල් ලබාදෙන්න යෑමේ දී ගැටළුවක් මතුවෙලා තිබ්බා ඒ තොරතුර ඉස්සෙල්ලම ඒ රියදුරු වෙන පුද්ගලයෙකුට දීලා තිබ්බා. ඒ පුද්ගලයා මාර්ගයෙන් මිගමුව දිසා බුද්ධි කාර්යංශයේ PC කෙනෙක්ට ගිහිල්ලා තිබ්බා. එතකොට ඒ හරහා තමයි නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමාට තොරතුර ඇවිල්ලා තිබ්බේ. ඒ බව අපි දන්නේ ගොඩක් ටික කාලයක් ගියාට පස්සේ මට මේ තොරතුරු ලබාදුන්නේ නියෝජ්‍ය අධ්‍යක්ෂක සම්පත් කුමාර මහතා.

ප්‍ර: එතකොට ඔබගේ ඔබ හිතන හැටියට ඒ සම්බන්ධයෙන් ඇගයීමකට ලක් විය යුතු ඇගයීමකට ලක්විය යුතු වෙනත් නිලධාරියෙක් ඉන්නවද?

FAIR COMMENT BY JEZEEM

පි: ඔව් ඒ තොරතුර ඒ මීගමුවේ පොලිස් කොස්තාපල්වරයාට දීලා තියෙනවා නම් ඔහුත් අනිවාර්යෙන් ඇගයීමට ලක් විය යුතුයි.

ප්‍ර: ඔහුගේ නම් මොකක්ද?

පි: ඔහුගේ නම ගමගේ.

ප්‍ර: ඔබගේ මේ බුද්ධිතොරතුරු රැස්කිරීමේදී අනාවරණය වෙනවද මේ සහරාන් ඇතුලු කණ්ඩායම යම් ඩ්‍රෝන කැමරාවක් සම්බන්ධයෙන් යම් අත්හදා බැලීමක් කරනවා කියලා?

පි: එකේ සම්පූර්ණ වැටලීමක මමයි ස්වාමිනි. එකේ රියාස් කියන පුද්ගලයෙක් තමයි ඒ සම්බන්ධව අත්අඩංගුවට ගත්තේ එකේ අපි වෙනම සේප් හවුස් එකක් කාත්තන්කුඩිය කුපා පටුමඟේ තිබුණු සේප් හවුස් එක හොයාගත්තා රිල්වාන් පාවිච්චි කරපු නිවසක් ඒ ගෙදර ඉදන් තමයි මේ ඩ්‍රෝණ කැමරාව යවලා තිබ්බේ මේක රුපියල් 90,000 ට තමයි මොහු රියාසත් කියන පුද්ගලයා අරන් තිබ්බේ කොළඹ නුගේගොඩ කැමරා ඩොට් එල්කේ එකෙවන් ඒකට සම්බන්ධ වෙච්ච හුස්නි අහමඩ රියාසාත් සියලු දෙනාම අත් අඩංගුවට ගැනීමට හැකි වුණා. ඒ වගේම ඒ ඔවුන් පාවිච්චි කර එක්පා පටුමගෙහි රිල්වාන්ගේ ආරක්ෂිත නිල නිවාසයත් සොයා ගන්න හැකි වුණා.

ප්‍ර: ඒ ඩ්‍රෝණ කැමරාව කුමක් සඳහා මිලට ගත්තා කියලාද තොරතුරු ලැබුණේ?

පි: ඒ ඩ්‍රෝණ කැමරාව සහරාන්ලාගේ මිටින් තියෙන කොට පාවිච්චි කරන්න හැදුවා කියලා ඔවුන් කිව්වාත් ඒ ඩ්‍රෝණ කැමරාවට පුපුරන ද්‍රව්‍යය දමලා ඔන්නම් ප්‍රහාරයක වුනත් යොදවා ගැන්න හැකියාවක් තියෙනවා කියලා මගේ විශ්වාසය.

ප්‍ර: දැන් ඔබගේ තොරතුරු රැස්කිරීමේ ක්‍රියාවලියේදි ලැප්ටොප් පරිගනකයක් ඔබ විසින් සොයාගන්නවද ඔබට ලැබුණු තොරතුරු අනුව?

පි: ප්‍රධාන සමන්තුරේ,නින්දවූර්, හැර තව lap top ඇර පරිඝනකයක් ඔසවා ගන්නවා කල්මුණ සියාම් කරා කාත්තන්කුඩි පාලමුන නෙමේ අඩ්ඩාලච්චේන පාලමුනේ කලපුවක සඟවා තිබියදි.

ප්‍ර: එය ලැප්ටොප් පරිගනකය භාවිතා කෙරුවේ කවුද කියලාද ඔබගේ තොරතුරුවලින් කියවෙන්නේ?

පි: ඒක ලැප්ටොප් පරිඝනකය අර අන්තිම දවසේ 26 වෙනිදා ෂයිනි විසින් තමයි දීලා තිබ්බේ මේක සහරාන්ගේ ලැප්ටොප් එකක් කියලා කල්මුණ සියාම්ට භාරදීලා තිබ්බේ ඒක නිසා ඒ සියාම් ප්‍රකාශ කරන ආකාරය අනුව මෙම පරිගණක Lap top වල සහරාන්ගේ ලැප්ටොප් එකක් විය හැකියි.

ප්‍ර: එම ලැප්ටොප් පරිගනකය සොයාගැනීමට මාධ්‍යවලින් ප්‍රසිද්ධ කරනු ලැබුවා නේද ඒ කාලේ?

පි: ලැප්ටොප් පරිගණකය

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ කලපුවෙන් ලබා ගන්නවා සොයා ගත්ත බව?

පි: මතක හැටියට ප්‍රචාර කරා ස්වාමිනි. මේක කාත්තන්කුඩි පාලමුණේ ඇත පේන ටවර් එකෙන් තමයි මේ ස්ථානය සොයාගත්තේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: භූමියෙන් තොරතුරු ලබා ගන්නා අවස්තාවේදී ඔබේ අවධානයට යොමු වුනාද අබු හබාබ් කියලා තැනැත්තෙක්?

පි: එසේ ස්වාමිනි.

ප්‍ර: ඔහුගේ නිවැරදි නම මොකක්ද මේක දෙන නමනේ සංවිධානයෙන් මේ සංවිධානයෙන් කියන්නේ සහරාන් විසින් ?

පි: රියාසත්

ප්‍ර: රියාසත්ගේ නිවසක් තිබුණද කොහේ හරි?

පි: ආරක්ෂක නිවාසයක් තිබ්බා කාත්තන්කුඩි පාලමුනේ කුපා පටුමගේ.

ප්‍ර: ඇයි ඒ නිවස ඔබ ආරක්ෂිත නිවසක් කියලා කියන්නේ?

පි: මේක වැඩි හරියක් භාවිතා කරලා තිබුබේ රිල්වාන්ගේ වැඩවලට .

ප්‍ර: රිල්වාන්ගේ මොන වැඩවලටද?

පි: මේ නිවසේ ඉදන් තමයි රිල්වාන් ඩ්‍රෝණ කැමරාවක් යවලා තිබ්බා ඉහලට ඒ වගේම රිල්වාන් සමහරවිට නැවතිලා ඉන්න යොදා ගන්න නිවසක් වුණා මේ නිවසේ ඉදන් ඩ්‍රෝණ කැමරාවක් යැව්ව බවට අපට අනාවරණය වුණා.

ප්‍ර: එතකොට එය පටිගත කිරීමක් කරලා තිබුණාද රිල්වාන් ඩ්‍රෝණ කැමරාවක් යැවීම ගැන

පි: පටිගත කිරීමක් කරලා තිබුණා

ප්‍ර: ඒ පටිගත කිරීම ඔබට ලැබුණද?

පි: ලැබුණා ස්වාමිනි.

ප්‍ර: ඔබට දැන් පෙන්නුවොතින් හදුන ගන්න පුළුවන්ද පටිගත කිරීම?

පි: පුළුවන් ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ දැක්ක පටිගත කිරීම ද ඔබ ඔය සඳහන් කරන්නේ ඔබට ලැබුණු තොරතුරු අනුව කරුණු සොයා බැලීමේදී අනාවරණය වූ පටිගත කිරීම විදියට?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ පටිගත කිරීමේදී යම් නිවසක් වගේ ස්ථානයක් තියෙන තැනක් පෙන්වන්න ඒ ස්ථානයද ඔබ ඔය කියන අබුහබාබ්ගේ හිටපු ස්ථානය කියන්නේ ඔය රිල්වාන් ආරක්ෂිත නිවාසයේ විදිහයට පාවිච්චි කරපු එක ?

පි: එසේය ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒක කරබලා කුරුක්කාන් පිටිපාර කාත්තන්කුඩි එකෙහි පිහිටලා තියෙන්නේ නේද?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: එතකොට රිල්වාන් ඩ්‍රෝණ යානයක් යැවීම පටිගත කරා කියලානේ ඔබ කිව්වේ ඒ පටිගත කිරීමේදී පුද්ගලයකු පෙන්වනවානේ ඉතා සමීප දසුනක් මුහුණත් එක්ක ඒ කවුද?

පි: රිල්වාන් .

ප්‍ර: ඒ රිල්වාන් ඔබ කොහොමද දන්නේ ඔහු රිල්වාන් කියලා?

පි: රිල්වාන් අපි අඳුරනවා ඡායා රූපවලින් දැකලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඔබට ඔය පටිගත කිරීම ලැබුණේ කොහෙන්ද?

පි: මේක පටිගත කිරීම මේ තිබ්බේ අපිට සමන්තුරේ තිබ්බ සමන් තුරේ නැත්නම් නින්දුර් තැන් දෙකක ඉන්න එකක තිබ්බ පෙන්ඩ්‍රයිව් එකක තමයි ඔය විඩියෝ එක තිබ්බේ.

ප්‍ර: ඔබ එතකොට ඒ ඩ්‍රෝණ පටිගත කිරීම සම්බන්ධයෙන් ඒ කියන්නේ ඩ්‍රෝණ කැමරාව ගුවන් ගත කරලා රිල්වාන් කරපු අත්හදා බැලීම ගැන ඒ වගේම අබු හබාබ්ගේ නිවස ආරක්ෂිත ස්ථානයක් විදියට රිල්වාන් පාවිච්චි කරපු එක ගැන සඳහන් කරලා ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට වාර්තාවක් ඉදිරිපත් කරාද?

පි: ඉදිරි පත්කරා ස්වාමිනි

ප්‍ර: ඒ වාර්තාව 2019. 05.වෙනි මාසේ 04 වෙනිදා ඉදිරිපත් කරලා තියෙනවා කියලා මා කිව්වොතින් නිවැරදිද?

පි: නිවැරදියි ස්වාමිනි.

ස්වාමිනි එම වාර්තාව X 139 ලෙස ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර පතනවා

ප්‍ර: එ වගේම සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ලද ඩ්‍රෝණ ගුවන් ගත කිරීමට අදාල එම පටිගත කිරීම C 936 ලෙස ලකුණු කොට ඉදිරිපත් කරනවා. ඒ C 936 කියලා ඔබ දිරිපත් කරපු CD පටයේ පටිගත කිරීම් ඔබ කිව්වානේ රිල්වාන් කියලා තැනැත්තෙක් ඉන්නවා කියලා ඒ කියන්නේ සහරාන්ගේ මල්ලිනේ නේද ?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: ඒ රිල්වාන්ට ඒ විඩියෝ පටය දකින ආකාරයට කිසිදු තුවාලයක් ඒ ඇගේ පේන ස්ථානවල සිදුවුන බවක් පෙන්නෙ නැහැ නේද ඒ වන විට?

පි: එම විඩියෝ පටයේ එහෙම පෙන්න නැහැ මොඅකද රිල්වාන්ට තුවාල සිද්ධ වුනේ 2018 ඔක්තෝම්බර් වල මේ ඊට ප්‍රථම ගත්ත එකක්

ප්‍ර: අන්තර්ජාලයෙන් සොයා ගන්නා ලද මේ විවෘත කොමිෂන් සභාවේදී බාගත ගත කර ගන්නා ලද මෙම දර්ශනය සාක්ෂි කරුගේ අවධානයට යොමු කිරීමට අවසර පතනවා. ඔබට පේනවද මෙම රූප රාමුව.

පි: එසේය ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ රූපරාමුව කුමකට අදාලව ගන්නා ලද්දක්ද බව ඔබ දන්නවද?

පි: මේ කල්මුණ සියාම්ට අවසාන මොහොතේ 2019 .4.26 වන දින ෂයිනි සහරාන්ගේ ලැප්ටොප් එකක් යැයි කියා ෂයිනි විසින් කල්මුණ සියාම්ට ලබා දුන් ලැප්ටොප් පරිගණකය

ප්‍ර: එතකොට ඔබ සඳහන් කෙරුවාණේ අර රිල්වාන් අර ඩ්‍රෝණ ගුවන්ගත කිරීම සම්බන්ධයෙන් යම් ලැප්ටොප් එකක තිබුණා කියලා?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: ඒ තිබුණ ලැප්ටොප් එකද මේ තීරයේ දැක්වෙන ඒ නිලධාරියා අල්ලා ගෙන ඒ දෙස බලන් ඉන්න ලැප්ටොප් එක?

පි: නැත ස්වාමිනි.

ප්‍ර: එහෙනම් මොකක්ද?

පි: ඒ ඩ්‍රෝණ කැමරාව තිබ්බේ ස්වාමිනි සමන්තුරේ ආරක්ෂක නිල නිවසනේ මේක පාලමුණ කලපුවේ තිබ්බේ.

ප්‍ර: මෙම තිරයේ දැක්වෙන ඡායාරූපයයේ පෙන්වානේද ලැප්ටොප් යන්ත්‍රයක්?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: ඒ ලැප්ටොප් යන්ත්‍රයේද ඔබ සඳහන් කරපු රිල්වාන් ඩ්‍රෝණ යාත්‍රාවක් ගුවන් ගත කිරීමක් අඩංගු වෙලා තිබුණේ?

පි: නැත ස්වාමිනි.

ප්‍ර: එහෙම නම් ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ගරු කොමිෂන් සභාවට මෙම ලැප්ටොප් යන්ත්‍රය කෙරෙහි ඔබලාගේ අවධානය යොමු වුනේ මොන අවස්ථාවේදීද කියලා කොහේ ඉදලාද ඒක සොයා ගත්තේ කොහේ තිබිලාද?

පි: මෙම ලැප්ටොප් පරිගණකය සොයා ගත්තේ ඔය සියාම්ගේ තොරතුරු මත අඩිවාලවේවේන පාලමුණ කලපුවක සගවා තිබිය තමයි සොයා ගත්තේ

ප්‍ර: එතකොට ඔබ කියන්නේ එහෙම නම් රිල්වාන් ඩ්‍රෝණ යත්ත්‍රාව ගුවන් කිරීමට අදාල වූ එම විඩියෝ පටිගත කිරීම ඔබලාට සොයා ගන්නට හැකි වුණේ සමන්තුරේ ආරක්ෂිත නිවාසය පරීක්ෂා කරපු අවස්ථාවේ එහි තිබූ පෙන් ඩ්‍රයිවින් එකකින් කියලා ස්වාමිනි සාක්ෂිකරු විසින් දැන් පැහැදිලිව සඳහන් කරනු ලැබුවා අන්තර් ජාලයෙන් අප විසින් බාගත කොට ඔහුගේ අවධානය වෙත යොමු කරන ලද මෙම ඡායාරූපය පාලමුණේ දී කලපුවේ දී ඔහු සොයා ගන්නා ලද ලැප්ටොප් පරිගණකය පෙන්නුම් කරන ඡායා රූපයට අනුව ඒ අනුව එම ඡායාරූපයේ මුද්‍රිත පිටපතක් C 937 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

****

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙතුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතීඥවරයාට ලබාදෙමි.

****

<u>ජනාධිපති නීතිඥ ශාමිල් පෙරේරා මහතා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ කිව්වා මේ කලවන්චි කුඩි කියන නගරයෙහි දෙවන ප්‍රහාරයක් සම්බන්ධයෙන් කතෝලික පල්ලියක් ගැන?

පි: කලවන්චිකුඩි තේතාතිව්

ප්‍ර: ඒ මොකක්ද ඒ කතෝලික පල්ලියේ නම දන්නවද?

පි: තේතාතිව් පල්ලිය කියලා තමයි කියන්නේ.

ප්‍ර: මේ මොකක්ද ඒ ඔබ කල විමසිම කොහොම ද ඒ විමසීම පල්ලියට ගිහිල්ලා බැලුවද වෙන යම් විදියකින් තොරතුරු ලැබුණද මේ සම්බන්ධයෙන් ?

පි: ඒ තොරතුර ඇවිල්ලා හාදියාගේ ප්‍රකාශයෙන් වෙන්නේ 2019.04.23 වෙනිදා සාරා එනවා නින්දුර් නිවසට ඒ වගේම ඒ අවස්ථාවේදී හාදියා සහරාන්ගේ නෝනත් එම නිවසේ සිටිනවා එතකොට සාරගේ නෝනා ෆොටෝ වගයක් පෙන්නනවා හාදියාට එකේ තිබ්බේ ඒ පොටෝවල තිබ්බේ සාරාගේ නෝනා පවසන ආකාරයට තමයි කිව්වේ ඒ ෆොටෝවල තිබ්බේ කලවන්චකුඩි තේතාතිව් දේවස්ථානයේ ෆොටෝ කියලා එතකොට සහරාන් ගේ නෝනා අහලා තියෙනවා ඇයි මේවා කියලා එතකොට සාරා කියලා තියෙනවා මේක මට ඕන වෙයි කියලා. ඒක නිසා තමයි අපි හිතුවේ දෙවන ප්‍රහාරයක් වුණා නම් සමහර විට සාරගෙ එහෙම ටාගට් එකක් තියෙන්න පුළුවන් කියලා අපිට තොරතුරක් විදියට ආවේ එකක් නෙමේ අර ෆොටෝ පෙන්නපු හින්දා තමයි අපි තීරණය කරේ සාරාගේ ෆොටෝ පෙන්නලා පැවසූ හින්දා තමයි අපි තීරණය කරේ. සාරාගේ සමහර විට ටාගට් එකක් වෙන්න පුළුවන් කියලා අපිට තොරතුරු ලැබුණේ ඊළඟ ටාගට් එක දළදා පෙරහැරට කරන්න බැරිවුණොත් අනිකුත් පන්සල්වලට

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ කිව්වා මේ සහරාන්ගේ බිරිඳ හාදියා මෛත්‍රි ගුණරත්න ජනාධිපති නීතිඥ සමඟ නඩුවකට ආවා කියලා ?

පි: සහරාන්ගේ බිරිඳ නෙවේ මෛත්‍රී ගුණරත්න කැඳවගෙන ඇවිල්ලා තිබ්බේ අලියාර් ගේ Case එකේ නඩුවට සිද්ධියට දෙවන හෝ තුන්වෙනි නඩු වාරයකට දෙපාරක් ඇවිල්ලා තිබ්බා ඒ බිරිඳගේ සහෝදරයෙක් තමයි රැගෙන ගෙන ඇවිල්ලා කියලා තොරතුරු වාර්තා වුණේ ස්වාමිනි.

ප්‍ර: දැන් ඒ මෛත්‍රි ගුණ රත්න සමඟ මුස්ලිම් නීතිඥ මහත්මයෙක් ආවා කියලාත් කිව්වා ?

FAIR COMMENT — BY JEZEEM

පි: මුස්ලිම් නීතිඥ මහත්මයෙකුත් ඇවිල්ලා තිබුණා.

ප්‍ර: ඒ මුස්ලිම් නීතිඥ මහත්මයා හිජාස් හිස්බුල්ලා මහත්මයා ද?

පි: නැහැ හිජාස් හිස්බුල්ලා නෙමේ මට දැන් මෙතන නම මතක නැහැ ස්වාමිනි නමුත් මේ හිජාස් හිස්බුල්ලා ගැන නෙමේ මේ නඩුවට උදව් කරා දැනට කල්මුණ මහනගර සභාවේ නගරාධිපති රකිත් ලෝයර් උදව් කරා. මේ නඩුවට ඒවගේම කලින් මා සඳහන් කර රුස්ති නායක නීතිඥවරයා උදව් කරා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී වැඩිදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා ප්‍රශ්න ඇසීමට ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා ඉල්ලීමක් කරයි අවසර ලබා දෙමි

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: ඔබ දැන් කියා සිටියා නීතිඥ මහත්මයා ලබා ගැනීම සම්බන්ධයෙන් සහරාන්ගේ බිරිඳගේ සහෝදරයකු කටයුතු කල යුතු බව?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: ඒ සහෝදරයාගේ නම මොකක්ද?

පි: මගේ මතකය විදියට අන්සාර් වගේ මතක

ප්‍ර: අන්සාර්?

පි: අන්සාර් වගේ නමක් තමයි මතකයට එන්නේ හරියටම මට සහෝදරයාගේ නම ලියාගෙන නැහැ. සහෝදරයෙක් උදව් කරා කියලා තමයි වාර්තා වුණේ.

ප්‍ර: එය සහරාන්ගේ බිරිඳට සහෝදරයන් කීදෙනෙක් හිටියද?

පි: විස්තර තියෙනවා මගේ ළඟ කැකුණ ගොල්ලේ ඒ විස්තර.

ප්‍ර: ඔබ ගාව තියෙනවා?

පි: තියෙනවා.

ප්‍ර: කරුණා කර මෙම නීතිඥ මහතා කැඳවා ගැනීමට කටයුතු සහෝදරයාගේ නම ඔබට කීමට හැකියාවක් තිබෙනවද බලා ලේඛන පරීක්ෂා කර බලා ගරු කොමිෂන් සභාවට එය සැල කරන්න?

පි: සහරාන්ගේ නෝනාට සහෝදරයෝ 04 දෙනෙක් සහ සහෝදරියෝ දෙන්නෙක් ඉන්නවා මෙකෙන්.

ප්‍ර: සහෝදරයන් 4 යි සහෝදරියන් දෙන්නයි?

පි: මෙකේ දෙන්නෙක් නිවුන් සහෝදරයෝ ඉන්නේ එක්කෙනෙක්ගේ නම අබ්දුල් කාදර් හසීම් අනිත් කෙනා අබුදුර් කාදර් අන්සාර් මට තොරතුරු

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ලැබුණ ආකාරයට අන්සාර් සහෝදරයා හරහා තමයි මේ මෙකට උදව් කරලා තිබ්බේ කියලා තොතරතුරු තිබ්බේ.

ප්‍ර: ඔබට තොරතුරු තියෙනවද මේ කැකුණගොල්ලෙ නිවසේ සහරාන්ගේ බිරිඳගේ නිවසේ ද මේ අන්සාර් පදිංචි වෙලා හිටියේ කියන්න?

පි: නිවසේ පදිංචි වෙලා හිටියේ නැහැ කැන්ටිමක් කරන්නේ මරදමුල්ලේ මෙයා වෙනම තමයි ඉදලා තියෙන්නේ.

ප්‍ර: ඔහු කැකුණගොල්ල නිවසේ පදිංචි කරුවෙක්ද නැද්ද කියන්න මේ අවස්ථාවේදී හැකියාවක් තියෙනවාද?

පි: හැකියාවක් තියෙනවා. මේ කැකුණගොල්ල සම්බන්ධයෙන් මඩකලපු නිසා මට මේ ගෙදර සම්බන්ධයෙන් මට අවබෝධයක් නැහැ නමුත් මං දන්න විදියට එක ළඟ තමයි මේ ගෙවල් තියෙන්නේ.

ප්‍ර ඔබ කියා සිටියා පෙර සාක්ෂි දෙන විට පොලිස් පරීක්ෂක ඩයස් කියන නිලධාරියා සමඟ ඔබ 2019.03.07වෙනිදා දුරකථනයෙන් සම්බන්ධ වුණා එහිදි ඔබ ඔහුට කියා සිටියා මේ ආමී මොහිදීන් සම්බන්ධයෙන් නිවැරදිද?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: ඒ ආමී මොහිදීන් පදිංචිවෙලා ඉන්න ස්ථානයක් ගැන ඔබ පොලිස් පරීක්ෂක ඩයස්ට දැනුම් දුන්නද?

පි: ආමී මොහිදීන් සැගිවිලා ඉන්න ස්ථානය. දැනුම් දිලා පෙන්නුම් කිරීමක් සිදු කරා අපේ නිලධාරීන්

ප්‍ර: ඔබගේ නිලධාරීන් කීදෙනෙක්ද?

පි: දෙන්නයි.

ප්‍ර: දෙන්නෙක් ඒ ස්ථානය පෙන්වා සිටියා ?

පි: එසේ ස්වාමිනි.

ප්‍ර; කොහේද ඒ ස්ථානය පිහිටලා තිබ්බේ?

පි: පාසිකුඩා.

ප්‍ර: පැහැදිලි කර ගැනීමට මං අහන්නේ එය පොල්වත්තක් මැද පිහිටා තිබ්බ නිවසක් ද නැද්ද කියන්න කියා ඔබට මතකයක් තියෙනවද?

පි: පොල්වත්තක් තුළ පිහිටා තිබ්බ මඩුවක් වගේ නමුත් එම පොඩිම නෙමේ සාමාන්‍යයෙන් ඉන්න පුළුවන් ජීවත් වෙන්න පුළුවන් හැකියාවක් තියෙන මඩුවක්.

ප්‍ර: ඔබ එම තොරතුරු ලබා දෙන විට ඩයස්ට මෙම ආමී මොහිදීන් පොලිස් පරීක්ෂක ඩයස්ට ආමී මොහිදීන් සිටින ස්ථානය ඔහුට දැනුවත් කරාද ඒ අවස්ථාවේදී මේ ආමී මොහිදීන් සම්බන්ධයෙන් වරෙන්තුවක් පවතින බවට?

පි: මම දැනුවත් කරා මගේ නිලධාරීනුත් දැනුවත් කරා.

****

President's Secretary's Copy
FAIR COMMENT — BY JEZEEM —

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍රශ්න එපමණ බව දන්වයි.

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවෙන් කාර්ය භාර්ය සම්බන්ධයෙන් දැක්වූ දායකත්වයට සාක්ෂිකරුට කොමිෂන් සභාව ස්තූතිය පලකරනවා.

මේ අවස්ථාවේදී සාක්ෂි කරු විසින් දෙන ලද සාක්ෂිය හේතුවෙන් 2015 අංක 04 දරණ සාක්ෂිකරුවන් හට චින්දිතයන් හට සහය ලබා දීම සහ ආරක්ෂා කිරීමේ පනතේ 25 (4) උපගන්තිය ප්‍රකාරව මෙම සාක්ෂිකරුට හිමිවිය යුතු සියලු වරප්‍රසාද සහ අයිතීන් ඔහුට ලබා දෙන ලෙසට සාක්ෂිරුගෙන් හා චින්දිතයන් ආරක්ෂා කිරීම සහ පහසුකම් සලසා දීමේ ජාතික අදිකාරිය වෙත නියෝග කරනු ලැබේ.

එසේම එම නියෝගයේ අන්තර්ගත වන ලිපියේ මුල්පිටපත සහ සාක්ෂිකරුට ලැබෙන ඔහුගේ පිටපත යන දෙකම මෙම සාක්ෂිකරුට නිකුත් කලයුතු බව කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරන අතර එසේ එම මුල් පිටපත සහ මුල් ලේඛන සහ පිටපත් යන ලේඛන දෙකම සාක්ෂිකරුගේ අතට භාර දුන් බව එම ලේඛනයේ සඳහන් කරන ලෙසට ද කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරනවා.

එසේම හෙට උදෑසන පෙ.ව.9.30 කොමිෂන් සභාවේ පෙනී සිටින ලෙසට සාක්ෂිකරුට අවවාද කරනවා.අදාල සියලු ලේඛනත් සමඟ.

කොමිෂන් සභාව හෙට උදෑසන කොමිෂන් සභාව ජූනි මස 23 දින පෙ.ව 9.30 රැස් වෙන බව සටහන් කර තබමි.

දැන් වේලාව. 9.50.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.07.23 වේලාව :- ප.ව. 4.00

සටහන් කළේ :- එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා (පැමිණ නැත) - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම :-

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතීඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා, චතුරංග බණ්ඩාර මහතා, සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

01.	සම්පූර්ණ නම	:	සෙනරත් කෝණාර මුදියන්සේලාගේ රංජන් සෙනරත් බණ්ඩාර
02.	වයස	:	අවුරුදු 36 යි
03.	ජාතිය	:	සිංහල
04.	ආගම	:	බෞද්ධ
05.	දැනට දරන තනතුර උසස්	:	වර්තමානයේ පොලිස් පරීක්ෂක තනතුරට වී රාජ්‍ය බුද්ධි සේවාවේ සේවය කරයි.

(සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි)

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : බණ්ඩාර මහත්මයා මීට ඉස්සර වෙලා සාක්ෂි දීලා තියෙනවද අධිකරණයක?

පි : මම අධිකරණයේ පළවෙනි වතාවට තමයි සාක්ෂි දෙන්නේ.

ප්‍ර : හරි. මම ඔබෙන් ප්‍රශ්න අහනවා?

පි : ඔව් ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

Media එකට කියන්නේ නම වාර්තා කරන්න එපා සාක්ෂිකරුගේ.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : මම ඔබෙන් ප්‍රශ්න අහනවා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒ ප්‍රශ්නවලට ඔබ දන්න දේ පිළිබඳව උත්තර දෙන්න. ඔබ කියන දේ තහවුරු කරන්න ලේඛන තියෙනවා නම් ඒවත් ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න. හොඳේ. මම අහන දේ තේරෙන්නේ නැත්නම් මට කියන්න. මම එතකොට ඔබට තේරෙන විදියට ඒක යොමු කරන්නම් ප්‍රශ්නය?

පි : එසේයි ස්වාමීනි.

ප්‍ර : අපි ඉස්සර වෙලාම බලමු ඔබ පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණු අවස්ථාව ගැන. කවදද පොලිසියට බැඳුණේ ඔබ?

පි : ගරු ස්වාමීනි මම 2008.09.21 දින තමයි පොලිස් දෙපාර්තමේන්තුවට උප පොලිස් පරීක්ෂකවරයෙක් විදියට බැඳෙන්නේ.

President's Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඔබ බුද්ධි අංශයට සම්බන්ධ වුණේ?

පි : මූලික පොලිස් පුහුණුවෙන් පසු 2009.06.26 වන දින මම රාජ්‍ය බුද්ධි සේවාවට වාර්තා කරනවා. ඊට පස්සේ එතනදී මාසයක කාලයක් මම බුද්ධි පාඨමාලාවක් හදාරනවා. ඉන් අනතුරුව රාජ්‍ය බුද්ධි සේවාවේ කොට්ඨාශයකට අන්තර්ගත වෙනවා.

ප්‍ර : හොඳයි. එහෙම පැහැදිලි කරන එක හොඳයි. හැබැයි වේගය පොඩ්ඩක් අඩු කළොත් හොඳයි මොකද මේ මිස් ලියාගන්න ඕන ඔබේ සාක්ෂිය. එතකොට තමයි එය ප්‍රයෝජනවත් වෙන්නේ. ඔබ කිව්වා මූලික පුහුණුවෙන් පස්සේ යම් ස්ථානයකට අනුයුක්ත වුණා කියලා. ඒ කොහේද?

පි : රාජ්‍ය බුද්ධි සේවාවෙම තියෙන මුස්ලිම් ත්‍රස්තවාදී සහ අන්තවාදී කටයුතු නිරීක්ෂණය කරන අංශයට.

ප්‍ර : ඒවෑ හඳුන්වා ගැනීම් ගැන කියන්නට ඕන නැහැ. විෂය පථය ගැන විතරක් කිව්වහම ඇති. ඔබ එම අංශයට අනුයුක්ත වුණේ එතකොට 2009 ද?

පි : 2009 ස්වාමීනි.

ප්‍ර : එතන ඉඳලා ඔබ මේ වෙනකම්ම සේවය කරන්නේ එම අංශයේද?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එහෙම නම් ඔබට ඔය දීර්ඝ අත්දැකීම් සම්භාරයක් තියෙනවනේ?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : මෙම සේවාවේ?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඔබට කියන්නට පුළුවන්ද ඔබලා තොරතුරු ලබා ගන්නේ මොන මූලාශ්‍රවලින්ද කියලා?

පි : අපි ස්වාමීනි විවෘත තොරතුරුවලින්, විවෘත මූලාශ්‍රවලින් ලබා ගන්නවා. ඒ වාගේම තොරතුරුකරුවන් මාර්ගයෙනුත් තොරතුරු ලබා ගන්නවා ස්වාමීනි.

ප්‍ර : එතකොට ඕවා හඳුන්වන යම් විශේෂ නම් තියෙනවද? විවෘත තොරතුරු කියලා ඔබ හැඳින්වීමක් කෙරුවනේ?

පි : විවෘත තොරතුරු කියලා කියන්නේ ස්වාමීනි Open News Papers, Web sites වලින් එන තොරතුරු තමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ ඕනෑම කෙනෙකුට ප්‍රවේශ විය හැකි ආකාරයේ තොරතුරු?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එතකොට තොරතුරුකරුවන්ගෙන් ලැබෙන තොරතුරු එසේ අන් අයට ප්‍රවේශ විය හැකි තොරතුරුද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මම එසේ විශ්වාස කරන්නේ නැහැ ස්වාමිනි. මොකද තොරතුරුකරු ඉලක්කයකට අපි යොමු කරලා ඒ ඉල්ක්කයක් තුළින් තමයි තොරතුරු ලබා ගන්නේ.

ප්‍ර : එහෙම ලැබෙන තොරතුරු කාට හරි ඉදිරිපත් කරන්නට ඕනනේ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : කාටද ඉදිරිපත් වෙන්නේ?

පි : මම මාගේ සහකාර අධ්‍යක්ෂතුමාට තමයි ඒ කියන්නේ මුල් අවදියේ මම හිටියේ ඒ අංශයේ නිලධාරියෙක් විදියට ඉන්නකොට මම එතන හිටිය මගේ අංශ භාර නිලධාරීතුමාට ඉදිරිපත් කරනවා.

ප්‍ර : ඒ කියන්නේ ඔබ භූමිය ආශ්‍රිතවද එතකොට වැඩ කළේ?

පි : භූමිය ආශ්‍රිතව කියන්නේ මම ඒ කියන්නේ Ground එකේ Sourceලා Handle කරලා තොරතුරු වාර්තා කරනවා.

ප්‍ර : ඔව්. ඒ ලබා ගන්න තොරතුරු ඔබ වාර්තා කරනවා. මොකද දැන් අපට අවශ්‍ය වෙනවා කොයි ආකාරයටද ඔබේ අධ්‍යක්ෂවරයාට මේ තොරතුරු ගියේ කියන එක ගරු කොමිෂන් සභාවට දැන ගන්න?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : මොකද අපට පේනවා ඔබගේ ප්‍රකාශ බැලුවහම ඔබට මේ විෂය පිළිබඳව ඉතා හොඳ අත්දැකීමක් තියෙනවා කියලා. එතකොට අධ්‍යක්ෂතුමාට ඒක යන්න නම් ඔබේ තොරතුරු ඔබ ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට දෙනවා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : අපි උදාහරණයක් විදියට ගමුකෝ ඔබ භූමියේ ඉඳන් තමයි රැස් කරන්නේ මේ මූලාශ්‍ර කියලා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එතකොට ඊළඟට ඉන්න ජ්‍යෙෂ්ඨ නිලධාරියා කවුද ඔබට?

පි : මම දැනට ඒ කියන්නේ වර්තමානයේ මම ...,

ප්‍ර : නැහැ අපි දැන් ඔබේ මුල් අවස්ථාවට යමු. ඊට පස්සේ මම අහන්නම් දැන් ඔබ කවුද කියලා?

පි : ජ්‍යෙෂ්ඨ නිලධාරියා විදියට ඉන්නේ අංශ භාර නිලධාරියා. එතුමාට තමයි වාර්තා කරන්නේ.

ප්‍ර : එතුමාගේ තනතුර සාමාන්‍යයෙන් මොකද්ද? පොලිස් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය බුද්ධි අංශය ගත්තහම එහි කුමන තනතුරක්ද ඔහු දරන්නේ?

පි : රාජ්‍ය බුද්ධි සේවාවේ තනතුරු පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරින් තමයි රාජ්‍ය බුද්ධි සේවාවේ සේවය කරන්නේ.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහෙම කියන්න බැහැනේ දැන් නේද?

පි : නමුත් තනතුරුවල තියෙන්නේ අංශ භාර නිලධාරියා, සහකාර අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ විදියට තියෙන්නේ.

ප්‍ර : මම දන්නවා. නමුත් යම් හේතුවකට මම මේවා අහන්නේ. ඒකයි මම අහන්නේ දැන් ඔබ භූමියෙන් ගන්නා තොරතුරු ඔබ ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට දෙනවනේ?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඔහුට කියන්නේ මොකද්ද? ඔහු සහකාරද ඔහු නියෝජ්‍යද කවුද?

පි : අංශ භාර නිලධාරියා.

ප්‍ර : එතකොට ඔබ සඳහන් කරපු ආකාරයේ අංශ කිහිපයක් තියෙනවනේ?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒ අංශ භාර නිලධාරියාට ලැබෙන තොරතුරු ඔහු යම් ස්ථානයක සටහන් කරනවද?

පි : පොතක සටහන් කරනවා.

ප්‍ර : ඒ ටික ඒ හැරෙන්නට අද වෙනකොට ඔබලාට තියෙනවද දත්ත රැස් කිරීම සඳහා යම් ක්‍රමෝපායන්?

පි : දත්ත යනුවෙන් අදහස් කරන්නේ...,

ප්‍ර : Data ඔය එකතු කරන ඒවා කොහේ හරි Store කරනවද?

පි : Store කරනවා.

ප්‍ර : කොහේද Store කරන්නේ?

පි : අපේ ලේඛනාගාරයේ තැන්පත් වෙනවා.

ප්‍ර : ලේඛනාගාරයේ තියෙන්නේ භෞතික වශයෙන්ද එහෙම නැත්නම් Digital විදියට තියෙනවද?

පි : වර්තමානයේ දෙවිදියටම තියෙනවා.

ප්‍ර : හරි. එතකොට එහෙම දත්ත රැස් කර ගන්නට ඉස්සර වෙලා ලේඛනාගාරයේ එම ලැබෙන දත්ත විශ්ලේෂණයක් කෙරෙනවද?

පි : විශ්ලේෂණයක් කෙරෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ විශ්ලේෂණය කරනකොට ඒ කොයි විදියටද අංශ භාර නිලධාරියා ඒක කරන්නේ? ඔබට ඒක සම්බන්ධයෙනුත් අත්දැකීම් තියෙන හින්දයි මම අහන්නේ?

පි : අංශ භාර නිලධාරියාට ඒ කියන්නේ ඒ සම්බන්ධව තියෙන දැනුමත් එක්ක තමයි ඒකට එකතු කිරීම්, අඩු වැඩි කිරීම් කෙරෙන්නේ.

ප්‍ර : එතකොට දැනුම තියෙන්නේ ඔහුට මේ ලැබෙන තොරතුර සමහරවිට අළුත් තොරතුරක් වෙන්නට පුළුවන්නේ. එහෙම

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නැත්නම් දැනටමත් තියෙන තොරතුරක් සම්බන්ධයෙන් ඔහුට ඒ තොරතුර ලැබුණා වෙන්න පුළුවන්. එතකොට මේ ලැබිලා තියෙන තොරතුරේ නිශ්චිතභාවය පිළිබඳව ඔහු හොයලා බලනවද?

පි : තහවුරු කිරීමක් කර ගන්නවා.

ප්‍ර : තහවුරු කිරීමක් කරන්නේ මොන මුලාශ්‍ර පදනම් කරගෙනද?

පි : ආයතනයේ තියෙන තොරතුරු, Record කරලා තියෙන තොරතුරුත් බලපානවා. ඒ වගේම අංශ භාර නිලධාරියාට තොරතුරුකරුවන් ඉන්නවා ඒ මගිනුත් තහවුරු කර ගැනීම් කර ගන්නවා.

(ඉංග්‍රීසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප්‍ර : ඔබේ ඔය ලේඛනාගාරයේ තියෙන දත්ත ගැන බලනකොට ඒකේ තියෙනවා නේද රජයේ සේවකයින්ට අදාළ තොරතුරු?

පි : මම ඒ සම්බන්ධයෙන් හරියටම කියන්න දන්නේ නැහැ ස්වාමීනි. මගේ විෂය පථය ගැන මම ...,

ප්‍ර : එහෙමනම් ඔබ මේක කියන්නකෝ. ඔබ භූමියෙන් රැස් කර ගන්නේ ඔබේ අංශයට අදාළ තොරතුරුනේ?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : නමුත් ඔබට වෙන ඔබේ අංශයට අදාළ නැති තොරතුරක් ලැබුණොත් ඔබ ඒක රැස් කර ගන්නේ නැද්ද?

පි : මගේ අංශයට අදාළ නොවන තොරතුරක් කියලා අදහස් කරන්නේ ස්වාමීනි එහෙම තොරතුරක් ආවොත් ඒ අදාළ Desk එකට තමයි ඒක Share කරන්නේ. ඒක මගේ Record එකට Update වෙන්නේ නැහැ.

ප්‍ර : යන්නේ නැහැ. නමුත් ඒ තොරතුර රැස් කර ගැනීම කරනවනේ?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එහෙම රැස් කරලා ඔබ අදාළ අංශයට ඒක භාර දුන්නහම ඒ අදාළ අංශයෙන් ලේඛනාගාරයේ ඒක තැන්පත් කර ගන්නවා?

පි : ඒක ඒ කට්ටියගේ Responsibility එක.

ප්‍ර : හරි. ඊට පස්සේ දැන් ඔය තොරතුරු එතන රැස් කරලා තියෙන එකේ මම අහන්නේ මේකයි. යම් අවස්ථාවකදී අවශ්‍යතාවයක් ඇති වෙනවා දැනට ලේඛනාගාරයේ තියෙන තොරතුරුවලට පිවිසිලා ඒක හරස් විදියට පරීක්ෂා කරලා බලන්න, Cross Check කරන්න. ඒ අවස්ථාවේදී ඔබේ අංශ ප්‍රධානියාට හැකියාව තියෙනවා නේද ලේඛනාගාරයට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරලා, ඒ තොරතුරු ලබා ගන්නට තමන්ට අවශ්‍ය තොරතුරු?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අංශ භාර නිලධාරියාට තියෙන්නේ එයාගේ අංශයට අදාළ තොරතුරු පරීක්ෂා කරන්න ස්වාමීනි. ඒ වගේම ඒකේ Limited ඒවා තියෙනවා. ඒවා පරීක්ෂා කරන්න අයිතිය තියෙන්නේ සහකාර අධ්‍යක්ෂතුමාගෙන් ඉහළ කෙනෙකුට තමයි ස්වාමීනි.

ප්‍ර : ඔව්. එතකොට දැන් ඔබේ අංශ ප්‍රධානියාට ඒ තොරතුරු ලබා දුන්නාට පස්සේ අංශ ප්‍රධානියා කල්පනා කළොත් මේ තොරතුර මා වඩා සුදුසුයි මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට ලබා දෙන්නට කියලා. ඔහු ලබා දෙනවද? එයාවත් කවුරු හරි අධීක්ෂණය කරන නිලධාරියෙක් ඉන්නවනේ?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එයාට ලබා දෙනවද ඒ තොරතුර?

පි : මගේ අංශයට අදාළ තොරතුරක් නම් ස්වාමීනි ඒක අංශ භාර නිලධාරියා විසින් එතනින් ඉහළ නිලධාරියාට තමයි ...,

ප්‍ර : මම වෙන ඒවා අහන්නේ නැහැ. ඔබේ අංශය ගැන තමයි අහන්නේ. ඔබේ අංශය නිසා තමයි රටේ ප්‍රශ්න ඇති වෙලා තියෙන්නේ. තේරුණයි. ඒ නිසා තමයි ඒක ගැන අහන්නේ. එතකොට මම අහන්නේ අංශ ප්‍රධානියා හිතනවා එයාගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට මේ තොරතුරු දෙන්නට ඕන කියලා. ඒ නිසා එතකොට එයාට දෙන්න පුළුවන්නේ?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඒ අංශ ප්‍රධානියාට ඉහළ ඉන්න ජ්‍යෙෂ්ඨ නිලධාරියා කවුද?

පි : සහකාර අධ්‍යක්ෂතුමෙක් තමයි අංශ ප්‍රධානියාට ඉහළ.

ප්‍ර : සහකාර අධ්‍යක්ෂතුමා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : සහකාර අධ්‍යක්ෂතුමත් ඔය තොරතුර බලනවා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එතුමා බලලා එතුමා හිතනවා නම් මේ තොරතුර එක්කෝ වැඩි දියුණු කරන්නට ඕන කියලා එහෙමනම් තමන්ට තොරතුර දුන්න අංශ ප්‍රධානියාට කියන්නට පුළුවන් උපදෙස් දීලා මේක වැඩි දුයුණු කරන්න කියලා. තමන්ට ලැබුණ තොරතුර ඉහළ නිලධාරියාට දෙන්නට ඕන කියලා ඔහු හිතනවා නම් එතකොට සහකාර අධ්‍යක්ෂතුමාට පුළුවන් නේද ඉහළ ඔහුගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට දෙන්න?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : හොඳයි. ඒ ජ්‍යෙෂ්ඨ නිලධාරියා කවුද?

පි : නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා.

Presidential Secretariat's Copy
FAIR COMMENT
BY JEZEEM

ප : නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාටත් අර සහකාර අධ්‍යක්ෂතුමා කරපු දේවල්ම කරන්න පුළුවන්නේ?

පි : පුළුවන් ස්වාමීනි.

ප : එතකොට නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා හිතනවා නම් ඒ තොරතුරු දෙන්නට ඕන කියලා එයාට ඉහළ ඉන්න ජ්‍යෙෂ්ඨ නිලධාරියාට කාටද ඔහු ඒක දෙන්නේ?

පි : අධ්‍යක්ෂතුමාට තමයි.

ප : එතකොට අධ්‍යක්ෂතුමාට හම්බ වෙන තොරතුරු එතුමාගේ ඒවා පරීක්ෂා කරලා එතුමාගේ අභිමතය අනුව ඒ අවශ්‍යයි කියලා හිතන අයට එතුමාට පුළුවන් භාර දෙන්න නේද?

පි : ඔව් ස්වාමීනි.

ප : දැන් ඔබ වර්තමානයේ මොකද්ද මේ සේවාවේ දරන තනතුර?

පි : වර්තමානයේ මම දරන්නේ අංශයේ අංශ භාර නිලධාරයා මෙන් කටයුතු කරන්නේ.

ප : මොකද්ද ඔබේ අංශය?

පි : මුස්ලිම් අන්තවාදී සහ ත්‍රස්තවාදී කටයුතු නිරීක්ෂණය කරන අංශය.

ප : ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙන්නේ කවුද එතකොට

පි : සහකාර අධ්‍යක්ෂතුමා.

ප : සහකාර අධ්‍යක්ෂතුමානේ. කරුණාකරලා 2018 ඉඳලා ඔබේ සහකාර අධ්‍යක්ෂවරයා විදියට හිටපු නිලධාරියාගේ නම අපිට ලියලා දෙන්නට පුළුවන්ද? වාර්තා කර ගන්නට අවශ්‍ය වෙනවා.

පි : පුළුවන් ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුර ඔහු ලේඛනයක සටහන් කර ලබා දෙයි. එය සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් සටහන් කළයුතු බව ලඝුලේඛිකාවට නියෝග කරමි.

පි : එම්.එස්.ඩී. මල්ලවආරච්චි මහතා.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප : ඔබ සඳහන් කරපු අංශයේ අංශ ප්‍රධානියා විදියට මොනවද ඒ අංශයෙන් කෙරෙන මූලික කාර්යයන් කියලා මේ ගරු කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි.

President's Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : කියන්නකෝ?

පි : මගේ අංශයට පවරලා තියෙන රාජකාරීවල මෙරට තියෙන මුස්ලිම් ආගමික සංවිධාන සහ අනෙකුත් සංවිධාන නිරීක්ෂණය කරන එක රාජකාරියක් විදියට පවරලා තියෙනවා. ඊට අමතරව ස්වාමීනි මෙරටට පැමිණෙන මුස්ලිම් විදේශිකයන්ගේ කටයුතු නිරීක්ෂණය කරන එක රාජකාරියක් විදියට තියෙනවා. ඒ වගේම මෙරටට පැමිණෙන මුස්ලිම් විදේශිකයන්ගේ විදේශිකයන් සම්බන්ධයෙන් නිශ්කාෂණ වාර්තා ලබාදෙන කොට ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කරන එක රාජකාරියක් වෙලා තියෙනවා. ඊට අමතරව මෙරට අරාබි විද්‍යාල සහ පල්ලි සම්බන්ධව ඒ කට්ටියගේ තියෙන අන්තවාදී ක්‍රියාකාරකම් සම්බන්ධව නිරීක්ෂණය කරන එක. ඒවගේ රාජකාරී තියෙනවා. ඊට අමතරව වෙනත් අංශයකට වෙන රාජකාරී Pool Duty වගේ දේවලුත් අංශයේ නිලධාරීන්ට පවරලා තියෙනවා.

ප්‍ර : මොන Duty ද?

පි : ඒ කියන්නේ, රාජකාරී කියන්නේ අපේ Pool Duty කියලා අදහස් කරන්නේ අපේ පාලන සංයුතියේ රාජකාරී.

ප්‍ර : එතකොට දේශීය සහ විදේශීය වශයෙන් ජමාත් කටයුතුවල යෙදෙන මෙරට මුස්ලිම් ජාතිකයින්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙනුත් නිරීක්ෂණය කරනවද?

පි : නිරීක්ෂණය කරනවා. පැමිණෙන විදේශිකයන් කියලා අදහස් කළෙත් ..,

ප්‍ර : ආ ඒක. එතකොට ආගමික දේශනවලට සහ අධ්‍යාපන කටයුතුවලට එන එකත් ඒක යටතේ තමයි එන්නේ?

පි : තියෙනවා ස්වාමීනි.

ප්‍ර : මීළඟට මම කැමතියි ඔබෙන් දැන ගන්න තොරතුරක් ලැබුණහම ඒ තොරතුරේ නිරවද්‍යතාවය පිළිබඳව ඔබලා කොයි ආකාරයටද සොයා බලන්නේ කියලා?

පි : තොරතුරක් ලැබුණහම ස්වාමීනි අපි ...,

ප්‍ර : ඒකට යම් ක්‍රමවේදයක් තියෙනවද?

පි : තොරතුරක් මුලින් ලැබුණහම ඒකට අපි ඒ තොරතුර සම්බන්ධ පරණ Records සහ ඒ සම්බන්ධයෙන් අපේ තියෙන තොරතුරුකරුවන්ගේ තියෙන තොරතුරුත් එකතු කරලා තමයි ඒක ඊළඟට පරිවර්තනය කරලා කරන්නේ.

ප්‍ර : ඔව්. ඒ කියන්නේ දැනට ලැබිලා තියෙන තොරතුරුත් එකතු කර ගන්නවා ඒකට?

පි : ඔව් ස්වාමීනි.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට මොන කරුණුද බලන්නේ තොරතුරක, ඒක විශ්වසනීය තොරතුරක්ද කියන අනුමැතියට එන්නට? Credible Information ද කියලා මේක කොහොමද බලන්නේ?

පි : ඒකට ස්වාමීනි බලපානවා තොරතුරුකරු සහ ඒ නිලධාරියා අතර තියෙන සම්බන්ධීකරණයත් බලපානවා. ඒ වගේම ඒ තොරතුරුකරු ඒ ඉලක්කයෙහි හැසිරීම සම්බන්ධයෙනුත් බලපානවා විශ්වසනියත්වය කියන කාරණයට. අපි තොරතුරක කරුණු 06 ක් බලනවා.

ප්‍ර : මොනවද ඒ බලන ඒවා?

පි : අපි බලනවා කවුද කියන කාරණය. කවදාද කියන කාරණය. කොතනද කියන කාරණය. මොකටද, ඇයි සහ කොහොමද කියන කරුණු හය තමයි අපි බලන්නේ ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒ කරුණු බලලා ඊට පසසේ මොකද කරන්නේ?

පි : ඊට පස්සේ ඒ තොරතුර ඒ කියන්නේ අපේ තියෙන අනිකුත් දේවලුත් එක්ක තමයි ඒක ඊට පස්සේ තොරතුරුකරු සහ නිලධාරියා අතර තියෙන විශ්වාසනීයත්වය, එයා ඉලක්ක පෙර හැසිරීම් ඒවත් එක්ක තමයි මේවා විශ්වාසනියත්වය සම්බන්ධයෙන් Grading කරන්නේ A1ද, A2ද කියලා අපි Categorize කරලා ගන්නේ.

ප්‍ර : එතකොට දැන් එහෙම ඔබලා විශ්ලේෂණයට භාජනය කරන අවස්ථාවේදී උදාහරණයක් විදියට යම් අඩුපාඩුවක් ඒ තොරතුරේ දැක්කොත් ඔබ ඒක බුද්ධි තොරතුරක් බවට පත්කර ගන්නට පෙර ඒ අඩුපාඩුව තියෙන අංශය පිළිබඳව වැඩිදුර තොරතුරු සොයා ගැනීමක් කරනවද?

පි : වැඩිදුර තොරතුරු සොයා ගැනීමක් කරනවා.

ප්‍ර : සොයා ගැනීමක් කරනවා. එතකොට ඔබට පුළුවන්කම තියෙනවා නේද ඔබ දැන් කලින් කිව්ව විදියට ඔබේ තියෙන දත්තම පාවිච්චි කරන්න?

පි : පුළුවන් ස්වාමීනි.

ප්‍ර : භූමියෙන්, වෙනත් අයගෙන් තොරතුරු ලබා ගන්නට?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එතකොට සංවෘත සහ විවෘත කියන ඔය හැම මාධ්‍යයෙන්ම එන තොරතුරු ලබා ගන්නවා? මට පොඩ්ඩක් කියන්නකෝ ඔබලාගේ ඔය තොරතුරු පද්ධතියේ තියෙනවද ලංකාවේ යම් වැදගත් ස්ථාන එහෙම නැත්නම් මොනවා හරි අපි උදාහරණයක් විදියට ගත්තොත්, පල්ලි ගැන. පල්ලි ලංකාවේ තියෙනවනේ ක්‍රිස්තියානි පල්ලි තියෙනවා. කතෝලික පල්ලි තියෙනවා. මෙතෝදිස්ත

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පල්ලි තියෙනවා. විවිධාකාර පල්ලි තියෙනවා. මගේ උදාහරණය හොදේ. එතකොට ඔබේ ඔය දත්ත ගබඩාවෙන් පුළුවන්ද ඒ කරුණ සොයා ගන්නට. කොයි ස්ථානවලද තියෙන්නේ අපි කිව්වොත් ක්‍රිස්තියානි පල්ලි කියලා, ක්‍රිස්තියානි පල්ලි තියෙන්නේ කොළඹ නම් කොහේද කියලා එහෙම හොයා ගන්න පුළුවන්ද?

පි : මගේ ළඟ තියෙන Dataවල මට කොළඹ තියෙන මුස්ලිම් පල්ලි තියෙන තැන් ටික මගේ ගාව වෙනම Database එකක් මගේ අංශයේ පවත්වාගෙන යනවා. එතකොට ඒවාගේ Hard Copies වෙනම දාලා තියෙනවා Recordsවලට. අනෙක් අංශවල තියෙන Perfect බව මම, ඒ ගැන මම මොකුත් දන්නේ නැහැ ගරු ස්වාමීනි.

ප්‍ර : නැහැ. ඔබේ අංශය ගැන ඔබ දන්න එක විතරක් කියන්නකෝ. අපි ඔබට කරදර කරන්නේ නැහැ?

පි : මුස්ලිම් පල්ලිවල තියෙන Data සම්බන්ධයෙන් මම දන්නවා. මොකද මම ගාව වෙනමම ඒවා සම්බන්ධයෙන් Data තියෙනවා.

දැන් වේලාව : ප.ව. 4.20 යි.
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව ප.ව. 4.20 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඔබ කෙටියෙන් කියන්නේ ඔබේ අංශයට අදාල ප්‍රයෝජනවත් වෙයි කියලා හිතෙන සියළු දත්ත ඔය දත්ත ගබඩාවේ සුරක්ෂිතව ගබඩා කරලා තියෙන බවනේ?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට දැන් ඔය තොරතුරු ලැබෙන එක දේශීය වගේම විදේශීයවත් ලැබෙනවානේ?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එතකොට ඒ විදේශීයව අපිට ලැබෙන තොරතුරුවලත් සමහර විට යම් අඩුපාඩු තියෙන්න පුළුවන් ඔබ ඔය කිව්ව අංග 6 බලන කොට මොනවා හරි අඩුපාඩුවක් තියෙන්න පුළුවන්නේ?

පි : පුළුවන් ස්වාමිණි.

ප්‍ර : එතකොට ඒවාගේ නිරවද්‍යතාවය බලන්නටත්, ඒවා බුද්ධි තොරතුරක්ද කියලා තීරණය කරන්නටත් ඔබ අර දේශීය තොරතුරට අනුගමනය කරන ක්‍රමවේදයමද අනුගමනය කරන්නේ? Analyze කරන්නේ කොහොමද?

පි : ගොඩක් වෙලාවට එහෙම කරනවා.

ප්‍ර : ඒ මොකද ගොඩක් වෙලාවට කියලා විශේෂණයක් එකතු කලේ?

පි : නැහැ ස්වාමිණි අපි දැන් තොරතුරක් ලැබුණාම ඒ තොරතුර තවදුරටත් Develop කරන්න ඕන නම් අපි දැන් දේශීයව කරනවා නම් තොරතුරුකරුවෙක්ගෙන් හරහා කරනවා නම් ඒ තොරතුරේ අඩුපාඩු තියෙනවා නම් ඒ තොරතුරුකරුට කියලා නැවත ඒ සම්බන්ධයෙන් විමසීමක් කරනවා. ඒ විදියට තමයි අනෙකුත් තොරතුරුවලටත් තොරතුර තවදුරටත් වර්ධනය කර ගැනීමක් කරන්නේ.

ප්‍ර : ඒ කියන්නේ දේශීයව ලැබුණත්, විදේශීයව ලැබුණත් අපිට පිටරට තොරතුරුවලින් වැඩක් නැහැනේ ලංකාවේ ඒවානේ වැදගත් වෙන්නේ?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එතකොට ඒවා වර්ධනය කර ගැනීම සඳහා ඔබලාගේ තිබෙන දත්ත සහ ඒ ක්‍රමෝපායන් පාවිච්චි කරගෙන සලකලා බලනවා මේක බුද්ධි තොරතුරක්ද නැද්ද කියලා?

පි : ඔව් ස්වාමිණි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : එතකොට මම කැමතියි මේ කරුණ ගැනත් ඔබෙන් දැන ගන්න. දැන් ඔබට ලැබෙන තොරතුරු ඔබට පුළුවන්ද ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා නොවන කෙනෙක්ට ඒ කියන්නේ, මං කියන්නේ මේ ඔබට ලැබෙන වෙනත් අංශයකට අදාල තොරතුරු නෙමෙයි. ඔබේ අංශයට අදාලව ඔබට ලැබෙන තොරතුරු ඔබට පුළුවන්ද රාජ්‍ය බුද්ධි සේවාවේ වුවත් වෙනත් නිලධාරියෙක්ට ලබා දෙන්න?

පි : එහෙම ක්‍රමවේදයක් මා දැනුවත්ව නැහැ ස්වාමිණි.

ප්‍ර : ඇයි ඒ?

පි : අපේ ආයතනයේ තියෙන විදියට, ඒ කියන්නේ හැදිලා තියෙන ක්‍රමවේදය තුළ මට ලැබෙන තොරතුරු මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට තමයි මම report කරන්න අවශ්‍ය වෙන්නේ.

ප්‍ර : ඒක ඔය ඔබලා පාවිච්චි කරන need to know basis කියන පදනම මතද?

පි : Need to know basis කියන්නේ මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා තමයි වගකියන්න ඕන නිලධාරියා මම. එතුමාට තමයි මම ඒ තොරතුරු හැමදේම වාර්තා කරන්නේ ස්වාමිණි.

ප්‍ර : දැන් ඔබ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ සේවය කෙරුවා වුනත් ඔබේ අංශයට අදාල තොරතුරක් ඔබට ලබා දෙන්නට බැහැ ඒ සේවාවේ ඉන්න වෙනත් නිලධාරියෙක්ට ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා හැරෙන්නට?

පි : මගේ අංශයේ විෂය පථයට අදාල සියළු තොරතුරු මම දෙන්න ඕනේ මගේ සහකාර අධ්‍යක්ෂතුමාට.

ප්‍ර : එතකොට දැන් එහෙම නම් ඔබට උපදෙස් ලැබුනොත් ඒ තොරතුර ලබා දෙන්නට කියලා රාජ්‍ය බුද්ධි සේවයේ තවත් නිලධාරියෙක්ට ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාගෙන් එතකොට දෙන්නට පුළුවන්ද ඒ තොරතුර?

පි : ඔව් ජ්‍යෙෂ්ඨ නිලධාරියා අවසර දෙනවා නම් එතුමා...

ප්‍ර : ලැබෙන බලය මත තමයි ඔබට කටයුතු කරන්න පුළුවන් කියලා ඔබ කියන්නේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඊලඟට අපිට කියන්න දැන් මේ රටේ ඉන්නවානේ තවත් බුද්ධි අංශ තියෙනවානේ?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : පොලිසියේ තියෙනවා, එතකොට යුද හමුදාවේ තියෙනවා, නාවික හමුදාවේ, ගුවන් හමුදාවේ ඒ වගේ හැම තැනම තියෙනවා?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : දැන් ඔබට ලැබෙන තොරතුරු දැන් එගොල්ලන් එක්ක ඔබලා යාළුයිනේ, සාමාන්‍යයෙන් මිත්‍රයෝ විදියට ආශ්‍රය කරනවානේ.

FAIR COMMENT BY JEZEEM

එතකොට ඒ අය ඔබ දන්නවා ඇති සමහර විට කතා කරන කොට ඒ අයත් ඔබ හොයන කරුණුම සමහර වෙලාවට බුද්ධි තොරතුරු රැස් කරනවා කියලා. උදාහරණයක් මම ගන්නේ, එතකොට ඔබට යම් තොරතුරක් ලැබුනොත් ඔබ දන්න නිසා මේක ප්‍රයෝජනවත් වෙයි, මේ අයත් අපි කියමුකෝ යුද හමුදාව කියලා, යුද හමුදාවේ බුද්ධි අංශයත් මේ වෙලාවේ මේක කරනවා, එතකොට ඔබට ඒ තොරතුර දෙන්නට පුළුවන්ද යුද හමුදාවේ බුද්ධි අංශයට?

පි : මට එහෙම බලයක් පැවරිලා නැහැ ස්වාමිණි. මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට තමයි මම සියළු දේ වගකියන්න ඕනේ ස්වාමිණි.

ප්‍ර : නමුත් ඔබ කියන්නේ ඔබේ අධ්‍යක්ෂවරයාට පුළුවන් ඔහුගේ අභිමතය පාවිච්චි කරලා පල්ලෙහා ඉදලා, භූමියේ ඉදලා ඉහළට ගලාගෙන එන තොරතුරු වෙනත් බුද්ධි ආයතනයකට දෙනවද නැද්ද කියන තීරණය ගන්න?

පි : ඔව් එතුමාගෙන් තමයි ස්වාමිණි.....

ප්‍ර : අභිමතය, Discretion නේ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : නමුත් ඔහුට හැකියාව තියෙනවා එයානේ ලොක්කා ඔහු තමයි ජ්‍යෙෂ්ඨ නිලධාරියා?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ඔබ මේ විෂය ගැන 2009 ඉදලම හදාරලා තියෙනවානේ?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එහෙනම් ඔබට කියන්නට පුළුවන්ද අපිට ටිකක් කෙටියෙන් මේ ඉස්ලාම් ධර්මය ඇතිවෙලා තියෙන්නේ කොහාමද කියලා?

පි : පුළුවන් ස්වාමිණි.

ප්‍ර : ඔබ ඉස්ලාම් ආගම ගැන යම් අධ්‍යයනයක් කරලා තියෙනවද?

පි : ඔව් ස්වාමිණි මම පොතපතින්, Internet එකෙන් මම අධ්‍යයනය කරලා මේ සම්බන්ධයෙන් දැනුමක් තියෙනවා ස්වාමිණි.

ප්‍ර : ඇයි ඔබ එහෙම කියවලා බලලා තියෙන්නේ?

පි : මගේ විෂය මට හම්බ වෙලා තියෙන රාජකාරිය තුළ මම ඒ සම්බන්ධයෙන් දැනුමක් ලබා ගන්න ඕන හින්දා මේ සම්බන්ධයෙන් දැනුමක් ලබා ගත්තා.

ප්‍ර : ඒ මොකද ඒ පිළිබඳව කරුණු දන්නවා නම් ඔබේ රාජකාරිය හොඳින් ඉෂ්ඨ කරන්න පුළුවන් නිසා?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එතකොට දැන් ඔය ඉස්ලාම් ආගමේ අරාබි භාෂාව පාවිච්චි වෙනවානේ?

පි : ඔව් ස්වාමිණි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : ඒ අරාබි භාෂාව දන්නවා නම් එහෙනම් තවදුරටත් ඔය ආගම ඔබට හොඳින්, වැඩියෙන් තේරුම් ගන්න පුළුවන්නේ?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : ඉතින් ඔබ යම් පියවරක් අරන් තියෙනවද අරාබි භාෂාව ඉගෙන ගන්න?

පි : අරන් තියෙනවා ස්වාමිණි.

ප්‍ර : මොකක්ද ඔබ කලේ?

පි : මම සහ මගේ අංශයේ නිලධාරීන් තව සිව් දෙනෙක් අරාබි පාඨමාලාවලට සහභාගී වෙලා තියෙනවා කොළඹ විශ්ව විද්‍යාලයේ.

ප්‍ර : කොපමණ කාලයක පාඨමාලාවක්ද?

පි : මාස 4 ක වගේ පාඨමාලාවක්.

ප්‍ර : මොනවද ඒකේ උගන්වන්නේ?

පි : ඒකේ ස්වාමිණි සාමාන්‍යයෙන් කතා කරන්න, අරාබි භාෂාව කතා කරන්න තමයි ඒකේ අධ්‍යාපනය ලැබුවේ.

ප්‍ර : ඔබට පුළුවන්ද අරාබි කතා කරන්න, පුළුවන්නේ?

පි : සාමාන්‍ය knowledge එකක් තියෙන්නේ.

ප්‍ර : සාමාන්‍ය දැනුමක් තියෙනවා. එතකොට කියන දේ තේරෙනවා, ඔබට සංනිවේදනය කරන්න පුළුවන් නේ?

පි : පුළුවන් ස්වාමිණි.

ප්‍ර : ඒක නිසානේ ඉගෙන ගත්තේ. ඊට පස්සේ දැන් ඔබ ඔය ඉස්ලාම් ආගම ඉගෙන ගත්ත හින්දා ඉස්ලාම් ආගම අදහන 99% ක් පමණම කතා කරන්නේ ද්‍රවිඩ භාෂාවනේ?

පි : ඔව් ස්වාමිණි ලංකාවේ කතා කරන්නේ ද්‍රවිඩ භාෂාව.

ප්‍ර : ඔබට ද්‍රවිඩ භාෂාව පිළිබඳ ඒ කතා කරන්න හැකියාවක් තියෙනවද?

පි : තියෙනවා ස්වාමිණි.

ප්‍ර : කොහොමද ඒ හැකියාව ඔබ ලබා ගත්තේ?

පි : ද්‍රවිඩ භාෂාව මම ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවාවට වාර්තා කිරීමෙන් පසු ඒ කියන්නේ විවිධ අවස්ථාවන්වලදී නැගෙනහිර පළාතේ සහ උතුරු පළාතේ රාජකාරීවලට සම්බන්ධ වෙලා තියෙනවා, ඒ වගේම මගේ උත්සාහය මත මම දෙමළ භාෂාව ඉගෙන ගෙන O/L exam කරලා pass වෙලා තියෙනවා. මම රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ exam එක කරලා pass වෙලා තියෙනවා.

ප්‍ර : බොහොම හොඳයි, එතකොට ඔබ මේ අධ්‍යාපනය අතිනුත් ඒ සඳහා සුදුසුකම් ලබලා තියෙනවා, ඒ හැරෙන්නට භාවිතය මගිනුත් ඔබ එය දියුණු කරගෙන තියෙනවා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : ඔව් දැන් මම ඔබෙන් ඇහුවේ ඉස්ලාම් ආගම හැදුනු විදියනේ?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එතකොට ඔබට කෙටියෙන් පැහැදිලි කරන්න පුළුවන්ද මේක ආරම්භයේ සිටම මේ ලොව පහලවීම ඇති වුණ වෙලාවේ ඉදන්ම ඉස්ලාම් ධර්මය ලොවට කොහොමද ඒක වර්ධනය වෙලා තියෙන්නේ කියලා?

පි : පුළුවන් ස්වාමිණි.

ප්‍ර : කියන්න කෝ?

පි : ඉස්ලාම් ආගම පටන් ගන්නේ ස්වාමිණි ක්‍රිස්තු වර්ෂ 570 දී. ඒ කියන්නේ මොහොමඩ් නබිතුමා කේන්ද්‍ර කරගෙන තමයි ඉස්ලාම් ආගම ඇති වෙන්නේ. ඊට කලින් ඉස්ලාම් ආගම විශ්වාස කරනවා අල්ලාහ් දෙවියන් වහන්සේ තමයි ලෝකයේ සර්වබලධාරී එකම දෙවියන්. අල්ලාහ් දෙවියන්ගේ අවසාන පණිවිඩකරු මොහොමඩ් නබිතුමා කියලා තමයි ඉස්ලාම් භක්තිකයෝ අපේ විශ්වාස කරන්නේ.

ප්‍ර : එතකොට මේ බුදුරජාණන් වහන්සේත් අල්ලාහ් දෙවියන් වහන්සේ විසින් එවන ලද නබිවරයෙක්ද?

පි : එහෙම දෙයක් ස්වාමිණි කුර්ආනයේ සඳහන් වෙනවා. කුර්ආනයේ 21,/ 85 කියන සූරාවේ තියෙනවා දුල්කිපල් කියලා. ඒ දුල්කිපල් කියලා කියන්නේ, කිපල් කියන්නේ කපිලවස්තු පුර කියලා, දුල් කියන්නේ බුදුන් වහන්සේ හදුන්වපු එක නමක් කියලා අබ්දුල් කලාම් අසාද් කියලා .

ප්‍ර : මේක 21/ 85 ශූරාවේ තියෙන්නේ ?

පි : 21/ 85 ත් තියෙනවා 38/48 ත් තියෙනවා ස්වාමිණි.

ප්‍ර : කියන්න කෝ?

පි : ඒ දෙකේ සඳහන් වෙනවා බුදුන් වහන්සෙත් එක නබිවරයෙක් කියලා. ඒ වගේම.

ප්‍ර : එතකොට ජේසුස් වහන්සේ?

පි : ජේසුස් වහන්සෙත් එක නබිවරයෙක් කියලා සඳහන් වෙනවා. එයාට ඊසානබී කියලා තමයි මුස්ලිම් ජනතාව, ඉස්ලාම් භක්තිකයෝ විශ්වාස කරන්නේ. එතකොට ඒ වගේ නබිවරු ඉතිහාසයට එයාලා මොහොමඩ් නබිතුමාට කලින් ඉතිහාසයට නබිවරු 125000 ක් සිටියා කියලා විශ්වාස කරනවා. ආදම් කියලා කියන්නෙත් එක නබිවරයෙක් කියලා විශ්වාස කරනවා. ඒවගේම ඊබ්‍රාහිම් කියලා නබිවරයෙක් හිටියා කියලා විශ්වාස කරනවා. එතකොට ස්වාමිණි ක්‍රිස්තු වර්ෂ 570 දී මේ මොහොමඩ්

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

නබිතුමාට මක්කම හිරා කියන ගුහාවේදී මෙන්න මේ අල්ලාහ් දෙවියන්ගේ ධර්මය හම්බ වුණා කියලා කියනවා.

ප : හිරා ගුහාව, හිරා කන්දේ නේද ඒක තියෙන්නේ?

පි : ඔව්. එතකොට ස්වාමිනි ඒ 570 හම්බ වුණාට පස්සේ එතුමා එයාට අල්ලාහ් දෙවියන්ගෙන් හම්බ වෙච්ච පණිවිඩ ටික ලෝකෙට කියන්නේ එයාගේ අනුගාමිකයෝ ඇති කරන්න උත්සාහ කරනවා. නමුත් ඒ වෙන කොට සෞදියේ තිබුණ පරිසරය තුළ එයාගේ වෑයමට ප්‍රශ්නයක් වෙන නිසා ආපහු එයා මක්කම කියන නගරයේ ඉදන් මදීනාව කියන නගරයට යනවා.

ප : එතකොට මක්කම තමයි එතුමා හිටියේ, මේ හීරා කන්ද තියෙන්නේ හීරා ගුහාව තියෙන්නේ මක්කම?

පි : මක්කම.

ප : එහිදී තමයි ඔය වහී පහලවෙලා ඔබ කියන ආකාරයට අල්ලාහ් ගෙන් ඒ පණිවිඩ ලැබුනේ, කොච්චර ලැබිලා තියෙනවද?

පි : අවස්ථා 2 ක් තියෙනවා. කුර්ආනයේ තියෙනවා මක්කා සහ මදීනා කියලා කොටස් 2 ක් තියෙනවා ස්වාමිණි. ඒ මක්කා සහ මදීනා කියලා කියන්නේ ඒ අවසන් නබිවරයා නැත්නම් මොහොමඩ් නබිතුමා හිටියා කියනවා මක්කාවේ කාලයක් සහ මදීනාවේ කාලයක්. ඒ නිසා කුර්ආනයේ සඳහන් වෙනවා මක්කා සහ මදීනා කියලා කොටස් 2 ක්. එතකොට ස්වාමිණි කුර්ආනයේ තියෙනවා අල්ලාහ් දෙවියන් වහන්සේ නබිතුමාට දුන්නයි කියලා පණිවිඩ 114 ක්, ඒවට සූරා කියලා තමයි කියන්නේ. එක පණිවිඩයක තව කොටස් ගණනාවක් තියෙනවා. එතකොට උදාහරණයක් විදියට කිව්වොත් ස්වාමිණි එක කියලා ගත්තාම ඒකේ කරුණු 100 ක් 200 කුත් තියෙන අවස්ථාවල් තියෙනවා. එතකොට ඒ විදියට තමයි ඉස්ලාම් ආගම ආරම්භ වන්නේ. එතකොට මේ කියන නබිතුමා තමන්ගේ ධර්ම ව්‍යාපාරය අවසන් වෙනවා එතුමා 632 දී මරණයට පත් වෙනවා. 632 දී මරණයට පත්වෙන කොට එතුමා මැදපෙරදිග කලාපයම ඉස්ලාම් රාජ්‍යයක් විදියට පත් කරගෙන තියෙනවා.

ප : ඔව් එතකොට එතුමාගෙන් පස්සේ මේ ඉස්ලාම් රාජ්‍යය ඉදිරියට පවත්වාගෙන යාමේ ප්‍රශ්නය ඇති වෙන්නට ඇති නේ?

පි : ඔව්, එතුමාගෙන් පස්සේ ගැටළුවක් ඇති වෙනවා ස්වාමිණි. මම පොත පතින් හදාරලා තියෙන විදියට එතුමාගේ අවසන් භාර්යාවගේ නම තමයි අයිෂා උම්මා කියන කෙනා. ඒ අයිෂා උම්මා ඇගේ පියා වෙන්නේ අබුබක්කර් සිද්දික් කියන කෙනා. එතකොට නබිතුමාගේ තව ඉන්නවා සහෝදරයෙක් ඒ කියන්නේ තාත්තගේ මල්ලී කෙනෙක්ගේ සහෝදරයෙක් වගේම

FAIR COMMENT BY JEZEEM

නබිතුමාගේ එක දියණියක්ගේ husband ඒ කියන්නේ මහත්තයා, එතකොට එයා අලීර් අලී කියලා, එතකොට මෙයා තමයි නබිතුමාගේ මරණයෙන් පස්සේ නායකත්වයට එන්න ඕන කියලා ඒ family එකෙන් එහෙම යෝජනාවක් එනවා.

ප්‍ර : ඒ කියන්නේ නබිතුමාගේ පවුලේ අය හිතුවා අලී තමයි දැන් ඊලඟ අනුප්‍රාප්තිකයා වෙන්නට ඕන කියලා?

පි : නමුත් නබිතුමාගේ අවසන් භාර්යාව කියනවා අයිෂා උම්මා කියන කෙනා නැහැ, මගේ තාත්තා තමයි සුදුස්සා කියලා.

ප්‍ර : ඒ වගේම ඔය අයිෂා උම්මගේ තාත්තා අබුබකර් නබිතුමාගේ ඉතාම හොඳ යාළුවෙක් වෙලා හිටියා නේද?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : ඒ නිසාම නේද ඔය අයිෂා උම්මාව නබිතුමාට විවාහ කර දුන්නේ?

පි : ඔව් ස්වාමිණි. එතකොට ඒ වගේම පළවෙනි කලීෆා විදියට මේ අබුබකර් සිද්දික් කියන කෙනා තමයි 632 දී පත් වෙන්නේ. එතකොට ඒ කලීෆා කියලා කියන්නේ ස්වාමිණි අර ඉස්ලාම් රාජ්‍යය පාලනය කරන නායකයාට කලීෆා කියලා තමයි හඳුන්වන්නේ. එතකොට 632 ඉදන් මේ අබුබක්කර් සිද්දික් කියන කෙනා 634 වෙන කල් පාලනය කරනවා. ඊට පස්සේ 634 දී මෙයා මරණයට පත් වෙනවා. ඒ මරණයට පත් වුණාම ඊලඟට උදුමාන් කියලා එක්කෙනෙක් පත් වෙනවා. ඊට පස්සේ එයත් පොඩි කාලයක් ඉන්න කොට උස්මාන් කියලා තව එක්කෙනෙක් පත් වෙනවා. ඊට පස්සේ 661 දී අලීර් අලී කියන එක්කෙනාම මේ බෑණාම කලීෆා විදියට පත් වෙනවා. එතකොට මේ කලීෆා විදියට මේ අලීර් අලී කියන එක්කෙනා පත්වුණාම අර අයිෂා උම්මා කියන කෙනාගේ පොඩි පොඩි විරෝධයන් මතු වෙනවා ස්වාමිණි. ඒ විරෝධය තුළ ගැටුම් කීපයක් ඇති වෙනවා. ඒ තුළ මේ අයිෂා උම්මා කියන කෙනාගේ පාර්ශවයේ කෙනෙක් මුආවියා කියලා කෙනෙක් අලීර් අලී සහ එයාගේ දරුවන් දෙදෙනාව ඝාතනය කරනවා. ඔන්න ඔය ගැටුම හින්දා ඉස්ලාම් ආගම කොටස් 2 කට බෙදෙනවා. සුන්නි සහ ෂියා කියලා. ඊට අමතරව මේ අවසන් සටනේදී එක පාර්ශවයක් කියනවා අලීර් අලීතුමා අයිෂා උම්මාගේ පැත්තට ඒ කියන්නේ සාම ගිවිසුමකට ගියා කියලා විරුද්ධ වෙනවා. ඒ කට්ටිය බාවාරීච් කියලා හඳුන්වනවා. නමුත් එයාලා මුස්ලිම් සමාජයේ හිටියට ගොඩක් ප්‍රසිද්ධියේ බාවාරීච් කියන නිකාය ප්‍රසිද්ධ වෙන්නේ නැහැ. නමුත් සුන්නි සහ ෂියා කියන නිකායන් දෙක තමයි ලෝකයේ ප්‍රසිද්ධ වෙලා තියෙන්නේ.

ප්‍ර : එතකොට ඔබට කියන්නට පුළුවන්ද මේ සුන්නි සහ ශියා බෙදන්නේ මොන පදනමක් මතද කියලා?

FAIR COMMENT — BY JEZEEM —

පි : පදනම කියලා කිව්වොත් ස්වාමිණි ඉස්ලාමය කරුණු 5 ක් මත තමයි කේන්ද්‍ර වෙලා තියෙන්නේ. එතකොට මේ දෙකට බෙදෙන්නේ අලීර් අලී කියන කෙනාගේ ඝාතනය. අලීර් අලී කියන කෙනාට පළවෙනි පාරටම කලීමා කියන තනතුර හම්බ වුණේ නැහැ කියන ප්‍රශ්නය තියෙනවා. ඒ වගේම ඒ ඝාතනයයි, ඒ කරුණු හින්දා තමයි අලීර් අලීට හිතවත් කට්ටිය ෂියා වෙනවා. නබිතුමාගේ සහ අයීෂා කියන එයාගේ අවසන් භාර්යාවගේ පාර්ශවය සුන්නි වෙනවා. ඒ විදියට තමයි ස්වාමිණි සුන්නි සහ ෂියා කියන නිකායන් දෙක 661 න් පස්සේ ඇති වෙන්නේ. එතකොට මේ 661 න් පස්සේ මේ දෙගොල්ලගේ ප්‍රතිපත්තිවලත් පොඩි පොඩි ගැටළු තියෙනවා. එකක් තමයි මෙයාලා ඒ කියන්නේ Five pillars of Islam නැත්නම් කරුණු 5 ක් මත තමයි ඉස්ලාමය තියෙන්නේ ස්වාමිණි. පළවෙනි එක කලීමා කියනවා. මේ කලීමා එක කියද්දිම සුන්නි සහ ෂියා කට්ටිය තමන් වෙනස්කම ප්‍රසිද්ධ කරලා තමයි කියන්නේ.

ප්‍ර : මොකක්ද කලීමා කියන්නේ?

පි : කලීමා කියලා කියන්නේ ලෝකයේ සර්වබලධාරී එකම දෙවියන් අල්ලාහ්. එයාගේ අවසාන පණිවිඩකරු මොහොමඩ් කියලා තමයි සුන්නි කට්ටිය කියන්නේ. ඒක ඇරබික් වලින් කියනවා ස්වාමිනි ලායිලායිලා ඉල්ලල්ලා මොහොමදු රසලුල්ලා කියලා. ඒ වගේම ෂියා කට්ටිය කියනවා සර්වබලධාරී එකම දෙවියා අල්ලාහ්. අවසන් පණිවිඩකරු අලීර් අලී කියලා. ඒ කියන්නේ තමන්ගේ ශාස්තෘවරයා. ඒ කට්ටිය කියනවා ලායිලයිලා ඉල්ලල්ලා අලීර් අලී රසලුල්ලා කියලා. ඒක තමයි කලීමා එකෙන් වෙනස් වෙන්නේ. ඒ වගේම සලාතේ කියලා කියනවා දවසට 5 පාරක් pray කරන එක. ඒකේ සුන්නි කට්ටිය දවසට 5 පාරක් pray කරනවා. ෂියා කට්ටිය දවසට 3 පාරයි pray කරන්නේ. ඊට පස්සේ සකාත් කියන එක. ඒ කියන්නේ වාර්ෂිකව දෙන පල්ලියට දෙන donation එක. ඒක සාමාන්‍යයෙන් දෙගොල්ලන්ම කරනවා. ඊලඟට රාමලාන් කියන එක. ඊලඟට හජ් කියන එක. මේ හජ් කියන එක වෙනස් වෙනවා. සුන්නි කට්ටිය හජ් කියන එකට නැත්නම් ඒ වන්දනාවට යන්නේ සෞදි අරාබියට. ඒ කියන්නේ එයාලගේ ඉස්ලාම් කැලැන්ඩරය අනුව හජ් කියන මාසේ. එතකොට ෂියා කට්ටිය යන්නේ ඉරාකයේ කරබලාවලට. අවුරුද්දේ පළවෙනි මාසේ මුහර්රම් කියන මාසේ. එතකොට ඉස්ලාම් එකේදී මම කියන්න ඕන දෙයක් තව ස්වාමිණි, මොකද ඉස්ලාම් අපි දින කැලැන්ඩරය ගත්තාම අපේ ජනවාරි to

FAIR COMMENT BY JEZEEM

දෙසැම්බර් වුණාට, එයාලා ගන්නේ මුහර්රම් to හජ් කියලා. මාසත් වෙනස් වෙනවා.

ප්‍ර : සාමාන්‍යයෙන් අපේ භාෂාවෙන් කිව්වොත්?

පි : ඒ කියන්නේ මුහර්රම් මාසේ ඉදන් හජ් කියන මාසෙට. මාස වෙනස් වෙනවා.

ප්‍ර : මුහර්රම් මාසේ කිව්වේ?

පි : මුහර්රම් මාසේ කියලා කියන්නේ ඒ කියන්නේ අපි ගොඩක් වෙලාවට එයාලා අවුරුද්ද ගන්නේ හඳ බලලා තමයි කැලැන්ඩරය හදා ගන්නේ. එතකොට පළවෙනි අවුරුද්ද හජ් වලින් පස්සේ එන මාසේ මුහර්රම් මාසේ.

ප්‍ර : එතකොට දැන් ඔබ කිව්වනේ පැහැදිලි කරලා මේ සුන්නි ෂියා කොයි ආකාරයට බෙදීම සිද්ධ වුණාද කියලා?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එතකොට ඒ කියන්නේ මුල් අවස්ථාවේ පටන්ම වගේ නබිතුමාගේ වියෝවත් සමඟ මේ මුස්ලිම් ජාතිකයින්ගේ බෙදීම ආරම්භ වෙලා තියෙනවා.

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : ඔබ දන්නවද වහබ් වාදය ගැන?

පි : දැනුවත් ස්වාමිණි.

ප්‍ර : වහබ් වාදය ඇති වුණේ කොහොමද? වහබ් වාදය කෙටියෙන්ම කියන්න ඕන, කොයි ආකාරයටද ඉස්ලාම් ධර්මය කෙරෙහි බලපාලා තියෙන්නේ කියලා පැහැදිලි කරන්න කෝ?

පි : මම මුලින්ම සඳහන් කළා ස්වාමිණි 570 ඉස්ලාම් ධර්මය ආරම්භ වෙනවා කියලා. එතකොට මේ ආරම්භ වන ඉස්ලාම් ධර්මයට පසුකාලීනව ඒ කියන්නේ වෙනත් ආගම්වල ආභාෂයනුත් ඒ කට්ටිය ඇතුලත් කර ගන්නවා. එතකොට මෙහෙම යන කොට 18 වන ශතවර්ෂයේදී සෞදියේ උයානා කියන ගමේ හිටපු ඉබන්අල් වහබ් කියන පුද්ගලයා මතවාදයක් ඉදිරිපත් කරනවා. එයා කියනවා කුර්ආනයේ තියෙන අර ශූරා 114, ඒ වගේම නබිතුමා ජීවත් වෙලා හිටපු කාලේ එයා කරපු දේවල් සහ එයාගේ ගතිපැවතුම් ඇතුලත් ග්‍රන්ථයක් තියෙනවා හදීස් කියලා. මේ ග්‍රන්ථය විතරයි ඉස්ලාම් ලබ්ධිකයෝ බලන්න ඕනේ. මෙතනින් පිට ගියොත් ඉස්ලාම් නෙමෙයි කියලා එයා තර්කයක් ඉදිරිපත් කරනවා ඒක තමයි වහබිසම් කියලා ලෝකෙට ප්‍රචාරය වෙන්නේ.

ප්‍ර : එතකොට අර ෂියා භක්තිකයෝ සාමාන්‍යයෙන් කුර්ආන් එක, හදීස් ඇරෙන්නට වෙන මොනවා හරි තමන්ට ගුරුකොට ගන්නවද?

Presidential Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

පි : ෂියා භක්තිකයෝ මේ කුර්ආනයමයි බලන්නේ. හදීස් එක වෙනස් වෙනවා. හදීස් එකේ අලීර් අලීගේ ජීවන රටාව ඇතුලත් හදීස් එකක් තමයි බලන්නේ. ඒ විදියට තමයි ස්වාමිණි සුන්නි සහ ෂියා වල වෙන්නේ. සුන්නි නිකායේ තව කොටස් කිහිපයකට කැඩිලා තියෙනවා. ඒක පසුකාලීනව තබ්ලික් සහ ඉස්තිහාද් අහුනුල් සුන්නතුල් වල්ජමාත් කියලා සංවිධානයක් හැදෙනවා. ඒ සංවිධාන මේ කුර්ආන් හදීස්වලට අමතරව ඉෂ්මා කියාස් කියලා තව ග්‍රන්ථ දෙකක් බලනවා. ඉජ්මා, කියාස් කියන ග්‍රන්ථ දෙක ගැන කිව්වොත් ඉජ්මා කියලා කියන්නේ ඉස්ලාමයේ ශාස්තෘවරු පසුකාලීනව ඉදිරිපත් කරපු මත. කියාස් කියලා කියන්නේ ඒ කට්ටිය ඒ සම්බන්ධයෙන් විග්‍රහයන් කරලා ඉදිරිපත් කරපු දේවල්.

ප්‍ර : එතකොට සුන්නි පාර්ශවයද ඔය ආකාරයට කොටස්වලට බෙදන්නේ, එහෙම නැත්නම් ෂියා පාර්ශවයද?

පි : සුන්නි පාර්ශවය.

ප්‍ර : එතකොට ඒක තවදුරටත් සලෆි වාදයට කොහොමද ඒක බලපාන්නේ?

පි : වහබ් වාදය 18 වන ශතවර්ෂයේ, 19 වන ශතවර්ෂයේ

ප්‍ර : 17 ද 18 ද වහබ් වාදය?

පි : 18 ස්වාමිණි. 18 වන සියවසේ ඒ කියන්නේ 1790 ගණන්වල වගේ වෙන්නේ. ඊට පස්සේ 19 වන ශතවර්ෂයේදී ඇති වෙනවා සෞදි අරාබියේ මැදපෙරදිග කේන්ද්‍ර කරගෙන තවත් මතවාදයක් ඒ කට්ටිය කියනවා නෑ කුර්ආන්, හදීස්වලට අමතරව නබිතුමාගේ ලඟම හිටපු කට්ටියට කියනවා සහාබිවරු කියලා.

ප්‍ර : සහාබිවරු?

පි : සහාබිවරු. මේ සහාබිවරුන්ගේ ගතිපැවතුනුත් තමන්ගේ ජීවිතයට ඇතුලත් කර ගන්න ඕනේ, ඒ විදියට ජීවත් වෙන්න ඕනේ කියලා මතයක් හදනවා ඒ කට්ටිය සලෆි කියලා තමයි හඳුන්වනු ලබන්නේ.

ප්‍ර : දැන් මේ වහබ් වාදය සහ සලෆි වාදය ඉස්ලාම් ධර්මය සමඟ එකතුවීම නිසා ඒ ආගමේ තිබුණු, මුලින් තිබුණ තත්ත්වයේ වෙනස්වීමක් වෙනවද?

පි : දැන් සලෆි සහ වහබ් වාදය පැත්තට නැඹුරු වෙච්ච පුද්ගලයෝ දකින්නේ මොහොමඩ් නබිතුමා ඒ වගේම ඒ මොහොමඩ් නබිතුමාට කලින් ඉන්නවා ඊබ්‍රාහිම් කියලා නබිවරයෙක්. එතුමන්ගේ කාලය ඒ වගේම මේ පළවෙනි කලිෆාගේ කාලය තුළ ඒ වගේ කාලයන් විදියට වර්තමානයෙත් ජීවත් වෙන්න ඕන කියලා තමයි ඒ කට්ටිය අදහස් කරන්නේ. එතකොට තව ඒ සලෆි සහ වහබ් වාදය අනුගමනය නොකරන පිරිස විශ්වාස කරනවා

FAIR COMMENT BY JEZEEM

නැහැ අපි ඊට පසුකාලීනව ඇති වෙච්ච අලුත්, අලුත් අර ජීමා සහ කියාස් වගේ ග්‍රන්ථ පරිශීලනය කරලා තමන්ගේ දර්ශනය නැත්නම් තමන්ගේ ආගම අදහන්න ඕනේ කියලා විශ්වාස කරනවා.

ප : එතකොට දැන් ඔය ඔබ කිව්ව ආකාරයට හදිස්වල තියෙන විදියට නබිතුමා ජීවත් වුණු විදියට ජීවත්වීම අවශ්‍යයි කියලා හිතන ඒ පක්ෂය ඒ මතය දරන අය හිතනවද තමන්ගේ ආගමේ වුනත් ඒ ආකාරයට ජීවත් වෙන්නේ නැති කෙනෙක් මුස්ලිම් කෙනෙක් නෙමෙයි කියලා?

පි : ඔව් ස්වාමිණි.

ප : ඒ ගැන පොඩ්ඩක් ඔබට කියන්න පුළුවන්ද?

පි : ඒ කියන්නේ ස්වාමිණි කුර්ආනයේ අවස්ථා කිහිපයකම කුර්ආනයේ අවස්ථා 100 කට වඩා තියෙනවා අල්ලාහ් තමා සර්වබලධාරී එකම දෙවියන් කියලා. එතකොට ඒ අනිකුත් දැන් වහබි, සලෆි කට්ටියට අමතරව ලංකාවෙත් තව ඒ වගේ සංවිධාන ගොඩක් තියෙනවා ඒ කියන්නේ සුන්නි වුණාට වෙන සංවිධාන. එයාලා තමන්ගේ පරණ ආගමික ශාස්තෘවරුනේග් සොහොන් හදාගෙන පල්ලිවල ඒවාට වැඳුම් පිදුම් කරනවා. එතකොට අර සර්වබලධාරී අල්ලාහ් කියන දේ වෙනස් වෙනවා. ඒ නිසා ඒ කට්ටිය ඉස්ලාම් එකේ කියනවා ආගමෙන් පිට පැන්නොත් ඒ කෙනාව කාෆීර් කෙනෙක් නැත්නම් මුස්රිකූන් කෙනෙක් nonbeliever කෙනෙක් ඒ විදියට තමයි හඳුන්වලා තියෙන්නේ. එතකොට ඉස්ලාම් වුනත් එයා අර විදියට කුර්ආන් හදීස්වලට පිටින් වෙන දෙයක් කරනවා නම් එයා කාෆීර් කෙනෙක් විදියට තමයි හඳුන්වනු ලබන්නේ.

ප : ඒ අනුව ඔබ දන්නවද ඔවුන් ජීවත් වුනත් මළවුන් වගේ සලකනවයි කියලා ඔවුන් පාලනය කරනු ලබන යම් සභාවක් උලමා සභාව?

පි : උලවා සභාව ස්වාමිණි උලමා සභාව කියන්නේ සමස්ථ ලංකා ජමෙයිතුල් උලමා සභාව. නමුත් ඒකේ මේ කියන වහබි සහ අර වහබි අනුගමනය නොකරන කට්ටියත් මේ සභාව ඇතුලේ ඉන්නවා. එතකොට එයාලා ඇතැම් අවස්ථාවල දී විවිධ මත ඉදිරිපත් කරලා තියෙනවා. සමහර අය ඉස්ලාම් නෙමෙයි කියලා. උදාහරණයක් විදියට කියනොත් ස්වාමිණි 2007 වගේ මගේ මතකයේ හැටියට. මෙහේ ලංකාවේ තියෙනවා අහමදියා මුස්ලිම් ජමාත් කියලා සංවිධානයක්. ඒ සංවිධානයට විරුද්ධව ප්‍රකාශයක් නිකුත් කරලා තියෙනවා මෙයාලා ඉස්ලාම් නෙමෙයි Non Muslim කියලා.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : ලියන්නේ ෆත්වා එකක්?

පි : ෆත්වා එකක් ස්වාමිණි. ඒ අහමදියා කියන ව්‍යාපාරය හැදෙන්න ඒක ගැන කිව්වොත් ස්වාමිණි ඉන්දියාව සහ පකිස්ථානය එකට තිබ්බ කාලේ එහි හිටපු අහමදියා එක හදපු නිර්මාතෘවරයා කියනවා මම තමයි නබිතුමාට පස්සේ එන මහාධිවරයා කියලා. ඒ කියන්නේ ඉස්ලාම් කුර්ආනයේ තියෙනවා ලෝකේ විනාශ වෙන දවසක් එනවා. එදාට ඉමාම් මහාධි කියන කෙනා ලෝකේ ආපහු අළුතින් හදනවා. ඉස්ලාම් වෙනුවෙන් නැත්නම් අල්ලාහ් වෙනුවෙන් අල්ලහ්ගේ දර්ශනය වෙනුවෙන් කැප වෙන කට්ටිය අල්ලාහ් දෙවියෝ ලඟට ගන්නවා. අර අළුතින් හැදෙන ලෝකෙදී එයාට යස ඉසුරුත් එක්ක ලෝකේ ආපහු ජීවත් වීමට අවස්ථාව ලබා දෙනවා කියලා කුර්ආනයේ සමහර තැන් කීපයකම සඳහන් වෙනවා.

ප්‍ර : එහෙම නම් ඔබේ ඔය තියෙන අත්දැකීම සහ දැනුම අනුව ඔබට ගරු කොමිෂන් සභාවට කියන්නට පුළුවන්ද අප රටේ ඉන්න සුන්නි ලබ්ධිකයෝ විවිධ සංවිධානවලට බෙදලා ඉන්නවද කියලා?

පි : පුළුවන් ස්වාමිණි.

ප්‍ර : සංවිධාන කීයක් පමණ ලංකාවේ තියෙනවද ඒ ආකාරයට?

පි : අපි හඳුනාගෙන තියෙනවා දැනට 10 කට වගේ ආසන්න ප්‍රමාණයක්.

ප්‍ර : මොනවද?

පි : ඒකේ ප්‍රධාන වශයෙන් කිව්වොත් සුන්නි නිකාය. ඒ කියන්නේ 1926 වගේ වෙන කොට ඉන්දියාවෙන් අපිට ලංකාවට එනවා තබ්ලික් ජමාත් කියලා ව්‍යාපාරයක්. ඒ තබ්ලික් ජමාත් කියලා කියන්නේ ඉන්දියාවේ දිල්ලියේ තියෙනවා නිසමුදීන් කියලා පල්ලියක්. මේ නිසමුදීන් කියන පුද්ගලයා කේන්ද්‍ර කරගෙන තමයි මේ ව්‍යාපාරය ඇති වෙන්නේ. එතකොට මේක තබ්ලිත් ජමාත් කියලා තමයි ලංකාවේ ඇති වෙන්නේ. ඊට පසුකාලීනව 1950 ට පස්සේ කාලේදී ලංකාවේ වහබි සහ සලෆි ව්‍යාපාර ලංකාවට ආවට පස්සේ තවත් සංවිධාන ගණනාවක් හැදෙනවා. ඒකෙදී අර තබ්ලික් ජමාත් ව්‍යාපාරයෙන්ම කැඩිච්ච කොටසක් තව ඉන්නවා. ඉස්තිහාද් අහුලුල් සුන්නතුල් වල්ජමාත් කියලා. මෙයාලට කියනවා තරික්කා කියලත් කියනවා. එතකොට මේ තරික්කා කියන සංවිධානයෙත් තවත් කෑලි කිහිපයකට කැඩිලා තියෙනවා ස්වාමිණි. ඒක කාදිරියා, මදිලියා ඒ වගේ එක එක කාදිලියා කියන්නේ ඒ කට්ටිය තරික්කා කට්ටිය තව කඩාගෙන සංවිධාන කිහිපයක් තියෙනවා.

ප්‍ර : කීයක් විතර තියෙනවද?

FAIR COMMENT BY JEZEEM

පි : ඒකේ සංවිධාන 5 ක් වගේ තියෙනවා.

ප්‍ර : ඒක කියන්න පුළුවන්ද ඔබට මොනවද කියලා?

පි : පුළුවන් ස්වාමිණි.

ප්‍ර : කියන්න කෝ ?

පි : ඒ තරික්කා කට්ටිය කාදිරියා කියලා තියෙනවා. මාදුලියා කියලා තියෙනවා. නක්ෂබන්දි කියලා තියෙනවා, රිපායියා කියලා තියෙනවා, දිස්තීයා කියලා තියෙනවා. ඒ කියන්නේ මේවා අර ස්වාමිණි දැන් බෙරුවල පැත්තේ ඉන්න කට්ටිය එක විදියක්, කාත්තන්කුඩි ඉන්න කට්ටිය එක විදියක්, නුවර ඉන්න කට්ටිය එක විදියක් ඒ විදියට තමයි මේ තරික්කා කට්ටිය බෙදිලා ඉන්නේ. ඊට අමතරව තියෙනවා මේ ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාම් කියලා සංවිධානයක් තියෙනවා. ඊට පස්සේ ජමාතුල් සලමා කියලා සංවිධානයක් තියෙනවා. ඊට අමතරව තවුහිද් කියන මේ වහබි එකෙන් පස්සේ පෝෂණය වෙච්ච සංවිධාන කිහිපයක් තියෙනවා ඒකේ පළවෙනි එක තමයි ජමාත් අන්සාරිස් සුන්නතුල් මොහොමදියා කියන සංවිධානය. ඊට අමතරව ඒ සංවිධානයෙන් කොටසක් කැඩිලා ගිහිල්ලා පස්සේ හදා ගන්නවා සමස්ථ ලංකා තවුහිද් ජමාත් කියලා. ඊට පස්සේ ඒකේ කොටසක් කැඩෙනවා ශ්‍රී ලංකා තවුහිද් ජමාත් කියලා, ඒකේ තව කොටසක් කැඩෙනවා සිලෝන් තවුහිද් ජමාත් කියලා. ඊට පස්සේ තව කොටසක් ඉන්නවා ජාතික තවුහිද් ජමාත් කියලා. ඊට අමතරව ඉන්නවා ජමාතුල් මුස්ලිමීන් කියලා කණ්ඩායමක් පුත්තලම, පොළොන්නරුව වගේ ප්‍රදේශවල තමයි ඒ කට්ටිය ඉන්නේ. ඊට අමතරව ෂියා කට්ටිය ඉන්නවා.

ප්‍ර : එක්සත් තවුහිද් ජමාත් කියලත් එකක් තියෙනව නේ?

පි : ඔව් එක්සත් තවුහිද් ජමාත් කියන්නේ එක හැදිච්ච පොඩි ව්‍යාපාරයක්. සමස්ථ ලංකා තවුහිද් ජමාත් එකම හදා ගන්නවා එක්සත් තවුහිද් ජමාත් කියලා.

ප්‍ර : ඒ ආකාරයට තමයි මේ සංවිධාන හැදිලා තියෙන්නේ?

පි : හැදිලා තියෙන්නේ.

ප්‍ර : එතකොට ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ශ්‍රී ලංකා ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියන ඒ සංවිධානය කොහොමද ඇති වුනේ කියලා?

පි : පුළුවන් ස්වාමිණි.

ප්‍ර : කොහොමද ඇති වුණේ?

පි : ජමාතුල් මිල්ලතු ඊබ්‍රාහිම් කියන්නේ ඊබ්‍රාහිම් නබිතුමාගේ මාර්ගය කියන එක. එතකොට මේ කියන සංවිධානය හැදෙන්නේ ඒ කියන්නේ IS සංවිධානය පටන් ගන්නවා එය 2014.06.29

FAIR COMMENT BY JEZEEM

අබුබක්කර් අල් බක්දාදි කියන පුද්ගලයා announcement එකක් නැත්නම් ප්‍රතිඥාවක් දෙනවා මම තමයි ඉස්ලාම් රාජ්‍යයේ නායකයා. මම ඉස්ලාම් රාජ්‍යයක් අළුතෙන් හදනවා, අර කුර්ආනයේ හදීස්වල තියෙන ඉස්ලාම් රාජ්‍යය හැදුවා. සිරියාවට, ඉරාකයට එන්න කියලා. එතකොට ඒකට ලංකාවෙන් පිරිසක් යනවා. ඒවගේම ලංකාවෙන් යන්න උනන්දුවක් තියෙන ඉස්ලාම් රාජ්‍යයක ජීවත් වෙන්න ඕන කියලා උනන්දුවක් තියෙන පිරිසක් ලංකාවේ හදා ගන්නවා පොඩි ගෲප් එකක් ජමාතුල් මිල්ලතු ඊබ්‍රාහිම් කියලා.

ප්‍ර : මම ඔබට පොඩ්ඩක් බාධා කරනවා. දැන් ඔබ කිව්වානේ ඕක බග්දාදි විසින් හදන එකක් කියලා?

පි : ජමාතු මිල්ලතු එක නෙමෙයි.

ප්‍ර : නැහැ IS එක?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එතකොට IS එක සර්කාවි නෙමෙයිද හැදුවේ?

පි : සර්කාවි පටන් ගන්නේ 1999 JTJ කියලා. ජමාත් අල් තවුහිද් කියලා. එයා හදා ගන්නේ ඒ කියන්නේ සර්කාවි කියන පුද්ගලයා 1978, 79 සෝවියට් යුද්දේ කාලේ ඇෆ්ගනිස්ථානයේ බින්ලාඩන්ලත් එක්ක හිටපු එක්කෙනෙක්. එයා ඉරාකෙට ගිහිල්ලා JTJ කියලා සංවිධානයක් හදා ගන්නවා. ඒ පුද්ගලයා ඉන්න කොට පස්සේ කාලේ තමයි මේ IS එක හැදෙන්නේ බැග්ඩෑඩ්ගේ නායකත්වයෙන්. IS කියන එක හැදෙන්නේ බැග්ඩෑඩ්ගේ නායකත්වයෙන්

.ප්‍ර : ISIS එක?

පි : ඔව් ISIS තමයි ප්‍රතිඥාව දුන්නට පස්සේ. මුලින් එයාලා 2003 දී ඒ සංවිධානය සටන් කරන්නේ ඉරාකෙට විතරයි. එතකොට ISII Islamic State of Iraq. ඊට පස්සේ ඒක එයාලා සිරියාවටත් යනවා. 2011 වෙන කොට. එතකොට සිරියාවට ගියාම ISIS Islamic State of Iraq and Syria. පස්සේ මේගොල්ලන් African ඒ වගේ තැන්වල attack පටන් ගන්නවා. පස්සේ ISIL වෙනවා. ISIS Islamic State of Iraq and Levant කියලා. 2014.06.29 IS විතරක් කියලා ප්‍රතිඥා දෙනවා.

ප්‍ර : ඔව් එතකොට ඒ බැග්ඩෑඩ්ගේ කාලේ තමයි මේක ISIS කියලා එන්නේ?

පි : ඔව් ස්වාමිණි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට දැන් ඔබ කිව්වා බැග්ඩෑඩ් විසින් නිවේදනයක් කළාය කියලා මේ ඉස්ලාම් රාජ්‍යය ගොඩ නැගීම සඳහා සිරියාවට එන්නටෙයි කියලා?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : මේ ආකාරයට බැග්ඩෑඩ් නිවේදනයක් කලාම මොන වගේ ප්‍රතිචාරයක්ද ලෝකේ ඉන්න මුස්ලිම් ජන කොටියාශයන් ඒකට දැක්වූයේ?

පි : ඒකේදී ස්වාමිණි 2014.06.29 බැග්ඩෑඩ් ඉස්ලාම් රාජ්‍යය හදද්දි එයා ඒකට සමහර යොදා ගන්නේ කුර්ආනයේ සහ හදීස්වල තියෙන සමහර කරුණු. ඒ කරුණු මත ලෝකේ ඒ කියන්නේ කුර්ආනයේම කියලා තියෙනවා ඉස්ලාම් ආගමේ කුර්ආන්වල තියෙන දේවල් ඒ කියන්නේ Research කරන්න එපා ඒ කියන දේ ඒ සැටියෙන්ම පිළිගන්න කියලා.

ප්‍ර : ඒ කියන්නේ ප්‍රශ්න කරන්න බැහැ?

පි : ප්‍රශ්න කරන්න බැහැ ස්වාමිණි.

ප්‍ර : තියෙන විදියටම පිළිගන්න ?

පි : පිළිගන්න ස්වාමිණි. ඒ අනුව මේ නිර්මාණයත් එක්කම මෙයා invite කරනවා එතකොට ගොඩක් ඉස්ලාම් ලඛ්ධිකයෝ කැමතියි ඉස්ලාම් රාජ්‍යයක ජීවත් වෙලා මරනෙන් පස්සේ මෝක්ෂය ලබාගෙන අර දෙවියන්ගේ වරදාන ලබා ගන්න. එතකොට ඒ මත කවුරුත් ඒ කියන්නේ ගොඩක් ලෝකයේ හැම රටකින්ම ඉරාකයට, සිරියාවට එන්න පටන් ගන්නවා.

ප්‍ර : දැන් ඔබ කිව්වානේ කොයි ආකාරයටද බැග්ඩෑඩ් ආරාධනා කලේ කියලා මේ මුස්ලිම් ජනතාවට?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එතකොට අල්කයිඩා එකත් ඔය Global Jihad කියන සංකල්පයම නේද වැපිරුවේ?

පි : ඒකේදී Global Jihad තමයි ස්වාමිණි, අල්කයිඩා සංවිධානය..

ප්‍ර : ISIS එක වගේම අල්කයිඩාත් කලේ ඒකමනේ?

පි : නමුත් අල්කයිඩා එක....

ප්‍ර : එතකොට එහෙම නම් ඔබට කියන්න පුළුවන්ද අල්කයිඩා එකට මුස්ලිම් ජනතාව මොකද මුජහිදීන්වරු සටන් කෙරුවේ අල්කයිඩා එක වෙනුවෙන්නේ?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එතකොට අල්කයිඩා එකට වැඩිය යම් විශේෂත්වයක් තිබුණද ISIS එකේ? ඇයි ඔබ කියන විදියට මේ ලෝකයේ හුහක් ස්ථානවලින් ප්‍රතිචාර දක්වන්නට පටන් ගත්තේ බැග්ඩෑඩිගේ මේ ආරාධනාවට?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒකේදී ස්වාමීණි අල්කයිඩා සංවිධානය පටන් ගන්නේ මුලින්ම අල්කිඩාමට් කියන කණ්ඩායමක් තමයි 1978, 79 කාලේදී ඇෆ්ගනිස්ථානයේ පටන් ගන්නේ බින්ලාඩන් අබ්දුල් යුෂුෆ් ඇසෑම් කියන කට්ටිය කේන්ද්‍ර කරගෙන. පස්සේ කාලෙකදී මේක අල්කයිඩා වෙන්නේ. එතකොට අල්කයිඩා සංවිධානයේ ප්‍රචාරණ කටයුතු කරපු අන්නර් අල්අවුලාකි කියන පුද්ගලයා කුර්ආන් හදිස්වල තියෙන පොඩි පොඩි කරුණු තමයි කේන්ද්‍ර කර ගන්නේ. නමුත් ඒකේදී විග්‍රහ වෙන්නේ නැහැ මේක එයත් කියන්නේ අපි ඉස්ලාම් කියන්නේ ලෝකෙම, මුළු ලෝකෙම ඉස්ලාම් කරනවා කියලා තමයි Global Jihad කියලා එයාලා කියන්නේ. නමුත් මේ IS සංවිධානය හදද්දි කුර්ආන් හදිස්වල තියෙන කරුණු ඒ විදියටම ගොඩක් වෙලාවට use කරනවා. පාවිච්චි කරනවා. එතකොට ඒකෙදි කියනවා ඉස්ලාම් රාජ්‍යයක් අපි හදනවා, ඒ ඉස්ලාම් රාජ්‍යයේ ජීවත් වෙලා මෝක්ෂය ලබා ගන්න. දෙකේම පොඩි පොඩි වෙනස්කම් තමයි තියෙන්නේ. නමුත් අර කට්ටිය IS කියන සංවිධානය කුර්ආන් හදිස්වල තියෙන කරුණු ගොඩක් දුරට භාවිතා කර ගැනීම තුල අල්කයිඩා එකට වඩා IS සංවිධානයට නැඹුරු වෙන්න ලෝකේ මිනිස්සු ඉස්ලාම් ලබ්දිකයෝ පෙළඹෙනවා.

ප්‍ර : ඔබ කියන්නේ ආගම පෙරදැරි කරගෙන තමයි එහෙම නම් ISIS සංවිධානය තම ප්‍රචාරක කටයුතු කරන්නේ මේ සංවිධානය ගැන?

පි : ඒකේදි ස්වාමීණි ආගම පෙරටු කරගෙන කියන්නේ කුර්ආනයේ හදිස් දැන් හදිස් කියන ග්‍රන්ථ 6 ක් වගේ තියෙනවා. අල්බුහාරි කියන එක්කෙනා හදිස් එකක් ලියලා තියෙනවා. අල්මුස්ලිමින් කියන එක්කෙනා හදිස් එකක් ලියලා තියෙනවා. එතකොට ඒ හදීස් දැන් අවුලාකි කියන පුද්ගලයා එයාට ආවේණික විදියට ඒක ලියාගෙන එයාගේ සංවිධානය එයා කරනවා. එතකොට IS සංවිධානයත් ඒ විදියට තමන්ට ආවේණික විදියට හදීස් එකක් යොදාගෙන තමයි මේකේදී කුර්ආනයේ තියෙනවා ලෝකේ විනාශ වෙනවා, ඉමාම්මහදි කියන එක්කෙනා ඊසානබිත් එක්ක ලෝකෙට එනවා ආපහු. ඒ එන්නේ සාම්දේශයෙන් කියලා. සාම්දේශය කියන්නේ වර්ථමාන සිරියාව. එතකොට මේ සාම්දේශයෙන් එන ඉමාම්මහදිත් එක්ක අලුතින් හදන ලෝකෙට ගිහිල්ලා තමන් වරදානත් එක්ක ජීවත් වෙන එක හොඳයි කියලා තමයි සමහර තැන්වල කුර්ආනයේ සඳහන් වෙන්නේ.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : ඒ නිසා තමයි ඔබ කියන්නේ මේ ISIS සංවිධානයට සමබන්ධ වෙන්න කියලා අල් බැග්ඩෑඩ් 2014 ආරාධනා කලාම ඒකට හොඳ ප්‍රතිචාරයක් ලැබුණා කියලා?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එතකොට එහෙම නම් ඒ ආරාධනාව පිළි අරගෙන ධනවත්, දුප්පත්, උගත්, නූගත් හැම ජාතියේම මුස්ලිම් ජන කොටියාශයට අයත් තැනැත්තන් සිරියාවට ගියාද?

පි : ගිහිත් තියෙනවා ස්වාමිණි. ලෝකේ පුරාම මේ වගේ ඇවිල්ලා තියෙනවා.

ප්‍ර : එතකොට ලංකාවෙනුත් ඒ ආකාරයට ඇතැම් අය ගිහිල්ලා තියෙනවා?

පි : ගිහිල්ලා තියෙනවා.

ප්‍ර : නමුත් යම් අවස්ථාවකදි ඔය 2014 දී අල් බැග්ඩෑඩ් කරපු ආරාධනාව යම් ආකාරයකට වෙනස් වුණාද? දැන් ඇමරිකාව එහෙම පහර දෙන්නට පටන් ගත්තානේ ISIS සංවිධානයට. සිරියාවට ගැහුවානේ මේ අයට?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : ඉතින් එතකොට ඒ පහරදීම්වලට ලක් වුණාම ඒ සංවිධානයට කොයි ආකාරයට ද බලපෑවේ?

පි : මං ස්වාමිණි මේකේදී අලුත් දෙයක් එකතු කරන්නත් කැමතියි මොකද මම ඉස්සෙල්ලා කිව්වා ශ්‍රී ලංකා ජමාත් ඉස්ලාම් කියන සංවිධානය ගැන. ජමාත් ඉස්ලාම් කියන සංවිධානය පටන් ගන්නේ 1954 වගේ කාලයේ. එයාලගේ තේමාව තිබුනෙත් ඉස්ලාම් රාජ්‍යයක් කියලා. එතකොට ලෝකේ විශ්වාස කරන ඔටෝමන් කියන ඉස්ලාම් කැලිෆට් එක ඉවර වුනේ 1921 වගේ.

ප්‍ර : 1921 ඔටෝමන් කැලිෆට් නේ?

පි : ඒ කියන්නේ තුර්කියේ ජනාධිපති අටාටෝ කියන කෙනා ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකට ආවට පසු තමයි ඒ තිබුණ ඉස්ලාම් රාජ්‍යය කියන එක නැති වෙන්නේ. ඒක නිසා එයාලා විශ්වාස කරනවා ඒ කියන්නේ 2021 හරි ඉස්ලාම් රාජ්‍යයක් හදන්න ඕන කියලා. අවුරුදු 100 කට පස්සේ හරි. එතකොට ඒ වගේ අරමුණක් තමයි තිබුණේ. එතකොට IS සංවිධානයට 2014 බැග්ඩෑඩ් මේ වගේ විවෘත ආරාධනාවක් කලාම ලෝකේ පුරාම මිනිස්සු යනවා. පසු කාලීනව ඇමරිකාව ප්‍රමුඛ ඒකාබද්ධ හමුදා ඉරාකය සහ සිරියාවේ IS ඉලක්ක වෙත ප්‍රහාර එල්ල කරනවා. 2017 මැද වෙන කොට අගෝස්තු වගේ වෙන කොට IS සංවිධානයේ නායකත්වය විසින් announce කරනවා සිරියාව

FAIR COMMENT BY JEZEEM

ඉරාකයට එන්න එපා තමන් ඉන්න තැන ඉඳන් ඉස්ලාම් රාජ්‍යය වෙනුවෙන් attack කරන්න කියලා.

ප්‍ර : ඒ අනුව ඔබට නම් කරන්නට පුළුවන්ද එම ප්‍රකාශනයෙන් පසු යම් යම් ස්ථානවල මේ ලෝකේ සිදු වුණු එවැනි ප්‍රහාර?

පි : පුළුවන් ස්වාමිණි.

ප්‍ර : මොනවද?

පි : උදාහරණයක් ප්‍රංශයේ Nice attack එක.

ප්‍ර : දැන් ඒක වුන ස්ථානය, සිදුවුණ ආකාරය ගැන චුට්ටක් පැහැදිලි කරන්න?

පි : එහෙමයි ස්වාමිණි. 2016.06.13 තමයි මේක වෙන්නේ. මේකේ ඒ කියන්නේ එක attack එකක් ප්‍රංශයේ 2016.06.13 වෙනිදා. ඊට පස්සේ ආපහු බෙල්ජියමේ වෙනවා 2016.06.15. 2016.06.21 ජෝර්දාන්වල වෙනවා. මේ වගේ දිගින් දිගටම attacks කිහිපයක් වෙනවා. මේකේදි යොදා ගන්නේ IS එක කියනවා තමන්ට ගෙදර දොරේ භාවිතා කරන්න පුළුවන් ඕනෑම දෙයක් තමන්ගේ අරමුණ වෙනුවෙන් යොදා ගන්න පුළුවන්. ඒකේදී පිහියක් ගොඩක් වෙලාවට IS එකෙන් එයාලගේ ප්‍රචාරණවලදි භාවිතා කලා රුමෙයියා සහ ඩාබික් කියන මැගසීන් දෙක. එතකොට Websites එයාලගේ වෙනම තිබුණා. ඒ Websites වල ගොඩක් කිව්වේ පිහියක් Introduce

ප්‍ර : Websites වල නමුත් කිව්වා නම් අපිට ප්‍රයෝජනවත්, දැනට තියෙන කරුණු තහවුරු වෙනවා එතකොට ඔබෙන්?

පි : කිලාෆා කියලා එක Websites එකක් තිබුණා. තව තිබුණා ඒ කියන්නේ කාලෙන් කාලෙට වෙනස් වුණා. ඩාබික් කියන එකටත් වෙනම Websites එකක් එයාලගේ වෙනම තියන් හිටියා, අන්සලුල් කිලාෆා කියලා එකක් තිබුණා. කිලාෆා කියලා තව එකක් තිබුණා. කොන්ස්තන්තිනියා කියලා තව Websites එකක් තිබුණා. Websites කිහිපයකින් තමයි මෙයාලා යොමු කලේ. එතකොට පිහි භාවිතය සම්බන්ධයෙනුත් මෙයාලා වෙනම හැඳින්වීමක් කරලා තිබුණා. පිහියක දිග ප්‍රමාණය, කොතනටද ශරීරයේ අනින්න ඕනේ, ඒ වගේ නොයෙක්...

ප්‍ර : ඒ මොකද ඒ ශරීරයක, පාවිච්චි කරන ආයුධය පිහියක් නම් ඒකේ අරමුණ වෙන්නේ ශරීරයට තුවාල කිරීම නම්, යම් නිශ්චිත තැනක් තියෙනවද තුවාල කරන්න?

පි : ඒකේදී එයාලා හඳුන්වා දීලා තිබුණා ශරීරයේ මෙතෙන්ට ඇන්නොත් තමයි අනිවාර්යයෙන් මැරෙන්නේ

ප්‍ර : ඒ කියන්නේ හෘද වස්තුවට?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒ කියන්නේ තුවාල කිරීමක් නෙමෙයි බලාපොරොත්තු වෙන්නේ අන්‍යාගමිකයෙක් ඝාතනය කිරීම කියන එක. ඒකේදී වාහන භාවිතා කරන්න ඕනේ කියලා තිබුණා. ඒ වගේ පහුගිය ඒ කියන්නේ 2016,17,18 කාලයන් තුල විදේශයන්වල ගොඩක් මේ වගේ incident වෙලා තියෙනවා. වාහනවලින් මිනිස්සු යට කරලා මරලා තියෙනවා. එතකොට පිහිවලින් මිනිස්සුන්ට attack කරලා තියෙනවා. ඒ වගේ ගොඩක් ඒ කියන්නේ ක්‍රමවේදයන් ISIS එක භාවිතා කරලා තියෙනවා. IS එක කියන්නේම explosive වලට වඩා තමන්ට ගෙදරින් හදා ගන්න පුළුවන් දෙයින් තමයි nonbelievers ලා මරන්න use කරන්න කියලා කියන්නේ.

ප්‍ර : පාවිච්චි කරන්න කියලා කියන්නේ?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එතකොට ඔබ කිව්වානේ ට්‍රක් රථ ප්‍රහාර, ඒ වගේම ආයුධ, ස්වයං ඝාතනය කිරීම?

පි : Suicide.

ප්‍ර : ඔව් Suicide කිරීම මගින් ජනතාව මරණයට පත් කිරීම ගැනත් මොනවා හරි ඒගොල්ලන් ප්‍රවර්ධනය කරනවද ඒ අදහස්?

පි : ඒ කියන්නේ ඉස්ලාම්වල තැන් තැන්වල කුර්ආන්වල එහෙම තියෙනවා Suicide කර ගන්න එක වැරදියි කියලා. නමුත් IS සහ අල්කයිඩා සංවිධාන පසුකාලීනව ඒක වෙනස් අර්ථ කථනයක් දීලා තිබ්බා. තමන් ඒ කියන්නේ තමන්ගේ ඉස්ලාම් රාජ්‍ය, තමන්ගේ ජිහාද් අරමුණ වෙනුවෙන් කරන දේවල් අල්ලාහ් විසින් ඒ කියන්නේ ඒක අනුමත කරනවා කියලා.

ප්‍ර : ඒ කියන්නේ ජිහාදය වෙනුවෙන් කුර්ආනයේ එපා කියලා තිබුණා වුනත් ජිහාදය වෙනුවෙන් ඒක කරනවා නම් ඒකට අල්ලාහ් සමාව දෙනවා කියලයි මේ කියන්නේ?

පි : ඒ කියන්නේ IS සහ අල්කයිඩා සංවිධාන තමයි ඒ විදියට අර්ථ නිරූපණයක් කරලා තියෙන්නේ.

ප්‍ර : එතකොට ඔබට කියන්න පුළුවන්ද ඔය 2017 බැග්ඩෑඩ් ඔය ප්‍රකාශය කරන්නට පෙර ....

පි : 2016 අන්තිමට වගේ තමයි ස්වාමීනි කෙරෙන්නේ.

ප්‍ර : හරි ශ්‍රී ලංකාවේ ඔබ දන්න පුද්ගලයින් ඒ කියන්නේ ඔබ පසුව හඳුන ගත්ත, ශ්‍රී ලාංකිකයින් බවට හඳුනා ගත්ත අය සිරියාවට ගිහිල්ලා තිබ්බද?

පි : 2014.06.29 IS එකෙන් ඉස්ලාම් රාජ්‍යයක් ප්‍රකාශයට පත් කලාට පස්සේ පිටරට ඒ කියන්නේ ලංකාවේ සම්භවයක් තියෙන ශ්‍රී

FAIR COMMENT BY JEZEEM

ලාංකිකයෝ පිටරට ඉදලා තුර්කිය හරහා සිරියාවට ගියපු අවස්ථා කිහිපයක් අපිට වාර්තා වුණා.

ප්‍ර : මොකක්ද පිටරටක ඉදලා ගියා කියලා කියන එකෙන් අදහස් කරන්නේ?

පි : ඒ කියන්නේ එයාලා අපේ ..

ප්‍ර : ශ්‍රී ලාංකිකයෝ නමුත් පුරවැසිභාවය වෙන ස්ථානයකින් ලබාගෙන?

පි : පුරවැසිභාවය තියෙන කට්ටියත් ඉන්නවා, නමුත් පුරවැසි භාවය අයින් නොකර ගෙන ලංකාවේ පුරවැසියෙක් හැබැයි වෙන රටක රැකියාවක් හෝ යම් කටයුත්තක නිරත වෙලා ඉදලා එතනින් තුර්කියට ඇවිල්ලා සිරියාවට ගියපු අවස්ථා කිහිපයක් එහෙම අපිට වාර්තා වෙලා තියෙනවා.

ප්‍ර : දැන් ඇයි මේ තුර්කියට ගිහිල්ලා සිරියාවට යන්නේ? කෙලින්ම සිරියාවට යන්න බැරිද ඔබේ ඔය දත්ත ගවේශණයේදී ලැබුණු තොරතුරු අනුව ?

පි : ඒ කියන්නේ සිරියාවට ඒ කියන්නේ IS එකේ IS activities ආවට පස්සේ සිරියාවට කෙලින්ම ඇවිල්ලා මේ විදියට සම්බන්ධ වෙන්න හැකියාවක් තිබුනේ නැහැ. නමුත් තුර්කිය සහ සිරියාව කියන බෝඩර් එකේ තියෙන ගසියන්ටැප් කියන area එකෙන් තමයි ගොඩක් IS එකට supporters ලා ගියේ. ඒ කියන්නේ ගොඩාක් අතරමැදියෝ හරහා තමයි ඒ විදියට සම්බන්ධවීම් පහුගිය කාලේදි වුණා කියලා අපි තොරතුරුවලින් අනාවරණය වෙලා තියෙන්නේ.

ප්‍ර : ඔබ ඔය සොයා ගන්නා ලද තොරතුරුවලින් මේ ගරු කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද ඒ වගේ තුර්කිය හරහා සිරියාවට ගිය ශ්‍රී ලාංකික සම්භවයක් තියෙන අය කවුද කියලා?

පි : මුලින්ම අපිට එක පුද්ගලයෙක්ව හඳුනා ගන්න හම්බ වෙනවා 2014 දී. මොහොමඩ් උනයිස් මොහොමඩ් අමීන් කියලා කැළණිය ප්‍රදේශයේ පුද්ගලයෙක්. ඒ පුද්ගලයා ඕස්ට්‍රේලියාවේ පුරවැසි භාවය ලබාගෙන හිටියේ. ඊට පස්සේ තව පුද්ගලයෙක් අපිට දැන ගන්න හම්බ වෙනවා මොහොමඩ් මූෂින් නිශාක් අහමඩ් කියලා පුද්ගලයෙක්. මෙයා ටැන්සානියාවල තමයි රැකියාවක් කලේ. Islam Health කියන NGO එකේ වැඩ කලේ රාජ්‍ය නොවන සංවිධානයේ. ඊට පස්සේ..

ප්‍ර : ඔහු තනියමද ගියේ?

පි : එයා වැඩ කලේ ටැන්සානියාවල තනියම. පසුකාලීනව එයාගේ බිරිඳ සහ දරුවන් ගෙන්වා ගන්නවා එරටට. එතනින් තමා එයා සිරියාවට යන්නේ. ඊට අමතරව 2014 දී අරුස් කියලා තව

FAIR COMMENT BY JEZEEM

පුද්ගලයෙක් බලංගොඩ ප්‍රදේශයේ පුද්ගලයෙකුත්, ඔස්ට්‍රේලියාවේ තමයි එයා අධ්‍යාපන කටයුතු කරන්නේ. පස්සේ එයා ශ්‍රී ලංකාවට ඇවිල්ලා ලංකාවෙන් තමයි සිරියාවට යන්නේ.

ප්‍ර : ඔය කියන්නේ මොහොමඩ් සුහේර් මොහොමඩ් අරූස්?

පි : ඔව්. ඊට පස්සේ මේ මොහොමඩ් මූෂින් නිශාක් අහමඩ් කියන පුද්ගලයගේ සහෝදරයා යනවා 2015.01.15 වෙනිදා මොහොමඩ් මූෂින් සර්ෆාස් නිලාම් කියන පුද්ගලයා එයාගේ බිරිඳයි දරුවනුයි පිරිසක් එක්ක ඒත් එක්ක තව පුද්ගලයෙක් ලංකාවෙන් යනවා, ඉමාඩ් කියලා පුද්ගලයෙක්. එයා බිරිඳ සහ දරුවන් එක්ක යන්නේ. තුර්කියට ගිහිල්ලා ආපහු ලංකාවට එනවා එයා දවසක් වගේ ඉදලා. එයා සිරියාවට යන්නේ නැහැ. හැබැයි එයත් මේ ඉස්ලාම් රාජ්‍යයේ මතවාදයට නැඹුරු වෙලා හිටපු පුද්ගලයෙක්. ඊට අමතරව අපි 2015 වෙන කොට මේ සම්බන්ධයෙන් තොරතුරු ගවේශණය කරද්දි පාස්කු දවසේ දෙහිවල ට්‍රොපිකල් ඉන් ලැඟුම් හලේ ප්‍රහාරය සිදු කර ගත්ත අබ්දුල් ලතිෆ් මොහොමඩ් ජමීල් කියන පුද්ගලයත් 2014 ඒ කියන්නේ එයා තුර්කියෙන් සිරියාවට යන්න පුළුවන්ද කියන එක උත්සාහ කරන්න එක් අවස්ථාවක් තුර්කියට ගිහිල්ලා ලංකාවට ඇවිල්ලා තිබුණා කියලා හඳුනා ගන්න හම්බ වෙනවා. ඊට පස්සේ 2015.01.20 වෙනිදා මේ මොහොමඩ් මූෂින් සර්ෆාස් නිලාම් කියන පුද්ගලයාගේ බිරිඳගේ සහෝදරයින් දෙදෙනෙක්, අම්මා සහ තව කාන්තාවක් ඇතුළු කිහිප දෙනෙක් පවුල්වල සාමාජිකයෝ සිරියාවට ගියා කියලා තොරතුරු වාර්තා වෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

ප්‍ර : ඔය ඉමාට් කියන පුද්ගලයා පදිංචි වෙලා ඉන්නේ දෙහිවල ප්‍රදේශයේද?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : පාස්කු දින ප්‍රහාරයෙන් පසුව අත්අඩංගුවට ගැනීමක් සිදු වන්නේ ඔබ මේ කියන ඉමාට් කියන පුද්ගලයද?

පි : ඔව් ස්වාමිණි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>:

ප්‍ර : ඔය ඉමාඩ් සහ ජමීල් මුල් වුණේ නැද්ද ශ්‍රී ලංකා ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධානය ගොඩනගන්න?

පි : මුල් වුණා ස්වාමිණි. ඒ කියන්නේ අපි 2016 විතර වෙන කොට ඒ කට්ටිය හදා ගන්නවා ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියලා සංවිධානයක්. ඒ සංවිධානය හදන්නේ ...

FAIR COMMENT — BY JEZEEM —

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් සංවිධානය ගැන තව ටිකකින් අපිට පැහැදිලි කරන්න. අර දෙහිවල ප්‍රදේශයෙන් අත් අඩංගුවට ගත්තු ඉමාඩ් කියන පුද්ගලයා ගැන ඔබ ලඟ තියෙන තොරතුරු අපිට ලබා දෙන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමිණි.

ප්‍ර : කියන්න?

පි : ඉමාඩ් කියන පුද්ගලයා ස්වාමිණි ඒ කියන්නේ 2015.01.15 වෙනිදා මොහොමඩ් මූෂින් සර්ෆාස් නිලාම් කියන පුද්ගලයාත් එක්ක තමයි එයාගේ බිරිඳ සහ දරු දෙන්නෙක් එක්ක තුර්කියට යන්නේ. පසුව එයාගේ මවට අසනීපයි කියලා ඒ වගේ දුරකථන ඇමතුමකින් පස්සේ තමයි ලංකාවට එන්නේ. හැබැයි ලංකාවට ආවට ඒ පුද්ගලයා එයාගේ මතවාදය නැත්නම් ඉස්ලාම් රාජ්‍යයට යන්න ඕනේ කියන, ගිහිල්ලා ජීවත් වෙන්න ඕනේ කියන අදහස වෙනස් වෙන්නේ නැහැ. එතකොට එයා සහ මේ ජමිල් කියන පුද්ගලයා මෙන්ම තව මේ ඉස්ලාම් රාජ්‍යයකට සිරියාවට යන්න ඕනේ කියන පුද්ගලයෝ කිහිප දෙනෙක් මේ කොළඹ ආශ්‍රිතව ඒ කියන්නේ සංවිධානගත වෙලා ඉන්නවා මේ ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් කියන නමින්. එතකොට ඉමාට් කියන පුද්ගලයත් ඒ විදියට මේ සංවිධානයේ ක්‍රියාකාරීව හිටපු පුද්ගලයෙක්. ඒ සම්බන්ධයෙන් ස්වාමිණි අපි list එකකුත් දාලා තියෙනවා ඒකේ මේ පුද්ගලයගේ විස්තරත් තියෙනවා ස්වාමිනී.

ප්‍ර : ඉමාඩ් කියන පුද්ගලයාගේ පියාගේ නම මොකක්ද?

පි : මට නම හරියටම මතක නැහැ මම බලලා ..

ප්‍ර : බලලා කියන්න?

පි : එහෙමයි ස්වාමිණි. ස්වාමිණි මම ලඟ තියෙන වාර්තාවේ එයාගේ පියාගේ නම සඳහන් කරලා නැහැ. මට ඒ සම්බන්ධයෙන් දෙන්න පුළුවන් ස්වාමිණි අපි ලඟ දත්ත තියෙනවා.

ප්‍ර : ඔබට නම මතකද?

පි : මට හරියට නම ස්වාමිණි මතක නැහැ.

ප්‍ර : යෝජනා කෙරුවොත් මතක් වෙයිද?

පි : සමහර විට මතක් වෙයි. මට එහෙම නම හරියටම මතක නැහැ ස්වාමිනි.

ප්‍ර : මෙනුඩීන් කියන්නේ ?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : මෙයමුඩීන්?

පි : ඒ වගේ නමක් නෙමෙයි ස්වාමිණි මට මතක විදියට.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දෙහිවල කොයි ප්‍රදේශයේද ඔය ඉමාට් කියන පුද්ගලයා ?

පි : දෙහිවල, ඒ කියන්නේ marry කලාට පස්සේ වැල්ලවත්ත ප්‍රදේශයේ බිරිඳගේ ඥාති නිවසක.

ප්‍ර : අත්අඩංගුවට ගැනීම සිදු වෙන්නේ කොතනද?

පි : දෙහිවල නිවසේදී.

ප්‍ර : මොකක්ද ඒ ලිපිනය?

පි : ලිපිනය මට හරියටම මතක නැහැ ස්වාමිණි. මට ඒක බලලා කියන්න පුළුවන් අපි ගාව දත්ත තියෙනවා ස්වාමිණි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඔබ ඔය සඳහන් කරපු ශ්‍රී ලංකා ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධානයේ සාමාජිකයෝ වෙලා හිටියද මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් ඉල්හාම් අහමඩ් ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බය පුපුරපු එක්කෙනා. ඒ වගේම එම මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් ඉන්සාෆ් අහමඩ් සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ බෝම්බය පුපුරපු එක්කෙනා?

පි : අපිට මුල් අවස්ථාවේ ඒ කියන්නේ පාස්කු දින ප්‍රහාරය දක්වා ඒ වගේ තොරතුරක් තිබුණේ නැහැ ස්වාමිණි.

ප්‍ර : නමුත් පසුව හෝ අනාවරණය වුණාද?

පි : අනාවරණය වුණා ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධානයේ සාමාජිකයෝ දෙන්නෙක් කියලා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

කොමිෂන් සභාවේ කටයුතු පස්වරු 5 පසුවී විනාඩි 30 තෙක් කල් තබනවා. ඒ අතරතුර කාලය තුලදි අසන ලද ප්‍රශ්නෙට අවශ්‍ය තොරතුරු කාර්යාලයෙන් ලබා ගන්නා ලෙසට සාක්ෂිකරුට දන්වනවා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දැන් වේලාව : ප.ව. 7.20 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

සම්පූර්ණ නම : සෙනරත් කෝණාර මුදියන්සේලාගේ රංජන් සෙනරත් බණ්ඩාර

(වැඩිදුර සාක්ෂි)
(සාක්ෂිකරු ප්‍රතිඥා දෙයි)

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප : කෙටි විවේකයට පෙර ඔබෙන් ප්‍රශ්න කරනු ලැබුවා අර ශ්‍රී ලංකා ජමාතේ මිල්ලතු ඉබ්‍රාහිම් කියන සංවිධානය බිහි කරන්නට මූලික වූ එක් පුද්ගලයෙක් වන ඉමාඩ් පිළිබඳව?

පි : ඔව් ස්වාමීනි.

ප : ඉමාඩ්ගේ ක්‍රියා පිළිබඳව ගරු සභාපති කොමසාරිස්තුමා ඔබෙන් ප්‍රශ්න කරනු ලැබුවා?

පි : ඔව් ස්වාමීනි.

ප : ඔබට ඒ පිළිබඳ තොරතුරු හොයා ගන්නට පුළුවන් වුණාද?

පි : පුළුවන් වුණා ස්වාමීනි.

ප : ඒ ගැන දැන් ඔබට සඳහන් කරන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි. ඔහුගේ පියාගේ නම මොහොමඩ් ඉම්තිසාම් පකීර්. එයා Arrest කරලා තියෙන්නේ ඉමාඩ් කියන පුද්ගලයා 2019.04.27. Arrest කරන්නේ කවුඩාන පාර, දෙහිවල කියන ලිපිනයේදී.

****

ගරු සභාපතිතුමා :

ප : පියාගේ නම මොකද්ද?

පි : මොහොමඩ් ඉම්තිසාම් පකීර් පියාගේ නම ස්වාමීනි.

ප : අත් අඩංගුවට ගන්න පුද්ගලයාගේ නම මොකද්ද?

පි : පකීර් මොහොමඩ් ඉමාඩ් ඉම්තිසාම්.

ප : පියාගේ ගම් පළාත මොකද්ද?

පි : කොළඹ ප්‍රදේශයේ ස්වාමීනි. තව දෙහිවල ප්‍රදේශයේ කිහිප දෙනෙක් ඒ ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් සංවිධානයට සම්බන්ධකම් තිබුණා ස්වාමීනි.

ප : අත් අඩංගුවට ගැනීම් කරනවද දෙහිවල ප්‍රදේශයේ?

පි : අත් අඩංගුවට ගැනීම් සිදු වෙනවා ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ ගත්තු ස්ථානවල තොරතුරු ඔබ ගාව තියෙනවද?

පි : අපි ඒ කියන්නේ ස්වාමීනි 2017.10.31 පුද්ගලයෝ 94 ක List එකක් අපි පොලිස්පතිතුමා වෙත යවනවා ස්වාමීනි. ඒකේ ඉන්නවා දෙහිවල ප්‍රදේශයේ පුද්ගලයෝ කිහිප දෙනෙක්. ගරු ස්වාමීනි දැනුම් දුන් පරිදි මෙයිනුදීන් කියන පුද්ගලයෙක් ඉන්නවා. මොයුනුදීන් ඊෂාන් අහමඩ් කියලා, එයා දෙහිවල ප්‍රදේශයේ ගල්වල පාරේ පුද්ගලයෙක්.

ප්‍ර : ඒකේ විස්තර කියන්න?

පි : ඒ පුද්ගලයත් මේ ඉමාඩ් කියන පුද්ගලයත් එක්ක සම්බන්ධතා පවත්වපු පුද්ගලයෙක්. මුල් අවදියේ JMI කියන සංවිධානය බිහිවන කාලය තුළ, මුල් අවදියේ ඒ කියන්නේ 2016, 17 කාලවලදී ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධානය ආරම්භ වෙන අවස්ථාවේ කොළඹ ප්‍රදේශයේ තරුණ පිරිසක් හිටියා ඒ සංවිධානයේ. ඒ එක පුද්ගලයෙක් විදියට තමයි මෙයාව අපි හඳුනා ගනු ලබන්නේ.

ප්‍ර : නැවත සම්පූර්ණ නම කියන්න?

පි : මොයුනුදීන් ඉෂාම් අහමඩ්.

ප්‍ර : අත් අඩංගුවට ගන්න ස්ථානයට ඔබට තියෙනවද?

පි : දෙහිවල ප්‍රදේශයේ ගල්වල පාරේදී ගෙදරදී අත් අඩංගුවට ගත් බවක් තමයි මට අනාවරණය වුණේ ස්වාමීනි.

ප්‍ර : ගල්වලද, ගල් විහාර පාරද?

පි : ගල්වල පාර කියලා TID එකෙන් තමයි ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයෙන් තමයි අත් අඩංගුවට ගැනීම සිදු වන්නේ ස්වාමීනි.

ප්‍ර : හරි. ඒ මෙයිනුදීන් ඉෂාම් අහමඩ්ගේ පියාගේ නම මොකද්ද?

පි : මෙයිනුදීන් කියලා තමයි ස්වාමීනි මම දැනුවත් වෙන්නේ. එයාගේ පියා අන්තිමට වැඩ කළා තැපැල් හා මුස්ලිම් කටයුතු අමාත්‍යාංශයේ හිටපු හලීම් ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ වැඩ කළා කියලා දැනුවත්.

ප්‍ර : කවුරු වශයෙන්ද වැඩ කළේ?

පි : උපදේශකයෙක් මට දැනුවත් හැටියට ස්වාමීනි. ගම් පළාත මන්නාරම ප්‍රදේශය වගේ තමයි මම දැනුවත් ස්වාමීනි. ඔහු සම්බන්ධ වාර්තාවක් මම ගාව තියෙනවා ස්වාමීනි ඒ List එකත් එක්ක.

ප්‍ර : ඒක ලකුණු කරන්න. ඒ පුද්ගලයා නැවත අත් අඩංගුවට ගත්ත දිනය කියන්න?

President's Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමීනි මේ මෙයිනුදීන් කියන පුද්ගලයා අත් අඩංගුවට ගත් දිනය මට හරියටම මතක නැහැ. අර ඉමාඩ් කියන පුද්ගලයාව අත් අඩංගුවට ගත් දිනය තමයි ස්වාමීනි මම සඳහන් කළේ 2019.04.27 කියලා. ඒ ආසන්න කාලවලදී තමයි ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයෙන් අත් අඩංගුවට ගැනීම සිදු වන්නේ.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

(ස්වාමීනි අවසර අයැද සිටිනවා පකීර් මොහොමඩ් ඉමාඩ් ඉම්තිසාම් නැමැත්තාගේ තොරතුරු දැක්වෙන ලේඛනයක් X-148 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට)

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

****

ගරු සභාපතිතුමා :

ප : මෙයිනුදීන් ඉෂාන් අහමඩ්ගේ තොරතුරු මොකුත් තියෙනවද?

පි : 94 List එකේ තියෙනවා ස්වාමීනි.

ප : ඒ List එකේ තොරතුරු තියෙනවා?

පි : තියෙනවා ස්වාමීනි.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප : කෙටි විවේකයට පෙර මා ඔබෙන් ප්‍රශ්න කෙරුවා අබු බැග්ඩාඩි විසින් 2017 වසරේදී ප්‍රකාශ කරාට පස්සේ සිරියාවට එන්නට අවශ්‍ය නැහැ. ඔවුන්ට තමන් ඉන්න ස්ථානවල ඉඳලා ඒ IS මතවාදයන් ජය ගන්නට සහ ඉස්ලාම් රාජ්‍යයක් බිහි කිරීම සඳහා කටයුතු කරන්නටය කියලා මේ ලෝකයේ මොන මොන ස්ථානවලද යම් යම් ප්‍රහාර සිදු වුණේ කියලා. ඔබ යම් ප්‍රහාර පිළිබඳව එහිදී සඳහන් කළා නේද?

පි : ඔව් ස්වාමීනි.

ප : දැන් 2017 එළඹෙන්නට ඉස්සර වෙලා ඔබලා එවකට ගරු නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය සාගල රත්නායක මහතාට ඉදිරිපත් කරලා තිබුණද 2016 අගෝස්තු 02 වෙනිදා මා කිව්ව විදියට පසුගිය මාස දෙකක් තුළ IS සටන්කාමීන් සහ එම මතවාදයට නැඹුරු වී සිටින පුද්ගලයින් සිදු කර ඇති ප්‍රහාර කියලා මේ ලෝකයේ විවිධ ස්ථානවල ඔවුන් විසින් සිදුකොට තිබූ ප්‍රහාරයන් 34 ක් පිළිබඳව වාර්තාවක්?

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ස්වාමීනි. මගේත් Document එකක් තියෙනවා.

ප්‍ර : ඔබ ළඟ තියෙනවා එම ලේඛනය?

පි : ඔව්.

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

(ස්වාමීනි එම වාර්තාව X-149 ලෙස ලකුණු කිරීමට අවසර අයැදිනවා)

ප්‍ර : ඔබට කියන්නට පුළුවන්ද ගරු කොමිෂන් සභාවේ අවධානය පිණිස මෙම වාර්තාව මගින් ඔබලා කුමන රටවල්වල සිදු වූ IS ප්‍රහාර ලෙස හඳුනා ගන්නා ලද ප්‍රහාර ලැයිස්තුගත කරලා තිබෙනවද කියලා?

පි : පුළුවන් ස්වාමීනි.

ප්‍ර : නම් ටික කිව්වා නම් රටවල්වල හරි?

පි : ඉරාකය, බංගලා දේශය, සිරියාව, ජෝර්දානය, ඇෆ්ගනිස්ථානය, ඇමෙරිකා, ප්‍රංශය, බෙල්ජියම, මැලේසියාව, තුර්කිය, කුවේට්, සෞදි අරාබිය, ඉන්දුනිසියාව, නයිජීරියාව, ජර්මනිය ආදී රටවල්.

ප්‍ර : එම රටවල්වල තමයි මේ ප්‍රහාරයන් ඒ වනවිට සිදු වුණාය කියලා ඔබලා වාර්තා කරලා තියෙන්නේ?

පි : ඔව් ස්වාමීනි.

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප්‍ර : මා ඔබේ අවධානය යොමු කරන්නට කැමතියි X-149 ලෙස ඔබ දැන් ලකුණු කරලා ඉදිරිපත් කරන ලද මේ ලේඛනයේ ආවරණ ලිපියේ දෙවෙනි පිටුවේ අවසාන ඡේදයට පෙර තියෙන ඡේදයේ මේ වගේ ප්‍රහාරවලට සම්බන්ධ පුද්ගලයින් කොයි ආකාරයටද ඒ රටවල්වලට ඇවිල්ලා තියෙන්නේ කියන කරුණ පිළිබඳව ඔබලා කියලා තියෙනවනේ?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : අන්න ඒ කරුණ පිළිබඳව ගරු කොමසාරිස්වරුන්ව දැනුවත් කරන්න?

පි : ගරු ස්වාමීනි ලෝකයේ ඒ කියන්නේ 2014 ඉඳන් පස්සේ ගත්තහම ඒ කියන්නේ බැග්ඩාඩ් විසින් සිරියාවට එන්න අවශ්‍ය නැහැ. තමන් ඉන්න රටේ රැඳී සිටිමින් ප්‍රහාර එල්ල කරන්න කියලා ලෝකයේ වෙච්ච ප්‍රහාරයන් සම්බන්ධයෙන් බලපුවාම...,

ප්‍ර : මේක 2016. ඒ 2017 කියන්නට ඉස්සර වෙලා වෙච්ච එකක්?

පි : 2016 ස්වාමීනි. එතකොට ඒ ප්‍රහාරවලට සම්බන්ධ වෙච්ච පුද්ගලයෝ ගොඩක් ඒ රටවල්වලට යන්නේ සංක්‍රමණිකයෝ විදියට. ඒ කියන්නේ Visa අරන් ගිහිල්ලා asylum හරි ඒ වගේ අපේක්ෂා කරලා තමයි පස්සේ ටික කාලයක් තුළ තමන්ගේ ප්‍රහාර

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සිද්ධ කර ගන්නේ. එතකොට එතන අපි අවධානය යොමු කරන්නේ ඒ වගේ තත්ත්වයන් තමයි විදේශයන්වල තියෙන්නේ කියලා ස්වාමීනි. ඒ වගේම ස්වාමීනි ඒකේ අපි නිරීක්ෂණයකට ලක් කරනවා මේ වගේ තත්ත්වයන් සම්බන්ධයෙන් අපේ ලංකාවෙත් මේ IS, Islam State මතවාදයට නැඹුරු වෙලා ඉන්න පුද්ගලයෝ මේ Attack සම්බන්ධයෙන් අවධානයෙන් ඉන්නවා කියලා ස්වාමීනි.

ප : ඒ වාගේම ඔබ සඳහන් කරනවා නේද ගරු අමාත්‍යවරයාගේ අවධානයට මේ සරණාගතයින් ලෙස පැමිණි අයවළුන්ට අවශ්‍ය සියළු පහසුකම් එම රටවල් විසින් සලසා දීලා තියෙනවා කියලා?

පි : ඔව් ස්වාමීනි.

ප : ඒ වගේම ඔබ කියනවා එසේ වුවත් ආගම පදනම් කරගත් ප්‍රචාරණයන් තුළින් ඔවුන්ගේ ඉලක්ක සපුරා ගන්නට ඔවුන් පෙළඹිලා තියෙනවා කියලා නේද?

පි : ඔව් ස්වාමීනි.

ප : එතකොට ඔබ තවදුරටත් කියනවා මෙරටද ඒ කියන්නේ ලංකාවටද සරණාගතයින් ලෙස එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහා කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචිය යටතේ පකිස්ථානු සහ ඇෆ්ගනිස්ථානු ඇතුළු විදේශීය ජාතිකයින් 1288 ක් රැඳී සිටින අතර, ඔවුන්ගෙන් 120 දෙනෙක් 2016 වර්ෂය තුළ ලියාපදිංචිවූවන් වේ. නේද?

පි : ඔව් ස්වාමීනි.

ප : හරි. දැන් ඔබ මේ ඉදිරිපත් කරන ලද මේ ලිපිය සහ වාර්තාව කාගේ අත්සනින්ද ගරු අමාත්‍යවරයා වෙත යන්නේ?

පි : රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂතුමාගේ අත්සනින්.

ප : එවකට?

පි : ඔව්.

ප : කවුද ඔහු?

පි : එවකට නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහත්මයා.

ප : ඔබ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා සමඟ කොපමණ කලක් රාජකාරී කරලා තියෙනවද?

පි : නිලන්ත ජයවර්ධන මහතා රාජ්‍ය බුද්ධි සේවාවේ දීර්ඝ කාලයක් සිටියා ගරු ස්වාමීනි. එතුමන් 2015 වර්ෂයේ මට දින වකවානු මතක නැහැ ස්වාමීනි. 2015 වර්ෂයේ එතුමන් රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂවරයා විදියට රාජකාරී වාර්තා කරනවා. ඊට පස්සේ 2016 අවුරුද්දේදී 11 වෙනි මාසේ වගේ මාව වැඩ බලන අංශ භාර නිලධාරියා විදියට පත් වෙනවා. එදා ඉඳන් 2019 එතුමන් රාජ්‍ය

FAIR COMMENT BY JEZEEM

බුද්ධි සේවාවෙන් යනකම්ම එතුමන් එක්ක රාජකාරී කරලා තියෙනවා.

ප්‍ර : ඒ අවස්ථාවේදී ඔබට එම කාලය තුළදී ඔහුගේ අත් අකුරු දකින්න ලැබිලා තියෙනවද?

පි : දැකලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : අත්සන් දකින්න ලැබිලා තියෙනවද?

පි : දැකලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : අත් අකුරු කිව්වහම සිංහල ඉංග්‍රීසි දෙකම දැකලා තියෙනවා නේ?

පි : දැකලා තියෙනවා.

ප්‍ර : අත්සන් කිව්වහම දිගු අත්සන්, කෙටි අත්සන් දෙකම දැකලා තියෙනවා?

පි : දැකලා තියෙනවා.

ප්‍ර : එතකොට මේ ඔබ දැන් X-149 ලෙස ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙන ඒ ආවරණ ලිපියේ අත්සන කාගේද?

පි : රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂතුමාගේ අත්සන.

ප්‍ර : ඔබට රාජකාරියේ තියෙන හුරු පුරුද්ද අනුවද ඒ අත්සන හඳුනා ගත්තේ?

පි : ඔව් ස්වාමීනි. නිලන්ත ජයවර්ධන මහතාගේ අත්සන.

ප්‍ර : ඔබට කියන්නට පුළුවන්ද ඔබ කෙටි විවේකයට පෙර ගරු කොමිෂන් සභාවට සඳහන් කරන ලද මේ ඉස්ලාම් ආගමේ අර සුන්නි ෂියා භේදය නිසා ඇති වෙලා තියෙන මේ බෙදී හේතු කරගෙන පවතින මේ මතවාද කොයි ආකාරයටද නැගෙනහිර පළාතට ලංකාවේ බලපාලා තියෙන්නේ කියලා?

පි : පුළුවන් ස්වාමීනි.

ප්‍ර : කියන්නකෝ?

පි : නැගෙනහිර පළාතේ ගත්තහම ස්වාමීනි ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර කියන දිස්ත්‍රික්ක තුනේ, ඒ දිස්ත්‍රික්ක තුනේ ජීවත්වන මුස්ලිම් ජාතිකයින් සුන්නි සහ ෂියා කියන නිකායන් දෙක යටතේම, දෙකම අදහන ඉස්ලාම් ලබ්දිකයෝ ඉන්නවා. ඒ අතර සුන්නි නිකාය අදහන කට්ටිය ගත්තහම ඒ කට්ටිය දිස්ත්‍රික්ක තුනම නියෝජනය කරනවා. ෂියා නිකාය අදහන පුද්ගලයෝ ගත්තහම එයාලා මඩකලපුව දිස්ත්‍රික්කයේ වාලච්චේන කියන ප්‍රදේශය තමයි ඔට්ටමාවඩි, වාලච්චේන කියන ප්‍රදේශ තමයි නියෝජනය කරන්නේ. එතකොට සුන්නි නිකායේ තව සංවිධාන ගණනාවක් මම මුලදී සඳහන් කළා ස්වාමීනි. ඒ සඳහන් කළ සංවිධානවලට තමයි මෙයාලා බෙදිලා ඉන්නේ. එතනින් ඒ සුන්නි නිකායේ මම මුලින් සඳහන් කළා තබ්ලික් ජමාත් කියලා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සංවිධානයක්. ඒ වගේම ඉස්තිහාද් අහ්ලුල් සුන්නතුල් වල් ජමාත්, හෙවත් තරික්කා කියලා සංවිධානයක් ගැන සඳහන් කළා. ඒ සංවිධාන දෙකේ ලබ්දිකයොත් කාත්තන්කුඩි, මඩකලපුව, අම්පාර සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජීවත් වෙනවා ස්වාමීනි. එතකොට ඒ ප්‍රදේශයේ නමුත් වහාබි සහ සලෆි කියන මතවාද දෙක ඒ ප්‍රදේශයේ බොහොම ශීඝ්‍රයෙන් පැතිරිලා යනවා විවිධ සංවිධාන කිහිපයක් මුල් කරගෙන. ඒකෙන් එකක් කිව්වොත් ජමාත් අන්සාරි සුන්නතුල් මොහොමදියා. ඊළඟට සමස්ත ලංකා තවුහිද් ජමාත්. ඊළඟට ශ්‍රී ලංකා තවුහිද් ජමාත්. ඊළඟට ජාතික තවුහිද් ජමාත් කියන සංවිධාන තමයි ගොඩක් ඒ ප්‍රදේශයේ Active විදියට ක්‍රියාත්මක වෙන්නේ ස්වාමීනි.

ප : හොඳයි. එතකොට මම ඔබෙන් කැමතියි දැන ගන්න මේ ජාතික තවුහිද් ජමාත් සංවිධානය පිළිබඳව?

පි : ඔව් ස්වාමීනි.

ප : එය ආරම්භ වුණේ කාගේ ප්‍රමුඛත්වයෙන්ද?

පි : මා දැනුවත්ව හිටියේ ස්වාමීනි 2012 වර්ෂයේදී මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් කියන පුද්ගලයා කේන්ද්‍ර කරගෙන තමයි ජාතික තවුහිද් ජමාත් සංවිධානය ආරම්භ වෙන්නේ.

ප : ඔය වෙනකොට මොහොමඩ් සහරාන් කියන තැනැත්තාට වයස අවුරුදු 26 ක් විතර වෙන්න පුළුවන්ද?

පි : මගේ මතකයේ හැටියට මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් 1986 ඉපදිච්ච පුද්ගලයෙක්. 08 වෙනි මාසේ 17 මම නිවැරදි ඇති උපන්දිනය. 07 වෙනි මාසේ 17. එතකොට ස්වාමීනි ඔය වගේ වයසක් තමයි වෙන්නේ. හැබැයි එයා අවුරුදු 18, 19 ඉඳන්ම වගේ ඉස්ලාමය සම්බන්ධව ලොකු ප්‍රචාරණයක් කරගෙන යම් පිරිසක් එයා වටා එක් කරගන්න දක්ෂ වෙච්ච පුද්ගලයෙක්.

ප : ඔහු මවුලවී කෙනෙක් වෙන්නට අධ්‍යාපනයක් ලැබුවා නේද යම් ආකාරයකට?

පි : ඔහු මවුලවී කෙනෙක් විදියට කාත්තන්කුඩි තියෙන තවත් අරාබි විද්‍යාලයකින් අධ්‍යාපනය හදාරනවා. නමුත් ඔහු ඔහුගේ අධ්‍යාපනය සම්පූර්ණ කරන්නේ නැහැ. පොඩි කාලයකින් එයාගේ ...,

ප : මොකද එතන වෙන ප්‍රශ්නය?

පි : ඒ තියෙන ඒ අරාබි විද්‍යාලයේ පරිපාලනයට විරුද්ධව යම් යම් දේවල් කරලා එයා ඒ අරාබි විද්‍යාලයෙන් එළියට යනවා. ඒ නිසා තමයි එයාගේ අධ්‍යාපන කටයුතු නතර වෙන්නේ ස්වාමීනි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : එතන ඒ අධ්‍යාපන කටයුතු අඩාල වුණහම ඔහු යනවද මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් ගාවට?

පි : මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් කියලා කියන්නේ කාත්තන්කුඩි පුද්ගලයෙක්. හැබැයි ඒ පුද්ගලයා විවාහ වෙන්නේ කුලියාපිටිය කැකුණගොල්ල කියන ප්‍රදේශයෙන්. එතකොට ඒ පුද්ගලයා එහෙට ගියහම සහරාන් අර කාත්තන්කුඩි තියෙන සම්බන්ධතාවය උඩ කැකුණගොල්ලට ගිහිල්ලා එහෙත් අරාබි විද්‍යාලයක පොඩි කාලයක් අධ්‍යාපනය හදාරනවා. එතකොට ඒ සම්බන්ධතාවය තමයි, එයා යටතේ තමයි පෝෂණය වෙන්නේ.

ප්‍ර : එතකෙට ඔය නවුෆර් කියන තැනැත්තා කටාර් රාජ්‍යයේ රක්ෂාව කළා කියලා මා කිව්වොතින් පිළිගන්නවද?

පි : පිළිගන්නවා ස්වාමිනි. වසර 19 කට වගේ කාලයක් මගේ මතකයේ හැටියට කටාර් රාජ්‍යයේ රැකියාව කරන්නේ.

ප්‍ර : එතකොට Muslim Brotherhood එක ගැන ඒ මතවාදය ප්‍රචාරය කරන කෙනෙක් ඉන්නවද කටාර් රාජ්‍යයේ?

පි : ඉන්නවා ස්වාමීනි.

ප්‍ර : කවුද ඒ?

පි : මගේ මතකයේ හැටියට යූසුෆ් සර්කාවි කියන පුද්ගලයා. එයා කටාර් Base වෙලා හිටියේ. නමුත් එයා මම දැනුවත් විදියට දැන් ඉන්නේ ඊජිප්තුවල. Muslim Brotherhood කියන එක තියෙන්නේ ඊජිප්තුවල. Muslim Brotherhood කියන එකට ....,

ප්‍ර : අනිත් පැත්ත අනිත් පැත්ත. දැන් එක සැරයකුත් ඕක හින්දා මෙතන සාක්ෂි මෙහෙයවන්න සිද්ධ වුණා. හරියට කියන්න?

පි : Muslim Brotherhood කියන එක හදුන්වනවා ...,

ප්‍ර : පටන් ගත්තේ ඒක ඊජිප්තුවෙනේ මෙයා?

පි : ඔව්.

ප්‍ර : කරලාවි හිටියේ ඊජිප්තුවේ උත්පත්තිය.

පි : ඔව්.

ප්‍ර : නමුත් එයා යම් අවස්ථාවකදී එයාගේ ඔය Brotherhood මතවාදය නිසා, Muslim Brotherhood මතවාදය නිසා ඔහුව නෙරපනවා නේද ඊජිප්තුවෙන්. හොඳට මතක් කරන්නකෝ. ඔහුට විරුද්ධව නඩු පැවරීමක් සිදු කරනවා. ඔහු නැතුව ඊජිප්තුවේ නඩු විභාගයක් කරනවා. රජයට සහ ජනතාවට එරෙහිව ඔවුන්ගේ ජීවිත අනතුරට පත්වන ආකාරයට ඔහුගේ මතවාද වගා කිරීම ගැන ඊජිප්තු රජය ඔහුට විරුද්ධව නඩු පවරනවා. ඒ අවස්ථාවේදී ඔහු නොමැතිව ඒ නඩු විභාගය පවත්වන්නේ. ඔහුට සිර දඩුවම් ලැබෙනවා. නමුත්

FAIR COMMENT — BY JEZEEM —

ඒ අවස්ථාව වෙනකොට ඔහු රටින් පිටුවහල් කරලා ඉන්නේ. ඒ අනුව ඔහු කටාර් රාජ්‍යයේ තමයි දැන් ජීවත් වෙන්නේ. හරිද මම කිව්වා?

පි : හරි ස්වාමීනි.

දැන් වේලාව : ප.ව. 7.45 යි
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව ප.ව. 7.45 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : එතකොට කටාර් රාජ්‍යයේ තමයි එහෙම නම් අල් කර්දාවි ඉන්නේ?

පි : ඔව්.

ප්‍ර : අල් කර්දාවි ඉන්න කටාර් රාජ්‍යයේ තමයි එහෙම නම් නවුෆර්?

පි : අවුරුදු 19 ක් සේවය කරන්නේ.

ප්‍ර : එතකොට නවුෆර් සහරාන්ට යම් ආකාරයේ ඥාතීත්වයක් ඇති කර ගන්නවද?

පි : ඇති කර ගන්නවා ස්වාමිණි.

ප්‍ර : කොහොමද ඒක ඇති වෙන්නේ?

පි : මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් කියන පුද්ගලයා විවාහ වෙන්නේ කැකුණගොල්ල ප්‍රදේශයේ කාන්තාවක් එක්ක. ඒ කාන්තාවගේ වැඩිමහල් සහෝදරියගේ දියණිය තමයි සහරාන් විවාහ වෙලා හිටියේ.

ප්‍ර : කියන්නේ හිදායා?

පි : හිදායා ස්වාමිණි.

ප්‍ර : එතකොට ඒ අනුව ලඟ ඥාතීත්වයක් තමයි එහෙම නම් දැන් එතකොට විවාහය මගින් සහරාන්ට සහ නවුෆර්ට ඇති වෙන්නේ?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : ඔබලා විසින් තොරතුරු රැස්කර ගන්න කොට මේ මුස්ලිම් ආගමික අන්තවාදය පිළිබඳව ඔබට තොරතුරු ලැබුණද කොයිතරම් බලපෑමක් ඔය නවුෆර් සහරාන්ගේ ජීවිතය කෙරෙහි ඇති කලාද කියලා මේ ආගමික මතවාදය සහරාන්ගේ මනසේ ඇති කරන්නට?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : මොනවද ඔබට ලැබුණු තොරතුරු?

පි : නවුෆර් හරහා තමයි ඒ කියන්නේ, ගරු ස්වාමිණි 2014 මේ Islam State එක කියන සංවිධානය හැදෙන කොට ලංකාවෙන් පිරිසක් සිරියාවට යනවා, ඒ වගේම ලංකාවේ මම මුලින් සඳහන් කලා ජමාතු මිල්ලතු කියලා සංවිධානයක් මේ මතවාදයට සංවිධානය වෙනවා කියලා ස්වාමිණි. ඊට පස්සේ ඒ කියන්නේ සහරාන් කියන පුද්ගලයා මේ 2014 වෙන කොට IS සංවිධානය බිහි වෙනකොට එයා ඒ මතවාදයේ හිටපු පුද්ගලයෙක් නෙමෙයි. හැබැයි ඒ පුද්ගලයා ඒ වෙන කොටත් ඒ ප්‍රදේශයේ තියෙන

President Secretary's Copy
FAIR COMMENT — BY JEZEEM —

අනෙකුත් ආගමික සංවිධාන ඒ කියන්නේ ඒක දේවවාදය කියන එක ප්‍රතික්ෂේප කරන සංවිධානත් එක්ක බොහොම ගැටීම් ඇති කර ගන්න පුද්ගලයෙක්. එතකොට අපි 2015 වර්ෂයේදී එයා ගැන හඳුනා ගන්නවා කාත්තන්කුඩි හිටපු ආණ්ඩුකාරතුමා හිස්බුල්ලා මහතා ඒ ප්‍රදේශයේ පටන් ගන්නවා උරුම කෞතුකාගාරය කියලා කෞතුකාගාරයක්. ඒකේ තියෙන නටඹුන් ඒ කියන්නේ පිළිම ප්‍රතිමා තියෙන්නේ. එතකොට ඒකට විරුද්ධව සහරාන් නැගී සිටිනවා මොකද ප්‍රතිමා කියන එක ඉස්ලාම්වල .. (ලයිට් ගියා)

ප : ඔබේ පිළිතුර ඉවරයිද?

ප : ඊට පස්සේ නවුෆර් කියන පුද්ගලයා ඒ වෙන කොට සහරාන් කියන පුද්ගලයා ඒ සංවිධානයට විරුද්ධව සහ එහි තියෙන ඔය ආගමික ප්‍රතිමා කියන concept එකට විරුද්ධව හඬ නඟන පුද්ගලයෙක්. එතකොට අපි මේ සිද්ධිය කේන්ද්‍ර කරගෙන මෙයාව හඳුනා ගන්නවා. එතකොට අනික් ආගම්වලට විරුද්ධව තමයි මතවාද පතුරුවන්නේ. එහෙම යන කොට මේ පුද්ගලයා ඒ කියන්නේ IS එකත් ඒ වෙන කොට ඒ පුද්ගලයා IS එකත් ඉස්ලාම් නෙමෙයි කියන මතයේ ඉන්නවා. හැබැයි 2016 වර්ෂයේදී මේ නවුෆර් කියන පුද්ගලයාගේ ආභාෂයෙන් මෙයා වෙනම පිරිස් රැස් කරලා තමන්ගේ කාත්තන්කුඩි පල්ලියේ පිරිස් ගෙනල්ලා මේ IS සංවිධානය නිවැරදියි, මේක් කුර්ආන් හදීස්වල තියෙන දෙයක් කියන එක සඳහන් කරනවා. එතකොට එතන ඉදන් නවුෆර්ගේ ආභාෂයෙන් තමයි සහරාන් නවුෆර් අපි මුල ඉදන් 2016,17 ඉදන්ම ලිස්ට්වල හඳුනා ගත්තු පුද්ගලයෙක් වුණා.

ප : එතකොට ඔබ දැනගෙන හිටියද එහෙම නම් මේ සහරාන් හෂීම් සම්බන්ධයෙන් යම් අවස්ථාවකදී කාත්තන්කුඩිය පොලිසිය විසින් කරන ලද කරුණු දැක්වීමක් මත මඩකලපුවේ ගරු මහේස්ත්‍රාත්තුමා විසින් ඔහුට එරෙහිව වරෙන්තුවක් නිකුත් කරලා තිබ්බා කියලා?

පි : මා දැනුවත් ස්වාමිණි.

ප : ඒ මොන සිද්ධියක් පදනම් කරගෙනද?

පි : 2017.03.10 වෙනිදා කාත්තන්කුඩි අලියාර් කියන හන්දියේදී සහරාන්ගේ ජාතික තවුහිද් ජමාත් සංවිධානය දේශනයක් පවත්වනවා. ඒ දේශනය පවත්වන අවස්ථාවේ ඒ ප්‍රදේශයේ තියෙනවා මම මුලින් සඳහන් කරපු ඉස්තිහාද් අහලුල් සුන්නතුල් වල්ජමාත් තරික්කා කියන party ය රවුල් මවුලවි කේන්ද්‍ර කරගෙන. ඒ සංවිධානයෙන් මේකට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ඒ හරහා දෙගොල්ලන් අතර ගැටුමක් ඇති වෙනවා. ගැටුමෙන් සහරාන්ගේ පාර්ශවයේ කිහිපදෙනෙක් පොලිස්

FAIR COMMENT BY JEZEEM

අත්අඩංගුවට පත් වෙනවා. සහරාන්, රිල්වාන්. සහරාන්ගේ සහෝදරයා මොහොමඩ් කාසිම් මොහොමඩ් රිල්වාන්, ඒ වගේම ආමි මොහිදීන් කියන අනුවර්ථ නාමයෙන් හඳුන්වන පුද්ගලයා, ඒ වගේම තවත් පුද්ගලයෙක් ප්‍රදේශයෙන් පලා යනවා. ඒ පලා ගියාම අත්අඩංගුවට පත් පුද්ගලයා අධිකරණයට ඉදිරිපත් කළාට පස්සේ අධිකරණයෙන් මේ පුද්ගලයාව අත්අඩංගුවට පත් කරන්න කියනවා. පසුකාලීනව එයාට වරෙන්තුවක් නිකුත් කරනවා.

ප්‍ර : දැන් ඔබ ඔය තරම් කරුණු හොඳින් කොහොමද ඔය ගැන දන්නේ?

පි : මම ගරු ස්වාමිණි මට තියෙන්නේ මේ විෂය තමයි. මේ විෂය මම අධ්‍යයනය කරනවා.

ප්‍ර : එහෙම නම් යම් අධිකරණයක් විසින් කෙනෙක් විෂයෙහි වරෙන්තුවක් නිකුත් කළාම ඔබ දන්නවද පොලිස් නිලධාරියෙක් විදියට ඒ වරෙන්තුව ක්‍රියාත්මක කරලා ඒ තැනැත්තාව අත්අඩංගුවට ගන්නට පුළුවන් කියලා ඒ වරෙන්තුව නිකුත් කරපු ආකාරය අදාල වන ආයතනය විසින්?

පි : ඔව්.

ප්‍ර : ඔබලා සාමාන්‍ය පොලිස් නිලධාරී විදියට සැකකරුවන් අත්අඩංගුවට ගැනීමක් කරනවද?

පි : අපේ රාජ්‍ය බුද්ධි සේවාවේ ගරු ස්වාමිනි රාජකාරී තුල තොරතුරු වාර්තා කිරීම තමයි සිදු වෙන්නේ. අපිට අත්අඩංගුවට ගැනීමට එහෙම බලයක් නැහැ ස්වාමිණි.

ප්‍ර : එතකොට නමුත් ඒ පිළිබඳව තොරතුරු සොයා ගැනීම, ඔවුන් කොහේද ඉන්නේ කියලා හොයා බැලීම ඒක කරන්නට පුළුවන්නේ?

පි : පුළුවන් ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ පිළිබඳව යම් පියවරක් ගත්තද? වරෙන්තු මත ඉන්නවා කියලා දැනගෙන හිටියා නම් ඒ අයව ඉන්න ස්ථාන, ඒගොල්ලන් හැංගිලා ඉන්නේ කොහේද කියලා හොයන්නට ඔබ පියවර ගත්තද?

පි : පියවර ගත්තා ස්වාමිනි.

ප්‍ර : මොකක්ද ගත්ත පියවර?

පි : අපි 2017 වර්ෂයේදී ඉදිරිපත් කරන වාර්තාවේ සහරාන් කියන පුද්ගලයා ඉස්ලාම් රාජ්‍ය මතවාදයේ ඉන්න පුද්ගලයෙක් ලෙස හඳුනා ගන්නවා. ඒ වගේම 2017.03.10 සිදුවීමට අවශ්‍ය කරන පුද්ගලයෙක් කියලා දැන ගන්නවා. ඒ අනුව සහරාන් ප්‍රදේශයෙන් යන්නේ සිද්ධියට මාසයකට විතර පස්සේ. ඊට පස්සේ එයා ගිහිල්ලා එයාගේ බිරිඳ පදිංචි වෙලා හිටපු කැකුණගොල්ලේ

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

නිවසට අවස්ථාවෙන් අවස්ථාව පැමිණෙනවා කියලා අපි හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් වාර්තා කරලා තියෙනවා.

ප්‍ර : කාටද වාර්තා කලේ?

පි : මා ලඟ සමහර වාර්තා තියෙනවා ස්වාමිණි. අධ්‍යක්ෂතුමා විසින් පොලිස්පතිතුමා, ආරක්ෂක ලේකම්තුමා, ජාතික බුද්ධි ප්‍රධානීතුමා, ඒ වගේම ඇතැම් අවස්ථාවල අමාත්‍යතුමන්ලාටත් වාර්තා කරපු අවස්ථා තියෙනවා.

ප්‍ර : මොන අමාත්‍යවරුන්ද?

පි : මාගේ මතකයේ හැටියට ගරු ස්වාමිණි සාගල රත්නායක ඇමතිතුමා එවකට හිටපු, රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමා මේක අත්අඩංගුවට නොගතහොත් යම් ප්‍රහාරයක් මේ රටේ වෙන්න පුළුවන් කියන එක 2018 වර්ෂයේ දිගින් දිගටම වගේ අවධාරණය කරලා තියෙනවා ස්වාමිණි.

ප්‍ර : එතකොට ඒ සහරාන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඔබ කියනවා ඔබලා ඔහු පිළිබඳව සොයා බැලීමට යම් යම් පියවර ගත්තාය කියලා. ඔබේ අවධානය යොමු වුණාද සහරාන් විසින් යම් පල්ලියක් කාත්තන්කුඩියේ ගොඩනඟනවාය කියලා?

පි : ගරු ස්වාමිණි 2012 වර්ෂයේදී සහරාන් ජාතික තවුහිද් ජමාත් සංවිධානය හැදුවට පස්සේ ඒ සංවිධානය කාත්තන්කුඩි වෙනම පල්ලියක් නිර්මාණය කරනවා. ඒ පල්ලිය තමයි එයා ටිකින් ටික සංවර්ධනය කරන්නේ.

ප්‍ර : සහරාන් රක්ෂාවක් කරපු කෙනෙක්ද?

පි : සහරාන් මාගේ මතකයේ හැටියට එක් අවස්ථාවක විදේශගත වෙලා තියෙනවා.

ප්‍ර : ජපානෙට ගියා?

පි : 2009 වර්ෂයේදී.

ප්‍ර : ඒ ජපානෙට ගියේ යම් පල්ලියක මෙහෙයවීමෙන් නේද?

පි : මාත් දැනුවත් හැටියට ගරු ස්වාමිණි සහරාන් කියන පුද්ගලයා දේශකයෙක් විදියට තමයි ප්‍රචලිත වෙලා හිටියේ. ඒ නිසා එයාගේ දේශන ගොඩක් එයා අන්තර් ජාලය හරහා යොමු කරනවා. ඒ නිසා එයාගේ දැනුවත් භාවය සම්බන්ධයෙන් එයාට එහේ ආරාධනාවකට තමයි ජපානෙට යන්නේ. එයා දේශන කරලා ඒ හම්බ වෙන ආදායමකින් තමයි මා දැනුවත් විදියට ජීවත් වුණේ.

ප්‍ර : නමුත් පල්ලියක් හදන්න බැහැනේ ඒ දේශනවලින් උපයන මුදලින් නේද. එතකොට ඔබට තොරතුරු ලැබුණද සහරාන් හදන පල්ලිය හදන්නට යම් විදේශ ආධාරයක් හෝ විදේශයක සිටින තැනැත්තෙක්ගෙන් මුදල් ලැබුණද කියලා?

FAIR COMMENT BY JEZEEM

පි : මගේ මතකයේ හැටියට ගරු ස්වාමිණි දේශීය වශයෙනුත් මොහුට ඒ ප්‍රදේශයේ ඉන්න ධනපතියන්ගෙන් සමහර අවස්ථාවලදී සල්ලි ලැබුණා කියන එක අනාවරණය වෙලා තිබුණා. ඒ වගේම සිංගප්පූරුවේ හිටපු මට නම හරියටම මතක නැහැ මොහිදීන් ඒ වගේ නමක්...

ප්‍ර : හාජ්ජියාර් මොහිදීන් කිව්වොත්?

පි : හාජ්ජියාර් මොහිදීන් ඒ පුද්ගලයා මෙයාගේ හිතවත්කම මත වෙස්ටන් යූනියන් හරහා මගේ මතකයේ හැටියට මුදල් වාගයක් එයාට යොමු කරලා තිබුණා. එයා කාත්තන්කුඩිවලින් තමයි ඒ මුදල් ලබාගැනීම කරලා තියෙන්නේ.

ප්‍ර : ඒ 2014 අවුරුද්දේ වගේ නේද?

පි : 2014 වගේ.

ප්‍ර : එතකොට ඔබට මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්නට පුළුවන්ද අර දෙහිවල පිපිරීම සිදු කරපු ජෙමීල් පිලිබඳව?

පි : පුළුවන් ස්වාමිණි.

ප්‍ර : මොනවද ඔබලා දැන ගත්තේ ජෙමීල් පිළිබඳව?

පි : ජමීල් කියන පුද්ගලයා ගරු ස්වාමිණි 2014 වර්ෂයේදි සිරියාවට යන්න උවමනාවෙන් 2014 තුර්කියට ගිහිල්ලා නැවත ලංකාවට එනවා. එයා උත්සාහයක් දරනවා තුර්කියෙන් ප්‍රශ්නයක් නොවනවද කියලා. පසුව එයා කොළඹ කේන්ද්‍ර කරගෙන මම මුලින් සඳහන් කරන ලද ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් හෙවත් ඊබ්‍රාහිම් නබිතුමාගේ මාර්ගය කියන මතවාදයත් එක්ක කොළඹ ප්‍රදේශයේ තරුණයෝ ඒකරාශී කර ගනිමින් එයා දිගින් දිගටම මේ විදියට සිරියාවට යන්න ඕනේ හෝ ලංකාවේ ඉස්ලාම් රාජ්‍යයක් කරන්න ඕනේ කියන මතවාදයේ හිටපු පුද්ගලයෙක් විදියට හඳුනා ගෙන තියෙනවා ගරු ස්වාමිණි.

ප්‍ර : ඔහු එතකොට අර සිරියාවට ගිය නිලාම් එක්ක මුකුත් සම්බන්ධයක් තිබුණද?

පි : සම්බන්ධයක් තිබුණා ගරු ස්වාමිණි.

ප්‍ර : මොකක්ද තිබ්බ සම්බන්ධය?

පි : මොහොමඩ් මූෂින් සර්ෆාස් නිලාම් කියන පුද්ගලයා 2014 තමන්ගේ සහෝදරයා වන මොහොමඩ් මූෂින් නිසාන අහමඩ් කියන පුද්ගලයා සිරියාවට ගියාට පස්සේ මෙයත් සිරියාවට යාමේ අවශ්‍යතාවයෙන් හිටපු පුද්ගලයෙක්. එතකොට මේ පුද්ගලයා තමන්ගේ සමීපතයෝ කිහිපදෙනෙක් සමඟ තමයි මේ ඉස්ලාම් රාජ්‍ය සංකල්පය ගැන සාකච්ඡා කරන්නේ. එතකොට ඒ අතරේ මේ ජමීල් කියන පුද්ගලයා සහ මා මුලින් සඳහන් කරන ලද ඉමාඩ්

FAIR COMMENT — BY JEZEEM —

කියන පුද්ගලයත්, ඒ වගේම තව කොළඹ ප්‍රදේශයේ තරුණයෝ කිහිපදෙනෙකුත් ඒ කණ්ඩායමේ හිටියා ගරු ස්වාමිණි.

ප්‍ර : මීලඟට ඔබෙන් මම දැන ගන්න කැමතියි ඔබලා රැස් කරන තොරතුරු අනුව ඔබේ අවධානය යොමු වෙලා තියෙනවද එක්කෝ පොලිස් දෙපාර්තමේන්තුවේ නැත්නම් වෙනත් රාජ්‍ය අංශවල සේවයේ නියුක්ත එහෙම නැත්නම් විශ්‍රාමික නිලධාරීන් IS මත දරන්නන් බවට වාර්තා වීමක් එහෙම වෙලා තියෙනවද?

පි : ගරු ස්වාමිණි මට අවස්ථාවක් ජමීල් කියන පුද්ගලයාගේ සම්පූර්ණ විස්තර ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් කියන එක සම්බන්ධයෙන් **<u>ස්වාමිණි සාක්ෂිකරු විසින් මේ අවස්ථාවේ අබ්දුල් ලතීෆ් ජෙමීල් මොහොමඩ් යන අයට අදාල ජීවදත්ත සටහනක් ඉදිරිපත් කරනවා. එම සටහන X150 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැදිනවා</u>**.

ප්‍ර : ඔව් මා ඔබෙන් විමසමින් සිටියේ එක්කෝ රාජ්‍ය සේවයේ, පොලිස් සේවයේ,එහෙම නැත්නම් ත්‍රිවිධ හමුදාවේ, එහෙමත් නැත්නම් දැනට විශ්‍රාම අරගෙන ඉන්න යම් නිලධාරීන් ඉන්නවා නම් ඒ අය හෝ ඒ අයට සම්බන්ධ යමෙක් IS මත දරන අය බවට ඔබට වාර්තා වෙලා තියෙනවද?

පි : ගරු ස්වාමිණි රජයේ සේවයේ නියුතු හෝ විශ්‍රාම ගිය පුද්ගලයෝ මේ මතවාදයට නැඹුරු වුණා කියලා අපිට තොරතුරු ලැබුනේ නැහැ. නමුත් ගරු ස්වාමිණි ඒවගේ රාජ්‍ය සේවයේ ඉන්න සහ විශ්‍රාම ගත්ත පුද්ගලයන්ගේ සමහර පවුල්වල සාමාජිකයෝ සම්බන්ධවීමක් ගැන වාර්තා වුණා. 2014 වර්ෂයේදී අපිට වාර්තා වෙනවා

ප්‍ර : ඒ රජයේ සේවකයා හරි විශ්‍රාමික තැනැත්තා හරි ඒ අයගේ නමුයි, ඒ සම්බන්ධ අයගේ නමුයි පුළුවන් නේද අපිට ලියලා දෙන්න?

පි : පුළුවන් ස්වාමිණි.

ප්‍ර : ඔබලාගේ රැස්කරන ලද දත්තවලට මේ වන විට අනාවරණය වෙලා තිබෙනවද රජයේ දැනට සේවය කරන නිලධාරීන් හෝ විශ්‍රාම ගෙන සිටින නිලධාරීන් හෝ IS මතවාදයට නැඹුරුව එය ප්‍රවර්ධනය කරමින් සිටින බව?

පි : එසේ වාර්තාවීමක් සිදු වෙලා නැහැ ගරු ස්වාමිණි.

ප්‍ර : ඔබලා විසින් දත්ත රැස්කරන විට කරනු ලබන පරීක්ෂණවලදී IS මතවාදය ප්‍රවර්ධනය කරන තැනැත්තන් පිළිබඳව කරුණු අනාවරණය වෙලා තියෙනවද?

පි : රජයේ නිලධාරීන්ද ස්වාමිණි.

Presidential Secretariat Copy
FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : නැහැ නැහැ මම අහන්නේ general ප්‍රශ්නයක්, ඔයා කිව්වනේ රජයේ නිලධාරීන් නැහැ කියලා.

පි : ප්‍රවර්ධනය කරන පුද්ගලයෝ සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය වෙලා තියෙනවා. ඒකෙන් එක පුද්ගලයෙක් තමයි මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් කියලා කියන්නේ. ඒ වගේම මොහොමඩ් ඊබ්‍රාහිම් නවුෆර් කියන්නෙත් ඒ වගේ පුද්ගලයෙක්.

ප්‍ර : ඔබලා විසින් ඔය IS මතවාදය ප්‍රවර්ධනය කරන බවට කරුණු අනාවරණය කරගෙන තිබෙන පුද්ගලයින්ගෙන් යම් ඥාතීත්වයක් යම් රජයේ නිලධාරියෙකුට හෝ විශ්‍රාමික නිලධරයෙක්ට තියෙනවද කියන එක අනාවරණය වෙලා තියෙනවද?

පි : ගරු ස්වාමිණි රජයේ සේවකයෝ ගැන කියන්නේ රජයේ සේවකයෝ විශ්‍රාම ගියපු කට්ටිය සම්බන්ධ නොවුනත් එයාලගේ පවුල්වල සාමාජිකයෝ සම්බන්ධ වෙච්ච අවස්ථා කිහිපයක් අපට වාර්තා වෙලා තිබුණා. එකක් තමයි ගරු ස්වාමිණි 2014 වර්ෂයේ සිරියාවට ගමන් කරන ලද මොහොමඩ් උනයිස් මොහොමඩ් අමීන් කියන පුද්ගලයගේ සහෝදරයෙක් රජයේ සේවයේ ඉන්නවා ගරු ස්වාමිණි. ඒ වගේම විශ්‍රාම ගියපු විනිසුරුතුමෙක් ගේ පුත්‍රයා සහ දියණියකගේ ස්වාමි පුරුෂයා සලෆි කියන මතවාදයට නැඹුරු වෙලා ඉන්නවා කියලා අපිට වාර්තා වෙලා තිබුණා. ඒ කට්ටිය යර්මනයේ අධ්‍යාපනය හදාරපු කට්ටිය. ඊට අමතරව ඒ දියණියගේ ස්වාමි පුරුෂයා වන මොහොමඩ් උන්නි මොහොමඩ් නවාස් කියන පුද්ගලයා 2016 වර්ෂයේදී ලංකාවේ ඉන්න කොට මීගමුවේ අල්කිම්මා කියන අරාබි විද්‍යාලයේ ගුරුවරයෙක් විදියට වැඩ කළා. ඒ පුද්ගලයා ඒ විද්‍යාලයේ වැඩ කරන කාලේ ඉන්දියාවේ කේරළයෙන් ආපු තරුණයෝ පිරිසක් මේ අධ්‍යාපනය කරලා පෙරළා ඉන්දියාවට ගිහිල්ලා එතනින් ඇෆ්ගනිස්ථානයට ගිහිල්ලා IS එකට joint වෙලා ඒකේ පුද්ගලයෝ කිහිපදෙනෙක් මියගියා කියලා අපිට වාර්තා වෙලා තිබුණා ගරු ස්වාමිණි.

ප්‍ර : එතකොට ඔබලා ඔය තොරතුරු සොයා බැලූ අවස්ථාවේදී ඔබලා දිගටම ඔය තොරතුරු සොයනවානේ හැමදාම, මේ වනතුරු ඔය කිව්ව අවස්ථා 2 ඇර වෙනත් රාජ්‍ය නිලධාරීන්ට හෝ විශ්‍රාම ගිය නිලධාරීන්ට අදාල වූ පුද්ගලයින් IS මතවාදයට නැඹුරු වෙලා ඉන්නවා කියලා අනාවරණය වෙලා නැද්ද මේ වනතුරු?

පි : එහෙම අනාවරණය වීමක් මගේ මතකයේ හැටියට නැහැ ස්වාමිණි.

****

FAIR COMMENT — BY JEZEEM

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු ජමාතේ ඉස්ලාම් සංවිධානය ඉස්ලාම් රාජ්‍යයක් බිහිකරලීම සඳහා ප්‍රමුඛව කටයුතු කලයි කියලා තමන් කියනවද?

පි : ඔව් ගරු ස්වාමිණි. 1954 වර්ෂයේ තමයි ජමාතේ ඉස්ලාම් කියන සංවිධානය ආරම්භ වෙන්නේ ගරු ස්වාමිණි. එතකොට ඒ සංවිධානය ඉස්ලාම් රාජ්‍යයක් කියන මතවාදය තමයි එයාලගේ අරමුණ විදියට තිබුණේ. හැබැයි 2014 වර්ෂයේදී IS සංවිධානය 2014.06.29 වෙනිදා ඉස්ලාම් රාජ්‍යයක් ප්‍රකාශයට පත් කළාම මේ ශ්‍රී ලංකා ජමාත් ඉස්ලාම් කියන සංවිධානය තමන්ගේ ඉස්ලාම් රාජ්‍යය කියන මතවාදය ඒ කියන්නේ ප්‍රදර්ශනය කරන්නේ නැහැ, එයාලා ශ්‍රී ලංකා ජමාත් ඉස්ලාම් සංවිධානය කියන නම විතරක් තියාගෙන ඒ විදියට තමයි Operate වෙන්නේ. එතකොට ඒ සංවිධානය ඒ විදියට තමයි Operate වෙන්නේ.

ප්‍ර : ඔය ජමාතේ ඉස්ලාම් සංවිධානයට සම්බන්ධව SIS එකේ නිලධාරියෙකු කටයුතු කරලා තියෙනවද?

පි : තියෙනවා ස්වාමිනි.

ප්‍ර : කවුද?

පි : මගේ මතකයේ හැටියට ගරු ස්වාමිණි රාජ්‍ය බුද්ධි සේවාවේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂතුමෙක් වන මහීල් ඩූල් මහතා. ඒ සංවිධානයත් එක්ක සම්බන්ධකම් තියෙනවා කියලා අපිට තොරතුරු වාර්තා වෙලා තියෙනවා ස්වාමිණි.

ප්‍ර : දැන් ඒ දෙක එකිනෙක යාකරලා බැලුවාම එයින් මොකක්ද හැඟෙන්නේ?

පි : මට ප්‍රශ්නය පොඩ්ඩක් ගරු ස්වාමිණි..

ප්‍ර : ඒ කියන්නේ ඉස්ලාම් රාජ්‍යයක් ඇති කර ගැනීම සඳහා කටයුතු කරනු ලබන සංවිධානයක් සමඟ තමන්ලගේ බුද්ධි අංශයේ නිලධාරියෙකු සම්බන්ධ බවට තමන් කියනවා.

පි : තොරතුරු තිබුණා ගරු ස්වාමිණි.

ප්‍ර : තොරතුරු තියෙනවා. ඒ තොරතුරු වැඩිදුරටත් විමසා බැලුවද?

පි : අපි සෙවීමක් කෙරුවා එතුමන් ඒ සංවිධානයේ ක්‍රියාකාරී සාමාජිකයෙක් කියලා අපිට තොරතුරු තිබුණේ නැහැ ගරු ස්වාමිණි. එතුමා ඒ සංවිධානයත් එක්ක සම්බන්ධයි කියලා අපිට තොරතුරු තිබුණා.

ප්‍ර : එය රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක්ද?

පි : එතුමන් ක්‍රියාකාරී මට්ටමේ කටයුතු කරනවා කියලා අපිට වාර්තා වෙලා තිබුණේ නැති නිසා ස්වාමිණි මට ඒ ගැන ඊට වැඩිය දෙයක් අපි වාර්තා කරලා නැහැ ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මෙම ප්‍රහාරයෙන් පසුවත් ඔහු යම්කිසි සංවිධානයක ක්‍රියාත්මක වෙලා හිටියද?

පි : ඒ සම්බන්ධයෙන් අපිට තොරතුරක් තිබුණේ නැහැ ස්වාමිණි

ප්‍ර : සේව් ද පර්ල් නමැති සංවිධානයේ?

පි : මගේ මතකයේ හැටියට මට එහෙම තොරතුරක් මා දැනුවත්ව නැහැ ගරු ස්වාමිනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඔබ සාක්ෂි දෙන ගමන් සඳහන් කළා මොහොමඩ් හෂීම් මොහොමඩ් සහරාන් ජාතික තවුහිද් ජමාත් සංවිධානය තමයි ඔහුගේ සංවිධානය?

පි : ඔව් ගරු ස්වාමිණි.

ප්‍ර : ඒ වගේම ඔබ අද දින සඳහන් කෙරුවා පාකීර් මොහොමඩ් ඉමාඩ් ඉම්තිසාමී සහ ඒවගේම පෙමීල් යන අය ශ්‍රී ලංකා ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් සංවිධානය නිර්මාණය කරන්න දායක වුණා කියලා?

පි : ඔව් ගරු ස්වාමිණි.

ප්‍ර : ඔබලාගේ ඔය කරුණු සෙවීමේදී, තොරතුරු රැස්කිරීමේදී අනාවරණය වුණාද යම් අවස්ථාවකදී මේ සංවිධාන දෙක එකට එක්කෝ සංවිධාන දෙක නැත්නම් මේ සංවිධාන දෙකෙහි සාමාජිකයින් ඇතැම් අය එකට එකතු වුණාද කියලා විශේෂයෙන්ම 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා සිදු කරන ලද පාස්කු ප්‍රහාරයට ඔය සංවිධානයේ සාමාජිකයෝ දෙගොල්ලම සහභාගී වෙලා තියෙනවද කියලා අනාවරණය වුණාද?

පි : අපිට ගරු ස්වාමිණි තොරතුරු වාර්තා වෙලා තිබුණා. කියන්නේ සහරාන් කියන පුද්ගලයා 2016 ඉදන් IS මතවාදය නැත්නම් ඉස්ලාම් රාජ්‍යයක් වෙනුවෙන් තමයි තමන්ගේ ක්‍රියාකාරකම් සිදු කලේ. ඒ වගේම ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධානය 2015, 16 ඉදන්ම අපිට නිරීක්ෂණය වුණා එයාලත් ඉස්ලාම් රාජ්‍යයක් වෙනුවෙන් තමයි ක්‍රියාත්මක වෙන්නේ කියලා. එතකොට ගරු ස්වාමිණි මේ සංවිධාන දෙක අපිට වාර්තා වෙනවා 2016 වගේදී කල්මුණේ හුස්නි මුබාරක් කියන පුද්ගලයාගේ විවාහ මංගල උත්සවයේදී පස්සේ මරදමුනේ ස්වාමිණි ඒ පුද්ගලයා අත්අඩංගුවට පත් වෙනවා. ඒ විවාහ මංගල උත්සවයෙන් පස්සේ මේ සංවිධාන දෙකම එකතු වෙනවා කියලා. ඊට පස්සේ තමයි ගරු ස්වාමිණි පාස්කු දින ප්‍රහාරය සිදු කරන්නේ. විලයාත් අස් සෙයිලානි කියලා මේ ජාතික තවුහිද් ජමාත් සංවිධානය සහ ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධාන දෙකේ එකතුවක් විදියට.

FAIR COMMENT BY JEZEEM

එතකොට මේ ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධානයේ එක සාමාජිකයෙක් වන අබ්දුල් ලතීෆ් මොහොමඩ් ජමීල් කියන පුද්ගලයා දෙහිවල ප්‍රහාරයට සම්බන්ධ වෙනවා ගරු ස්වාමිනි. ඒ වගේම මේ ප්‍රහාරයෙන් පස්සේ සිදු කරන ලද විමර්ශනවලදි අනාවරණය වෙනවා ජමාතේ මිල්ලතු සංවිධානයේ සාමාජිකයෝ කිහිප දෙනෙක් ප්‍රහාරයට අවශ්‍ය පහසුකම් සැලසුවා කියන එක.

ප : එතකොට දැන් ඔය ප්‍රහාරය සඳහා යම් යම් ආකාරයට ඔවුන් විසින් ද්‍රව්‍ය සූදානම් කරගෙන තිබුණ බවට අනාවරණය වුණානේ, නේද. එතකොට ඔබලාට තොරතුරු සොයා ගන්නට පුළුවන් වුණාද සහරාන් හෂීම් විසින් ඔහුගේ කටයුතු සඳහා කොයි ආකාරයටද මුදල් සපයාගෙන තිබුණේ කියලා, ඔබ මගේ ප්‍රශ්නයකට අද දින පිළිතුරු දෙන ගමන් කිව්වා දේශකයෙක් විදියට ඔහු මුදල් ඉපයීමක් කරලා තිබුණයි කියලා?

පි : ඔව් ගරු ස්වාමිණි.

ප : ඒවගේම ඔබ කිව්වා අර පල්ලිය හදන්නටත් සහරාන් හෂීම්ට සිංගප්පූරුවේ ඉදලා හාජ්ජියාර් මොහිදීන් විසින් මුදල් එවපු බවක් අනාවරණය වුණාය කියලා නේද?

පි : ඔව් ගරු ස්වාමිණි.

ප : ඒ වගේම ඔය ප්‍රහාරයන් සඳහා සිදු කරන ඒ කටයුතු එතකොට ඔබලාට අනාවරණය වෙලා තිබුණද යම් යම් කඳවුරු තිබුණයි කියලා දරුවන්ව පුහුණු කරන්නට?

පි : ගරු ස්වාමිණි අපිට මුලදී අපි සහරාන්ව හඳුනා ගැනීම කරන්නේ 2016 දී මේ වගේ දිවයින පුරා තෝරා ගත්තු පුද්ගලයෝ පිරිසක් ගෙනල්ලා කාත්තන්කුඩි පල්ලියේ ඉස්ලාම් රාජ්‍යයක් කියන සංකල්පය පෝෂණය කරන එකක් ස්වාමිණි. ඒකේදී අපි කාත්තන්කුඩි ප්‍රදේශයට අමතරව ගාල්ලේ පුද්ගලයෙක් සෆ්රාන් කියන පුද්ගලයෙකුත් මෙයා මෙහාට ගෙනල්ලා training කරනවා අපි හඳුනාගෙන වාර්තා කරලා තිබුණා ස්වාමිණි. ඒ වගේම අපි වනාතවිල්ලුවේ 2019.01.16 වෙනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවට ගැනීමෙන් පස්සේ පුද්ගලයෝ දෙන්නෙක්, හමාස් සහ මුෆීස් කියන පුද්ගලයෝ දෙන්නව අපි සම්මුඛ සාකච්ඡාවකට ලක් කරනවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී. එතනදී 2019.03 මාසේ වගේ අනාවරණය වෙනවා පුහුණු කඳවුරු කිහිපයක් පවත්වලා තියෙනවා නුවරඑළියේ එකක් පැවැත්තුවා කියලා. ඒ කඳවුරේ පුහුණු කලේ සින්න මවුලවි කියන පුද්ගලයෙක් කියලා අනාවරණය වෙනවා. ඒ සින්න මවුලවි කියන පුද්ගලයා ගැන පරණ අපි ලඟ තිබුනු රෙකෝඩ්ස් බැලුවාම සින්න මවුලවි කියන්නේ සහරාන්ගේ

FAIR COMMENT BY JEZEEM

සහෝදරයා වන මොහොමඩ් කාසිම් මොහොමඩ් ෂයිනි කියන එක සම්බන්ධයෙන් අපි අනාවරණය කර ගන්නවා.

ප : එතකොට මේ පුහුණුවීම් කරලා තියෙන්නේ ඔවුන් සියල්ල එකතුවෙලා?

පි : ඔව් ගරු ස්වාමිණි.

ප : එතකොට දැන් ඒ පුහුණුවීම් සඳහා අවශ්‍ය මුදල්, ඔය අනෙකුත් කටයුතු සඳහා අවශ්‍ය මුදල් සහරාන් මවුලවිට කොහෙන්ද ලැබිලා තිබුණේ කියන එක ඔබලා කරුණු රැස්කිරීමේදී හොයා ගත්තද?

පි : අපිට ගරු ස්වාමිණි මුදල් ලැබීම සම්බන්ධයෙන් තොරතුරු වාර්තා වෙලා තිබුණේ නැහැ ගරු ස්වාමිණි.

ප : හම්බ වෙලා තිබුනේ නැහැ,?

පි : අපිට එහෙම විදේශ රටින් අර හාජා මොහිදීන් කියන පුද්ගලයා පල්ලි හදන්න සල්ලි දුන්නා කියන එක තිබුණා ස්වාමිණි. ඊට පස්සේ මුදල් සම්බන්ධයෙන් මේ පුද්ගලයා කියලා එහෙම තොරතුරක් තිබුණේ නැහැ ගරු ස්වාමිණි.

ප : ඔබ දන්නවා නේද ඔය පාස්කු ප්‍රහාරයට ඊබ්‍රාහිම් සහෝදරයෝ දෙන්නෙක් සම්බන්ධ වුණා?

පි : පාස්කු ප්‍රහාරයෙන් පසුව දන්නවා ගරු ස්වාමිණි.

ප : මම අහන්නේ ඔබලා රැස්කරන ලද තොරතුරුවලින් ඒවා ආශ්‍රයෙන්. පාස්කු ප්‍රහාරයෙන් පසුව හෝ කරුණු අනාවරණය වුණාද සහරාන් හෂීම්ට ඔහුගේ කටයුතු සිදු කරන්නට කොහෙන්ද මුදල් ලැබිලා තිබුණේ කියලා?

පි : ගරු ස්වාමිණි පාස්කු ප්‍රහාරයෙන් පසුව දෙමටගොඩ ඊබ්‍රාහිම් කියන පුද්ගලයගේ පුතාලා දෙන්නා වන ඉල්හාම් සහ ඉන්ෂාෆ් කියන පුද්ගලයෝ දෙන්නා මේ සහරාන්ට සම්බන්ධ වුණා සහ ෂැංග්‍රිලා හෝටලයේ සහ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ ප්‍රහාර දෙක සිදු කලා කියන එක අනාවරණය වුණා. ඒ වගේම ඒ සම්බන්ධව විමර්ශන සිදු කිරීමේදී සහ අත්අඩංගුවට පත් වුණු පුද්ගලයින්ගෙන් ප්‍රශ්න කිරීමේදී අනාවරණය වුණා දෙමටගොඩ ඊබ්‍රාහිම් කියන පුද්ගලයාගේ පුතා වන ඉල්හාම් කියන පුද්ගලයා තමයි මුදල් යෙදවීම් කෙරුවේ කියලා.

ප : දැන් ඔබ සඳහන් කෙරුවනේ අර පුහුණුවීම් කඳවුරු පැවැත්වීම පිළිබඳව?

පි : ඔව් ස්වාමිණි.

ප : හම්බන්තොට එක පුහුණුවීමේ කඳවුරක් තිබුණද?

පි : තිබුණා ගරු ස්වාමිණි.

ප : ඒ හම්බන්තොට කඳවුරට අදාලව ඔබගේ රාජ්‍ය බුද්ධි සේවයේ ඔබ විසින් ඔබේ අධ්‍යක්ෂතුමා වෙත ඔබේ අධීක්ෂණ නිලධාරියා හරහා

FAIR COMMENT — BY JEZEEM —

වාර්තාවක් ඉදිරිපත් කෙරුවද වර්ථමාන වැඩ බලන පොලිස්පතිතුමා වෙත ඉදිරිපත් කිරීම සඳහා 2019.05.18 වෙනිදා හම්බන්තොට එක ගැන?

පි : ගරු ස්වාමිණි අවස්ථා කිහිපයකදී වාර්තා කිහිපයක් යොමු කළා. (සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටි)

ප්‍ර : ඔව් එහෙම නම් ඔබට මතකද එහෙම ඉදිරිපත් කෙරුවද කියලා හම්බන්තොට?

පි : මතකයි ගරු ස්වාමිනි.

ප්‍ර : එම පුහුණු කඳවුර සඳහා යොදා ගන්නා ලද නිවස පිහිටලා තිබුණේ හම්බන්තොට සමෝදා ගම ග්‍රාම සේවා වසමේ 67/4/1 කියන ලිපිනයේ නේද?

පි : ඔව් ගරු ස්වාමිණි.

ප්‍ර : ඒ ඉඩමේ ප්‍රමාණය පර්චස් 22 ක් බවට ඔබට අනාවරණය වෙලා තිබුණද?

පි : අනාවරණය වෙලා තිබුණා ගරු ස්වාමිණි.

<u>එම අදාල වාර්තාව ස්වාමිනි 2019.05.18 දරන X151 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්නට අවසර ඉල්ලා සිටිනවා.</u>

ප්‍ර : එම වාර්තාව අනුව ඔබට ගරු කොමිෂන් සභාවේ අවධානයට යොමු කරන්නට පුළුවන්ද කොයි ආකාරයටද මෙම පුහුණු කඳවුර පැවැත්වෙලා තිබුණ බවට ඔබට කරුණු අනාවරණය වුනේ කියලා?

පි : ගරු ස්වාමිනි මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් කියන පුද්ගලයා තමන්ගේ පිරිස් සඳහා පවත්වන ලද පුහුණු කඳවුරු කිහිපයක් සම්බන්ධයෙන් අනාවරණය වෙනවා. ඒ අතරින් එකක් වන මේ හම්බන්තොට කඳවුරේදී දවස් 2ක 3 ක වගේ පුහුණු වැඩ සටහනක් තමයි තියෙන්නේ. ඒකේදී අපිට අනාවරණය වෙනවා දවසේ උදේ අවදිවීම, ආගම ඇදහීම ඊට පස්සේ පොත්පත් කියවීමට දෙනවා ඒ වගේ වලින් පස්සේ විවිධ ක්‍රීඩා කටයුතුවලට යොමු කරනවා. ඊට පස්සේ weapon training ඒ වගේ training කරලා තියෙනවා. ඊට අමතරව සිරියාවේ සහ ඉරාකයේ තියෙන Videos පෙන්නලා අභිප්‍රේරණයක් කිරීමක් සිදු වෙනවා කියලා අනාවරණය වීමක් වෙලා තියෙනවා ගරු ස්වාමිණි.

ප්‍ර : ඊලඟට ඔබට කියන්නට පුළුවන්ද යම් අවස්ථාවකදී පොලිස්පතිතුමාට ඔබලා භූමියෙන් ඔය රැස්කර ගන්නා ලද සංවෘත සහ විවෘත තොරතුරු ආශ්‍රය කරගෙන IS මතවාදයට නැඹුරු වෙලා ඉන්න පුද්ගලයින් හඳුනා ගැනීමෙන් පස්සේ 94 ක ලැයිස්තුවක් ඉදිරිපත් කරනු ලැබුවද යම් අවස්ථාවකදී කියලා,

FAIR COMMENT — BY JEZEEM —

මොකද ඊයේ දින මේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන්න ඔබේ සේවාවේ නිලධාරියෙක් ඒ පිළිබඳව අනාවරණය කළා?

පි : අපි විසින් වාර්තා කරනවා ගරු ස්වාමිණි 2017 වර්ෂය වන කොට අපි හඳුනා ගන්නා ලද පුද්ගලයෝ 94 ක ලැයිස්තුවක් ගරු ස්වාමිනි

ප්‍ර : දිනය කවද්ද ඒ වාර්තාවේ?

පි : 2017.10.31 ගරු ස්වාමිනි.

ප්‍ර : කවුරු විසින් කාවෙතද ඒක යවලා තියෙන්නේ?

පි : රාජ්‍ය බුද්ධි සේවාවේ එවකට අධ්‍යක්ෂතුමා වන නිලන්ත ජයවර්ධන මහතා විසින් හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා වෙත තමයි ඒ ලිපිය වාර්තා කිරීම සිදු වන්නේ.

<u>ස්වාමිණි එම වාර්තාව X152 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා.</u>

පි : ගරු ස්වාමිණි මම ඒකේ වැඩිමනක් කියන්න කැමතියි ගරු ස්වාමිණි ඒ වාර්තාවට අපි ඇතුලත් කරලා තියෙනවා මොහොමඩ් හිලාම් මොහොමඩ් ෆාරුක් කියලා පුද්ගලයෙක් සම්බන්ධයෙන්. ඒ පුද්ගලයා අබුහයිතම් කියන අනුවර්ථනාමයෙන් තමයි Telegram Accounts වල පෙනී හිටියේ. එතකොට මේ පුද්ගලයා අපි භූමියේ සිදු කරන ලද මෙහෙයුම්වලදී අනාවරණය වෙනවා ත්‍රිකුණාමලේ ප්‍රදේශයට ගිහිල්ලා අවි ආයුධ මිලදී ගැනීමට උත්සාහ කිරීමක් සම්බන්ධයෙන්. ඒකත් මේ වාර්තාවට ඇතුලත් කරලා තියෙනවා ගරු ස්වාමිණි.

ප්‍ර : එතකොට එම X152 කියන ලිපියට ඇමුණුමක් විදියට ඉදිරිපත් කරලා තියෙනවා නේද පොලිස්පතිතුමාගේ අවධානයට ඔබ සඳහන් කරපු අර නම් 94 ක ලැයිස්තුව?

පි : ඔව් ගරු ස්වාමිණි.

<u>ස්වාමිණි එම ලැයිස්තුව X152A වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්නට අවසර ඉල්ලා සිටිනවා.</u>

ප්‍ර : ඔබට ඒ නම් පිළිබඳව ඔබේ අවධානය යොමු කරන්න ඉස්සරවෙලා මා කැමතියි ඔබගෙන් දැනගන්නට මේ කරුණ. ඔබලා 2017 ඉදිරිපත් කරපු මේ 94 ක නම් සහිත ලැයිස්තුවේ නම් කීයක් සඳහන් වෙනවද පාස්කු ප්‍රහාරයට අදාලව? ප්‍රධාන වශයෙන් ක්‍රියාකාරී විදියට සහභාගී වුණාය කියලා රාජ්‍ය බුද්ධි සේවාවට අනාවරණය වූ පුද්ගලයින්?

පි : ගරු ස්වාමිණි අපි 2017.10.31 වන දින වාර්තා කරන ලද ලිපියේ ඇමුණුමක් විදියට දාන්න පුද්ගලයෝ 94 දෙනාගෙන් පුද්ගලයෝ 2 ක් ස්වයං ඝාතකයන් විදියට පාස්කු දින ප්‍රහාරය සිදු කරනවා. එක් පුද්ගලයෙක් අබ්දුල් ලතීෆ් මොහොමඩ් ජමීල්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : List එක බලලා කියන්න list එකේ කීවෙනි ස්ථානයේද ඕගොල්ලන් ඒ ගැන කියලා තියෙන්නේ කියලා සහ දීලා තියෙන comment එක ගැනත් කියන්න?

පි : ගරු ස්වාමිණි අප විසින් යොමු කරන ලද වාර්තාවේ 1 වෙනි පුද්ගලයා විදියට තමයි අබ්දුල් ලතීෆ් මොහොමඩ් ජමීල් කියන පුද්ගලයාගේ නම ඇතුලත් වෙන්නේ. ඔහු සම්බන්ධයෙන් අපි 2015.08.27 වන දිනත් සම්බන්ධ වාර්තාවක් යොමු කරලා තියෙනවා කියලා අපි වාර්තාවේ සඳහන් කරනවා ස්වාමිණි.

ප්‍ර : ඔහු තමයි දෙහිවල බෝම්බය පුපුරා ගත්තේ නේ?

පි : ඔව් ගරු ස්වාමිණි. 57 වෙනි පුද්ගලයා විදියට සඳහන් කරනවා මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් කියන පුද්ගලයා. ඒ පුද්ගලයා සම්බන්ධයෙන් අපි 2017.03.29 වන දිනත් වාර්තාවක් යොමු කලා කියන එක මේ වාර්තාවට ඇතුලත් කරනවා ගරු ස්වාමිණි.

ප්‍ර : එතකොට සහරාන් ෂැංග්‍රිලා හෝටලයේ..

පි : ෂැංග්‍රිලා හෝටලයේ ප්‍රහාරකයා ස්වාමිණි.

ප්‍ර : එක ප්‍රහාරකයෙක්?

පි : ඔව් ස්වාමිණි. ඒ වගේම ගරු ස්වාමිණි පාස්කු දින හවස, සන්ධ්‍යා කාලයේ ඇදිරිනීති තත්ත්වය මත දඹුල්ල පොලිස් ස්ථානය විසින් නතර කර ගන්නවා පුද්ගලයෝ දෙන්නෙක්. ඒ පුද්ගලයින් දෙදෙනාගෙන් එක්කෙනෙක් තමයි මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් කියලා කියන්නේ.

ප්‍ර : ඒ නවුෆර් පිළිබඳව ඔය..

පි : අපේ වාර්තාවේ 64 වන නම විදියට ඒ නම සඳහන් කරලා තියෙනවා ස්වාමිණි. එතකොට මේ පුද්ගලයා තමයි සහරාන්ව ඉස්ලාම් රාජ්‍යයක් වෙනුවෙන් හදන්නේ.

ප්‍ර : ඒ කියන්නේ ඔහුගේ බාප්පා, ඒ නවුෆර් කියලා ඔබ අදහස් කරන්නේ සහරාන්ගේ භාර්යාවගේ පුංචි අම්මා බැඳලා ඉන්න නවුෆර්?

පි : ඔව් ගරු ස්වාමිණි. එතකොට ගරු ස්වාමිණි මේ පුද්ගලයා අපි 2017 වර්ෂයේ ඉදලා වාර්තා කරනවා ගරු ස්වාමනි. ඒ වගේම මේ පුද්ගලයා සම්බන්ධයෙන් කිව්වොත් ගරු ස්වාමිණි 2019.04.21 වෙනිදා.

ප්‍ර : මේ පුද්ගලයා කියන්නේ නවුෆර්?

පි : සමාවෙන්න ගරු ස්වාමිණි මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් කියන පුද්ගලයා 2019.04.21 වෙනි දින ප්‍රහාරයෙන් පස්සේ කොළඹ ප්‍රදේශයෙන් පලා යනවා. ඒ අවස්ථාවේ ඇදිරිනීති තත්ත්වය හේතුවෙන් දඹුල්ල ප්‍රදේශයේ ලැහුම් හලකට ගියාම

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

එතනින් තොරතුරක් මත දඹුල්ල පොලිස් ස්ථානයට කැඳවීමක් කරනවා. ඒ අනුව ඒ පුද්ගලයා සහ මොහොමඩ් රමිෂ් මොහොමඩ් සාදික් කියන පුද්ගලයෙක් දඹුල්ල පොලිස් ස්ථානයෙන් අත් අඩංගුවට පත් වෙනවා. එතකොට ඒ පුද්ගලයෝ දෙන්නා සම්බන්ධයෙන් මූලික විමර්ශන කලාම දඹුල්ල පොලිස් ස්ථානයෙන් අවමංගල්‍ය උත්සවයට සහභාගී වෙන්න කාත්තන්කුඩි යනවා කියලා තමයි ප්‍රකාශ කරන්නේ ගරු ස්වාමිණි. නමුත් අපි ලඟ මේ තොරතුරු තිබ්බ නිසා මේ පුද්ගලයා සම්බන්ධයෙන් දැනුමක් තිබ්බ නිසා ඒ සිදුවීම දවසේම සන්ධ්‍යා කාලයේ, රාත්‍රී මගේ මතකයේ හැටියට මගේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා සම්පත් කුමාර ලියනගේ මහතා කතා කරලා මධ්‍යම පළාත අධීක්ෂණය කරන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාට කතා කරලා මේ පුද්ගලයෝ දෙන්නා අවශ්‍ය කරන පුද්ගලයෝ දෙන්නෙක් කියන කාරණය මතු කරනවා. මොකද මේ පුද්ගලයෝ දෙන්නම අපේ දැනීමට අපිට කලින් රෙකෝඩ්ස්වලට ඇවිල්ලා තිබ්බ පුද්ගලයෝ දෙන්නෙක් ගරු ස්වාමිණි. ඒ නිසා ඒ පුද්ගලයෝ දෙන්නා නතරවීම තුල කාත්තන්කුඩියට යෑම වැළැක්වෙනවා. ඒ වගේම අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවට පත් වෙනවා. ඒ පත්වීමෙන් පස්සේ අනාවරණය වෙනවා නවුෆර් කියන පුද්ගලයා තමයි මේ සහරාන් ඇතුළු IS ක්‍රියාවලිය සම්බන්ධයෙන් සම්පූර්ණම. ඒ පුද්ගලයා ගැන අපේ රෙකෝඩ්ස් තිබුණ නිසා ඒ පුද්ගලයා අත්අඩංගුවට පත්වීමෙන් පස්සේ ගරු ස්වාමිණි අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවෙන් වැඩිදුර විමර්ශන සිදු කරනවා. ඒ සිදු කිරීමෙන් පස්සේ අනාවරණය වෙනවා මේ පුද්ගලයා තමයි ලංකාවේ IS ක්‍රියාකාරිත්වයේ නායකත්වයේ හිටපු පුද්ගලයා කියලා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : ඔබ කියන්නේ දැන් නවුෆර් ගැනනේ ඔබ කතා කරන්නේ?

පි : ඔව් ගරු ස්වාමිණි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජීනසේන මෙනවිය:</u>

ප : දැන් ඔහුත් ඔය 94 list එකේ ඔබලා අඩංගු කරලා තිබිලා තියෙනවා 2017?

පි : ඔව් ගරු ස්වාමිණි.

ප : වෙන කවුද?

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : ඔබ නවුෆර් කියලා කියන්නේ නවුෆර් මවුලවිද?

පි : ඔව් ගරු ස්වාමිණි. මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් හෙවත් නවුෆර් මවුලවි.

ප්‍ර : ඔව් මට ඒක තමයි අවශ්‍ය වෙලා තිබුනේ සම්පූර්ණ නම අපිට කවදාවත් ලැබිලා තිබුනේ නැහැ,

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

පි : ඒ වගේම ස්වාමිණි 2019.04.26 වන දින අම්පාර සයින්දමර්දු ප්‍රදේශයේ නිවසක පිපිරීමක් සිදුවෙනවා. ඒ නිවසේ පිපිරීම සිදු කරගනු ලබන මොහොමඩ් කාසිම් මොහොමඩ් රිල්වාන් කියන ඉහත මා සඳහන් කරන ලද සහරාන්ගේ සහෝදරයා

ප්‍ර : අංක කීයද සඳහන් කරලා තියෙන්නේ?

පි : අපේ ලැයිස්තුවේ ගරු ස්වාමිණි 52 විදියට නම සඳහන් වෙනවා ස්වාමිණි. ඒ වගේම ගරු ස්වාමිණි 57 විදියට නම සඳහන් වෙනවා මොහොමඩ් කාසිම් මොහොමඩ් ෂයිනි කියන පුද්ගලයා.

ප්‍ර : ඒත් සහරාන්ගේ සහෝදරයෙක්?

පි : සහරාන්ගේ අනික් සහෝදරයා ගරු ස්වාමිණි. 58 විදියට ගරු ස්වාමිණි නම සඳහන් වෙන්නේ.

ප්‍ර : 57 නෙමෙයි 58 ?

පි : එහෙමයි ස්වාමිණි. ඒ පුද්ගලයෝ ටික ස්වාමිණි සිද්ධියෙන් මරණයට පත් වුණා. ඒ වගේම ගරු ස්වාමිණි දැනට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ සිද්ධියට අදාලව අත්අඩංගුවේ පත් වෙන පුද්ගලයෝ මට නම් වශයෙන් එකිනෙක මතක නැහැ ගරු ස්වාමිණි. නමුත් මේ ලැයිස්තුවේ ඉන්න පුද්ගලයන්ගෙන් 80% ක් වගේ මා දැනුවත් විදියට අත්අඩංගුවේ දැන් ඉන්නේ.

ප්‍ර : කමක් නැහැ, නමුත් ඔබ අර නම් වශයෙන් සඳහන් කරපු අය ඔබලා 2017 වසර වෙන කොටත් පොලිස්පතිතුමාගේ අවධානයට යොමු කලා IS මතවාදයට මේ අය නැඹුරුයි කියලා?

පි : ඔව් ගරු ස්වාමිණි.

ප්‍ර : ඔබ යම් අවස්ථාවකදි බස්නාහිර බුද්ධි ඒකකයට යම් දේශනයක් එහෙම කලාද?

පි : මගේ මතකයේ හැටියට ස්වාමිණි දින වකවානු හරියට මතක නැහැ ගරු ස්වාමිණි. 2017 හෝ 2018

ප්‍ර : ඔබ 2017 තමයි ඒක කරලා තියෙන්නේ?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : මා සහ මගේ සහකාර අධ්‍යක්ෂතුමා සහභාගි වෙලා දේශනයක් සිදු කළා ස්වාමිණි.

ප්‍ර : ඔබගේ සහකාර අධ්‍යක්ෂතුමාගේ නම ඉස්සෙල්ලා දුන්නා නේ?

පි : මම ලබා දුන්නා ස්වාමිණි.

ප්‍ර : එතකොට ඔබට ඒ අවස්ථාව ලැබුනේ කොහොමද?

පි : මම මුලින්ම සඳහන් කලා ගරු ස්වාමිණි මම 2009 දී තමයි රාජ්‍ය බුද්ධි සේවාවට සම්බන්ධ වෙන්නේ. වසර 3 ක් 4 ක වගේ කාලයෙන් පස්සේ මම රාජ්‍ය බුද්ධි සේවයේ මේ විෂය සම්බන්ධයෙන් හදාරා දැනීමත් එක්ක දේශන රාජ්‍ය බුද්ධි සේවාවෙන් කුමන හෝ ආයතනයකින් ඉල්ලුවාම සහභාගී වෙනවා ස්වාමිණි. එතකොට ඒ වගේ බස්නාහිර බුද්ධි එකෙනුත් ඉල්ලන ලද දේශනයකට සහභාගි වෙන්න කියලා කරන ලද දැනුම්දීම මත තමයි ගරු ස්වාමිණි ගිහිල්ලා දේශනය සිදු කරන්නේ ගරු ස්වාමිණි.

ප්‍ර : එතකොට ඔබ නාවික හමුදාවෙත් ඒ වගේ දේශනයක් කරලා තියෙනවද නිලධාරීන්ට?

පි : නාවික හමුදාවේ අවස්ථා කිහිපයකදී දේශන කරලා තියෙනවා ගරු ස්වාමිණි. මගේ මතකයේ විදියට 2016 එක් දිනයක දකුණ නාවික විධානයේදී දේශනයක් කලා. ඒකට නිලධාරීන් 100 ට ආසන්න ප්‍රමාණයක් මගේ මතකයේ හැටියට සහභාගි වුණා.

ප්‍ර : ඔබට නාවික හමුදාපති ප්‍රසංශා සහගතව ලිඛිතව ඔහුගේ ප්‍රසංශාව හිමි කලේ කොයි අවස්ථාවේදි ද ඔබේ දේශනය සම්බන්ධයෙන්?

පි : 2016 වසරේදි ගරු ස්වාමිණි මේ සහරාන් සහ IS Network එකත් හා සම්බන්ධව සියළු තොරතුරු දේශනයට සම්බන්ධ කරලා ප්‍රකාශ කරනවා. එතනින් පස්සේ නාවික හමුදාපතිතුමා වෙනුවට කියලා අත්සන් කරලා අත්සනක් සහිතව ලිපියක් රාජ්‍ය බුද්ධි සේවාවට හම්බ වුණා. ඒක පොලිස් දෙපාර්තමේන්තුවට ප්‍රසංශා කරලා

****

<u>**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**</u>.

ප්‍ර : සාක්ෂිකරු ඔබගෙන් කලින් අහපු සිද්ධියකට ඔබගේ මතකය ගෙනියන්න අවශ්‍යයි?

පි : ඔව් ගරු ස්වාමිණි.

ප්‍ර : අර දෙහිවල ගල්වල පාරෙන් අත් අඩංගුවට ගත්තානේ යම් තැනැත්තෙක්?

පි : ඔව් ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ අත් අඩංගුවට ගත්තාට පස්සේ එම තැනැත්තාගේ නිවසට යම්කිසි විශේෂ පුද්ගලයෙකු ගියා කියලා ඔබලට තොරතුරු තියෙනවද යම් අවස්ථාවක?

පි : ගරු ස්වාමිණි 21 දින සහ එතනින් පස්සේ සිදුවීම්වලට මම, මේ සිද්ධිය දැනුමක් තියෙන පුද්ගලයෙක් හින්දා විමර්ශනයට ගොඩක් සම්බන්ධ වුනා. සිදුවීම් කිහිපයක්. මට එහෙම නිශ්චිතව මතකයක් නැහැ ගරු ස්වාමිණි.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු මේ පැහැදිලි කර ගැනීමකට අහන්නේ, කලින් ඔබ කිව්වා SIS එකේ සහකාර අධ්‍යක්ෂවරයෙක් වන ඩූල් මහතා ජමාතේ ඉස්ලාම් සංවිධානයට සම්බන්ධයි කියලා?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එසේ සම්බන්ධ වුනේ විශ්‍රාම යාමට පෙරද පසුද?

පි : මාගේ දැනුවත්කම හැටියට විශ්‍රාම යෑමෙන් පසුව තමයි අපිට තොරතුරු තිබුණේ ගරු ස්වාමිණි.

ප්‍ර : එසේ නම් ඔබ කියලා තියෙන්නේ එවැනි පුද්ගලයෙකු නිසි ලෙස වාර්තා කිරීම සම්බන්ධ ගැටළු සහගතයි කියලා?

පි : ගරු ස්වාමිණි ජමාත් ඉස්ලාම් එකේ පුද්ගලයෝ ගොඩක් මේ සහරාන්ගේ සිද්ධි දාමයට සම්බන්ධ වෙනවා ස්වාමිණි. ඒ කියන්නේ ජමාත් ඉස්ලාම් කියන සංවිධානයේ ශිෂ්‍ය සංවිධානය කියන සංවිධානයේ හිටපු පුද්ගලයෙක් තමයි මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා කියන්නේ. ඒ පුද්ගලයා 2014 වර්ෂයේදී සිරියාවට ගිහිල්ලා පුහුණුව ලබනවා. ඒ පුද්ගලයා විසින් මේ සංවිධානයේ ශිෂ්‍ය ව්‍යාපාරයට කරන ලද දේශන සහ ඒ සම්බන්ධතා තුල ඒ පුද්ගලයෝ ගොඩක් සහරාන් වටා එකතු වෙනවා ගරු ස්වාමිණි. ඒ නිසා ගරු ස්වාමිණි ඒකට සම්බන්ධ පුද්ගලයෙක් නිසා තොරතුරු, මට කවදාවත් තොරතුරුක් වාර්තා වෙලා නැහැ ස්වාමිණි. නමුත් අර සැකයි කියලා මම කිව්වේ, එහෙම කියන්නේ නැහැ ගොඩක් වෙලාවට තමන්ගේ සංවිධානයට සම්බන්ධ නම් තමන් හිතවත් කමක් තියෙනවා නම් අන්න ඒ නිසා ස්වාමිණි ඒ විදියට.

ප්‍ර : ඒ කියන්නේ එම නිලධාරියා ඒකට ජමාතේ ඉස්ලාම් එකට සම්බන්ධ නම් ඔහු ඒ තොරතුරු හරියට දෙන්නේ නැහැයි කියන එකද කියන්නේ, දීම සම්බන්ධයෙන් ගැටළු සහගතයි කියන්නේ ඒකයි තමන් කියන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ගරු ස්වාමිණි සමහර සංවිධානවල හිටපු, එහෙම පුද්ගලයෙක් සම්බන්ධව තොරතුරු දෙනවා බොහොම අඩු නිසා ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ ඔහු විශ්‍රාම ගියායින් පස්සේද, ඊට පෙරද?

පි : විශ්‍රාම ගියාට පස්සේ තමයි ගරු ස්වාමිනි අපිට නිරීක්ෂණය වෙලා තියෙන්නේ. ඊට කලින් මම නම් දැනුවත් නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

රාත්‍රී ආහාරය සඳහා කොමිෂන් සභාව පස්වරු 9 පසු වී විනාඩි 15 තෙක් කල් තබනවා.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව:ප.ව. 9.15

<u>රජයේ අධි නීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා</u>

ගරු සභාපතිතුමනි මෙම අවස්ථාවේ අතිරේක සොලිසිටර් ජෙනරල් මෙනවිය හට පෞද්ගලික අවශ්‍යතාවයක් උද්ගත වී ඇති බැවින් මෙම සාක්ෂිකරුගේ සාක්ෂි මෙහෙය වීම කල් දැමීමට ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරියට උද්ගත වූ පෞද්ගලික අපහසුතාවය පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කල සටහන් කර තබමි. ඒ අනුව ඉල්ලීමට අවසර ලබා දෙමි. මෙම සාක්ෂිකරු සහ අද දින මෙහෙය වීමට නියමිතව සිටි. අනෙකුක් සාක්ෂිකරුගේ සාක්ෂිය 2020 ජූලී මස 24 වෙනි දින සවස 4ට මෙහෙයවන බව සටහන් කර තබමි. සාක්ෂිකරුට අවවාද කරමි. හෙට සවස 4 ට පෙනී සිටින ලෙසට නියෝග කරමි.

කොමිෂන් සභාවේ කටයුතු 2020.ජූලි මස 24 වෙනි දින පස්වරු 12 පසු වි විනාඩි 30 තෙක් කල් තබනවා.

දැන් වේලාව. 9.20

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.07.24 වේලාව: ප.ව 9.00

සටහන් කළේ - නිල්මිණි කුමාරි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, රජයේ අධිනීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

විවේකයන් පසුව

නම: සෙනරත් කෝනාර මුදියන්සේලාගේ රංජන් සෙනරත් බණ්ඩාර
ප්‍රතිඥා දී කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර: බණ්ඩාර මහත්මයා ඔබ ඊයේ දින රාජ්‍ය බුද්ධි සේවයේ ඔබේ අංශය විසින් සිදු කරනු ලබන රාජකාරි කටයුතු පිළිබඳව මේ ගරු කොමිෂන් සභාවේ සාක්ෂි දුන්නා?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: මා කැමතියි අද ඔබෙන් එක පුද්ගලයෙක් ගැන දැන ගන්න?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඔබට කියන්න පුළුවන්ද කවුද අබුහින්ද් කියන්නේ කියලා ඔබේ විමර්ශන අනුව ඔබේ තොරතුරු හොයා ගැනීමේ දී අබුහින්ද් කියන නාමයෙන් අනාවරණය වෙලා තියෙන්නේ කවුද?

පි: ගරු ස්වාමිනි විමර්ශනවලදී අනාවරණය වෙන්නේ මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් කියන ෂැංග්‍රිලා හෝටලයේ ස්වයං ඝාතක සහ දෙහිවල ට්‍රොපිකල් ඉන් හෝටලයේ ස්වයං ඝාතක අබ්දුල් ලතීෆ් මොහොමඩ් ජමීල් ඒ වගේම 2019.04.26 දින සයින්දමරුදු නිවසේ පුපුරවා ගන්නා ලද මොහොමඩ් කාසීම් මොහොමඩ් රිල්වාන් මෙන්න මේ තිදෙනාම සබඳතා පවත්වන විදේශීය පුද්ගලයෙක් තමයි අබුහින්ද් කියන අනුවර්ථ නාමයෙන් පෙනී සිටියා කියන එක අනාවරණය වෙලා තියෙන්නේ.

ප්‍ර: ඔහු කුමන රටක ද ඉන්නේ?

පි: ගරු ස්වාමිනි සහරාන් කියන පුද්ගලයා 2016/2017 ඉඳන්ම උත්සාහ කරනවා විදේශ ගත වෙන්න. සිරියාවට ඉරාකයට යන්න. ඒ සඳහා එයා යම් යම් උත්සාහයන් ගන්නකොට අබ්දුල් ලතීෆ් මොහොමඩ් ජමීල් කියන පුද්ගලයාට සම්බන්ධකම් කිහිපයක් තියෙනවා සිරියාවට ලංකාවෙන් ගමන් කරන ලද පුද්ගලයෝ සමඟ. ඒ ඔස්සේ උත්සාහයක් දරනවා. නමුත් සිරියාවට 2014/15 වර්ෂවලදී ගමන් කරන ලද පුද්ගලයෝ යම් ආර්ථික මට්ටමක් තියෙන, යම් උසස් අධ්‍යාපන මට්ටමක් තියෙන පුද්ගලයෝ හැබැයි මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් කියන පුද්ගලයා ආර්ථික මට්ටමින් පහළයි සහ අධ්‍යාපන මට්ටමින් පහළයි. ඒ නිසා ඒ දෙගොල්ලෝ අතරේ සම්බන්ධීකරණයක් ඒ කියන්නේ සිරියාවේ ඉන්න පුද්ගලයෝ සහරාන් කියන පුද්ගලයාව සම්බන්ධ කර ගන්න උත්සාහ, කැමති වෙන්නේ නැහැ. ඒ තුළ සහරාන් වෙනත් විදේශිකයොන්ගේ ආධාර පතනවා සිරියාවට යන්න. ඔන්න ඔය තත්ත්වය තුල සහරාන්ට Telegram කියන Social Media හරහා අබුහින්ද් කියන පුද්ගලයෙක් සම්බන්ධ වුණා කියලා තමයි විමර්ශනවලදී

FAIR COMMENT — BY JEZEEM —

අනාවරණය වෙන්නේ ගරු ස්වාමිනි. ඒ පුද්ගලයා ඉන්දියානු ජාතිකයෙක් කියලා තමයි අනාවරණය වෙන්නේ. ඒකට උදාහරණ දැනට අත්අඩංගුවේ වෙසෙන පුද්ගලයන් අතරින් රිස්කාන් කියන පුද්ගලයා ප්‍රහාර වෙන දින දක්වාම සහරාන් සමඟ හිටිය පුද්ගලයෙක්. දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉන්නවා ගරු ස්වාමිනි. ඒ පුද්ගලයා කියනවා සම්බන්ධතා තිබුණා කියලා. ඒ වගේම ප්‍රහාරයෙන් පසු ප්‍රහාරයට දින කිහිපයකට ප්‍රථම විදේශ ගත වුණු නැත්නම් සෞදි අරාබියට ගියපු හයාතු මොහොමඩ් මිල්හාන් කියන පුද්ගලයාත් මේ අබුහින්ද් කියන පුද්ගලයාත් එක්ක දුරකථනයෙන් අවස්ථා කිහිපයක දී Telegram කියන සන්නිවේදන හරහා සබඳතා පැවැත්වුවා කියන එක එයාගේ විමර්ශනවලදී එයාගෙත් අනාවරණය වෙනවා. ඒ මිල්හාන් කියන පුද්ගලයාත් අද වෙනකොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ පසු වෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔය අබුහින්ද් කියන කෙනා ඔය හැමෝටම සම්බන්ධකම් තියෙන බවටයි අනාවරණය වෙලා තියෙන්නේ ඔබ කියන විදිහට?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඔබ කිව්වානේ සහරාන් අවස්ථා කිහිපයක දී විදේශගත වන්නට සිරියාවට යන්නට උත්සාහ කෙරුවායි කියල?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: යම් අවස්ථාවකදී ඔබලාට අනාවරණය වුණාද ඔහු එක්කෝ නීත්‍යානුකූල විදිහට නැත්නම් නීති විරෝධී විදිහට ලංකාවෙන් පිටවෙලා ගිහිල්ලා තිබුණාය කියලා?

පි: ගරු ස්වාමිනි අපි භූමියේ කරන ලද බුද්ධි මෙහෙයුම්වලදී කිසිදු අවස්ථාවක සහරාන් මෙරටින් විදේශ ගතවුණා කියන එක සම්බන්ධයෙන් තොරතුරු වාර්තා වෙලා තිබුණේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ කිව්වා ඊයේ දින මේ ගරු කොමිෂන් සභාවට තොරතුරු රැස් කරන කොට සංවෘත වගේම විවෘත ආකාරයටත් ඔබලා මූලාශ්‍රවලින් තොරතුරු රැස් කරනවාය කියලා ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට විවෘත තොරතුරුවලට අයත් වෙනවා නේද මුහුණු පොත?

පි: facebook අයත් වෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර: ඔබලාගේ රාජකාරිවලදී ඔබලා අනිත් අයගේ මුහුණු පොත්වලටත් යනවානේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබගේ අවධානය යොමු වුණාද ඉන්දියාවේ සහරාන් හෂීම්ගේ මුහුණු පොතේ පණිවිඩ උඩුගත කරලා තිබුණායි කියලා ඒ කියන්නේ දේශනයක් මට මතක විදිහට?

FAIR COMMENT BY JEZEEM

පි: ගරු ස්වාමිනි මගේ මතකයේ හැටියට සහරාන් විසින් මුල් කාලීනව facebook කියන තාක්ෂණය ඔස්සේ තමයි එයාගේ සන්නිවේදනයන් කළේ එයාගේ අනුගාමිකයෝ අතර. 2018 වර්ෂයේ ඉඳලා පමණ ඔහු සන්නිවේදනයන් කළේ Telegram කියන තාක්ෂණය ඔස්සේ. ගරු ස්වාමිනි මගේ මතකයේ හැටියට 2019 වර්ෂයේ මුල් කාලයේ දී අපිට වෙනත් විදේශ රටකින් වාර්තා වෙනවා එයා යනුවෙන් අදහස් කෙරුවේ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් ගරු ස්වාමිනි. මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන්ගේ facebook account 2ක් ඉන්දියාවේ බැංගලෝර්වල Operate වෙනවා කියන එක අනාවරණය වෙනවා ගරු ස්වාමිනි. ඒ සම්බන්ධයෙන් අපි ඉන්දියාවෙන් විමසීමක් කරනවා ගරු ස්වාමිනි 2019 මගේ මතකයේ හැටියට 2වැනි මාසේ හෝ 1 වෙනි මාසේ. ඒ විමසීමට අපිට සාධාරණ පිළිතුරක් වාර්තා වෙලා තිබුණේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: නමුත් ඔබ කියන්නේ ඔබලා ඒ කරුණ දැනගෙන හිටියා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: සහ ඒ සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වුවා කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ වගේම 2018 වසරේ දී ඔබේ අවධානයට යොමු වුණේ නැද්ද සහරාන් හෂීම් සිරියාවට ගිහිල්ලා තියෙනවා කියලා?

පි: සහරාන් හෂීම් භූමියේ අපි සිදු කරන ලද බුද්ධි මෙහෙයුම්වලදී කවදාවත් 2009 පස්සේ විදේශ ගතවෙලා නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ නීත්‍යානුකූල ආකාරයටනේ. නීත්‍යානුකූල ආකාරයට පිට වෙනවානම් බණ්ඩාර මහත්මයා ඕනෑම කෙනෙක්ට සොයා ගන්න පුළුවන්නේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: නමුත් බුද්ධි අංශ ඉන්නේ ඊට එහා ගිහිල්ලා ඔවුන් වෙන වෙන විවිධ ක්‍රමයන් පාවිච්චි කරලා ඒ උපක්‍රම මඟින් නියමිත ගුවන් යානා තොටුපළවල් නැතිව, නියමිත වරායවල් නැතිව දිවයිනෙන් බැහැර වෙනවද යන්න කරුණක් සොයා ගන්න පුළුවන්ද තැනකනේ නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට මම අහන්නේ එහෙම භූමියෙන් තොරතුරු ඔබට ලැබුණේ නැද්ද ඒ ගැන?

පි: ගරු ස්වාමිනි අපි 2017.03.10 සහරාන් කියන පුද්ගලයා කාත්තන්කුඩි අලියාර් හන්දියේ සිද්ධියෙන් පසු පළා යෑමෙන් පසු අවස්ථා කිහිපයක දී නිරීක්ෂණය වෙනවා එයාගේ බිරිඳ පදිංචි වෙලා හිටපු කැකුණුගොල්ල නිවසට ඇවිල්ලා දවසක් වගේ පොඩි කාලයක් ඉඳලා යනවා. ඒ වගේ තැනින් තැන එයා ඒ නිවසට ගමන් කරනවා. ඒවගේම මාවනැල්ල ප්‍රදේශයේ සංචාරය කරනවා. ඒ වගේ තොරතුරු තිබුණා. නමුත් එයා

FAIR COMMENT — BY JEZEEM —

විදේශගත වීමක් සම්බන්ධයෙන් අපිට බුද්ධි තොරතුරක් වාර්තා වෙලා තිබුණේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට දැන් සමහර විට ඔබ කිව්වානේ ඔබ ඔය වැඩ කරන අංශය අනුව භූමියෙන් ලැබෙන තොරතුරුත් ඔබට එනවා. එතකොට පිටින් කවුරුහරි බුද්ධි අංශයකින් තොරතුරක් සැපයුවනම් ඒකත් ඔබට එනවානේ?

පි: එනවා ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට 2009 ඉඳලානේ ඔබ ඔය කාර්ය කරන්නේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබට කොයිම අවස්ථාවක දී වත් ඔබේ අවධානය යොමු වුණාද යොමු කරමින් ලිඛිතව යම් ලේඛනයක් ලැබුණද සහරාන් සිරියාවේ පදිංචි වෙලා තියෙනවා කියලා නීතිවිරෝධී ආකාරයට රටෙන් පිටවෙලා 2018 වසරේ දී පෙබරවාරි වල?

පි: මගේ මතකයේ හැටියට ගරු ස්වාමිනි තවත් බුද්ධි අංශයකින් ලද තොරතුරක් තිබුණා. ඒ තොරතුරේ සඳහන් වුණේ මට මගේ මතකයේ විදිහට ඒ තොරතුර වාර්තා වෙන්නේ 2019 මාර්තු මාසේ වගේ ගරු ස්වාමිනි. ඒකේ දී සඳහන් වෙලා තිබුණා සහරාන් විදේශ ගතවෙලා නැවත ලංකාවට පැමිණියා කියලා. නමුත් අපට භූමියේ තොරතුරු ඒවගේ තොරතුරක් ලැබිලා තිබුණේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: මා කියන්නේ නම් ඒ බුද්ධි තොරතුර ගැන නෙවෙයි. ස්වාමිනි X – 162 ලේඛනය සාක්ෂිකරුගේ අවධානයට යොමු කිරීමට අවසර පතනවා. මේ ලේඛනය අමතලා තියෙන්නේ රාජ්‍ය බුද්ධි සේවය අධ්‍යක්ෂට. ඒ කියන්නේ ඔබේ ආයතනයනේ ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: 2018 දෙසැම්බර් 18 වෙනිදා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඔබ සේවයේ හිටියානේ?

පි: හිටියා ස්වාමිනි.

ප්‍ර: ඔය අංශයේම?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එහෙනම් ඕක කියවලා බලලා මේ ගරු කොමිෂන් සභාවට කියන්න ඔබට ඔය ලේඛනය දකින්නට ලැබුණද කියලා?

පි: ලැබුණා ස්වාමිනි.

ප්‍ර: එතකොට ඕක ගැන මතක නැති වුණාද මං අහනකොට කියන්න?

පි: ඔව් ගරු ස්වාමිනි මම 2019යේ document එක තමයි මට මතකෙට ආවේ එකපාරටම. මේ document එකත් මතකයි ස්වාමිනි.

ප්‍ර: හරි. එතකොට ඕකේ එක ඡේදයක තියෙනවා නේද සහරාන් 2018 පෙබරවාරි මාසේ නීතිවිරෝධී ආකාරයට මුහුදු මාර්ගයෙන් ලංකාවෙන්

FAIR COMMENT BY JEZEEM

පිට වෙලා සිරියාවේ පදිංචිව ඉඳමින් ISIS සාමාජිකයින් සමඟ සබඳතා පවත්වන බවට අනාවරණය වුණා කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ බුද්ධි අංශවලට?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ වගේම ඒගොල්ලන් වාර්තා කරලා තියෙනවා ඔබේ අධ්‍යක්ෂවරයාට 2018 සැප්තැම්බර් මස සිරියාවේ ඉඳලා ඔහු නැවත ලංකාවට පැමිණිලා මඩකලපුව, කල්මුණේ ප්‍රදේශවල දින කිහිපයක් ඉඳලා නැවතත් ඔහුගේ අනුගාමිකයන් සමඟ සාකච්ඡා පැවැත්වුවාට පස්සේ සිරියාවට ගිහිල්ලා තියෙන බවට තොරතුරු අනාවරණය වෙලා තියෙනවා කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඔබට මේ ලිපිය ලැබුණානම් මේ කරුණු අනාවරණය වුණානම් මොකක්ද ගත්ත පියවර?

පි: ගරු ස්වාමිනි මේ වගේ තොරතුරු කිහිපයක් අපිට භූමියෙන් සහ ලැබිලා තිබුණා. නමුත් අපි විසින් සිදු කරන ලද බුද්ධි මෙහෙයුම්වලදී සහරාන් භූමියේ රැඳී සිටිමින්, ශ්‍රී ලංකා භූමියේ රැඳී සිටින බවට තොරතුරු තිබුණා ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට අල්ල ගන්න බැරි වුණේ මොකද?

පි: ඔහු රැඳී සිටින ස්ථානයන්, ඔහු ගමන් කරන ස්ථානයන් සම්බන්ධයෙන් දිගින් දිගටම ගරු ස්වාමිනි වාර්තා කරලා තියෙනවා. උදාහරණයක් විදිහට කියන්න කැමතියි ගරු ස්වාමිනි 2018.12.23 සහ 25 දින මාවනැල්ලේ ආගමික ප්‍රතිමාවලට හානි කිරීම ගත්තාම ගරු ස්වාමිනි ඒ සිද්ධියට රාජ්‍ය බුද්ධි සේවාවෙන් වාර්තාවක් යවනවා 2019/12 වෙනි මාසේ 29 වෙනිදා. ඊට පස්සේ ආපහු වාර්තාවක් යවනවා 2018.12.30 වෙනිදා. ඒ වාර්තාවේ සඳහන් කරනවා සහරාන් තමයි මේ බුදු පිළිම හානිය පිටුපස සිටින්නේ කියලා. ඒ වගේම අපි ඒ සම්බන්ධව රැස් කරන බුද්ධි තොරතුරුවලදී වාර්තා වෙනවා සහරාන් ඒ වෙන කොටත් මාවනැල්ලේ හිටියා කියලා. ඒ වගේම වනාතවිල්ලුව 2019.01.16 පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම වන විට වනාතවිල්ලුව ලැක්ටෝස් වත්ත කියන ඉඩමෙත් සහරාන් රැඳී සිටියා කියන එක භූමියේ බුද්ධි තොරතුරු අපිට වාර්තා වෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර: ඔව් දැන් ඔබ මට දීර්ඝ උත්තරයක් දුන්නාට මම අහපු ප්‍රශ්නෙට උත්තර දුන්නේ නැහැනේ බණ්ඩාර මහත්මයා. මම ඇහුවේ බොහොම සරල ප්‍රශ්නයක්නේ. මම ඇහුවේ මේ ලිපිය ඔබට ලැබුණානම් මේ ලිපිය සම්බන්ධයෙන් මොකක්ද කළේ කියලා?

පි: ගරු ස්වාමිනි මේකට මේ වාර්තාවට යවපු වාර්තාව මගේ ළඟ මේ වෙලාවේ නැහැ ස්වාමිනි. නමුත් මගේ මතකයේ විදිහට මේකට පිටසන් වාර්තාවක් ආපස්සට අපි යවලා ඇති අධ්‍යක්ෂතුමා වෙත. අපිට භූමියේ

FAIR COMMENT — BY JEZEEM —

තොරතුරු තිබුණා සහරාන් මේ භූමියේ ඉන්නවා කියලා. ඒ හින්දා අපි මේ තොරතුර පස්සේ ගොඩක් වෙලාවට හඹාගෙන ගියේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: අන්තිම ටික නැවත කියන්න

පි: අපිට භූමියේ තිබුණා සහරාන් මේ භූමියේමයි ඉන්නේ කියලා. මොකද අපි රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා විසින් අවස්ථා කිහිපයක දී කතා කරලා මගේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා, සහකාර අධ්‍යක්ෂතුමා සමඟ කතා කරලා කියලා තියෙනවා සහරාන් විදේශ ගත වෙලා කියලා ගොඩක් ආයතනවලින් වාර්තා කරනවා. මොකක්ද ඔබලාට තියෙන තොරතුරු කියලා ඒ අවස්ථාවල දී අපිට භූමියෙන් ලැබුණු තොරතුරුවල තිබුණේ සහරාන් මේ භූමියේම සිටිනවා කියලා. ඒ නිසා අපි අධ්‍යක්ෂතුමාට වාර්තා කරලා තියෙනවා. සහරාන් මේ භූමියේ ඉන්නවා කියලා අපිට තොරතුරු තියෙනවා කියලා.

ප්‍ර: ඔබට තොරතුරු තිබෙනවා කියලා ඔබ වාර්තා කරාට ඔබට 2019 අප්‍රේල් 21 වෙනිදා මේ පිපිරීම් සිදු කරන තුරු සහරාන්ව අත්අඩංගුවට ගන්නට හෝ ඔහු පිළිබඳව ඉන්න ස්ථානයට නියමිත ආකාරයට පොලිසියක් හෝ විමර්ශකයින් මෙහෙයව ගන්න බැරි වුණානේ නේද?

පි: ගරු ස්වාමිනි අපි මගේ ළඟ වාර්තා කිහිපයක් තිබෙනවා ගරු ස්වාමිනි. දිගින් දිගටම අපි වාර්තා කරනවා. වාර්තා 11ක් ගරු ස්වාමිනි 2018

ප්‍ර: ඔබ වරින් වර වාර්තා කරපු බව ඇත්ත බණ්ඩාර මහත්මයා. මං අහන්නේ ඒක නෙවෙයි. ඔතන මොකක් හරි ඔය ක්‍රමයේ බිඳ වැටීමක් තියෙනවනේ. මොකද ඔබලා සාර්ථක නම් ඇත්තටම ඔය 21 වෙනිදා සිද්ධිය සිද්ධ වෙන්නේ නැහැනේ නේද?

පි: ගරු ස්වාමිනි සාර්ථක නම් කියලා අදහස් කරන්නේ අපි ළඟ බුද්ධි තොරතුරු තිබුණා. නමුත් අපි ආයතනය විසින් රාජ්‍ය බුද්ධි සේවාව විසින් අත්අඩංගුවට ගැනීම් සිදු කරේ නැහැ. ඒවගේම තොරතුරු දෙවන පාර්ශවයකට දීලා තමයි බලන් ඉන්නේ action ගන්නකම් ගරු ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබලාට වැටහිලා තිබුණද සහරාන් විසින් පතුරවනු ලබන මේ මතවාදය රටේ ජාතික ආරක්ෂාවට හිතකර නැහැ කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඔබ පෞද්ගලිකව අවස්ථා බොහොමයකදී ඒ පිළිබඳව වාර්තා කරානේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබේ අධ්‍යක්ෂවරයා ඒ පිළිබඳව යම් යම් අවස්ථාවන්වලදී පොලිස්පතිවරයාට වාර්තා කරලා තිබුණා. ඒවගේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඒ පිළිබඳව දැනුම් දීලා තිබුණානේ. හරි දැන් ඔය අන්තිමට ඒකේ ප්‍රතිඵලයක් වුණේ නැහැනේ?

පි: ඔව් ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: යම් යම් අවස්ථාවලදී ඔහු ඉන්න තැනින් හරි ඒ පිළිබඳව කිව්වොත් හරි යමක් වෙලා තිබුණේ නැහැ. ප්‍රායෝගිකව එය ක්‍රියාත්මක වෙලා තිබුණේ නැහැ. ඒවගේ වෙලාවක මොහුගේ හැසිරීමේ පසුබිම දන්න, එහි භයංකරත්වය පිළිබඳව භූමියෙන් ඔබට ලැබුණු තොරතුරු තියෙන ඔබලාට පුළුවන්ද එතනින් විතරක් නවතින්න. මොකද ඔබලා ගන්න මේ වෑයමේ යම් ප්‍රතිඵලයක් තියෙන්නට ඕනිනේ?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ ප්‍රතිඵලය ධනාත්මක මිසක් සෘණාත්මක වෙන්න බැහැ නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඇත්තටම අවංකව කතා කරනවානම් බණ්ඩාර මහත්මයා ඔබ දිවා රෑ මහන්සි වෙලා ගත්ත ඒ වෑයම්වල ධනාත්මක ප්‍රතිඵලයක් තිබ්බද? ඔබට පුළුවන් වුණාද ඔය රෑස් කර ගත්ත තොරතුරු ඔබේ ජ්‍යෙෂ්ඨයින්ට ලබාදීලා මේ 21 වෙනිදා වෙන ප්‍රහාරය වළක්වා ගන්න බැරි වුණානේ. අපි ඇත්ත කතා කරමුකෝ නේද?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: එතකොට එහෙනම් කොහේද ඔතන ප්‍රශ්නේ ඇති වෙලා තියෙන්නේ? ඔබගේ ආයතනයට පුළුවන්ද අපිට තියෙන්නේ තොරතුරු සැපයීම පමණයි කියන එක නවත්වලා එතැනින් නැවතිලා ඉදිරියට යන්නේ නැතුව ඉන්න ඔබලා දන්නවානම් එහි තිබෙන භයංකරත්වය? මට ඒක පොඩ්ඩක් කියන්න.

පි: ගරු ස්වාමිනි මම පොඩි විස්තරයක් කරන්න කැමැතියි මේකට. ගරු ස්වාමිනි 2014.06.29 IS සංවිධානයේ ඉස්ලාම් රාජ්‍යයක් ප්‍රකාශයට පත් කරනවා මම ඊයේ දිනෙත් සඳහන් කරා ගරු ස්වාමිනි. එතකොට ඒ ඉස්ලාම් රාජ්‍යය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව ලංකාවේ පුද්ගලයෝ වගේම විදේශිය පුද්ගලයොත් සිරියාවට යනවා. ඒවගේම 2017 අගෝස්තු මාසේ වෙනකොට සිරියාවේ සහ ඉරාකයේ ඉලක්ක වෙත ඇමරිකානු සහ ඒකාබද්ධ හමුදාවන් ප්‍රහාර එල්ල කිරීමෙන් අනතුරුව මෙම සංවිධානයේ යම් බිඳ වැටීමක් වෙනවා. මේ තුල IS නායකත්වය විසින් නියෝග කරනවා ඉස්ලාම් රාජ්‍යයට හිතැති පුද්ගලයන්ට තමන් ඉන්න රටේ ඉඳන් ප්‍රහාර එල්ල කරන්න කියලා. ඒ අනුව ගරු ස්වාමිනි එම අවස්ථාවේ සිට අපි විදේශයන්වල ප්‍රහාර, ඒ ප්‍රහාරවලට වෙන ආකාරයන් ඒවගේම ඒ සම්බන්ධයෙන් වාර්තා විශාල ප්‍රමාණයක් යවලා තියෙනවා. ඒ වගේම ආරක්ෂක කවුන්සිලය සහ අධ්‍යක්ෂතුමා විසින් සහභාගී වෙන අනිකුත් සාකච්ඡා ඒ කියන්නේ පොලිස්පතිතුමා, ජාතික බුද්ධි ප්‍රධානිතුමා, ආරක්ෂක ලේකම්තුමා ඇතුළු සාකච්ඡාවලට මගේ අංශයෙන් තොරතුරු සැපයීම තමයි මගේ කාර්ය භාරය වුණේ. එතකොට මේ සම්බන්ධ වෙන භූමියේ තියෙන තොරතුරු රෑස් කරලා, ඒ සම්බන්ධයෙන් බහු මාධ්‍යය ඉදිරිපත් කිරීම් සකස් කරලා දෙනවා. ඒ

FAIR COMMENT — BY JEZEEM

වගේම තියෙන තොරතුරු සම්බන්ධයෙන් වාර්තා කිරීමක් කරනවා ගරු ස්වාමිනි. ඒවගේම ගරු ස්වාමිනි 2018 මම මුලින්ම සඳහන් කරා 12.23 සහ 25 දින වල මාවනැල්ල ආගමික ප්‍රතිමා හානියේ දී එක පුද්ගලයෙක් ප්‍රදේශවාසීන් අල්ලාගෙන පොලිසියට භාර දෙනවා. ඔහු සම්බන්ධ විමර්ශනවලින් පස්සේ අපිත් භූමියට සම්බන්ධ වෙලා තොරතුරු රැස් කරලා පුද්ගලයෝ විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගන්නවා. එතනදීත් අපි ප්‍රකාශ කරනවා මේක සහරාන් මේක පිටිපස්සේ ඉන්නේ කියලා ගරු ස්වාමිනි. ඒවගේම ගරු ස්වාමිනි මේ විමර්ශනයේ දී විමර්ශනය සම්පූර්ණම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කේන්ද්‍ර කරගෙන විමර්ශනය සිදු වන්නේ. ඒ අනුව අපිට භූමියෙන් වාර්තා වෙන තොරතුරු එතැන් සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත අපි විසින් වාර්තා කරලා තියෙනවා ගරු ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: යම් කිසි අවස්ථාවක රාජ්‍ය බුද්ධි සේවය දැනුවත් කිරීමක් සිදු වෙනවද සහරාන් සම්බන්ධයෙන් සියලු පරීක්ෂණ එක් විමර්ශන ආයතනයක් විසින් සිදු කරනවා කියලා?

පි: මට ගරු ස්වාමිනි ඒ සම්බන්ධයෙන් නිශ්චිත උත්තරයක් දෙන්න අමාරුයි ගරු ස්වාමිනි. ඒ සම්බන්ධයෙන් ඉහළින් නියෝගයක් මට එහෙම තිබුණෙත් නැහැ ස්වාමිනි. භූමියේ රැස් කරන තොරතුරු මා විසින් අධ්‍යක්ෂතුමාට වාර්තා කරනවා මගේ සහකාර අධ්‍යක්ෂතුමා, නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා හරහා එතුමන් ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සමහර තොරතුරු යවලා ඒකේ පිටපත්, අපිට ආපස්සට ලැබිලා තියෙනවා ගරු ස්වාමිනි. ඒවගේම පොලිස්පතිතුමා වෙතත් ඒවගේම වාර්තා යවලා ඒකේ සමහර වෙලාවට පිටපත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යවලා තියෙනවා. ඒවගේ තමයි අපිට පිටපත් ආපස්සට ලැබිලා තියෙන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර: අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව රාජ්‍ය බුද්ධි සේවයෙන් යම් තොරතුරු ලබා ගන්නවානම් කවුරු හරහාද එන්න ඕනි?

පි: අපරාධ පරීක්ෂණ ස්වාමිනි ප්‍රශ්නය පොඩ්ඩක්..

ප්‍ර: අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහරාන් හෂිම් සම්බන්ධයෙන් තොරතුරු ඕනිනම් ඔහු කොතන ද ඉන්නේ කියන එක ආදී කරුණු දැන ගන්න ඕන්නම් එය ලබා ගන්නා ක්‍රමවේදය මොකක්ද රාජ්‍ය බුද්ධි සේවයෙන්?

පි: ගරු ස්වාමිනි රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂතුමා හරහා තමයි තොරතුරු ලබා ගැනීම සිදු වන්නේ. ආගමික ප්‍රතිමා හානියෙන් පස්සේ භූමියේ තිබුණු තොරතුරු ඒ වෙලාවේ අපේ නිලධාරීන් විසින් ඒ අවස්ථාවේ

FAIR COMMENT BY JEZEEM

විමර්ශන කරන පොලිසියට ඒවා ලබා දුන්නා. ඒවගේම මා දැනුවත් හැටියට ගරු ස්වාමිනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වනාතවිල්ලුවේ පුද්ගලයෝ 4 දෙනෙක් අත්අඩංගුවට ගන්නවා. ඒකෙන් දෙදෙනෙක් මා සහ මාගේ සහකාර අධ්‍යක්ෂතුමා විසින් සම්මුඛ සාකච්ඡාවට ලක් කරනවා. එතන දී ඔවුන් ප්‍රකාශ කරනවා. පුහුණු කඳවුරු වගයක් පැවැත්වුවා. ඒවගේම ඒ පුහුණු කඳවුරුවල සින්න මවුලවි කියලා කෙනෙක් දේශන කරා කියලා. ඒ සම්බන්ධයෙන් තොරතුරු අපි නැවත වාර්තා කරනවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට. ඒවෙනකොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් අපිට වඩා තොරතුරු යමක් එයාලා ගාවට වාර්තා වෙනවා. ඒවගේම සහරාන් සහ ඔහුගේ සහෝදරයා ඒ වගේම ආමි මොහිදින් කියන පුද්ගලයාට වරෙන්තු තියෙනවා කියලා අපිට වාර්තා වෙලා තිබුණා මුල සිටම 2017.03.10 සිටම. ඒ අනුව ෂයිනි සහ ආමි මොහිදින් කියන පුද්ගලයෝ සම්බන්ධයෙන් අම්පාරේ අපේ සහකාර අධ්‍යක්ෂතුමා විසින් මගේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාගේ දැනුම් දීම මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ඒ ස්ථාන පෙන්නුවා කියලා වාර්තා කරලා තිබුණා ගරු ස්වාමිනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ස්වාමිනි සාක්ෂිකරුට ඡායාරූපයක් පෙන්වීමට බලාපොරොත්තු වෙනවා. ඔහු වනාතවිල්ලුව ගැන කිව්වා නිසා.

ප්‍ර: ඔය වනාතවිල්ලුවේ සිද්ධිය පුපුරණ ද්‍රව්‍ය සොයා ගත්තට පස්සේ ඔබ සහ ඔබේ සහකාර අධ්‍යක්ෂවරයා ඒ ස්ථානයට ගියා නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.

ස්වාමිනි සාක්ෂිකරුගේ අවධානයට JM -1 වශයෙන් ලකුණු කොට ඇති ලේඛනය පෙන්වීමට අවසර ඉල්ලා සිටිනවා ස්වාමිනි.

ප්‍ර: මේ ඡායාරූපයේ ඔබ ඉන්නවද?

පි: බොහෝ දුරට මේ ඡායාරූපයේ මා මේ ස්ථානයේ හිටියා. ඒකේ Color print out එක තිබුණානම්

ප්‍ර: ඔතන ඉන්නවද ඔබේ සේවාවේ රියදුරු වෘත්තිය කරන නිලධාරියෙක්?

පි: මෙම ස්ථානයට මගේ ආයතනයේ රියදුරු වෘත්තිය කරන නිලධාරියෙක් ගියා. ඒ වගේම රියදුරාත් අපේ ආයතනයේ වාහනයකින් තමයි මම සහ තවත් නිලධාරීන් කිහිප දෙනෙක් යන්නේ මගේ සහකාර අධ්‍යක්ෂතුමාත් එක්ක. මෙතන photo එකේ ඔහුගේ ඡායාරූපය හඳුනා ගන්න අපහසුයි.

ප්‍ර: ඔබට අපහසුයි නමුත් ඔහුව හොඳින් දන්න වෙනත් ඔබේ සේවාවේ කෙනෙක් ඔහුව හඳුනා ගත්තා. ඒකයි මම ඇහුවේ. කමක් නැහැ ඔය ඡායාරූපයේ ඔබ හිතන්නේ මෙතන ඉන්නේ ඔබ කියලා?

FAIR COMMENT — BY JEZEEM —

පි: මට මේකේ clear ඡායාරූපයක් තිබ්බොත් මම කියලා, මම ඒ ස්ථානයට ගියපු නිසා මට ප්‍රකාශ කරන්න පුළුවන් ගරු ස්වාමිනි.

ප්‍ර: මේ ගත්ත ඡායාරූපය පෙන්වලා තමයි මේ දෙදෙනා ඝාතනය කළ යුතු අය බවට NTJ එකෙන් හඳුනාගෙන තියෙන්නේ ඒ අනුව තමයි තස්ලීම්ට වෙඩි තියන්නේ?

පි: වෙඩි තියන්නේ.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නවා ඒ ඡායාරූපයේ මැද ඉන්න නිල්පාට කමිසයක් ඇඳ ඉන්න තැනැත්තා බොහෝ විට ඔහු විය හැකි බවට.

ප්‍ර: මම ඔබේ මතකය නැවත 2017 වසරට අපි එමු මාවනැල්ලේ එකට 2017 වසරට ගෙන ගියොත් ඔබ ඊයේ දින මේ ගරු කොමිෂන් සභාවට ලකුණු කරලා ඉදිරිපත් කරා පොලිස්පතිතුමා වෙත ඔබේ අධ්‍යක්ෂවරයා ඔබලා විසින් රැස් කරන ලද අර නම් 94ක තොරතුරු යවපු අවස්ථාව පිළිබඳව?

ප්‍ර: ඔව් ගරු ස්වාමිනි.

පි: ඒ වගේම මම කැමතියි ඔබේ අවධානයට 2017 දෙසැම්බර් මාසේ 5 වෙනිදා නැවතත් රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා පොලිස්පතිවරයා වෙත යවා ඇති මෙන්න මේ වාර්තාව යොමු කරන්නට?

ප්‍ර: ඔව් ගරු ස්වාමිනි.

පි: එම වාර්තාව මඟින් කුමන කරුණු ද ඔබේ සේවාව පොලිස්පතිවරයාගේ අවධානයට යොමු කරලා තියෙන්නේ? ලිපියේ දිනය කවද්ද බණ්ඩාර මහත්මයා?

ප්‍ර: 2017.12.05 වන දින ගරු ස්වාමිනි. මේකේ දී ගරු ස්වාමිනි අපි විසින් වාර්තා කරනවා සෆ්රාන් කියලා පුද්ගලයෙක් සම්බන්ධයෙන්. සහරාන් කියන පුද්ගලයාට අමතරව. මේ සෆ්රාන් කියන පුද්ගලයා ගාල්ල ප්‍රදේශයේ පුද්ගලයෙක්. එතකොට මේ සෆ්රාන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් අපි අවස්ථා කිහිපයක දී වාර්තා යොමු කරලා තියෙනවා. ඒවගේම මේ සහරාන් කියන පුද්ගලයා 2016 ඉඳන් යොමු කරන වීඩියෝ පට හරහා ඔහු විසින් කියන්නේ මොකක් ද කියන කාරණය සම්බන්ධයෙන් මෙතන ඉස්මතු කරලා තියෙනවා ගරු ස්වාමිනි. මේ සෆ්රාන් කියන පුද්ගලයාගේ විශේෂත්වයකුත් මෙතන තියෙනවා ගරු ස්වාමිනි. ඔහු ගාල්ලේ පුද්ගලයෙක්. පසුව සහරාන් සමඟ සහරාන් එක්ක ඉන්නවා. 2016 දී සහරාන් විසින් කාත්තන්කුඩි පල්ලියේ තෝරා ගත්ත පිරිසකට පවත්වනවා IS එක සම්බන්ධයෙන් දේශන. ඒකටත් ඔහු සහභාගී වෙනවා. ඒවගේම 2017.03.10 කාත්තන්කුඩි අලියාර් හන්දියේ සිදුවීමේ දී ඔහු බන්ධනාගාරගත වෙනවා. ඔහු බන්ධනාගාරගත වෙලා ඉන්නකොට ඔහු එහි දී අවස්ථා ගණනාවක දී විවිධ ප්‍රකාශ කරනවා.

ප්‍ර: ඔහු ඇප ලබා ගන්නට උත්සාහ කරනවා. නමුත් ඔහුට ඇප ලැබෙන්නේ නැහැ නේද?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව් ගරු ස්වාමිනි. එතකොට ඔහු බන්ධනාගාරගත වෙලා සිටිය දී ඔහු බලන්න ඔහුගේ මව බන්ධනාගාරයට යනවා. එහිදී ඔහු ප්‍රකාශ කරනවා මේ රටේ නීතිය වැඩක් නැහැ ඉස්ලාම් රාජ්‍යයක නීතිය තමයි අවශ්‍ය. එහෙම වුණානම් අපිට සිරගත වෙන්න වෙන්නේ නැහැ කියන එක. ඒවගේ කාරණා කිහිපයක් තුල තමයි මේ වාර්තාවේ අපි ඉස්මතු කරන්නේ මේ හා සබැඳි වාර්තා විශාල ප්‍රමාණයක් යොමු කරන නිසා ඒකේ අවසන් වාර්තාවේ අපි සඳහන් කරනවා ඒ වාර්තාවලත් යොමු අංක ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔය වාර්තාවේ ඔබලා සඳහන් කරනවද සහරාන් හෂිම් කුමන කරුණුද ඔහුගේ දේශනවල ඉස්මතු කරලා තියෙන්නේ කියලා?

පි: කාරණා කිහිපයක් මතු කරනවා ගරු ස්වාමිනි.

ප්‍ර: මොනවද ඒ?

පි: ඒකේ එකඑක් තියෙනවා ගරු ස්වාමිනි ඥානසාර හාමුදුරුවෝ සම්බන්ධ සිදුවීමක්. ඒවගේම ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානයේ එවකට හිටපු මහා ලේකම් අබ්දුල් රාසික් අත්අඩංගුවට ගැනීම සම්බන්ධව. ඒවගේම අන්‍යාගමිකයන්ගේ කැමැත්ත සහ ජිහාදය කියලා. එතන දී ඒ වාර්තාවේ අපි සඳහන් කරලා තියෙනවා ගරු ස්වාමිනි ඒ කියන්නේ අන්‍යාගමිකයෝ කියන එක නෙවෙයි ජිහාදය කියලා තියෙන කාරණාව මොකක්ද කියන එක. ඒ වගේම තවුහිද් වෙනුවෙන් සිරගතවූ සහෝදරයින් කියලා කාරණයක් මතු කරනවා. ඒ කියන්නේ 2017.03.10 වන දින අලියාර් හන්දියේ සිදුවීමෙන් පස්සේ අත්අඩංගුවට ගත් පුද්ගලයෝ සම්බන්ධයෙන් තමයි ඒ වාර්තාවෙන් සහරාන් ඉස්මතු කරන්නේ. ඒවගේම ගිංතොට සිද්ධිය සම්බන්ධව ඒ වගේ ඔය කියන කාරණා කිහිපයක් සම්බන්ධයෙන් තමයි ගරු ස්වාමිනි ඒකේ අපි විශේෂයෙන් ඉස්මතු කරන්නේ.

ප්‍ර: මාතෘකාව කියන්න ඒ ලිපියේ?

පි: National Thawheed Jamath සංවිධානයේ ක්‍රියාකාරී සාමාජිකයින් දෙදෙනෙකු විසින් IS සංවිධානයේ මතවාදය පෝෂණය කිරීම.

ස්වාමිනි 2017 දෙසැම්බර් මස 05 වෙනි දින දරන එකී ලිපිය X - 170 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර: දැන් ඔය ලිපියේ දැන් ඔබ සඳහන් කෙරුවානේ එක කරුණක් ලෙස ඥානසාර ස්වාමීන් වහන්සේ ගැන?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ නිසා හිතුවා මේ දැන්මම ඔබේ අවධානයට තවත් වාර්තාවක් යොමු කරන්නට ඕනි කියලා. මා ඇත්තටම ඔබෙන් බලාපොරොත්තු වෙන්නේ මේ Coming soon කියලා තියෙන එක ගැන අහන්න නමුත් ආවරණ ලිපිය බලලා?

FAIR COMMENT
BY JEZEEM

පි: මේක වාර්තා කරන්නේ ගරු ස්වාමිනි මාවනැල්ල ආගමික ප්‍රතිමා හානියෙන් පස්සේ එතන දී අපි මේ සහරාන් ..

ප්‍ර: දිනය ගැන කියලා කියන්න ඕනි.

පි: හොඳයි ස්වාමිනි. 2018.12.30 තමයි මේ වාර්තාව යවන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර: කාටද යවන්නේ?

පි: පොලිස්පතිතුමා වෙත යවන්නේ.

ප්‍ර: මොනවා ගැනද?

පි: මාවනැල්ලේ ආගමික ප්‍රතිමා හානිය සම්බන්ධව මීට පෙර යවන වාර්තාවකට යොමුවක් විදිහට යවන්නේ. 2018.12.29 වාර්තාවට සබැඳිව. ඒකේ දී ගරු ස්වාමිනි අපි ඉස්මතු කරනවා මේ මාවනැල්ලේ ආගමික ප්‍රතිමා හානියට සම්බන්ධ අත්අඩංගුවට පත් පුද්ගලයන්ට නායකත්වය දෙන ලද ප්‍රදේශයෙන් පළා යන ලද මොහොමඩ් ඊබ්‍රහීම් සාදික් අබ්දුල්ලා. ඒවගේම මොහොමඩ් ඊබ්‍රහීම් ෂාහිඩ් අබ්දුල් හක් කියන පුද්ගලයෝ දෙන්නා සහ ඔවුන්ගේ පියා වන රෂීඩ් මොහොමඩ් ඊබ්‍රහිම් කියන පුද්ගලයා මේ සහරාන්ගේ සමඟ සම්බන්ධයක් තියෙනවා කියන එක. ඒවගේම මොවුන් 2023 ශ්‍රී ලංකා කියලා අපේ නෙළුම් කුළුණේ IS flag එක ගහපු ඡායාරූපයක්, ඒවගේම ඥානසාර හාමුදුරුවන්ගේ රූපය තියෙන coming soon කියලා තියෙන ඡායාරූපයකුත් ඒකට ඇමුණුමක් විදිහට

ප්‍ර: ඒ මොකක්ද ඒ coming soon කියලා ඥානාසාර ස්වාමීන් වහන්සේගේ ඡායාරූපයේ තියලා ඒකේ පිටිපස්සේ IS ත්‍රස්තවාදියෙක් වගේ එක්කෙනෙක් ඉන්නවානේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඒකෙන් අදහස් කරන්නේ? මොකක්ද ඒකේ අර අපි කියන්නේ gesture හැඟවීම මොකක්ද ? මොකක් ද දෙන පණිවිඩය ? බලන කෙනාට මොකක් ද දෙන්නේ පණිවිඩය ?

පි: මේකේ දී ගරු ස්වාමිනි මේ ඔවුන් ළඟ තිබ්බලා අපි විසින් සොයා ගන්නා ලද ඡායාරූප 2ක්.

ප්‍ර: ඔවුන් කිව්වේ?

පි: අත්අඩංගුවට ගත් වූ පුද්ගලයෝ සන්තකයේ තිබ්බලා.

ප්‍ර: කවුද?

පි: මාවනැල්ලේ ආගමික ප්‍රතිමාවලට හානියට අදාළව අත්අඩංගුවට ගත් එතකොට ඒ වාර්තාවේ දී අපි කියන්නේ මෙයලා නුදුරේ ටාගට් එකක් නැත්නම් අනාගත ඉලක්කයක් තියාගෙන තමයි අන්‍යාගාමිකයෝ ඝාතනය කරන්න ඕනි ඥානසාර හාමුරුදුවෝ ඡායාරූපය කියන එක නෙවෙයි ස්වාමිනි ඉස්මතු වෙන්නේ සහ මේකේ නෙළුම් කුලුනේ අපේ

FAIR COMMENT BY JEZEEM

IS flag එක ගහලා තියෙන එක. එතකොට ඒ කියන්නේ එයාලාගේ ටාගට් එකක් තියෙනවා කියන එක තමයි එතනින් එයාලා ඒ කියන්නේ අනාගත ටාගට් එකක් තියෙනවා කියන එක තමයි එතන ඉස්මතු කරන්න හදන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට මාවනැල්ල බුදු පිළිම හානි කිරීමේ සිද්ධියෙන් පස්සේ තමයි ඔබලා මේ වාර්තාව දැම්මේ නේද?

පි: ඔව් ගරු ස්වාමිනි. 12.30

ප්‍ර: ඒ වාර්තාව දැම්මේ 21 වෙනිදා ප්‍රහාරයට මාස 4කට පෙර?

පි: ඔව් ගරු ස්වාමිනි.

ස්වාමිනි 2018 දෙසැම්බර් මස 30 වන දින දරන රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා විසින් පොලිස්පතිතුමා වෙත සබරගමුව, මධ්‍යම සහ වයඹ පළාතේ ස්ථාන කිහිපයක බෞද්ධ, හින්දු සහ කතෝලික ප්‍රතිමා වෙත ප්‍රහාර එල්ල කිරීම යන මාතෘකාව යටතේ යවා ඇති මෙම ලිපිය X – 171 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර: දැන් ඔබ ඊයේ දින භූමියෙන් ලැබෙන තොරතුරු විශ්ලේෂණය කිරීම ගැන කිව්වානේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඔබට පුළුවන්ද ඒ විශ්ලේෂණයේ දී කොයි ආකාරයටද වර්ගීකරණය කරන්නේ ඒ තොරතුරු කියන එක ගැන මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කිරීමක් කරන්න මං හිතන්නේ ඔබ තමයි ඒක කරන්න හොඳම නිලධාරියා රාජ්‍ය බුද්ධි සේවයේ. මොකද ඔබ මේ Desk එකේ බොහෝ කාලයක් අත්දැකීම් ලබලා තියෙන හින්දා

පි: ගරු ස්වාමිනි වර්ගීකරණය කිරීමේ දී වර්ගීකරණ කිහිපයක් තියෙනවා බුද්ධි තොරතුරු වර්ගීකරණය අනුව.

ප්‍ර: මොනවද ඒ?

පි: ඒකේ දී A1 ඉඳන් A5 දක්වා වගේ අපි වර්ගීකරණයට ලක් කරනවා. ඒකට කාරණා කිහිපයක් බලපානවා ගරු ස්වාමිනි. ඒ කියන්නේ යම් ඉලක්කයක්, ඉලක්කයේ තොරතුරුකරුගේ හැසිරීම, ඒ තොරතුරුකරු ඊට පෙර ලබාදීලා තියෙන තොරතුරු, ඒවා වෙනත් මාර්ගවලින් අපිට තහවුරු වෙලා තියෙනවාද නැද්ද කියන කාරණය ඒවගේ කාරණා කිහිපයක් මුල් කරගෙන තමයි ගරු ස්වාමිනි අපි වර්ගීකරණය කරන්නේ.

ප්‍ර: එතකොට B අක්ෂරයෙන් දෙනවනම්?

පි: B අක්ෂරයෙන් කියන්නේ යම් එකකින් තහවුරු වෙලා නොතිබෙන ඒවගේ තොරතුරක් තමයි ගරු ස්වාමිනි. මට ඒකේ grading එක හරියටම මතක නැහැ. මං ගාව තියෙනවා.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: B2 ශ්‍රේණිය වගේ වුණානම් grading එකක් දීලා තියෙනවානම් ඒක කොයි වගේද?

පි: ඒක අනිකුත් මාර්ගවලින් තහවුරු වෙලා නොතිබෙන අවස්ථාවක් විය හැකියි ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට තමයි B 2 දෙන්නේ නේද?

පි: ඒක නිශ්චිතව මට සඳහන් කරන්න අමාරුයි ගරු ස්වාමිනි. මොකද අපේ වර්ගීකරණය සම්බන්ධ වාර්තාවක් මා ගාව තියෙනවා. එහෙම වුණොත් ඒක අරගෙන තමයි හරියටම

ප්‍ර: දැන් තියෙනවද?

පි: ළඟ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: කොයි වෙලාකව හරි ඔබේ ඔය තොරතුරු රැස් කිරීමේදී දැන ගන්නට ලැබුණද වාලච්චේනයේ ඕට්ටමාවඩිහි ක්‍රියාත්මක වුණ කල්කුඩා සයිෆුල්ලා මාෂල් ආර්ම් ඇකඩමි කියලා ස්ථානයක් ගැන?

පි: වාර්තා වුණා ගරු ස්වාමිනි.

ප්‍ර: ඔබට හොඳ මතකයක් තියෙනවානේ මොකක්ද ඔබට වාර්තා වුණේ?

පි: සයිබුල්ලා මාෂල් ඇකඩමි කියන එකේ වෙනම කණ්ඩායමක්, ඒ කියන්නේ තරුණයෝ කණ්ඩායමක් කරාතේ Class එකක් පවත්වාගෙන යන එක සම්බන්ධයෙන් තමයි තොරතුරක් වාර්තා කරලා තිබුණේ.

ප්‍ර: කොහෙන්ද ඒක වාර්තා වුණේ කියලා මතකද?

පි: මට නිශ්චිතව මතකයක් නැහැ.

ප්‍ර: කමක් නැහැ. නමුත් ඒ තොරතුර වාර්තා වුණා කියලා මතකයිනේ?

පි: ඒ වගේ තොරතුරක් තිබ්බා.

ප්‍ර: වාර්තා වුණාට පස්සේ මොකක්ද ගත්ත පියවර? දැන් එය තොරතුරුකරුවෙක්ගෙන්නේ ලැබෙන්නට ඇත්තේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට මොකක්ද ලැබුණු තොරතුර? ඒක ගැන බැලුවද ඔබ? ඔබ කිව්වානේ එහෙම ඇකඩමි එකක් පවත්වාගෙන යන එක ගැන තමයි මේ ලැබුණේ තොරතුර එතකොට ඒ පිළිබඳව සොයලා බැලුවද නිරවද්‍යතාවය?

පි: මගේ මතකයේ හැටියට එක නිලධාරියෙක්ගේ තොරතුරකට ආපහු නිලධාරියා හරහා පරීක්ෂා කිරීමක් කරලා තිබෙනවා. මට නිශ්චිතව ඒ සම්බන්ධයෙන් වාර්තා කරන්න බැහැ ගරු ස්වාමිනි. මොකද මගේ ළඟ ඒ Document දැනට නැති නිසා.

ප්‍ර: මම නැවත ඔබේ අවධානය තොරතුරු වර්ගීකරණයට ගෙන ගියොත් තොරතුරු ලැබුණු තොරතුර විශ්ලේෂණය කරලා, එහි ගණය පිළිබඳව ශ්‍රේණිය පිළිබඳව තීරණය කරන කොට ඔබලා ඒ මුල් ආරම්භයේදීම ඒක තහවුරු කර ගන්න ඕන්නම් B අක්ෂරයක් දෙනවද? ඒ කියන්නේ දැන්

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එනවා තොරතුර ඔබට ඒ අවස්ථාවේ ඔබ ඒක කියවන කොට ඔබට පේනවා වෙනත් කරුණුවලින් තාම ඒක තහවුරු වෙලා නැහැ කියලා. එතකොට B අක්ෂරයක් දෙනවද?

පි: මට ඒ සම්බන්ධයෙන් නිශ්චිත උත්තරයක් දෙන්න අමාරුයි ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට මම මෙහෙම අහන්නම්කෝ. දැන් විශ්ලේෂණය කරනවානේ?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: විශ්ලේෂණය කරාට පස්සේ දැන් ඒ වේලාවේ වෙනකොට B අක්ෂරයක නම් ඒක ඉන්නේ එතකොට ඔබ සටහනක් දානවද ඔබේ අංශය හරි කවුරුහරි ඒක විශ්ලේෂණය කරන තැනැත්තා මේක A ශ්‍රේණියට ගන්නට පුළුවන්ද කියලා A1ට හරි A2 හරි . A1 ඉඳලා A5 දක්වා මොකක් හරි තැනකට මේක ගෙන්න පුළුවන්ද කියලා සටහනක් දානවද?

පි: ගරු ස්වාමිනි අපි සිදුකරන ක්‍රමවේදය තමයි භූමියේ තොරතුරුකරුවෙක් හරහා අපේ නිලධාරියෙක් වාර්තා කරාම ඒ නිලධාරියා විසින් ඒක අර අපේ අනිකුත් ක්‍රමවේද අනුව තහවුරු වෙලා නැත්නම් සහ ඒ දේවල් අනුව යම් අක්ෂරයක් යොදනවා. ඒ අනුව ඊට පස්සේ ඒකේ යම් තව කරුණු කිහිපයක් තහවුරු කර ගන්න අවශ්‍යනම් ඒ අංශභාර නිලධාරියා විසින් ගොඩක් වෙලාවට ඒ නිලධාරියාටම ආපස්සට ඒ තොරතුරු දෙනවා මේ ටික පරීක්ෂා කරන්න කියලා. පසුව ඔහු ඒ ටික හොයා ගත්තායින් පස්සේ ඔහු වාර්තාවක් මඟින් තමයි ඒ ටික ඉදිරිපත් කරන්නේ. එතනදී අර වගේ A ,B කියන වර්ගීකරණයක් ඇතුලත් කරලා නෙමෙයි කරන්නේ. ඒ ඉතුරු කරුණු ටිකට further report එකක් එහෙම නැත්නම් තවත් report එකක් විදිහට තමයි ඔහු ඒක වාර්තා කරන්නේ.

සාක්ෂිකරුට X – 169 ලේඛනය පෙන්වයි.

ප්‍ර: දැන් මේක B2නේ ශ්‍රේණිගත කිරීම තියෙන්නේ. ඊට පස්සේ දැන් A + 1හෝ A2 විදිහට ඒක ගේනන පුළුවන් කියන ලද එකද ඒකේ කියන්නේ තොරතුරු?

පි: මේක සඳහන් කරේ කවුද කියන එක කියන මට

ප්‍ර: මම අහන්නේ සාමාන්‍යයෙන් කරන විදිහට ?

පි: මේ විදියට B 2 ගණයට දාලා ආවොත් එයාට ආපහු මේ නිලධාරියා report කරන එක්කෙනාට අපි ආපහු දානවා ගොඩාක් වෙලාවට. සමහර විට එයා මේ වගේම Source එකකිනුත් මේකේ ඉතිරි කරුණු ටික complete කරලා වාර්තා යොමු කරනවා. එතකොට ඒක තවත් මාර්ගවලින් තහවුරු කරලා තිබුණොත් ඒ නිලධාරියා ඒ source එක දෙවැනි source එක විදිහටත් මේ වගේ තොරතුර දාන්න පුළුවන්. ඒ වගේ විදිහට තමයි

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එහෙම දාන්න පුළුවන්. එතකොට ඒවාගේ අවස්ථාවක දී මේ වගේ සටහනක් යෙදෙන්න පුළුවන්ද කියලා මං අහන්නේ?

පි: මේ වගේ නෙවේ ගරු ස්වාමිනි. ගොඩක් වෙලාවට වාර්තා කරලා මේ නිලධාරියා නැවතත් වෙනත් දිනයක යොදලා තව තොරතුරක් වාර්තා කරන්න පුළුවන් මේකම. හැබැයි මේකේ නැති කරුණු ටික සඳහන් කරලා එතකොට මේකේ A1 හරි A2 හරි ඒ වගේ grading එකකට එන්න පුළුවන්. නැවත ඉදිරිපත් කරන තොරතුරුපතට.

ප්‍ර: එතකොට ඒ තියෙන තොරතුරු බලලා ඊට පස්සේ ඔහු ඒ නිසා මෙතන මෙහෙම සටහනක් දැමෙන්න පුළුවන්ද? ඉදිරිපත් කරනකොට ඒක වෙනම ලේඛනයක් විදිහට යනවා වෙන්න පුළුවන්. මං අහන්නේ ඒක evaluate කරන අවස්ථාවේ විශ්ලේෂණය කරන අවස්ථාවේ එතකොට ඔහු කල්පනා කරමින්නේ කරන්නේ මේක. මේ තියෙනවා තොරතුරු. දැන් විශ්ලේෂණය කරමින් කරන කොට, මම ඔබෙන් අහන්නේ බණ්ඩාර මහත්මයා එතකොට දැන් නිලධාරියා කල්පනා වෙන්න පුළුවන්නේ මේක B + 2ක් ඉහළට එන්න ඕනි. මොකද මට තහවුරු වීමට අවශ්‍ය කරුණු ඇතැම් ඒවා ලැබිලා තියෙනවා. එතකොට ඔහුගේ හිතට ප්‍රශ්නයක් එන්න පුළුවන් මම මේක මොන ශ්‍රේණියටද A ශ්‍රේණියට ගේනවානම් ගේන්නේ කියලා එතකොට ඔහු යම් වෙලාවක සටහනක් දාගන්න පුළුවන්නේ මේක එක්කෝ A 1 නැත්නම් A2ට මට ගේන්න පුළුවන් කියලා එහෙම හිතුණොත් මේ වගේ අවස්ථාවක් තියෙනවද ඔහොම සටහනක් දාන්න කියලා මං අහන්නේ ?

පි: මෙහෙම සඳහනක් අපි භාවිතා කරන්නේ නැහැ. මේක නිලධාරියා මොකක් හරි හේතුවක් මත practice එකක් විදියට කරා වෙන්න හැකියාවක් තියෙනවා ගරු ස්වාමිනි. නැවත ඉදිරිපත් කරනවානම් A1 හරි A2 හරි

ප්‍ර: ඉදිරිපත් කිරීමේ දී ඕක ඔය යථා පරිදි කරනවා වෙන්න පුළුවන්ද මං අහන්නේ දැන් අපි ඔය කටුවැඩ කරනකොටත් අපි මොකක් හරි සටහනක් දානවානේ. හැබැයි ඒක දෙන්නේ නැහැනේ අපි ජ්‍යෙෂ්ඨ නිලධාරියාට?

පි: නැහැ ගරු ස්වාමිනි. මේක ගොඩක් වෙලාවට නිලධාරියා ඒ කියන්නේ එයාට මේක මේ තත්ත්වයට ගේන්න පුළුවන් කියන නිසා මේ සටහන යොදා ගත්තා විය හැකියි.

ප්‍ර: ඔව් ඒක හරි. ඒ කියන්නේ යම් අවස්ථාවල්වලදී එහෙම වැඩි දියුණු කරලා වාර්තාව ඉදිරිපත් කරනවානම් වෙනම වාර්තාවක් හදනවා. ඒකට මම ඔබ සමඟ එකඟ වෙනවා. මම විවාද කරන්නේ නැහැ. මං අහන්නේ අර B 2 ශ්‍රේණියේ තියෙනවා කියලා මුල් අවස්ථාවේ තීරණය කරපු තොරතුරේ ගුණාත්මක භාවය වැඩිවෙන බව පේනවානම් විශ්ලේෂණයෙන් පස්සේ

FAIR COMMENT BY JEZEEM

එතකොට ඔහු කල්පනා කරමින් නිලධාරියෙක්ට මේක A1 ද A2 කියලා ඒ category එකට එන්න පුළුවන් නේද කියලා ඒ ඔය වගේ සටහනක් දැමේ හැකියාව තියෙනවානේ?

පි: ඒ කියන්නේ ගරු ස්වාමිනි මේක නිලධාරියා ඔහුගේ සටහනක් විදිහට මේක තබාගෙන නැවතත් මේක අර විදිහට අනිත් කරුණු සම්පූර්ණ කරලා මේ තත්ත්වයට වාර්තා කරන්න හැකියාවක් තිබෙනවා ස්වාමිනි.

****

දැන් වේලාව: ප.ව.9.50

මෙතැන් සිට ල/ලේ: චන්දිමා මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව: 9.50
පෙර සටහන්: නිල්මිණි
මෙතැන් සිට: චන්දිමා

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: දැන් මට ඔබෙන් තව ප්‍රශ්නයක් අහන්න තියෙනවා ඔබ දන්නවද අර දිගන සිද්ධියක් වුණා මේ ට්‍රක් එහෙකට කෙනෙක් යටවෙලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඊට පස්සේ සිංහල මුස්ලිම් පාර්ශවයන් අතර යම් අසමගිතාවයක් ඇතිවුණා. මොකක්ද ඒ වුණේ? කොයි කාලේද වුණේ

පි: 2018.03.08 වෙනිදා මගේ මතකයේ හැටියට පෙට්‍රල් ෂෙඩ් එකක තෙල් ගහන්න ගිහිල්ලා වෙච්ච සිදුවීමක් හැටියට තමයි සිංහල ජාතිකයෙකුට පහර දීමක් වෙලා ඔහු රෝහල් ගතවෙලා ඉදලා පසුව ඔහු මිය ගියේ එතැනින් පස්සේ තමයි ඒ සිදුවීම කේන්ද්‍ර කරගෙන දිගන මහනුවර ප්‍රදේශය ආශ්‍රිතව සිංහල සහ මුස්ලිම් ජාතිකයින් අතර යම්ගැටලු කාරි තත්ත්වයක් ඇති වුණේ ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ දැනගෙන හිටියද නැෂනල් තවුහිද් ජමාත් සංවිධානයේ ඊට පස්සේ ඒ වගේ සමාජ සංස්ථාවේ ඇතිවුණ අසමතුලිතතාවයන් භාවිතා කරලා ඒ ප්‍රදේශවලින් තමන්ගේ සංවිධානයට පුද්ගලයින් බඳවා ගැනීමට කටයුතු කරන ලද බව?

පි: ගරු ස්වාමිනි සහරාන් නැෂනල් තවුහිද් ජමාත් සංවිධාන නායක මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් ඔහුගේ අනුගාමිකයන් රැස් කර ගැනීමේදී මේ වගේ සිදුවීම් යොදාගෙන තිබුණා උදාහරණයක් විදියට කියන හැකි ගරු ස්වාමිනි 2014 අලුත්ගම සිද්ධියෙන් පස්සේ ඒ සිද්ධියේදී තුවාල ලබපු එක් පුද්ගලයෙක් පස්සාන් මගේ මතකයේ හැටියට නම ඒ පුද්ගලයාවත් මේ වගේ අන්‍යාගමිකයන්ට එරෙහිව ප්‍රහාර එල්ල කරන්න ඔනේ කියන තැනට අභිප්‍රේරණය කරලා ඔහුට අවස්ථා දෙකකදි වගේ ත්‍රිරෝද රථ අරන් දීලා ඔහුට අවශ්‍ය වෙලාවට කථා කරන්නම් කියලා ඉන්න කියලා තිබ්බ අවස්ථා වාර්තා වෙලා තිබුණා ගරු ස්වාමිනි. ඒ පුද්ගලයා මේ වෙන කොට අත්අඩංගුවේ සිටින්නේ ඒ වගේ තමයි ගොඩාක් ..

ප්‍ර: එතකොට ඔබ පිළිගන්නවා ඒ වගේ අවස්ථාවන් පාවිච්චි කරලා තමන්ගේ සංවිධානයට සාමාජිකයින් බඳවා ගැනීම එහෙමනම් නැෂනල් තවුහිද් ජමාත් සංවිධානය විසින් සිදු කරා කියලා නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: මා ඔබේ අවධානයට යොමු කරනවා C 947 කියලා ලකුණු කරලා තියෙන ලේඛනයක් ඔබට ද්‍රවිඩ භාෂාවත් පුළුවන්නේ අපිට කියන්නකෝ මොකක්ද මේ තියෙන්නේ කියලා? නැෂනල් තවුහිද් ජමාත් සංවිධානය

Presidential Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

වරහන් ඇතුලේ තියෙන්නේ මොකක්ද? ISIS නේද මොකක්ද මේ? නැෂනල් තවුහිද් ජමාත් නැත්නම් වරහන් ඇතුලේ ISIS කියන්නේ කාටද ආමන්ත්‍රණය කරන්නේ මොකක්ද කියන්නේ කවුද මේකට අත්සන් කරන්න යන්නේ? කියන්න දෙමළ කියන් පුළුවන්නේ? කථා කරන්න විතර ද පුළුවන්?

පි: කථා කරන්න විතරයි පුළුවන්

****

<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර; සාක්ෂිකරු ඔබගෙන් මීට පෙර විමසුවා අබු හින්ද් කියන තැනැත්තා

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර; ඔබට ලැබී තිබෙන තොරතුරු අනුව ඔහු කුමන කණ්ඩායමට අයිති තැනැත්තෙක්ද ?

පි: ගරු ස්වාමිනි අබු හින්ද් කියන පුද්ගලයා මුලදි සහරාන් සම්බන්ධ වෙන්නේ telegram ගිණුමක් ඔස්සේ තමයි සම්බන්ධ වෙන්නේ. ඔහුත් සිරියාවට යාමට සඳහා උත්සාහ කරපු පුද්ගලයෙක් බවට තමයි වාර්තා වෙන්නේ. ඊට පසුකාලීනව සහරාන් ඇතුළු පුද්ගලයෝ ත්‍රීමා කියන application එක හරහා තමයි තමාගේ සන්නිවේදනයන් කරන්නේ. එතකොට මේ අබුහින්ද් කියන පුද්ගලයත් එක්ක මේ ත්‍රීමා කියන application එකෙන් තමයි සම්බන්ධ වෙන්නේ . අබුහින්ද් කියන පුද්ගලයා ගරු ස්වාමිනි අනාවරණය වෙලා තියෙන්නේ ඉන්දියාවේ සිටින පුද්ගලයෙක් ඒ වගේම ඔහු IS එකට යන්න අවශ්‍යතාවක් සහිතව ප්‍රචාරණයක් සිදු කරන පුද්ගලයෙක් විදියට තමයි හඳුනාගෙන තියෙන්නේ.

ප්‍ර: ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවයට ලැබී ඇති තොරතුරු අනුව?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: මං මේ ප්‍රශ්නය අහන්නේ අපිට මේ සියලු කරුණු ගැන කොමිෂමේ අවධානය යොමු කරන්න වෙන හින්දා ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ආචාර්ය රෝහාන් ගුණරත්න එක් අවස්ථාවක ප්‍රකාශ කරනවා මේ අබුහින්ද් තමා සහරාන්ගේ Handler, අබු හින්ද් තමා IS සංවිධානයේ නියෝජිතයා කියලා ඒක කියන්නේ ආචාර්ය රෝහාන් ගුණරත්න. ඒ කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධිසේවයට යම් කිසි තොරතුරක් වාර්තා වෙලා තියෙනවද?

පි: ඔව් ගරු ස්වාමිනි මං මුලින් සඳහන් කලේ සහරාන් උත්සහ කරා ලංකාවේ සරහාන් ලංකාවේන් සිරියාවට ගිහිල්ලා ඉන්න පුද්ගලයෝ සම්බන්ධවෙන්න එතන ඉන්න පුද්ගලයෝ සම්බන්ධ වෙන්න එතන

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඉන්න පුද්ගලයන්ගේ අබු හින්ද් කියලා නමක් තිබුණේ නැහැ. අපි මේ සම්බන්ධයෙන් අත්අඩංගුවේ පසුවන පුද්ගලයින්ගේ අනාවරණ මඟින් වාර්තා වෙන්නේ ගරු ස්වාමිනි අබු හින්ද් කියන පුද්ගලයා සිරියාවේ හිටපු පුද්ගලයෙක් නෙමේ ඉන්දියාවේ සිටින පුද්ගලයෙක් බවට තමයි ගරු ස්වාමිනි තොරතුරු වාර්තාවෙන්නේ

මේ අවස්ථාවේ දී මීට පෙර සාක්ෂි ලබා දුන් සාක්ෂිකරු මාර්ගයෙන් ලකුණු කරන ලද C 947 දරණ ලේඛනය දමිළ භාෂාවෙන් තිබුණු ලේඛනයක් හෙයින් එහි සිංහල පරිවර්ථන C 947 A වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: නිල වශයෙන් ස්වාමිනි සිංහලයට පරිවර්ථනය කරන ලද ලේඛනය සාක්ෂිකරුගේ අවධානයට යොමුකරනවා මේ C 947 කියලා ලේඛනය මොන වගේ ලේඛනයක්ද මොකක්ද එකෙන් ඒ මොකටද ඒක පුරවන්න ඕනේ ? එහෙනම් කියනවද ට්‍රාන්ස්ලේෂන් එක ගැන

පි: මේක ගරු ස්වාමිනි යම් කිසි දිවුරුමක් ප්‍රකාශ කරන්න ඒ කියන්නේ සහරාන් හෝ ඒ වගේ එවකට ප්‍රකාශ කරන්න ලියවිල්ලක් ලබා ගැනීමට ඔහු විසින් සකස් කරන ලද document එකක් වෙන්න පුළුවන් ගරු ස්වාමිනි.

ප්‍ර: ඔව් එමගින් මොකක්ද කියන්නේ?

පි: තවුහිද් ජමාත් සංවිධානයේ සාමාජිකයෙක් වෙනවා වෙනත් සංවිධානයකට සමාජිකත්වය දරන්නේ නැහැ. නබිතුමා විසින් ප්‍රකාශ කරන ලද පරිදි ඒ කරුණු මුල් කරගෙන එයා විශ්වාස කරනවා කියන කාරණය තමයි ගරු ස්වාමිනි ඒ වෙගේම IS නීතිවලට යටත් වෙනවා කියන එක තමයි ස්වාමිනි ඉස්මතු කරලා දිවුරා පවසන්නේ.

ප්‍ර: ඒක තමයි ඒකේ තියෙන භයානක වන්නේ ජමාතේ ISIS නීතිවලට යටහත්ව ක්‍රියකාරන බවත් ජාතික තවුහිද් ජමාතයට විරුද්ධව කිසිදු සංවිධානයක සාමාජිකත්වය හෝ ආධාරකරුවෙකු වශයෙන් හෝ කටයුතු නොකරන බවටත් සහතික වෙනවා ඉතින් මේක ජාතික ආරක්ෂාවට කොහොම බලපායිද බණ්ඩාර මහත්මයා ? මොකද ඔබ හිතන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීයෙක් විදියට විශේෂයෙන්ම මේ අන්තගාමී ඉස්ලාම් අන්තවාදය පිළිබඳ ඒ Desk එකේ අංශ භාර නිලධාරියා විදියට ඔබ මොකක්ද මේ ඉල්ලුම් පත්‍රය ගැන හිතන්නේ? C 947 ?

පි: මේ අයදුම් පත්‍රය ඒකේ මාතෘකාවේම ISIS කියලා ගහලා තියෙනවා එතකොට මේ සහරාන් විසින් ඔහුගේ අනුගාමිකයන්ගේ යම් දිවුරුමක්

FAIR COMMENT BY JEZEEM

ලබා ගෙන තිබුණා සංවිධානය විසින් පවත්වන ලද වැඩමුළුවලදී මේ වගේ ලේඛනයක් මට මේක නිශ්චිතවම සහරාන්ගේ කියන එක සම්බන්ධයෙන් ප්‍රකාශ කරන්න මගේ ළඟ තොරතුරක් එහෙම නෑ ගරු ස්වාමිනි. නමුත් 2017.03.10 න් පස්සේ සහරාන්ගේ සංවිධානයේ නිල ලාංඡනය සහ ඒ ලිපිනයන් භාවිතා කරමින් ඔහුට විරුද්ධ කණ්ඩායම් විවිධ IS කියන ලේබලය අලවලා ඒ වගේ ප්‍රචාරනයන් ගෙන ගියා ඒක මට නිශ්චිතව ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්න නමුත් සහරාන්..

ප්‍ර: ඔබ කියන්නේ ඔහුට විරුද්ධ කණ්ඩායමක්ද ලේබල් එක IS ලේබල් එක අලවලා ඒ ප්‍රචාරයන් ගෙන ගියේ?

පි: සහරාන් විසින් ප්‍රසිද්ධියේ තමන් IS කියන එක තමන්ගේ අනුගාමිකයන් අතර කිව්වාට ඒ වගේ ලේඛනයක් ප්‍රචාරය කරලා එහෙම කර ගෙන ගිය බවක් තොරතුරු තිබුණේ නැහැ ස්වාමිනි ඒ කියන්නේ ඔහුව හඳුනා ගන්න තෝරගත්ත පිරිස අතරේ පමණයි ඒ දේ කරන්නේ ඔහුට විරුද්ධ කණ්ඩායම් ඔහු යම් මතකයක් හදන්න ඒ වගේ නොයෙක් අවස්ථාවල තිබුණා. ඔහු එක රටක තවත් කාගේ හරි ඒජන්ට් කෙනෙක් ඒ වගේ නොයෙක් නොයෙක් ඡායාරූප දාලා ඒ වගේ ප්‍රචාරණයන් සමාජ ජාලා හරහා ගොඩාක් හුවමාරු වුණා. මේක මට නිශ්චිතව සඳහන් කරන්න අමාරුයි ඔහුගේ සංවිධානයේ එකක්ද කියලා මොකද දිවුරමක් ගත්තා කියලා මෙකේ තිබුණා ස්වාමිනි. ලේඛනයකට දිවුරුමක් ගත්තා ස්වාමිනි වාර්තාවක් තිබුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර: මේ ගරු කොමිෂන් සභාවට සාක්ෂි ඉදිරිපත් වෙලා තියෙන්නේ දිගන සිද්ධියෙන් පස්සේ ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානයට සමාජිකයන් බදවා ගැනීම සඳහා ඔබට ඔබේ අවධානයට යොමු කරපු C947 ඉල්ලුම් පත්‍රය පුද්ගලයින්ට භාර දුන් බව ඒක තමයි ඉදිරිපත් වුණේ අද දිනමයි ඔබට පෙර ඒ සාක්ෂිය අපිට ලැබුණේ ඔබ ඊයේ දින ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා මේ ඉස්ලාම් අන්තවාදය සහ IS මතවාදයට හිතැති පුද්ගලයින් 129 කගේ නම් අඩංගු ලැයිස්තුවක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පතිවාරයා වෙත රාජ්‍ය බුද්ධි සේවය විසින් යොමු කරන ලද බව නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: මා කිව්වොතින් නිවැරදි ද එම ලේඛනය ඉදිරිපත් කරනු ලැබුවේ 2019 ජනවාරි 31 වෙනිදා දින දරණ ආවරණ ලිපිය සමඟ කියලා? එය ඔබ ළඟ තිබෙනවද?

පි: තියෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර: එය කවුද යවලා තියෙන්නේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට?

FAIR COMMENT
BY JEZEEM

පි: අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි සේවාව විසින් එවකටඅධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතාගේ අත්සනින් තමයි යවලා තියෙන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර: එම ලිපියටම ඇමුණුමක් විදියට ඔබ සඳහන් කරපු අර 129 දෙනාගේ ලැයිස්තුව ඇතුලත් කරලා තියෙනවා නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.

ස්වාමිනි එම වාර්තාව X 172 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්න අවසර අයදිනවා.

ප්‍ර: එම ලේඛනය ප්‍රකාරව මොනවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අවධානයට ඔබලා විසින් යොමු කරලා තියෙන කරුණු ?

පි: ගරු ස්වාමිනි එම වාර්තාවේ අපි සඳහන් කරනවා 2015 ඉඳන් සිරියාවට ගමන් කරන ලද පුද්ගලයන්ගේ තොරතුරු ඒ වගේම සිරියාවට යන්න අවශ්‍යතාවයෙන් දිවයිනෙන් තුර්කියට ගිහිල්ලා නැවත ලංකාවට පැමිණිච්ච පුද්ගලයන් දෙදෙනෙකු සම්බන්ධයෙන් ?

ප්‍ර: විසින් එක්කෙනෙක් ජමීල් නේද?

පි: ඔව් ගරු ස්වාමිනි

ප්‍ර: අබ්දුල් ලතිෆ් ජමිල් මොහොමඩ් වෙන?

පි: ඊට අමතරව තව සඳහන් කරනවා ජාතික තවුහිද් ජමාත් සංවිධානය All Ceylon thowheed jamath ජමාත් සංවිධානය වගේ ඒ වගේ දේශන මුස්ලිම් තරුණ කොටස් විදේශිය ත්‍රස්තවාදී සංවිධානවලට යොමු වන්න කාරණයක් වෙන වෙනවා කියන එකත් වහාබි මතවාදය පෝෂණය කිරීම හේතුවක් වෙනවා කියන එකත් ඒ වාර්තාවේ ඉස්මතු කරනවා ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ෂරියා නීතිය ක්‍රියාත්මක කර ගැනීම කෙරෙහි ඉස්ලාමිය තරුණයින්ගේ දක්වන ආකල්පය ගැන එහි සඳහන් වෙනවද?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: මොකද කියන්නේ?

පි: ෂරියා නීතිය ක්‍රියාත්මක ඉස්ලාම් රාජ්‍යයක් ලෙස සිය ආගමික හා සාමාජීය කටයුතු වැඩි පහසුකම් ඉටු කර ගැනීම හැකි වන බව මානසිකව පෙළඹීමක් තියෙනවා කියන එක තමයි මෙතන ඉස්මතු කරලා තියෙන්නේ එතකොට ඒ වගේම මේ වගේ අන්තවාදී මත වාද වෙත නැඹුරුව සිටින බවට බුද්ධි තොරතුරු ඔස්සේ හඳුනාගෙන තියෙනවද මූලික විමර්ශනයන්ගෙන් අර මාවනැල්ල සිදුවීම ප්‍රධාන සැකකරුවන් වන සහෝදරයන් දෙදෙනා ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට අබූ බකර් අල්බැග්ඩෑඩි විසින් ප්‍රකාශිත කල්පිත ඉස්ලාම් රාජ්‍යයට ශ්‍රී ලංකාව ඇතුලත් වෙනවද නැද්ද කියන කරුණ ඔබලා

FAIR COMMENT BY JEZEEM

විසින් පොලිස්පතිතුමාගේ අවධානයට මේ ලිපිය මගින් යොමු කරලා තියෙනවාද?

පි: ඔව් ගරු ස්වාමිනි. කුරසාන් කියන ඒ කියන්නේ මං මුලිනුත් සඳහන් කරා ගරු ස්වාමිනි 2014. 06.29 IS සංවිධානයේ නායක අබුබකර් බැග්ඩැඩි විසින් ඉස්ලාම් රාජ්‍යයක් ප්‍රකාශයට පත්කරනවා කියලා එතකොට එතනදි ඔහු විසින් විලයාත් නැත්නම් උප රාජ්‍යයන් විදියට රටවල් කීපයක් එකතු කරලා නම් කීපයක් දෙනවා එකේදී ඉන්දියාව ශ්‍රී ලංකාව පකිස්ථාන, ඇෆගනිස්ථානය කියන රටවල් කේන්ද්‍ර කරගෙන කුරසාන් කියන විලයාත් එක තමයි ඔවුන් නම් කරන්නේ විලයාත් කියලා කියන්නේ ඇරබික්වලින් උප රාජ්‍යයක් කියන එක අර ප්‍රධාන ඉස්ලාම් රාජ්‍යයේ උප රාජ්‍යයක් විදියට තමයි කුරසාන් කියන එක නම් කරන්නේ කුරසාන් එකට ලංකාව ඇතුලත් වෙනවා කියන එක

ප්‍ර: එතකොට ලංකාවත් ඒකට ඇතුලත් වෙනවා ඔය කියන විදියට ඒ කියන කුරසාන් රාජ්‍යයට?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ ආවරණ ලිපියට X 172 ලෙස ලකුණු කරලා ඉදිරිපත් කරපු ආවරණ ලිපියට ඔබ අර සඳහන් කරන ලද නම් 124 ක් අඩංගු ලැයිස්තුවත් අන්තර්ගත වෙනවානේ නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.

ස්වාමිනි එම ලැයිස්තුව X 172 A අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: දැන් අපි බලමු ඒ නම් 172 ගැන මං එහිදි ඔබේ අවධානයට මෙන්න මේ කරුණු යොමු කරන්න කැමතියි පළමුවෙන්ම වවුනතිව්වල සිදුවුනු පොලිස් නිලධාරීන් දෙදෙනා ඝාතනය කිරීමේ සිද්ධිය 2018 නොවැම්බර් මාසේ 30 වෙනිදා ?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඊළඟට මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිම ක්‍රිස්තියානි සහ හින්දු පිළිමවලට හානි කිරීම සිදුකිරීම පිළිබඳව වාර්තා වුනා 2018 දෙසැම්බර් මාසේ 23.,24,26 කියන දවස් වලදි ඊළඟට 2019 ජනවාරි මාසේ 16 වෙනිදා වනාතවිල්ලුවේ ලැක්ටෝස් වත්තේ තිබිලා පුපුරණ ද්‍රව්‍ය ඇතුලු පිඩාකාරි ආයුධ සොයා ගැනීමක් සිද්ධ වුණා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඔය කරුණු සිදු වෙලා තිබුණු ඔය පසු බිමේ තමයි ඔබලා එහෙම නම් මේ X 172 A කියන ලැයිස්තුවේ තියෙන මේ නම් ටික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත යවලා තියෙන්නේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ප්‍රධානත්වය දරණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඒ වන විට මාවනැල්ල බුදු පිළිම

FAIR COMMENT BY JEZEEM

පිළිබඳව විමර්ශන ඒවගේම වනාතවිල්ලුවේ පිඩාකාරි ආයුධ ඇතුලුව අනෙකුත් ආයුධ සොයා ගැනීම පිළිබඳ විමර්ශන සිදු කරමින් තිබුණා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එහෙමනම් ඔබට කියන්නට පුළුවන්ද මේ නම් 124 කින් සමන්විත මේ ලැයිස්තුවේ ඔබලා එම සිද්ධීන්වලට වගේම පසුව ප්‍රහාරය 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා සිදුවූ ප්‍රහාරයත් අප්‍රේල් 26 වෙනිදා සිදු කර ගන්නා ලද ස්වයං ප්‍රහාරත් සඳහා දායක වූ කී දෙනෙක්ගේ නම් එහි අඩංගු කරලා තියෙනවද කියලා?

පි: මේ වාර්තාවේ ගරු ස්වාමිනි මම ඊයේ දිනත් 94 ක වාර්තාවක් සඳහන් කරා ඒ වාර්තාවට වැඩිපුර එකතු වෙච්ච පුද්ගලයින්ගේ නම් තමයි මේකේ 124 ක වගේ ලිස්ට් එකක් තියෙන්නේ.

ප්‍ර: බැහැ මුල ඉඳන් යන්න ඕනි?

පි: ගරු ස්වාමිනි එම වාර්තාවේ තිබෙන පුද්ගලයෝ 124 දෙනා අතුරින් ගරු ස්වාමිනි 2019.04.21 වෙනිදා ස්වයංඝාතක ප්‍රහාරකයින් සම්බන්ධයෙන් සඳහන් කරන්න කැමතියි ගරු ස්වාමිනි එකේ පළවෙනි පුද්ගලයා හැටියට අබ්දුල් ලතීෆ් මොහොමඩ් ජමීල් කියන පුද්ගලයා දෙහිවල ට්‍රොපිකල් ඉන් ලැගුම් හලේ පුපුරවා ගන්නවා ගරු ස්වාමිනි.

ස්වාමිනි එම අංක 01 ස්ථානය X 172 A (i) වශයෙන් ලකුණු කරලා ඉදිරිපත්කරනවා

ප්‍ර: දැන් මේ 21 වෙනිදා ප්‍රහාරයන් ගැන ස්වාමිනි කියන්නේ සාක්ෂිකරු?

පි: ගරු ස්වාමිනි අංක 54 ලෙස අප විසින් යොමු කරන ලද ලිපියේ සඳහන් වෙනවා මොහොමඩ් තාසිම් මොහොමඩ් සහරාන් කියන පුද්ගලයා .

ස්වාමිනි එම ස්ථානය X 172 A (ii) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා

පි: ඔහු ෂැංග්‍රිලා හෝටලයේ ස්වයං ඝාතක ප්‍රහාරය එල්ල කරගනිමින් මිය යනවා ඊට අමතරව ගරු ස්වාමිනි මේ වාර්තාවේ අපි සඳහන් කරනවා අංක 50 විදියට මොහොමඩ් කාසිම් මොහොමඩ් රිල්වාන් කියලා පුද්ගලයෙක්

ප්‍ර: රිල්වාන් ඉන්නේ දැන් ඔයා 21 ප්‍රහාරය ගැනනේ කිව්වේ. එතකොට ප්‍රහාර ඉවරයි ද ඔතනින් ඒ දෙන්නාගෙන්?

පි: ඒ දෙන්නා තමයි මේ වාර්තාවේ ඉන්න ප්‍රහාරයේ ස්වයං ඝාතකයින් ඉන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර: හරි දැන් කියන්නේ කවුරු ගැන ද?

පි: 26 වෙනිදා පුපුර වාගත්ත

ප්‍ර: මීළඟට කියන්නේ 26 වෙනිදා පුපුරවා ගන්නා ලද පුද්ගලයින් පිළිබඳ එතකොට ඒක යටතේ මේ ලැයිස්තුවේ කවුද ඉන්නේ ?

පි: අංක 50 ඉන්නවා ගරු ස්වාමිනි මොහොමඩ් කාසිම් මොහොමඩ් රිල්වාන්

ස්වාමිනි එම ස්ථානය X 172 B (i) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා

FAIR COMMENT BY JEZEEM

පි: ඊට පස්සේ ගරු ස්වාමිනි අංක 55 ලෙස සඳහන් කරනවා මොහොමඩ් කාසිම් මොහොමඩ් සෙයින් කියන පුද්ගලයා

ස්වාමිනි එම ස්ථානය X 172 B (ii) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.

පි: ඊට අමතරව ගරු ස්වාමිනි අංක 84 ලෙස සඳහන් කරනවා හයාතු මොහොමදු මොහොමඩ් කාසිම් කියලා .

ප්‍ර: ඒ කවුද?

පි ඔහු සහරාන්ගේ පියා 2019.04.26 වෙනිදා සයින්දමර්දු නිවසේදී පුපුරවා ගෙන මරණයට පත්වෙනවා ගරු ස්වාමිනි.

ස්වාමිනි එම ස්ථානය X 172 B (iii) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා

පි: ඊට අමතරව ගරු ස්වාමිනි 2019.04.21 වෙනි දින ප්‍රහාරයෙන් අනතුරුව පලායමින් සිටියදී රාජ්‍ය බුද්ධි සේවාවේ දැනුම් දීම මත අත්අඩංගුවට පත්වෙනවා. මොහොමඩ් ඊබ්‍රහිම් මොහොමඩ් නවුෆර් පුද්ගලයා පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අත්අඩංගුවට ගන්නවා.

ප්‍ර: අනු අංක කීයද?

පි: අංක 61 විදියට ඔහුගේ නම සඳහන් වෙනවා.

ස්වාමිනි එම ස්ථානය X172 C (i) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා

ප්‍ර: ඔහු නවුෆර් කියන මවුලවි කියල හඳුන්වන්නේත් ඔහුද?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඔහු පදිංචි ලිපින විදියට ලිපින කීයක් දක්වලා තියෙනවද ඔබේ වාර්තාවේ ?

පි: ලිපිනයන් තුනක් සඳහන් කරලා තියෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ මොනවද?

පි: කාත්තන්කුඩි ලිපිනයන් දෙකක් සඳහන් කරලා තියෙනවා ඔහු පදිංචි වෙලා හිටපු ලිපියන් විදියට ඊට අමතරව අරක්යාල, කුලියාපිටිය කියන ලිපිනය සඳහන් කරලා තියෙනවා ඔහු ඒ ලිපිනයේ තමයි ප්‍රහාරයට කලින් කාලේ පදිංචි වෙලා හිටපු ලිපිනය

ප්‍ර: වෙන ?

පි: ඊට අමතරව ගරු ස්වාමිනි මගේ මතකයේ හැටියට මේ ලැයිස්තුවේ ඉන්න පුද්ගලයන්ගෙන්

ප්‍ර: දෙන්නෙක් පලා යන කොට අල්ල ගත්තා කිව්වා නේද?

පි: මේ ලැයිස්තුවේ අනෙක් පුද්ගලයාගේ නම නෑ ගරු ස්වාමිනි. නමුත් මාවනැල්ලේ සිදුවීමට පස්සේ

ප්‍ර: මේ ලැයිස්තුව ඉවර කරලා ඉමු?

පි: ගරු ස්වාමිනි මේ වාර්තාවේ සඳහන් පුද්ගලයන් අතරින් පුද්ගලයන් 80කට ආසන්න ප්‍රමාණයක් මගේ මතකයේ හැටියට අත්අඩංගුවේ ඉන්නවා දැනට පාස්කු ප්‍රහාරයට සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශය විසින් මට නම් එකිනෙක මතකෙම නැහැ ගරු ස්වාමිනි.

Presidential Secretariat Copy
FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර; ඒ කියන්නේ ඔබ දැන් සඳහන් කරන නම් හැරෙන්නට වෙනත් නමුත් එතකොට මේකේ අන්තර්ගත වෙනවා කියලානේ ඔබ කියන්නේ?

පි: ඔව් ගරු ස්වාමිනි ඒකේ මට එක නමක් ප්‍රකාශ කරන්න පුළුවන් ගරු ස්වාමිනි. මම ඊයේ දිනයේ සඳහන් කරා ඒ වගේම මෙම වාර්තාවේ අප විසින් සඳහන් කරලා තියෙනවා ගරු ස්වාමිනි පුද්ගලයෝ දෙන්නෙක් තුර්කියට ගිහින් පෙරලා අවා කියලා එක පුද්ගලයෙක් අබ්දුල් ලතීෆ් මොහොමඩ් ජමීල්, ඒ වගේම මේ වාර්තාවේ අපි සඳහන් කරනවා අංක 05 ලෙස ෆකීර් මොහොමඩ් ඉමාඩ් ඉම්තිසාම් කියලා මේ පුද්ගලයාත් තුර්කියට ගිහිල්ලා නැවත මෙරටට පැමිණි පුද්ගලයෙක්.

ස්වාමිනි එම ස්ථනය **X 172 D (i) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා**

පි: ඒ වගේම ගරු ස්වාමිනි මෙම වාර්තාවේ අංක 62 විදියට පුද්ගලයෙක් නමක් සඳහන් වෙනවා මොහමඩ් නිලාම් මොහොමඩ් ෆාරුක් අබු හයිතම් කියලා මේ පුද්ගලයා සම්බන්ධයෙන් ඊයේ දිනයේදී මම සඳහන් කරා පුද්ගලයෙක් 94 ක වාර්තාවක් යවනවා 2017 වර්ෂයේ දී කියලා ඒකේදී ඒ වාර්තාවට එක ඡේදයක අපි සඳහන් කරනවා මේ කියන පුද්ගලයා ත්‍රිකුණාමල ප්‍රදේශයක ගිහිල්ලා ගිනි අවි මිලදී ගැනීමට උත්සහ කිරීමක් සම්බන්ධයෙන් මේ පුද්ගලයාගේ නම මෙතන 62 විදියට නම සඳහන් වෙනවා ස්වාමි .

ස්වාමිනි කලින් වාර්තාවේ සඳහන් වූ පුද්ගලයින්ගේ මේ වාර්තාවේත් නම නැවත සඳහන් පුද්ගලයෙක් විදියට මේ නම හඳුනා ගන්නා නිසා එය X172 E (i) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කර සිටිනවා.

ප්‍ර: එතකොට ඒ වගේම ඊයේ දින මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කෙරුවා නේද සමහර විට නිලධාරීන් සමහර විට රජයේ විශ්‍රාම ගිය නිලධාරීන්, සම්බන්ධකම් තියෙන ISIS මතවාදය ප්‍රචර්ධනය කරන පෝෂණය කරන වහබ්වාදය පතුරන ඔවුන්ගේ ඥාතින් පිළිබඳවත් ඔබලා සොයා ගෙන තියෙනවා කියලා ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ අයව ලැයිස්තුගත කරලා තියෙනවද මේ X 172 A වාර්තාවේ?

පි: මෙම වාර්තාවේ ගරු ස්වාමිනි සඳහන් කරලා තියෙනවා සිරියාවට ගමන් කරන ලද පුද්ගලයන් කියලා .

ප්‍ර: නම් තියෙන තැන් කියන්නකෝ?

පි: දෙවන පිටුවේ සඳහන් කරලා තියෙනවා ගරු ස්වාමිනි අංක 03 විදියට මොහොමඩ් උනයිස් මොහොමඩ් අමීන් කියලා පුද්ගලයෙක්ගේ නමක් ගරු ස්වාමිනි 02 පිටුවේ වාර්තාවේ ඇමුණුමේ නෙමේ ගරු ස්වාමිනි .

ප්‍ර: කී වෙනි ඡේදයද?

පි: පුද්ගලයෝ 07 දෙනෙක් සම්බන්ධයෙන් සඳහන් කෙරෙනවා එකේදී දෙවනි වාට් එකේ අංක තුන විදියට සඳහන් වෙන පුද්ගලයා ගරු ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ සමීර්ද?

පි: මොහොමඩ් උනයිස් මොහොමඩ් අමීන් කියන පුද්ගලයා ගරු ස්වාමිනි.

ප්‍ර: මොහොමඩ් උනයිස් මොහොමඩ් අමීන් ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට අර තව විශ්‍රාමික විනිසුරුවරයෙක්ගේ ඥාතියෙක් කියලා කිව්වේ?

පි: අංක. 29 විදියට සඳහන් කරලා තියෙනවා ස්වාමිනි මොහොමඩ් උමයිර්,මොහොමඩ් නවාස්,උන්නි නවාස් කියලා. ඒ වගේම අංක 28 ලෙස සඳහන් කරලා තියෙනවා අබ්දුල්ලා, අබ්දුල් ගපූර් කියලා පුද්ගලයෙක් ඒ පුද්ගලයෝ දෙන්නාගේ නම් දෙක තමයි ගරු ස්වාමිනි .

ප්‍ර: ඒ දෙන්නම සලෆි, ලබ්දිකයෝ, අන්තවාදී මත කරෙහි දැඩි නැඹුරුවකට පත්ව සිටින අය යේමනයේ සලෆි අධ්‍යාපනය ලබලා තියෙන අය නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.

ස්වාමිනි ඒ අංක 28 කියන ස්ථානය ඒ ඥාතීත්වය අනුව ස්වාමිනි X 172 (i) වශයෙනුත්, අංක 29 කියන ස්ථානය X 172 F (ii) වශයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

පි: ඔහුගේ හක් සහෝදරයෝ දෙන්නාගේ පියාගේ නම සඳහන් වෙනවා ගරු ස්වාමිනි අංක. 120 විදියට රෂීඩ් මොහොමඩ් ඊබ්‍රාහිම් කියලා .

එම ස්ථානය ස්වාමිනි X 172 G (i) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: එතකොට සහෝදරයෝ ?

පි: ඊට අමතරව ගරු ස්වාමිනි අංක 121 විදියට සඳහන් කරනවා මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් කියලා

එම ස්ථානය ස්වාමිනි X172 G (iii) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා

පි ඒ වගේම ගරු ස්වාමිනි අංක 125 විදියට සඳහන් කරනවා මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල් හක් කියලා .

ස්වාමිනි එම ස්ථානය X 172 G (iii) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: එතකොට බිලාල් මොහොමඩ් අහමඩ් කවුද?

පි: ඒ පුද්ගලයත් මාලදිවයින් ජාතිකයෙක් විදියට තමයි ඉන්නේ නමුත් මොහු ශ්‍රී ලංකාවේ පුරවැසි භාවයත් තියෙනවා ඔහු ශ්‍රී ලංකාවේ ජාතික හැදුනුම් පතක් ඔහුට තියෙනවා. ඔහු මේ ඔහු මතවාදයට නැඹුරු වෙච්ච පුද්ගයලයෙක් ඒ වගේම ගරු ස්වාමිනි මෙම වාර්තාවේ අපි අංක.116 විදියට පුද්ගලයෙක්ගේ නමක් සඳහන් කරලා තියෙනවා නයිජල් වාවිඩ් ටර්නාට් කියලා ඒ පුද්ගලයා සම්බන්ධයෙන් ගරු ස්වාමිනි මේ පුද්ගලයා සම්බන්ධයෙන් විදේශ අංශයකින් තොරතුරක් අනාවරණය වෙලා මේ පුද්ගලයා මෙරට රැඳී සිටිනවා සහ සලෆි මතවාදය දරනවා IS

FAIR COMMENT BY JEZEEM

මතවාදය දරනවා කියන එක ඒ අනුව මේ පුද්ගලයා හඳුනා ගන්නවා ඉන්න ප්‍රදේශයේ පසුව සොයා බැලීමේදී මෙම පුද්ගලයාට වලංගු විසා නැතිව මෙරට රැඳී සිටිනවා කියලා වාර්තා කරන්නවා ඒ අනුව අපි ආගමන විගමන දෙපාර්තමේන්තුවට දැනුම් දීලා මේ පුද්ගලයා මෙරටින් පිටුවහල් කිරීමට කටයුතු කරනවා ගරු ස්වාමිනි.

ප්‍ර: ඔබේ අවධානයට මම මේ 107 වශයෙන් ඔබ නම් කර තිබෙන ස්ථානය බලන්න?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: මොහොමඩ් ඉස්මත් රිස්වින් ඒ පුද්ගලයා ගැන ඔබ මේ ලැයිස්තුවට ඇතුලත් කරලා තියෙනවා නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඔව් එතකොට ඒ ඔය ලැයිස්තුවේ අඩංගු කරලා තියෙන්නේ ඔය කරුණු 2019 ජනවාරි මාසේ 31 වෙනිදා වෙන කොට නේද ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඔබ ඒ ලැයිස්තුවේ අවසාන කොලමේ වෙනත් කරුණු කියන මාතෘකාව යටතේ ඔහු ඉදිරියෙන් ලියලා තියෙනවා නේද IS සංවිධානයේ මතවාද සමාජ ජාලා හරහා ප්‍රචාරය කරනු ලබයි කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඔබ දැන ගෙන හිටියද ඔය 2019 ජනවාරි 31 වන විට ඔහු නිරාගාමික තැනැත්තෙක් කියලා?

පි: ගරු ස්වාමිනි මේකේදි අපි හඳුනා ගැනීම් කරනවා සමාජ ජාල Face book වගේ දේවල් IS මතවාදය හුවමාරු කරන පුද්ගලයෝ ඒ අතරේ තමයි මේ පුද්ගලයාගේ නම සඳහන් වෙන්නේ

ප්‍ර: ඔව් ඒක තමයි මං අහන්නේ ඒ නිසානේ ඕක ලියලා තියෙන්නේ මං අහන්නේ ඔබලාගේ ඔය තොරතුරු රැස් කිරීමේ දී අනාවරණය වුණාද මේ තැනැත්තා මොහොමඩ් ඉස්මත් රිස්වින් කියන තැනැත්තා යම් අවස්ථාවකදී ජමාතේ ඉස්ලාම් සංවිධානයේ ශිෂ්‍ය සංවිධානයට බැදිලා ක්‍රියාකාරි විදියට කටයුතු කරා කියා කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි මෙම පුද්ගලයා ශ්‍රී ලංකා ජමාත් ඉස්ලාම් සංවිධානයේ සමබන්ධකම් තිබුණා වගේම මොහු ඇතැම් දේවල්වලට විරුද්ධත්වය පළ කලාම මොහු සංවිධානයේන් ඉවත් වුනා කියන එක සහ ඒ දේවල් වර්තා වෙලා තිබුණා.

ප්‍ර: ඒ කියන්නේ ඔහු ඉස්සෙල්ලා ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ ඉදල ඊට පස්සේ නෑ ඉස්සෙල්ලා ජමාතේ ඉස්ලාම් සංවිධානයේ ඉදලා යම් අවස්ථාවකදී තවුහිද් ජමාත් සංවිධානයේ ඉඳලා අනතුරුව ඔබ දන්නවද ඔහු මැදපෙරදිග සෞදි අරාබියාවේ රක්ෂාවකට ගියා කියලා?

පි: මට නිශ්චිත මතකයක් නැහැ ගරු ස්වාමිනි පුද්ගලයා ගැන

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔහු උපතින් ඉස්ලාම් ආගම නැත්ම් මුස්ලිම් ජාතිකයෙක් ඇඳහුවේ ඉස්ලාම් ආගමද එත කොට ඔබ කිව්ව විදියට ඔහු ජමාතේ ඉස්ලාම් සංවිධානයේ ශිෂ්‍ය සංවිධානයේ ක්‍රියාකාරි සමාජිකයෙක් විදියට හිටියා ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: නමුත් ඔබලාට දැන ගන්නට හම්බුනාද යම් අවස්ථාවකදී ඔහු එම සංවිධානයේ කටයුතුවලින් ඈත් වුන බව ?

පි: මෙම පුද්ලයා සම්බන්ධයෙන් මගේ මතකයේ හැටියට මොහු හා සම්බන්ධ පුද්ගලයන් කීප දෙනෙක් සම්බන්ධයෙන් මට දින වකවානු හරියට මතක නෑ ස්වාමිනි. නමුත් පොලිස්පතිතුමා විසින් යොමු කරන ලද ලිපියකට පුද්ගලයෝ කීප දෙනෙක් සම්බන්ධයෙන් විමර්ශන කරලා වාර්තා කරනවා ඒ නමක් විය හැකියි මට බොහෝ දුරට මතකයේ තියෙන විදියට.පුද්ගලයා සම්බන්ධයෙන් මට නිශ්චිත වෙනත් තොරතුරු මතකයක් නෑ ස්වාමිනි.

ප්‍ර: ඔබ දැනගෙන හිටියාද යම් අවස්ථාවකදී ඔහුව සාතනය කරන්නට සහරාන් විසින් පුද්ගලයින් කණ්ඩායමක් එවා තිබූ බව? ඔබේ බුද්ධි අංශයේ තොරතුරුවලට එය හසුවුනාද ?

පි: ගරු ස්වාමිනි පාස්කු දින සිදුවීමෙන් පස්සේ සිදු කරන ලද විමර්ශනවලදී අනාවරණය වුනා පුද්ගලයින් කීපදෙනෙක් සාතනය කිරීමට උත්සහ ඒ කියන්නේ සහරාන්ලාගේ ජාලයේ තිබුණා කියලා ඒ අතරේ මේ පුද්ගලයාගේ නම තිබුණා ඒ වගේම තවත් පුද්ගලයන්ගේ නම් කීපදෙනෙක් ගැන කිය වුණා.

ප්‍ර: එතකොට මොහුගේ එම කරුණ පිළිබඳව ඔබට අනාවරණය වුණා නේද,?

පි: පාස්කු ප්‍රහාරයෙන් පස්සේ සම්බන්ධ විමර්ශනවලදී කීප දෙනෙක්ගේ නම් සඳහන් වුණා ගරු ස්වාමිනි. මුලින්ම 2017 .03.10 අලියාර් හන්දියේ සිද්ධියට සම්බන්ධ රහුත් මවුලවි සම්බන්ධයෙන් වගේ ඊට අමතරව ජමෙයිතුල් උලමා සංවිධානයේ මුක්ති කියන පුද්ගලයා සම්බන්ධ, ඒ වගේම මෙම පුද්ගලයා නම් කීපයක් සම්බන්ධයේ රිස්වි මුත්ති අනාවරණය වීමක් වුනා ස්වාමිනි.

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබට කියන්නට පුළුවන්ද මොකක්ද රිස්වි මුත්ති කියන පුද්ගලයා ගැන අනාවරණය වෙච්ච කරුණු?

පි: ගරු ස්වාමිනි රිස්වි මුත්ති කියන පුද්ගලයා ශ්‍රී ලංකා සමාවෙන්න ගරු ස්වාමිනි සමස්ථ ලංකා ජමෙයිතුල් උලමා සභාවේ මුක්තිවරයෙක් විදියට එහෙම නැත්නම් සභාපතිවරයා විදියට ඔහු කටයුතු කරනවා ඔහු ආගමික කටයුතුවලදී අර වහාබි සලපි දෙකට වඩා වෙනත් පැත්තකට

FAIR COMMENT BY JEZEEM

නැඹුරු වෙනවා කියන එක නිසා සහරාන් ගේ ජාලය විසින් ඔහුට ඔහු ඉස්ලාම් නෙමේ කියන වගේ පණිවිඩයක් තමයි ගොඩාක් වෙලාවට කරා කියන දේ තමයි ස්වාමිනි අනාවරණය වෙලා තිබුණේ. ඒ අවස්ථා කීපයකදී ස්වාමිනි සහරාන්ගේ සමාජ ජාලාවලත් අපි දැකලා තියෙනවා රිස්වි මුක්ති කියන පුද්ගලයා සම්බන්ධයෙන් විවේචනය කරලා සටහන් යොදලා තියෙනවා ගරු ස්වාමිනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඔබට මතකද 2019 මාර්තු මාසේ 21 වෙනිදා ශ්‍රී ලංකාවෙන් ශ්‍රී ලාංකිකයෝ 4 දෙනෙක් මාළ දිවයින බලා ගිහිල්ලා මාල දිවයිනේ මුස්ලිම් පල්ලිවලදී තරුණයින් ඔවුන්ගේ මතවාදයට නැඹුරු කරගැනීමේ කටයුතු සිදු කරලා තිබුණු බවට ඔබේ සේව වාවට තොරතුරු ලැබිලා තිබුණා ?

පි: ගරු ස්වාමිනි මගේ මතකයේ හැටියට වෙනත් සේවාවකින් හෝ තැනකින් තමයි යම් තොරතුරක් ලැබිලා තිබුණේ ඒ සම්බන්ධයෙන් මගේ මතකයේ හැටියට වාර්තාවක් යවලා තියෙනවා පුද්ගලයෝ කීප දෙනෙක් සම්බන්ධයෙන් .

ප්‍ර: ඔබලා ඒ සම්බන්ධයෙන් කරුණු සොයා බැලුවද?

පි: සොයා බැලීමක් කරලා තියෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර: එහෙම කරුණු සොයා බලලා ඒ 2019.03.21 වෙනිදා සිදුවෙලා තිබුණ ඒ සිද්ධිය පිළිබඳව 2019. මැයි මාසේ 18 වෙනිදා වර්තාවක් ඉදිරිපත් කළාද වැඩ බලන පොලිස්පති සි.ඩී.වික්‍රමරත්න මහත්මයාට ? දැක්කොතින් ඔබට අදුරන්න පුළුවන්ද ඒ වාර්තාව ඔබ රැස් කරනවානේ මේ තොරතුරු?

පි: පුළුවන් ගරු ස්වාමිනි.

ප්‍ර: ගිහිල්ලා තියෙන අය ගිහිල්ලා තියෙන්නේ කවදද මොන ගුවන් යානයෙන්ද ඇවිල්ලා තියෙන්නේ කවද්ද, ඔවුන් ගුවන් තොටුපලේ දී කරන්න හදලා තියෙන්නේ මොනවද මාලදිවයින් ජාතිකයෝ කීදෙනෙක් මේ අය සමඟ සම්බන්ධ වෙලා තියෙනවද ලංකාවේදී කියන ඒ කරුණු ඔක්කෝම කියන්න,

පි: ගරු ස්වාමිනි මගේ මතකයේ හැටියට මේ පාස්කු දින සිදුවීමෙන් පස්සේ විවිධ ආයතන සහ දේශීය සහ විදේශීය වශයෙන් තොරතුරු විශාල ප්‍රමාණයක් වර්තා වුණා ඒ වාර්තා වන තුරු මගේ සියට සියක් නිවැරදි නොවෙන් පුළුවන් ගරු ස්වාමිනි මගේ මතකයේ හැටියට මේ සම්බන්ධ වන තොරතුරු පොලිස්පතිතුමා වෙත වාර්තා වීමක් සිදු වුණා. මට නිශ්චිතව මතක නැහැ මේකේ තියෙන පුද්ගලයන් සම්බන්ධයෙන් නිවැරදි තොරතුරක් කියන්න ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබට මතක නැහැ?

පි: මේ ඒ පාස්කු දින ප්‍රහාරයෙන් පස්සේ ආපු සියලු වාර්තා තොරතුරු ලැබු සියලු තොරතුරු ඒ විදියටම ගොඩාක් අවස්ථාවලදී පොලිස්පතිතුමා වෙත යොමු වීමක් තමයි සිදු වුනේ.

ප්‍ර; එතකොට ඔබ මේ පිළිබඳව තොරතුරු රැස්කිරීමක් සිදු කලේ නැද්ද ?

පි: මේ සම්බන්ධව මට නිශ්චිතව සඳහනක්.

ප්‍ර: කමක් නැහැ ඒක නැත්නම් අපි එතනින් ඉදිරියට යං ඔබට මතකද 2019 අප්‍රේල් මාසේ 05 වෙනිදා ඔබේ සහකාර අධ්‍යක්ෂවරයා ඔබට යම් තොරතුරක් දුන්නා විශ්ලේෂණය කරලා දෙන්න කියලා ?

පි: මතකයි ගරු ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඒ තොරතුරේ අඩංගු වුණේ?

පි: ගරු ස්වාමිනි ඒ තොරතුරේ සඳහන් වුණේ සහරාන් නම් කීපයක් තිබුණා ස්වාමිනි නම් රක් මගේ මතකයේ හැටියට

ප්‍ර: දැන් තියෙනවද ඒ තොරතුර?

පි: මගේ ළඟ නැහැ ස්වාමිනි.නම් 06 ක් වගේ තිබුණා ඒ වගේම IS සංවිධානය විසින් non believers

මා ඔහුගෙන් විමසුවේ ස්වාමිනි 2019 අප්‍රේල් මාසේ 05 වෙනිදා ඔහුට යම් කාර්යක් කිරීමට යම් තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා උපදෙස් ලැබුණාද කියලා ඔහු කිව්වා ඒ සම්බන්ධයෙන් තොරතුරක් ලැබුණා කියලා ඔහු ඒ පිළිබඳව තමයි පැහැදිලි කරන්නේ

පි: ගරු ස්වාමිනි 2019.04.05 වෙනිදා තොරතුරක් ලබා දෙනවා මගේ සහකාර අධ්‍යක්ෂතුමා විසින් ඒ තොරතුරේ සඳහන් වුණේ නම් 06 ක් මගේ මතකයේ හැටියට ඒ වගේම IS සංවිධානය විසින් අන්‍යාගමිකයෝ නැත්නම් ඔවුන් කාෆිර්ලා කියලා තමයි හඳුන්වන්නේ ඝාතනය කිරීමට යොදා ගන්නා ක්‍රමවේද Suicide attack මගේ මතකයේ හැටියට vehicle, knife, attack , ඒ වගේ කරුණු 04 ක් මගේ මතකය හැටියට සඳහන් කරලා තිබුණා. ප්‍රහාරයක් එල්ල කරන්න සුදානමක් තියෙනවා කියන එක තමයි ස්වාමිනි ඒ තොරතුරේ සඳහන් වෙලා තිබුණේ. එතකොට ගරු ස්වාමිනි ඒකේ ඉන්න පුද්ගලයෝ අතරින් පුද්ගලයෝ කීපදෙනෙක්ගේ නම් සම්බන්ධයෙන් ඒ කියන්නේ ස්වාමිනි කෙටි නම්වලින් ස්වාමිනි සඳහන් වෙලා තිබුණේ ඊට පස්සේ ඒ පුද්ගලයා කවුද කියන එක සම්බන්ධයෙන් වාර්තාවක් නැවත මාගේ සහකාර අධ්‍යක්ෂකතුමාට වෙත යොමු කරන්න මා විසින් යොමු කරනවා ඊට පස්සේ ඒ වාර්තාව එතුමා අධ්‍යක්ෂකතුමා වෙත යොමු කරනවා ගරු ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබට විශ්ලේෂණය කිරීම සඳහා ලැබුණු ඔය තොරතුරු වල අඩංගුවුනේ ඔබ ඔය කිව්ව කරුණු පමණක්මද?

FAIR COMMENT BY JEZEEM

පි: මම කියපු කරුණු ටික තමයි ස්වාමිනි තිබුණේ.

ප්‍ර: ඒ කියන්නේ ඔබට නම් වගයක් ලැබුණා?

පි: නම් 06 ක් මගේ මතකයේ හැටියට තිබුණේ කෙටි නම් 06 ක් ඒ වගේම IS එකෙන් ප්‍රහාර දියත් කරන්න කියලා උපදෙස් දීලා තියෙන කරුණු 04 ක් මගේ මතකයේ හැටියට ගරු ස්වාමිනි. ඒ වගේම ප්‍රහාරයක් එල්ල කරන්න සුදානමක් තියෙනවා කියන එක තමයි සඳහන් කරලා තිබුණේ ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ කරුණු හැරෙන්නට මේ තොරතුරු ලැබුණේ කොහොමද, කොහෙන්ද එන්නේ කියන කරුණ පිළිබඳව ඔබට යම් දැනුම් දීමක් ලැබුණද?

පි: මගේ සහකාර අධ්‍යක්ෂතුමා විසින් ප්‍රකාශ කරනවා ඒ තොරතුරු ලැබෙන්නේ ඉන්දියාවෙන් කියලා. ඒ විදියට තමයි තොරතුරු ලබා දෙන්නේ ඉංග්‍රිසි භාෂාවෙන් තිබුණු කොලයක් දීලා ඒකේ තමයි වාර්තාවක් එතුමාට මං යවන්නේ.

ප්‍ර: එතකොට ඔබ දැක්කාද ඒ ලැබුණාය කියන තොරතුර?

පි; ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඔබට මා අවධානයට ලේඛනයක් යොමු කරනවා. ස්වාමිනි C4 B ලේඛනය සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා. ඔබ දැක්ක ලේඛනය මේ ලේඛනයද?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: C4 B ඔබට මේ ලේඛනය ඔබේ සහකාර අධ්‍යක්ෂවරයා එව්වේ කොහොමද?

පි: එතුමා විසින් ඒකට පිටසන් කිරීමක් කරලා තමයි මා වෙත ලබා දෙන්නේ .

ප්‍ර; ඒ කියන්නේ ඒ කොලයේද පිටිසන් කරේ?

පි: මට ඒ සම්බන්ධව නිශ්චිත මතකයක් නැහැ. ඒ පිටපතේ හෝ වෙන Attachment එකක හෝ මට ඒක නිශ්චිතව මතක නැහැ ගරු ස්වාමිනි නමුත් එතුමන්ගේ සටහනක් තිබුණා මා වෙත ලබා දීමේදී.

ප්‍ර: Whatsapp මාර්ගයෙන් යම් වෙලාවක පණිවිඩයක් ලැබුණද?

පි: මගේ මතකයේ හැටියට ඒ තොරතුරම ඊට පෙර දිනයේ වෙලාව හරියට මතක නැහැ ගරු ස්වාමිනි නමුත් මගේ සහකාර අධ්‍යක්ෂතුමා කියනවා ඒ පණිවිඩයම එතුමන්ට හම්බුණා කියලා ඒ සම්බන්ධයෙන් බලන්න කියලා තමයි උපදෙස් ලබා දුන්නේ.

ප්‍ර: මම අහන්නේ WhatsApp මාර්ගයෙන් ඔය සිද්ධියට අදාලව පණිවිඩයක් ලැබුණද කියලා?

පි: මට WhatsApp වලින් හම්බුන් නැහැ ස්වාමිනි නමුත් මගේ සහාකාර අධ්‍යක්ෂතුමා කිව්වා එතුමාට හම්බුනා කියන එක ඊට පසු දින මට මේ

FAIR COMMENT — BY JEZEEM —

අදාල වාර්තාව දීලා වාර්තාවක් ලබා දෙන්න කියන එක උපදෙස් දෙනවා ගරු ස්වාමිනි

ප්‍ර: එතකොට ඔබ ඔබේ සහකාර අධ්‍යක්ෂවරයා සමඟ ඔහුගේ නම දැනටමත් ලබා දීලා තියෙනවා ස්වාමිනි, කොපමණ කලක් රාජකාරි කරලා තියෙනවද?

පි: මගේ සහකාර අධ්‍යක්ෂතුමා ගරු ස්වාමිනි 2015 මට නිශ්චිත දිනය මතක නැහැ ස්වාමිනි නමුත් 2015 වර්ෂයේදී තමයි මේ අංශයේ අංශ භාර නිලධාරියා විදියට එන්නේ ඊට පස්සේ 2016 වර්ෂයේදී එතුමන් වැඩ බලන සහකාර අධ්‍යක්ෂවරයා විදියට මෙම අංශයේම ඉන්නවා. පස්සේ එතුමන් සහකාර පොලිස් අධිකාරි හැටියට උසස් වුණාට පස්සේ එතුමන් ඒ අංශයේ සහකාර අධ්‍යක්ෂවරයා විදියට එදා සිට 2019.12.31 වෙනකම් වගේ මගේ මතකයේ හැටියට කටයුතු කරනවා

ප්‍ර; එහෙමනම් ඔහුගේ අත්සන් ඔබ හඳුනනවද?

පි: හඳුනනවා ස්වාමිනි.

ප්‍ර: දිගු අත්සන් කෙටි අත්සන්?

පි: එතුමන් දිගු අත්සනක් යොදන්නේ නැහැ මගේ මතකයේ හැටියට එක අත්සනක් විතරයි එතුමාගේ තියෙන්නේ.

ප්‍ර: ඒ කියන්නේ ඔබට හොඳට හුරුපුරුදුයි ඒ අත්සන පිළිබඳව ඔහුගේ අත්අකුරු දන්නවද?

පි: දන්නවා ස්වාමිනි.

ප්‍ර; ඉලක්කම් දන්නවද?

පි: මතකයක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඉංග්‍රීසි ,සිංහල අත්අකුරු දෙකම දන්නවද?

පි; දන්නවා ගරු ස්වාමිනි.

ප්‍ර: මා ඔබේ අවධානයට අත්අකුරු වගයක් යොමු කරනවා. මෙන්න මේ ඉහල තියෙන අත්අකුරු කාගේද?

පි; මේ ගරු ස්වාමිනි මගේ සහකාර අධ්‍යක්ෂතුමාගේ එතුමාගේ අත්සන තියෙන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේ දී කොමිෂන් සභාවේ කටයුතු හෙට උදෑසන 10 වන තෙක් කල් තබනවා.

දැන් වේලාව. ප.ව.9.45

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.07.25 වේලාව: ප.ව. 04.30

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා, රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින නීතිඥ දුනික පෙරේරා මහතා සමඟ ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා පෙනී සිටී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>වැඩිදුර සාක්ෂි විමසීම.</u>

නම : සෙනරත් කෝනාර මුදියන්සේලාගේ රංජන් සෙනරත් බණ්ඩාර.

ප්‍රතිඥා දී කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: බණ්ඩාර මහත්මයා ඊයේ දින මේ ගරු කොමිෂන් සභාව කල්තබනු ලැබූ අවස්ථාවේ දී මා ඔබෙන් ප්‍රශ්නයක් විමසුවා. ඒ තමයි 2019/04 වැනි මාසේ 05 වැනිදා ඔබට යම් උපදෙසක් ලැබුණ ද කියලා යම් දත්ත විශ්ලේෂණයක් සිදුකිරීමට?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඒ වගේම මා ඊයේ දින ඔබට මෙම ලේඛනය පෙන්වා සිටියා. එතකොට ඔබ අඳුනාගත්තා ඒ මා පෙන්වන ස්ථානයේ තිබෙන අත්අකුරු වගේම අත්සන ඔබගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා වන සහකාර අධ්‍යක්ෂවරයාගේ බව?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඔබ එහි දී සඳහන් කරනු ලැබුවා ඔබට ලැබුණ තොරතුර C 04 B ලේඛනයේ අඩංගු මෙම තොරතුරුය කියලා?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: එහෙනම් ඔබට මේ ගරු කොමිෂන් සභාවට කියන්නට පුළුවන් ද එහෙනම් ඔබ කොයි ආකාරයට ද ඒ දත්ත විශ්ලේෂණය කළේ කියලා?

උ: පුළුවන් ගරු ස්වාමීනි.

ප්‍ර: මොකද්ද කළේ ඔබ මේ තොරතුර ලැබුණට පස්සේ?

උ: ගරු ස්වාමීනි 2019/04/05 වැනි දින මා වෙත පෙන්වා දෙන ලද වාර්තාව මා වෙත ලැබෙනවා. එහි නම් 06 ක් වගේ සඳහන් වෙනවා. කෙටි නාමයන්. කෙටි නම් 06 කින් පුද්ගලයෝ 06 දෙනෙක් සම්බන්ධයෙන් සඳහන් කිරීමක් කරනවා. ඒ වගේම ප්‍රහාර එල්ලවන ක්‍රමවේදයන් 04 ක් සඳහන් වෙනවා. ඒ තොරතුර තමයි සඳහන් වෙන්නේ. ඊට පස්සේ මේ තොරතුර මා අතට පත් වෙනවා. එහිදී මා මේ තොරතුරේ තියෙන පුද්ගලයෝ සම්බන්ධයෙන් සඳහන් කරොත් ස්වාමීනි මේ තොරතුරේ සඳහන් වෙනවා මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් නැත්නම් නැෂනල් තවුහිද් ජමාත් සංවිධානයේ නායකයා සම්බන්ධයෙන්. ඔහු සම්බන්ධව ගරු ස්වාමීනි මම ඉදිරිපත් කරන්න කැමතියි 2018/02/24 ඉඳන් කෙටි දින වකවානු කිහිපයක් තුළ වාර්තා 11 ක් ඉදිරිපත් කරනවා. ඉදිරිපත් කරලා මා සඳහන් කරනවා මේ පුද්ගලයා අත්අඩංගුවට ගැනීමක් නොවුණහොත් මේ වගේ ප්‍රහාරයක් එල්ලවෙන්න තියෙන සම්භාවිතාවය 100% යි කියලා.

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: පැහැදිලි කර ගැනීම සඳහා මා ඔබෙන් අහන්නේ ඔබට C04 B ලේඛනයේ තිබෙන තොරතුරු දුන්නාම ඔබ යම් ක්‍රියාමාර්ගයක් අනුගමනය කරා කියලනේ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඒ අවස්ථාවේද දැන් ඔබ සඳහන් කරපු 2018 ඉඳලා සහරාන් හෂීම් සම්බන්ධයෙන් ගොනු කරන ලද වාර්තා 11 ක් ඔබ මේ දැන් සඳහන් කරපු ආකාරයට නිගමනයකට එළඹීම සඳහා පාදක කර ගත්තේ?

උ: මං ගරු ස්වාමීනි පැහැදිලි කරන්න උත්සාහ කළේ මේ තොරතුර එන්නේ මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් කියන පුද්ගලයා ප්‍රහාරයක් එල්ල කරන්න සුදානමක් තියෙනවා කියන කාරණය සහ ඒකේ දී පුද්ගලයෝ 06 දෙනෙක්ගේ කෙටි නාමයන් සඳහන් වෙනවා. ඒ වගේම ස්වාමීනි එකේ දී සඳහන් කරලා තිබෙනවා ක්‍රමවේදයන් 04 ක් සම්බන්ධයෙන්. එතකොට මේ ක්‍රමවේදය සහ මේ විදියේ ප්‍රහාර සැලසුම් සම්බන්ධයෙන් අවස්ථා 11 කදී මම highlight කරලා කියනවා මේ පුද්ගලයා අත්අඩංගුවට ගන්න ඕන නැත්නම් ප්‍රශ්නයක් වෙනවා කියලා.

ප්‍ර: ඒ කියන්නේ මීට පෙර අවස්ථාවල ?

උ: මීට පෙර අවස්ථාවල. ඒ වගේම ගරු ස්වාමීනි මේකේ දී මම කියනවා පොලීසියේ විශේෂ අංශයක් හරහා හෝ මේක අත්අඩංගුවට ගැනීම සිදු කරන්න අවශ්‍යයි කියන එක.

ප්‍ර: ඒ අවස්ථාවලදී ඔබ කියලා තියෙනවා?

උ: ඔව් ගරු ස්වාමීනි. ඒ වාර්තා ටික මා ළඟ මෙතැන තියෙනවා ස්වාමීනි. ඒ වගේම ගරු ස්වාමීනි ඒ වාර්තාවමත් ඊට කලින් 2018/12/23 වැනිදා සහ 25 වැනිදා මාවනැල්ල සහ ගම්පොළ ඒ වගේම පොතුහැර පොලිස් area වල ආගමික ප්‍රතිමා හානියෙන් පස්සේ භූමියෙන් බුද්ධි තොරතුරු රැස් කිරීමේ දී මා විසින් වාර්තා කරනවා. මේක සහරාන් මේක පිටුපස්සේ ඉන්නවා කියන එක. ඒ වගේම ගරු ස්වාමීනි එතැන් සිට අවස්ථා කිහිපයකදී වාර්තා කිහිපයක් අප විසින් යොමු කරනවා. සහරාන්ගේ සමීපතයින් සම්බන්ධව, සහරාන් එක්ක ළඟින් ආශ්‍රය කරන කට්ටිය සම්බන්ධව, ඒ වගේම මගේ මතකයේ හැටියට මං ළඟ වාර්තාවකුත් තියෙනවා ගරු ස්වාමීනි. 2019/03/01 වැනිදා වාර්තාවක් යොමු කරනවා. ඒකේ සඳහන් කරනවා සහරාන් පුහුණු කඳවුරු පවත්වනවා සහ ඒ පුහුණු කඳවුරුවල දේශන කරන්නේ මේ මේ පුද්ගලයෝ කියන එක සම්බන්ධව ඒ වගේම ගරු ස්වාමීනි 2019/03 මාසේ 29 වගේ දිනක මා ළඟ වාර්තාවක් තියෙනවා ගරු ස්වාමීනි. සඳහන් කරනවා මේ පුහුණු කඳවුරු කරන පුද්ගලයෝ නිවෙස්වල රැඳී සිටිනවා සමහර අය. වරෙන්තු තියෙන පුද්ගලයොත් ඉන්නවා කියන එක ගරු ස්වාමීනි.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ කිව්වා 100% ක් වෙන්න පුළුවන් කියලා මෙය 100% ක් පරීක්ෂණවලදී තමන් කිව්වේ වාර්තාවේ සඳහන් වෙනවයි කියලා මොකද්ද ඒ ?

උ: ගරු ස්වාමීනි විදේශයන්වල මේ වගේ ඒ කියන්නේ සහරාන් වගේ IS ඉස්ලාම් රාජ්‍යය වෙනුවෙන් කැමැත්තෙන් පසුවන පුද්ගලයෝ පහුගිය කාලයේ ප්‍රහාර එල්ල කරපු ප්‍රවණතාවය සහරාන්ගේ හැසිරීම් සම්බන්ධයෙන් අපිට තිබුණු බුද්ධි තොරතුරු වලදී සහරාන් ප්‍රහාරයක් එල්ල කරන්න උත්සහායකින් ඉන්නවා කියන දේ අපි සනාථ කරමින් තමයි වාර්තා යොමු කළේ ස්වාමීනි.

ප්‍ර: ඒ වාර්තා තමන්ගේ අධ්‍යක්ෂතුමාට යොමු කරාද?

උ: යොමු කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් එවැනි වාර්තා තිබෙන අවස්ථාවක යම් බුද්ධි තොරතුරක් ලැබුණාම ඒ පුද්ගලයින් පිළිබඳව තව දුරටත් පරීක්ෂණ කරන්න අවශ්‍යතාවයක් තියෙනව ද?

උ: ගරු ස්වාමීනි මේකේ සඳහන් වෙන පුද්ගලයෝ අතරින් අපි පුද්ගලයෝ මේ සියළු දෙනාම වගේ අපි මීට කලින් වාර්තා කරන ලද පුද්ගලයෝ. ඒ වගේම මේ තොරතුර ආවමත් මේ තොරතුරේ සඳහන් පුද්ගලයෝ සහරාන්, රිල්වාන් කියන එක සම්බන්ධයෙන් වාර්තාවක් මගින් සඳහන් කරනවා ගරු ස්වාමීනි.

ප්‍ර: ඔවුන්ගේ යාථා තත්ත්වය රාජ්‍ය බුද්ධි සේවය දැනගෙන හිටියා මේ අවස්ථාවේ?

උ: ඒ කියන්නේ ගරු ස්වාමීනි අපි 2019 දෙසැම්බර් මාසේ ආගමික ප්‍රතිමා හානියෙන් පස්සේ දැනට තියෙන තත්ත්වය සහ වනාතවිල්ලුවේ පුපුරන ද්‍රව්‍ය සොයා ගැනීම. එතැනින් පස්සේ අත්අඩංගුවට පත් වූ පුද්ගලයන්ගේ ප්‍රශ්න කිරීම්වලදී වාර්තා වෙනවා මෙයාලා පුහුණු කඳවුරු පවත්වනවා පුපුරන ද්‍රව්‍ය අත්හදා බැලීම් කරනවා. ඒ කාරණාත් එක්ක ස්වාමීනි මේ තත්ත්වය ගැන අපි දිගින් දිගටම වාර්තා කරනවා.

ප්‍ර: මේ අවදානම තමන් වටහාගෙන තිබ්බේ?

උ: ඒ කියන්නේ ගරු ස්වාමීනි මෙයාලා ඕනෑම මොහොතක යමක් කරන්න තියෙන සම්භාවිතාවය ගැන අපි වටහාගෙන තිබුණා. ඒ අනුව ගරු ස්වාමීනි මේ තොරතුරත් අප අතට පත් වුණාම ඒකේදීත් මේ වෙන කොට ගරු ස්වාමීනි දවසින් දවස දවසකට වාර්තා දෙක වගේ ඒ වගේ සමහර අවස්ථාවලදී සතියකට සැරයක් වගේ නිරන්තරයෙන් සහරාන් සම්බන්ධයෙන් වාර්තා ගණනාවක් යනවා. ඒ වගේම මේ සහරාන් ඇතුළු ජාලයේ ඉන්න පුද්ගලයෝ පාස්කු දින ප්‍රහාරයෙන් ඝාතනය වුණ මං ඊයේ දිනෙත් සඳහන් කරා ගරු ස්වාමීනි. ඒ පුද්ගලයෝ කිහිප දෙනෙක් මේ වාර්තාවල ඉන්නවා. ඒ වගේම දැනට අත්අඩංගුවේ ඉන්න මේ ජාලය

FAIR COMMENT BY JEZEEM

මෙහෙයවපු පුද්ගලයෝ විශාල ප්‍රමාණයක් දැනට අත්අඩංගුවට පත්වුණේ ප්‍රහාරයෙන් පස්සේ. ඒ ගන්න කලින් අපි වාර්තා කිරීම් කරනවා ගරු ස්වාමීනි. ඒ වගේම මේ තොරතුරත් එනකොට මේ තොරතුරේ තියෙන්නෙත් මා අර පෙර වාර්තා කරන ආකාරයේම ප්‍රහාරයක් එල්ල වෙන්න තියෙන සැලසුමක් සම්බන්ධයෙන් ගරු ස්වාමීනි. ඒ අනුව මා ඒ සිද්ධිය වාර්තා කරනවා. මේ තොරතුරත් ඒ විදියටම මම මගේ සහකාර අධ්‍යක්ෂතුමාට ඉදිරිපත් කරනවා ගරු ස්වාමීනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: ඔබ ඒ අවස්ථාවේ දී සඳහන් කරා වාර්තා 2018 ඉඳලා වාර්තා 11 ක් ඔබ සහරාන්ට අදාළව ඉදිරිපත් කරලා තිබ්බයි කියලා?

උ: 11 ක් කියලා අදහස් කළේ ස්වාමීනි 11 ට වැඩිය ඉදිරිපත් කරලා තියෙනවා. නමුත් ඒකේ දී මා විශේෂයෙන් ඉස්මතු කරලා තියෙනවා මෙයා අත්අඩංගුවට ගත්තේ නැත්නම් මෙන්න මේ වගේ ප්‍රහාරයක් වෙන්න තියෙන සම්භාවිතාවය ගැන මම ඉස්මතු කිරීමක් කරලා තියෙනවා ගරු ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ C 04 B ලේඛනයේ අඩංගු තොරතුරු විශ්ලේෂණය කරන අවස්ථාවේ දී ඔය කියන තොරතුරු අඩංගු වාර්තා 11 ත් ඉදිරිපත් කෙරුවද ඔබේ සහකාර අධ්‍යක්ෂවරයට?

උ: මා දන්නා විදියට ගරු ස්වාමීනි මගේ සහකාර අධ්‍යක්ෂතුමා මේ සම්බන්ධව දැනීමක් තිබෙන පුද්ගලයෙක් මොකද ඒ වගේම මා එතුමාට නිරන්තරයෙන් සහරාන් සම්බන්ධයෙන් දැනුම්දීම් කරනවා. එතකොට මගේ සහකාර අධ්‍යක්ෂතුමා නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාට දැනුවත් කරනවා. අපි දන්නවා මේ තියෙන සම්භාවිතාවය මේකේ තියෙන අපි හැම සිද්ධියක්ම එකින් එකට දන්නවා. ඒ නිසා මා මගේ ඒ යොමු කරන වාර්තාවට වානතවිල්ලුවේ Recovery එක නැත්නම් බුදුපිළිම ඒ වගේ ඒවා ඇතුළත් කරන්නේ නැහැ. නමුත් මේ හැම සිද්ධියක්ම දෛනික වාර්තා කරන අතරේ තමයි මේ විදේශ රටින් එන බුද්ධි තොරතුර එන්නේ. ඒකේ තියෙන්නෙත් අර මා පෙර සඳහන් කරපු මා විසින් වාර්තා කරනු ලබන ආකාරයේම ප්‍රහාර සැලසුමක් සම්බන්ධයෙන් තමයි ගරු ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ පෙන්නුම් කරන ඒ වාර්තා 11 මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන් ද?

උ: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: ඔබ මීට පෙරත් සහරාන් සම්බන්ධයෙන් කරන ලද නිර්දේශ පිළිබඳව මේ ගරු කොමිෂන් සභාවේ අවධානය යොමු කරමින් 2018 වසරේ වාර්තාවන් 11 ක් මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා නේද?

FAIR COMMENT BY JEZEEM

උ: ඔව් ගරු ස්වාමීනි.

ස්වාමීනි ඒ අනුව 2018 පෙබරවාරී මස 24 වන දින අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි සේවාව විසින් පොලිස්පතිතුමා වෙත NTJ නායකයා විසින් ජිහාද් සම්බන්ධව සිය අනුගාමිකයින් දැනුවත් කිරීම යන මාතෘකාව යටතේ යවා ඇති මෙම වාර්තාව X174 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමටත් එසේම සාක්ෂිකරු විසින් එහි මෙම සහරාන්ට අදාළව කර ඇති නිර්දේශ දැන් කියවනු ලබනවා ස්වාමීනි. එය කියවීමෙන් අනතුරුව එය X 174 A වශයෙනුත් ලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

උ: මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් විසින් ඉස්ලාම් දේශකයින් සහ සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සභාව ACJU විවේචනය කරමින් අල්ලාහ්ගේ ඉගැන්වීම් නිවැරදිව අනුගමනය කරන එකම මවුලවීවරයා තමා ලෙසත්, IS සංවිධානය කුරානය සහ හදීස් මූලික ඉගැන්වීම් නිවැරදිව අනුගමනය කරමින් ඉස්ලාමය පෝෂණය කරන එකම සංවිධානය ලෙසටත් ප්‍රචාරය කිරීම තුළ දැඩිමතදාරී මුස්ලිම් තරුණ කොටස් ඔහු වටා ඒකරාශී වීමේ ප්‍රවණතාවය සීඝ්‍රයෙන් වර්ධනය වී ඇත. එමෙන්ම මෙලෙස ආකර්ශනීය ලෙස දැඩිමතදාරී මුස්ලිම් තරුණ කොටස් ඔහුගේ මතවාදය වටා ඒකරාශී වීම සැලකිල්ලට ගැනීමේ දී යම් කලහකාරී ක්‍රියාවක් සඳහා එවැනි තරුණ කොටස් පහසුවෙන් පෙළඹවීමේ හැකියාවක් එවැනි ප්‍රචාරණයන් තුළින් ඔහු විසින් නිර්මාණය කරගෙන ඇති බව පෙනී යයි.

මීළඟට ස්වාමීනි 2018 මැයි මස 19 වැනි දින රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂ විසින් නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත NTJ නායකයා විසින් නබිතුමාගේ යුද්ධයේ ඉතිහාසය සහ ජිහාදය සම්බන්ධව සිය අනුගාමිකයින් දැනුවත් කිරීම යන ලිපිය X 175 ලෙස ලකුණු කරන්නට අවසර අයදිනවා. එහි සාක්ෂිකරුගේ අවධානයට ඔහු විසින් එම ලිපියේ අවසානයට සඳහන් කොට ඇති නිර්දේශය යොමු කරමින් ස්වාමීනි එම නිර්දේශය ඔහු විසින් කියවීමෙන් අනතුරුව X 175 A වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

උ: මෙම අන්තවාදී දේශකයා විසින් 2016 වර්ෂයේ සිට IS සංවිධානයේ මතවාදය සාධාරණීකරණය කරමින් අන්‍යාගමිකයින් ඝාතනය කරමින් ඉස්ලාම් රාජ්‍යයක් ඇති කළ යුතු බවට ප්‍රචාරණයන් සිදුකිරීමත් 2017/03/10 වන දින කාත්තන්කුඩි ප්‍රදේශයේ දී ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ පිරිසක් විසින් ඉස්තිපාද් අහලූල් සුන්නතුල් වල් ජමාත් සංවිධානයේ පිරිසකට පහරදීමේ සිද්ධියට අදාළ ප්‍රධාන සැකකරු වන මොහු අධිකරණය මඟහරිමින් සැඟව සිටිමින් යම් කලහකාරී ක්‍රියාවක් සඳහා මුස්ලිම් තරුණයින් පෙළඹවීමේ අදහසින් එවැනි ප්‍රචාරණයන් සිදුකිරීමත් සැලකිල්ලට ගෙන මොහු පොලීසියේ විශේෂ අංශයක් හරහා

FAIR COMMENT BY JEZEEM

අත්අඩංගුවට ගෙන සමාජගත කිරීම සඳහා කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව නිරීක්ෂණය වේ.

ස්වාමීනි එම ඡේදය 175 A ලෙස ලකුණු කිරීමටයි අවසර පතන්නේ.

මීළඟට සාක්ෂිකරු විසින් 2018 මැයි මස 24 වන දින ඉදිරිපත් කරනු ලබන එම දාතමින් ඉදිරිපත් කරන රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා විසින් පොලිස්පතිවරයා වෙත යවා ඇති නැෂනල් තවුහිද් ජමාත් NTJ නායකයා විසින් ජිහාද් කිරීමට පසුබසින්න එපා යනුවෙන් සමාජ ජාල හරහා විඩියෝ පටයක් යොමු කිරීම යන ශීර්ෂය යටතේ ඇති ලිපිය X 176 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර: එහි අවසාන ඡේදය සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා. මේ අවසාන ඡේදයෙන් මොකද්ද ඔබ කරලා තියෙන නිර්දේශය?

උ: ගරු ස්වාමීනි මෙලෙස අධිකරණය හා පොලීසිය මහහරිමින් කාත්තන්කුඩි ප්‍රදේශයෙන් පලා ගොස් මෙරට මුස්ලිම් තරුණ පිරිස් යම් කලහකාරී ක්‍රියාවක් සඳහා පෙළඹවීමට කටයුතු කරන මෙම පුද්ගලයා අත්අඩංගුවට ගෙන අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව යෝජනා කරමි.

එය X 176 A වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

මීළඟට 2018 ජූනි මස 07 වන දින අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි සේවාව විසින් ගරු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා වෙත පහත මාතෘකාව යටතේ එනම් නිසි ක්‍රමවේදයකින් තොරව ආගමික ස්ථාන පවත්වාගෙන යාම හේතුවෙන් ආගමික සංවිධාන සහ ජාතීන් අතර ගැටුම්කාරී තත්ත්වයන් උද්ගතවීම යන මාතෘකාව යටතේ යවා ඇති එම ලිපිය X177 ලෙස ලකුණු කිරීමට අවසර පතනවා.

එහි ස්වාමීනි 2 වන පිටුවේ අවසාන ඡේදය සාක්ෂිකරුගේ අවධානයට යොමු කරමින් ඔහු එය කියවා අවසන් වුණු පසු එම ඡේදය X 177 A වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

උ: ඉස්ලාම් ලබ්දිකයන්ගේ මූලික ඉගැන්වීම් වන කුරානය සහ හදිස්වල ආගම වෙනුවෙන් උපරිම ලෙස කැපවීමට කර ඇති අභිප්‍රේරණය තුළ ඉස්ලාම් ලබ්දිකයින් සිය ආගම වෙනුවෙන් ඕනෑම ක්‍රියාවක නිර වීමට පසුබට නොවන බැවින් ආගම මුල් කරගෙන මෙරට අන්තවාදී හෝ ත්‍රස්තවාදී ක්‍රියාවන් ඇතිවීම වළක්වා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් වී ඇත. ඒ අනුව නිසි ක්‍රමවේදයකින් තොරව මෙරට තැනින් තැන ආගමික ස්ථාන ඉදිකිරීම පාලනය කිරීම සඳහා සියළු ආගම්වලට බලපාන පොදු නීති පද්ධතියක් සකස් කර ආගමික හෝ ජාතික හැඟීමකින් තොර රාජ්‍ය නිලධාරීන් හරහා අදාළ නීති පද්ධතිය ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය බව පෙනී යයි.

FAIR COMMENT BY JEZEEM

ස්වාමීනි මීළඟට 2018 ජූනි මස 15 වන දින රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා විසින් නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පහත මාතෘකාව යටතේ එනම් NTJ නායකයා විසින් ශුද්ධ කාරක බද්ධ හෙවත් සකාත් පිළිබඳව සිය අනුගාමිකයන් දැනුවත් කිරීම සම්බන්ධව යන මාතෘකාව යටතේ ඉදිරිපත් කොට ඇති ලිපිය X 178 ලෙස ලකුණු කරමින් එහි දෙවන පිටුවේ අවසාන ඡේදයට පෙර ඡේදය සාක්ෂිකරුගේ අවධානයට යොමු කරමින් ඔහු එය කියවා අවසන් වූ පසු එම ඡේදය X 178 A අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

උ: වහාබි මතවාදය දරණ M.C.M. සහරාන් 2016 වර්ෂයේ සිට IS සංවිධානයේ මතවාදය සාධරණීකරණය කරමින් අන්‍යාගමිකයින් ඝාතනය කරමින් ඉස්ලාම් රාජ්‍යයක් ඇති කළ යුතු බවට ප්‍රචාරණයන් සිදු කිරීමත්, 2017.03.10 වන දින කාත්තන්කුඩි ප්‍රදේශයේ ඇති වූ ගැටළුකාරී තත්ත්වයෙන් පසු අධිකරණය මගහරිමින් ප්‍රදේශයෙන් පලාගොස් සිටිමින් යම් කලහකාරී ක්‍රියාවක් සඳහා මුස්ලිම් තරුණයින් පෙළඹවීමේ අදහසින් මෙවැනි ප්‍රචාරණයන් සිදු කිරීමත් සැලකිල්ලට ගැනීමේ දී මොහු කඩිනමින් අත්අඩංගුවට ගෙන මෙම ප්‍රචාරනයන් නියාමනය සහ මොහු සමාජගත කිරීමට වැඩ පිළිවෙළක් සකස් කිරීම අත්‍යවශ්‍ය බව පෙනී යයි.

මීළඟට ස්වාමීනි 2018 ජූනි මස 24 වන දාතමින් රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා විසින් ජාතික බුද්ධි ප්‍රධානී වෙත පහත මාතෘකාව යටතේ එනම් ඉස්ලාම් රාජ්‍යයට අපහාස කරන අය අල්ලාහ්ට බිය වන්න යනුවෙන් NTJ නායකයා විසින් සිය සමාජ ජාල ගිණුම හරහා විඩියෝ පටයක් ප්‍රචාරය කිරීම යන ලිපිය X 179 ලෙස ලකුණු කරමින් එහි දෙවන පිටුවේ අවසාන ඡේදයට පෙර ඡේදයට සාක්ෂිකරු විසින් කියවා අවසන් වූ පසු එම ඡේදය X 179 A වශයෙන් ලකුණු කිරීමට අවසර පතමි.

උ: 2017/03/10 දින කාත්තන්කුඩි ප්‍රදේශයේ දී ජාතික තවුහිද් ජමාත් සංවිධානය සහ ඉස්තිහාද් අහලූල් සුන්නතුල් වල් ජමාත් සංවිධානය අතර ඇති වූ ගැටුමෙන් පසු සැගව සිටිමින් IS සංවිධානයේ ක්‍රියාවලිය සාධාරණීකරණය මෙම දැඩිමතදාරී පුද්ගලයා අත්අඩංගුවට ගෙන මෙම ක්‍රියාවලිය නතර කිරීමට කටයුතු නොකිරීම තුළින් ඔහුගේ මතවාදය වටා ඒකරාශී වන පුද්ගලයින් IS සංවිධානයේ අරමුණු වෙනුවෙන් මෙරට දී යම් ප්‍රහාරයක් එල්ල කිරීමට හැකියාවක් පවතින බව නිරීක්ෂණය වේ.

මීළඟට ස්වාමීනි 2018 ජූලි මස 12 වැනි දින රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා විසින් පොලිස්පතිවරයා වෙත පහත මාතෘකාව යටතේ එනම් ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ (NTJ) නායකයා සිය Telegram ගිණුම හරහා IS මතවාදයට නැඹුරු වූවන් සමඟ සම්බන්ධතා පැවැත්වීම යන ලිපිය X 180 ලෙස ලකුණු කිරීමටත් එහි දෙවන පිටුවේ

FAIR COMMENT — BY JEZEEM

අවසාන ඡේදයට පෙර සාක්ෂිකරු විසින් දැන් කියවනු ලබන ඡේදය කියවීමෙන් අනතුරුව එය X 180 A වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමටත් අවසර පතනවා.

ඌ: 2017/03/10 දින කාත්තන්කුඩි ප්‍රදේශයේ දී ජාතික තවුහිද් ජමාත් සංවිධානය සහ ඉස්තිහාද් අහලූල් සුන්නතුල් වල් ජමාත් සංවිධානය අතර ඇති වූ ගැටුමෙන් පසු ප්‍රදේශයෙන් පලා ගොස් සැඟ සිටිමින් IS සංවිධානයේ ක්‍රියාවලිය සාධාරණීකරණය කරන මෙම දැඩිමතදාරී පුද්ගලයා. අත්අඩංගුවට ගෙන මෙම ක්‍රියාවලිය නතර කිරීමට කටයුතු නොකිරීම තුළින් මොහුගේ මතවාදය වටා ඒකරාශී වන පුද්ගලයින් IS සංවිධානයේ අරමුණ වෙනුවෙන් මෙරට දී යම් ප්‍රහාරයක් එල්ල කිරීමට හැකියාවක් ඇති බව නිරීක්ෂණය වේ.

වේලාව: ප.ව. 04.55
මෙතැන් සිට : නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

දැන් වේලාව : ප.ව.4.55
පෙර සටහන් ල/ලේ: සවිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

මීළඟට ස්වාමිනි අවසර පතනවා 2018/07 වන මස 21 වෙනි දින අධ්‍යක්ෂ රාජ්‍ය සේවා බුද්ධි විසින් පොලිස්පතිතුමා වෙත පහත මාතෘකාව යටතේ එනම් NTJ සංවිධානය විසින් ඉස්ලාම් ආගමට පටහැනි ක්‍රියාවන් පිළිබඳව සිදු කරන ලද විග්‍රහයන් ඇතුලත් ලිපි පෙළක් සමාජ ජාල හරහා ප්‍රචාරය වීම යනුවෙන් ඉදිරිපත් කොට ඇති මෙම ලිපිය ස්වාමිනි X – 181 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමටත්,

එහි දෙවන පිටුවේ අවසාන ඡේදය සාක්ෂිකරු විසින් කියවා අවසන් වූ පසු එය X – 181 (A) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමටත් ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

පි: 2017.03.10 දින කාත්තන්කුඩි ප්‍රදේශයෙන් පලා යෑමෙන් පසුවද මොහු විදේශ ගතවූ බවට සංවිධානයේ සාමාජිකයින් සමාජය තුල ප්‍රචාරයක් සිදු කළ නමුත් කැකුණගොල්ල, නාරම්මල ප්‍රදේශයේ පිහිටි ඔහුගේ බිරිඳට අයත් නිවසේ ඉතා රහසිගතව සැඟව සිටිමින් සිය ප්‍රචාරණයන් සිදු කළ බව බුද්ධි නිරීක්ෂණවලදී හඳුනා ගන්නා ලදී.

මීළඟට ස්වාමිනි 2018/08 වන මස 23 වන දින රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා විසින් ජාතික බුද්ධි ප්‍රධානි වෙත NTJ නායකයා විසින් සමාජ ජාලා ඔස්සේ හජ්ජි උත්සවය පිළිබඳව අනුගාමිකයින් දැනුවත් කිරීම සම්බන්ධව යන මාතෘකව යටතේ යවා ඇති ලිපිය X – 182 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමටත්,

එහි දෙවන පිටුවේ අවසාන ඡේදය සාක්ෂිකරු විසින් කියවා අවසන් වූ පසු එය X – 182 (A) අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමටත් අවසර පතනවා.

පි: එම තත්ත්වයන් සැළකිල්ලට ගැනීමේදී අභිප්‍රේරණය වූ මොහුගේ අනුගාමිකයින් අන්‍යාගමිකයන් ඉලක්ක කරගෙන යම් ක්‍රියාකාරකමක් සිදු කිරීමේ හැකියාව මැඩපැවැත්වීම සඳහා ඔහුගේ සමාජ ජාලා ගිණුම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, CERT සහ face book ආයතනවලට සම්බන්ධීකරණය යටතේ නියාමනයට ලක්කිරීම සුදුසු බව නිරීක්ෂණය වේ.

ප්‍ර: එහෙම නියාමනයක් සිදු වුණාද?

පි: නැහැ.

මීළඟට ස්වාමිනි අවසර පතනවා 2018 සැප්තැම්බර් මස 7 වෙනි දින රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා විසින් ජාතික බුද්ධි ප්‍රධානි වෙත යවා ඇති ලිපිය X – 183 වශයෙන් ලකුණු කිරීමටත්, එම ලිපියේ එක පිටුවයි ස්වාමිනි තියෙන්නේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අවසාන ඡේදයට පෙර ඡේදය සාක්ෂිකරු කියවීමෙන් පසු එය X – 183 (A) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමටත්

පි: M.C.M සහරාන් සහ M.C.M ෂයිනි යන අයවලුන් IS සංවිධානයේ මතවාදය සාධාරණීකරණය කරමින් මෙරට ඉස්ලාම් රාජ්‍යයක් ඇති කිරීමේ අපේක්ෂාවෙන් සිදු කරන ප්‍රචාරනයන් හරහා සංවිධානයට යම් අපකීර්තියක් එල්ලවීමේ අවදානම සැළකිල්ලට ගෙන M.C.M ෂයිනි සංවිධානයෙන් ඉවත් කළ බවට 2018.08.31 දින ලිපියක් යොමු කරමින් ව්‍යාජ තත්ත්වයක් නිර්මාණය කිරීමට සංවිධානයේ ක්‍රියාකාරීන් කටයුතු කරන බව පෙනී යයි.

ස්වාමිනි මීළඟට අවසර පතන්නේ 2018 ඔක්තෝබර් මස 19 වෙනි දින රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා විසින් ජාතික බුද්ධි ප්‍රධානි වෙත National Thauhid Jamath නායකයා විසින් සමාජ ජාලා හරහා සිදු කර ඇති ප්‍රචාරනයන් යන මාතෘකව යටතේ යවා ඇති ලිපිය X – 184 වශයෙන් ලකුණු කිරීමටත්,

එය පිටු 3කින් සමන්විත වෙනවා ස්වාමිනි, එහි දෙවන පිටුවේ අවසාන ඡේදය සාක්ෂිකරු විසින් කියවා අවසන් වූ පසු එම ඡේදය X – 184 (A) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමටත්

පි: පසුගිය කාලයේ මොහු කැකුණගොල්ල, කඩහපොළ, කටුපොත, නාරම්මල යන ලිපිනයේ පදිංචි ඒ.සී.ඒ සිත්තියා නම් සිය බිරිඳගේ නිවසේ රැඳී සිට ඇති බවත්, අංක J 53/9 , ෆාතිමා හාල්මෝල පාර, ගනේතැන්න, හිඟුල , මාවනැල්ල පදිංචි සිය අනුගාමිකයෙක් වෙන මොහොමඩ් රාසික් මොහොමඩ් රිස්වි සහ අංක 120/ 9 / A/ 1 තම්සන් ප්‍රදේශය, නුවර පාර, තිහාරියේ පදිංචි නියාස් සෙයිඩ් අහමඩ් සිද්දික් (සිරාජී) යන අයවලුන්ගේ නිවස්වලට අවස්ථා කිහිපයක දී පැමිණ ඇති බවටත් තොරතුරු ඇත.

ප්‍ර: බණ්ඩාර මහත්මයා දැන් ඔබ ඉදිරිපත් කරපු ඔය ඔක්කෝම වාර්තා 2018 වසරටනේ?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: එතකොට 2019 ඔය වගේ වාර්තා තියෙනවද?

පි: තිබෙනවා ගරු ස්වාමිනි. ගරු ස්වාමිනි මීට අමතරව ගරු ස්වාමිනි මගේ අධ්‍යක්ෂතුමා සහභාගී වුණ සාකච්ඡා සම්බන්ධයෙන් මගේ සහකාර අධ්‍යක්ෂතුමා දැනුම් දීම් කරාම ඒ සාකච්ඡා සඳහාත් බහු මාධ්‍ය ඉදිරිපත් කිරීම් සකස් කරලා දීලා මොහු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඉස්මතු කරලා තියෙනවා ගරු ස්වාමිනි. ඒවාගේම ගරු ස්වාමිනි මාවනැල්ල ආගමික ප්‍රතිමා හානියෙන් පසුව මුලින්ම අපි ලිපියක් යොමු කරනවා ආගමික හානිය සම්බන්ධයෙන් 2018.12.29. ඒකේ පුද්ගලයෝ කිහිප දෙනෙක්ගේ නම් සඳහන් කරනවා ගරු ස්වාමිනි. ඊට අමතරව ගරු ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මොකක් ද ඒකේ දිනය?

පි: 2018.12.29 ගරු ස්වාමිනි.

ප්‍ර: කවුරු විසින් කා වෙතද යවලා තියෙන්නේ?

පි: රාජ්‍ය බුද්ධි සේවාවේ එවකට අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා විසින් පොලිස්පතිතුමා වෙත යවන ලද ලිපියක් ගරු ස්වාමිනි.

ප්‍ර: මාතෘකාව?

පි: සබරගමුව, මධ්‍යම සහ වයඹ පළාතේ ස්ථාන කිහිපයක බෞද්ධ හින්දු සහ කතෝලික ප්‍රතිමා වෙත ප්‍රහාර එල්ල කිරීම.

ප්‍ර: එම ලේඛනය අපි දැනටමත් ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙනවා ඔබ මඟින් නේද?

පි: ඔව්.

ප්‍ර: ඒ නිසා ඊළඟට ලේඛනයට යමු?

පි: ඊළඟට ස්වාමිනි 2018.12.30 වෙනිදා ලිපියක් යොමු කරනවා ගරු ස්වාමිනි රාජ්‍ය බුද්ධි සේවාවේ එවකට අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා පොලිස්පතිතුමා වෙත. ඒ වාර්තාවේ සඳහන් කරනවා සහරාන් කියන පුද්ගලයා මාවනැල්ල බුදු පිළිම හා ආගමික ප්‍රතිමා හානිය සම්බන්ධ පුද්ගලයින් සමඟ සමීප සම්බඳතා පවත්වන බව. ඒවගේම ඒකේ අවසාන paragraph එකේ සඳහන් කරනවා ගරු ස්වාමිනි අත්අඩංගුවට ගෙන බන්ධනාගාර ගත කර ඇති පුද්ගලයින් සම්බන්ධව සිදු කරන ඉදිරි විමර්ශන සඳහා ප්‍රධාන සැකකරුවන් දෙදෙනාගේ නිවසේ ඇති පරිගණක සහ විද්‍යුත් උපකරණ ඔස්සේ මොවුන්ගේ අන්තවාදී ප්‍රචාරනයන් මෙන්ම විදේශීය ත්‍රස්තවාදී සංවිධාන කෙරෙහි දක්වන ආකර්ෂණය පිළිබඳව අවධානය යොමු කරමින් පුළුල් විමර්ශනයක් සිදු කිරීම තුල සිංහල සමාජයෙන් එල්ල විය හැකි ප්‍රතිරෝධය අවම කර ගැනීම මෙන්ම මෙම කණ්ඩායම සම්බන්ධ වී දිවයින පුරා සිටින අනිකුත් අන්තාවදී තරුණ කොටස් හඳුනා ගැනීමේ හැකියාවක් ඇති බව පෙනී යයි ගරු ස්වාමිනි.

ප්‍ර: එම ඡේදය තියෙන්නේ ඒ ලේඛනයේ කීවෙනි පිටුවේ කුමන ස්ථානයකද?

පි: 2වන පිටුවේ ගරු ස්වාමිනි අවසාන ඡේදය ගරු ස්වාමිනි.

ස්වාමිනි 2018/12 වන මස 30 වන දින දරණ එම ලේඛනය X- 185 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමටත්,

දෙවන පිටුවේ අවසාන ඡේදය සාක්ෂිකරු විසින් කියවන්නට යෙදුණු අවසාන ඡේදය X- 185 (A) වශයෙනුත් ලකුණු කරන්නට අවසර පතනවා.

පි: ඒ වගේම ගරු ස්වාමිනි 2019.01.06 වන දින ලිපියක් යොමු කරනවා අපි විසින් රාජ්‍ය බුද්ධි සේවාවේ එවකට අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා පොලිස්පතිතුමා වෙත National Thauhith Jamath (NTJ) නායකයා විසින් සමාජ ජාල හරහා සිදු කර ඇති ප්‍රචාරණය කියලා. ඒ වාර්තාව පිටු

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

3කින් සමන්විතයි ගරු ස්වාමිනි. ඒ වාර්තාවේ 3වන පිටුවේ අවසාන ඡේදයට කළින් ඡේදයේ සඳහන් කරනවා ගරු ස්වාමිනි නමුත් මෙම සිදුවීම්වලට සම්බන්ධ වූ පුද්ගලයින් පිළිබඳව විමර්ශන කිරීමේදී එවැනි අන්තවාදී හා ත්‍රස්තවාදී පසුබිම් කෙරෙහි අවධානය යොමු නොවීමත් මොවුන්ගේ අන්තවාදී පසුබිම නොමැති බවට මුස්ලිම් විද්වතුන් සහ දේශපාලන නායකයින් සමාජයට මතයක් ලබාදීම තුල විමර්ශකයින්ගේ අවධානය එවැනි ක්ෂේත්‍ර කරා යොමු නොවීමත් සැලකිල්ලට යුතුවේ කියලා ගරු ස්වාමිනි.

ප්‍ර: එය තියෙන්නේ අවසාන ඡේදයේ කියලා ඔබ කිව්වා?

පි: අවසාන ඡේදයට කළින් ඡේදය.

ස්වාමිනි 2019 ජනවාරි මස 26 වෙනි දින දරණ එම ලේඛනය X- 186 ලෙසත්, දෙවන පිටුවේ අවසාන ඡේදයට පෙර එම ඡේදය X- 186 (A) වශයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර: බණ්ඩාර මහත්මයාට තව ලේඛන ඉදිරිපත් කරන්න පුළුවන්ද ඔබේ අවධානය යොමු වුණ ඒවා හැටියට?

පි: පුළුවන් ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ කවදාද ඊළඟ ලේඛනය?

පි: තවත් වාර්තා කිහිපයක් තියෙනවා ගරු ස්වාමිනි. ඒකෙන් මා වාර්තා 2ක් සඳහන් කරන්න කැමැතියි එකට ගරු ස්වාමිනි 2019.01. 23 සහ 2019.01.25 වාර්තා 2ක් යොමු කරනවා පොලිස්පතිතුමා වෙත. එම වාර්තා 2ට ගරු ස්වාමිනි ඇමුණුම් තිබෙනවා. එක වාර්තාවක පුද්ගලයින් 13 දෙනෙකුගේ නාම ලේඛනයක් යොමු කරනවා ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ කවදා ලිපියත් එක්කද?

පි: 2019.01.25 දින ලිපියට.

ප්‍ර: ඒකට තමයි 13 දෙනෙක්ගේ නම් ඇතුලත් වෙන්නේ ?

පි: ඔව් ගරු ස්වාමිනි. ඒවගේම 2019.01.23 වන දින යොමු කරන ලිපියට ඇමුණුමක් ඇතුලත් කරනවා ගරු ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඇමුණුම?

පි: ඒකේ පුද්ගලයෝ 12 දෙනෙක්ගේ නම් සඳහන් වෙනවා. ඒ පුද්ගලයෝ 12 දෙනා අතරින් අංක 5 ලෙස නම් සඳහන් වෙන පුද්ගලයා මොහොමඩ් රමීස් මොහොමඩ් සාජිත් කියන පුද්ගලයා පාස්කු දින ප්‍රහාරයෙන් පසු දඹුල්ල පොලිස් ස්ථානය විසින් ඇදිරි නීති තත්ත්වය හින්දා නතර කර ගත්තාම ඔහු පොලිසියෙන්, ඔහු සම්බන්ධයෙන් ඒ තරම් අවධානයක් යොමු කරන්නේ නැහැ . ඒ පසුබිමේ දී අප විසින් ඔහු සහ ඔහු සමඟ අත් අඩංගුවට පත්වුණු අනෙකුත් පුද්ගලයා වන මොහොමඩ් ඊබ්‍රහිම් මොහොමඩ් නවුෆර් හෙවත් නවුෆර් මවුලවි අත්අඩංගුවට ගැනීම සඳහා ඒ අවස්ථාවේ ක්‍රියාත්මක වෙනවා. ඒ වාර්තා 2ත් ඉදිරිපත් කරන්න කැමැතියි ගරු ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM

ස්වාමිනි ඒ අනුව 2019.01.23 වන දින දරණ එම වාර්තාව X- 187 ලෙසත්, 2019.01.25 දරණ එම වාර්තාව X- 188 ලෙසත් ලකුණු කර ඉදිරිපත් කරන්න අවසර පතනවා.

පි: ඒ වගේම ගරු ස්වාමිනි 2019.03.01 වන දින වාර්තාවක් යොමු කරනවා ගරු ස්වාමිනි එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා සෙනෙවිරත්න මහතා වෙත එවකට රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා විසින් එම වාර්තාවේ පුද්ගලයෝ 8 දෙනෙකේග් නම් සඳහන් කරනවා ගරු ස්වාමිනි. ඒවාගේම ගරු ස්වාමිනි වාර්තාවේ සඳහන් කරනවා නුවරඑළියේ පුහුණු කඳවුරු පැවැත්වුවා සහ පුපුරණ ද්‍රව්‍ය භාවිතා කිරීම පිළිබඳ වැඩමුළු පවත්වලා තියෙනවා. ඒකේ දේශන පවත්වලා තියෙනවා සින්න මවුලවි කියන පුද්ගලයා සම්බන්ධයෙන් විස්තර. ඒවගේම ආමි මොහිදීන් කියන පුද්ගලයා සම්බන්ධව ඒවගේම ප්‍රහාරයෙන් පසුව අත්අඩංගුවට පත් ඒවගේම ගරු ස්වාමිනි ඒකේ පුද්ගලයෙක් අපි සඳහන් කරනවා මොහොමඩ් තයුබ් කියලා. ඇතුන්ගහකොටුවේ පුද්ගලයෙක්. මේ පුද්ගලයා ගරු ස්වාමිනි පාස්කු ප්‍රහාරයෙන් පස්සේ අත්අඩංගුවට ගැනීමක් සිදු වෙනවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්. මේ පුද්ගලයා ගැන විමර්ශන කරාම ගරු ස්වාමිනි අනාවරණය වෙනවා මේ පුද්ගලයා මීට පෙර අවුරුදු උත්සව දවස්වල නුවරඑළිය ප්‍රදේශයේ සහ ඊට කළින් දින කිහිපයකට කළින් පොතුවිල් ආරුගම් ප්‍රදේශයේ සංචාරය කරලා ස්ථාන කිහිපයක් නිරීක්ෂණය කරා කියලා ප්‍රහාර සැලසුම් සම්බන්ධව. ඊට අමතරව මේ වාර්තාවේ ඇතුලත් කරනවා අපි මොහොමඩ් ඊබ්‍රහිම් මොහොමඩ් නවුෆර් හෙවත් නවුෆර් මවුලවි සම්බන්ධව. ඒවගේම 2019.04.26 වෙනි දින සයින්දමරුදු නිවසේ පුපුරා ගන්නා ලද මොහොමඩ් කාසීම් මොහොමඩ් රිල්වාන් සම්බන්ධව.

ප්‍ර: ඒ 3.01 වෙනිදා වාර්තාවේ තියෙන්නේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ස්වාමිනි එම වාර්තාව X- 189 ලෙස ලකුණු කොට ඉදිරිපත් කරන්න අවසර පතනවා.

ප්‍ර: මීළඟ වාර්තාව?

පි: මීට අමතරව ගරු ස්වාමිනි 2019.03.30 වෙනි දින වාර්තාවක් යොමු කරනවා එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා සෙනෙවිරත්න මහතා වෙත. එවකට රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා විසින් එම වාර්තාවේ සඳහන් කරනවා ගරු ස්වාමිනි සහරාන්ගේ මතවාදය වටා පිරිස් රැස්කිරීමේ නියමුවා ලෙස කටයුතු කරන්නේ මොහොමඩ් කාසීම් මොහොමඩ් රිල්වාන්. ඒ වගේම ගරු ස්වාමිනි ඔහු දින කිහිපයක් රාත්‍රී කාලයේ දී ඔහුගේ බිරිඳ පදිංචි අංක 309/D, සිරිනාස් පාර, දෙවන

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

හරස්වීදිය, ආරියම්පති නැගෙනහිර, ආරියම්පති කියන ලිපිනයට පැමිණෙනවා කියන එක සහ ඔහු සහ ආමි මොහිදින් කියන පුද්ගලයන්ට වරෙන්තු තියෙනවා අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීම සුදුසු බව යෝජනා කරනවා ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත තමයි ඔබේ අධ්‍යක්ෂවරයා එම යෝජනාව කරලා තියෙන්නේ ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ස්වාමිනි 2019/03 වන මස 30 වෙනි දින දරණ එම ලිපිය X- 190 ලෙස ලකුණු කොට ඉදිරිපත් කර සිටිනවා.

ප්‍ර: එච්චරයි ද වාර්තා තියෙන්නේ?

පි: එම වාර්තා ටික තියෙනවා. ඊට අමතරව වාර්තා කිහිපයක් තියෙනවා ස්වාමිනි. නමුත් ඒ අතරේ වාර්තා කිහිපයක් රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂතුමා විසින් එම දිනවලින් පසුව පොලිස්පතිතුමා සහ නොයෙකුත් අංශ වෙත යොමු කිරීමක් සිදු වෙලා තිබෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර: එම දිනවලින් පසුව කියන්නේ? මට ඕනි වෙන්නේ දැන් ඔබට මේ විශ්ලේෂණය කිරීම සඳහා මේ තොරතුර ලැබෙන 2019/04 මාසේ 05 වෙනිදා දක්වා වූ ඔබේ අවධානය යොමු වූ ඒවා විතරයි

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එච්චා තමයි එතකොට ලේඛන?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට දැන් ඔබ කිව්වා ඒ විශ්ලේෂණයේ දී ඔබ මේ සහරාන් හෂීම්ට අදාළවනේ මේවා ඔය කරුණු දැන් ඉදිරිපත් කළේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට අර C- 4 (B) ලේඛනයේ තව ඉන්නවා නේද ජලාල් කිතාල්, රිල්වාන්, සජිත් මවුලවි, සාහිඩ්, මිල්හාන් කියලා අය. ඒ අය සම්බන්ධයෙනුත් සොයලා බැලුවද?

පි: ගරු ස්වාමිනි ඒකේ දී අපි වාර්තාවේ ඇතුලත් කරනවා මොහෙමඩ් කාසීම් මොහොමඩ් සහරාන් ඒවගේම රිල්වාන් කියන පුද්ගලයා. රිල්වාන් කියන පුද්ගලයාම තමයි මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන්ගේ සහෝදරයා. ඔහු තමයි ජල්අල් කිතාල් කියන නමින් පෙනී සිටින්නේ. ඒවගේම ස්වාමිනි සාහිඩ් කියන පුද්ගලයා මාවනැල්ල ආගමික ප්‍රතිමාවලින් පස්සේ පළා යන ලද පුද්ගලයෙක්. ඔහු සම්බන්ධයෙන් ඊට පෙර වාර්තාවල අපි සඳහන් කරලා තියෙනවා. ඒවගේම ස්වාමිනි සාජිත් මවුලවි කියන පුද්ගලයා තමයි දඹුල්ල පොලිස් ස්ථානයෙන් 2019.04.21 අත්අඩංගුවට පත් වෙන්නේ. ඔහු සම්බන්ධවත් අපි ඊට කළින් වාර්තාවල යොමු කරලා තියෙනවා. Milhan and other's කියලා තියෙනවා ස්වාමිනි. ඒකට අපි ඒ සම්බන්ධයෙන් සඳහන් කිරීමක් කරලා නැහැ

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

මොකද මිල්හාන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් අපිට මීට පෙර නිරීක්ෂණයට ලක්වෙලා තිබුණේ නැති නිසා ස්වාමිනි.

ප්‍ර: හරි කමක් නැහැ. නමුත් ඔබ කියන්නේ මෙතන නම් සඳහන් අයගෙන් බහුතරයක් පිළිබඳව ඔබලා මීට කළින් වාර්තා කරලා තිබුණායි කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: ඒ ජලාල් කිතාල් කියන්නේ නමක් වශයෙන්ද?

පි: ගරු ස්වාමිනි ජලාල් කිතාල් කියන්නේ රිල්වාන් කියන පුද්ගලයා භාවිතා කරන තවත් අනුනාමයක්.

ප්‍ර: දැන් අර අපේ විදේශිය බුද්ධි වාර්තාවේ නම් 2ක් වශයෙන් එය සඳහන් වෙනවා ?

පි: නම් 2ක් වශයෙන් සඳහන් වෙනවා ස්වාමිනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අර්ෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර: එතකොට දැන් ඔබේ විශ්ලේෂණය කරන කොට ඔය ඔබ දැන් සඳහන් කරුණු මේ ගරු කොමිෂන් සභාවට ඒවා බලනකොට ඔබට ඒත්තු ගියාද මේ C- 4 (B) ලේඛනයේ තියෙන කරුණු අනුව නිශ්චිතව මේ ප්‍රහාරය සිදු වන්නට පුළුවන් කියලා?

පි: ගරු ස්වාමිනි මේ වාර්තාවේ නිශ්චිත දිනයක් සඳහන් වුණේ නැහැ. Shortly කියලා වගේ වචනයක් තමයි ගරු ස්වාමිනි සඳහන් වෙන්නේ. ඒවගේම ස්වාමිනි මා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවල සහ 2018 ආගමික ප්‍රතිමාවල ඉඳන් අපි විසින් මා සිටින අංශය විසින් යොමු කරන ලද වාර්තාවල නිරන්තරයෙන් සඳහන් කරලා තියෙනවා සහරාන් ප්‍රහාරයකට සැලසුම් කරනවා කියන එක. ඒ අනුව ගරු ස්වාමිනි මේකේ තියෙන නම් සම්බන්ධයෙන් සඳහන් කිරීමක් කරනවා. එතනදී අපි මගේ සහකාර අධ්‍යක්ෂතුමාට වාර්තා කරන්නේ. ඒ වාර්තා කිරීමේ දී මා විසින් වෙනත් විශ්ලේෂණයකට ලක් කරන්නේ නැහැ. මොකද මගේ සහකාර අධ්‍යක්ෂතුමා විෂය ගැන දන්නවා සහ මගේ සහකාර අධ්‍යක්ෂතුමා මීට කළින් වාර්තා නිරන්තරයෙන් මා දෙනිකව වගේ යොමු කිරීමක් සිදුකරන නිසා ගරු ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඔබ ඉදිරිපත් කරපු වාර්තා?

පි: ඒ ගරු ස්වාමිනි මේකේ තියෙන නම්වලින් සඳහන් වෙන මුල් තොරතුරේ තිබෙන්නෙත් ප්‍රහාරයක් සූදානමක් සම්බන්ධයෙන්. ඒ වගේම ඊට කළින් මං ප්‍රහාරයක් වෙන්න තියෙන අවදානම සම්බන්ධයෙන් ඉස්මතු කරලා මොහුව අත්අඩංගුවට ගැනීම අත්‍යාවශ්‍යයි කියලා යෝජනා කරලා

FAIR COMMENT — BY JEZEEM —

තියෙනවා ගරු ස්වාමිනි. මේකේ තියෙන පුද්ගලයෝ මොහොමඩ් කාසීම් මොහොමඩ් රිල්වාන් කියන පුද්ගලයෝ දෙන්නාගේ තමයි සහරාන් වටා තමයි මේක කේන්ද්‍ර කරගෙන තිබුණේ. ඔහුගේ නම සම්බන්ධ ඇතුලත් වාර්තාවක් යොමු කරනවා ගරු ස්වාමිනි.

ප්‍ර: අපිට ඒ වාර්තාව බලන්න පුළුවන්ද?

පි: මගේ ළඟ මේ වෙලාවේ නැහැ ස්වාමිනි. මං හිතන්නේ මේ වෙනකොටත්.

ප්‍ර: ඒ කියන්නේ ඔබ මේ ලේඛනයේ තිබෙන මෙන්න මේ මට දැන් පෙන්වන ලේඛනය තමයි ඔබ යවන ලද කෙටුම්පත ඔබගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීයා වූ සහකාර අධ්‍යක්ෂතුමාට?

පි: ඔව්. මේකට මගේ සහකාර අධ්‍යක්ෂතුමා මා විසින් යොමු කරන ලද මුල් වාර්තාවට අඩු වැඩි කිරීම් කිහිපයක් කරලා තිබුණා. ඊට පස්සේ එතුමන් ආපහු නැවත සකස් කරලා දෙන්න කියන දැනුම් දීම මත මා විසින් මේ වාර්තාව ආපහු සකස් කරලා දෙනවා. ඊට පස්සේ එතුමා අත්සන යොදලා අධ්‍යක්ෂතුමා වෙත යොමු කරනවා.

ප්‍ර: ඔබ ඒ වාර්තාව ඉදිරිපත් කරන්නේ මා අර කළින් පෙන්වන ලද මෙම සටහනට පස්සේද?

පි: මගේ මතකයේ හැටියට අත්සනක් මේකේ දාලා තියෙනවා. මේ සහකාර අධ්‍යක්ෂතුමා සකස් කරලා යොදන පිටසන ගරු ස්වාමිනි.

ප්‍ර: නැහැ මම අහන්නේ මේ මෙතන තියෙන සටහන ඔබේ සහකාර අධ්‍යක්ෂවරයා යොදන්නේ ඔබට මේ වාර්තාව සම්බන්ධයෙන් උපදෙස් දෙන්නට පෙරද? වාර්තාව කියන්නේ අර තොරතුර සම්බන්ධයෙන් evaluate කරන්න කියනවානේ විශ්ලේෂණය කරන්න කියලා?

පි: ගරු ස්වාමිනි ඒ වාර්තාවට ප්‍රථම එතුමන් වෙත WhatsApp එකෙන්, message එකක් එනවා. මට ඒක print out එකක් අරගෙන ඒකට තමයි මේ සටහන යොදලා තිබුණේ. ඊට පස්සේ මේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාගේ අත්සන දාලා තියෙන්නේ. මේ සහකාර අධ්‍යක්ෂතුමා මට යොදන සටහන.

ප්‍ර: ඒ කියන්නේ මේ ක්‍රියාදාමයේ කොහොමද මේ සිද්ධිය වුණේ කියන එකට අදාළ සටහන්නේ මේ තියෙන්නේ ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ දැන් අපිට පෙන්වන්නේ මේ ලේඛන මෙන්න මේ ලේඛනය ඔබ විසින් ඔබේ සහකාර අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරන ලද ලේඛනයක්?

පි: මා විසින් සකස් කරන ලද වාර්තාවක්. ඒ කියන්නේ සහකාර අධ්‍යක්ෂ වෙත මුදලින් වාර්තාවක් මං යොමු කරනවා. එතුමන් ඒකේ අඩු වැඩිකිරීම් කිහිපයක් සඳහන් කරලා ඒක නිවැරදි කරලා එවන්න කියනවා.

ප්‍ර: එතකොට මේ දෙවැනි වරට ඔබ ඉදිරිපත් කරපු කෙටුම්පතද?

පි: ඔව් ගරු ස්වාමිනි.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට පළවෙනි කෙටුම්පත එහෙනම් මේක නෙවෙයි නේද නැහැනේ?

පි: නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: එහෙනම් මේ ලේඛනය බලන්නකෝ.

පි: එතුමා විසින් අඩුවැඩි කිරීම් කරලා තියෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර: නැහැ නැහැ මම දැන් අහන එක කියන්නකෝ බණ්ඩාර මහත්මයා මං අහන්නේ අර දැන් ඉස්සරවෙලාවම අර තොරතුර විශ්ලේෂණය කරලා දානවානේ කෙටුම්පතක්?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ කෙටුම්පතද ඔය කෙටුම්පත කියන්නේ ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ස්වාමිනි සාක්ෂිකරු විසින් C - 4 (B) ලේඛනය සම්බන්ධයෙන් එහි දැක්වෙන තොරතුර විශ්ලේෂණය කිරීමට ඔහුට උපදෙස් ලැබුණු පසු ඔහු විසින් එම තොරතුර විශ්ලේෂණය කරලා ඔහුගේ සහකාර අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන ලද පළමු වන කෙටුම්පත මේ අවස්ථාවේ දී X – 191 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරන්නට අවසර පතනවා.

ප්‍ර: මෙම තොරතුරේ ඔබ මොන කරුණු ද සහකාර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරලා තියෙන්නේ කියලා අපිට Point form එකේ කියන්න පුළුවන්ද?

පි: පුළුවන් ගරු ස්වාමිනි.

ප්‍ර: කියන්න

පි: මේකේ දී ගරු ස්වාමිනි රිල්වාන් යන අය සහරාන් නැමැත්තාගේ බාල සොයුරා මෙන්ම ඔහුගේ මතවාදය වටා පිරිස් රැස් කරන නියමුවා ලෙස කටයුතු කරන බවත්, රිල්වාන් හඳුනාගෙන ඇති අතර ඔහු කාත්නත්කුඩි ප්‍රදේශයේ දී NTJ සංවිධානය සහ තවත් ආගමික සංවිධානයක් අතර ඇති වූ ගැටුමකින් පස්සේ ඔහු ප්‍රදේශයෙන් පළා ගොස් සැඟවී සිටින බවත් සඳහන් කරනවා ගරු ස්වාමිනි. ඒ වගේම ගරු ස්වාමිනි ඔහු රාත්‍රී කාලයේ ආරියම්පති ලිපිනයට පැමිණෙන බවත් බිරිඳගේ නිවසට පැමිණෙන බවට බුද්ධි මෙහෙයුම්වලදී නිරීක්ෂණය වුණා කියන එක ඉස්මතු කරනවා ගරු ස්වාමිනි. ඒ වගේම ආමි මොහිදින් කියන පුද්ගලයාත් අපි සම්බන්ධ කරනවා ගරු ස්වාමිනි. මොකද ආමි මොහිදින් කියන පුද්ගලයාත් මේ සහරාන්ගේ සිද්ධියට සම්බන්ධ නිසා ගරු ස්වාමිනි. රිල්වාන් නැමැත්තා සහරාන්ගේ ජාලයේ ක්‍රියාකාරියෙකු බැවින් ඔහු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීම හරහා සහරාන් සහ මාවනැල්ලේ සිදුවීමට සම්බන්ධිතයින් සැඟව සිටින ස්ථාන පිළිබඳව තොරතුරු අනාවරණය කර ගැනීමට හැකියාවක් ඇති බවට නිරීක්ෂණය වේ කියලා ඉස්මතු කරනවා ගරු ස්වාමිනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔව් එතකොට අර C- 4 (B) ලේඛනයේ ඔබට ලැබුණු ඒ තොරතුරේ සඳහන් පුද්ගලයින් 6 දෙනාගෙන් ඔබ එහි සඳහන් සහරාන් ගැන, රිල්වාන් ගැන, ආමි මොහීදීන් ගැන, මිල්හාන් ගැන කරුණු ඉදිරිපත් කරනවා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ කිව්වා ජලාල් කිතාල් කියලා කියන්නෙත් සහරාන් හෂීම්ට පාවිච්චි කරන තව නමක් කියලා?

පි: රිල්වාන්ට භාවිතා කරන නමක්.

ප්‍ර: රිල්වාන්ට පාවිච්චි කරන එකක්. සහරාන්ට නෙවෙයිද?

පි: නැහැ ස්වාමිනි.

ප්‍ර: රිල්වාන්ට පාවිච්චි කරන තව නමක් කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ සාජිත් මවුලවි ගැන මෙහි සඳහන් කිරීමක් කරලා නැහැ නේද?

පි: සාජිත් මවුලවි සාහිඩ් කියන දෙන්නා ගැන සඳහන් කරලා නැහැ ස්වාමිනි.

ප්‍ර: ඉතිරි අය ගැන සඳහන් කරලා තියෙනවා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ මේ වාර්තාවේ එහෙනම් සඳහන් කරලා තියෙනවද අර වවුනතිව් සිද්ධිය 2018 නොවැම්බර් 30 වෙනිදා පොලිස් නිලධාරීන් දෙදෙනෙක් ඝාතනය කිරීම ගැන?

පි: නැහැ ගරු ස්වාමිනි

ප්‍ර: ඇයි ඒ සඳහන් කළේ නැත්තේ?

පි: ගරු ස්වාමිනි වවුනතිව් සිද්ධිය 2018.11.30 වෙනිදා. ඒ සිද්ධිය සම්බන්ධයෙන් භූමියෙන් තොරතුරු තිබුණේ නැහැ මුස්ලිම් සහ සහරාන්ගේ ජාලය සම්බන්ධ ක්‍රියාවලියක් කියන එක. නමුත් ගරු ස්වාමිනි

ප්‍ර: ඒකෙන් අදහස් කරනවද ඔබ මේ කෙටුම්පත පිළියෙල කරන ලද 2019 අප්‍රේල් 5 වෙනිදා වෙනකම් වවුනතිව් සිද්ධිය සහරාන්ගේ කණ්ඩායම විසින් සිදු කරන ලද්දක් බවට රාජ්‍ය බුද්ධි සේවාවට අනාවරණය වෙලා තිබුණේ නැහැ කියලා?

පි: අප වෙත භූමියේ බුද්ධි තොරතුරු තිබුණේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ මෙහි අඩංගු කරනවද මාවනැල්ල සිද්ධිය පිළිබඳව 2018 දෙසැම්බර් මාසේ 23, 24, 26 යන දවස්වලදී මාවනැල්ල සහ ඊට ආශ්‍රිත ප්‍රදේශවල විවිධ ස්ථානවල සිදුවූ සිද්ධීන් පිළිබඳව සඳහන් කරනවද?

පි: ගරු ස්වාමිනි මේකේ දී මම සහරාන්ගේ ඊට කළින් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඇතුලත් කිරීමක් කරන්නේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: ඒකේ කියලා තියෙනවද ඒ කරුණ කියලා?

පි: කියලා නැහැ ගරු ස්වාමිනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කියලා නැහැ?

පි: නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: ඇයි එහෙම කිව්වේ නැත්තේ මොකද දවස් 3ක විවිධ ස්ථානවලදීනේ සිද්ධ වුණේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ ඊයේ දින මේ ගරු කොමිෂන් සභාවට කිව්වා ඒ සිදුවුණ සිද්ධියේ දී ඊබ්‍රහිම් සහෝදරයෝ දෙදෙනා ඇතුළුව තවත් කට්ටිය බුද්ධ ප්‍රතිමාවලට, හින්දු කෝවිල්වල ප්‍රතිමාවලට, ඒ වගේම ක්‍රිස්තියානි පල්ලිවල ඒ යම් ප්‍රතිමාවලට හානි කරලා තිබ්බා කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට එතන ආගමික අසංගතිය නෙවෙයිද ඇති වෙන්නේ?

පි: ආගමික අසංගතිය ස්වාමිනි.

ප්‍ර: ඉතින් එහෙමනම් ඇයි ඔබ මේ C- 4 (B) ලේඛනයේ ප්‍රහාර එල්ල කිරීමට නියමිතයි කියලා ප්‍රහාර වර්ග 4ක් පිළිබඳවත් කරුණු දක්වලා තියෙන වෙලාවේ දී මේ ගැන කිව්වේ නැත්තේ මාවනැල්ල ගැන?

පි: ගරු ස්වාමිනි මා මේ වාර්තාව කෙටුම්පත ඉදිරිපත් කළේ මගේ සහකාර අධ්‍යක්ෂතුමාට. එතුමන්ට මාවනැල්ලේ ආගමික ප්‍රතිමාවලින් පස්සේ මේක සහරාන්ගේ ක්‍රියාවක් කියන එක සඳහන් කරලා අපි වාර්තා යොමු කරලා තියෙනවා. ඒ වගේම වනාතවිල්ලුවේ පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීමෙන් පස්සේ අත්අඩංගුවට පත්වූ පුද්ගලයන්ගේ විමර්ශනවලදී පුහුණු කඳවුරු පැවැත්වීම සම්බන්ධ විස්තරත් අනාවරණය වෙලා ඒවාත් වාර්තා කරලා තියෙනවා. ඒ වාර්තා කිරීම් නිරන්තරයෙන් කරන අවදියේ තමයි මේ තොරතුරු වාර්තා වෙන්නේ. ඒ අනුව මේ වාර්තාවේ තියෙන පුද්ගලයෝ ගැන සඳහන් කිරීමක් කරාට පෙර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මා මෙහි ඇතුලත් කරන්නේ නැහැ. මොකද මගේ සහකාර අධ්‍යක්ෂතුමාත් මේ විෂය ගැන දන්න කෙනෙක් නිසා මා මේකට ඇතුලත් කිරීමක් කරන්නේ නැහැ ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

කොමිෂන් සභාවේ කටයුතු පස්වරු 5.50 තෙක් කල් තබනවා.

දැන් වෙලාව: ප.ව.5.30

****

FAIR COMMENT BY JEZEEM

කොමිෂන් සභාව නැවත රැස් වේ.
දැන් වෙලාව: ප.ව.6.05
ප්‍රතිඥා දී නැවත කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර: බණ්ඩාර මහත්මයා කෙටි විවේකයට පෙර මා ඔබෙන් ප්‍රශ්න කෙරුවේ අර X- 191 ලෙස ලකුණු කරලා ඔබ ඉදිරිපත් කරපු ඔබේ පළවෙනි වාර්තාවේ මාවනැල්ල සිද්ධීන් පිළිබඳව අඩංගු කරේ නැත්තේ ඇයි කියලා ඒ ගැන ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ගරු කොමිෂන් සභාවට?

පි: ගරු ස්වාමිනි මෙම තොරතුර වාර්තා වීමෙන් පසු එම තොරතුරේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ඇතුලත් කිරීමක් කරනවා. නමුත් මාවනැල්ල හෝ ඒ අදාළ සමගාමී සිදුවීම් කිසිවක් මේකට ඇතුලත් කිරීමක් මා විසින් කරන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් ගරු ස්වාමිනි මා ඒ අදාළ සිද්ධියෙන් සිද්ධියට වාර්තාවන් මගේ සහකාර අධ්‍යක්ෂතුමාට ඉදිරිපත් කරනවා ගරු ස්වාමිනි. ඒ නිසා මේ වාර්තාවේ අඩංගු කරුණු ටික සම්බන්ධයෙන් විතරයි මා ඇතුලත් කරන්නේ. වෙන වාර්තාවල ඊට පෙර සිදුවීම් මේකට සමගාමී කරලා ඇතුලත් කිරීමක් කරන්නේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ කිව්වා මේ වාර්තාවේ අඩංගු දේවල් පමණයි ඒකට ඇතුලත් කරේ කියලා ඒ කියන්නේ මොකක්ද බණ්ඩාර මහත්මයා?

පි: ඔව් ගරු ස්වාමිනි මේකේ නම් කිහිපයක් සහ සහරාන් මරාගෙන මැරෙන ප්‍රහාර දියත් කිරීම සම්බන්ධයෙන් මොකද ගරු ස්වාමිනි මේ වාර්තාව එන අවස්ථාව වෙනකොටත් අපි සහරාන් සම්බන්ධයෙන් වාර්තා ගණනාවක් යොමු කරගෙන යන අවදියක්. ඒ වෙනකොට මේ තොරතුර එන්නේ එක පාර්ශවයකින්. ඒ තොරතුරට වාර්තාවක් මගේ සහකාර අධ්‍යක්ෂතුමා ඉදිරිපත් කිරීමක් මා කරන්නේ. එතකොට සහකාර අධ්‍යක්ෂතුමාට ඒ වෙනකොට අනිකුත් සිද්ධීන්වලට එකිනෙකට එකිනෙකට වාර්තා මා යොමු කරගෙන යන අතරේ තමයි මේකත් මා වෙත ලැබෙන්නේ. මේ වාර්තාවට මේ සිද්ධි සම්බන්ධ කරගෙන වාර්තා කරන්නේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: හොඳයි. මා ඔබේ අවධානය යොමු කරනවා C- 4 (B) ලේඛනයේ පස්වන නමට. මොකක්ද නම?

පි: සාහීඩ් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට මාවනැල්ල බුදු පිළිමවලට හානි කරන ලද ඒ සිද්ධියේදී ඔය සාහිඩ් කියන නම එනවද?

පි: එනවා ගරු ස්වාමිනි.

ප්‍ර: එහෙම නම් ඔබ හිතන්නේ නැද්ද සාහිඩ් කියන නම මේ ඔබට ලැබුණු තොරතුරු විශ්ලේෂණය සඳහා ඔබට ලැබුණු තොරතුරුවල අඩංගු

FAIR COMMENT BY JEZEEM

වෙනවානම් මාවනැල්ල සිද්ධියට අදාළවත් ඔබේ කෙටුම්පතේ ඇතුලත් කොට තිබුණානම් සහරාන්, රිල්වාන්, ආමි මොහිදින්, මිල්හාන් යන අය පිළිබඳව සඳහන් කරපු විදිහටම ඔබේ කෙටුම්පත සම්පූර්ණ වෙනවා කියලා?

පි: ගරු ස්වාමිනි මේ නම් අතර තියෙනවා සාජිත් මවුලවි කියලා කෙනෙක් ඉන්නවා. ඒ සාජිත් මවුලවි කියන්නෙත් මාවනැල්ල සිද්ධියෙන් පස්සේ පලා යන පුද්ගලයෙක්. ඒ සම්බන්ධව මා මීට ප්‍රථම ඉදිරිපත් කරන ලද වාර්තාවල සඳහන් කරලා තිබුණා. ඒවගේම සාහිඩ් කියන පුද්ගලයා සම්බන්ධයෙනුත් ඒ වගේ වාර්තාවේ සඳහන් කිරීමක් කරලා තිබුණා ගරු ස්වාමිනි. නමුත් මේ දෙන්නා නිශ්චිත වශයෙන් මේ සහරාන්ගේ ටීම් එක තුල ඉන්න කෙනෙක් ද කියන එක සම්බන්ධයෙන් අපිට භූමියේ තොරතුරු තිබුණේ නැහැ ගරු ස්වාමිනි. ඒ නිසා ඒ සම්බන්ධ කර ගැනීමක් කරන්නේ නැහැ. නමුත් සහරාන්, රිල්වාන් කියන දෙන්නා ගැන නිශ්චිතව දන්න නිසා භූමියේ තොරතුරු තියෙන නිසා ඒ දෙන්නා ගැන ඉස්මතු කර ගැනීමක් කරනවා ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියන්නේ ඔබට භූමියේ තොරතුරු තිබුණේ නැහැ කියලා සාජිත් මවුලවි සහ සාහිඩ් පිළිබඳව?

පි: භූමියේ තොරතුරු ඒ දෙන්නා පළා යෑම සම්බන්ධයෙන් තිබුණාට ගරු ස්වාමිනි සහරාන් ළඟ ඉන්නේ කියන එක සම්බන්ධයෙන් අපිට භූමියේ තොරතුරු තිබුණේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ 2019 අප්‍රේල් මාසේ 5 වෙනිදා වෙනකම් ඒ තොරතුර තිබුණේ නැහැ කියලා ඔබ කියන්නේ ?

පි: 21 වෙනකම්ම තිබුණේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: 5 වෙනිදානේ ඔබේ මේ වාර්තාව හදන්නේ? ඒ වෙනකම් තිබුණේ නැහැ හොඳයි. දැන් ඔබලා තොරතුරු රැස් කරනකොට මතකද සිද්ධියක් සිදු වුණා 2019 මාර්තු මාසේ මගේ මතකය නිවැරදිනම් 17 වගේ කබීර් හෂිම් එවකට ගරු ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක් වුණ තස්ලීම්ට වෙඩි තිබ්බා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ තස්ලීම්ට වෙඩි තැබීම සම්බන්ධයෙන් ඔබලා තොරතුරු හොයලා බැලුවද?

පි: ගරු ස්වාමිනි මාවනැල්ල ආගමික ප්‍රතිමා හානියෙන් පස්සේ අප විසින් භූමියේ බුද්ධි තොරතුරු රැස් කරලා. එම රැස් කරපු තොරතුර මා මීට කළින් ඉදිරිපත් කරන ලද වාර්තාවකත් සඳහන් කරලා තිබුණා. එතන හිටපු පුද්ගලයෝ කිහිප දෙනෙක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සමහර අය සම්බන්ධ කරගෙන තොරතුරුකරුවන් ලෙස එයලාව භාවිතා කරන් තමයි වනාතවිල්ලුව recovery එක ඒ වගේ දේවල් වෙන්නේ 1.16. එතකොට තස්ලීම් කියන පුද්ගලයාට වෙඩි තබන්නෙත්

FAIR COMMENT — BY JEZEEM —

2019.03.08 වෙනිදා ස්වාමිනි. එතකොට ඒ සිද්ධිය සම්බන්ධයෙන් අපිට භූමියේ තොරතුරු රැස් කිරීමේ දී ඒක නිශ්චිත වශයෙන් සහරාන් සිදු කරන වෙඩි තැබීමක් කියන එකට තොරතුරක් අපිට වාර්තා වුණේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: නැහැ මම අහන්නේ සහරාන් ගැන නෙවෙයි. මම අහන්නේ ඒ සිද්ධිය පිළිබඳව වාර්තා වුණානේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ සිද්ධියට කවුද මේ සිද්ධිය කරලා තියෙන්නේ කියලා ඔබලා තොරතුරු සොයලා බැලුවද?

පි: තොරතුරු සෙවීමක් කරා ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට මොනවද අනාවරණය වුණේ?

පි: ඒ අවස්ථාවේ දී භූමියේ විවිධ තොරතුරු මතුවුණා ගරු ස්වාමිනි ඒ පුද්ගලයා මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් විවිධ පුද්ගලයන්ට චෝදනා කිරීම හරහා එහෙම තර්ජනයක් තියෙනවා කියලාත් ආවා. ඒ වගේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඔහු සම්බන්ධ කරගෙන වනාතවිල්ලුව පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීමේ දී ඔහු මාධ්‍යයට හෙළිදරව් වීම හරහා ඔහුට ඒ කණ්ඩායමෙන් සහරාන් කියලා තිබුණේ නැහැ. නමුත් සාහිඩ්, සාදික් කියන දෙන්නාගෙන් තර්ජනයක් තියෙන එක භූමියෙන් තොරතුරු ආවා. නමුත් අපිට නිශ්චිත වශයෙන් ඒක තහවුරු කර ගන්න තරම් තොරතුරු භූමියේ තිබුණේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට දැන් ඔබලාගේ ඔය වාර්තාවලට සළකලා බලනකොට නිශ්චිත වශයෙන් තිබුණු තොරතුරු විතර ද සළකලා බලන්නේ නිර්දේශයක් කරන කොට?

පි: ගරු ස්වාමිනි සිද්ධියෙන් සිද්ධියට අපි වාර්තා කිරීමේ දී අර අනිත් සිද්ධි ගොඩක් වෙලාවට එහෙම ඇතුලත් කිරීමක් මා සහකාර අධ්‍යක්ෂතුමා වෙතට ඉදිරිපත් කරන්නේ නැහැ ගරු ස්වාමිනි. මොකද එතුමන් සහ මා එකම විෂය ඇතුලත තමයි ජීවත් වෙන්නේ. ඒක නිසා එතුමන් ඒ හැම සිද්ධියක්ම එතුමාට දැනීමක් තියෙනවා. ඒ නිසා මට ground එකෙන් නිලධාරියෙක් වාර්තා කරත් ඔහුත් ඒ සිද්ධි සිද්ධි සම්බන්ධ කරලා වාර්තා කිරීමක් කරන්නේ නැහැ. ඒ සිද්ධියට අදාළ දෙන තොරතුරට තමයි විමර්ශන කරලා වාර්තා කරන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර: නමුත් ඔබ හිතන්නේ නැද්ද ඔබලා තස්ලීම්ට වෙඩි තැබීම පිළිබඳව සළකලා බැලුවානම් ඒ පිළිබඳව කරුණු සෙව්වානම් සාහිඩ් කියන තැනැත්තෙක් පිළිබඳවත් එහිදී යම් ආකාරයකට නමක් අනාවරණය වෙලා තියෙනවා. නමුත් දැන් ඔබ කියනවානේ මේ කරුණු තහවුරු කර ගන්නට ඕනි කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: දැන් මේ වාර්තාවෙත් ඔබලා කියනවා නේද කරුණු තහවුරු කර ගන්නට ඕනි වැඩිදුරට කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඉතින් එතකොට එහෙමනම් ඒවගේ වගන්තියක් ඔබලා ඇතුලත් කරන නිසා සාහිඩ් සම්බන්ධයෙනුත් එසේ තොරතුරු ඇතුලත් කළ හැකිව තිබුණා නේද? භූමියේ කරන ලද විමර්ශනවලින් මේ වගේ තොරතුරක් අනාවරණය වුණා කෙසේ වුවත් මේ පිළිබඳව වැඩිදුර විමර්ශන සිදු කරමින් පවතී. සාමාන්‍යයෙන් ලියනවානේ ඒක එකතු කරනවානේ නේද අර වාර්තාවේ අවසානයට ඉතින් එහෙම දානකොට ඒකෙන් අදහස් කරන්නේ ඔබේ වාර්තාව අවසන් වාර්තාව කියලා නෙවෙයිනේ. ඔබලා යම් නිගමනයකට ඇවිල්ලා තියෙනවා කියන එක නෙවෙයිනේ. මම ඔබෙන් අහන්නේ බණ්ඩාර මහත්මයා එහෙමනම් මේ C- 4 (B) ලේඛනයේ සඳහන් සාහීඩ්ගේ නම සම්බන්ධයෙන් ඇයි ඔබේ කෙටුම්පතේ X – 191හි ඒ පිළිබඳව සඳහන් නොකරේ කියලා?

පි: ගරු ස්වාමිනි මා මුලින් සඳහන් කළ ආකාරයෙන්ම මට සහකාර අධ්‍යක්ෂතුමා විසින් අදාළ තොරතුර ලබා දීමේදී මා එහි නිශ්චිත වශයෙන් සහරාන් හෂිම් කියන පුද්ගලයා මේ මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන්මයි කියලා නිශ්චිත වශයෙන් හඳුනා ගන්නවා. ඒවගේම ජල්ආල් කිතල් කියන නම ගැන මීට කළින් අපිට තොරතුරු තිබුණේ නැහැ ගරු ස්වාමිනි. නමුත් රිල්වාන් කියන නම දකිනකොටම අපිට මීට කළින් රිල්වාන් කියන්නේ මොහොමඩ් කාසීම් මොහොමඩ් රිල්වාන් එහෙම නැත්නම් සහරාන්ගේ සහෝදරයා කියන එක අපිට තොරතුරු දන්නවා. ඒ නිසා අපි ඒ දෙන්නාගේ නම් සම්බන්ධයෙන් මා වාර්තාවේ ඇතුළත් කරනවා. ඒවගේම සාජිත් මවුලවි කියන කෙනා මාවනැල්ලේ ආගමික ප්‍රතිමාවලින් පස්සේ අපි තොරතුරු වාර්තා කර තිබුණත් ඔහු සහරාන් සමඟ එකට ඒ කියන්නේ ඒකෙන් අදහස් කරන්නේ එකට කියලා සහරාන් සහ රිල්වාන් කියන දෙන්නාම හිටියේ 2017.03.10 සිද්ධියෙන් පස්සේ පළා ගිහිල්ලා දෙදෙනාම එකට හිටියේ. ඒ නිසා මේ පුද්ගලයා ඔහු සමඟ ඉන්නවා කියන එක ගැන අපිට තොරතුරක් තිබුණේ නැහැ ගරු ස්වාමිනි. ඒ වගේම සාහිඩ් කියන පුද්ගලයා සම්බන්ධයෙනුත් අපි මීට කළින් මාවනැල්ල ආගමික ප්‍රතිමාවලින් පස්සෙත් ඔහුගේ සියලු විස්තර අනාවරණය කරගෙන තිබුණත් ඔහුත් සහරාන් සමඟ ඉන්නවා කියන එක සම්බන්ධයෙන් භූමියේ තිබුණේ නැති නිසාත් Milhan and other's කියලා තියෙනවා. අපිට ඒක නිශ්චිතව මිල්හාන් සම්බන්ධයෙනුත් වැඩි තොරතුරක් තිබුණේ නැහැ. නමුත් මිල්හාන් කියලා facebook වල අපිට අනාරවණය වෙච්ච අපි නිරීක්ෂණය කර ගත්ත පුද්ගලයෙක් සම්බන්ධයෙන් තමයි මේ වාර්තාවට ඇතුලත් කරන්නේ ගරු ස්වාමිනි.

****

FAIR COMMENT — BY JEZEEM

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: ජල්ආල් කිතාල් කියන පුද්ගලයායි රිල්වාන් කියන පුද්ගලයායි එකම පුද්ගලයෙක් වශයෙන් තමන්ලාට හෙළි වුණාද නැත්නම් ජල්ආල් කිතාල් කියලා වෙනත් පුද්ගලයෙක් ඉන්නවද කියලා ඔබලා සොයලා බැලුවද?

පි: ගරු ස්වාමිනි පාස්කු දින ප්‍රහාරයෙන් පස්සෙ 4.25 වෙනිදා අපි වාර්තාවක් යවනවා දෙවන ප්‍රහාරයක් සම්බන්ධයෙන්. ඒ දෙවන ප්‍රහාරය සම්න්ධයෙන් සහ 4.21 ප්‍රහාරයේ වගකීම IS සංවිධානය භාරගැනීම සම්බන්ධව ඒ භාර ගැනීමට අදාළව වීඩියෝ පටය IS සංවිධානය වෙත යොමු කරන ලද පුද්ගලයා අපි භූමියෙන් හඳුනා ගන්නවා මොහොමඩ් සහරාන් මොහොමඩ් ෆස්සූල් රහුමාන් කියලා. මේ පුද්ගලයෝ දෙන්නා සම්බන්ධයෙන් අපි ප්‍රහාරයෙන් පස්සේ තමයි ජල්ආල් කිතාල් කියන්නේ සහරාන්ගේ සහෝදරයා ඒවගේම ඔහුගේ ඊට කළින් අත්හදා බැලීමකදී ඔහුගේ අතේ ඇඟිලි නැහැ කියන කාරණය අපි අනාවරණය කරගන්නේ. ඒ අනුව ගරු ස්වාමිනි 4.25 අපි වාර්තාවක් යවලා තියෙනවා. ජල්ආල් කිතාල් කියන්නේ රිල්වාන් කියන එක තහවුරු කර ගැනීමෙන් පස්සේ ස්වාමිනි.

ප්‍ර: රිල්වාන් ඒ නම භාවිතා කරලා තියෙනවද ජල්ආල් කිතාල් කියලා?

පි: ඒ නම අපිට භූමියෙන් කවදාවත් වාර්තා වෙලා තිබුණේ නැහැ ගරු ස්වාමිනි. මොකද මෙයාලා තමන්ගේ තොරතුරු හුවමාරු කර ගත්තේ ගොඩක් වෙලාවට මුල් අවදියේ Telegram වලින්. පස්සේ ගරු ස්වාමිනි ත්‍රීමා කියන application එක තමයි ගරු ස්වාමිනි පාවිච්චි කරේ. එතනදී ඔහු ඔහුව හඳුන්වා දීලා තියෙන්නේ ජල්ආල් කිතාල් කියලා. අපිට ඒ ගැන මීට කළින් වාර්තා වෙලා තිබුණේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: සනාථ වෙනවා මොකද කොමිෂන් සභාවට දැන ගන්නට ඕනේ ජල්ආල් කිතාල් කියලා වෙන පුද්ගලයෙක්?

පි: වෙන පුද්ගලයෙක් නැහැ ස්වාමිනි. රිල්වාන් තමයි කියලා සනාථ වෙනවා ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු මට එක ප්‍රශ්නයක් තියෙනවා ඔබ දැන් වෙනකම් දුන්න සාක්ෂියට. රාජ්‍ය බුද්ධි සේවාවේ දත්තයන් පරිගණකගත කරලාත් තියෙනවා, ලැබුණු මුල් දත්තයන් ඒ කියන්නේ ලේඛන අනුවත් ගබඩා කරලා තියෙනවා නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: ඒ පරිගණකගත කරලා තියෙන දත්තයන් අවුරුදු 60කට වඩා පරණ දත්තයන් තියෙනවා නේද?

පි: ඔව් ගරු ස්වාමිනි. මෑත කාලයේ තමා පරිගණකගත කරලා තියෙන්නේ ගරු ස්වාමිනි. ඊට කළින් තිබුණේ ගරු ස්වාමිනි hard copies විදිහට ගරු ස්වාමිනි.

ප්‍ර: නැහැ ඒ සියලු දත්තයන් දැන් පරිගණකගත කරලා තියෙනවා?

පි: තියෙනවා ස්වාමිනි.

ප්‍ර: එතකොට දැන් ඔබ X – 191 දරණ ලේඛනය සෑදීම සඳහා ඒ පරිගණකගත කරලා තියෙන දත්තවලින් ඔය X – 191 සාදන්නට පාදක වුණු අර බුද්ධි තොරතුරේ අඩංගු නම් දාලා සෙවීමකින් පස්සේද මේක හැදුවේ?

පි: ගරු ස්වාමිනි ඒ නම්වලින් අපි වාර්තාව දුන්නායින් පස්සේ ඒක අපි ලේඛනගත පරීක්ෂාවක් සිදු කිරීමක් සිදු කරන්නේ නැහැ. මොකද ගරු ස්වාමිනි අපිට සහරාන් සම්බන්ධයෙන් අපි නිශ්චිතව හඳුනාගෙන තිබුණා. මේ අනිත් පුද්ගලයාත් කවුද කියන එක මේ රිල්වාන් කියන්නෙත් කවුද කියලා දැනන් හිටියා සහ අනිත් පුද්ගලයෝ අපි අනිත් ලේඛනාගාරයේ තියෙන තොරතුරු සම්බන්ධයෙන් පරීක්ෂා කර ගැනීමක් ඒ සම්බන්ධයෙන් documents සොයා බැලීමක් කරන්නේ නැහැ. නමුත් අපිට භූමියේ තිබ්බ තොරතුරුත් එක්ක තමයි වාර්තා කිරීමක් මගේ සහකාර අධ්‍යක්ෂතුමාට කරන්නේ.

ප්‍ර: ඒ කියන්නේ ඔබ X – 191 දරණ මේ draft එක ආකෘතිය හදන විට අර පරිගණකගත කරලා තිබ්බ දත්තයන් සමූහයේ සෙවීමක් කරන්නේ නැතිවයි මේක හැදුවේ?

පි: නැහැ ගරු ස්වාමිනි. දැන් මේකේ ගරු ස්වාමිනි පරිගණකගත කරලා තියෙන අපේ දත්තවල ගරු ස්වාමිනි අපිට සහරාන් හෂිම් කියලා අපේ record එකේ පරිගණකයෙන් search කරාට සහරාන් හෂිම් කියන කෙනා මොකද අපි සහරාන් හාෂිම් කියලා add කරලා තිබෙන නිසා. අනිකුත් නම් තියෙන්නේ සාජිත් මවුලවි ඒ විදිහට අපේ record එකෙන් තොරතුරක් එළියට ගන්න බැහැ. නමුත් අපි LU කිරීමක් කරලා බලනවා. LU කරනවා කියලා අදහස් කරන්නේ ගරු ස්වාමිනි පරිගණකයේ තියෙන එක නැවත search කරලා බැලීමක්. එතන දී මේ නම්වලට නම් කෑලි තියෙන්නේ. නම් කොටස් තියෙන්නේ ඒ නිසා ඒ සම්බන්ධයෙන් දීර්ඝ තොරතුරක් අපේ record වලින් ගන්න බැරි වෙනවා ගරු ස්වාමිනි. ඒ නිසා අපි දන්නේ ඒකේ නිශ්චිත වශයෙන් සහරානුයි රිල්වානුයි එකට ඉන්න දෙන්නා කියලා. ඒ නිසා තමයි නිශ්චිත වශයෙන් ඒ දෙන්නාගේ නම් දෙක ගහලා ඊට අමතරව සහරාන් සම්බන්ධයෙන් වැඩිමනත් දන්න

FAIR COMMENT BY JEZEEM

කෙනෙකුට ඉන්නේ ආමි මොහිදින් කියන එක highlight කරලා තමයි ස්වාමිනි වාර්තාව යවන්නේ.

ප්‍ර: දැන් මම අහපු ප්‍රශ්නයට පිළිතුර තාමත් ලැබුණේ නැහැ. ඔබ මේ X – 191 දරණ ආකෘතිය හදන්න ඉස්සෙල්ලා ඒ පරිගණක දත්ත ගබඩාවේ අර විදේශිය ආයතනයකින් ලැබුණු බුද්ධි තොරතුරේ සඳහන් නම් සෙවීමක් කෙරුවද නැද්ද?

පි: සෙවීමක් කරනවා ගරු ස්වාමීනි.

ප්‍ර: මොන නම්ද හෙව්වේ?

පි: සහරාන් හෂීම්, ජල්අල් කිතාල්, රිල්වාන්, සාජිත් මවුලවි නමට search කරන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර: එහෙම සෙවිමක් කරනවානම් ඒක ඔබ විසින් නෙවෙයිනේ කරන්නේ ?

පි: නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබ ඒ දත්ත ගබඩාව භාරව ඉන්න අධ්‍යක්ෂවරයා නේද?

පි: නැහැ ස්වාමිනි. දැන් මගේ අංශය තුල තියෙනවා ඒ system එකට නැත්නම් ඒ පද්ධතියට ඇතුලත් වෙන්න පුළුවන්. එතකොට මගේ අංශයේ නිලධාරියෙකුට පුළුවන් මේ නම බලන්න මොකක්ද මේකේ තියෙන්නේ කියලා. එහෙම බලලා තමයි ගරු ස්වාමිනි අපි මූලික වාර්තාවක් සකස් කිරීමක් කරන්නේ.

ප්‍ර: ඔබ කියන හැටියට ඒ විදිහට බැලීමක් කෙරුවද?

පි: ඒ විදිහේ බැලීමක් කරා ගරු ස්වාමිනි. LU කරනවා.

ප්‍ර: කවුද LU එක කෙරුවේ?

පි: LU එක කරන්නේ මගේ අංශයේ නිලධාරියෙක් විසින් කරන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර: නම කියන්න

පි: මගේ අංශයේ ඉන්නවා A11 රාළහාමි කෙනෙක්. පොලිස් කොස්තාපල් කෙනෙක්. ඔහු විසින් මේකේ LU කරන්නේ. සෑම වාර්තාවක්ම අපි සාමාන්‍යයෙන් ඒකේ NIC නැත්නම් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ අංකයක් තිබුණොත්, දුරකථන අංකයක් තිබුණොත් ඒ ඔක්කෝම එකට දාලා LU කිරීමක් කරලා තමයි තව තොරතුරු හොයා ගන්න Try කරන්නේ.

ප්‍ර: එතකොට ඕක LU කෙරුවේ කවද්ද?

පි: මට මතක විදිහට ආපු දිනයේම ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ අප්‍රේල් 5 වෙනිදාද?

පි: අප්‍රේල් 5 වෙනිදා ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ දත්ත ගබඩාවේ LU කිරීමක් කෙරුවානම් ඒක වාර්තාගත කරලා තියෙනවා නේද? ඒක වාර්තා වෙනවා නේද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ගොඩාක් වෙලාවට සමහර වේලාවට හදිස්සියෙන් වාර්තාවක් හම්බුණාම ඒක ඒ නිලධාරියාට දීලා එහෙම බලා ගන්නවා. ඒකට ඒ නිලධාරියා සටහනක් යොදන්නේ නැති අවස්ථාත් ගොඩක් වෙලාවට තියෙනවා. මට මේක නිශ්චිත වශයෙන් සඳහන් කරන්න බැහැ. ඒ සම්බන්ධයෙන් මම ඔහුට නියෝගයක් යොදලා ඔහුගෙන් ගත්තා ද කියන එක.

****

දැන් වෙලාව : දැන් වෙලාව ප.ව.6.30
මෙතැන් සිට ල/ලේ : චන්දිමා මෙනවිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව: ප.ව.6.30
පෙර සටහන්: නිල්මිණි කුමාරි
මෙතැන් සිට: චන්දිමා දිල්හානි

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

ප්‍ර: නෑ සටහනක් ගැන නෙමේ මං කියන්නේ දැන් මේ දත්ත ගබඩාවේ යම්කිසි password එකේ තියෙනවානේ ඇතුලු වෙන්න?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: password එකක් තියෙනවා ඒක නම් ඇතුලු වුණ තැනැත්තාගේ ඒ password ඒක භාවිතා කරපු තැනැත්තා ඒ දත්ත ගබඩාවට මෙන්න අප්‍රේල් 05 වෙනි දින මේ වේලාවට ඇතුලත් වුනා කියලා ඒක database එකේ Record වෙනවානේ?

පි: රෙකෝඩ් වෙනවා ගරු ස්වාමිනිනි.

ප්‍ර: මං අහන්නේ ලේඛනය ගැන නෙමේ? database එකේ Record වෙනවා?

පි: Record වෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර: ඔබ කියන විදියට LU එකක් අප්‍රේල් 05 වෙනිදා කෙරුවා නම් ඔබ කියන A 15?

පි: A 1130 ගරු ස්වාමිනි.

ප්‍ර: A 1130 නිලධාරියා ඇතුලත් වුන බවට එහි කරපු සෙවීම තියෙන්න ඕනේ මම නේද?

පි: තියෙන්න ඕනේ.

ප්‍ර: ස්තූතියි

පි: ගරු ස්වාමිනි මේක නිශ්චිතව සඳහන් කරන්න ඕනේ මට මේක නිශ්චිත මතකය අපි සාමාන්‍ය ලියුමක් ආවාම අපි අනිවාර්යෙන් ලේඛන පරීක්ෂා කිරීමක් කරලා තමයි වාර්තා කරන්නේ මට ඒක නිශ්චිතව සඳහන් කරන්න අමාරුයි මොකද මම එදින රාත්‍රියේ මම මඩකලපු යන්න සුදානමින් තමයි ඉන්නේ ප්‍රදේශයේ තොරතුරුකරු හම්බෙන්න සහ ඒ දෙවල් එක්ක මට නිශ්චිත මතකයක් නැති නිසා තමයි මං කිව්වේ ගරු ස්වාමිනි මෙකේ මං සටහනක් සාමාන්‍යයෙන් කරනවා. 1130 LU and Report වගේ එහෙම සටහනක් මට නැති නිසාම මේක නිශ්චිත සඳහන් කරන්න අමාරුයි ගරු ස්වාමිනි.

****

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අශේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: එතකොට LU කරනවා කියලා කියන්නේ මොකක්ද බණ්ඩාර මහත්මයා?

පි: ගරු ස්වාමිනි LU කරනවා කියලා අදහස් කරන්නේ LU and report කියලා අපි ගොඩාක් වේලාවට දන්නේ පුද්ගලයෙක්ගේ සම්බන්ධයෙන් අපිට විමර්ශනයක් ආපු ගමන් අපි මුලින්ම කරන්නේ අපේ රෙකෝඩ්ස් වල තියෙන ඩේටා සෙවීමක් කරනවා ඒ කියන්නේ ඔහු ගැන අපි ළඟ කලින් තියෙනවද කියලා බලා ගන්න .

ප්‍ර: ඒ කියන්නේ lookup එහෙමද?

පි: ඔව්

ප්‍ර: බලන්න කියලා නේද?

පි: ඔව් ගරු ස්වාමිනි

ප්‍ර: එතකොට මට ඊට පස්සේ කියන්න දැන් ඔබ මේ ගරු කොමිෂන් සභාවේ සඳහන් කරා කීප අවස්ථාවකදී 2019 ජනවාරි මාසේ 16 වෙනිදා වනාතවිල්ලුවේ ලැක්ටෝස් වත්තෙන් යම් පුපුරන ද්‍රව්‍ය ඇතුලු නඩු භාණ්ඩ කීපයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සොයා ගැනීම පිළිබඳව?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ වගේම ඔබ ඊයේ දින මා විසින් ඔබට පෙන්වන ලද ඡායාරූපයක් පරීක්ෂා කරමින් එක් ස්ථානයක සිටින්නේ ඔබ වන්නට පුළුවන් කියලාත් කිව්වා .

පි: මොකද මම ඒ ස්ථානයට ගියපු නිසා මා විය හැකියි කියලා තමයි..

ප්‍ර: ඔබ වනාතවිල්ලුවට ගියේ ඔබේ සහකාර අධ්‍යක්ෂවරයා සමඟ කියලා මා කිව්වොත් ඒක නිවැරදිද?

පි: නිවැරදියි ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ අවස්ථාවේදී ඔබලාට යුධ හමුදා නිලධාරීන් මුණ ගැහුනද?

පි: එම ස්ථානයට යන කොට ගරු ස්වාමිනි මාගේ සාහකාර අධ්‍යක්ෂකතුමා

ප්‍ර: මේජර් දිනේෂ් හම්බුනාද?

පි: නිලධාරීන් කීප දෙනෙක් හම්බුනා ගරු ස්වාමිනි.

ප්‍ර: කවුද හම්බුනේ ?

පි: කර්නල් සර් කෙනෙකුත් ඉන්නවා මට එතුමාගේ නම් නිශ්චිත එක මතක නැහැ නමුත් මේ දිනේෂ් කියන නිලධාරියා හම්බනෙවා එතුමා මීට කලින් හම්බෙලා තියෙනවා සමහර තැන්වලදී ඒ නිසා ඔහුගේ නම දන්නවා. මගේ සහකාර අධ්‍යක්ෂතුමා මා සහ ඒ නිලධාරීන් අතර සාකච්ඡා වෙනවා. ඒ වගේම එම ප්‍රදේශයේ මගේ මතකයේ හැටියට තවත් විශේෂ කාර්යාංශ නිලධාරීන් වගේ එවැනි නිලධාරීන් කීප දෙනෙකුත් සිටිනවා මොක ද විමර්ශනය සම්පූර්ණයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කරන්නේ නමුත් අපේ නිලධාරීන් එක

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තැනක ඒ කට්ටිය ඒකත් විමර්ශනයට බාධා කිරීමක් වෙන්නේ නැහැ නමුත් සිද්ධිය සම්බන්ධයෙන් නිරීක්ෂණයට තමයි අපි ඒ වෙලාවේ එතැන්ට යන්නේ ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබත් බුද්ධිමය රාජකාරියක්නේ කරන්නේ බුද්ධි අංශයේ ?

පි: එහෙමයි ගරු ස්වාමිනි.

ප්‍ර: යුද හමුදාවෙන් ඇවිල්ලා හිටියෙත් බුද්ධි අංශයෙන්නේ ?

පි: එහෙමයි ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට පොලිසියෙන් ඇවිල්ලා හිටියද පොලිසියේ බුද්ධි අංශයෙන්?

පි: මට නිශ්චිතව සඳහන් කරන්න අමාරුයි ගරු ස්වාමිනි. නිලධාරීන් කීප දෙනෙක් හිටියා මට ඒ කොයි කොයිකද කියලා

ප්‍ර: දැන් යුද හමුදාවෙන් ආපු එක ඔබ දැන් ස්ථිර කරනවානේ?

පි නිශ්චිතව මතකයි දිනේෂ් කියන නිලධාරියා අපිත් එක්ක හිටපු නිසා

ප්‍ර: ප්‍රශ්නේ අහනකම් ඉන්න යුද හමුදාවෙන් බුද්ධි අංශයෙන් පැමිණියා කියලා ඔබ දැන් ස්ථිර කෙරුවානේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට එහෙමනම් ඔබලා එකිනෙකා හඳුනා ගෙන තියෙන නිසා මේ වගේ වැදගත් කරුණක් ඒ කියන්නේ භයානක කරුණු හෙළිදරව් වෙමින් පවතිනවා පාලු වත්තක පුපුරන ද්‍රව්‍ය ඇතුලු තවත් භාණ්ඩ තොගයක් සොයා ගැනීමක් තමයි දැන් සිද්ධ වෙලා තියෙන්නේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඒක ජාතික ආරක්ෂාවට හිතකරද බණ්ඩාර මහත්මයා?

පි: හිතකර වෙන් නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: එහෙමනම් ඒක ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් සලකලා බලනකොට බුද්ධි අංශයේ වැඩ කරන ඔබලාට ඒක වැදගත් කරුණක්ද?

පි: වැදගත් කරුණක් ගරු ස්වාමිනි

ප්‍ර: 20119 අප්‍රේල් මාසේ 21 වෙනිදා සිදුවුනු පිපිරිමේදී ඔය වනාතවිල්ලුවේ තිබිලා සොයා ගන්නා ලද නඩු භාණ්ඩවලට සමාන දේවල් යොදාගෙන ඒ පිපිරිම් කටයුතු සඳහා යම් යම් දේවල් සකස් කරලා තිබුණා කියලා කියන එක පිළිබඳව ඒ කියන්නේ බෝම්බ සකස් කරලා තිබුණ එක පිළිබඳව ඔබලාගේ අවධානය යොමු වුනාද? මම කියන්නේ වනාතවිල්ලුවේ තිබුණ ඒවා පාවිච්චි කරලා නෙමේ නමුත් එතැන තිබ්බ පුපුරන ද්‍රව්‍ය වගේ දේවල් පාවිච්චි කරලා තමයි 21 වෙනිදා පිපිරිම වුනේ කියලා මං මේ කියන්නේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට 26 වෙනිදා සයින්ද මර්දුවල සිදුවුන පිපිරිම ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඒකේදීත් ඔය වනාත විල්ලුවේ තිබුණ ඒවා විදිහේ ඒවා නේද පාවිච්චි කරලා තියෙන්නෙ?

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට දැන් ඔබ අප්‍රේල් මාසේ අර 05 වෙනදා ඔබට විශ්ලේෂණය කරන්නට ලැබුණ තොරතුරේ තියෙනවා නේද suicide attack එකක් ගැන ?

පි: ඔව් ගරු ස්වාමිනි

ප්‍ර: suicide attack එකක් කරගන්න කොට ඔය වනාතවිල්ලුවේ ඒ හම්බුණු නඩු භාණ්ඩ වගේ දේවල් පාවිච්චි කරන්නට පුළුවන් නේද ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඊළඟට බලන්න ඔබේ තොරතුරේ තියෙනවා නේ suicide attack එකක් ගැන එතකොට ට්‍රක් එකකින් හප්පලත් මරන්න පුළුවන් ඊට වැඩිය හානියක් කරන්න පුළුවන් නේද ට්‍රක් එකට පුපුරණ ද්‍රව්‍ය එකතු කරලා එය පුපුරවා හැරීමෙන් ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එහෙමනම් බණ්ඩාර මහත්තයා ඔබ හිතන්නේ නැද්ද වනාතවිල්ලුවේ සිද්ධිය පිළිබඳව ඔබේ මේ කෙටුම්පතේ ඒ කියන්නේ X191 හි සඳහන් කිරීම උචිතයි කියලා ඔබ ඒකේ සඳහන් කරලා නෑ නේද ඒක ගැන?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: සඳහන් කරලා නැහැ නේද?

පි: සඳහන් කරලා නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: මං ඔබෙන් අහන්නේ එහෙමනම් වඩා උචිත නැද්ද මේ පිටරටකින් ලැබුණු තොරතුරක් විශ්ලේෂණය කිරීම සඳහා ඉතාම වැදගත් අංශයක් මෙහෙයවන මේ විෂය සම්බන්ධයෙන් නිපුණතාවයක් තිබෙන කරුණු අතැඹුලක් සේ දන්න ඔබට ඔබගේ වාර්තාවේ ඒ වනාතවිල්ලුවේ පුපුරන ද්‍රව්‍ය ඇතුලු අනෙකුත් ද්‍රව්‍යයන් සොයා ගැනීම පිළිබඳව මෙහි වාර්තා කිරීම ?

පි: ගරු ස්වාමිනි පාස්කු දින ප්‍රහාරය සිදුවීමෙන් පසු මේ 4.4 තොරතුරේ කරුණු සඳහන් කිරීම සම්බන්ධව තමයි මේ ඒ කියන්නේ විමසීම සිදුවෙන්නේ එතකොට මීට කලින් මම විසින් සහරාන්ගේ සම්බන්ධය සහරාන්ගේ නොලේජ් එකක් තියෙනවා සහරාන් අත්අඩංගුවට ගන්න ඕනේ කියන එක සම්බන්ධයෙන් දිර්ඝ කාලීනව වාර්තා කිරීමක් සිදු කරනවා ගරු ස්වාමිනි. නමුත් මේ තොරතුරෙන් එන කොටත් මම දිගින් දිගටම හැම සිද්ධියකටම අදාලව වාර්තා කිරීමක් කරනවා මාවනැල්ල බුදුපිළිමවලට සහරාන් ගැන කියනවා ඒ වගේම වනාතවිල්ලුව recovery එකෙන් පස්සේ අත්අඩංගුවට ගන්න පුද්ගලයෝ පුහුණු කඳවුරු සම්බන්ධයෙන් වාර්තා කරනවා 3.01 ඒ වගේ යන කොට තමයි මේක වාර්තා කරන්නේ මේ සිද්ධියට මේ තොරතුර එන්න කලින් මේ තොරතුර ලැබෙන පාර්ශවය විසින් මේ සම්බන්ධයෙන් අපිට නිශ්චිතව

FAIR COMMENT BY JEZEEM

සහරාන් සම්බන්ධයෙන් කිසිම වාර්තා කිරීමක් වෙලා තිබුණ් නැහැ හැබැයි සහරාන් සම්බන්ධයෙන් අප විසින් දීර්ඝව වාර්තාවක් කරනවා නමුත් පාස්කු දින සිද්ධියෙන්ම සිද්ධ වුන නිසා මේ තොරතුර තමයි පදනම විදියට දාගන්නේ නමුත් අප විසින් මීට කලින් තොරතුරු ගනණුවක් භූමියේ බොහෝම අමාරුකම් මධ්‍යයේ සොයා ගන්න තොරතුරු ගැන කිසිම විමසිමක් වෙන්නේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: බණ්ඩාර මහත්මයා මම කොයිම අවස්ථාවකදීවත් ඔබලා කරලා තියෙන රාජකාරියවත් මේ සොයා ගෙන තියෙන කරුණුවත් ලඝු කොට තකන්නේ නැහැ ඒක තේරුම් ගන්න ඕනේ හැබැයි අර ඔබ දන්නවා නේද අර මැක්කාගේ න්‍යාය. මොකක් කිව්වත් මැක්කා යන්නේ එතැන්ටමයි නේද මැක්කා පිළිබඳ රචනාව ලියලා තියෙනවා නේද? ඒක මේ අහල තියෙන එකක් මං කියන්නේ නමුත් ඔබගේ ඔය උත්තර දැන් අහන් ඉන්නකොට මට ඒක මතක් වෙන එක නවත්වන්න මට බැහැ මං අහන ප්‍රශ්නයට උත්තර දෙන්නකෝ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: මම ඇහුවේ ඔබගෙන් ඉතාමත්ම කෙටි සහ සෘජු ප්‍රශ්නයක්නේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: මම ඔබෙන් අහන්නේ ඔබට කියලා තියෙන කොට C 4B ලේඛනයේ තියෙන තොරතුරු විශ්ලේෂණය කරන්න ඕක දුන්නේ වෙන කාටවත් නෙමේනේ ඔක දුන්නේ මේ මුස්ලිම් ආගමික අන්තවාදය සම්බන්ධයෙන් මේ අංශය භාර ප්‍රධානියා වන ඔබට එහෙනම් ඒකෙන් අපේක්ෂා කරන්නේ සහකාර අධ්‍යක්ෂවරයා ඔබත් ඔහුත් මේ කරුණු දන්නවා ඒක ඇත්ත නමුත් පිටරටකින් ලැබුණු තොරතුර එහි සඳහන් කරන කොට Shortly කියලා කෙටි කාලයකින් කියලා ඒක පිළිබඳ evaluation එකක්නේ නේද ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට එහිදි කියනවානම් ඔබ කිව්වා 4 ආකාරයකට පහරදීම් සිදුවන්නට පුළුවන් කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එකක් තමයි ස්වයං ඝාතන අකාරයට ?

පි: ඔව් ගරු ස්වාමිනි

ප්‍ර: අනෙක් එක තමයි ට්‍රක් රථයක් මාර්ගයෙන් ට්‍රක් ප්‍රහාරයක් මගින් මං අහන්නේ එතකොට ඔය දෙකේදීම පුපුරන ද්‍රව්‍ය පාවිච්චි කරන්න පුළුවන් හින්දා ඔබට ඔයතරම් අත්දැකීම් තියෙන එකේ ඔබේ ඔය කෙටුම්පතට ඒ වනාතවිල්ලුවේ පුපුරන ද්‍රව්‍ය මෙපමණ ප්‍රමාණයක් විශාල ප්‍රමාණයක් සොයා ගැනීම පිළිබඳව අන්තර් ගත කරලා තිබුණා නම් හොඳයි නේද කියලා?

FAIR COMMENT BY JEZEEM

පි: ගරු ස්වාමිනි මා වාර්තා යොමු කරන්නේ මගේ සහකාර අධ්‍යක්ෂතුමාට එතුමන් මේ සම්බන්ධව එකින් එක දන්නවා එතකොට මං සහරාන් ගැන වාර්තා කරන්නේ මා සහරාන් ගැනත් මේකේ වැඩි විස්තරයක් සඳහන් කරන්නේ නැහැ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් සඳහන් කරන්නේ මීට පෙර අවස්ථාවල මා සහකාර අධ්‍යක්ෂතුමාට වාර්තා කිරීමේ දී මුල්ම අවස්ථාවේදී සහරාන්ගේ ලිපිනය ජාතික හැඳුනුම්පත් අංකය මේ සියල්ලත් එක්ක තමයි සහකාර අධ්‍යක්ෂතුමාට වාර්තා කරන්නේ. නමුත් ඊට පසු කාලිනව සහරාන් මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් නම විතරයි භාවිතා කරන්නේ එතකොට මගේ සහකාර අධ්‍යක්ෂතුමා දන්නවා ඒ හැම සිද්ධියක්ටම අදාලවම සිද්ධියෙන් මා විසින් සිද්ධියට සම්බන්ධයෙන් වර්තා කරනවා ඒ වගේම මේ සිද්ධියට මේ සිද්ධියේ නම් ටිකෙන් කියන පුද්ගලයෝ කවුද කියෙවන එක සහ මේක වලක්ව ගන්න රිල්වාන් කියන කෙනා මීට කලින් තුන්වෙනි මාසේ 07 වෙනිදා මඟින් මඩකලපුවේ අම්පාර අපේ නිලධාරීන් විසින් පෙන්වා දෙනවා අපේ දෙපාර්තමේන්තුවට ඔහුව අත්අඩංගුවට ගෙන මේ තියෙන තොරතුරේ සත්‍ය අසත්‍යතාවය සම්බන්ධයෙන් සහ මේක වලක්වා ගැනීමට කටයුතු කරන්න කියන එක තමයි මගේ වාර්තාවේ මම සඳහන් කරන්නේ ගරු ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඔබ දැන් ප්‍රකාශ කරපු සාක්ෂි හේතුවෙන් මං ඔබට ලේඛන දෙකක් ඔබගේ අවධානය කෙරෙහි යොමු කරනවා ?

පි: ඔව් ගරු ස්වාමිනි.

සාක්ෂිකරුට X 189 දරණ ලේඛනය පෙන්වයි

ප්‍ර: මේ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දුන්නා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ගිය නිලධාරියෙක් ඩයස් කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඔහු කොමිසමට ප්‍රකාශ කෙරුවා ඔහුගේ ආසන්නතම අධීක්ෂණ නිලධාරියා වන මාරසිංහ සහ ඊට ඉහලින් සිටින සහකාර පොලිස් අධිකාරි වික්‍රමසේකරගේ දැනුවත් වීම ඇතුව ආමී මොහිදීන් කියන තැනැත්තාව තොරතුරුකරුවෙක් වශයෙන් තියා ගත්තා කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: X 189 දරණ ලේඛනය කවුරු විසින් කාට යවපු ලේඛනයක්ද?

පි: ගරු ස්වාමිනි මේක යවලා තියෙන්නේ එවකට රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඩී.ආර්.බී සෙනවිරත්න මහතා වෙත ගරු ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: යවපු දිනය කවද්ද?

පි: ගරු ස්වාමිනි 2019.03.01 ගරු ස්වාමිනි.

ප්‍ර: ඔය X 189 දරණ ලේඛනයේ ආමි මොහිදින් ගැන මොකක්ද රාජ්‍ය බුද්ධි සේවය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දන්නවලා තියෙන්නේ?

පි: ගරු ස්වාමිනි අපිට මුල් අවදියේදී වාර්තා වෙන්නේ ආමි මොහිදීන් කියන පුද්ගලයා සහරාන්ගේ ජාලයේ කට්ටියට ගිනි අවි පුහුණුව ලබා දෙන බවක් ඒ වගේම නුවරඑළියේ පංති පැවැත්වීමක් සම්බන්ධයෙන් තොරතුරක් ලැබුණා ස්වාමිනි ඒ තොරතුරේදී සඳහන් වෙනවා මොහු එතැනට ගියා කියන කාරණය ඒ වගේම ස්වාමිනි මොහුට වරෙන්තුවක් තියෙන කාරණය අපිට මතුවෙලා තිබුණේ ඒත් එක්ක ඊට අමරතව මොහු වෙපන් මිලදි ගැනීමක් සම්බන්ධයෙන් තොරතුරකුත් තියෙනවා ස්වාමිනි ඒ නිසා මොහු සම්බන්ධයෙන් විශේෂ සඳහන් කිරීමක් මේ වාර්තාවේ කරනවා ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ ආමි මොහිදීන් ගැන දැන් කියපු ඒ තොරතුරු සියල්ල ඔබ X 189 දරණ ලේඛනයේ අඩංගු කරලා තියෙනවද?

පි: තියෙනවා ගරු ස්වාමිනි.

X 190 දරන ලේඛනය සාක්ෂිකරුට පෙන්නවයි.

ප්‍ර: X 190 දරණ ලේඛනය කවුරු විසින් කාට යවපු ලේඛනයක්ද ?

පි: ගරු ස්වාමිනි එම වාර්තාව එවන්නේ එවකට හිටි රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය ඩී.ඩබ්.ආර්.බී සෙනවිරත්න මහතා වෙත ගරු ස්වාමිනි.

ප්‍ර: දිනය කවද්ද?

පි: 2019.03.30 ගරු ස්වාමිනි.

ප්‍ර: **X 190** දරණ ලේඛනයේ ආමි මොහිදීන් ගැන යම් තොරතුරක් අඩංගු වෙනවද?

පි: සඳහන් වෙනවා ගරු ස්වාමිනි

ප්‍ර: මොකක්ද අඩංගු වෙන්නේ?

පි: ඔහු පාසිකුඩා ප්‍රදේශයේ ස්ථානයක රහසිගතව සැඟව සිටින බවත් සිකුරාදා දිනයේ බිරිඳ සහ දරුවන් බලන්න කාත්තන්කුඩි නිවසකට පැමිණෙන බවත් ස්වාමිනි.

ප්‍ර: ඔය යවපු **X 189 සහ ,X 190** දරණ ලේඛනවලට ඔබගේ දැනුම අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් යම් තොරතුරු ආපසු හරවා එවීමක් සිදුවෙලා තියෙනවද?

පි: මාගේ දැනීමේ හැටියට එහෙම සිදුවීමක් වෙලා නැහැ ගරු ස්වාමිනි 3.1 න් පස්සේ මාගේ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා විසින් දැනුම් දීමක් කරනවා

FAIR COMMENT BY JEZEEM

ඒ ප්‍රදේශයේ නැගෙනහිර පළාතේ ඉන්න අපේ නිලධාරීන්ට මේ පුද්ගලයාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පෙන්වා දෙන්න කියලා ඒ අනුව මගේ දැනිම හැටියට ගරු ස්වාමිනි 2019. 03 වෙනි මාසේ 07 හෝ 8 වගේ දිනක ඒ ප්‍රදේශයේ නිලධාරීන් විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්ත්මේන්තුවේ නිලධාරීන්ට ආමී මොහදීන් සහ රිල්වාන් ඒ වගේම ෂයිනි ඉන්න ස්ථානය ෂයිනි මවුලවි කියන පුද්ගලයා ඉන්න තැන පෙන්වා දෙනවා .

ප්‍ර: ඒ තොරතුරු අප ඉදිරියේ දැනටමත් තියෙනවා ස්තූති.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඊළඟට බණ්ඩාර මහත්මයා ඔබ කිව්වානේ අර 2019 අප්‍රේල් මාසේ 16 වෙනිදා කාත්තන්කුඩිය පාලමුනේ සිදු වූ බයිසිකල් බෝම්බ පිපිරිම ගැන ඒක ගැනත් බැලුවානේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: බණ්ඩාර මහත්මයා 16 වෙනිදා අර පාලමුනේ සිදුවුන පිපිරිම ඒ පිපිරීම බයිසිකල් බෝම්බ පිපිරීමක් කියලා ඔබට අනාවරණය වුනේ කොයි අවස්ථාවේදී?

පි: ගරු ස්වාමිනි 2019 .04.16 වන දින තාලන්කුඩා ප්‍රදේශයේ යතුරු පැදියක් පුපුරා යාම සම්බන්ධයෙන් පොලීසියට පැමිණිල්ලක් ලැබෙන්නේ 2019.04.17 වෙනිදා සවස් කාලයේ ඒ අනුව අපිට 2019.04.18 වන දින උදෑසන ලැබෙනවා ඒ බයිසිකලයේ චැසි නම්බරය ඒ චැසි අංකය ඒ චැසි අංකය ලබා ගැනිමෙන් අනතුරුව අපි චැසි අංකය මොටර් රථ ලියාපදිංචි කිරිමේ කොමසාරිස් කාර්යාලයෙන් පරික්ෂා කිරීමක් කරනවා එතකොට යතුරු පැදි අංකයක් අපිට ලබා ගන්න හම්බ වෙනවා ගරු ස්වාමිනි. ඒ යතුරු පැදි අංකය ඔස්සේ අපි විමර්ශන තොරතුරු රැස් කරනවා

ප්‍ර: අපි ඒක පස්සේ කතා කරමු ඔබ කලිනුත් ඒක ගැන කිව්වානේ නමුත් ඔබේ පිළිතුරෙන් නැවතත් ඒක ස්ථීර වුනා මේ සිද්ධිය වෙලා තිබුණේ අප්‍රේල් මාසේ 16 වෙනිදා කියලා ?

පි: ඔව් ගරු ස්වාමිනි

ප්‍ර: නමුත් ඔබට විශ්ලේෂණය සඳහා මේ C4 B ලේඛනයේ තිබෙන තොරතුරු ලැබෙන්නේ අප්‍රේල් මාසේ 05 වෙනිදානේ ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට එතෙක් තියෙන ඒවා විතරනේ ඔබට විශ්ලේෂණය කරන්න පුළුවන් වෙන්නේ බයිසිකල් බෝම්බේ ගැන ඔබට විශ්ලේෂණය කරන්න බැහැනේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් එහෙමනම් ඔබ කියන්නේ එතෙක් ඔබ පස්වෙනිදා වෙනකම් ඔබ ළඟ තිබුණු තොරතුරු සලකලා බලලා තමයි ඔබ ඔය X 191 කියන කෙටුම්පත පිළියෙල කරලා ඔබේ සහකාර අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කෙරුවේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: සාමාන්‍යයෙන් එහෙම ඉදිරිපත් කරාම එතුමා මොකද කරන්නේ දැන් ඔබ කිව්වානේ ඔබ තරම්ම එතුමත් මේ විෂයේම ජීවත් වෙන කෙනෙක් කියලා ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට මොකක්ද ඔහු ඊළඟට කරන්නේ සාමාන්‍යයෙන්?

පි: එතුමන් ඒ වාර්තාවලට අඩු වැඩිකිරීම් එකතු කිරීමක් කරනවා ඒ කරලා ඒවාට ඇතැම් අවස්ථාවල මේ වාර්තාව නෙමේ වෙනත් වාර්තාවන්ට යම් කිසි තව verify එහෙම නැත්නම් තව පරීක්ෂා කර ගැනීමක් අවශ්‍ය නම් ඒවා පරීක්ෂා කරන්න කියලා උපදෙස් දෙනවා ඒ වගේම ඒ වර්තාවේ ලබා දෙන උපදෙස් අනුව වාර්තාව පිළියෙල කිරීමක් කරලා මා විසින් නැවත යොමු කිරීමක් කරනවා.

ප්‍ර: එතකොට X 191 ත් එතුමා විසින් යම් යම් වෙනස් කිරීම් සංශෝධන කරනු ලැබුවද?

පි: ඔව් ස්වාමිනි මේ වෙනස් කිරීම් කරන ලද වර්තාව

ප්‍ර: එතකොට ඒ අත්අකුරෙන් තියෙන්නේ කවුරු විසින් යොදන ලද සටහන්ද?

පි: සිංහල භාෂාවෙන් සටහන් කරලා තියෙන්නේ එතුමාගේ අත්අකුරු ස්වාමිනි.

ප්‍ර: එතුමා විසින් සටහන් කරලා තියෙන්නේ හොඳයි ඊළඟට ඔබ කිව්වා සමහර වේලාවට ඔබේ සහකාර අධ්‍යක්ෂවරයා ඔබට උපදෙස් දෙනවාය කියලා තවත් තොරතුරු සොයන්නට කියලා?

පි; ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: නමුත් මේ X 191 අනුව ඔබ ඉදිරිපත් කරපු තොරතුරුවලට අදාලව තවත් තොරතුරු සොයන්නට කියලා ඔහු උපදෙස් දුන්නාද ඔබට?

පි: ගරු ස්වාමිනි මේ තොරතුරට සබැඳිව ඊට කලින් වෙන සිදුවීම් මාලවක් හා සමගාමීව මා 4.05 වෙනි දින මා වෙත ලබා දෙනවා උපදෙස් මඩකලපුව සහ අම්පාර ප්‍රදේශවල සංචාර කරලා තොරතුරුකරුවෙක් සහ මේ නිලධාරීන් හම්බෙලා කතා කරන්න අපේ situation එක සම්බන්ධයෙන් දැනුවත් කරන්න. සහරාන්ගේ සිදුවීම සම්බන්ධයෙන් ඒ වගේම ස්වාමිනි ආගමික ප්‍රතිමාවලින් පස්සේ මා අපි ආයත නිලධාරීන් දැනුවත් කිරීමක් කරලා තියෙනවා සහරාන් කියන පුද්ගලයා අත්‍යවශ්‍ය වර්තමානයේ කියන කාරණය සම්බන්ධයෙන්. ඒ වගේම එදින

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

රාත්‍රියේ 4 . 5 වන දින රාත්‍රි කාලයේ මා තවත් නිලධාරීන් දෙන්නෙක් සමඟ යනවා මඩකලපු ප්‍රදේශයට ඒ වගේම ඒ ප්‍රදේශයේ නිලධාරීන්ව දැනුවත් කිරීමකට ලක් කරනවා ස්වාමිනි.

ප්‍ර: දැන් සිංහල ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා කියවන එක ටිකක් අමාරුයි ඔබ දන්නවානේ අත් අකුරු මොකද ගරු කොමිෂන් සභාවේ මහත්ම මහත්මියන්ටත් මේක කියවන්නට බැරිවෙනවා ඒ නිසා ආධාරයක් විදියට ඔබට පුළුවන් නේද අපිට උදව් කරනවාද බණ්ඩාර මහත්මයා මේ ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ අත් අකුරු කියවලා පළවන ඡේදයේ මොනවද කරලා තියෙන සංශෝධන අපි සංශෝදන අනුව විතරක් යන්කෝ ?

පි: ප්‍රහාරයක්.

ප්‍ර: තුන් වෙනි පේළියේ ප්‍රහාර කියන එක ප්‍රහාරයක් කියලා ඔහු සංශෝධනය කරලා තියෙනවා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට පළවෙනි ඡේදයේ වෙන මොනවද කරලා තියෙන සංශෝධන?

පි; ඊට අමතරව ස්වාමිනි තොරතුර පිළිබඳ පරීක්ෂණ ආරම්භ කළ අතර

ප්‍ර: පරීක්ෂණ ආරම්භ කල අතර කියන වචන එකතු කරන්නට කියලා ඔහු උපදෙස් දීලා තියෙනවා? ඊළඟට දෙවන ඡේදයේ?

පි: ලිපියේ සඳහන් පහත කියන ඇතුලත් කිරීම කරලා තියෙනවා.

ප්‍ර: දෙවන ඡේදයේ දෙවන පේළියේ ලිපියේ සඳහන් කියන වචනවලට අනුව පහත කියන වචනය එකතු කරන්නට කියලා උපදෙස් දීලා තියෙනවා? වෙන මොනවද පළවෙනි පිටුවේ දීලා තියෙන උපදෙස්?

පි: ඊට අමතරව ස්වාමිනි පළවෙනි පිටුවේ අවසාන ඡේදයට කලින් ඡේදයට ඇතුලත් කිරීමක් කරන්න කියලා තියෙනවා.මොහු පිළිබඳ ඔබතුමාගේ අත්සනින් කියලා ඉතුරු කර මෙතන පේන්නේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: මෙතන තියෙනවා නේද පළවන පිටුවේ අවසාන ඡේදයට පෙර ඡේදයේ ඒක අවසාන වෙන්නේ බුද්ධි මෙහෙයුමකදී නිරීක්ෂණය වී ඇත කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඊට පස්සේ ඊතලයක් ද තියෙන්නේ පිටුවේ යටට?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: මොකක් සඳහාද කියන්නේ ඒකේ?

පි: එකතු කිරීමක් කරන්න කියලා කියන්නේ ස්වාමිනි මොහු පිළිබඳව ඔබතුමාන්ගේ අත්සනින් කියන ගරු ස්වාමිනි මේක පැහැදිලි නැහැ.

ප්‍ර: ඒක බලන්නකෝ Correction එක අනුව බලල ඒක කිව්වනම් ඒත් කමක් නැහැ ඒක වැඩිය ලේසිනේ?

පි; එහෙමයි ගරු ස්වාමිනි.

ප්‍ර; අත්සනින් ?

FAIR COMMENT — BY JEZEEM

පි: මේ පිළිබඳව ඔබතුමාගේ අත්සනින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත කියලා ගරු ස්වාමිනි.

ප්‍ර: ඒක තමයි සංශෝධනය කරන්න කියලා යෝජනා කරලා තියෙන්නේ අවසාන ඡේදයේ සහ ඊට පෙර ඡේදයේ දැනට තියෙන අවසාන පේළියට පස්සේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර; ඊළඟට දෙවනි පිටුව ගන්න දෙවනි පිටුවේ පළවෙනි ඡේදයේ මොනවද යෝජිත සංශෝධන ?

පි: මුලින්ම අදාල ලිපියේ යනුවෙන් සඳහන් කරන්න කියලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර; ඒ කියන්නේ ඉහත නම් සඳහන් කියන වචන ඉවත් කරලා අදාල ලිපියේ?

පි: ඔව් ගරු ස්වාමිනි.ඊට පස්සේ මිල්හාන් ලෙස සඳහන් පුද්ගලයා කියලා ලියන්න කියලා තියෙනවා ඊට පස්සේ අන්‍යාගමිකයින් කියන එක අයින් කරලා නැවත ඒක ඒ විදියටම තියන්න කියලා උපදෙස් දීලා තියෙනවා.

ප්‍ර; එතකොට ඒ පිටුවේ තුන්වෙනි පේළියේ සමාවෙන්න ස්වාමිනි එම පිටුවේ තුන්වන ඡේදයේ දෙවනි පේලියේ නෑ තුන් වන පේළියේද?

පි: මේ වනතෙක් නිරීක්ෂණය වී නොමැත කියන කාරණයක් ඉස්මතු කරලා තියෙනවා.

ප්‍ර: කොහේද ඒ තියෙන්නේ?

පි: තුන්වෙනි පේළියේ ගරු ස්වාමිනි

ප්‍ර: තුන්වන පේළියේ ප්‍රචාරණයන් පළ කර ඇති බවට?

පි: මේ වනතෙක් කියලා වචනයක් ඇතුලත් කරන්න කියලා තියෙනවා.

ප්‍ර: මේ වෙන තෙක් නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: මේ වනතෙක් නිරීක්ෂණය වී නොමැත කියලායි මේ කියන්නේ? හරි ඊට පස්සේ සංශෝධනය එන්නේ කොතෙන්ටද?

පි: ඊළඟට මා විසින් යොමු කරන ලද වාර්තාවේ අවසාන ඡේදයට කලින් ඡේදය ඉවත් කරන්න කියලා උපදෙස් දීලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර; ඔව් ඒක සම්පූර්ණයෙන්ම ඉවත් වෙනවා?

පි; ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට අවසාන ඡේදය?

පි: අවසාන ඡේදයේත් සැඟවී සිටින කියන තැන ඉඳන් ඉතුරු ටික ඉවත් කිරීමට ලක් කරනවා.

ප්‍ර: මොනවද එතුමා කරන යෝජනා මොන වචනද යොදන්න කියලා කියන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි; ස්ථාන මෙන්ම ලිපියේ සඳහන් ප්‍රහාර සැලසුම් ජාලය පිළිබඳ වැඩිදුර තොරතුරු අනාවරණය කරගත හැකි බව නිරීක්ෂණය වේ මෙම තොරතුරු පිළිබඳව තවත් වැඩි දුරටත් පරීක්ෂණ සහ බුද්ධි මෙහෙයුම් සිදුකරන අතර ඔබතුමාගේ කාරුණික අවධානය සඳහා ඉදිරිපත් කරමි.

ප්‍ර: එහෙම තමයි ඔහු විසින් කරලා තියෙන යෝජනාව?

පි: එහෙමයි ගරු ස්වාමිනි.

ප්‍ර: දැන් එම යෝජනාව ප්‍රකාරව ඔබ විසින් සංශෝධනය කරනු ලැබුවාද කෙටුම් පත?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එසේ සංශෝධිත කෙටුම් පත ඔබ ඉදිරිපත් කරාද ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එය දැන් ඔබට පුළුවන්ද ඉදිරිපත් කරන්නට මෙම ගරු කොමිෂන් සභාවට?

පි: එම වාර්තාව මා සතුව දැනට නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: එයත් බණ්ඩාර මහත්මයා කෙටුම් පතක් විදියටමද ඉදිරිපත් කරේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ස්වාමිනි සාක්ෂිකරු විසින් දෙවන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද කෙටුම් පත X192 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර: ඔබේ ක්‍රමවේදය ප්‍රකාරව මෙහෙම ජ්‍යෙෂ්ඨ නිලධාරියා යෝජනා කරන ලද සංශෝධන ඇතුලත් කිරීමෙන් පසු නැවත කෙටුම් පතක් පිළියෙල කරලා ඉදිරිපත් කරනු ලබන්නේ ඒ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට ද ඒ කියන්නේ ඔබේ සහකාර අධ්‍යක්ෂකවරයාටද?

පි ඔව් ගරුස්වාමිනි

ප්‍ර: ඊට පස්සේ මොකද වෙන්නේ ?

පි; එතුමන් ඒ වාර්තාව ඊට පස්සෙ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා වෙත යොමු කරනවා ඊටපස්සේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා තමයි මේ කොට්ඨාශයේ ප්‍රධානියා හින්දා ඔහු ඒක අත්සන් තබලා අධ්‍යක්ෂ තුමා වෙත යොමු කරනවා

ප්‍ර: එතකොට ඔය හැම අවස්ථාවකදීම හැබැයි අවශ්‍ය නම් කරුණු ඇතුලත් කිරීම හෝ තවත් සංශෝධන එකතු කිරීමට හැකියාව තියෙනවා?

පි: ඔව් ගරුස්වාමිනි.

ප්‍ර: ඊළඟට මා ඔබේ අවධානය යොමු කරනවා C 4 කියන ලේඛනයට C 4C ලේඛනයට C4C ලේඛනයයි ඔබ ඉදිරිපත් කරපු කෙටුම්පතයි දෙක සංසන්දනය කරලා ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න ඔබ මේ දෙවනි අවස්ථාවේ ඉදිරිපත් කරපු කෙටුම්පතෙහි තියෙන අන්තර් ගතයම ද C4 C ලේඛනයේ ඇතුලත් වෙන්නේ කියලා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ගරු ස්වාමිනි එම වාර්තාවේ තිබෙන කරුණු ඇතුලත් වීමක් වෙනවා නමුත් ඇතැම් කරුණු එතැනින් ඉවත් වීමක් සිදුවෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර: ඇතැම් කරුණු ඒ කියන්නේ ඔබේ අර දෙවනි කෙටුම්පතෙහි තියෙන සමහර කරුණු ඉවත් වෙලා තියෙනවා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: C4 C ලේඛනය මොනවද ඉවත්වෙලා තියෙන්නේ? ඔබේ කෙටුම් පතෙහි තියෙන C4 C එකේ නැති ඒවා ගැන අපි ඉස්සෙල්ලා කතා කරමු මොනවද ඉවත් කරලා තියෙන්නේ ඔබේ කෙටුම් පතේ තියෙන ඒවගෙන් ?

පි: දෙවන සහ තුන් වන ඡේදයන් ඒ ඡේදයන් වෙනස්වීමකට ලක් වෙලා තියෙනවා ස්වාමිනි මෙම වර්තාවේ දෙවනි ඡේදයේ තියෙන්නේ ඉහත තොරතුර සම්බන්ධයෙන් කියලා අප විසින් යොමු කරන ලද වාර්තාවේ තියෙන්නේ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් කියන විදියට තමයි ඉස්මතු වෙලා තියෙන්නේ තොරතුරු කෙටි කිරීමකට ලක් කරලා තියෙනවා ස්වාමිනි. දිර්ඝ ලෙස සඳහන් කරන වාරත්තාවේ

ප්‍ර: ඔබේ වාර්තාවේ අපි මෙහෙම කියමුකෝ ඔබ විසින් ඔබේ කෙටුම්පතෙහි ඉස්මතු කරලා තියෙනවා මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් මරාගෙන මැරෙන ප්‍රහාර සඳහා සම්බන්ධ කර ගෙන සිටින පුද්ගලයින් බවට ලිපියේ සඳහන් පහත අයවලුන් කියන කරුණක් එතකොට අර C4 C ලේඛනයේ දෙවනි ඡේදයේ ඒක පේළි තුනකට සීමා වෙනවා එහි මොහොමඩ් සහරාන් පිළිබඳව ඔබේ අර දෙවනි කෙටුම්පතේ තිබෙන ආකාරයට ඉස්මතු කිරීමක් වෙන්නේ නැහැ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඉස්මතු කිරීමක් වෙන්නේ නැහැ?

පි: කෙටි කිරීමකට ලක් කරනවා

ප්‍ර: දැන් ඔබ ඇයි මේක ඉස්මතු කෙරුවේ? ඇයි මොහොමඩ් සහරාන්ගේ නම දෙවනි ඡේදයේ ඔබ මෙහෙම ඉස්මතු කෙරුවේ?

පි: ගරු ස්වාමිනි මට ලබා දෙන වාර්තාවේ තියෙන්නෙත් මොහොමඩ් සහරාන් කියන කාරණය .ඒක නිසා ගරු ස්වාමිනි මා විසින් දෙවනි වාර්තාවේත් මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් මරාගෙන මැරෙන ප්‍රහාර සඳහා සම්බන්ධ කරගෙන සිටින පුද්ගලයින් බවට තියන කාරණයේ තමයි para එක පටන්ගන්නේ.

ප්‍ර; ඒක නිසා තමයි ඔබ ඉස්මතු කෙරුවේ? නමුත් මේ C4 C ලේඛනයේ එහෙම ඉස්මතු කිරීමක් එකේ වෙලා නැහැනේ ?

පි; ඔව් ගරු ස්වාමිනි

ප්‍ර: වෙන මොනවද ඔබේ වාර්තාවේ තියෙන දෙවන කෙටුම් පතේ තියෙන C4 C ලේඛනයේ නැති ඒවා?

FAIR COMMENT — BY JEZEEM —

පි; තොරතුරේ තිබෙන නම් 06 ම මා විසින් මෙතන සඳහන් කිරීමක් කරනවා ගරු ස්වාමිනි. ඒ නම් 06 මෙතැනට වෙනම සඳහන් වීමක් වෙන්නේ නැහැ

ප්‍ර: ඇයි ඔබ වෙනම තොරතුරේ තියෙන නම් 06 ඒ තොරතුරේ තියෙන ආකාරයෙන්ම මේ කෙටුම් පතෙහි ඒ ඉංග්‍රිසි භාෂාවෙන්ම එකක් පස එකක් යට එකක් සටහන් කෙරුවේ? මොකක්ද ඔබේ එකේ අදහස තිබ්බේ?

පි: ගරු ස්වාමිනි ඒ නම් සඳහන් කරපු පුද්ගලයින් අතරින් මොහොමඩ් කාසිම් සහරාන් කියන එක්කෙනා අපි උඩින් සඳහන් කරනවා කවුද කියන එක ඊට අමතරව තියෙන නම් සම්බන්ධයෙන් වාර්තා තියෙනවා නම් කියන එක ඒ නම රිල්වාන් කියන එක රිල්වාන් නම් රිල්වාන් කියලා සඳහන් කරනවා ස්වාමිනි ඒ විදියට තමයි මේක සඳහන් කිරීමකට ලක් කරන්නේ ඒ අදහසින් තමයි මෙතන නම් ටික ඒ විදියටම සඳහන් කරන්නේ

ප්‍ර: නමුත් C4 C ලේඛනයේ ඔබ දෙවැනි කෙටුම් පතේ සිදු කරපු ඒ කරුණු උද්දිපනය අනෙක් පුද්ගලයින් පිළිබඳව වූ කරුණු හුවා දැක්වීම ඔවුන්ගේ නම් ප්‍රමුඛත්වය දාලා සලකපු බව C4 C එකේ බැලූ බැල්මට නෑ නේද?

පි; සහරාන් හෂිම් කියලා තියෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර: දැන් මං මේ අහන්නේ ඔබේ කෙටුම් පතේ තේරුණාද?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: දෙවැනි කෙටුම් පතේ ඔබ දාලා තියෙනවා අර තොරතුරේ තිබ්බ නම් සියල්ලම ඒ පිළිවෙලටම ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඔබ කිව්වා ඒක වැදගත් කියලා මොකද ඒ ලැබුණු තොරතුරු අනුව මේ අය තමයි සහරාන් හෂිම් සමඟ මේ ප්‍රහාරය සඳහා සම්බන්ධ වෙලා තියෙනවා කියලා තොරතුරේ කියන්නේ ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: නමුත් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කිරීමට යන මේ තොරතුරේ C4 C ලේඛනයේ ඒ පිළිබඳව එහෙම කරුණු ඉස්මතු කිරීමක් වෙන්නේ නැහැනේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: දකින දේ කියන්න ඕනේනේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර; ඊළඟට මොනවද ඔබේ දෙවනි කෙටුම් පතේ ඔබ දාලා තියෙන ඒවායින් අයින් කරලා තියෙන්නේ C4 C ලේඛනයේ?

FAIR COMMENT — BY JEZEEM —

පි: මා විසින් රිල්වාන් යන අය සහරාන්ගේ බාල සොහොයුරා කියන විස්තරේ දාලා නම විස්තර ටිකක් සඳහන් කිරීමක් කරනවා ගරු ස්වාමිනි ඒක මොකක් දිර්ඝ විදියකට සඳහන් වීමක් තමයි මෙතන වෙන්නේ.

ප්‍ර: ඒක ඊට වැඩිය වැඩි දියුණු කිරීමක් සිදුකරලා තියෙනවා ඔබ කියන්නේ C4 C ලේඛනය ?

පි: ඒ para දෙකම එකතු කිරීමකට ලක් වෙලා තියෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර; මොකක්ද දෙකම එකතු කරලා තියෙන්නේ ?

පි: මේකේ තියෙනවා ගරු ස්වාමිනි ඔලුවිල් ප්‍රදේශයේ මේ ටික මෙතැන්ට ඇඩ් කිරීමකට කරනවා එකතු කිරීමකට ඒ වගේම මේ ඡේදයේ තියෙන රාත්‍රී කාලයේ කියන කෑල්ල වෙනත් ඡේදයකින් සටහන් කිරීමක් කරනවා ගරු ස්වාමිනි. මේ para විදියට එකතු කරලා වෙන අපරාධයක් විදියට තමයි සඳහන් වෙන්නේ

ප්‍ර ඔබ කියනවා නේද ඔලුවිල් රිල්වාන් ද සිය සමීපතයකු ඉදලා තියෙන්නේ නැත්නම් සහරාන්ද? ඔබ කියන ආකාරයට දෙවනි කෙටුම් පත්ද?

පි; සහරාන් සමීපතයකු ලෙසට නිවසට ඇවිල්ලා තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ ඔලුවිල්වල ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: දැන් C4 C ලේඛනයේ ඒ ඔලුවිල්වලට ගියපු බව එහි සිටිය බවට සහරාන් කියනවද? සඳහන් වෙලා තියෙනවද?

පි: මෙතන තියෙනවා ගරු ස්වාමිනි සහරාන් කියන පුද්ගලයාගේ විස්තර අඩංගු ඡේදයේ සඳහන් වෙනවා ඔලුවිල් ප්‍රදේශයේ රහසිගතව සැඟව සිටින බවට තොරතුරු වාර්තා වී ඇත කියලා ස්වාමිනි

ප්‍ර; හැබැයි ඔබ තරම් සහරාන් පිළිබඳව තොරතුරු එතරම් පුළුල් ලෙස C4 C ලේඛනයේ සඳහන් වෙලා නැහැ නේද? බලන්න සංසන්ධනය කරලා ?

පි; මේ ඡේද දෙකේම එකතු කිරීමකට ලක් කරලා තියෙනවා ස්වාමිනි

ප්‍ර: මං අහන්නේ රිල්වාන් ගැන නෙමේ සහරාන් හෂිම් ගැන ?

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු

පි: ඔව් ගරු ස්වාමිනි

ප්‍ර: X 191 නේ ඔබ හැදුවේ?

පි: ඔව් ගරු ස්වාමිනි

ප්‍ර: C4 C ඔබ හැදුවේ නැහැනේ?

පි: නැහැ ගරු ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: ඔබගෙන් මේ ප්‍රශ්න අහන්නේ දෙක සංසන්දනාත්මකව C4 C එකට වගකියන්න ඕනෙ ඔබ නෙමේනේ?

පි: ඔව් ගරු ස්වාමිනි

ප්‍ර: ඒකයි අහන ප්‍රශ්නේ ඒකට අහලා උත්තර දෙන්න? සරල ප්‍රශ්නයක් අහන්නේ?

පි: මේ දෙවන ඡේදයේ සඳහන් වෙනවා මේ ගරු ස්වාමිනි මා විසින් මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් කියන නම දානවා මේ ඡේදයේ සඳහන් වෙන්නේ සහරාන් හෂිම් සිංහලයට පරිවර්තනය කරලා එතන කියලා සහරාන් හෂිම් ලියනවා ස්වාමිනි . රිල්වාන් කියන නමත්

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඒ කියන්නේ C4 C එකේ තියෙන්නේ සහරාන් හෂිම් කියලා සිංහලෙන් ලියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: නමුත් ඔබේ කෙටුම් පතේ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් කියන සම්පූර්ණ නමම ඔබ සටහන් කරලා තියෙනවා?

පි: ඔව් ගරු ස්වාමිනි

ප්‍ර: නමුත් C4 C ලේඛනයේ එසේ සම්පූර්ණ නම සඳහන් වීම වෙන්නේ ඉහලම ඡේදයේ නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.සඳහන් කරනවා

ප්‍ර: ඒ කියන්නේ ඔබේ පළවෙනි ඡේදය එහෙම්ම අරගෙන තියෙනවාද?

පි: වෙනස් කිරීමකට ලක් වෙනවා ගරු ස්වාමිනි මා විසින් යොමු කරන ලද වාර්තාවේ සඳහන් කරනවා පරීක්ෂණ ආරම්භ කළ අතර වාර්තාව ඉදිරිපත් කරමි කියලා මෙකේ කියනවා වැඩිදුරටත් සඳහන් කර ඇති කියලා ගරු ස්වාමිනි.ඡේදය වෙනස් විමකට ලක් වෙනවා ස්වාමිනි.

ප්‍ර: නමුත් ඔබ නැවතත් මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන්ගේ නම ඉස්මතු වෙන විදියටනේ දෙවන ඡේදයත් ලියන්නේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: අර ඔබට ලැබුණු තොරතුර අනුව ප්‍රහාරය සිදු කරන්නට පුළුවන් කියලා කියන්නේ ඉඩ තියෙන බව කියන්නේ මේ සහරාන් කාසිම්ගේ නම ලිව්වාට පස්සේ C4 C ලේඛනයේ කිසිම ස්ථානයක ඒ ආකාරයට සම්පූර්ණයෙන් නම උද්දීපනය කරමින් පෙන්නුම් කිරීමක් කරන්නේ නැහැ නේ?

පි: ඔව් ගරු ස්වාමිනි

Presidential Secretariat's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: හැබැයි ඔබට ලැබුණු තොරතුර අනුව ප්‍රහාරය සිදු කරන්නට පුළුවන් කියලා කියන්නේ ඉඩ තියෙන බව කියන්නේ මේ සහරාන් හෂීම් සමඟ තමයි කට්ටියක් කරන්න පුළුවන් කියලා කියන්නේ?

පි; ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර එහෙම නම් වෙන මොනවද ඔය වෙනස්කම් ඔබේ කෙටුම්පත සහ C4 C ලේඛනයේ තියෙන ඔබ ඔය යොදලා තියෙන තොරතුරු මොනවද ඉවත් කරලා තියෙන්නේ වෙන C4 C ලේඛනයේ ?

පි: ගරු ස්වාමිනි දෙවන ඡේදය වෙනස් කිරීමට භාජනය වෙනවා. ඒ වගේම නම් හය වෙනස් වීමකට ලක්වෙනවා ස්වාමිනි.

ප්‍ර: මෙතනින් කිව්වොත්?

පි: C4 C වාර්තාවෙන් ඉවත් වීමකට ලක්වෙනවා ස්වාමිනි. ඒ වගෙම් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට කියන්න මගේ කෙටුම්පතේ තියෙන මේ අහවල් දේ C4 C එකේ නැහැ? අන්න එහෙම කිව්වා නම් ගරු කොමසාරිස් තුමාන්ලාට ඒක පහසුයි

පි: මා විසින් යොමු කරන ලද වාර්තාවේ ඉහත සඳහන් රිල්වාන් යන අය විදියට තමයි සඳහන් කරන්නේ එම ඡේදය මෙතන සඳහන් කරනවා රිල්වාන් කියන නමින් මා රිල්වාන් කියන නම මොහොමඩ් කාසිම් මොහොමඩ් රිල්වාන් කියන නම සම්පූර්ණ නම සඳහන් කරනවා

ප්‍ර: සම්පූර්ණ නම යොදලා තියෙනවා ඔබේ වාර්තාවේ?

පි: මෙතන ඒක සිංහලයට පරිවර්තනය කරලා තියෙනවා.

ප්‍ර: මෙතන මෙතන කියලා බැහැ?

පි: සමාවෙන්න ගරු ස්වාමිනි C4 වාර්තාවේ

ප්‍ර: නෑ C4 C මේ තියෙන්නේ

පි: C4 C වාර්තාවේ එය සිංහලයෙන් සඳහන් වීමක් තමයි සිදු වන්නේ ගරු ස්වාමිනි

ප්‍ර: නමුත් ඔබ ඉංග්‍රීසියෙන්ම එක අනිත් ඒ තියෙන සටහනෙන් ඉස්මතු වෙන ආකාරයට තමයි ඔබේ කෙටුම්පත ඉදිරිපත් කරලා තියෙන්නේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: වෙන?

පි: ඒ වගේම ගරු ස්වාමිනි මා විසින් යොමු කරන ලද වාර්තාවේ පළවෙනි පිටුවෙහි අවසන් ඡේද දෙකෙහි සඳහන් තොරතුරු C4 C වාර්තාවේ වෙනත් ආකාරයකට ඡේද දෙහෙක විදියට තමයි සඳහන් වෙන්නේ ගරු ස්වාමිනි. දෙකක් විදියට

ප්‍ර: නමුත් ඒ අදාල තොරතුරු සඳහන් වෙනවද ඒ දෙකේ? නැත්නම් අඩුවීමක් වෙලා තියෙනවාද?

පි; සඳහන් වීමක් වෙනවා ගරු ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර; ඔබ දෙවනි කෙටුම්පතෙහි සපයලා තියෙන නමුත් C4 C ලේඛනයේ අඩංගු නොවන වෙනත් කරුණු මොනවද?

පි: මා විසින් යොමු කරන ලද වර්තාවේ මේ පිළිබඳ ඔබතුමාගේ අත්සනින් ජ්‍යෙෂ්ඨ පොලිස්පතිතුමා අපරාධ පරීක්ෂණ දෙපාර්මේන්තුව කියලා මට සහකාර අධ්‍යක්ෂකතුමා ඇතුලත් කරන්න කියන ඡේදය මෙතන සඳහන් වීමක් වෙන්නේ නැහැගරු ස්වාමිනි

ප්‍ර: ඒ කියන්නේ ඔහුගේ ඒ යෝජනාවත් C4 C හි සංශෝධනය වෙලා තියෙනවා?

පි ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඊට පස්සේ?

පි: මේ මා විසින් එවන වාර්තාවේ පළමු පිටුවේ සඳහන් අවසන් ආමි මොහිදින් කියන එක මේකේ පළවෙනි පිටුවට එන්නේ නැහැ ගරු ස්වාමිනි. එත් වගේම දෙවන පිටුවට ඇතුලත් වෙන්නේ ඊට පහල ඡේදයකින් ස්වාමිනි ඒ කියන්නේ C4 C වාර්තාවේ අවසන් ඡේදයට කලින් ඡේදයේ තමයි ආමි මොහිදීන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් වාර්තා වීම් සිදුවන්නේ .

ප්‍ර: වෙන?

පි ඊට අමතරව ගරු ස්වාමිනි මිල්හාන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් මා විසින් යොමු කරන ලද වාර්තාවේ සඳහන් වෙන්නේ දෙවන පිටුවේ දෙවන සහ තුන්වන ඡේද විදියට ඒක මෙම C4 C වාර්තාවේ සඳහන් වෙන්නේ දෙවන පිටුවේ පළවන ඡේදය විදියට තමයි සඳහන් වෙන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර: නමුත් කරුණුවල අඩුපාඩුවක් තියෙනවද? ඒ කරුණුමද නැවත පෙන්වලා තියෙන්නේ C4 C හි ?

පි: ඒ කරුණුම තමයි ගරු ස්වාමිනි ඉස්මතු වීමක් වෙන්නේ.

ප්‍ර: මා ඔබෙන් අහන්නේ ඔබේ දෙවනි කෙටුම් පතේ තිබෙන නමුත් C4 C හි අන්තර්ගත වෙලා නැති තොරුතුරු?

පි: ගරු ස්වාමිනි මේකේ මා විසින් සඳහන් කරනවා මොහුගේ දුරකථන විශ්ලේෂණය කරමින් භෞතික හඳුනා ගැනීම්ට කටයුතු කර ඇති අතර කියන කාරණය එතැන C4 C වාර්තාවේ එම කරුණු සඳහන් වීමක් වෙන්නේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ කාගේ නම යටතේද?

පි: මිල්හාන් කියන පුද්ගලයාගේ ගරු ස්වාමිනි.

ප්‍ර: නැවත කියන්න ඒක?

පි: මා විසින් සඳහන් කරනවා.

ප්‍ර: මිල්හාන් සම්බන්ධයෙන් සඳහන් කරමින් ඔබ කෙටුම්පතෙහි මොනවද සඳහන් කරලා තියෙන්නේ?

FAIR COMMENT — BY JEZEEM —

පි: මොහුගේ දුරකථනය විශ්ලේෂණය කරමින් භෞතිකව හඳුනා ගැනීමට කටයුතු කර ඇති අතර සමාජ ජාලා ගිණුම් පිළිබඳ පරිගණක සම්බන්ධීකරණ යටතේ මා සිදුකරමින් සිටි කියන එක. අපි අභ්‍යන්තර කටයුත්තක් නිසා මේ වාර්තාවේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: නමුත් දුරකථන තොරතුරු අනුව ඔහුව හඳුනා ගැනීමක් සිදු වෙලා තියෙනවායි කියන එක ඔබේ කෙටුම් පතේ සඳහන් වෙනවා නේද? නැද්ද?

පි: හඳුනා ගැනීමට කටයුතු කර ඇති අතර කියලා ගරු ස්වාමිනි.

ප්‍ර: හැබැයි ඉතින් ඔබලා තවදුරටත් විමර්ශන කරනවානේ එතකොට ඒක දැමීමේ අපහසුවක් නැනේ නේද C4 C වාර්තාවේ ඔබ යොදපු විදියට?

පි: පුළුවන්.

ප්‍ර: වෙන මොනවද ඔබේ කෙටුම්පතේ තියෙන නමුත් C4 C හි නැති ඒවා?

පි: ඒ වගේම ගරු ස්වාමිනි මා විසින් යොමු කරන ලද වාර්තාවේ අවසන් පිටුවේ අවසානයේ සිට තුන්වන ඡේදයේ සඳහන් කරනවා සහරාන් කියන නම සහරාන් නැමැත්තා විසින් කියලා මේක C4 C වාර්තාවේ සඳහන් වෙන්නේ සහරාන් යන අය කියලා ගරු ස්වාමිනි. ඒ වගේම මා විසින් යොමු කරන ලද වාර්තාවේ අවසන් ඡේද දෙක සහරාන් ඇතුලු කියලා ඡේදයක් සඳහන් කරනවා ඒ වගේම රිල්වාන් නැමැත්තා කියලා ඡේදයක් සඳහන් කරනවා ඒ දෙක මේ වාර්තාවෙන් ඉවත් වීමකට ලක්වෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ ඉවත් කරලා තියෙන ඡේද දෙක මගින් ඔබ මොනවද ඊට ඇතුලත් කරලා තියෙන්නේ ?

පි: මා විසින් සඳහන් කරලා තියෙන්නේ සහරාන් ඇතුලු ජාලයේ ඉදිරියේ සැලසුම් පිළිබඳව තොරතුරු වාර්තා වන තොරතුරු පදනම් කර ගනිමින් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය අවට ප්‍රදේශය සහ කොළඹ නගරේ කතෝලික දේවස්ථානය ආසන්නයේ නිරීක්ෂණය සඳහා බුද්ධි නිරීක්ෂණය සඳහා නිලධාරින් යොදවා බුද්ධි තොරතුරු රැස් කිරීමට කටයුත්ත යොදවා ඇත.රිල්වාන් නැමැත්තා සහරාන්ගේ ජාලයේ ක්‍රියාකරනු බැවින් මොහු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීම හරහා සහරාන් සහ මාවනැල්ල සිදුවීමට සම්බන්ධයෙන් සැඟව සිටින ස්ථාන මෙන්ම ලිපියේ සඳහන් ප්‍රහාර සැලසුම් ජාලය පිළිබඳ වැඩි දුර තොරතුරු අනාවරණය කරගත හැකි බව නිරීක්ෂණය වෙයි මෙම තොරතුරු පිළිබඳ වැඩිදුරටත් පරීක්ෂණ සහ බුද්ධි මෙහෙයුම් සිදු කරන අතර ඔබතුමාගේ කාරුණික අවධානය සඳහා ඉදිරිපත් කරමි.

ප්‍ර; දැන් ඒ කරුණු එහෙමනම් C4 C ලේඛනයේ නැහැ කියලා ඔබ කියන්නේ? සංසන්දනය කරලා?

FAIR COMMENT
BY JEZEEM

පි: සඳහන් කරන කොට නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර; දැන් මා ඔබේ කෙටුම්පත කෙරෙහි ඔබේ අවධානය නැවත යොමු කරනවා එහි කියනවා නේද දෙවන පිටුවේ අවසාන ඡේදයට පෙර ඡේදයේ දී සහරාන් ඇතුළුව ජාලයේ ඉදිරි සැලසුම් පිළිබඳව වාර්තා වන ලද තොරතුරු පදනම් කර ගනිමින් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය අවට ප්‍රදේශයේ සහ කොළඹ නගරයේ කතෝලික දේවස්ථාන ආසන්නයේ බුද්ධි නිරීක්ෂණයන් සඳහා නිලධාරී කණ්ඩායම් යොදවා බුද්ධි තොරතුරු රැස් කිරීමට කටයුතු යොදා ඇත කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ ඒ ඡේදය ඇතුලත් කරන කොට කෙටුම්පතට මේ කියන දත්තයන් ඔබට කොහෙන්ද ලැබුනේ? එකක් තමයි ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය අවට ප්‍රදේශයේ බුද්ධි තොරතුරු රැස් කිරීමට නිලධාරින් යොදලා තියෙනවා දෙවනි එක කොළඹ නගරයේ කතෝලික දේවස්ථාන ආසන්නයේත් බුද්ධි නිරීක්ෂණ සඳහා නිලධාරී කණ්ඩායම් යොදවලා තිබෙනවා. ඒ කරුණු දෙක ඔබට කොහෙන්ද ලැබුණේ මේ කෙටුම්පතෙහි අන්තර්ගත කරන්න?

පි: ගරු ස්වාමිනි මගේ මතකයේ හැටියට යොමු වුන මුල් වාර්තාවේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ගැන සඳහන් වීමක් තිබුණා

ප්‍ර: ඔව් කතෝලික පල්ලි?

පි: එම වාර්තාවේම ගරු ස්වාමිනි සඳහන් වෙනවා මං පළවෙනි ඡේදයේම සඳහන් කරනවා ඒ තොරතුරේ තියෙන කරුණු ඒ විදියටම ඒ විදියටම තමයි මා මෙම වාර්තාවේදීත් අවසන් පිටුවේ අවසන් ඡේදයට කලින් ඡේදයේ ඒ වගේ සඳහන් කිරීමක් කරන්නේ.

ප්‍ර; දැන් මම ඔබ ඒකේ යොදලා තියෙන වචනයක් නිසයි ඒක ඇහුවේ මොකද දැන් අර C4 B ලේඛනයේ ඒ පළවෙනි ඡේදයේ තියෙන්නේ මෙන්න මෙහෙමයි As per an input Sri Lanka based zaharan Hasim important churches එතකොට of Nation thowheed jamath and his associates are planning to carry attack in Sri lanka shortly some some important churches are planning to target කියලානේ ඒකේ තියෙන්නේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ කතෝලික පල්ලි කියලා ඔතන සඳහන් කරේ මොනපදනමක් මතද?

පි: churches කිව්වාම අදහස් කරන්නේ කතෝලික

ප්‍ර: ඔබේ ආගම මොකක්ද?

පි: බෞද්ධ ගරු ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට ඔබ දන්නවද ස්තියානි ඒ ආගමේ ක්‍රිස්තියානි සහ කතෝලික ඒ වගේම ප්‍රොතේස්තන්ත්‍ර ඒ වගේ විවධ නිකායන් තියෙනවා කියලා? නිකායන් තියෙනවා කියලා?

පි: සාමාන්‍ය දැනීමක් තියෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට එහෙනම් මට කියන්නකෝ ඇයි මේ කතෝලික පල්ලි කියලා මෙතන සඳහන් කරේ?

පි: මා අදහස් කරන්නේ ස්වාමිනි කතෝලික යනුවෙන් ක්‍රිස්තියානි ඒ සියලු දෙනාම වෙන් කිරීමකට මෙතෝදිස්ත ඒ වගේ වෙන් කිරීමක් මම දන්නේ නැහැ ස්වාමිනි. නමුත් කතෝලික යනුවෙන් අදහස් කරන්නේ අරකේ important churches කියන වචනය තමයි කතෝලික කියලා සඳහන් කරන්නේ ඒ වගේම මම විසින් යොමු කරන ලද වාර්තාවේ පළවෙනි පිටුවේත් මා සඳහන් කරන්නේ. ප්‍රසිද්ධ කතෝලික පල්ලි කියලා.

ප්‍ර: ඒ කියන්නේ ඔබ අදහස් කරන්නේ ජේසුතුමා අදහන ඒ ගොල්ලෝ ඔක්කොමන්ලා කතෝලිකයෝ කියලාද?

පි: ඔව් ගරු ස්වාමිනි. මම ඒ ගැන කතෝලික ආගම ලොකුවට දැනීමක් නැහැ ගරු ස්වාමිනි

ප්‍ර: දරුවෝ ඔය ගොල්ලන්ගේ තියෙනවා කියලා ඊයේ මට කිව්වා නේද පල්ලි පිළිබඳව data base ඒකේ? ඒකේ තියෙනවා නේද ක්‍රිස්තියානි සහ කතෝලික පල්ලි පිළිබඳ වෙනම තියෙනවා නේද තොරතුරු ?

පි: ගරු ස්වාමිනි මා එදින සඳහන් කරා මා මුස්ලිම් පල්ලි සම්බන්ධයෙන් මට දැනීමක් තියෙනවා ගරු ස්වාමිනි ඒ වගේම data තියෙන කියන එක සම්බන්ධයෙන් මට නිශ්චිතව සඳහන් කරන්න බැහැ. මට ඒ සම්බන්ධව විශාල දැනීමක් නැහැ ඒ නිසා මම කතෝලික ආගම සම්බන්ධයෙන් පරීක්ෂා කරන්න වෙන අංශයක් විසින් ඒ නිසා ඒ සමබන්ධයෙන් වැඩිදුර විස්තරයක් දන්නේ නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර: ඕක තමයි ගරු සභාපතිතුමා ඇහුවේ ඔබෙන් මේ තොරතුර ලැබුණාම අර දත්ත ගබඩාවට ගිහිල්ලා ඒවා පරීක්ෂා කරාද කියලා එතකොට ඔබ කිව්වානේ අර LU එකක් කෙරුවා කියලා ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ lookup එතකොට important churches catholic කියලා ඔබ කතලික් කියලා කිව්වාම ඒවත් බැලුවානම්ද හොඳ බැලුවේ නැද්ද නිකම්ද ලිව්වේ මොකක්ද වුණේ?

පි: ගරු ස්වාමිනි තොරතුරේ තියෙන important churches කියන කාරණේ record check කිරීමකට ලක් කරේ නැහැ ගරු ස්වාමිනි. නම් ටික තමයි LU කිරීමට මා විසින් ලක් කරේ මගේ මතකය හැටියට ගරු ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: නම් ටික විතරයි?

පි: ඔව් ගරු ස්වාමිනි. පුද්ගලයන්ගේ නම් ටික පමණයි ගරු ස්වාමිනි.

ප්‍ර: හරි එතකොට දැන් ඔබ වෙනස්කම් එහෙනම් සොයා ගත්තානේ මේ දෙකේ තියෙන ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර එහෙමනම් ඔබට කියන්න පුළුවන්ද මේ C4C ඔබේ දෙවනි කෙටුම්පත මත පදනම්ව යම් යම් සංශෝධනයන්ට ලක් කරලා පිළියෙල කරන ලද ලේඛනයක් කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට මෙහෙම සංශෝධනයන්ට ලක් කරලා ඔය C4 C වගේ ලේඛනයක් පිළියෙල කරාට පස්සේ ඔබේ ක්‍රමවේදය අනුව ඊළඟට මොකද වෙන්නේ?

පි: ඇතැම් අවස්ථාවල ගරු ස්වාමිනි මට මේ වාර්තාව සකස් කරේ කවුද කියන එක සම්බන්ධයෙන් නිශ්චිත මතකයක් නැහැ ගරු ස්වාමිනි නමුත් මා විසින් සකස් කරන ලද කෙටුම් පත මගේ අංශයෙන් සකස් කරන්නේ ඒ වගේම මේ .

ප්‍ර: දැන් මේ C4 C ලේඛනය ඒ වාර්තාව කවුරු විදියෙන් එහෙම නම් හදන්න පුළුවන්ද? දැන් ඔබ කිව්වානේ විනාඩියක් ඉන්න දැන් ඔබ කිව්වා ඔබේ සහකාර අධ්‍යක්ෂවරයාට තමයි ඔබ මේක ඉදිරිපත් කරන්නේ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: පළවෙනි කෙටුම්පත ඉදිරිපත් කරාට පස්සේ එතුමා විසින් යම් සංශෝධන ඔබට යෝජනා කරා ඒ යෝජනා අන්තර්ගත කරලා ඔබ දෙවන කෙටුම්පත පිළියෙල කරලා ඔහුට ඉදිරිපත් කරා ?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට මේ C4 C ලේඛනයේ මේ ආකාරයට ඔබේ දෙවනි කෙටුම්පතෙහි වූ ඇතැම් දේවල් ඉවත් කරලා සංශෝධනය කරමින් ඉදිරිපත් කරන්නට පුළුවන්කම තියෙන්නේ මොන මොන නිලධාරීන්ටද කියලා කියන්න?

ප්‍ර: ගරු ස්වාමිනි මාගේ සහකාර අධ්‍යක්ෂතුමාටත් පුළුවන්කම තියෙනවා,ඒ වගේම නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමාටත් හැකියාවක් තියෙනවා, ඒ වගේම අධ්‍යක්ෂකතුමාටත් හැකියාවක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර: අධ්‍යක්ෂක තුමාටත් හැකියාව තියෙනවා හොඳයි දැන් මේ අදියර පහුවුනාට පස්සේ ඒ කියන්නේ එහෙම වාර්තාව දැන් අධ්‍යක්ෂතුමාට යනවානේ ඒතකොට ඒ යන්නේ ඔබ මේ C4 C කියන වාර්තාව තමයි දැන් යන්නේ අධ්‍යක්ෂකතුමාට?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: මා විසින් මීට ප්‍රථම නිරීක්ෂණයට කරන ලද වාර්තාව තමයි යන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර: කොයිකද ?

පි: මීට කලින් මට වාර්තාවක් පෙන්නුවේ ස්වාමිනි මගේ සහාකාර අධ්‍යක්ෂකතුමාගේ අත්සන සහිත වාර්තාවක්

ප්‍ර: මේකද යන්නේ එතකොට?

පි; එහෙමයි ගරු ස්වාමිනි.

ප්‍ර: මේ තමයි ඔබේ ?

පි: සහාකාර අධ්‍යක්ෂතුමා අත්සන් කර තිබෙන්නේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා වෙනුවට ගරු ස්වාමිනි එදින වාර්තාව යවන්නේ 2019.04.05 වෙනිදා මගේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා වෙනුවට සහකාර අධ්‍යක්ෂතුමා තමා අත්සන් කරලා තිබෙන්නේ එතුමාගේ අත්සන යොදලා යවලා තියෙන්නේ ගරු ස්වාමිනි.

ස්වාමිනි නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙනුවට සාක්ෂිකරු විසින් H කොට්ඨාශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක වෙනුවට සාක්ෂිකරු විසින් ඔහුගේ සහකාර අධ්‍යක්ෂකවරයා විසින් 2019.04.05 වන දින අත්සන් කොට අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි සේවාව වෙත ඉදිරිපත් කොට ඇති බවට සාක්ෂිකරු හඳුනා ගනු ලැබූ මෙම ලේඛනය **X** 192 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා ගරු ස්වාමිනි.

ප්‍ර: මේක පළවෙනි එක?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: ඒක තමයි X 191 හරි එතකොට ඔබ කියන්නේ මේක තමයි දෙවනි කෙටුම්පත ඔබ දාපු එක?

පි: ඔව් ගරු ස්වාමිනි

ප්‍ර: දැන් අපි නැවතත් අර වාර්තාව පිළියෙල කිරීම පහසු කර ගැනීම සඳහා ඔබ මගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් ලේඛන දෙකක් සංසන්දනය කෙරුවානේ.

පි: ඔව් ගරු ස්වාමිනි

ප්‍ර: සංසන්දනය කරලා ඔබ කිව්වා ඔබේ කෙටුම්පතෙහි තිබෙන ඇතැම් කරුණු ඒ අනෙක් ලේඛනයේ සඳහන් වෙලා නැති අවස්ථාවන් ගැන සඳහන් කරා.එහෙම නැත්නම් ඔබේ ලේඛනයේ තිබෙන ඔබේ කෙටුම්පතෙහි සඳහන් දේවල් වෙනස් ආකාරයකට අනෙක් ලේඛනයේ සඳහන් කරාය කියලා කිව්වා

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබේ ලේඛනයේ කියලා ඔබ ඒ අවස්ථාවේදි පරීක්ෂා කරේ X192 වශයෙන් ලකුණු කරලා අපි මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරපු ඔබේ දෙවනි කෙටුම්පත නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර; එතකොට ඔබ ඒම කෙටුම් පත සමඟ සංසන්දනය කරේ දැනටමත් ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් වෙලා තියෙන C4 C කියන ලේඛනය නේද?

පි: ඔව් ගරු ස්වාමිනි.

වේලාව:ප.ව 7.30

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වෙලාව 7.30
පෙර සටහන් චන්දිමා
සටහන් ගැනීම යමුනා දසනායක

<u>ගරු විනිසුරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර සාක්ෂිකරු ඔබ ඔබගේ C4 C කියන එකට පෙර ඔබ X.191 කියල එකක් හැදුවානේ, 01 වෙනිම ලේඛනය , ඒ ලේඛනයේ තිබෙනවා අවසාන ඡේදයේ සහරාන් යන අය සමාජ ජාල ගිණුම් ඔස්සේ සිය අනුගාමිකයින් අභිප්‍රේරණය කිරීමේදී මෙරට කතෝලික පල්ලි සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඉලක්ක කරගන්නා ලෙසට නිශ්චිතව සඳහන් කළ බවට මේ වන තෙක් නිශ්චිතව නිරීක්ෂණය වී නොමැති නමුත් සියලු අන්‍යාගමිකයන් ඝාතනය කිරීම උතුම් ආගමික කරුණක් බවත්, අන්‍යාගමිකයින් විනාශකරමින් ඉස්ලාම් ධර්මය ප්‍රවර්ධනය කළයුතු බවත්. සහරාන් කොයිම අවස්ථාවකවත් ඔහුගේ දේශනවල මේ ඉස්ලාමය ප්‍රවර්ධනය කළ යුතුයි කියලා කියල තියෙනවද, එහෙම නැත්නම් , ඉස්ලාම් රාජ්‍යයක් ඇති කළ යුතුයි , අන්‍යාගමිකයන් මරා දැමිය යුතුයි කියලද කියලා තියෙන්නේ?

උ ගරු ස්වාමිනි, ඔහු සඳහන් කරන්නේ අන්‍යාගමිකයන් ඝාතනය කරමින් ඉස්ලාම් රාජ්‍යයක් ඇති කළයුතුයි. ඒ වගේම ඉස්ලාමය තමයි ලෝකයේම ඇති කරන්න ඕන කියන කාරණය.

ප්‍ර ඉතින් එහෙමනම් සහරාන් නිතරම කියන්නේ, ඇයි මේ වාර්තාවේ ඒක ඒ ආකාරයෙන්ම කියලා මෙහි භයානක තත්ත්වය කියවන්නාට අවබෝධ කරගැනීමට ඉඩහරින්නේ නැතිව අන්‍යාගමිකයින් විනාශ කරමින්. විනාශ කරමින් කිව්වහම ඝාතනය කරනවයි කියල අදහස් වෙන්නේ නැහැ. ඉස්ලාමය ප්‍රවර්ධනය කළයුතුයි කිව්වහම ඉස්ලාම් රාජ්‍යයක් බිහිකළ යුතුයි කියන එක අදහස් වෙන්නෙත් නැහැ. ඔබගේ සටහනේත් එම තොරතුර නැහැ.අවසාන
C4 C එකටත් එම තොරතුර ඇවිල්ලා නැහැ. ඒක ගැන ඔබට කියන්නට පුලුවන්ද ඇයි එහෙම වුනේ කියලා?

උ ගරු ස්වාමීනි, මෙහි අපි සඳහන් කරන්නේ මේ සහරාන්ගේ සිදුකළ නිරීක්ෂණවලදී ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඉලක්ක කරගන්න කියන කාරණයක් ඔහු ඉස්මතු කරලා තිබුනේ නැහැ. නමුත් ඔහු නිරන්තරයේන්ම සඳහන් කරන්නේ අන්‍යාගමිකයන් ඝාතනය කරන්න ඕන කියන කාරණය. ඉස්ලාමය ප්‍රවර්ධනය කළයුතුය කියලා අදහස් කරන්නේ ඔහු දිගින් දිගටම සඳහන් කරන්නේ ඉස්ලාම් රාජ්‍ය යක් කියන කාරණය නිසා මම ඒ විදිහට සඳහන් කිරීම කට ලක්කරන්නේ ගරු ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඔබ දන්නවා ඔය සහරාන් හැම තිස්සේම කිව්වා අන්‍යාගමිකයන් මරාදැමිය යුතුයි සහ ඉස්ලාම් රාජ්‍යයක් බිහිකල යුතුයි කියලා.

උ ඔව්.

ප්‍ර නමුත් මේ වාර්තාවේ තියෙන්නේ අන්‍යාගමිකයින් විනාශ කරමින් ඉස්ලාමය ප්‍රවර්ධනය කළයුතුයි කියලා. එතකොට දැන් මේ වාර්තාව කියවන පොලීසියේ හෝ කිසියම් ස්ථානයක නිලධාරියෙකුට අවබෝධ වෙනවද මේ සහරාන් කියන පුද්ගලයා ඉතා භයානක දේවල් කියපු පුද්ගලයෙක් ඔහුව කොහොම හරි අත්අඩංගුවට ගැනීමට කටයුතු කළයුතුයි කියලා මෙන්න මේ අන්‍යාගමිකයින් විනාශ කරමින් සහ ඉස්ලාමය ප්‍රවර්ධනය කළයුතුයි කියන ඒ වාක්‍යයෙන් ?

උ ගරු ස්වාමිනි මා මේ වාර්තාව යොමු කරන්නේ මගේ සහකාර අධ්‍යක්ෂතුමාට එතුමන් මේ සම්බන්ධයෙන් දැනිමක් තියෙනවා. ඒ වගේම මම අදහස් කරන්නේ එතුමත් දැනීම තියෙන නිසා ගරු ස්වාමිනි, නිරන්තරයෙන් වාර්තා අපි සහරාන් සම්බන්ධයෙන් දෛනිකව වාර්තා යොමු කිරීමේ අවස්ථාත් තියෙනවා, ඒ වගේම නිරන්තරයෙන් සහරාන්ගේ තියෙන මේ තත්ත්වය සම්බන්ධයෙන් තමයි වාර්තා කිරීම් කරන්නේ ඒ නිසා විශේෂයෙන් ඒ සම්බන්ධයෙන් ඇතුලත් නොකළත් සහරාන්ගේ තියෙන ප්‍රවර්ධනය තමයි එතනදි අදහස් කරන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර ඒ එක්කම අර ඔබ ඇතුල් කරලා තිබුණුනේ අර ජිහාද් කිරිම වැනි වගන්තියක් ඒ ඡේදයක් ඒකත් සම්පුර්ණයෙන්ම අයින් කරලා තියෙනවා නේද? ඔබගේ X.191 කියන මුල්ම කෙටුම්පතේ?

උ ගරු ස්වාමිනි, 191 කියන වාර්තාව මෙතන නැහැ ගරු ස්වාමිනි,

ප්‍ර අර ඔබ හදපු පළවෙනිම කෙටුම්පත ඔබගේ ඉහළ නිලධාරියාට දැන්වීමට දැම්මේ අර අත්අකුරුවලින් යම් යම් තැන්වල දේවල් ලියලා තිබුණේ, ඒකෙන් ඒ අර ජිහාදය කියන ඡේදයම අයින් කරලා තිබුණා. දැන් ඒකත් අයින් කරලා ඒකත් මේ වාර්තාවෙන් අයින් කරලා මේ කියන විදියට අන්‍යාගමිකයින් විනාශ කරමින් ඉස්ලාමය ප්‍රවර්ධනය කළයුතු බවටත් කියලා කිව්වහම කියවන පුද්ගලයෙකුට මේ සහරාන් පිළිබඳව ඔහුගේ භයානකකම පිළිබඳව නියම ප්‍රතිරූපයක් හිතාගන්න අමාරු වෙනවා නේද?

උ ගරු ස්වාමිනි , මා සහකාර අධ්‍යක්ෂතුමා වෙත වාර්තා කරන්නේ. එතුමන් මේ විෂය සම්බන්ධයෙන් දැනුමක් තියෙන නිසා එතුමන්ට වාර්තා කරන්නේ ගරු ස්වාමිනි,

****

FAIR COMMENT
BY JEZEEM

ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා

ප්‍ර සාක්ෂිකරු ඔබ ඊයේ ඉදිරිපත් කළා ඔය ජමීල් ඇතුලු සැකකරුවන් 94 දෙනෙකුගේ ලැයිස්තුවක් ඉදිරිපත් කළා නේද?

උ ඔව්ගරු ස්වාමිනි94ක් සහ ඊට පස්සේ 129 ක වාර්තා 02ක් ගරු ස්වාමිනි.

ප්‍ර ඒ අනුව ජමීල් විදේශ පුහුණුව X.172 කියලා?

උ ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර එම ලේඛනය අනුව ජමීල් තමයි විදේශිය පුහුණුව ලැබූ ISIS මතධාරී , දැඩි මතධාරියෙක් වශයෙන් ඔබ වාර්තා කරලා තිබෙනවා?

උ විදේශ පුහුණුව ලැබුවා කියලා වාර්තා කරලා නැහැ ස්වාමිනි අපි කවදාවත් ඔහු 2014 වර්ෂයේ තුර්කියට ගිහිල්ලා සිරියාවට යන්න බලලා පෙර සූදානම නිරීක්ෂණය කරලා ඉන්පසුව නැවත ලංකාවට ඇවිල්ලා සිරියාවට යාමේ අවශ්‍යතාවයෙන් ඉන්න පුද්ගලයෙක් සහ ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධානය නිර්මාණය කරන්නේ ඔහු සහ තව ඉමාඩ් කියන පුද්ගලයා කේන්ද්‍ර කරගෙන කියන එක තමයි වාර්තා කරලා තිබුනේ ගරු ස්වාමිනි.

ප්‍ර ඔහු ඕස්ට්‍රේලියාවේදි ISIS සංවිධානය සමග සම්බන්ධවෙලා හිටියා කියලා නිරීක්ෂණය කළාද?

උ අපිට ඕස්ට්‍රේලියාවේදි ඔහු ISIS එකේ පුහුණුව ලැබුව කියලා තෙරතුරු තිබුණේ නැහැ ගරු ස්වාමිනි, නමුත් ඕස්ට්‍රේලියාවේදි දී ඔහු අල්පුරුකාන් කියන තැනට ගියා කියන කාරණයක් විතරයි අනාවරණය වෙලා තිබුණේ ගරු ස්වාමිනි.

ප්‍ර දැන් ස්වයං ඝාතනය වුනු පුද්ගලයින්ගෙන් මුල් ලැයිස්තුවේ සිටියේ ජමීල් පමණයි නේද?

උ ගරු ස්වාමිනි සහරානුත් ඒ ලැයිස්තුවේ ඉන්නවා

ප්‍ර ජමීල් සහ සහරාන් පමණයි?

උ ඔව්

ප්‍ර දැන් ඔබට කියන්න පුළුවන්ද ඒ ISIS දැඩි මතධාරි ජමීල් වැනි පුද්ගලයෙකු විසින් ටජ් හෝටලය ඉලක්ක කරගෙන ගිය ඉලක්කය ඔහු විසින් ඉටුකර ගන්න බැරිවුනේ ඇයි කියලා? අනෙකුත් එතරම් දැඩි මතධාරි නොවන මුල් අවස්ථාවේ සිටිය මෙම සංවිධානයට බැඳිල නොසිටිය පුද්ගලයින් සාර්ථකව තම ඉලක්කයන් සපුරා ගත්තා. නමුත් ජමීල්ට මෙම ඉලක්කය සපුරාගන්න බැරිවුනේ ඇයි? ඔබගේ බුද්ධි වාර්තාවන්, තොරතුරු අනුව කියන්න පුලුවන්ද?

උ ගරු ස්වාමිනි ජමීල් කියන පුද්ගලයා අපිට නිරීක්ෂණයට ලක්වෙන්නේ 2015 මුල් කාලයේදි ගරු ස්වාමිනිඒ 2014 සහ 2015 වර්ෂවලදි ISIS සංවිධානයට පුද්ගලයෝ ලංකාවෙන් ගමන් කරා කියන කාරණයේදිත්, 2015.07.12 වෙනිදා සිරියාවේදි නීලාම් කියන පුද්ගලයා ඝාතනය වීමෙන්

FAIR COMMENT BY JEZEEM

පසුව අපි සිදුකරන ලද විමර්ශණවලදි තමයි අනාවරණය වන්නේ ගරු ස්වාමිනි එයිට පසුකාලිනව අපි අනාවරණය කරගන්නවා ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධානය ජමිල් කියන පුද්ගලයා සහ ඉමාඩ්ඩ් කියන පුද්ගලයා වටා කේන්ද්‍ර වෙනවා කියලා ගරු ස්වාමිනි. එහිදි අපි ජමිල් කියන පුද්ගලයා වෙනස්ව හඳුනා ගන්නවා ඔහු සිරියාවට යාමට හෝ ශ්‍රී ලංකාව ඉස්ලාම් රාජ්‍යයක් කරන්න ඕන කියන මතයෙන් පෙලෙන පුද්ගලයෙක් කියලා. ඒ වගේම ඔහු බටහිර සහ අනෙකුත් ජාතින්ට විරුද්ධව කතා කරන පුද්ගලයෙක් කියන එක සම්බන්ධයෙන් තමයි අනාවරණය වන්නේ ගරු ස්වාමිනි. මම ඒ සම්බන්ධව තොරතුරු වාර්තා කරලා තියෙනවා ගරු ස්වාමිනි. එතකොට ජමිල් කියන පුද්ගලයා ටාජ් සමුද්‍රා හෝටලයට ගිහිල්ලා ඔහු විසින් පුපුරුවා ගැනීම සිදුකරපු සම්බන්ධ විමර්ශණ කිරීමේදී අනාවරණය කරන්නේ ඔහුගේ ඔහු භාවිතා කරන ලද පුපුරන අයිතමය පිපිරුනේ නැහැ කියන කාරණය. නමුත් ඔහුගේ මතවාදය ඔහු විසින් 2014, 2015 සහ ඔහු ඕස්ට්‍රේලියාවේ සිට පැමිණීමෙන් අනතුරුව ඔහුගේ හැසිරීම් නිරීක්ෂණය කරහාම සහ ඉස්ලාම් රාජ්‍ය මතවාදය තියෙන පුද්ගලයෝ තමන්ම suicide එකක් කරගන්න ඕන කියන කාරණයට එළඹෙන්නේ නැහැ ගරු ස්වාමිනි. ඒකේදි ටීම් එකක් එකතුවෙලා ඇටෑක් එකක් ප්ලෑන් කරහම ඒ ඇටෑක් ප්ලැන් එකේදී එක්කෙනෙක් suicide කරගත්තත් ඒකේදි non-believers විශාල ප්‍රමාණයක්, නැත්නම් අන්‍යාගමිකයන් විශාල ප්‍රමාණයක් ඝාතනය වුනොත් ඒකේදි ඒ හැම දෙනාටමඅල්ලාහ් විසින් එක හා සමාන Reward දෙනවා කියලා තමයි ඔවුන්ගේ ක්‍රමවේදය තුල තියෙන්නේ ගරු ස්වාමිනි. ඒ නිසා ඔහු පුපුරුවා ගැනීම සිදු නොකළාද, පිපිරීම සිදු නොවුනාද කියනකාරණය සම්බන්ධයෙන් මට නිශ්චිත උත්තරයක් දෙන්නට බැහැ ගරු ස්වාමිනි. නමුත් ඔහු ඕනෑම අවස්ථාවක මරණයට පත්වන්න කැමැත්තෙන් සිටි පුද්ගලයෙක් ගරු ස්වාමිනි.

ප්‍ර දැන් ඔබගේ ප්‍රකාශය අනුව ජමීල්ට අවශ්‍ය තරම්, ජමීල් වැනි පුද්ගලයකුට ඔබ දැන් දරණ අදහස් අනුව පුපුරුවා නොගෙන අනිත් කට්ටියට පුපුරුවා ගැනීමට සලස්වලා ඉන්න තිබ්බා කියන එක?

උ ඉන්න තිබ්බා කියන්නේ ගරු ස්වාමිනි එතනදී ඔහුගේ අරමුණ ඔහුගේ හැසිරීම් සම්බන්ධයෙන් නෙමෙයි ගරු ස්වාමිනි නමුත් ඔහු 2015 සිට ඉන්නේ ඉස්ලාම් රාජ්‍යයකට යාමේ අවශ්‍යතාවයෙන් හෝ අන්‍යාගමිකයින් ඝාතනය කර ඉස්ලාම් රාජ්‍යයක් ඇතිකිරීමේ අදහසින්.එතකොට ගරු ස්වාමිනි ඔහු ඇතුලු මේ ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් එක , නැෂනල් තව්හිද්ජමාත් , N.TJ එකට ඒකාබද්ධ වීමෙන් තමයි, විලායත් අස් සෙයිලානි කියන සංවිධානය හදාගන්නේ. එතකොට ඒ දෙගොල්ල එකතුවෙලා තමයි ගරු ස්වාමිනි මේ සිද්ධි සියල්ල කරන්නේ. එතකොට විදේශයන්වල මේ පසුගිය කාලේ වෙච්ච ප්‍රහාර

FAIR COMMENT BY JEZEEM

ගැන නිරීක්ෂණය කළහම ටීම් එකක් එකතුවෙලා කරනවා. හැබැයි ඒකේ එක් කෙනෙක් දෙන්නෙක් suicide කරගන්නවා. නමුත් අනිත් ටීම් එකත් විශ්වාස කරනවා අපිටත් අල්ලාහ් දෙවියෝ Reward දෙනවා නැත්නම්, ඒ කියන්නේ පාරිතෝෂික ලබාදෙනවා කියන විශ්වාසයක් තියෙනවා.

ප්‍ර ඒ කියන්නේ අනිත් කට්ටිය suicide කරගත්තහම එක් පුද්ගලයෙකුට ඒ Reward එක අරගෙන suicide නොකර යන්න පුලුවන් කියන එක?

උ ඒ වගේ අදහසක් ඔවුන් ගාව තියෙනවා ගරු ස්වාමිනි. ඒ කියන්නේ ඉස්ලාම් එකේ ගරු ස්වාමිනි අපි දැන් අර LTTE සංවිධානය වගේ ගත්තහම ඊට වඩා වෙනස් මතවාදයක් එයාලට ඒ කියන්නේ non-believers100ක් මැරුවත් ඒ විදියමයි. එක්කෙනෙක් මරාගත්තත් ඒ විදියමයි එයාලගේ අදහස තියෙන්නේ ඒකේදි non-believersලා මරනවා කියන කාරණය විතරයි ගරු ස්වාමිනි.

ප්‍ර දැන් තවදුරටත් ඔබගෙන් අහන්නේ ඔබ බුද්ධි අංශ නිලධාරියෙක් වශයෙන් කියන්න පුලුවන්ද? එම ටජ් හෝටලයේ දි පුපුරුවා ගැනිම නොකර හෝ පිපිරවීමක් කිරිමට නොහැකිව ඔහු වෙනත් ස්ථානයකට ගිහිල්ලා ඒක පිපිරිමක් සිදුකරගැනීමට හේතුවක් තියෙනවාද?

උ ගරු ස්වාමිනි 2015 වර්ෂයේ සිට මේ සංවිධානය සම්බන්ධයෙන් අපි විසින් බුද්ධි තොරතුරු රැස්කිරිමේදී අබ්දුල්ලතිෆ් මොහොමඩ් ජමිල් කියන පුද්ගලයාට තමයි සම්බන්ධකම් තිබුණේ අපේ ශ්‍රී ලංකාවෙන් සිරියාවට ගමන් කරලා IS හා සම්බන්ධ වුන මොහොමඩ් සුවහිර් මොහොමඩ් අරූස් කියන පුද්ගලයා ඒ වගේම 2015.07.15 වෙනි 12 වෙනිදා මරණයට පත්වන මොහොමඩ් නිලාම් කියන පුද්ගලයා, ඒ වගේම මොහොමඩ් මුෂි නිෂාක් අහමඩ් කියන සිරියාවේ ඉන්න පුද්ගලයා ඊට අමතරව ඕස්ට්‍රේලියාවේ ඉදලා සිරියාවට ගමන් කල පුද්ගලයෙක් ඉන්නවා මොහොමඩ් උනයින් මොහොමඩ් අමින් කියලා. මේ තුන්දෙනාත් එක්ක සම්බන්ධකම් තිබුනේ මේ ජමිල් කියන පුද්ගලයාට. ඒ නිසා ගරු ස්වාමිනි ඔහුත් නිරන්තරයෙන් ජීවත්වෙන්නේ ඒ මතවාදය තුළ. ඒ නිසා ඔහු ඒ වගේ වෙනස්විමකට ලක් වුනාද කියන කාරණය හිතන්න පුලුවන් ගරු ස්වාමිනි.

ප්‍ර ඒ කියන්නේ ඔහුගේ ආපු ඉලක්කය වෙනස්කරලා ඒ අවස්ථාවේදි ඔහුගේ අදහස වෙනස්කරාද කියලා ඇතිවෙන්නත් පුලුවන් කියන එක කියන්නේ?

උ ඒ කියන්නේ ස්වාමිනි ඔහුට තමන් වුනත් දැන් උදාහරණයකට මම පෙන්වා දෙන්න කැමැතියි ගරු ස්වාමිනි දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටිනවා මෙහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් කියන පුද්ගලයා. ඒ පුද්ගලයා කවදාවත් තවත් පුද්ගලයෙක් සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් අනාවරණය කරන් නැහැ. ඔහු කියන්නේ ඕනෑ වෙලාවක ඔහු ත්‍රස්තවාදියෙක්. නමුත් ඔහු වෙන

FAIR COMMENT BY JEZEEM

කෙනෙක් ගැන තොරතුරු කිසිම දෙයක් අනාවරණය කරන්නේ නැහැ ගරු ස්වාමිනි. ජමීල් කියන පුද්ගලයාත් අන්න ඒ වගේ පුද්ගලයෙක් , සහරාන් සහ ජමිල් කියන පුද්ගලයෝ දෙන්නා තමයි ගොඩක් මේ Network එක තුළ ඒ කියන්නේ අර අන්‍යාගමිකයන් මරන්නම ඕන කියන දැඩි චේතනාවෙන් ඉන්න පුද්ගලයෝ. මොකද ගරු ස්වාමිනි අපි විසින් හඳුනාගන්නේ අර 94ක ලැයිස්තුවේදි 2017 වර්ෂයේදී සඳහන් කරනවා ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් කියලා සංවිධානයක් ඒ සංවිධානය හැදෙන්නේ මේ ජමිල් සහ ඉමාඩ්ඩ් කියන පුද්ගලයන් මෙන්ම උමයිර් කියන පුද්ගලයා කේන්ද්‍ර කරගෙන එතකොට ජමිල් කියන පුද්ගලයාගේ උවමනාව මත තමයි ජාතික තවුහිද් ජමාත් සංවිධානයත් එක්ක එකතුවෙන්නේ. ඒ කියන්නේ ගරු ස්වාමිනි 2015 සිරියාවට ගමන්කරන ලද පුද්ගලයෝ අතරින් නිලාම් කියන පුද්ගලයා තමයි මේ කොළඹ නගරයේ හිටපු JMI කියන නැත්නම් ජමාත මිල්ලතු ඊබ්‍රාහිම් කියන කට්ටියව නායකත්වය දෙන්නේ. ඔහු ගියාට පස්සේ මෙරට හිටපු කට්ටියට නායකත්වයක් නැතිව හිටියේ . ඒ තත්ත්වය තුල තමයි සහරාන් වටා මොවුන් එකතු වෙන්නේ.

ප්‍ර දැන් ඔය ජමීල් දෙහිවලට ගිහිල්ලා මුස්ලිම් පල්ලියකට ගිය අවස්ථාවේදී යම් ආරක්ෂක නිලධාරියෙක් ඇවිල්ලා ඔහුව ප්‍රශ්ණ කරා බව දන්නවද තමන්?

උ ඔව්.

ප්‍ර එම නිලධාරියා බුද්ධි අංශයට කුමන හෝ බුද්ධි අංශයකට සම්බන්ධ පුද්ගලයෙක්ද?

උ මට ඒ ගැන නිශ්චිතව සඳහන් කරන්න අමාරුයි. නමුත් ගරු ස්වාමිනි ඔහු විසින් දෙහිවල ප්‍රදේශයේ ගමන්කරන ලද පල්ලිය මේ ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් කියන කට්ටිය මීට කලින් කාලවලදී ඔවුන් ආගම අදහන්න යොදාගත්ත පල්ලියක්. ඒ මොකද ඒ පල්ලිය තවුහිද් පල්ලියක් විදියට තමයි අපි විසින් හඳුනාගෙන තිබුණේ. මේ ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියන කණ්ඩායම අපි 2016-2017 හඳුනා ගැනීමේදී ඔවුන් සියලුදෙනා හමුවන්න යොදාගත්ත ස්ථානයක් තමයි මේ පල්ලිය. ඒ වගේම මරදාන දෙමටගොඩ පාරේ අම්ජාඩ් කියන පුද්ගලයාගේ නිවස. ඒ වගේම දෙහිවල එස්.ඩී.එස් ජයසිංහ ක්‍රීඩාංගනය. අපි ඒ සම්බන්ධයෙන් ඒ කාලවලදී වාර්තා යොමුකරලා තියෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර තමන්ට කියන්න පුලුවන්ද එම පල්ලියට පැමිණි අවස්ථාවේදී ඔහු එම ස්ථානයේ සිටින බවට තොරතුරු ඔහුගේ නිවසින් බුද්ධි අංශයකට ලැබිලා තියෙනවා. එම අවස්ථාවේදී ඔහුව අත්අඩංගුවට ගෙන ඔහුගේ ස්වයංසාතනය නතර කර ගැනීමට හැකි නොවුයේ මොකද කියලා ඔබලා පරීක්ෂා කරලා බැලුවාද?

FAIR COMMENT — BY JEZEEM

උ ඒ සම්බන්ධව නිශ්චිතව පරීක්ෂා කිරීමක් කලේ නැහැ ගරු ස්වාමිනි. ඒ සම්බන්ධව ඔහු බුද්ධි නිලධාරියකුට හමුවුනාද කියන එක ගැන මට නිශ්චිත මතකයක් නැහැ ගරු ස්වාමිනි. මොකද සිද්ධිය දවසේ ඉදන් කාර්ය බහුලත්වය නිසා මට ඒ ගැන නිශ්චිත මතකයක් නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර දැන් තමන්ලා පරික්ෂා කර බැලුවද මෙම බෝම්බ පිපිරීමත්. ඉන්දීය ජාතිකයන් වැඩිපුර ගැවසෙන ස්ථානයක හෝටලයක සිදුවිය හැකි බව 19 හෝ 20 දැනුම් දීමක් බුද්ධි අංශවලට ලැබුණද? තමන්ගේ බුද්ධි අංශයට ලැබුණද?

උ 04.20 දින ලැබුණ කියලා තමයි දැනගන්න තියෙන්නේ.

ප්‍ර තමන්ලාගේ රාජ්‍ය බුද්ධි අංශයටද?

උ රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂතුමා වෙත ගරු ස්වාමිනි.

ප්‍ර එවැනි තොරතුරක් ලැබුන අවස්ථාවේදි ඒ තොරතුර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට මෙන්ම එම ටජ් හෝටලය වැනි ඉන්දීය ජාතිකයින් වැඩිපුර ගැවසෙන හෝටලයකට සාමාන්‍යයෙන් දන්වා සිටීමක් වෙනවා නේද? එම බුද්ධි අංශ මගින් ?

උ ගරු ස්වාමිනි, මට නිශ්චිත උත්තරයක් ඒ සම්බන්ධයෙන් සඳහන් කරන්න අමාරුයි.අධ්‍යක්ෂතුමාවෙත තමයි තොරතුරු ලැබෙන්නේ. මට මගේ සහකාරඅධ්‍යක්ෂතුමාපවසන ආකාරයට එතුමන් පොලිස්පතිතුමා, හමුදාපති වරුන් ඇතුලු ඉහල නිලධාරීන් දැනුවත් කළා කියන එක තමයි මට වාර්තා වුණේ ගරු ස්වාමීනි. මට ඒ සම්බන්ධයෙන් නිශ්චිත උත්තරයක් දෙන්න බැහැ ගරු ස්වාමිනි.මට ඒ ගැන දැනිමන් නැහැ ගරු ස්වාමිනි.

ප්‍ර ඉන්දියන් මහ කොමසාරිස් කාර්යාලයට විශේෂ ආරක්ෂාවක් සපයන්න දැනුම් දුන්නනම් එවැනි හෝටලයක් සම්බන්ධව දැනුම්දීමක් ලැබුණහම එවැනි ප්‍රහාරයක් සිදුවුනොත් එය ජාත්‍යන්තර වශයෙන් කැළලක් සිදුවන නිසා එවැනි අවස්ථාවක ඒ හෝටලයට ආරක්ෂාව සැපයීම හෝ විශේෂයෙන් දැනුම්දීමක් කරන්න හැකියාවක් තියෙනවා නේද?

උ මට නිශ්චිතව සඳහන් කිරීමක් කරන්න අමාරුයි. මම ඒ සම්බන්ධව දන්නේ නැහැ. මොකද අධ්‍යක්ෂ තුමා තමයි තොරතුරු පිටතට හුවමාරු කරන එකම පුද්ගලයා.

ප්‍ර මොකද ඒ කාලය තුල එය හදිසියේ ජමිල්ගේ ප්‍රහාරය සිදුවුණානම් තමයි මේකේ බරපතලකම තේරෙන්නේ. එහෙම දැනුම්දීමක් ලැබිලා, ඉන්දීය ජාතිකයන් වැඩිපුර ගැවසෙන ස්ථානයක් වශයෙන් හෝටලයක් වශයෙන් ලංකාවේ ටජ් හෝටලයනේ. හැම අවස්ථාවකදීම සලකන්නේ. තමන් දන්නවා ඇති LTTE කාලයේත් එවැනි ප්‍රහාරයන් සිදුවන අවස්ථාවලදී ටජ් හෝටලයට දැනුම්දීම් කරනවා. ඒ සම්බන්ධයෙන් ඔබට කියන්න පුලුවන්ද මොනවත්?

FAIR COMMENT — BY JEZEEM

උ මා පෙර සඳහන් කළ ආකාරයෙන් මට ආයතනයට තොරතුරක් ආවහම මා විසින් වෙනත් තැන්වලට වාර්තා කිරීමක් කරන්නෙත් නැහැ. ඒ සම්බන්ධයෙන් එකම බලධරයා අධ්‍යක්ෂතුමා රාජ්‍ය බුද්ධි සේවාව. එතුමන් තමයි පිටත ආයතනත් එක්ක සියල්ල ගනුදෙනු කරන්නේ.

ප ඔබලාට මෙම ප්‍රහාරය පිළිබඳව තොරතුරු ලැබුණේ 04 වෙනිදා. ?

උ 04 වෙනිදා ගරු ස්වාමිනි තොරතුරක් ලැබෙන්නේ, ප්‍රහාර සැළසුමක් සම්බන්ධයෙන්.

ප එතකොට 09 වෙනිදා සියලුම අංශ වෙත දන්වලා යැව්වා ආරක්ෂක අංශවලට තමන්ලා කියන විදියට දැනුම් දීම් කලා?

උ ඔව් ගරු ස්වාමිනි.

ප එතකොට 21 වෙනිදා ප්‍රහාරය සිදුවුනා?

උ ඔව්. ඊට කලින් අපි සඳහන් කිරීමක් කරනවා 04.18 , තාලංකුඩා 04.16 පුපුරුවා ගැනීමත් මේ අත්හදා බැලීමක් විය හැකියි කියන එක.

ප 21 වෙනිදා ප්‍රහාරය සිදුවුනායින් පස්සේ දින 05ක් යන්න කලින් ඒ අන්තවාදී ජාලය ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගත්තා?

උ ඔව්.

ප ඒ දින 05ක් ඇතුලත ඒ අත්අඩංගුවට ගැනීමේ හැකියාවක් තිබෙනවානම් ඇයි 04 වෙනිදා ආපු තොරතුර මත දවස් 16ක් පමණ කාලයක් ඔබලාට ඒ ජාලය වළක්වන්න බැරිවුනේ?

උ අපි 94 ක ලිස්ට් එකක් වාර්තා කරනවා. ඒ වගේම 129ක ලිස්ට් එකක් වාර්තා කරනවා . මාවනැල්ල ආගමික ප්‍රතිමා හානියෙන් පස්සේ ඉඳන් නිරන්තරයෙන් මේ පුද්ගලයෝ ජාලය සම්බන්ධයෙන් සියලු තොරතුරු වාර්තා කරනවා. ප්‍රහාරයෙන් පස්සේ මේ පුද්ගලයෝ සියලුදෙනාම අත්අඩංගුවට පත්වන්නේ කිහිපදෙනෙක් තමයි ප්‍රදේශවලින් පලා ගොස් සිටියදි අත්අඩංගුවට පත්වන්නේ. අනෙක් පුද්ගලයෝ සියලුදෙනාම අපේ තිබුණ තොරතුරුත් එක්ක තමයි අත්අඩංගුවට පත්වන්නේ. ඒ ප්‍රහාරය සිදුවෙච්ච නිසාම තමයි අත්අඩංගුවට පත්වන්නේ.

ප ඒ කියන්නේ සාර්ථකව අත්අඩංගුවට ගැනීම් සිදුවුනා?

උ ඔව්.

ප ඒ සාර්ථකභාවයෙන් යුතු අත්අඩංගුවට ගැනීම් තමන්ට බුද්ධි තොරතුරු ලැබුණාට පස්සේ සිදුවුනානම් දින 14ක් තිබ්බා සම්පූර්ණයෙන් මේ ජාලය අක්‍රිය කරන්න?

උ ඔව්.

ප ඒ සම්බන්ධයෙන් ඇයි එවැනි දෙයක් සිදුවුනේ නැත්තේ?

උ මට මගේ අංශයේ භූමිකාව තුළ මට ලැබිලා තියෙන්නේ, භූමියෙන් තොරතුරු රැස්කරලා වාර්තා කරන්න කියලයි.

ප බුද්ධි නිලධාරියෙක් වශයෙන් ඔබට කියන්න පුලුවන්ද ඔබ මොකද සිතන්නේ කියලා?

FAIR COMMENT — BY JEZEEM —

උ මා සිතන්නේ මගේ අදහසක් ගරු ස්වාමීනි අප විසින් 2017 වර්ෂයේදී ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියල සංවිධානයක් ගැන වාර්තා කරනවා. පුද්ගලයෝ 94 ක් ගැන වාර්තා කරනවා. සහරාන් කියන පුද්ගලයාත් ඒකේ ඉන්නවා. ඒ වගේම ජමිල් කියන පුද්ගලයාත් ඒකේ ඉන්නවා. ඒ පුද්ගලයෝ දෙන්නා අත්අඩංගුවට ගැනීමකට ලක්කරා නම් මේ ප්‍රහාරය වළක්වා ගැනීමට තිබෙනවා. ගරු ස්වාමිනි. ඒ වගේම ප්‍රහාරයෙන් අනතුරුව අත්අඩංගුවට පත්වන්නේත් අප විසින් ලබාදෙන ලද බුද්ධි තොරතුරු මතම තමයි. රාජ්‍ය බුද්ධි සේවාවට මා දැනුවත්ව එහෙම අත්අඩංගුවට ගැනිමේ අංශයක් සම්බන්ධ වෙලා නැහැ. මා මුල් කාලවලදී දැකලා තියෙනවා ත්‍රස්ත මර්ධන හා විමර්ශණ කොට්ඨාශය රාජ්‍ය බුද්ධි සේවාව හා සම්බන්ධව ඒ කියන්නේ එකම අයෙක් නියෝජ්‍ය පොලිස්පතිතුමෙක් යටතේ තිබු අවස්ථා ඒ වගේ අවස්ථාවලදී අපේ තොරතුරු දීලා ත්‍රස්ත මර්ධන කොට්ඨාශයෙන් අත්අඩංගුවට ගැනීමක් සිදුවුනා. මේ කාල වකවානුවේදී එහෙම තිබුණා නම් අත්අඩංගුවට ගැනීමට නැත්නම් දැන් අද වනවිට වන්නේ අපේ තොරතුරු දීලා දෙවන පාර්ශවයකින් තමයි අත්අඩංගුවට පත්වීම සිදුවන්නේ. ඒ නිසා නැතිව අර විදියට mechanism එකක් තිබුණානම් මේ ප්‍රහාරයට කලින් අදාල පුද්ගලයෝ සියලු දෙනාම අත්අඩංගුවට ගැනීමක් සිදු කරන්නට තිබුණා.

ප්‍ර. ඒ අනුව ඔබ පිලිගන්නවා ආරක්ෂක අංශවල සියලු තොරතුරු තිබ්බා නමුත් ඒ දක්ෂතා තිබ්බා. අත්අඩංගුවට ගැනීමට හැකියාවක් තිබ්බා ක්‍රියාන්විතයක් කරලා, නමුත් කුමන හේතුවක් මත ඔබට කියන්න පුලුවන්ද එවැනි දෙයක් කරන්න බැරිවුනේ ඇයි කියලා?

උ මට නිශ්චිතව සඳහන් කිරීමක් කරන්න අමාරුයි. නමුත් අපි විසින් නවුෆර් සහ සාජිත් මවුලවි අල්ලා ගන්නේත් අපේ තොරතුරු මතමයි. ඒ වනවිට අද වෙනකොට පකිස්ථානයේ පුද්ගලයෙක් අත්අඩංගුවට පත්කරලා තියෙනවා. මුවාත් කියල පුද්ගලයෙක්. ඒ පුද්ගලයා අත්අඩංගුවට පත්කරන්නෙත් අපේ තොරතුරු මත ඒ වගේම ඩුබායි රාජ්‍යයෙත් පුද්ගලයෝ දෙන්නෙක් අත්අඩංගුවේ පසුවෙනවා. ඒ වගේම සෞදි අරාබියේත් එක් පුද්ගලයෙක් අත්අඩංගුවේ සිටිනවා. ඒ වගේම කටාර් රාජ්‍යයෙත් පුද්ගලයෝ 06 දෙනෙක් අත්අඩංගුවේ පත්වෙනවා. මේ කට්ටිය අත්අඩංගුවට ගන්නෙත් මේ තොරතුරු මතම තමයි. ඒ වගේ මට නිශ්චිතව සඳහන් කරන්න බැහැ මොකක්ද ඒකට හේතුව කියන කාරණය. නමුත් අපට mechanism එකක් තිබුණා නම් මීට කලින් සාර්ථක ප්‍රතිඵලයක් ගන්න තිබුණා.

ප්‍ර දැන් තමන්ට කියන්න පුලුවන්ද බුද්ධි නිලධාරියෙක් හැටියට තමන්ලට බුද්ධි තොරතුරු තිබ්බද මෙවැනි අන්තවාදී සංවිධානවලට යම්

FAIR COMMENT BY JEZEEM

දේශපාලන රැකවරණයක් සහ දේශපාලන ආධාර මෙම අන්තවාදී කල්ලිවලට ලැබුණද කියලා?

උ ගරු ස්වාමිනි මට නිශ්චිතව ඒ සම්බන්ධයෙන් උත්තරයක් දෙන්න අමාරුයි. නමුත් මේ ඉස්ලාම් රාජ්‍යය කියන සංකල්පය තුල ඒ කියන්නේ එයාලා මානසිකව මම පෙර දින සඳහන් කළා ස්වාමීනි කුරානයේ හදීස්වල තියෙනවා ඉස්ලාම් රාජ්‍යයක් කියන කාරණය. ඒ වගේම මට සඳහන් කරන්න පුලුවන්, කුරානයේ සඳහන් කරලා තියෙනවා 2/282, 43/61 , 21/96, 18/94 කියන වගන්තිවල මේ ලෝක විනාශ වන එක සම්බන්ධව සහ එයාලගේ මරණයෙන් පස්සේ එයාලට Reward හම්බවෙන ඒවා ඒවගේ කාරණා කිහිපයක් සම්බන්ධයෙන්. අන්න ඒ කාරණ හා එක හදීස් එකක් මත තමයි මේ ඉස්ලාම් රාජ්‍යය කියන එක නිර්මාණය කරන්නේ. ඒ කියන්නේ අබුබක්කර් අල්බැග්ඩෑඩි කියන පුද්ගලයා IS සංවිධානය හදන්නේ මේකුරානය හදීස් කියන දෙක සම්බන්ධකරගෙන, ඒ නිසා තමයි ලෝකය පුරාම ඉන්න කට්ටිය ගිහිල්ලා IS සංවිධානයට සම්බන්ධ වන්නේ. ඒ වගේ මේ කට්ටියගේ මානසිකව තියෙන්නේ අපි ඉස්ලාම් රාජ්‍යයක ජීවත් වුනොත් පමණයි අපිට ස්වර්ගයට යන්න පහසුයි කියලා. ඒක නිසා ඉස්ලාම් රාජ්‍යයක් හදාගන්න ඒ කට්ටියගේ පෙර කාලවල හිටපු පුද්ගලයෝ ජිහාද් කරා ඒ කට්ටියට කියනවා මුජහිදීන් කියලා. ඒ නිසා මේ කට්ටියට තියෙන මානසික සංකල්පයක්.

ප මගේ ප්‍රශ්නය මම ඇහුවේ මේ සඳහා ඔබලා ඒ පැත්ත දිහා බැලුවේ නැද්ද තමන්ලා , බුද්ධි අංශ මේ අන්තවාදී කල්ලි සම්බන්ධව විමර්ශනය කළානේ?

උ ඔව්.

ප මේ විමර්ශණය කිරිමේදී මේ කල්ලිවලට මුදල් සපයන්නේ කවුද, දේශපාලන වශයෙන් ආධාර කරන්නේ කවුද යන කරුණු සම්බන්ධයෙන් ඔබගේ විමර්ශණවලට ඇතුලත් වුනේ නැද්ද ඒ කරුණු?

උ අපි සොයා බැලීම් කරලා තියෙනවා, නමුත් අර දේශපාලඥයන්ගේ මතවාදය ප්‍රජාතන්ත්‍රවාදී පැත්තට යනවා, එතකොට මෙයාලගේ මතවාදයත් එක්ක සම්බන්ධවීමක් නෑ. නමුත් පුද්ගලයෝ වශයෙන් අපිට මෙයා සම්බන්ධයි, මෙයා සම්බන්ධයි කියලා තොරතුරක් තිබුණේ නැහැ භූමියේදී. නමුත් මේ IS මතවාදය ඔලුවේ තියන් ඉන්න පුද්ගලයෝ සම්බන්ධයෙන් තමයි අපි භූමියෙන් තොරතුරු රැස්කළේ. ඒ වගේම අපිට එහිදී දේශපාලන හෝ වෙනත් පුද්ගලයෝ සම්බන්ධයෙන් අනාවරණය විමක් වෙලා නැහැ

ප දැන් ඔබ පසුගිය දින සාක්ෂි දීමේදී රාජ්‍ය නිලධාරීන් දෙදෙනෙකු සම්බන්ධයෙන් පමණක් ඔවුන්ගේ ළමයි සම්බන්ධයි කියලා කිවා. ඒ

FAIR COMMENT — BY JEZEEM

කියන්නේ මේ සංවිධානවල ඔය දෙදෙනාගේම ළමයි කිහිප දෙනෙක් පමණයිද සිටියේ? නැතිනම් අනිත් කට්ටිය ගැන ඔබලා සෙව්වේ නැද්ද?

උ අපිට නිශ්චිතව සඳහන් කරන්න අමාරුයි. මොකද අපිට තොරතුරු වාර්තාවුනු පුද්ගලයෝ පමණයි අපි දන්නේ. ඊට වඩා ඉන්න පුලුවන්. එහෙම නිශ්චිතව මට සඳහන් කරන්න බැරි අපිට වාර්තා වෙලා තිබෙන්නේ එපමණයි.

ප්‍ර ඔබට කියන්න පුලුවන්ද, දැන් බෝම්බ ස්වයං ඝාතන සිදුවුනා හෝටල්වල දේවස්ථානවල, ශැංග්‍රිලා හෝටලයේ පමණක් දෙදෙනෙක් පුපුරුවා ගැනීමත්, අනෙක් හෝටල් වල සහ අනෙක් ස්ථානවල එක් අයෙක් පමණක් පුපුරුවා ගැනීමටත් හේතු වුනේ මොකක්ද?

උ. විමර්ශණවලදි අපිට තොරතුරු ලැබුන හැටියට ගත්තහම සහරාන් සහ ඉල්හාම් කියන පුද්ගලයෝ දෙන්නා මෙතෙන්ට සම්බන්ධ වුනේ ප්‍රහාර දෙකටම. ඒකෙදි එක දෙයක් වාර්තා වුනා මුලදිම සහරාන් කියන පුද්ගලයාට හැකියාවන් තියෙන්නේ ද්‍රවිඩ සහ ඇරබික් කියන භාෂා දෙක පමණයි. ඒ වගේම ඔහුට වරෙන්තුවක් තියෙන පුද්ගලයෙක් කියලා ඔහු දන්නවා. ඒ නිසා ඔහු ඉල්හාම් කියන පුද්ගලයාගේ සහයෝගය මත තමයි ඒකට යන්නේ, මොකද ඔහුට ඉංග්‍රිසි භාෂාව බැහැ, සිංහල බැහැ, කියන කාරණය හින්දා. වෙන නිශ්චිතවම සඳහන් කරන්න අමාරුයි මේක ටාගට් එකක් විදියට සිලෙක්ට් කරගත්තේ ඇයි කියන කාරණය නමුත් ඔවුන් දෙදෙනාම යන්නේ මොකද ඉල්හාම් කියන පුද්ගලයා මත තමයි සහරාන් කියන පුද්ගලයා මෑත කාලීනව යැපෙන්නේ කියන කාරණය තමයි අපිට වාර්තාවෙන්නේ. ඒකට උදාහරණයක් විදියට කිවොත් මගේ මතකයේ හැටියට 2019.02.19 හෝ 20 යන දිනකදී සහරාන්ගේ බිරිඳ කැකුණගොල්ල නිවසේ ඉදන් කොළඹට එනවා. ඒ කොළඹට එන්නේ මේ ඉල්හාම් කියන පුද්ගලයාගේ වෙහිකල් එකේ. ඒ කියන්නේ වාහනයේ. ඒත් සහරාන් මේ ඉල්හාම් කියන පුද්ගලයා තමයි මෑතකාලීනව ඔහු ළඟම තියාගෙන සම්බන්ධකම් තිබු පුද්ගලයා කියන එක තමයි අපිට තොරතුරු තිබුණේ.

ප්‍ර. තමන්ට කියන්න පුලුවන්ද දැන් අන්තවාදී කල්ලියක නායකයෙක් වන අබ්දුල් රාසික් , ඔහු අන්තවාදී කල්ලියක් නායකත්වය දරමින් ආගමික අන්තවාදය සඳහා කටයුතු කරාද? ඔහු අනියම් ආකාරයකින් හෝ මෙම අනික් සංවිධානවලට උදව් කළාද?

උ. අබ්දුල් රාසික් කියල කියන්නේ මුලින්ම සමස්ථ ලංකා තවුහිද් ජමාත් කියන සංවිධානයේ හිටපු පුද්ගලයෙක්. පසුකාලීනව ඔහු ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානයේ මහ ලේකම් විදියට කටයුතු කරනවා මගේ මතකයේ හැටියට 2005 වර්ෂයේදී පමණ විතර ඉදලා. ඊට පස්සේ කාලයේදී 2018 වර්ෂයේදි ඔහු විසින් හදා ගන්නවා අලුත් සංවිධානයක් , ඒ සංවිධානයේ මත ගැටුම් නිසා CTJ කියලා. ලංකා තවුහිද් ජමාත් කියලා. ඔහුත් වහාබි

FAIR COMMENT BY JEZEEM

මතවාදය දරණ පුද්ගලයෙක්. ඔහු සඳහන් කරන්නේ කුරානය හදීස් කියන පොත් දෙක පමණක් බලන්න කියලා. ඔහු සම්බන්ධ නැද්ද කියන එක ගැන නිශ්චිත අපට බුද්ධි තොරතුරක් නැහැ.. නමුත් ඔහුත් ඉස්ලාම් රාජ්‍යය කියන ඒ ගෝල් එක කරා යන වහාබි කුරාන් හදීස් කියන මතවාද දෙක නැත්නම් කුරාන් හදීස් විතරක් දැඩිව අනුගමනය කරන්න ඕන කියලා ඉන්න පුද්ගලයෙක්. ඒ වගේම ලංකාවේ වහාබි සහ සලෆි කියන සංවිධානවල ප්‍රතිපත්ති නැත්නම් කුරානයේ හදීස් සහ මං පෙර දිනයේ සඳහන් කලා සහාබිවරු කියලා ඒ කියන්නේ
නබි IS තුමාගේ මුල් අවදියේ සිටි පුද්ගලයෝ .ඒ කුරානයේ හදීස්වලට අමතරව මේ සහාබිවරුන්ව අනුගමනය කරන්න ඕන කියලා ඉන්න පුද්ගලයෝ හිතන්නේ කවදාහරි දවසක ඉස්ලාම් රාජ්‍යය හදන්න ඕන කියා. අන්න ඒ නිසා ඒ කට්ටියගේ මතවාදය ඕනෑම මොහොතක වෙනස්වෙන්න තිබෙන සම්භාවිතාවයක් තියෙනවා. ලෝකයේ

ප්‍ර ඔහු හා සහරාන් හා හස්තූන් හා සහරාන් අතර සම්බන්ධතා තිබ්බාද?

උ ගරු ස්වාමිනි අපිට තොරතුරු තියෙන විදියට මුල් අවස්ථාවේදී SLTJ කියන සංවිධානයට සහරාන්ගේ පොඩි සම්බන්ධකමක් තිබෙනවා. ඒ වගේම සහරාන් NTJ කියන සංවිධානය හදාගන්නේ 2012 වර්ෂයේදී. හස්තූන් කියන පුද්ගලයා හා ඔහුගේ බිරිඳ සාරා ජෙස්මීන් කියන කාන්තාව ඉස්ලාමය වැළඳගන්නේ SLTJ හරහා. ඒ වගේම හස්තූන් කියන පුද්ගලයාව විවාහ වෙන්නෙත් SLTJ කියන සංවිධානය හරහා. ඒ වෙනකොට SLTJ කියන සංවිධානයේ මහලේකම් වරයා විදියට කටයුතු කරන්නේ මේ අබ්දුල් රාසික් රවි කියන පුද්ගලයා.

ප්‍ර දැන් බුද්ධි අංශ නිලධාරියෙක් වශයෙන් කියන්න පුලුවන්ද දැන් මේ අන්තවාදී කල්ලි මර්ධනය වීමක් සිදුවෙලා තියෙනවාද ඉදිරියේදී ඔවුන්ගේ ක්‍රියාත්මක වීමක් සිදුවිය හැකිද?

උ දැනට අත්අඩංගුවේ පසුවන පුද්ගලයෝ අතරින් ඇතැම් පුද්ගලයන්ගේ අත්අඩංගුවේ පසුවීම කියන කාරණයේදී ඔවුන් කවදාවත් ඔවුන්ගේ මතවාදය වෙනස් කරගෙන නැහැ. ඒකට හොඳම උදාහරණය මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර්. ඒ පුද්ගලයා කවදාවත් අදට අත්අඩංගුවේ සිටියත් ඔහුගේ මතවාදය වෙනස් කරන්නේ නැහැ. ඔහු අත්අඩංගුවේ සිටින අවස්ථාවේත් ඔහුගේ ලඟ සිටින සාමාජිකයෝ තවදුරටත් මේ රාජ්‍යය මතවාදය වටා තබාගෙන සිටීමක් තමයි කරන්නේ. ඒකට මට උදාහරණයක් මතක් කරන්න පුලුවන් එක්සත් රාජධානියේ අත්අඩංගුවේ පසුවුණා . පසුගිය කාලයේ 2018ට කලින් වගේ අංජුන් චෞදරි කියල පුද්ගලයෙක්. ඒ පුද්ගලයා බන්ධනාගාර ගතවෙලා සිටියදී ඔහුගේ වටේ සිටිය මුස්ලිම් අය ඔක්කොම අන්තවාදයට නැඹුරු කරනවා. එතකොට ඒ වගේ මේ නවුෆර් කියන පුද්ගලයාත් ඒ වගේ චරිතයක් . ඒ නිසා මේ කට්ටිය ඒ කියන්නේ යම් තත්ත්වයකට පත් නොකර නිදහස්

FAIR COMMENT BY JEZEEM

කිරීම කියන කාරණය ගරු ස්වාමිනි නැවතත් ඒ වගේ මතවාදයක් බිහිවෙන්න, මොකද සහරාන් කියන පුද්ගලයාට මුලම බීජය හැදෙන්නේ මේ නවුෆර් කියන පුද්ගලයාගෙන්. එතකොට සහරාන් සහ ජමීල් කියන පුද්ගලයෝ දෙන්නාගෙන් න් තමයි මේ සිද්ධි දාමය වෙන්නේ. ඒ නිසා ඒ වගේ තත්ත්වයක් තිබෙන්නේ.

ප්‍ර මෙම ප්‍රහාරය මූලිකව කිරීමට සහරාන් නායකත්වය ගත්තද? නමුත් ඔහු නායකත්වය තබා වෙනත් සංවිධානයක් විසින් මොහු ඉදිරියට තබා මෙම ප්‍රහාරයන් සිදුකළාද කියලා කියන්න පුලුවන්ද?

උ ගරු ස්වාමිනි අපිට තිබුණ තොරතුරු අනුව මේ මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් කියන පුද්ගලයා තමයි සහරාන්ව ඉදිරියට දාන්නේ. මොකද සහරාන් කියන පුද්ගලයාට යම් කාලයක් තුලදී ඔහු මතවාදය හදලා ඔහු යම් පිරිසක් සම්බන්ධ කරගන්නවා. නමුත් නවුෆර් කියන පුද්ගලයා තමයි මේකේ න්‍යායාචාර්ය. එහෙම නැත්නම් ගරු ස්වාමිනි මේ කට්ටියට යම් මතය දෙන්නේ. ඒ කියන්නේ කුරානය කොහොමද තියෙන්නේ හදීස් කොහොමද මොකද නවුෆර් කියන පුද්ගලයා තමයි ඉස්ලාම් සම්බන්ධව දැනීමක් තිබෙන පුද්ගලයා. සහරාන් කියන පුද්ගලයාට එහෙම දැනිමක් නැහැ. ඒ නිසා ඔහු කේන්ද්‍ර කරගෙන තමයි නායකත්වය ඇතිවන්නේ. නමුත් ඔහු ඉන්නේ ව්‍යාජ නායකත්වයක් තුළ. මොකද නායකත්වයට පෙන්වන්නේ සහරාන් කියලා. ඒ තුළ පසුකාලීනව ගරු ස්වාමිනි යම් යම් මත ගැටුම් තුළ නවුෆර් කියන පුද්ගලයාගේ ගෝල් එක තියෙන්නේ ලංකාවේ ඉස්ලාම් රාජ්‍යයක් හදලා එයාගේ මුල්ම ටාගට් එක එයා ප්ලෑන් කරන්නේ ඇසළ පෙරහැර කියන එක තමයි ටාගට් කරගෙන ඔහු ඔපරේට් වෙමු කියන්නේ . නමුත් සහරාන් කියන පුද්ගලයාට , මාවනැල්ල ආගමික ප්‍රතිමා , වනාතවිල්ලුව මේකෙන් පස්සේ ඔහු පසුපස හඹාගෙන යාමත්, ඔහු ඕනෑම කෙනෙකුට ක්ෂණිකව motivate කරන්න නැතිනම් ප්‍රහාරයකට අභිප්‍රේරණය කරන්න පුලුවන් තත්ත්වයක් තුල ඔහු නවුෆර් එක්ක ඇතිකරගන්නා මත ගැටුම් තුල තමයි, ඔහු වෙනම ගිහිල්ලා සිද්ධිය කරන්නේ. ඊබ්‍රාහිම් කියන පුද්ගලයා ගරු ස්වාමිනි ඔපරේට් වෙන්නේ, ඒ කියන්නේ ලොකු ගෝල් එකක් තියාගෙන. ඒ කියන්නේ එයාලා දීර්ඝකාලීනව සටන් කිරීමේ අභිප්‍රාය තුළ ගරු ස්වාමිනි.

කොමිසමේ කටයුතු ස්වල්ප වේලාවකට නතර කරනවා.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

අතිරේක සොලිසිටර් ජනරාල් අයෙෂා ජිනසේන මෙනවිය

ප්‍ර බණ්ඩාර මහත්මයා මා ඔබගෙන් මීට ටික වේලාවකට පෙරදී ප්‍රශ්න කරනු ලැබුවා 05 වෙනිදා ඔබට ලැබුණු තොරතුර විශ්ලේෂණය කරාට පස්සේ ඒක අධ්‍යක්ෂවරයා දක්වා යන අවස්ථාව පිළිබඳව. ඔබ කිව්වා C.4 C ලේඛනය ඔබ පිලියෙළ කරන ලද දෙවෙනි කෙටුම්පත ඒ කියන්නේ X 192 ලේඛනය මත පදනම්ව පිළියෙල කරන ලද්දක් බව. දැන් ඒක අධ්‍යක්ෂවරයාට ගිහිල්ලා ඊට පස්සේ මොකද වෙන්නේ?

උ මට පෙන්වා දුන් පරිදි එහි යම් යම් වෙනස් කිරීම් කිහිපයකට භාජනය වෙලා තිබුණා. ගරු ස්වාමිනි මට නිශ්චිතව සඳහන් කරන්න අමාරුයි. මොකද ඒ වාර්තාව මා විසින් සකස් කරන ලද වාර්තාවක් නොවෙයි.

ප්‍ර එතකොට ඒ වාර්තාව උපයෝගි කරගෙනඅධ්‍යක්ෂවරයා යම් බාහිර ආයතනවලට දැනුම් දෙනවානම් ඔබේ අත්දැකීම අනුව එම වාර්තාවත් ඇමුණුමක් විදියට ඒ යවන ලේඛනවලට එකතු කරලා යවනවාද? උදාහරණයක් විදියට පොලිස්පතිතුමාට දැන් මේ ඔබ විසින් අර Develop කරපු වාර්තාව දැන් යවනවා, ඒ කියන්නේ C4 C කියලා දැන් ඔවුන් සංශෝධනය කරලා තියෙන ඒ ලේඛනය පාවිච්චි කරලා ලිපියක් පිලියෙල කරනවා පොලිස්පතිතුමාට යවන්න. එතකොට ඔබේ අත්දැකීම අනුව අර ඔබේ , ඔබලා විසින් පිලියෙල කරලා සංශෝධනය කරලා අධ්‍යක්ෂවරයා වෙත අවසානයට ඇවිල්ලා තියෙන වාර්තාවත් ඇමුණුමක් විදියට එතකොට බාහිර පාර්ශවයන්ට යවනවාද? ඒකයි මම අහන්නේ.

උ අප අංශය විසින් ගොඩක් අවස්ථාවලදී මාගේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාගේ අත්සනින් තමයි වාර්තා අධ්‍යක්ෂතුමා වෙත යොමු කරන්නේ. එම වාර්තාව අඩුවැඩි කිරීම් එකතු කරලා අධ්‍යක්ෂතුමා විසින් අවසන් වාර්තාවක් ආයතනවලට යොමු කරනවා. ඇතැම් අවස්ථාවල අප විසින් යොමු කරන ලද නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාගේ අත්සන සහිත වාර්තාව යොමු කරන අවස්ථාත් තියෙනවා. එතුමන් වෙනස් කරන වාර්තාත් තියෙනවා. අප විසින් යොමු කරන ලද වාර්තාවේ අත්සන් කරන්නේ අපේ ආයතනයේ අභ්‍යන්තරයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ සහකාරඅධ්‍යක්ෂ. තනතුරක්.ඒ නිසා ඒවගේ වාර්තා ඇමිණුමක් සම්බන්ධයෙන් මා මෑත කාලයේ නිරීක්ෂණයට ලක් කරන්නේ නැහැ.

ප්‍ර එතකොට ඒ කියන්නේ ඒ ලිපි පිළිබඳව පිලියෙල කිරීම කරන්නේ ඔබ විසින් නෙවේද? අධ්‍යක්ෂතුමා ෆයවන ලිපි?

උ ගරු ස්වාමිනි ඒකට නිශ්චිතවම එහෙම කියලා කියන්න අමාරුයි. මොකද සමහර අවස්ථාවල වාර්තා අපේ කොට්ඨාශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට පිටසන් කරනවා මේ වාර්තාව මේ විදියට සකස් කරන්න කියලා. එහෙම ආපුවහම සකස් කරලා කෙටුම්පත විද්‍යුත් තැපෑල හරහා අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයට යොමු කරනවා. ඇතැම් අවස්ථාවල අප විසින් නියොජ්‍ය අධ්‍යක්ෂතුමා අත්සන් කරන වාර්තාවම soft copy

FAIR COMMENT BY JEZEEM

එකඅධ්‍යක්ෂතුමාගේ කාර්යාලයට මේල් කරන්න කියනවා. එහෙම අවස්ථාවල තමයි , අවසන් වාර්තාව printout එක එලියට එන්නේඅධ්‍යක්ෂතුමාගේ කාර්යාලයෙන් ගරු ස්වාමිනි

ප්‍ර අධ්‍යක්ෂතුමා ඇතැම් අවස්ථාවන්වලදි එහෙම වාර්තාවක් උඩහටම ගියහම එතුමාටම ගියහම එතුමා විසින් අවස්ථාවල් තිබෙනවාද එය කියවා බලලා තව දුරටත් මේ පිළිබඳව කරුණු සොයා බලා වාර්තා කරන්න කියලා ඔබලාට උපදෙස් දීලා තියෙනවාද?

උ එහෙම අවස්ථා තිබෙනවා.

ප්‍ර නමුත් මේ අවස්ථාවේදී ඒ ආකාරයට ඔබට අධ්‍යක්ෂතුමා ගෙන් වැඩිදුර උපදෙස් ලැබුණේ නැනේ තවත් සොයා බලා නැවත වාර්තා කරන්න කියලා?

උ මට අධ්‍යක්ෂතුමා ඒක මේ සිද්ධිය කියලා කියන්න අමාරුයි. එහෙම Direct කතා කරන අවස්ථා බොහොම අඩුයි. නමුත් මගේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා , සහකාර අධ්‍යක්ෂ තුමා හරහා තමයි මට නියෝග ලැබෙන්නේ. මගේ සහකාර අධ්‍යක්ෂතුමා මට සඳහන් කරන්නේ , 556 ගිහිල්ලා මඩකලපු, අම්පාර visit කරලා නිරීක්ෂණයට ලක්කරන්න කියන කාරණයේදී එහිදි මම 05 වෙනිදා මඩකලපුවට ගිහිල්ලා මගේ මතකයේ හැටියට 07 වගේ දිනයක තමයි මම ආපහු කොළඹට එන්නේ.

ප්‍ර මොනවද ඔබ සොයා ගන්නේ මඩකලපුවෙන්?

උ ගරු ස්වාමිනි ඒ වෙනකොට එම ප්‍රදේශයට අප කොට්ඨාශයේ හිටපු නිලධාරියෙකුත් යොමු කරලා තිබ්බා. අම්පාර සහකාර අධ්‍යක්ෂතුමා යටතේ ක්‍රියාත්මක වෙන්න. ඒ වගේම අපගේ ඒ කියන්නේ මඩකලපු දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන දිසා බුද්ධි සේවා කාර්යාංශයේ ඒකක තිබෙනවා. ඒ වගේ රාජකාරි කරනවා මුස්ලිම් නිලධාරින්. මම දීර්ඝ කාලයක් තිස්සේ ස්ථානාධිපතිතුමන්ලාට උපදෙස් පන්තිවලදී කියලා තිබෙනවා මේ විෂය සම්බන්ධයෙන් දැනුවත් කරනවා. ඒ වගේම අර මුස්ලිම් නිලධාරින් තෝරගෙන ඒ අයට දැනුම්දීමක් කරනවා මේ සහරාන්ගේ තත්ත්වය සම්බන්ධව සහ ඒ සම්බන්ධව තොරතුරු රැස්කරන්න කියන කාරණය ගරු ස්වාමිනි

ප්‍ර එතකොට ඒ තොරතුරු රැගෙන ඔබ නැවත කොළඹ ආවද?

උ ඔව්.

ප්‍ර ඒ කවදද? 07 වෙනිදා?

උ මගේ මතකයේ හැටියට 07 දින වගේ තමයි මම ආවේ. 07 හෝ 08 වගේ.

ප්‍ර ඇවිල්ලා මොකද කළේ? එතකොට අර තොරතුර ඔබ අර විශ්ලේෂණය කරලා වාර්තා කරන ලද තොරතුර? 05 වෙනිදා. ඒ තොරතුර තවදුරටත්

FAIR COMMENT — BY JEZEEM —

වැඩිදුරට වාර්තාවක් ඉදිරිපත් කරලා තවත් කරුණු පෙන්නුම් කෙරුවාද ඔබේ සහකාර අධ්‍යක්ෂවරයාට?

උ නැහැ. ගරු ස්වාමිනි එහෙම කිරීමක් කළේ නැහැ.

ප ඉතින් මොකක්ද ඔබේ අරමුණ එතකොට ඔය මඩකලපුවට යාමේ?

උ යාම. ගරු ස්වාමිනි එකක් එම ප්‍රදේශයේ ඉන්න රාජ්‍ය බුද්ධි සේවාවේ මුස්ලිම් නිළධාරීන් දැනුවත් කරලා, මොකද ඒ නිලධාරින් හරහා තමයි අපිට තොරතුරු ගන්න තියෙන එක ක්‍රමයක්. අනෙක් එක තමයි ඒ ප්‍රදේශයේ අප විසින් යොමු කරන ලද නිලධාරියෙක් දාලා හිටියා සහකාර අධ්‍යක්ෂ, අම්පාර යටතේ ක්‍රියාත්මක වෙන්න. ඔහු සමග ඔහු වෙත පොඩ්ඩක් දැනුම්දීමක් කරන එක. ඒ වගේ කාරණා කිහිපයක් මුල් කරගෙන තමයි එම ප්‍රදේශයේ සංචාරය කරන්නේ. ඊට අමතරව මම සාමාන්‍යයෙන් දීර්ඝ කාලීනව මඩකලපුව, අම්පාර ඒ වගේ අනෙක් ප්‍රදේශවලත් නිරීක්ෂණයට ලක්කරනවා ඒ කියන්නේ මගේ විෂය පථයට අදාලව. ඒ ප්‍රදේශවල සිටින තොරතුරුකරුවන් වගේ කට්ටිය හමුවන්න.

ප එතකොට හැබැයි මේ අවස්ථාවේදී ඔබ ඔය 05 වෙනිදා වාර්තාව ඔබේ සහකාර අධ්‍යක්ෂවරයාට දාලා එදා රාත්‍රියේ මඩකලපුවට යන්නට තිරණය කෙරුවේ ඒ කියන්නේ ඔබට තේරුණාද මේ C 4 B ලේඛණයේ තියෙන මේ තොරතුර වැදගත් තොරතුරක් කියලා.?

උ ඔය තොරතුර පදනම් කරගෙන මම වැදගත් කියලා හිතුවේ නැහැ. නමුත් මම 2015, 2016 ඉඳන්ම වැදගත්කමක් දැනුන මට මොකද ලෝකයේ IS ප්‍රහාර මාලාව නිරීක්ෂණය කළාම දිනෙන් දින වන ප්‍රහාර දැක්කාම ඒ කියන්නේ අපේ ලංකාවේත් ඉස්ලාම් රාජ්‍යයක් කියලා ඔලුවේ තියාගෙන ඉන්න කට්ටිය ඕනෑම මොහොතක වාහනයක් අරන් ගිහින් ඇටෑක් කරයි. ඒ වගේ ඕනෑම අවස්ථාවක විය හැකි සම්භාවිතාවයක් සම්බන්ධයෙන් අපි අපේ විෂය සම්බන්ධයෙන් දැනුවත් හින්ද අපිට නිරීක්ෂණයට ලක්වුණා. ඒ අනුව තමයි මේ විදියට මේ ප්‍රදේශයේ සංචාරය කරන්නේ.

ප එතකොට ඔබේ ඒ අතීතයේ දැන් ඔබ අද ඉදිරිපත් කරානේ 2018 සිට 2019 වන තුරු ඒ කියන්නේ මේ ප්‍රහාරය දක්වා 21 වෙනිදා. ඔබ විසින් විවිධ අවස්ථාවල්වලදී ඉදිරිපත් කරල තියෙන වාර්තා ?

උ ඔව්. ගරු ස්වාමිනි.

ප ඒ වාර්තාවල තියෙන කරුණු සියල්ල සලකලා බලනවිට ඔය තොරතුරේ තියෙන සිද්ධිය සිදුවීමේ සම්භාවිතාවය ඔබට හිතුනද යම් ප්‍රතිශතයක් දක්වා යන්නට පුලුවන් කියලා?

උ 04.05 දින තොරතුරට සැබැඳිව ඊට කලින් අපි මාවනැල්ල බුදුපිළිම සිද්ධිය මා මීට කලිනුත් වාර්තා කළා. එතන සිටන් අපිට නිරීක්ෂණය වෙනවා සහරාන්ගේ යම් ඉදිරියට අඩිතාලමක් තියෙන බව. ඒ අනුව තමයි ඔහු සම්බන්ධ වන සියලු තොරතුරු ක්ෂණිකව අපි වාර්තා

FAIR COMMENT BY JEZEEM

කරන්නේ. උපදෙස් පංති පවත්වන එක. ඒ අතරේ යන තොරතුරක් තමයි මේ විදේශ රටකින් ලැබෙන තොරතුර. අපි ඒකටත් ඒ නම් ගම් ඇතුලත් කළා. මගෙන් මුලදි විමසිමක් කලා වනාතවිල්ලුව ඒ වගේ දේවල් ඇතුලත් නොකිරිම සම්බන්ධයෙන් ගරු ස්වාමිනි මා ඒ සියල්ල ඒ විදියට වාර්තා කරන්නේ ඒ කාලය තුලම අපි වාර්තා කිරීමකට ලක්කරනවා මේ සහරාන් කියන පුද්ගලයා අත්අඩංගුවට ගන්න ඕන කියන කාරණය. ඒ හින්ද තමයි ගරු ස්වාමීනි 03.07 මගේ මතකයේ හැටියට ආමි මොහිදීන් කියන පුද්ගලයා රිල්වාන් කියන පුද්ගලයා පෙන්වා දෙන්නේ. ඒ වගේම ෂයිනි කියන පුද්ගලයාව සින්න මවුලවි කියන නමින් තමයි, අන්වර්ථ නාමයෙන් පෙනී හිටියේ. නමුත් ඔහුගේ සියලු තොරතුරු අප විසින් වාර්තා කිරීමකට ලක් කරන්නේ මොහු තමයි සහරාන්ව , සහරාන්ගේ උපදෙස් පංතිවල මේ ඉස්ලාම් සමබන්ධව දේශන කරන එක පුද්ගලයෙක් කියන එක. ඔහු ඒ වන විටත් ගරු ස්වාමීනි නිවසේ රැඳී සිටියේ. ඒ අනුව විස්තර වාර්තා කරනවා.

ප මට හැබැයි ඕන මගේ ප්‍රශ්නයටනම් උත්තර හම්බ වුනේ නෑ. මං ඇහුවේ අර තොරතුරේ තියෙන දේ , ඔය තියෙන දැනුම් සම්භාරයත් එක්ක සිදුවන්නට පුලුවන්ද නැද්ද? මම මේ සාමාන්‍ය මනුෂ්‍යයෙක් විදියට ඒක අහන්නේ? ඔබ වගේ ඔය හසල දැනුමක් නෑනේ මට. මම මේක බැලුවහම මට ඔලුවට ප්‍රශ්නයක් එනවා, මේක වෙන්න පුලුවන්ද බැයිද? එතකොට මට ඒ සම්බන්ධයෙන් පසුබිමට තියෙන තොරතුරුත් තියෙනවා නම් මං එතකොට යමක් මට ඔලුවට එන්න පුලුවන් සාමාන්‍ය පුද්ගලයෙක් විදියට.ඉතින් ඔබ අපට වඩා ඒ ගැන දැන උගත් කෙනෙක්නේ. ඉතින් ඔබට අපිට තියෙන ප්‍රශ්ණය නැද්ද? මේක වෙන්න පුලුවන් ද? බැයිද? වෙනවානම් කොයිතරම් සම්භාවිතාවක් වෙන්න පුලුවන්ද? ගණන් පාස්නේ නේ. කියන්නකෝ බලන්න මේ සාමාන්‍ය ජීවිතයේ ඒවා. සාමාන්‍ය දෙයක් කියන්නකෝ.

උ ගරු ස්වාමිනි මා සිතන ආකාරයට මේ වාර්තාව මා යොමු කරන්නේ ඒ අදාළ වාර්තාව යොමු කරන්නේ මගේ සහකාර අධ්‍යක්ෂතුමාට. එතුමාට මම දවසින් දවස නිරන්තරයෙන් වාර්තා ඉදිරිපත් කරනවා සහරාන් සහරාන් සහරාන් කියලා. ඒ කියන කාරණය තුළ ඒ වාර්තාවත් මා යොමුකරනවා. එතනදී මාවනැල්ල ආගමික ප්‍රතිමා ඉදන් වනාතවිල්ලුව Recovery ඒ සියලු කාරණත් එක්ක තමයි වාර්තා යොමු කරන්නේ, එක වාර්තාවක් විදියට මේක දකින පුද්ගලයෙකුට සිතන්න පුලුවන් ගරු ස්වාමිනි මේකේ වටිනාකමක් නැහැ කියලා. නමුත් මා දීර්ඝ වාර්තා යොමු කරන හින්දා මේ වාර්තාව ඒ වාර්තා එක්ක සබැඳෙනවා. එතකොට ඒ වාර්තා බලන කෙනා මේවත් එක්ක දැනුමක් තිබෙන පුද්ගලයෙක් සහ මගේ සහකාර අධ්‍යක්ෂතුමාත් මේ ගැන දන්නවා.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර කෙටියෙන් කියනවා නම් ඔබ ඔබගේ වාර්තා හැමවිටම යොමු කරන්නේ බුද්ධි අංශයේ තොරතුරු ලැබෙමින් සිටි පුද්ගලයින්ට?

උ ඔව්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර ඔව්. එතකොට එහෙමනම් ඕක කියවුවහම ඕක වෙන්න පුලුවන්ද නැද්ද කියන එක පිළිබඳව ඒක කියවපු මනුස්සයාට තේරෙනවානේ?

උ ඒ කියන්නේ ගරු ස්වාමිනි මේ දිගටම දෛනිකව වාර්තා යොමුකරන නිසා දැනීමක් තියෙනවා.

ප්‍ර දැනීමක් තියෙනවා. එතකොට ඕක මට හම්බවුනා නම් නිතරම මට හිතෙනවා මේක වෙන්න පුලුවන්නේ කියලා හිතෙනවා. ඒකේ වැරැද්දක් නැනේ?

උ ඔව්.

ප්‍ර ඒකේ වැරැද්දක් නෑ. ඔබට මතකයිද ඔබ 2019.04.18 වෙනිදා ඔබේ සහකාර අධ්‍යක්ෂවරයා සමඟ ගියා කාත්තන්කුඩිය පාලමුණේට.

උ ගියා ස්වාමිනි.

ප්‍ර ඇයි ඒ ගියේ?

උ ගරු ස්වාමිනි 2019.04.16 වෙනිදා තාලංකුඩාවල යතුරු පැදියක් පුපුරුවා හරිනවා කියලා 2019.04.17 පොලීසියට වාර්තා වෙනවා. ඒ අනුව ඒ ප්‍රදේශයේ ඉන්න රාජ්‍ය බුද්ධි සේවා නිලධාරින් විසින් වාර්තා කරනවා මේ යතුරුපැදියේ වැසි අංකය, ඒ ඔස්සේ අපි විසින් වාර්තාවක් මුලින්ම පිළියෙල කරනවා 2019.04.18 වෙනිදා මගේ මතකයේ හැටියට. ඒ වාර්තාවේ සඳහන් කරනවා මේ යතුරුපැදිය මිලදීගැනීම. ඒ හා සබැඳි තවත් යතුරුපැදියක් මිලදී ගැනිම. සහ මේකට හුවමාරුවට ලබාදෙනවා ඩිස්කවරි වර්ගයේ යතුරුපැදියක්. ඒ යතුරුපැදියේ හිමිකරු වෙන්නේ අවසන් හිමිකරු වෙන්නේ සහරාන් සමඟ සමීපව සම්බන්ධ වෙච්ච පුද්ගලයෙකුගේ නමට. ඒ නිසා ඒ සබැඳි වාර්තාවක් යොමුකරලා, මගේ සහකාරඅධ්‍යක්ෂතුමාකියනවා නිලධාරි තුමාගේ උපදෙස් ලැබුණා ප්‍ර දේශයේ නිරීක්ෂණය කරන්නයි කියලා. ඒ අනුව 2019.04.19 මගේ මතකයේ හැටියට , 18 රාත්‍රී කාලයේ වගේ තමයි යන්නේ, 19 ඒ ප්‍රෙද්ශයට අපි ගමන් කරනවා. ඒ අනුව නැවත පැමිණිලා ඒ සබැඳි තවත් වාර්තාවක් යොමු කරනවා මගේ මතකයේ හැටියට සාෆි කියන පුද්ගලයව අත්අඩංගුවට අරගෙන

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

මේ සිද්ධි දාමය සම්බන්ධයෙන් ප්‍රශ්ණ කරන්න කියන එක යෝජනා කරලා වාර්තාවක් යොමුකිරීමක් කරනවා ගරු ස්වාමිනි

ප ඔය වාර්තාව ඔබලා ඔය සොයාගන්නා ලද්දේය කියන ඔය කරුණු සියල්ලම අන්තර්ගත කරලා ඔබට අවබෝධයක් තියෙනවද ඔබේ එවකටඅධ්‍යක්ෂ වුණ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා පොලිස්පති තුමා වෙත වාර්තාවක් යැව්වද කියලා කියන්න?

උ මා ළඟ පිටපතක් තියෙනවා ගරු ස්වාමීනි. යවලා තියෙනවා.

ප කවදද යවලා තියෙන්නේ?

උ 2019.04.18 වෙනි දින.

ප 2019.04.18 වෙනිදා. මොකක්ද ඒකේ මාතෘකාව

උ කාත්තන්කුඩි පොලිස් වසමේ තාලංකුඩා ප්‍ර ද්ශයේදී යතුරුපැදියක් පුපුරුවා හැරීම සම්බන්ධව කියන මාතෘකාව.

ප ඔව්. එතකොට 2019.04.18 වෙනිදා ඔබගේ අධ්‍යක්ෂවරයා පොලිස්පතිතුමා වෙත එම මාතෘකාවෙන් යවන ලද ඔය ලියුමේ ඔබ සඳහන් කරපු ඔය යතුරුපැදි මිලදී ගැනීම ඒක කොහොමද වෙලා තියෙන්නේ කියන හැම කරුණක් පිළිබඳව සඳහන් වෙලා තියෙනවා නේද?

උ ඔව්. ගරු ස්වාමිනි
ස්වාමීනි එම වාර්තාව X 193 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයදිනවා

ප Dry run එකක් කියන්නේ මොකක්ද බණ්ඩාර මහත්තයා?

උ Dry run එකක් කියලා අදහස් කරන්නේ අත්හදා බැලීමක් කියන කාරණය.

ප දැන් ඔය ස්ථානය සඳහා ඔබ ගියා කියලා කිව්වනේ මේක පිපිරීම සිදුවෙලා තියෙන?

උ ඔව් ගරු ස්වාමිනි

ප එතකොට දැක්කද ඒ අවට ඔබ නිරීක්ෂණය කළාද?

උ ඔව් ගරු ස්වාමිනි

ප ඒ පිපිරීමෙන් සිදුවූ හානිය ඔබ දැක්කද?

උ ඔව් ගරු ස්වාමිනි

ප C 812 සිට අපි පුළුල් තිරයේ ඔබගේ මතකය අවදිකර ගමු නේද? දැන් ටිකක් කල්නේ ගිහිල්ලා. මතකයිද ස්ථානය?

උ මතකයි.

ප ඕකේ ඔබ නැද්ද? නැහැ නේද? හරි. ඔබ ගියේ 18 වෙනිදානේ.

උ 19 වෙනිදා උදෑසන තමයි ගියේ.

ප මේ පොලිස් නිලධාරීන් ගිහිල්ලා තියෙන්නේ ඒ සිද්ධිය පිළිබඳව වාර්තා වුන ගමන්ම?

උ ඔව්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර එතකොට දැන් අපිට දැනුත් ජේනවා ඒකේ වෙලා තියෙන හානියේ ඇතැම් ප්‍රතිඵල. ඔබ පොලිස් නිලධාරියෙක්නේ බුද්ධි නිලධාරියෙක් වුණාට අමතරව?

උ ඔව් ගරු ස්වාමිනි

ප්‍ර ඔබට වෙඩි තියන්න පුලුවන්ද? ගිනි අවි පාවිච්චි කරන්න පුලුවන්ද? ඒ සම්බන්ධයෙන් පුහුණුවක් ලැබිලා තියෙනවද?

උ ඔව්.

ප්‍ර එතකොට ඔබ භූමියේ තොරතුරු රැස් කරනකොට ඔබ පුපුරන ද්‍රව්‍ය පිළිබඳව අධ්‍යයනය කරලා තියෙනවාද?

උ යම් අධ්‍යාපනයක් ලබලා තියෙනවා.

ප්‍ර ඔබ මේ ස්ථානීය පරීක්ෂණය සඳහා ගියානම් එතනට සිදුවෙලා තිබුන හානිය පිළිබඳව ඔබ දකින්නට ඇතිනේ ?

උ ඔව්.

ප්‍ර එතකොට ඔබේ මනසට පොලිස් නිලධාරියෙක් වගේම බුද්ධි නිලධාරියෙක් විදියටත්, අවබෝධයක් ලැබුණද කොයිතරම් විදියක හානියක් මේ බයිසිකල් බෝම්බය මගින් සිදුවෙලා තියෙනවාද කියලා?

උ ඔව් ගරු ස්වාමිනි

ප්‍ර එතකොට එවැනි හානියක් නිකන් සිදුකරන්න පුළුවන්ද? ඔය වගේ ටෙස්ට් එකක් නිකන් කරනවාද? මොනවහරි චේතනාවක් ඇතුව පරමාර්ථයක් ඇති නෙවෙයිද ඔය වගේ ටෙස්ට් එකක් කරන්නේ? පරීක්ෂණයක් ?

උ ඔව්.

ප්‍ර එහෙමනම් ඔබට එතකොට මේකේ වැදගත්කමක් තේරුණාද බුද්ධි නිලධාරියෙක් විදියට? මොනවාහරි දෙයකට පෙරහුරුවක් වන්නට පුලුවන් මේ කියලා?

උ ඔව්.

ප්‍ර ඒ නිසා නේද ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට දැනුවත් කරලා ඔබයි, සහකාර අධ්‍යක්ෂයි දෙන්නමනේ ගියේ. අනතුරුව මෙය අධ්‍යක්ෂවරයා දක්වා ගිහිල්ලා අධ්‍යක්ෂවරයා පොලිස්පතිවරයා වෙත ඔබ දැන් X 193 ලෙස ලකුණු කරලා ඉදිරිපත් කර තියෙන වාර්තාව ඉදිරිපත් කෙරුවේ?

උ ඔව් ගරු ස්වාමිනි

ප්‍ර එතකොට දැන් ඔබට අර C4B තොරතුරේ තියෙන වාර්තාව පිලිබඳව කල්පනා වුනාද?අපිට විදේශ බුද්ධි සේවයකින් මේ වගේ තොරතුරක් ලැබිලා මම ඒක දැන් Analyse කරලානේ තියෙන්නේ. ඒකේ කියන්නෙත් ප්‍රහාරයන් සිද්ධ වෙනවා කියලා?

උ ඔව්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර එතකොට ඔබ දැන් මෙතන ස්ථාන පරීක්ෂාවක් කරලා ඔබ දකිනවා වෙලා තියෙන හානිය? නිකන් මිනිස්සු බයිසිකල්වලට බෝම්බ තියලා පත්තු කරන්නේ නැහැනේ නේද?

උ ඔව් ගරු ස්වාමිනි

ප්‍ර මොකක් හරි පරමාර්ථයකට. ඉතින් ඔබ ඔය දෙක අතර යම් සම්බන්ධතාවයක් ගොඩනැඟුවද?

උ ගරු ස්වාමීනි 04.04 තොරතුර සම්බන්ධයෙන් නෙමේ සාමාන්‍යයෙන් සහරාන්ගේ නෙට්වර්ක් එක සම්බන්ධයෙන් අපේ තියෙන දැනුමත් එක්ක 04.18 වාර්තාව යොමු කරනවා. ඒකේදි කියනවා මේක විය හැකි සම්භාවිතාවයක් Dry run එකක් කියන කාරණය. ඒ වගේම ඊට අමතරව මිලදීගන්න යතුරුපැදිය සමස්ථ පොලිසියම දැනුවත් කරන්න ඕන කියන කාරණය යෝජනා වෙනවා .ඒ වගේම මීට පස්සේ අපි තව වාර්තාවක් යොමුකරනවා ඒ ආපු දවසෙම ආපහු කොළඹට. ඒ සහරාන්ගේ මේ යතුරුපැදිය පුපුරුවා හැරීම ඉදිරි සැලසුම් සියල්ල අනාවරණය කරගන්න පුලුවන් මෙන්න මේ සාෆි කියන පුද්ගලයාව අත්අඩංගුවට ගැනිමෙන් කියලා. මොකද සාෆි කියන පුද්ගලයාගේ නමින් අවසානයට තියෙන යතුරුපැදිය, ඩිස්කවරි කියන යතුරුපැදිය තමයි යතුරුපැදි දෙකක් ලබාගැනිමට නැත්නම් මේ සිද්ධියට අදාළ යතුරුපැදිය මිලදී ගැනීමේදී හුවමාරුවට ලබාදෙන්නේ. ඒ නිසා ඔහු සම්බන්ධවත් විස්තර වාර්තාවක් අපි කරනවා. මොහු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කරන්න ඕන කියලා. ඔහු දැනට අත්අඩංගුවේ පසුවෙන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර දැන් ඔය ඕක Dry run එකක්ද කියන එක පිළිබඳව ඔබේ ඔළුවට ආවේ කොයි වේලාවේද?

උ සිද්ධිය පොලීසියට වාර්තා වෙන්නේ 04.17. 04.18 උදෑසන වන විට මාගේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාවෙත ඒ ප්‍රදේශයේ ඉන්න රාජ්‍ය සේවා බුද්ධි සේවා නිලධාරින්ගෙන් ඡායාරූප ලැබෙනවා. ඒ ඡායාරූප නිරීක්ෂණය කළහමත් මේක සහ ඒ ප්‍රදේශයේ නිලධාරින් සහකාර අධ්‍යක්ෂතුමා වෙත ලබාදෙන තොරතුරු මත මේක Dry run එකක් කියන නිරීක්ෂණයට අපි එනවා. මොකද මේ ප්‍රදේශයට සහරාන්ට තමයි ගොඩක් access තියෙන්නේ. සහ සහරාන්ගේ තියෙන motivation එක ගැන අපි නිරන්තරයෙන් කියනවා සහරාන් ගහන්න ප්ලෑන් කරනවා කියන එක. ඒ අනුව තමයි ඒ 04.18 වාර්තාව යොමු කිරීමක් කරන්නේ.

ප්‍ර ඔව්.එතකොට මේ 19 කියන දාතමින් රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා පොලිස්පතිතුමා වෙත යවන ඒ ලිපියේ මේ

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කාත්තන්කුඩියේදී සිදුවුන ඒ සිද්ධිය Dry run එකක් කියන එක ලියලා නෑ නේද?

උ ගරු ස්වාමිනි 2019.04.18 දින යොමු කරන ලද අංක දරණ ලිපිය හා සබැඳේ කියලා තමයි යොමු කරන්නේ.

ප්‍ර එතකොට ඔබ කියලා තියෙනවා X 193 මාවනැල්ල සිදුවීමට සම්බන්ධ නැෂනල් තවුහිද් ජමාත් නායක මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් ඇතුළු ජාලය විසින් පුපුරන අයිතම සකස් කරගැනීම සම්බන්ධයෙන් 2018 ඔක්තෝම්බර් මස 05, 06 සහ 07 යන දිනවල නුවරඑළිය ප්‍ර දේශයේදී උපදෙස් පංති පවත්වා ඇති බවට තොරතුරු වාර්තා වී තිබීමත්, සහරාන්ගේ ජාලයට සම්බන්ධිතයින් සැලකිය යුතු පිරිසක් කාත්තන්කුඩි ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් ජීවත්වීමත් සැලකිල්ලට ගැනීමේදී යතුරුපැදියක් අනුසාරයෙන් යම් පිපිරීමක් සිදුකිරීමට අත්හදා බැලීමක් ලෙස මෙය සිදුකර ඇති බව පෙනී යයි කියලා?

උ ඔව්.

ප්‍ර එතකොට ඒක තමයි මේ Dry run කියලා අදහස් කරන්නේ?

උ ඔව්.

ප්‍ර එතකොට ඒකට තමයි ඔබ සඳහන් කරන්නේ 2019.04.වන මස 19 වන දින ඔබේ අධ්‍යක්ෂකවරයා පොලිස්පතිතුමා වෙත යවා ඇති ලිපියේ පළමුවන ඡේදයේ 2019.04.18 වන දින යොමු කරන ලද අංක: S. 1758/2019 දරණ ලිපිය සබැඳේ. කියලා

උ ඔව්.

ස්වාමීනි එම ලිපිය X 194 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසරයි. ඒ කියන්නේ ස්වාමීනි 2019.04 වන මස 19 වන දින දරණ.ලිපිය X.194 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා.

ප්‍ර මීළඟට 20 වෙනිදා හැන්දෑවේ ඔබ කොහේද හිටියේ?

උ මා 2019.04.19 නැවත කොළඹ ඇවිල්ලා, ඊට පස්සේ 20 වෙනි දින මම විවේකය වාර්තා කරලා නිවසේ සිටියා.

ප්‍ර 20 වෙනිදා ඔබ විවේකය වාර්තා කරලා ගෙදර හිටියා?

උ **ඔව්.**

ප්‍ර ඒ ඉන්නකොට ඔබට යම් තොරතුරක් ලැබුණද?

උ එදින සවස මගේ මතකයේ හැටියට 06.00 හෝ 07.00 වගේ වෙලාවකදී සවස් කාලයේ , සහකාර අධ්‍යක්ෂතුමා කතා කරලා දැනුම් දීමක් කරනවා, සහරාන්ගේ කට්ටිය ඇටෑක් එකක් කරන්න ප්ලෑන් කරන් ඉන්නවා . ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂතුමා වාර්තා කිරීමක් කරනවා.ඒවගේම අධ්‍යක්ෂතුමා, පොලිස්පතිතුමා ඇතුළු හමුදා බලධාරීන් මෙන්ම ඒ වගේම ආරක්ෂක අංශ දැනුවත්

FAIR COMMENT BY JEZEEM

කිරීමක් කරලා තියෙනවා. තොරතුරු හොයන්න මේ සම්බන්ධයෙන් මොනව හරි තියෙනවානම් ටක් ගාලා වාර්තා කරන්න කියලා කියනවා.

ප්‍ර හැබැයි ඉතින් ඕක වෙලා තිබ්බේ 04 වෙනිදානේ. 04 වෙනිදා නේ ඔය පණිවිඩය ඇවිල්ලා තිබ්බේ. එතකොට මොකද මේ 20 හදිස්සිවෙලා?

උ 04 තොරතුරෙහි නිශ්චිතව කියන්නේ අප විසින් 2018 ඉඳන් දිගටම වාර්තා කරන ක්‍රමවේදය ඇතුලත් වාර්තාවක් තමයි තියෙන්නේ. එතකොට 04/20 කියන්නේ හෙට ගහනවා කියන පණිවිඩය තමයි මා දැනුවත් විදියට සහකාරඅධ්‍යක්ෂතුමා විසින් මා වෙත දැනුවත් කරන්නේ.

ප්‍ර එතකොට මේ හෙට ගහනවා කියන එක ඔබ හොයාගත්ත දෙයක් නෙමෙයි. නැවත අර තොරතුරු සේවයෙන් ඔබට ලැබුණ එකක්? නේද?

උ මට නෙමෙයි. අධ්‍යක්ෂතුමාට.

ප්‍ර කොහොම වුනත් ලංකාවට හම්බවුනේ එහෙමනේ? ඔබලා හොයාගෙන නෙවෙයිනේ?

උ නැහැ ගරු ස්වාමීනි.

ප්‍ර එතකොට ඔය තොරතුර ඔබේ සහකාර අධ්‍යක්ෂවරයා ඔබට කිව්වහම ඒ වගේම ඔබට උපදෙස් දුන්නයි කිව්වානේ තව තොරතුරු තියනවානම් සොයන්න කියලා එතකොට ඔබ මොකද කලේ? ඔබ අංශයේ ස්ථානාධිපතිනේ. මොකක්ද කළේ?

උ ඒ වෙනකොට අනුව ස්වාමිනි,අංශයේ අනෙකුත් නිලධාරීන් වෙතත් සහකාර අධ්‍යක්ෂකතුමා දැනුම් දීමක් කරලා තිබුණා තොරතුරුකරුවන් හරහා කතාකරලා තොරතුරු රැස් කරන්න කියන කාරණය. ඒ වගේම මා දැනුවත් හැටියට නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා ආවේක්ෂණ අංශයත් දැනුවත් කරලා තියෙනවා තොරතුරු රැස් කරන්න කියන කාරණය. මමත් ඒ විදියට තමයි තොරතුරු රැස් කිරීමට තොරතුරුකරුවන් හා සම්බන්ධ වුනේ.

ප්‍ර මොනවාද ඔබලාට රැස්කරගන්න පුළුවන් වුන තොරතුරු?

උ නිශ්චිතවම තොරතුරක් ලැබෙන්නේ නැහැ.

මින්පසු සටහන් ගැනිම මුතුමාලි

FAIR COMMENT
BY JEZEEM
President's Secretary's Copy

වේලාව : ප.ව.08.30 යි.
පෙර සටහන් ල/ලේ : යමුනා මිය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : කොහොමද තොරතුරු රැස් කර ගන්න ගියේ?

පි : ගරු ස්වාමිනි තොරතුරුකරුවෝ හරහා තමයි තොරතුරු රැස් කරන්නේ. ඒ වගේම අප විසින් සහරාන් ඇතුළු ජාලය සම්බන්ධයෙන් කට්ටිය use කරන Telegram ගිණුම් කිහිපයක් සමඟ අපි සම්බන්ධ වෙලා ඉන්නවා. ඒ වගේ සම්බන්ධතා හරහා තමයි අපි තොරතුරු රැස් කිරීමක් කර ගන්නේ. ඒ වගේ තොරතුරක ප්‍රතිඵලයක් තමයි 24 වෙනිදා තව පුද්ගලයෙක් අත්අඩංගුවට ගැනීමටත් ලක් කරන්නේ.

ප්‍ර : දැන් මේ හෙට ගහනවා කියලනේ දැන් පණිවිඩය ඇවිල්ලා තියෙන්නේ. 25 ගත්ත ඒවාට වැඩක් වෙන්නේ නෑ. දැන් හෙට ගහන එකට අද කරපු surveillance එක ගැන මම අහන්නේ.

පි : ආවේක්ෂන රාජකාරිය සම්බන්ධයෙන්

ප්‍ර : කොහොමද ඒ ආවේක්ෂණය කෙරුවේ?

පි : ඒ සම්බන්ධයෙන් මට දැනීමක් නෑ ගරු ස්වාමිනි.

ප්‍ර : ඔබ දන්නේ නෑ ඔබ ආවේක්ෂණය කෙරුවේ නෑ? ඔබ කළේ තොරතුරු රැස් කිරීම විතරයි?

පි : ඔව් .

ප්‍ර : ඔබ තොරතුරු රැස් කිරීම සඳහා ඔබේ තොරතුරුකරුවන්ව හමු වුණාද?

පි : හමුවීමක් කළේ නෑ ගරු ස්වාමිනි අංශයේ නිලධාරීන්ගේ තොරතුරුකරුවොත් ඉන්නවා. ඒ නිලධාරීන්ටත් දැනුවත් කිරීමක් කරනවා සහකාර අධ්‍යක්ෂතුමා විසින් තොරතුරු රැස් කරන්නයි කියන කාරණාව. ඒ විදිහට තමයි ගරු ස්වාමිනි තොරතුරු රැස් වෙන්නේ.

ප්‍ර : එහෙම තොරතුරු දැන් ඔබ තනියම නෙවේනේ රැස් කළේ?

පි : නෑ ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට අනික් නිලධාරීනුත් ඒ සඳහා අනුයුක්ත කරන්න ඇති?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට කී දෙනෙක් ඔය තොරතුරු රැස් කරන්නට කියලා අංශ ස්ථානාධිපති විදිහට ඔබ අනුයුක්ත කළාද 20 වෙනිදා රාත්‍රියේ?

පි : මම එදින කවුරුත් අනුයුක්ත කිරීමක් කළේ නෑ ගරු ස්වාමිනි භූමියට.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ තනියමද කළේ එතකොට?

පි : නෑ ගරු ස්වාමිනි.

ප්‍ර : එහෙනම්?

පි : මා වෙත පණිවිඩය ලබා දෙන අවස්ථාවේ සහකාර අධ්‍යක්ෂතුමා විසින් එතුමන් මාගේ අංශයේ ඉන්න අනෙකුත් නිලධාරීන් කිහිප දෙනෙක් දැනුවත් කළා කියන කාරණේ දැනුම් දෙනවා ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ එහෙනම් ඔබේ අංශයේ නිලධාරීන් කීයක් ඉන්නවද?

පි : 17 දෙනෙක් ගරු ස්වාමිනි සිටින්නේ.

ප්‍ර : ඔබ ඒ 17 න් එක්කෙනෙක්වත් සම්බන්ධ කර ගත්තේ නැද්ද?

පි : නෑ ගරු ස්වාමිනි සහකාර අධ්‍යක්ෂතුමා කතා කරලා කියන්නේ කොළඹ ප්‍රදේශයේ ඒ කියන්නේ ඒ දවස සෙනසුරාදා හවස දවසක් ඒ දවස වෙන කොට නිලධාරීන් සමහර අය විවේකය වාර්තා කරලා නිවෙස්වලට ගිහිල්ලා. ඒ අනුව කොළඹ ප්‍රදේශයේ සිටින නිලධාරීන් දැනුවත් කිරීමට ලක් කරනවා කියලා තමයි ගරු සහකාර අධ්‍යක්ෂතුමා කියන්නේ.

ප්‍ර : කොළඹ ප්‍රදේශයේ කී දෙනෙක් ඉන්නවද නිලධාරීන්?

පි : නිලධාරීන් පස් හය දෙනෙක් තමයි ගරු ස්වාමිනි සිටින්නේ.

ප්‍ර : එතකොට සහකාර අධ්‍යක්ෂතුමා ඔබට කිව්වා නිලධාරීන් පහක් හයක් ඉතුරු ඉන්න අයට ඒ ගොල්ලන්ව දැනුවත් කළා කියලා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට අංශ ස්ථානාධිපති විදිහට ඔබත් ඒ අයව දැනුවත් කළා නම් නේද හොඳ?

පි : ගරු ස්වාමිනි අංශ ඒ කියන්නේ අර පොලිස් ස්ථානයක අංශ භාර ස්ථානාධිපති වගේ නෙවෙයි නමුත් සහකාර අධ්‍යක්ෂතුමා සහ සහකාර අධ්‍යක්ෂතුමා දැනුවත් කිරීම් කරනවා. ඒ අවස්ථාවේදී නැවත දැනුවත් කිරීම් මා විසින් මීට පෙරත් කවදාවත් කරලා නැහැ. ඒ නිසා මම එදිනත් එහෙම දැනුවත් කිරීමක් විශේෂයෙන් කරන්නේ නෑ ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ දන්නවද ඔබේ රාජ්‍ය බුද්ධි සේවයේ ඉන්නවනේ ඔය ආවේක්ෂණ නිලධාරීන්?

පි : ඔව් ඉන්නවා ගරු ස්වාමිනි.

ප්‍ර : මීඩියා නෑ ඒ නිසා කියන්නකෝ ආවේක්ෂණය කරන නිලධාරීන් සාමාන්‍යයෙන් කී දෙනෙක් ඉන්නවද කියලා?

පි : මට නිශ්චිතව සඳහන් කරන්න දන්නේ නෑ ගරු ස්වාමිනි. මොකද ඒ නිලධාරීන් අපිත් එක්ක රාජකාරිවලදී එහෙම සම්බන්ධවීමක් වෙන්නේ නෑ.

ප්‍ර : ඔබවත් ආවේක්ෂණය වෙනවද ඒ අයගෙන්?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙම වෙන්නේ නෑ. ඒක මම හරියට නිශ්චිතව දන්නේ නෑ ගරු ස්වාමිනි.

ප්‍ර : නෑ කියලා කියන්න බෑනේ?

පි : දන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : නමුත් ඔබ පිළිගන්නවනේ ඔබට කියන්නේ රාජ්‍ය බුද්ධි සේවයට ආවේක්ෂණ නිලධාරීන් ඉන්නවා කියලා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඔබ දන්නවද එදා රාත්‍රියේ 20 වෙනිදා ඔය තොරතුර නිශ්චිතවම 21 ප්‍රහාරය එල්ල වෙනවා කියලා දැන ගත්තාම ඔබේ ආවේක්ෂණ රාජකාරී නිලධාරීන්ව ආවේක්ෂණ රාජකාරීවල අනුයුක්ත කළාද නැද්ද කියන්න?

පි : ඒ සම්බන්ධව නිශ්චිතව මා දන්නේ නෑ ගරු ස්වාමිනි මගේ සහකාර අධ්‍යක්ෂතුමා දැනුම් දෙනවා නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා විසින් ඒ අංශය බලන සහකාර අධ්‍යක්ෂතුමා දැනුවත් කිරීම හරහා එම නිලධාරීන් අනුයුක්ත කිරීමක් වන බවට. මා නිශ්චිතව කවුද කොතැනද කියන කාරණය සම්බන්ධයෙන් නිශ්චිතව දන්නේ නෑ ගරු ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබ වැඩිපුර තොරතුරු දන්නේ නෑ කියන එකද ඕකෙන් හඟවන්න හදන්නේ වැරැද්දක් නෑ මේ ඒ කියන්නේ?

පි : නෑ ස්වාමිනි මම ආවේක්ෂණ අංශයේ රාජකාරී සම්බන්ධයෙන් මාගේ දැනීමක් නැහැ. ඒ සම්බන්ධව නිශ්චිතව කියන්න බැරි ඒ නිසා ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබට තොරතුරු හොයා ගන්න බැරි වුණා කිව්වනේ නේද?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව පසුවදා ප්‍රහාරයන් කිහිපයක් එල්ල වුණා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඒක එල්ල වුණාම මොනවද ඔබට හිතුණේ? ඔබ කොහොමද දැන ගත්තේ ප්‍රහාරයන් එල්ල වුණාය කියලා පහුවදා 21 වෙනිදා ?

පි : මුල්ම ප්‍රහාරය සිද්ධ වුණාට පස්සේ අපි ඒ සිද්ධිය එකින් එකට එකින් එකට සම්බන්ධ වෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර : ඒ කුමන ස්ථානයක වුණ ප්‍රහාරයද කිංස්බරි එකේද කොච්චිකඩේ එකයි කිංස්බරි එකයිනේ ඉස්සර වෙලා වුණේ?

පි : කිංස්බරි එකට තමයි ගරු ස්වාමිනි මුලින්ම මම යන්නේ. ඊට කලින් අනිත් නිලධාරීන් අංශයේ හිටපු අනිත් නිලධාරීන් එක එක තැන්වලට ගමන් කරනවා ගරු ස්වාමිනි. ඒ අනුව ඊට පස්සේ ෂැංග්‍රීලා හෝටලය ඊට පස්සේ සිනමන් ග්‍රෑන්ඩ් එක ඒ වගේ ඊට පස්සේ දවල් කාලේ වෙන කොට දෙමටගොඩ නිවසේ පිපිරීම සහ

Parliament Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

දෙහිවල හෝටලයේ පුපුරවා ගැනීම කියන කාරණා තමයි නිරීක්ෂණයට ලක් කරන්නේ ගරු ස්වාමිනි.

ප : ඒවා ඔබේ අවධානයට එනවා?

පි : ඇතැම් ඒවා අවධානයට ලක් වෙනවා ගරු ස්වාමිනි මොකද ඒ වෙලාවේ තිබුණ කාර්ය බහුලත්වයත් එක්ක හැම සිද්ධියටම මම ඒ වෙලාවේ ඒ දවසේ ගමන් කරන්නේ නෑ ගරු ස්වාමිනි.

ප : නෑ නෑ ඒක කමක් නෑ ගමන් කරපු එකක් ගැන නෙවෙයි මම අහන්නේ. දැන් පළවෙනියෙන්ම ඔබ දැන ගත්තේ කොච්චිකඩේ පිපිරීමද කිංස්බරි එකේ පිපිරීමද?

පි : කොච්චිකඩේ එක තමයි ගරු ස්වාමිනි වාර්තා වුණේ.

ප : ඒ කියන්නේ දේවස්ථානයක්නේ. අර තොරතුරේ තිබ්බනේ දේවස්ථානයකට පහර දෙන්න නියමිතයි කියලා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප : එතකොට ඔබට මොකක්ද හිතුණේ? තොරතුරක් ලැබිලා තිබ්බා ලංකාවෙන් නෙවෙයි විදේශයකින්. ඒකේ සඳහන් වෙලා තිබුණා පල්ලිවලට ප්‍රහාර එල්ල කරන්න ඉඩ තියෙනවා කියලා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප : ඔබ ඔබේ කෙටුම්පතේ සඳහන් කෙරුවා කතෝලික පල්ලිවලට ප්‍රහාර එල්ල කරන්නට ඉඩ තියෙනවා කියලා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප : නමුත් දැන් ඔබ මොනවා ඒකේ ලියුවත් ඔබ ඒ කෙටුම්පතෙහි පල කරන ලද ප්‍රහාරයක් වීමට ඉඩ තියෙන බිය දැන් සනාථ වෙලා තියෙනවා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප : මේ අංශයේ මුස්ලිම් අන්තවාදී කටයුතු පිළිබඳව තොරතුරු රැස් කරන ඒ සඳහා විශේෂ වූ ඒ අංශය ඒ ස්ථානාධිපති විදිහට කටයුතු කරන ඔබට මොනවද හිතුණේ ඒ වෙලාවේ?

පි : මට ඒ වෙලාවේ හිතුණේ ගරු ස්වාමිනි ඒ කියන්නේ 2017 ඉඳන් තොරතුරු තිබිලත් අපිට ඒ සම්බන්ධයෙන් ඒ කියන්නේ ඔහු අත්අඩංගුවට ගැනීමට කටයුතු නොකිරීම තමයි මේකට ප්‍රධාන හේතුව කියන කාරණේ.

ප : ඔබ ඒ ගමන්ම අද දැන් ස්වල්ප වෙලාවකට පෙර කිව්වා ඒ දවස ඇතුළත බස්නාහිර පළාතේ විවිධ ස්ථානවල තවත් පිපිරීම් බොහොමයක් සිද්ධ වුණා කියලා ?

පි : ඔව් ගරු ස්වාමිනි.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහෙමනම් ඔබේ අවධානයට යොමු වෙන්න ඇති ඔබ වගේ බුද්ධි අංශවලට සම්බන්ධ නැති ත්‍රස්තවාදී කටයුතුවලට සම්බන්ධ නැති තමන්ගේ දරු පවුල් එක්ක ආදරයෙන් ගත කරන එක්කෝ හෝටල්වලට ඇවිල්ලා යම් අවස්ථාවක් සමරන

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : එහෙමත් නැත්නම් ජේසුතුමාගේ උත්ථානය සමරන ඒ විශේෂ පූජාවට සහභාගි වූ ඒ කතෝලික ක්‍රිස්තියානි බැතිමතුන් ඔවුන් ඒ පූජාවන්වලට සහභාගි වෙන අවස්ථාවේදීම ඉතා කෲර ලෙස ඝාතනයට ලක් වෙලා තියෙනවා කියන කරුණ?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබට මොකද හිතුණේ?

පි : ගරු ස්වාමිනි මේක මේ එදින සිද්ධ වෙච්ච සිදුවීම කියන කාරණේට වඩා ගරු ස්වාමිනි මට මගේ හැඟීමට එන්නේ මොකද අපි ළඟ තොරතුරු බහුතරයක් තිබිලා ප්‍රහාරයෙන් පසුව අත්අඩංගුවට ගන්නේ ඒ තොරතුරු මතමයි. ඊට පෙර ඒ තොරතුරුවලට ක්‍රියාත්මක වුණා නම් ගරු ස්වාමිනි මේ පාස්කු දින ප්‍රහාරයක් සිද්ධ වෙන්නේ නෑ ගරු ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ දුන්න රැස් කරලා දුන්න තොරතුරු සියල්ල ඔබ කියන විදිහට ඔබේ අධ්‍යක්ෂවරයා වෙත ලබා දුන්නා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඔබ ඊයේ දින නැත්නම් පෙරේදා දින මා ඔබෙන් අහන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් පිළිගනු ලැබුවා අධ්‍යක්ෂවරයා වෙත ගලා යන මේ තොරතුරු බාහිර පාර්ශවයන්ට ලබා දීමේ අභිමතය ඔහු සතුයි කියලා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබලා විසින් වරින් වර ඔහු වෙත යොමු කරන ලද මේ තොරතුරු එහෙම නම් ඔහුගේ දැනුම තුළ තියෙන තොරතුරුනේ?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම ඔබ අද දින ලකුණු කරන ලද ඊයේ දින ලකුණු කරන ලද ඇතැම් වාර්තා මඟින් දැන් සනාථ වෙනවා ඔහුත් යම් යම් වාර්තාවන් පොලිස්පතිතුමාට ඒ වගේම ජාතික බුද්ධි ප්‍රධානී වෙත සමඟර විට නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා වෙත යවමින් ඔවුන්ගේ අවධානට ඒ කරුණු යොමු කළාය කියලා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් යවලා තියෙනවා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට දැන් මේ රජයට තොරතුරු සපයන්නේ කවුද බුද්ධි තොරතුරු සපයන්නේ?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : බුද්ධි අංශ විසින්.

ප්‍ර : බුද්ධි අංශ. ඒ බුද්ධි අංශවලිනුත් ප්‍රමුඛස්ථානයක් ගන්නේ කවුද?

පි : රාජ්‍ය බුද්ධි සේවාව.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවාව. ඒ කියන්නේ ඔබ සේවය කරන ආයතනය?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඔබට හිතෙන විදිහට ඔබේ මේ මහන්සිය ගැන මම කතා කරන්නේ. ඔබට හිතෙන විදිහට ඔබ භූමියෙන් ඒ කියන්නේ ඔබ සංවෘත, විවෘත මූලාශ්‍රයන්ගෙන් ලබා ගන්නා ලද එම තොරතුරු වෙනත් පාර්ශවයන්ට දීලා ඒ වෙනත් පාර්ශවයන් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් මොකක්ද රාජ්‍ය බුද්ධි සේවාවට කරන්න පුළුවන්? ඔබ එතනින් නවතින්නට ඕනේද? අපේ තොරතුරු අපි දුන්නා අපේ රාජකාරීය කළා කියලා ඔබට එතනින් නවතින්න පුළුවන්ද? ඔබ මහන්සි වෙලානේ කරන්නේ මේ තොරතුරු මොකක්ද ඔබ බලාපොරොත්තු වෙන්නේ ඒ වගේ වෙලාවක ඔබේ ආයතනය විසින් සිදු කරයි කියලා?

පි : ගරු ස්වාමිනි මට මගේ රාජකාරීයට මට පවරලා තියෙන වගකීම තමයි භූමියේ තොරතුරු රැස් කරන එක කියන එක. ඒ කාරණේදී මා 2016 ඉඳන් දීර්ඝව දවසින් දවස දවසින් දවස තොරතුරු අරන් වාර්තා කරනවා. එතකොට ඒ තොරතුරු මේකේ Mechanism එකේ ප්‍රශ්නේ හින්දා තමයි මෙහෙම මේ වගේ සිද්ධියකට මුහුණ දෙන්නත් වෙන්නේ ගරු ස්වාමිනි. මොකද අපේ අතේ තොරතුරු තියෙනවා. අත්අඩංගුවට ගන්නේ තව පාර්ශවයකින්.

ප්‍ර : අන්න ඒ Mechanism එක ගැන පොඩ්ඩක් පැහැදිලි කරන්නකෝ මොකද ගරු කොමසාරිස්තුමන්ලාට මම ඔබෙන් ඒ ප්‍රශ්න අහන එකේ අරමුණ වෙන්නේ ඒකයි මොකද එතුමන්ලා විසින් රෙකමදාරුවක් කරන්න ඕනේ ගරු ජනාධිපතිතුමාට යම් යම් කරුණු පිළිබඳව නිරීක්ෂණය කරලා. එතකොට මේ අපේ මේ ක්‍රමවේදයේ යම් අඩුපාඩු තියෙනවානම් ඒවා අපි සපුර ගෙන ඉදිරියට යන්නට ඕනනේ රටක් විදිහට ජනතාවක් විදිහට නේද. අන්න ඒ සම්බන්ධයෙන් තමයි එයට ආධාර කිරීම සඳහා තමයි මම ඔබෙන් ඔය ප්‍රශ්න අහන්නේ. ඒ මිසක් ඔබව අමාරුවේ දාන්නවත් ඔබ සමඟ තියෙන අමනාපයක් හින්දාවත් නෙවෙයි. අපි සියළු දෙනාම එකතුවෙලා මොකක් හරි මේකේ ආධාරයක් කරන්න ඕනනේ රට ඉදිරියට යන්න. කියන්නකෝ?

පි : ගරු ස්වාමිනි ලෝකයේ වන ප්‍රවණතාවයක් තමයි 2014/06/29 IS ඉස්ලාම් රාජ්‍යය ඇති වෙන එක. එතකොට ඉස්ලාම් භක්තිකයොන්ගේ ඇතැම් පිරිසක් අර කුරාන් හදීස්වල තියෙන

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

විදිහට ජීවත් වෙන්න ඒ කියන්නේ අර මම මුලින් සඳහන් කළා 570 වේ හිටපු නබිතුමාගේ සහ 660 වෙනකම් හිටපු සහාබිවරුන්ගේ යුගයට යන්න ඕනේ කියලා. එතකොට ඒ අතරේදී අන්‍යාගමිකයෝ කියන කාරණයේදී බෞද්ධ, කතෝලික, හින්දු සහ ඉස්ලාම් අර කුර්ආන් හදීස්වලින් බැහැර වෙන සියළු දෙනාම කාෆිර්වරු. නැත්නම් අන්‍යාගමිකයෝ කියන කාරණේ තමයි ඉස්මතු කරන්නේ. එතකොට මේ විදිහට අපි භූමියේ බුද්ධි තොරතුරු විශාල වශයෙන් රැස්කර ගෙන දෙනිකව තොරතුරු වාර්තා කිරීමක් කරනවා. නමුත් ගරු ස්වාමිනි රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරීයෙක් විදිහට ඒ කියන්නේ අප ආයතනය සතුව තිබුණා නම් වෙනත් අත්අඩංගුවට ගැනීමට සම්බන්ධ පාර්ශවයක් මේ තොරතුරු තවත් පුද්ගලයෙකුට දීලා අත්අඩංගුවට ගැනීමක් සිදුවන තාක් කල් බලන් ඉන්න අවශ්‍යතාවයක් නෑ. මොකද එහෙනම් අපිට අපේ තොරතුරු අපිට අත්අඩංගුවට ගැනීම්වලට ලක් කිරීමකට තිබුණා.

ප : ඔබ කියන්නේ වර්තමානයේ එවැනි පහසුකම් එවැනි බලතල ඔබ සතුව නෑ කියලද?

පි : ඒ කියන්නේ අපේ ආයතනයට එහෙම අත්අඩංගුවට ගැනීමේ ක්‍රමවේදයක් නැති නිසයි ගරු ස්වාමිනි මෙහෙම වෙනත් පාර්ශවයකට තොරතුරු දීලා බලන් ඉන්න වෙලා තියෙන්නේ ගරු ස්වාමිනි. ඒකේ ප්‍රතිඵලයක් තමයි 21 ප්‍රහාරය.

ප : එතකොට දැන් ඊට පස්සේ ඔය ප්‍රහාරයෙන් පස්සේ ඔබට මතකද ඔය ප්‍රහාරය සම්බන්ධයෙන් ISIS සංවිධානය විසින් යම් ප්‍රකාශයක් නිකුත් කරලා තිබ්බා අල්බග්ඩාඩී විසින්?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප : අර කැලිෆේට් එකක් ප්‍රකාශ කරමින් ඔබ කිව්වනේ කැලිෆෙට් එක ප්‍රකාශයට පත් කරන ලද අල්බග්ඩාඩී ගැන?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප : අල් බග්ඩාඩී ඔබට මතකද යම් ප්‍රකාශයක් කරලා තිබ්බා ISIS එක විසින් මෙය පිළි අරගෙන?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප : එතකොට ඔබේ බුද්ධි අංශ පරීක්ෂා කරලා බැලුවද කොහෙන්ද මේ තොරතුර ගිහිල්ලා තියෙන්නේ ISIS එක පිළිගන්න මේක ඇත්තටම ISIS එකේ විසින් කරන ලද දෙයක්ද එහෙම නැත්නම් ISIS එකට සම්බන්ධකම් තියෙන කෙනෙක් කරන ලද දෙයක්ද මේ තොරතුර කොහොමද ISIS එක විසින් මේ ආකාරයට පිළි අරගෙන අන්තර්ජාලයට මුදා හැරලා තියෙන්නේ කියලා?

President Secretariat
FAIR COMMENT
BY JEZEEM

පි : පරීක්ෂා කිරීමක් කළා.

ප්‍ර : ඒ කුමන මාධ්‍යයකින්ද ගිහිල්ලා තිබුණේ?

පි : ගරු ස්වාමිනි මුලින්ම ගියේ අමාක් නිව්ස් ඒජන්සි කියන එකේ 2019.04.23 වෙනිදා.

ප්‍ර : අමාක් නිව්ස් ඒජන්සි එක කාගේ නිල ප්‍රකාශකයාද?

පි : IS සංවිධානය විසින් නිල ප්‍රකාශය විදිහට පත් කරන්නේ එතනින් තමයි. එතකොට ගරු ස්වාමිනි මා මුලදී සඳහන් කළා අපි මේ IS මතවාදය නැත්නම් ඉස්ලාම් රාජ්‍යය මතවාදය නැඹුරු වෙලා ඉන්න පුද්ගලයෝ හඳුනා ගද්දී භූමියේ මානසික තත්ත්වයක් ඒ නිසා කවුරුත් මේ මම IS කියලා Badge එක ගහගෙන නැති නිසා අපි මෙයාලව හඳුනා ගැනීමේදී මෙයාලා පාවිච්චි කරන Telegram, Whatsapp ඒ වගේ හැම ගිණුම්වලම අපිත් නිරන්තරයෙන් අපි ඒ අන්තවාදීන් විදිහට සැරිසරනවා. ඒ අතරතුර තමයි අපිට මේ තොරතුර යොමු කරන පුද්ගලයාව හඳුනා ගැනීමට හමුවෙන්නේ. මොකද මේ පුද්ගලයා සම්බන්ධයෙන් මීට ඊට මාස කිහිපයකට ප්‍රථම අප වෙත වෙනත් රටකින් ඒ පුද්ගලයාගේ Telegram ගිණුමේ ඒ කියන්නේ භාවිතා කරන නාමය හම්බ වෙනවා.

ප්‍ර : දැන් බණ්ඩාර මහත්මයා දැන් අපිට පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ඒ මොකද අපි මේ වෙනකොට ඔබ ඔය කියන එකට අදාළව යම් කරුණක් මේ ගරු කොමිෂන් සභාවේ මෙහෙයවලා තියෙනවා.

පි : හොඳයි ස්වාමිනි.

ප්‍ර : ඒ නිසා ඇයි මේ පුද්ගලයාව Follow-up කරන්න ඔබට හේතු වුණේ මොකක්ද? ඒ Follow-up කිරීමේ ක්‍රමවේදය මොකක්ද කියන එක පැහැදිලි කළොත් මගේ සහෝදරයට ලේසි ඉදිරියේ එන සාක්ෂිකරුව මෙහෙයවන්න.

පි : හොඳමයි ගරු ස්වාමිනි.

ප්‍ර : කියන්නකෝ ?

පි : ගරු ස්වාමිනි මේ සිද්ධියට පෙර මම සිද්ධි කිහිපයක් මතක් කරන්න කැමතියි. මේ වගේ ගරු ස්වාමිනි අපිට විදේශ අංශවලින් ඒ වගේ තැන් තැන්වලින් තොරතුරු එනවා විවිධ ගිණුම් සම්බන්ධව ඒ කියන්නේ මේ ගිණුම භාවිතා කරන්නේ මේ වගේ කියලා. ඒ වගේ ගිණුමේ තියෙන්නේ නමක් විතරයි. ඒ නම අපි Telegram Account එකේ නම search කරලා නමට අපි නමට අදාළ පුද්ගලයෙක්ව හොයා ගෙන ඒ වගේ අපි ඒ සම්බන්ධ පුද්ගලයන්ගේ ideas නැත්නම් අදහස් බලා ගෙන ඒ වගේ පුද්ගලයොත් එක්ක සම්බන්ධ වීමක් සිදු කරනවා. මගේ මතකයේ හැටියට දෙවෙනි මාසේ ඒ වගේ මාසේක තමයි මේ

FAIR COMMENT BY JEZEEM

වගේ ගිණුමක් අපිට සම්බන්ධ වෙන්නේ. ඒ අතරේ අපේ නිලධාරීන් ඒ ගිණුම් සමඟ සම්බන්ධ වෙනවා. මේ එක ගිණුමක් පමණයි. එතකොට මීට කලිනුත් මට උදාහරණයක් විදිහට ගිණුමක් දෙන්න පුළුවන් නයිසර් කියලා පුද්ගලයෙක්ගේ ගිණුමකින් අපි මේ වගේ තොරතුරු හුවමාරු කර ගැනීමක් කරනවා. ඒ පුද්ගලයත් මේ වගේ පුපුරන අයිතම සකස් කර ගැනීම සම්බන්ධයෙන් තමයි idea එක තිබුණේ. එතකොට අපි ඔහුත් එක්ක ගනුදෙනු කරද්දී අපිත් අර අන්තවාදී ස්වරූපයෙන් තමයි ගනුදෙනු කරන්නේ. එතකොට ඒ අදහස්වලට ඔහු match වෙලා ඔහු ඔහුගේ අදහස් අපිට ලබා දෙනවා. එතකොට ඔහු විවිධ තොරතුරු අපිට දීලා අපි ඔහු සම්බන්ධයෙනුත් ඒ අවස්ථාවේදී වාර්තා කිරීමක් කරනවා ගරු ස්වාමිනි.

ප : ඒ කියන්නේ අපිත් ඔහුගේ කෙනෙක් කියන එක ඔහුට හඟවන්න ඕනේ නේද?

පි : ඒත්තු ගන්වනවා ගරු ස්වාමිනි. ඒ වගේම ගරු ස්වාමිනි මේ ප්‍රහාරය සම්බන්ධව තමයි මගෙන් විමසීම කරන්නේ. එතකොට මේ කියන පුද්ගලයාත් අර ඒ වගේ අපේ ගිණුමට හම්බ වෙලා අපි මොහු සම්බන්ධයෙන් මේ ගිණුමේ නම විතරයි තියෙන්නේ. එතනදී අපි ඒක Develop කරගෙන මාස ගාණක් තිස්සේ අරන් යනවා. ඒ වගේ ගිණුම් කිහිපයක් අරන් යනවා එතකොට මේ පුද්ගලයාගේ ගිණුමත් ඒ විදිහට අපි සම්බන්ධ වෙලා මොහුගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා දීර්ඝ කාලයක් යනවා ගරු ස්වාමිනි. ඒ අතරේ යන කොට තමයි ප්‍රහාරය සිද්ධ වෙන්නේ. ඒ ප්‍රහාරය වෙන කොට අපි ඔහු සම්බන්ධයෙන් ඔහුගෙන් ලබා ගන්නා ලද දුරකථන අංකයක් ඔස්සේ ඔහුගේ පුද්ගලික විස්තර සියල්ල අනාවරණය කර ගැනීමකට ලක් කරනවා. ඒ සම්බන්ධව අපේ දිසා බුද්ධි සේවා කාර්යාංශයක් හරහා තමයි අනාවරණය කර ගැනීම සිදු කරන්නේ. ඒ අනුව මොහු සඳහන් කිරීමක් කරනවා 21 ප්‍රහාරය අදාළ වගකීම නැත්නම් IS සංවිධානයට මේ සහරාන් ඇතුළු කණ්ඩායම් බයියත් කරන නැත්නම් ප්‍රතිඥා දෙන Video පටය මේ IS එකේ නිල වෙබ් අඩවියට යොමු කරන්නේ තමා විසින් බවට. ඒ අනුව අප ඒ කියන්නේ ආයතනය විසින් කරන ලද දැනුම් දීමක් ප්‍රකාරව මාතලේ ප්‍රදේශයේදී ඔහු අත්අඩංගුවට ගැනීමක් සිදු කරනවා ගරු ස්වාමිනි.

ප : ඔහුගේ නම මොකක්ද?

FAIR COMMENT — BY JEZEEM

පි : මොහොමඩ් සහරාන් ෆස්රූල් රහුමාන් කියන පුද්ගලයා. ඒ අනුව ඔහු අත්අඩංගුවට පත් වෙලා කාලයක් ඒ සම්බන්ධයෙන් ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දීමක් කරනවා ගරු ස්වාමිනි. නමුත් ඔහු මගේ මතකයේ හැටියට 05 වෙනි මාසේ 08 වගේ දිනක තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නැවත ඔහු අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන්නේ.

ප්‍ර : එතකොට ඔබ කියන්නේ මේ යම් වරදක නිරත වන පුද්ගලයින් සමඟ සම්බන්ධකම් පවත්වලා තොරතුරු රැස් කර ගැනීම රාජ්‍ය බුද්ධි සේවාව විසින් තොරතුරු රැස් කර ගැනීමේ එක් ක්‍රමවේදයක් පමණයි කියලා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබලාට දැන් ස්ථිර වුණාට පස්සේ නැත්නම් සනාථ වුණාට පස්සේ ෆස්රූල් රහුමාන් මොහොමඩ් සහරාන් කියන තැනැත්තා තමයි මේ ප්‍රහාරයන් පිළිබඳව IS සංවිධානය වෙත ඒ තොරතුරු යවලා තියෙන්නේ කියලා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඔබ කිව්වා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔහුව අත්අඩංගුවට ගත්තා කියලා?

පි : මුලින්ම ගරු ස්වාමිනි රාජ්‍ය බුද්ධි සේවාව දැනුම්දීමක් කරලා මාතලේ පොලිස් ස්ථානය මගේ මතකේ හැටියට අත්අඩංගුවට ගැනීම කරන්නේ. ඊට පස්සේ ඔහු බන්ධනාගාරගත කිරීමක් සිදු වෙනවා. මං හිතන්නේ ඊට පස්සේ පසු කාලීනව තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔහුව ඔවුන්ගේ භාරයට ගන්නේ ගරු ස්වාමිනි. මට ඒ සම්බන්ධව නිශ්චිතව මතක නෑ කොහොමද ක්‍රමවේදය වුණේ කියන එක ගරු ස්වාමිනි.

ප්‍ර : කමක් නෑ නමුත් ඔබ දන්නවනේ මේ වන විට ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ ඉන්නවා කියලා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඔබට මතකද ඔය කරුණු අනාවරණය වුණාට පස්සේ ඔබ වාර්තාවක් දැම්මා ඔබේ අධ්‍යක්ෂකවරයාට?

පි : ගරු ස්වාමිනි වාර්තා ඒ කියන්නේ ප්‍රහාරයෙන් පස්සේ වාර්තා කිහිපයක් යොමු කළා.

ප්‍ර : 2019/04/25 වෙනිදා ඔය මොහොමඩ් සහරාන් ෆස්රූල් රහුමාන් යන තැනැත්තාව අත්අඩංගුවට ගැනීම ගැන ඒ සම්බන්ධයෙන් ඔබ ලිව්වනේ?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : වාර්තාවක් 25 වෙනිදා දාතමින් යන විදිහට?

පි : ඔව් ගරු ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒක නැවත දැක්කොත් අඳුරන්න පුළුවන්ද තියෙනවද ඒක?

පි : ගරු ස්වාමිනි මං ළඟ 04/25 ගියපු තවත් වාර්තාවක් තියෙනවා. ඒ වාර්තාවේ මා විසින් සඳහන් කරනවා මේ දෙවෙනි ප්‍රහාරය සම්බන්ධව සහ ඒක ජල්ලල් කිතාල් කරන්නේ කියන කාරණය ගරු ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ රිල්වාන්?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඔබ දැන් මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන 2019/04/21 වෙනි දින සිදු වූ ප්‍රහාරවල වගකීම IS සංවිධානය භාර ගැනීම සම්බන්ධව සහ ඉදිරියේදී සිදු විය හැකි ප්‍රහාරයක් පිළිබඳව තොරතුරක් දැනුම් දීම කියන මාතෘකාව යටතේ තිබෙන මෙම ලිපිය 2019/04/25 වෙනිදා ඔබගේ එවකට අධ්‍යක්ෂ වූ රාජ්‍ය බුද්ධි සේවයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා වෙත යවන ලද්දක් නේද?

පි : ඔව් ගරු ස්වාමිනි.

ස්වාමිනි එම ලේඛනය X 195 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර : ඔබට X 195 වශයෙන් ලකුණු කරන ලද මේ වාර්තාව මඟින් ඔබ මොනවද ඔබේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරලා ඔහු විසින් ඔය X 195 සඳහන් කරලා තියෙන්නේ කියලා මේ අපේ වාර්තාවේ සඳහන් වීම සඳහා කියවන්නට පුළුවන්ද?

පි : ගරු ස්වාමිනි සම්පූර්ණ වාර්තාවද ගරු ස්වාමිනි.

ප්‍ර : ඔව් ඔව්.

පි : මෙම වාර්තාව ගරු ස්වාමිනි යොමු කරන්නට යෙදෙන්නේ 2019/04/25 වෙනි දින. එවකට රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතාගේ අත්සනින් පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා වෙත. ඒකේ අංකය ලෙස සඳහන් වෙනවා ගරු ස්වාමිනි අංක S 1840/2019 කියලා. මාතෘකාව විදිහට සඳහන් වෙනවා ගරු ස්වාමිනි 2019/04/21 දින සිදු වූ ප්‍රහාරවල වගකීම IS සංවිධානය භාර ගැනීම සම්බන්ධව සහ ඉදිරියේදී සිදු විය හැකි ප්‍රහාරයක් පිළිබඳව තොරතුරු දැනුම් දීම කියන මාතෘකාව ගරු ස්වාමිනි. ඒකේ පළවෙනි ඡේදය ගරු ස්වාමිනි සඳහන් කරනවා 2019/04/21 දින සිදු වූ මරාගෙන මැරෙන ප්‍රහාර IS සංවිධානයේ අනුගාමිකයන් විසින් සිදු කළ බවට වගකීම භාර ගනිමින් IS සංවිධානයේ මාධ්‍ය අංශය යැයි හඳුනා ගෙන ඇති අමාක් නිව්ස් ඒජන්සි විසින් 2019/04/23 වෙනි දින පැය 16.05 ට පමණ විශේෂ නිවේදනයක්

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

යොමු කර ඇති බව නිරීක්ෂණය වේ. ඒකේ වරහන් ඇතුළේ දානවා ගරු ස්වාමිනි අදාළ නිවේදනය හා ඡායා රූපයේ ඇමුණුම (අ) කියන කාරණය. ඒ වගේම ඒකේ දෙවෙනි Para එක දෙවෙනි ඡේදයේ සඳහන් කරනවා ගරු ස්වාමිනි IS මතවාදයට නැඹුරුව සිටි ශ්‍රී ලාංකිකයින් IS සංවිධානය සිය මව් සංවිධානය බවට පිළිගැනීමක් වරහන් ඇතුලේ බයියත් කියලා සඳහන් කරනවා සිදු කර නොතිබූ හෙයින් ප්‍රහාර මාලාව 2019/04/21 දින සිදු වුවද එදිනම ප්‍රහාරයේ වගකීම IS සංවිධානය භාර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ. එසේ වුවත් තොරතුරුවලට අනුව අංක 19/1, මට්ටාව පාර, වරකාමුර, මාතලේ පදිංචි මොහොමඩ් සහරාන් ෆස්රූල් රහුමාන් නැමැති පහත සඳහන් පුද්ගලයා විසින් 2019/04/23 දින නැෂනල් තවුහිද් ජමාත් නායක මොහොමඩ් කාසීම් සහරාන් ඇතුළු IS මතවාදයට නැඹුරු ජාලය IS සංවිධානය සිය මවු සංවිධානය බවට බයියත් කර තිබෙන බව අමාක් නිව්ස් ඒජන්සී වෙත ලිපියක් සහ Video පටයක් ඔස්සේ දැනුම් දීමෙන් පසු එම සංවිධානය ප්‍රහාරයේ වගකීම භාර ගන්නා බවට සිය මාධ්‍ය අංශය ඔස්සේ ප්‍රකාශයට පත් කර ඇති බවට දැන ගැනීමට ඇත. ඒකේදී ගරු ස්වාමිනි ඡායාරූපයත් ඔහුගේ දාලා ඔහුගේ නම සඳහන් කරනවා.

ප : ඒ කියන්නේ ෆස්රූල් රහුමාන්ගේ ඡායාරූපයකුත් ඔබ ඒකට අන්තර්ගත කරලා තියෙනවා?

පි : ඔව් ගරු ස්වාමිනි. මොහොමඩ් සහරාන් ෆස්රූල් රහුමාන් නම, ලිපිනය අංක 19/1, මට්ටාව පාර, වරකාමුර, මාතලේ, ජාතික හැඳුනුම්පත් අංකය 893125751 V. විදේශ ගමන් බලපත්‍ර අංකය සඳහන් කරනවා N 7694215 කියලා. ඒ වගේම දුරකථන අංක 03 ක් සඳහන් කරනවා. 077-4962280 ඒ වගේම 075-8459252 ඒ වගේම 077-1658541. ඒ වගේම ඒකේ සටහන කියලා කෑල්ලකුත් ඇතුළත් කරනවා. මෙම පුද්ගලයා රාජ්‍ය බුද්ධි සේවාවේ තොරතුරු මත මාතලේ පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත කියලා ගරු ස්වාමිනි. ඒ වගේම පළවෙනි පිටුවේ අවසාන Para එකේ තියෙනවා IS මාධ්‍ය අංශය විසින් අදාළ ප්‍රහාරයේ වගකීම භාර ගැනීමෙන් පසු 2019/04/24 දින නැවත අමාක් නිව්ස් ඒජන්සී හරහා නිවේදනයක් නිකුත් කරමින් ශ්‍රී ලංකාවේ සිටින සිය අනුගාමිකයින් කරුණු කිහිපයක් සම්පූර්ණ කළ යුතු බවත්, ඒ අතර නායකයෙකු නම් කිරීම වැදගත් බවත්, එසේ නම් කිරීමෙන් පසු විලයා සෙයිලානි ලෙසින් ශ්‍රී ලංකාව සංවිධානයේ අනු ශාඛාවක් ලෙස නම් කරන බවටත් දැනුම් දී ඇති

Fair Comment by Jezeem

බවට තොරතුරු ඇත කියලා ගරු ස්වාමිනි. ඒ වගේම මෙමඟින් කලාපීය IS සාමාජිකයින්ගේ අවධානය ශ්‍රී ලංකාව වෙත යොමු වීමේ හැකියාවක් ඇති බව බැහැර කළ නොහැක කියලත් ගහනවා. ඒකේ දෙවෙනි පිටුවේ සඳහන් කරනවා පළවෙනි ඡේදය විදිහට ගරු ස්වාමිනි එමෙන්ම මොහොමඩ් ඊබ්‍රහීම් මොහොමඩ් නවුෆර් සම්බන්ධයෙන් අමාක් නිව්ස් ඒජන්සි සහ IS හිතවාදී මාධ්‍ය වන දීවාන් අල් ඉලාම් විසින් විමසීමක් කරන බවට ඉහත මොහොමඩ් සහරාන් ෆස්රූල් රහුමාන් නැමැත්තා විසින් මෙරට සිටින සහරාන්ගේ මතවාදයට නැඹුරු පිරිස් අතර Telegram ගිණුම් හරහා පුළුල් ප්‍රචාරණයක් ගෙන යන බවට වාර්තා වී ඇත. මෙම නවුෆර් නැමැත්තා 2019/04/21 දින දඹුල්ල පොලිස් ස්ථානය විසින් අත්අඩංගුවට ගැනීමෙන් පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. ඒ වගේම ගරු ස්වාමිනි ඒකේ ඊළඟ Para එකේ සඳහන් කරනවා මේ අතර 2019/05/05 දිනෙන් ඇරඹෙන රාමසාන් උපවාස මාසයට පෙර මෙරට තුළ නැවතත් මරාගෙන මැරෙන ප්‍රහාර මාලාවක් දියත් කිරීමට ජල්අල් කිතාල් නමින් පෙනී සිටින IS මතවාදයට නැඹුරුව ඇති අයෙකු මූලිකත්වයෙන් යුත් කණ්ඩායමක් පිරිමි 11ක් කාන්තාවන් 06 ක් සැලසුම් කරමින් සිටින බවට මෙම සේවාවේ තොරතුරු වාර්තා වී ඇත. මෙහිදී අත්අඩංගුවේ සිටින හෝ ජීවිතක්ෂයට පත් වූ පුද්ගලයින්ගේ භාර්යාවන් මෙන්ම ඔවුන්ගේ සමීපතම ඥාතීන් මේ සඳහා යොමු වීමේ හැකියාවක් පවතී. තවද අදාළ ප්‍රහාරය සඳහා පුපුරන අයිතම සකස් කිරීමට අවශ්‍ය පරිපථ කොටස් ලබා ගනිමින් පවතින බවට ද දැන ගැනීමට ඇත. එමෙන්ම එම ප්‍රහාර මාලාවේ ඉලක්ක වශයෙන් රෝහල්, සාප්පු සංකීර්ණ, සුපිරි වෙළෙඳසැල් හා පොලිස් ස්ථාන මෙන්ම මෙරට තුළ ස්ථාපනය කර ඇති ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඇතුළු ඉන්දීය සම්බන්ධතා ඇති ස්ථාන තෝරාගෙන ඇති බවට වැඩිදුරටත් වාර්තා වී ඇත. ඉහත ජල්ලල් කිතාල් යන අය දැන්වල ඇඟිලි කිහිපයක් නොමැති බැවින් සැම විටම ඔහු අත් වැසුම් පළඳින බවත් පුපුරන අයිතම සකස් කිරීමට උත්සාහ කළ අවස්ථාවකදී සිදු වූ අනතුරක් හේතුවෙන් ඔහුගේ ඇසක් හානි වී ඇති බවටත් දැන ගැනීමට ඇත. අදාළ තොරතුරු තවදුරටත් විශ්ලේෂණය කරමින් පවතින අතර ආරක්ෂක වැඩ පිළිවෙල සංවිධානය කිරීමේදී මහජනතාව අතර කැළඹීමක් ඇති නොවන අයුරින් කටයුතු කිරීම මෙන්ම බිම් මට්ටමේ නිලධාරීන් දැඩි අවධානයෙන් රාජකාරියේ යෙදීම සුදුසු බව යෝජනා කරමින් ඉදිරිපත් කරමි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : එතකොට ඔබ ඒ වාර්තාව ඉදිරිපත් කළේ 2019/04/25 වෙනිදා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : එම වාර්තාව ඉදිරිපත් කළාට පසු දින මොකද වුණේ?

පි : පසුදින නැවත පුපුරවා ගැනීමක් සිදු කරනවා සයින්දමරුදු නිවසේදී. ඒ වෙන කොට එදින 25 වෙනිදා වෙනකොට නැවත තොරතුරක් හම්බ වෙනවා ඒ කියන්නේ මේ සහරාන් 21 ප්‍රහාරයට සම්බන්ධ පුද්ගලයින් පුපුරන ද්‍රව්‍ය ඉතුරු වෙච්ච කොටස් රැගෙන යාමක් සම්බන්ධව. ඒ සම්බන්ධ පුද්ගලයා අපේ දිසා බුද්ධි සේවා කාර්යාංශයක් හරහා තමා සම්බන්ධ වෙන්නේ. ඒ අනුව ඒ සම්බන්ධව නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා මඟින් ඔහු සම්බන්ධීකරණය කරමින් අම්පාර සහකාර අධ්‍යක්ෂතුමා වෙත ඔහුව සම්බන්ධ කරනවා. ඒ අනුව තමයි එහේ සෝදිසි මෙහෙයුමකට ලක් කරනවා එම නිලධාරීන්.

ප්‍ර : ඒ කියන්නේ සමන්තුරෙයි සහ නින්දවුර් යන ස්ථානවල තිබ්බ ආරක්ෂිත නිවාස?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඊට පස්සේ ?

පි : ඒ සම්බන්ධ සිදුවීම් එකිනෙක නිවැරදිව කියන්න මම නිවැරදිව දන්නේ නෑ ගරු ස්වාමිනි.

ප්‍ර : කමක් නෑ අපි ඒක ගැන දැනට සාක්ෂි මෙහෙයවලා තියෙනවා.

පි : සහකාර අධ්‍යක්ෂතුමා අම්පාර ඒ සම්බන්ධව සියළු තොරතුරු දන්නවා මොකද එතුමා ඒ ස්ථානයේ සිටි.

ප්‍ර : ඒ සම්බන්ධව දැනට සාක්ෂි දීලා තියෙනවා. එතකොට මම ඔබට කියන්නේ දැන් 26 වෙනිදා රාජ්‍ය බුද්ධි සේවාව විසින් පොලිසියට ලබා දුන්න තොරතුරු මත සිදු කරන ලද විමර්ශනයේදී තමයි සමන්තුරේ සහ නින්දවුර් යන ස්ථානවල තිබුණු ආරක්ෂිත නිවස්න වටලලා ඒවායේ තිබුණ පුපුරන ද්‍රව්‍ය වගේම අනෙකුත් අපරාධ සඳහා භාවිතා කර ගන්නට පුළුවන් ඉඩ තියෙන නොයෙකුත් ද්‍රව්‍ය ඔවුන්ගේ භාරයට ගනු ලැබුවේ පොලිසියේ භාරයට ගනු ලැබුවේ?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට ඊට පස්සේ නේද සයින්දමර්දුහි සිදු වූ පිපිරීම සිදු වුණේ?

පි : ඔව් ගරු ස්වාමිනි මා දැනුවත් හැටියට මුලින්ම නිලධාරීන් අඩ්ඩාලච්චේනයේ ඉඳන් නිවාස කිහිපයක් පරීක්ෂා කිරීමට ලක් කරනවා. එම අතරේ තමයි ගරු ස්වාමිනි මගේ දැනීමේ හැටියට එක පුද්ගලයෙක් විසින් එම ප්‍රදේශයෙන් යන පිරිසකට තර්ජනය කිරීමක් හා පොලිස් ස්ථානයේ නිලධාරීන්ට වෙඩි තැබීමක් අතර තමයි මේ විමර්ශනය ඒ කියන්නේ මෙහෙයුම සමගාමීව හමුදාව ඒ වගේ පොලිස් නිලධාරීන් එකතු වෙලා කරන සෝදිසි

FAIR COMMENT BY JEZEEM

මෙහෙයුම්වලින් ප්‍රතිඵලයක් විදිහට තමයි ඒ කට්ටිය එම නිවසේ දී පුපුරවා ගැනීම සිදු කරන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබේ X 195 වාර්තාවේ සඳහන් ආකාරයට අර අල් කිතාල් මොන කිතාල්ද?

පි : ජල්අල් කිතාල් ගරු ස්වාමිනි.

ප්‍ර : ජල්අල් කිතාල් යන තැනැත්තා ඔය සයින්දමර්දු පිපිරීමේදී මිය ගියා නේද?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම ඔබේ වාර්තාවේ ඔබ සඳහන් කරනවා මේ මරාගෙන මැරෙන මේ ප්‍රහාර මාලාවේ පිරිමි 11 යි ගැහැණු 06 කුයි සැලසුම් කරමින් එය සැලසුම් කරමින් සිටින බවට තොරතුරු වාර්තා වෙලා තියෙනවා කියලා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට සයින්දමර්දුවල පුපුරුවා ගෙන ඒ මැරුණු අවස්ථාවේදී ඒ ස්වයං ඝාතකයින් ඒකට ඔබලාට තොරතුරු ලැබුණු විදිහටම ගැහැණු අයත්, පිරිමි අයත් දෙකොට්ඨාශයම අයත් වුණා නේද?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : සාරා ජෙස්මින් සම්බන්ධයෙන් ඔබේ ඔය තොරතුරු රැස් කිරීමේදී යම් කරුණු අනාවරණය වුණාද?

පි : ගරු ස්වාමිනි මාගේ මතකයේ හැටියට 04/20 දින වගේ වාර්තාවක් රාජ්‍ය බුද්ධි සේවාවෙන් යොමු කිරීමක් කරලා තියෙනවා. එම වාර්තාවේ මා ළඟ දැනට පිටපතක් නෑ ගරු ස්වාමිනි.

ප්‍ර : කමක් නෑ කියන්න.

පි : නමුත් එම වාර්තාවේ සඳහන් කිරීමක් කරනවා මොහොමඩ් හස්තුන් අච්චි මොහොමඩ් මොහොමඩ් හස්තූන් කියන පුද්ගලයා මේ සාරා ජෙස්මින් කියන කාන්තාව සමඟ විවාහ වෙලා ඉන්නවා කියන කාරණය. ඒ වගේම ඒ සාරා ජෙස්මින් පුලස්තිනි මහේන්ද්‍රන් කියන කාන්තාව සාරා ජෙස්මින් කියලා ඉස්ලාම් වැළඳ ගත්තට පස්සේ භාවිතා කරන නම. ඒ වගේ තොරතුරක් වාර්තා වෙලත් තිබුණා ගරු ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම ඔබලාට වාර්තා වුණාද සයින්දමර්දු සිදු වූ පිපිරීමේදී මිය ගිය අයගේ ඒ DNA සමඟ සන්සන්දනය කිරීමේදී සාරා ජෙස්මින් නැත්නම් පුලස්තිනි යන අයගේ මවගේ DNA සමඟ ඒ කිසිවක් ගැළපුණේ නෑ කියලා?

පි : අම්පාර ප්‍රදේශයේ සහකාර අධ්‍යක්ෂතුමා විසින් මගේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාට වාර්තා කිරීමක් කරලා තිබුණා. ඒ අනුව මා දැනුවත් විදිහට ගරු ස්වාමිනි මගේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙනුත්

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

විමසීමකට ලක් කරලා තිබුණා. DNA Match වෙන්නේ නැත්නම් එතන ගැටලුවක් තියෙනවා කියන කාරණය ගරු ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප : සාක්ෂිකරු ඔබ X 195 දරන ලේඛනය කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරුවා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප : සිදු විය හැකි දෙවැනි ප්‍රහාරයක් සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් සම්බන්ධයෙන්?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප : මම අහන ප්‍රශ්නෙට හොඳට අහගෙන ඉඳලා උත්තර දෙන්න වැඩි විස්තර දෙන්න යන්න එපා. මම අහන ප්‍රශ්නෙට කෙටි උත්තරයක් දෙන්න.

පි : හොඳමයි ගරු ස්වාමිනි.

ප : එම X 195 දරන ලේඛනයේ ඇතුළත් වී තිබෙන එම දෙවැනි ප්‍රහාරය සිදු වීම සම්බන්ධයෙන් තොරතුරු රාජ්‍ය බුද්ධි සේවයට ලැබෙන්නේ සංවෘත මූලාශ්‍රයක්ද, විවෘත මූලාශ්‍රයක්ද නැත්නම් විදේශීය ආයතනයකින්ද?

පි : මට ලැබෙන ආකාරය ගරු ස්වාමිනි නිශ්චිතව මතක නැහැ. නමුත් අධ්‍යක්ෂතුමා තමයි තොරතුර ලබා දෙන්නේ.

ප : ආ..... ඔබට ඒ තොරතුර ලබා දෙන්නේ අධ්‍යක්ෂ?

පි : අධ්‍යක්ෂ.

ප : අධ්‍යක්ෂවරයා වශයෙන් හිටියේ?

පි : එවකට නිලන්ත ජයවර්ධන මැතිතුමා.

ප : දැන් ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ කොපමණ කාලයක් සේවයේ නියුක්ත වෙලා ඉන්නවද?

පි : ගරු ස්වාමිනි මා 2009/06 වෙනි මාසේ ඉඳන් රාජ්‍ය බුද්ධි සේවාවේ තමයි රැකියාව කරන්නේ.

ප : දෙදාස්?

පි : 2009/06 වෙනි මාසේ ඉඳන් ගරු ස්වාමිනි. 06/24 හෝ 26 වගේ මට මතක විදිහට.

ප : එතකොට අවුරුදු 11 කට ආසන්න කාල සීමාවක් නේද?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප : එම කාල සීමාව තුළදී ඔබට පුද්ගලික දැනුමක් තියෙනවද රාජ්‍ය බුද්ධි සේවය විසින් කිසියම්ම හෝ පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමක් සිදු කරනවද කියන එක?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ගරු ස්වාමිනි මා මේ මගේ සේවා කාලය තුළ අධ්‍යක්ෂතුමන්ලා තිදෙනෙක් යටතේ රැකියාව කරලා තියෙනවා. මුලින්ම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කීර්ති ගජනායක මහතා යටතේ. ඒ වගේම නියෝජ්‍ය පොලිස්පති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා යටතේ. ඒ වගේම අවසානයට හිටියා නිලන්ත ජයවර්ධන මහතා. ඒ වගේම වර්තමානයේ සුරේෂ් සලේ මහතා යටතේ ඉන්නවා. එතකොට ගරු ස්වාමිනි අර කලින් කියපු සඳහන් කරපු කාල තුනදී කාල දෙකකදී මම නිරීක්ෂණයට ලක් කරලා තියෙනවා සමහර අපේ තොරතුරුවලට ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශයෙන් අත්අඩංගුවට ගැනීමක් සිදු වෙනවා. ඒ මන්ද කියනවානම් ගරු ස්වාමිනි එතුමා මගේ ඒ කියන්නේ එවකට අධ්‍යක්ෂතුමා යටතේ තමයි එම කොට්ඨාශත් පැවතුණේ.

ප්‍ර : ඒ කියන්නේ ඔබගේ දැනීමේ හැටියට රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරීන් විසින් ඔබගේ පුද්ගලික දැනුම අනුව යම්කිසි පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමක් සිදු වෙලා තියෙනවද නැද්ද?

පි : නෑ ගරු ස්වාමිනි අපේ තොරතුරු වෙනත් ඒ කියන්නේ අර ඒජන්සියේ කට්ටිය එක්ක ගිහිල්ලා තමයි අත්අඩංගුවට ගැනීම සිදු වන්නේ.

ප්‍ර : එතකොට දැන් කොමිෂන් සභාවට විස්තර කරන්න දැන් ඔබ මේ කොමිෂන් සභාවට ප්‍රකාශ කරපු හැටියට

පි : ඔව් ගරු ස්වාමිනි

ප්‍ර : මේ සහරාන් හෂීම් සහ වෙනත් ඔහුගේ අනුගාමිකයින් සම්බන්ධ බොහෝ තොරතුරු ප්‍රමාණයක් රාජ්‍ය බුද්ධි සේවයට යම් කාල සීමාවක් තුළ ලැබෙනවා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඒ ලැබිච්ච තොරතුරු හැම දෙයක්ම ඔබ කියන හැටියට වෙනත් ආයතනයකට යොමු කරලා තියෙනවද?

පි : ඔව් ගරු ස්වාමිනි .

ප්‍ර : කොමිෂන් සභාව ඉදිරියේ තිබෙන සාක්ෂි අනුව හුඟක්ම යොමු කරලා තියෙන්නේ පොලිස්පතිවරයාට?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : සමහරක් අවස්ථාවලදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් යොමු කරලා තියෙනවා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඒ විදිහට ඔබගේ රාජ්‍ය බුද්ධි සේවයට ලැබෙන තොරතුරු පොලිස්පතිවරයාට යොමු කිරීමක් සිදු වන්නේ ඇයි?

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ගරු ස්වාමිනි මාගේ දැනීමේ හැටියට අත්අඩංගුවට ගැනීම සහ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා තමයි එම තොරතුරු ලබා දීමක් සිදු වන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබ අර කලින් කියපු විදිහට රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන් අත්අඩංගුවට ගැනීමක් සිදු නොකරන හින්දා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඔබගේ දැනුම අනුව ලෝකයේ යම් ආයතන තියෙනවද යම් සංවිධාන ඒ කියන්නේ බුද්ධි තොරතුරු රැස් කිරීමේ සංවිධාන ඔය විදිහට ඔබ කියන ආකාරයට බුද්ධි තොරතුරු ලබා ගෙන ඔවුන් විසින්ම ඒ තොරතුරු මත යම් අත්අඩංගුවට ගැනීම් සිදු කරන ඔබගේ දැනීමට අනුව?

පි : ගරු ස්වාමිනි මා දැනුවත් හැටියට ඇතැම් රටවල්වල තියෙනවා ඒ කියන්නේ බුද්ධි අංශයත් එක්කම පාලනය වන ඒ කියන්නේ අත්අඩංගුවට ගැනීමේ ඒ කියන්නේ ඒ වගේ වෙනම අංශයක්. එතකොට ඒ අංශය අර තොරතුර ගන්නෙත් එකම ආයතනයෙන්. අත්අඩංගුවට ගන්නෙත් එකම ආයතනයෙන්. එතකොට අංශ දෙකක් විදිහට තමයි ගොඩක් වෙලාවට Operate වෙන්නේ ගොඩක් රටවල්වල. දැන් ඇමරිකාවෙත් ඒ වගේ අංශ කිහිපයක් තිබෙනවා තොරතුරු අරගෙන අනිත් පැත්තෙන් අත්අඩංගුවට ගැනීම් සිදු කරන. ඒ වගේම ඉන්දියාවෙත් මං හිතන්නේ NIA වගේ කියන ආයතනයත් අත්අඩංගුවට ගන්න RAW වගේ ආයතනවල තොරතුරු මා දැනුවත් හැටියට ගරු ස්වාමිනි. ඒ වගේ මේ රටවල් කිහිපයක ඒ වගේ ආයතන තියෙනවා. සමහර රටවල්වල බුද්ධි ආයතනය ස්වාධීනව ක්‍රියාත්මක වෙනවා. තොරතුරු දෙන්නේ අර වගේ මේ ලංකාවේ වගේ වෙනත් ආයතනයකට තමයි අත්අඩංගුවට ගැනීමට කියලා ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබට හිතෙන හැටියට ඔය ක්‍රමවේද දෙකෙන් වඩාත් කාර්යක්ෂම මොකක්ද ක්‍රමවේදය?

පි : ගරු ස්වාමිනි මාගේ දැනීමේ හැටියට මං හිතන්නේ තොරතුරු දැන් මේ පහුගිය අත්දැකීම් අපි එකතු කළොත් ගරු ස්වාමිනි අපිට රාජ්‍ය බුද්ධි සේවාවේ තොරතුරු තිබුණා අත්අඩංගුවට ගන්න කල්වේලා යන කොට තමයි මේ ප්‍රහාරයට හේතු වන්නේ එක කාරණයක්. ඒ නිසා ඒ වගේ මං හිතන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ එක පැත්තකට තව ඒජන්සී එකක් සම්බන්ධ වුණා නම් මේ අත්අඩංගුවට ගැනීම් මීට වඩා කාර්යක්ෂමව සිදු වෙනවා කියන විශ්වාසයක් මං හිතනවා ගරු ස්වාමිනි.

ප්‍ර : දැන් ඔය ඔබගේ ආයතනය විසින් රැස් කර ගත්තු තොරතුරු පොලිස්පතිවරයාට යැවීමට අමතරව

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : යම් අවස්ථාවලදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් යවලා තියෙනවද?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඇයි එවැනි ක්‍රමවේදයක් අනුගමනය කෙරුවේ?

පි : මං නිශ්චිතව සඳහන් කරන්න හැකියාවක් නෑ ගරු ස්වාමිනි. මං හිතන ආකාරයට 2018/12/23,25 මාවනැල්ල සිදුවීම් හා සමගාමීව විමර්ශනය කෙරෙන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කේන්ද්‍ර කර ගෙන. එතනින් පස්සේ ගොඩක් තොරතුරු අධ්‍යක්ෂතුමා විසින් එම ආයතනයට ලබා දීමක් සිදු කරලා තියෙනවා. පොලිස්පතිතුමා වෙත යොමු කරන වාර්තාවලත් මම දැක්කා පිටපත එතුමන්ලා වෙත යොමු කිරීමක් ගරු ස්වාමිනි.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද ඔබගේ දැනීම අනුව රාජ්‍ය බුද්ධි සේවයේ ආගමික අන්තවාදී ක්‍රියාකාරකම් පිළිබඳව Desk Officer කෙනෙක් ඉස්සෙල්ලාම පත් කරන්නේ කොයි කාලේද කියලා?

පි : මාගේ දැනීම හැටියට ගරු ස්වාමිනි 2002 වර්ෂයේදී වගේ.

ප්‍ර : එතකොට ඒ 2002 වර්ෂයේදී Desk Officer කෙනෙක් පත් කරන්නේ යම් කිසි එක ආගමික සංවිධානයක අන්තවාදී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්ද නැත්නම් පොදුවේ ආගමික අන්තවාදය සම්බන්ධයෙන්ද?

පි : මාගේ දැනීමේ හැටියට ගරු ස්වාමිනි මම හිතන්නේ මුස්ලිම් අන්තවාදී කියන අංශය එක කොටස්‌ාශයක තවත් සුළු අංශයක් විදිහට ස්ථාපනය වෙන්නේ 2001.09.11 ඇමරිකාවේ 9/11 ප්‍රහාරයෙන් පස්සේ තමයි මේකට Face කරන්නේ මොකද අල්කයිඩා සංවිධානය ක්‍රියාවලිය ලෝකයේ හැම තැනම සිද්ධ වෙන හේතුව මුල් කරගෙන. ඒ අනුව පසුකාලීනව තමයි ගරු ස්වාමිනි මේ අංශය තවදුරටත් ඇති වෙන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබගේ දැනුම අනුව ඒ රාජ්‍ය බුද්ධි සේවයේ ඒ විදිහට 2002 දී Desk Officer කෙනෙක් පත් කරන කොට ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් සෙවීම සඳහා ඒ හා සමගාමීව ලංකාවේ තියෙන වෙනත් යම් ආයතනවලත් ඒ වගේ Desk Officers ලා නැත්නම් යම් කිසි නිලධාරියෙක් නැත්නම් අංශ ස්ථාපිත වීමක් සිදු වෙනවද?

පි : ඒ සම්බන්ධයෙන් නිශ්චිතව ගරු ස්වාමිනි සඳහන් කරන්න අදහසක් නෑ නමුත් මා මෑත කාලීනව නිරීක්ෂණයට ලක් වෙලා යුධ හමුදා බුද්ධි ඒ වගේ අනිත් බුද්ධි අංශවලත් මේ හා සබැඳි අංශ තියෙනවා කියන එක.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : ඒ අංශ කවද්ද ස්ථාපන කෙරුවේ කියලා ඔබට කියන්න බෑ?

පි : ඒ සම්බන්ධව නිශ්චිත දිනයක් කියන්න අමාරුයි ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට කොමිෂන් සභාවට කියන්න ඔබගේ දැනුම අනුව ඔබ කිව්වේ දැන් 2009 රාජ්‍ය බුද්ධි සේවයේ සේවයට ආවා කියලා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : ඒ වෙන කොට ආගමික අන්තවාදී කණ්ඩායම් සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාවේ තොරතුරු තිබ්බේ එක් ආගමික කොට්ඨාශයක් සම්බන්ධයෙන් පමණක්ද නැත්නම් කීපයක් සම්බන්ධයෙන් තොරතුරු තිබ්බද?

පි : ගරු ස්වාමිනි මාගේ දැනීමට මා 2009 වර්ෂයේදී රාජ්‍ය බුද්ධි සේවාවට සම්බන්ධ වෙන කොට මම සම්බන්ධ වෙන්නේ මුස්ලිම් අන්තවාදය කියන එක ආයේ ඒ Desk එකට. එතකොට එතන ඒ අංශය බැලුවේ මුස්ලිම් ක්‍රියාකාරකම් සබැඳිව පමණයි ගරු ස්වාමිනි. එහෙම තවත් කොට්ඨාශයක අනෙකුත් අන්තවාදී කොටස් සහ ත්‍රස්තවාදී කොටස් සම්බන්ධයෙන් වෙනත් කොට්ඨාශවල නිරීක්ෂණයන්ට ලක් කරලා තිබුණා ගරු ස්වාමිනි.

ප්‍ර : ඒ කොයි කොයි සංවිධාන පිළිබඳවද කියලා ඔබේ දැනුමක් තියෙනවද?

පි : නිශ්චිතව ගරු ස්වාමිනි Tamil වගේ දේවල් වෙන අංශයකින් තමයි කරන්නේ සහ අනෙකුත් සම්බන්ධයෙන් වෙන අංශවලින් තමයි ගරු ස්වාමිනි කෙරෙන්නේ.

ප්‍ර : යම් අවස්ථාවකදී මේ රාජ්‍ය බුද්ධි සේවයේ තියෙන මේ ආගමික අන්තවාදී කොට්ඨාශ සම්බන්ධයෙන් කරන විමර්ශනයන්ට අදාළ මේ එක් එක් අංශ එක අංශයක් යටතට ගේනවද?

පි : එක් අංශයක් යටතට 2009 න් පස්සේ ගරු ස්වාමිනි මාගේ නිරීක්ෂණයට ලක් වෙන්නේ නැහැ. නමුත් මගේ මතකේ හැටියට 2012 වර්ෂයේදී ද්‍රවිඩ වගේ දේවල් සහ ඉස්ලාම් වගේ දේවල් එක නියෝජ්‍ය අධ්‍යක්ෂතුමෙක් යටතට පත් වෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට රාජ්‍ය බුද්ධි සේවයේ නිරීක්ෂණයට ලක් වෙන්නේ ඒ ඔබ කියන විදිහට ඉස්ලාම් අන්තවාදය සහ දමිළ අන්තවාදී කණ්ඩායම් පමණක්ද?

පි : නෑ ගරු ස්වාමිනි අනෙකුත් අන්තවාදීන් සම්බන්ධවත් වෙනත් කොට්ඨාශවල නිරීක්ෂණයට ලක් වෙනවා.

ප්‍ර : කොයි කාලේද ඒ ?

පි : මට දින වකවානු ගරු ස්වාමිනි මතක නැහැ. නමුත් වෙනත් කොට්ඨාශයකින් තමයි ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණයට ලක් කරන්නේ ද්‍රවිඩත් නියමිත දිනය මතක නෑ ගරු ස්වාමිනි නමුත් මා සහ ඒ අංශ එකම කොට්ඨාශයක් යටතේ එකම නියෝජ්‍ය

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

අධ්‍යක්ෂතුමෙක් යටතේ 2011 වර්ෂයේ ඉඳන් වගේ 2019 අන්තිම වෙනකම් වගේ එකට මේවා වුණා. නමුත් ඊට පස්සේ ඒකත් තවත් කොට්ඨාශ දෙකක් විදිහට තමයි දැනට වර්තමානයේ ක්‍රියාත්මක වෙන්නේ ගරු ස්වාමිනි.

ප : දැනට කොට්ඨාශ දෙකක් විදිහට?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප : එතකොට ඔබට මේ කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද ඉස්ලාම් අන්තවාදයට අමතරව වෙනත් ආගමික අන්තවාදී කොටස් ඉන්නවද කියන එක?

පි : ගරු ස්වාමිනි මට නිශ්චිතව නම් සංවිධාන සඳහන් කරන්න මම ඒ තරම් දැනුමක් නෑ ගරු ස්වාමිනි මට වෙන අංශ සම්බන්ධයෙන්.

ප : දැන් ඔබගෙන් දීර්ඝ වශයෙන් ප්‍රශ්න කිරීමක් කෙරුණා ඔබ විසින් සකස් කරන ලද ඔබගේ ඉහළ නිලධාරීන්ට යවන ලද යම් කිසි වාර්තා සම්බන්ධයෙන්?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප : යම් අවස්ථාවක ඔබ විසින් වාර්තා සකස් කෙරුවද රාජ්‍ය බුද්ධි සේවය තුළ යන වාර්තාවක් නෙවෙයි නමුත් ඉන් පිටතට යන වාර්තාවක් ඔබ විසින් සකස් කිරීමක් සිදු වුණාද?

පි : ගරු ස්වාමිනි මා පෙර ප්‍රශ්නෙකත් සඳහන් කළා ගරු ස්වාමිනි අප විසින් මුලින් වාර්තාවක් සකස් කරලා අධ්‍යක්ෂතුමාට යොමු කරනවා. එතකොට අධ්‍යක්ෂතුමා එම වාර්තාවට සඳහන් කරනවා මේක මොකක් හරි ඒජන්සියක නමක් දීලා මේකට Address කරන්න කියලා. ඒ කියන්නේ අපි වාර්තාව Address කරලා අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ විද්‍යුත් ලිපිනයට යොමු කරනවා. ඒකේ අවසාන වාර්තාව සකස් වෙන්නේ එතන කාර්යාලයෙන් තමයි ගරු ස්වාමිනි.

ප : ඒ කියන්නේ ඔබ කියන විදිහට යම් කිසි වාර්තාවක් ඔබ සකස් කරන විට පළමු කෙටුම්පත සකස් කිරීමේදී

පි : ඔව් ගරු ස්වාමිනි.

ප : ඔබේ ඉහළ නිලධාරීන් ඔබට කියන්නේ නැද්ද ඒක රාජ්‍ය බුද්ධි සේවාව තුළ සංසරණය වන වාර්තාවක්ද නැත්නම් ඉන් පිටතට යවන්න හදන වාර්තාවක්ද කියලා?

පි : ගරු ස්වාමිනි දැන් මගේ විෂය පථයට අදාළව මම යම් විමර්ශන කරද්දී මං විමර්ශනයේදී යම් තොරතුරක් අනාවරණය වුණාම සහකාර අධ්‍යක්ෂතුමාත් එක්ක ඒ විමර්ශනයට අදාළ සම්බන්ධ වාර්තාව සකස් කරලා නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාගේ අත්සනින් අධ්‍යක්ෂතුමා වෙත යොමු කරනවා. එතුමන් තමයි ගරු ස්වාමිනි ඒ බලධාරියා වෙන්නේ එතුමන් තමයි කියන්නේ මේ ආයතනයට

Registered Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

යොමු කරන්න Address කරලා එවන්න කියලා අපිට කියන අවස්ථා තියෙනවා නැත්නම් අපි සකස් කරලා යොමු කරන වාර්තාවේ soft copy එක එතුමන්ගේ කාර්යාලයේ විද්‍යුත් ලිපිනයට ගෙන්ව ගෙන එතනින් සකස් කරලා යොමු කරන අවස්ථාත් තියෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබ කියන හැටියට හැම විටම ඔබ කෙටුම්පතක් සකස් කරන්නේ ඔබගේ අධ්‍යක්ෂවරයාට ඉදිරිපත් කිරීම සඳහා?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : දැන් එවැනි වාර්තාවක් ඔබ සකස් කරන කොට එහෙමනම් ඔබ ඒ වාර්තාව සකස් කරන්නේ යම් කිසි උපකල්පනවලට පැමිණිලාද නැත්නම් ඔබට තියෙන සියළුම තොරතුරු ඔබ ඒ වාර්තාවේ දානවද?

පි : ගරු ස්වාමිනි භූමියේ තියෙන තොරතුරු ඒකට ඇතුළත් කරනවා ගරු ස්වාමිනි. ඒක මා විසින්ම සකස් කරලා කෙටුම්පත මගේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා තමා වාර්තාව අත්සන් කරන බලධාරියා වෙන්නේ මගේ කොට්ඨාශයේ. එතකොට මා විසින් සකස් කරන මුල් වාර්තාව උදාහරණයක් මුලින් පෙන්නපු වාර්තාව ගරු ස්වාමිනි ඒක මගේ සහකාර අධ්‍යක්ෂතුමා වෙත වාර්තා කරනවා. එතුමන් ඒකට එකතු කිරීම් අඩුවැඩි කිරීම් කරලා එතුමන් ආයේ නිවැරදි කරන්න කියනවා. ඒ අනුව නිවැරදි කිරීම් කරලා දෙනවා. ඒ අනුව ඇතැම් අවස්ථාවල ඒ වාර්තාව නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාගේ අත්සනින් තමයි අධ්‍යක්ෂතුමාට යන්නේ. එතකොට එතුමනුත් තව මේකට අඩුවැඩි කිරීම් කරන්න උපදෙස් දෙනවා. ඒ අනුව නැවත නිවැරදි කිරීම් කරලා එතුමා ගාවට යනවා. ඒ අනුව තමයි එතුමා තමයි අත්සන් කරලා අධ්‍යක්ෂතුමා වෙත ඒ වාර්තාව යොමු කරන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර : යම් අවස්ථාවක ඔබට උපදෙසක් ලැබුණානම් ඔබගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්ගෙන් යම් වාර්තාවක් පිළියෙල කරන්න කියලා ඊට පස්සේ ඔහු කිව්වා නම් ඒත් සමඟම මෙම වාර්තාව යවන්නේ යම් කිසි වෙනත් ආයතනයකට. ඒ කියන්නේ බුද්ධි අංශයේ බුද්ධි කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරන අංශයක් නෙවෙයි වෙනත් අංශයක්.

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : එවැනි උපදෙසක් ඔබට ලැබුණානම් ඔබ එම වාර්තාව සකස් කරන ක්‍රමවේදයයි රාජ්‍ය බුද්ධි සේවය තුළම ලේඛනය සංසරණය වෙනවා නම් ඒක සකස් කරන ක්‍රමවේදයයි අතර වෙනසක් තියෙනවද නැද්ද?

පි : වෙනසක් තියෙනවා ගරු ස්වාමිනි.

Presidential Commission of Inquiry's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මොකක්ද වෙනස?

පි : ගරු ස්වාමිනි මාගේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා අධ්‍යක්ෂතුමා වෙත යවන වාර්තාවලට අප විසින් සිදු කරන වෙනත් විමර්ශන තව ඒවා සම්බන්ධව තොරතුරු දැන් උදාහරණයක් විදිහට දුරකථන විශ්ලේෂණ ඒ වගේ දේවලුත් ඇතුළත් කරනවා. වෙනත් පිටතට යවන වාර්තාවලට ඒ වගේ දේවල් කරන්නේ නැහැ. තියෙන බුද්ධි තොරතුර වාර්තා කරනවා පමණක් ගරු ස්වාමිනි සිදු වන්නේ.

ප්‍ර : ඇයි එවැනි වෙනස්කමක් කරන්නේ?

පි : ගරු ස්වාමිනි මුල් වාර්තා මගේ අත්දැකීම හැටියට ගරු ස්වාමිනි එහෙම සිදු වන්නේ ආයතනයේ අභ්‍යන්තරයේ ඒ ක්‍රියාවලිය සම්බන්ධයෙන් තවදුරටත් ඒ කියන්නේ තොරතුරු වර්ධනය කිරීමක් කර ගන්න අතරේ තමයි මුල් තොරතුර වෙනත් ආයතනයකට ලබා දෙන්නේ. එම අවස්ථාවල ඒ තොරතුර තවදුරටත් වර්ධනය වීමෙන් පසුවත් නැවතත් අර වාර්තාවට පසු වාර්තාවක් විදිහටත් යොමු කරන අවස්ථා තියෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර : දැන් රාජ්‍ය බුද්ධි සේවයට ඔබ කියන හැටියට බෑනේ පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමක් කරන්න ඒක කරන්න ඕනේ වෙනම අංශයක් විසින්නේ ඔබ කියන්නේ?

පි : ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර : දැන් වෙනම අංශයක් විසින් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න ඕනේ නම් ඒ ලිපිය ලැබෙන අංශය පූර්ණ දැනුවත් කිරීමක් කරන්න අවශ්‍යයි නේද ඒ පුද්ගලයින්ව අත්අඩංගුවට ගැනීමක් කරනවා නම් නැත්නම් ඒකට තිබෙන ඔබලා ඔවුන්ට දැනුම් දෙන කාරණා සම්බන්ධයෙන් කොයි විදිහටද ක්‍රියාත්මක වෙන්න ඕනේ කිරීම ඔවුන් තීරණය කිරීමේදී ඔවුන්ට ඒකට උපකාරීවන සියළු කරුණු එම ආයතනවලට දන්වන්න ඕනේ නේද?

පි : ගරු ස්වාමිනි එහෙම දැනුවත් කිරීමක් වෙනවා ගරු ස්වාමිනි. මම අර මුලින් සඳහන් කළෙත් ගරු ස්වාමිනි තොරතුරක් ආවාම ඒ තොරතුරේ අපි නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා විසින් අධ්‍යක්ෂතුමාට වාර්තා කරන ලිපියේ දුරකථන විශ්ලේෂණ, සමාජ මාධ්‍ය පරීක්ෂා කිරීම ඒ වගේ දේවල් කරුණු ඇතුළත් කරනවා. එතකොට අධ්‍යක්ෂතුමාගේ අත්සනින් පිටත ආයතනයට මුල් තොරතුරම යනවා නම් ඒ තොරතුරට ඒ වගේ ඇතුළත් කිරීමක් වෙන්නේ නැහැ. නමුත් මේ සම්බන්ධව විමර්ශන කරනවා වගේ කරුණු සඳහන් කිරීමක් කරනවා. ඊට පස්සේ අර අපි විසින් සිදු කරන ලද පසුකාලීන විමර්ශන නැත්නම් බුද්ධි මෙහෙයුම්වලදී යම් තොරතුරක් වැඩිදුර වර්ධනය වුණාම ඒ තොරතුරු නැවතත් අර

FAIR COMMENT BY JEZEEM

මුල් ලිපිය හා සම්බන්ධ කරලා ඒ අදාළ ආයතනයට යොමු කිරීමක් සිදු වෙනවා ගරු ස්වාමිනි.

****

දැන් වේලාව : ප.ව.09.30 යි.
මෙතැන් සිට ල/ලේ :- ඉන්ද්‍රානි මිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කළේ මුතුමාලි මෙය
දැන් වේලාව : ප.ව. 9.30 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : බණ්ඩාර මහත්මයා දැන් අප්‍රේල් මාසේ 20 වෙනිදා රාත්‍රී 7.00 ට හෙට ප්‍රහාරයක් එල්ල වෙනවා කියලා තොරතුරු ඔබට අහන්න ලැබුණහම ඔබට මොනවද ඒ වෙලාවේ හිතුණේ?

පි : ගරු ස්වාමීනි සහරාන් කියන පුද්ගලයා සබැඳිව තමයි මගේ සහකාර අධ්‍යක්ෂතුමා කියන්නේ සහරාන් හෙට ප්‍රහාරයක් එල්ල කරන්න ලැහැස්තියි කියලා. ඉතිං ගරු ස්වාමීනි ....,

ප්‍ර : නැහැ. මගේ ප්‍රශ්නයට කෙළින්ම උත්තරයක් දෙන්න. පණිවිඩය ලැබුණහම ඔබට මොනවද හිතුණේ?

පි : ප්‍රහාරය වෙන්න තියෙන සම්භාවිතාව පෙර දැන් අපි දැනුමක් තිබෙද්දී අත් අඩංගුවට පත් නොවීම තමයි මට දැනුණේ ස්වාමීනි. මට දැනුණේ ඒ වගේ දෙයක්. ඒ කියන්නේ අත් අඩංගුවට ගත්තා නම් හෙට දින වළක්වා ගැනීමට වඩා වළක්වා ගන්න කල් තියා තිබුණා කියන කාරණය ස්වාමීනි.

ප්‍ර : කවුද අත් අඩංගුවට නොගත්තේ එතකොට?

පි : ඒ සම්බන්ධව ගරු ස්වාමීනි, මුලින්ම සඳහන් කළේ අපේ ඒ කියන්නේ SIS රාජ්‍ය බුද්ධි සේවාව කියන ආයතනයට ඒ වගේ ආයතනයක් සම්බන්ධ වුණා නම් මේක මීට වඩා වෙනස් විදියකට සිදු වන්න තිබුණා ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔබ කියන විදියට ඔබට අත් අඩංගුවට ගැනීමට නීතියෙන් බලයක් නැහැ. අත් අඩංගුවට ගන්න බලය තිබිච්ච අය එය ක්‍රියාත්මක කළේ නැහැයි කියලද ඔබ කියන්නේ.

පි : ගරු ස්වාමීනි තොරතුරු හුවමාරු වීම සම්බන්ධයෙන් ඒ කියන්නේ අත් අඩංගුවට ගන්න පාර්ශවය රාජ්‍ය බුද්ධි සේවාවේ තොරතුරුවලට කොයි විදියට ඒක ගත්තාද කියන කාරණයට මට නිශ්චිත උත්තරයක් නැහැ ස්වාමීනි. නමුත් ගරු ස්වාමීනි ප්‍රහාරයෙන් පසුව වැටලීම් සියල්ල සිදු වන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ තොරතුරු මත. නමුත් ඒ තොරතුරු ඊට පෙර දාතම වාර්තා කර තිබියදීත් ඒ කාලයේ අත් අඩංගුවට ගැනීමක් සිදු වුණානම් 04.21 ප්‍රහාරයක් සිදු වන්නේ නැහැ ස්වාමීනි. මොකද ජමීල් කියන පුද්ගලයා නිරන්තරයෙන් ගෙදර Open හිටපු පුද්ගලයෙක්. ඒ ගැන සම්බන්ධයෙන් 2015 සිට වාර්තා කරනවා.

FAIR COMMENT BY JEZEEM

JMI කියන කණ්ඩායම සම්බන්ධයෙන් 2015 සිට නිරන්තරයෙන් තැනින් තැන වාර්තා කරනවා. ෂයිනි කියන පුද්ගලයා සම්බන්ධයෙන් ඔහු නිරන්තරයෙන් Open ගෙදර ඉන්නවා ඕන වෙලාවක ගන්න. ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් එකේ වර්තමානයේ අත් අඩංගුවට ගත්ත හැම පුද්ගලයෙක්ම පළා ගොස් සැඟව සිටියදී නෙමෙයි අත් අඩංගුවට ගන්නේ නිවසේ ඉද්දිම අරන් එන්නේ ගිහිල්ලා. ඒ වගේ ක්‍රමවේදය 21 ට කලින්ම ඒ තොරතුරුවලට ක්‍රියාත්මක වුණා නම් ගරු ස්වාමීනි 21 ප්‍රහාරය වළක්වා ගන්න හැකියාවක් තිබෙනවා ගරු ස්වාමීනි.

ප : හරි. ඔක්කොම බැරි වුණා කියමුකෝ. අප්‍රේල් 20 ඇ 7.00 ට හෙට ප්‍රහාරයක් එල්ල කරනවයි කියලා තොරතුරු ලැබුණහම ඒ වෙනකොට අල්ල ගන්න මේ අය හොයා ගන්න බැරිම වුණා නම් මොකද්ද කරන්න තිබුණේ ඔබ හිතන විදියට?

පි : ගරු ස්වාමීනි මේ තොරතුර ලද විගස ඇඳිරිනීති තත්ත්වයක් ඇති කළා නම් මේ ප්‍රහාරය වළක්වගන්න තිබුණා. මොකද විමර්ශනයෙන් පස්සේ වෙච්ච විමර්ශනවලදී අපට තොරතුරු වාර්තා වුණේ මේ ප්‍රහාරකයින් හෝටල් කාමර book කරලා පසුව එළියට ගිහිල්ලා නැවත රාත්‍රියේ ඇවිල්ලා තමයි පසු දින ප්‍රහාරයන් සිදු කර ගන්නේ. පාන්දර කාලයේ ආපු පුද්ගලයොත් ඉන්නවා. ඉතිං ගරු ස්වාමිනි ඇඳිරිනීති තත්ත්වයක් ඇති කළා නම් මේ තොරතුරට යම් වටිනාකමක් අරගෙන බලධාරීන් ඒ විදියට වුණා නම් මේ ප්‍රහාරයට වෙන්න තිබෙන සම්භාවිතාවය අවම කර ගන්න හැකියාවක් තිබුණා ගරු ස්වාමීනි. මොකද පසු දිනත් ඇඳිරිනීති තත්ත්වයක් ඇති කළා නම් ඉරිදා දිනයක් නිසා. ඒ වගේ දෙයක් කරගන්න හැකියාවක් තියෙනවා ගරු ස්වාමීනි.

ප : එතකොට පොලීසියට හැකියාවක් තිබුණාද, පොලීසිය හැටියට ඇඳිරිනීතිය පනවන්න. නැත්නම් ඔබ වෙන කාට හරි මේ වගකීම පැවරිය යුතුයි කියලා හිතනවද?

පි : මම එහෙම විශ්වාස කරන්නේ නැහැ ස්වාමීනි. මට ඉහළ නිලධාරීන් සම්බන්ධයෙන් මට ලොකු දැනුමක් නැහැ ස්වාමීනි.

ප : ඔබ හිතන විදියට බොහොම අවංකව කියන්න මාධ්‍යයත් නැති හින්දා, මේ විනාශය මෙහෙම වුණේ තොරතුරුත් තිබිලා කාගේ හරි වරදක් නිසානේ. කවුද වග කියන්න ඕන මේකට?

පි : ගරු ස්වාමීනි මට නිශ්චිතව උත්තරයක් දෙන්න බැහැ ගරු ස්වාමීනි. නමුත් මේකේ මම මුලින් සඳහන් කළා වාගේ අපි ප්‍රශ්නයට හේතුව ස්වාමීනි බුද්ධි අංශයේ තොරතුරු තියෙනවා. අත් අඩංගුවට ගන්නේ දෙවන පාර්ශවයක්. දෙවන පාර්ශවය බුද්ධි

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

අංශයේ තොරතුර ඒක කොච්චර දුරට ගන්නවද කියන කාරණයේ ප්‍රශ්නයක් තියෙනවා ගරු ස්වාමීනි. එ නිසා බුද්ධි අංශය හා සබැඳිව තවත් අත් අඩංගුවට ගැනීම අධිකරණ ක්‍රියාමාර්ග සිදුවන ආයතනයක් සම්බන්ධ කරලා තිබුණා නම් මීට වඩා ශක්තිමත් වැඩ පිළිවෙලක් සිද්ධ වෙනවා කියලා මගේ විශ්වාසය ගරු ස්වාමීනි.

ප්‍ර : විශ්‍රාම ලත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මහීල් ඩූල් මහත්මයා ඉස්ලාම් මේ අන්තවාදීන්ගේ පැත්තේ හිටියයි කියලා ඔබ දකිනවද?

පි : ගරු ස්වාමීනි ඉස්ලාම් අන්තවාදීන් කියලා අදහස් කරන්නේ එතුමන් රාජ්‍ය බුද්ධි සේවාවේ හිටපු නිලධාරී මහත්මයෙක්. එතුමා එතනින් විශ්‍රාම ගියාට පස්සේ ඉස්ලාම් භක්තිකයෙක් විදියට එතුමන්ගේ දෛනික චර්යාවන්වලට යොමු වෙනවා. ඒ වගේම එතුමා ශ්‍රී ලංකා ජමාත් ඉස්ලාම් කියන සංවිධානයට සම්බන්ධකම් තියෙනවා කියලා අපට තොරතුරුත් තිබුණා. ඒ වගේම ස්වාමීනි ශ්‍රී ලංකා ජමාත් ඉස්ලාම් කියන සංවිධානය මම මුලදිත් සඳහන් කළා 1954 ලංකාවේ ස්ථාපිත වෙන්නේ ඉස්ලාම් රාජ්‍යයක් කියන කාරණය කේන්ද්‍ර කරගෙන. ඒ වගේම ඒ සංවිධානය, ශිෂ්‍ය සංවිධානයේ පුද්ගලයෝ වර්තමානයේ විමර්ශනවලදී අනාවරණය වෙනවා සැළකිය යුතු පිරිසක් පිටරට ගිහිල්ලා Training වෙලා ආපු පුද්ගලයෝ. උදාහරණයක් හැටියට මාවනැල්ල ආගමික ප්‍රතිමා හානියෙන් පස්සෙන් අත් අඩංගුවට ගත්, වර්තමානයේ අත් අඩංගුවට ගත් සාදික් කියන පුද්ගලයා. එතකොට මේ ජමාත් ඉස්ලාම් සංවිධානයට සම්බන්ධකම් තියෙන කට්ටියගේ බාහිරට තමන්ගේ මතවාදය නොපෙනුණත්, අභ්‍යන්තරයේ ඉස්ලාම් රාජ්‍යය කියන සංකල්පය ඔවුන් ගාව තිබෙනවා. ගරු ස්වාමීනි මම ඒකෙන් සඳහන් කරන්න ඕන අර ඉහ්වානුල් මුස්ලිමීන් කියලා මතවාදයක් තියෙනවා. ඒකෙත් කියන්නේ මුස්ලිම් සහෝදරත්වය කියන එක. ඒ සහෝදරත්වය කියන එක තියෙන්නෙත් මේ ජමාත් ඉස්ලාම් සංවිධානය කේන්ද්‍ර කරගෙන.

ප්‍ර : ජමාතේ ඉස්ලාම් එකෙන් ගිහිල්ලා පුහුණු වෙලා ආපු අය ඔබගේ තොරතුරු අනුව තව කවුද ඉන්නේ?

පි : ගරු ස්වාමීනි මට නිශ්චිතව නම් මතක නැහැ. නමුත් සමහර පුද්ගලයෝ සම්බන්ධයෙන් අපි වාර්තාවන් යොමු කිරීමක් කරලා තියෙනවා. මොකද සාදික් අබ්දුල් හක් කියන පුද්ගලයා දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බාරයේ ඉන්නේ ගරු ස්වාමීනි. ඔහු විසින් සඳහන් කිරීමක් කරනවා ජමාත් ඉස්ලාම් සංවිධානයේ පුද්ගලයෝ එම සංවිධානයේ විදේශ රටවල තියෙන

FAIR COMMENT
BY JEZEEM

පුහුණු කඳවුරුවලට, විවිධ වැඩසටහන් නායකත්වය පුහුණුව වගේ ඒවට සහභාගී වුණහම එතනින් පස්සේ ගිහිල්ලා එක එක රටවල්වලට ගිහිල්ලා පුහුණුවීම් ලබලා දැනට පැමිණෙන බවට ඔහු ප්‍රකාශ කරනවා ඒ ආකාරයෙන් ගරු ස්වාමීනි. ඒ නිසා මට නිශ්චිතව නම් ගම් මේකයි කියලා මතක නැහැ ගරු ස්වාමීනි. සමහර නම් ගම් අපි වාර්තා කිරීමක් කරලා තියෙනවා ගරු ස්වාමීනි.

ප්‍ර : පුවත්පත්වල නියෝජිතයෝ කවුරුත් නැති හින්දා මම මේ ප්‍රශ්නය අහන්නේ. ඔබ අරාබි භාෂාව ඉගෙන ගන්න ගියානේ?

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : ඔබත් එක්ක අරාබි භාෂාව ඉගෙන ගන්න හිටපු පන්තියේ මේ ප්‍රහාරකයෝ හිටියා නේද?

පි : එක පුද්ගලයෙක් හිටියා ස්වාමීනි.

ප්‍ර : කියන්න බලන්න ඒ ගැන?

පි : ගරු ස්වාමීනි මා සහ මගේ අංශයේ නිලධාරීන් මේ විෂය දාමය හා සම්බන්ධ ක්‍රියාවලියේදී අරාබි භාෂාව කියන්නේ අපට වැදගත් කාරණයක්. ඉතිං අපි අරාබි භාෂාව ඉගෙන ගන්න මුල් අදියරක් විදියට කොළඹ විශ්ව විද්‍යාලයේ පුහුණුවකට සහභාගී වෙනවා මාස හතරක වගේ. එම පුහුණු පන්තියේ එක පුද්ගලයෙක් හිටියා කියන එක අපි දන්නේ මේ ප්‍රහාරයෙන් පස්සේ කරපු විමර්ශනවලදී අපිට කොළඹ විශ්ව විද්‍යාලයේ දේශකයෙක් විසින් තමයි දැනුම් දෙන්නේ අපේ Class එකේ හිටපු කෙනෙක් තමයි මේ Suicide එක කර ගන්නේ කියලා. ඉතිං අපිට ඊට කලින් ඔහු ගැන දැනීමක් තිබුණේ නැහැ. තිබුණා නම් අපි මේ 94 List එකට ඔහුගේ නම අනිවාර්යයෙන් ඇතුළත් කරනවා ගරු ස්වාමීනි. මුවාත් කියන පුද්ගලයා ගරු ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ රාජ්‍ය බුද්ධි අංශයේ මුස්ලිම් අන්තවාදීන් පිළිබඳ සොයා බලන කොට්ඨාශයේ වැඩ බලන ස්ථානාධිපති නේ?

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : එතකොට දැන් ස්ථානාධිපතිද? නැත්නම් තවමත් වැඩ බලනවද?

පි : නැහැ ගරු ස්වාමීනි. මම 2019.12.31 වෙනකම් හිටියේ වැඩ බලන අංශ බාර නිලධාරියා විදියට. පස්සේ ඒක වෙනම කොට්ඨාශයක් වෙලා අංශ දෙකකට කැඩෙනවා. ඒකේ එක අංශයක තමයි වර්තමානයේ මම ඉන්නේ. ඒකේ මේ ඉස්ලාම් රාජ්‍ය සංකල්පය හා සම්බන්ධ විමර්ශනය කියන කාරණය තමයි මට ලැබිලා තියෙන රාජකාරිය ගරු ස්වාමීනි.

ප්‍ර : ප්‍රහාරය එල්ල වෙනකොටත් ඔබ එම තනතුර දැරුවා එහෙනම්?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : නැහැ ගරු ස්වාමීනි. එතකොට වැඩ බලන අංශ බාර නිලධාරියා විදියට ..,

ප්‍ර : හරි. වැඩ බලන හරි තනතුර දැරුවනේ?

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : දැන් බලන්න මේ වෙච්ච විනාශය ගැන ඔබට වැටහීමක් තියෙනවනේ ඔබගේ අංශය තමයි මේ පිළිබඳව සොයා බැලුවේ?

පි : ඔව් ස්වාමීණි.

ප්‍ර : ඔබගේ පැත්තෙන් බැලුවහම ඔබ සම්පූර්ණයෙන්ම ඔබේ රාජකාරිය Duty එක ඉටු කළා කියලා ඔබ සෑහීමකට පත් වෙනවද?

පි : ගරු ස්වාමීනි මට 2014 විතර ඉඳන් පැවරිලා තිබ්බ රාජකාරී අනුව මම මගේ කාලය තුළ මම සම්පූර්ණ රාජකාරිය ඉෂ්ඨ කරන්න කැප වුණා. ඒ අතර තමයි මේ පුද්ගලයෝ 94 ක් මුලින් හඳුනා ගන්නේ. මොවුන් කිසි කෙනෙකුගේ තොරතුරු බාහිරට පේන්නේ නැහැ. නමුත් ඔවුන් සම්බන්ධයෙන් අපි දිවා රාත්‍රියේ වැඩ කරලා කරපු මෙහෙයුම්වලදී තමයි අපි හොයා ගන්නේ පුද්ගලයෝ. අපි රාජකාරිය, අපි තොරතුරු රැස් කරලා අපි වාර්තා කළාට ස්වාමීනි අත් අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් නොවිච්ච නිසා තමයි ඒ ගැන අපිට සෑහීමකට පත් වෙන්න බැරි වෙලා තියෙන්නේ ගරු ස්වාමීනි.

ප්‍ර : සහරානුත්, ජමීල්නුත් ඕනෑම මොහොතක ප්‍රහාරයකට සූදානම්ව සිටිය බවට නිශ්චිත තොරතුරු තිබුණා නේද?

පි : ගරු ස්වාමීනි ජමීල් කියන පුද්ගලයා තමයි අපිට මුලින්ම හඳුනා ගන්න ලැබෙන්නේ 2015 දී. 2016 අවසානය වෙනකොට තමයි අපිට සහරාන් කියන පුද්ගලයා හඳුනා ගන්න ලැබෙන්නේ. ඔවුන් දෙදෙනා අනිත් පුද්ගලයින්ට වඩා ප්‍රහාරයකට ඕනෑ වෙලාවක ඕනෑම කෙනෙකුට වුණත් ඔවුන්ව අභිප්‍රේරණය කරන්න පුළුවන් කියන කාරණය අපි හඳුනාගෙන තමයි ඒ සම්බන්ධයෙන් දැඩිව වාර්තා කරන්නේ ගරු ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ එහෙම තොරතුරු තිබුණා. ඒ වුණාට එම තොරතුරු ඔස්සේ ක්‍රියාත්මක වීමට නොහැකි වීම ඔබලා සතුව තිබූ නිතිමය බලතල වල ප්‍රශ්නයක්ද?

පි : ගරු ස්වාමීනි රාජ්‍ය බුද්ධි සේවාවේ තියෙන්නේ තොරතුරු රැස් කරන්න කියන කාරණය කේන්ද්‍ර කරගෙන. අත් අඩංගුවට ගැනීම කියන කාරණය එතන නැති නිසා තමයි මේ වගේ ප්‍රශ්නයට අපිට මුහුණ දෙන්න වෙන්නේ.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : ඒක තමයි මම ඒ ප්‍රශ්නය ඇහැව්වේ. එතනින් ඔබ්බට ගිහිල්ලා ඔබ කිව්වොත් ඔබට නීතිමය බලයක් තිබුණේ නැහැනේ?

පි : නැහැ ගරු ස්වාමීනි.

ප්‍ර : ඔබ බලාපොරොත්තු වෙනවද එවැනි නීතිමය බලයක් ඉදිරියේදී හෝ ඔබට ලබා දුන්නොත් හොඳයි කියන එක?

පි : ගරු ස්වාමීනි දැන් මේ ඉස්ලාම් ත්‍රස්තවාදය කියන කාරණය අපි පාස්කු ප්‍රහාරයෙන් ඉවරයි කියලා අර්ථකථනය කරන්න අමාරුයි ස්වාමීනි ඔහුගේ ලෝකයේ නිරීක්ෂණය කරහම. දැන් පහුගිය කාලයේ අපට වෙන්නේ තොරතුරු තියෙනවා. අත් අඩංගුවට ගැනීමක් වෙන්නේ නැති නිසා වෙනස්ම අත් දැකීමකට අපිට ලොකු හානියකට මුහුණ දෙන්න වෙනවා. නමුත් ගරු ස්වාමීනි රාජ්‍ය බුද්ධි සේවාවට අත් අඩංගුවට ගැනීමේ බලතල නැතිනම් වෙනත් ආයතනයක් රාජ්‍ය බුද්ධි සේවාව හා එකට සම්බන්ධ වෙලා තිබුණොත් මීට වඩා ගොඩක් ඵලදායී දෙයක් අපිට කරන්න පුළුවන් කියන කාරණය විශ්වාස කරනවා ස්වාමීනි.

ප්‍ර : අනාගතය ගැන ඔබ වචනයක් කියපු නිසා මම මේ ප්‍රශ්නය අහන්නම්. ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් තවමත් අපට තර්ජනයක්ද ඔබ හිතන විදියට?

පි : අනිවාර්යයෙන් තර්ජනයක් ගරු ස්වාමීනි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් තර්ජනයක් කියලා තොරතුරු ලැබිලා තියෙනවා නම් ඔබ මේ වනවිට ඒ පිළිබඳව මේ කොමිසමට දෙන අනතුරු ඇඟවීම මොකද්ද?

පි : ගරු ස්වාමීනි මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් කියන පුද්ගලයා සම්බන්ධයෙන් වාර්තා කිරීම් කිහිපයක් අපි කරනවා. ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඔහු හා සබැඳිව අනෙකුත් සැකකරුවන් එකම සිර මැදිරියේ දමා සිටීම ප්‍රශ්නගතයි කියන එක අපි වාර්තා කරනවා ගරු ස්වාමීනි. ඒ වගේම ඔහු සම්බන්ධව, ඔහු හා සබැඳි ඔහුගේ ප්‍රකාශයක් නිරීක්ෂණයට ලක් කරා නම් ඔහු විසින් සඳහන් කරනවා මම ත්‍රස්තවාදියෙක් කියන කාරණය. ඒ වගේම ඔහු ප්‍රහාරයක් එළියට ආවත් හෙට කරනවා කියන කාරණයේ තමයි ඔහු ඉන්නේ. ඒ නිසා ඔහු යම් මානසික වශයෙන් තැනකට තල්ලු කරලා නැතුව එළියට ආවොත් ඔහු යම් අනතුරක් අනාගතයේදී කරනවා කියන එක ඔහුගේ අදහස්වලින් හිතන්න පුළුවන් ගරු ස්වාමීනි.

ප්‍ර : එහෙම බලනකොට ඔබ හිතන්නේ මේ අන්තවාදීන්ගේ මේ ක්‍රියා කලාපයන්වල අවසානයක් දකින්න බැහැ කියලද ජේන තෙක් මානයකදී?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ගරු ස්වාමීනි මේක මානසික තත්ත්වයක්. විදේශයන්වල ගත්තහමත් අපට දවසින් දවස, අද හොඳට ඉන්නවා හෙට පිහියක් අරන් ගිහිල්ලා මනුස්සයෙකුට අණිනවා ඉස්ලාම් රාජ්‍යය කියන අර පෙළඹවීම මත. ඒ නිසා ගරු ස්වාමීනි මේක නිශ්චිත ක්‍රියාදාමයක් සම්බන්ධයෙන් ලෝකයේ කොහේවත් එහෙම තැනක් අහලා නැහැ. හැම රටේම අද හොඳට ඉන්න මිනිහා හෙට පිහියක් අරන් අණිනවා. උදාහරණයක් ස්වාමීනි මතක් කරන්න කැමතියි තුර්කියේ හිටපු රෂියන් තානාපතිතුමාට පොලිස් නිලධාරීයෙක් විසින් වෙඩි තැබීමක් සිදු කරනවා. ඒ නිලධාරියා ආරක්ෂාවට හිටපු නිලධාරියෙක්. තානාපතිතුමා ප්‍රකාශ කරන්නේ අපි හැමදාම සිරියාවට උදව් කරනවා කියලා. එතකොට ඒ අභිප්‍රේරණය තුළ නිලධාරියෙක් වෙඩි තබනවා. එතකොට ඔහුගේ මානසික තත්ත්වය තමයි ඒකේදී බලපාන්නේ. ඒ නිසා තර්ජනය කියන දේ මුළු ලෝකයටම තියෙන කාරණයක් ස්වාමීනි.

ප්‍ර : ඔබ හොඳ තැනකට ගෙනාවේ. මට කියන්න මගේ අවසාන ප්‍රශ්නය. අපි හිතමු මේ චෝදනාවන්ට ඉස්ලාම් අන්තවාදීන් අපි සීයක් හරි උසාවි ගෙනිහිල්ලා, නඩු පවරලා වැරදිකාරයෝ වුණා කියලා?

පි : ඔහු ගරු ස්වාමීනි.

ප්‍ර : එහෙම වුණත් ඒගොල්ලෝ බන්ධනාගාරගත කළත් ඒ අයගේ ඒ අන්තවාදී හැඟීම සහ ඒ සිතුවිලි ඔවුන්ගේ ඔළු තුළ තියෙනවා. එවැනි වාතාවරණයක් යටතේ මේ අය නැවතත් ඔවුන්ගේ අර Brain Wash කරලා තියෙන එක අනිත් පැත්ත හරවන්න ඒ කියන්නේ Reverse කරන්න ඔබ දැකලා තියෙන විදියට, ඔබ අහලා තියෙන විදියට, එහෙම නැත්නම් ඔබ කියවලා තියෙන විදියට කළ යුත්තේ මොකද්ද?

පි : ගරු ස්වාමීනි මා නිරීක්ෂණයට ලක් කරලා තියෙනවා රටවල් කිහිපයක තියෙන ක්‍රමවේදයන්. සමහර රටවල තියෙනවා මේ අපේ වගේ ඕනෑම තැනක තමන්ට හැකි අයුරින් ආගමික ස්ථාන ඉදි කරන්න නැත්නම් වෙනත් දේවල් කරන්න එහෙම හැකියාවක් නැහැ. ගොඩක් මුස්ලිම් රටවල් තියෙනවා. සිකුරාදා ආගමික දේව මෙහෙය කරනවා නම් මාතෘකාවක් දෙනවා මේක කරන්න ඕන, මේකෙන් පිට පණිවිඩ බැහැ, දේශකයන්ට ඕන ඕන විදියට දේශන කරන්න බැහැ. ඒකේ නීතිමය රාමුවක් තියෙනවා. ඉතිං ඒ වගේ තත්ත්වයන් තමයි ගරු ස්වාමීනි ඇති වන්න අවශ්‍ය. නැත්නම් ඒ කියන්නේ මේ පුද්ගලයෝ වුණත් දැන් අත් අඩංගුවට ගත්ත පුද්ගලයොත් ගොඩක් රටවල්වල අත් අඩංගුවට ගැනීම් සිදු

FAIR COMMENT BY JEZEEM

වෙනවා. ඔවුන් කාලයක් බන්ධනාගාර ගත කරලා තිබ්බත් ඔවුනට යම් මානසික වශයෙන් ආගමේ වෙනස් විදියකට ඔවුන්ව, වෙනස් ආකාරයකට ඔවුන්ව Brain Wash කිරීමක් කරනවා. ඔවුන් ඉන්නේ කුරාන් හදීස් කියන එකේ ඉස්ලාම් රාජ්‍යය කියන සංකල්පය තුළ. නමුත් ඔවුන් හිතන්නේ අර මම මුලින් සඳහන් කළා 570, 661 කාලයේ ජීවත් වෙන්න ඕන වර්තමානයේ කියලා. නමුත් අර දියුණු ලෝකයත් එක්ක ඒ අය ජීවත් වෙන්න කැමති නැහැ. ඉතිං ඒ තත්ත්වය ඔවුන්ගේ මානසිකත්වයට ලක් කරන්න ඕන කියන කාරණය තමයි නිදහස් කරන්න කලින් කරන්න ඕන ගරු ස්වාමීනි.

බොහොම ස්තුතියි.

****

ගරු බන්දුල අතපත්තු මැතිතුමා :

ප්‍ර : සෙනරත් බණ්ඩාර මහත්මයා දැන් ඔබ කිව්වා අප්‍රේල් 04 වෙනිදා වෙනකොටත් මේ සහරාන් පිළිබඳව කරුණු දැනගෙන තිබුණයි කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔහු Attack එකක් කරන්න හදනවයි කියලා. ඒ කියන්නේ ඊට කලිනුත් දැනගෙන හිටියනේ?

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : එතකොට මෙයා Most Wanted man වෙලා නීතියේ?

පි : වරෙන්තුවක් තිබුණා ගරු ස්වාමීනි.

ප්‍ර : වරෙන්තුවක් නෙමෙයි ඒක අත්‍යවශ්‍යම පුද්ගලයෙක්නේ අත් අඩංගුවට ගන්න?

පි : අත්‍යවශ්‍යම පුද්ගලයෙක්.

ප්‍ර : දැන් Islandwide Search එකක් වාගේ දෙයක් කළා නම් මොහු අත් අඩංගුවට තිබුණේ නැද්ද?

පි : ගරු ස්වාමීනි Islandwide කියන කාරණයටත් වඩා ඔහු නිරන්තරයෙන් පැමිණෙන ස්ථාන කිහිපයක් සම්බන්ධයෙන් අපි වාර්තා කිරීම් කරනවා ගරු ස්වාමීනි. එතකොට ඒ අවස්ථාවලදී ඔහුව අත් අඩංගුවට ගැනීමට ලක් කරන්නත් තිබුණා ගරු ස්වාමීනි.

ප්‍ර : ක්‍රියාත්මක නොවුණේ මොකද?

පි : ගරු ස්වාමීනි මම අර මුලදී සඳහන් කළා වගේ ...,

ප්‍ර : ඔබට බලතල නැහැ. නමුත් බලතල තියෙන පුද්ගලයින්ට බැරි වුණාද ඔබට යෝජනාවක්වත් ඔබට කරන්න ...,

FAIR COMMENT BY JEZEEM

පි : ගරු ස්වාමීනි මම හිතන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ තොරතුරු, අත් අඩංගුවට ගන්නේ තව පාර්ශවයක්. ඒ හා සබැඳි යම් ප්‍රශ්නගත ක්‍රියාවලියක් ඇති ගරු ස්වාමීනි. ඒ නිසා තමයි අත් අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාද වන්නේ. අර රාජ්‍ය බුද්ධි සේවාව මුල් අවදියේ මමත් නිරීක්ෂණයට ලක් කරලා තියෙනවා ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශය, රාජ්‍ය බුද්ධි සේවාව එකම අධ්‍යක්ෂවරයෙක් නැත්නම් නියෝජ්‍ය පොලිස්පතිතුමෙක් යටතේ ක්‍රියාත්මක වුණ අවස්ථාව. එතකොට ඒ වගේ අවස්ථාවලදී තොරතුර රාජ්‍ය බුද්ධි සේවාවේ අත් අඩංගුවට ගැනීම ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශය හෝ විශේෂ කාර්ය බලකායේ. ඒ වගේ අවස්ථාවලදී මම මුල් අවදියේදී මගේ රාජ්‍ය බුද්ධි සේවයේ මුල් අවදියේදී එහෙම නිරීක්ෂණයට ලක් වෙලා තියෙනවා. ඒ වගේ අවස්ථාවන් තිබුණා නම් ගරු ස්වාමීනි මේක වළක්ව ගන්න තිබුණා ගරු ස්වාමීනි.

හොඳයි. බොහොම ස්තුතියි.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : මිස්ට බණ්ඩාර ඔබගෙන් ප්‍රශ්න ටිකක් මට තියෙනවා අහන්න. මම බලන්නම් කෙටියෙන්. ඔබ 2017 වසරේදී නාම ලේඛන දෙකක් දුන්නනේ. එක නාම ලේඛනයක එකසිය ගාණක් සහ තවත් එකක අනූ ගාණක් ඉන්න?

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : ඒ නාම ලේඛන දෙකේ ඔබ සඳහන් කළා අප්‍රේල් 21 ප්‍රහාරයේ හිටපු ඒ ප්‍රහාරයට සම්බන්ධ වෙච්ච අය?

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබට වාර්තා වෙලා ඇති කියලා මා හිතනවා 2015 වසරේ ඉඳලා Directorate of Military Intelligence කියන ආයතනය ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධානයට අයිති පුද්ගලයින් පස් දෙනෙක් පිළිබඳව ඉතාමත්ම ආසන්නව කෙනෙක්ව Infiltrate කරලා ආවේක්ෂණය කළා කියලා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඔබලාට ඒ පිළිබඳව තොරතුරු වාර්තා වෙලා නැද්ද බුද්ධි ආයතනයක් හැටියට. DMI එකේ තොරතුරු ඔබලාට සම්ප්‍රේෂණය වෙන්නේ නැද්ද?

පි : ගරු ස්වාමීනි මාගේ දැනීමේ හැටියට අවස්ථා කිහිපයකදී වගේ තමයි යුධ හමුදා බුද්ධි අංශයේ තොරතුරු වාර්තාවීමක් මම දැකලා

FAIR COMMENT BY JEZEEM

තියෙන්නේ මගේ විෂය පථයට අදාළව. වෙනත් විෂයන් සම්බන්ධව මට නිශ්චිතව සඳහන් කරන්න බැහැ. එහෙම ඇතුළට යොමු කරලා හිටපු කෙනෙක් සම්බන්ධයෙන් මට නිශ්චිත මතකයක් නැහැ. රාජ්‍ය බුද්ධි සේවාව මෙන්ම යුධ හමුදා බුද්ධි අංශයත් ඒ වගේ අභ්‍යන්තරයට පුද්ගලයන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ඒ වගේ විමර්ශන කරනවා ගරු ස්වාමීනි. මට නිශ්චිතව සඳහන් කරන්න බැහැ ගරු ස්වාමීනි.

ප්‍ර : ඔබලාගේ බුද්ධි අංශය විසින් හඳුනා ගත්තා නේද මේ ජමීල් මොහොමඩ් කියන පුද්ගලයා?

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : මේ ජමීල් මොහොමඩ් කියන්නෙත් අර ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධානයට ආරම්භක සාමාජිකයෙක් නේද?

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : උමයිර් මොහොමඩ් කියන්නේ කවුද?

පි : උමයිර් මොහොමඩ් කියන්නෙත් ගරු ස්වාමීනි JMI එක පටන් ගද්දි ආරම්භක සාමාජිකයෙක්.

ප්‍ර : දැන් කොහේද උමයිර් මොහොමඩ් ඉන්නේ?

පි : මේ වෙනකොට ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශයේ අත් අඩංගුවේ ඉන්නේ ගරු ස්වාමීනි.

ප්‍ර : ඔබ මෙම කොමිසමේදී සඳහන් කළානේ අර චව්ට්‍රි කියලා එක්කෙනෙක්?

පි : අන්ජීම් චවුට්‍රි.

ප්‍ර : කවුද නම්?

පි : අන්ජීම් චවුට්‍රි.

ප්‍ර : එයාගේ ආභාෂයෙන් නේද මේ ජමීල් මොහොමඩ් කියන එක්කෙනා මේ ඉස්ලාම් ආගමික අන්තවාදයට ගමන් කිරීම ආරම්භ වුණේ?

පි : ගරු ස්වාමීනි නිශ්චිතව තොරතුරු නැහැ. නමුත් ඔහු ඕස්ට්‍රේලියාව සහ එක්සත් රාජධානියේ අධ්‍යාපනය ලබනවා. එක්සත් රාජධානියේ ඔහු අධ්‍යාපන කාලය තුළ අන්ජීම් චවුට්‍රි කියන පුද්ගලයාව ඔහු සම්බන්ධ වුණා කියන එක තමයි Open ඒ කියන්නේ විවෘත ආරංචි මාර්ග හරහා අපට වාර්තා වෙන්නේ. නිශ්චිතව ඒ සම්බන්ධයෙන් වෙනත් බුද්ධි අංශයක තහවුරුවීමක් වෙලා නැහැ ස්වාමීනි. ඒ හා සබැඳිව වර්තමානයේදී කාන්තාවක් අත් අඩංගුවට පත් කර ගන්නවා එංගලන්තයේ. ඒ කාන්තාවත් ජමීල් හා සබැඳි අන්ජීම් චවුට්‍රි හා සම්බන්ධකම් තියෙනවා කියලා විවෘත තොරතුරු ඇවිල්ලා තිබුණා ස්වාමීනි. නමුත් ඒ

FAIR COMMENT BY JEZEEM

සම්බන්ධයෙන් එම බුද්ධි අංශවලින් නිශ්චිත තහවුරු කර ගැනීමක් වෙලා නැහැ ස්වාමීනි.

ප : නමුත් ඔබලාට බුද්ධි ආයතනයක් ලෙස මතකයක් තිබෙනවාද ඕස්ට්‍රේලියාවේ අගමැතිවරයා සහ ඔය ජමීල් ඉගෙන ගත්ත විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයා ප්‍රකාශ කරලා තියෙනවා මේ ජමීල් කියන පුද්ගලයා ඉස්ලාම් ආගමික අන්තවාදයට අඩිතාලම දැමුවේ මෙම විදේශ රාජ්‍යයන් වලදී කියන එක ගැන තොරතුරු ඔබලාට ලැබුණේ නැද්ද?

පි : ගරු ස්වාමීනි මාගේ මතකයේ හැටියට 2014 දී මම මුලින්ම සඳහන් කළා මොහොමඩ් උනායිස් මොහොමඩ් අමීන් කියන පුද්ගලයෙක් ඕස්ට්‍රේලියාවේ ඉඳන් සිරියාවට ගමන් කළා කියලා. ඒ හා සම්බන්ධ මේ ජමීල් කියන පුද්ගලයා අපට 2015 දී නිරීක්ෂණයට ලක් වෙනවා. මොහු සම්බන්ධව අපි විදේශ බුද්ධි අංශ හරහා තොරතුරු හුවමාරු කර ගන්නකොට අපිට ආරංචි වෙනවා මොහු ඕස්ට්‍රේලියාවේ මෙල්බන් කියන නගරයේ තිබෙන අල්වුර්කාන් කියන ආයතනයෙන් තමයි මේ IS පැත්තට නැඹුරු වෙන්නේ කියලා. පසු කාලයේදී දැන ගන්න ලැබෙනවා මේ ඕස්ට්‍රේලියාවේ මෙල්බන්වල තිබ්බ අල්වුර්කාන් කියන ආයතනය ඒ රටෙන් තහනම් කරනවා කියලා. මොකද ඒ ආයතනය IS සංවිධානයට පුද්ගලයෝ සම්බන්ධ කරන එක ඒජන්සියක් වෙනවා කියලා. ඒ වගේ දෙයක් තමයි වාර්තා වෙන්නේ ගරු ස්වාමීනි.

ප : ඔබ සඳහන් කළා National Thawheeth Jamath මේ සහරාන්ගේ ආරම්භ කරපු සංවිධානයට Spiritual Leader න්‍යායාචාර්යවරයා ලෙස කටයුතු කළේ ඔය නවුෆර් මවුලවී කියන පුද්ගලයා කියලා නේද?

පි : ගරු ස්වාමීනි National Thawheeth Jamath එකට වඩා මේ සහරාන් IS පැත්තට නැඹුරු වෙනකොට ඒකේ න්‍යායාචාර්ය විදියට තමයි සහරාන් මවුලවී ක්‍රියාත්මක වෙන්නේ.

ප : එතකොට මේ ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධානයේ න්‍යායාචාර්යවරයා කවුද?

පි : ගරු ස්වාමීනි මම මුලිනුත් සඳහන් කළා ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් කියලා කියන්නේ ඒක විස්තර කරනවා නම් ඉස්ලාමයේ නබිවරු කිහිප දෙනෙක් ගැන කියනවා. එක නබිවරයෙක් තමයි ඊබ්‍රාහිම් නබිතුමා කියන්නේ. එතුමන්ගේ මාර්ගය කියන එක තමයි ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් කියන ඇරබික් වචනය. ගරු ස්වාමීනි ලංකාවේ ඒක පටන් ගන්නේ ජමීල් ඉමාඩ් උමයිර් සහ තව කොළඹ හිටපු

FAIR COMMENT BY JEZEEM

පුද්ගලයින් කිහිප දෙනෙක් කේන්ද්‍ර කරගෙන. මේක ඇති වෙන්න කලින් සිරියාවට ගමන් කරලා 2015.07.12 වෙනිදා මරණයට පත් වෙනවා නිලාම් කියලා පුද්ගලයෙක්. ඒ පුද්ගලයා තමයි මේ කණ්ඩායමේ නායකත්වයේ හිටියේ. ඒ පුද්ගලයා සිරියාවට යනවා. මෙයාලා සිරියාවට යාමේ අවශ්‍යතාවයෙන් පෙළෙනවා. එතකොට මේ කට්ටියට Spiritual Leader කෙනෙක් හිටියේ නැහැ. නමුත් එයාලා අර නිලාම් තමයි Follow කළේ ගරු ස්වාමීනි.

ප්‍ර : එතකොට මේ ජමෙයිතු මිල්ලතු ඊබ්‍රාහිම් සංවිධානයට සම්බන්ධයිද ඔය Jamathe Islamic Student Movement කියන එක?

පි : ගරු ස්වාමීනි ජමාතේ ඉස්ලාම් සංවිධානයේ Student Movement කියන එක ජාමියා කියලා තමයි හඳුන්වන්නේ ජමියා කියලා. ඒ සංවිධානය මේ ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් නෙමෙයි. නමුත් ඒ සංවිධානයේ සිදු කරගෙන යනවා වැඩසටහනක් තරුණයෝ ඒ කියන්නේ තරුණයන්ට පොඩි Workshops වාගයක් කරනවා. ඒ Workshops වලට සම්බන්ධ වුණේ මේ සාදික් අබ්දුල් කියන මාවනැල්ලේ පුද්ගලයා. ඒ පුද්ගලයා හරහා මේ ඇතැම් සාමාජිකයෝ JMI කියන සංවිධානයට නැඹුරු වෙනවා. සංවිධාන දෙක අතර එහෙම සම්බන්ධයක් නැහැ ගරු ස්වාමීනි. නමුත් අර සංවිධානයේ සාමාජිකයෝ මේ JMI එකට සම්බන්ධ වෙනවා.

ප්‍ර : දැන් ඔය Spiritual Leadersලා ඉන්නවනේ ඇත්තට දැන් ඔය අබුබකර් අල්බග්ඩාඩිටත් හිටියනේ Spiritual Leader කෙනෙක්. අල්සර්කාවිටත් හිටියනේ. දැන් ඔබ සඳහන් කරන විදියට මේ සහරාන්ටත් Spiritual Leader කෙනෙක් හිටියා. දැන් සාමාන්‍යයෙන් ඔය IS මතවාදය අනුව ඉස්ලාමික රාජ්‍යය පිහිටුවනකොට ඒකට කාඩිෆ්වරයෙකුත් ඉන්නවනේ?

පි : කාඩිෆ්වරයෙක් ස්වාමීනි.

ප්‍ර : ඔව්. ඒ දේශපාලන නායකයා. මේ සංවිධානවලට එහෙම සහයෝගයක් දක්වන කවුරු හරි හිටියා කියලා ඔබලාගේ බුද්ධි තොරතුරුවලට අනාවරණය වෙලා තියෙනවද? දැන් Spiritual Leader කෙනෙක් ඉන්නවා. නමුත් මේ කැලිෆට් එක ඉතිං හදා ගත්තා නම් හරි එහෙම වුණා නම් ඒ කැලිෆට් එකට ඉන්න ඕනනේ කාඩිෆ්වරයෙක්. දැන් ඒ සිහිනය දකිමින් මේකට කොහේ හෝ සිට උදවු කරන, සහයෝගය දක්වන, මූල්‍යමය වශයෙන්

FAIR COMMENT BY JEZEEM

හෝ වෙනත් ආකාරවලින් දේශපාලන කණ්ඩායමක් හෝ එක්කෙනෙක් හෝ හිටියද මේ සංවිධානය පිටිපස්සේ?

පි : ගරු ස්වාමීනි මේ සංවිධානයේ අරමුණත් එක්ක දේශපාලන සංවිධාන මම හිතන්නේ නැහැ සම්බන්ධ වෙලා, මෙයාලා හිතන්නේ එක නායකයයි ඉන්න ඕන. එයාට කියනවා කලීෆා නැත්නම් අමීර් කියලා. එතකොට ඒ පුද්ගලයා වටා තමයි, එයාට තමයි තීරණ ගන්න බලතල තියෙන්නේ. එයාට පල්ලෙහා ඉන්න කට්ටිය තමයි සූරා කවුන්සිල් එක. එතකොට ඒ පුද්ගලයො ඉන්නෙත් ඉස්ලාම් සම්බන්ධ පිරිසක් විතරයි. එතකොට ඒ පුද්ගලයන්ටත් දේශපාලන කඳවුරු එතනට එකතු කරන්නේ නැහැ. අර පුද්ගලයාට සූරා කවුන්සිල් එකෙන් දෙනවා තීරණය. අරයා අනුමත කරනවා. ක්‍රියාත්මක කරන්න වෙන කණ්ඩායමක් ඉන්නවා. ඒ විදියට තමයි මේක Operate වෙන්නේ. එතකොට මේකේ වෙන එහෙම දැකලා නැහැ ගරු ස්වාමීනි. නමුත් අර නවුෆර් කියන පුද්ගලයා තමයි මේකේ ව්‍යාජ නායකයා. නායකයා ....,

ප්‍ර : පාලකයා ?

පි : ඔව්. පාලකයා විදියට ඉන්නවා. ඔහු එළියේ පේන්න ඉන්නේ නැහැ. සහරාන් තමයි මේකේ නායකත්වය විදියට එළියට පෙන්වන්නේ. නමුත් නවුෆර්ගේ තමයි මතවාදය ස්වාමීනි.

ප්‍ර : දැන් DMI එක 2015 ඉඳලා ඔය ජමාතු මිල්ලතු ඊබ්‍රාහිම් එකේ කණ්ඩායමක් ආවේක්ෂණය කළානේ මම ඔබට සඳහන් කළේ Infiltrate කරලා. එහෙම ආවේක්ෂණය කරන එක බුද්ධි තොරතුරුවල වාර්තා වෙනවා 2019 අප්‍රේල් 19 වන දිනයේදීත් මේ කණ්ඩායම අවේක්ෂණය කළා කියලා?

පි : හොඳයි ගරු ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබලා ජමීල්ව ආවේක්ෂණය කිරීම ආරම්භ කළේත් 2015 නේද?

පි : 2015 ඉඳන් ගරු ස්වාමීනි.

ප්‍ර : ඔබලා ජමීල්ව ආවේක්ෂණය කළේ එවැනි ක්‍රමයක් තුළින්ද නැත්නම් ඔහුගේ සංවෘත තොරතුරු අන්තර්ජාලය හරහා කරන දේවල්වලින්ද ආවේක්ෂණය කළේ එහෙම නැත්නම් ඔබලා DMI එක කරන ආකාරයටද ආවේක්ෂණය කළේ ජමීල්ව?

පි : ගරු ස්වාමීනි ජමීල් කියන පුද්ගලයා සහ හඳුනා ගන්න පුද්ගලයෝ සම්බන්ධයෙන් අපේ දිසා බුද්ධි සේවා කාර්යාංශය හරහා තමයි අපි ගොඩක් වෙලාවට එහෙම කරන්නේ. ඊට අමතරව අපි ආවේක්ෂණ අංශයේ සම්බන්ධකම් ඒ කියන්නේ ඒ කට්ටියට

FAIR COMMENT BY JEZEEM

දැනුම් දීමක් කරනවා මෙහෙම මෙහෙම පුද්ගලයෝ ඉන්නවා කියලා. ඒ හරහා තමයි කරන්නේ. අර අපේ අංශයේ නිලධාරීන් එක්කෙනා පිටිපස්සේ ඒ වගේ ආවේක්ෂණයක් කිරීමට ලක් කරන්නේ නැහැ ගරු ස්වාමීනි.

ප : දැන් ඔබලාගේ ආයතනයටත් මේ ලංකාවේ තියෙන සුවිශේෂ බුද්ධි ආයතනය තමයි DMI එක. මේ ආයතන දෙකටම ඇයි නොහැකි වුණේ මේ විදේශීය බුද්ධි තොරතුරු සේවාවක් විසින් හරියටම කියන තොරතුරු ආකාරයට තොරතුරු සොයා ගැනීමට නොහැකි වුණේ ඇයි කියලද ඔබට කියන්නට පුළුවන්. ඇයි එහෙම වුණේ. අපේ ශ්‍රී ලංකාවේ බුද්ධි ආයතන දෙකක්ම අවේක්ෂණය කරලා තියෙනවනේ. දැන් ඔබලා හොඳටම ජමීල් පිළිබඳව දන්නවා. ජමීලුත් JMI. එතකොට මේ ජමීල් ගැන DMI එකත් දන්නවා ජමීල් සහ තවත් හතර දෙනෙක් පිළිබඳව. එතකොට විදේශ බුද්ධි ආයතනයක් හරියටම තොරතුරු කියනවනේ. දැන් අප්‍රේල් 21 පිළිබඳව තොරතුරු අප්‍රේල් 04 කියනවා, 20 කියනවා, 21 උදෙත් කියනවා. එතකොට ඇයි අපේ රටේ තියෙන මේ ප්‍රබල බුද්ධි ආයතන දෙකෙන් එකකට හෝ ඒ විදියට තොරතුරු දැන ගැනීමට නොහැකි වුණේ?

පි : ගරු ස්වාමීනි සහරාන් කියන පුද්ගලයා සහ ඒ කණ්ඩායමේ සාමාජිකයෝ උත්සාහ කළේ සිරියාවට යන්න. පසු කාලයේදී ඒ කට්ටිය උත්සාහ කළා කාශ්මීරයට යන්න. අන්න එහෙම සිදු කරන ක්‍රියාදාමයක තමයි ඔවුන්ගේ අර Telegram ගිණුම් ඊට පස්සේ ඒක Threemaවලට පරිවර්තනය වෙනවා. ඒ හරහා තමයි ඒ සම්බන්ධීකරණයක් තුළ තමයි ඔහු යම් පුද්ගලයෙක් කේන්ද්‍ර කරගෙන ඔහු තමයි මොවුන්ගේ ක්‍රියාදාමය සම්බන්ධව දැනුමක් තියෙන්නේ. මොකද අද වෙනකොට වර්තමානයේ අත් අඩංගුවේ සිටින පුද්ගලයෝ කිහිප දෙනෙක්ගෙන් තොරතුරු එනවා. අර අබුහින්ද් කියලා ගරු කොමිෂන් සභාවෙන් අසා සිටපු පරිදි අබුහින්ද් කියන පුද්ගලයා හිටියා කියලා. එතකොට ඒ වගේ පුද්ගලයෙක් Through තමයි ගොඩක් වෙලාවට මේ වගේ තොරතුරු හුවමාරු කර ගැනීමක් සිදු වන්න ඕන ගරු ස්වාමීනි.

ප : මම අහපු ප්‍රශ්නයට නම් ඔබගෙන් පිළිතුරක් ලැබුණේ නැහැ?

පි : අප ආයතනවලිනුත් අර වගේ පුද්ගලයෙක් ඒ කියන්නේ ඇතුළට යොමු කිරීමකින් හරි ඒ වගේ දෙයක් කළා නම් මේ වගේ තොරතුරක් ගන්න තිබුණා කියලා විශ්වාස කරනවා ගරු ස්වාමීනි.

ප : නැහැ. නමුත් DMI එක එහෙම ඇතුළට එක්කෙනෙක් යොදවලා තමයි මේ තොරතුරු හෙව්වේ. ඇයි ඒ ආයතනය අසාර්ථක වුණේ

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කියලා බුද්ධි ආයතනයක් ලෙස ඔබට කියන්නට පුළුවන්ද? මොකද්ද සිද්ධ වෙච්ච අපේ ක්‍රමවේදයේ හරි තාක්ෂණික ක්‍රමවල හරි මොකද්ද සිද්ධ වෙච්ච අතපසුවීම?

පි : ගරු ස්වාමීනි මා විශ්වාස කරන්නේ JMI කියන සංවිධානයේ පුද්ගලයන් අතරින් ජමීල් කියන පුද්ගලයා විතරයි Suicide Attackවලට සම්බන්ධ වෙන්නේ. ජමීල් සහ දෙමටගොඩ අයියයි මල්ලියි කියන සහෝදරයෝ දෙන්නා. එතකොට ඒ පුද්ගලයෝ තිදෙනාම සහරාන් වටා එකතු වෙලා හිටිය බොහොම තදබල සාමාජිකයෝ. එතකොට නවුෆර් කියන පුද්ගලයාගේ ඉලක්කය වුණේ 2019 ඇසළ පෙරහැර කියන Target එක. එතකොට ....,

ප්‍ර : නැහැ දැන් ඔබ කියන ඔය ඔක්කොම දේවල් දැන් මේ කොමිසම හමුවේදී දීර්ඝ වශයෙන් ඉදිරිපත් වුණ කරුණුනේ?

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : මම කෙළින්ම අහන්නේ ඇයි බැරි වුණේ අපේ බුද්ධි අංශයන්වලට ඔබලාගේ ආයතනයට සහ DMI එකට ඉන්දීය බුද්ධි සේවාව විසින් කියපු ආකාරයට මේ ත්‍රස්තවාදීන්, මේ අපේ භූමියේම ක්‍රියාත්මක වන ත්‍රස්තවාදීන් අපේ භූමියේම තියෙන සුවිශේෂ බුද්ධි ආයතන දෙකෙන් එකකටවත් හොයා ගන්නට බැරි වුණේ ඇයි කියන ප්‍රශ්නය අහන්නේ මම. ඒකයි ඔබ වෙන විස්තර මම හිතන්නේ කියනවා. ඒ ප්‍රශ්නයට හරියටම උත්තරයක් මට ලැබුණේ නැහැ. සමහරවිට ඔබට බැරුව ඇති ඒකට උත්තරයක් දෙන්න?

පි : නිශ්චිතව උත්තරයක් සඳහන් කරන්න අමාරුයි.

ප්‍ර : ඔබට කියන්නට පුළුවන්ද මේ අබු හයිතම් කියන්නේ කවුද කියලා? අබු හයිතම් කියලා නමින් හඳුන්වන?

පි : අබු හයිතම් කියලා කියන්නේ ගරු ස්වාමීනි මහනුවර උඩතලවින්න ප්‍රදේශයේ පුද්ගලයෙක්. හිලා ෆාරුක් කියලා තමයි එයාගේ නම. ඒ පුද්ගලයත් අපි නිරීක්ෂණයට ලක් කරලා ඔහු සම්බන්ධයෙන් මම අර 94 ක ලැයිස්තුවක වාර්තාවේ සඳහන් කරනවා. ඔහු Weapon මිලදී ගැනීමට ත්‍රිකුණාමලයේ ගියපු කාරණයක්. ඒ සම්බන්ධයෙන් ගරු ස්වාමීනි වර්තමානයේ අත් අඩංගුවට ගැනීමෙන් පස්සේ අනාවරණය වෙනවා මේ දෙමටගොඩ සහෝදරයන්ගේ මැදිහත්වීම තුළ තමයි Weapon මිලදී ගැනීමට ඔහු ඒ ප්‍රදේශයේ ගමන් කරන්නේ කියන කාරණය.

ප්‍ර : ඔහු ඔබලාගේ ආයතනයෙන් නිරීක්ෂණයට ලක් කරන්නේ කවුරු හරහාද?

Provisional Copy
FAIR COMMENT BY JEZEEM

පි : ගරු ස්වාමීනි ඔහු මුලින්ම උඩතලවින්න ප්‍රදේශයේ පදිංචි වෙලා ඉන්නවා.

ප්‍ර : නැහැ නැහැ නැහැ. ඔබලාගේ ආයතනය නිරීක්ෂණය කරනවානේ අබුහයිතම්ව?

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : කවුද ඒ පුද්ගලයා මෙතන මේගොල්ලන් නැති නිසා මම හිතන්නේ කියන්නට පුළුවන් වෙයි?

පි : අපි ඔක්කොම නිරීක්ෂණයට ලක් කරන්නේ අපේ දිසා බුද්ධි සේවා කාර්යාංශයේ ඒකක හරහා. හඳුනා ගත්ත පුද්ගලයෝ සියළු දෙනා සම්බන්ධ තොරතුරු එම නිලධාරීන්ට දිලා තමයි අපි ඔවුන් සම්බන්ධයෙන් නිරීක්ෂණයට වාර්තා ගෙන්න ගන්නේ ස්වාමීනි.

ප්‍ර : ඔබ මෙම කොමිසමට ප්‍රකාශ කළා නේද Sonic Sonic කියලා එක්කෙනෙක් ගැන?

පි : නැහැ. ස්වාමීනි. ඒ අපි වෙන ෆස්රුල් රහුමාන් කියන විමර්ශනයේ තමයි ඒ අපි ....,

ප්‍ර : Sonic Sonic?

පි : අනුවර්ත නාමය Sonic Sonic කියන්නේ ස්වාමීනි.

ප්‍ර : ඒ Sonic Sonic වෙනත් නාමයකින් මෙයා ගැන කරනවද ඒ Sonic Sonic කරපු කාර්යයම?

පි : ගරු ස්වාමීනි මා සඳහන් කරන්න අවශ්‍යයි. අප විසින් සිදු කරන ඒ කියන්නේ විමර්ශන කරන එක නිලධාරියෙක් ඔහු විවිධ නම් භාවිතා කරනවා Sonic Sonic කියන්නේ එක Nickname එකක් ස්වාමීනි. ඒ වගේ නිලධාරීන් තවත් නම් ගොඩක් භාවිතා කරනවා. ෆස්රුල් රහුමාන්ට සම්බන්ධ වෙන Nick Name එක තමයි ඔහුගේ Sonic Sonic කියන්නේ. ඒ වගේම ඒ නමින් තවත් කිහිප දෙනෙක් අතර ඔහු සම්බන්ධ වෙනවා ගරු ස්වාමීනි.

ප්‍ර : අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසුව ඉස්ලාම් ආගමික අන්තවාදී අළුත් සංවිධාන මොනවා හරි ඇති වෙනවා හරි ඇති වෙමින් තිබෙනවා කියන එක පිළිබඳව ඔබලාගේ බුද්ධි අංශවලට තොරතුරු වාර්තා වෙනවද?

පි : ගරු ස්වාමීනි මම මුලදී සඳහන් කළා මුල දවසෙම 1921 Ottoman Caliphate එක ඉවර වුණහම ඉස්ලාම් රාජ්‍යය අවසන් වෙනවා අටාටොක් කියන ජනාධිපතිතුමා තුර්කියේ පත්වීමත් එක්ක. එතකොට 2021 ට අවුරුදු සීයක් සපිරෙනවා. හිස්බුල් තාහිර් කියන සංවිධානයක් ලෝකය පුරාම ක්‍රියාත්මක වෙනවා. ඔවුන්ගේ Goal එක තියෙන්නේ අවුරුදු සීයකින් ඉස්ලාම්

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

රාජ්‍යයක් නැවත ඇති කරන්න ඕන කියලා. එතකොට ලංකාවෙත් තැනින් තැන අපට එහෙම හිස්බුල් තාහිර් කියන නම යටතේ සංවිධාන ගැන අපිට තොරතුරු තියෙනවා. නමුත් ඒක තහවුරු වෙලා නැහැ ස්වාමීනි. නමුත් විදේශීය රටවල අද වෙනකොට හිස්බුල් තාහිර් කියන එක සම්බන්ධයෙන් ගොඩක් රටවල්වල සනාථ වීමක් වෙලා තියෙනවා.

ප : ඒ කියන්නේ භයානක තත්ත්වයක ඉන්නවා නේද ලංකාව. හිස්බුල් තාහිර් සහ අර Save the Pearl කියලත් එකක් තියෙනවා නේද?

පි : රාජ්‍ය නොවන සංවිධානයක් විදියට තමයි ක්‍රියාත්මක වෙන්නේ.

ප : ඒක අන්තවාදී ත්‍රස්තවාදී සංවිධානයක් නෙමෙයිද ඉස්ලාම් ආගමික?

පි : ගරු ස්වාමීනි මම මුලින් සඳහන් කළා ජමාත් ඉස්ලාම් සංවිධානයට සබැඳි තවත් රාජ්‍ය නොවන සංවිධාන. ඒ වගේ ඒවාගේත් එයාලා මුහුණුවරක් තියාගෙන පෙන්නුවට නමුත් එයාලගේ Goal එක තියෙන්නේ ඉස්ලාම් රාජ්‍යය කියන Concept එක ගරු ස්වාමීනි.

ප : දැන් ඔබ ප්‍රකාශ කළා කුරසාන් කියන උප රාජ්‍යයක් ඇති කරන්න අදහසක් තියෙන බව සහ ඔය විලායත් අස් සෙයිලානි කියන එක පිළිබඳව. දැන් ඔය 2019.04.21 ප්‍රහාරයේ සැබෑ අරමුණ මොකද්ද? ඒකේ දිගුකාලීන අරමුණක් තියෙනවද? එහෙම නැත්නම් කෙටි කාලීන අරමුණක් ඔස්සේද මේ අය මේ 21 ප්‍රහාරය එල්ල කළේ?

පි : ගරු ස්වාමීනි 2004.06.29 බැග්ඩෑඩ් විසින් ඉස්ලාම් රාජ්‍යයක් ප්‍රකාශයට පත් කරලා කුරසාන් කියලා එක විලයාත් එකක් නැත්නම් උප රාජ්‍යයක් නම් කරනවා. ඒකට ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඇෆ්ගනිස්ථානය, පකිස්ථානය රටවල් ඇතුළත් වෙනවා. නමුත් සහරාන් ඒ කුරසාන් කියන එක යටතේ නෙමෙයි ක්‍රියාත්මක වන්නේ. ඔහු අස් සෙයිලානි කියන නමින්. එතකොට ඔහු ඒකට අර මම මුලින් සඳහන් කළා ෆස්රූල් රහුමාන් කියන පුද්ගලයා හා සබැඳිව. ඒ පුද්ගලයා වීඩියෝ එක යොමු කරන්න කලින් IS එක මේ ලංකාවේ ප්‍රහාරයේ වගකීම බාරගෙන ප්‍රකාශයක් නිකුත් නොකරන්නෙත් IS සංවිධානයට හා සබැඳිව සහරාන්ගේ ඒ වගේ බයියත් කිරීමක් නැත්නම් ප්‍රතිඥා දීමක් නොතිබුණු නිසා ගරු ස්වාමීනි. ප්‍රහාරයෙන් අනතුරුව ලංකාවේ ප්‍රහාරය IS සංවිධානය බාර ගැනීමත්, ඒ හා සම්බන්ධව IS සංවිධානයට ආපු Credit එක එහෙම නැත්නම් එයාලා ලොකු ප්‍රහාරයක් කළා කියන එයාලගේ තත්ත්වයත් එක්ක එයාලා අස්

සෙයිලානි නමින් කෑල්ලක් ලංකාවේ හදන්න සහ මේ ෆසූල් රහුමාන් ඒ වෙනුවට දෙවෙනි නායකත්වයක් පත් කරන්න උත්සාහ කරනවා ගරු ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ ළඟ තියෙන දැනුම අනුව ඔබට ප්‍රකාශ කරන්න පුළුවන්ද මෙම කොමිසමට දැන් ඉන්දියාව සහ කාශ්මීරයයි, පකිස්ථානයයි ආසන්නයේ විලායත් අස් හින්ද් කියලා එකක් තියෙනවානේ Declare කරලා. දැන් ඔය Sonic Sonic සමඟ ඔබලාගේ ආයතනයත් සමඟ සන්නිවේදනය අනුව මෙම කොමිසමටත් පෙනී ගියා එම සන්නිවේදනය කුමක්ද කියා. අවසානයේදී මේ විලායත් අස් සෙයිලානි ගැන තමයි කථා කරන්නේ. ඔබගේ තියෙන බුද්ධි දැනුම සහ ඔබ IS සංවිධානය පිළිබඳව ඔබ ලබා ඇති න්‍යායාත්මක දැනුම සහ වෙනත් දැනුම ආශ්‍රිතව කියන්න ශ්‍රී ලංකාවේ මේ විලායත් අස් සෙයිලානි කියන එක ප්‍රකාශයට පත් කිරීම IS සංවිධානය විසින් කවදා හෝ කරයිද එහෙම නැත්නම් එය නුදුරු අනාගතයේදීම කරයිද? ඒ කරනවා නම් ඒකට අවශ්‍ය පසුබිම ශ්‍රී ලංකාව තුළ දැනට නිර්මාණය වෙලා තියෙනවද හෝ නිර්මාණය වෙමින් තිබෙනවාද?

පි : ගරු ස්වාමීනි මම මුලින් සඳහන් කළා අර මොහොමඩ් ඊබ්‍රාහිම් නවුෆර් කියන පුද්ගලයා සම්බන්ධයෙන්. ඔහු සම්බන්ධ මේ ප්‍රහාරයට වගකීමට අදාළ වීඩියෝ පටය යොමු කිරීමෙන් අනතුරුව ඒ IS සංවිධානය විසින් විමසීමක් කරනවා. ඒ කියන්නේ ඔහු ගැන දැනුමක් ඒ සංවිධානය සතුව තිබෙන නිසා. ඔහු වටා තමයි අස් සෙයිලානි කියන සංවිධානය මෙහේ ක්‍රියාත්මක කරන්න කැමති වෙන්නේ. ඒ හා සම්බන්ධව නායකත්වයකට පුද්ගලයෙකු නම් කරන්න කියනවා. නමුත් එවැනි නායකත්වයක් ....,

ප්‍ර : ඒ විස්තර අපි දන්නවා. මම ඔබගෙන් අහන්නේ දැන් ඔය විලායත් අස් සෙයිලානි එකක් කර ගන්නනේ මේ ප්‍රහාරය එල්ල කරලා තියෙනවා වගෙයි කියන එක මේ Sonic Sonic සංවාදයෙන් පෙනී යනවා.

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : මම ඔබගෙන් අහන්නේ ජාතික බුද්ධි ආයතනයේ දිර්ඝ කාලීන අත්දැකීම් සහ ඔබට විශාල අත්දැකීම් දැනුමක් තියෙනවා මේ IS සංවිධානය ගැනත්. එතකොට මේ ලංකාවේ මේ විලායත් අස් සෙයිලානි කියන එක ප්‍රකාශයට පත් කර ගැනීමට පසුබිමක් දැනට නිර්මාණය වෙලා තියෙනවද? එහෙම නැත්නම් ඒ සඳහා ශ්‍රී

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ලංකාවේ සිටින ඔය ඉස්ලාම් ආගමික අන්තවාදීන් වේගයෙන් ගමන් කරමින් සිටිනවාද?

පි : ප්‍රහාරයෙන් පස්සේ අත් අඩංගුවට පත්වීමත් එක්ක ඒ සම්බන්ධයෙන් වේගයෙන් ක්‍රියාත්මක වීමක් නිරීක්ෂණය වෙන්නේ නැහැ ගරු ස්වාමීනි.

ප්‍ර : එහෙනම් අපිට ටිකක් සතුටින් ඉන්න පුළුවන් අස් සෙයිලානි එක දැන්මම දාන එකක් නැහැ කියලා නේද ලංකාවේ?

පි : අස් සෙයිලානි කියන එක නොදැම්මත් ගරු ස්වාමීනි අර Individual ඕනෑම රටක අද ලෝකයේ වෙන ප්‍රහාර පිහි Attack ඒ වගේ ...,

ප්‍ර : එවැනි දේවල් කරන්න පුළුවන්?

පි : පුළුවන් ස්වාමීනි.

ප්‍ර : මගේ අවසාන ප්‍රශ්නය. දැන් ඔබ සඳහන් කළා මද්‍රසා පාසල්, සිකුරාදා දේව මෙහෙයන් කියලා. දැන් අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසුව විශේෂයෙන් ඔබගේ අංශය විසින් ආරම්භ කරලා තියෙනවද ඔය අරාබි පාසල් සහ මද්‍රසා පාසල් වගේම පුම්මා මස්ජිත් පල්ලිවල විශේෂයෙන්ම ඔය තවුහිද් නිකායට අයිති සිකුරාදා දේව මෙහෙයෙන් පසුව හෝ පෙර පවත්වන දේශනාව. වාර්තා වී තිබෙන කරුණු අනුව එම දේශනාව තමයි ඔය ආගමික අන්තවාදය පිළිබඳව දැඩි විදියට කරනු ලබන දේශනාව?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඒවා පිළිබඳව ඔබලා බුද්ධි තොරතුරු එක්රැස් කිරීම දැනටම ආරම්භ කරලා තියෙනවද ඔබගේ අංශයෙන්?

පි : වර්තමානයේ ගරු ස්වාමීනි ඒ වගේ වැඩසටහනක් ක්‍රියාත්මක කරගෙන යනවා. අරාබි විද්‍යාල, ඒ වාගේම මද්‍රසා කියලා තමයි ඇරබික් භාෂාවෙන් කියන්නේ. ඒ වගේම පුම්මා පල්ලි සහ අනෙකුත් තක්කියා පල්ලිවල දේශනයන් සම්බන්ධයෙන්, ඒ දේශන කරන පුද්ගලයන්ගේ කුමන අරමුණක්ද ඔවුන් දේශනයේදී දේශනයෙන් පස්සේ සිදු කරන ක්‍රියාවලියේදී කරන්නේ කියන කාරණය නිරීක්ෂණයට ලක් කරනවා ගරු ස්වාමීනි.

ප්‍ර : තව පුංචි ප්‍රශ්නයක් තියෙනවා. ඔබ අර විශ්‍රාමික රාජ්‍ය සේවකයන් ගැන කථා කළානේ දරුවෝ එහෙම. ඔබලාගේ බුද්ධි තොරතුරුවලට වාර්තා වෙලා තියෙනවද, මම අහන්නේ නැහැ විශ්‍රාමික රාජ්‍ය සේවකයෝ, මමත් විශ්‍රාමයිනේ බයයි දැන් ඕගොල්ලෝ මගේ ළමයිනුත් ත්‍රස්තවාදීන් කියලා හෙව්වොත් එහෙම. මම අහන්නට කැමතියි ඔබගෙන් රාජ්‍ය සේවයේ දැනටමත් ඉන්න කිසියම් අය මේ කොමිසම හමුවේත් කරුණු

FAIR COMMENT BY JEZEEM

ඉදිරිපත් වුණා. ඔය තුර්කියේ, ඊජිප්තුවේ ඉඳලා නෙරපන ලද තුර්කියේ දැනට ජීවත්වන යූසුෆ් අල් කර්දාවිත් සමඟ සබඳතා පවත්වන ශ්‍රී ලාංකික රාජ්‍ය සේවකයෙකු ඉන්නවා කියලා. කටාර්වල දැනට සිටින නමුත් He is originally from Egypt නේ. ඒ පුද්ගලයා සමඟ ඉතාම සමීපව සබඳතා පවත්වපු සුවිශේෂ රාජ්‍ය ආයතනයක අමාත්‍යාංශයක පුද්ගලයෙකු සිටින බව. ඔබලාගේ බුද්ධි තොරතුරුවලට එවැනි දේවල් වාර්තා වෙනවද?

පි : නිශ්චිතව නමක් එහෙම සඳහන් කිරීමක් කරන්න මට මතකයට නැහැ ගරු ස්වාමීනි.

ප්‍ර : මෙම කොමිසම හමුවේ සාක්ෂි ඉදිරිපත් වුණා මම හිතන්නේ ඔබලා අර පත්තරේ යන ඒවා බලනවා නම් මම හිතන්නේ මේ නම ඔබටත් මතකයේ තියෙන්න ඕන. ඉනාමුල්ලා කියලා පුද්ගලයෙක්. විදේශ කටයුතු අමාත්‍යාංශයේ තමයි මොහු සේවය කරන්නේ. එහෙම වාර්තා වෙලා නැද්ද?

පි : මට ඒ නම නිශ්චිතව මතක නැහැ. ඉනාමුල්ලා කියලා නමක් මතකයේ තියෙනවා. ඔහු සබැඳිව විස්තර මම හිතන්නේ අපේ ආයතනය සතුව තිබෙනවා.

ප්‍ර : එහෙමනම් ඔබට තව මම අවසාන ප්‍රශ්නය කියලා දැන් කිහිපයක් ඇහුවා. මේක අවසානම ප්‍රශ්නය. ශ්‍රී ලංකා ජමාතේ උලමාවරුන්ගේ සංවිධානය කියලා එකක් තියෙනවනේ?

පි : තියෙනවා.

ප්‍ර : ඒ සංවිධානය ඔබලාගේ බුද්ධි තොරතුරුවලට අනුව තිබෙනවාද ඔවුන් ආගමික අන්තවාදයට බර වූ සංවිධානයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා කියලා කිසියම් කාල වකවානුවකදී? ඒ කියන්නේ ආරම්භයේදී සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ගේ බලයට නතුව තිබිච්ච සාමකාමී සංවිධානයක් වර්තමානය වනවිට ඉස්ලාම් ආගමික අන්තවාදී නිකායන් ඔය තබ්ලික් ජමාත්, තවුහිද් ජමාත් කියන ඒවා සංවිධානවල බහුතරයකගෙන් සැදුම්පත් සංවිධානයක් බවට පරිවර්තනය වෙලා තියෙනවා. ඔබලාට එම සංවිධානය පිළිබඳව මොනවා හරි තිබෙනවද? ඔවුනුත් මේ අන්තවාදය ප්‍රවර්ධනය සඳහා යම් යම් කටයුතු නොදැනීම එහෙම කරන ආයතනයක් කියලා කාටවත් නොදැනෙන්න?

පි : ගරු ස්වාමීනි. සඳහන් කළ පරිදිම මෙම සංවිධානය ආරම්භ වෙන්නේ අර තබ්ලික් සහ තරික්කා කියන සංවිධාන සාමාජිකයන් කේන්ද්‍ර කරගෙන. පසුකාලීනව මේ සංවිධානයේ මුල් පුටුවලට පත් වෙනවා වහාබි සහ සලෆි මතවාද දරන පුද්ගලයෝ. ඒ හරහා අර ඔවුන් සමස්ත ලංකා ජමෙයිතුල් උලමා කියන සංවිධාන නාමය

FAIR COMMENT BY JEZEEM

යටතේ ඔවුන්ගේ ක්‍රියාවලින් සිදු කරනවා කියලා නිරීක්ෂණයට ලක් වෙලා තියෙනවා ස්වාමීනි. ඒ සම්බන්ධයෙන් දැනටත් අපි නිරීක්ෂණයන් සිදු කරමින් යනවා ස්වාමීනි.

හරි බොහොම ස්තුතියි.

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

****

ගරු සභාපතිතුමා :

කොමිෂන් සභාවේ කටයුතු ස්වල්ප වේලාවකට නතර කරනවා.

ප්‍ර : සාක්ෂිකරු ඔබගෙන් ප්‍රශ්නයක් අහන්න ඕන. මේ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි මෙහෙයවලා තියෙනවා අර මගේ උගත් කොමසාරිස්වරිය ඇහුවා වගේ අර යූසුෆ් අල් කර්දාවි සමඟ සම්බන්ධතාවයන් පවත්වන යම් ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන්?

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : එහිදී තවත් නමක් සඳහන් වෙනවා එන්.එම්. අමීන් කියලා. ඔහු සම්බන්ධයෙන් ඔබගේ ආයතනයේ යම්කිසි තොරතුරු තිබෙනවාද?

පි : තිබුණා ගරු ස්වාමීනි. ඔහු මුස්ලිම් මාධ්‍ය සංසඳය කියලා එකක් පවත්වාගෙන යනවා. ඒ වගේම ඔහු ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිල් කියලා එකක් පවත්වාගෙන යනවා. ඔහුගේ පුතෙක් තමයි BBC නාලිකාවට වාර්තා ඉදිරිපත් කරන පුද්ගලයා. ඒ වගේම ඔහු සම්බන්ධයෙන් නිරීක්ෂණයට ලක් කරගෙන යන පුද්ගලයෙක්. ඔහු විදේශ රටවල්වල ඉන්න විවිධ පුද්ගලයින් සමඟ සම්බන්ධකම් තියෙන පුද්ගලයෙක් බවට අපට තොරතුරු ලැබිලා තියෙනවා.

ප්‍ර : ඒ ඔබගේ ආයතනයේ නිරීක්ෂණයට ලක් වන්නේ යම්කිසි විශේෂ හේතුවක් මතද?

පි : ගරු ස්වාමීනි ඔහුගේ පුත්‍රයා විශේෂයෙන් සමහර ඇත්තටම ලංකාවේ සිදු වුණ සිදුවීම් සම්බන්ධයෙන් විදේශ රටවලට වාර්තා කිරීම් සිදු වෙනවා. ඒ වගේම මේ පුද්ගලයාත් ලංකාවේ ඇතැම් සිදුවීම්වලදී මැදිහත්වීමක් කරනවා, ආගමික වශයෙන් මැදිහත්වීමක්. ඒ අවස්ථාවලදී තමයි ඔහු නිරීක්ෂණයට ලක් වන්නේ.

ප්‍ර : ඒ කියන්නේ ඔහු නිරීක්ෂණයට ලක් වන්නේ මේ ආගමික මැදිහත්වීම සිදු කරන හේතුවෙන්ද?

පි : ඔව් ගරු ස්වාමීනි. ඔහුගේ වෙන අදහසක් අපට තවම ඒ කියන්නේ ඔහු ඉස්ලාම් රාජ්‍ය මතවාදියෙක්ද කියලා අපට එහෙම

Parliament Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

නිරීක්ෂණයට ලක් වෙලා නැහැ ස්වාමීනි. නමුත් ඔහුගේ මැදිහත්වීම හරහා අපි නිරීක්ෂණයට ලක් කරනවා එහෙම විශේෂ කාරණයක් නැහැ ගරු ස්වාමීනි.

ප්‍ර : ඔහු යම්කිසි ඔබ විසින් සඳහන් කරන්නට යෙදුණ සංවිධානවල සාමාජිකත්වය දරනවද?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : මොකද්ද සංවිධාන?

පි : Media forum කියන එකෙත් ඔහු ඉන්නවා ගරු ස්වාමීනි. ඒ වගේම ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිල් කියන එකෙත් ඔහු ඉන්නවා ගරු ස්වාමීනි.

ප්‍ර : නැහැ මම අදහස් කළේ ඔබ මීට කලින් කිව්වනේ ලංකාවේ සිටින මුස්ලිම්වරුන් විවිධ කොට්ඨාශවලට බෙදෙනවා කියලා?

පි : ගරු ස්වාමීනි ඔහුගේ නිකාය විදියට අපට මුලින් වාර්තා වෙන්නේ සමස්ත ලංකා තවුහිද් ජමාත් කියන සංවිධානය කියලා. ඒක සියයට සීයක් තහවුරු කරන්න බැහැ. මොකද එක එක අවස්ථාවලදී ඔවුන්ට වෙනස්වීමකට ලක් වෙනවා. ඒ නිසා මට ඒ සංවිධානයේද කියන එක ස්ථිර වශයෙන්ම කියන්න අමාරුයි.

ස්තුතියි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතීඥවරයාට ලබා දෙයි.

****

ජනාධිපති නීතීඥ ශමිල් පෙරේරා මහතා :

ප්‍ර : බණ්ඩාර මහත්මයා තවුහිද් ජමාත් කියන මුස්ලිම් අන්තවාදී කොට්ඨාශයේ කාත්තන්කුඩියෙහි තියෙනවද මෙහි ශාඛාවක් Islamic Centre කියලා තමා දන්න තරමට?

පි : ගරු ස්වාමීනි තවුහිද් ජමාත් සංවිධානය කියපුවාම අර තවුහිද් කියන්නේ ඇරබික් වලින් එක් දෙවියෙක් කියන කාරණය. තව සංවිධාන ගොඩක් තියෙනවා. Islamic Centre කියලා සංවිධානයක් තියෙනවා. ඒක මේ තවුහිද් සංවිධාන කිහිපයකට සම්බන්ධයි. මම දන්න විදියට සමස්ත ලංකා තවුහිද් ජමාත් සංවිධානයට සම්බන්ධකම් තමයි ඒ සංවිධානයේ තියෙන්නේ.

ප්‍ර : ඒක අන්තවාදී සංවිධානයක්ද? ඔබ දන්න තරමින්?

පි : Islamic Centre කියන එකත් මේ තවුහිද් ප්‍රතිපත්ති තමයි ගොඩක් වෙලාවට ප්‍රචාරය කරන්නේ. ඒ කියන්නේ ඒ කට්ටිය අද තර්ජනයක්ද කියන කාරණාවට වඩා එයාලගේ විශ්වාසය

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තියෙන්නේ අර කුරාන් හදීස් පමණයි කියන එක. එතනදී ඔවුන් අන්‍යාගමිකයෝ කියන කාරණය ඔවුන් ඉස්මතු කරනවා අන්‍යාගමිකයන්ට තැන සම්බන්ධව සහ අපි නිරීක්ෂණයට ලක් කරනවා ගරු ස්වාමිනි. නමුත් අපිට එහෙම නිශ්චිත වශයෙන් සඳහන් කරන්න තොරතුරක් නැහැ.

ප්‍ර : මේ මැතකදී මේ Islamic Centre, කාත්තන්කුඩියේ තියෙන Islamic Centre කියන ස්ථානය න්‍යායන් කියලා වෙනස් නමකින් හඳුන්වනවද?

පි : මට නිශ්චිත තොරතුරක් නැහැ ඒ සම්බන්ධයෙන්.

ප්‍ර : දැන් තමා දීර්ඝ වශයෙන් වාර්තා ගණනාවක් ඉදිරිපත් කෙරුවා අද මේ ගරු කොමිෂන් සභාවට?

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : දැන් තමාට කියන්න පුළුවන්ද මෙම වාර්තා අනුව තමා දන්න තරමින් මෙම වාර්තාවල තමා නිර්දේශක් කරලා තියෙනවා. හැම වාර්තාවකම වගේ නිර්දේශක් කරලා තිබෙනවා. ඒක හරිද?

පි : ඔව් ගරු ස්වාමීනි.

ප්‍ර : දැන් තමා දන්න තරමින් මේ නිර්දේශ ලබා දුන් නිලධාරී මහත්වරුන් ඒ පිළිබඳව යම් යම් පියවර ගත්තාද කියලා තමා දන්නවද?

පි : ගරු ස්වාමීනි එසේ අප වෙත නැවත වාර්තාවීමක් සිදු වෙලා නැහැ ගරු ස්වාමීනි.

ප්‍ර : එතකොට තමා දන්නවද බුද්ධි සමාලෝචන රැස්වීම්වලදී මෙම වාර්තාවන් ඉදිරිපත් කර තිබෙනවද කියලා තමාගේ දැනුම අනුව තමා දන්නවද?

පි : ගරු ස්වාමීනි මම මුලදිත් සඳහන් කළා ඒ කාරණය. මොකද මගේ අධ්‍යක්ෂතුමා විවිධ සාකච්ඡාවලට සහභාගී වෙන බව සඳහන් කරලා මගේ සහකාර අධ්‍යක්ෂතුමා විසින්. බහු මාධ්‍යය ඉදිරිපත් කිරීම ඒ වගේම වෙනත් වාර්තා ඉල්ලා ගන්නවා. ඒ අවස්ථාවලදී මේ කාරණය සම්බන්ධයෙන් සහ විදේශ ප්‍රහාර සම්බන්ධයෙන් අපි වාර්තා කිරීමක් කරනවා ගරු ස්වාමීනි. ඒ අනුව සාකච්ඡාවට භාජනය වෙන්න ඇති කියන විශ්වාසය මගේ ළඟ තියෙනවා.

ප්‍ර : එතකොට තමාට කියන්න පුළුවන්ද තමාගේ දැනුම අනුව මෙම වාර්තා ජනාධිපතිතුමාට දීලා තිබෙනවාද කියලා?

පි : ගරු ස්වාමීනි ආරක්ෂක කවුන්සිලය කියන සාකච්ඡාව මම හිතන්නේ ජනාධිපතිතුමා මූලික කරගෙන පවත්වන සාකච්ඡාවක්. මට ඒ සම්බන්ධව නිශ්චිත සඳහනක් නැහැ. නමුත් ජනාධිපතිතුමා හා සබැඳි වාර්තාවල පිටපත් අපිට නැවත ලැබීමක් වෙන්නේ නැහැ

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගරු ස්වාමීනි. ඒ නිසා මට ඒකට නිශ්චිතව දැනුවත්ද නැද්ද කියන කාරණයට උත්තරයක් දෙන්න හරි අමාරුයි ස්වාමීනි.

ප්‍ර : දැන් තමා දන්න තරමින් වර්තමානයේ මෙවැනි NTJ අන්තවාදී ක්‍රියාකාරකම් තවමත් තිබෙනවාද?

පි : ගරු ස්වාමීනි ජාතික තවුහිද් ජමාත් සංවිධානය වර්තමානයේ දැනට අඩපණවීමක් වෙලා තියෙනවා. නමුත් ඒකේ සාමාජිකයෝ තවමත් ඒ වහාබි මතවාදය එහෙම නැත්නම් කුරාන් හදීස් පමණක් අනුගමනය කරන්න ඕන කියන මතවාදයේ ඉන්නවා. ඔවුන්ට නිසි නායකත්වයක් ඒ කියන්නේ අර සහරාන් වගේ නායකත්වයක් නැහැ. ඔවුන් නැවතත් ඒ වගේ නායකත්වයක් කරා ඒකරාශි කර ගන්න හැකියාවක් තියෙනවා ගරු ස්වාමීනි.

ප්‍ර : දැන් මගේ මේ ප්‍රශ්නය මම අහන්නේ මේ ගරු කොමිෂන් සභාවේ අහපු ප්‍රශ්නයකට තමා කිව්වා මේ පාස්කු ප්‍රහාරය වළක්වන්න පුළුවන්කමක් තිබුණා කියලා අප්‍රේල් මාසේ 20 වෙනිදා ඇඳිරිනීතිය දැම්මා නම් කියලා තමා කිව්වා නේද?

පි : ඔව් ගරු ස්වාමිනි. මගේ අදහසක් විදියට කිව්වේ.

ප්‍ර : දැන් ඇඳිරිනීතිය පොලිස්පතිතුමාට දාන්න බැහැනේ. එහෙම නේද?

පි : මට නිශ්චිතව සඳහන් කරන්න දන්නේ නැහැ ගරු ස්වාමීනි ඒ සම්බන්ධයෙන්.

ප්‍ර : දැන් ඇත්තටම ඇඳිරිනීතිය දාන්න පුළුවන් නීතිය අනුව ජනාධිපතිතුමාට පමණයි. ඒ අනුව මේ ඇඳිරිනිතිය මේ අන්දමට තමා කියපු විදියට මේ ඇඳිරිනිතිය දැම්මා නම් මේ පාස්කු ප්‍රහාරය වළක්වන්න තිබුණා. ඒ අනුව ජනාධිපතිතුමා තමාගේ උත්තරය අනුව මේ පාස්කු ප්‍රහාරයට වගකිව යුතු නේද?

පි : ගරු ස්වාමීනි නිශ්චිතව කියන්න බැහැ. මම මගේ අදහසක් විදියට කිව්වේ. මොකද වළක්වා ගන්න ඇඳිරිනිතිය කියන කාරණය මතු කළේ අර විමර්ශනවලින් පස්සේ අනාවරණයට ලක් වෙනවා පුද්ගලයෝ හෝටල්වලට ඇතුළත් වෙලා පස්සේ හෝටල්වලින් පිටතට ගිහිල්ලා රාත්‍රී කාලයේ සහ පාන්දර කාලයේ හෝටලයට නැවත එන්නේ කියන කාරණය සහ 21 වෙනිදා උදේ පුපුරවා ගත්ත දේවස්ථානවල පුපුරවා ගත්ත පුද්ගලයෝ දවල් කාලයේ තමයි දේවස්ථානයට ඇතුල් වෙන්නේ. අන්න ඒ කියන කාරණය නිරීක්ෂණයට ලක් කරලා තමයි මම ඒ වගේ මගේ අදහසක් කිව්වේ. නමුත් මට නිශ්චිතව ඒකට උත්තරයක් දෙන්න බැහැ ගරු ස්වාමීනි.

****

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි.

කොමිෂන් සභාව ඉදිරියට පැමිණි සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්යය සම්බන්ධයෙන් දැක් වූ සහයෝගයට කොමිෂන් සභාවේ ස්තුතිය සාක්ෂිකරු හට පළ කරනවා.

සාක්ෂිකරු මුදා හරිනවා.

දැන් වේලාව : ප.ව. 10.20 යි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM